
# සෑම ගමනකටම සවියක් වෙමින්



ඒකාබද්ධ වාර්ෂික වාර්තාව

2025

NSB

**සෑම ගමනකටම සවියක් වෙමින්**

ජාතික ඉතිරිකිරීමේ බැංකුව
ඒකාබද්ධ වාර්ෂික වාර්තාව 2025

© ජාතික ඉතිරිකිරීමේ බැංකුව
ISBN 978-624-5790-17-3



# සෑම ගමනකටම සවියක් වෙමින්

සෑම ශ්‍රී ලාංකිකයෙකුගේම ජීවන ගමන එකිනෙකට වෙනස්ය. එම සෑම ගමනකටම ශක්තියක් වීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව සැමවිටම කැපවී සිටියි. සුළු හා ක්‍රමවත් තැන්පතුවල සිට දිගුකාලීන ආයෝජන දක්වාත්, දැරිය හැකි පොළී අනුපාතයන් සහිත නිවාස හිමිකමක සිට අධ්‍යාපන සහ ව්‍යවසායකත්ව මූල්‍ය පහසුකම් දක්වාත් වෙළඳපොළේ ඉහළම, ජනතාවගේ අවශ්‍යතා හඳුනාගත් විශිෂ්ට මූල්‍ය විසඳුම් අපි පිරිනමන්නෙමු. අපගේ පුළුල් ශාඛා ජාලය සහ ශ්‍රී ලංකා තැපැල් සේවය හරහා විහිදුණු නියෝජිත ජාලය මගින්, අනෙකුත් මූල්‍ය ආයතනවලට ළඟා වීමට අපහසු දුරස්ථ ප්‍රජාවන් වෙත පවා ගොස් සියලුදෙනා ඇතුළත් කරගත් මූල්‍ය අන්තර්කරණය අපි සහතික කරමු. ශක්තිමත් ප්‍රාග්ධනය හා ද්‍රවශීලතාවය මෙන්ම ඩිජිටල් පරිවර්තනය සහ තිරසාර මූල්‍යකරණය කෙරෙහි වූ අපගේ දැඩි අවධානය තුළින්, එක් පාරිභෝගිකයෙකුගෙන් ඇරඹී, එක් පවුලක් සහ එක් ප්‍රජාවක් වශයෙන් මුළු මහත් ජාතියේම ප්‍රගමනය අපි සවිබල ගන්වන්නෙමු.

# පටුන


අපගේ ඒකාබද්ධ
වාර්ෂික වාර්තාව ගැන 4

## 9

## පූර්විකාව

ජාතික ඉතිරිකිරීමේ බැංකුව පිළිබඳව
කෙටියෙන් 10

වසර 193ක අභිමානවත් උරුමය 12

නිමැවුම් සහ සේවා 13

වැදගත් තොරතුරු 14

සභාපතිතුමාගේ පණිවිඩය 16

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක
නිලධාරීගේ සමාලෝචනය 20

## 27

## අපගේ තිරසාර වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය

මෙහෙයුම් පරිසරය 28

අවදානම් සහ අවස්ථාවන් 34

ප්‍රමාණාත්මකතාවය 40

ඒකාබද්ධ පාර්ශ්වකාර සහභාගිත්වය 52

අපගේ තිරසාරත්ව රාමුව 60

ව්‍යාපාර ආකෘතිය 62

උපායමාර්ගය සහ සම්පත් වෙන්කිරීම 66

## 79

## කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය

ව්‍යාපාර අංශ සමාලෝචනය 80

මූල්‍ය ප්‍රාග්ධනය 90

නිෂ්පාදිත ප්‍රාග්ධනය 109

මානව ප්‍රාග්ධනය 117

බුද්ධිමය ප්‍රාග්ධනය 134

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය 144

ස්වාභාවික ප්‍රාග්ධනය 172

SLFRS තිරසාරතාවයට අදාළ මූල්‍ය අනාවරණ
(SLFRS S1 සහ SLFRS S2) 182

ආයතනික පාලනය පිළිබඳ ප්‍රකාශය 212

අවදානම් කළමනාකරණය පිළිබඳ ප්‍රකාශය 213

ස්වාධීන වෘත්තිකයින්ගේ සීමිත සහතික
කිරීමේ වාර්තාව 214




මූල්‍ය ශක්තිය සංවර්ධන අරමුණු සමඟ ඒකාබද්ධ කරන ප්‍රමුඛතම රජය සතු ඉතිරි කිරීමේ ආයතනය ලෙස අපගේ කාර්යසාධනය, අපගේ ආකෘතියේ පවතින සදාකාලික අදාළත්වය සනාථ කරයි.



දිගුකාලීන ඉලක්කයන් සමඟ සමබර වෙමින් අප දක්වන ප්‍රතිචාරශීලීත්වය මගින්, ආයතනික වගකීම ආරක්ෂා කරමින් රජය වෙත ස්ථාවර සහයෝගීතාවයක් සැපයීමට අපට ඇති කැපවීම පිළිබිඹු වේ.

පටුන

# 219

## පාලනය


අධ්‍යක්ෂ මණ්ඩලය **220**

ආයතනික කළමනාකාරිත්වය **226**

විධායක කළමනාකාරිත්වය **228**

ප්‍රධාන කළමනාකාරවරු **230**

ආයතනික පාලනය **231**

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව **245**

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටු වාර්තාව **248**

අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටු වාර්තාව **250**

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව **251**

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටු වාර්තාව **253**

අවදානම් කළමනාකරණ වාර්තාව **254**


# 281

## මූල්‍ය වාර්තා


මූල්‍ය දින දර්ශනය **282**

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව **283**

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම සම්බන්ධ ප්‍රකාශය **289**

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය **290**

අභ්‍යන්තර පාලනය පිළිබඳ ස්වාධීන සහතික වාර්තාව **292**

සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරිගේ සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්, සැලසුම් සහ කළමනාකරණ තොරතුරු පද්ධති)/ප්‍රධාන මූල්‍ය නිලධාරිගේ වගකීම් ප්‍රකාශය **293**

විගණකාධිපති වාර්තාව **294**

මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගතය **297**

ආදායම් ප්‍රකාශය **298**

විස්තීරණ ආදායම් ප්‍රකාශය **299**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය **300**

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය **302**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය **306**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් **308**


# 439

## අතිරේක තොරතුරු


2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම **440**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA SRI LANKA) විසින් නිකුත් කරන ලද 2023 ආයතනික පාලනය පිළිබඳ යහපරිච සංග්‍රහය (සංග්‍රහය) සමඟ අනුකූලතාවය **469**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද අනෙකුත් හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් **474**

2016 අංක 1 දරන බැංකු පනතේ නියෝගයෙහි III උපලේඛනය ප්‍රකාර බාසල් III හෙළිදරව්කිරීම් **480**

දේශීය පද්ධති අනුව වැදගත් බැංකු තක්සේරු කිරීමේ ක්‍රියාකාරකම - 2025 **490**

මධ්‍ය නිර්ණායක සමඟ අනුකූල අන්තර්ගත දර්ශකය **491**

ආදායම් ප්‍රකාශය - ඇමරිකානු ඩොලර් වලින් **494**

විස්තීරණ ආදායම් ප්‍රකාශය - ඇමරිකානු ඩොලර් වලින් **495**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය - ඇමරිකානු ඩොලර් වලින් **496**

සංඛ්‍යාලේඛනාත්මක දර්ශකයන් 2016-2025 **497**

තැන්පතු විශ්ලේෂණය **498**

ආදායම් ප්‍රකාශය පිළිබඳ තිරස් විශ්ලේෂණය **499**

ආදායම් ප්‍රකාශය පිළිබඳ සිරස් විශ්ලේෂණය **499**

මූල්‍ය තත්ත්වය පිළිබඳ තිරස් විශ්ලේෂණය **500**

මූල්‍ය තත්ත්වය පිළිබඳ සිරස් විශ්ලේෂණය **501**

අනුරූප බැංකු **502**

හුවමාරු සමාගම් **503**

මූල්‍ය සහ බැංකුකරණයට අදාළ පාරිභාෂිත වචන මාලාව **504**

ආයතනික තොරතුරු **508**

# අපගේ ඒකාබද්ධ වාර්ෂික වාර්තාව ගැන

GRI 2-1



මෙය 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ (NSB) කාර්යසාධනය, උපායමාර්ගික දිශානතිය, පාලන රාමුව සහ පුළුල් මෙහෙයුම් පසුබිම පිළිබඳ සාකල්‍ය විස්තරයක් ඉදිරිපත් කරන 11 වන ඒකාබද්ධ වාර්ෂික වාර්තාවයි. ජාතික ඉතිරිකිරීමේ බැංකුව තිරසාර දිගුකාලීන අගයක් නිර්මාණය කරන්නේ කෙසේද යන්න පිළිබඳ පැහැදිලි විස්තරයක් ගොඩනැගීම සඳහා මූල්‍ය හා මූල්‍ය නොවන හෙළිදරව් කිරීම් බාධාවකින් තොරව මුසු කරමින්, ඒකාබද්ධ චින්තනය වෙනුවෙන් අප සතු නොසැලෙන කැපවීම මෙම වාර්තාව මගින් මැනවින් විදහා දක්වයි.

ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ රාමුවට (International Integrated Reporting Framework) අනුකූලව සකස් කරන ලද මෙම වාර්තාව මගින් අපගේ උපායමාර්ගික ප්‍රමුඛතාවන්ට සාපේක්ෂව ලබා ඇති ප්‍රගතිය, සංකීර්ණ සහ අවිනිශ්චිත මෙහෙයුම් පරිසරයක් තුළ අප කටයුතු කළ ආකාරය සහ විවිධ පාර්ශ්වකරුවන්ගේ විකාශනය වන අපේක්ෂාවන් සඳහා අප දක්වන ප්‍රතිචාරාත්මක බව මැනවින් පිළිබිඹු කරයි.

අභියෝගාත්මක වසරක් මධ්‍යයේ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පරිවර්තනීය ගමන් මඟ මෙම වාර්තාව මගින් සවිස්තරාත්මකව වාර්තා කරන අතර එහිදී ආයතනික ශක්තිමත්භාවය, ඩිජිටල් හැකියාවන් ඉහළ නැංවීම, පාරිභෝගික විශ්වාසය වර්ධනය කිරීම සහ අපගේ මෙහෙයුම්වල සියලු අංශ හරහා තිරසාරත්වය ස්ථාපිත කිරීම සඳහා ගත් විචක්ෂණශීලී පියවර මෙහිදී අවධාරණය කෙරේ. තවද, සාර්ව ආර්ථික වෙනස්කම්, තාක්ෂණික දියුණුව, සමාජීය අපේක්ෂාවන්, නියාමන වර්ධනයන් සහ පාරිසරික අවශ්‍යතා ඇතුළත් අන්තර්-සම්බන්ධිත බාහිර බලවේගයන්ට අපගේ ව්‍යාපාරික ආකෘතිය ගතිකව ප්‍රතිචාර දක්වන ආකාරය පිළිබඳව ද මෙහිදී විමසා බැලේ. මෙම ඒකාබද්ධ දෘෂ්ටිකෝණය හරහා, අපගේ ජාතික වගකීම ස්ථාවරව ඉටු කරමින් සමබර සහ ඔරොත්තු දෙන වර්ධනයක් අත්කර ගැනීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව සතු ප්‍රාග්ධන රූප හය (මූල්‍ය, නිෂ්පාදිත, මානව, බුද්ධිමය, සමාජීය හා සබඳතා සහ ස්වභාවික ප්‍රාග්ධනය) උපයෝගී කර ගන්නා ආකාරය අපි පෙන්නුම් කරමු. වේගයෙන් පරිවර්තනය වන වාතාවරණයක් තුළ ඔරොත්තු දීමේ හැකියාව, අදාළත්වය සහ අපගේ බලපෑම සාධාරණ, වගකීම් සහගත සහ දුරදිග යන එකක් බව සහතික කිරීම සඳහා අප දක්වන නොසැලෙන කැපවීම මෙම වාර්තාවෙන් පිළිබිඹු වේ.

මෙම ලේඛනය අපගේ වර්තමාන තත්ත්වය පිළිබඳ අතීතාවර්ජනයකට වඩා එහා ගිය, අපගේ පාරිභෝගිකයන්, සේවකයන්, හවුල්කරුවන්, කොටස් හිමියන් සහ අප සේවය කිරීමට භාග්‍යය ලත් සමස්ත ශ්‍රී ලාංකේය සමාජය ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් සඳහා තිරසාර වටිනාකමක් නිර්මාණය කිරීම වෙනුවෙන් ජාතික ඉතිරිකිරීමේ බැංකුව සතු අඛණ්ඩ කැපවීම පිළිබඳ සාක්ෂියකි.

## වාර්තාව කියවීම සහ පරිශීලනය කිරීම

ප්‍රධාන කොටස් අතර පවතින අන්තර්-සම්බන්ධතාවය ඉස්මතු කරමින් කියවීමේ සහ පරිශීලනය කිරීමේ පහසුව වැඩිදියුණු කිරීම සඳහා අන්තර්ක්‍රියාකාරී අංග සහ සංකේත (Icons) නිර්මාණය කර ඇති අතර, එමඟින් ඒකාබද්ධ චින්තනය වෙනුවෙන් අප සතු කැපවීම පිළිබිඹු වේ. මෙම වාර්තාව පුරා භාවිත කර ඇති සංකේත පිළිබඳ මාර්ගෝපදේශය 7 වන පිටුවේ ඇතුළත් කර ඇත.

## අපගේ වාර්තාකරණ රාමු හා අනුකූලතාව

මෙම වාර්තාව පිළියෙල කිරීමේදී, අදාළ අනාවරණ අවශ්‍යතා සහ මහා පරිමාවන් සමඟ පෙළ ගැසීම සහතික කරමින් ආයතනික වාර්තාකරණ හා නියාමන රාමු පිළිබඳ පුළුල් පැහැකඩකට අපි අනුගත වී ඇත. අපගේ කැපවීම අනුකූලතාවයෙන් ඔබ්බට විහිදෙන අතර ඉන් විනිවිදභාවය, වගවීම සහ වාර්තාකරණ අඛණ්ඩතාවය පිළිබඳ උසස් ප්‍රමිති කරා අපගේ කැපවීම පිළිබිඹු කරයි.

| | |
|---|---|
| CA | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA Sri Lanka) විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති |
| INTEGRATED REPORTING | <IR> IFRS පදනමේ රාමුව (www.theiirc.org) |
| GRI | ගෝලීය වාර්තාකරණ ප්‍රවේශය (GRI) තිරසාර වාර්තාකරණ මාර්ගෝපදේශ GRI ප්‍රමිති (www.globalreporting.org) |
| CA | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ආයතනික පාලනය පිළිබඳ යහපරිච සංග්‍රහය |
| SUSTAINABLE DEVELOPMENT GOALS | තිරසාර සංවර්ධන අරමුණු (SDGs) - එක්සත් ජාතීන්ගේ අපේක්ෂිත ගෝලීය අරමුණු 17 සමඟ මුලපිරීම |
| | ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) නියෝග සහ මාර්ගෝපදේශ |
| | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ (IRD) රෙගුලාසි හා නියෝග |
| | 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත හා එහි සංශෝධන |
| | 1988 අංක 30 දරන බැංකු පනත හා එහි සංශෝධන |

# අපගේ ඒකාබද්ධ වාර්ෂික වාර්තාව ගැන

GRI 2-4

## අපගේ විෂය පථය සහ වාර්තාකරණ සීමාවන්

අපගේ වාර්තාකරණය මඟින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව (මින් ඉදිරියට "බැංකුව" ලෙස හැඳින්වෙන) සහ එහි පූර්ණ අයිතිය සහිත පරිපාලිත වන NSB ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම (NSB Fund Management Company Ltd) සහ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව (Sri Lanka Savings Bank Ltd) ආවරණය වන අතර, මේවා සාමූහිකව "සමූහය" (Group) ලෙස හැඳින්වේ. මූල්‍ය තොරතුරු බැංකුව සහ සමූහය යන දෙඅංශය සඳහාම ඉදිරිපත් කර ඇති අතර, මූල්‍ය නොවන හෙළිදරව් කිරීම් වෙනත් ආකාරයකින් සඳහන් කර නොමැති නම් ප්‍රධාන වශයෙන් බැංකුවට පමණක් අදාළ වේ.

අපගේ වාර්ෂික මූල්‍ය සහ තිරසාරත්ව වාර්තාකරණ චක්‍රයට අනුකූලව, මෙම වාර්තාව 2025 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා වූ මාස 12ක කාලසීමාව ආවරණය කරයි.

තවද, 2026 පෙබරවාරි 23 වන දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබුණු දිනය දක්වා වූ වැදගත් ශේෂ පත්‍ර පසු සිදුවීම් (Post-balance sheet events) ද මෙයට ඇතුළත් වේ. පෙර කාලසීමාවන්ට සාපේක්ෂව වාර්තාකරණයේ විෂය පථය හෝ සීමාවන්හි සැලකිය යුතු වෙනස්කම් සිදුවී නොමැත. සංසන්දනාත්මක දත්තයන්හි කිසියම් ප්‍රතිසංස්කරණයක් (Restatements) හෝ වර්ගීකරණයන්හි වෙනසක් (Reclassifications) සිදු කර ඇත්නම්, ඒවා අදාළ අංශයන්හි නිසි පරිදි පැහැදිලි කර ඇත.

මූල්‍ය හෙළිදරව් කිරීම්වලට අමතරව, අපගේ මූල්‍ය නොවන කාර්යසාධනය පිළිබඳ පුළුල් දෘෂ්ටියක් මෙම වාර්තාව මඟින් සපයයි. මෙහෙයුම් පරිසරය, අවදානම් සහ අවස්ථාවන්, වැදගත් කරුණු (Material matters) ඒකාබද්ධ පාර්ශ්වකරුවන්ගේ සම්බන්ධතාවය, උපායමාර්ගික දිශානතිය මෙන්ම අපගේ ව්‍යාපාරික ආකෘතිය සහ ආයතනික පාලනය වැනි ප්‍රධාන ක්ෂේත්‍ර පිළිබඳව මෙහිදී විස්තර කෙරේ. ඉදිරි වසර දෙක තුනක කාලසීමාව සඳහා වන අපගේ කෙටි හා මධ්‍යකාලීන ප්‍රමුඛතාවන්ට අනුකූලව, මූල්‍ය සහ මූල්‍ය නොවන අරමුණු සහ ජයග්‍රහණ සම්බන්ධයෙන් 2025 වසර තුළ බැංකුව ලබා ඇති ප්‍රගතිය ද මෙම වාර්තාවේ සටහන් වේ. ශ්‍රී ලංකාවේ ගතික ආර්ථික පරිසරය තුළ ආයතනික ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමට සහ දිගුකාලීන අදාළත්වය තහවුරු කිරීමට ඉදිරි වසර පහේ සිට දහය දක්වා කාලය තුළ ජාතික ඉතිරිකිරීමේ බැංකුව අනුගමනය කරන දිගුකාලීන උපායමාර්ගික දිශානතිය පිළිබඳව ද මෙහි සඳහන් වේ.

### ඒකාබද්ධ වාර්තාකරණ සීමා

පහත ත්‍රිත්වය මගින් පැන නගින අවදානම්, අවස්ථා හා ප්‍රතිඵල ආවරණය කරයි



මෙහෙයුම් පරිසරය — පිටු අංක 28 - 33



දැරියහැකි සහ ලබාගතහැකි ප්‍රාග්ධනය
ඇතුළුව ව්‍යාපාර ආදර්ශය — පිටු අංක 62 - 65



උපායමාර්ගික හා
සම්පත් වෙන් කිරීම — පිටු අංක 66 - 77

ඒකාබද්ධ පාර්ශ්වකරුවන්ගේ
සහභාගීත්වය — පිටු අංක 52 - 59



සයවැදෑරුම් ප්‍රාග්ධන
භාවිතය හා බලපෑම — පිටු අංක 90 - 181

FC MC HC IC SRC NC

### අපගේ මූල්‍ය වාර්තාකරණ සීමා

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති.

### පරිපාලිත සමාගම්

ජාතික ඉතිරිකිරීමේ බැංකුව පිළිබඳ කෙටියෙන් යන සටහනෙහි පිටු අංක 11 හි මුළුමනින්ම අයිති පරිපාලිත සමාගම් ද්විත්වය දක්වා ඇත.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ 2025 ජනවාරි 1 සිට 2025 දෙසැම්බර් 31 දක්වා මූල්‍ය වර්ෂය, කාර්යසාධන තොරතුරු මගින් ආවරණය වේ. මෙදිනෙන් පසු හා මෙම වාර්තාවේ අනුමැතිය දක්වා දිනට සැලකියයුතු හෝ වැදගත් සිදුවීම් මීට ඇතුළත් කර ඒ අනුව සටහන් කර ඇත.

## ඒකාබද්ධ චින්තනය - අපගේ තිරසාර වටිනාකම් නිර්මාණය මෙහෙයවයි

ජාතික ඉතිරිකිරීමේ බැංකුව තුළ, ඒකාබද්ධ චින්තනය යනු අපගේ මෙහෙයුම් ස්වභාවය, උපායමාර්ගික සම්පාදනය, තීරණ ගැනීමේ ක්‍රියාවලීන් සහ දිගුකාලීන වටිනාකම් නිර්මාණය හැඩගස්වන මූලික විනයක් ලෙස ක්‍රියා කරයි. මෙම පාලන මූලධර්මය අපගේ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම, පාලන රාමුවල ශක්තිමත්භාවය, කාර්යසාධනයේ අඛණ්ඩතාව සහ අපගේ පාර්ශ්වකරුවන් සමඟ පවතින සබඳතාවල ගැඹුර විනිවිද යන අතර, එමඟින් වඩ වඩාත් ගතික වන පරිසරයක් තුළ අවදානම් කළමනාකරණය කිරීමටත් අවස්ථාවන් ග්‍රහණය කර ගැනීමටත් අපට ඉඩ සලසයි.

# අපගේ ඒකාබද්ධ වාර්ෂික වාර්තාව ගැන

මූල්‍ය සහ මූල්‍ය නොවන ප්‍රාග්ධනයන් අතර අර්ථවත් සබඳතා ගොඩනැගීම මගින් අපගේ ව්‍යාපාරික ආකෘතිය ක්‍රියාත්මක කිරීමේදී සාකල්‍ය දෘෂ්ටිකෝණයකින් කටයුතු කිරීම ඒකාබද්ධ චින්තනය මගින් අනිවාර්ය කෙරෙන අතර, එමගින් සියලු පාර්ශ්වයන් ඇතුළත් කරගන්නා වූත් තිරසාර වූත් වටිනාකම් නිර්මාණයක් ප්‍රවර්ධනය කරයි. මෙම ප්‍රවේශය හරහා, කොටස් හිමියන්ගේ ප්‍රතිලාභවලින් ඔබ්බට ගිය ප්‍රතිඵල ලබා දීමටත්, අපගේ පාරිභෝගිකයන්, සේවකයන්, ප්‍රජාවන් සහ සමස්ත ජාතිය වෙනුවෙන් කල්පවතින ප්‍රතිලාභ උත්පාදනය කිරීමටත් අපි උපායමාර්ගිකව ස්ථානගත වී සිටිමු.

## ප්‍රමාණාත්මක කරුණු

ඒකාබද්ධ චින්තන ප්‍රවේශය තුළ වැදගත්භාවය පිළිබඳ තක්සේරුකරණයන් අත්‍යවශ්‍ය අංගයක් වේ. විවිධ කාලපරිච්ඡේද තුළ වටිනාකම් උත්පාදනය කිරීමට සහ පවත්වා ගැනීමට අප සතු හැකියාව කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන මෙන්ම, බැංකුවේ කෙටි, මධ්‍යම සහ දිගුකාලීන ප්‍රතිඵල හා ප්‍රතිවිපාක කෙරෙහි බලපාන කරුණු අපි ප්‍රමාණාත්මක කරුණු (Material matters) ලෙස අර්ථ දක්වන්නෙමු. ජාතික ඉතිරිකිරීමේ බැංකුව මෙහිදී ද්විත්ව වැදගත්භාවය පිළිබඳ දෘෂ්ටිකෝණයක් (Double materiality perspective) අනුගමනය කරයි; එනම්, ආර්ථික වටිනාකම නිර්මාණය කිරීමට හෝ සුරැකීමට ඇති හැකියාව කෙරෙහි බලපාන කරුණු පිළිබිඹු කරන මූල්‍යමය වැදගත්භාවය (Financial materiality) සහ පරිසරය, ප්‍රජාවන් සහ සමාජය කෙරෙහි අප විසින් ඇති කරනු ලබන පුළුල් බලපෑම් සලකා බලනු ලබන බලපෑමේ වැදගත්භාවය (Impact materiality) යන අංශ දෙකම මෙහිදී ඇගයීමට ලක් කෙරේ.

මෙම වාර්තාව මගින් එක් එක් වැදගත් කරුණක් ඒවාට අදාළ සන්දර්භය තුළ තබන අතර, බැංකුවේ උපායමාර්ගික හා මෙහෙයුම් ප්‍රමුඛතාවන්ට පදනම වෙමින් විවිධ කාලරාමු ඔස්සේ වටිනාකම් උත්පාදනය කිරීමට හෝ වටිනාකම් ක්ෂය වීමට (Erosion of value) බලපෑ හැකි කරුණු මෙහිදී ඉස්මතු කරයි. එමෙන්ම, මෙම වැදගත් කරුණු ඒවායේ බලපෑමේ ප්‍රමාණය අනුව ශ්‍රේණිගත කර ඇත.

## ගතික ප්‍රමාණාත්මක කරුණු

නිරන්තරයෙන් පරිණාමය වන මෙහෙයුම් ක්ෂේත්‍රය සහ අපගේ ව්‍යාපාරය කෙරෙහි උපරිම බලපෑමක් ඇති කරන අංශ කෙරෙහි බලපෑම් කිරීමට එම ක්ෂේත්‍රයට ඇති හැකියාව අපි හඳුනාගෙන ඇත්තෙමු. එබැවින්, නිසි ප්‍රතිචාරාත්මක බව සහතික කිරීම සඳහා අපි වාර්ෂිකව දැඩි වැදගත්භාවය පිළිබඳ සමාලෝචනයන් (Materiality reviews) සිදු කරන්නෙමු.

වටිනාකම් නිර්මාණය කිරීමට සහ ඒවා පවත්වා ගැනීමට අප සතු හැකියාව හැඩගස්වන අත්‍යවශ්‍ය කරුණු අපගේ වාර්තාකරණය මගින් ඵලදායී ලෙස ග්‍රහණය කර ගන්නා බවට අපි විශ්වාසය පළ කරමු.

## අපගේ වාර්තාකරණ ව්‍යුහයෙහි වැඩිදියුණු කිරීම්

- තොරතුරු අතර පවතින සම්බන්ධතාවය (Connectivity) වැඩිදියුණු කිරීම.
- ප්‍රාග්ධන වර්ග (Capitals), උපායමාර්ග සහ ව්‍යාපාරික ක්ෂේත්‍ර පිළිබඳ සමාලෝචනයන් (Business lines review) සම්බන්ධ හෙළිදරව් කිරීම් වැඩිදියුණු කිරීම.
- කියවීමේ පහසුව සහ සැලසුම්කරණය (Design) වැඩිදියුණු කිරීම.
- ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) යටතේ වන තිරසාරත්ව හෙළිදරව් කිරීම් ප්‍රමිතීන් - එනම්, SLFRS S1 තිරසාරත්වය සම්බන්ධ මූල්‍ය තොරතුරු හෙළිදරව් කිරීමේ පොදු අවශ්‍යතා සහ SLFRS S2 දේශගුණය ආශ්‍රිත හෙළිදරව් කිරීම් (Climate Related Disclosures) යොදා ගැනීම.

**ඉදිරි දැක්ම**

අපගේ උපායමාර්ගය ක්‍රියාත්මක කිරීමේදී අපට මුහුණ දීමට සිදුවිය හැකි අභියෝග සහ අපට උදාකර ගත හැකි අවස්ථාවන් පදනම් කර ගනිමින් අපගේ ඉදිරි දැක්ම සකස් වී ඇත. මෙම සාධක අපගේ ව්‍යාපාරික ආකෘතියට සහ අනාගත කාර්යසාධනයට බලපාන ආකාරය පහත දැක්වෙන අංශ හරහා සාකච්ඡා කෙරේ.


**19** වන පිටුවේ ඇති සභාපතිතුමාගේ පණිවිඩය

**24** වන පිටුවේ ඇති සාමාන්‍යාධිකාරීවරයාගේ සමාලෝචනය

**28** සිට **33** දක්වා පිටුවල ඇති මෙහෙයුම් පරිසරය

**72** සිට **77** දක්වා පිටුවල ඇති උපායමාර්ග සහ සම්පත් වෙන්කිරීම

**90** සිට **108** දක්වා පිටුවල ඇති මූල්‍ය ප්‍රාග්ධනය

**116** වන පිටුවේ ඇති නිෂ්පාදිත ප්‍රාග්ධනය

**133** වන පිටුවේ ඇති මානව ප්‍රාග්ධනය

**143** වන පිටුවේ ඇති බුද්ධිමය ප්‍රාග්ධනය

**154, 160, 166, 171** යන පිටුවල ඇති සමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය

**181** වන පිටුවේ ඇති ස්වභාවික ප්‍රාග්ධනය


## අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් ප්‍රකාශය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආයතනික පාලන ව්‍යුහයේ භාරකරුවන් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය, මෙම ඒකාබද්ධ වාර්තාවේ අඛණ්ඩතාව (integrity), නිරවද්‍යතාව සහ විනිවිදභාවය පිළිබඳ පූර්ණ වගකීම සහතික කරයි. මෙම වාර්තාව මගින් බැංකුවේ කාර්යසාධනය, උපායමාර්ගික දිශානතිය, අවදානම් තත්ත්වයන් සහ පාර්ශ්වකරුවන් කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳ සත්‍ය සහ සමබර පිළිබිඹුවක් ඉදිරිපත් කරන බවටත්, කෙටි, මධ්‍යම සහ දිගුකාලීනව තිරසාර වටිනාකම් නිර්මාණය කිරීමේ බැංකුවේ හැකියාව පිළිබඳ පැහැදිලි දැක්මක් සපයන බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාසය පළ කරයි.

මෙම වාර්තාව ඒකාබද්ධ වාර්තාකරණ රාමුවේ (Integrated Reporting Framework) මූලධර්මවලට අනුකූලව, කළමනාකාරිත්වයේ අධීක්ෂණය යටතේ සහ ශක්තිමත් අභ්‍යන්තර හා බාහිර සහතික කිරීමේ ක්‍රියාවලීන් (Assurance processes) මගින් මැනවින් සනාථ කර සකස් කර ඇත. වාර්තාවේ අන්තර්ගතය සහ වගකීම් සහගත, වටිනාකම් මත පදනම් වූ වාර්තාකරණයක් සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ කැපවීම විදහා දැක්වීමේදී එහි භූමිකාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පූර්ණ ලෙස අනුමත කරනු ලබයි.

මෙම වාර්තාව ඒකාබද්ධ වාර්තාකරණ රාමුවේ (Integrated Reporting Framework) මූලධර්මවලට අනුකූලව, කළමනාකාරිත්වයේ කැපවූ අධීක්ෂණය යටතේ සහ ශක්තිමත් අභ්‍යන්තර හා බාහිර සහතික කිරීමේ ක්‍රියාවලීන් (Assurance processes) මගින් මැනවින් සනාථ කර සකස් කර ඇත. වාර්තාවේ අන්තර්ගතය සහ වගකීම් සහගත, වටිනාකම් මත පදනම් වූ වාර්තාකරණයක් සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ කැපවීම විදහා දැක්වීමේදී එහි භූමිකාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පූර්ණ ලෙස අනුමත කරනු ලබයි.

**ආචාර්ය හර්ෂ කබ්රාල්, ජනාධිපති නීතිඥ** - සභාපති/ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ

**ශ්‍රීඩ් නිලුක්ෂාන් මහතා** - අධ්‍යක්ෂ (නිල බලයෙන්)/ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ

**එස් ආර් ඩබ්ලිව් එම් රුවන් පාලිත සත්කුමාර මහතා** - අධ්‍යක්ෂ (නිල බලයෙන්)/ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ

**දුෂ්‍යන්ත බස්නායක මහතා** - ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ

**අශේන් ජයසේකර මහතා** - ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ

**රනිල් ගුණතිලක මහතා** - ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ

**සුපුල් විජේසිංහ මහතා** - ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ/ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ

## අනාගතය පිළිබඳ ප්‍රකාශයන්

මෙම වාර්තාවට ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අනාගත කාර්යසාධනය සහ ඉදිරි දැක්ම පිළිබඳ ප්‍රකාශයන් ඇතුළත් වන අතර, ඒවා අපගේ වර්තමාන තක්සේරු කිරීම් සහ අපේක්ෂාවන් මත පදනම් වේ. කෙසේ වෙතත්, විකාශනය වන අවදානම්, අවිනිශ්චිතතාවයන් සහ අනෙකුත් සැලකිය යුතු සාධක හේතුවෙන් අපගේ ප්‍රක්ෂේපණයන්ගෙන් වෙනස් වූ ප්‍රතිඵල ඇති විය හැකි බවත්, එමගින් බැංකුවේ අනාගත ව්‍යාපාරික සහ මූල්‍ය ප්‍රතිඵල කෙරෙහි අහිතකර ලෙස බලපෑම් කළ හැකි බවත් හඳුනා ගැනීම වැදගත් වේ.

**විමසීම**

මෙම වාර්තාව පිළිබඳ ඔබේ අදහස් සහ විමසීම් අපි ඉතා අගය කොට සලකන අතර, ඒවා පහත ලිපිනයට යොමු කළ හැකිය:


**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී**
(මූල්‍ය, සැලසුම් සහ කළමනාකරණ තොරතුරු පද්ධති)/ප්‍රධාන මූල්‍ය නිලධාරී
මූල්‍ය හා සැලසුම් අංශය
ජාතික ඉතිරිකිරීමේ බැංකුව,
අංක 255, ගාලු පාර,
කොළඹ 03.

අපගේ ඒකාබද්ධ වාර්ෂික වාර්තාව ගැන

## සංචලන සළකුණු

### ප්‍රාග්ධනයන්

- **FC** මූල්‍ය ප්‍රාග්ධනය
- **MC** නිෂ්පාදිත ප්‍රාග්ධනය
- **HC** මානව ප්‍රාග්ධනය
- **IC** බුද්ධිමය ප්‍රාග්ධනය
- **SRC** සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය
- **NC** ස්වාභාවික ප්‍රාග්ධනය

### පාර්ශ්වකරුවන්



කොටස් හිමියා/ ආයෝජකයා



ගනුදෙනුකරුවන්



සේවකයින්



නියාමකයින් හා රජයේ ආයතන



ව්‍යාපාර හවුල්කරුවන්



සමාජය හා පරිසරය

### උපාය මාර්ගික කුළුණු




ගනුදෙනුකාර කේන්ද්‍රීයත්වය සහ මූල්‍ය අන්තර්කරණය




තිරසාර ඵෙන්ද්‍රීය වර්ධනය සහ කළඹ ප්‍රශස්තරණය




සේවක සංස්කෘතිය සහ සහභාගිත්ව විශිෂ්ටත්වය




අවදානම් සංස්කෘතිය, පාලනය සහ අනුකූලතා විනය




ඩිජිටල් වේගවත්වීම සහ දත්ත-පදනම් බැංකුකරණය




තිරසාරභාවය, දේශගුණය සහ ප්‍රජා ඔරොත්තු දීම



# සෑම ජීවන ගමනකම පදනම වන පුරුද්ද සවිබල ගැන්වීම

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වෘත්තාන්තයේ කේන්ද්‍රස්ථානය වන්නේ ශ්‍රී ලාංකික පුද්ගලයායි. අනාගත සුරක්ෂිතතාව උදෙසා ඉතිරි කරන දෙමාපියන්ගේ සිට, සිය ප්‍රථම තැන්පතුව සිදුකරන පාසල් දරුවා සහ අවිනිශ්චිත තත්ත්වයන්ට එරෙහිව මූල්‍යමය රැකවරණයක් ගොඩනගා ගන්නා සේවකයා දක්වා සියලුදෙනා එහි අන්තර්ගත වේ.

දශක පහකට අධික කාලයක් පුරා, ඉතිරි කිරීමේ ක්‍රියාවලිය සරල, සුරක්ෂිත සහ සෑම පුද්ගලයෙකුටම පහසුවෙන් ප්‍රවේශ විය හැකි අත්දැකීමක් බවට පත් කරමින්, රුපියලෙන් රුපියල එක් කර මූල්‍ය විචක්ෂණභාවය පිළිබඳ ජාතික සංස්කෘතියක් පෝෂණය කිරීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව නිරන්තරයෙන් කැපවී සිටී.

ඒකාබද්ධ වාර්තාව

# පූර්විකාව

ජාතික ඉතිරිකිරීමේ බැංකුව පිළිබඳව කෙටියෙන්
10

වසර 193ක අභිමානවත් උරුමය
12

නිමැවුම් සහ සේවා
13

වැදගත් තොරතුරු
14

සභාපතිතුමාගේ පණිවිඩය
16

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය
20

# ජාතික ඉතිරිකිරීමේ බැංකුව පිළිබඳව කෙටියෙන්

GRI 2-1

## ස්ථාවරත්වය, සවිබලගැන්වීම හා විශ්වාසයේ උරුමය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ කතාව 1972 දී ආරම්භ නොවෙයි; එය සියවසකටත් අඩකටත් වැඩි කාලයක් ඈතට දිවෙමින්, 193 වසරක් පුරා විහිදෙන මූල්‍ය භාරකාරත්වයේ පොහොසත් රටාවක් වියමින් ගෙන යයි. 1832 දී සිලෝන් සේවින්ස් බැංකුව (CSB) ස්ථාපිත කිරීමත් සමඟ මෙම උරුමය ආරම්භ වූ අතර, එය ජාතියේ ඉතුරුම් සංස්කෘතිය වගා කිරීම සඳහා රටේ ගනු ලැබූ ප්‍රථම ආකෘතික පියවර ලෙස සනිටුහන් විය. 1885 දී තැපැල් කාර්යාල ඉතුරුම් බැංකුව ස්ථාපිත කිරීම, 1938 දී ඉතුරුම් සහතිකා අංශය ආරම්භ කිරීම සහ 1943 දී ජාතික ඉතුරුම් ව්‍යාපාරය පිහිටුවීම ඔස්සේ මෙම පදනම ශක්තිමත් විය. මෙම ගෞරවාන්විත ආයතන හතර 1972 දී ඒකාබද්ධ කොට ජාතික ඉතිරිකිරීමේ බැංකුව බිහි කරන ලද අතර, රටේ මූල්‍ය අනාගතයේ ඒකාබද්ධ භාරකරු ලෙස එය ස්ථාපිත විය.

එතැන් සිට දශක පහකට අධික කාලයක් තිස්සේ, NSB ශ්‍රී ලංකාවේ මූල්‍ය ස්ථාවරත්වය හා සවිබලගැන්වීමේ දිදුලන ආදර්ශයක් ලෙස ස්ථාපිත ව, ජාතික ඉතුරුම් හා මූල්‍ය විචක්ෂණශීලිත්වයේ සංස්කෘතියක් පෝෂණය කරමින් සිටී. 1988 දී බැංකු පනත අංක 30 යටතේ බලපතලාභී විශේෂිත බැංකුවක් (LSB) ලෙස නම් කිරීමත් සමඟ, NSB සිය මූල්‍ය ඇතුළත් කිරීමේ කැපවීම නැවත තහවුරු කළ අතර, පන්තිය, ජාතිය හා ස්ත්‍රී-පුරුෂ භේදය ඉක්මවා ගොස් සමාජයේ සියලු ස්ථර වෙත ඉතුරුකිරීමේ පුරුදු ප්‍රවර්ධනය කළේය.

අද වන විට, ජාතික ඉතිරිකිරීමේ බැංකුව ශ්‍රී ලංකාවේ වඩාත්ම අන්තර්වාරී මූල්‍ය ආයතන අතර ඉදිරියෙන් පසුවන අතර, සක්‍රීය ගිණුම් මිලියන 10 කට අධික සංඛ්‍යාවකට ආඩම්බරයෙන් සේවය කරමින් නොගැනියහැකි ජීවිත කෙරෙහි කල්පවත්නා බලපෑමක් ඇති කරයි. මෑත වසරවල පැවති ආර්ථික කැළඹිලි මධ්‍යයේ වුවද, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සිය මෙහෙවරෙහි අචලව රැඳී සිට ඇත. එහි ආරම්භක මූලධර්ම මගින් මෙහෙයවනු ලබන සහ ඔරොත්තු දීමේ හැකියාවෙන් ශක්තිමත් වූ බැංකුව, අඛණ්ඩව පරිණාමය වෙමින්, අනුවර්තනය වෙමින් සහ බලගන්වමින් ඉදිරියට යයි. අභියෝගාත්මක අවස්ථාවන් කළමනාකරණය කරගැනීමට බැංකුව සතු හැකියාව, එහි පාර්ශ්වකරුවන් වෙත දක්වන සේවාව තහවුරු කිරීමට පමණක් නොව, පුද්ගලයන්ට සහ ප්‍රජාවන්ට සමෘද්ධිමත් වීමට උපකාර කිරීමේ ලා බැංකුව සතු කාර්යභාරය නැවත තහවුරු කිරීමටද හේතු වී ඇති අතර, එමගින් සමස්ත ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් වඩාත් දීප්තිමත් මෙන්ම වඩාත් අන්තර්වාරී අනාගතයක් සහතික කරයි.

## සන්නාම ශ්‍රේණිගත කිරීම

ලංකා ශ්‍රේණිගත ආයතනය (LRA) බැංකුවට 2025 සඳහා ස්ථාවර (SL) AAA නිකුත්කර ශ්‍රේණිගත කිරීම ලබා දී ඇත. Brand Finance Lanka Ltd ආයතනය, බැංකුව ශ්‍රී ලංකාවේ පස්වන වඩාත්ම වටිනා සන්නාමය ලෙස නම් කර ඇත.

## ශාඛා ජාලය

ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨ ඉතුරුම් ආයතනය ලෙස, NSB ශාඛා 263ක්, ATM/CRM 418ක් සහ තැපැල් කාර්යාල හා උප-තැපැල් කාර්යාල හරහා නියෝජිතයන් 4,002 දෙනෙකුගෙන් සමන්විත ව්‍යාප්ත ජාලයක් ආඩම්බරයෙන් ක්‍රියාත්මක කරන අතර, රට පුරා ශ්‍රේෂ්ඨ ප්‍රවේශ්‍යතාවය හා සේවා ශ්‍රේෂ්ඨකම සහතික කරයි.


**අපගේ දැක්ම**

ඉතුරුම් හා ආයෝජන විසඳුම් සඳහා වඩාත්ම විශ්වාසදායක හා ඉල්ලුම් කරනු ලබන තේරීම.

**අපගේ මෙහෙවර**

සියලු කොටස්කරුවන්ගේ අපේක්ෂාවන් ඉෂ්ට කරමින්, ඔවුන්ගේ ඉතුරුම් හා ආයෝජන අවශ්‍යතා ප්‍රශස්ත කිරීම සඳහා ගනුදෙනුකරුවන්ට සම්පූර්ණ මූල්‍ය විසඳුම් ලබා දීම.


**අපගේ වටිනාකම්**

අපගේ දෛනික ව්‍යාපාර කටයුතු මෙහෙයවීමේදී, අපි කඩිනමින් ප්‍රතිචාර දක්වමින්, විශ්වාසය, අන්‍යෝන්‍ය ගෞරවය හා අවංකභාවය ඔස්සේ නිර්මාණශීලීව ක්‍රියා කරනු ඇත.

**අපගේ අරමුණ**


ජාතියේ වර්ධනය වේගවත් කිරීම.


## අපගේ ශක්තිය හා ස්ථාවරත්වය




රූපය 1


## ජාතික ඉතිරිකිරීමේ බැංකුව පිළිබඳව කෙටියෙන්




රූපය 2

- ප්‍රගතිශීලී ආයතනික සංස්කෘතියකින් සහාය වන අරමුණු සහිත ව්‍යාපාරයක්
  **ඉතිරිකිරීම් සහ ආයෝජන සඳහා ඉතා විශ්වාසදායක සහ ගෞරවනීය තේරීමක්**
- ව්‍යවස්ථාව පරිදි තැන්පතු වලින් 60% ක් ඉතා සුරක්ෂිත රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම
  **ජාතික මූල්‍ය ස්ථාවරත්වයේ විශ්වාසදායක භාරකරුවෙක්**
- තෝරාගත් උත්පාදිත හා යහපත් අවදානම් කළමනාකරණය
  **ක්ෂේත්‍රයේ සාමාන්‍යයට සාපේක්ෂව අඩු අක්‍රිය ණය අනුපාතයක්**
- සියලුම තැන්පතු හා එහි පොලිය පිළිබඳ 100% රජයේ විශ්වාසය සහිත රටේ එකම බැංකුව
  **රටතුළ ආරක්ෂිත බැංකුව**
- මිලියන 10.52 ගිණුම්වලට සේවය සැලසීම
  **ජනතාවගේ තේරීම**
- බදු, අයකිරීම්, ගාස්තු සහ ලාභාංශ මහා භාණ්ඩාගාරයට දායකවීම
  **ජාතික ආර්ථිකයට නොසැලෙන සහයෝගය**
- රජයේ දිගුකාලීන සංවර්ධනය සහ සමාජ-ආර්ථික ව්‍යාපෘති සඳහා අරමුදල් ලබාදීම
  **ජාතිය ගොඩනැගීම**
- සමාජයට ධනාත්මක බලපෑමක් ඇති කරන ආකාරයෙන් ව්‍යාපාර පැවැත්වීම
  **වගකීම් සහගත බැංකුකරණය තුළින් ධනාත්මක බලපෑම**
- ප්‍රවීණ කළමනාකරණය සමඟ ඒකාබද්ධ වූ පාලනය
  **යහපාලනය තුළින් විශිෂ්ටත්වය**

# වසර 193ක අභිමානවත් උරුමය



# නිමැවුම් සහ සේවා
























**ඉතුරුම් තැන්පතු** →

- සාමාන්‍ය ඉතුරුම්
- ළමා ඉතුරුම් - කිරිකැටි හපන්, පුංචි හපන්, හපන් ළමා ඉතුරුම් ගිණුම
- යෞවන ඉතුරුම් - නියෝ ඉතුරුම් ගිණුම
- තරුණ ඉතුරුම් - I'M ඉතුරුම් ගිණුම
- කාන්තා ඉතුරුම් - ස්ත්‍රී ඉතුරුම් ගිණුම
- විශේෂ ඉතුරුම් - හැපී ඉතුරුම් ගිණුම,
- ස්මයිල් ඉතුරුම් ගිණුම

**ඉතුරුම්/විශ්‍රාම සැලසුම්** →

- NSB පෙන්ෂන් +
- පස් අවුරුදු ඉතුරුම්
- රියැලිටි ඉතුරුම් සැලසුම
- ප්‍රාර්ථනා
- ප්‍රාර්ථනා +
- සවිබල ඉතුරුම්

**කාලීන තැන්පතු** →

- සාමාන්‍ය තැන්පතු - ස්ථාවර තැන්පතු (FDs)
- ජ්‍යෙෂ්ඨ පුරවැසි තැන්පතු - ගෞරව ස්ථාවර තැන්පතු ගිණුම, ජ්‍යෙෂ්ඨ පුරවැසි තැන්පතු විශේෂ ස්ථාවර තැන්පතු

**විදේශ මුදල් නිෂ්පාදන** →

- පුද්ගලික විදේශ මුදල් ගිණුම් (PFCA)
- ව්‍යාපාරික විදේශ මුදල් ගිණුම් (BFCA)
- අභ්‍යන්තර ආයෝජන ගිණුම් (IIA)
- විදේශ මුදල් කාලීන තැන්පතු
- විශේෂ තැන්පතු ගිණුම (SDA)
- ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම (CTRA)
- මුදල් මාරු කිරීමේ ව්‍යාපාර

**පාරිභෝගික ණයදීමේ ව්‍යාපාර** →

- නිවාස/දේපළ ණය - ගේ දොර, අලංකාර, රාජ්‍ය සේවකයන් සඳහා නිවාස ණය
- First home owner

**පුද්ගලික ණය** →

- NSB පුද්ගලික ණය
- බුද්ධි ණය
- විශේෂ විශ්‍රාමික ණය
- තැන්පතු මත ණය - ක්ෂණික ණය

**කාඩ්පත් සේවා** →

- Shopping + ATM කාඩ්පත
- NSB ඊසි කාඩ්පත

**වෙනත් සේවා** →

- ප්‍රේෂණ - NSB U-Trust
- විකුණුම් ලක්ෂ්‍ය (POS) උපාංගය පදනම් කරගත් ඉතුරුම් බලමුලු ගැන්වීම - NSB Reach
- වෙළෙඳ මූල්‍ය
- ඇපකර
- ස්ථාවර නියෝග
- සෘජු හර පහසුකම්
- ආරක්ෂිත තැන්පතු සේප්පු
- නාමයෝජනා
- උපයෝගීතා බිල්පත් ගෙවීම

**ආයතනික ණයදීම** →

**ඩිජිටල්/ඉලෙක්ට්‍රොනික් බැංකුකරණය** →

- NSB PayApp
- ඩිජිටල් බැංකුකරණය
- ක්ෂණික ප්‍රතිචාර කේත බැංකුකරණය

**පාසල්වල එකතු කිරීමේ මධ්‍යස්ථාන** →

**පාරිභෝගික සම්බන්ධතා මධ්‍යස්ථානය - බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය** →

**භාණ්ඩාගාරය** →

- භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, ප්‍රතිම්ලදී ගැණුම් සහ ප්‍රතිවිකුණුම්, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර, ප්‍රවර්ථන (SPOT) සහ ඉදිරි හුවමාරු ගිවිසුම්

# වැදගත් තොරතුරු

## වැදගත් මූල්‍ය තොරතුරු

| දෙසැම්බර් 31 දිනට | බැංකුව | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|
| | 2025 | 2024 | වෙනස% | 2025 | 2024 | වෙනස% |
| **වර්ෂයේ ප්‍රතිඵලය (රු. මිලියන)** | | | | | | |
| ශුද්ධ පොලී ආදායම | 84,849 | 72,583 | 16.90 | 86,419 | 75,069 | 15.12 |
| මූල්‍ය එකතුකළ අගය මත බදු වලට පෙර ලාභය | 57,387 | 35,615 | 61.13 | 59,206 | 38,248 | 54.80 |
| බදුකරණයට පෙර ලාභය (PBT) | 44,493 | 26,268 | 69.38 | 45,945 | 28,359 | 62.01 |
| ආදායම් බදු වියදම් | 17,172 | 10,145 | 69.26 | 17,782 | 10,862 | 63.71 |
| බදුකරණයට පසු ලාභය | 27,321 | 16,122 | 69.46 | 28,163 | 17,497 | 60.96 |
| **වසර අවසානය වන විට මූල්‍ය තත්ත්වය (රු. මිලියන)** | | | | | | |
| කොටස්කරුවන්ගේ අරමුදල් (මුළු හිමිකම්) | 119,051 | 98,843 | 20.44 | 127,868 | 106,835 | 19.69 |
| අනෙකුත් ගණුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු/ගණුදෙනුකරුවන්ගේ තැන්පතු | 1,608,490 | 1,556,271 | 3.36 | 1,608,892 | 1,556,682 | 3.35 |
| ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් – ණය සහ වෙනත් උපකරණ | 1,092,990 | 1,039,035 | 5.19 | 1,096,343 | 1,048,966 | 4.52 |
| ණය සහ ලැබිය යුතු දෑ | 550,828 | 532,379 | 3.47 | 550,639 | 527,715 | 4.34 |
| මුළු වත්කම් | 1,831,024 | 1,752,438 | 4.48 | 1,888,338 | 1,779,767 | 6.10 |
| **සාමාන්‍ය කොටස් මත තොරතුරු (රු.)** | | | | | | |
| ඉපයුම් (මූලික) | 29.06 | 17.15 | 69.46 | 29.96 | 18.61 | 60.96 |
| ශුද්ධ වත්කම් වටිනාකම | 126.65 | 105.15 | 20.44 | 136.03 | 113.65 | 19.69 |

| | 2025 | 2024 | වෙනස (bps) | 2025 | 2024 | වෙනස (bps) |
|---|---|---|---|---|---|---|
| **අනුපාතික** | | | | | | |
| ශුද්ධ පොලී ආන්තිකය (%) | 4.74 | 4.22 | 51 | 4.71 | 4.30 | 41 |
| පිරිවැයට ආදායම (%) | 34.30 | 38.35 | (406) | 48.28 | 50.07 | (179) |
| සාමාන්‍ය කොටස්කරුවන්ගේ අරමුදල් මත ප්‍රතිලාභ (ROE) (%)) | 25.08 | 17.89 | 718 | 24.00 | 17.98 | 602 |
| සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ (ROA) % | 2.48 | 1.53 | 96 | 2.51 | 1.62 | 88 |
| ඉපයීම් වල වර්ෂ අනුරූප වර්ධනය (%) | 69.46 | 123.41 | (5,395) | 60.96 | 81.94 | (2,098) |
| **වත්කම්වල ගුණාත්මකභාවය පිළිබඳ අනුපාත (%)** | | | | | | |
| ශුද්ධ අදියර 3 ණයවලට මුළු ණය | 2.53 | 5.18 | (265) | 2.53 | 5.23 | (270) |
| අදයිර 3 ආවරණ වෙන් කිරීම් | 58.56 | 44.50 | 1,406 | 60.01 | 45.98 | 1,403 |
| **ව්‍යවස්ථාපිත ද්‍රවශීල අනුපාතික (%)** | | | | | | |
| රුපියල් - අවම අවශ්‍යතාවය - 100% | 360.39 | 351.33 | 906 | N/A | N/A | – |
| සියළු මුදල් ඒකක - අවම අවශ්‍යතාවය - 100% | 349.15 | 344.55 | 460 | N/A | N/A | – |
| ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතිකය - අවම අවශ්‍යතාවය - 100% | 206.44 | 193.53 | 1,291 | N/A | N/A | – |
| **ව්‍යවස්ථාපිත ප්‍රාග්ධන අවශ්‍යතා - බාසල් III** | | | | | | |
| ස්ථර 1 – අවම අවශ්‍යතාවය (8.5%) | 24.90 | 23.42 | 148 | 27.27 | 26.69 | 58 |
| සමස්ත ප්‍රාග්ධනය – අවම අවශ්‍යතාවය (12.5%) | 26.83 | 25.88 | 94 | 29.07 | 29.06 | 1 |
| ද්‍රවශීලතා අනුපාතිකය – අවම අවශ්‍යතාවය (3%) | 9.34 | 8.00 | 134 | 9.48 | 8.85 | 63 |

## මූල්‍ය ඉලක්ක සහ කාර්යසාධනය – බැංකුව

| මූල්‍ය දර්ශකය | | කාර්යසාධනය | | | | |
|---|---|---|---|---|---|---|
| | අරමුණ | 2025 | 2024 | 2023 | 2022 | 2021 |
| ශුද්ධ පොලී ආන්තිකය (%) | 4.77 | 4.74 | 4.22 | 1.79 | 2.03 | 3.71 |
| සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ (ROA) % | 1.18 | 2.48 | 1.53 | 0.26 | 0.28 | 1.93 |
| සාමාන්‍ය කොටස්කරුවන්ගේ අරමුදල් මත ප්‍රතිලාභ (ROE) (%) | 19.54 | 25.08 | 17.89 | 9.36 | 3.40 | 33.92 |
| ආදායමේ වර්ධනය (%) | 7.89 | (2.35) | (10.53) | 32.97 | 29.34 | 5.80 |
| වර්ෂය සඳහා ලාභයේ වර්ධනය (බදු පසු ලාභය) (PAT) | 9.67 | 69.46 | 123.41 | 185.27 | (88.56) | 118.83 |
| සමස්ත වත්කම් වල වර්ධනය (%) | 11.58 | 4.48 | 3.88 | 4.35 | 2.38 | 15.79 |
| **ප්‍රාග්ධන අවශ්‍යතා – බාසල් III** | | | | | | |
| ස්ථර 1 – අවම අවශ්‍යතාවය (8.5%) | Over 8.5% | 24.90 | 23.42 | 16.91 | 15.78 | 18.60 |
| මුළු වත්කම් – අවම අවශ්‍යතාවය (12.5%) | Over 12.5% | 26.83 | 25.88 | 19.26 | 18.00 | 20.83 |

වගුව 1

# වැදගත් තොරතුරු

## 1 පාරිසරික

ශාඛාවක් සඳහා බලශක්ති පරිභෝජනය
ගිගාජූල් 134.4 (2024 – 125.5 ගිගාජූල්)

තෙවන පාර්ශවීය ජලය ඉවත් කිරීම
සත මීටර් 68,815 (2024 – සත මීටර් 62,744)

නිකුත් කරන ලද කඩදාසි ද්‍රව්‍ය (ඒකක)
900,741 (2024 – 685,343)

පුනර්ජනනීය බලශක්තිය වෙනුවෙන් ලබාදුන් ණය
රු. බිලියන 1.0 (2024 – රු. බිලියන 4.0)

පාරිසරික, සමාජීය සහ පාලන (ESG) අනුකූල ණය/ආයෝජන ප්‍රතිශතය
100% (2024 – 100%)

දේශගුණික ආතති පරීක්ෂාවන් (Climate stress testing) සිදු කිරීම
ඔව් (2024 – ඔව්)

## 2 සමාජීය

ලබාදුන් අභ්‍යාසලාභී අවස්ථාවන්
299 (2024 - 191)

First Home Owner පාරිභෝගිකයින්
89 (2024 - නැත)

First Home Owner පාරිභෝගිකයින් සඳහා ණය ලබාදීම
රු. මිලියන 351.5 (2024 - නැත)

විශ්‍රාමිකයන් වෙනුවෙන් ලබාදුන් ණය
රු. බිලියන 4.5 (2024 - රු. බිලියන 8.1)

තැන්පතු රක්ෂණ වාරිකය
රු. බිලියන 1.5 (2024 - රු. බිලියන 1.4)

බෝග රක්ෂණ බද්ද (ජාතික රක්ෂණ භාර අරමුදල)
රු. මිලියන 273 (2024 - රු. මිලියන 163)

වැඩිහිටි පුරවැසි තැන්පතුකරුවන්
253,944 (2024 - 196,998)

ඩිජිටල් පහසුකම් සහිත පාරිභෝගිකයින්
801,437 (2024 - 618,314)

දේශීය සැපයුම්කරුවන් වෙනුවෙන් වියදම් කළ ප්‍රතිශතය[LA]
100% (2024 - 100%)

නව බඳවා ගැනීම්
116 (2024 - 31)

## 3 පාලනය

බැංකුවේ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව
7 (2024 - 5)

පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව
15 (2024 - 13)

80%කට වඩා අධ්‍යක්ෂවරුන්ගේ සහභාගිත්වයෙන් යුත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ප්‍රතිශතය
100% (2024 - 100%)

නායකත්ව භූමිකාවන්හි කාන්තා නියෝජනය (සංඛ්‍යාව)
451 (2024 - 241)

මානව හිමිකම් උල්ලංඝනය කිරීම්
නැත (2024 - නැත)

දූෂණ සිදුවීම්[LA]
නැත (2024 - නැත)

සමාජ-ආර්ථික අනුකූල නොවීම් සම්බන්ධ අවස්ථා
නැත (2024 - නැත)

පාරිසරික අනුකූල නොවීම් සම්බන්ධ අවස්ථා
නැත (2024 - නැත)

ගෙවූ බදු
රු. බිලියන 30.1 (2024 - රු. බිලියන 19.5)

භාණ්ඩාගාරය වෙත ගෙවූ ලාභාංශ
රු. බිලියන 6 (2024 - නැත)

# සභාපතිතුමාගේ පණිවිඩය



**මූල්‍ය ශක්තිය සංවර්ධන අරමුණු සමඟ ඒකාබද්ධ කරන ප්‍රමුඛතම රජය සතු ඉතිරිකිරීමේ ආයතනය ලෙස අපගේ කාර්යසාධනය, අපගේ ආකෘතියේ පවතින සදාකාලික අදාළත්වය සනාථ කරයි.**

### වෙනස්වීම් සහ අභියෝගාත්මක කාලසීමාවන් හමුවේ නොසැලෙන නායකත්වය

2025 වසරේ කාර්යසාධනය පිළිබඳව නැවත හැරී බැලීමේදී, දශක පහකට වැඩි කාලයක් පුරා අපගේ ආයතනය හඳුනාගත් ඔරොත්තු දීමේ හැකියාව, අනුවර්තනය වීමේ ශක්තිය සහ මූල්‍ය විනය පිළිබඳ නොසැලෙන කැපවීම ජාතික ඉතිරිකිරීමේ බැංකුව නැවත වරක් ප්‍රදර්ශනය කර ඇත. දේශපාලනික සංක්‍රාන්තිය, ආර්ථික ප්‍රතිසංවිධානය සහ දිට්වා සුළි කුණාටුවෙන් ඇති වූ බාධාවන් මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්ෂේත්‍රයේ ස්ථාවරත්වයේ ප්‍රදීපාගාරයක් ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුව නොසැලෙන ස්ථාවරත්වයක් පෙන්නුම් කළේය. ප්‍රබල මූල්‍ය කාර්යසාධනයක් පවත්වා ගනිමින් සහ අපගේ ජාතික වගකීම ඉටු කරමින් මෙම බහුවිධ අභියෝග ජය ගැනීමට අපට ඇති හැකියාව, අපගේ ආයතනික පෞරුෂයේ ශක්තිය සහ මිලියන සංඛ්‍යාත ශ්‍රී ලාංකිකයන් අප කෙරෙහි තබා ඇති විශ්වාසය මැනවින් ඉස්මතු කරයි.

2025 වසර අපගේ මෙහෙයුම් හැකියාවන් පමණක් නොව අපගේ උපායමාර්ගික විසඳුමද පරීක්ෂාවට ලක් කළේය. විනයගරුක ක්‍රියාත්මක කිරීම, විචක්ෂණශීලී අවදානම් කළමනාකරණය, අපතේ යෑම් අවම කළමනාකරණය (Lean Management) සහ අපගේ මූලික අරමුණ කෙරෙහි දැක්වූ නොසැලෙන අවධානය තුළින්, අප වඩාත් ශක්තිමත් සහ වඩාත් ඔරොත්තු දෙන ආයතනයක් ලෙස ඉදිරි වසරේදී ජාතියට සේවය කිරීමට වඩා හොඳ මට්ටමකට පත්ව සිටිමු. අපගේ කාර්යසාධනය, මූල්‍ය ශක්තිය සංවර්ධන අරමුණු සමඟ ද, වාණිජ විනය සමාජ වගකීම සමඟ ද ඒකාබද්ධ කරන ප්‍රමුඛතම රජය සතු ඉතිරිකිරීමේ ආයතනය ලෙස අපගේ ආකෘතියේ පවතින සදාකාලික අදාළත්වය සනාථ කරයි.

### පරිවර්තනීය වසරක මෙහෙයුම

2025 වසරේදී ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ, උද්ධමනය පාලනය වීම සහ බාහිර අංශයේ වර්ධනය මගින් ශ්‍රී ලංකා ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ සලකුණු පෙන්නුම් කළේය. මෙම පසුබිම තුළ, පරීක්ෂාකාරී වත්කම් සහ වගකීම් කළමනාකරණය මගින් මධ්‍යස්ථ පොලී ආන්තිකයන් සහ සුපරීක්ෂාකාරී ලෙස ණය වර්ධනය කළමනාකරණය කරමින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව උපායමාර්ගික කඩිසරභාවයක් ප්‍රදර්ශනය කළේය.

2024 අග භාගයේ සිදු වූ රජයේ සංක්‍රාන්තියෙන් පසු, ජාතික ඉතිරිකිරීමේ බැංකුව ආයතනික මූල්‍ය ඒකාබද්ධතාවය, පාලන විනිවිදභාවය සහ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව ඇතුළු නව ජාතික ප්‍රතිපත්ති අවශ්‍යතා සමඟ ක්‍රියාශීලීව පෙළගැසුණු අතර, එහි ආයතනික ස්වාධීනත්වය සහ වාණිජ විනය ආරක්ෂා කර ගැනීමට ක්‍රියා කළේය. බැංකුව ඩිජිටල්කරණය වේගවත් කළ අතර දිගුකාලීන අරමුණු සඳහා බාධාවක් නොවන පරිදි මෙහෙයුම් කාර්යක්ෂමතාව වර්ධනය කළේය.

වසරේ අග භාගයේදී දිට්වා සුළි කුණාටුවෙන් සිදු වූ බාධා කිරීම් හමුවේ වුවද, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සේවා අඛණ්ඩතාවය සහතික කිරීම, පාරිභෝගික සහය සඳහා ප්‍රමුඛතාවය දීම සහ කාර්ය මණ්ඩලය ආරක්ෂා කිරීම මගින් කඩිනමින් ප්‍රතිචාර දැක්වීය. මෙම උත්සාහයන් කෙටි කාලීන මෙහෙයුම් පීඩනයන් ඇති කළද, එමගින් බැංකුවේ පොදු ජන වගකීම තහවුරු වූ අතර ප්‍රජා විශ්වාසය තවදුරටත් වර්ධනය විය.

### මූල්‍ය කාර්යසාධනය: උපායමාර්ගික මූල්‍ය විනය තුළින් ලද ශක්තිය

2025 වසරේ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ මූල්‍ය කාර්යසාධනය, අපගේ උපායමාර්ගික සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීමට සහ ආයතනික පදනමේ ශක්තිමත්භාවයට ලැබුණු මනා සාක්ෂියකි. මධ්‍යස්ථ පොලී අනුපාතික පවතින වටපිටාවක වුවද, විනයගරුක අවදානම් කළමනාකරණය සහ විචක්ෂණශීලී මූල්‍ය භාරකාරත්වය මගින් අපගේ සමබර වර්ධන ප්‍රවේශයේ සාර්ථකත්වය යළි තහවුරු කරමින්, ප්‍රබල සහ තිරසාර ප්‍රතිඵල අත්කර ගැනීමට අපට හැකි විය.

ජාතික ඉතිරිකිරීමේ බැංකු සමූහය 2025 මූල්‍ය වර්ෂය සඳහා රුපියල් බිලියන 59.2 ක මෙහෙයුම් ලාභයක් (සියළුම බදුවලට පෙර) වාර්තා කළ අතර, එය පෙර වසරේ වාර්තා වූ රුපියල් බිලියන 38.2 ට සාපේක්ෂව ප්‍රබල වර්ධනයකි. බදු පසු ලාභය (PAT) සියයට 61 කින් රුපියල් බිලියන 28.2 දක්වා ඉහළ ගිය අතර, එය අපගේ ප්‍රබල ලාභදායීත්වය සහ කාර්යක්ෂම ප්‍රාග්ධනය භාවිතා කිරීම ඉස්මතු කරයි.

මෙම කාර්යසාධනය ප්‍රධාන ප්‍රතිලාභ දර්ශක මගින් තවදුරටත් සනාථ වේ: වත්කම් මත ප්‍රතිලාභය (ROA) පෙර වසරේ පැවති 1.53% සිට 2.48% දක්වා ශක්තිමත් වූ අතර, හිමිකම් මත ප්‍රතිලාභය (ROE) 17.89% සිට 25.08% දක්වා වර්ධනය විය. මෙම ජයග්‍රහණයන් මගින් අපගේ එකම කොටස් හිමිකරුවා වන ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ඉහළ ප්‍රතිලාභ ලබා දීමට අප සතු වර්ධිත හැකියාව මැනවින් ප්‍රදර්ශනය වේ.

මෙම ජයග්‍රහණවල වටිනාකම වඩාත් ඉස්මතු වනුයේ, අපගේ ණය ප්‍රමිතීන් සම්බන්ධයෙන් කිසිදු සම්මුතියකට එළඹීමෙන් තොරව, වාණිජ විනය, පාලන විශිෂ්ටත්වය සහ නොසැලෙන ජාතික අරමුණ යන සියල්ල මනාව ඒකාබද්ධ වූ උපායමාර්ගික සැලැස්මක ප්‍රතිඵලයක් ලෙස මේවා අත්කරගෙන ඇති බැවිනි.

### ජාතික සංවර්ධනය සහ ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව සඳහා බැංකුවේ කාර්යභාරය

ශ්‍රී ලංකාවේ මූල්‍ය පරිසර පද්ධතිය තුළ ජාතික ඉතිරිකිරීමේ බැංකුව සාම්ප්‍රදායික බැංකුකරණයෙන් ඔබ්බට ගිය තිරණාත්මක කාර්යභාරයන් කිහිපයක් ඉටු කරමින් සුවිශේෂී සහ අද්විතීය ස්ථානයක් හිමිකර ගනී.

රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරන විශාලතම ආයතනික ආයෝජකයෙකු ලෙස, අපි රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කිරීමටත්, සාර්ව ආර්ථික කළමනාකරණයට සහාය වීමටත්, විශේෂයෙන් ආර්ථික පීඩනයන් පවතින කාල පරිච්ඡේදවලදී රජයේ ණය වෙළඳපොළට තිරණාත්මක සහයෝගයක් ලබා දීමටත් කටයුතු කරන්නෙමු. යටිතල පහසුකම් සංවර්ධනයෙහි නියැලී සිටින රාජ්‍ය ව්‍යවසායයන් වෙත ලබා දෙන ණය සහ අත්තිකාරම් මෙන්ම උපායමාර්ගික ආයෝජන හරහා, ආර්ථික පුනරුදයට සහ දිගුකාලීන නිෂ්පාදන ධාරිතාවට අපි සෘජුවම දායක වන්නෙමු.

තැපැල් ජාලයෙන් තවදුරටත් ශක්තිමත් වූ අපගේ දිවයින පුරා විහිදුණු පුළුල් ශාඛා ජාලය මගින්, සියලුම කලාපවල සහ ආදායම් මට්ටම්වල වෙසෙන පුරවැසියන් සඳහා රජයේ ඇපකරය සහිත සුරක්ෂිත ඉතිරිකිරීමේ අවස්ථා සලසා දෙමින් ගැඹුරු මූල්‍ය අන්තර්ග්‍රහණයක් සහතික කරයි. මෙම සංවර්ධන භූමිකාවට අමතරව, තැන්පත්කරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරන අතරම රජයේ මූල්‍ය ශක්තිමත් කරමින්, අපගේ එකම කොටස් හිමිකරුවා වන ශ්‍රී ලංකා රජය වෙත සෘජු රාජ්‍ය මූල්‍ය දායකත්වයක් ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් සපයනු ලබයි.

සමාලෝචිත වසර තුළ, ජාතික මූල්‍ය සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේහි සුවිශේෂී දායකත්වය අපගේ නොසැලෙන මූල්‍ය වගකීම පිළිබිඹු කළේය. බැංකුව ජාතික ආර්ථිකය සඳහා බදු වශයෙන් රුපියල් බිලියන 30.1 ක මුළු දායකත්වයක් ලබා දුන් අතර, මීට මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද (VAT) රුපියල් බිලියන 11.3 ක්, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) රුපියල් බිලියන 1.6 ක් සහ ආදායම් බදු වියදම් රුපියල් බිලියන 17.2 ක් ඇතුළත් විය. ප්‍රකාශිත ලාභාංශ රුපියල් බිලියන 6.1 ක් සහ තැන්පතු රක්ෂණ සහ බෝග සහන බද්ද සඳහා රුපියල් බිලියන 1.8 ක් ද ඇතුළුව, රජය වෙත බැංකුවේ මුළු දායකත්වය රුපියල් බිලියන 39 ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව සියයට 74 ක කැපී පෙනෙන වර්ධනයකි.

## සභාපතිතුමාගේ පණිවිඩය

සංවර්ධන මූල්‍ය ආයතනයක් මෙන්ම ලාභ ලබන, ලාභාංශ ගෙවන ව්‍යවසායයක් ලෙස මෙම ද්විත්ව දායකත්වය, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේහි සදාකාලික වටිනාකම් පිරිනැමීම අර්ථ දක්වන සමබර ප්‍රවේශය නිදර්ශනය කරයි.

### ඩිජිටල් විශිෂ්ටත්වය සහ පාරිභෝගික අත්දැකීම් ප්‍රවර්ධනය

අපගේ ඩිජිටල් පරිවර්තන ගමන 2025 වසරේදී සැලකිය යුතු ගම්‍යතාවක් අත්කර ගත් අතර, එය දශක පහකට වැඩි කාලයක් පුරා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේහි හඳුනාගත් විශ්වාසය සහ ප්‍රවේශය සමඟ තාක්ෂණික විචක්ෂණභාවය ඒකාබද්ධ කරන අනාගතයට සූදානම් ආයතනයක් ගොඩනැගීමට අපගේ කැපවීම පිළිබිඹු කරයි.

වැඩිදියුණු කළ පරිශීලක අතුරුමුහුණත්, සරල කළ පාරිභෝගික ඇතුළත් කරගැනීමේ ක්‍රියාවලීන් සහ පුළුල් කරන ලද ස්වයං-සේවා හැකියාවන් ලබා දීම සඳහා අපි ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ජංගම සහ අන්තර්ජාල බැංකුකරණ වේදිකාවල වර්ධනයන් වේගවත් කළෙමු. මෙම ඩිජිටල් ආයෝජන දිටිවා සුළි කුණාටුව පවතින අවස්ථාවකදී අතිශයින් වටිනා බව ඔප්පු වූ අතර, එහිදී බලපෑමට ලක් වූ ප්‍රදේශවල මූලික සේවා සැපයුම් යාන්ත්‍රණය බවට ඩිජිටල් මාධ්‍යයන් පත් විය.

අපගේ අබණ්ඩ කාර්යසාධනය, ශක්තිමත් සන්නාම මූලධර්ම සහ තරඟකාරී මූල්‍ය සේවා ක්ෂේත්‍රය තුළ වර්ධනය වන අදාළත්වය අගයමින්, Brand Finance ආයතනය විසින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව ශ්‍රී ලංකාවේ පස්වන වටිනාම සන්නාමය ලෙස ශ්‍රේණිගත කරන ලද අතර, එය හත්වන ස්ථානයේ සිට ලැබූ දියුණුවකි. එය සමඟම අපගේ සන්නාම ශ්‍රේණිගත කිරීම AA+ දක්වා ඉහළ නංවා ඇත. මෙම ජයග්‍රහණය අපගේ මූල්‍ය ශක්තිය පමණක් නොව, එහි ඉතිරිකිරීමේ වගකීමට අවංකව සිටිමින් නවීන, නව්‍ය ආයතනයක් ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුව ලබා ගන්නා වර්ධනය වන පිළිගැනීම ද පිළිබිඹු කරයි.

2025 වසරේ සුවිශේෂී සන්ධිස්ථානයක් වූයේ කොළඹ 07, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවතේ අංක 23 දරන ස්ථානයේ පිහිටි ජාතික ඉතිරිකිරීමේ බැංකුවේහි සුවිශේෂී ප්‍රමුඛ බැංකු ශාඛාව වන "The Premμer" විවෘත කිරීමයි. "The Premier" මගින් වර්ධනය වන පාරිභෝගික අපේක්ෂාවන් මුදුන්පමුණුවාලීම සඳහා අපගේ කැපවීම සහ අපගේ සියලුදෙනා ඇතුළත් කරගන්නා ප්‍රවේශය අත් නොහරිමින් ඉහළ ශුද්ධ වටිනාකමක් සහිත පාරිභෝගිකයන් සඳහා වන අපගේ වටිනාකම් පිරිනැමීම ශක්තිමත් කිරීම සඳහා වන කැපවීම නියෝජනය කරයි.

### තිරසාර ප්‍රතිපත්ති සහ ESG මූලධර්ම අන්තර්ගත කිරීම

තිරසාරත්වය සහ ESG (පරිසරය, සමාජය සහ පාලනය) සැලකිල්ලට ගැනීම් අන්තර්ගත කිරීමේ ප්‍රගතිය 2025 වසරේදී සැලකිය යුතු ගම්‍යතාවක් අත්කර ගත් අතර, එහිදී ජාතික ඉතිරිකිරීමේ බැංකුව පරිසරය, සමාජය සහ පාලන මූලධර්ම අපගේ ව්‍යාපාර උපාය මාර්ගය, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සහ මෙහෙයුම් තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළට තවදුරටත් අන්තර්ගත කළේය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ තිරසාර මූල්‍ය මාර්ග සිතියමට (Sustaμnable Finance Roadmap) අනුව අප තිරසාර මූල්‍ය වැඩපිළිවෙළ ඉදිරියට ගෙන ගිය අතර, සහනදායී නිවාස, පුනර්ජනනීය බලශක්ති මූල්‍යකරණය සහ සමාජීය වශයෙන් අන්තර්ග්‍රහණය වූ මූල්‍ය නිෂ්පාදන සඳහා ප්‍රවේශය පුළුල් කළෙමු. අතිශයින් අඩු පොලී අනුප්‍රාතයන් යටතේ ක්‍රියාත්මක වන "1st Homeowner" නිවාස ණය යෝජනා ක්‍රමය සහ "Rividhanavi" සූර්ය බලශක්ති ණය යෝජනා ක්‍රමය වැනි ක්‍රමයන් මගින්, අපගේ සංවර්ධන භූමිකාව ශක්තිමත් කරන අතරම දිගුකාලීන සමාජ ස්ථාවරත්වය, දේශගුණික ක්‍රියාමාර්ග සහ සම්පූර්ණ ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීමට අපට ඇති කැපවීම පිළිබිඹු වේ.

මීට සමාන්තරව, තිරසාරත්වයට සහ දේශගුණික මූල්‍ය අවදානම් සහ අවස්ථා හඳුනා ගැනීම, ඇගයීම, කළමනාකරණය සහ හෙළිදරව් කිරීමට අවශ්‍ය මූලික පාලනය, ක්‍රියාවලීන් සහ දත්ත රාමු ස්ථාපනය කරමින් SLFRS S1 සහ SLFRS S2 ප්‍රමිතීන් වෙනුවෙන් සංක්‍රාන්ති වීම අප ආරම්භ කළෙමු. මෙම ගමනාන්තය ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ESG රාමුව (ESG Framework) තුළ සිදුකරනු ලබන අතර, එමගින් උපාය මාර්ග සෑදීම, ණය තීරණ ගැනීම, ව්‍යවසාය අවදානම් කළමනාකරණය සහ කොටස්කරුවන් සමඟ සම්බන්ධ වීමේදී තිරසාර සැලකිල්ලට ගැනීම් අන්තර්ගත කිරීම සඳහා ව්‍යුහගත ප්‍රවේශයක් සලසා දෙයි.

නිවාස සහ අත්‍යවශ්‍ය ප්‍රජා යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය සඳහා ඉලක්ක කරගත් මූල්‍ය පිරිනැමීමක් ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් "Ditwah Relief" නිවාස ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී. තවද, කෙටි කාලීන බාධාවන් දිගු කාලීන මූල්‍ය බැහැර කිරීමක් බවට පරිවර්තනය නොවන බව සහතික කරමින්, ආපසු ගෙවීමේ හැකියාව තාවකාලිකව අඩාල වූ ගනුදෙනුකරුවන්ට සහන සහ ප්‍රතිව්‍යුහගත කිරීමේ විසඳුම් ද අපි ලබා දුන්නෙමු.

මෙම ක්‍රියාමාර්ග මගින් ප්‍රාග්ධනය යොදා ගැනීම ජාතික සංවර්ධන ප්‍රමුඛතාවන් සමඟ පෙළගැස්වීමට අපට ඇති හැකියාව වර්ධනය වේ. එය විනිවිදභාවය සහ වගවීම ශක්තිමත් කරන අතර වර්තමානයේ විකාශනය වන ආර්ථික, නීතිමය සහ දේශගුණික අභියෝගයන් හමුවේ දිගුකාලීන ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමට සහාය වේ. එමගින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව ශ්‍රී ලංකාව සඳහා තිරසාර වටිනාකම් නිර්මාණය කිරීමට කැපවූ, වගකීම් සහගත සහ අනාගතයට පෙර ප්‍රතිචාර දක්වන ඉතිරිකිරීමේ බැංකුවක් ලෙස ප්‍රතිස්ථාපනය වේ.

### පාලනය සහ අවදානම් අධීක්ෂණය ශක්තිමත් කිරීම

2025 වසරේදී බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය, අනු-කමිටු මගින් වර්ධිත අධීක්ෂණයක් සහිතව බැංකු පාලනය තවදුරටත් ශක්තිමත් කළේය. එහිදී ඒකාබද්ධ අවදානම් කළමනාකරණය, විගණන කාර්යක්ෂමතාව, තාක්ෂණික පාලනය, දේශගුණික අවදානම්, මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව සහ සයිබර් ආරක්ෂාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කළේය.

බැංකු පාලනය, පාරිභෝගික ආරක්ෂාව, දේශගුණික හෙළිදරව් කිරීම් සහ සයිබර් ඔරොත්තු දීමේ හැකියාව කෙරෙහි වැඩි බරක් තබමින් නියාමන වටපිටාව විකාශනය වන විට ජාතික ඉතිරිකිරීමේ බැංකුව එහි අනුකූලතා ක්‍රියාමාර්ග, අවදානම් පාලනය සහ පාලන පද්ධතීන් බලගැන්වීම මගින් ක්‍රියාශීලීව ප්‍රතිචාර දැක්විය. පද්ධතිමය වශයෙන් වැදගත් රාජ්‍ය බැංකුවක් ලෙස, අපි තිරසාර මූල්‍ය, මූල්‍ය ඇතුළත් කිරීම සහ පද්ධතිමය ස්ථාවරත්වය පිළිබඳ නියාමන ආයතන සමඟ ඵලදායී ලෙස සම්බන්ධ වී සිටිමු.

පාරිභෝගික දත්ත ආරක්ෂා කිරීම සහ විශ්වාසය පවත්වා ගැනීම සඳහා වැඩිදියුණු කළ ආරක්ෂක යටිතල පහසුකම්, වැඩිදියුණු කළ අධීක්ෂණය, සිදුවීම් ප්‍රතිචාර වැඩිදියුණු කිරීම සහ පුළුල් කාර්ය මණ්ඩල දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සැලකිය යුතු ආයෝජන සමඟ සයිබර් ආරක්ෂාව උපායමාර්ගික ප්‍රමුඛතාවයක් ලෙස පැවතුනි.

### කෘත්‍රිම බුද්ධිය (AI) උපායමාර්ගික ක්‍රියාකාරකයක් ලෙස හඳුනා ගැනීම

ජාතික ඉතිරිකිරීමේ බැංකුව කෘත්‍රිම බුද්ධිය (AI) තනි විසඳුමක් ලෙස නොව උපායමාර්ගික බලගැන්වීමක් ලෙස හඳුනා ගනී. දත්ත විශ්ලේෂණය, වංචා හඳුනා ගැනීම, පාරිභෝගික සේවා ප්‍රශස්ත කිරීම සහ අවදානම් කළමනාකරණය සඳහා AI, භාවිතා කිරීමට ඇති අවස්ථා අප හඳුනාගෙන ඇත. මෙම ක්‍රියාමාර්ග, පාලන ක්‍රියාවලිය, දත්ත වගකීම, ආචාරාත්මක භාවිතය සහ නියාමන අනුකූලතාවය කෙරෙහි පරීක්ෂාකාරී වශයෙන් අවධානය යොමු කරමින් ඉදිරියට ගෙන යනු ලබයි.

අපගේ ප්‍රවේශය සැලසුම් සහගතව පියවරෙන් පියවර සහ අවදානම් පිළිබඳව දැනුවත්ව සිදු වන්නකි. එමගින් පාරිභෝගික සම්බන්ධතා වල මූලික පදනම වන විශ්වාසය සහ ආරක්ෂාව ආරක්ෂා කර ගන්නා අතරම AI, ප්‍රයෝජන මගින් සෘජු වටිනාකම් ලබා දීම සහතික කරයි. මෙම හැකියාවන් වර්ධනය කරන විට, අප කැපවී සිටිනුයේ තාක්ෂණය මිනිසා වෙනුවෙන් සේවය කළ යුතු බවට මිස, මිනිසා තාක්ෂණය වෙනුවෙන් නොවන බව සහතික කිරීම සඳහා ය.

### අපගේ ප්‍රජාව: ඔරොත්තු දීමේ හැකියාවේ පදනම

2025 වසරේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව ලබා ගත් සාර්ථකත්වය අපගේ කාර්ය මණ්ඩලයේ කැපවීම, ප්‍රවීණතාව සහ ඔරොත්තු දීමේ හැකියාව සමඟ නොබිඳිය හැකි වශයෙන් බැඳී පවතී. අප අත්කර ගත් සෑම සන්ධිස්ථානයක්ම සාක්ෂාත් වූයේ අපගේ විශිෂ්ට කණ්ඩායමේ නොපසුබට උත්සාහය මගිනි. විශිෂ්ටත්වය වෙනුවෙන් වූ කැපවීම, අනුකූලතාව සහ පාරිභෝගික කේන්ද්‍රීය ප්‍රවේශය මගින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව හඳුන්වා දෙනු ලබන වටිනාකම් මැනවින් නියෝජනය වේ.

## සභාපතිතුමාගේ පණිවිඩය

දිවිවා සුළි කුණාටුවෙන් එල්ල වූ අභියෝග මධ්‍යයේ වුවද, අපගේ ප්‍රගතියේ කොඳු නාරටිය වූ සහ අඛණ්ඩ සේවා සැපයීම සහතික කළ, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ දිවයින පුරා සිටින කාර්ය මණ්ඩලයට මගේ විශේෂ කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. ඔවුන්ගේ ඔරොත්තු දීමේ හැකියාව, වෘත්තීයභාවය සහ ස්ථිර කැපවීම අපගේ ප්‍රගතියේ කොඳු නාරටිය විය. පීඩිත කාලසීමාවන්හිදී සංවේදීව සහ කාර්යක්ෂමව පාරිභෝගිකයන්ට සහ ප්‍රජාවට සේවය කිරීමට ඔවුන් සතු හැකියාව මගින්, කිසිදු තාක්ෂණයකට ආදේශ කළ නොහැකි මිනිස් ස්වභාවය පිළිබිඹු වේ.

අවදානම් කළමනාකරණය, ඩිජිටල් බැංකුකරණය, භාණ්ඩාගාරය, අනුකූලතාවය සහ ශාඛා කළමනාකරණය යන අංශවල ව්‍යුහගත ඉගෙනුම් මාර්ග හරහා කුසලතා සංවර්ධනය සඳහා අපි අඛණ්ඩව ආයෝජනය කළෙමු. ඉහළ හැකියාවන් සහිත කාර්ය මණ්ඩලය සඳහා වූ විශේෂිත අනුප්‍රාප්තික සැලසුම් සහ නායකත්ව සංවර්ධන වැඩසටහන් මගින් බැංකුවේ මීළඟ පරම්පරාවේ නායකයින් ගොඩනැගීම සහතික කෙරේ. තොරතුරු තාක්ෂණය, සයිබර් ආරක්ෂාව සහ අවදානම් කළමනාකරණය වැනි තීරණාත්මක කුසලතා අංශ සඳහා ඉලක්කගත රඳවා ගැනීමේ පියවරයන්, කුසලතා සඳහා ඇති දැඩි තරඟකාරිත්වය සහ මෙම හැකියාවන්හි උපායමාර්ගික වැදගත්කම හඳුනා ගනී.

අපගේ මෙහෙයුම් නවීකරණය කරමින් සහ තාක්ෂණික දියුණුව වැළඳ ගනිමින්, දශක ගණනාවක් තිස්සේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව නිර්වචනය කර ඇති මානව කේන්ද්‍රීය සංස්කෘතිය ආරක්ෂා කිරීම සඳහා අපි නොසැලී සිටිමු. අන්‍යෝන්‍ය ගෞරවය, සහයෝගිතාවය සහ නවෝත්පාදනය තුළ මුල් බැසගත් මෙම සංස්කෘතිය, අපගේ කාර්ය සාධනය මෙහෙයවනවා පමණක් නොව, අපගේ කණ්ඩායම් තුළ විශ්වාසය සහ මිත්‍රත්වය ශක්තිමත් කරයි.

### ඉදිරි දැක්ම: 2026 සහ ඉන් ඔබ්බට වූ උපායමාර්ගික ප්‍රමුඛතාවයන්

අපි 2026 සහ ඉන් ඔබ්බට බලන විට, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේහි උපායමාර්ගික ප්‍රමුඛතා අඛණ්ඩතාව සහ පරිණාමය යන දෙකම පිළිබිඹු කරයි. මූලික පද්ධතීන් තවදුරටත් නවීකරණය කිරීම, ඩිජිටල් ස්වයං-සේවා හැකියාවන් පුළුල් කිරීම සහ පෞද්ගලික මට්ටමේ පිරිනැමීම් සහ ව්‍යාපාරික තීරණ ගැනීම වැඩිදියුණු කිරීම සඳහා දත්ත සහ විශ්ලේෂණ ක්‍රියාවලීන් බලගැන්වීම මගින් අපගේ ඩිජිටල් පරිවර්තනය අප තවදුරටත් ගැඹුරු කරන්නෙමු. මෙම ආයෝජන මගින් මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කරන අතරම පාරිභෝගික අත්දැකීම් ද වැඩිදියුණු කරනු ඇත.

අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම ප්‍රධානතම කාර්යය වශයෙන් පවතින අතර, එහිදී ණය ප්‍රතිලේඛන (Underwriting) ක්‍රියාවලිය තවදුරටත් සංශෝධනය කිරීම, දේශගුණික අවදානම් විශ්ලේෂණය පුළුල් කිරීම සහ මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව සහ සයිබර් ආරක්ෂාව වර්ධනය කිරීම කෙරෙහි අපගේ අවධානය යොමු වනු ඇත. 2025 වසරේදී, විශේෂයෙන්ම දිවිවා සුළි කුණාටුවෙන් ලැබූ ප්‍රායෝගික පාඩම්, අනාගත අභියෝගයන් හමුවේ නොසැලී සිටිය හැකි ආයතනික ධාරිතාවන් ගොඩනැගීම සඳහා අපගේ ඉලක්කයන් ප්‍රශස්ත කර ඇත.

පුනර්ජනනීය බලශක්ති සහ ඔරොත්තු දීමේ හැකියාව සහිත ව්‍යාපෘති සඳහා ණය පිරිනැමීම් පුළුල් කිරීම, දේශගුණික සැලකිල්ලට ගැනීම් අවදානම් කළමනාකරණයට ගැඹුරින් අන්තර්ගත කිරීම සහ SLFRS S1 සහ SLFRS S2 ඇතුළු නව හෙළිදරව් ප්‍රමිතීන් සමඟ ක්‍රමානුකූලව පෙළගැස්වීම මගින් තිරසාරත්වය සහ හරිත මූල්‍යකරණය ප්‍රවර්ධනය කිරීම අපගේ උපාය මාර්ගයේ මධ්‍යස්ථ කරුණක් වනු ඇත.

අවසාන වශයෙන්, මානව හැකියාව සහ සංස්කෘතිය වර්ධනය කිරීම මගින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අනාගතයට මෙහෙයවීමට සූදානම් වූ, ඉහළ කාර්යසාධනයක් සහිත, ඩිජිටල් සාක්ෂරතාවයෙන් හෙබි සහ අවදානම් පිළිබඳව දැනුවත් කාර්ය මණ්ඩලයක් අප ගොඩනගන්නෙමු. අපගේ ප්‍රජාව හුදු සේවකයින් පමණක් නොව ඔවුන් වර්තමාන උරුමයේ භාරකරුවන් සහ හෙට දවසේ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේහි නිර්මාණකරුවන් වනු ඇත.

### කෘතඥතාව සහ වගකීම පිළිබඳ පණිවිඩයක්


ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ගමනාන්තය සැමවිටම විශ්වාසය, නව්‍යකරණය සහ ජාතිය වෙනුවෙන් කරනු ලබන සේවය මත පදනම් වූ සහයෝගිතාවයේ සහ ප්‍රගතියේ ප්‍රතිඵලයකි. 2025 වර්ෂය පිළිබඳව මෙනෙහි කරන විට, අපගේ සාර්ථකත්වය සඳහා දායක වූ සෑම අයෙකුටම මාගේ කෘතඥතාව පිරිනැමීමට මම කැමැත්තෙමි.

අභියෝගාත්මක වර්ෂයක් තුළ ලබා දුන් අමිල උපාය මාර්ගික මඟපෙන්වීම සහ අධීක්ෂණය වෙනුවෙන් බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාගේ හෘදයාංගම කෘතඥතාව ප්‍රකාශ කර සිටිමි. පසුගිය වර්ෂ දෙක පුරා බැංකුවේ සාර්ථකත්වය වෙනුවෙන් කළ විශිෂ්ට නායකත්වය, ඉදිරි දැක්ම සහිත ඉලක්කයන් සහ නොසැලෙන කැපවීම වෙනුවෙන් 2026 ජනවාරි 09 වැනි දින සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී ධුරයෙන් විශ්‍රාම ලැබූ ශෂී කණ්ඩම්බි මහත්මිය වෙත මාගේ හෘදයාංගම ස්තුතිය හිමි වේ. එමෙන්ම වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී ධුරයේ කටයුතු භාරගත් රෝහණ බණ්ඩාර වීරකෝන් මහතාව මම සාදරයෙන් පිළිගන්නා අතර, ආයතනය පුරා මෙහෙයුම් විශිෂ්ටත්වය මෙහෙයවීමට ඔවුන් කරනු ලබන කැපවීම සහ නොපසුබට උත්සාහය වෙනුවෙන් ආයතනික කළමනාකරණ කණ්ඩායමට ද මාගේ කෘතඥතාව පිරිනමමි.

අපගේ වටිනා ගනුදෙනුකරුවන්ගේ අඛණ්ඩ පක්ෂපාතිත්වය සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව කෙරෙහි ඔවුන් තබන විශ්වාසය වෙනුවෙන් මම ඔවුන්ට බෙහෙවින් කෘතඥ වෙමි. ඔබගේ විශ්වාසනීයත්වය අපගේ ඉහළම වගකීම මෙන්ම අපගේ ශක්තිමත්ම වත්කම ද වන්නේ ය. අපගේ ගෞරවනීය කොටස් හිමිකරුවා වන ශ්‍රී ලංකා රජය වෙත, ජාතිය සඳහා වටිනාකම් නිර්මාණය කරන විනයගරුක සහ වගකීම් සහගත ප්‍රවේශය සඳහා අපට සහාය වූ විශ්වාසනීයත්වය සහ හාරකාරත්වය වෙනුවෙන් මාගේ අගය කිරීම හිමි වේ. අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු මුදල් අමාත්‍යතුමාටත්, එතුමාගේ දූරදර්ශී නායකත්වය සහ ස්ථිර සහයෝගය වෙනුවෙනුත්, ගරු අග්‍රාමාත්‍යතුමිය සහ නියෝජ්‍ය මුදල් අමාත්‍යතුමාගේ දිරිගැන්වීම සහ මග පෙන්වීම වෙනුවෙන් අපගේ අවංක කෘතඥතාව පළ කරමි. බැංකු මෙහෙයුම් වලදී දෙන ලද නිරන්තර උපදෙස් සහ සහයෝගිතාවය සඳහා භාණ්ඩාගාර ලේකම්තුමාටත්, විචක්ෂණ නියාමන අධීක්ෂණය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමාටත් මාගේ අගය කිරීම පිරිනමමි.

අවසාන වශයෙන්, ජනාධිපති ලේකම්, නීතිපති සහ විගණකාධිපති ඇතුළු අදාළ රාජ්‍ය ආයතනවල නිලධාරීන් විසින් ලබා දෙන ලද අමිල සහයෝගය සහ මග පෙන්වීම, බැංකුවට අඛණ්ඩතාව, විනිවිදභාවය සහ අරමුණ සමඟ තම වරම ඉටු කිරීමට හැකිවීම සඳහා ඔවුන්ගේ දායකත්වය උපකාරී වී ඇති බව මම කෘතඥතාවයෙන් යුතුව සිහිපත් කරමි.

අප ඉදිරියට ගමන් කරන විට, ජාතික ඉතිරිකිරීමේ බැංකුව පොදු ජන ඉතිරි කිරීම් ආරක්ෂා කිරීමටත්, ජාතික පුනරුදයට සහාය වීමටත් සහ වේගයෙන් වෙනස් වන මූල්‍ය පරිසරයට වගකීම් සහගතව අනුකූල වීමටත් කැපවී සිටින්නේ ය. ඔරොත්තු දීමේ හැකියාව, වගවීම සහ නව්‍යකරණය අපගේ මඟපෙන්වන ප්‍රතිපත්ති ලෙස තබා ගනිමින් අප නිරවද්‍යතාවයෙන් සහ අරමුණක් සහිතව ජාතියට සේවය කරන්නෙමු. අප එක්ව කළමනාකරණය කරනු ලබන්නේ හුදු බැංකුවක් පමණක් නොව, සෑම ශ්‍රී ලාංකිකයෙකුටම අයිති වූ සහ අප සියල්ලන් අපේක්ෂා කරන ජාතිය ගොඩනැගීමට දායක වන ආයතනයකි.



**ජනාධිපති නීතිඥ හර්ෂ කබ්‍රාල්**

සභාපති

2026 පෙබරවාරි 06

# සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය



සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය

**දිගුකාලීන ඉලක්කයන් සමඟ සමබර වෙමින් අප දක්වන ප්‍රතිචාරශීලීත්වය මගින්, ආයතනික වගකීම ආරක්ෂා කරමින් රජය වෙත ස්ථාවර සහයෝගීතාවයක් සැපයීමට අපට ඇති කැපවීම පිළිබිඹු වේ.**

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ගමන් මගෙහි තීරණාත්මක සන්ධිස්ථානයකදී, වැඩබලන සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන විධායක නිලධාරී ධුරයට පිවිසෙමින්, 2025 වර්ෂය සඳහා වූ මෙම සමාලෝචනය ඉදිරිපත් කරනුයේ ගැඹුරු වගකීමක් සහ නිහතමානී හැඟීමකින් යුතුව ය. 2026 ජනවාරි 09 වැනි දින විශ්‍රාම ලැබීමත් සමඟ සේවා කාලය නිමා වූ මගේ පූර්වගාමියා වූ ශෂී කණ්ඩම්බි මහත්මියගෙග් විශිෂ්ට නායකත්වය යටතේ, ගෙවීගිය වර්ෂය කැපී පෙනෙන ජයග්‍රහණයන් සහිත කාල පරිච්ඡේදයක් නියෝජනය කරයි. ඇය විසින් ස්ථාපනය කරන ලද ශක්තිමත් පදනම මත බැංකුවේ ඉදිරි ගමන මෙහෙයවීමට සහ මෙම ප්‍රෞඩ ආයතනය මෙහෙයවීමට ලැබීම මා ලැබූ ගෞරවයකි.

## අභියෝගාත්මක වසරක ඔරොත්තු දීමේ හැකියාව, අනුවර්තනය සහ ප්‍රගතිය

දැඩි ආර්ථික ආතතියෙන් පසු ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමඟ, නැවත ක්‍රමාංකනය කිරීමේ සහ ප්‍රවේශම් සහගත ශුභවාදී කාලපරිච්ඡේදයක් සනිටුහන් කළ වසරකි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගීතාව සහිත ප්‍රතිසංස්කරණ මගින් ලැබූ ශක්තිය, උද්ධමනකාරී පීඩනයන් ලිහිල් කිරීම සහ බාහිර අංශයේ කාර්ය සාධනය වර්ධනය වීම මගින් සාර්ව ආර්ථික පරිසරය යහපත් අතට පත්වීම පිළිබිඹු විය. අඩු පොලී අනුපාත ණය ගැතියන්ට සහනයක් ලබා දුන්නද, දිගුකාලීන තැන්පතු කළඹ කළමනාකරණය කරන ආයතනවලට ඒවා අභියෝග එල්ල කළේය. ජාතික ඉතිරිකිරීමේ බැංකුව මෙම අභියෝග සඳහා ක්‍රියාශීලී මූල්‍ය කළමනාකරණය, ඵලදායී අවදානම්-ගැලපුම් වත්කම් වෙන් කිරීම සහ තිරසාර මෙහෙයුම් කාර්යක්ෂමතාව තුළින් මෙම අභියෝගවලට විනය හා දූරදර්ශීභාවයෙන් මුහුණ දුන්නේය.

රජය වෙනස් වීමත් සමඟ මූල්‍ය ඒකාබද්ධතාවය සහ රජය සතු ව්‍යවසායයන්ගේ වගවීම කෙරෙහි නව අවධානයක් යොමු විය. උපායමාර්ගික ස්වාධීනත්වය සහ වාණිජ විනය පවත්වාගෙන යන අතරම බැංකු පාලන පාරදෘශ්‍යභාවය ශක්තිමත් කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සහ ඩිජිටල් පරිවර්තන ක්‍රියාවලිය වේගවත් කිරීම මගින් අපි ඒ සඳහා ප්‍රතිචාර දැක්වීය. අපගේ දිගුකාලීන ඉලක්කයන් සමඟ සමබර වෙමින් අප දක්වන මෙම ප්‍රතිචාරශීලීත්වය මගින්, ආයතනික වගකීම ආරක්ෂා කරමින් රජය වෙත ස්ථාවර සහයෝගීතාවයක් සැපයීමට අපට ඇති කැපවීම පිළිබිඹු වේ.

වර්ෂයේ අවසාන කොටස සඳහා දිවිවා සුළි කුණාටුව ප්‍රබල බලපෑමක් එල්ල කළ අතර, එය කලාප කිහිපයක ආර්ථික ක්‍රියාකාරකම් ව්‍යාකුල කළේය. බලපෑමට ලක් වූ ප්‍රදේශවල, අපි ඉලක්කගත සහන පියවර, ණය ප්‍රතිව්‍යුහගත කිරීම් සහ ප්‍රතිසාධන සහාය හඳුන්වා දුන් අතර, ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් කිරීම සහ දේශගුණික අවදානම් තක්සේරුව ඇතුළුව මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව කෙරෙහි අපගේ අවධානය තීව්‍ර කළෙමු. මෙම ව්‍යසනය පවතින විට බැංකු ශාඛා වෙත ප්‍රවේශ වීම සීමා සහිත වූ අවස්ථාවලදී, විශේෂයෙන්ම ඩිජිටල් මාධ්‍යයන් හරහා සේවා අඛණ්ඩතාව පවත්වාගෙන යාමට අපට ඇති හැකියාව මගින්, තාක්ෂණික යටිතල පහසුකම් සහ මෙහෙයුම් සූදානම සඳහා වර්ෂ ගණනාවක් පුරා කළ ආයෝජන වල ප්‍රතිඵල ප්‍රත්‍යක්ෂ විය.

## මූල්‍ය කාර්යසාධනය: උපායමාර්ගික විනය මගින් ලැබූ ශක්තිය

2025 වර්ෂයේදී, විකාශනය වන ආර්ථික ගතිකයන් මධ්‍යයේ උපාය මාර්ගිකව අනුකූල වීමටත්, මෙහෙයුම් විනය පවත්වාගෙන යාමටත් ආදායම් මාර්ග ප්‍රශස්ත කිරීමට අපට ඇති හැකියාව සලකුණු කරමින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව විශිෂ්ට කාර්යසාධනයක් සිද්ධ කළේය. ණය සහන ප්‍රතිපත්ති සහ පොලී වියදම් විනයගරුකව කළමනාකරණය කිරීම හේතුවෙන්, අභියෝගාත්මක පොලී අනුපාතයන් මධ්‍යයේ වුවද පොලී වියදම 14% කින් පහත වැටුනු අතර, ශුද්ධ පොලී ආදායම රු. බිලියන 84.8 දක්වා 17% කින් වර්ධනය විය. මෙම කාර්යසාධනය මගින් අපගේ භාණ්ඩාගාර මෙහෙයුම් වල විචක්ෂණභාවය සහ ස්වෛරී ආරක්ෂාව මත පදනම් වූ තැන්පතු සන්නාමයේ ස්ථාවරත්වය නියෝජනය කරයි.

බදු පෙර ලාභය (PBT) 69% කින් ඉහළ ගොස් රු. බිලියන 44.5 ක් වූ අතර, බදු පසු ලාභය (PAT) රු. බිලියන 27.3 ක් විය. වත්කම් මත ප්‍රතිලාභය (ROA) 2.5% දක්වාත්, කොටස් හිමිකම් මත ප්‍රතිලාභය (ROE) 25.1% දක්වාත් වැඩිදියුණු වූ අතර, එය ශක්තිමත් ලාභදායීත්වය සහ කාර්යක්ෂම ප්‍රාග්ධන ප්‍රයෝජනය පිළිබඳව පෙන්නුම් කරයි. කොටසක් සඳහා ඉපයීම පසුගිය වර්ෂයේ රු. 17.15 සිට රු. 29.06 දක්වා ඉහළ ගියේ ය.

ප්‍රධාන කැපී පෙනෙන සිදුවීමක් වූයේ වත්කම් ගුණාත්මකත්වයේ කැපී පෙනෙන වර්ධනයක් සිද්ධ වීමයි. එහිදී ණය හානිකරණී ප්‍රතිපාදන (impairment charges) 2024 වර්ෂයේ වූ රු. බිලියන 11.5 සිට රු. බිලියන 1.6 දක්වා කැපී පෙනෙන වශයෙන් අඩු විය. අදියර 3 (Stage 3) ණය අනුපාතය 5.2% සිට 2.5% දක්වා වර්ධනය වූ අතර, අදියර 3 (Stage 3) ප්‍රතිපාදන ආවරණ අනුපාතය 58.6% දක්වා ශක්තිමත් විය. මෙම වර්ධනය මගින් ශක්තිමත් කළ ණය නිරීක්ෂණය, බෙලිඅත්ත ප්‍රදේශයේ ස්ථාපනය කළ අපගේ නව ණය අය කර ගැනීමේ මධ්‍යස්ථානය ඇතුළු ක්‍රියාශීලී ණය අය කර ගැනීමේ ක්‍රියාමාර්ග සහ ආර්ථිකය ස්ථාවර වීමත් සමඟ ණය ගැනුම්කරුවන්ගේ ප්‍රතිගෙවීම් හැකියාව වර්ධනය වීම පිළිබිඹු වේ.

අපගේ ප්‍රාග්ධන ස්ථාවරත්වය අතිශයින්ම ශක්තිමත්ව පවතී. මූළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය 26.8% ක් සහ ස්ථර 1 (Tier 1) ප්‍රාග්ධනය 24.9% ක් වූ අතර, එය නියාමන අවම ප්‍රමාණයන් ඉක්මවා යෑමකි. ද්‍රවශීලතා මිනුම් ද එලෙසම ශක්තිමත් වූ අතර, ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR) 349.2% ක් සහ ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (NSFR) 206.4% ක් විය. බැංකුවේ AAA ණය ශ්‍රේණිගත කිරීම අඛණ්ඩව පවත්වාගෙන යාම මගින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේහි මූල්‍ය ශක්තිය සහ රජය බලගැන්වූ ව්‍යාපාරික ආකෘතිය කෙරෙහි වෙළඳපොළ විශ්වාසනීයත්වය තවදුරටත් ස්ථාපනය විය. වැඩි විස්තර සඳහා පිටු 90 සිට 108 දක්වා වූ මූල්‍ය ප්‍රාග්ධන කොටස බලන්න.

## අංශමය කාර්යසාධනය: වර්ධනයේ විවිධාංගීකරණය වූ පදනම

පාරිභෝගික බැංකුකරණ අංශය, ආයතනික බැංකුකරණය, භාණ්ඩාගාර මෙහෙයුම් සහ ජාත්‍යන්තර බැංකුකරණය යන ක්ෂේත්‍රයන් පුරා විහිදුණු අපගේ විවිධාංගීකරණය වූ ව්‍යාපාරික ආකෘතිය, ආර්ථික චක්‍රයන් හමුවේ ඔරොත්තු දීමේ හැකියාව සලසා දෙන අතර, ක්ෂේත්‍ර ගණනාවක් පුරා වර්ධන අවස්ථා හඳුනා ගැනීමට ආධාරක වේ.

### පාරිභෝගික (Retail Banking) බැංකුකරණ අංශය

පාරිභෝගික බැංකුකරණ අංශය අපගේ මෙහෙයුම් වල දෙවැනි විශාලතම දායකත්වය සපයන ක්ෂේත්‍රය වන අතර, රු. බිලියන 25.3 ක බදු පෙර ලාභයක් සහ රු. බිලියන 441.6 ක සමස්ත වත්කම් ප්‍රමාණයක් සහිතව බැංකුවේ ලාභදායීත්වයට විශාලතම ප්‍රතිශතයක් දායක කරයි. පරිභෝජනය මූල් කරගත් ණය ගැනීමේ ප්‍රවණතාවය මන්දගාමී වුවද, අපගේ රන් භාණ්ඩ උකස් මෙහෙයුම් වල ඔරොත්තු දීමේ හැකියාව මත පදනම්ව ණය කළඹ ස්ථාවර වර්ධනයක් පවත්වාගෙන ගියේය. එමෙන්ම සමස්ත පාරිභෝගික තැන්පතු ප්‍රමාණය රු. බිලියන 1,575.4 දක්වා ඉහළ ගොස් ඇති අතර, එය ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සන්නාමය කෙරෙහි මහජනයා තබා ඇති විශ්වාසය තහවුරු කරයි. කාඩ් සහ ඩිජිටල් බැංකු සේවා වල සේවා ගාස්තු ආදායම යහපත් වර්ධනයක් වාර්තා කළ අතර, එය වේගවත් ඩිජිටල් අනුකූලතාවය සහ අපගේ නවීකරණය කළ අන්තර්ජාල වේදිකා කෙරෙහි පාරිභෝගිකයන් දක්වන රුචිය පිළිබිඹු කරයි.

## සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය

### ආයතනික (Corporate) බැංකුකරණ අංශය

අපගේ ආයතනික බැංකුකරණ ක්ෂේත්‍රය රු. බිලියන 166.1 ක සමස්ත වත්කම් ප්‍රමාණයක් කළමනාකරණය කරමින් සහ රු. බිලියන 5.3 ක බදු පෙර ලාභයක් සපයමින් උපාය මාර්ගිකව දායක විය. රජයට සම්බන්ධ සහ විශාල ආයතනික නිරාවරණයන්ට සෘජු ණය දීමත් සමඟ, කළඹ උසස් තත්ත්වයේ ණයකරවල සංකේන්ද්‍රණය වී තිබුණි. පරීක්ෂාකාරීව ගොඩනගා ගත් උපාය මාර්ගික සහයෝගිතාවයන් මගින්, ජාතික ආර්ථික සංවර්ධනය සහ යටිතල පහසුකම් වර්ධනය මෙහෙයවන සමස්ත සංවර්ධන ව්‍යාපෘති සඳහා මූල්‍ය සම්පාදනය කිරීම පිළිබිඹු විය.

### භාණ්ඩාගාර (Treasury) මෙහෙයුම්

භාණ්ඩාගාර මෙහෙයුම් 2025 වර්ෂයේදී ඉහළ විචක්ෂණභාවයක් පෙන්නුම් කළ අතර, රු. බිලියන 1,036.1 ක බැංකුවේ විශාලතම වත්කම් ප්‍රමාණයක් කළමනාකරණය කරමින් (ප්‍රධාන වශයෙන් රජයේ සුරකුම්පත්වල) රු. බිලියන 26.3 ක ඉහළම බදු පෙර ලාභය ලැබීය. මෙම ක්ෂේත්‍රය රු. බිලියන 124.3 ක සැලකිය යුතු පොලී ආදායමක් උත්පාදනය කළ අතර, ආයතනයේ ප්‍රධාන අභ්‍යන්තර අරමුදල් මධ්‍යස්ථානය ලෙස ක්‍රියා කරමින් බැංකුවේ ණය ක්‍රියාකාරකම් සඳහා අතිරික්ත ද්‍රවශීලතාවය කාර්යක්ෂමව ප්‍රතිචක්‍රීකරණය කරමින් සහ ජාතියේ ඉතුරුම් ප්‍රශස්ත ලෙස යෙදවීම සහතික කළේය.

### ජාත්‍යන්තර බැංකුකරණය

ජාත්‍යන්තර බැංකුකරණ අංශය රු. බිලියන 24.2 ක සමස්ත වත්කම් සහ රු. මිලියන 501 ක බදු පෙර ලාභයක් සහිතව ස්ථාවර කාර්ය සාධනයක් පවත්වාගෙන ගියේය. එහිදී අප්‍රකාශිත ප්‍රාග්ධන අවදානම් කළමනාකරණ උපාය මාර්ග ප්‍රයෝජනයට ගනිමින් වෙළඳපොළ අස්ථාවරත්වයන් කළමනාකරණය කළේය. නේවාසික නොවන තැන්පතු කළඹ රු. බිලියන 33.1 ක මට්ටමක පැවති අතර, බැංකු වල විදේශ මුදල් තැන්පතු රු. බිලියන 24.2 ක මට්ටමක පැවතුණි.

> බැංකුවේ අංශ කාර්ය සාධනය පිළිබඳ ගැඹුරු සහ වඩාත් පුළුල් විශ්ලේෂනයක් ව්‍යාපාර අංශමය සමාලෝචන අංශය යටතේ පිටු 80 සිට 89 දක්වා විහිදෙන අතර, එක් එක් ප්‍රධාන කොටස සපයන දායකත්වයන් සහ උපාය මාර්ග පිළිබඳ වටිනා අවබෝධයක් ලබා දෙයි.

### ඩිජිටල් පරිවර්තනය: අනාගතයට සූදානම් ආයතනයක් ගොඩනැගීම

මූලික බැංකු යටිතල පහසුකම් නවීකරණය කිරීම සහ පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් අපගේ ඩිජිටල් ගමනාන්තයේ අප සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගත්තෙමු. අපගේ ඩිජිටල් පරිවර්තනය හුදෙක් තාක්ෂණය පිළිබඳව පමණක් නොව, එය ඔරොත්තු දීමේ හැකියාව, ප්‍රවේශය සහ දිගුකාලීන තරඟකාරීත්වය ගොඩනැගීම පිළිබඳව වන්නකි.

NSBPay ජංගම සහ අන්තර්ජාල බැංකු වේදිකා වල වැඩිදියුණු කිරීම් අප වේගවත් කළ අතර, වර්ධනය වූ අතුරු මුහුණත් (interfaces), සරල පාරිභෝගික ලියාපදිංචි කිරීම් (Onboarding) සහ පුළුල් කළ ස්වයං-සේවා (Self-service) විශේෂාංග සපයන ලදී. අපගේ කාඩ් සහ බිල් ගෙවීම් (e-payment) හැකියාවන් පුළුල් කිරීම මගින් පාරිභෝගිකයන්ට ප්‍රායෝගික ප්‍රයෝජන සලසන අතරම සේවා සපයන වියදම ද අඩු කළේය.

තාක්ෂණය මගින් මෙහෙයවන ගතික පරිසරය සඳහා අවශ්‍ය උසස් විශ්ලේෂණ (Analytics) සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය බලගැන්වීමට අපගේ දත්ත වැනුහය සහ වාර්තාකරණ වේදිකා (Reporting platforms) ශක්තිමත් කළෙමු. අපගේ මූලික බැංකු පද්ධතිය වන Temenos T24 වෙනුවෙන් කළ ආයෝජන සහ Cisco සහයෝගීතාවයෙන් SD-WAN තාක්ෂණය ක්‍රියාත්මක කිරීම මගින් ශාඛා ජාලය පුරා සම්බන්ධතාවය සහ ඩිජිටල් විශ්වාසනීයත්වය වර්ධනය විය.

මෙම ආයෝජන වල උපාය මාර්ගික වටිනාකම දිට්වා සුළි කුණාටු කාලසීමාවේදී ප්‍රත්‍යක්ෂ වූ අතර, එහිදී බලපෑමට ලක් වූ ප්‍රදේශ වල ප්‍රධාන සේවා සපයන යාන්ත්‍රණය බවට ඩිජිටල් මාර්ග පත් විය. ඉහළ ගනුදෙනු ප්‍රමාණයක් සහ සේවා අබණ්ඩතාව වැඩිදියුණු වීම මගින් තහවුරු වූයේ, ඩිජිටල්කරණය යනු හුදෙක් සාමාන්‍ය කාලසීමාවන්හි පහසුව සඳහා පමණක් නොව, ව්‍යසන කාලසීමාවන්හිදී ඔරොත්තු දීමේ හැකියාව සහ ප්‍රවේශය සඳහා බලපාන මූලික සාධකයක් බවයි.

### ආරක්ෂාව, අනුකූලතාව සහ අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීම

2025 වසර පුරා සයිබර් ආරක්ෂණය සහ දත්ත සුරැකීම උපායමාර්ගික ප්‍රමුඛතාවන් විය. වඩ වඩාත් සංකීර්ණ වන තර්ජනකාරී පරිසරයක් තුළ, පාරිභෝගික දත්ත සුරක්ෂිත කිරීම සහ විශ්වාසය පවත්වා ගැනීම සාකච්ඡාවට භාජනය නොකළ යුතු අත්‍යවශ්‍ය කරුණු වේ.

මීළඟ පරම්පරාවේ ෆයර්වෝල් (Next-generation firewalls), වැඩිදියුණු කළ අන්ත ලක්ෂ්‍ය ආරක්ෂණය (Enhanced endpoint protection) සහ ආරක්ෂක තොරතුරු සහ සිදුවීම් කළමනාකරණය (SIEM) මෙන්ම ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථාන (SOC) හැකියාවන් හරහා නිරීක්ෂණ කටයුතු දියුණු කරමින්, අපි අපගේ ආරක්ෂක යටිතල පහසුකම් සැලකිය යුතු ලෙස යාවත්කාලීන කළෙමු. අපගේ උසස් ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානය (Advanced SOC) මඟින් පැය 24 පුරාම නිරීක්ෂණ කටයුතු සහ තර්ජන පිළිබඳ බුද්ධි තොරතුරු ලබා දෙන අතර, එමඟින් මතුවන තර්ජන කඩිනමින් හඳුනා ගැනීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමට හැකියාව ලැබේ.

තීරණාත්මක සන්නිවේදන මාර්ග හරහා බහු-සාධක සහතික කිරීමේ (Multi-factor authentication) ක්‍රමවේදය හඳුන්වා දුන් අතර, සංකේතන ප්‍රමිතීන් (Encryptιon standards) තවදුරටත් ශක්තිමත් කරන ලදී. බහු-සාධක සත්‍යාපනය තීරණාත්මක බහු-සාධක සත්‍යාපනය තීරණාත්මක නාලිකා හරහා ක්‍රියාත්මක කරන ලද අතර, සංකේතාංකන ප්‍රමිතීන් තවදුරටත් ශක්තිමත් කරන ලදී. විකාශනය වන නියාමන ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කරමින්, පුද්ගලික දත්ත ආරක්ෂණ පනතේ (PDP) අවශ්‍යතාවලට අනුකූලව විස්තීර්ණ දත්ත වර්ගීකරණ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කරන ලදී.

වැඩිදියුණු කළ පාරිභෝගික නිසි විමර්ශන ක්‍රියාවලීන් (Customer due diligence), දියුණු කළ ගනුදෙනු නිරීක්ෂණය සහ ශක්තිමත් කළ සම්බාධක පරීක්ෂාව හරහා අපි අපගේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මූල්‍ය පහසුකම් සැපයීමට එරෙහි වීමේ (AML CEFT) රාමුව තවදුරටත් ඉහළ නැංවූවෙමු. බැංකුව පුරා පවත්වනු ලබන ඉලක්කගත පුහුණු වැඩසටහන්වල සභාය ඇතිව, පැහැදිලි සන්නිවේදන මාර්ග සහිත ශක්තිමත් පාලන සහ වාර්තාකරණ යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කරන ලදී.

සාර්ව ආර්ථික කම්පන සහ දේශගුණික විපර්යාස ආශ්‍රිත කාලගුණික සිදුවීම් ඇතුළත් කරමින්, වැඩිදියුණු කළ ආතති පරීක්ෂණ (Stress testing) හරහා අපගේ අවදානම් කළමනාකරණ රාමුව ශක්තිමත් කරන ලදී. බැසල් III (Basel III) ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි අපගේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය ඇගයීමේ ක්‍රියාවලිය (ICAAP) සහ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමු අපි තවදුරටත් සංවර්ධනය කළෙමු. මෙහෙයුම් අවදානම් සහ ව්‍යාපාර අබණ්ඩතා රාමු ශක්තිමත් කිරීම මඟින් බාධාවන් සඳහා කඩිනම් සහ කාර්යක්ෂම ප්‍රතිචාර සහතික කළ අතර දිට්වා සුළි කුණාටුවෙන් උගත් පාඩම් ද අපගේ සැලසුම් සහගත උපකල්පනවලට ඇතුළත් කර ගන්නා ලදී.

### පාරිභෝගික කේන්ද්‍රීය නවෝත්පාදනය සහ සේවා විශිෂ්ටත්වය

පාරිභෝගික කේන්ද්‍රීයභාවය අපගේ උපායමාර්ගික දැක්මේ මූලික පදනම ලෙස තවදුරටත් පැවතිණි. සෑම පියවරක්ම, සෑම ආයෝජනයක්ම සහ සෑම තීරණයක්ම පාරිභෝගික වටිනාකම පදනම් කරගනිමින් ඇගයීමට ලක් කෙරේ.

කැපවූ සම්බන්ධතා කළමනාකරණය සහ උසස් සේවා ප්‍රමිතීන් හරහා උසස් සහ ඉහළ පුද්ගලාරෝපිත බැංකුකරණයක් ලබා දෙන, කොළඹ 7, සර් අර්නස්ට් ද සිල්වා මාවතේ අංක 23 දරන ස්ථානයේ පිහිටි අපගේ සුවිශේෂී ප්‍රමුඛ බැංකු ශාඛාව වන "ද ප්‍රිමියර්" දියත් කිරීම සුවිශේෂී සන්ධිස්ථානයක් විය. මෙම මුලපිරීම, අපගේ ඇතුළත්, ප්‍රවේශ විය හැකි ප්‍රවේශය අත් නොහරිමින්, පාරිභෝගික අපේක්ෂාවන් සමඟ

## සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය

පරිණාමය වීමට සහ ඉහළ ශුද්ධ වටිනාකමක් ඇති පුද්ගලයින් සඳහා අපගේ වටිනාකම් යෝජනාව ශක්තිමත් කිරීමට අපගේ කැපවීම නියෝජනය කරයි. තවද, තෝරාගත් ශාඛා කිහිපයක සති අන්ත බැංකු සේවාවන් අපි නැවත හඳුන්වා දුන් අතර, පාරිභෝගික සේවාවන්ට බාධාවකින් තොරව ප්‍රවේශ වීමේ පහසුව වැඩිදියුණු කිරීම සඳහා ශාඛා කිහිපයක උපායමාර්ගික වැඩිදියුණු කිරීම් ද සිදු කළෙමු.

විධිමත් ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයන් සහ අබණ්ඩව නිරීක්ෂණය කළ හැකි (End-to-end tracking) වැඩිදියුණු කළ පැමිණිලි කළමනාකරණ පද්ධතියක් හරහා, පාරිභෝගික අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවූ අතර විසඳුම් ලබා දීමේ කාලය අවම කළෙමු. අපගේ සේවා ගුණාත්මකභාවය පිළිබඳ පුනුණු වැඩසටහන් මඟින් සෑම සේවා මධ්‍යස්ථානයකදීම ස්ථාවර සහ ගුණාත්මක සේවාවක් සැපයීම සහතික කරන ලදී.

නිෂ්පාදන නවෝත්පාදනයන් සැමවිටම අවධානය යොමු කළේ පාරිභෝගිකයාගේ විවිධ ජීවන අවධීන්හි අවශ්‍යතා සපුරාලීම කෙරෙහි ය. "පළමු නිවාස හිමියා" නිවාස ණය යෝජනා ක්‍රමය මඟින් පළමු වරට දේපළ මිලදී ගන්නන් සඳහා දැරිය හැකි මූල්‍යකරණයක් සඳහා ප්‍රවේශය පුළුල් කරන ලදී. දිට්වා සුළි කුණාටුවෙන් පසුව, බලපෑමට ලක් වූ කණ්ඩායම්වලට සැලකිය යුතු මූල්‍ය ආධාර සැපයීම සඳහා අපි "දිට්වා සහන" නිවාස ණය යෝජනා ක්‍රමය හඳුන්වා දුන්නෙමු. අපගේ ජ්‍යෙෂ්ඨ පාරිභෝගික ප්‍රජාවගේ ගෞරවය, සෞඛ්‍යය සහ ස්වාධීනත්වය සහතික කිරීම සඳහා, ඔවුන්ගේ සුවිශේෂී මූල්‍ය සැලසුම් අවශ්‍යතාවලට ගැලපෙන පරිදි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වන විශේෂ ස්ථාවර තැන්පතු යෝජනා ක්‍රමය අපි පහසුකම් සැලසුවෙමු.

සංස්කෘතික හා ආගමික උත්සව වලදී ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය බර ලිහිල් කිරීම සඳහා අපි "උත්සව අත්තිකාරම්" පුද්ගලික ණය යෝජනා ක්‍රමය ප්‍රවර්ධනය කළෙමු. NSB ආරම්භය සනිටුහන් කිරීම සඳහා අපගේ විශේෂ මූලපිරීම වන "NSB සෙනෙහසේ දායාද" ව්‍යාපාරය, 2025 මාර්තු 16 සිට 2025 මාර්තු 31 දක්වා උපත ලබන ළදරුවන් සඳහා ළමා ඉතුරුම් ගිණුම් විවෘත කිරීමට පහසුකම් සපයන ලද අතර, එමඟින් මුල් කාලීන ඉතුරුම් සංස්කෘතියක් පෝෂණය විය.

මෙම ක්‍රියාමාර්ග මඟින් පාරිභෝගික අවශ්‍යතා පිළිබඳ අප සතු ගැඹුරු අවබෝධය සහ ඔවුන්ගේ මූල්‍ය ගමන් මග පුරා විශ්වාසවන්ත සහකරුවෙකු වීමට අප සතු කැපවීම මැනවින් පිළිබිඹු වේ.

## උපායමාර්ගික හවුල්කාරිත්වයන් සහ තිරසාර මූල්‍යකරණය

මූල්‍ය අන්තර්ග්‍රහණය (Financial μinclusion) පිළිබඳ අපගේ වගකීම තහවුරු කරමින්, ග්‍රාමීය සහ අර්ධ නාගරික ප්‍රදේශවල සේවා මධ්‍යස්ථාන ව්‍යාප්ත කිරීම සඳහා තැපැල් සහ රජයේ ආයතන සමඟ පවතින සහයෝගීතාවන් අපි තවදුරටත් ඉදිරියට ගෙන ගියෙමු. ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව සමඟ පවතින හවුල්කාරිත්වය හරහා තැපැල් කාර්යාල සහ උප තැපැල් කාර්යාල 4,002 කට අධික සංඛ්‍යාවක් මඟින් බැංකු සේවා සැපයීමට හැකි වී ඇති අතර, එය බැංකු පහසුකම් අවම ප්‍රජාවන් වෙත ළඟා වීමේදී අප සතු බලවත්ම සුවිශේෂී සාධකයකි.

වසර තුළ ඇති කරගත් උපායමාර්ගික හවුල්කාරිත්ව මාලාවක් මඟින් ඩිජිටල්, දේපළ සහ ප්‍රේෂණ අංශ හරහා බැංකුවේ වටිනාකම් ප්‍රස්තාවන් (value proposition) තවදුරටත් ඉහළ නැංවීය. තාක්ෂණය සහ ගෙවීම් සපයන්නන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමෙන්, අපි අපගේ විද්‍යුත් වාණිජ්‍යය සහ කාඩ්පත් ලබා ගැනීමේ හැකියාවන් ශක්තිමත් කළෙමු. ඒ සමඟම, ජෝන් කීල්ස් ප්‍රොපර්ටීස් ජා-ඇල (පුද්ගලික) සමාගම වැනි දේපළ සංවර්ධකයින් සහ මැදපෙරදිග, කොරියාව සහ යුරෝපය පුරා විහිදුණු විදේශ විනිමය හුවමාරු ආයතන සමඟ ඇති කරගත් ගිවිසුම් මඟින් දේශීය දේපළ වෙළඳපොළ සහ ජාත්‍යන්තර ප්‍රේෂණ ක්ෂේත්‍රය තුළ අපගේ ස්ථාවරය ශක්තිමත් කර ඇත. මෙම මූලපිරීම් හරහා ගනුදෙනු පරිමාවන් ඉහළ නැංවීමට, වෙළඳපොළ ආවරණය පුළුල් කිරීමට සහ නව ගාස්තු මත පදනම් වූ ආදායම් මාර්ග උත්පාදනය කිරීමට සාර්ථකව හැකි වී තිබේ.

ණය අනුමත කිරීම් පාලනය කිරීම සඳහා ශක්තිමත් කරන ලද පාරිසරික හා සමාජීය කළමනාකරණ රාමුවක් (ESM framework) හරහා බැංකුවේ මෙහෙයුම් පද්ධතියට පාරිසරික, සමාජීය සහ පාලන (ESG) මූලධර්ම ඒකාබද්ධ කිරීම තහවුරු කර ඇත. මෙම ප්‍රබල රාමුව හරහා අපගේ හරිත සහ දේශගුණයට අනුකූල ණය කළඹ (Green and climate-aligned lending portfolio) පුළුල් කිරීමට මග පෑදුණු අතර, පුනර්ජනනීය බලශක්තිය, බලශක්ති කාර්යක්ෂම නිවාස සහ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සඳහා වැඩි ප්‍රාග්ධනයක් යෙදවීමට හැකි විය. පාරිසරික තිරසාරත්වය සහ ඇතුළත් කරගන්නා වර්ධනය යන ද්විත්ව අරමුණු සඳහා 2025 වසරේදී ක්‍රියාත්මක කළ සුවිශේෂී ව්‍යාපෘති දෙකක් උදාහරණ ලෙස දැක්විය හැකිය: එනම්, ශ්‍රී ලංකාවේ අඩු විමෝචන තාප විදුලි ජනනය වෙත සංක්‍රමණය වීමේ තීරණාත්මක පියවරක් වන සොභාධනවි (Sobhadhanavi) ව්‍යාපෘතිය සඳහා මූල්‍ය පහසුකම් සැපයීම සහ "1st Homeowner" නිවාස ණය යෝජනා ක්‍රමයයි. සොබාදනවි ව්‍යාපෘතිය සඳහා 2025 වසරේ ලබා දුන් මුළු මූල්‍ය නිදහස් කිරීම් රුපියල් බිලියන 1ක් විය.

දේශගුණයට අදාළ අවදානම් සාධක, බැංකුවේ අවදානම් රුචිය (Risk appetite) ප්‍රකාශයන්ට, ආතති පරීක්ෂණ (Stress testing) සහ කළඹ නිරීක්ෂණ කටයුතු සඳහා ක්‍රමානුකූලව ඇතුළත් කරන ලදී. තිරසාරභාවයට සහ දේශගුණයට අදාළ මූල්‍ය අවදානම් සහ අවස්ථාවන් හඳුනා ගැනීමට, ඇගයීමට, කළමනාකරණය කිරීමට සහ අනාවරණය කිරීමට අවශ්‍ය මූලික පාලන ක්‍රමවේද, ක්‍රියාවලීන් සහ දත්ත රාමු ස්ථාපිත කරමින් ශ්‍රී ලංකා තිරසාර අනාවරණ ප්‍රමිතීන් (SLFRS S1 සහ SLFRS S2) අනුගමනය කිරීම සඳහා වන සංක්‍රමණික ක්‍රියාවලිය අපි ආරම්භ කළෙමු.

## අපගේ කාර්ය මණ්ඩලය සවිබල ගැන්වීම සහ මෙහෙයුම් විශිෂ්ටත්වය

2025 වසරේදී ජාතික ඉතිරිකිරීමේ බැංකුව ලබාගත් සාර්ථකත්වය, අපගේ සේවක මණ්ඩලයේ කැපවීම, ප්‍රවීණත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව සමඟ අවිච්ඡේද්‍ය ලෙස බැඳී පවතී. අප ලබාගත් සෑම සන්ධිස්ථානයක්ම සාක්ෂාත් කර ගැනීමට හැකි වූයේ අපගේ විශිෂ්ට කණ්ඩායමේ නොපසුබට උත්සාහය නිසාය.

අවදානම් කළමනාකරණය, ඩිජිටල් බැංකුකරණය, මූල්‍ය කළමනාකරණය, අනුකූලතාව සහ ශාඛා මෙහෙයුම් ඇතුළු තීරණාත්මක ක්ෂේත්‍ර හරහා විධිමත් ඉගෙනුම් මාර්ග ක්‍රියාත්මක කරමින්, මානව ප්‍රාග්ධනය සඳහා ආයෝජනය කිරීම මූලික ප්‍රමුඛතාවයක් ලෙස පැවතිණි. කෘතිම බුද්ධිය (AI), සයිබර් ආරක්ෂණය සහ දත්ත විශ්ලේෂණය (Data analytics) වැනි අනාගතයට ගැළපෙන කුසලතාවලින් අපගේ සේවකයින් සන්නද්ධ කිරීම සඳහා ඉලක්කගත නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර, එමඟින් විකාශනය වන මූල්‍ය ක්ෂේත්‍රය තුළ කඩිනමින් හැඩගැසිය හැකි සේවක පිරිසක් සහතික කරන ලදී.

ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs), පාරිභෝගික ප්‍රතිඵල සහ අවදානම් සංස්කෘතිය කෙරෙහි වැඩි අවධාරණයක් යොමු කරමින් කාර්යසාධන කළමනාකරණ රාමු පිරිපහදු කරන ලද අතර, වැඩිදියුණු කළ සුවතා වැඩසටහන් මඟින් අන්‍යෝන්‍ය සහයෝගීතාවය, නවෝත්පාදනය සහ සියල්ලන් ඇතුළත් කරගන්නා වටපිටාවක් නිර්මාණය කරන ලදී. දක්ෂතාවලට අතහිත දීම සහ කුසලතා අගය කිරීම පිළිබඳ අපගේ කැපවීම පිළිබිඹු කරමින්, වසර තුළ සේවකයින් 353 දෙනෙකුට උසස්වීම් ලබා දෙන ලදී. එය ව්‍යාත්තීය වර්ධනය උදෙසා බැංකුවේ ඇති කැපවීමට සහ අපගේ සේවකයින්ගේ උපරිම විභවය සපුරා ගැනීමට ඔවුන් සවිබල ගැන්වීමට කදිම සාක්ෂියකි. දීර්ඝකාලීන සේවා ඇගයීම් සම්මාන උළෙල, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අනන්‍යතාවයේ පදනම වන සේවකයින්ගේ පක්ෂපාතිත්වය සහ කැපවීම ඇගයීමට ලක් කරමින්, බැංකුව සතු ගැඹුරු ආයතනික කැපවීම තහවුරු කළේය.

සැලසුම් සහගත ක්‍රියාවලි ප්‍රශස්තකරණය හරහා මෙහෙයුම් විශිෂ්ටත්වය ඉදිරියට ගෙන යන ලදී. පාරිභෝගික සේවා කාලය (Turnaround times) අවම කිරීම සඳහා ශාඛා මට්ටමේ වැඩ ප්‍රවාහයන් විධිමත් කළ අතර, කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා පසු කාර්යාල (Backoffice) කටයුතු මධ්‍යගත කරන ලදී. තවද, අතින් සිදුකළ සංසන්දන ක්‍රියාවලීන් (Manual reconciliation) ක්‍රමයෙන් ස්වයංක්‍රියකරණය හරහා විධිමත් කෙරිණි. ලේඛන කළමනාකරණ පද්ධතිය (Document Management System) ප්‍රතිස්ථාපනය කිරීම මඟින් සැකසුම් හැකියාවන් තවදුරටත් වර්ධනය වූ අතර, එමඟින් කඩිනම් සේවාවක් සහ අවම මිනිස් මැදිහත්වීමක් සහතික විය. බැංකුවේ දිගුකාලීන වටිනාකම් උත්පාදනයට පදනම වන තාක්ෂණය, අවදානම් කළමනාකරණය සහ දක්ෂතා සංවර්ධනය සඳහා වන ආයෝජනයන් සුරක්ෂිත කරමින්, අත්‍යවශ්‍ය නොවන අංශයන්හි පිරිවැය විනය ඉතා ප්‍රවේශමෙන් පවත්වා ගන්නා ලදී.

## සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය

### ජාතික ප්‍රතිසංස්කරණ කටයුතු උදෙසා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ භූමිකාව

දිට්වා සුළි කුණාටුවෙන් පසුව ශ්‍රී ලංකාව යළි ගොඩනැඟීමේ කටයුතු සඳහා සක්‍රීයව දායක වීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුවට පැවරී ඇති බලතල මෙන්ම වගකීමක් ද ඇත. එම සුළි කුණාටුව හමුවේ අප දැක්වූ ප්‍රතිචාරය මඟින් අපගේ පොදු ජන වරම ප්‍රායෝගික ක්‍රියාමාර්ග බවට පරිවර්තනය කරන ආකාරය මැනවින් නිරූපණය වේ.

අපි දිට්වා සහන නිවාස ණය යෝජනා ක්‍රමය හරහා ඉලක්කගත ප්‍රතිසංස්කරණ මූල්‍ය පහසුකම් ලබා දුන් අතර, පීඩාවට පත් ප්‍රජාවන් වෙත සැලකිය යුතු මූල්‍ය ආධාර පිරිනැමුවෙමු. ණය ආපසු ගෙවීමේ හැකියාව තාවකාලිකව අඩාල වූ පාරිභෝගිකයින් සඳහා, කෙටිකාලීන බාධාවන් හේතුවෙන් ඔවුන් දීර්ඝකාලීනව මූල්‍ය පද්ධතියෙන් බැහැර නොවන බව සහතික කරමින් සහන කාලසීමාවන් සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ විසඳුම් ලබා දුන්නෙමු. භෞතිකව ශාඛා වෙත ප්‍රවේශ වීමට බාධා පැවති අවස්ථාවලදී ඩිජිටල් සන්නිවේදන මාර්ග හරහා සේවාවන්හි අඛණ්ඩතාව පවත්වා ගත් අතර, ප්‍රදේශයේ යථා තත්ත්වයට පත් කිරීමේ කටයුතු සඳහා සහය වීමට අපගේ කාර්ය මණ්ඩලය සෘජුවම බලපෑමට ලක් වූ ප්‍රදේශ වෙත යොමු කරන ලදී.

රාජ්‍ය-පෞද්ගලික සහයෝගිතාවය ජාතික යටිතල පහසුකම් සංවර්ධනයට සහ යථා තත්ත්වයට පත් කිරීමේ කටයුතුවලට සහාය වන උපායමාර්ගික බලවේගයක් වනු ඇත. ශ්‍රී ලංකාවේ තිරසාර සහ සියල්ලන් ඇතුළත් කරගන්නා ආර්ථික ප්‍රගතිය සඳහා දායක වීමට රජයේ ආයතන සහ ආයතනික පාර්ශ්වකරුවන් සමඟ සමීපව කටයුතු කිරීමට අපි කැපවී සිටිමු.

රටේ ප්‍රමුඛතම ඉතිරිකිරීමේ ආයතනය ලෙස, අපගේ වගකීම් හුදු වාණිජමය කාර්යසාධනයෙන් ඔබ්බට ගොස් ජාතික සංවර්ධනයේ සැබෑ හවුල්කරුවෙකු වීම දක්වා විහිදෙන බව අපි පිළිගනිමු. යටිතල පහසුකම් සඳහා මූල්‍ය පහසුකම් සැපයීම, පුද්ගලයින්ට සහය වීම හෝ ස්වභාවික විපත්වලින් පීඩාවට පත් ප්‍රජාවන් යළි නගාසිටුවීමට උදවු කිරීම හරහා වේවා, NSB බැංකුව සැමවිටම සේවය කිරීමට සූදානමින් සිටී.

### ඇගයීම් සහ සම්මාන

නවෝත්පාදනය, අන්තර්ග්‍රහණය සහ තිරසාරභාවය උදෙසා අප සතු නොසැලෙන කැපවීම විවිධ කීර්තිමත් සම්මාන සහ ඇගයීම්වලට පාත්‍ර වීම හේතුවෙන් 2025 වසර ජාතික ඉතිරිකිරීමේ බැංකුවට සුවිශේෂී ගෞරවයක් ගෙන දුන් වසරක් විය.

කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා වන අපගේ ප්‍රමුඛතම වැඩපිළිවෙලක් වන NSB ස්ත්‍රී ඉතිරි කිරීමේ ගිණුම, 2025 වසරේ හොඳම කාන්තා ඉතිරි කිරීමේ සැලසුම ලෙස "Peoples Pinnacle" සම්මානයෙන් පිදුම් ලැබූ අතර, NSB හපන් (NSB Hapan) ලදරු ඉතිරි කිරීමේ ගිණුම 2025 වසරේ හොඳම ළමා ඉතිරි කිරීමේ සැලසුම ලෙස තේරී පත් විය. මෙම ඇගයීම් මඟින් විවිධ පාරිභෝගික කාණ්ඩවල සුවිශේෂී මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා නිෂ්පාදන සැලසුම් කිරීමට අප සතු කැපවීම තහවුරු වේ.

අපගේ නිෂ්පාදනවලින් ඔබ්බට යමින්, ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2025 වසරේ ශ්‍රී ලංකාවේ කාන්තාවන් සඳහා වඩාත් හිතකාමී සේවා ස්ථානවලින් (Most Women-Friendly Workplaces) එකක් ලෙස නම් කරන ලදී. බඳවා ගැනීමේ සහ සේවයේ රඳවා ගැනීමේ සිට නායකත්ව සංවර්ධනය සහ වෘත්තීය හා පෞද්ගලික ජීවිතයේ සමතුලිතතාවය (Work-life integration) දක්වා කාන්තාවන්ගේ වෘත්තීය ජීවිතයේ සෑම අදියරකදීම ඔවුන්ට සහාය වන ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග සඳහා අප විසින් සිදු කරන ලද සැලසුම් සහගත ආයෝජනයන් මෙයින් පිළිබිඹු වේ.

ජාත්‍යන්තර තලයේදී, ලෝක ඉතුරුම් සහ සිල්ලර බැංකුකරණ ආයතනය (World Savings and Retail Banking Institute) විසින් සංවිධානය කරන ලද WSBI-SDG සම්මාන උළෙලේදී ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තිරසාර ගමන් මග සුවිශේෂී ඇගයීමකට ලක් විය. එහිදී, දේශගුණික මූල්‍යකරණය (Climate Finance), පාරිභෝගික ආරක්ෂණය සහ ඩිජිටල් පරිවර්තනය පිළිබඳ නායකත්වය සඳහා වන WSBI-SDG සම්මානයෙන් අපි පිදුම් ලැබුවෙමු.

මෙම සම්මාන සියල්ල සමස්තයක් ලෙස ගත් කල, ජාතික ඉතිරිකිරීමේ බැංකුව එකවර නවීන මෙන්ම විශ්වාසවන්ත, නවෝත්පාදන මෙන්ම සියල්ලන් ඇතුළත් කරගන්නා, වාණිජමය වශයෙන් විනයගරුක මෙන්ම සමාජීය වශයෙන් වගකීම් සහගත ආයතනයක් බව සනාථ කරයි.

### 2026 සහ ඉන් ඉදිරියට සඳහා වන උපායමාර්ගික ප්‍රමුඛතාවන්

අපි 2026 වසර සහ ඉන් ඉදිරි කාලය දෙස බලන විට, අපගේ උපායමාර්ගික ප්‍රමුඛතාවන් තුළින් අඛණ්ඩතාව මෙන්ම විකාශනය යන ද්විත්වයම නිරූපණය වේ. ඒ හරහා, රටේ ප්‍රමුඛතම ඉතිරි කිරීමේ ආයතනය ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ භූමිකාව තවදුරටත් ඉදිරියට ගෙන යාම සඳහා 2025 වසරේදී ලබාගත් ප්‍රගතිය පදනම් කරගනු ලබයි.

මූලික පද්ධති (Core systems) අඛණ්ඩව නවීකරණය කිරීම, ස්වයං-සේවා පහසුකම් ව්‍යාප්ත කිරීම සහ දත්ත විශ්ලේෂණ (Data analytics) භාවිතය ඉහළ නැංවීම සමඟ ඩිජිටල් පරිවර්තනය අතිශයින් වැදගත් කාර්යයක් ලෙස පවතිනු ඇත. බැංකු ක්ෂේත්‍රයේ වෙනස් වන ගතිකත්වයට ප්‍රතිචාර දැක්වීම සඳහා සර්ව-චැනල සේවා සැපයුම් (Omnichannel delivery) ශක්තිමත් කිරීමටත්, ෆින්ටෙක් (Fintech) හවුල්කාරිත්වයන් ගවේෂණය කිරීමටත් මුදල් රහිත (Cashless) ගෙවීම් පද්ධති ව්‍යාප්ත කිරීමටත් අපි කැපවී සිටිමු.

මෙම ඩිජිටල් අවධානයට අමතරව, පිරිපහදු කළ ණය ප්‍රතිඟණනය (Credit underwriting), පුළුල් කළ දේශගුණික අවදානම් විශ්ලේෂණය සහ වැඩිදියුණු කළ මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව මෙන්ම සයිබර් ආරක්ෂණ විධිවිධාන හරහා අපි ආයතනය පුරා අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව තවදුරටත් තහවුරු කරන්නෙමු. දිට්වා සුළි කුණාටුවෙන් උගත් පාඩම්, අපගේ ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ හැකියාවන් ශක්තිමත් කිරීමට උපකාරී වන අතර, දේශගුණික අවදානම් තත්ත්වයන් අපගේ ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමුවට (ERM framework) ඒකාබද්ධ කිරීම SLFRS S1සහ SLFRS S2 අවශ්‍යතාවලට අනුකූලව ඉදිරියට ගෙන යනු ඇත.

මූලික ණය දීමේ ක්‍රියාකාරකම්වලට අතිරේකව, ලාභාන්තිකයන් (Margins) සාමාන්‍යකරණය වන විට, ගාස්තු මත පදනම් වූ සහ පොළී නොවන ආදායම් වර්ධනය කිරීම අත්‍යවශ්‍ය වනු ඇත. අපගේ ආදායම් පදනම විවිධාංගීකරණය කිරීමට සහ තිරසාර ආදායම් මාර්ග ගොඩනැඟීමට අපි කාඩ්පත්, ගෙවීම් සහ වෙළඳ සේවා (Trade services) කෙරෙහි අවධානය යොමු කරන්නෙමු.

පුළුල් කළ දේශගුණික මූල්‍යකරණය, හරිත ණය ලබා දීම, පුනර්ජනනීය බලශක්ති ආයෝජන සහ කාබන්-උදාසීන (Carbon-neutral) බැංකු විසඳුම් සංවර්ධනය කිරීම හරහා අපගේ තිරසාරත්ව ක්‍රියාවලිය වේගවත් වනු ඇත. නිෂ්පාදන මට්ටමේ මූලපිරීම්වලට අමතරව, දේශගුණික විපර්යාස ආශ්‍රිත සලකා බැලීම් මූලික තීරණ ගැනීමේ ක්‍රියාවලීන් තුළට ඇතුළත් කිරීමට අපි සූදානම් වෙමින් සිටින අතර, තිරසාරභාවය අප ව්‍යාපාර කරන ආකාරයෙහි අත්‍යවශ්‍ය අංගයක් බවට පත්වන බව සහතික කරමු.

රටේ විශාලතම ඉතිරිකිරීමේ බැංකුව ලෙස, අපගේ වගකීම අපගේ සේවාවන් පහසුවෙන් ලබාගත හැකි ප්‍රජාවන්ගෙන් ඔබ්බට විහිදෙ යයි. මූල්‍ය අන්තර්ග්‍රහණය පිළිබඳ අපගේ අත්‍යවශ්‍ය වගකීම යළි තහවුරු කරමින් සහ මූල්‍යමය වශයෙන් සවිබල ගැන්වීමේ ගමනේදී කිසිදු ශ්‍රී ලාංකිකයෙකු මග නොහැරෙන බව සහතික කරමින්, බැංකු පහසුකම් අවම සහ ග්‍රාමීය ප්‍රදේශවල අපගේ සේවා ව්‍යාප්ත කිරීමට අපි දිගටම කැපවී සිටිමු.

මෙම දැක්මේ හදවත වන්නේ අපගේ සේවක මණ්ඩලයයි. නැඟී එන තාක්ෂණයන් පිළිබඳ විශේෂිත පුහුණුව, වැඩිදියුණු කළ සුවතා වැඩසටහන් සහ උපදේශකත්වය (Mentoring) හා අනුප්‍රාප්තික සැලසුම් (Succession planning) මත පදනම් වූ නායකත්ව සංවර්ධනය හරහා, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ උරුමය ආරක්ෂා කරන්නන් සහ එහි අනාගතයේ නිර්මාණකරුවන් වෙනුවෙන් අපි අඛණ්ඩව ආයෝජනය කරන්නෙමු.

### උරුමයකට ගරු කරමින්, අනාගතය වැළඳ ගැනීම

මම වැඩබලන සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන විධායක නිලධාරී ධුරයේ වගකීම් භාර ගන්නා මෙම අවස්ථාවේදී, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ නායකත්වය දරමින් විශිෂ්ට සේවා කාලයකින් පසු 2026 ජනවාරි 9 වන දින විශ්‍රාම ගිය මගේ පූර්වගාමී ශෂී කන්ඩම්බි මහත්මිය විසින් ඉටු කරන ලද සුවිශේෂී මෙහෙවර කෘතවේදීව සිහිපත් කළ යුතුය. ඇයගේ

# සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය

දුරදර්ශී නායකත්වය යටතේ, බැංකුව අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන් ජයගත් අතර, එහි මූල්‍ය පදනම ශක්තිමත් කරමින් ඩිජිටල් පරිවර්තනය වේගවත් කළාය. එමෙන්ම තිරසාරභාවය සහ සියල්ලන් ඇතුළත් කරගන්නා වර්ධනය උදෙසා වූ කැපවීම තවදුරටත් තහවුරු කරන ලදී. මෙම සමාලෝචනයේ සඳහන් වන ශක්තිමත් ක්‍රියාකාරිත්වය ඇය සතු උපායමාර්ගික තීක්ෂ්ණ බුද්ධිය, විනයගරුක ක්‍රියාත්මක කිරීමේ හැකියාව සහ මෙම ආයතනයට මෙන්ම එය සේවය කරන ජාතියට දක්වන නොසැලෙන කැපවීම පිළිබඳ මනා සාක්ෂියකි. ඇයගේ නායකත්වය වෙනුවෙන් අපි අපගේ හෘදයාංගම ස්තුතිය පුද කරන අතර, ඇයගේ විශ්‍රාමික ජීවිතය සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම උරුමය මත ගොඩනැගීමටත්, ජාතික ඉතිරිකිරීමේ බැංකුව එහි මීළඟ පරිච්ඡේදය කරා මෙහෙයවීමටත් මා වෙත පැවරී ඇති වගකීම පිළිබඳව මම ගැඹුරින් දැනුවත්ව සිටිමි. ඒ සඳහා දක්ෂ හා කැපවූ නායකත්ව කණ්ඩායමක සහ ඔරොත්තු දීමේ හැකියාව, ව්‍යාත්තීයභාවය මෙන්ම විශිෂ්ටත්වය උදෙසා වූ කැපවීම අතින් අසමසම වූ සේවක පිරිසකගේ සහාය මට හිමිවේ. අපි සියලු දෙනා එක්ව අතීතයට ගරු කරමින් අනාගතය වැළඳ ගැනීමට සූදානම්ව සිටිමු.

## කෘතඥතාව සහ කැපවීම

සභාපති, ආචාර්ය හර්ෂ කබ්රාල් (ජනාධිපති නීතිඥ) මහතා සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දෙන ලද උපායමාර්ගික මග පෙන්වීම, ප්‍රඥාවන්ත උපදෙස් සහ අඛණ්ඩ විශ්වාසය වෙනුවෙන් මම මාගේ අවංක කෘතඥතාව පිරිනමමි. ඔවුන්ගේ මූලිකත්වය සහ නායකත්වය, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සාර්ථකත්වයට පදනම වන ශක්තිමත් පාලන ව්‍යුහය සපයනු ලබයි.


එමෙන්ම, මුදල් අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ගරු ජනාධිපතිතුමාට, ගරු අග්‍රාමාත්‍යතුමියට, මුදල් නියෝජ්‍ය අමාත්‍යවරයාට, මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා ඇතුළු නිලධාරී මහත්ම මහත්මීන්ට, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා සහ නිලධාරීන්ට මෙන්ම සියලුම නියාමන ආයතන වෙත ඔවුන් ලබා දෙන මිල කළ නොහැකි සහයෝගය වෙනුවෙන් මම ස්තුතිවන්ත වෙමි. නීතිපති, විගණකාධිපති, තැපැල්පති සහ තැපැල් දෙපාර්තමේන්තුවේ සමස්ත කණ්ඩායම් වෙතත්, අනෙකුත් නියාමන ආයතනවල ප්‍රධානීන් සහ ඔවුන්ගේ කණ්ඩායම් වෙතත්, ඔවුන් පවත්වාගෙන යනු ලබන අඛණ්ඩ සහයෝගීතාවය සහ හවුල්කාරිත්වය වෙනුවෙන් මාගේ විශේෂ ඇගයීම හිමි වේ.

ශාඛා ජාලය, ප්‍රධාන කාර්යාලය සහ සහායක අංශ පුරා විහිදී සිටින අපගේ සියලුම සේවකයින් වෙත මාගේ හෘදයාංගම ස්තුතිය පිරිනමමි. විශේෂයෙන් දිට්වා සුළි කුණාටුවෙන් පීඩාවට පත් ප්‍රජාවන් වෙනුවෙන් සේවය කිරීමේදී ඔබ දැක්වූ කැපවීම, ඔරොත්තු දීමේ හැකියාව සහ මානුෂීය ගුණය මෙම ආයතනයේ සැබෑ ශක්තියයි. එවැනි විශිෂ්ට කණ්ඩායමකට නායකත්වය දීමට ලැබීම මම ගෞරවයක් කොට සලකමි.

අපගේ ස්ථාවරත්වයේ සහ වර්ධනයේ පදනම වන අප කෙරෙහි අඛණ්ඩව විශ්වාසය තැබූ පාරිභෝගිකයින් සහ තැන්පත්කරුවන් වෙත මාගේ ගැඹුරු කෘතඥතාව පළ කරන අතර, ඔබගේ අවශ්‍යතාවලට අඛණ්ඩව අවංකව සහ විශිෂ්ටත්වයෙන් යුතුව සේවය කිරීමට ඇති නොසැලෙන කැපවීම මම මෙයින් යළි තහවුරු කරමි.

තාක්ෂණික සේවා සපයන්නන්, සංවර්ධන ආයතන සහ අපගේ සාර්ථකත්වයට දායක වූ අනෙකුත් සියලුම පාර්ශ්වකරුවන් ඇතුළු අපගේ උපායමාර්ගික හවුල්කරුවන් වෙත ද මාගේ ස්තුතිය හිමි වේ.

අපි 2026 වසර සහ ඉන් ඉදිරියට ගමන් කරන විට, NSB බැංකුවේ නොසැලෙන වටිනාකම්, නවෝත්පාදන දැක්ම සහ කැපවූ සේවක මණ්ඩලය අපගේ ආයතනයටත්, පාරිභෝගිකයින්ටත් මෙන්ම ශ්‍රී ලංකාවටත් වඩාත් ඔරොත්තු දෙන, සියල්ලන් ඇතුළත් කරගන්නා සහ සමෘද්ධිමත් අනාගතයක් කරා අපව මෙහෙයවනු ඇති බව මට විශ්වාසයි.



**රෝහණ බණ්ඩාර වීරකෝන්**

වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

2026 පෙබරවාරි 6 වන දින



# සෑම ජීවන ගමනකම ප්‍රථම පියවරයන් සවිබල ගැන්වීම

වෘත්තීය ජීවිතය ආරම්භ වීමටත්, ප්‍රථම වේතනය ලැබීමටත් පෙර සිටම, ජාතික ඉතිරිකිරීමේ බැංකුව ඒ සඳහා සූදානමින් සිටියි. ළමා ඉතිරි කිරීමේ ගිණුම් සහ තරුණ ප්‍රජාව කේන්ද්‍ර කරගත් මූල්‍ය නිෂ්පාදන ඔස්සේ, ලාබාලතම ශ්‍රී ලාංකිකයන් තුළ මූල්‍ය විශ්වාසය නමැති බීජය රෝපණය කිරීමට බැංකුව කටයුතු කරයි. ඒ මගින්, ඔවුන් සමාජයට පා තබන විට වඩාත් සාර්ථක සහ පෙරටුගාමී ආරම්භයක් ලබා ගැනීමටත්, ජීවිත කාලය පුරාම පවතින යහපත් මූල්‍ය පුරුද්දක් ගොඩනගා ගැනීමටත් අවස්ථාව සලසා දෙයි.

# අපගේ තිරසාර වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය

මෙහෙයුම් පරිසරය
28

අවදානම් සහ අවස්ථාවන්
34

ප්‍රමාණාත්මකතාවය
40

ඒකාබද්ධ පාර්ශ්වකාර සහභාගිත්වය
52

අපගේ තිරසාරත්ව රාමුව
60

ව්‍යාපාර ආකෘතිය
62

උපායමාර්ගය සහ සම්පත් වෙන්කිරීම
66

# මෙහෙයුම් පරිසරය

## ගෝලීය ආර්ථිකය 2025

2025 වසර පුරාවටම ප්‍රධාන වෙළඳපොල කඩාවැටීම් දිගින් දිගටම ඇතිවූ හු දේශපාලනික සහ දැඩි මූල්‍ය තත්ත්වයන් වලට හැඩ ගැසීමට සිදුවූවත් ගෝලීය ආර්ථිකය කල්පවත්නා ස්වභාවයක් සහ ප්‍රසාරණයක් අත්පත් කර ගැනීමට සමත්ව ඇත. සංවර්ධන රටවල උද්ධමනය සමනය වීමත් සමඟ මහා බැංකුවලට බදු ඉහළ යාම නැවැත්වීමට සහ බදු කැපීම ඇරඹීමට හැකි විය. එය පාරිභෝගික ක්‍රියාකාරිත්වය සහ ව්‍යාපාර ආයෝජන පවත්වා ගැනීමට උදව් වී ඇත. ගෝලීය වෙළඳාම තරමක වර්ධනයක් පෙන්වන අතර, සැපයුම් මාර්ග වල ස්ථායිතාව සහ තාක්ෂණික භාණ්ඩ වලට තිබෙන දැඩි ඉල්ලුම මත පාවෙමින් රදා පැවතී ඇත. චීනය 5.0% ක වාර්ෂික වර්ධනයක් අත්පත් කරගැනීමට සමත්වී ඇත්තේ ශක්තිමත් කාර්මික ප්‍රතිදාන,සුවිශේෂී ලෙස අධි තාක්ෂණික උපකරණ නිපදවීම සහ එම නිෂ්පාදන අපනයනය ප්‍රකෘතිමත් කිරීම මගින් වේ. ශක්තිමත් පාරිභෝගික ඉල්ලුම, ඩිජිටල් සහ මූල්‍ය සේවාවල උත්පාදනය සහ ඉහළ ගිය ආයෝජන හේතුවෙන් ඉන්දියාව සිය මූල්‍ය වසරේ තුන්වන කාර්තුව වන විට සැලකිය යුතු 7.8% ක දළ දේශීය නිෂ්පාදිත වර්ධනයක් වාර්තා කළේය. ගෘහ වියදම් යථා තත්ත්වයට පත්වීම, ප්‍රාග්ධන වියදම් වැඩිවීම සහ විභව වෙළඳ බාධක ඉදිරියේ වුවත් අපනයනවල වැඩිවීම හේතුවෙන් ජපානයේ ආර්ථිකය ඇස්තමේන්තුගත 1.1% කින් වර්ධනය වී ඇත. ඇමරිකානු තීරුබදු සහ ශක්තිමත් අභ්‍යන්තර ඉල්ලුමක් අපේක්ෂාවෙන් කළ පූර්වගාමී අපනයන හේතුවෙන්, යුරෝ කලාපය මන්දගාමී වසර දෙකක සිට දළ වශයෙන් 1.4% කින් නැවත වර්ධනය වීමට සමත් විය. රජයේ වසා දැමීම් සහ මුල් වසරේ පරිභෝජනයේ දුර්වලතාවය වැනි බාධා මධ්‍යයේ වුවද, 2025 මුල් කාර්තු තුන තුළ ඇමරිකා එක්සත් ජනපදය කැපී පෙනෙන ශක්තියක් පෙන්නුම් කළේය.කෙසේ වෙතත්, වියදම් සහ ආයෝජන කෙරෙහි වසා දැමීමේ බලපෑම අවසාන කාර්තුවේදී වර්ධනය අඩුවීමට හේතු විය.

## 2026 ගෝලීය ආර්ථික දැක්ම

2026 දී ගෝලීය වර්ධනය 3.1% ක් පමණ ස්ථාවරව පවතිනු ඇතැයි පුරෝකථනය කර ඇත. දියුණු ආර්ථිකයන්හි වර්ධනය 1.6% ක මන්දගාමී මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කරන අතර, එය අඛණ්ඩ ව්‍යුහාත්මක අභියෝග සහ ප්‍රතිපත්ති සහයෝගයේ මැකී යන බලපෑම පිළිබිඹු කරයි. නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් 4.0% කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, ගෝලීය ව්‍යාප්තියේ ප්‍රධාන ධාවකයන් ලෙස ඔවුන්ගේ භූමිකාව පවත්වා ගනී. ප්‍රධාන ආර්ථිකයන් කිහිපයක වෙළඳ ආතතීන්, භූ දේශපාලනික පීඩන සහ මූල්‍ය තිරසාරභාවය පිළිබඳ ගැටළු ඇතුළු ඉහළ අවදානම් තත්ත්ව හේතුවෙන් ඉදිරි දැක්ම අපැහැදිලිව පවතී. 2026 දී ගෝලීය වර්ධනය 3.1% ක් පමණ ස්ථාවරව පවතිනු ඇතැයි පුරෝකථනය කර ඇත. දියුණු ආර්ථිකයන්හි වර්ධනය 1.6% ක මන්දගාමී මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කරන අතර, එය අඛණ්ඩ ව්‍යුහාත්මක අභියෝග සහ ප්‍රතිපත්ති සහයෝගයේ මැකී යන බලපෑම පිළිබිඹු කරයි. නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් 4.0% කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, එය අඛණ්ඩ ව්‍යුහාත්මක අභියෝග සහ ප්‍රතිපත්ති සහයෝගයේ මැකී යන බලපෑම පිළිබිඹු කරයි. ඔරොත්තු දෙන අපනයන කාර්ය සාධනය සහ ශක්තිමත් මූල්‍ය සහයෝගය යම් සහනයක් ලබා දෙන නමුත්, ජනවිකාශන පීඩනයන් සහ පුළුල් ආර්ථික ප්‍රති තුලනයක අවශ්‍යතාවය හේතුවෙන් මධ්‍ය කාලීන ආර්ථික දැක්ම වඩ වඩාත් සීමා වෙමින් පවතී. දශක ගණනාවක අවධමනකාරී පීඩනයන්ගෙන් සෙමෙන් ගොඩ ඒමත් සමඟ, 2026 දී දළ දේශීය නිෂ්පාදිතය 0.9% දක්වා ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇති ජපානයේ මධ්‍යස්ථ වර්ධන මාවත දිගටම පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## ශ්‍රී ලංකා ආර්ථිකය

### දළ විශ්ලේෂණය

2022 දී ජාතිය ගිලගත් පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයෙන් නිශ්චිත හැරීමක් සනිටුහන් කරමින්, 2025 දී ශ්‍රී ලංකා ආර්ථිකය කැපී පෙනෙන ඔරොත්තු දීමේ හැකියාවක් සහ ප්‍රකෘතිමත් වීමක් පෙන්නුම් කළේය. 2024 අවසානය වන විට ආර්ථිකය සාර්ථකව ස්ථාවර වී තිරසාර වර්ධන මාවතකට නැවත පැමිණි අතර 2025 වසර පුරාම ස්ථාවරව පැවතුනි.

2025 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ සැබෑ දළ දේශීය නිෂ්පාදිත වර්ධනය ආසන්න වශයෙන් 5% ක් වූ අතර එය 2024 දී අත්පත් කරගත් 5% ක ප්‍රසාරණයට සමාන වේ.

එය අඛණ්ඩව කාර්තු හයක් ආර්ථික හැකිලීමෙන් පසුව සිදු විය. මෙම වර්ධන ගමනාගමනය පුළුල් පදනමක් මත පදනම් වී ඇති අතර, ඉදිකිරීම්, නිෂ්පාදන සහ විදුලි උත්පාදනයේ ශක්තිමත් ව්‍යාප්තීන් හරහා කාර්මික අංශය ප්‍රකෘතිමත් වීම සිදුවූ අතර, සංචාරක කර්මාන්තයේ පුනර්ජීවනයෙන් සහ වැඩිදියුණු වූ දේශීය ඉල්ලුමෙන් සේවා අංශය සැලකිය යුතු ලෙස ප්‍රතිලාභ ලැබීය. කාලගුණික තත්ත්වයන් හේතුවෙන් කෘෂිකාර්මික අංශය අස්ථාවරව පැවතුනද, දිට්වා සුළි කුණාටුවට පෙර ස්ථාවර වීමේ සලකුණු පෙන්නුම් කළේය. බාහිර අංශය අඛණ්ඩව දියුණු විය. 2025 ජනවාරි - සැප්තැම්බර් කාලය තුළ, ජංගම ගිණුම සංචාරක ඉපැයීම් සහ සේවක ප්‍රේෂණ මගින් සහාය ලබා ගත් දළ වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 1.86 ක සමුච්චිත අතිරික්තයක් වාර්තා කළේය. අර්බුදය අතරතුර තියුනු ලෙස පහත වැටුණු දළ නිල සංචිත, 2024 අවසානය වන විට ඇමරිකානු ඩොලර් බිලියන 6.1 දක්වා වැඩි වූ අතර එය ඇමරිකානු ඩොලර් බිලියන 6.2 ක් පමණ විය. 2025 සැප්තැම්බර් අවසානය වන විට, ආසන්න වශයෙන් මාස 3 ක ආනයන ගිවිසුම් ආවරණය කරයි.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රගතිය අවිනිශ්චිතතාවයේ ප්‍රධාන මූලාශ්‍රයක් අඩු කළ අතර ස්වෛරී ණය තක්සේරුකරණයේ වැඩිදියුණු කිරීම් සඳහා සහාය විය. 2025 මාර්තු සහ ජූලි මාසවල ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 1.7 ක් වූ IMF වාරික ලැබීම මෙයට සහය විය.

කෙසේ වෙතත්, සැලකිය යුතු අභියෝග දිගටම පැවතුනි. වසර දෙකක ආර්ථික වර්ධනයක් තිබියදීත්, සැබෑ තත්ත්වය 2018 මට්ටමට වඩා පහළින් පවතින අතර, යථා තත්ත්වයට පත්වීම පුළුල් සුභසාධන වැඩිදියුණු කිරීම් බවට තවම පරිවර්තනය වී නොමැත. දරිද්‍රතාවය ඉහළ මට්ටමක පැවතුන අතර විශේෂයෙන් ළමුන් අතර ආහාර අනාරක්ෂිතභාවය සහ මන්දපෝෂණ ගැටළු ද සැලකිය යුතු ලෙස පැවතුනි.

කාන්තාවන් සහ නාගරික සේවකයින් විශේෂයෙන් බලපෑමට ලක් වූ අතර, සැබෑ වැටුප් අර්බුදයට පෙර මට්ටමට වඩා පහළින් පැවතුනි. 2025 සැප්තැම්බර් වන විට ශ්‍රම බලකා සහභාගීත්වය 49.9% ක් වූ අතර, වසර තුළ ඇති වූ උච්චාවචනයන් හේතුවෙන් සේවකයින් අධෛර්යමත් වීම, පුහුණු ශ්‍රමිකයන් සංක්‍රමණය වීම වැඩිවීම සහ ආර්ථික අර්බුදයේ කැළැල් සහගත බලපෑම් පිළිබිඹු විය.

2025 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවට බලපෑ දිට්වා සුළි කුණාටුව, තිරණාත්මක යටිතල පහසුකම්, ජීවනෝපායන් සහ ආර්ථික ස්ථාවරත්වයට සැලකිය යුතු හානියක් සිදු කළේය.

## මෙහෙයුම් පරිසරය

ලෝක බැංකු සමූහය විසින් නිකුත් කරන ලද ගෝලීය හදිසි ආපදා හානි ඇස්තමේන්තු (GRADE) වාර්තාවට අනුව, දිට්වා සුළි කුණාටුව ශ්‍රී ලංකාවට ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 4.1 ක හානියක් සිදු කළ අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් 4% කට සමාන වේ. කෘෂිකාර්මික අංශයට පමණක් ඇමරිකානු ඩොලර් මිලියන 800 කට ආසන්න හානියක් සිදුවිය. ග්‍රාමීය ජීවනෝපායන් සහ ප්‍රජාවන්ට එය බලපායි. දිට්වා සුළි කුණාටුවේ බලපෑම එක් එක් ප්‍රාග්ධන අංශ යටතේ විස්තරාත්මකව සාකච්ඡා කෙරේ.

කඩිනම් නියාමන මැදිහත්වීම්, පීඩාවට පත් ණය ගැතියන් සඳහා ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ යාන්ත්‍රණයන් සහ ක්‍රමයෙන් ආර්ථික සාමාන්‍යකරණය මගින් සහාය සලසමින්, අර්බුදය සහ යථා තත්ත්වයට පත්වීමේ කාලය පුරාම බැංකු අංශය ඔරොත්තු දීමේ හැකියාව පෙන්නුම් කළේය. අර්බුදය අතරතුර ඉහළ ගිය අක්‍රීය ණය අනුපාත, ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීමත්, ණය ගැතියන් ණය සේවාකරණ ධාරිතාව නැවත ලබා ගැනීමත් සමඟ ස්ථාවර වීමේ සලකුණු පෙන්නුම් කළේය. ඉහළ ප්‍රතිපාදන අවශ්‍යතා සහ අඩු අනුපාත පරිසරය තුළ ආන්තික සම්පීඩනය හේතුවෙන් ඉපැයීම් සීමා වුවද, බැංකු විසින් ප්‍රාග්ධන සඳහා ප්‍රමාණවත් වන අනුපාත නියාමන අවම මට්ටමට වඩා බෙහෙවින් ඉහළින් පවත්වා ගෙන යන ලදී.

### දේශීය ආර්ථික වර්ධනය

2025 දී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන මාවත, 2023 තුන්වන කාර්තුවේදී ආරම්භ වූ ප්‍රකෘතිමත් වීම දිගටම කරගෙන ගිය අතර, එය 2021-2023 දැඩි හැකිලීමේ කාලපරිච්ඡේදයෙන් තීරණාත්මක බිඳියාමක් පෙන්නුම් කරයි. ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම් ඇස්තමේන්තු වලට අනුව 2025 සඳහා පූර්ණ වාර්ෂික වර්ධනය 4.8% කි.

2024 තුන්වන කාර්තුවේ වාර්තා වූ 10.1% වර්ධනයට සාපේක්ෂව 2025 තුන්වන කාර්තුවේදී කාර්මික අංශය 8.1% ක වර්ධනයක් වාර්තා කළේය.

දළ දේශීය නිෂ්පාදිතයෙන් ආසන්න වශයෙන් සියයට 60 ක් පමණ වන සේවා අංශය, වර්ධනයට ප්‍රධාන දායකත්වයක් ලබා දුන්නේය. 2025 තුන්වන කාර්තුවේදී සේවා ක්‍රියාකාරකම් සැලකිය යුතු 3.5% ක වර්ධනයක් වාර්තා කළේය. 2025 දී සංචාරකයින්ගේ පැමිණීම ඇස්තමේන්තුගත මිලියන 2.33 දක්වා ඉහළ ගොස් ඇති අතර එය පෙර පැවති සියලු කාලීන වාර්තාව ඉක්මවා ගොස් ඇති අතර 2026 දී එය මිලියන 2.5 ඉක්මවනු ඇතැයි අපේක්ෂා කෙරේ.


2025 තුන්වන කාර්තුව අවසන් වන විට කෘෂිකාර්මික අංශය 3.6% ක ප්‍රසාරණයක් වාර්තා කළේය.

උද්ධමනය පහත වැටීම, නාමික වැටුප් ඉහළ යාම සහ රැකියා උත්පාදනය සමඟ සැබෑ ගෘහස්ථ ආදායම වැඩිදියුණු වීමත් සමඟ පුද්ගලික පරිභෝජනය (දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 60 ක් පමණ) යථා තත්ත්වයට පත් විය. කෙසේ වෙතත්, කුටුම්භ ණය ආපසු ගෙවීම සහ ඉතුරුම් නැවත ගොඩනැගීමට ප්‍රමුඛත්වය දීම නිසා පරිභෝජන මට්ටම් අර්බුදයට පෙර උපරිම මට්ටමට වඩා පහළින් පැවතුනි. දැඩි මූල්‍ය තත්ත්වයන් සහ ණය සේවාකරණ ප්‍රමුඛතා හේතුවෙන් රජයේ ආයෝජන සීමා වී තිබුණි.

ඉදිරිය දෙස බලන විට, අඛණ්ඩ ණය ප්‍රසාරණය, සමස්ත ඉල්ලුම යථා තත්ත්වයට පත්වීම, දේශපාලනික හා ප්‍රතිපත්තිමය ස්ථාවරත්වය සහ අඛණ්ඩ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ මගින් සහාය වන, 2026-2027 කාලය තුළ වාර්ෂිකව ආසන්න වශයෙන් 3.5 - 4% ක පමණ ප්‍රක්ෂේපිත මධ්‍ය කාලීන ආර්ථික වර්ධනය අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, අර්ථවත් දරිද්‍රතාවය අඩු කිරීම සහ රැකියා නිර්මාණය සඳහා අවශ්‍ය ඉහළ වර්ධන අනුපාත සාක්ෂාත් කර ගැනීම සඳහා, යටිතල පහසුකම් හිඩැස්, ශ්‍රම වෙළඳපොලේ කුසලතා නොගැලපීම්, ව්‍යාපාර ප්‍රවේශයට සහ ව්‍යාප්තියට ඇති නියාමන බාධක සහ ගෝලීය වටිනාකම් දාමයන්ට ඒකාබද්ධ වීම ඇතුළු ව්‍යුහාත්මක සීමාවන් ආමන්ත්‍රණය කිරීම අවශ්‍ය වනු ඇත.


මෑත කාලීන ගංවතුර සහ නායයෑම් ආර්ථික ප්‍රකෘතියට අමතර අවාසි සහගත අවදානමක් නිර්මාණය කර ඇත.

**කාර්තුමය සැබෑ දළ දේශීය නිෂ්පාදිතයේ වසරින් වසර වර්ධනය** ප්‍රස්ථාර 1




**දත්ත මූලාශ්‍ර:** ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ජාතික ගිණුම් ඇස්තමේන්තු, 2025 පළමු කාර්තුව - ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් ප්‍රතිපත්ති වාර්තාව, 2025 අගෝස්තු - ශ්‍රී ලංකා මහ බැංකුව, ප්‍රස්ථාරවල සාර්ව ආර්ථික සංවර්ධනය, 2025 දෙවන කාර්තුව - ලෝක බැංකුව, ශ්‍රී ලංකා සංවර්ධන යාවත්කාලීන කිරීම, 2025 අප්‍රේල්

**සැබෑ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය 2021-2025** ප්‍රස්ථාර 2




## මෙහෙයුම් පරිසරය


### උද්ධමනය

2025 මැද භාගය වන විට අපේක්ෂා කළ පරිදි පළමු කාර්තුවේ අවධමනකාරී තත්ත්වය ස්ථාවර මට්ටමකට ළඟා වීමත් සමඟ 2025 දී උද්ධමන තත්ත්වය ස්ථීර මට්ටමක පැවතුනි.


**පැවති හා ප්‍රක්ෂේපිත උද්ධමනය** ප්‍රස්ථාර 3




**2024-2025 මාසික උද්ධමනය වසරින් වසර** ප්‍රස්ථාර 4




**මධ්‍ය කාලීන උද්ධමන ප්‍රක්ෂේපණය** ප්‍රස්ථාර 5




දත්ත මූලාශ්‍ර - ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් ප්‍රතිපත්ති වාර්තාව, 2025 අගෝස්තු, රූපය 02: "ප්‍රක්ෂේපිත ශීර්ෂ උද්ධමනය (කාර්තුමය, CCP, y-o-y, %)" - ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් ප්‍රතිපත්ති සමාලෝචනය

අංක 5, 2025 සැප්තැම්බර් - ශ්‍රී ලංකා මහ බැංකුව, CCP, උද්ධමනය පිළිබඳ මාධ්‍ය නිවේදන (විවිධ මාස, 2024-2025) - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCP, 2021=100)

### පොලී අනුපාත

උද්ධමනය ඉලක්කගත අනුපාත කරා මෙහෙයවීම සඳහා මහ බැංකුව 2025 වර්ෂයේදී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කරමින් එක් රැයකින් ප්‍රතිපත්ති අනුපාතය අඩු කළේය.


විවිධ වෙළඳපල කොටස් හරහා සම්ප්‍රේෂණය ක්‍රමයෙන් සහ වෙනස් වූ නමුත්, ඉහත සඳහන් ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට ප්‍රතිචාර වශයෙන් වෙළඳපොළ පොලී අනුපාතික සැලකිය යුතු ලෙස පහළට ගෙන සකස් කරන ලදී.සාමාන්‍ය බරිත නව ණය අනුපාතිකය (AWNLR) 2023 දී එහි උපරිම මට්ටමට වඩා 2025 මැද භාගය වන විට සැලකිය යුතු ලෙස පහත වැටුණි, එයින් ඇඟවෙන්නේ නව ණය ගැණුම්කරුවන් පවතින ණය ගැණුම්කරුවන්ට වඩා මුදල් ලිහිල් කිරීමෙන් වේගයෙන් ප්‍රතිලාභ ලබා ඇති බවයි.

තැන්පතු අනුපාතික ද සැලකිය යුතු ලෙස පහත වැටුණද, ණය අනුපාතිකවලට වඩා තරමක් වේගවත් වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ පොලී ආන්තිකයන් යම් ප්‍රමාණයකින් සම්පීඩනය විය. ප්‍රතිපත්ති ලිහිල් කිරීමත් සමඟ භාණ්ඩාගාර බිල්පත් අනුපාත සහ රජයේ බැඳුම්කර පොලී අනුපාත පුළුල් ලෙස පහත වැටුණද, දිගුකාලීන පොලී අනුපාත ගැලපීම් සහ දිගුකාලීන මූල්‍ය තිරසාරභාවය පිළිබඳ අවශේෂ උත්සුකයන් පිළිබිඹු කරමින් දිගුකාලීන පොලී අනුපාත තරමක් ඉහළ මට්ටමක පැවතුනි. 2022-2023 කාලය තුළ අත්විඳින ලද පහත වැටීම් හා සසඳන විට, 2025 ජූලි මාසය වන විට වසරින් වසර 19.6% කින් පුළුල් වෙමින්, අඩු පොලී අනුපාත පරිසරයට පෞද්ගලික අංශයේ ණය වර්ධනය ශක්තිමත් ලෙස ප්‍රතිචාර දැක්වීය. ඉදිරිය දෙස බලන විට, තවදුරටත් ලිහිල් කිරීම උද්ධමන ගතිකත්වය, වර්ධන ගම්‍යතාව, බාහිර අංශයේ ස්ථාවරත්වය සහ මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව යන කරුණු මත කොන්දේසි සහිත වනු ඇති බවට මහ බැංකුව සංඥා කර ඇත.

## මෙහෙයුම් පරිසරය

### ප්‍රතිපත්ති අනුපාත (වසර අවසානයේ)

ප්‍රස්ථාර 6




SDFR: ස්ථාවර තැන්පතු පහසුකම් අනුපාතය (2024 නොවැම්බර් සිට ප්‍රතිපත්ති අනුපාතය ලෙස අත්හිටුවන ලදී)


OPR: එක් රැයකින් ප්‍රතිපත්ති අනුපාතය (2024 නොවැම්බර් සිට ප්‍රාථමික ප්‍රතිපත්ති අනුපාතය)

SLFR: ස්ථාවර ණය පහසුකම් අනුපාතය (2024 නොවැම්බර් සිට ප්‍රතිපත්ති අනුපාතය ලෙස අත්හිටුවන ලදී)

AWCMR: සාමාන්‍ය බරිත ඇමතුම් මුදල් අනුපාතය

### වෙළෙඳපොළ ණය අනුපාත (වාර්ෂික සාමාන්‍යය)

ප්‍රස්ථාර 7





AWNLR: සාමාන්‍ය බරිත නව ණය දීමේ අනුපාතය (නව ණය සඳහා පමණි)

AWLR: සාමාන්‍ය බරිත ණය දීමේ අනුපාතය (සියලුම හිඟ ණය)

AWPR: සාමාන්‍ය බරිත ප්‍රාථමික අනුපාතය

### වෙළෙඳපොළ තැන්පතු අනුපාත (වාර්ෂික සාමාන්‍යය)

ප්‍රස්ථාර 8





AWDR: සාමාන්‍ය බරිත තැන්පතු අනුපාතය (සියලුම හිඟ තැන්පතු)

AWFDR: සාමාන්‍ය බරිත ස්ථාවර තැන්පතු අනුපාතය

AWNDR: සාමාන්‍ය බරිත නව තැන්පතු අනුපාතය (නව තැන්පතු සඳහා පමණි)


### භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිලාභ (වසර අවසානයේ)

ප්‍රස්ථාර 9




### රජයේ බැඳුම්කර ප්‍රතිලාභ (වසර අවසානයේ)

ප්‍රස්ථාර 10




**දත්ත මූලාශ්‍ර** - ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් ප්‍රතිපත්ති වාර්තාව, 2025 අගෝස්තු - ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් සහ පොලී අනුපාත සංඛ්‍යාලේඛන පිළිබඳ මාසික ප්‍රකාශනය, 2025 සැප්තැම්බර් - ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික වාර්තාව 2024, පරිච්ඡේදය 1: සාර්ව ආර්ථික සංවර්ධන - ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් ප්‍රතිපත්ති සමාලෝචන නිවේදන (විවිධ දිනයන්, 2023-2025)

### විනිමය අනුපාත

2022 ආර්ථික අර්බුදය අතරතුර අත්විඳින ලද දැඩි අස්ථාවරත්වයට සාපේක්ෂව, 2025 දී ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාත ගමන් පථය, සාපේක්ෂ ස්ථාවරත්වය සහ මධ්‍යස්ථ ක්ෂයවීම් පීඩන මගින් සංලක්ෂිත විය. 2025 දී, රුපියල වඩාත් කැපී පෙනෙන ක්ෂයවීම් පීඩනයකට මුහුණ දුන් අතර, විනිමය අනුපාතය 2024 අවසානයේ දළ වශයෙන් රු. 296/ඇමරිකානු ඩොලර් සිට 2025 දෙසැම්බර් වන විට 311 දක්වා ඉහළ ගියේය. එමනිසා ප්‍රමාණාත්මක සීමාවන් ඉවත් කිරීමෙන් පසු ආනයන ඉල්ලුම ඉහළ යාමත් සමඟ පුළුල් වන වෙළඳ හිඟය පිළිබිඹු විය.


අපනයන ආදායම මධ්‍යස්ථව වර්ධනය වෙමින් අපනයන කාර්ය සාධනය පහළ මට්ටමක පවතී.

කෙසේ වෙතත්, සේවා ශේෂය දැඩි ලෙස ධනාත්මකව පවතින අතර, සංචාරක ඉපැයීම් 2025 ඔක්තෝබර් වන විට ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 4.2 දක්වා ළඟා විය. 2025 ඔක්තෝබර් දක්වා සේවක ප්‍රේෂණ ආසන්න වශයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 6.8 ක ස්ථාවර මට්ටමක පවතී. පුළුල් වන වෙළඳ හිඟය තිබියදීත්, 2025 මුල් මාස දහය තුළ ජංගම ගිණුම ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 1.7 ක අතිරික්තයක් පවත්වා ගෙන ගොස් ඇත.

## මෙහෙයුම් පරිසරය


### USD/LKR ස්ථානීය විනිමය අනුපාත (මාසික රුපියල ඇ.ඩො. සාපේක්ෂව)

ප්‍රස්ථාර 11





### හරස් අනුපාත එදිරිව LKR (ඒකකයකට LKR)

ප්‍රස්ථාර 12




### සැබෑ ඵලදායී විනිමය අනුපාතය (REER - දර්ශකය 2010 = 100)

ප්‍රස්ථාර 13




**දත්ත මූලාශ්‍ර** - ශ්‍රී ලංකා මහ බැංකුව, විනිමය අනුපාත (දෛනික දර්ශක අනුපාත) - ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික වාර්තාව 2024 - ශ්‍රී ලංකා මහ බැංකුව, බාහිර අංශයේ කාර්ය සාධන වාර්තා, 2024-2025 - ජාත්‍යන්තර පියවීම් සඳහා බැංකුව (BIS), ඵලදායී විනිමය අනුපාතිකය

දර්ශක - ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ජාත්‍යන්තර මූල්‍ය සංඛ්‍යාලේඛන

### බැංකු අංශයේ දැක්ම: 2026 සහ ඉන් ඔබ්බට

ඉදිරියට යමින්, රටේ මූල්‍ය පද්ධතියේ අඛණ්ඩතාව ආරක්ෂා කිරීම සඳහා බැංකු අංශය වඩ වඩාත් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ඇත. බාසල් මූලික මූලධර්ම සහ ජාත්‍යන්තර හොඳම භාවිතයන්ට අනුකූලව, ණය වර්ගීකරණ ප්‍රමිතීන් සහ අවදානම් කළමනාකරණ අවශ්‍යතා ඇතුළුව නියාමන රාමුව පිළිබඳ පුළුල් සමාලෝචනයක් හරහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය තවදුරටත් ශක්තිමත් කෙරේ.

ඊට සමගාමීව, බැංකු සහ මූල්‍ය සමාගම් ඒකාබද්ධ කිරීම සඳහා වන ප්‍රධාන සැලැස්ම යටතේ වඩාත් ඔරොත්තු දෙන මූල්‍ය අංශයක් ගොඩනැඟීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව දරන උත්සාහයන් අඛණ්ඩව සිදුවනු ඇති අතර, එමඟින් දිගුකාලීන තිරසාරභාවය, වැඩිදියුණු කළ මූල්‍ය ස්ථාවරත්වය, වැඩිදියුණු කළ කාර්යක්ෂමතාව සහ කර්මාන්තය පුරා අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීම අරමුණු කර ගෙන ඇත.

විශේෂයෙන් දිවිවා සුළි කුණාටුවේ බලපෑම ආර්ථිකයේ ප්‍රධාන අංශ කෙරෙහි බලපා ඇති බැවින් දේශගුණික අවදානම් වලට එරෙහිව බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට ඉඩ ඇත.

2025 දී දියත් කරන ලද CBSL හි තිරසාර මූල්‍ය මාර්ග සිතියම 2.0 මත පදනම්ව,

ශ්‍රී ලංකා හරිත මූල්‍ය වර්ගීකරණය 2026 දී තිරසාර මූල්‍යකරණයේ සමාජ මානයන් ඇතුළත් කිරීම සඳහා පුළුල් කිරීමට නියමිතය.

ජාතික ගෙවීම් පද්ධතියේ ඩිජිටල්කරණය, කාර්යක්ෂමතාව සහ ප්‍රවේශ්‍යතාව වැඩි දියුණු කිරීම සඳහා 2025 දී සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇති බැවින්, 2025-2027 සඳහා ජාතික ගෙවීම් පද්ධති මාර්ග සිතියම ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත, එමඟින් කර්මාන්තයට සාමූහිකව අඩු මුදල්, ඩිජිටල්කරණය කළ ආර්ථිකයක් කරා ප්‍රගතියක් ලබා ගැනීම සඳහා පැහැදිලි උපායමාර්ගික දිශාවක් සහ හොඳින් අර්ථ දක්වා ඇති ඉලක්ක සපයයි. අනෙකුත් ප්‍රධාන ප්‍රමුඛතා අතරට උපායමාර්ගික තොරතුරු තාක්ෂණ මූලපිරීම් හරහා බැංකු අංශයේ ඩිජිටල් පරිවර්තනය ඉදිරියට ගෙන යාම, මූලික පද්ධති නවීකරණය කිරීම, මධ්‍යගත මහා දත්ත සහ දත්ත ගබඩා වේදිකාවක් සඳහා මාර්ග සිතියමක් ස්ථාපිත කිරීම සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සයිබර් ආරක්ෂාව සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම ඇතුළත් වේ.

ඉදිරිය දෙස බලන විට, ඒකාබද්ධ කිරීමේ ගම්‍යතාව, තිරසාර මූල්‍යකරණයේ ගැඹුරු ඒකාබද්ධතාවය, වේගවත් ඩිජිටල් භාවිතය සහ අවදානම් කළමනාකරණය කෙරෙහි විනයගරුක අවධානයක් මඟින් මෙම අංශය හැඩගැසෙනු ඇත. මූල්‍ය ශක්තිය, කඩිසර බව සහ නවෝත්පාදනය සමඟ ඒකාබද්ධ කරන බැංකු කර්මාන්තය එහි ඊළඟ පරිච්ඡේදයට ගෙන යාමට හොඳම ස්ථානයේ සිටිනු ඇත.

# මෙහෙයුම් පරිසරය

**NSB සඳහා ඉදිරි දැක්ම: අවස්ථා, අවදානම් සහ අභියෝග**

2026 සහ ඉන් ඔබ්බට NSB අපේක්ෂා කරන විට, රජය සතු විශේෂිත ඉතිරිකිරීමේ බැංකුවක් ලෙස එහි සුවිශේෂී තත්ත්වය එහි උපායමාර්ගික මාවත හැඩගස්වන අද්විතීය අවස්ථා සහ සීමාවන් සමූහයක් ඉදිරිපත් කරයි.

### අවස්ථා

ඩිජිටල්කරණය සහ මූල්‍ය ඇතුළත් කිරීම සඳහා වන ජාතික ප්‍රවනතාව, විශේෂයෙන් ග්‍රාමීය ඉතිරි කරන්නන් සහ අඩු සේවා ලත් ප්‍රජාවන් අතර තම ප්‍රවේශය පුළුල් කිරීමට NSB හට සැලකිය යුතු අවස්ථාවක් ලබා දෙයි. ජාතික ගෙවීම් පද්ධති මාර්ග සිතියම ක්‍රියාත්මක කිරීම සහ පුළුල් කර්මාන්ත පුළුල් ඩිජිටල් පරිවර්තන මූලපිරීම් මඟින් සේවා සැපයීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ පාරිභෝගික සහභාගීත්වය වැඩි දියුණු කිරීම සඳහා මං නිර්මාණය වේ. ඊට අමතරව, සමාජීය මානයන් ඇතුළත් තිරසාර මූල්‍ය රාමු පුළුල් කිරීම, NSB හි සංවර්ධන වගකීම සමඟ සමපාත වන අතර, සමාජ යටිතල පහසුකම් සහ හරිත මූල්‍යකරණ මූලපිරීම් සඳහා විභව සහභාගීත්වය විවෘත කරයි.

### අවදානම්

විශාල සිල්ලර පදනමක් සහිත තැන්පතු බර ආයතනයක් ලෙස, NSB පොලී අනුපාත අස්ථාවරත්වයට නිරාවරණය වී සිටී. මුදල් ප්‍රතිපත්තියේ ඕනෑම වේගවත් හෝ අනපේක්ෂිත මාරුවක් ශුද්ධ පොලී ආන්තිකයන් සම්පීඩනය කළ හැකිය. පාලනය, ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය සහ ද්‍රවශීලතාවය ආවරණය වන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ වැඩිදියුණු කළ අධීක්ෂණය යටතේ ඉහළ යන නියාමන අපේක්ෂාවන් සඳහා මෙහෙයුම් සහ කීර්තිනාම අවදානම් අවම කිරීම සඳහා සුපරීක්ෂාකාරී අනුකූලතාවයක් අවශ්‍ය වේ. තවද, පරිණාමය වෙමින් පවතින සයිබර් ආරක්ෂණ තර්ජන පාරිභෝගික විශ්වාසය සහ ආයතනික ඔරොත්තු දීමේ හැකියාව ආරක්ෂා කිරීම සඳහා අඛණ්ඩ ආයෝජන ඉල්ලා සිටී.

### අභියෝග

අනාගත බැංකුකරණයේ ඉල්ලුමට සරිලන පරිදි තත්‍ය කාලීන සැකසුම්, ඩිජිටල් ඇතුළත් කිරීම සහ දත්ත පාදක පුද්ගලීකරණය ඇතුළු මූලික පද්ධති නවීකරණය කිරීම සැලකිය යුතු උපායමාර්ගික සහ මෙහෙයුම් අභියෝගයක් මතු කරයි. විශාල හා විවිධාකාර පාරිභෝගික පදනමකට අඛණ්ඩ සේවාවක් සහතික කිරීම සඳහා මේ සඳහා සැලකිය යුතු ආයෝජනයක්, දක්ෂ කුසලතා සහ ප්‍රවේශමෙන් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

අතිරේකව, NSB පනත මගින් අර්ථ දක්වා ඇති ව්‍යාපාර ආකෘති සීමාවන් යටතේ NSB ක්‍රියාත්මක වේ. කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය අංශයට ණය ලබා දීමට බැංකුවට අවසර නැත, ජංගම ගිණුම් පිරිනැමීමට ද එයට අවසර නැත. මෙම සීමාවන් මඟින් බැංකුවට තම වත්කම් පදනම විවිධාංගීකරණය කිරීමට සහ අඩු වියදම් ගනුදෙනු තැන්පතු වෙත ප්‍රවේශ වීමට ඇති හැකියාව සීමා කරන අතර, එමඟින් ආන්තික තිරසාරභාවය මත ව්‍යුහාත්මක පීඩනයක් ඇති වේ. ඒකාබද්ධ පෞද්ගලික බැංකු සහ වේගවත් ඩිජිටල් ප්‍රවේශකයින්ගෙන් එල්ල වන දැඩි තරඟකාරිත්වයක් සහිත පරිසරයක, ලාභදායිතාවය පවත්වා ගනිමින් මෙම සීමාවන් හරහා ගමන් කිරීම සහ එහි මහජන වරම ඉටු කිරීම සඳහා එහි නීතිමය රාමුවේ සීමාවන් තුළ විනයගරුක මූල්‍ය කළමනාකරණය සහ උපායමාර්ගික නවෝත්පාදනයන් අවශ්‍ය වනු ඇත.

## බැංකු ක්ෂේත්‍රයට සාපේක්ෂව බැංකුවේ කාර්යසාධනය

| | 2025 | | | 2024 | | |
|---|---|---|---|---|---|---|
| | බැංකුව | බැංකු ක්ෂේත්‍රය | NSB බැංකුවේ වෙළඳපොළ කොටස(%) | බැංකුව | බැංකු ක්ෂේත්‍රය | NSB බැංකුවේ වෙළඳපොළ කොටස(%) |
| **වත්කම් සහ වගකීම් (රු. බිලියන)** | | | | | | |
| ණය සහ ලැබිය යුතු දෑ | 551 | 12,913 | 4.3 | 532 | 10,478 | 5.1 |
| ආයෝජන | 1,211 | 9,367 | 12.9 | 1,136 | 9,090 | 12.5 |
| තැන්පතු | 1,608 | 19,927 | 8.1 | 1,556 | 17,969 | 8.7 |
| මුළු වත්කම් | 1,831 | 24,922 | 7.3 | 1,752 | 22,147 | 7.9 |
| **ලාභදායිතාව (%)** | | | | | | |
| වත්කම් මත ඉපැයීම් (ROA) | 2.5 | 2.5 | | 1.5 | 2.6 | |
| කොටස් මත ඉපැයීම් (ROE) | 25.1 | 16.7 | | 17.9 | 17.4 | |
| ශුද්ධ පොලී ආන්තිකය (NIM) | 4.7 | 4.3 | | 4.2 | 4.4 | |
| ආදායමට පිරිවැය (බදු රහිත) | 34.3 | 68.6 | | 38.4 | 76.9 | |
| **වත්කම් තත්ත්වය(%)** | | | | | | |
| අදියර 3 මුළු ණයට ණය අනුපාතය | 2.5 | 4.5 | | 5.2 | 12.7 | |
| අදියර 3 හානිකරණ ආවරණ අනුපාතය | 58.6 | 56.7 | | 44.5 | 54.1 | |
| **ප්‍රාග්ධන ප්‍රමාණත්මතාව (%)** | | | | | | |
| පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය | 24.9 | | | 23.4 | 16.7 | |
| මුළු ප්‍රාග්ධන ප්‍රමාණත්මතා අනුපාතය | 26.8 | 18.7 | | 25.9 | 20.3 | |
| **ද්‍රවශීලතාව (%)** | | | | | | |
| ද්‍රවශීලතා ආවරණ අනුපාතය (සියලුම මුදල්) | 349.1 | 249.7 | | 344.5 | 313.8 | |
| ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය | 206.4 | 159.4 | | 193.5 | 164.8 | |

# අවදානම් සහ අවස්ථාවන්

## ඔරොත්තුදීම යාත්‍රණය කිරීම

### අපගේ 2025 අවදානම් සහ අවස්ථා වාතාවරණය

2025 දී, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ඩිජිටල් යොදා ගැනීම වේගවත් කරන අඛණ්ඩ නියාමන වෙනස්වීම මගින් හඳුනාගත් වාතාවරණයක සහ මෙම ස්ථාවරත්වය සංවේදීව පවතින සාර්ව ආර්ථික පරිසරයක යාත්‍රණය කළේය. මෙම සන්දර්භය තුළ, ඉලක්කගත පරිනාමන මුළපිරීම් හඹායමින්, බැංකුවේ අවධානය තැන්පත්හිමියන්ගේ විශ්වාසය ශක්තිමත් කිරීම, ශේෂ පත්‍ර ඔරොත්තුදීම දරා ගැනීම, සහ අපගේ ජාතික ඉතුරුම් හා සංවර්ධනය විධිනියෝගය ලබදීම ශක්තිමත් කිරීම කෙරෙහි යොමු වී පැවතුණි.

මෙම වසරේ විශේෂයෙන් දිටිවා සුලි කුණාටුවෙන් පසු ඔරොත්තුදීමේ වැදගත්කම සහ වගකීම්සහගත බැංකුකරණය නැවත සහතික කරන ලදී. එය සේවා අඛණ්ඩතාවයේ, වැදගත්කම, ණයගැති පුනරුත්ථාපනය, සහ ප්‍රතිසාධන මූල්‍ය ඉහළට ඔසවන ලදී. ඒ අනුව, අවදානම් හා අවස්ථා කළමනාකරණය සඳහා බැංකුවේ ප්‍රවේශය

(i) ව්‍යවසාය අවදානම් විනය (ප්‍රාග්ධනය, ද්‍රවශීලතාව, සයිබර්, අනුකූලතාව) සහ,

(ii) වටිනාකම් නිර්මාණ අවස්ථා (ඩිජිටල් සවිබලගැන්වීම්, ඇතුළත්වීම පදනම් වර්ධනය. මූල්‍ය ඔරොත්තුදීම)ඒකාබද්ධ කරන අතර බැංකුව විශ්වාසී, ස්ථාවර සහ අනාගතයට සූදානම්ව පවතින බව සහතික කරයි.

### අවදානම් හා අවස්ථා කළමනාකරණය සඳහා පාලනය හා වගවීම

අවදානම් සහ අවස්ථා කළමනාකරණය, අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණය, කළමනාකරණ හිමිකාරිත්වය සහ පාලන සහතික කිරීම සම්බන්ධ කරන ඒකාබද්ධ රාමුවක් හරහා බැංකුවේ පාලන නිර්මාණ ශිල්පය තුළට ඇතුළත් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය සහ එහි කමිටු උපායමාර්ගික මඟ පෙන්වීම සහ අධීක්ෂණය සපයන අතර කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම මෙහෙයවයි. තෙවැදෑරුම් ආරක්ෂක මාර්ග ආදර්ශය අවදානම් හඳුනා ගැනීම, කළමනාකරණය, නියාමනය සහ සහතික කිරීම සඳහා වගවීම පැහැදිලි කරයි. අවදානම් රුචිය සහ ප්‍රධාන සීමාවන් තීරණ ගැනීම, උත්සන්න කිරීම සහ කාර්යසාධන නියාමනය මෙහෙයවන අතර, උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීම ප්‍රාග්ධනය, ද්‍රවශීලතාවය, මෙහෙයුම් ඔරොත්තු දීම සහ පාර්ශ්වකරුවන්ගේ විශ්වාසනීය අරමුණු සමඟ පෙළ ගැසී පවතින බව සහතික කරයි.

මෙම පෙළගැසීම ශක්තිමත් කිරීමට, බැංකුවේ අවදානම් ප්‍රමුඛතා උපායමාර්ගික සැලසුම්කරණය සහ සම්පත් වෙන් කිරීම යන නිර්මිතයට බැඳී ඇති අතර, ආරම්භයේ සිටම අවදානම් ප්‍රතිෂ්ඨාවන්, ආයෝජන තීරණ, ප්‍රාග්ධන යෙදවීම සහ මෙහෙයුම් මුලපිරීම් දැනුම් දෙන බව සහතික කරයි. මෙම ඒකාබද්ධ කිරීම මගින් බැංකුවට අදාළ අවදානම් පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඇතිව වර්ධන අවස්ථා හඹා යාමට හැකියාව ලබා දෙන අතර, තීරණ ගැනීමේ සෑම අංශයකටම විචක්ෂණභාවය ඇතුළත් කරයි. (මෙම ඒකාබද්ධ වාර්තාවේ 254 සිට 280 දක්වා පිටුවල අවදානම් කළමනාකරණ වාර්තාවේ වැඩිදුරටත් විස්තර කරන පරිදි).

### 2025 තක්සේරුවට වර්ධනයන (2024 ට එදිරිව)

2024 ක්‍රමවේදය මත ගොඩ නැගෙමින්, පහත ක්‍රියාවලි මගින් 2025 නැවුම්ව ශක්තිමත් කරන ලදී :

- දේශගුණික/ආපදා ඉගෙනීම් (දිටිවා) වඩාත් පැහැදිලිව ගනුදෙනුකාර ප්‍රතිඵල, මෙහෙයුම් අඛණ්ඩතාව සහ කළඹ ඔරොත්තු දීම සමඟ ඒකාබද්ධ කිරීම.
- පැමිණිලි සහ මැසිවිලි පිළිබඳ අවබෝධය, ශාඛා මට්ටමේ ප්‍රතිපෝෂණ, විශේෂයෙන් බලපෑමට ලක් වූ කලාපවලින් සහ සමාජ මාධ්‍ය සංඥා නියාමනය කිරීම. හාවිතා කරමින්, පාර්ශ්වකරුවන්ගේ යෙදවුම් තියුණු කිරීම,
- අවදානම් ලේඛනයට පැහැදිලි සිතියම්ගත කිරීම, අවදානම් රුචිය සහ ප්‍රාග්ධන/ ද්‍රවශීලතා සැලසුම් කිරීම ඇතුළුව අවදානම් නිර්මාණ ශිල්පයට සම්බන්ධතාවය ශක්තිමත් කිරීම.
- SLFRS S1 සහ SLFRS S2 සහ මහ බැංකුවේ තිරසාර මූල්‍ය මාර්ග සිතියම දෙසට පෙළග ැස්වීමේ මාර්ග ඇතුළුව මිණුම් සලකුණු කිරීම සහ අනාවරණය කිරීමේ සූදානම තියුණු කිරීම.
ක්‍රියාත්මක කිරීමේ ධාරිතාවය මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව සහ සේවා ගුණාත්මකභාවය සඳහා ප්‍රධාන සාධකයකි. කුසලතා හිඩැස්, ක්ෂය වීම සහ යහපැවැත්මේ අවදානම් මගින් පරිවර්තනය ප්‍රමාද කළ හැකිය, මෙහෙයුම් පාඩු වැඩි කළ හැකිය සහ පාරිභෝගික ප්‍රතිඵල දුර්වල කළ හැකිය (අවදානම සහ අවස්ථා පිටු 34 සිට 39 දක්වා, මානව ප්‍රාග්ධන පිටු 117 සිට 133 දක්වා බලන්න)

**සම්පත් වෙන්කිරීම**

තිරණාත්මක බඳවා ගැනීම්, භූමිකාව පදනම් කරගත් ඉගෙනුම් මාර්ග, නායකත්වය මාර්ග සහ අනුප්‍රාප්තික මෙවලම්, යහපැවැත්ම/ ආරක්ෂක වැඩසටහන් සහ සංස්කෘතික ගොඩනැඟීම යාන්ත්‍රණ සඳහා ප්‍රමුඛතා ආයෝජන. (මානව ප්‍රාග්ධනය පිටු 117 සිට 133 දක්වා බලන්න)

**උපායමාර්ගය ක්‍රියාවට නැංවීම සඳහා වූ ප්‍රධාන මැදිහත්වීම්**

- ඩිජිටල්, අවදානම්, ESG සහ දත්ත විෂයයන්හි ඉලක්කගත හැකියාවන් ඉහළ නැංවීම දියුණු කරන ලදී. තීරනාත්මක භූමිකාවන් සඳහා විශේෂඥ යෙදවුම් සඳහා සහාය වැඩි කරන ලදී.
- අඛණ්ඩ සූදානමට ඒකාබද්ධ කරන ලද යහපැවැත්ම සහ ආරක්ෂාව සමඟ නියැලීම සහ අභ්‍යන්තර සන්නිවේදන චර්යාවන් ශක්තිමත් කරන ලදී. (මානව ප්‍රාග්ධනය පිටු 117 සිට 133 දක්වා බලන්න)

**අප අපේක්ෂා කරන ප්‍රතිඵල**

- **කෙටි-මධ්‍ය කාලීන (අවුරුදු 1-5):** තිරණාත්මක කුසලතා ලබා ගැනීමේ හැකියාව ස්ථාවර කිරීම, සම්බන්ධතා චර්යාවන් ශක්තිමත් කිරීම, වෙනස්කම් හදා ගැනීම සහ සේවා වැඩි දියුණු කිරීම අනුකූලතාව.
- **දිගු කාලීන (අවුරුදු 5 ට වැඩි):** නායකත්ව ගැඹුරක් සහිත තිරසාර ඉගෙනුම් සංස්කෘතියක් සහ පරිවර්තනය සහ ඔරොත්තු දීමේ හැකියාව සඳහා සහාය වීමට අනුප්‍රාප්තික සූදානම. (මානව ප්‍රාග්ධන පිටු 117 සිට 133 දක්වා බලන්න)

KPI දර්ශක

වගුව 7

| | ඒකකය | 2025 | 2024 | 2023 |
|---|---|---|---|---|
| සේවක පිරිවැටුම් අනුපාතය | % | 2.3 | 3.8 | 3.7 |
| ස්වේච්ඡා පිරිවැටුම (තීරණාත්මක භූමිකාවන්) | % | 1.4 | 2.5 | 2.2 |
| සේවකයෙකු සඳහා පුහුණු වේලාවන් | පැය ගණන | 10.8 | 6.8 | 12.2 |
| අභ්‍යන්තර උසස්වීම් අනුපාතය | % | 8.4 | 12.6 | 0.1 |
| නොපැමිණීමේ අනුපාතය | % | 0.8 | N/A | N/A |

| | | |
|---|---|---|
| **සම්බන්ධිත මූලික කරුණු** | → | **3.1** කුසලතා ආකර්ෂණය කර ගැනීම/රඳවා තබා ගැනීම සහ අනාගතයට සූදානම් කුසලතා<br>**3.2** සේවක සෞඛ්‍යය, ආරක්ෂාව, යහපැවැත්ම සහ ඇතුළත් කරගන්නා සංස්කෘතිය |
| **ප්‍රධාන අවදානම්** | → | කුසලතා පරතරයන්, සේවකයන් ඉවත්වීම, පරිවර්තන ක්‍රියාවලීන් ප්‍රමාද වීම, ආරක්ෂාව සහ මනෝසමාජීය අවදානම් |
| **ප්‍රධාන අවස්ථාවන්** | → | ශක්‍යතා ඉහළ නැංවීම (ඩිජිටල්/අවදානම්/ESG/දත්ත), ඵලදායිතාවය, ශක්තිමත් සබඳතා සහ සේවා සංස්කෘතිය, නායකත්ව ගැඹුර |
| **ප්‍රාග්ධන** | → | මධ්‍යස්ථ: මූල්‍ය ප්‍රාග්ධනය, බුද්ධිමය ප්‍රාග්ධනය, සමාජ සහ සබඳතා ප්‍රාග්ධනය<br>ඉහළ: මානව ප්‍රාග්ධනය |
| **තිරසාර සංවර්ධන ඉලක්ක** | → | 3 GOOD HEALTH AND WELL-BEING, 4 QUALITY EDUCATION, 5 GENDER EQUALITY, 8 DECENT WORK AND ECONOMIC GROWTH, 10 REDUCED INEQUALITIES |

# උපායමාර්ගය සහ සම්පත් වෙන්කිරීම

**4** **අවදානම් සංස්කෘතිය, පාලනය සහ අනුකූලතා විනය**



**අපගේ අවධානය**

ශක්තිමත් පාලනයක්, අඛණ්ඩ අනුකූලතාවයක් සහ ඉහළ සදාචාරාත්මක ප්‍රමිතීන් පවත්වා ගැනීම හරහා පද්ධතිමය ස්ථාවරත්වය සහ විශ්වාසය තහවුරු කිරීම.

**එය වැදගත් වීමට හේතුව**

විශ්වාසය සහ ක්‍රියාත්මක වීමට බලපත්‍රය රඳා පවතින්නේ විනයගරුක පාලනය සහ අනුකූලතාවය මත ය. ඉහළ පරීක්ෂාවකට ලක් වූ පරිසරයක, දුර්වල පාලනයන් හෝ අනාවරණය කිරීමේ හිඩැස් නියාමන ප්‍රතිඵල, කීර්ති නාමයට හානි සහ මූල්‍ය අලාභ ඇති කළ හැකිය. (ආයතනික පාලන පිටු 231 සිට 253 දක්වා, අවදානම් කළමනාකරණ වාර්තාව පිටු 254 සිට 280 දක්වා බලන්න)

**සම්පත් වෙන්කිරීම**

පාලනය/ කමිටු චර්යාවන්, අනුකූලතා පරීක්ෂණ, වංචා/AML විශේෂඥ ධාරිතාව, සහභාගිත්වය සූදානම සහ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය යාන්ත්‍රණ සඳහා ප්‍රමුඛතා යෙදවීම. (ආයතනික පාලනය පිටු 231 සිට 253 දක්වා, මණ්ඩල විගණන කමිටු වාර්තාව පිටු 245 සිට 247 දක්වා බලන්න)

**උපායමාර්ගය ක්‍රියාවට නැංවීම සඳහා වූ ප්‍රධාන මැදිහත්වීම්**

- අධීක්ෂණ සහ උත්සන්න කිරීමේ චර්යාවන් ශක්තිමත් කරන ලදී, CDD/KYC වැඩිදියුණු කරන ලදී, අධීක්ෂණය සහ පරීක්ෂා කිරීම.
- වැඩිදියුණු කළ විනිවිදභාවය සහ විශ්වාසය ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාශීලී සම්බන්ධ වීම මගින් ආචාර ධර්ම සහ අනුකූලතා පුහුණුව සහ සහතික කිරීමේ පිළිවෙත් ශක්තිමත් කරන ලදී (මානව ප්‍රාග්ධන පිටු 117 සිට 133 දක්වා බලන්න)

**අප අපේක්ෂා කරන ප්‍රතිඵල**

- **කෙටි-මධ්‍ය කාලීන (වසර 1-5):** අධීක්ෂණ චර්යාවන් ශක්තිමත් කිරීම, වංචා/මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පාලන සහ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම, පාර්ශ්වකරුවන්ගේ සන්නිවේදනය සහ ප්‍රතිචාරාත්මක බව ඉහළ නැංවීම.
- **දිගුකාලීන (වසර 5 ට වැඩි):** කාර්යසාධන කළමනාකරණය සහ තීරණ ගැනීමේ පාලනය තුළට අවදානම් සංස්කෘතිය සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ කිරීම, විශ්වාසය මත පදනම් වූ සුවිශේෂීත්වය තහවුරු කිරීම.

## KPI දර්ශක

වගුව 8

| | ඒකකය | 2025 | 2024 | 2023 |
|---|---|---|---|---|
| නියාමන උල්ලංඝනය කිරීම් | සංඛ්‍යා | **ශූන්‍ය** | ශූන්‍ය | ශූන්‍ය |
| අනුකූලතා ව්‍යතිරේක නියමිත වේලාවට | % | **100** | 100 | 100 |
| AML/CFT: STR/CTR නියමිත වේලාවට ඉදිරිපත් කිරීම් | % | **100** | 100 | 100 |

**සම්බන්ධිත මූලික කරුණු** →
- **4.1** පාලන විශිෂ්ටත්වය, අනුකූලතාවය සහ සදාචාරාත්මක හැසිරීම
- **4.2** මූල්‍ය අපරාධ, වංචා සහ AML/CFT
- **4.3** විශ්වාසය, කීර්තිය සහ ක්‍රියාශීලී කොටස්කරුවන්ගේ සහභාගිත්වය

**ප්‍රධාන අවදානම්** → අනුකූල නොවීම/දඩ මුදල්, අඛණ්ඩතාව සහ හැසිරීම් අවදානම, වංචා/මුදල් විශුද්ධිකරණ (AML) උල්ලංඝනයන්, දුර්වල හෙළිදරව් කිරීම් සහ කීර්තිනාමයට එල්ලවන බලපෑම්.

**ප්‍රධාන අවස්ථාවන්** → විශ්වාසය මත පදනම් වූ අනන්‍යතාවය, දත්ත විශ්ලේෂණ මගින් මෙහෙයවනු ලබන පාලනයන්, වැඩිදියුණු කළ විනිවිදභාවය සහ පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය.

**ප්‍රාග්ධන** → මධ්‍යස්ථ: මූල්‍ය ප්‍රාග්ධනය | ඉහළ: මානව ප්‍රාග්ධනය, බුද්ධිමය ප්‍රාග්ධනය, සමාජ සහ සබඳතා ප්‍රාග්ධනය.

**තිරසාර සංවර්ධන ඉලක්ක** →



## උපායමාර්ගය සහ සම්පත් වෙන්කිරීම

**5** **ඩිජිටල් ත්වරණය සහ දත්ත පදනම් කරගත් බැංකුකරණය**




**අපගේ අවධානය**

තාක්ෂණික නවීකරණය හරහා පාරිභෝගික අත්දැකීම ඉහළ නැංවීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීම සහ දත්ත විශ්ලේෂණය මත පදනම්ව තීරණ ගැනීම.

**එය වැදගත් වීමට හේතුව**

වේගයෙන් වෙනස් වන පාරිභෝගික ඉල්ලීම් සහ තරඟකාරී පරිසරය තුළ ඩිජිටල්කරණය අත්‍යවශ්‍ය වේ. දත්ත පදනම් කරගත් තීරණ ගැනීම මගින් අවදානම් වඩාත් නිවැරදිව කළමනාකරණය කිරීමටත්, මෙහෙයුම් පිරිවැය අඩු කිරීමටත් හැකි වේ.

**සම්පත් වෙන්කිරීම**

ප්‍රමුඛතා ආයෝජන අතරට ඩිජිටල් වේදිකා, සයිබර්/පෞද්ගලිකත්ව පාලනයන්, දත්ත ගෘහ නිර්මාණ ශිල්පය, ආකෘති පාලනය, DR/BCP පරීක්ෂා කිරීම සහ විකුණුම්කරු/බාහිරකරණ සහතික කිරීම ඇතුළත් වේ. (බුද්ධිමය ප්‍රාග්ධන පිටු 134 සිට 143 දක්වා බලන්න)

**උපායමාර්ගය ක්‍රියාවට නැංවීම සඳහා වූ ප්‍රධාන මැදිහත්වීම්**

- ශක්තිමත් DR/BCP පරීක්ෂණ, සයිබර් අධීක්ෂණය, ප්‍රවේශ පාලනය පරිණතභාවය සහ සිදුවීම් සූදානම සමඟින් සර්ව නාලිකා ක්‍රියාත්මක කිරීම වේගවත් කරන ලදී.
- දැඩි විකුණුම්කරු පාලනය සහ අඛණ්ඩතා පරීක්ෂණ සමඟ ආරක්ෂිත විශ්ලේෂණ සම්මත කර ගැනීමට සහාය වීම සඳහා දත්ත පාලනය සහ ආකෘති පාලනයන් ශක්තිමත් කරන ලදී. (බුද්ධිමය ප්‍රාග්ධන පිටු 134 සිට 143 දක්වා බලන්න)

**අප අපේක්ෂා කරන ප්‍රතිඵල**

- **කෙටි-මධ්‍ය කාලීන (වසර 1-5):** ඩිජිටල් සේවා භාවිතය ඉහළ නැංවීම, පද්ධතිවල ක්‍රියාකාරී කාලය සහතික කිරීම, සයිබර් ආරක්ෂණ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම.
- **දිගුකාලීන (වසර 5 ට වැඩි):** වගකිවයුතු ස්වයංක්‍රීයකරණය සහ විශ්ලේෂණ පරිමාණය කිරීම, අඩු සේවා පිරිවැය, වැඩිදියුණු කළ තීරණ ගුණාත්මකභාවය සහ පාරිභෝගික අත්දැකීම්. (බුද්ධිමය ප්‍රාග්ධන පිටු 134 සිට 143 දක්වා බලන්න)

### KPI දර්ශක

වගුව 9

| | ඒකකය | 2025 | 2024 | 2023 |
|---|---|---|---|---|
| ඩිජිටල් ක්‍රියාකාරී පාරිභෝගිකයින් | සංඛ්‍යා | 801,437 | 618,314 | 401,812 |
| තිරණාත්මක පද්ධති ක්‍රියාකාරී කාලය (නාලිකා/හර) | % | 99.98 | 99.97 | N/A |
| සයිබර් ආරක්ෂණ සිදුවීම් (ප්‍රමාණාත්මක) | සංඛ්‍යා | ශූන්‍ය | ශූන්‍ය | ශූන්‍ය |
| DR/BCP පරීක්ෂණ සාර්ථකත්වය | % | 100 | 100 | 100 |

**සම්බන්ධිත මූලික කරුණු** →
- **5.1** ඩිජිටල් පරිවර්තනය සහ තොරතුරු තාක්ෂණ (IT) යටිතල පහසුකම්වල ඔරොත්තු දීමේ හැකියාව.
- **5.2** සයිබර් ආරක්ෂණය සහ දත්ත රහස්‍යභාවය.
- **5.3** මෙහෙයුම් විශිෂ්ටත්වය සහ ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය.

**ප්‍රධාන අවදානම්** → සයිබර් තර්ජන/දත්ත උල්ලංඝනයන්, තොරතුරු තාක්ෂණ බිඳවැටීම්/ආපදා ප්‍රතිසාධන (Disaster recovery) ගැටලු, පැරණි පද්ධති (Legacy systems) සඳහා වැයවන ඉහළ පිරිවැය, ඩිජිටල් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්, මූල්‍ය තාක්ෂණික (FinTech) සමාගම් හමුවේ වෙළඳපල කොටස අහිමි වීම.

**ප්‍රධාන අවස්ථාවන්** → සර්ව නාලිකා පරිමාණය සහ කාර්යක්ෂමතාව, වැඩිදියුණු කළ තීරණ ගැනීම/පුද්ගලීකරණය, වගකිවයුතු AI පාලනයන්, ශක්තිමත් ඔරොත්තු දීමේ හැකියාව සහ විකුණුම්කරු පාලනය

**ප්‍රාග්ධන** → මධ්‍යස්ථ: සමාජ සහ සබඳතා ප්‍රාග්ධනය | ඉහළ: මූල්‍ය ප්‍රාග්ධනය, මානව ප්‍රාග්ධනය, බුද්ධිමය ප්‍රාග්ධනය

**තිරසාර සංවර්ධන ඉලක්ක** →



# උපායමාර්ගය සහ සම්පත් වෙන්කිරීම

## 6 තිරසාරත්වය, දේශගුණික සහ ප්‍රජා ඔරොත්තු දීමේ හැකියාව



### අපගේ අවධානය

දේශගුණික/ආපදා ඔරොත්තු දීමේ හැකියාව මෙහෙයුම් සහ කළඹ තිරණ වලට ඒකාබද්ධ කිරීම, ප්‍රතිසාධන මූල්‍ය ධාරිතාව ශක්තිමත් කිරීම, පියවර කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ SLFRS S1 සහ SLFRS S2 සූදානම් තිරසාර පාලනය සහ හෙළිදරව් කිරීම් ප්‍රගතිය.

### එය වැදගත් වීමට හේතුව

දිට්වා සුළි කුණාටුව භෞතික බාධා, ණය ගැතියන්ගේ ආතතිය සහ අයකර ගැනීමේ අවශ්‍යතා යන ද්‍රව්‍යමය බව ශක්තිමත් කළේය. දේශගුණික අවදානම් ණය ගුණාත්මකභාවය, අඛණ්ඩතාව සහ කීර්ති නාමයට බලපෑ හැකි අතර, SLFRS S1 සහ SLFRS S2 අපේක්ෂාවන් සඳහා ශක්තිමත් පාලනයක්, පාලනයන් සහ තිරණ ගැනීමට ප්‍රයෝජනවත් හෙළිදරව් කිරීම් අවශ්‍ය වේ.

### සම්පත් වෙන්කිරීම

සම්පත් යෙදවීම ප්‍රමුඛතාගත ප්‍රතිසාධනය මූල්‍ය ධාරිතාව, ණය/ කළඹ ක්‍රියාවලීන්හි දේශගුණික ආවරණ, ESG දත්ත ගෘහ නිර්මාණ ශිල්පය සහ වාර්තාකරණ පාලනයන්, පියසටහන් කාර්යක්ෂමතාව වැඩසටහන් සහ ඔරොත්තු දීමේ හවුල්කාරිත්වයන්. (තිරසාරභාවය රාමුව පිටුව 60, බුද්ධිමය ප්‍රාග්ධන පිටු 134 සිට 143 දක්වා බලන්න)

### උපායමාර්ගය ක්‍රියාවට නැංවීම සඳහා වූ ප්‍රධාන මැදිහත්වීම්

- ණය ගැතියන්ට සහන සහ අයකර ගැනීම මූල්‍ය සැපයීම ඇතුළුව දිට්වා පසු ඔරොත්තු දීමේ ප්‍රතිචාරය සහ අඛණ්ඩතාව සැලසුම් ඉහළ නංවන ලදී.
- ESG පාලනය සහ වාර්තාකරණ පාලනය ප්‍රගතිශීලී කළඹ අවදානම් පරීක්ෂාව දැනුවත් කිරීම සමඟ, ප්‍රජා හවුල්කාරිත්වයන් සහ පාද සටහන් කාර්යක්ෂමතා ක්‍රියාමාර්ග මගින් සහාය දක්වන ලද SLFRS S1 සහ SLFRS S2 සහයෝගීතාවය ඉදිරියට ගියේය. (තිරසාරභාවය රාමුව පිටුව 60, ස්වාභාවික ප්‍රාග්ධනය පිටු 172 සිට 181 දක්වා බලන්න)

### අප අපේක්ෂා කරන ප්‍රතිඵල

- **කෙටි-මධ්‍ය කාලීන (වසර 1-5):** ප්‍රතිසාධන මූල්‍ය සහ සහන/ප්‍රතිව්‍යුහගත කිරීම ශක්තිමත් කිරීම, තක්සේරු කිරීම්වලට දේශගුණික සලකා බැලීම් ඇතුළත් කිරීම, ESG පාලනය සහ වාර්තා කිරීමේ සූදානම වැඩිදියුණු කිරීම, කාර්යක්ෂමතා ක්‍රියාමාර්ග නිරීක්ෂණය කිරීම.
- **දිගුකාලීන (වසර 5 ට වැඩි):** ක්‍රමානුකූලව දේශගුණික/ස්වභාවික අවදානම් තක්සේරුව සහ කළඹ මෙහෙයවීම වැඩි දියුණු කිරීම, ඔරොත්තු දීමේ හැකියාවට අනුකූලව නිෂ්පාදන ගැඹුරු කිරීම, විගණනය කළ හැකි හෙළිදරව් කිරීම් ශක්තිමත් කිරීම.

## KPI දර්ශක

එකුව 10

| | ඒකකය | 2025 | 2024 | 2023 |
|---|---|---|---|---|
| හරිත/තිරසාර මූල්‍ය වියදම් | රු. බිලියන | 1.0 | 4.0 | – |
| ESG/දේශගුණික පරීක්ෂණ ආවරණය (නව ණය දීම) | % | 100 | 100 | 100 |
| බලශක්ති පරිභෝජනය | GJ | 35,353 | 32,883 | 30,621 |
| කඩදාසි අඩු කිරීම/කඩදාසි රහිත භාවිතය | සංඛ්‍යා | 900,741 | 685,343 | N/A |

**සම්බන්ධිත මූලික කරුණු** →

- **6.1** දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව, ආපදා ප්‍රතිචාර සහ සාධාරණ සංක්‍රාන්ති මූල්‍යකරණය
- **6.3** මෙහෙයුම් පාරිසරික පියසටහන
- **6.4** මූල්‍ය කළඹෙහි ස්වභාවය, ජෛව විවිධත්ව බලපෑම්
- **6.5** ESG දත්ත ගුණාත්මකභාවය, විනිවිදභාවය සහ වාර්තා කිරීමේ සූදානම (SLFRS S1 සහ SLFRS S2)

**ප්‍රධාන අවදානම්** → සේවා කඩාකප්පල් කරන භෞතික අවදානම්, දේශගුණික ණය අවදානම (අංශ/කලාප නිරාවරණය, ඇපකර අස්ථාවරත්වය), සංක්‍රාන්ති අවදානම (ප්‍රතිපත්ති/වෙළඳපොළ මාරුවීම්), ප්‍රතිසාධනයෙන් වැඩිවන මෙහෙයුම් පිරිවැය, රක්ෂණ වාරික ඉහළ යාම, ඇනහිටීම් අතරතුර ගාස්තු ආදායම අහිමි වීමේ විභවය.
ESG දත්ත පරතරයන්/පාලන දුර්වලතා සහ හරිත සේදීමේ නිරාවරණය, ඉහළ ණය අලාභ ප්‍රතිපාදන, පීඩනකාරී අංශවලින් ශුද්ධ පොලී ආදායම අඩු වීම.

**ප්‍රධාන අවස්ථාවන්** → ඔරොත්තු දෙන ප්‍රතිසාධන මූල්‍ය, ඔරොත්තු දීමේ හැකියාව-පෙළගැස්වූ නිෂ්පාදන/ඇගයීම් ආවරණ, වැඩිදියුණු කළ අවදානම් මිලකරණය/කළඹ මෙහෙයවීම, පියවර කාර්යක්ෂමතාව, දේශගුණික-පෙළගැස්වූ ණය දීමෙන් නව පොලී සහ ගාස්තු ආදායම් මූලාශ්‍ර.
තිරණ-ප්‍රයෝජනවත් ESG ඒකාබද්ධ කිරීම සහ සහතික කිරීමේ සූදානම, ESG-සවිඥානික ආයෝජකයින්ගෙන් ප්‍රාග්ධනයේ විභව අඩු පිරිවැය, තිරසාර මූල්‍ය වෙළඳපොළවල් වෙත ප්‍රවේශය වැඩිදියුණු කිරීම.

**ප්‍රාග්ධන** → මධ්‍යස්ථ: නිෂ්පාදිත ප්‍රාග්ධනය, මානව ප්‍රාග්ධනය | ඉහළ: මූල්‍ය ප්‍රාග්ධනය, බුද්ධිමය ප්‍රාග්ධනය, සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය, ස්වභාවික ප්‍රාග්ධනය,

**තිරසාර සංවර්ධන ඉලක්ක** →





# සෑම ජීවන ගමනකම පදනම සවිබල ගැන්වීම

නිවසක් යනු හුදු නවාතැනක් පමණක් නොවේ. එය සුරක්ෂිතතාවය, අභිමානය සහ ජීවිතයේ සාර්ථකත්වය විඳහා දක්වන සලකුණකි. "පළමු නිවාස හිමියාගේ නිවාස ණය යෝජනා ක්‍රමය" (1st Homeowner Housing Loan Scheme) සහ පහසුවෙන් ප්‍රවේශ විය හැකි උකස් ණය නිෂ්පාදන හරහා, අරමුණක් සහිතව වෙහෙස මහන්සි වී ඉතිරි කළ ශ්‍රී ලාංකේය පවුල්වල නිවාස සිහිනය, ප්‍රත්‍යක්ෂ සන්ධිස්ථානයක් බවට පත් කිරීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව කටයුතු කරයි.

# කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය


ව්‍යාපාර අංශ සමාලෝචනය

80

මූල්‍ය ප්‍රාග්ධනය

90

නිෂ්පාදිත ප්‍රාග්ධනය

109

මානව ප්‍රාග්ධනය

117

බුද්ධිමය ප්‍රාග්ධනය

134

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

144

ස්වාභාවික ප්‍රාග්ධනය

172

# ව්‍යාපාර අංශ සමාලෝචනය

## කළමනාකාරිත්වයේ සිට මැනියහැකි වටිනාකම දක්වා


ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ව්‍යාපාර ආදර්ශය තුළින් ප්‍රධාන ව්‍යාපාර අංග හතරක් එනම් පාරිභෝගික බැංකුකරණ අංශය, ආයතනික බැංකුකරණ අංශය, ජාත්‍යන්තර බැංකුකරණ අංශය සහ භාණ්ඩාගාර අංශය ක්‍රියාත්මක කරයි.

මේ සියල්ල එක්ව රට තුළ ඉතුරුම් සංචලනය, වගකීම්සහගත ණයදීම, විදේශ විනිමය ගලාඒම්, සහ වෙළෙඳ පහසුකම් ඇති කිරීම සහ විනයානුකූල ද්‍රවශීලතාව සහ ආයෝජන කළමනාකරණය කරයි. 2025 දී, ගනුදෙනුකාර ප්‍රතිඵල, ඔරොත්තුදීම, ඩිජිටල් සක්‍රියකරණය සහ තිරසාර වටිනාකම් නිර්මාණය කෙරෙහි පැහැදිලි අවධානයක් සමඟ එක් එක් අංශය අපි ශක්තිමත් කළ අතර ඒ තුළින් සෑම ගනුදෙනුකාර ගමනකටම අඛණ්ඩව, විශ්වාසයෙන් සහ ආරක්ෂිතව අපි සහය වුනෙමු.

---

## 1. පාරිභෝගික බැංකුකරණ අංශය

### ප්‍රධාන කාර්යසාධන සුවිශේෂී අවස්ථා




| ශුද්ධ මෙහෙයුම් ආදායම | අංශයේ වත්කම් | අංශයේ වගකීම් |
|---|---|---|
| රු.බි. 47.36 | රු.බි. 441.63 | රු.බි. 1,575.41 |

### 1.1 අංශය පිළිබඳ දැක්මක්

පාරිභෝගික බැංකුකරණ අංශය බැංකුවේ කොඳුනාරටිය ලෙස පවතින අතර, එය ශ්‍රී ලාංකිකයින් අතර ඉතුරුම් සංස්කෘතියක් ඇති කිරීමේ අපගේ ප්‍රමුඛ අරමුණ ශක්තිමත් කරයි. 2025 දී, මෙම අංශය බැංකුවේ මූලික ස්ථාවර, අඩු පිරිවැය අරමුදල් මූලාශ්‍රය ලෙස සිය ස්ථානය ශක්තිමත් කිරීම පමණක් නොව විනයගත ණය දීම සහ ශක්තිමත් ගනුදෙනුකාර වටිනාකම් කොටසක් තුළින් සිය ලාභදායිතාවයට සැලකියයුතු දායකයෙක්ද විය.

### 1.2 අප පිරිනමන දෑ

- **තැන්පතු නිෂ්පාදන:** ඉතුරුම් තැන්පතු, ස්ථාවර තැන්පතු, ජ්‍යෙෂ්ඨ පුරවැසි තැන්පතු යෝජනා ක්‍රම, විශ්‍රාම ගිණුම් සහ බාලවයස්කාර ගිණුම්.
- **ණය කළඹ:** නිවාස ණය, උකස් ණය, තැන්පතු මත ණය, පුද්ගලික ණය (උකස් පදනම් ණය ඇතුළුව) වාහන සහ කාර්ය මණ්ඩල ණය.
- **ඩිජිටල් සහ ස්වයං සේවා:** NSB Mobile, NSB PayApp, අන්තර්ජාල බැංකුකරණය, ATM/CDM ජාලය, ශාඛා බලගැන්වූ සහය ඩිජිටල් සේවා.

## ව්‍යාපාර අංශ සමාලෝචනය

### 1.3 මෙහෙයුම් සන්දර්භය 2025

**මෙහෙයුම් ධාවක**

- අඩු පොලී අනුපාත චක්‍රය පැවතීම
- සාර්ව ආර්ථික ස්ථායිකරණය සහ ගනුදෙනුකාර විශ්වාසය වර්ධනය
- ඩිජිටල් ස්වයං සේවාවන්ට වේගවත් මාරුවීම
- වංචා සහ සයිබර් අවදානම් ඉහළයාම
- වඩා ශක්තිමත් නියාමන අපේක්ෂාවන් (KYC/AML, දත්ත රහස්‍යතාව)
- පිරිවැය පීඩනය (තාක්ෂණය හා බෙදාහැරීම)

**බැංකුව කෙරෙහි බලපෑම**

- ආන්තික පීඩනය සහ වඩාත් අනුපාත-සංවේදී තැන්පතු හැසිරීම, ප්‍රතිමිලකරණයට අවස්ථාව සහ තියුණු අඩු පිරිවැය තැන්පතු
- නිවාස සහ පුද්ගලික ණය ඉල්ලුම් වැඩිවීම, විනයගත ප්‍රතිරක්ෂනයේ අවශ්‍යතාව.
- පහසු ඇතුළත්කරගැනීම්, ගෙවීම් සහ කාඩ්රහිත ගනුදෙනු සඳහා වැඩි අපේක්ෂාවන්, වඩා ඉහළ ලබාගැනීමේ අවශ්‍යතා.
- සහතික කිරීමේ විනය, නියාමනය සහ ගනුදෙනුකාර දැනුවත්කම සඳහා වැඩි වූ අවශ්‍යතාව.
- ගනුදෙනුකාර ගනුදෙනු හරහා වඩා දැඩි පාලනයන්, නියාමනය සහ ලේඛනගත කිරීම.
- ඩිජිටල්කරණය හා ක්‍රියාවලි සරලකරණය තුළින් ආදායමට පිරිවැය ප්‍රශස්ථ කිරීමේ අවශ්‍යතාව.

### 1.4 උපායමාර්ගික ප්‍රමුඛතා සහ ප්‍රතිචාර රාමුව

| උපායමාර්ගික අවධානය | ප්‍රධාන අවදානම්/අවස්ථා | 2025 දී බැංකුවේ ප්‍රතිචාරය |
|---|---|---|
| **අඩු පිරිවැය තැන්පතු පදනම ශක්තිමත් කිරීම** | **අවදානම** අනුපාත සංවේදී ගනුදෙනුකරුවන් අඩුවීම.<br>**අවස්ථාව** ද්‍රවශීලතාව වැඩිකර අරමුදල්වල පිරිවැය අඩු කරයි. | ඉලක්කගත තරුණ සහ කාන්තා කේන්ද්‍රීය ඉතුරුම් වර්ධනය, වැඩසටහන් මෙහෙයවූ තැන්පතු යෙදවීම, සහ රඳවාගැනීම් වර්ධනයට ඩිජිටල් සහභාගිත්වය. |
| **ඩිජිටල් යොදා ගැනීමේ ආරක්ෂාව වැඩි කිරීම** | **අවදානම** වංචාව, කාලය අඩුවීම සහ යොදා ගැනීමේ පරතර.<br>**අවස්ථාව** වඩා අඩු ඒකක පිරිවැය සහ අත්දැකීම් වර්ධනය. | ශාඛාවලදී ඩිජිටල් සහය, සේවා නියාමනය, සහ ශක්තිමත් ගනුදෙනු පාලනයන්. |
| **වගකීම්සහගත පාරිභෝගික ණය වර්ධනය** | **අවදානම** අනාරක්ෂිත ණයදීම් තුළ වඩා ඉහළ පැහැර හැරීම<br>**අවස්ථාව** උසස්-තත්ත්වයේ අත්තිකාරම් වැඩිවීම. | වැඩිකළ ණයගැති අවදානම් පැතිකඩ, ඇප පාදක වූ පුද්ගලික ණය දීමේ අවධානය, ශක්තිමත් ආපසු අයකිරීම්, සහ පිරිපහදු උකස් කළඹ. |
| **ගනුදෙනුකාර ආරක්ෂාව සහ නිෂ්පාදන පාලනය** | **අවදානම** අහිතකර ගනුදෙනුකාර ප්‍රතිඵල හා පැමිණිලි.<br>**අවස්ථාව** දිගුකාලීන විශ්වාසය ගොඩ නැගීම. | ගාස්තුව/කාලීන පැහැදිලි සමාලෝචන, පැමිණිළිවල මූලික හේතු විනය, සේවා යලිසැකසුම් කාර්යයන් සහ කාර්ය මණ්ඩලය මෙහෙයවීම. |
| **දත්ත සහ වාර්තාකරන විනය** | **අවදානම** වැරදි වාර්තාකරණය හා ව්‍යාජ විචල්‍යතා<br>**අවස්ථාව** වඩා වේගවත්, වැඩි තීරණවලට ඵලදායී කළමනාකරණ තොරතුරු පද්ධති | ප්‍රධාන බිඳවැටීම් සඳහා ප්‍රතිසන්ධාන චර්යාවන් සහ මූලාශ්‍ර ඒකක සමඟ ව්‍යතිරේක-නායකත්වය දරන පසු විපරම්. |

### 1.5 සම්පත් වෙන් කිරීම සහ සක්‍රීයකරුවන්

පාරිභෝගික බැංකුකරණ අංශය විශාලතම වගකීම් උත්පාදකය සහ ප්‍රධාන ඉපයීම් යන්ත්‍රයක් ලෙස පවතී. මෙය ආංශික වගකීම්වලින් 92%කින් සහ ආංශික වත්කම්වලින් 24%කින් සමන්විත වේ. සම්පත් වෙන් කිරීම උත්තෝලන හතරක් එනම් පිරිස් හැකියාව, තාක්ෂණය සහ යටිතල පහසුකම්, අවදානම් ප්‍රාග්ධනය සහ පාලනයන් සහ ගනුදෙනුකාර ප්‍රවේශය හරහා ඉදිරිපත් කෙරේ. එමඟින් අංශයේ ගමන ක්‍රියාත්මක කිරීමේ යථාර්ථයට සම්බන්ධ වේ.

- **ජාතික මට්ටමේ බෙදාහැරීම:** පහසුව වර්ධනය සඳහා ශාඛා ජාලය සමඟ තැපැල් කාර්යාල (ePost) සහ සතිඅන්ත බැංකුකරණය තුළින් පුළුල්කළ ප්‍රවේශය.
- **තාක්ෂණය:** වේගය සහ විශ්වාසය වර්ධනය සඳහා ප්‍රධාන බැංකුකරණ නවීකරණය, API ගේට්වේ හැකියාව සහ ඩිජිටල් වැඩි දියුණු කිරීම්වල අබණ්ඩ ආයෝජනය.
- **සේවකයින්:** ඉදිරිපෙළ සේවා හැකියාව නගාසිටුවීම (ඩිජිටල් ඇතුළත්වීමේ සහය, සේවාවල තත්ත්වය පුහුණු කිරීම) සහ විශේෂිත ශක්තිමත් කිරීම් (වංචා, සයිබර්, විශ්ලේෂණ).
- **පාලනයන්:** ශක්තිමත් කළ KYC/AML ක්‍රම, ප්‍රධාන ක්‍රියාවලි මත සලකුණුකරු - පරීක්ෂක අනුමැතීන්, සහ MIS සහ වාර්තාකරණ වක්‍රවල ව්‍යතිරේක පදනම් දත්ත වලංගුකරණය
- **අලෙවිකරණය:** මූල්‍ය සාක්ෂරතා බලපෑම් විසින් සහයවන තැන්පතු සේවයේ යෙදවීම සහ ඩිජිටල් යොදා ගැනීම සඳහා ඉලක්කගත වැඩසටහන්.

## 1.6 සම්පත් වෙන් කිරීම සහ සක්‍රීයකරුවන්

පාරිභෝගික බැංකුකරණ අංශය විශාලතම වගකීම් උත්පාදකය සහ ප්‍රධාන ඉපයීම් යන්ත්‍රයක් ලෙස පවතී. මෙය ආංශික වගකීම්වලින් 92%කින් සහ ආංශික වත්කම්වලින් 24%කින් සමන්විත වේ. සම්පත් වෙන් කිරීම උත්තෝලන හතරක් එනම් පිරිස් හැකියාව, තාක්ෂණය සහ යටිතල පහසුකම්, අවදානම් ප්‍රාග්ධනය සහ පාලනයන් සහ ගනුදෙනුකාර ප්‍රවේශය හරහා ඉදිරිපත් කෙරේ. එමඟින් අංශයේ ගමන ක්‍රියාත්මක කිරීමේ යථාර්ථයට සම්බන්ධ වේ.

### තැන්පතු සංචලනය: ශක්තියේ ප්‍රධාන ප්‍රතිඵලය

පාරිභෝගික තැන්පතු පදනම පසුගිය වසරේ මෙම කාලසීමාවට වඩා 6.4%ක වර්ධනයකින් සමඟ රු. බිලියන 1,575 ඉක්මවමින් වසර තුළ සන්ධිස්ථානයක් වාර්තා කළේය. මෙම වර්ධනය උග්‍ර තරඟකාරී අඩු පොලී අනුපාත වාතාවරණයක් තුළ සාක්ෂාත් කරගෙන ඇත. අපගේ උපායමාර්ගය සක්‍රිය සම්බන්ධතා කළමනාකරණය සඳහා අක්‍රිය සමුච්චිතකරණයෙන් ඉදිරියට විතැන්වීමකි.

- **සම්බන්ධතා තියුණු කිරීම:** NSB සමඟ ඉතිරිකිරීමේ ආරක්ෂාව සහ දිගුකාලීන ප්‍රතිලාභ අවධාරණය කරන ඉලක්කගත ව්‍යාපාර හරහා අපි අපගේ විශාල පාරිභෝගික පදනම සම්බන්ධ කර ගත්තෙමු. කාන්තාවන් සඳහා NSB ස්ත්‍රී ඉතුරුම් ගිණුම සහ පවුල් සමඟ ශක්තිමත්ව ප්‍රචලිත බාලවයස්කාර ඉතුරුම් ගිණුම් සඳහා වැඩිකළ අංග ඇතුළුව ප්‍රධාන අංශ සඳහා ගලපනලද යෝජනා අපි උපායමාර්ගිකව නැවත දියත් කළෙමු. එහි ප්‍රතිඵලයක් ලෙස, බැංකුවේ අඩු පිරිවැය සහ ස්ථාවර අරමුදල් මූලාශ්‍ර ලෙස සේවය කරන ඉතුරුම් තැන්පතු රු. බිලියන 331 දක්වා ලඟාවෙමින් 2024ට වඩා 10.4%කින් වර්ධනය විය.
- **ඩිජිටල් යොදා ගැනීම මෙහෙයවීම:** ගනුදෙනුකාර මනාපයන්ගේ වෙනස්වීම හඳුනාගනිමින්, අපගේ ඩිජිටල් බැංකුකරණ වේදිකාවන් වෙත පාරිභෝගික ගනුදෙනුකරුවන් ඇතුළත් කර ගැනීමේ උත්සාහයන් අපි වැඩි කළෙමු. අලුතින් බැංකුවට පැමිණෙන ගනුදෙනුකරුවන් සඳහා සරල කරන ලද ස්වයං ඇතුළත්කිරීමේ මාර්ගය හඳුන්වාදීම තුළින් ගැටීමේ සහ අත්කරගැනීමේ පිරිවැය අඩු කර ඇත. බොහෝ දෙනෙකුගේ ප්‍රධාන සම්බන්ධතා ස්ථානය ලෙස ශාඛාව පැවතුනද, ශේෂ විමසීම්, අරමුදල් මාරු කිරීම් සහ බිල්පත් ගෙවීම් සඳහා අපගේ ජංගම යෙදුම භාවිතයේ ස්ථාවර වැඩිවීමක් අපට දක්නට ලැබුණු අතර, අනාගත කාර්යක්ෂමතාව ඉහළ යාම සඳහා අඩිතාලම දැමීය.

### ණය දීම: පාරිභෝගික කේන්ද්‍රීය අවධානයක් සහිතව දූරදර්ශී ව්‍යාප්තිය

පාරිභෝගික ණය කළඹ පසුගිය වසරේ රු. බිලියන 426 සිට 2025 මූල්‍ය වර්ෂය තුළ රු. බිලියන 442 දක්වා පුළුල් වී ඇති අතර, ඉන් අලුත්කළ ණය ඉල්ලුම ග්‍රහනයකර ගැනීම සඳහා අපගේ ක්‍රමාංකන ප්‍රවේශය පිළිබිඹු කරයි. අපගේ වර්ධනය තිරසාර බවත් අගය වැඩිවන බවත් සහතික කරමින්, පාරිභෝගිකයින්ට උපරිම සහාය ලබා දීම කෙරෙහි අපි අවධානය යොමු කළෙමු.

- **නිවාස ණය:** නිවාස මූල්‍ය ප්‍රධාන නිෂ්පාදනයක් ලෙස පවතී. ඉල්ලුම උත්තේජනය කිරීම සඳහා, නිශ්චල දේපල අංශය සමඟ අපගේ සහයෝගය අපි ශක්තිමත් කළෙමු. වසර තුළ, බැංකුව ප්‍රධාන පෙළේ සහාධිපත්‍ය සංවර්ධකයින් සමඟ අපි අවබෝධතා ගිවිසුම් අත්සන් කළෙමු. මෙම හවුල්කාරිත්වයන් අපට විශේෂිත ගනුදෙනුකරුවන්ට මනාප පොලී අනුපාත, අඩු කළ සැකසුම් ගාස්තු සහ කැපවූ සහාය ලබා දීමට හැකියාව ලබා දුන්නේය. මෙම ක්‍රියාශීලී මැදිහත්වීම සෞඛ්‍ය සම්පන්න බෙදාහැරීම් වලට හේතු වූ අතර නිවාස කළඹේ සමස්ත වර්ධනයට දායක විය.
- **උකස් ණය:** රන් මිල ගණන්වල අබණ්ඩ ඉහළ යාමේ ප්‍රවණතාවය සහ NSB හි සුරක්ෂිත සහ විනිවිද පෙනෙන උකස් සේවාවේ ආවේණික ආකර්ෂණය හේතුවෙන් 2025 දී උකස් කළඹ සුවිශේෂී කාර්ය සාධනයක් ලබා දුන්නේය.

### ගනුදෙනුකාර ඩිජිටල් සවිබලගැන්වීම

පාරිභෝගික බැංකුකරණය සඳහා අපගේ ඩිජිටල් පරිවර්තනීය වැඩසටහන 2025 දී සැලකියයුතු සන්ධිස්ථානයක් අත්කරගෙන ඇත. අපි බැංකුකරණය වඩාත් සරල සහ පිවිසියහැකි බවට පත් කිරීම කෙරෙහි අවධානය යොමු කළෙමු.

- **වැඩිකළ ජංගම බැංකුකරණය:** බැංකුවේ ජංගම යෙදුම ඊ-ප්‍රකාශන නැරඹීම සහ ස්ථාවර උපදෙස් කළමනාකරණය කිරීම ඇතුළුව නව අංගවලින් යාවත් කරන ලදී. පරිශීලක අත්දැකීම කෙරෙහි මෙම අවධානය ඩිජිටල් ගනුදෙනු පරිමාවන් හි සලකුණුකළ වැඩිවීමකට හේතු විය.
- **වෙළෙඳ විසඳුම්:** මුදල් රහිත සමාජයකට මාරුවීමට සහාය වීම සඳහා, අපි අපගේ විකුණුම් ලක්ෂ්‍ය (POS) පර්යන්ත සහ NSB QR කේත විසඳුම් සිල්ලර වෙළෙන්දන් වෙත ආක්‍රමණශීලී ලෙස ප්‍රවර්ධනය කළෙමු. මේ තුළින් නව ගාස්තු ආදායමක් ජනිත කිරීම පමණක් නොව බැංකුව සාකල්‍ය මූල්‍ය හවුල්කරුවෙක් ලෙස ස්ථානගත කරමින් කුඩා ව්‍යාපාර පරිසර පද්ධතිය සමඟ අපගේ සහභාගිත්වය අපි තියුණු කර ඇත.

### වත්කම්වල තත්ත්ව කළමනාකරණය

ණයදීමේ පරිමාවන් විශාලනය කිරීමේදී, ශක්තිමත් වත්කම් තත්ත්වයක් පවත්වා ගැනීම සාකච්ඡා කළ නොහැකි ප්‍රමුඛතාවයකි. අපි දැඩි සත්‍යාපන ප්‍රමිති සවිබලගන්වා ඇති අතර අපගේ ණයදීමේ ලකුණු ආදර්ශ ශක්තිමත් කළෙමු. යම් පැහැර හැරීමේ ගිණුම් සම්බන්ධව මූලික මැදිහත්වීම සහ අවධානිත සහභාගිත්වය සහතික කිරීම සඳහා සුවිශේෂ අයකරගැනීමේ නියමයන් සහිතව ප්‍රාදේශීය ශාඛා සමඟ සමීපව කටයුතු කර ඇත.

මෙම විනයගත ප්‍රවේශය මගින් කළඹ තුළ ශක්තිමත් වර්ධනය එහි යහපතට වියදමක් නොවන බව සහතික කරයි.

### ඉදිරි ගමන් මඟ

පාරිභෝගික බැංකුකරණය සඳහා ඉදිරි දැක්ම තවදුරටත් ශක්තිමත් කිරීමට අපේක්ෂිත ගනුදෙනුකාර විශ්වාසය සමඟ ධනාත්මකව පවතී. මෙම අවධානය විශේෂයෙන්ම නිවාස ණය ඇතුළුව ණය වර්ධනය වේගවක් කිරීම කෙරෙහි මෙන්ම ගනුදෙනුකාර අත්දැකීම වැඩි කිරීමට සහ වගකීම් සම්බන්ධතා තියුණු කිරීමට ඩිජිටල් මෙවලම් භාවිතා කිරීම කෙරෙහිද වේ.

#### කෙටිකාලීන ප්‍රමුඛතා

- **විනිවිදයාම දැඩි කිරීම:** ඉලක්කගත ප්‍රවර්ධන වැඩසටහන් තුළින් නිවාස, පුද්ගලික, උකස් ණය හරහා ගලපන ලද ණයදීම පුළුල් කිරීම.
- **ඩිජිටල් ඇතුළත් කිරීම වේගවත් කිරීම:** සාමාන්‍ය ගනුදෙනු සහ ස්ථාවර තැන්පතු විවෘත කිරීම් සඳහා ගනුදෙනුකරුවන් ඩිජිටල් නාලිකා වෙත සංක්‍රමණය වීම වේගවත් කිරීම.
- **හවුල්කාරත්වයන් ශක්තිමත් කිරීම:** මූල්‍ය වෙළෙඳපලේ වඩා විශාල කොටසක් ග්‍රහනය කර ගැනීමට සංවර්ධකයින් සමඟ නව අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම.

#### මධ්‍ය කාලයේ සිට දිගුකාලීන ප්‍රමුඛතා


- **ඩිජිටල් නායකත්වය ස්ථාවර කිරීම:** අයදුම් කිරීමේ සිට මුදල් ගෙවීම දක්වා ප්‍රධාන ණය ක්‍රියාවලීන්හි ණය ක්‍රියාවලීන්හි අවසානය දක්වා ඩිජිටල්කරණය අත්කර ගැනීම.
- **අවදානම් රාමු ශක්තිමත් කිරීම:** සක්‍රීය කළඹ නියාමනය සහ මුල් අවවාද සංඥ හඳුනා ගැනීම සඳහා කෘතීම බුද්ධිය පදනම් විශ්ලේෂණ ක්‍රියාවට නැංවීම.
- **අනාගතයට සූදානම් සංවර්ධනය:** gig ආර්ථික ක්‍රියාකරුවන්ට ගලපනලද නිෂ්පාදන හඳුන්වාදීම සහ සූර්යබල සහ EV අංශ වෙත හරිත මූල්‍ය විකල්ප පුළුල් කිරීම.


## ව්‍යාපාර අංශ සමාලෝචනය


GRI 203-1

### 2. ආයතනික බැංකුකරණ අංශය

ප්‍රධාන කාර්යසාධන සුවිශේෂී අවස්ථා




| ශුද්ධ මෙහෙයුම් ආදායම | අංශයේ වත්කම් | අංශයේ වගකීම් |
|---|---|---|
| රු.බි. 5.38 | රු.බි. 166.12 | රු.බි. 11.83 |

#### 2.1 අංශය පිළිබඳ දැක්මක්

ආයතනික බැංකුකරණය, ජාතික සංවර්ධනයට ප්‍රමුඛතාවයන්ට අනුකූලව සකස් කරන ලද ව්‍යූහගත ණය, සින්ඩිකේෂන් සහ සකස් කළ ණය විසඳුම් සහිත විශාල ආයතනික, මූල්‍ය ආයතන සහ රජය සතු ව්‍යවසායන් සඳහා සහාය වේ. 2025 දී, මෙම අංශය අවදානම් මත පදනම් වූ මිලකරණය, කළඹ සාන්ද්‍රණය පාලනයන් සහ ESG පරීක්ෂණ විනය ශක්තිමත් කරන අතරතුර, යටිතල පහසුකම් සහ පුනර්ජනනීය බලශක්තිය සඳහා තෝරාගත් නිරාවරණය පුළුල් කළේය.

#### 2.2 අප පිරිනමන දෑ

- **කාරක ප්‍රාග්ධනය:** කෙටි කාලීන ණය, චක්‍රීය පහසුකම් සහ ව්‍යූහගත සීමා.
- **කාලීන ණයදීම:** capex සහ ව්‍යාපෘති මූල්‍ය සඳහා මධ්‍ය සිට දිගුකාලීන ණය ලබා දේ.
- **ව්‍යූහගත මූල්‍ය:** ඒකාබද්ධ ණය, සුරුකුම්පත්කරණය, පුද්ගලික නිකුතු සහ ණයකර.
- **රාජ්‍ය අංශ මූල්‍යකරණය:** විචක්ෂණ සීමා තුළ රජයට අයත් ව්‍යවසාය, සහ රජය සම්බන්ධ ආයතන සඳහා ණය පහසුකම්.

#### 2.3 මෙහෙයුම් සන්දර්භය 2025

**මෙහෙයුම් ධාවක**

- ආර්ථික ස්ථායීකරණය සහ ප්‍රතිමූල්‍ය ඉල්ලුම
- පුනර්ජනනීය බලශක්තිය සහ යටිතල පහසුකම්වල වර්ධනය
- පොලී අනුපාත පහළයාම
- වඩා දැඩි නියාමන අපේක්ෂාවන් සහ ප්‍රාග්ධන විනය

**බැංකුව කෙරෙහි බලපෑම**

- ප්‍රතිව්‍යූහගතකරණය සහ දිගුකාලීන අරමුදල් සඳහා වඩා ඉහළ ඉල්ලුම සහ ශක්තිමත් මුදල් ප්‍රවාහ පදනම් තක්සේරුව සඳහා අවශ්‍යතාව.
- තිරසාර මූල්‍යකරණය පුළුල් කිරීමට අවස්ථාව, ව්‍යාපෘති වැඩි කිරීම සහ කළමනාකරණය කිරීමට ක්‍රියාත්මක කිරීමේ අවදානම.
- ණය ගැනීම සහ නැවත ගෙවීම දිරිමත් කිරීම සහ මිලකරණ ආදර්ශ සමඟ ආන්තික ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව.
- අවදානම් බර තැබූ වත්කම් ප්‍රශස්ත කිරීම, ගිවිසුම් ශක්තිමත් කිරීම සහ අධීක්ෂණය කිරීම.

## ව්‍යාපාර අංශ සමාලෝචනය

### 2.4 උපායමාර්ගික ප්‍රමුඛතා සහ ප්‍රතිචාර රාමුව

| උපායමාර්ගික අවධානය | ප්‍රධාන අවදානම්/අවස්ථා | 2025 දී බැංකුවේ ප්‍රතිචාරය |
|---|---|---|
| **කළඹ විවිධාංගීකරණය** | **අවදානම** රාජ්‍ය අංශයේ නිරාවරණවල සංකේන්ද්‍රණය, ජාතික ණය පුළුල් කිරීම කෙරෙහි රාජ්‍ය ප්‍රතිපත්ති උපදෙස්.<br>**අවස්ථාව** උසස් තත්ත්වයේ පුනර්ජනනීය බලශක්තිය සහ යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම. | නිරාවරණ සීමා, අංශයේ සීමා, සහ නිවාරණ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවල වැඩිකළ උත්පාදනය. |
| **අවදානම් මත පදනම් වූ ව්‍යුහගත කිරීම සහ මිලකරණය** | **අවදානම** සංකීර්ණ පහසුකම් වැරදි මිලකරණය.<br>**අවස්ථාව** ගාස්තු ආදායම සහ වඩා ශක්තිමත් අවදානම ගලපනලද ප්‍රතිඵල. | සුරැකුම්පත්කරණය සහ සින්ඩිකේෂන් සඳහා වැඩිදියුණු කළ මිලකරණ රාමු, ගිවිසුම් විනය සහ වැඩිදියුණු කළ ගනුදෙනු පාලනය. |
| **ESG - හා බැඳුණු ණයදීම** | **අවදානම** මූල්‍ය ව්‍යාපෘතිවල ESG සහ අනුකූලතා අසමත්වීම්.<br>**අවස්ථාව** උසස් තත්ත්වයේ පුනර්ජනනීය බලශක්තිය සහ යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම. | ඇගයීම සඳහා ESG ප්‍රේරක ඒකාබද්ධ කිරීම, වැඩිකළ නිසි පරීක්ෂාව, සහ වඩා ඉහළ අවදානම් ව්‍යාපෘති සඳහා නියාමනය. |
| **ගනුදෙනු ක්‍රියාවට නැංවීමේදී මෙහෙයුම් කාර්යක්ෂමතාව** | **අවදානම** ලේඛනගතකරණය සහ පාලන පරතර.<br>**අවස්ථාව** වඩා වේගවත් ගතවන කාලසීමාව. | බලය පවරන ලද ප්‍රසාධනය, සහ විගණක පරීක්ෂණ සමඟ සැකසුම්කරු පරීක්ෂක අනුමැතීන්. |

### 2.5 සම්පත් වෙන් කිරීම සහ සක්‍රීයකරුවන්

ආයතනික බැංකුකරණ අංශය මුළු ආංශික වත්කම්වලින් 10%කින් හා මුළු ආංශික වගකීම්වලින් 1%කින් සමන්විත වේ. සම්පත් වෙන් කිරීම උත්තෝලන හතරක් එනම් සේවක හැකියාව, තාක්ෂණය සහ යටිතල පහසුකම්, අවදානම් ප්‍රාග්ධනය සහ පාලනයන් සහ ගනුදෙනුකාර ප්‍රවේශය හරහා ඉදිරිපත් කෙරේ. එමඟින් අංශයේ ගමන ක්‍රියාත්මක කිරීමේ යථාර්ථයට සම්බන්ධ වේ.

- **කැපවූ සබඳතා කණ්ඩායම.**
- **ණය අවදානම් ප්‍රවිනත්වය:** ක්ෂේත්‍රය අවධානිත පුහුණු කිරීම් සහ ශක්තිමත් ඇගයීම් මාර්ග තුළින් නගා සිටුවීම.
- **මූලික බැංකුකරණ ආයතනික ණය මොඩියුලය:** පිරිසැකසුම්කරණය, ලේඛනගතකිරීම පරීක්ෂාව සහ නියාමන අවරෝහය වර්ධනය කිරීම ක්‍රියාවට නංවයි.
- **පාලනය:** ඉහළ වටිනාකම/සංකීර්ණ ගනුදෙනු සඳහා ලේඛනගත ලිපි, ගනුදෙනු සමාලෝචන සමඟ බලතල බෙදීම වැඩි කිරීම.
- ESG සක්‍රීයකරණය: ESRM ප්‍රතිපත්තිය භාවිතය, ව්‍යාපෘති පිරික්සුම් මෙවලම් සහ පසු-වියදම් අධීක්ෂණ චර්යාවන්

### 2.6 කාර්යසාධන සමාලෝචනය

ආයතනික බැංකුකරණ අංශය රු. බිලියන 5.3ක බදු පෙර ලාභයක් වාර්තා කරමින් ශක්තිමත් කාර්යසාධනයක් ලබාදී ඇත. සෘජු ආයතනික ණයදීම සහ හාර සහතිකපත් සහ ණයකරවල ආයෝජනවලින් සමන්විත ණය කළඹ රු. බිලියන 166.1ක් විය.

### රූපියල්වලින් ණයදීම: තත්ත්වය සහ උපායමාර්ගික හවුල්කාරත්වයන් කෙරෙහි අවධානයක්

රු. බිලියන 58.8ක් වූ ආයතනික ණය කළඹ ණයවල තත්ත්වය සහ ජාතික ප්‍රමුඛතා සමඟ උපායමාර්ගික බැඳීම කෙරෙහි විශේෂ අවධානය සමඟ කළමනාකරණය කරන ලදී.

- **රජයට අයත් ව්‍යවසාය** (SOEs): බැංකුව උපායමාර්ගිකව වැදගත් රජයට අයත් ව්‍යවසාය වෙත ණය පහසුකම් පුළුල් කරමින් රජයට ප්‍රධාන මූල්‍ය හවුල්කරුවෙක් ලෙස සිය කාර්යභාරය පවත්වා ගන්නා ලදී. අපගේ සහභාගිත්වයන්ගෙන් රටේ යටිතල පහසුකම් සහ උපයෝගිතා අංශවලට අත්‍යවශ්‍ය වන මෙවැනි ආයතනවල මූල්‍ය ස්ථායිතාව සහ මෙහෙයුම් අඛණ්ඩතාවන් සහතික කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.
- **ව්‍යාපෘති මූල්‍ය:** ව්‍යාපෘති මූල්‍ය අවකාශය තුළ විශේෂයෙන් බලශක්තිය, සැපයුම් සහ ඉදිකිරීම් වැනි අංශවල ජාතික සංවර්ධන ඉලක්ක සමඟ සමපාත වන අවස්ථා අපි තෝරා බේරා ඇගයීමට ලක් කළෙමු. අපගේ ප්‍රවේශය වූයේ මූල්‍යමය වශයෙන් ශක්තිමත් අනුග්‍රාහකයින් සහ තිරසාර ප්‍රතිලාභ සහ ස්පෘශ්‍ය ආර්ථික ප්‍රතිලාභ ලබා දෙන හොඳින් ව්‍යුහගත ව්‍යාපෘති සමඟ හවුල් වීමයි.

### ගාස්තු පදනම් කටයුතු

ආයතනික අංශයෙන් ගාස්තු ආදායම වසරකට පෙර වාර්තාකළ රු.මිලියන 103 සිට රු. මිලියන 110 දක්වා වැඩි වූ අතර, මෙයට මූලික වශයෙන් සින්ඩිකේට් ගාස්තු සහ ණය පහසුකම්වලට අදාළ ගාස්තුවල වැඩිවීම හේතු විය. දැඩි තරඟකාරිත්වය කොමිස් අනුපාත මත පීඩනයක් ඇති කළ අතර, පුළුල්, සම්බන්ධතා පදනම් කරගත් විසඳුම් සැපයීම කෙරෙහි අපගේ අවධානය යොමු කිරීම, අරමුදල් මත පදනම් නොවන ආදායම් ප්‍රවාහයක් ස්ථාවරව පවත්වා ගැනීමට උපකාරී විය.

### ඉදිරි ගමන් මඟ

ආයතනික බැංකුකරණය සඳහා වන ඉදිරි දැක්ම දිරිගන්වන සුළු වන අතර, ආර්ථිකය ප්‍රසාරණය වන විට ණය ඉල්ලුම ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේවෙතත්, තරඟකාරී පීඩනයන් වැඩි වනු ඇත. බැංකුවේ අවධානය වන්නේ ක්‍රියාවලි ක්‍රමවත් කරමින් සහ සම්බන්ධතා දැඩි කරමින් රජයට අයත් ආයතන සහ උසස් තත්ත්වයේ ආයතන සඳහා විශ්වාසී හවුල්කරුවෙක් ලෙස සිය ස්ථානය ශක්තිමත් කිරීමයි.

#### කෙටිකාලීන ප්‍රමුඛතා


- **ගනුදෙනුකාර දැනුම වැඩි කිරීම:** ආයතනික ගනුදෙනුකාර අවශ්‍යතා පිළිබඳ අවබෝධය වැඩි කිරීමට සහ තිරස් විකුණුම් අවශ්‍යතා හඳුනා ගැනීමට දත්ත විශ්ලේෂණ යොදා ගැනීම.
- **කාලවේලාව ක්‍රමවත් කිරීම:** වඩා වේගවත් තීරණ ගැනීම සහතික කිරීමට සහ සේවාදායක ප්‍රතිචාර වර්ධනය කිරීමට අභ්‍යන්තර ණය අනුමත ක්‍රියාවලි සරල කිරීම.

#### මධ්‍ය කාලයේ සිට දිගුකාලීන ප්‍රමුඛතා

- **තිරසාර මූල්‍ය ගවේශණය:** ජාතික කාලගුණ අරමුණුවලට අනුකූලව සිය හරිත සංක්‍රාන්තිය තුළ ආයතනික සේවාදායකයින්ට සහයවීමට තිරසාරතාව හා බැඳුණු ණය ව්‍යුහගතකරණය ආරම්භ කිරීම.
- **අංශයේ ප්‍රවිනතාව දැඩි කිරීම:** වඩාත් දැනුම සහිත උපදේශන හා මූල්‍ය සහය ලබාදීමට පුනර්ජනනීය බලශක්තිය වැනි ඉහළ විභවතා ක්ෂේත්‍රවල විශේෂිත දැනුම ගොඩ නැඟීම.

## ව්‍යාපාර අංශ සමාලෝචනය

### 3. ජාත්‍යන්තර බැංකුකරණ අංශය
### ප්‍රධාන කාර්යසාධන සුවිශේෂී අවස්ථා




| ශුද්ධ මෙහෙයුම් ආදායම | අංශයේ වත්කම් | අංශයේ වගකීම් |
|---|---|---|
| රු.බි. 0.75 | රු.බි. 24.18 | රු.බි. 33.08 |

### 3.1 අංශය පිළිබඳ දැක්මක්

ජාත්‍යන්තර බැංකුකරණය ශ්‍රී ලංකාවේ විදේශ මුදල් ගලා ඒම සහ පාරිභෝගිකයින්ගේ දේශසීමා අවශ්‍යතා සඳහා සහාය වන ප්‍රේෂණ, වෙළඳ මූල්‍ය සහ අනුරූප බැංකුකරණය සඳහා පහසුකම් සපයයි. 2025 දී, මෙම අංශය අවධානය යොමු කළේ ප්‍රේෂණ ග්‍රහණය පුළුල් කිරීම, ඩිජිටල් නාලිකා හරහා පාරිභෝගික පහසුව වැඩිදියුණු කිරීම සහ AML/CFT සහ වාර්තාකරු-බැංකු විශ්වාසය ශක්තිමත් කිරීම කෙරෙහි ය.

### 3.2 අප පිරිනමන දෑ

- **විදේශ විනිමය ගිණුම්:** පුද්ගලික විදේශ විනිමය ගිණුම (NR), පුද්ගලික විදේශ විනිමය (R), ව්‍යාපාර විදේශ විනිමය ගිණුම, විශේෂ තැන්පතු ගිණුම් (SDA) සහ අභ්‍යන්තර ආයෝජන ගිණුම (IIA) සහ ප්‍රධාන ව්‍යවහාර මුදල්වලින් FCB.
- **අභ්‍යන්තර/බාහිර ප්‍රේෂණ:** SWIFT, හවුල්කාර හුවමාරු නිවාස සහ ඩිජිටල් මාර්ග.
- **වෙළෙඳ මූල්‍ය:** විදේශ විනිමය හුවමාරුව, ආනයන ණයවර ලිපි නිකුතුව, ආනයන බිල්පත් පිරි සැකසුම, සහ නාවික සහ ගුවන් භාණ්ඩ ඇප නිකුතුව.
- **අනුරූප බැංකුකරණය:** විවිධ ව්‍යවහාර මුදල් ගනුදෙනු සඳහා ගෝලීය හවුල්කාරත්වයන්.

### 3.3 මෙහෙයුම් සන්දර්භය 2025

| මෙහෙයුම් ධාවක | බැංකුව කෙරෙහි බලපෑම |
|---|---|
| ඉහළ ශ්‍රමික සංක්‍රමණය සහ ඩයස්පෝරා ගලාඒම් | අභ්‍යන්තර ප්‍රේෂණ ග්‍රහනය සහ විදේශ විනිමය තැන්පතු සේවයේ යෙදවීම වැඩිවීමේ අවස්ථාව. |
| අධ්‍යාපනය සහ සංචාර සඳහා පිටතට ගෙවීම් ඉහළයාම | පහසු බාහිර ප්‍රේෂණය සහ කාඩ්පත් විසඳුම්, වඩා ඉහළ අනුකූලතා සියුම් පරීක්ෂාව සඳහා ඉල්ලුම. |
| ගෝලීය අවදානම් අඩු කිරීමේ ප්‍රවණතා | අනුරූප බැංකු සම්බන්ධතා පීඩනයන්ගේ අවධානම, ශක්තිමත් අනුකූලතා විනිවිදභාවය අවශ්‍යය. |
| තත්‍ය කාලීන ඩිජිටල් මාරු කිරීම් සඳහා පාරිභෝගික අපේක්ෂාවන් | සුවිශේෂී ප්‍රේෂණ අත්දැකීම සහ වඩා වේගවත් පිරිසැකසුමක් සඳහා අවශ්‍යතාව. |

## ව්‍යාපාර අංශ සමාලෝචනය

### 3.4 උපායමාර්ගික ප්‍රමුඛතා සහ ප්‍රතිචාර රාමුව

| උපායමාර්ගික අවධානය | ප්‍රධාන අවදානම්/අවස්ථා | 2025 දී බැංකුවේ ප්‍රතිචාරය |
|---|---|---|
| **ප්‍රේෂණ පද්ධති ප්‍රසාරණය** | **අවදානම** හවුල්කාර කාර්යසාධනය සහ නියාමනය දැඩි කිරීම.<br>**අවස්ථාව** අභ්‍යන්තර ගලාඒම් වර්ධනය. | ශක්තිමත් හවුල්කාර කළමනාකරණය, විදේශීය ප්‍රවර්ධනය, සහ යවන්නන්/ලැබෙන්නන් සඳහා වර්ධිත ගනුදෙනුකාර දෘශ්‍යතාව. |
| **අනුරූප බැංකරණ ඔරොත්තුදීම** | **අවදානම** අවදානම් ඉවත් කිරීම සහ බේරුම්කරණ බාධා.<br>**අවස්ථාව** ගෝලීය ප්‍රවේශය ශක්තිමත් කිරීම. | වැඩිදියුණු කළ අවදානම් ශ්‍රේණිගත කිරීමේ මිනුම්, වැඩිදියුණු කළ අනුකූලතා වාර්තාකරණය සහ ප්‍රධාන හවුල්කරුවන් සමඟ විනිවිදභාවය. |
| **විවිධ දේශ සීමාවල ගනුදෙනුකරුවන් සඳහා ඩිජිටල් පහසුව** | **අවදානම** වංචා සහ මෙහෙයුම් දෝෂ.<br>**අවස්ථාව** වඩා යහපත් අත්දැකීම. | සුවිශේෂී ප්‍රේෂණ යෙදුමක් සඳහා මාත්‍රික මාර්ග සිතියම සහ පිරිසැකසුම සහ දැන්වීම තුළ වර්ධිත ස්වයංක්‍රියකරණය. |
| **AML/CFT සහ සම්බාධක විනය** | **අවදානම** නියාමන කඩකිරීම්.<br>**අවස්ථාව** විශ්වාසය සහ කීර්තිනාම ශක්තිය වැඩි කිරීම. | වඩා ශක්තිමත් නිවාරණ පාලනයන්, කාර්ය මණ්ඩල හැකියාව නගා සිටුවීම සහ වැඩිකළ නියාමනය/සහතික කිරීමේ පුරුදු. |

### 3.5 සම්පත් වෙන් කිරීම සහ සක්‍රීයකරුවන්

සම්පත් වෙන් කිරීම උත්තෝලන හතරක් එනම් සේවක හැකියාව, තාක්ෂණය සහ යටිතල පහසුකම්, අවදානම් ප්‍රාග්ධනය සහ පාලනයන් සහ ගනුදෙනුකාර ප්‍රවේශය හරහා ඉදිරිපත් කෙරේ. එමඟින් අංශයේ ගමන ක්‍රියාත්මක කිරීමේ යථාර්ථයට සම්බන්ධ වේ.

- **විදේශීය ව්‍යාපාර ප්‍රවර්ධනය:** හුවමාරු මධ්‍යස්ථාන හවුල්කරුවන් සමඟ නිලධාරීන් සහ ව්‍යූහගත සහභාගිත්වය.
- **ප්‍රධාන බැංකුකරණ සක්‍රීය ක්‍රියාවලිය:** මධ්‍යගත විදේශ විනිමය මෙහෙයුම් මත දුර්වල ඔරොත්තුදීම උසස් කිරීම සහ ශාඛා මට්ටමේ සේවා හැකියාව වර්ධනය.
- **අනුකූලතා වාර්තාකරණ වැඩි දියුණු කිරීම්:** ජාත්‍යන්තර ගනුදෙනු සඳහා (KYC, සම්බාධක නිරාවරණ, ගනුදෙනු නියාමනය, සහ විගණන පරීක්ෂණ).
- **ගනුදෙනුකාර සහභාගිත්ව වැඩසටහන:** විදේශීය ශ්‍රී ලාංකිකයින් සහ ශිෂ්‍ය ප්‍රේෂණ ඉලක්ක කිරීම

### 3.6 කාර්යසාධන සමාලෝචනය

ජාත්‍යන්තර බැංකුකරණය අංශය 2024 දී වාර්තාකළ රු. මිලියන 219ට අනුරූපීව රු. මිලියන 501ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත. අන්තර්ගාමී තැන්පතු සංචලනය සහ අතිරික්ත විදේශ මුදල් අඩු අවදානම් ස්ථානගත කිරීම්වල යෙදවීම යන අංශයේ ප්‍රධාන කටයුතු මගින් රුපියල් මිලියන 507 ක ශුද්ධ පොලී ආදායමක් සහ අපගේ ප්‍රේෂණ සහ වෙළඳ සේවා පිරිනැමීම්වල වටිනාකම අවධාරණය කරමින් පසුගිය වසරේ පැවති රු. මිලියන 77 ට වඩා රු. මිලියන 252 ක අනෙකුත් ආදායමක් ජනනය කරන ලදී.

#### තැන්පතු සංචලනය

අන්තර්ගාමී විදේශ විනිමය (NRFC) ගිණුම් සහ අන්තර්ගාමී විදේශ විනිමය (RFC) ගිණුම් වලින් සමන්විත අන්තර්ගාමී තැන්පතු කළඹ ප්‍රසංශනීය රු.බිලියන 33.1 කරා ලඟා විය. මෙම වර්ධනයට ශ්‍රී ලාංකීය ඩයස්පෝරා සහ අපගේ සම්බන්ධතාව දැඩි කිරීමට විවිධ කල්පවත්නා උපායමාර්ගයක් මගින් දායක විය.

- **ඉලක්කගත සහභාගිත්වය:** විදේශ විනිමය ඉපයීම් සඳහා වඩාත් විශ්වාසී ආරක්ෂිත මධ්‍යස්ථානයක් ලෙස බැංකුව සවිබල ගන්වමින් සංක්‍රමණික සේවකයින්ගේ පවුල් සමඟ නියමිත සම්බන්ධයක් පවත්වා ගැනීමට අපගේ පුළුල් ශාඛා ජාලය අපි භාවිතා කරමු.
- **සරලකළ ක්‍රියාවලි:** අපි අන්තර්ගාමීකයින් සඳහා ගිණුම් විවෘත කිරීමේ ක්‍රියාවලිය විධිමත් කළෙමු, ලේඛන කටයුතු සහ ආපසු හැරවීමේ කාලය අඩු කිරීම සඳහා ඩිජිටල් නාලිකා උපයෝගී කර ගත්තෙමු. බැංකුවේ ගිණුම්වලට වඩාත් වේගවත් සහ විශ්වාසී ප්‍රේෂණ ගලාඒම් සහතික කිරීමට ප්‍රධාන මැද පෙරදිග වෙළෙඳපොල තුළ ප්‍රමුඛ වුවමාරු මධ්‍යස්ථාන සහ හවුල්කාරත්වයන් ශක්තිමත් කරන ලදී.
- **වටිනාකම එකතුකළ සේවා:** අපගේ අන්තර්ගාමී තැන්පතුකරුවන් සඳහා වටිනාකම කොටස වැඩි කිරීමට තරඟකාරී පොලී අනුපාත පිරිනැමීම අපි අඛණ්ඩව සිදු කළෙමු.

#### වත්කම් යෙදවීම: විචක්ෂණශීලී ද්‍රවශීලතා කළමනාකරණය

අංශය විසින් සංචිතය කළ විදේශ විනිමය සම්පත් යෙදවීමේ ප්‍රධාන මාර්ගය වූයේ අනෙකුත් බැංකු සමඟ ස්ථානගත කිරීම් හරහා වන අතර එය රුපියල් බිලියන 24.2 ක් විය.

මෙම ගතානුගතික උපායමාර්ගය NSB හි සමස්ත අවදානම් කළමනාකරණ රාමුව සමඟ සමපාත වන අතර, විදේශ මුදල් වත්කම්වල ආරක්ෂාව සහ ද්‍රවශීලතාවයට ප්‍රමුඛත්වය දෙයි. වසර තුළ, විදේශ මුදල් සඳහා, විශේෂයෙන් අධ්‍යාපනය සහ වියදම් සඳහා, විභව පාරිභෝගික ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් ලබා ගත හැකි බව සහතික කරමින්, ප්‍රතිලාභ ප්‍රශස්ත කිරීම සඳහා අපි මෙම ස්ථානගත කිරීම්වල කාලසීමාවන් ප්‍රවේශමෙන් කළමනාකරණය කළෙමු.

#### ගාස්තු පදනම් කටයුතු: ප්‍රේෂණ හා වෙළෙඳාම

අංශය සඳහා ශුද්ධ ගාස්තු සහ වෙනත් ආදායම රු. මිලියන 252ක් වූ අතර එයට විශාල වශයෙන් ප්‍රේෂණ මෙහෙය වූ ගාස්තු සහ වෙළෙඳ සේවා අයකිරීම් හේතු විය.

- **අභ්‍යන්තර ප්‍රේෂණ ගලාඒම:** ප්‍රේෂණ ගලාඒම් ආර්ථිකයේ ප්‍රධාන ධාරාවක්ව අඛණ්ඩව පවතින අතර, ග්‍රාහකයින් සඳහා ගනුදෙනුකාර අත්දැකීම වැඩි කිරීම කෙරෙහි බැංකුව අවධානය යොමු කළේය. අපි බැංකුවේ ගිණුම්වලට සෘජු ණය ප්‍රවර්ධනය කළ අතර, එය මුදල් ගෙනයාම්වලට වඩා වේගවත්, ආරක්ෂිත, සහ වඩාත් පහසු විය. ඉලක්කගත වැඩසටහන් විදේශ විනිමය හෝ රුපියල් කාලීන තැන්පතුවල ප්‍රේෂණවල කොටසක් ඉතුරු කිරීමේ ප්‍රතිලාභ ඉස්මතු කරන ලදී.
- **වෙළෙඳ මූල්‍ය:** වෙළෙඳ මූල්‍ය සඳහා බැංකුවේ සෘජු නිරාවරණය සාපේක්ෂව මධ්‍යස්ථ වන අතර, ණයවර ලිපි සහ වෙනත් වෙළෙඳ ලියවිලි පහසුවෙන් සහ කාර්යක්ෂමව මෙහෙයවීම සහතික කිරීමට අපි අපගේ අනුරූප බැංකුකරණ සම්බන්ධතා ශක්තිමත් කර ඇත.

# ව්‍යාපාර අංශ සමාලෝචනය

**ඉදිරි ගමන් මඟ**

ජාත්‍යන්තර බැංකුකරණය පිළිබඳ ඉදිරි දැක්ම ධනාත්මකව පවතින අතර, තිරසාර ප්‍රේෂණ ගලා ඒම් සහ වෙළඳාම ක්‍රමයෙන් සාමාන්‍යකරණය වීම එයට සහාය වේ. වැඩිදියුණු කළ ඩිජිටල් මැදිහත්වීම තුළින් අනේවාසික තැන්පතු පදනම වර්ධනය කිරීම සහ ඩයස්පෝරා ප්‍රජාවට උසස් සේවාවක් සැපයීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

**කෙටිකාලීන ප්‍රමුඛතා**

- **ඩිජිටල් ඇතුළත්කර ගැනීම වර්ධනය කිරීම:** තාක්ෂණිකව දැනුවත් විදේශීය ශ්‍රී ලාංකිකයින් වෙත ලබාගැනීමට හැකිවන පරිදි PFCA (NR)/ PFCA (R) සහ RFC ගිණුම් විවෘත කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන් ඩිජිටල්කරණය කිරීම.
- **ප්‍රේෂණ කොරිඩෝව ශක්තිමත් කිරීම:** ප්‍රේෂණ ප්‍රවාහයන්ගෙන් විශාල කොටසක් අල්ලා ගැනීම සඳහා ප්‍රධාන මූලාශ්‍ර වෙළඳපොළවල විනිමය ආයතන සහ මූල්‍ය තාක්ෂණ චේදිකා සමඟ නව හවුල්කාරිත්වයන් ඇති කර ගැනීම.
- **ස්ථානගත ප්‍රතිපල ප්‍රසශ්න කිරීම:** දැඩි අවදානම් රුචියක් තුළ ප්‍රතිඵල ප්‍රසශ්ත කිරීමට විදේශ විනිමය ස්ථාපන කළඹ සක්‍රියව කළමනාකරණය කිරීම.


**මධ්‍ය කාලයේ සිට දිගුකාලීන ප්‍රමුඛතා**

- **අනුරූප ජාලය පුළුල් කිරීම:** වෙළෙඳ මූල්‍ය හැකියාවන් වැඩි කිරීමට සහ ගනුදෙනුකරුවන් සඳහා ගනුදෙනු පිරිවැය අඩු කිරීමට අනුරූප බැංකු ජාලය පුළුල් කිරීම.
- **උපදේශන සේවා ඒකාබද්ධ කිරීම:** ශ්‍රී ලංකාව තුළ ආයෝජන අවස්ථා සහ මූල්‍ය සැලසුම්කරණය කෙරෙහි අනේවාසික ගනුදෙනුකරුවන්ට අපි සුවිශේෂ උපදේශන සහය ලබා දීම.


## 4. භාණ්ඩාගාරය

### ප්‍රධාන කාර්යසාධන සුවිශේෂී අවස්ථා


භාණ්ඩාගාරය — ප්‍රස්ථාර 27





ලාභදායිතාව — ප්‍රස්ථාර 28




වත්කම් සහ වගකීම් — ප්‍රස්ථාර 29




රජයේ සුරැකුම්පත් කළඹ — ප්‍රස්ථාර 30




| ශුද්ධ මෙහෙයුම් ආදායම | අංශයේ වත්කම් | අංශයේ වගකීම් |
|---|---|---|
| රු.බි. 34.33 | රු.බි. 1,036.07 | රු.බි. 5.08 |

## ව්‍යාපාර අංශ සමාලෝචනය

### 4.1 අංශය පිළිබඳ දැක්මක්

භාණ්ඩාගාරය යනු ප්‍රතිලාභ ප්‍රශස්ත කරන අතරම ස්ථාවරත්වය ආරක්ෂා කිරීම සඳහා ද්‍රවශීලතාවය, ආයෝජන කළඹ, පොලී අනුපාත ස්ථානගත කිරීම සහ විදේශ විනිමය මෙහෙයුම් කළමනාකරණය කරන බැංකුවේ මූල්‍ය ස්නායු මධ්‍යස්ථානයයි. මෙම අංශය ALM විනය තහවුරු කරන අතර, නියාමන ද්‍රවශීලතා සූදානම සහතික කරමින් වෙළෙඳපොල කටයුතු කරමින් සහ රජයේ සුරැකුම්පත්වල සහභාගිත්වය තුළින් වඩා පුළුල් මූල්‍ය පද්ධතියකට සහය වේ.

### 4.2 අප පිරිනමන දෑ

- **රජයේ සුරැකුම්පත් වෙළෙඳාම:** භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල ප්‍රාථමික වෙළෙඳ නියෝජිත.
- **ස්ථාවර ආදායම් ආයෝජන කළමනාකරණය:** ස්වෛරී සුරැකුම්පත්වල ශූන්‍ය අවදානම් කළඹ
- **ස්කන්ධ ආයෝජන:** ස්කන්ධ ආයෝජනවල වෙළෙඳාම සහ ආයෝජනය
- **විදේශ විනිමය කළමනාකරණය:** ප්‍රධාන ව්‍යවහාර මුදල්වලින් ස්ථානීය, ඉදිරි සහ wap ගනුදෙනු.
- **ද්‍රවශීලතාව සහ පොලී අනුපාත අවදානම් කළමනාකරණය:** මුදල් ප්‍රවාහ පුරෝකථනය, ගැලපුම් කාලය සහ වැටයීම් උපකරණ තුළින්.
- **අන්තර්-බැංකු වෙළෙඳපොල සහභාගිත්වය:** ප්‍රති විකුණුම්/ප්‍රති මිලදීගැනීමේ වැඩපිළිවෙල.
- **අරමුදල් රැස්කිරීම:** ප්‍රශස්ත මූල්‍ය ස්ථාවරත්වය සහ සම්පත් ලබාගැනීමේ හැකියාව සහතික කිරීමට බැංකුවේ ද්‍රවශීල අවශ්‍යතා සමඟ උපායමාර්ගිකව බැඳුණු ණයකර හා බැඳුම්කර නිකුතුව තුළින් අරමුදල් රැස්කිරීමේ වැඩසටහන් සිදු කිරීම.

### 4.3 මෙහෙයුම් සන්දර්භය 2025

**මෙහෙයුම් ධාවක**

- අඩු පොලී අනුපාත සහ ඵලදා චක්‍ර විතැන්වීම්
- විදේශ විනිමය උච්ඡාවචනය සහ අගය කිරීමේ සිද්ධි
- පද්ධතියේ ද්‍රවශීලතා අසමමිතිය
- වෙළෙඳපොල අවදානම් පාලනය කෙරෙහි වඩා ඉහළ අපේක්ෂාවන්

**බැංකුව කෙරෙහි බලපෑම**

- ප්‍රති ආයෝජන පීඩනය සහ වෙළෙඳපොල තුළ ගතිකතා, සක්‍රිය කාලසීමාව කළමනාකරණයට අවශ්‍ය වේ.
- වෙළෙඳ හා ප්‍රත්‍යාගණන බලපෑම්, විනයගත ස්ථාන සීමා සඳහා අවශ්‍යතාව.
- කෙටිකාලීන මුදල් වෙළෙඳපොල වෙනස්වීම්, ශක්තිමත්කළ පුරෝකථනය සහ ඇප සූදානම අවශ්‍ය වේ.
- පීඩන පරීක්ෂාව, සීමා ආවේක්ෂණය හා විගණනය කිරීමේ අවශ්‍යතාව

### 4.4 උපායමාර්ගික ප්‍රමුඛතා සහ ප්‍රතිචාර රාමුව

| උපායමාර්ගික අවධානය | ප්‍රධාන අවදානම්/අවස්ථා | 2025 දී බැංකුවේ ප්‍රතිචාරය |
|---|---|---|
| **කළඹේ ආදායම් ප්‍රසශ්ත කිරීම** | **අවදානම** පහත වැටෙන අනුපාත නැවත ආයෝජන ප්‍රතිලාභ අඩු කරයි.<br>**අවස්ථාව** කාලසීමාව සහ චක්‍රය ස්ථාගත කිරීම. | කළඹ නැවත තුලනය, කාලසීමා කළමනාකරණය, සහ පීඩන පරීක්ෂාව සමඟ ALCO පදනම් ස්ථානගත කිරීම. |
| **විදේශ විනිමය ගනුදෙනුවල විනය ශක්තිමත් කිරීම** | **අවදානම** තියුණු ව්‍යවහාර මුදල් වෙනස්වීම්.<br>**අවස්ථාව** වර්ධිත ගනුදෙනුකාර අනුවර්තනය හා පැහිරීම්. | ක්‍රමාංකනය කළ ස්ථාන සීමාවන්, වැඩිදියුණු කළ මිලකරණ පාලනය සහ වැඩිදියුණු කළ සුපරීක්ෂාව. |
| **ද්‍රවශීලතා කළමනාකරණ මෙවලම් දැඩි කිරීම** | **අවදානම** ද්‍රවශීලතා පරතර.<br>**අවස්ථාව** වඩා අඩු අරමුදල් පිරිවැය සහ ශක්තිමත් ස්වාරක්ෂක. | වැඩිකළ කෙටිකාලීන පුරෝකථනය, ඇප ප්‍රසශ්තකරණය සහ නිරවුල් කිරීමේ කාර්යක්ෂමතාව. |
| **වෙළෙඳපොල අවදානම අතීශයින් පාලනය** | **අවදානම** උල්ලංඝනය කිරීම් සහ ඉපැයීම් අස්ථාවරත්වය.<br>**අවස්ථාව** වඩා ශක්තිමත් විශ්වාසය හා විනිවිදභාවය. | VaR සහ පීඩන පරීක්ෂාවන් හා බැඳුණු වෙළෙඳපොල අවදානම් උපකරණ පුවරුව, ශක්තිමත් මැදි කාර්යාල පාලනයන්. |

## 4.5 සම්පත් වෙන් කිරීම සහ සක්‍රීයකරුවන්

භාණ්ඩාගාර අංශය රජයේ සුරැකුම්පත්වල තැන්පතුවලින් 60%ක අවමයක් ආයෝජනය කිරීමේ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයට අනුකූල වෙමින් මුළු ආංශික වත්කම්වලින් 62.1% කට දායක වේ. සම්පත් වෙන් කිරීම උත්තෝලන හතරක් එනම් සේවක හැකියාව, තාක්ෂණය සහ යටිතල පහසුකම්, අවදානම් ප්‍රාග්ධනය සහ පාලනයන් සහ ගනුදෙනුකාර ප්‍රවේශය හරහා ඉදිරිපත් කෙරේ. එමඟින් අංශයේ ගමන ක්‍රියාත්මක කිරීමේ යථාර්ථයට සම්බන්ධ වේ.

- **තාක්ෂණය:** තත්‍ය කාලීන ස්ථාන පසු විපරම, සීමිත නියාමනය සහ සෘජු මාර්ග පිරිසැකසුම සඳහා භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය (TMS) ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ග සිතියම.
- **සේවකයින්:** සාර්ව විශ්ලේෂණ, අවදානම් විශ්ලේෂණ සහ බදු වත්කම් පන්ති කළමනාකරණය තුළ වෙළෙන්දා සහ මැදි කාර්යාලවල කුසලතා ඉහළ දැමීම, ALM/විදේශ විනිමය/ස්ථිර ආදායම තුළ ව්‍යූහගත වටමාරුව.
- **යටිතල පහසුකම්:** RTGS සහ LankaSecure සමඟ වැඩිකළ සම්බන්ධතාවය, වර්ධිත නිරවුල් කිරීමේ කාර්යක්ෂමතාව සහ ඇප කළමනාකරණය.
- **පාලනය:** ශක්තිමත්කළ ALCO සිරිත්, වෙළෙඳපොල අවදානම් උපකරණ පුවරුව, ස්වාධීන සීමා ආවේක්ෂණය, සහ ලාභ අලාභ ආරෝපනය.
- **පාලනයන්:** ලේඛනගත ගනුදෙනු ක්‍රියාපටිපාටි, සීමිත වෙනස්වීම් මත සැකසුම්කරු- පරීක්ෂක අනුමැතීන්, සහ කාලිනව පීඩන පරීක්ෂණ සහ ආපසු පරීක්ෂණ.

## 4.6 කාර්යසාධන සමාලෝචනය

භාණ්ඩාගාරය බැංකුවේ සමස්ථ ලාභදායිතාවයට විශාලතම දායකයා වූ අතර, රු. බිලියන 26.3ක ශක්තිමත් බදු පෙර ලාභයක් වාර්තා කර ඇත. මෙම අංශයේ ශුද්ධ පොලී ආදායම රු. බිලියන 33.9ක් වූ අතර එය එහි විශාල, ස්ථිර ආදායම කළඹ පිළිබඳ සිය ඵලදායී කළමනාකරණය සහ වෙළෙඳ ආදායම් ඉපයීමට සිය හැකියාව පිළිබඳ සාක්ෂියකි.

### ස්ථිර ආදායම් කළඹ කළමනාකරණය: සක්‍රීය සහ අනුවර්ති

භාණ්ඩාගාරය බැංකුවේ විශාලතම වත්කම් කළඹේ භාරකාරත්වය වන අතර, එය රු. බිලියන 1,036ක් වටිනා රජයේ සුරැකුම්පත් සහ වෙනත් ආයෝජනවලින් සමන්විත වේ. මෙම කළඹ බැංකුවේ පොලී ආදායමේ තනි විශාලතම මූලාශය වන අතර 2025 දී රු. බිලියන 121.8ක් උත්පාදනය කර ඇත.

- **උපායමාර්ගික වෙන් කිරීම:** වසර ආරම්භයේදී, අඩු වූ ණය වර්ධනයත් සමඟ, එය තවදුරටත් අඩුවීමට පෙර ඵලදායීන් ග්‍රහනය කිරීමට කළඹ ගොඩ නගමින් භාණ්ඩාගාරය උපායමාර්ගිකව අතිරේක ද්‍රවශීලතාව රජයේ සුරැකුම්පත්වල සේවයේ යොදවන ලදී. මෙම ඉදිරි පෙළ උපායමාර්ගය වසර මුළුල්ලේ පොලී ආදායමට ධනාත්මකව දායක විය.

- **ගතික ප්‍රතිස්ථානගත කිරීම:** පාරිභෝගික සහ ආයතනික බැංකුකරණ අංශවලින් ණය ඉල්ලුම වසර මැද සිට ඉදිරියට වේගවත් වූ බැවින්, භාණ්ඩාගාරය සිය උපායමාර්ගය විවර්තනය කරන ලදී. ගනුදෙනුකරුවන්ට ණයදීම රජයේ සුරැකුම්පත් මත අඩුවන ඵලදායට වඩා යහපත් අවදානම් ගලපන ලද ඵලදායන් පිරිනමන බව හඳුනා ගනිමින්, එය අපධාවය කරා කල්පිරෙන රජයේ සුරැකුම්පත් කළඹින් කොටසකට ඉඩ දෙන ලදී. මෙම අභ්‍යන්තර අරමුදල් ප්‍රතිවෙන් කිරීම බැංකුවේ පුළුල් ණය ප්‍රසාරණ ධාවකයට සහයවීමේදී සහ බැංකුවේ සමස්ථ ශුද්ධ පොලී ආන්තිකය ප්‍රසශ්ත කිරීමේදී තීරණාත්මක විය.

- **සක්‍රීය වෙළෙඳාම:** වසර පුරාම, භාණ්ඩාගාරය ප්‍රාග්ධන ලාභ උපලබ්ධිවීමට සහ පොලී ආදායමට සහයවීමට මිල උච්චාවචනය කෙරෙහි ප්‍රාග්ධනනියකරණය කරමින් ද්විතියික බැඳුම්කර වෙළෙඳපොල තුළ සක්‍රීය පැවැත්මක් පවත්වා ගෙන ඇත.

### විදේශ විනිමය කළඹ හා විදේශ විනිමය මෙහෙයුම්

බැංකුවේ විදේශ විනිමය ස්ථාවරය පිළිබඳ භාණ්ඩාගාරයේ කළමනාකරණය සමානව සාර්ථක විය.

- **ද්‍රවශීලතාව සහ සහය:** ශක්තිමත් ප්‍රේෂණ ගලාඒම හේතුවෙන් යහපත්ව පවත්වාගන්නා විදේශ විනිමය ද්‍රවශීලතාව සමඟ, බාධා නොමැතිව විදේශ විනිමය ගෙවීම් සහ වෙනත් තිරස් මායිම් ගනුදෙනු ඇති කරමින් භාණ්ඩාගාරයට බැංකුවේ ගනුදෙනුකරුවන්ට සහයවීමට හැකියාව ලැබී ඇත.

- **ගනුදෙනුකාර විදේශ විනිමය ගනුදෙනු:** වසර තුළ ගනුදෙනුකරුවන් පදනම් විදේශ විනිමය හුවමාරු ගනුදෙනුවල සැලකියයුතු වැඩිවීම මඟින් භාණ්ඩාගාරය ප්‍රතිලාභ ලබා ඇති අතර එයට වෙළෙඳ සහ සංචාර පෙරලා පැමිණීම හේතු විය. මෙය අංශයේ රු. බිලියන 1.6ක ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායමකට දායක විය.

### ද්‍රවශීලතාව සහ අරමුදල්කරණය

බැංකුව වසර මුළුල්ලේම බලකොටු වැනි ද්‍රවශීලතා තත්ත්වයක් පවත්වාගෙන ඇති බව භාණ්ඩාගාරය සහතික කර ඇත. LCR: රුපියල් සහ සියලුම ව්‍යවහාර මුදල් සහ NSFR අතුළුව සියලුම නියාමන ද්‍රවශීලතා අනුපාත පහසුවෙන්ම සපුරාලන ලදී. සෑම අවස්ථාවකදීම අරමුදල් පිරිවැය පරීක්ෂාකර තබා ගනිමින් අවශ්‍ය අවස්ථාවලදී ප්‍රති මිලදීගැනීමේ ගිවිසුම් (repo) තුළින් ආමන්ත්‍රණය කළ කෙටි කාලීන ද්‍රවශීලතා අවශ්‍යතා සමඟ බැංකුවේ පරමාර්ථවලට සහයවීමට අරමුදල්කරණය කළමනාකරණය කරන ලදී.

### ඉදිරි ගමන් මඟ

2026 සහ ඉන් ඔබ්බට භාණ්ඩාගාරයේ ඉදිරි දැක්ම වඩාත් ස්ථාවර නමුත් තරඟකාරී පොලී අනුපාත වාතාවරණයක් හරහා ගමන් කිරීම කෙරෙහි කේන්ද්‍ර වනු ඇත. ණය ඉල්ලුම ස්ථිරව පවතී යන අපේක්ෂාව සමඟ, බැංකුවේ සමස්ථ ප්‍රතිඵල ප්‍රසශ්ත කිරීමට ආයෝජන කළඹ හා ගනුදෙනුකාර ණයදීම අතර විවක්ෂණව තුලනාත්මක ද්‍රවශීලතාව කෙරෙහි අවධානය යොමු කරනු ඇත. පොලී අනුපාතය හා විදේශ විනිමය කළමනාකරණය ප්‍රමුඛව පවතිනු ඇත.

#### කෙටිකාලීන ප්‍රමුඛතා

- **වත්කම් වෙන්කිරීම ප්‍රසශ්ථ කිරීම:** අවශ්‍යයෙන්ව ඉහළයන පොලී අනුපාත ක්‍රියාදාමයක් තුළ ශුද්ධ පොලී ආන්තිකය උපරිම කිරීමට වත්කම්-වගකීම් මුසුව අඛණ්ඩව නැවත සකස් කිරීම.
- **අවදානම් කළමනාකරණ පද්ධති වැඩි කිරීම:** වඩාත් නවීන ක්‍රියාදාම විශ්ලේෂණ හා පිඩන පරීක්ෂාව ශක්තිමත් කිරීමට වත්කම්-වගකීම් කළමනාකරණ පද්ධතිය (ALM) උසස් කිරීම.
- **ගනුදෙනුකාර විදේශ විනිමය සහය දැඩි කිරීම:** සිය විදේශ විනිමය අවදානම් කළමනාකරණය කිරීමට ආයතනික සේවාදායකයින්ට ඉදිරි ආවරණ සහ වෙනත් වැටයීම් විසඳුම් ලබාදීමට හැකියාව.

#### මධ්‍ය කාලයේ සිට දිගුකාලීන ප්‍රමුඛතා

- **අරමුදල් මාර්ග පුළුල් කිරීම:** වගකීම් පදනම විවිධාංගීකරණයට සහ සංකේන්ද්‍රණ අවදානම අඩු කිරීමට නව අරමුදල් උපකරණ සහ මූලාශ්‍ර ගවේශනය කිරීම.
- **උසස් විශ්ලේෂණ සංවර්ධනය කිරීම:** වෙළෙඳපොල වෙනස්වීම් සහ වඩාත් ගතික කළඹ කළමනාකරණය පිළිබඳ පුරෝකථන විශ්ලේෂණ සඳහා කෘතිම බුද්ධිය සහ යන්ත්‍ර ඉගෙනුම.
- **ප්‍රාග්ධන කොටස ශක්තිමත් කිරීම:** රටේ ප්‍රමුඛ ඉතුරුම් බැංකුව ලෙස සහ අනාගත වර්ධන අපේක්ෂාවන් සඳහා සිය කාර්යභාරයට සහයවීමට බැංකුවේ දිගුකාලීන ප්‍රාග්ධන සැලසුම් කිරීම හා බැඳුණු භාණ්ඩාගාර උපායමාර්ග සහතික කිරීම.

# මූල්‍ය ප්‍රාග්ධනය



## සියලුම පාර්ශ්වකරුවන් සඳහා ස්ථාවරත්වය සහ වර්ධනය ඇති කිරීම

ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ මූල්‍ය ප්‍රාග්ධනය ගනුදෙනුකරුවන් විසින් අප වෙත පවරන ලද අරමුදල්, අපගේ කොටස්හිමි විසින් ලබාදුන් ප්‍රාග්ධනය සහ තිරසාර වර්ධනය සහ ඔරොත්තුදීමට රඳවාගත් ඉපයීම්වලින් සමන්විත වේ. මෙම සම්පත් එක්ව, තැන්පත්කරුවන්ට ආරක්ෂිතව සේවය කිරීමට, ජාතික සංවර්ධනයට සහාය වීමට, සේවා හැකියාව සඳහා ආයෝජනය කිරීමට සහ වෙනස්වන ආර්ථික චක්‍ර හරහා ඔරොත්තු දීමට බැංකුවට හැකියාව ඇති කරන මූල්‍ය පදනම සකස් කරයි. එබැවින් මූල්‍ය ප්‍රාග්ධනය බැංකුවට ලබාගතහැකි සම්පත් පමණක් නොව, එය ආරක්ෂා කර, සේවයේ යොදවා සහ අලුත් කර ඇති විනය ද පිළිබිඹු කරයි.

තැන්පත්කරුවන්ගේ විශ්වාසය ප්‍රමුඛ වන බැංකකරණ ආදර්ශයක් තුළ, මූල්‍ය ප්‍රාග්ධනය හුදෙක් ශේෂ පත්‍ර ප්‍රතිඵලයක් ලෙස සැලකීම පමණක් නොව, එය ඒකාබද්ධ පද්ධතියක් ලෙස කළමනාකරණය කරන අතර එහිදි බැංකුවේ වරම ආරක්ෂා කිරීමට සහ දිගුකාලීන වටිනාකම් නිර්මාණය දරාගැනීමට අරමුදල්වල ස්ථාවරත්වය, වත්කම්වල තත්ත්වය, ප්‍රාග්ධන ප්‍රමානාත්මතාව, ද්‍රවශීලතා ඔරොත්තුදීම, ලාභවල තත්ත්වය සහ වාර්තාකරණ සම්පූර්ණත්වය එක්ව කටයුතු කරයි.

බැංකුවේ මූල්‍ය ප්‍රාග්ධනය මූලිකවම කොටස්හිමි ප්‍රාග්ධනය ගනුදෙනුකාර තැන්පතු, රඳවාගත් ඉපයීම් සහ භාණ්ඩාගාර ආයෝජනවලින් සහ අවසරලත් ණයදීමේ කටයුතුවලින් උපයනලද ආදායම තුළින් හට ගනී. බැංකුවේ මූල්‍ය ආදර්ශයට ගනුදෙනුකාර විශ්වාසයේ ප්‍රමුඛ වැදගත්කම පාදක කර ගනිමින්, බැංකුවේ මූලික අරමුදල් මූලාශ්‍ර ලෙස ගනුදෙනුකාර තැන්පතු පවතී. මෙය කොටස්හිමි ප්‍රාග්ධනය සහ රඳවාගත් ඉපයීම් ස්ථීර අලාභ අවශෝෂණය කිරීමේ පදනම සපයන අතර එය ඔරොත්තුදීම, ශක්තිමත් කර, නියාමන ප්‍රමාණතාවයට සහය වෙමින් දිගු-කාලීන ස්ථාවරත්වය තහවුරු කරයි.

### උපායමාර්ගික කුළුණුවලට අදාළත්වය සහ වටිනාකම් නිර්මාණය

බැංකුව ගනුදෙනුකාර විශ්වාසය සුරක්ෂිත කරමින්, ගෘහස්ත ඉතුරුම් සේවයේ යොදවමින් සහ ජාතික සංවර්ධනයට සහ සේවා අඛණ්ඩතාවයට සහයවිමේදී විවක්ෂණව අරමුදල් යොදවමින් මූල්‍ය ප්‍රාග්ධනය ආරක්ෂා කර අලුත් කරයි.

**1 ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව සහ මූල්‍ය අන්තර්කරණය:**

තැන්පත්හිමි විශ්වාසය රඳවාගැනීම සහ අපගේ නිෂ්පාදන සහ සේවා හරහා දරාගතහැකිබව, විශ්වාසය, සහ මුදල් සඳහා වටිනාකම ආරක්ෂා කරමින් වඩා පුළුල් ප්‍රවේශය.

**2 තිරසාර වෙනදීය වර්ධනය හා කළඹ ප්‍රසශ්තකරණය:**

ප්‍රාග්ධනය විවක්ෂණශීලීව වෙන්කරමින්, වත්කම්වල තත්ත්වය වර්ධනය කරමින් සහ ස්ථාවර ඉපයීම් සහ ද්‍රවශීලතා ස්වාරක්ෂක පවත්වා ගනිමින් අපි දිගු-කාලීන වටිනාකම ශක්තිමත් කරමු.

**3 සේවක, සංස්කෘතිය සහ සහභාගිත්වයේ විශිෂ්ටත්වය:**

ප්‍රමුඛ සේවාබලකාය සහ ඵලදායිතා අවශ්‍යතාවන්ට අරමුදල් යොදවමින් අපි කාර්යසාධනය ශක්තිමත් කළ අතර, පිරිවැය විනය සහ සාධාරණ ප්‍රදාන ව්‍යුහයක් පවත්වාගෙන ඇත.

**4 අවදානම් සංස්කෘතිය, පාලනය සහ අනුකූලතා විනය:**

අපි ශක්තිමත් ප්‍රාග්ධනය, ද්‍රවශීලතාව තුළින්, විනය ප්‍රතිපාදනය කරමින් සහ විශ්වාසය ආරක්ෂා කරන අවදානම් රුචිය හා බැඳුණු තිරණ තුළින් ස්ථාවරත්වය සුරක්ෂිත කරමු.

**5 ඩිජිටල් වේගවත් කිරීම සහ දත්ත පදනම් බැංකුකරණය:**

අපි කාර්යක්ෂමතාව වැඩි කිරීමට, සේවයට පිරිවැය අඩුකිරීමට, සහ මැනියහැකි වේදිකා හරහා සේවා විශ්වාසය ශක්තිමත් කිරීම සඳහා පරිනාමය තුළ වගකීම්සහගතව අයෝජනය කළෙමු.

**6 තිරසාරභාවය, දේශගුණය සහ ප්‍රජා ඔරොත්තුදීම:**

අපි සංක්‍රාන්ති සහ අයකිරීමේ අවශ්‍යතා සඳහා මුදල් ලබාදෙන අතර දේශගුණ අවදානම් කළඹ ඔරොත්තුදීම, ණය තීරණ සහ දිගුකාලීන මූල්‍ය සැලසුම්කරණය හා ඒකාබද්ධ කරමු.

# මූල්‍ය ප්‍රාග්ධනය

### ප්‍රධාන අවදානම් සහ අභියෝග

- **ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා පීඩනය:** හානිකරණ හෝ උච්ඡාවචනයෙන් ස්වාරක්ෂක පිරිහීම අවම අවශ්‍යතා කඩකළ හැකිය.
- **වත්කම් - වගකීම් නොගැලපීම:** ද්‍රවශීලතාව සහ පොලී අනුපාත අවදානමට තැන්පත් සහ ණය නිරාවරණ අතර කල්පිරීම් නොගැලපීම්.
- **ණයවල තත්ත්වය පිරිහීම:** අක්‍රිය ණය ඉහල යාම ලාභදායිතාව අඩුකර, ප්‍රාග්ධනය භාවිතාකර කළඹ පීඩනය සලකුණු කරයි.
- **ද්‍රවශීලතා සංරෝධක:** අනපේක්ෂිත ආපසු ගැනීම් හෝ බිඳවැටීම් ද්‍රවශීලතාව සහ හානිකරණ බැඳීම් බොහෝ සෙයින් දුර්වල කළ හැකිය.
- **සංකේන්ද්‍රණ අවදානම:** අංශ, ණයගැනියන් හෝ කලාපවලට අධි නිරාවරණය සහ වැටීම්වලට හේතුවීමේ හැකියාව විශාලනය කරයි.
- **ලාභදායිතා පීඩනය:** ආන්තික පටුවීම, ඉහළයන පිරිවැය, සහ තරඟය ඉපයීම් සහ ඩිජිටල් උත්පාදනය සම්පීඩනය කරයි.
- **නියාමන ප්‍රාග්ධන ගාස්තු:** මතුවන නියමයන් (බාසල් III, SLFRS 9, කාලගුණ අවදානම) ප්‍රාග්ධන අවශ්‍යතා වැඩිකළ හැකිය.

### අපගේ උපායමාර්ගික ප්‍රතිචාරය හා ලිහිල් කිරීම

- **විචක්ෂණ ප්‍රාග්ධන ස්වාරක්ෂක පවත්වා ගැනීම:** අවමයට ඉහළ අනුපාත, පිඩන පරීක්ෂණය, සක්‍රීයව කළමනාකරණය කිරීම සහ අවදානම බරතබහලද වත්කම් ප්‍රසශ්තකරණය.
- **ALM විනය ශක්තිමත් කිරීම:** ශක්තිමත් වත්කම්-වගකීම් කළමනාකරණය, අරමුදල් විවිධාංගීකරණය, ණය සහ තැන්පතු කාලසීමා ගැලපීම.
- **ණය අවදානම් විනය වැඩි කිරීම:** ප්‍රතිරක්ෂණය දැඩි කිරීම, මුල් අවවාද පද්ධති ශක්තිමත් කිරීම සහ අයකරගැනීමේ යාන්ත්‍රණ.
- **ශක්තිමත් ද්‍රවශීලතා ස්වාරක්ෂක පවත්වා ගැනීම:** අවශ්‍යතාවන්ට ඉහළින් උසස් තත්ත්වයේ ද්‍රවශීල වත්කම් දරාගැනීම සහ තැන්පතු පදනම විවිධාංගීකරණය.
- **කළඹ ක්‍රමානුකූලව විවිධාංගීකරණය:** සංකේන්ද්‍රණ සීමා සකස් කිරීම. සක්‍රියව විශාල නිරාවරණ කළමනාකරණය සහ විවිධාංගීකරණය හඹායාම.
- **ශේෂ පත්‍ර කාර්යක්ෂමතාව ප්‍රසශ්තකරණය:** මිලකරණය, පාලන පිරිවැය වර්ධනය, ගාස්තු ආදායම සහ හරිත නිෂ්පාදන තුළින් ආදායම විවිධාංගීකරණය.
- **සක්‍රීය නියාමන සහභාගිත්වය:** සංවර්ධන නියාමනය, බලපෑම් ඇගයීම් පැවැත්වීම, වැඩවිම් සඳහා ස්වාරක්ෂක පවත්වා ගැනීම.

## මූල්‍ය ප්‍රාග්ධන වටිනාකම් දාමය හා තිරසාර සංකලනයවීම

අපි අන්තයේ සිට අවසානය දක්වා වටිනාකම් දාම ප්‍රවේශයක් හරහා මූල්‍ය ප්‍රාග්ධනය තක්සේරු කරන අතර, අරමුදල් ලබා ගන්නේ කෙසේද, යොදවන්නේ කෙසේද, ආරක්ෂා කරන්නේ කෙසේද සහ අලුත් කරන්නේ කෙසේද යන්න පරීක්ෂා කරමු. සෑම පියවරකදීම, අපි තිරසාරභාවය පිළිබඳ ප්‍රතිඥාවන්, අවදානම් විනය සහ පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිඵල ඒකාබද්ධ කරමු.

**යෙදවුම්**

ස්වෛරී ඇප, ප්‍රාග්ධන ස්වාරක්ෂක, ද්‍රවශීල කළඹ, ඉපයීම් හැකියාව, මිලකරණ මට්ටම්, අවදානම් රුචි සහ සීමා, අරමුදල් ප්‍රවේශ සහිත තැන්පතු පදනම.

**භාරකාරත්ව කටයුතු**

ALM සහ ද්‍රවශීලතා කළමනාකරණය, අවදානම ගලපන ලද මිලකරණය, ණය වෙන් කිරීම සහ මුල් අවවාද කිරීම, ප්‍රාග්ධනය සැලසුම්කරණය හා පිඩන පරීක්ෂණය (කාලගුණ වැසීම් ඇතුළුව), පිරිවැය සහ කාර්යක්ෂම විනය, අදාළ තැන්වලදී ESG-බැඳුණු වෙන් කිරීමේ නිවාරණ.

**නිමැවුම්**

ස්ථාවර අරමුදල්කරණ මුසුව, ප්‍රමාණවත් ද්‍රවශීලතා ස්වාරක්ෂක, වර්ධිත කළඹේ තත්ත්වය, ඔරොත්තුදෙන ප්‍රාග්ධන අනුපාත, විනයගත මිලකරණය සහ ගාස්තු පාලනය, ඉලක්කගත සහන, අයකිරීමේ යාන්ත්‍රණ.

**ගනුදෙනුකරු සහ පාලන ප්‍රතිඵල**

වඩා ශක්තිමත් තැන්පත්කාර විශ්වාසය, වඩා අඩු ද්‍රවශීලතා තොග, වඩා යහපත් දරිය හැකි ප්‍රථිඵල, වර්ධිත අලාභ අවශෝෂණය, පුරෝකථනය කළ හැකි අරමුදල් සියල්ල ඇතුළත් ණය දීම වඩා ශක්තිමත් අවදානම් පාලනය විනිවිදභාවය.

**දිගුකාලීන බලපෑම්**

මූල්‍ය පද්ධතියේ විශ්වාසය, තිරසාර විධිනියෝගය ලබා දීම, වඩා ශක්තිමත් කම්පන අර්බුදවල අවශෝෂණය වර්ධිත දිගුකාලීන ඉපැයීම් ඔරොත්තු දීම, සාධාරණ සංක්‍රාන්තියට වැඩි කළ හැකියා හා අයකිරීමේ මූල්‍ය.

### ප්‍රමාණාත්මක කරුණ

| | | | | | |
|---|---|---|---|---|---|
| **1.1** ගනුදෙනුකාර කේන්ද්‍රීය සියල්ල ඇතුළත් සහ දැරියහැකි බැංකුකරණය | **2.1** සාර්ව ආර්ථික ස්ථායිතාව සහ මූල්‍ය පද්ධති විශ්වාසය | **2.2** වත්කම්වල තත්ත්වය, ප්‍රාග්ධනය හා ද්‍රවශීලතා කළමනාකරණය | **2.3** මූල්‍ය තිරසාරභාවය සහ ඉපයීම් ඔරොත්තුදීම | **3.1** දක්ෂයින් ආකර්ෂණය/රඳවාගැනීම හා අනාගයට සූදානම් දක්ෂතා | **4.1** පාලන විශිෂ්ටත්වය, අනුකූලතාව සහ සදාචාර හැසිරීම |
| **4.2** මූල්‍යමය අපරාධ, වංචා සහ AML/CFT | **4.3** විශ්වාසය, කීර්තිනාම සහ සක්‍රීය පාර්ශවකාර සහභාගිත්වය | **5.1** ඩිජිටල් පරිනාමය සහ වගකීම් සහගත කෘතීම බුද්ධි/විශ්ලේෂණ | **5.2** සයිබර් ආරක්ෂාව, දත්ත රහස්‍යතාව සහ ඔරොත්තුදීම | **5.3** තෙවන පාර්ශව/ බාහිර පාර්ශව සහ වෙළෙඳ ඔරොත්තුදීම | **6.1** කාලගුණ ඔරොත්තුදීම, ආපදා ප්‍රතිචාරය හා සාධාරණ සංක්‍රාන්ති මූල්‍යකරණය (දිට්වා) |

# මූල්‍ය ප්‍රාග්ධනය

## SDGs ට අපගේ දායකත්වය

**1 NO POVERTY** — ඉලක්කය 1.4
ජාතික මට්ටමේ ශාඛා ජාලය, දැරියහැකි බැංකුකරණය, සියලුම වයස් කාණ්ඩ සඳහා සියලුම ප්‍රවේශය

**8 DECENT WORK AND ECONOMIC GROWTH** — ඉලක්කය 8.10
ඉතුරුම් සේවයේ යෙදවීම, වගකිම්සහගත ණයදීම, මූල්‍ය අන්තර්කරණය, සේවක කාර්යසාධනය පදනම් දිරිදීමනා

**9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE** — ඉලක්කය 9.3
ඩිජිටල් යටිතල පහසුකම් පුළුල් කිරීම

**10 REDUCED INEQUALITIES** — ඉලක්කය 10.2
සියලුම ජනවිකාශවලට ජ්‍යෙෂ්ඨ පුරවැසි පෙරාතු ලේඛණ, සහය සේවා, ග්‍රාමීය පිවිසීම, නිෂ්පාදන ලබාදීම

**17 PARTNERSHIPS FOR THE GOALS** — ඉලක්කය 17.3
රාජ්‍ය ඉතුරුම් සේවයේ යෙදවීම, ජාතික සංවර්ධන මූල්‍යකරණය, දිගුකාලීන සංවර්ධන ව්‍යාපෘති තුළින් ජාතිය ගොඩනැගීමට දායකවීම

## අපගේ මූල්‍ය ප්‍රාග්ධන ගමන්මඟ: භාරකාරත්වයේ සිට මැනියහැකි වටිනාකම දක්වා

ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ මූල්‍ය ප්‍රාග්ධනය යන්නෙන් මූල්‍ය පදනම අර්ථවත් කරන අතර, එමඟින් තැන්පත්කරුවන්ට ආරක්ෂිතව සේවය කිරීමට, ජාතික සංවර්ධනයට සහාය වීමට, සේවා හැකියාව සඳහා ආයෝජනය කිරීමට සහ වෙනස් වන ආර්ථික චක්‍ර හරහා ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීමට අපට හැකියාව ලැබේ. අපගේ අරමුදල්, ද්‍රවශීලතාවය, ප්‍රාග්ධනය සහ ඉපැයීම් බැංකුකරණය ඇතුළුව විශ්වාසදායක ලෙස සැපයීම සඳහා එක්ව කටයුතු කරන බව සහතික කරමින්, මහජන විශ්වාසයට අදාළ වන දැඩි පාලනයක් සහිතව අපි මෙම සම්පත් කළමනාකරණය කරමු.

**1 අපගේ ප්‍රාග්ධන පදනම්**
තැන්පත්කරුවන්ගේ විශ්වාසය ආරක්ෂා කරන සහ උපායමාර්ගික ක්‍රියාත්මක කිරීමට ඉඩ සලසන පාලනය, අරමුදල් ව්‍යුහය, ප්‍රාග්ධන ස්වාරක්ෂක, ද්‍රවශීලතා සංචිත සහ වාර්තාකරණ අඛණ්ඩතාව.

**2 අපි හැකියාව ශක්තිමත් කරන ආකාරය**
විනයගරුක තැන්පතු සේවයේ යෙදවීම, භාණ්ඩාගාර කළමනාකරණය, ද්‍රවශීලතා සැලසුම් කිරීම, ප්‍රාග්ධන ප්‍රශස්තකරණය, පිරිවැය කාර්යක්ෂමතාව සහ පාලන ශක්තිමත් කිරීම.

**3 අපි ප්‍රතිඵල සක්‍රිය කරන ආකාරය**
- සෑම ගනුදෙනුකාර අංශයක් සඳහා විශ්වාසදායක බැංකුකරණය
- සේවා පොරොන්දුවක් ලෙස ඔරොත්තු දීමේ හැකියාව
- වගකිවයුතු වෙන් කිරීම තුළින් ජාතික බලපෑම
- සාධාරණත්වය, දැරිය හැකි විම සහ ගනුදෙනුකාර ආරක්ෂාව

**4 මෙයින් ලබා දෙන දෑ**
අරමුදල් ස්ථාවරත්වය, විචක්ෂණශීලී ශක්තිය, ඉපැයීම් ගුණාත්මකභාවය සහ තිරසාර වාර්තාගත ලාභ සහ ශක්තිමත් ප්‍රාග්ධන කොටස ඇතුළුව වාර්තාකරණ අඛණ්ඩතාවයේ මැනිය හැකි ජයග්‍රහණ.

## 1 අපගේ ප්‍රාග්ධන පදනම්

බැංකුවේ මූල්‍ය ප්‍රාග්ධනය අන්තර් සම්බන්ධ පදනම් දෙකක්, එනම් විචක්ෂණ පාලනය සහ විනයගරුක මූල්‍ය කළමනාකරණය තුළින් ආරක්ෂා කරයි. මේ සියල්ල එක්ව, මහජන ඉතුරුම් ආරක්ෂා කිරීම, ද්‍රවශීලතාවය ඔරොත්තු දීමේ හැකියාව සමඟ පවත්වා ගැනීම, ප්‍රාග්ධන ස්වාරක්ෂක නියාමන අවශ්‍යතාවලට වඩා ඉහළින් සංරක්ෂණය කිරීම සහ ලාභදායීතාවය දිගුකාලීන ස්ථාවරත්වයට සහාය වීම සහතික කරයි. මෙම ඒකාබද්ධ ප්‍රවේශය අපගේ ශේෂ පත්‍රය ඔරොත්තු දෙන බව, අපගේ අවදානම් කළමනාකරණය විනයගරුක බව සහ අපගේ මෙහෙයුම් විශ්වාසදායක බව ඇතිකරන අතර, එමඟින් බැංකුවට තැන්පත්කරුවන්ගේ විශ්වාසය ආරක්ෂා කරමින් එහි සංවර්ධන විධි නියෝගය ඉටු කිරීමට හැකියාව ඇති කරයි.

### 1.1 පාලනය සහ අධික්ෂණය

අධ්‍යක්ෂ මණ්ඩල අධික්ෂණය, කළමනාකරණ කමිටු සහ ස්වාධීන සහතික කිරීම අපගේ මූල්‍ය ප්‍රාග්ධන පාලනය ශක්තිමත් කරයි. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අවසාන වගකීම භාර ගන්නා අතර, මූල්‍ය තත්ත්වය සහ කාර්යසාධනය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ඔවුන් ඉදිරිපත් කරන බව සහතික කරයි. අපගේ පාලන රාමුවට ප්‍රාග්ධන කළමනාකරණය, ද්‍රවශීලතා අවදානම, භාණ්ඩාගාර මෙහෙයුම්, ණය විනය, උපායමාර්ගික සැලසුම්කරණය, අයවැයකරණය, ලාභදායීතා සැලසුම්කරණය සහ මූල්‍ය වාර්තාකරණ අඛණ්ඩතාව හරහා ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ඇතුළත් වේ.

- **ඒකාබද්ධ සැලසුම්කරණය සමඟ අධ්‍යක්ෂ මණ්ඩලය සහ ආයතනික කළමනාකරණ අධික්ෂණය:** අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රාග්ධනය, ද්‍රවශීලතාවය සහ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ උපායමාර්ගික හාරකාරත්වය සපයන අතර, දිගුකාලීන දැක්ම ක්‍රියාකාරී මූල්‍ය පුරෝකථනයන් බවට පරිවර්තනය කරන ඒකාබද්ධ සැලසුම්කරණය සමඟ සම්පත් වෙන් කිරීම මෙහෙයවන අයවැය සහ සැලසුම් අනුමත කරයි.
- **වත්කම් සහ වගකීම් කමිටු (ALCO) පාලනය:** ALCO ද්‍රවශීලතාවය, ශේෂ පත්‍ර ව්‍යුහය, පොලී අනුපාත අවදානම සහ අරමුදල් උපාය මාර්ගය පාලනය කරමින් ආන්තික ප්‍රසාරණය සහ ප්‍රශස්ත ප්‍රතිලාභ මෙහෙයවා සක්‍රිය මිලකරණය සහ කළඹ අධික්ෂණය සමඟ ස්ථාවරත්වය සහතික කරයි.
- **ඒකාබද්ධ අවදානම් කළමනාකරණය සහ මූල්‍ය තීරණ ගැනීම:** පූර්ව අනතුරු ඇඟවීමේ දර්ශක, පිඩන පරීක්ෂණ සහ අයකිරීමේ සැලසුම්කරණය මූල්‍ය තීරණ ගැනීමේදී ඇතුළත් කරන අතර, ඉන් සාර්ව ආර්ථික අවදානම් තක්සේරු කිරීම් සියලුම සැලසුම් සහ අයවැය උපකල්පන දැනුම් දෙන බව සහතික කරයි.
- **ලාභදායීතාවය සහ පිරිවැය කළමනාකරණය සමඟ මූල්‍ය පාලනය:** විනයගරුක සැලසුම්කරණය, අයවැයකරණය සහ මූල්‍ය පාලනය මාසික කාර්යසාධන සමාලෝචන මඟින් සහාය වන අතර, ආදායම් විනය සහතික කරමින් කාර්යක්ෂමතා මුලපිරීම් ඇතුළත් කරමින් මෙහෙයුම් වියදම් පාලනය කරයි.
- **ඒකාබද්ධ සහතික කිරීම:** අවදානම, අනුකූලතාවය සහ අභ්‍යන්තර විගණනය මඟින් ස්වාධීන සමාලෝචන, ප්‍රාග්ධන සැලසුම්කරණය, ද්‍රවශීලතා කළමනාකරණය, භාණ්ඩාගාර පාලනයන්, අයවැය පිළිපැදීම සහ වාර්තාකරණ අඛණ්ඩතාව පිළිබඳ කාර්යක්ෂමතාව තහවුරු කරයි.

# මූල්‍ය ප්‍රාග්ධනය

## 1.2 අවදානම් රුචිය, සීමා සහ මූල්‍ය පාලන පරිසරය

සීමාවන්, ප්‍රේරක, ඉවසීමේ සීමාවන් සහ උත්සන්න කිරීමේ විෂයයන් වටා ගොඩනගා ඇති ව්‍යුහගත පාලන පරිසරයක් තුළින් බැංකුව සිය මූල්‍ය ශක්තිය ආරක්ෂා කරයි.

| පාලන ප්‍රදේශය | ප්‍රවේශය |
|---|---|
| **ප්‍රාග්ධන අවදානම් රුචිය** | ICAAP විශ්ලේෂණය සහ කළමනාකරණ කාර්යය සැලසුම්කරණය මගින් සහාය දක්වන, අවම නියාමන සීමාවන්ට වඩා බෙහෙවින් ඉහළින් පවතින අභ්‍යන්තර ඉලක්ක ස්වාරක්ෂක, |
| **ද්‍රවශීලතා අවදානම් රුචිය** | ද්‍රවශීලතා ආවරණය, අරමුදල් සංකේන්ණය, කල්පිරීම් නොගැලපීම් සහ හදිසි සූදානම සඳහා අභ්‍යන්තර සීමාවන්. |
| **පොලී අනුපාත සහ වෙළෙඳපොල අවදානම** | ඉපැයීම් සහ තක්සේරුකරණ අස්ථාවරත්වය අඩු කිරීම සඳහා මිලකරණ විශ්ලේෂණය, කාල සීමාවන් සහ සංවේදීතා නියාමනය. |
| **මූල්‍ය වාර්තාකරණ පාලනයන්** | ප්‍රධාන අභ්‍යන්තර සහ බාහිර වාර්තා සඳහා සැසඳීම්, ලේඛනගත අනුමැතීන්, ව්‍යතිරේක කළමනාකරණය සහ සාක්ෂි මත පදනම් වූ අත්සන් කිරීම්. |
| **නියාමන අනුකූලතා විනය** | නියාමකයින් වෙත කාලීන හා නිවැරදි වාර්තා, වාර්තා කිරීමේ ගැටළු කල්තියා හඳුනා ගැනීම සහ නිවැරදි කිරීම. |

**NII මත CRROs හි ගම්‍යතාව**

- **ණය කළඹ තුළ දේශගුණික අවදානම:** භෞතික හා සංක්‍රාන්ති අවදානම් ණය හානිකරණ වැඩි කළ හැකි අතර, SLFRS 9 යටතේ අදියර 3 වත්කම් වලින් ලැබෙන පොලී ආදායම අඩු කරයි.
- **හරිත මූල්‍යකරණ ප්‍රසාරණය:** තිරසාරභාවය හා සම්බන්ධ ණය මඟින් අඩු ආරම්භක ඵලදාවක් ලබා දිය හැකි නමුත් සහනදායී ප්‍රතිමූල්‍යකරණය විවෘත කර දිගුකාලීන කළඹේ ගුණාත්මකභාවය වැඩි දියුණු කරයි.
- **තැන්පත්කරුවන්ගේ තිරසාරභාවය පිළිබඳ මනාපයන්:** වගකීම්සහගත සහ සදාචාරාත්මක බැංකුකරණය පිළිබඳ දැනුවත්භාවය වර්ධනය වන බැවින්, තැන්පත්කරුවන්ගේ අපේක්ෂාවන් විශේෂයෙන් විශ්වාසය සහ ආයතනික කීර්තිනාමය තැන්පතු සේවයේ යෙදවීමේ ප්‍රධාන ධාවකයන් වන විට, නිෂ්පාදන නිර්මාණය, විනිවිදභාවය සහ අරමුදල්වල ස්ථාවරත්වය කෙරෙහි වැඩි වැඩියෙන් බලපෑම් කළ හැකිය,

**ඉදිරි දැක්ම**

ශුද්ධ පොලී ආදායම තුළින් විනයගරුක ALM, සියුම් තැන්පතු සේවයේ යෙදවීම සහ දේශගුණික-ඔරොත්තුදෙන අංශ කරා ක්‍රමානුකූලව කළඹ නැවත සමතුලිත කිරීම හරහා ඔරොත්තු දෙමින් පැවතීම අපේක්ෂා කෙරේ. බැංකුව තිරසාර ණය වර්ධනයට සහාය වන අතරම ආන්තික ආරක්ෂා කිරීම සඳහා අරමුදල් මුසුව ප්‍රශස්ත කිරීම අඛණ්ඩව කරගෙන යනු ඇත.

## 2 අපි හැකියාව ශක්තිමත් කරන ආකාරය

2025 දී. අරමුදල් ස්ථාවරත්වය, භාණ්ඩාගාර විනය, ද්‍රවශීලතා සූදානම, ප්‍රාග්ධන සැලසුම්කරණය, ලාභදායීතා තත්ත්වය සහ මූල්‍ය වාර්තාකරණ අඛණ්ඩතාව තුළ ඕනෑකමින් කළ වැඩිදියුණු කිරීම තුළින් බැංකුව මූල්‍ය ප්‍රාග්ධන හැකියාව අඛණ්ඩව ශක්තිමත් කළේය. මෙම හැකියාවන් වැඩිදියුණු කිරීම් මගින් විශ්වාසය පවත්වා ගැනීමට, කම්පන අවශෝෂණය කර ගැනීමට සහ මූල්‍ය ශක්තිය සේවා අඛණ්ඩතාව සහ ජාතික වටිනාකම බවට පරිවර්තනය කිරීමට බැංකුවේ හැකියාව තහවුරු කරයි.

### අ ආදායම් ප්‍රකාශ කළමනාකරණය


### 2.1 ශුද්ධ පොලී ආදායම් ප්‍රසාරණය හරහා තිරසාර ඉපයීම් ගොඩනැඟීම

බැංකුවේ ශුද්ධ පොලී ආදායම (NII) රු. බිලියන 84.8 දක්වා වැඩි වී ඇති අතර ඉන් පෙර වසරේ පැවති රු. බිලියන 72.6 ට වඩා 17% ක වර්ධනයක් පිළිබිඹු කරයි. මෙම කාර්යසාධනය ප්‍රධාන වශයෙන් විනයගරුක වගකීම් කළමනාකරණය මගින් මෙහෙයවනු ලැබූ අතර එමඟින් බැංකුවට පහත වැටෙන පොලී අනුපාත පරිසරයෙන් වැඩි ප්‍රතිලාභයක් ලබාගත හැකි විය.

පොලී ආදායම රු.බිලියන 197.8 ක් දක්වා 3% කින් අඩු වූ අතර, මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, විශේෂයෙන් ආයතනික අංශය තුළ සමහර ණය සම්පූර්ණයෙන්ම ආපසු ගෙවීමයි. කෙසේ වෙතත්, පොලී වියදම පසුගිය වසරේ වාර්තාකළ රු. බිලියන 131.2 සිට රු. බිලියන 112.9 දක්වා 14%කින් තියුණු ලෙස පහත වැටී ඇත. එයට හේතුව තැන්පතු සක්‍රිය ප්‍රතිමිලකරණය කිරීම මගින් බැංකුවට එහි අරමුදල් පදනමට ලිහිල් මුදල් ප්‍රතිපත්තියේ ප්‍රතිලාභ ලබා දීමට ඉඩ සැලසුණු බැවිනි. පොලී ආදායමේ පහත වැටීම අභිබවා යමින් අරමුදල් පිරිවැයෙහි මෙම සැලකිය යුතු අඩුවීම, ශුද්ධ පොලී ආදායමේ ශක්තිමත් වර්ධනය තහවුරු කරන ලදි.

මෙම විනයගරුක ශේෂ පත්‍ර කළමනාකරණයේ සෘජු ප්‍රතිඵලයක් ලෙස, බැංකුවේ ශුද්ධ පොලී ආන්තිකය පසුගිය වසරේ පැවති 4.22% සිට 4.74% දක්වා වර්ධනය වූ අතර, ඉන් පහත වැටෙන පොලී අනුපාත පරිසරයක් තුළ ඵලදායී වගකීම් ප්‍රතිමිලකරණය සහ විනයගරුක ශේෂ පත්‍ර කළමනාකරණය පිළිබිඹු කරයි. මෙම දියුණුව මගින් බැංකුව ක්ෂේත්‍රයේ ඉහළම ආන්තික අතර ශ්‍රේණිගත කිරීම පමණක් නොව, මෑත වසරවලදී බැංකුව විසින් වාර්තා කරන ලද ශක්තිමත්ම මට්ටම්වලින් එකක් ද නියෝජනය කරයි.

**ශුද්ධ පොලී ආදායම (NII) එදිරි ශුද්ධ පොලී ආන්තික (NIM)** ප්‍රස්ථාර 31




| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| NII | 55 | 32 | 30 | 73 | 85 |
| NIM – බැංකුව | 3.71 | 2.03 | 1.79 | 4.22 | 4.74 |
| NIM – බැංකු ක්ෂේත්‍රය | 3.44 | 3.98 | 3.66 | 4.3 | 4.3 |

# මූල්‍ය ප්‍රාග්ධනය

## 2.2 අරමුදල් නොවන ආදායම් ප්‍රවාහ තුළින් ආදායම විවිධාංගීකරණය


පොලී නොවන ආදායමට ශුද්ධ ගාස්තු සහ කොමිස්, වෙළෙඳ ලාභ, සාධාරණ වටිනාකම් වෙනස්වීම් සහ අනෙකුත් මෙහෙයුම් ආදායම් ඇතුළත් වේ. 2025 දී, මුළු පොලී නොවන ආදායම රුපියල් බිලියන 4.6 දක්වා වැඩි වූ අතර එය පෙර වසරේ පැවති රු. බිලියන 3.6 ට වඩා 29.4% ක වර්ධනයකි.

ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම රු. බිලියන 2.6 දක්වා 46%කින් වර්ධනය විය. එයට ණය බෙදාහැරීම් වැඩිවීම, ඉහළ කාඩ් නිකුතුව සහ භාවිතය සහ වර්ධිත වෙළෙඳ හා ප්‍රේෂණ ආශ්‍රිත ගාස්තු ආදායම හේතු වූ අතර ඉන් ගනුදෙනුකාර සම්බන්ධතාවය වැඩිවීම සහ බැංකුවේ සේවා විවිධාංගීකරණ උපාය මාර්ගයේ සාර්ථකත්වය පිළිබිඹු කරයි.

මූල්‍ය වත්කම් බැහැර කිරීමෙන් ලද ලාභ සහ ශුද්ධ වෙනත් මෙහෙයුම් ආදායම රු.බිලියන 1.3 දක්වා සුවිශේෂී 49.1%කින් වැඩි වී ඇති අතර, එය බැංකුවේ ආදායම විවිධාංගීකරණයට සහ ඉපයීම් ස්ථාවරත්වයට තවදුරටත් දායක වේ.

### අරමුදල් පදනම් නොවන ආදායම

පිටුව 32




| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| ● ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම | 2,843 | 1,940 | 1,276 | 1,751 | 2,560 |
| ● වෙනත් අරමුදල් පදනම් නොවන ආදායම | 450 | (583) | 3,504 | 1,810 | 2,067 |

**අරමුදල් නොවන ආදායම මත CRROs හි ගමන්මාර්ග**

- **දේශගුණය සම්බන්ධ ගාස්තු අවස්ථා:** හරිත බැඳුම්කර, තිරසාරතාවයට සම්බන්ධ ණය, සහ ESG උපදේශන සේවා නව ගාස්තු පදනම් ආදායම් ප්‍රවාහ ජනනය කළ හැකිය.
- **ඩිජිටල් ඇතුළත් විධිනියෝගය:** මහ බැංකුවේ මූල්‍ය අන්තර්කරණ උපදෙස් කාඩ් සහ ප්‍රේෂණ ගාස්තු වර්ධනයට සහය වෙමින් ඩිජිටල් ගෙවීම් සේවා සඳහා ඉල්ලුම ඇති කරයි.
- **ගාස්තු මිලකරණය තුළ හැසිරීම් අවදානම:** සාධාරණ ප්‍රතිකාරය පිළිබඳ නියාමන සියුම් පරීක්ෂාවට දණ්ඩනීය අයකිරීම් නොවන අගය එකතුකළ සේවාවන්ගෙන් ලැබෙන වර්ධනය සහතික කරමින් විනිවිද ගාස්තු ව්‍යූහයක් අවශ්‍යය.

**ඉදිරි දැක්ම**

අරමුදල් නොවන ආදායම පුළුල්කළ ඩිජිටල් සේවා පිරිනැමීම්, හරිත මූල්‍ය නිෂ්පාදන සහ ප්‍රේෂණ සම්බන්ධතා තුළින් තිරසාර වර්ධනය සඳහා පවතී. බැංකුව මහ බැංකුවේ සැලකීම් අපේක්ෂාවන් හා බැඳුණු විනයගරුක මිලකරණ පාලනය පවත්වා ගනු ඇත.

## 2.3 ණය අවදානම් කළමනාකරණය හා හානිකරණ විනය ශක්තිමත් කිරීම

බැංකුව SLFRS 9 යටතේ ණය අවදානම් කළමනාකරණය සඳහා ඉදිරිය දකින ප්‍රවේශයක් පවත්වා ගනී. 2025 දී, හානිකරණ අයකිරීම් සැලකියයුතු 86%ක අඩුවීමක් සලකුණු කරමින් පසුගිය වසර තුළ පැවති රු.බිලියන 11.5ට සාපේක්ෂව විශේෂයෙන් රු. බිලියන 1.6 දක්වා අඩු වී ඇත. මෙම අපූර්ව වර්ධනය ප්‍රධාන වශයෙන් දැඩි අයකිරීමේ මුලපිරීම්, කළඹ නියාමනය වැඩිකිරීම, සහ ණය පොත තුළ ණයවල තත්ත්වය ස්ථායිකරණය මගින් ඇතිකරන ලදී.


මෙම ප්‍රතිඵලවලට දායකවන මූලික මුල්පිරීම්වලට පහත දැ ඇතුළත් වේ:

- **ශක්තිමත් කළ අයකර ගැනීමේ යාන්ත්‍රණ:** අක්‍රීය ණය අයකර ගැනීම සඳහා විශේෂිත ණය එකතුකරන්නන් පත් කිරීම, අයකර ගැනීමේ උත්සාහයන් සැලකිය යුතු ලෙස වේගවත් කළ අතර හානි වූ වත්කම්වලින් මුදල් ප්‍රවාහ වර්ධනය කළේය.
- **වැඩිදියුණු කළ කළඹ නියාමනය:** පූර්ව අනතුරු ඇඟවීමේ දර්ශක දැඩි ලෙස ආවේක්ෂණය කිරීම මගින් විභව පිඩනය කාලීන ලෙස හඳුනා ගැනීමට හැකි වූ අතර, පැහැර හැරීම් සිදුවීමට පෙර ක්‍රියාකාරී මැදිහත්වීමකට ඉඩ සැලසීය.
- **ණය ගැනියන්ගේ මුදල් ප්‍රවාහයන් වැඩිවීම:** ක්‍රමයෙන් ආර්ථිකය ප්‍රකෘතිමත් වීම සහ ව්‍යාපාරික තත්ත්වයන් ස්ථාවර වීම පාරිභෝගික සහ ආයතනික කළඹ හරහා වර්ධිත ආපසු ගෙවීමේ හැකියාවට සහයවිය.

2025 නොවැම්බර් අග භාගයේ ඇති වූ සුළි කුණාටුව සහ ගංවතුරට ප්‍රතිචාර වශයෙන්, බැංකුව අතිරේක කළමනාකරණ ආවරණ විධිවිධාන ස්ථාපිත කිරීමෙන් එහි මූල්‍ය ආරක්ෂණ සක්‍රියව ශක්තිමත් කළේය. මෙම ඉදිරි දැක්ම සහිත පියවර ස්වාභාවික ආපදාවක සම්පූර්ණ මූල්‍ය බලපෑම බොහෝ විට කාලයත් සමඟ දිග හැරෙන බව පිළිගනිමින් බලපෑමට ලක් වූ කලාපවල ණයගැතියන් අතර ඇති විය හැකි ණය පිඩනය ආවරණය කිරීම සඳහා නිර්මාණය කර ඇත. මෙම පූර්වාරක්ෂක ස්වාරක්ෂකය ගොඩනැගීමෙන්, බැංකුව අපේක්ෂිත අලාභ සිදුවීමට පෙර ඒවා ගණනය කරමින්, එහි ශේෂ පත්‍රය ඔරොත්තු දෙමින් පවතින බව සහ මෙම දේශීයකරණය වූ අස්ථාවරත්වය වඩා පුළුල් මූල්‍ය බිඳවැටීමක් දක්වා වර්ධනය නොවන බව සහතික කරයි.

### හානිකරණ අයකිරීම්

පිටුව 33





| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| ◐ හානිකරණ අයකිරීම් | 4.3 | 4.9 | 4.3 | 11.5 | 1.6 |

# මූල්‍ය ප්‍රාග්ධනය

## හානිකරණ අයකිරීම් වර්ගීකරණ

පුස්ථාර 34




| | | | |
|---|---|---|---|
| 2024 | 6,557 | 5 | 4,922 |
| 2025 | 388 | 10 | (1,059) |

**ණය අවදානම මත CRROs හි ගම්‍යාර්ථ**

- **ණය කළඹ තුළ දේශගුණික අවදානම:** භෞතික අවදානම් (ගංවතුර, නියඟ) සහ සංක්‍රාන්ති අවදානම් (ප්‍රතිපත්ති වෙනස්වීම්) විශේෂයෙන් කෘෂිකර්මය හා උවදුරට පත්වන අංශවල ණය හානිකරණ වැඩි කරනු ඇත.
- **හරිත ණය මුලපිරීම්:** තිරසාර මූල්‍යකරණය සඳහා නියාමන අනුග්‍රාහ දිගුකාලීන වත්කම්වල තත්ත්වය වර්ධනය කරමින් දේශගුණිකව ඔරොත්තු දෙන අංශ කරා කළඹේ විතැන්වීම දිරිගැන්විය හැකිය.
- **ආපදා ප්‍රතිසාධන මූල්‍යකරණය:** දේශගුණික සිදුවීම් අවස්ථාවල සහන සහ ප්‍රතිව්‍යුහගතකරණය කෙරෙහි මහ බැංකුවේ උපදෙස් SLFRS 9 යටතේ හානිකරණ හා අදියර ගණනය කෙරෙහි බලපායි.

**ඉදිරි දැක්ම**

වැඩිකළ පූර්ව අනතුරු පද්ධති, ඉලක්කගත අයකිරීමේ යාන්ත්‍රණ, සහ දේශගුණිකව ඔරොත්තු දෙන අංශ කරා ක්‍රමිකව කළඹ විවිධාංගීකරණය තුළින් වත්කම්වල තත්ත්වය තවදුරටත් ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ. සැපයුම් විනය SLFRS 9 යටතේ විවක්ෂණශීලිව පවතිනු ඇත.

## 2.4 මෙහෙයුම් වියදම්: වර්ධනය හමුවේ විනයගරුක පිරිවැය කළමනාකරණය

මෙහෙයුම් වියදම් 2025 දී රු. බිලියන 30.4 දක්වා වැඩි වූ අතර එය පසුගිය වසරේ රු. බිලියන 29.0ට වඩා පාලිත 4.9%ක වැඩි වීමකි. මෙම මධ්‍යස්ථ වැඩිවීම තුළින් ශ්‍රම බලකාය ප්‍රසශ්ථකරණය ඇතුළුව අබණ්ඩ කාර්යක්ෂම මූලපිරීම් සමඟ ඩිජිටල් යටිතල පහසුකම් සහ හැකියාව ගොඩ නැගීම තුළ උපායමාර්ගික ආයෝජනයන් තුලනය කිරීමට ඇති බැංකුවේ හැකියාව පිළිබිඹු කරයි.

හැකියාව ගොඩ නැගීම තුළ උපායමාර්ගික ආයෝජනයන් තුලනය කිරීමට ඇති බැංකුවේ හැකියාව පිළිබිඹු කරයි.

කාර්ය මණ්ඩල වියදම් රු. බිලියන 19.9 දක්වා 2%කින් අඩු වූ අතර ජීවන වියදම් ගැලපීම්වල අඩුකිරීම්, කාර්යසාධනය හා බැඳුණු ප්‍රසාද දීමනා, සහ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වලට දායකත්වයන් එයට මූලික වශයෙන් හේතු විය. මෙම පහතවැටීම සේවක සුභසාධනය හා රඳවාගැනීම වෙත අපගේ බැඳීම පවත්වා ගනිමින් විචක්ෂණ ශ්‍රමබලකා පිරිවැය කළමනාකරණය තහවුරු කරනු ලබයි.

ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය රු. බිලියන 2.3 දක්වා 34.9%කින් ඉහළ ගිය අතර ඉන් මධ්‍යම බැංකුකරණ පද්ධති, සයිබර් ආරක්ෂාව වැඩි කිරීම්, සහ ඩිජිටල් යටිතලපහසුකම්වල දැනට පවත්නා තාක්ෂණික ආයෝජනවල වේගවත් බලපෑම පිළිබිඹු කරයි. ගිණුම්කරණ අවශ්‍යතාවන්ට අනුව තාක්ෂණික ආයෝජනවල පිරිවැය ඒවායේ ඵලදායී ජීව කාලය පුරා හඳුනා ගන්නා බැවින්, මෙම වැඩිවීම තුළින් පසුගිය වසරවල සිදුකළ තාක්ෂණික ආයෝජනවල උපලේඛනගත ක්ෂයකිරීම සහ ක්‍රමක්ෂය සහ බැංකුවේ දිගුකාලීන මෙහෙයුම් ඔරොත්තුදීම ශක්තිමත් කිරීම පිළිබිඹු කරයි.

අනෙකුත් මෙහෙයුම් වියදම් පසුගිය වසරේ පැවති රු. බිලියන 7.0 සිට රු.බිලියන 8.3 දක්වා 18%කින් වර්ධනය විය. මෙම වැඩිවීමට මූලික වශයෙන්ම මහ බැංකුව වෙත ගෙවන ලද තැන්පතු රක්ෂණ වාරිකයෙහි වැඩිවීම සමඟ ව්‍යාපාර පුළුල්කිරීම සහ නියාමන අනුකූලතාවයට සහයවීමට අවශ්‍ය කාර්යාල පරිපාලන සහ ආයතනික වියදම් හේතු විය. විශේෂයෙන්, බැංකුවේ ආදායමට පිරිවැය අනුපාතය ක්ෂේත්‍රයේ සාමාන්‍යයට වඩා පහළින් රඳවා ගනිමින් පසුගිය වසරේ 38.4% සිට 34.3% දක්වා සැලකියයුතු ලෙස වර්ධනය විය. මෙම වර්ධනයෙන් අපගේ පිරිවැය කළමනාකරණ මූලපිරීම්වල ඵලදායිත්වය සමඟ ශක්තිමත් ආදායම් වර්ධනය, බැංකුවේ මෙහෙයුම් උත්තෝලනය සහ ඉපයීම් ඔරොත්තුදීම ශක්තිමත්වීම පෙනුම් කරයි.

**මෙහෙයුම් වියදම මත CRROs හි ගම්‍යාර්ථ**


- **දේශගුණය සම්බන්ධ අනුකූලතා පිරිවැය:** මතුවන අනාවරණ අවශ්‍යතා (SLFRS S1 සහ SLFRS S2) සහ ස්ථීර පිරිවැය පදනමට එකතුකළ දේශගුණික අවදානම් දත්ත යටිතලපහසුකම් ආයෝජන.
- **හරිත තාක්ෂණික ආයෝජන:** බලශක්ති කාර්යක්ෂම ශාඛා, කඩදාසි රහිත බැංකුකරණය, සහ තිරසාර අරමුණු සහ දිගුකාලීන පිරිවැය කාර්යක්ෂමතාවයට ඩිජිටල් යටිතල පහසුකම් සහය.
- **නියාමන වාර්තාකරණ බර:** වැඩිකළ දේශගුණික සහ තිරසාර අනාවරණවලට අතිරේක සම්පත් අවශ්‍යවන අතර පුද්ගලික සහ පද්ධති පිරිවැයට බලපෑම් කරයි.

**ඉදිරි දැක්ම**

කාර්යක්ෂමතාව වැඩි කිරීමට, ගනුදෙනුකාර අත්දැකීම සහ අනාගතයට තහවුරු මෙහෙයුම් ඉහළ දැමීම, දිගුකාලීන හැකියා ගොඩනැගීම විශේෂයෙන් ඩිජිටල් නව්‍යකරණය, මානව සම්පත් සංවර්ධනය, සහ අවදානම් පාලනය තුළ බැංකුව ආයෝජනය කරන බැවින්, පිරිවැයෙහි ඉහළයන ප්‍රවනතාව අබණ්ඩව අපේක්ෂා කළ හැකිය.

## පිරිවැය සහ ආදායම් වර්ධනය

පුස්ථාර 35




| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| ආදායම් වර්ධනය (LHS) | 5.80 | 29.34 | 32.97 | (10.53) | (2.35) |
| මෙහෙයුම් වියදම් (VAT රහිත) වර්ධනය (LHS) | 14.95 | 11.46 | 11.57 | 39.40 | (20.87) |
| VAT රහිත ආදායමට පිරිවැය (RHS) | 33.17 | 62.93 | 71.59 | 38.35 | 34.30 |

# මූල්‍ය ප්‍රාග්ධනය

GRI 207-3

## 2.5 බදු දායකත්වයන් තුළින් මූල්‍යමය වගකීම නගා සිටුවීම

2025 දී, බැංකුව ජාතික ආර්ථිකයට රු. බිලියන 30.1ක සැලකියයුතු මූල්‍ය දායකත්වයක් සිදුකළ අතර, ඉන් පසුගිය වසරේ රු. බිලියන 19.5ට වඩා ශක්තිමත් 54.2%ක වැඩිවීමක් පිළිබිඹු කරයි. මෙම දායකත්වයෙන් සෘජු හා වක්‍ර බදු තුළින් මහජන මූල්‍ය සඳහා සිය ලාභදායිත්වයේ වර්ධනීය කොටසක් ප්‍රවාහය කරමින් ජාතිය ගොඩ නැගීමේදී සැලකියයුතු හවුල්කරුවෙක් ලෙස බැංකුවේ කාර්යභාරය පෙන්නුම් කරයි. මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු (VAT), සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL), සහ ආදායම් බදු බැඳීම්වලින් මුළු බදු සමන්විත වේ.

ආදායම් බදු වියදම් 2024 දී පැවති රු. බිලියන 10.1 සිට රු.බිලියන 17.2 දක්වා 69.3%කින් ඉහළ ගිය අතර ඉන් බැංකුවේ අඛණ්ඩ ශක්තිමත් ලාභදායිතාව සහ ඉපයීම් වර්ධනය සෘජුව පිළිබිඹු කරයි. මෙම වැඩිවීමෙන් බැංකුවේ මූල්‍ය කාර්යසාධනය සහ රජයේ ආදායම්වලට එහි දායකත්වය අතර ධනාත්මක සම්බන්ධතාව පෙන්නුම් කරයි. මූල්‍ය සේවා මත VAT සහ SSCL වසරකට පෙර වාර්තාකළ රු. බිලියන 9.3 සිට රු. බිලියන 12.9 දක්වා 37.9%කින් වැඩිවූ අතර එයට බැංකුවේ මෙහෙයුම් හරහා බදුකළහැකි මූල්‍යමය මැදිහත්වීමේ කටයුතුවල ප්‍රසාරණය සහ වඩා ඉහළ වටිනාකම් නිර්මාණය හේතු විය.

මෙම වැඩිවීම්වල ප්‍රතිඵලයක් ලෙස, ඵලදායී බදු අනුපාතය (විලම්භිත බදු රහිත) පසුගිය වසරේ පැවති 38.4% සිට 38.6% දක්වා සුළු වශයෙන් ඉහළ ගිය අතර ඉන් ලාභදායිතාව සහ අදාළ බදු පාලන තන්ත්‍රය වැඩිවීමේ අභ්‍යන්තර ක්‍රියාකාරිත්වය පිළිබිඹු කරයි.

**බදු දායකත්වයන් මත CRROs හි ගම්‍යාර්ථ**

- **හරිත බදු දිරිදීමනා:** තිරසාර මූල්‍ය කටයුතු සඳහා විභව බදු සහන ඵලදායී බදු අනුපාතයට සහ කළඹ වෙන්කිරීමේ තිරණ කෙරෙහි බලපා හැකිය.
- **කාබන් මිලකරණ නිරාවරණය:** අනාගත කාබන් බදු හෝ මෙහෙයුම් මත බදු (බලශක්ති භාවිතය, රථවාහන ගමන්) වක්‍ර බදු බර වැඩි කළ හැකිය.
- **මූල්‍ය ප්‍රතිපත්ති පෙළ ගැසීම:** රජයට අයත් ආයතනයක් ලෙස, බදු දායකත්වයන් සෘජුවම රජයේ ආදායම් ඉලක්ක සහ දේශගුණික මූල්‍ය බැඳීම්වලට සහය වේ.

**ඉදිරි දැක්ම**

බැංකුව ලබාගතහැකි හරිත බදු දිරිදීමනා ගවේශනය කරමින් මූල්‍ය ව්‍යවස්ථාවන්ට සම්පූර්ණ අනුකූලතාව පවත්වා ගනු ලබයි. බදු දායකත්වයන් තිරසාර ලාභදායිතාව සමඟ ජාතික සංවර්ධන ප්‍රමුඛතාවන්ට අඛණ්ඩව සහය වනු ඇත.

## 2.6 තිරසාර ලාභදායිතාව සහ ඉපයීම් ගම්‍යතාව


බැංකුවේ මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු (VAT) සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) ට පෙර මෙහෙයුම් ලාභය පසුගිය වසරේ පැවති රු. බිලියන 35.6 සිට 2025 දී රු.බිලියන 57.4 දක්වා ඉහළ යමින් 61%ක ශක්තිමත් වර්ධනයක් වාර්තා කර ඇත. මෙම ශක්තිමත් මෙහෙයුම් කාර්යසාධනය බදු පෙර ලාභය තුළ 69%ක වැඩිවීමක් ලෙසට පරිවර්තනය විය. එය රු.බිලියන 26.3 සිට රු. බිලියන 44.5 දක්වා ඉහළයාමක් වන අතර, බදු පසු ලාභය ද වසරකට පෙර වාර්තාකළ රු. බිලියන 16.1 ට සාපේක්ෂව රු.බිලියන 27.3 දක්වා අනුරූපව ඉහළ ගොස් ඇත. ලාභදායිතාව තුළ මෙම සැලකියයුතු ප්‍රසාරණයට සවිබලගැන්වීමේ සාධක දෙකක් මූලිකවම හේතු විය. ඒවානම්, වත්කම්වල තත්ත්වය ශක්තිමත්වීම බිළිබිඹු කරමින් හානිකරණ අයකිරීම්වල සැලකියයුතු අඩුවීම සහ පොලී වියදම්වල තියුණු පහත වැටීමයි. මෙය පොලී ආදායම තුළ මධ්‍යස්ථ සංකෝචනය හිලව් කිරීමට වැඩි හේතුවකි. මෙම කාර්යසාධනයෙන් බැංකුවේ සක්‍රිය වගකීම් කළමනාකරණය, විනයගරුක මිලකරණ උපායමාර්ග සහ ශක්තිමත් ණය අවදානම් රාමුවේ ඵලදායිතාවය තහවුරු කරයි.

මෙම සුවිශේෂී ඉපයීම් ගම්‍යතාව පිළිබිඹු කරමින්, සියලුම ප්‍රධාන කොටස්හිමි වටිනාකම් මාත්‍රික වසර තුළ සලකුණුකළ වර්ධනයන් වාර්තා කර ඇත. කොටස ඉපයීම (EPS) පසුගිය වසරේ පැවති රු. 17.15 සිට රු. 29.06 දක්වා 69%කින් වැඩිවිය. ස්කන්ධය මත ඉපයීම් (ROE) 17.89% සිට 25.08% දක්වා සැලකියයුතු ලෙස ශක්තිමත් වූ අතර වත්කම් මත ඉපයීම් (ROA) 1.53% සිට 2.48% දක්වා වැඩි විය. කොටසකට ශුද්ධ වත්කම් වටිනාකම රු. 105.15 සිට රු. 126.65 දක්වා වැඩි වූ අතර ඉන් ශක්තිමත් ලාභ රඳවා ගැනීම තුළින් බැංකුවේ ප්‍රාග්ධන පදනම අඛණ්ඩව ශක්තිමත් කිරීම පිළිබිඹු කරයි.

වසරේ වඩා ශක්තිමත් ලාභදායිතාව එහි තනි කොටස්හිමිකරු වෙත ප්‍රාග්ධන ප්‍රදානය ශක්තිමත් කිරීමේ බැංකුවේ හැකියාව සහ ශ්‍රී ලංකාවේ රජයට අයත් ප්‍රමුඛ ඉතුරුම් බැංකුව ලෙස සිය කාර්යභාරය තුළ විශ්වාසය රඳවාගැනීම වැඩි කර ඇත.

### ලාභදායීතාව මත බදු බලපෑම

පිටුව 36





| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| ආදායම් බදු ඵලදායී අනුපාතය (PBT මත පදනම්) (RHS) | 22.06 | 43.90 | (68.32) | 38.62 | 38.60 |
| බදු පසු ලාභය (LHS) | 22.12 | 2.53 | 7.22 | 16.12 | 27.32 |
| ගෙවන ලද මුළු බදු (LHS) | 12.42 | 5.23 | (1.63) | 19.49 | 30.07 |

# මූල්‍ය ප්‍රාග්ධනය

## බදු පෙර ලාභයට එදිරි ස්කන්ධය මත ඉපයීම හා වත්කම් මත ඉපයීම


ප්‍රස්ථාර 37




| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| බදු පසු ලාභය (LHS) | 22 | 3 | 7 | 16 | 27 |
| සාමාන්‍ය කොටස්හිමි ස්කන්ධය මත ප්‍රතිලාභ (ROE) – (RHS) | 33.92 | 3.40 | 9.36 | 17.89 | 25.08 |
| සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ (ROA) – (RHS) | 1.93 | 0.28 | 0.26 | 1.53 | 2.48 |

## සාමාන්‍ය කොටස්හිමි ස්කන්ධය


ප්‍රස්ථාර 38




| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| සාමාන්‍ය කොටස්හිමි ස්කන්ධය | 65 | 74 | 77 | 90 | 109 |

## බදු පෙර ලාභය හා බදු පසු ලාභය

ප්‍රස්ථාර 39




| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| බදු පෙර ලාභය | 28.4 | 4.5 | 4.3 | 26.3 | 44.5 |
| බදු පසු ලාභය | 22.1 | 2.5 | 7.2 | 16.1 | 27.3 |

**ලාභදායිතාව මත CRROs හි ගමන්මාර්ග**

- **දේශගුණය අවදානම් ගලපනලද ලැබීම්:** දේශගුණික අවදානම මිලකරණය සහ සැපයුමට ඒකාබද්ධ කිරීම කෙටිකාලීන ආන්තික සංකෝචනය කලත් දිගුකාලීන ඉපයීම් ස්ථාවරත්වය වර්ධනය කරයි.
- **තිරසාර මූල්‍ය ලාභදායිතාව:** හරිත බැඳුම්කර සහ තිරසාරතාවයට බැඳුණු ණය වඩා අඩු මූලික ඉපයීම් පිරිනැමුවද, වඩා අඩු පිරිවැය අරමුදල් සහ මනාප නියාමන සැලකීම ආකර්ෂණය කර ගනී.
- **විවිධාංගීකරණය තුළින් ඔරොත්තුදීම:** දේශගුණිකව ඔරොත්තු දෙන අංශ සමඟ කළඹ ගැලපීම දේශගුණිකව අදාළ කම්පනවලින් ඉපයීම් වෙනස්වීම් අඩු කරයි.

**ඉදිරි දැක්ම**

විවිධාංගීකරණය කළ ආදායම් මූලාශ්‍ර, විනයගරුක පිරිවැය කළමනාකරණ, සහ කාබනික ප්‍රාග්ධන උත්පාදනය මගින් සහය වෙමින් ලාභදායිතාව ශක්තිමත්ව පැවතීම අපේක්ෂා කෙරේ. බැංකුව නියාමන වෙනස්වීම් අවශෝෂණය කරගැනීමට මනාව ස්ථාපිත වී ඇති අතර කොටස්හිමියන්ට තිරසාර ප්‍රතිඵල ලබා දේ.

## 2.7 අනෙකුත් විස්තීර්ණ ආදායම තුළ වෙනස්වීම්

වසර සඳහා ලාභයෙන් ඔබ්බට, බැංකුව අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් වෙනස්වීම් වාර්තා කර ඇත. 2025 දී, බැංකු මට්ටමේදී මුළු විස්තීර්ණ ආදායම 2024 දී පැවති රු. බිලියන 17.3ට සාපේක්ෂව රු. බිලියන 26.1ක් විය.

මෙය අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් මනින ලද ආයෝජන මත ලැබීම්වලින් අර්ධ වශයෙන් හිලව් කරනු ලැබුවද අනෙකුත් විස්තීර්ණ ආදායම පශ්චාත්-සේවක ප්‍රතිලාභ බැඳීම් නැවත මැනීම සහ සමහර ආයෝජන උපකරණ මත වඩා අඩු සාධාරණ වටිනාකම මගින් සෘණාත්මකව බලපාන ලදී. මෙම වෙනස්වීම් වැදගත් වන්නේ ඒවා ආදායම් ප්‍රකාශය තුළින් සෘජුව පසුනොකරන අවස්ථාවලදී පවා ඒවා සංචිත සහ මුළු ස්කන්ධයට බලපාන බැවිනි.

මෙය මූල්‍ය කාර්යසාධනයේ වඩා පුළුල් දැක්මක් සඳහා අවශ්‍යතාව සවිබලගන්වන අතර, එය බදු පසු ලාභය පමණක් නොව සංචිත වෙනස්වීම්, ඇගයීම් වෙනස්වීම්, සහ මුළු ප්‍රාග්ධන ශක්තියට ඒවායේ බලපෑම සලකා බැලීමක් ද වේ.

# මූල්‍ය ප්‍රාග්ධනය

**අනෙකුත් විස්තීර්ණ ආදායම මත CRROs හි ගම්‍යතාව**

- **ආයෝජන කළඹ තුළ දේශගුණික අවදානම:** හරිත බැඳුම්කර සහ තිරසාරව බැඳුණු උපකරණවල සාධාරණ අගයේ වෙනස්වීම් සංචිත ශක්තියට බලපෑමින් අනෙකුත් විස්තීර්ණ ආදායමට බලපායි.
- **පශ්චාත් සේවක ප්‍රතිලාභ බැඳීම්:** ආයුගණක උපකල්පන (ජීවිත අපේක්ෂාව, සෞඛ්‍යාරක්ෂක වියදම්) වලට දේශගුණයට අදාළ ගැලපීම් LKAS 19 යටතේ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් නැවත මැනීමට බලපෑ හැකිය.
- **කාබන් ණය ඇගයීම්:** බැංකුව කාබන් ණය හෝ ස්වභාවය පදනම් වත්කම්වල ආයෝජනය කරයි නම්, සාධාරණ අගයේ වෙනස්වීම් අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් ප්‍රවාහය වනු ඇත.

**ඉදිරි දැක්ම**

බැංකුව අනෙකුත් විස්තීරණ ආදායමේ වෙනස්වීම කළමනාකරණය කර ගැනීමට ශක්තිමත් ALM සහ සාධාරණ වටිනාකම් මැනීමේ විනය පවත්වා ගනු ඇත. විස්තීර්ණ ආදායමේ විනිවිද අනාවරණය මූල්‍ය ශක්තිය හා සංචිත ප්‍රමාණතාව පිළිබඳ සම්පූර්ණ දැක්මක් නියාමකයින්ට සහ පාර්ශ්වකරුවන්ට අඛණ්ඩව ලබා දෙනු ඇත.

## අ) මූල්‍ය කළමනාකරණ ප්‍රකාශය

2025 දී, බැංකුව මනිනලද වත්කම් වර්ධනය, විචක්ෂණ වගකීම් කළමනාකරණය, වඩා ශක්තිමත් වත්කම්වල තත්ත්වය, විනයගරුක භාණ්ඩාගාර සේවයේ යෙදවීම, සහ ශක්තිමත් ප්‍රාග්ධන හා ද්‍රවශීල ස්වාරක්ෂක තුළින් සිය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ තත්ත්වය, ඔරොත්තුදීම සහ කාර්යක්ෂමතාව අඛණ්ඩව ශක්තිමත් කරන ලදී. මෙම ශේෂ පත්‍ර හැකියාවන් තැන්පත්කරු විශ්වාසය සුරක්ෂිත කිරීමට සහ බැංකුවට විවිධ ආර්ථික තත්ත්වයන් හරහා ආරක්ෂිතව සහ ඵලදායීව මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගතහැකි බව සහතික කිරීමට ඉවහල් වේ.

## 2.8 මුළු වත්කම් වර්ධනය හා සංයුතිය

2025 දී, බැංකුව මනිනලද සහ ඔරොත්තුදෙන ආකාරයෙන් සිය ශේෂ පත්‍රය අඛණ්ඩව පුළුල් කරන ලදී. මුළු වත්කම් වැඩිවීමෙන් 4.5%ක් නියෝජනය කරමින් රු. ට්‍රිලියන 1.75 සිට රු.ට්‍රිලියන 1.83 දක්වා දක්වා වැඩි විය.

මෙම වර්ධනයට මූලිකවම සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම්, ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද ණය උපකරණ, සහ ණය සහ අත්තිකාරම්වල වැඩිවීම් හේතු විය. වත්කම් මුසුව හරහා විචක්ෂණ ආයෝජනය තුළින් තැන්පත්කරුවන්ගේ අරමුදල් සුරක්ෂිත කිරීම සහ වගකිම්සහගත ණයදීම තුළින් ආර්ථික කටයුතුවලට සහයවීම යන බැංකුවේ දෙයාකාර විධි නියෝගය පිළිබිඹු කරයි. මූලික වශයෙන්ම රජයේ සුරැකුම්පත්වලින් සමන්විත ආයෝජන කළඹ ද්‍රවශීලතා ස්වාරක්ෂක සහ ස්ථාවර ඉපයීම් ලබාදෙන අතර, ණය කළඹ ආර්ථිකයේ නිෂ්පාදන අංශ කරා ඉතුරුම් සෘජුව මාර්ගගත කරයි.


ශුද්ධ ණය හා අත්තිකාරම් රු. බිලියන 550.8 දක්වා වැඩි වූ අතර, ණය හා වෙනත් උපකරණ රු. ට්‍රිලියන 1.1 දක්වා වැඩි විය. බැංකුව මනිනලද වත්කම් වර්ධනයට සහය වෙමින් ද්‍රවශීලතාව සහ ඉපයීම් සුරක්ෂිත කරමින් සිය ප්‍රධාන භාණ්ඩාගාර වත්කම් උපායමාර්ගය සමඟ ණයදීමේ කටයුතු අඛණ්ඩව තුලනය කරන බව මෙයින් පෙන්නුම් කරයි.

## 2.9 ණය හා අත්තිකාරම්

නිවාස ණය, උකස් අත්තිකාරම්, පුද්ගලික ණය, සහ වෙනත් පහසුකම්වලින් සමන්විත බැංකුවේ ශුද්ධ ණය හා අත්තිකාරම් කළඹ පසුගිය වසරට වඩා 3.5% ක වර්ධනයක් වාර්තා කරමින් 2025 දෙසැම්බර් 31 දිනට රු. බිලියන 550.8 දක්වා ලඟා විය. ආර්ථික කොන්දේසි ස්ථායිකරණය සහ පාරිභෝගික විශ්වාසය වර්ධනය වැඩි වූ ණය ගැනීමේ කටයුතුවලට සහය වූ බැවින්, මෙම පුළුල් කිරීම විශේෂයෙන් පාරිභෝගිත අංශවල ණය ඉල්ලුමෙහි ක්‍රමික පෙරලා පැමිණීම මගින් තහවුරු කරන ලදී.


කළඹ තුළ වර්ධනයේ සැලකියයුතු ප්‍රසාරණය උකස් අත්තිකාරම් මගින් ඇති කළේය. එය වසර තුළ රු. බිලියන 155.4 දක්වා 29.8%කින් වැඩි වූ අතර කළඹට අතිරේක රු. බිලියන 35.7ක් දායක කර ඇත. උකස් අංශය තුළ මෙම ශක්තිමත් කාර්යසාධනය දිගුකාලීන ණයවල රු. බිලියන 27.4ක පහත

**මුළු වත්කම්** ප්‍රස්ථාර 40




| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| ණය හා අත්තිකාරම් | 539 | 553 | 527 | 532 | 551 |
| ආයෝජන | 981 | 979 | 1,053 | 1,136 | 1,211 |
| වෙනත් වත්කම් | 59 | 85 | 107 | 84 | 69 |

**වත්කම් වර්ධනය** ප්‍රස්ථාර 41





| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| මුළු වත්කම් (LHS) | 1,579 | 1,617 | 1,687 | 1,752 | 1,831 |
| වත්කම් වර්ධනය - බැංකුව | 15.79 | 2.38 | 4.35 | 3.88 | 4.48 |
| වත්කම් වර්ධනය - බැංකු ක්ෂේත්‍රය | 15.39 | 15.40 | 5.04 | 8.73 | 12.53 |

# මූල්‍ය ප්‍රාග්ධනය


වැටීම පියවා ගැනීම මෙන්ම, පවත්නා ආර්ථික වාතාවරණයන් හමුවේ වඩා කෙටි කාලීන සුරක්ෂිත ණය පහසුකම් කරා ණයගැතියන්ගේ මනාපය විතැන්වීම පිළිබිඹු කරයි.

**ශුද්ධ ණය හා අත්තිකාරම්** ප්‍රස්ථාර 42




| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| ශුද්ධ ණය හා අත්තිකාරම් | 539 | 553 | 527 | 532 | 551 |

**ශුද්ධ ණය හා අත්තිකාරම්** ප්‍රස්ථාර 43




## 2.10 ණය අවදානම් කළමනාකරණය හා වත්කම්වල තත්ත්වය සුරක්ෂිත කිරීම

පූර්ව හඳුනාගැනීම, සක්‍රීය නියාමනය සහ විනයගරුක අයකිරීමේ ව්‍යවහාර මත ශක්තිමත් අවධාරණයක් සමඟ SLFRS 9 යටතේ ණය අවදානම් කළමනාකරණයට ඉදිරිය දකින ප්‍රවේශයක් බැංකුව පවත්වා ගනී. 2025 වසර තුළ, වත්කම්වල තත්ත්ව මාන්ත්‍රික විවිධ මානයන් හරහා අර්ථවත් වර්ධනයන් වාර්තා කළ අතර, වැඩිකළ ණය නියාමන රාමු සහ ඉලක්කගත අයකිරීමේ මූලපිරීම්වල ඵලදායිත්වය පිළිබිඹු කරයි.

දළ අදියර 3 ණය පසුගිය වසරේ රු. බිලියන 49.7 සිට 2025 දෙසැම්බර් 31 දිනට රු. බිලියන 33.6 දක්වා පහත වැටුණු අතර ඉන් 32.4%ක සැලකියයුතු අඩුවීමක් නියෝජනය කරයි. වර්ධනීය ආර්ථික තත්ත්වයන් හමුවේ ණයගැතියාගේ මුදල් ප්‍රවාහ ශක්තිමත් වූ බැවින්, මෙම වර්ධනය ඇති කරනු ලැබුවේ තිරසාර අයකිරීමේ ගාමක බලය මගිනි. විශේෂිත ණය අයකරන්නන් පත් කිරීම සහ වියුහගත අයකිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අක්‍රිය ණය නිරාවරණ අඩු කිරීමට විශේෂයෙන් දායක විය. එහි ප්‍රතිඵලයක් ලෙස, හානිකරණ ණය (අදියර 3) අනුපාතය 2024 මූල්‍ය වසර අවසානයේදී වාර්තාකළ 5.18% සිට 2.53% දක්වා තියුණු ලෙස වර්ධනය විය.

බැංකුව පසුගිය වසරේ 44.50% සිට 58.56% දක්වා ශක්තිමත් කළ අදියර 3 වෙන් කිරීමේ ආවරණය සමඟ විචක්ෂණ හා මනාව ක්‍රමාංකිත වෙන් කිරීමේ ස්ථාවරයක් පවත්වාගෙන ඇත. අදියර 1 සහ අදියර 2 ණය සඳහා ආවරණය පිළිවෙලින් 1.0% සහ 12.9% හි සුදුසු මට්ටම්වල පැවතුණි. ආවරණ අනුපාතවල මෙම වර්ධනය තුළින් සාර්ව ආර්ථික වෙනස්වීමට අනුව ශක්තිමත් ස්වාරක්ෂක පවත්වා ගැනීමට බැංකුවේ කැපවීම මින් පෙන්වා දෙන අතර


වත්කම්වල තත්ත්වය අබණ්ඩව වර්ධනය වන විටදී පවා තැන්පත්කරුවන්ගේ සහ වෙනත් පාර්ශ්වකරුවන්ගේ බැඳියාවන් ආරක්ෂා කරයි.

## 2.11 ආයෝජන කළඹ කළමනාකරණය

භාණ්ඩාගාරයේ හැකියාව ඉපයීම්වල තත්ත්වයට හා ද්‍රවශීලතා ඔරොත්තුදීමට කේන්ද්‍රීය ධාවකයින් වෙති. 2025 දී, බැංකුවේ ආයෝජන කළඹ පසුගිය වසරට වඩා 6.7%ක වැඩිවීමක් වාර්තා කරමින් රු.ට්‍රිලියන 1.2 දක්වා වැඩි විය. මෙම වර්ධනය මගින් බැංකුවේ මධ්‍යස්ථ ණය ස්ථාපනය හා නියාමන බැඳීම් සමඟ අනුරූපව උසස් තත්ත්වයේ ද්‍රවශීල වත්කම්වලට කල්පිරෙන සුරැකුම්පත් නැවත ආයෝනය හා වර්ධනීය තැන්පතු උපායමාර්ගිකව සේවයේ යෙදවීම පෙන්නුම් කරයි.


රජයේ සුරැකුම්පත් ප්‍රධාන සංරචකයක්ව පවතින අතර, මුළු ආයෝජන කළඹින් 87.7%ක් ඇතුළත්ය. මෙම වෙන් කිරීම ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත යටතේ බැංකුවේ ව්‍යවස්ථාපිත විධි නියෝගය හා සමපාත වේ. මෙම පනතින් තැන්පතුවලින් 60% ක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම අවශ්‍ය වන අතර, ඉන් අපගේ මධ්‍යස්ථ ආයෝජන ස්ථාපනය සහ ශක්තිමත් ද්‍රවශීලතා ස්වාරක්ෂක පවත්වා ගැනීමේදී මෙම උපකරණ විසින් ඉටුකරන

**වත්කම්වල තත්ත්වය** ප්‍රස්ථාර 44




| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| අදියර 1 | 505 | 516 | 486 | 488 | 506 |
| අදියර 2 | 20 | 22 | 28 | 17 | 31 |
| අදියර 3 | 14 | 16 | 13 | 28 | 14 |
| ශුද්ධ අදියර 3 අනුපාතය (RHS) | 2.54 | 2.82 | 2.41 | 5.18 | 2.53 |

**වෙන්කිරීම් ආවරණය** ප්‍රස්ථාර 45




| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| අදියර 3 හානිකරණය (LHS) | 6,304 | 9,913 | 14,449 | 22,105 | 19,660 |
| අදියර 3 වෙන්කිරීම් ආවරණය | 31.52 | 38.86 | 53.28 | 44.50 | 58.56 |


# මූල්‍ය ප්‍රාග්ධනය

තීරණාත්මක කාර්යභාරය පෙන්නුම් කරයි. මෙම කළඹ ව්‍යූහගත කරනු ලබන්නේ කාල කළමනාකරණය, නැවත ආයෝජන අවදානම, සහ බැංකුවේ වත්කම් හා වගකීම් කළමනාකරණ රාමුව සමඟ පෙළගැනීමට පරීක්ෂාකාරී අවධානය සමඟ නිශ්චිත අවදානම් පරාමිති තුළ ලැබීම් ප්‍රසාත්ත කිරීම සඳහාය.


කළඹින් 9.0%ක් සමන්විත ණය උපකරණ රු. බිලියන 108.7ක් වූ අතර අනුමත ණය අවදානම් සීමා තුළ රැඳෙමින් ආදායම් වැඩිකිරීම සිදු කරයි. බැංකු සමඟ ස්ථාපන කළඹ 2.0% දක්වා වැඩිවී ඇති අතර 2024 මූල්‍ය වසර අවසානයේදී වාර්තාකළ රු. බිලියන 14.8 සිට රු. බිලියන 24.2 දක්වා 63.4%ක සැලකියයුතු වර්ධනයක් වාර්තා කළේය. මෙම වැඩිවීම හිතකර වෙළෙඳපොල අවස්ථා සහ බැංකුවේ සක්‍රීය ද්‍රවශීලතා කළමනාකරණය මගින් ඇති කරන ලදී.

බැංකුව වසර තුළ විනයගරුක භාණ්ඩාගාර මෙහෙයුම් පවත්වා ගෙන ඇති අතර එයට වැඩිකළ ඇගයිම් පාලනයන්, ස්වාධීන මිල සත්‍යාපනය, සහ ඉදිරි කාර්යාලය හරහා ශක්තිමත් රාජකාරී වෙන් කිරීම, අවදානම් කළමනාකරණය, සහ පසු-කාර්යාල කාර්යයන් හේතු විය. නිරන්තර පීඩන පරීක්ෂණ හා සංවේදිතා විශ්ලේෂණ කළඹ ඇගයීම මත වෙළෙඳපොල වෙනස්වීම්වල බලපෑම තක්සේරු කිරීම පවත්වනු ලබන අතර අභ්‍යන්තර සීමා සහ නියාමන අවශ්‍යතා සමඟ අනුකූලතාව දෛනිකව නියාමනය කෙරේ. මෙම ව්‍යවහාර මගින් තැන්පතුහිමියන් විසින් පවරන ලද අරමුදල් ආරක්ෂිතව, විනිවිදව සහ බැංකුවේ විධිනියෝගය, අවදානම් රුචිය, සහ පාලන රාමුවට දැඩි අනුකූලතාවය සමඟ සේවයේ යොදවන බව සහතික කරයි.

**ආයෝජනවල සංයුතිය** ප්‍රස්ථාර 46





**රජයේ සුරැකුම්පත් මුසුව** ප්‍රස්ථාර 47




| | | |
|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් | 19% | 16% |
| භාණ්ඩාගාර බැඳුම්කර | 81% | 84% |

**ආයෝජන** ප්‍රස්ථාර 48




| | | | | | |
|---|---|---|---|---|---|
| වෙනත් ආයෝජන | 147 | 157 | 168 | 162 | 149 |
| රජයේ සුරැකුම්පත් | 834 | 821 | 885 | 973 | 1,063 |

## 2.12 විචක්ෂණ ණය සහ වගකීම් කළමනාකරණය

### තැන්පතු


ගනුදෙනුකාර තැන්පතු 2025 දී බැංකුවේ අරමුදල් ආදර්ශයේ කොඳනාරටිය ලෙස පැවති අතර, ශේෂ පතු වර්ධනයට සහ ද්‍රවශීලතා ඔරොත්තුදීමට ස්ථාවර, අඩු අවදානම් පදනමක් අඛණ්ඩව ලබා දෙන ලදී. 2025 දෙසැම්බර් 31 දිනට, මුළු තැන්පතු රු.ට්‍රිලියන 1.61 දක්වා ලඟාවීමට 3.4%කින් වර්ධනය වූ අතර එය රඳවාගත් තැන්පත්හිමියන්ගේ විශ්වාසය සහ බැංකුවේ තැන්පතු සඳහා වූ රජයේ ඇපවීම මගින් තහවුරු කර ඇත. ගනුදෙනුකාර තැන්පතු පසුගිය වසරේ 88.8%ට සාපෙක්ෂව වසර අගදී මුළු වත්කම්වලින් 87.8%ක් වූ අතර බැංකුවේ ප්‍රධාන අරමුදල් මූලාශය ලෙස එය අඛණ්ඩව නියෝජනය කරයි.

ඉතුරුම් තැන්පතුවල වඩා ශක්තිමත් වර්ධනය අරමුදල් මුසුව වර්ධනය කළ අතර බැංකුවේ සම්ප්‍රදායික ඉතුරුම් යෙදවුම් විධිනියෝගය සවිබලගන්වා, මුළු අරමුදල තුළ ස්ථාවර, අඩු පිරිවැය තැන්පතුවල කොටස වැඩි කරයි. තැන්පතු පදනම තුළ, ඉතුරුම් තැන්පතු 11.7%ක ශක්තිමත් වර්ධනයක් වාර්තා කළ අතර එය පසුගිය වසරේ රු.බිලියන 303 සිට රු. බිලියන 338 දක්වා වැඩි වීමකි. ස්ථාවර තැන්පතු වඩා මධ්‍යස්ථව 1.3%කින් වර්ධනය වූ අතර රු. ට්‍රිලියන 1.27 දක්වා ලඟාවිය. ඉතුරුම් තැන්පතුවල වඩා ශක්තිමත් ගම්‍යතාව 2024 අවසානයට 19.4%ට සාපේක්ෂව මුළු තැන්පතු පදනමෙන් 21.0%ක් නියෝජනය කරන ඉතුරුම් සමඟ සමස්ථ අරමුදල් මුසුව වර්ධනය කරන ලදී. අඩු පිරිවැය ස්ථාවර අරමුදලේ වඩා ඉහළ කොටසක් කරා මෙම හිතකර විතැන්වීම ශුද්ධ පොළී ආන්තික ඔරොත්තුදීම ශක්තිමත් කර, අරමුදල් පිරිවැය වෙනස්වීම අඩුකර ඇති අතර තවදුරටත් බැංකුවේ අරමුදල් ව්‍යූහය සකසුරුවම් සහ මූල්‍ය අන්තර්කරණය ප්‍රවර්ධනය කිරීමේ සිය විධිනියෝගය සමඟ පෙළ ගස්වා ඇත.

# මූල්‍ය ප්‍රාග්ධනය

## ඉතුරුම් එදිරි කාලීන තැන්පතු

ප්‍රස්ථාර 49




| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| ඉතුරුම් | 326 | 265 | 278 | 303 | 338 |
| ස්ථාවර තැන්පතු | 1,103 | 1,212 | 1,204 | 1,254 | 1,271 |
| ඉතුරුම් මුසුව (RHS) | 29.5% | 21.8% | 23.1% | 24.1% | 26.6% |

## වෙනත් වගකීම් හා ස්කන්ධය

ප්‍රධාන වශයෙන් වඩා ඉහළ කැපීපෙනෙන මෙහෙයුම් වගකීම් හේතු කොට ගෙන, වෙනත් වගකීම් පසුගිය වසරේ පැවති රු. බිලියන 97.3 සිට 2025 දී රු. බිලියන 103.5 දක්වා වැඩි විය. මුළු ස්කන්ධය පෙර වසරේ රු. බිලියන 98.8ට සාපේක්ෂව 2025 දෙසැම්බර් 31 දිනට රු. බිලියන 119.1 දක්වා ලඟා වෙමින් 20.4%ක ශක්තිමත් වැඩිවීමක් වාර්තා කළේය. මෙම වර්ධනය වසර තුළ ජනනය කළ රඳවාගත් ඉපයීම්වලින් ඇති කළ අතර ඒමගින් බාහිර ප්‍රාග්ධන සහය තුළින් නොවන තිරසාර ලාභදායිතාව තුළින් මූලිකවම සිය ශේෂ පත්‍රය ශක්තිමත් කිරීමට බැංකුවේ හැකියාව පෙන්නුම් කරයි.


## අරමුදල් මූලාශ්‍රය හා උපයෝජනය

බැංකුවේ අරමුදල් කළඹ අරමුදල්වල ප්‍රධාන මූලාශ්‍රය ලෙස සේවන කරන ගනුදෙනුකාර තැන්පතු, මෙහෙයුම් මුදල් උත්පාදනය, සහ ආයෝජන කල්පිරීම් සමඟ ස්ථාවර හා විවිධාංගීකරණය කළ පදනම් මත අඛණ්ඩව ගොඩ නැඟේ.

මෙවැනි මූලාශ්‍ර ණය හා අත්තිකාරම්, ණය උපකරණවල ආයෝජන, ද්‍රවශීලතා සංචිත, මෙහෙයුම් වියදම, බදු බැඳීම්, ලාභාංශ ගෙවීම් සහ උපායමාර්ගික ප්‍රාග්ධන වියදම හරහා විචක්ෂණව යොදවන ලදී. මෙමගින් මූල්‍ය කළමනාකාරිත්වයට තුලනාත්මක ප්‍රවේශයක් පිළිබිඹු කරන අතර අරමුදල් ස්ථාවරත්වය සහ අනුකූලතාව සුරක්ෂිත කිරීමට වෙන් කිරීම පමණක් නොව තැන්පතුහිමියන්, පාර්ශ්වකරුවන්, සහ වඩා පුළුල්ව ආර්ථිකය සඳහා දිගුකාලීන වටිනාකම උත්පාදනය සහතික කරයි.

## අරමුදල් මූලාශ්‍රය


ප්‍රස්ථාර 50




| | | | | |
|---|---|---|---|---|
| 2024 | 205,453 | 85,708 | 18,938 | 18,020 |
| 2025 | 194,540 | 52,978 | 258 | 17,329 |

## අරමුදල් උපයෝජනය

ප්‍රස්ථාර 51





| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2024 | 15.4 | 94.6 | 27.7 | 144.3 | 19.2 | 7.0 | 0.8 | - | 14.5 | 4.6 |
| 2025 | 21.8 | 60.6 | 10.5 | 112.1 | 19.1 | 8.0 | 1.5 | 5.0 | 25.7 | 0.7 |

# මූල්‍ය ප්‍රාග්ධනය

## අරමුදල් ව්‍යූහය

ප්‍රස්ථාර 52




| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| ස්කන්ධය | 76,013 | 72,892 | 81,374 | 98,843 | 119,051 |
| REPO ණයගැනීම් | 8,221 | 20,776 | 36,922 | 48,190 | 39,057 |
| යටත්කළ වගකීම් | 5,087 | 5,108 | 5,108 | 5,101 | 5,085 |
| යටත් නොකළ වගකීම් | 32,442 | 18,670 | 18,698 | 11,866 | 11,826 |
| වෙනත් ණයගැනීම් | 7,185 | 77 | 33,674 | 488 | 81 |
| තැන්පතු (RHS) | 1,428,467 | 1,476,740 | 1,482,532 | 1,556,271 | 1,608,490 |

## 2.13 ශක්තිමත් ප්‍රාග්ධනය හා ද්‍රවශීලතා ස්වාරක්ෂක පවත්වා ගැනීම

### ප්‍රාග්ධන කළමනාකරණය හා නියාමන අනුපාත


විචක්ෂණ ප්‍රාග්ධන කළමනාකරණය බැංකුවේ මූල්‍ය උපායමාර්ගයේ ප්‍රධාන ප්‍රතිඵලයක්ව පවතී. ශක්තිමත් ලාභ රඳවාගැනීම මගින් තහවුරුකළ මුළු කොටස්හිමියන්ගේ ස්කන්ධය තුළ සැලකියයුතු වැඩිවීම බැංකුවේ ප්‍රාග්ධන පදනම තවදුරටත් ශක්තිමත් කරන අතර අබණ්ඩව ශේෂ පත්‍ර වර්ධනයට සහය වෙමින් විභව කම්පන අවශෝෂණය කර ගැනීමට ඇති සිය හැකියාව වැඩි කර ඇත.

ප්‍රධාන ප්‍රාග්ධන අනුපාත වසර මුළුල්ලේම නියාමන අවශ්‍යතාවයට වඩා ඉහළින් පැවතුණි. ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය 8.5%ක නියාමන අවමය සැලකියයුතු ලෙස ඉක්මවා යමින් 24.9%ක් වූ අතර මුළු ප්‍රාග්ධන අනුපාතය 12.5%ක අවම අවශ්‍යතාවයෙන් දෙගුණයකට වැඩි වෙමින් පහසුවෙන් 26.8%ට ලඟා විය. මෙම ශක්තිමත් ස්වාරක්ෂක සාර්ව ආර්ථික අවිනිශ්චිතතා යාත්‍රණය කිරීමට හා උපායමාර්ගික වර්ධන මුලපිරීම් හඹායාමට සැලකියයුතු ආවරණයක් සපයයි.

බාසල් III උත්තෝලන අනුපාතය 3.0%ක අවම අවශ්‍යතාවයට වඩා ඉහළින් පෙර වසරේ පැවති 8.0% සිට 9.3% දක්වා වර්ධනය විය. මෙම වර්ධනයෙන් බැංකුවේ ඔරොත්තුදීම සහ ශ්‍රී ලාංකීය බැංකු අතර ශක්තිමත් ප්‍රාග්ධන කොටස පවත්වා ගැනීමට එහි නොසැලෙන බැඳීම සවිබල ගන්වමින් ශේෂ පත්‍ර නිරාවරණය මත ස්කන්ධ ප්‍රාග්ධනයෙහි වැඩිවීම සහ විනයගරුක කළමනාකරණය පිළිබිඹු කරයි.

## ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය


ප්‍රස්ථාර 53




| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| Basel III – Tier I | 18.60 | 15.78 | 16.91 | 23.42 | 24.90 |
| Basel III – Total | 20.83 | 18.00 | 19.26 | 25.88 | 26.83 |

## අවදානම බරතබන ලද වත්කම් මත ප්‍රතිලාභ

ප්‍රස්ථාර 54




| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| අවදානම බරතබන ලද වත්කම් මත ප්‍රතිලාභ | 6.7 | 0.7 | 2.2 | 5.3 | 8.7 |

# මූල්‍ය ප්‍රාග්ධනය


## ද්‍රවශීලතා කළමනාකරණය හා නියාමන අනුපාත

බැංකුව 100%ක අවම අවශ්‍යතාව සැලකියයුතු ලෙස ඉක්මවා යමින් 349.2%ක සියලු ව්‍යවහාර මුදල් ද්‍රවශීලතා ආවරණ අනුපාතයක් සහ 360.4%ක රුපියල් ද්‍රවශීලතා ආවරණ අනුපාතයක් සමඟ 2025 පුරාම ශක්තිමත් ද්‍රවශීලතා ස්වාරක්ෂක පවත්වාගෙන ඇත. මෙම අනුපාතවලින් අමතර අරමුදල් කරා ප්‍රවේශවීමක් නොමැතිව දින 30ක පිඩන කාලසීමාවක් පුරා ශුද්ධ මුදල් පිටතට ගලායාම් සපුරාලීමට ඇති බැංකුවේ හැකියාව පෙන්නුම් කරයි.

ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (NSFR) 100%ක සීමාවට වඩා ඉහළින් 206.4%ක් වූ අතර, එමගින් ශක්තිමත් වූහගත අරමුදල් ස්ථායිතාව පෙන්නුම් කරයි. මෙම අනුපාතවලින් ප්‍රතිමූල්‍යකරණ අවදානම අඩුකරමින් සහ වෙළෙඳපොල බිඳවැටීම්වලට ඔරොත්තුදීම වැඩි කරමින් බැංකුවේ දිගුකාලීන වත්කම් ස්ථාවර අරමුදල් මූලාශ්‍ර මගින් අරමුදල් ලබාදෙන බව තහවුරු කරයි.

### ද්‍රවශීලතා අනුපාත

ප්‍රස්ථාර 55




| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| රුපියල් ද්‍රවශීලතා ආවරණය | 240.84 | 195.44 | 299.20 | 351.33 | 360.39 |
| සියලුම මුදල් ද්‍රවශීලතා ආවරණය | 240.43 | 193.49 | 293.71 | 344.55 | 349.15 |
| අවදානම බරතබන ලද වත්කම් මත ප්‍රතිලාභ | 160.78 | 180.51 | 180.49 | 193.53 | 206.44 |

## මුදල් ප්‍රවාහ ඔරොත්තුදීම

නියාමන අනුපාතවලින් ඉදිරියට, බැංකුවේ ද්‍රවශීලතා ශක්තිය එහි පාදක මුදල් ප්‍රවාහ ගතිකතාවලින් පිළිබිඹු කෙරේ. මෙහෙයුම් මුදල් ප්‍රවාහ 2025 පුරා ශක්තිමත්ව පැවතුණ අතර ස්ථාවර තැන්පතු ගලාඒම්, විනයගරුක වත්කම් යෙදවීම, සහ කාර්යක්ෂම භාණ්ඩාගාර මෙහෙයුම් මගින් සහයවිය. ආයෝජන කළඹේ කල්පිරීම් පැතිකඩ මගින් ස්ථීර මුදල් ගලාඒම් ප්‍රවාහයක් සහතික කරන අතර කුඩා, පාරිභෝගික නම්කළ තැන්පතු පදනම පුරෝකථනය කළහැකි ස්ථාවර අරමුදල්කරණය ලබා දේ.


බැංකුව නිරන්තරව පරීක්ෂා කරන සහ යාවත්කාලීන කරන අහඹු අරමුදල් සැලැස්ම මගින් පිඩන අවස්ථාවල පුළුල් පරාශයක් කරා ප්‍රතිචාර දැක්වීමට ඇති සූදානම සහතික කරයි. මෙම සැලැස්ම විභව අරමුදල් මූලාශ්‍ර හඳුනාගෙන, පැහැදිලි වැඩිකිරීමේ ප්‍රේරක ස්ථාපිත කර, අහිතකර තත්ත්වයන් යටතේ ද්‍රවශීලතාව ආරක්ෂා කිරීමට කළමනාකරණ කාර්යයන් පැහැදිලි කරයි. ශක්තිමත් නියාමන අනුපාත, ස්ථීර මුදල් ප්‍රවාහ, සහ ශක්තිමත් අහඹු සැලසුම් කිරීමේ සංයෝගය මගින් පිඩන තත්ත්වයන් යටතේ වුවද ගෙවීමට සිදුවන අවස්ථාවල සියලුම බැඳීම් සපුරාලීමට බැංකුවට හැකි බව සහතික කරයි.

## 2.14 කොටස්හිමියන්ට හා ජාතියට වටිනාකම ලබාදීම

බැංකුවේ ශක්තිමත් ඉපයීම් සිය තනි කොටස්හිමියාට සහ ජාතික ආර්ථිකයට වටිනාකම නිර්මාණයට හැකියාව ඇති කරයි. වසර තුළ, බැංකුව ශ්‍රී ලංකා රජයට රු.බිලියන 6.1ක ලාභාංශයක් ගෙවා ඇති අතර බදුවල රු. බිලියන 30.1කට දායක වී මූල්‍යමය වශයෙන් ඔරොත්තුදෙන ආයතනයක් සහ රාජ්‍ය මූල්‍යයට සැලකියයුතු දායකත්වයක් ලෙස සිය ද්විත්ව කාර්යභාරය පෙන්නුම් කර ඇත.

### කොටසකට ඉපයීම් සහ ශුද්ධ වත්කම් වටිනාකම

ප්‍රස්ථාර 56




| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| කොටසකට ඉපයීම් | 23.53 | 2.69 | 7.68 | 17.15 | 29.06 |
| කොටසකට ශුද්ධ වත්කම් වටිනාකම | 80.86 | 77.54 | 86.57 | 105.15 | 126.65 |

# ඇ වාර්තාකරණය සහ පාලනය

## 2.15 මූල්‍ය වාර්තාකරණයේ මූල්‍ය වාර්තාකරණයේ අඛණ්ඩතාව සහ විශ්ලේෂණය පාදක තීරණ ගැනීමේ ඥානය

මූල්‍යමය තීරණ ගැනීමේ තත්ත්වය දත්තවල තත්ත්වය, සැසැඳීම්, වාර්තාකරණ පාලනයන්, සහ විශ්ලේෂණ අවබෝධය මත මූලිකවම රඳා පවතී. 2025 දී, බැංකුව මූල්‍ය, සැලසුම්, භාණ්ඩාගාර සහ තොරතුරු තාක්ෂණ, කළඹ පද්ධති සහ පොදු ලෙජරය අතර දැඩි සංහිදියා විනය, කළමනාකරණ තොරතුරු සඳහා වඩා ශක්තිමත් සැකසුම්කරු-පරීක්ෂක-අනුමත පාලනයන් සහ නියාමන වාර්තාකරණය, සහ ලාභදායිතා ධාවක, ශේෂ පත්‍ර වෙනස්වීම, අරමුදල් ප්‍රවණතා සහ කලාපීය බලමුලු ගැන්වීමේ කාර්යසාධනය ආවරණය කරන ගැඹුරු මාසික විශ්ලේෂණ හරහා මූලාශ්‍ර දත්තවල පැහැදිලි හිමිකාරිත්වය තුළින් එහි මූල්‍ය වාර්තාකරණ පරිසරය තවදුරටත් ශක්තිමත් කළේය.

මූල්‍ය ප්‍රාග්ධනය

මෙවැනි වර්ධනයන් විශ්වාසය, කාලීනබව, සහ අභ්‍යන්තර හා බාහිර වාර්තාකරණයේ ප්‍රයෝජනය වැඩි කර ඇත. ඒවා කලින්ම විෂමතා සොයා ගැනීමට, ගැටළු කඩිනමින් විසඳීමට, සහ ශක්තිමත් මූල්‍ය තොරතුරු මත පදනම් වී නිවැරදි කිරීමේ තීරණ ගැනීමට කළමනාකාරිත්වයේ හැකියාව ශක්තිමත් කර ඇත. SLFRS S1 සහ SLFRS S2 සූදානම කරා ප්‍රගතිය සිදුකර ඇති අතර එයට පරතර තක්සේරු සම්පූර්ණ කිරීම, සහ දේශගුණය අදාළ මූල්‍ය නිරාවරණ සඳහා ක්‍රියාත්මක කරන මාර්ග සිතියමක් සංවර්ධනය කිරීම ඇතුළත්ය.

### සිරස් හා තිරස් විශ්ලේෂණ

සිරස් හා තිරස් විශ්ලේෂණ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය හා ආදායම් ප්‍රකාශය පිළිබඳ අවුරුදු පහක ප්‍රවනතා විශ්ලේෂණ ආන්තික, ශේෂ පත්‍ර සංයුතිය, ඉපයීම්වල තත්ත්වය, සහ ප්‍රාග්ධන තොරතුරුවල වෙනස්වීම පිළිබඳ පැහැදිලි අර්ථ නිරූපනයකට සහය වේ. මෙම විශ්ලේෂණ මගින් මතුවන අවදානම් කලින් හඳුනාගැනීමට සහ සම්පත් වඩා ඵලදායීව වෙන් කිරීමට කළමනාකරණයේ හැකියාව ශක්තිමත් කරයි.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය හා ආදායම් ප්‍රකාශය පිළිබඳ විස්තරාත්මක තිරස් සහ තත්‍ය විශ්ලේෂණවලට මෙම වාර්තාකරණ සහ පාලන රාමුව තුළ ඇතුළත් කෙරේ. එයට හේතුව මෙම විශ්ලේෂණවලින් වාර්ෂික විතැන්වීම, සංයුතියේ වෙනස්වීම් සහ ඉපයීම්වල තත්ත්ව ප්‍රවණතා පිළිබඳ ව්‍යුහගත දැක්මක් ලබා දේ. ඒ අනුව, විස්තරාත්මක වසර පහක තිරස් හා තත්‍ය විශ්ලේෂණයක් ඒකාබද්ධ වාර්ෂික වාර්තාවේ 499 සිට 501 දක්වා පිටුවල ඉදිරිපත් කරන අතර එය මූල්‍ය කාර්යසාධනය, සම්පත් වෙන් කිරීම, සහ මතුවන ශේෂ පත්‍ර අවදානම් පිළිබඳ වඩාත් දැනුවත් අර්ථකථනයකට සහය වේ.

## 3 අපි ප්‍රතිඵල සක්‍රියකරණ ආකාරය

බැංකුවේ විචක්ෂණ ශක්තිය රඳාපවතින සේවය, ඔරොත්තුදීම සහ ජාතික සංවර්ධන ප්‍රතිඵල කරා පරිවර්තනය කිරීමේදී මූල්‍ය ප්‍රාග්ධනය වටිනාකම් ලබා දේ. මූල්‍ය ප්‍රතිඵලයක් ලෙස පමණක් පැවතීම වෙනුවට, ගනුදෙනුකරුවන්ට, ප්‍රජාවන්ට, නියාමකයින්ට සහ වඩා පුළුල් ආර්ථිකයට සහයවන ශක්තිමත් පද්ධතියක් ලෙස එය ක්‍රියාකරයි. ශක්තිමත් අරමුදල්, ප්‍රාග්ධනය, ද්‍රවශීලතාව, ඉපයීම් තත්ත්වය, සහ පාලන විනය පවත්වා ගනිමින්, මූල්‍ය භාරකාරත්වය විශ්වාසය, අඛණ්ඩතාව, දැරියහැකිවීම, සහ දිගුකාලීන විශ්වාසය තුළින් සැබෑ පාර්ශවකාර වටිනාකම ඇති කරන බව බැංකුව සහතික කරයි.

| ප්‍රතිඵල ගමන්මඟ | ප්‍රධාන ජයග්‍රහන | පාර්ශවකාර වටිනාකම | බැංකුවට නිර්මාණය කළ අගය |
|---|---|---|---|
| **සැම ගනුදෙනුකාර ගමන සඳහා විශ්වාස බැංකුකණය** | ශක්තිමත් ප්‍රාග්ධන අනුපාත, ශක්තිමත් ද්‍රවශීලතා, ස්ථාවර තැන්පතු පදනම | තැන්පතු ආරක්ෂිත සහ ප්‍රවේශවිය හැකි බවට නිශ්චිතභාවය, බැංකුවේ වගකීම් ඉටු කිරීමේ හැකියාව පිළිබඳ විශ්වාසය, මූල්‍ය අවශ්‍යතා සඳහා විශ්වාසදායක හවුල්කරු. | ශක්තිමත් ගනුදෙනුකාර පක්ෂපාතිත්වය, තිරසාර තැන්පතු සේවයේ යෙදවීම, ශ්‍රී ලංකාවේ ආරක්ෂිතම බැංකුව ලෙස කීර්තිනාමය වැඩි කිරීම. |
| **සේවා පොරොන්දුව ලෙස ඔරොත්තුදීම** | විස්තීර්ණ ILAAP/ICAAP, පරීක්ෂා කරන ලද අහඹු අරමුදල් සැලසුම්, බාහිර මුදල් ඇතුළත් නොකර ශක්තිමත් ප්‍රාග්ධන ස්වාරක්ෂක. | බිඳවැටීම් මධ්‍යයේ වුවද බැංකු සේවා අබාධිත සිදුවන බවට සහතික වීම, අර්බුදකාරී කාලවලදී අරමුදල් සඳහා ආරක්ෂිත ප්‍රවේශය. | මෙහෙයුම් අලාභ වළක්වා ගැනීම, පීඩන අවස්ථාවන්හිදී ගනුදෙනුකාර විශ්වාසය පවත්වා ගැනීම, ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ නියාමන විශ්වාසය. |
| **වගකීම්සහගත වෙන්කිරීම තුළින් ජාතික බලපෑම** | ජාතික මූල්‍යකරණයට සහාය වන රජයේ සුරැකුම්පත්වල ඉහළම ආයෝජනය, යටිතල පහසුකම් සංවර්ධනයට සහාය වන ණය සහ අත්තිකාරම්, වඩා ඉහළ බදු සහ බදු දායකත්වයන්. | ජාතික සංවර්ධනයට සහ ආර්ථික ස්ථාවරත්වයට දායක වීම, මහජන ඉතුරුම් පිළිබඳ වගකිවයුතු කළමනාකරණය. | වැඩිදියුණු කළ සමාජ බලපතුය, ජාතික ප්‍රතිපත්ති අරමුණු සමඟ පෙළගැස්වීම, රජයේ මූලපිරීම් සඳහා මනාප හවුල්කරු. |
| **සාධාරණත්වය, දැරියහැකිබව, සහ ගනුදෙනුකාරුවන් ආරක්ෂාව** | නිෂ්පාදන පාලන වැඩිදියුණු කිරීම්, වගකීම්සහගත එකතු කිරීමේ ව්‍යවහාර, නියමයන් පිළිබඳ විනිවිද සන්නිවේදනය කිරීම, සාධාරණ සේවා මිලකරණය තුළින් ගාස්තු ආදායමේ ඉහළ වර්ධනය. | සාධාරණ සැලකීම, නිෂ්පාදන නියමයන් පිළිබඳ පැහැදිලි අවබෝධය, අයකිරීමේ අන්තර්ක්‍රියාවලදී ගරුත්වය. | හැසිරීම් අවදානම අඩු කිරීම, ගනුදෙනුකාර සබඳතා ශක්තිමත් කිරීම, විශ්වාසය සහ පක්ෂපාතිත්වය පවත්වා ගැනීම. |

### 3.1 සැම ගනුදෙනුකාර ගමන සඳහා විශ්වාසී බැංකුකරණය

තැන්පතු සුරකිමින්, බාධා නොමැති ගෙවීම් පිරිසකසමින්, සහ භෞතික සහ ඩිජිටල් මාර්ග හරහා බාධා රහිත සේවා ලබාදීම පවත්වා ගනිමින් මූල්‍ය ශක්තිය විශ්වාසී එදිනෙදා බැංකුකරණයට පරිවර්තනය කරන බව බැංකුව සහතික කරයි. විශ්වාසය කරා මෙම බැඳීම පහත සඳහන් යාන්ත්‍රණ තුළින් ලබා දේ.

| ධාවකයින් | යාන්ත්‍රණය | ගනුදෙනුකාර ප්‍රතිඵල |
|---|---|---|
| ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතා ස්වාරක්ෂක හරහා නිශ්චිතභාවය | ශක්තිමත් ප්‍රාග්ධන ප්‍රමාණවත් බව සහ ද්‍රවශීලතා සංචිත ආරක්ෂක තැන්පතු අරමුදල් සහ අවිනිශ්චිත තත්ත්වයන් තුළ විශ්වාසය පවත්වා ගැනීම. | ගනුදෙනුකාර තැන්පතු දැඩි මූල්‍ය කළමනාකරණයක් මගින් ආරක්ෂා කරන බව දැනුවත්ව ගනුදෙනුකරුවන්. |
| අරමුදල් ස්ථාවරත්වය හරහා අනුකූලතාව | ස්ථාවර, විවිධාංගීකරණය වූ තැන්පතු පදනමක් සියලුම කලාප හරහා ස්ථාවර සේවා ආවරණයක් ලබා දේ. | නාගරික සහ ග්‍රාමීය ප්‍රජාවන් සඳහා සමාන ඇතුළත් ප්‍රවේශය, අරමුදල් පීඩනය හේතුවෙන් කිසිදු ගනුදෙනුකාර අංශයකට ප්‍රමුඛතාවය අහිමි නොවේ. |
| පිරිවැය විනය හරහා නැවත ආයෝජනය කිරීම | පිරිවැය කාර්යක්ෂමතාව සහ ඩිජිටල් යොදා ගැනීම සේවා ආර්ථික වර්ධනය කර නැවත ආයෝජනය ගනුදෙනුකාර අත්දැකීමකට පත් කරයි. | සැම ගනුදෙනුකාර ගමනකටම ප්‍රතිලාභ ලබන වැඩි දියුණු ශාඛා ජාල සහ ඩිජිටල් වේදිකා. |

# මූල්‍ය ප්‍රාග්ධනය

## 3.2 සේවා පොරොන්දුවක් ලෙස ඔරොත්තුදීම

ගනුදෙනුකාර වටිනාකමට ඔරොත්තු දීමේ හැකියාව මූලික බව බැංකුව හඳුනාගන්නා අතර එම නිසා අහිතකර තත්ත්වයන් යටතේ වුවද තීරණාත්මක සේවාවන් ලබා ගත හැකි බව සහ ගනුදෙනුකාර බැඳීම් සපුරාලීම සහතික කිරීම සඳහා මෙහෙයුම් ඔරොත්තු දීමේ වැඩසටහන්, සයිබර් සූදානම සහ අයකරගැනීමේ සූදානම සඳහා ආයෝජනය කරයි. මෙම ඔරොත්තු දීමේ පොරොන්දුව පහත සඳහන් යාන්ත්‍රණයන් හරහා ලබා දේ.

| ධාවකයින් | යාන්ත්‍රණය | ගනුදෙනුකාර ප්‍රතිඵල |
|---|---|---|
| අඛණ්ඩ ආයෝජන සඳහා මූල්‍ය හැකියාව | ශක්තිමත් ලාභදායීතාවය සහ ප්‍රාග්ධන ස්වාරක්ෂක මඟින් ආපදා ප්‍රතිසාධනය, ව්‍යාපාර අඛණ්ඩතාව, සයිබර් පාලනය සහ සිදුවීම් ප්‍රතිචාර හැකියාව සඳහා තිරසාර ආයෝජන හැකියාව ඇති කරයි. | බාධාකාරී සිදුවීම් වලදී පවා, ගනුදෙනුකරුවන්ට බැංකුකරණය වඩාත් අවශ්‍ය වූ විට ගනුදෙනුකරුවන් ආරක්ෂා කෙරේ. |
| හදිසි සූදානම හරහා කඩිනම් ප්‍රතිචාරය | හොඳින් පරීක්ෂා කරන ලද හදිසි අරමුදල් වැඩපිළිවෙල සහ විනයගරුක ද්‍රවශීලතා කළමනාකරණය, ආයතනයට විශේෂිත වූ සහ වෙළෙඳපොළ පුරා පිඩන සිදුවීම් දෙකටම වේගයෙන් ප්‍රතිචාර දැක්වීමේ බැංකුවේ හැකියාව ශක්තිමත් කරයි. | පීඩාකාරී වෙළෙඳපල තත්ත්වයන් යටතේ වුවද, ගනුදෙනුකරුවන්ට අරමුදල් සහ අත්‍යවශ්‍ය සේවාවන් සඳහා බාධාරහිත ප්‍රවේශය රඳවා ගත හැකිය. |
| වාර්තාකරණ විනය තුළින් වේගවත් තීරණ | වර්ධිත වාර්තාකරණ සම්පූර්ණත්වය, විශ්ලේෂණ හැකියාව සහ ශක්තිමත් පාලන රාමු නිවැරදි තීරණ ගැනීමේ වේගය වැඩි කරයි. | අඩුකළ කාලය සහ යම් සේවා බිඳවැටීම්වල බලපෑම, ගනුදෙනුකාර අපහසුතා අවම කිරීම. |

## 3.3 වගකීම් සහගත වෙන් කිරීම තුළින් ජාතික බලපෑම

ජාතික ආයතනයක් ලෙස, බැංකුව ආරක්ෂාව, විධිනියෝග ගැලපීම, සහ තිරසාර ප්‍රතිෂ්ඨාවන් මඟින් මෙහෙයවන මූල්‍ය ප්‍රාග්ධනය වෙන් කරමින් මහජන ඉතුරුම් සංවර්ධන ප්‍රතිඵල කරා පරිවර්තනය කරන අතර, ඒ තුළින් ජාතික ප්‍රගතියට දායක වෙමින් විචක්ෂණ කළමනාකාරිත්වය පවත්වා ගනී. මෙම ජාතික බලපෑම පහත සඳහන් යාන්ත්‍රණයන් හරහා ලබා දේ.

ඒකාබද්ධ බලපෑම යනු ගනුදෙනුකරුවන්, ඇපකරුවන්, සහ නියාමනයින්ට බිඳවැටීමේ කාලසීමාවල පවා ස්ථාවරව සහ ප්‍රතිචාරාත්මකව සිටීමට බැංකුව කෙරෙහි විශ්වාසය තැබිය හැකිය යන්නයි. මෙය විචක්ෂණ ශක්තිය අත්‍යවශ්‍ය බැංකුකරණය ආරක්ෂිතව, පිවිසිය හැකි, සහ එය වඩාත් අවශ්‍යවන අවස්ථාවේදී රඳාපැවතිය හැකිය යන ස්පෘශ්‍ය සේවා පොරොන්දුවකට පරිවර්තනය කරයි.

| ධාවකයින් | යාන්ත්‍රණය | ජාතික ප්‍රතිඵල |
|---|---|---|
| ජාතික ප්‍රමුඛතාවන්ට සහයවීම | යටිතල පහසුකම්, නිවාස සහ කුඩා ව්‍යවසාය ඇතුළු ජාතික සංවර්ධන අරමුණු සඳහා සහාය වීම සඳහා භාණ්ඩාගාරය සහ අවසරලත් ණය ප්‍රතිපාදන ව්‍යුහගත කර ඇත. | තීරණාත්මක සංවර්ධන ප්‍රතිඵල සක්‍රීය කරන අතරම මූල්‍ය ස්ථාවරත්වය සහ තැන්පත්කරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කෙරේ. |
| තිරසාර සංක්‍රාන්තිය ඇති කිරීම | තිරසාර මූල්‍යකරණය සහ ව්‍යුහගත ගනුදෙනු දිගුකාලීන ආර්ථික හා පාරිසරික ඔරොත්තු දීමේ හැකියාවට සහාය වේ. | ජාතික දේශගුණික ඉලක්ක සඳහා දායකත්වය සහ අනාගත පෙළගස්වන ලද ණය කළඹක් සංවර්ධනය කිරීම. |
| විනිවිදභාවය තුළින් විශ්වාසය ශක්තිමත් කිරීම | මූල්‍ය තත්ත්වය, අවදානම් කළමනාකරණ ව්‍යවහාර සහ පාලන විධිවිධාන පිළිබඳ විනිවිද පෙනෙන අනාවරණය. | නියාමකයින්, ගනුදෙනුකරුවන් සහ පාර්ශ්වකරුවන් සමඟ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම, විශ්වාසදායක ජාතික ආයතනයක් ලෙස බැංකුවේ කාර්යභාරය ශක්තිමත් කිරීම. |

## 3.4 සාධාරණත්වය, දැරියහැකිවීම සහ ගනුදෙනුකාර ආරක්ෂාව

බැංකුව මිලකරණය හා නිෂ්පාදන නියමයන් පැහැදිලිකම, සමාන බව හා අහිතකර ප්‍රතිඵල සඳහා සක්‍රියව නියාමනය කරන බව සහතික කරමින් සාධාරණත්වය තුළින් කළමනාකාරිත්වය ක්‍රියාවට නංවන අතර ඒ මඟින් විශ්වාසය බලගන්වමින් සහ ගනුදෙනුකරුවන් වෙත දිගුකාලීන වටිනාකම ලබා දේ. සාධාරණත්වය සඳහා මෙම බැඳීම් පහත සඳහන් යාන්ත්‍රණයන් හරහා ලබා දේ.

| ධාවකයින් | යාන්ත්‍රණය | ගනුදෙනුකාර ප්‍රතිඵල |
|---|---|---|
| නිෂ්පාදන පාලනය සහ සාධාරණ සැලකීම | ගාස්තු, අයකිරීම් සහ නිෂ්පාදන නියමයන් අඛණ්ඩව සමාලෝචනය කිරීම පැහැදිලි බව සහ සාධාරණත්වය සහතික කරයි. පාරිභෝගික පැමිණිලි සහ ප්‍රතිඵල සක්‍රීයව නිරීක්ෂණය කිරීම මඟින් ගැටළු කලින් හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීමට මග පාදයි. | ගනුදෙනුකරුවන්ට විනිවිද, සාධාරණ සහ සුදුසු මිලකළ නිෂ්පාදන සහ සේවාවන් ලැබේ. |
| වගකීම්සහගත අයකිරීමේ ව්‍යවහාර | එකතු කිරීමේ සහ අයකිරීමේ ව්‍යවහාර අවදානම කළමනාකරණය කරන අතරම ගනුදෙනුකාර ගෞරවය ආරක්ෂා කිරීම සඳහා සැලසුම් කර ඇත. පූර්ව සහභාගිත්වය, නම්‍යශීලී විධිවිධාන සහ පැහැදිලි සන්නිවේදනය ගනුදෙනුකරුවන් රඳවා තබා ගැනීමට සහාය වේ. | මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණ දෙන ගනුදෙනුකරුවන්ට ගෞරවයෙන් සලකනු ලබන අතර තිරසාර විසඳුම් ලබා දෙනු ලැබේ. |
| විනිවිද භාවයකින් යුත් සන්නිවේදනය | අනුපාත, ගාස්තු සහ නිෂ්පාදන විශේෂාංගවල වෙනස්වීම් පැහැදිලිව සහ කල්තියා සන්නිවේදනය කරනු ලබන අතර, ගනුදෙනුකාර අධ්‍යාපන මාර්ග මඟින් සහාය ලැබේ. | මූල්‍ය සාක්ෂරතාවය වැඩිදියුණු කිරීම තුළින් දැනුවත් මූල්‍ය තීරණ ගැනීමට ගනුදෙනුකරුවන් බලගන්වනු ලැබේ. |

# මූල්‍ය ප්‍රාග්ධනය

## 4 මෙය ලබාදෙන ආකාරය

2025 දී, විනයගරුක මූල්‍ය කළමනාකාරිත්වය බැංකුවේ ඔරොත්තුදීම, තැන්පත්කරුගේ විශ්වාසය, සහ තිරසාර, විශ්වාසී, ඇතුළත් බැංකුකරණයට හැකියාවන් ශක්තිමත් කරන ලදී. විචක්ෂණ ශක්තිය සුරක්ෂිත කරමින්, ඉපයීම්වල තත්ත්වය, ශේෂ පත්‍ර විනය, සහ වාර්තාකරණයේ අවංකකම ශක්තිමත් කරමින්, පෙර වසරවලදී ස්ථාපිත ශක්තිමත් ගම්‍යතාව මත ගොඩ නැගෙමින් උපායමාර්ගය ආරක්ෂිතව සහ විශ්වාසයෙන් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය පදනම් බැංකුව සවිබලගන්වා ඇත.

### 4.1 ආයෝජනයෙන් බලපෑම දක්වා

මූල්‍ය ප්‍රාග්ධනය ශක්තිමත් කිරීම කෙරෙහි අපගේ අවධානය පහත දැක්වෙන තීරණාත්මක මානයන් හරහා මැනියහැකි වටිනාකම ලබා දෙන ලදී:

- **අරමුදල් ස්ථායිතාව සහ මහජන විශ්වාසය:** තැන්පතු පදනම යහපත් වර්ධනයක් වාර්තා කළ අතර බැංකුවේ අඩු අවදානම් අරමුදල් පැතිකඩ සවිබලගන්වා, පැහැදිලි රජයේ ඇප මගින් තැන්පතුහිමියන්ගේ විශ්වාසය තහවුරු කර ඇත.
- **ශේෂ පත්‍රයේ ශක්තිය:** ආයෝජන කළඹේ ස්ථිර පුළුල්වීම සහ ණය හා අත්තිකාරම්වල වැඩිවීමත් සමඟ මුළු වත්කම් ක්‍රමාංකිත වර්ධනය තුළින් ප්‍රසාරණය වූ අතර ඉන් වෙළෙඳපොල අවස්ථා සහ අවදානම් රුචිය සමඟ මනිනලද පෙළගැස්ම පිළිබිඹු කරයි.
- **විචක්ෂණ ඔරොත්තුදීම:** ප්‍රාග්ධන හා ද්‍රවශීලතා අනුපාත ශක්තිමත් මට්ටම්වලින් ක්ෂෘල බඤ්ඤල සහ හීඤ්ඤ සමඟ නියාමන සීමාවන්ට ඉහළින් පහසුවෙන් පවත්වාගන්නා ලද අතර එය බාධාරහිත සේවා අඛණ්ඩතාව සහතික කරමින් වෙළෙඳපොල වෙනස්වීම් අවශෝෂණයට බැංකුව ශක්තිමත් කරයි.
- **වර්ධිත ලාභදායිතා තත්ත්වය:** ඉපයීම්වල තත්ත්වය ශුද්ධ පොලී ආදායම තුළ වර්ධනය සහ වර්ධිත ශුද්ධ පොලී ආන්තික තුළින් වැඩිකළ අතර බදු පෙර ලාභය තිරසාර ආදායම උත්පාදනය පෙන්නුම් කරමින් ශක්තිමත් වැඩිවීමක් වාර්තා කළේය.
- **ආදායම් විවිධාංගීකරණය:** ප්‍රධාන පොලී ආදායම මත රඳාපැවැත්ම වැඩි වූ ගාස්තු පදනම් කටයුතු, කාඩ් සේවා, සහ ප්‍රේෂණයට අදාළ ආදායම් මගින් ඇතිකළ පොලී නොවන ආදායමෙහි යහපත් වර්ධනය තුළින් අඩුකර ඇත.
- **පිරිවැය කාර්යක්ෂමතාව:** ආදායමට පිරිවැය අනුපාතය පසුගිය වසරට සාපේක්ෂව වර්ධනය වූ අතර තිරසාර ආදායම් වර්ධනය සමඟ ඵලදායී පිරිවැය කළමනාකරණ විනය පෙන්නුම් කරයි.
- **ශක්තිමත් මූල්‍ය පාලන පරිසරය:** මූල්‍ය වාර්තාකරණ අඛණ්ඩතාව වර්ධිත ගැටළු වැසීමක් වන අඩුකළ සැසැදීම් බණ්ඩන තුළින් ශක්තිමත් කරන ලද අතර සියලුම නියාමන වාර්තා කාලීනව ඉදිරිපත් කිරීම පවත්වා ගෙන ඇත.
- **උපායමාර්ගික ප්‍රතිආයෝජන හැකියාව:** බැංකුව අනාගත වර්ධනය සහ මෙහෙයුම් විශිෂ්ටත්වය සඳහා ස්ථානගත කරමින් වර්ධිත මූල්‍ය ශක්තීන් සැලකියයුතු ප්‍රති ආයෝජන ඩිජිටල් හැකියා වැඩි කිරීමට සහ සේවා ඔරොත්තුදීමේ මූලපිරීම්වලට හැකියාව ඇති කරන ලදී.

### 4.2 මූල්‍ය ප්‍රාග්ධන වටිනාකම් ලකුණු පුවරුව

මූල්‍ය ප්‍රාග්ධනය තිරසාර බැංකුකරණය සඳහා විශ්වාසී පදනමක් ලෙස අඛණ්ඩව සේවය කරන බව සහතික කිරීම සඳහා, බැංකුව මූල්‍ය යහපත්, ඔරොත්තුදීම, කාර්යක්ෂමතාව, සහ පාලන තත්ත්වයට අවබෝධය ලබාදෙන ප්‍රමුඛ සහ විලම්බන දර්ශක රාශියක් නියාමනය කරයි. තැන්පතු සංකේන්ද්‍රණය, ICAAP ආවරණය, සහ ඉලක්කගත ආදායමට පිරිවැය කාර්යසාධනය වැනි ප්‍රමුඛ දර්ශක මතුවන ශක්තීන් සහ උවදුරු පුරෝකථනය කිරීමට සහය විය. ප්‍රාග්ධන අනුපාත, ද්‍රවශීලතා අනුපාත, ලාභදායිතාව, සහ හානිකරණ ක්‍රියාමාර්ග වැනි පසුගාමී දර්ශක කළමනාකාරිත්ව තීරණවල උපලබ්ධි ප්‍රතිලාභ පෙන්වා දේ. විචක්ෂණ, යහපත්, වර්ධනීය මූල්‍ය කාර්යසාධනය පවත්වා ගැනීමට සහ දිගුකාලීන වටිනාකම් නිර්මාණයට සහයවීමට මෙම විනයගරුක නියාමන රාමුව මූලික වේ.

| දර්ශක වර්ගය | මානිත ප්‍රදේශය | ප්‍රධාන කාර්යසාධන දර්ශක | ඒකකය | 2025 | 2024 | ප්‍රවනතාව |
|---|---|---|---|---|---|---|
| **ප්‍රමුඛ දර්ශක** | අරමුදල් ස්ථාවරත්වය | තැන්පතු වර්ධනය (වාර්ෂිකව) | % | 3.4 | 5 | අඩුකළ |
| | | විශාල තැන්පත්හිමි සංකේන්ද්‍රණය | % | 32 | 28 | වැඩිකළ |
| | වත්කම්වල තත්ත්වය | ප්‍රතිව්‍යුහගත සහ නැවත උපලේඛණගත කළ ණය | ගණන | 117 | 143 | අඩුකළ |
| | පාග්ධන සැලසුම්කරණය | ෂෂ්ඨ පීඩන පරීක්ෂණ ආවරණ අනුපාතය | % | 100 | 100 | ස්ථාවර |
| | කාර්යක්ෂමතාව | ආදායමට පිරිවැය අනුපාතය (ඉලක්ක පසුවිපරම) | % | 34.3 | 38.4 | වැඩිකළ |
| **පසුගාමී දර්ශක** | ප්‍රාග්ධන ප්‍රමාණතාව | මුළු ප්‍රාග්ධන අනුපාතය (CAR) | % | 26.8 | 25.9 | වැඩිකළ |
| | | ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය | % | 24.9 | 23.4 | වැඩිකළ |
| | ද්‍රවශීලතා ඔරොත්තුදීම | ද්‍රවශීලතා ආවරණ අනුපාතය (සියලුම මුදල්) | % | 349.2 | 344.6 | වැඩිකළ |
| | | ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (NSFR) | % | 206.4 | 193.5 | වැඩිකළ |
| | ලාභදායිතාව | ශුද්ධ පොලී ආන්තිකය (NIM) | % | 4.7 | 4.2 | වැඩිකළ |
| | | වත්කම් මත ඉපයීම (ROA) | % | 2.5 | 1.5 | වැඩිකළ |
| | | ස්කන්ධය මත ඉපයීම (ROE) | % | 25.1 | 17.9 | වැඩිකළ |
| | වත්කම්වල තත්ත්වය | හානිකරණ අයකිරීම/ආවරණ වත්කම් | % | 0.1 | 0.7 | වැඩිකළ |
| | නියාමන අනුකූලතාව | වැදගත් නියාමන වාර්තාකරණ කඩකිරීම් | ගණන | 0 | 0 | ස්ථාවර |

වගුව 11

# මූල්‍ය ප්‍රාග්ධනය

## 4.3 බැංකුවේ සමූහ කාර්යසාධනය: ස්කන්ධය මත ඉපයීමෙහි DuPont විශ්ලේෂණය


එන්එස්බී සමූහය 2024 දී සාක්ෂාත් කරගත් වාර්තාගත ගම්‍යතාව මත ගොඩ නැගෙමින් 2025 දී තවත් එක් ශක්තිමත් මූල්‍ය කාර්යසාධන වසරක් ලබාදී ඇත. බැංකුව සමූහයේ ඒකාබද්ධ වත්කම්වල බහුතරය සඳහා දායක වෙමින් ප්‍රධාන දායකයා ලෙස රැඳී සිටියේය.


සමූහයේ මුළු වත්කම් 2024 දී පැවති රු. ට්‍රිලියන 1.7 සිට 5.2%ක වැඩිවීමක් පිළිබිඹු කරමින් 2025 දී රු. ට්‍රිලියන 1.8 දක්වා වර්ධනය විය. ආර්ථික තත්ත්වයන් අඛණ්ඩව වෙනස්වෙමින් තිබියදී පවා මෙම ස්ථිර ප්‍රසාරණය ශක්තිමත් සහ ඔරොත්තුදෙන වත්කම් පදනමක් දරා ගැනීමට ඇති සමූහයේ හැකියාව තහවුරු කරයි.

සමූහයේ ඉපැයීම් ගම්‍යතාව ශක්තිමත් කරමින් ලාභදායිතාවය සුවිශේෂී මට්ටම්වල පැවතුණි.

සමූහයේ බදු පෙර ලාභය 2024 දී වාර්තා වූ රු. බිලියන 28.3 ට සාපේක්ෂව 2025 දී රු. බිලියන 45.9ට ලඟා විය. මේ අතර, බදු පසු ලාභය පසුගිය වසරේ පැවති රු. බිලියන 17.5 ට අනුව වසර සඳහා රු. බිලියන 28.2 ක් විය. මෙම ප්‍රතිඵල මගින් සමූහයේ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ එහි පාර්ශ්වකරුවන් සඳහා වටිනාකම් නිර්මාණය කෙරෙහි අඛණ්ඩ අවධානය යොමු කිරීම පිළිබිඹු කරයි.

**DuPont විශ්ලේෂණය - ස්කන්ධය මත ඉපයීම (ROE)**




රූපය 10

# මූල්‍ය ප්‍රාග්ධනය

## වෙනත් ප්‍රාග්ධනය සමඟ විභව සමතුලිතතා සහ සහක්‍රියාකාරකම්

- **නිෂ්පාදිත ප්‍රාග්ධනය සමඟ විභව සමතුලිතතා:** භෞතික යටිතල පහසුකම් සඳහා පූර්ව ප්‍රාග්ධන ආයෝජනය දිගුකාලීන මෙහෙයුම් විශ්වසනීයත්වය සහ සේවා ගුණාත්මකභාවය සුරක්ෂිත කරයි.
- **ස්වභාවික ප්‍රාග්ධනය සමඟ විභව සමතුලිතතා:** හරිත මූලපිරීම් සඳහා ඉහළ ආරම්භක පිරිවැය දිගුකාලීන ඉතිරුම් සහ තිරසාර ලාභ මගින් සමතුලිත කෙරේ.
- **සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය සමඟ විභව සමතුලිතතා:** රජයේ ඇපකරය මගින් තහවුරු වන තැන්පත්කරුවන්ගේ විශ්වාසය සහ නියාමන විශ්වාසය, අරමුදල් ස්ථාවරත්වයට සෘජුවම සහාය වේ.
- **මානව ප්‍රාග්ධනය සමඟ සහක්‍රියාකාරකම:** මූල්‍ය ශක්තිය සේවක සංවර්ධනයට අරමුදල් සපයන අතර, දක්ෂ කාර්ය මණ්ඩලය විචක්ෂණශීලී මූල්‍ය ක්‍රියාත්මක කිරීම සිදු කරයි.
- **බුද්ධිමය ප්‍රාග්ධනය සමඟ සහක්‍රියාකාරකම:** ශක්තිමත් කාර්යසාධනය උසස් විශ්ලේෂණවලට අරමුදල් ලබාදෙන අතර එමඟින් ප්‍රාග්ධන වෙන් කිරීම සහ වාර්තා කිරීමේ අබණ්ඩතාව වැඩි කරයි.
- **ගනුදෙනුකාර ප්‍රාග්ධනය සමඟ සහක්‍රියාකාරකම:** මූල්‍ය ස්ථාවරත්වය පාරිභෝගික අත්දැකීම් සහ ඇතුළත් සේවා සැපයීම සඳහා තිරසාර ආයෝජනයක් සක්‍රීය කරයි.

## ඉදිරි දැක්ම: 2026 සහ ඉන් ඔබ්බට ප්‍රමුඛතා

- **අරමුදල් ස්ථායිතාව ආරක්ෂා කිරීම:** තැන්පතු ඛණ්ඩනය, නිෂ්පාදන ප්‍රශස්තකරණය සහ ඩිජිටල් බලමුලු ගැන්වීම තුළින් ශක්තිමත්, වඩාත් විවිධාංගීකරණය වූ අරමුදල් පදනමක් ගොඩ නැඟීම.
- **ශේෂ පත්‍ර ව්‍යුහය ප්‍රශස්තකරණය:** සක්‍රිය ALM, අරමුදල් විවිධාංගීකරණය සහ ප්‍රාග්ධන කාර්යක්ෂමතාව තුළින් ආන්තික ඔරොත්තුදීම වැඩි කිරීම.
- **ශක්තිමත් ප්‍රාග්ධන ස්වාරක්ෂක පවත්වා ගැනීම:** විනයගරුක ICAAP/ILAAP ක්‍රියාවලීන් සහ නිතිපතා පීඩන පරීක්ෂණ හරහා විචක්ෂණශීලී ශක්තිය සහතික කිරීම.
- **තිරසාර මූල්‍යකරණය පරිමාණය කිරීම:** බැංකුවේ විධිනියෝගය සමඟ සමපාත වන හරිත හා ඔරොත්තු දීම හා සම්බන්ධ නිෂ්පාදන හරහා නව ආදායම් මාර්ග නිර්මාණය කිරීම.
- **ලාභදායීතාවයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම:** වැඩිදියුණු කළ මිලකරණය, භාණ්ඩාගාර ප්‍රශස්තකරණය සහ කාර්යක්ෂම මූලපිරීම් හරහා තිරසාර ඉපැයීම් ලබා දීම.
- **ඩිජිටල් ප්‍රමුඛ කාර්යක්ෂමතාව තියුණු කිරීම:** ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය සහ ඩිජිටල් සේවා ආර්ථිකය තුළින් ව්‍යුහාත්මක පිරිවැය අඩු කිරීම සාක්ෂාත් කර ගැනීම.
- **වත්කම්වල තත්ත්වය ශක්තිමත් කිරීම:** පූර්ව අනතුරු ඇඟවීමේ දර්ශක, දැඩි නියාමනය සහ සම්බන්ධීකරණ අයකිරීමේ ක්‍රියාමාර්ග හරහා ණය පිරිවැය අස්ථාවරත්වය අඩු කිරීම.
- **දේශගුණික අවදානම විචක්ෂණ රාමුවකට ඇතුළත් කිරීම:** අනාගතයට සුදානම් අවදානම් කළමනාකරණය සඳහා ප්‍රාග්ධන සැලසුම්කරණයට දේශගුණික ක්‍රියාදාම විශ්ලේෂණය ඒකාබද්ධ කිරීම.
- **LFRS S1 සහ SLFRS S2 සුදානම ඉදිරියට ගෙන යාම:** නියාමන අපේක්ෂාවන්ට අනුකූලව දේශගුණයට අදාළ මූල්‍ය අනාවරණ හරහා විනිවිදභාවය වැඩි කිරීම.
- **විගණනයට සුදානම් වාර්තාකරණ අබණ්ඩතාව සාක්ෂාත් කර ගැනීම:** සම්පූර්ණයෙන්ම සහතික කළ මූල්‍ය සහ තිරසාර අනාවරණ හරහා මනා පරිච විනිවිදභාවය ලබා දීම.

## අනාගත වර්ධනය සඳහා මූල්‍ය ප්‍රාග්ධනයේ ප්‍රමානතාව

සාර්ව ආර්ථික අස්ථාවරත්වය සහ වෙනස්වන නියාමන අපේක්ෂාවන් යන ද්විත්ව අවශ්‍යතාවලට මුහුණ දෙමින්, අපගේ විනයගරුක ප්‍රාග්ධන කළමනාකරණය, විචක්ෂණශීලී ද්‍රවශීලතා ස්ථානගත කිරීම සහ තිරසාර ලාභදායීත්වය ඔරොත්තු දෙන මූල්‍ය පදනමක් නිර්මාණය කර ගෙන ඇත. අපගේ ශක්තිමත් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත, විවිධාංගීකරණය වූ අරමුදල් ප්‍රභවයන් සහ උසස් තත්ත්වයේ වත්කම් කළඹ, ආර්ථික කම්පන අවශෝෂණය කර ගැනීමට, ජාතික ප්‍රමුඛතා අංශවලට සහාය වීමට සහ 2026-2028 උපායමාර්ගික ආයෝජන සඳහා විශ්වාසයෙන් අරමුදල් සැපයීමට අපව ස්ථානගත කරයි. ශ්‍රී ලංකාවේ මූල්‍ය ස්ථාවරත්වයේ ප්‍රධාන ප්‍රතිෂ්ඨාවක් වීමට අපි කැපවී සිටින අතර ඒතුළ සෑම ස්වාරක්ෂකයක්ම විචක්ෂණශීලීව පවත්වා ගැනීම, සෑම ප්‍රතිපාදනයක්ම තිරසාර වටිනාකම් නිර්මාණයට සහාය වීම සහ යොදවන සෑම රුපියලක්ම තැන්පත්කරුවන්ගේ විශ්වාසය සහ ජාතික ආර්ථික ඔරොත්තුදීම ශක්තිමත් කිරීම සිදුවේ.

# නිෂ්පාදිත ප්‍රාග්ධනය

## ශක්තිමත් පදනමක්, බාධා රහිත ප්‍රවේශයක්



නිෂ්පාදිත ප්‍රාග්ධනය යන්නෙන් භෞතික හා තාක්ෂණිකව ශක්තිමත් යටිතල පහසුකම් නියෝජනය කරන අතර එමඟින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව ආරක්ෂිත, විශ්වාසදායක සහ ඇතුළත් බැංකුකරණයක් ලබා දේ. එය අපගේ ශාඛා සහ සේවා ස්ථාන පාසටහන, ස්වයං සේවා ජාලය, මූලික බැංකුකරණය සහ ඩිජිටල් වේදිකා, දත්ත මධ්‍යස්ථාන සහ ආපදා ප්‍රතිසාධන හැකියාව

මෙන්ම ලබාගතහැකි මාර්ග සහ ආරක්ෂාව ඇති කරන මෙහෙයුම් විනය දක්වා විහිදේ. 2025 දී, අපගේ අවධානය පිවිසීමේ හැකියාව සහ ඔරොත්තුදීම ශක්තිමත් කිරීමට අඛණ්ඩව යොමු වූ අතර එමඟින් සෑම ගනුදෙනුකරුවෙක්ටම සහයවන ශාඛා හෝ ඩිජිටල් මාර්ගයෙන් ආරක්ෂිතව සිය මූල්‍ය ගමන නිම කළ හැකි වේ.

### උපායමාර්ගික කුළුණු සහ වටිනාකම් නිර්මාණාත්වයට අදාලත්වය

**1 ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව සහ මූල්‍ය අන්තර්කරණය:**

ගමන් බර අඩු කරන සහ සහාය-ඩිජිටල් යොදා ගැනීමට සහාය වන ආරක්ෂිත, ප්‍රවේශ විය හැකි, බාධක-නිදහස් සේවා පාසටහනක් සහ විශ්වාසදායක ස්වයං සේවා ප්‍රවේශයක් පවත්වා ගැනීම.

**2 තිරසාර වෙන්දීය වර්ධනය සහ කළඹි ප්‍රසශ්තකරණය:**

ප්‍රවේශ්‍යතාව ආරක්ෂා කරමින් සේවා පිරිවැය අඩු කිරීම සඳහා ජීවන චක්‍ර සැලසුම්කරණය, ප්‍රමිතිගත සැලසුම් සහ වැළැක්වීමේ නඩත්තුව හරහා වත්කම් පදනම ප්‍රශස්ත කිරීම.

**3 සේවක, සංස්කෘතික සහ සහභාගිත්ව විශිෂ්ටත්වය:**

අපගේ කණ්ඩායම් බලගැන්වීම සහ ඉහළ කාර්යසාධන සංස්කෘතියක් පෝෂණය කිරීම සඳහා ආරක්ෂිත, මනාව සන්නද්ධ සේවා ස්ථාන පවත්වා ගැනීම.

**4 අවදානම් සංස්කෘතිය, පාලනය සහ අනුකූලතා විනය:**

වත්කම් ආරක්ෂා කිරීම සහ නියාමන අනුකූලතාව සහතික කිරීම සඳහා දැඩි භෞතික ආරක්ෂක සහ පාලන ක්‍රියාමාර්ග බලාත්මක කිරීම.

**5 ඩිජිටල් වේගවත් කිරීම සහ දත්ත පදනම් බැංකුකරණය:**

ඔරොත්තු දෙන සම්බන්ධතාවය, ආරක්ෂිත පරිශ්‍රා තාක්ෂණය, උපාංග නියාමනය සහ විනයගරුක වෙළෙඳ SLAs හරහා ස්ථාවර ඩිජිටල් බෙදාහැරීමක් සක්‍රීයකරණය.

**6 තිරසාරතාවය, දේශගුණය සහ ප්‍රජා ඔරොත්තුදීම:**

පාරිසරික බලපෑම අවම කිරීම සහ සේවා අඛණ්ඩතාව පවත්වා ගැනීම සඳහා අපගේ පහසුකම් හරහා බලශක්ති කාර්යක්ෂමතාව සහ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම.

### ප්‍රධාන අවදානම් සහ අභියෝග

- සේවා ලබාගත හැකිවීම බිඳවැටීම (ශාඛා/ATM/මාර්ගගත කාලය)
- වත්කම් අඛණ්ඩතාව සහ භෞතික ආරක්ෂක තර්ජන
- දේශගුණික සහ ආපදා නිරාවරණ (ගංවතුර, කුණාටු සහ සුලිසුලඟ)
- තෙවන පාර්ශව හා සැපයුම්කාර රඳාපැවැත්මේ අවදානම්
- මෙහෙයුම් පිරිවැය ඉහළයාම (උපයෝගිතා, කුලී, මනා සංවිධාන)
- ගනුදෙනුකාර පිවිසීමේ හැකියා පරතර (අන්තර්කරණය හා ප්‍රවේශය)

### අපගේ උපායමාර්ගික ප්‍රතිචාරය හා අවම කිරීම

- බාධා රහිත සේවාවක් සහතික කිරීම සඳහා පූර්ව ක්‍රියාකාරී නඩත්තු කිරීම, අඛණ්ඩ නියාමනය සහ කඩිනම් ප්‍රතිචාර පද්ධති ක්‍රියාත්මක කිරීම.
- භෞතික වත්කම් සහ දත්ත ආරක්ෂා කිරීම සඳහා ඒකාබද්ධ ආරක්ෂක පාලනයන්, නිරන්තර පරීක්ෂණ සහ දැඩි ක්‍රියාපටිපාටිමය බලාත්මක කිරීම යෙදවීම.
- තිරණාත්මක යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සහ දේශගුණික ආශ්‍රිත බාධාවන්ට ඔරොත්තු දීම සඳහා ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් යොදා ගැනීම.
- වෙළෙඳ හවුල්කාරිත්වයන් පුළුල් කිරීමෙන් සහ දැඩි කාර්යසාධන සහ අඛණ්ඩතා ප්‍රමිති බලගන්වමින් සැපයුම් දාමය සුරක්ෂිත කිරීම.
- සම්පත් භාවිතය ප්‍රශස්ත කිරීම සහ මෙහෙයුම් වියදම් පාලනය කිරීම සඳහා බුද්ධිමත්, තිරසාර යටිතල පහසුකම් විසඳුම් අනුගමනය කිරීම.
- බාධක ඉවත් කර සියලුම ගනුදෙනුකරුවන් සඳහා ප්‍රවේශය සහතික කිරීම සඳහා විශ්වීය සැලසුම් මූලධර්ම සහ වැඩිදියුණු කළ සේවා විශේෂාංග අනිවාර්ය කිරීම.

# නිෂ්පාදිත ප්‍රාග්ධනය

## නිෂ්පාදිත ප්‍රාග්ධන වටිනාකම් දාමය හා තිරසාර අඛණ්ඩතාව

අන්තයේ සිට අවසානය දක්වා වටිනාකම් දාම ප්‍රවේශයක්, ගනුදෙනුකාර ප්‍රතිඵල සඳහා ප්‍රවේශ යටිතල පහසුකම්වල සෑම අදියරක්ම පරීක්ෂා කරමින් අපි නිෂ්පාදිත ප්‍රාග්ධනය තක්සේරු කරමු. සෑම පියවරකදීම, භෞතික අවදානම් නිරාවරණය, බලශක්ති තීව්‍රතාවය, සම්පත් කාර්යක්ෂමතාව සහ ප්‍රජාවන් සඳහා සේවා අඛණ්ඩතාව ඇතුළුව තිරසාරභාවය සහ දේශගුණික ප්‍රතිඵලවන් අපි ඒකාබද්ධ කරමු.

| යෙදවුම් | භාරකාරත්ව කටයුතු | නිමැවුම් | ගනුදෙනුකාර සහපාලන ප්‍රතිඵල | දිගුකාලීන බලපෑම් |
|---|---|---|---|---|
| ශාඛා, ස්වයං සේවා බලඇණිය, පරිශ්‍ර, ආරක්ෂක වත්කම්, උපකරණ, සම්බන්ධතා සහ උපස්ථ වැඩපිළිවෙල | සැලසුම් කිරීම සහ ප්‍රමුඛතාවය දීම, ප්‍රාග්ධනීකරණය, වැළැක්වීමේ නඩත්තුව, ආරක්ෂාව සහ සෞඛ්‍ය, ආරක්ෂාව සහ පරිසර පාලනයන්, විකුණුම්කරු SLAs, අවදානම් මත පදනම් වූ ස්ථාන ශක්තිමත් කිරීම සහ බලශක්ති කළමනාකරණය | නවීකරණය කළ/ප්‍රවේශ විය හැකි වැඩභූමි, වර්ධිත ක්‍රියාකාරී කාලය, පරීක්ෂා කළ අඛණ්ඩතා වැඩපිළිවෙල, උසස් කළ ආරක්ෂක පාලන, කාර්යක්ෂමතා ප්‍රතිසංස්කරණ. | ඇතුළත් ප්‍රවේශය, ආරක්ෂිත පරිසරයන්, බිඳවැටීම් අඩුවීම, ශක්තිමත් මුදල් අඛණ්ඩතාව සහ වඩාත් පුරෝකථනය කළ හැකි සේවා ප්‍රමිතීන්. | විශ්වාසය සහ මූල්‍ය අන්තර්කරණය, අඩු අලාභ සිදුවීම්, සේවා ඒකකයකට අඩු පාසටහනක් සහ කම්පන අතරතුර ශක්තිමත් ප්‍රජා ඔරොත්තු දීම |

### ප්‍රමාණාත්මක කරුණු

| 1.1 | 1.2 | 3.2 | 5.1 | 6.3 |
|---|---|---|---|---|
| ගනුදෙනුකාර කේන්ද්‍රීය, ඇතුළත් සහ දැරියහැකි බැංකුකරණය | ඩිජිටල් සහ මූල්‍ය සාක්ෂරතාව | සේවක සෞඛ්‍ය, ආරක්ෂාව, යහපැවැත්ම සහ ඇතුළත් සංස්කෘතිය | ඩිජිටල් පරිනාමය සහ වගකීම්සහගත කෘතිම බුද්ධිය/විශ්ලේෂණ | මෙහෙයුම් පාරිසරික පාසටහන |

## SDGs ට අපගේ දායකත්වය

**7 AFFORDABLE AND CLEAN ENERGY** — ඉලක්කය 7.2, 7.3

ජාල රදාපැවැත්ම අඩුකරන බලශක්ති කාර්යක්ෂම ශාඛා සැලසුම් සහ ජාලය පුරා LED ප්‍රතිසංස්කරණය, සූර්ය කෝෂ ස්ථාපනයන්, නව ශාඛා ඉදිකිරීම් සහ ප්‍රතිසංස්කරණවලදී හරිත ගොඩනැගිලි ව්‍යවහාර

**8 DECENT WORK AND ECONOMIC GROWTH** — ඉලක්කය 8.4

කඩදාසි රහිත මූලපිරීම් සහ ඩිජිටල් යොදා ගැනීම තුළින් සම්පත්-කාර්යක්ෂම මෙහෙයුම්, ශාඛා ජාලය සහ ප්‍රධාන කාර්යාලය හරහා භෞතික සම්පත් පරිභෝජනය ප්‍රශස්තකරණය කිරීම, උපකරණ සහ ද්‍රව්‍ය තිරසාර ලෙස ප්‍රසම්පාදනය කිරීම.

**9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE** — ඉලක්කය 9.1, 9.4

බැංකු සේවා සඳහා විශ්වාසදායක ප්‍රවේශයක් සහතික කරන අලෙවි කුට්ටි 263 කින් යුත් රට පුරා ශාඛා ජාලය, ATMs, CRMs යන්තු ඇතුළු නවීකරණය කරන ලද සේවා යටිතල පහසුකම්, බාධාරහිත සේවා සැපයීමට සහාය වන ඔරොත්තු දෙන භෞතික යටිතල පහසුකම්වල ආයෝජනය කිරීම.

**11 SUSTAINABLE CITIES AND COMMUNITIES** — ඉලක්කය 11.2, 11.7

නාගරික හා ග්‍රාමීය ප්‍රජාවන්ට සේවය සපයන ප්‍රවේශවිය හැකි ශාඛා ස්ථාන සහ ATM ස්ථානගත කිරීම්, ජ්‍යෙෂ්ඨයින්ට-හිතකාමී සහ ආබාධිත පුද්ගලයින්ට ප්‍රවේශ විය හැකි යටිතල පහසුකම්; ඇතුළත් නාගරික හා ග්‍රාමීය සංවර්ධනය ප්‍රවර්ධනය කරන අඩු සේවා ප්‍රදේශවල උපායමාර්ගික පැවැත්ම.

**13 CLIMATE ACTION** — ඉලක්කය 13.1

අතිශය කාලගුණික සිදුවීම් වලට ඔරොත්තු දීම සඳහා සැලසුම්කළ දේශගුණයට ඔරොත්තු දෙන භෞතික යටිතල පහසුකම්, දේශගුණික අවදානම් අවස්ථා ඇතුළත් ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්කරණය, ස්වාභාවික විපත් වලදී සේවා අඛණ්ඩතාව සහතික කරන ආපදා ප්‍රතිසාධන හැකියාවන්.

## අපගේ නිෂ්පාදන ප්‍රාග්ධන ගමන්මඟ: භාරකාරත්වයේ සිට මැනියහැකි වටිනාකම දක්වා

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේදී, අපගේ නිෂ්පාදිත ප්‍රාග්ධනය යනු අපගේ මහජන විශ්වාසය සහ මෙහෙයුම් ඔරොත්තු දීමට පාදක වන අත්‍යවශ්‍ය භෞතික හා තාක්ෂණික පදනම වේ. ශාඛාවල සිට ආරක්ෂිත පද්ධති දක්වා අපගේ යටිතල පහසුකම් සහතික කරමින්, විශ්වාසදායක ලෙස පාරිභෝගික ප්‍රවේශයට පහසුකම් සපයමින්, සේවා අඛණ්ඩතාව ආරක්ෂා කරමින්, භෞතික අවදානම් අවම කරමින්, සහ කල් පවතින ජාතික වටිනාකමට දායක වෙමින් අපගේ මූල්‍ය සම්පත් සඳහා යොදන ලද දැඩි පාලනය සමඟින් අපි මෙම තීරණාත්මක වත්කම් කළමනාකරණය කරමු,

### 1 අපගේ ප්‍රාග්ධන පදනම්

ගනුදෙනුකාර ප්‍රවේශය, මුදල් සංකලනය සහ සේවා අඛණ්ඩතාව ආරක්ෂා කිරීමට පාලනය, ජීවන රටා කළමනාකාරිත්වය, ආරක්ෂක පරිශ්‍ර, සහ මාර්ග පාලනයන්.

### 2 අපි හැකියාව ශක්තිමත් කරන ආකාරය

සැලසුම්කළ නවීකරණය, වැළැක්වීමේ නඩත්තුව, විකුණුම්කාර ඔරොත්තුදීම්, සහ යටිතල පහසුකම් විශ්වාසී, ඇතුළත් සහ අනාගතයට සූදානම්ව තබාගන්නා හරිත-පරිශ්‍ර මූලපිරීම්.

### 3 අපි ප්‍රතිඵල ශක්තිමත් කරන ආකාරයි

- ඇතුළත් ප්‍රවේශය සහ පාරිභෝගික අත්දැකීම්
- මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ පාලන විනය
- සේවා පොරොන්දුවක් ලෙස ඔරොත්තු දීම සහ අඛණ්ඩතාව
- තිරසාරභාවය සහ වගකිවයුතු මෙහෙයුම් සක්‍රීය කිරීම

### 4 මෙයින් ලබාදෙන දෑ

සේවා විශ්වාසය, ආරක්ෂාව, අඛණ්ඩතාව, සහ පිරිවැය කාර්යක්ෂමතාව තුළ මැනියහැකි ලාභ

# නිෂ්පාදිත ප්‍රාග්ධනය

## 1 අපගේ ප්‍රාග්ධන පදනම්

අපගේ නිෂ්පාදිත ප්‍රාග්ධනය ශ්‍රී ලංකාවේ විවිධ ගනුදෙනුකාර ගමන් සඳහා සහයවීමට සැලසුම්කළ ජාතික සේවා පරිසර පද්ධතියක් වටා ගොඩ නගයි. මෙයට සහය ප්‍රවේශය අවශ්‍ය පළමුවරට ඉතුරු කරන්නන් සහ විශ්‍රාමිකයින්, රජයේ ආයතන, සහ ප්‍රජාවන් ඇතුළත් වේ. සියලුම මෙහෙයුම් දැඩි ආරක්ෂාකාරී, සුරක්ෂිත, සහ නියාමන අපේක්ෂාවන් සපුරලනු ලබයි.

### 1.1 පාලනය හා අධීක්ෂණය


අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණය, කළමනාකරණ කමිටු සහ ස්වාධීන සහතික කිරීම අපගේ නිෂ්පාදිත ප්‍රාග්ධන පාලනය ශක්තිමත් කරයි. මෙම පාලන රාමුවට වත්කම් ජීවන චක්‍රය සහ පහසුකම් කළමනාකරණය, භෞතික ආරක්ෂාව සහ මුදල් හැසිරවීම, බාහිරින් ලබා ගැනීම සහ විකුණුම්කරුකළමනාකරණය, ව්‍යාපාර අඛණ්ඩතාව සහ ආපදා ප්‍රතිසාධනය සහ පරිශ්‍ර සඳහා සෞඛ්‍ය, ආරක්ෂාව සහ පාරිසරික අවශ්‍යතා හරහා ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ඇතුළත් වේ.

- සැලකිය යුතු සිදුවීම් සහ වැදගත් ඇනහිටීම් වැඩිවීමත් සමඟ, ප්‍රාග්ධන වියදම්, යටිතල පහසුකම් ප්‍රමුඛතා සහ අඛණ්ඩ කළමනාකරණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල සහ ආයතනික කළමනාකරණ අධීක්ෂණය.
- කළමනාකරණ කමිටු (අදාළ පරිදි මෙහෙයුම්/තොරතුරු තාක්ෂණ/ආරක්ෂාව) සේවා ලබා ගැනීමේ හැකියාව, ප්‍රධාන සිදුවීම්, පරිශ්‍ර අවදානම සහ විකුණුම්කරුවන්ගේ කාර්යසාධනය පාලනය කරයි.
- භෞතික පාලනයන්, ආරක්ෂක විධිවිධාන සහ විකුණුම්කරුවන්ගේ කළමනාකරණ ව්‍යවහාර පිළිබඳ අවදානම්, අනුකූලතාව සහ අභ්‍යන්තර විගණන සමාලෝචන හරහා ඒකාබද්ධ සහතික කිරීම.

### 1.2 සේවා පිවිසුම් යටිතලපහසුකම්

අපගේ සේවා ප්‍රවේශ යටිතලපහසුකම් සෑම ශ්‍රී ලාංකිකයෙකුටම විශ්වාසදායක, ඇතුළත් සහ ආරක්ෂිත බැංකුකරණයක් සපයන හිතාමතාම නිර්මාණය කරන ලද සහ ඒකාබද්ධ කළ ජාතික බැංකු ජාලයක් වන බැංකුවේ මහජන විටි වරමේ ප්‍රතාක්ෂ ප්‍රකාශනයකි. මෙම පරිසර පද්ධතිය මඟින් ගනුදෙනුකරුවන්ට ස්ථානය, කාලය හෝ හැකියාව නොසලකා විශ්වාසයෙන්, පහසුවෙන් සහ ගෞරවයෙන් යුතුව අත්‍යවශ්‍ය මූල්‍ය සේවාවන් වෙත ප්‍රවේශ විය හැකි බව සහතික කරයි.

අපගේ භෞතික ජාලය ශාඛා 263 කින් සහ ප්‍රාදේශීය කාර්යාල 11 කින් සමන්විත වන අතර, විශ්වාසදායක පුද්ගලික සහාය ලබා දේ. වීසා සහ මාස්ටර් කාඩ් ණය පහසුකම් සහිත අපගේ හිමිකාර ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර/CRMs යන්ත්‍ර 418 හරහා අපි මෙම ප්‍රවේශය පුළුල් කරමු. ලංකාපේ පොදු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ස්විචය සමඟ අපගේ හවුල්කාරිත්වය ප්‍රවේශය තවදුරටත් පුළුල් කරයි, එය දිවයින පුරා ATMs යන්ත්‍ර, කෂී සහ CRMs යන්ත්‍ර 6,000 කට අධික සංඛ්‍යාවකට ගනුදෙනුකරුවන් සම්බන්ධ කරයි.




රූපය 11

# නිෂ්පාදිත ප්‍රාග්ධනය

අපගේ භෞතික පැවැත්ම අනුපූරණය කිරීම අපගේ පොදු ගනුදෙනුකාර සහය රාමුව වේ. ඩිජිටල් සහයසේවා, සහ සමාජ මාධ්‍ය මාර්ගවලින් සහය වෙන අපගේ මධ්‍යගත ඇමතුම් මධ්‍යස්ථානය අඛණ්ඩ සහය ලබාදී, විමසිම් මෙහෙයවා ශාඛා බිඳවැටීම් හෝ කාර්ය බහුල කාලවේලාවන්වල තීරණාත්මක මාර්ග යක් පිරිනමයි. එමඟින් සේවා අඛණ්ඩතාව සම්මිතික කර බැංකුව සැමවිටම ලබාගතහැකි බවට හැඟීම සවිබල ගන්වයි.

පොදු පිවිසීමේ හැකියාව අපගේ සැලැස්මේ ගොඩ නගයි. අපි රෝද පුටු බෑවුම්, භෞතික මග පෙන්වීම, සහායක සේවා කවුළු සහ අපගේ ජාලය පුරා පැහැදිලි සංඥා පුවරු වැනි විශේෂාංග අපි සක්‍රීයව ඒකාබද්ධ කරමු. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සහ ආබාධිත ගනුදෙනුකරුවන් සඳහා කැපවූ සේවා පෙරාතු ලේඛන අපි ක්‍රියාත්මක කරන අතර, අපගේ යටිතල පහසුකම් බාධක ඉවත් බව සහ ඇතුළත් කිරීම සහ ගෞරවය මත පදනම් වූ බැංකු අත්දැකීමක් ලබා දෙන බව සහතික කරමු.

## අපගේ පැවැත්ම පුළුල් කිරීම

අපගේ සේවා යටිතලපහසුකම්වල ප්‍රමුඛ වර්ධනයක් තුළ, මෙම වසර තුළ බැංකුව කොළඹ 7 හි සිය ප්‍රථම "NSB ප්‍රමියර්" ශාඛාව විවෘත කරන ලදී. මෙම ශාඛාව ස්ථාපිත කිරීම මඟින් නවීන, සම්බන්ධතා කේන්ද්‍රීයව බැංකුකරණ අත්දැකීමක් ලබාදීමට සැලසුම් කළ අපගේ භෞතික ජාලයෙහි උපායමාර්ගික ආයෝජනයන් නියෝජනය කරයි. එය වෘත්තිකයන්ගේ, ආයතනික විධායකයින්ගේ සහ ප්‍රමුඛතා ගනුදෙනුකරුවන්ගේ විචක්ෂණශීලී අවශ්‍යතා සඳහා පමණක්ම සේවය කරන අතර, පිරිසිදු කළ පෞද්ගලික සහ පුද්ගලාරෝපිත සේවාවක් සහිත පරිසරයක් තුළ ගලපන ලද මූල්‍ය විසඳුම් පිරි නමයි. මෙම ශාඛාව වැඩිදියුණු කළ භෞතික පහසුකම් සහ බාධාරහිත ඩිජිටල් ඒකාබද්ධ කිරීම ඒකාබද්ධ කරන අතර ප්‍රධාන සේවාදායක අංශ සමඟ ගැඹුරු, වටිනාකම් මත පදනම් සබඳතා වර්ධනය කිරීමට අපගේ කැපවීම පෙන්නුම් කරයි, එමඟින් අපගේ ජාතික කළඹ විවිධාංගීකරණය කර ශක්තිමත් කරයි.




## වැඩිකළ ප්‍රවේශය සඳහා උපායමාර්ගික නැවත ස්ථානගත කිරීම්

ප්‍රවේශ්‍යතාව ප්‍රසශ්ත කිරීමට හා සේවා ලබාදීම ශක්තිමත් කිරීමට අපගේ දැනට සිදුවන උපායමාර්ගයට අනුව, බැංකුව පැල්මඩුල්ල, මාලිගාවත්ත, හබරාදුව, හික්කඩුව සහ අකුරැස්ස යන ශාඛා පහ වසර තුළ උපායමාර්ගිකව නැවත ස්ථාන ගත කළේය. ප්‍රජාවන් සහ වාණිජ කටයුතු වර්ධනය කරමින් ගනුදෙනුකාර රටාවන් වෙනස් කරමින් අපගේ ශාඛාජාලය සමඟ වඩා හොඳින් පෙළ ගැසීමට මෙම විතැන්වීම් සැලසුම් කරන ලදී. සෑම නව ස්ථානගත කිරීමක්ම පහසුව වැඩිකර, අපගේ පැවැත්ම පුළුල් කර ගතික හා ප්‍රතිචාරාත්මක ජාතික පෙනුම කරා අපගේ බැඳීම සවිබල ගන්වමින් ගනුදෙනුකරුවන්ට වඩාත් ඵලදායීව සේවය කිරීමට යාවත්කළ වින්‍යාස සැලැස්ම සහ තාක්ෂණය ඒකාබද්ධ කරයි.

## 1.3 මෙහෙයුම් පරිශ්‍ර සහ තීරණාත්මක උපකරණ

අපගේ සේවා සැපයීමේ ආරක්ෂාව, කාර්යක්ෂමතාව සහ ඔරොත්තු දීම අපගේ මෙහෙයුම් පරිශ්‍රයේ සහ ඒවා තුළ ඇති තීරණාත්මක උපකරණවල අඛණ්ඩතාව මත සම්පූර්ණයෙන්ම රඳා පවතී. අපි මෙම වත්කම් කළමනාකරණය කරන්නේ හුදකලා පහසුකම් ලෙස පමණක් නොව, ආරක්ෂිත, ඉහළින් පිවිසියහැකි ජාතික ජාලයක අන්තර් සම්බන්ධිත පුරුක් ලෙසය. කොළඹ පිහිටි අපගේ ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල 11 ප්‍රධාන බැංකුකරණය, භාණ්ඩාගාර මෙහෙයුම්, පරිපාලනය, සහ ජාතික මට්ටමේ සේවා පලනය සඳහා උපායමාර්ගික විධාන මධ්‍යස්ථාන ලෙස සේවය කරයි. මෙවැනි පහසුකම් බාධා රහිත මෙහෙයුම් සහතික කිරීමට නවීන සමතිරික්ත බලය සහිත ඔරොත්තුදීම සහ සන්නිවේදන පද්ධති සඳහා සැලසුම් කර ඇත.


වත්කම් ආරක්ෂා කිරීමට සහ ආරක්ෂාව සහතික කිරීමට සියලුම පරිශ්‍ර හරහා භෞතික ආරක්ෂක නියමයන් දැඩිව පවත්වා ගනී. අපගේ පහසුකම් කළමනාකරණයට විද්‍යුත් පද්ධති, වායු සම්කරණ යන්ත්‍ර, ගිනි හඳුනාගැනීම සහ මැඩලීමේ පද්ධති, හදිසි ආලෝකකරණය, සහ ඉවත් කිරීමේ මාර්ග, ගනුදෙනුකරුවන් සහ සේවකයින් සඳහා අපගේ පරිශ්‍ර ආරක්ෂිතව පවතින බව සහතික කරන ගිනි ආරක්ෂක අනුකූලතාව ඇතුළුව නිරන්තර ගිනි පෙරහුරු සහ අත්‍යවශ්‍ය සහතික කිරීම් ඇතුළු විස්තීර්ණ පාරිසරික ආරක්ෂක පාලනයන් ඇතුළත් කෙරේ.

නිෂ්පාදිත ප්‍රාග්ධනය


### ස්ථාවර වත්කම් වෙන්කිරීම

විවිධ වත්කම් වර්ගවල විස්තරාත්මක වෙන් කිරීම් ඇතුළුව අපගේ ස්ථිර වත්කම්වල ව්‍යාප්තිය පිළිබඳ විස්තරාත්මක පැහැදිලි කිරීමක් 357 පිටුවේ මූල්‍ය ප්‍රකාශවලට සටහන් 26 හි දක්වා ඇත.

**දේපල, පිරියත හා උපකරණවලට නව එකතු කිරීම්** ප්‍රස්ථාර 57




**දේපල, පිරියත හා උපකරණවල නව එකතු කිරීම්වල සංයුතිය** ප්‍රස්ථාර 58




## 1.4 වත්කම් භාරකාරත්වය හා ජීවන රටා පාලනය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ නිෂ්පාදිත ප්‍රාග්ධනයේ භාරකාරත්වය වටිනාකම ප්‍රසශ්ත කිරීමට හා ඔරොත්තුදීම සහතික කිරීමට සැලසුම් කළ උපායමාර්ගික, අවසාන ජීවන රටා කළමනාකරණ රාමුවක් මගින් පාලනය කෙරේ.

මෙම යෝජනාව ප්‍රධාන අදියර හතරකින් සලකුණු කෙරේ:

i. **උපායමාර්ගික සැලසුම්කරණය හා ආයෝජනය:** ප්‍රාග්ධන වියදම ආයතනික උපායමර්ගය සමඟ බැඳුණු බහු වසර සැලැස්මක් මගින් මෙහෙයවනු ලැබේ. සියලුම ප්‍රධාන ආයෝජන දැඩි විශ්ලේෂණයකට භාජනය කරන අතර ව්‍යූහගත අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ අධීක්ෂණය ලබා දේ.

ii. **පාලිත ප්‍රසම්පාදනය:** තත්ත්වය හා වටිනාකම සහතික කිරීමට අත්කරගැනීම විනිවිද, තරඟකාරී ක්‍රියාවලි හරහා ප්‍රමිතිගත කරන අතර දැඩි විකුණුම්කාර ගිවිසුම් හරහා පාලනය කෙරේ.

iii. **වැළැක්වීමේ නඩත්තුව:** උපලේඛනගත වැලැක්වීමෙන් නඩත්තුව පිළිබඳ අනිවාර්ය සංස්කෘතියක් විශ්වාසය සහතික කිරීමට සවිබල ගන්වන අතර අනාගත අසමත්වීම් වැලැක්වීමට මූලික හේතු විශ්ලේෂණය කරන ව්‍යූහගත නිවැරදි කිරීමේ ක්‍රියාවලියක් මගින් අනුපූරණය කෙරේ.

iv. **විගණනය හා ප්‍රසශ්තකරණය:** වත්කම් තත්ත්වය සහ උපයෝගිතාව පිළිබඳ නිරන්තර විගණන නවීකරණය, නැවත යෙදවීම හෝ බැහැර කිරීම පිළිබඳ දත්ත පදනම් තීරණ දැනුවත් කරන අතර බැංකුවේ උපායමාර්ගයට අනුව වත්කම් පදනම් නවීකරණය වී පවතින බව සහතික කරයි.

## 1.5 අන්තර් රඳාපැවැත්ම සහ තිරණාත්මක යටිතලපහසුකම්

බැංකුවේ මෙහෙයුම් ඔරොත්තුදීම බාහිර ජාතික පද්ධති සහ තෙවන පාර්ශව හවුල්කරුවන් සමඟ මූලිකවම අන්තර් සම්බන්ධ වේ පහත දක්වා ඇති ව්‍යූහගත කුළුණු තුනක උපායමාර්ගය තුළින් මෙවැනි තිරණාත්මක රඳාපැවැතුම් අපි සක්‍රීයව කළමනාකරණය කරමු:

1. **ජාතික යටිතලපහසුකම් අඛණ්ඩතාව:** ජාතික ගෙවීම් පද්ධතියේ ප්‍රධාන සහභාගිවන්නෙක් ලෙස, ශක්තිමත් තාක්ෂණික අඛණ්ඩතාව, අඛණ්ඩ නියාමනය, සහ අංශයේ ඔරොත්තුදෙන මූලපිරීම්වල සක්‍රිය සහයෝගිතාව තුළින් අපි විශ්වාසය සහතික කරමු.

2. **පාලිත තෙවැනි පාර්ශව කළමනාකරණය:** ප්‍රධාන විකුණුම්කරුවන් කෙරෙහි අපගේ විශ්වාසය බලාත්මක සේවා මට්ටමේ ගිවිසුම් සහිත කොන්ත්‍රාත්, අනිවාර්ය ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මේ අවශ්‍යතා, කාර්යසාධන සමාලෝචන, සහ සංකේන්ද්‍රණ අවදානම අවම කිරීමට සැපයුම්කාර විවිධාංගීකරණය හරහා පාලනය කෙරේ.

3. **පරීක්ෂාකළ අඛණ්ඩතා සහතික කිරීම:** අපි විස්තීර්ණ, විධිමත්, පරීක්ෂාකළ ව්‍යාපාර අඛණ්ඩතා සහ ආපදා ප්‍රතිසාධන සැලසුම් තුළින් සේවා ලබාගතහැකි වීම සහතික කරමු. මෙයට විකල්ප වැඩ භූමි, උපස්ථ යටිතලපහසුකම්, නිශ්චිත ප්‍රතිසාධන පරමාර්ථ, සහ සැලකියයුතු බිඳවැටීම් සඳහා සූදානම සහතික කිරීමට අර්ධ වාර්ෂික පෙළඹවීම් පෙරහුරු ඇතුළත් වේ.

## 2 අපි හැකියාව ශක්තිමත් කරන ආකාරය

නිෂ්පාදිත ප්‍රාග්ධනය ශක්තිමත් කිරීම යනු ගනුදෙනුකාර ප්‍රවේශය, ආරක්ෂාව, ඔරොත්තු දීම සහ මුදලට වටිනාකම සමතුලිත කරන විනයගරුක වැඩසටහනකි. 2025 දී, බැංකුව සේවා ස්ථාන නවීකරණය කිරීම, ස්වයං සේවා විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම, පිරිසැලසුම් සහ පාලනයන් ප්‍රමිතිකරණය කිරීම සහ ඇතුළත් ප්‍රවේශය පවත්වා ගනිමින් විශේෂයෙන් බැංකුව ඩිජිටල් බෙදාහැරීම වේගවත් කරන බැවින් යටිතල පහසුකම් තීරණවලට ඔරොත්තු දීම ඇතුළත් කිරීම කෙරෙහි අවධානය යොමු කළේය.

## 2.1 නවීකරණය හා සේවා ස්ථාන ප්‍රසශ්තකරණය

භෞතික බැංකුකරණය අදාළව සහ ඇතුළත්ව පවත්වා ගැනීමට, බැංකුව ඉලක්කගත නවීකරණය හඹා යන අතර එය ජාතික මට්ටමේ ලඟාවීම සුරක්ෂිත කරමින් ගනුදෙනුකාර ප්‍රවාහ, රහස්‍යතාව හා සේවා කර්යක්ෂමතාව වර්ධනය කරයි. සැලසුම් ප්‍රමිති පැහැදිලි යාත්‍රණය, උදාර ගනුදෙනුකාර මැදිහත්වීම්, සහ මෙහෙයුම් පාලනයන් අවධාරණය කරන අතර, එය ස්ථාන හරහා ස්ථිරව පවති. මේ සම්බන්ධයෙන්, පහත දැ ගෙන ඇත.

- උවදුරට පත්වන ගනුදෙනුකරුවන් සඳහා සුවිශේෂී සහය ස්ථාන ඇතුළුව ප්‍රවාහ, රහස්‍යතාව හා සේවා කර්යක්ෂමතාව වර්ධනය කිරීමට ශාඛා හතරක් නවීකරණය සහ පිරි සැලැමි වර්ධනය කිරීම්
- ප්‍රමිතිගත සන්නාමකරණය, ව්‍යාකූලත්වය අඩු කිරීමට සංඥ, සහ ගනුදෙනුකාර මඟපෙන්වීම, වර්ධිත යාත්‍රණය හා ජාලය හරහා ශක්තිමත් බැංකුවේ සේවා අත්දැකීම
- නතර වී සිටීමේ කාලය අඩු කිරීමට සහ ප්‍රත්‍යක්ෂ සේවා තත්ත්වය වර්ධනයට ගනුදෙනුකාර පාරිසරික වර්ධනයන්.
- උපයෝගිතාව ප්‍රසශ්ක කිරීමට අවකාශය හා උපකරණ භාවිතය තාර්කිකකරණය කරන අතර සේවා බැඳීම් හා ඔරොත්තුදීමේ අවශ්‍යතා සපුරාලීම.

නිෂ්පාදිත ප්‍රාග්ධනය

## 2.2 ස්වයං සේවා මාර්ගවල විශ්වාසය හා කාර්යසාධනය

අපගේ ස්වයං සේවා මාර්ග ජාලයේ - ATMs යන්ත්‍ර, මුදල් තැන්පතු යන්ත්‍ර (CDMs) සහ මුදල් ප්‍රතිචක්‍රීකරණ යන්ත්‍ර (CRMs) වල විශ්වසනීයත්වය අවදානමට ලක් කළ නොහැකි වන්නේ එය ගනුදෙනුකාර විශ්වාසය සහ ප්‍රවේශයට සෘජුවම බලපාන බැවිනි. පහත විස්තර කර ඇති පරිදි උපරිම කාර්යසාධනය සහතික කිරීම සඳහා බැංකුව බහු ස්ථර පාලන ආකෘතියක් බලාත්මක කරයි.

- අපි නිශ්චිත ප්‍රතිචාර කාල SLAs සහිත සියලුම උපාංග සඳහා ක්‍රියාශීලී, 24/7 නියාමනයක් යොදවා ඇති අතර, දෝෂ උත්සන්න කර නැවත ඇතිවීම වැළැක්වීම සඳහා මූල-හේතු විශ්ලේෂණය සමඟ ඉක්මනින් විසඳා ඇති බව සහතික කරමු.
- මුදල් නොමැති සිදුවීම් අඩු කිරීමට සහ ගනුදෙනුකාර විශ්වාසය වැඩි කිරීමට මුදල් නැවත පිරවීමේ සැලසුම් කිරීම සහ කාර්යසාධන නියාමනය.
- අලුත්වැඩියා කිරීමට සාමාන්‍ය කාලය (MTTR) අඩු කිරීමට සහ උපකරණවල ජීව කාලය දීර්ඝ කිරීමට වැළැක්වීමේ නඩත්තු කාලසටහන් සහ අමතර කොටස් කළමනාකරණය.
- ආරක්ෂක සිදුවීම් අඩු කිරීම සඳහා භෞතික ශක්තිමත් කිරීමේ පියවර (CCTV ආවරණය, ආලෝකකරණය, උපවේෂණ සංඥ, ආරක්ෂිත නැංගුරම් දැමීම සහ ප්‍රවේශ පාලන)

## 2.3 සැලැස්ම අනුව ඔරොත්තුදීම

අපගේ පහසුකම් සහ මාර්ග නිවැරදිව සැලසුම් කිරීම සහ කළමනාකරණය කිරීම තුළට අබණ්ඩතා ප්‍රතිෂ්ඨාවන් ඇතුළත් කිරීමෙන් බැංකුව ඔරොත්තු දීම ක්‍රියාත්මක කරයි. බාධා කිරීම් ගනුදෙනුකරුවන්ට, සේවකයින්ට සහ මූල්‍ය ස්ථාවරත්වයට බලපාන බව අපි පිළිගනිමු, එබැවින් සේවා තිරණාත්මක බව, භූගෝලීය අවදානම් නිරාවරණය සහ තෙවන පාර්ශවීය රඳා පැවැත්ම මත පදනම්ව වී ඔරොත්තු දීමේ ආයෝජන ප්‍රමුඛ කරමු.

සහතික කළ ගිනි ආරක්ෂක පද්ධති, නිරන්තර ඉවත් කිරීමේ පෙරහුරු, සහ විශ්වාසී උපස්ථ බලශක්ති වැඩපිළිවෙල ඇතුළුව ශක්තිමත් හදිසි සූදානම් ක්‍රියාමාර්ගවලට හේතුවන පුළුල් පහසුකම් අපි කරගෙන යන්නෙමු.

තාක්ෂණය හාභෞතික ආරක්ෂාව වැඩියෙන් ඒකාබද්ධවන බැවින්, අපි සියලුම තාක්ෂණය ශක්තිමත් පරිශ්‍රවල වැඩිකළ සයිබර්-භෞතික පාලනයන් ක්‍රියාත්මක කරමු. මෙම ඒකාබද්ධ ප්‍රවේශය මගින් ප්‍රවේශ පද්ධති, ආවේක්ෂණ ජාල, සහ සහ තිරණාත්මක යටිතලපහසුකම් අපගේ අවදානම් රුචිය හා නියාමන ප්‍රමිති සමඟ බැඳුණු ඩිජිටල් හා භෞතික තර්ජන ද්විත්වයට අනුව ආරක්ෂා කරන බව සහතික කරයි.

තවද, සංකේන්ද්‍රණ අවදානම අවම කිරීමට සහ අපගේ BCPs අබණ්ඩතා අවශ්‍යතාවයන්ට අනුකූල බව සහතික කිරීමට ප්‍රධාන සැපයුම්කරුවන් (ටෙලිකොම්, ආරක්ෂාව, මුදල් සැපයීම) පිළිබඳව නිරන්තර ඔරොත්තුදීමේ සමාලෝචන අපි පවත්වමු.

සයිබර්-භෞතික පාලනයන් පිළිබඳ වැඩිදුර විස්තර සඳහා 134 සිට 143 දක්වා පිටු බලන්න.

### දිට්වා සුළි කුණාටුව තුළින් සේවා නගා සිටුවීම

2025 දී ඇති වූ දිට්වා සුළි කුණාටුව අතරතුර අපගේ ඔරොත්තු දීමේ රාමුවේ මෙහෙයුම්වල ඵලදායිත්වය තිරණාත්මකව පරීක්ෂා කරන ලදී. මෙම අවස්ථාව අපගේ ආයෝජන සහ සූදානම, ප්‍රතිසාධන පද්ධති සහ ක්‍රියාපටිපාටි අපගේ ජනතාවගේ සහ ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව, තිරණාත්මක වත්කම් ආරක්ෂා කිරීම සහ සේවාවන් ඉක්මනින් ප්‍රතිසංස්කරණය කිරීමක් වන අපගේ මූලික අරමුණු සමඟ වලංගු කරන ලදී.

- **සක්‍රියකරණය සහ ප්‍රතිචාරය:** අපගේ පූර්ව ස්ථාපිත අවදානම් ආදර්ශ සහ සිදුවීම් විධාන ව්‍යුහය වහාම සක්‍රියකරණය කරන ලදි. පිඩාවටපත් දිස්ත්‍රික්කවල සේවා ස්ථාන කිහිපයක් විදුලිය හා සම්බන්ධතා ගැටළු හේතුවෙන් තාවකාලික බිඳවැටීම්වලට මුහුණපාන ලද අතර, අපගේ විමධ්‍යගත කළමනාකරණ පෙරාතු ලේඛණ කාර්ය මණ්ඩල ආරක්ෂාව සහ සේවා අබණ්ඩතාව සහතික කිරීමට කඩිනමින් සිද්ධියෙන් සිද්ධියට තීරණ ශක්තිමත් කරන ලදී.
- **සේවයේ යොදවන ලද අබණ්ඩතා පෙරාතු ලේඛණ:** නම් කරන ලද විකල්ප ප්‍රතිසාධන වැඩහුම් සහ අපගේ පොදු සහාය රාමුව බැංකු කටයුතු අබණ්ඩව පවත්වාගෙන යාම සහතික කළේය. තාක්ෂණික කණ්ඩායම් අපගේ ස්වයං සේවා ජාලය යථා තත්ත්වයට පත් කිරීමට ප්‍රමුඛත්වය දුන් අතර ශක්තිමත් හවුල්කාර සබඳතා මුදල් සැපයුම් සහ විදුලි සංදේශනය වේගයෙන් නැවත ස්ථාපිත කිරීමට පහසුකම් සැලසීය.
- **ප්‍රතිඵල හා වලංගුකරණය:** ප්‍රධාන යටිතලපහසුකම්වලට විශාල ව්‍යුහගත අලාභයක් නොමැතිව තිරණාත්මක සේවා පැය 48ක් තුළ 90% ට වඩා ප්‍රතිසංස්කරණය කරන ලදි. මෙම ප්‍රතිචාරය පාර්ශවකාර විශ්වාසය සවිමත් කළ අතර අපගේ ඔරොත්තුදීමේ සැලසුම්කරණයේ ස්පෘශ්‍ය වටිනාකම පෙන්නුම් කළේය.
- **යොදාගත පාඩම් ඉදිරියට ගෙන යාම:** මෙම සිදුවීම සෘජුවම අපගේ ඉදිරිය දකින උපායමාර්ගය හැඩගස්වා ඇති අතර ඉහළ අවදානම් ස්ථාන සඳහා දේශගුණික ඔරොත්තුදීම වේගවත් කර විමධ්‍යගත තීරණ ගැනීමේ පෙරාතු ලේඛණ නිවැරදි කර ඇත.

මෙම සැබෑ ලෝක පීඩන පරීක්ෂණය මගින් අපගේ නිෂ්පාදිත ප්‍රාග්ධනය නවින සහ කාර්යක්ෂම බව පමණක් නොව මූලිකවම කල්පවත්නා බව සනාථ කර ඇති අතර බැංකුව දේශගුණික හා මෙහෙයුම් බිඳවැටීම් තුළින් ජාතිය වෙනුවෙන් විශ්වාසී කුළුණක් ව පවතින බව සහතික කරයි.

## 2.4 තිරසාර සහ කාර්යක්ෂම යටිතල පහසුකම්

බැංකුව ද්විත්ව අරමුණු විධානයක් ලෙස සම්පත් කාර්යක්ෂමතාව හඹා යයි. එමගින් පාරිසරික භාරකාරත්ව බැඳීම් ඉටුකරන අතර දිගුකාලීන මෙහෙයුම් විනය සවිමත් කරයි. අපගේ තිරසාර යටිතලපහසුකම් උපායමාර්ගය තුළින් විශාලතම භෞතික පාසටහන කෙරෙහි අවධානය යොමු කරයි.

බලශක්ති කාර්යක්ෂමතාව මූලික අවධානයක් දිනා ගන්නා අතර ඉන් පූර්ණ පරිමාණ LED ආලෝකකරණ ප්‍රතිසංස්කරණ, උණුසුම, වාතාශ්‍රය සහ වායු සමීකරණ පද්ධති ප්‍රශස්තකරණය සහ තාක්ෂණිකව සහ මූල්‍යමය වශයෙන් කළ හැකි පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගේ ඉලක්කගත යෙදවීම වැනි ක්‍රමානුකූල මුලපිරීම් සාක්ෂාත් කර ගෙන ඇත. ඩිජිටල් ලියකියවිලි, විද්‍යුත් ප්‍රකාශන සහ ඩිජිටල් ගෙවීම් යොදා ගැනීම පුළුල් කිරීමෙන් අපි කඩදාසි-අඩු මෙහෙයුම් සක්‍රීයව මෙහෙයවන අතර එමඟින් භෞතික ගබඩා අවශ්‍යතා, හැසිරවීමේ පිරිවැය සහ අපද්‍රව්‍ය අඩු කරමු.

වැඩි කල්පැවැත්මක්, අඩු මුළු ජීවන චක්‍ර පිරිවැයක් සහ වගකීමෙන් යුතුව ලබාගත් සංරචක සහිත උපකරණ සහ ද්‍රව්‍ය සඳහා කැමැත්තක් දක්වමින් තිරසාරභාවය පිළිබඳ මූලධර්ම අපගේ ප්‍රසම්පාදන ක්‍රියාවලියට ඇතුළත් කර ඇත. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය (ඊ-අපද්‍රව්‍ය) සහ අනෙකුත් පහසුකම් අපද්‍රව්‍ය සඳහා පාලිත බැහැර කිරීමේ සහ විකුණුම්කාර ගිවිසුම් හරහා අපි වගකිවයුතු ජීව කාල අවසන් කිරීමේ ව්‍යවහාර වලංගු කරන අතර පාරිසරික රෙගුලාසිවලට අනුකූල වීම සහ අපගේ පාරිසරික බලපෑම අවම කිරීම සහතික කරමු.

ස්වභාවික ප්‍රාග්ධනය පිළිබඳ වැඩිදුර විස්තර සඳහා 172 සිට 181 දක්වා පිටු බලන්න.

නිෂ්පාදිත ප්‍රාග්ධනය

## 3 අපි ප්‍රතිඵල ශක්තිමත් කරන ආකාරය

නිෂ්පාදිත ප්‍රාග්ධනය ස්ථිර ගනුදෙනුකාර ප්‍රතිඵලවලට මාරු කරන සහ ක්‍රියාවට නැංවීම ආරක්ෂා කරන අවස්ථාවේදී පමණක් ඉතා ප්‍රයෝජනවත්ය. එමනිසා, බැංකුව ඇතුළත් ප්‍රවේශය, රඳාපවතින සේවය, ශක්තිමත් පාලන හා කාර්යක්ෂම මෙහෙයුම් ඇති කිරීමට යටිතලපහසුකම් තීරණ භාවිතා කරන අතර ඒ තුළින් මාර්ග තේරීම නොසලකා පිවිසිය හැකි සහ ඔරොත්තුදෙන ගනුදෙනුකාර අත්දැකීම ඇති කරයි.

### 3.1 ඇතුළත් ප්‍රවේශය හා ගනුදෙනුකාර අත්දැකීම

- ඩිජිටල් මාර්ග වෙත සංක්‍රමණය වන ගනුදෙනුකරුවන් සඳහා සහාය වන ඩිජිටල් සේවාවන් මගින් අනුපූරණය වන ප්‍රජා පාදක ඉතුරුම් ගමන් සඳහා සහාය වන විශ්වාසදායක භෞතික ප්‍රවේශ ස්ථාන.
- විශේෂයෙන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සහ අවදානමට ලක්විය හැකි ගනුදෙනුකරුවන් සඳහා ගනුදෙනුකාර මැදිහත්වීම් අතර පෞද්ගලිකත්වය සහ ගෞරවය ආරක්ෂා කරන සේවා පරිසරයන්.
- ස්වයං සේවා මාර්ග සහ සහාය සේවා ස්ථාන හරහා පුළුල් ප්‍රවේශය, ගමන් කාලය අඩු කිරීම සහ පහසුව වැඩි දියුණු කිරීම.
- කිසිදු පාරිභෝගිකයෙකු අත්‍යවශ්‍ය සේවාවන්ගෙන් බැහැර නොවන බව සහතික කිරීමට උපකාරී වන බාධා රහිත සැලැස්ම සහ ප්‍රවේශ්‍යතා නගා සිටුවීම්.

### 3.2 මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ පාලන විනය

- මෙහෙයුම් අස්ථාවරත්වය අඩුකරන සහ ස්ථාන හරහා පාලනයේ ස්ථිරබව වර්ධනය කරන ප්‍රමිතිගත පිරිසැලැස්ම සහ උපකරණ.
- වර්ධිත වත්කම් කාලය සහ අඩුකළ බිඳවැටීම්, අතින් සිදුකරන ක්‍රියා අවම කිරීම සහ අවසාන පාලන විනය ශක්තිමත් කිරීම.
- ආරක්ෂිත මුදල් හැසිරවීම, වංචා සොයා ගැනීම සහ සිදුවීම් වැලැක්වීමට සහය වන පහසුකම් හා උපකරණ පාලනයන්
- පරිශ්‍රය, ආරක්ෂාව සහ තාක්ෂණික නියමයන් වඩා යහපත් සම්බන්ධීකරණය, නඩත්තුව සහ සිදුවීම් ක්‍රියාමාර්ග සඳහා අවසාන විනය වර්ධනය කිරීම.

### 3.3 සේවා පොරොන්දුවක් ලෙස ඔරොත්තුදීම හා අඛණ්ඩතාව

- පරීක්ෂා කරන ලද ප්‍රතිචාර සහ ප්‍රතිසාධන ක්‍රියා පටිපාටි මගින් සහාය වන, බිඳවැටීම් අතරතුර අත්‍යවශ්‍ය සේවාවන් පවත්වා ගෙන යන අඛණ්ඩ විධිවිධාන.
- උපද්‍රව (උපයෝගිතා දෝෂ, පහසුකම් සිදුවීම්, ආරක්ෂක සිදුවීම් සහ දරුණු කාලගුණය)වලින් ඇතිවන සේවා බාධාකිරීම් අඩු කරන භෞතික හා පාරිසරික ආරක්ෂණ.
- බාහිර රඳාපැවැත්ම අවධාරණය කරන විට සේවාව පවත්වා ගැනීමට උපකාරී වන සැපයුම්කරු සහ හවුල්කරු උත්සන්න කිරීමේ යාන්ත්‍රණ.
- පාලිත පසුබෑම් සහ පැහැදිලි සන්නිවේදන පෙරාතු ලේඛන හරහා බාධාකාරී සිදුවීම් වලදී ගනුදෙනුකරුවන්ට සහ ප්‍රජාවන්ට සහාය වන වැඩි දියුණු කළ සූදානම.

### 3.4 තිරසාරභාවය සහ වගකීම්සහගත මෙහෙයුම් ඇති කිරීම

- බලශක්ති කළමනාකරණය සහ කඩදාසි-අඩු ක්‍රියාවලීන් හරහා සම්පත් තීව්‍රතාවය අඩු කිරීම, පිරිවැය විනය සහ පාරිසරික කාර්යසාධනයට සහාය වීම.
- දේශගුණිය හා -පෙළගැස්වූ මෙහෙයුම් සඳහා දායක වන පරිශ්‍ර මූලපිරීම් (උදා: හැකි තැන්වල පුනර්ජනනීය බලශක්තිය, කාර්යක්ෂම සිසිලනය) සහ බලශක්ති පිරිවැය අස්ථාවරත්වයට නිරාවරණය වීම අඩු කිරීම.
- ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය සහ පහසුකම් අපද්‍රව්‍ය ප්‍රවාහ වගකිවයුතු ලෙස හැසිරවීම ඇතුළුව පාලිත අපද්‍රව්‍ය කළමනාකරණය.

## 4 මෙය ලබාදෙන ආකාරය

විනයගත භාරකාරිත්වය හා ඉලක්කගත ආයෝජන තුළින්, බැංකුවේ නිෂ්පාදිත ප්‍රාග්ධන පදනම රඳාපවතින ප්‍රවේශ, ශක්තිමත් සේවා තත්ත්වය, බාධාරහිත සේවය සහ වැඩිකළ ඔරොත්තුදීම සඳහා සහය වේ. වාර්ෂික මිණුම් මෙහෙයුම් උපකරණ පුවරුව සහ ව්‍යවස්ථාපිත අනාවරණ හරහා වාර්තා කරන අතර, පහත ප්‍රතිඵල මෙම ප්‍රාග්ධනය තුළින් නිර්මාණය කළ වටිනාකම ග්‍රහනය කර ගනී.

### 4.1 ආයෝජනයේ සිට බලපෑම දක්වා

උපායමාර්ගික යටිතලපහසුකම් සහ වත්කම් ප්‍රසශ්තකරණය කෙරෙහි අපගේ අවධානය තීරණාත්මක මානයන් පහක් හරහා මැනියහැකි වටිනාකම ලබා දී ඇත:

1. **ඔරොත්තු දෙන මෙහෙයුම් ධාරිතාව:** බාධා රහිත නිෂ්පාදන සහ වත්කම් අඛණ්ඩතාව සමඟ ප්‍රධාන යටිතල පහසුකම් උසස් කිරීම් සාර්ථකව සමතුලිත කරන ලද අතර, එය බාධා රහිත පද්ධති ඒකාබද්ධ කිරීම්, අඩු කළ අක්‍රිය කාලය සහ ස්ථාවර ප්‍රතිදාන මිනුම් මගින් සනාථ වේ.

2. **අනාගතයට සූදානම් වත්කම් හැකියාව:** ස්වයංක්‍රියකරණය, සුහුරු යටිතල පහසුකම් සහ පරිමාණය කළ හැකි වේදිකාවල ඉලක්කගත ආයෝජන හරහා ආයතනයේ භෞතික හා තාක්ෂණික වත්කම් පදනම ශක්තිමත් කරන ලද අතර, වෙළඳපොළට වේගවත් කාලය සහ ඉහළ මෙහෙයුම් කාර්යක්ෂමතාව සක්‍රීය කරයි.

3. **ශක්තිමත් මෙහෙයුම් පෙළගැස්ම:** වැඩිදියුණු කළ වත්කම් ජීවන චක්‍ර කළමනාකරණය සහ හරස් කාර්යය සම්බන්ධීකරණය තුළින් වැඩි විශ්වසනීයත්වයක් සහ උපයෝගිතාවන් ඇති කරන ලද අතර, එමඟින් නව තාක්ෂණයන් යොදාගැනීම ඉහළ මට්ටමකට ගෙන ඒමට සහ උපකරණ ඵලදායීතා ලකුණු වැඩිදියුණු කිරීමට හේතු වේ.

4. **ආරක්ෂාව සහ වත්කම් අඛණ්ඩතාව කල්පිරීම:** ප්‍රතික්‍රියක නඩත්තු කිරීමේ සිට පුරෝකථන වත්කම් නියාමනය සහ අසමත් ආරක්ෂක සැලැස්ම දක්වා පුළුල් කිරීම මගින්, සැලසුම් නොකළ ඇනහිටීම් අඩු කිරීම සහ තිරසාර නිෂ්පාදන හැකියාවට සහායවීම මගින් මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම.

5. **යටිතල පහසුකම් ගැඹුර සහ නවීකරණය කිරීමේ සූදානම:** තීරණාත්මක නිෂ්පාදන පුරුක් සඳහා "දැනට සූදානම්" වත්කම් සහ පරිමාණය කළ හැකි පද්ධතිවල ශක්තිමත් මාර්ගයක් ගොඩනැගීම හා තනි-අසාර්ථක අවදානම අඩු කිරීම සහ මෙහෙයුම් හරහා උපායමාර්ගික අඛණ්ඩතාව සහතික කිරීම.

නිෂ්පාදිත ප්‍රාග්ධනය

## 4.2 නිෂ්පාදිත ප්‍රාග්ධන වටිනාකම් ලකුණු පුවරුව

අපගේ භෞතික යටිතල පහසුකම් සේවා සැපයීම සඳහා විශ්වාසදායක එන්ජිමක් ලෙස ක්‍රියා කරන බව සහතික කිරීම සඳහා, බැංකුව ප්‍රමුඛ සහ පසුගාමී ප්‍රාග්ධන හාරකාරත්ව දර්ශකවල සමතුලිත කට්ටලයක් නියාමනය කරයි. මෙම මිනුම් වත්කම්ල සෞඛ්‍යය, කාර්යක්ෂමතාව සහ ඔරොත්තු දීම පිළිබඳ තීරණාත්මක අවබෝධයක් ලබා දේ.

වැලැක්වීමේ නඩත්තු සම්පූර්ණ කිරීම සහ ව්‍යාපෘති මාර්ගවල සෞඛ්‍යය වැනි ප්‍රමුඛ දර්ශක අනාගත විශ්වසනීයත්වය පුරෝකථනය කරන අතර, ජාල ක්‍රියාකාරී කාලය සහ පිරිවැය කාර්යක්ෂමතාව වැනි පසුගාමී දර්ශක උපලබ්ධි ප්‍රතිඵල මනිනු ලබයි. හිමිකාරිත්වයේ මුළු පිරිවැය ප්‍රශස්ත කිරීම, සේවා අඛණ්ඩතාව සහතික කිරීම සහ ජාතික මූල්‍ය ඇතුළත් කිරීමට සහාය වීම සඳහා මෙම විනයගරුක ලුහුබැඳීම තීරණාත්මකය. මෙම ප්‍රධාන ක්ෂේත්‍ර හරහා අපගේ කාර්යසාධනය පහත වගුවෙන් විස්තර කරයි.

| දර්ශක වර්ගය | මිනුම් ක්ෂේත්‍රය | මූලික කාර්යසාධන දර්ශක | ඒකක | 2025 | 2024 | ප්‍රවණතාව |
|---|---|---|---|---|---|---|
| **ප්‍රමුඛ දර්ශක** | වත්කම් සෞඛ්‍යය සහ නඩත්තුව | නිමකළ සැලසුම්කළ නඩත්තුව% | % | 100 | 100 | ස්ථාවර |
| **පසුගාමී දර්ශක** | සේවා ලබාගතහැකි වීම | ශුද්ධ වැඩකරන කාලය (ශාඛා සහ ATMs) | % | 99.8 | 99.8 | ස්ථාවර |
| | මෙහෙයුම් කාර්යක්ෂමතාව | වත්කම් වටිනාකමින් %ක් ලෙස නඩත්තු පිරිවැය | % | 9.7 | 6.8 | වැඩිවීම |
| | සුරක්ෂිතතාව සහ ආරක්ෂාව | ප්‍රධාන සුරක්ෂිතතාව/ආරක්ෂක සිදුවීම් | ගණන. | 0 | 0 | ස්ථාවර |
| | තිරසාර කාර්යසාධනය | ශාඛාවකට බලශක්ති පරිභෝජනය | GJ | 134.4 | 125.5 | වැඩිවීම |

වගුව 12

### වෙනත් ප්‍රාග්ධන සමඟ විභව සමතුලිතා හා සහක්‍රියා

- **මූල්‍ය ප්‍රාග්ධනය සමඟ විභව සමතුලිතතා**
  අපි දිගුකාලීන මෙහෙයුම් ආරක්ෂා කිරීමට, ඉතුරුම්, අවදානම් අඩු කිරීම, සේවාවල තත්ත්වය වැඩි කිරීමට ඉදිරි මූල්‍ය වියදම් පිළිගනිමින් යටිතලපහසුකම් නවීකරණය කර ශක්තිමත් කිරීමට සැලකියයුතු ප්‍රාග්ධණ වියදමක් වෙන් කරමු.
- **මානව ප්‍රාග්ධනය සමඟ සහක්‍රියා**
  නවීන, කාර්යක්ෂම, සහ ආරක්ෂිත සේවා ස්ථාන සෘජුවම සේවක ඵලදායීත්වය සහ යහපැවැත්ම ශක්තිමත් කරන අතර දක්ෂ පිරිස් ඵලදායී වත්කම් මෙහෙයුම සහ නඩත්තුව සඳහා අත්‍යවශ්‍යය.
- **බුද්ධිමය ප්‍රාග්ධනය සමඟ සහක්‍රියා**
  අපගේ භෞතික යටිතල පහසුකම් සුහු ATMs සහ IoT හැකියාව ඇති ගොඩනැගිලි කළමනාකරණ පද්ධති ඇතුළුව ඩිජිටල් හා දත්ත පදනම් සේවා සඳහා පදනම ලෙස සේවය කරන අතර එමගින් අපගේ භෞතික වත්කම් පිළිබඳ තාක්ෂණය සහ බුද්ධිය අපගේ කාර්යක්ෂමතාව වැඩි කරයි.
- **ස්වභාවික ප්‍රාග්ධනය සමඟ සහක්‍රියා**
  අපි බලශක්ති කාර්යක්ෂම සහ දේශගුණිකව ඔරොත්තුදෙන සැලසුම්වල ආයෝජනය කරන අතර එහි මූලික පිරිවැය වඩා ඉහළ වුවත් අපගේ තිරසාර අරමුණු සමඟ පෙළ ගැසී දිගුකාලීන පාරිසරික බලපෑම සහ මෙහෙයුම් වියදම් අඩු කරයි.

### ඉදිරි දැක්ම: 2026 සහ ඉන් ඔබ්බට ප්‍රමුඛතා

- **පුරෝකථන වත්කම් කළමනාකරණය**
  පුරෝකථනය හරහා වැලැක්වීමේ නඩත්තුව සඳහ IoT සංවේදක හා විශ්ලේෂණ ක්‍රියාත්මක කිරීම
- **හරිත යටිතල පහසුකම් පරිමානය**
  සියලුම ප්‍රධාන ස්ථාපන සඳහා පුනර්ජනනීය බලශක්ති ස්ථාපනය කිරීම සහ අනිවාර්ය හරිත ප්‍රමිති පුළුල් කිරීම
- **ජාල ඔරොත්තුදීම සහ ශක්තිමත් කිරීම**
  ඉහළ අවදානම් ස්ථාන සඳහා දේශගුණිකව තහවුරුකිරීම සහ ආරක්ෂක වර්ධනයන් වේගවත් කිරීම
- **ඒකාබද්ධ මාර්ග උපායමාර්ගය**
  ගනුදෙනුකාර විශ්ලේෂණ සහ උපයෝගිතා දත්ත මත පදනම් වී භෞතික ඩිජිටල් සේවා මුසුව ප්‍රසශ්ථකරණය

### අනාගත වර්ධනය සඳහා නිෂ්පාදන ප්‍රාග්ධනයේ ප්‍රමාණාත්මතාව

දේශගුණික ආශ්‍රිත සහ මෙහෙයුම් බිඳවැටීම්වල වැඩිවන වාර ගණන තිබියදීත්, ජාල නවීකරණය, වැළැක්වීමේ ඔරොත්තු දීම සහ හරිත යටිතල පහසුකම්වල අපගේ උපායමාර්ගික ආයෝජන අනුවර්තන සහ කල් පවතින භෞතික වත්කම් පදනමක් නිර්මාණය කර ඇත. අපගේ නවීකරණය කළ ශාඛා, විශ්වාසදායක ස්වයං සේවා ජාලය සහ ශක්තිමත් කළ අඛණ්ඩතා වැඩපිළිවෙල අපගේ 2026-2028 උපාය මාර්ගය ලබා දීමට අවශ්‍ය රඳාපවතින, ඇතුළත් සහ කාර්යක්ෂම සේවා මාර්ග සපයයි.

ජාතික යටිතලපහසුකම් පවත්වා ගැනීමට අපි කැප වී සිටින අතර එය වර්තමාන අරමුණ සඳහා සුදුසු වීම පමණක් නොව අනාගතයේදී ශ්‍රී ලංකික පරම්පරාවට සේවය කිරීමට සුදුසු බව සනාථ කර ඇත.

# මානව ප්‍රාග්ධනය

## අපගේ ගමනේ කේන්ද්‍රය සවිබලගැන්වීම




ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සේවකයින් අපගේ ඉහළම වත්කම වේ. ඔවුන් අපගේ උපායමාර්ගික සාර්ථකත්වයේ සහ වටිනාකම නිර්මානයේ පදනම් සකස් කරන අතර නව්‍යකරණය, ගනුදෙනුකාර තෘප්තිය, සහ සියලුම මෙහෙයුම් හරහා තිරසාර වර්ධනය ඇති කරමින් අපගේ ආයතනික අරමුණ මූර්තිමත් කරයි.

2025 දී අපගේ මානව ප්‍රාග්ධන උපායමාර්ගය ඇතුළත්, ඉහළ කාර්යසාධන, සහ වේගයෙන් වෙනස්වන මූල්‍යමය වාතාවරණයක් තුළ සුවිශේෂ සේවයක් ලබා දීමට හැකියාව ඇති අනාගතයට සූදානම් ශ්‍රමබලකායක් ගොඩ නැගීම කෙරෙහි අවධානය යොමු කර ඇත. අපි දක්ෂයින් බඳවා ගැනීම, සේවක සංවර්ධනය, සේවා ස්ථාන යහපත, සහ විවිධත්ව මුලපිරීම්වල උපායමාර්ගිකව ආයෝජනය කරන අතර එය අපගේ තරඟකාරී වාසිය ශක්තිමත් කරමින් දිගුකාලීන ආයතනික තිරසාරතාවය සහතික කරයි.

### උපායමාර්ගික කුළුණු සහ වටිනාකම් නිර්මාණත්වයට අදාළත්වය

**1 ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව සහ මූල්‍ය අන්තර්කරණය:**

ගනුදෙනුකාර අවශ්‍යතා අවබෝධ කරගනිමින් සපුරාලන අන්තර්ගත විසඳුම් සමඟ නිර්මාණය කිරීමට සේවා බලකාය පුරා ඇතුළත් ගැඹුරු සහකම්පනය, නිර්මාණ චින්තන හැකියාවන් සහ දේශීයගත වෙළෙඳපොල දැනුම.

**2 තිරසාර වෙන්දේසිය වර්ධනය සහ කළඹ ප්‍රසශ්තකරණය:**

ආයෝජන තුලනය කිරීමට හා දිගු කාලීන වටිනාකම් නිර්මාණය ප්‍රමුඛ කිරීම සඳහා නියමයන් අතර පෝෂණය කළ කඩිසර මූල්‍ය දැනුම, වාණිජ විනය සහ උපායමාර්ගික තීරණ ගැනීමේ කුසලතා.

**3 සේවක, සංස්කෘතික සහ සහභාගිත්ව විශිෂ්ටත්වය:**

කාර්යසාධනය හා ඒ තුළ සන්නාම ලැදියාව මෙහෙයවීමට දක්ෂ ව්‍යවහාරවලට ඇතුළත් නායකත්ව සංවර්ධනය, මනෝ විද්‍යාත්මක ආරක්ෂාව සහ හඳුනා ගැනීම.

**4 අවදානම් සංස්කෘතික පාලනය හා අනුකූලතා විනය:**

සෑම කාර්යභාරයක් හරහාම පවතින සදාචාර තර්කනය හා වගවීම සහිත අඛණ්ඩ ඉගෙනුම තුළින් ශක්තිමත් කළ සක්‍රීය අවදානම් මනස.

**5 ඩිජිටල් වේගවත් කිරීම සහ දත්ත පදනම් බැංකුකරණය:**

ඩිජිටල් ආර්ථිකයක විශ්වාසී නව්‍යකරණය හා පුද්ගලාරෝපනය සවිමත් කිරීමට ඇතුළත් කළ ඩිජිටල් ප්‍රවීනතාව, දත්ත සාක්ෂරතාව, කඩිසරව වැඩකිරීමේ මාර්ග.

**6 තිරසාරතාවය, දේශගුණය ප්‍රජා ඔරොත්තුදීම:**

ඔරොත්තු දෙන අනාගතයක වගකීම්සහගත භාරකාරත්වය බලගැන්වීමට තිරසාර මූල්‍ය, දේශගුණ අවදානම් තක්සේරුව සහ ප්‍රජා හවුල්කාරත්වයක් තුළ ගොඩනගන ලද හැකියාවන්.

### ප්‍රධාන අවදානම් සහ අභියෝග

- **තරඟකරුවන්ට හා ෆින්ටෙක් වෙත දක්ෂයින් ආකර්ෂණය:** දක්ෂ ව්‍යක්තිකයින් අහිමිවීම සේවා අඛණ්ඩතාවයට හා මෙහෙයුම් ස්ථාවරත්වයට තර්ජනයකි.
- **අභ්‍යන්තර සහභාගී නොවීම:** සේවකයින්ට අසම්බන්ධිත හෝ අඩුවෙන් අගයකර ඇති බව දැනුනහොත්, මානසික මට්ටම හා ඵලදායීත්වය අඩු වේ.
- **කුසලතා තීරණාත්මක ගබඩාව:** ඩිජිටල් බැංකුකරණය, සයිබර් ආරක්ෂාව, දත්ත විශ්ලේෂණ, සහ තිරසාර මූල්‍ය බාධක, නව්‍යකරණය හා අනාගත වර්ධනය තුළ පරතරය.

### අපගේ උපායමාර්ගික ප්‍රතිචාරය හා අවම කිරීම

- **අනාගතයට සූදානම් ශ්‍රම බලකායක් ගොඩ නැගීම:** දක්ෂයින්ට වර්ධනය විමට හා ඉදිරියට යාමට හැකි පරිසරයක් පෝෂණය කරන කඩිසරකම හා ඩිජිටල් ව්‍යක්තභාවය වැඩි කරන ඉලක්කගත සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- **අපගේ සේවක සන්නාමය ශක්තිමත් කිරීම:** දක්ෂයින් ආකර්ෂණය කර, සහභාගි කර රඳවා ගැනීමට නායක යහපැවැත්ම, පිළිගැනීම, සහ සේවක කේන්ද්‍රිය සංස්කෘතියක්.
- **ආයතනික ඔරොත්තුදීම වැඩි කිරීම:** සේවකයින් ට වෙළෙඳපොල විනැහ්වීම යාන්ත්‍රනය කිරීමට හා වෙනස්වන ගනුදෙනුකාර අවශ්‍යතා සපුරාලීමට හැකියාව ඇති කරන අඛණ්ඩ කුසලතා වර්ධනය හා උපායමාර්ගික බඳවා ගැනීම තුළින් අනුවර්තනීය සහ දක්ෂ ශ්‍රමබලකායක් පෝෂණය කිරීම.

# මානව ප්‍රාග්ධනය

## මානව ප්‍රාග්ධන වටිනාකම් දාමය හා තිරසාර අබණ්ඩතාව

අපි කාර්යසාධනය, යහපැවැත්ම, සහ ඔරොත්තුදෙන ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල සඳහා බඳවාගැනීමේ හා දක්ෂතා යෙදවුම්වලින් වටිනාකම් දාම කාව හරහා අපි මානව ප්‍රාග්ධනය දකිමු.

**යෙදවුම්**

ශ්‍රම බලකාය සහ නායකත්ව මාර්ගය, සංස්කෘතිය සහ වටිනාකම්, මානව සම්පත් ප්‍රතිපත්ති සහ සේවක සබඳතා, ඉගෙනුම් වේදිකා සහ අයවැය, යහපැවැත්ම සහ ආරක්ෂක පද්ධති.

**භාරකාරත්ව කටයුතු**

ශ්‍රම බලකාය සැලසුම් කිරීම සහ තීරණාත්මක කාර්යභාර ආවරණය කිරීම, ඉගෙනීම සහ අනාගතයට සූදානම් කුසලතා මාර්ග, සංචලතාව සහ අනුප්‍රාප්තිය; සාධාරණ රැකියා සහ ආචාර ධර්ම ආරක්ෂණ, කාර්යසාධනය සහ හැසිරීම විනය, යහපැවැත්ම, වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව සහ හදිසි සූදානම, ඇතුළත් කිරීම සහ ප්‍රවේශ්‍යතා නවාතැන්.

**නිමැවුම්**

පුහුණුව ලත් සහ සහතික ලත් සේවකයින්, ශක්තිමත් ඩිජිටල්, දත්ත, අවදානම් සහ අනුකූලතා හැකියාවන්, ඉහළ සහභාගීත්වයක් සහ රඳවා ගැනීමක්, ආරක්ෂිත සේවා ස්ථාන, නායකත්ව මණ්ඩල ශක්තිය සහ අනුප්‍රාප්තික සූදානම.

**ගනුදෙනුකාර සහ පාලන ප්‍රතිඵල**

වඩාත් ස්ථාවර සේවා ගුණාත්මකභාවය සහ පාරිභෝගික ආරක්ෂාව, ශක්තිමත් පාලන ක්‍රියාත්මක කිරීම සහ අඩුකළ දෝෂ, ආරක්ෂිත මෙහෙයුම් සහ වඩා යහපත් සිදුවීම් සූදානම, ස්ථාවරත්වයට හානි නොකර ඉහළ වෙනස්කම් සම්මත කර ගැනීම.

**දිගුකාලීන බලපෑම්**

තිරසාර ආයතනික ඔරොත්තු දීම, රට පුරා විශ්වාසදායක සේවා සංස්කෘතිය, දේශගුණය සහ බාධා අවදානම් වලට අනුවර්තනය වීමේ හැකියාව වැඩිදියුණු කිරීම, යෝග්‍ය වැඩ, කුසලතා සංවර්ධනය සහ ඇතුළත් සේවා සැපයීම තුළින් ශක්තිමත් ජාතික වටිනාකමක්.

**ප්‍රමාණාත්මක කරුණු**

**2.1** සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ මූල්‍ය පද්ධති විශ්වාසය

**2.3** මූල්‍ය නිසාරභාවය සහ ඉපයීම් ඔරොත්තුදීම

**3.1** දක්ෂයින් ආකර්ෂණය/රඳවා ගැනීම සහ අනාගතයට සූදානම් කුසලතා

**3.2** සේවක සෞඛ්‍ය, යහපැවැත්ම සහ ඇතුළත් සමාජය

## SDGsට අපගේ දායකත්වය

**ඉලක්කය** 3.4 3.8

බලශක්ති කාර්යක්ෂම ශාඛා සැලසුම් සහ ජාලය පුරා LED ප්‍රතිසංස්කරණය, ජාල යැපීම අඩු කරන සූර්ය කෝෂ ස්ථාපනයන්, නව ශාඛා ඉදිකිරීම් සහ ප්‍රතිසංස්කරණ වලදී හරිත ගොඩනැගිලි ව්‍යවහාර.

**ඉලක්කය** 4.4 4.5

කඩදාසි රහිත මූලපිරීම් සහ ඩිජිටල් භාවිතය තුළින් සම්පත්-කාර්යක්ෂම මෙහෙයුම්, ශාඛා ජාලය සහ ප්‍රධාන කාර්යාලය හරහා භෞතික සම්පත් පරිභෝජනය ප්‍රශස්තකරණය කිරීම, උපකරණ සහ ද්‍රව්‍ය තිරසාර ලෙස ප්‍රසම්පාදනය කිරීම.

**ඉලක්කය** 5.1 5.5

බැංකු සේවා සඳහා විශ්වාසදායක ප්‍රවේශයක් සහතික කරන අලෙවිසැල් 263 කින් යුත් රට පුරා ශාඛා ජාලය, ATMs, CRMs යන්තු ඇතුළු නවීකරණය කරන ලද සේවා යටිතල පහසුකම්, අඛණ්ඩ සේවා සැපයීමට සහාය වන ඔරොත්තු දෙන භෞතික යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීම.

**ඉලක්කය** 8.5 8.8

නාගරික හා ග්‍රාමීය ප්‍රජාවන්ට සේවය සපයන ප්‍රවේශ විය හැකි ශාඛා ස්ථාන සහ ATM ස්ථාපනයන්, ජ්‍යෙෂ්ඨ-පුරවැසියන්ට සහ ආබාධිත පුද්ගලයින්ට ප්‍රවේශ විය හැකි යටිතල පහසුකම්, අඩු පහසුකම් සහිත ප්‍රදේශවල උපායමාර්ගිකව සිටීම, ඇතුළත් නාගරික හා ග්‍රාමීය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.

**ඉලක්කය** 10.3 10.4

අහිතකර කාලගුණික සිදුවීම් වලට ඔරොත්තු දීම සඳහා නිර්මාණය කර ඇති දේශගුණයට ඔරොත්තු දෙන භෞතික යටිතල පහසුකම්, දේශගුණික අවදානම් අවස්ථා ඇතුළත් ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්කරණය, ස්වාභාවික විපත් වලදී සේවා අඛණ්ඩතාව සහතික කරන ආපදා ප්‍රතිසාධන හැකියාවන්.

**ඉලක්කය** 16.5 16.6

සේවක හැසිරීම පාලනය කරන ශක්තිමත් ආචාර ධර්ම රාමුවක් සහ චර්යා සංග්‍රහයක්, ආයතනය පුරා අන්තර්ගත අල්ලස් හා දූෂණ විරෝධී පුහුණුව, විනිවිද මානව සම්පත් ප්‍රතිපත්ති සහ මැසිවිලි විසඳීමේ යාන්ත්‍රණයන්.

# මානව ප්‍රාග්ධනය

## අපගේ මානව ප්‍රාග්ධන ගමන්මඟ: භාරකාරත්වයේ සිට මැනියහැකි වටිනාකම දක්වා

බැංකුවේ, අපගේ මානව ප්‍රාග්ධනය යනු ජාතික විශ්වාසයේ එන්ජිම වන අතර එය තිරසාර ක්‍රියාත්මක කිරීමේ පදනම වේ. මහජන වරමක් සහිත රාජ්‍ය බැංකුවක් ලෙස, අපි මූල්‍ය ස්ථාවරත්වය සඳහා කරන ආකාරයටම ජනතා තීරණ සඳහා ද එම විනයම යොදන්නෙමු. අපි පාලනය, හැකියා ගොඩනැගීම සහ සංස්කෘතිය සේවා ගුණාත්මකභාවය, ගනුදෙනුකාර ආරක්ෂාව, අවදානම් කළමනාකරණය සහ තිරසාර වටිනාකම් නිර්මාණය සමඟ සෘජුවම සම්බන්ධ කරමු.

**1 අපගේ ප්‍රාග්ධන පදනම්**

පාලනය, ආචාර ධර්ම, සේවක සබඳතා, සාධාරණ රැකියා, සංස්කෘතිය සහ විශ්වාසය ආරක්ෂා කිරීම.

**2 අපි හැකියාව ශක්තිමත් කරන ආකාරය**

අනාගතයට සූදානම් බැංකුවක් සඳහා ශ්‍රම බලකාය සැලසුම් කිරීම, ඉගෙනීම, සංචලතාව සහ අනුප්‍රාප්තිය.

**3 අපි ප්‍රතිඵල ශක්තිමත් කරන ආකාරය**

- කාර්යසාධන කළමනාකරණය
- සේවක සහභාගිත්වය
- වෘත්තීය සෞඛ්‍යය, යහපැවැත්ම සහ ආරක්ෂාව
- දිට්ටවා සුළි කුණාටුව හරහා අපගේ සේවකයින් සමඟ සිටගැනීම
- සේවක සබඳතා සහ මැසිවිලි යාන්ත්‍රණ
- ආචාර ධර්ම, වෙනස් ලෙස නොසැලකීම සහ මානව හිමිකම් බැඳීම්.

**4 මෙයින් ලබාදෙන දෑ**

ඔරොත්තු දීම, සේවාව සහ ජාතික වටිනාකම ශක්තිමත් කරන මනින ලද ප්‍රතිඵල.

## 1 අපගේ ප්‍රාග්ධන පදනම්

විශ්වාසය සහ අඛණ්ඩතාව ආරක්ෂා කරන ශක්තිමත් අධීක්ෂණය, පැහැදිලි වගවීම සහ සාධාරණ රැකියා ව්‍යවහාර තුළ බැංකුවේ මානව භාරකාරත්වය පදනම් වී ඇති ආකාරය මෙම කොටසේ දක්වා ඇත.

### 1.1 පාලනය හා අධීක්ෂණය

මානව ප්‍රාග්ධන පාලනය අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණය තුළ පදනම් වී ඇති අතර කළමනාකරණය හරහා ක්‍රියාත්මක වේ. මෙමගින් සේවකයින් සම්බන්ධ තීරණ උපාය මාර්ග, සේවා ප්‍රතිඵල සහ ඔරොත්තු දීම සඳහා සෘජුවම සහාය වන බව සහතික කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණය ශ්‍රම බලකාය සැලසුම් කිරීම, ඉගෙනීම සහ සංවර්ධනය, හැසිරීම සහ සදාචාර, සේවක සබඳතා, ආරක්ෂාව සහ යහපැවැත්ම සහ අනුප්‍රාප්තික සූදානම දක්වා විහිදේ. මෙම ප්‍රවේශයෙන් මානව ප්‍රාග්ධනය ප්‍රමුඛ මානව සම්පත් ව්‍යවහාරවලට අනුකූලව උපායමාර්ගික වැදගත්කමක් ඇති බව සලකයි.

පහත සඳහන් පාලන ව්‍යූහය ක්‍රියාත්මකව පවතී:

- **අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව (BHRRC), සහ අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව (BNC)** - සේවකයින්ට අදාළ අවදානම්, ආචාර ධර්ම, චර්යාව, අනුප්‍රාප්තික ඔරොත්තු දීම සහ පාරිශ්‍රමිකය සඳහා අධීක්ෂණය සපයයි.
- **ආයතනික කළමනාකරණ කමිටුව (CMC)** - උපායමාර්ගය වාර්ෂික සේවක ප්‍රමුඛතා බවට පරිවර්තනය කර, බෙදා හැරීම නිරීක්ෂණය කර, නැගී එන ගැටළු උත්සන්න කරයි.
- **මානව සම්පත් කාර්යය සහ අංශ ප්‍රධානීන්** - මානව සම්පත් ප්‍රතිපත්ති සහ පද්ධති සැලසුම් කරන අතර, ව්‍යාපාරික නායකයින් දේශීය ක්‍රියාත්මක කිරීම, සංස්කෘතිය සහ පාලනයන් සතු වන සම-වගවියයුතු ආකෘතියක් ක්‍රියාත්මක කරයි.
- **සහතික කිරීම සහ අවදානම් ඒකාබද්ධ කිරීම** - බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණය සහ සහතික කිරීමේ චර්යාවන්ගේ කොටසක් ලෙස මානව ප්‍රාග්ධන අවදානම් සමාලෝචනය කරයි

### 1.2 වගකිවයුතු රැකියා නියුක්තිය, අනුකූලතාව සහ මානව හිමිකම් ආරක්ෂණ

බලපත්‍රලාභී බැංකුවක් සහ රාජ්‍ය ආයතනයක් ලෙස, සේවක භාරකාරත්වය සඳහා අපගේ ප්‍රවේශය ව්‍යුහගත ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි මගින් සහාය දක්වන අනුකූලතාවයට මුල් තැන දෙන රාමුවක් මත ගොඩනගනු ලබයි. සමාන අවස්ථාව, රැකියාවේ ගෞරවය සහ ආරක්ෂිත සේවා ස්ථාන සඳහා කැපවීම් ඇතුළත් කරන අතරම, අදාළ කම්කරු නීති සහ රෙගුලාසිවලට ස්ථිර අනුකූලතාවය අපි සහතික කරමු.

අපගේ රාමුව තුළින් වැටුප් ගෙවීම සහ ප්‍රතිලාභ, බඳවා ගැනීම් සහ උසස්වීම්, වැඩ කරන වේලාවන්, විවේක කාලයන්, නිවාඩු, විනය ක්‍රියාමාර්ග සහ වෙන්වීම් ඇතුළු සියලුම ප්‍රධාන සේවා නියුක්ති ක්ෂේත්‍ර ආවරණය කරයි. ස්ථාපිත මානව සම්පත් පාලන චර්යාවන්, සහතික කිරීමේ සමාලෝචන සහ පැහැදිලි කළමනාකරණ වගවීම හරහා අනුකූලතාව සක්‍රීයව නියාමනය කෙරේ.

## මානව ප්‍රාග්ධනය

**GRI** 2-19 2-23 2-24 402-1

මෙම බැඳීම එක්සත් ජාතීන්ගේ ගෝලීය සංයුක්ත (UNGC) මූලධර්ම 1 සිට 6 දක්වා සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) ප්‍රකාශනය ඇතුළුව ස්වේච්ඡා ගෝලීය මිණුම් සලකුණු සමඟ පෙළගැස්වීම සඳහා නියාමන අවශ්‍යතාවලින් ඔබ්බට විහිදේ.

| නිර්ණායක කෂේත්‍ර | දේශීය නීතිකරණය | බැංකුවේ ප්‍රතිපත්තිය | ගෝලීය මිණුම් ලකුණු ප්‍රමිතිය |
|---|---|---|---|
| **බැංකුවේ මානව සම්පත් කාර්යය කළමනාකරණය** | සාප්පු හා කාර්යාල සේවක පනත | මානව සම්පත් ප්‍රතිපත්තිය | UNGC මූලධර්ම 6<br>**ILO ප්‍රකාශනය:** ළමා ශ්‍රමය ඵලදායී ලෙස අහෝසි කිරීම, සේවා නියුක්තිය සහ වෘත්තිය සම්බන්ධයෙන් වෙනස් ලෙස සැලකීම තුරන් කිරීම. |
| **මැසිවිලි මෙහෙයවීම** | ක්ෂේත්‍රයේ මනා පරිචයන් | මානව සම්පත් ප්‍රතිපත්තිය | UNGC මූලධර්ම 1<br>**ILO ප්‍රකාශනය:** රැස්වීමේ නිදහස සහ සාමූහික කේවල් කිරීමේ අයිතිය ඵලදායී ලෙස පිළිගැනීම. |
| **වැටුප් හා වැටුප් නොවන ප්‍රතිලාභ** | සාප්පු හා කාර්යාල සේවක පනත | සාමූහික ගිවිසුම | UNGC මූලධර්ම 6<br>**ILO ප්‍රකාශනය:** වෙනස් ලෙස සැලකීම තුරන් කිරීම, සමාන පාරිශ්‍රමිකය ප්‍රවර්ධනය කිරීම. |
| **බඳවාගැනීම සහ අවසන් කිරීම** | සේවකයින්ගේ සේවා නියුක්තිය අවසන් කිරීමේ පනත | බඳවාගැනීම: අනුමත බඳවාගැනීමේ යෝජනා ක්‍රමය; විනයානුකූල අවසන් කිරීම: බැංකුවේ විනය සංග්‍රහය | UNGC මූලධර්ම 6<br>**ILO ප්‍රකාශනය:** සියලුම ආකාරයේ බලාත්කාර හෝ අනිවාර්ය ශ්‍රමය තුරන් කිරීම, වෙනස් ලෙස නොසැලකීම. |
| **පුහුණුව** | ක්ෂේත්‍රයේ මනා පරිචයන් | පුහුණුව සහ සංවර්ධන ප්‍රතිපත්තිය | UNGC මූලධර්ම 1<br>**ILO ප්‍රකාශනය:** වෘත්තීය මාර්ගෝපදේශ සහ පුහුණුව ප්‍රවර්ධනය. |
| **වෘත්තීමය සෞඛ්‍ය හා ආරක්ෂාව** | සාප්පු හා කාර්යාල සේවක පනත | මානව සම්පත් ප්‍රතිපත්තිය | UNGC මූලධර්ම 1<br>**ILO ප්‍රකාශනය:** වෘත්තීමය සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ මූලික ගිවිසුම්. |
| **මානව අයිතිවාසිකම්** | ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව | මානව සම්පත් ප්‍රතිපත්තිය | UNGC මූලධර්ම 1 හා 2<br>**ILO ප්‍රකාශනය:** මූලික මූලධර්ම හතර (රැස්වීමේ නිදහස, සියලුම ආකාරයේ බලාත්කාර හෝ අනිවාර්ය ශ්‍රමය තුරන් කිරීම යනාදිය). |
| **අල්ලස සහ දූෂණය** | දූෂණ විරෝධී පනත | දූෂණ විරෝධී පනත | UNGC මූලධර්ම 10 |
| **හිරිහැර කිරීම විසඳීම - ලිංගික/ලිංගික නොවන** | දණ්ඩ නීති සංග්‍රහය | මානව සම්පත් ප්‍රතිපත්තිය | UNGC මූලධර්ම 6<br>**කොන් කිරීම ILO ප්‍රකාශනය:** සේවා නියුක්තිය සහ වෘත්තිය සම්බන්ධයෙන් වෙනස් ලෙස සැලකීම තුරන් කිරීම. |
| **අභ්‍යන්තර ආරාවුල් විසඳීම** | ක්ෂේත්‍රයේ මනා පරිචයන් | බැංකුවේ විනය සංග්‍රහය | UNGC මූලධර්ම 1<br>**ILO ප්‍රකාශනය:** රැස්වීමේ නිදහස සහ රැස්වීමේ නිදහස සහ සාමූහික කේවල් කිරීමේ අයිතිය ඵලදායී ලෙස පිළිගැනීම. |
| **මානව සම්පත් කාර්යය විගණනය** | ක්ෂේත්‍රයේ මනා පරිචයන් | මානව සම්පත් ප්‍රතිපත්තිය | UNGC මූලධර්ම 1 |
| **කාර්යසාධන කළමනාකරණය හා අනුප්‍රාප්තික සැලසුම්කරණය** | ක්ෂේත්‍රයේ මනා පරිචයන් | මානව සම්පත් ප්‍රතිපත්තිය සහ චක්‍රලේඛ | UNGC මූලධර්ම 6<br>**ILO ප්‍රකාශනය:** වෙනස් ලෙස සැලකීම තුරන් කිරීම: වෘත්තීය මාර්ගෝපදේශ ප්‍රවර්ධනය. |

මානව ප්‍රාග්ධනය

## රැකියාවේ සදාචාරය හා මානව හිමිකම් ආරක්ෂාවන්

බැංකුවේ වැටුප් ගෙවීම සහ සේවයෙන් පහ කිරීම, බඳවා ගැනීම සහ උසස්කිරීම්, වැඩ කරන වේලාවන්, විවේක කාලයන් සහ අනෙකුත් ප්‍රතිලාභ සහ සුභසාධනය පාලනය කරන සියලුම නීති සහ රෙගුලාසි වලට දැඩි ලෙස අනුකූල වීම තුළින් මානව හිමිකම් සහ ළමා ශ්‍රමය, බලහත්කාර ශ්‍රමය, වෙනස් ලෙස සැලකීම සහ හිරිහැර කිරීම් වලට එරෙහිව ශූන්‍ය ඉවසීමේ ප්‍රතිපත්තියකට බැංකුවේ කැපවීම ක්‍රියාත්මක කෙරේ.

කාර්යක්ෂමතාව, ආරක්ෂාව, තරඟකාරී වාසිය සහ විශ්වාසනීය ජාතික සේවය ශක්තිමත් කරන මනින ලද ප්‍රතිඵල.

බුද්ධිමය ප්‍රාග්ධනය

## 1 අපගේ ප්‍රාග්ධන පදනම්

බැංකුවේ බුද්ධිමය ප්‍රාග්ධනය අන්තර් සම්බන්ධිත පදනම් හතරක් හරහා ගොඩනගා ඇත.

1.1 පාලනය සහ අධීක්ෂණය

1.2 ව්‍යවසාය දැනුම සහ ආයතනික මතකය

1.3 පද්ධති සහ වේදිකා

1.4 අස්පෘශ්‍ය වත්කමක් ලෙස විශ්වාසය සහ කීර්තිනාමය

මෙම පදනම් එක්ව, නවෝත්පාදනය සහ ඇතුළත් කිරීම සක්‍රීය කරන අතරම තැන්පත්කරුවන්ගේ විශ්වාසය ආරක්ෂා කරමින්, ක්‍රියාත්මක කිරීම පුනරාවර්තනය කළ හැකි, විගණනය කළ හැකි සහ ඔරොත්තු දෙන බවට පත් කරයි,

### 1.1 පාලනය හා අධීක්ෂණය

බුද්ධිමය ප්‍රාග්ධනය බංකුවේ ක්‍රියාත්මක වීමේ බලපත්‍රයට සෘජුවම බලපෑම් කරයි. ඒ අනුව, අපගේ පද්ධතිවල උල්ලංඝනයක් මහජන විශ්වාසය කඩ කිරීමක් බව හඳුනා ගනිමින්, මූල්‍ය භාරකාරත්වයට අදාළ වන දැඩි බව සමඟ අපි බුද්ධිමය ප්‍රාග්ධනය පාලනය කරමු. අපගේ ප්‍රවේශය බහු ස්ථර, ක්‍රියාශීලී වන අතර ඉහළම මට්ටමේ ආයතනික වගවීමකට ඇතුළත් කර ඇත.

තොරතුරු තාක්ෂණය, මෙහෙයුම්, මූල්‍ය, අවදානම් සහ අනුකූලතාව හරහා අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණය සහ විධායක වගවීම සමඟ අපි බුද්ධිමය ප්‍රාග්ධනය පාලනය කරමු. කම්ටු පාදක චර්යාවන් පාලන පරතර සහ තාක්ෂණික අවදානම් ප්‍රමුඛකරණය, වැඩි දියුණු කිරීම සහ වසා දැමීම මෙහෙයවන අතර, අවදානම් සහ අභ්‍යන්තර විගණනයෙන් ඒකාබද්ධ සහතික කිරීම මගින් සහාය වේ. තෙවන පාර්ශවීය පාලනය මගින් තීරණාත්මක වෙළෙන්දන් ඔරොත්තු දීම, ආරක්ෂාව සහ සේවා අපේක්ෂාවන් සපුරාලන බව සහතික කරයි.

- **අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපාය මාර්ග කම්ටුව (BITSC) සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කම්ටුව (BIRMC)** - තාක්ෂණ ආයෝජන, ඩිජිටල් නවෝත්පාදන සහ වැදගත් සයිබර්, දත්ත සහ වේදිකා අවදානම් කළමනාකරණය පිළිබඳ උපායමාර්ගික අධීක්ෂණය සපයයි.
- **ආයතනික කළමනාකරණ කම්ටුව** - ඩිජිටල් උපාය මාර්ගය වාර්ෂික තාක්ෂණ ප්‍රමුඛතා සහ කළඹ අරමුණු බවට පරිවර්තනය කරයි, ක්‍රියාත්මක කිරීම මෙහෙයවමින් තීරණාත්මක ලබාදීම හෝ ඔරොත්තු දීමේ ගැටළු උත්සන්න කරයි.
- **තොරතුරු තාක්ෂණ කාර්යය සහ ව්‍යාපාර අංශ ප්‍රධානීන්** - සම-වගකීම්සහගත ආකෘතියක් යටතේ ක්‍රියාත්මක වේ. තොරතුරු තාක්ෂණ කාර්යය, ව්‍යවසාය පද්ධති සහ වේදිකා නිර්මාණය කර, සුරක්ෂිත කර, නඩත්තු කරන අතර ව්‍යාපාරික නායකයින් ඔවුන්ගේ පාලන තන්ත්‍ර තුළ යොදා ගැනීම, දත්ත අඛණ්ඩතාව සහ ක්‍රියාත්මක කිරීම පාලනය නතු කර ගනී.
- **සහතික කිරීම සහ අවදානම් ඒකාබද්ධ කිරීම** - අභ්‍යන්තර හා බාහිර විගණන චර්යාවන් හරහා පවත්වන ලද ස්වාධීන සමාලෝචනය සහ වලංගුකරණය සමඟ, තාක්ෂණය සහ දත්ත අවදානම් බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවට විධිමත් ලෙස ඇතුළත් කරනු ලබයි.

### 1.2 ව්‍යවසාය දැනුම හා ආයතනික මතකය

මෙය අපගේ මෙහෙයුම් ප්‍රඥාවේ මූලාධාරය වේ. ව්‍යවසාය දැනුම සහ ආයතනික මතකය අපගේ බුද්ධිමය ප්‍රාග්ධනයේ අත්‍යවශ්‍ය පදනම සකස් කරමින් බැංකුවේ සාමූහික බුද්ධිය සහ උගත් අත්දැකීම් වලින් සමන්විත වේ. ණය තක්සේරු කිරීම සහ වංචා අනාවරණය වැනි සංකීර්ණ ක්ෂේත්‍රවල දිගු කලක් සේවය කළ බැංකුකරුවන්ගේ නිහඬ විශේෂඥතාව, රාජ්‍ය අර්ථසාධක අරමුදල් ආපසු ගැනීමේ සිට අක්‍රිය ගිණුම් දක්වා සියල්ල හැසිරවීම සඳහා වන ක්‍රියා පටිපාටි පිළිබඳ පැහැදිලි ලේඛනගත කිරීම, අපගේ අනුකූලතා කණ්ඩායම තුළ වැඩිදියුණු කරන ලද නියාමන අර්ථකථන කුසලතා සහ අතීත මෙහෙයුම් සිදුවීම් වලින් සාක්ෂාත් කරන ලද තීරණාත්මක පාඩම් මෙයට ඇතුළත් වේ.

මෙම ගැඹුරු දැනුම අපගේ දෛනික මෙහෙයුම් පසුපස ඇති අත්‍යවශ්‍ය "ඇයි" සහ "කෙසේද" යන්න සපයයි. එය සංකීර්ණ, විනිශ්චය පදනම් කරගත් කාර්යයන් අපගේ සමස්ත ජාලය පුරා කැපී පෙනෙන අනුකූලතාවයකින් සිදු කරන බව සහතික කරන අතර යාපනයේ ණය නිලධාරියෙකු සහ මාතර ණය නිලධාරියෙකු යන දෙදෙනාම බෙදාගත් ආයතනික මතකයකින් උකහාගෙන ඇති බැවින් ඔවුන්ට එකම මූලික අවදානම් මූලධර්ම යෙදීමට හැකියාව සලසයි. මෙම පද්ධතිමය අනුරූපතාව යනු අපගේ ක්‍රියාත්මක කිරීම විශ්වාසදායක ලෙස පුනරාවර්තනය කළ හැකි වීම සහ අපගේ සේවා ප්‍රමිතීන් සෑම ගනුදෙනුකරුවෙකු සඳහා පුරෝකථනය කළ හැකිවීමයි.

තවද, මෙම මූලික දැනුම අපගේ සමස්ත මෙහෙයුම් පරිසර පද්ධතිය සමඟ ගතිකව අන්තර් සම්බන්ධ වේ. එය ස්වයංක්‍රීය ව්‍යාපාර නීති ලෙස අපගේ මූලික බැංකු පද්ධතිවලට ක්‍රමානුකූලව කේතනය කර ඇති අතර සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (SOPs) ලෙස අපගේ දෛනික වැඩ ප්‍රවාහයන්ට විධිමත් කර ඇත. අවසාන වශයෙන්, කාලයත් සමඟ එහි ස්ථාවර සහ සදාචාරාත්මක යොදා ගැනීම හරහා, මෙම සාමූහික බුද්ධිය සියලු පාර්ශ්වකරුවන්ගේ අන්තර්ක්‍රියා හරහා කල් පවතින මහජන විශ්වාසය ගොඩනඟා දරාගන්නා වැදගත් සාරයක් බවට පත්වේ.

අවුරුදු 20ට වැඩි පළපුරුද්ද සහිත සේවකයින්

**330**

අවුරුදු 10ට වැඩි පළපුරුද්ද සහිත සේවකයින්

**1,873**

වෘත්තිමය වශයෙන් සුදුසකම් ලද කාර්ය මණ්ඩලය

**2,876**

### 1.3 ආයතනික සංස්කෘතිය: අපගේ බුද්ධිමය ප්‍රාග්ධනයේ මූලාධාරය

සෑම පද්ධතියක්ම, ක්‍රියාවලියක්ම සහ දැනුම් වත්කමක්ම පාදක කර ගැනීම අපගේ ආයතනික සංස්කෘතියේ මූලික අංගයකි. බැංකුව වටිනාකම් මත පදනම් වූ ආයතනයක් වන අතර, සියලු ව්‍යාපාර භාවිතයන් තුළ විශ්වාසය, අනෝන්‍ය ගෞරවය, අඛණ්ඩතාව, ආරක්ෂාව සහ නිර්මාණශීලිත්වය පෝෂණය කිරීමට දැඩිව කැපවී සිටී. දශක පහක් පුරා වගා කරන ලද මෙම මූලධර්ම, සංකල්පීය මූලධර්ම පමණක් නොව, අපගේ සේවකයින් සහ කළමනාකරණය පාර්ශ්වකරුවන් සමඟ අර්ථවත් සබඳතා ගොඩනඟා ගන්නා ආකාරය සහ බැංකුවේ බුද්ධිමය සම්පත් ආරක්ෂා කරන ආකාරය මෙහෙයවන මෙහෙයුම් පද්ධතියක් ද වේ.

අපගේ ශක්තිමත්, ධනාත්මක සංස්කෘතිය සදාචාර බැංකුකරණ ව්‍යවහාර තුළ මුල් බැස ඇති අතර, එහිදී අපි දැනුම හුවමාරුව, විනිවිදභාවය සහ ප්‍රජාව ගොඩනැඟීම සක්‍රීයව ප්‍රවර්ධනය කරමු. මෙම මනාව අර්ථ දක්වා ඇති මූලධර්ම මාලාව බැංකුවේ මෙහෙයුම්වල සෑම අංශයක්ම පාලනය කරන අතර, සංකීර්ණ ණය තක්සේරුකරණයේ සිට දෛනික ගනුදෙනුකාර අන්තර්ක්‍රියා දක්වා අපගේ රාජකාරී ක්‍රියාත්මක කිරීම නොසැලෙන අනුරූපතාවයකින් සහ වගවීමකින් සිදු කරන බව සහතික කරයි.

බුද්ධිමය ප්‍රාග්ධනය

**අපගේ කාර්යය තුළ මූලික වටිනාකම්:**




අපගේ ව්‍යවහාර නීතිපතා තක්සේරු කිරීමෙන්, වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීමෙන් සහ අනාගත සාර්ථකත්වය සඳහා අවශ්‍ය වැඩිදියුණු කිරීම් සිදු කිරීමෙන් අපි ආයතනයේ සෑම මට්ටමකම මෙම වටිනාකම් අබණ්ඩව ශක්තිමත් කරමු. මෙම සංස්කෘතික ඔරොත්තු දීම අප නව තාක්ෂණයන් තුළ ආයෝජනය කරන බැවින් සහ අපගේ ආයතනික මතකය සම්පාදනය කරන බැවින්, අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය සැමවිටම අරමුණක්, සැලකිල්ලක් සහ අපගේ මහජන වරම කෙරෙහි ස්ථීර කැපවීමක් සහිතව යොදවා ඇති බව සහතික කරන මානව අංගයට ප්‍රමුඛත්වය දෙන රාමුවක් තුළ අපි එසේ කරන බව සහතික කරයි.

## 1.4 පද්ධති සහ වේදිකා

මෙම පදනම සෑම ගනුදෙනුවක්ම සහ දත්ත ලක්ෂ්‍යයක්ම පිරිසකසන, ගබඩා කරන සහ සුරක්ෂිත කරන මෙහෙවර-තීරණාත්මක තාක්ෂණික යටිතල පහසුකම් නියෝජනය කරයි. එය අපගේ ඩිජිටල් අභිලාෂයේ ස්පර්ශ්‍ය ප්‍රකාශනය වන අතර, එය අලුතින් ස්ථාවර කරන ලද T24 මූලික බැංකු පද්ධතියෙන් සමන්විත වේ. මෙය සියලුම පාරිභෝගික ගිණුම් සහ මූල්‍ය තත්ත්වයන් සඳහා සත්‍යයේ තනි මූලාශ්‍රය ලෙස සේවය කරයි. අපගේ පොදු මාර්ග ප්‍රවේශ ස්ථරයට NSBPay ජංගම යෙදුම ඇතුළත් වන අතර එය අනාගත Tap & Pay ක්‍රියාකාරිත්වය, අන්තර්ජාල බැංකුකරණ බිහිදොර, සහ ඔරොත්තුදෙන ස්විචයක් හරහා සම්බන්ධිත ජාතික මට්ටමේ ATMs සහ CRMs ජාලයක් සඳහා නව APIs සමඟ 2025 දී වැඩිදියුණු කරන ලදී. මෙය පාදකකර ගැනීම යනු මූලික සහ ප්‍රතිසාධන දත්ත මධ්‍යස්ථාන ඇතුළුව අපගේ ආරක්ෂිත දත්ත යටිතල පහසුකමයි.

මෙම පදනම පශ්චාත් ක්‍රියාත්මක වීමේ තත්ත්වයක සිට ප්‍රශස්තකරණය කළ විශ්වසනීයත්වයකට හිතාමතාම මාරුවීම 2025 වසරේ ප්‍රධාන ජයග්‍රහණය විය. ක්‍රියාත්මක වීමෙන් පසුව, අපි කාර්යසාධනය සුසර කිරීම, කණ්ඩායම් ක්‍රියාවලි ප්‍රශස්තකරණය සහ තීරණාත්මක දෝෂ විසඳීම සම්බන්ධ වන දැඩි වැඩසටහනක් ක්‍රියාත්මක කළෙමු. මෙය මූලික බැංකුකරණ පද්ධතිය (CBS) නව පද්ධතියක සිට ඉහළින් ලබාගැනීමේ හැකියාව සහිත උපරිම ගනුදෙනු පරිමාවන් හැසිරවිය හැකි විශ්වාසදායක, පරිමාණය කළ හැකි හරයක් බවට පරිවර්තනය කළ අතර, අනෙකුත් සියලුම ඩිජිටල් සේවා සහ නිෂ්පාදන නව්‍යකරණ සෘජුවම සක්‍රීය කරයි.

## ක්‍රියාවලි හා පාලන විනය: ආරක්ෂක ක්‍රියාත්මක කිරීම සඳහා නිර්මාණය කළ රාමුව

මෙය පාලනය, ක්‍රියාපටිපාටි සහ පරීක්ෂාවන් පිළිබඳ සංවිධිත පද්ධතියක් වන අතර, ඉන් සෑම තාක්ෂණික හැකියාවකින්ම ආරක්ෂාව, අනුකූලතාව සහ වගවීමේ දැඩි මායිම් තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බව සහතික කරයි. එය අපගේ විධිමත්ව අනුමත කළ තොරතුරු තාක්ෂණ පාලන රාමුවට ඇතුළත් කර ඇති අතර එමගින් තාක්ෂණික තීරණ, වෙනස කළමනාකරණය හා අවදානම් හිමිකාරත්වය සඳහා පැහැදිලි වගවීමක් ස්ථාපිත කරයි. මෙම රාමුව සැලසුම්කරු-පරීක්ෂක අනුමැති වැඩප්‍රවාහයක් තුළින් ක්‍රියාත්මක කරන අතර, එය ණය බෙදාහැරීමේ සිට මූල්‍ය සඟරා පළකිරීම සහ අනවසර කටයුතු පාලනය කරන මූලික බැංකුකරණ පද්ධතිය තුළ දැඩි, කාර්යභාර පදනම් ප්‍රවේශ පාලනයක් දක්වා ප්‍රධාන ක්‍රියාවලික ඇතුළත් කෙරේ.

2025 දී තීරණාත්මක දියුණුවක් වූයේ අපගේ සිදුවීම් සහ අර්බුද කළමනාකරණ පෙරාතු ලේඛනවල පරිණතභාවයයි. මේවා හුදෙක් න්‍යායාත්මක නොවූ අතරම සැබෑ ලෝක සිදුවීම් සහ මූලික බැංකුකරණ පද්ධතිය සඳහා සම්පූර්ණ ආපදා ප්‍රතිසාධන පරීක්ෂණයක් ඇතුළුව නියමිත පෙරහුරු අභ්‍යාස අතරතුර පීඩන පරීක්ෂා කිරීමක්ද විය. පෙරාතු ලේඛනවලින් පැහැදිලි උත්සන්න කිරීමේ මාර්ග, සන්නිවේදන මාර්ග සහ ප්‍රතිසාධන පියවර නිර්වචනය කරන අතර, ඕනෑම බිඳවැටීමක් කඩිනම්, සම්බන්ධීකරණය කළ, සහ ඵලදායී ප්‍රතිචාර සමඟ සපුරාලන බව සහතික කරයි. මෙම විනයගරුක රාමුව තුළින් අපගේ පද්ධති තුළ ගනු ලබන සෑම ක්‍රියාවක්ම අවසර ලත් බවත්, වෙනස් කළ නොහැකි විගණන විමසුම්වල විනිවිදව සටහන් කර ඇති බවත්, සහ අවසානයේ අභ්‍යන්තර සහ බාහිර සහතික සපයන්නන් විසින් සත්‍යාපනය කළ හැකි බවත් සහතික කරයි.

## 1.5 අස්පෘශ්‍ය වත්කමක් ලෙස විශ්වාසය සහ කීර්තිනාමය

මෙම පදනම යනු ඉතා වෙහෙස මහන්සි වී උපයාගත් සහ ඉතා සූක්ෂ්ම ලෙස ආරක්ෂා කරන ලද, පාර්ශ්වකරුවන්ගේ විශ්වාසයේ අත්හල නොහැකි, අස්පෘශ්‍ය වත්කමකි. තැන්පත්හිමියෙකුගේ ජීවිත ඉතිරිකිරීම් ආරක්ෂිත සහ ඔරොත්තු දෙන ඩිජිටල් පරිසරයක් තුළ කළමනාකරණය කරනු ලබන බවට ඔහුගේ මූලික විශ්වාසය සහ අපගේ මූල්‍ය හා නියාමන වාර්තාකරණයේ නිරවද්‍යතාවය සහ අඛණ්ඩතාව පිළිබඳ නියාමකයෙකුගේ විශ්වාසය එය ග්‍රහණය කරයි.

2025 දී, ඔප්පු කරන ලද ක්‍රියාමාර්ග හරහා බැංකුව සක්‍රීයව විශ්වාසය ගොඩනඟා ඇත. දිට්වා සුළි කුණාටුව අතරතුර පද්ධති ස්ථායිතාව තුළින් ගනුදෙනුකරුවන්ට සහ නියාමකයින්ට ඔරොත්තු දීමේ හැකියාව පෙන්නුම් කළේය. ගෙවීම් ටෝකන්කරණය සහ දැනුවත් කිරීමේ ව්‍යාපාර වැනි ආරක්ෂක උසස් කිරීම් පිළිබඳ විනිවිද යාවත්කාලීන කිරීම් මගින් පාර්ශ්වකරුවන් දැනුවත් කර නැවත සහතික කරන ලදී. නව තොරතුරු තාක්ෂණ පාලන ප්‍රතිපත්තිය සහ පිරිසිදු විගණන මගින් ශක්තිමත් පාලනයන් තහවුරු කරන ලදී. මෙම විශ්වාසය ඩිජිටල් භාවිතය, සුමට නියාමන සබඳතා සහ වගකීමෙන් යුතුව නවෝත්පාදනය කිරීමට අවසර ලබාදීම උපකාරී විය.

# බුද්ධිමය ප්‍රාග්ධනය

## ඩිජිටල් විශිෂ්ටත්වය සහ උපායමාර්ගික සහභාගිත්වය මගින් වැඩිකළ බංකුවේ සන්නාමය

බැංකුවේ සන්නාමය අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය තුළින් නිර්මාණය කරන ලද බාධා රහිත, ආරක්ෂිත සහ නව්‍ය ඩිජිටල් අත්දැකීම් මගින් මූලික වශයෙන් බලගන්වනු ලබයි. අපගේ පරිශීලක-හිතකාමී ජංගම බැංකු යෙදුම්, බුද්ධිමය මාර්ගගත වේදිකා සහ කෘතිම බුද්ධි සහාය ඇති සේවාවන් නවීන ගනුදෙනුකාර අත්දැකීම නිර්වචනය කරන අතර, සෑම අන්තර්ක්‍රියාවක්ම කාර්යක්ෂම, ප්‍රයෝජනවත් සහ ආවේණිකව ආරක්ෂිත බවට පත්කරයි.

## සන්නාම හිමිකමක් ලෙස නව්‍යකරණය

අඛණ්ඩ නව්‍යකරණය සඳහා අපගේ හැකියාව අපගේ සන්නාම වටිනාකම සෘජුව ශක්තිමත් කරයි. හිමිකම සහිත මෘදුකාංග, පේටන්ට් බැංකුකරණ ක්‍රියාවලිය, සහ අපගේ හරිත මූල්‍ය හඹායාමේ මෙවලම් වැනි අසමසම ඩිජිටල් පිරිනැමීම් ස්පෘශ්‍ය බුද්ධිමය දේපල වත්කම් ලෙස සේවය කරයි. මෙම නව්‍යකරණයන් උසස් හැකියාව ප්‍රත්‍යක්ෂ සන්නාම හිමිකම සහ ගනුදෙනුකාර විශ්වාසය බවට පරිවර්තනය කරමින් බැංකුව වෙළෙඳපල තුළ වෙනස් කරනු ලබයි.

## සයිබර් බුද්ධිය මගින් ආරක්ෂිත විශ්වාසය

අපගේ ඩිජිටල් පරිසර පද්ධතියේ පදනම වන්නේ අපගේ කීර්තිනාමය පිළිබඳ ශක්තිමත්, සක්‍රිය, ආරක්ෂා කිරීමකි. අපගේ ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානය, උසස් තර්ජන බුද්ධි වේදිකා සහ දැඩි සදාචාරාත්මක අනවසරයෙන් ඇතුළුවීමේ වැඩසටහන් තීරණාත්මක බුද්ධිමය සම්පත් වෙති. ඒවා අප ගොඩනගා ඇති විශ්වාසය සක්‍රියව ආරක්ෂා කරන අතර, බැංකුවේ සන්නාමය කෙරෙහි විශ්වාසය පොරොන්දුවක් ලෙස පමණක් නොව, සුපරීක්ෂාකාරීව ආරක්ෂා කරන ලද ප්‍රතිඵලයක් බව සහතික කරයි.




## සමාජ මාධ්‍ය හරහා උපායමාර්ගික සහභාගිත්වය

අපගේ ඩිජිටල් පැවැත්ම සක්‍රිය සමාජ මාධ්‍ය සහභාගිත්වය තුළින් උපායමාර්ගිකව විශාලනය කරන අතර, එය නවින සහ ප්‍රතිචාරාත්මක සන්නාම අනන්‍යතාවක් හැඩගැස්වීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. අපි පහත දෑ සඳහා මෙම මාර්ග භාවිතා කරමු:

- විනිවිදභාවය සමඟ සන්නිවේදනය කිරීම: ඔරොත්තුදීම සහ විශ්වාසය බලගන්වමින් පද්ධති වැඩි දියුණු කිරීම් හෝ සේවා සිදුවීම්වලදී සත්‍ය කාලීන යාවත් කිරීම ලබා දීම.
- මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම: අත්‍යවශ්‍ය ඩිජිටල් ආරක්ෂාව, වංචා වැලැක්වීම, සහ NSBPay Tap & Pay වැනි විශේෂාංගවල ප්‍රතිලාභ පිළිබඳ ගනුදෙනුකරුවන් දැනුවත් කිරීම.
- සන්නාමය මානව හිතවාදී කිරීම: අපි සේවය කරන තනි පුද්ගලයින්ට ආයතනයේ මෙහෙවර සම්බන්ධකරමින් අපගේ සේවකයින් සහ ප්‍රජාවන් පිළිබඳ කථා හුවමාරු කිරීම.
- සාකච්ඡා ඇති කිරීම: පරිශීලක ගමන අඛණ්ඩව නිවැරදි කර වර්ධනය සඳහා සත්‍ය කාලීන ගනුදෙනුකාර ප්‍රතිපෝෂණ රැස් කිරීම.

2026 මාර්තුවලට

**වෙබ් අඩවියේ සහභාගි සැසි**
**මිලියන 2.1**

**යූටියුබ් ග්‍රහකයින්**
**5,170**

**X**
Likes/අනුගාමිකයින්
**468**

**මුහුණුපොත**
Likes/අනුගාමිකයින්
**165,021**

**LinkedIn**
Likes/අනුගාමිකයින්
**9,388**

**ඉන්ස්ටග්‍රෑම්**
අනුගාමිකයින්
**5,362**

රූපසටහන 12

බුද්ධිමය ප්‍රාග්ධනය

## 1.6 සම්මාන සහ පිළිගැනීම

අපගේ බුද්ධිමය ප්‍රාග්ධනයේ ශක්තිය සහ උපායමාර්ගික යොදා ගැනීම බැංකුවට ලැබෙන බාහිර පිළිගැනීම මගින් තහවුරු වේ. මෙම සම්මාන සහ පිළිගැනීම්, බැංකුවේ සමස්ත කාර්යසාධනය සමරන අතරම, තාක්ෂණය, දත්ත සහ නව්‍යකරණය තුළ මූලික ආයෝජන සම්මානලාභී ගනුදෙනුකාර ප්‍රතිඵල, ආරක්ෂාව සහ ඇතුළත් කිරීම සෘජුවම සක්‍රීය කරන ආකාරය ඉස්මතු කර පෙන්වයි.



**Pinnacle Sri Lanka 2025**

- 2025 වසර සඳහා විශිෂ්ටතම ළමා ඉතුරුම් සැලැස්ම - එන්එස්බී හපන්
- 2025 වසර සඳහා විශිෂ්ටතම කාන්තා ඉතුරුම් සැලැස්ම - එන්එස්බී ස්ත්‍රී



**WSBI – ESBG SDG සම්මාන 2025**

- තිරසාර සංවර්ධන අරමුණු (SDGs) ප්‍රදානය



**ටෙක්නොවේෂන් 2025**

- ගනුදෙනුකාර පහසුව තුළ විශිෂ්ටත්වය සඳහා වසරේ බැංකුව වර්ගීකරණය B - රන්
- මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වසරේ බැංකුව වර්ගීකරණය B - රන්
- ඩිජිටල් ගෙවීම්වල සමස්ත සම්මාන විශිෂ්ටත්වය (බැංකු ආයතන) ලෝකඩ



**ගණකාධිකාරිවරුන්ගේ දකුණු ආසියානු පදනම (SAFA)**

- විශිෂ්ට ලෙස ඉදිරිපත් කළ වාර්ෂික වාර්තා සම්මාන 2024 - රිදී



Satyn

- කාන්තා හිතකාමී සේවා ස්ථාන සම්මාන - ශ්‍රී ලංකාවේ වඩාත් කැපීපෙනෙන කාන්තා සේවා ස්ථානයක්




TAGS 2024

- රාජ්‍ය බැංකු අංශය - රන්
- ඒකාබද්ධ වාර්තාකරණය - පිළිගැනීමේ සහතිකය
- තිරසාර වාර්තාකරණය - පිළිගැනීමේ සහතිකය



**ඒකාබද්ධ වාර්තාකරණ සම්මාන වල CMA විශිෂ්ටත්වය**

- විශිෂ්ටතම ඒකාබද්ධ වාර්තාව (රාජ්‍ය බැංකු අංශය) - හවුල් ජයග්‍රාහක
- විශිෂ්ටතම ඒකාබද්ධ වාර්තා දහයෙන් එකකි



**බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් සම්මාන 2025**

- ශ්‍රී ලංකාවේ ඉහළම හා වඩාත් වටිනා සන්නාමය

රූපසටහන 13

බුද්ධිමය ප්‍රාග්ධනය

## 2 අපි හැකියාව ශක්තිමත් කරන ආකාරය

බුද්ධිමය ප්‍රාග්ධනය ගොඩනැගීම යනු නවීකරණය, විනය සහ ඉගෙනීම පිළිබඳ සක්‍රීය වැඩසටහනකි. 2025 දී, බැංකුව වේදිකා ස්ථායිතාව, පරිසර පද්ධති ඒකාබද්ධ කිරීම, දත්ත පාලනය, සයිබර් සහ ඔරොත්තු දීම සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම හරහා හැකියාව ශක්තිමත් කළ අතර, දුර්වල පාලනයන් නොමැතිව වඩා හොඳ සේවාවක් සහ වේගවත් ගමන් ලබා දෙන බව සහතික කළේය. බැංකුව CBS සිට ස්ථාවරකරණය සහ ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීම දක්වා ඉදිරියට යන බැවින් සහ තැපැල් බැංකුකරණ ඩිජිටල් පරිවර්තනය සහ ආරක්ෂිත සංකේතාත්මක ගෙවීම් වැනි නව මූලපිරීම් ආරම්භ කරන විට මෙය විශේෂයෙන් වැදගත් විය.

**අපගේ කළමනාකරණ දර්ශනය: "පාලිත නව්‍යකරණය"**

ආරක්ෂාව සහ කඩිසරකම අතර වැරදි තේරීම අපි ප්‍රතික්ෂේප කරමු. "පාලිත නව්‍යකරණය" පිළිබඳ අපගේ දර්ශනයෙන් බලය ලබා දේ:

- සෑම නව ඩිජිටල් හැකියාවක්ම ආරක්ෂිතව, සැලසුම් අනුව ආරක්ෂාව සහ පෙරනිමි මූලධර්ම සමඟ පෞද්ගලිකත්වය සමඟ ජනනය කළ යුතුය.
- සියලුම ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය මූලික මූල්‍ය පාලනයන් සහ විගණන විමසුම් මගින් ශක්තිමත් කළ යුතුය, එවා මඟ හැරිය යුතු නොවේ.
- විශ්ලේෂණ සඳහා ගුණාත්මකභාවය සහ අඛණ්ඩතාව සාකච්ඡා කළ නොහැකි පූර්ව අවශ්‍යතා සහිත දත්ත උපායමාර්ගික වත්කමක් ලෙස සලකනු ලැබේ.

### 2.1 වේදිකා නවීකරණය හා ඩිජිටල් ලබාදීම ශක්තිමත් කිරීම

2025 දී, බැංකුව නව CBS හි ස්ථායිකරණ අදියර නිමකරන ලද අතර සත්‍ය මෙහෙයුම් තත්ත්වයන් යටතේ විනයාසය සහ කාර්යසාධන වර්ධනයන් ක්‍රියාත්මක කරන ලදී. පසු අන්තයේ ගැලපුම් කිරීමට දත්ත පදනම ප්‍රසශ්තකරණය, තොග තුළ ගැලපීම්, සහ කාර්යසාධන වැඩි කිරීමේ විනයාශය, වර්ධිත ප්‍රතිචාරාත්මකබව සහ වර්ධනීය ගනුදෙනු පරිමාවන් සඳහා ප්‍රමාණ හැකියාව ඇතුළත්ය.

ඒ සමඟම, බැංකුව API වැඩිදියුණු කිරීම් හරහා ඩිජිටල් හැකියාව පුළුල් කළ අතර, නියමු ව්‍යාපෘතියක් සමඟ තැපැල් බැංකුකරණ ඩිජිටල් පරිවර්තන වැඩසටහන ආරම්භ කරමින් වසර අවසාන වන විට පූර්ව නිෂ්පාදනයට ළඟා වන ආරක්ෂිත ටෝකන්ගත Tap & Pay හැකියාව සහිත NSBPay උසස් කරන ලදී. මෙම මූලපිරීම්වලින් ඇතුළත්වීම, පහසුව සහ සේවා විශ්වාසයට සහය වන "පද්ධති ක්‍රියාත්මක කිරීමේ" සිට "වේදිකා සවිමත් කිරීම" දක්වා විතැන්වීමත් පිළිබිඹු කළේය.

**2025 දී මූලික කාර්යයන්**

**CBS ස්ථාවරකරණය සහ ප්‍රසශ්ථකරණය**

- විනයාස නිවැරදි කිරීම සහ පරාමිති ගැලපීම සජීවකරණය
- විකුණුම්කරුවන්ගේ පරිමාවන් සහ යොදවන ලද ඉලක්කගත වැඩිදියුණු කිරීම්.
- පවත්නා මධ්‍යම/අඩු ගැටළු ක්‍රමානුකූලව නිරීක්ෂණය කිරීමෙන් විසඳන ලද සියලුම තීරණාත්මක සහ ප්‍රධාන දෝෂ

**තැපැල් බැංකුකරණ ඩිජිටල් පරිවර්තනය**

- ක්‍රියාත්මක කළ සහ වලංගු කළ නියමු ක්‍රමය මඟ ආරම්භකළ වැඩසටහන
- තෝරාගත් තැපැල් කාර්යාල සඳහා POS යන්ත්‍ර සඳහා අවසන් කර ඇති සහ අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීමට සූදානම් ප්‍රසම්පාදනය

**ටෝකන්ගත Tap & Pay හැකියාව සහිත NSBPay**

- ගෙවීම් ආරක්ෂාව සහ වංචා ඔරොත්තුදීම ශක්තිමත් කිරීමට ඉහළින් ආරක්ෂක ටෝකන්කරණ භාවිතයෙන් 2025 අවසානය වන විට පූර්ව නිෂ්පාදනයට සකස් කළ ව්‍යාපෘතිය.

**භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම**

- භාණ්ඩාගාර මෙහෙයුම්, පාලනයන් සහ අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීමට ආරම්භ කළ ක්‍රියාත්මක කිරීම

**APIs තුළින් පරිසර පද්ධති සූදානම**

- ක්‍රියාකාරීත්වය වැඩි කිරීමට හා ඩිජිටල් වැඩ ප්‍රවාහ ක්‍රමවත් කිරීමට සංවර්ධනය කළ නව APIs

### 2.2 දත්ත පාලනය හා වාර්තාකරණ විනය

ප්‍රධාන වේදිකා පරිණත වන විට, තීරණ ගැනීම විශ්ලේෂණ මෙහෙයවන වාර්තාකරණය මත වැඩි වැඩියෙන් රඳා පවතී. 2025 දී, බැංකුව ඒකාබද්ධ කිරීමේ ගුණාත්මකභාවය සහ ප්‍රතිසන්ධාන වර්යාවන් වැඩිදියුණු කිරීමෙන් සහ ETL (උපුටා ගැනීම, පරිවර්තනය කිරීම, පැටවීම) සහ විශ්ලේෂණ වාර්තා සංවර්ධනය සඳහා අභ්‍යන්තර හැකියාව ගොඩනැගීමෙන් දත්ත අඛණ්ඩතාව සහ වාර්තාකරණ විශ්වාසය ශක්තිමත් කළේය. කළමනාකරණය කළ ගොනු හුවමාරුව වැනි ස්වයංක්‍රීයකරණ මූලපිරීම් අතින් හැසිරවීම තවදුරටත් අඩු කළ අතර පාලන විශ්වසනීයත්වය ශක්තිමත් කරමින් පද්ධති හරහා දත්ත ප්‍රවාහවල සමස්ත අඛණ්ඩතාව වැඩි දියුණු කළේය.

**අපි දත්ත තීරණවල පරිනතභාවය ශක්තිමත් කරන ආකාරය**

- තීරණාත්මක දත්ත කට්ටල සහ වාර්තා සඳහා හිමිකාරිත්වය සහ වලංගුකරණ චර්යාවන්
- වැඩිදියුණු කළ ප්‍රතිසන්ධානය සහ ව්‍යතිරේක හැසිරවීම
- ප්‍රායෝගික පුහුණුව සහ දැනුම හුවමාරුව හරහා පුළුල් කළ අභ්‍යන්තර විශ්ලේෂණ හැකියාව
- වඩා හොඳ නිස්සාරණය සහ ETL ව්‍යවහාර හරහා වැඩිදියුණු කළ වාර්තාකරණ කාලෝචිතභාවය සහ විශ්ලේෂණාත්මක ගැඹුර
- පාලිත සහ ස්වයංක්‍රීය ගොනු මාරු කිරීම් සඳහා ක්‍රියාත්මක කළ MFT

### 2.3 සයිබර් ආරක්ෂාව, රහස්‍යතාව, සහ මෙහෙයුම් ඔරොත්තුදීම

2025 දී, බැංකුව වැඩිකළ නියාමනය, වර්ධිත සිදුවීම් උත්සන්න ක්‍රියාපටිපාටි, සහ අභ්‍යන්තර පරීශීලක කටයුතු පිළිබඳ ශක්තිමත් පාලනයන් හරහා සයිබර් සහ මෙහෙයුම් ඔරොත්තුදීම ශක්තිමත් කරන ලදී. පශ්චාත් සංක්‍රමණ සමාලෝචන විශේෂයෙන් අභ්‍යන්තර වංචා අවදානම් සහ ප්‍රවේශ විනය වැනි ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර හඳුනා ගන්නා ලද අතර සමහර සීමාවන් ක්‍රියාත්මක කිරීමට සහ CBS තුළ ද්විත්ව පාලන මූලධර්ම ශක්තිමත්ව පිළිපැදීමට හේතු විය. ආපදා ප්‍රතිසාධන සූදානම සාර්ථක CBS DR පරීක්ෂණයක් තුළින් ශක්තිමත් කරන ලදී. එමෙන්ම බැංකුව දිට්වා සුළි කුණාටුව තුළ ඔරොත්තුදීම පෙන්නුම් කළ අතර, එහිදී පූර්ව විමධ්‍යගත පරිසරයට සාපේක්ෂව වර්ධිත සූදානම ඉස්මතු කරමින් මධ්‍යගත ශිල්පය පිඩාවට පත් නොවූ ශාඛා සහ ප්‍රධාන කාර්යාලය තුළින් සේවා අඛණ්ඩතාව ශක්තිමත් කළේය.

**සයිබර් රහස්‍යතාව සහ ඔරොත්තුදීමේ වර්ධනයන්:**

- CBS සහ තීරණාත්මක වේදිකා සඳහා ආරක්ෂක ශක්තිමත් කළ පෙරාතු ලේඛන
- විනිවිද යාමේ පරීක්ෂණ, අවදානම් තක්සේරු කිරීම් සහ සිදුකළ පද්ධති ශක්තිමත් කිරීම
- අභ්‍යන්තර වංචා අවදානම අවම කිරීම සඳහා ඇතුළත් කළ සීමා කිරීම් සහ දැඩි ද්විත්ව පාලනය
- 2025 දී හඳුන්වාදෙන ලද නව තොරතුරු තාක්ෂණ සිදුවීම් වාර්තාකරණ සහ උත්සන්න කිරීමේ ක්‍රියාපටිපාටි
- 2025 ඔක්තෝම්බර් මාසයේදී පවත්වන ලද CBS DR පරීක්ෂණය පැවැත්වීම
- මධ්‍යගත සේවා හැකියාව සහ වේගවත් ප්‍රතිසංස්කරණය හරහා දිට්වා සුළි කුණාටුව අතරතුර වැඩිදියුණු කල අඛණ්ඩතාව.

බුද්ධිමය ප්‍රාග්ධනය

## 2.4 ක්‍රියාවලි වැඩි දියුණු කිරීම, පාලන පරිනතභාවය සහ දැනුමෙහි අඛණ්ඩතාව

පද්ධති විනයගරුක මෙහෙයුම් ආදර්ශයකට යොදා ගන්නා අවස්ථාවේදී බුද්ධිමය ප්‍රාග්ධනය පරිනත වේ.

2025 වසර තුළ, CBS - සක්‍රීය කාර්ය ප්‍රවාහ වැඩිදියුණු කිරීම් හරහා ශාඛා මට්ටමේ අතින් සිදුකළ ක්‍රියාවලීන් අඩු කරන ලද අතර, සෘජු පිරිසැකසුම් සහ වේගවත් සේවාවට සහාය විය. මධ්‍යගත නියාමනය සහ පද්ධති විගණන ආරම්භ කිරීම පාලනය සහ අධීක්ෂණය ශක්තිමත් කළේය. 2024/25 පුරා උගත් පාඩම් ශක්තිමත් වෙනස කළමනාකරණයේ සහ දැනුවත් කිරීමේ වැඩසටහන් වල වැදගත්කම ඉස්මතු කළේය. ඊට ප්‍රතිචාර වශයෙන්, බැංකුව පාලන ව්‍යුහයන් ශක්තිමත් කළ අතර තොරතුරු තාක්ෂණ පාලන රාමුව හරහා පැහැදිලි වගවීම ඇතුළත් කළේය. තීරණාත්මක තාක්ෂණික සහ පාලන කාර්යභාරයන්හීදී ප්‍රධාන පුද්ගල අවදානම අඩු කිරීම සඳහා ප්‍රායෝගික පුහුණුව සහ ව්‍යුහගත ලියකියවිලි හරහා දැනුම අඛණ්ඩතාවයට සහාය විය

### අපි හැකියාව ආයතනගගත කරන ආකාරය:

- CBS ක්‍රියාවට නැංවීමේ ප්‍රතිලාභ හරහා ඉවත්කළ අතින් සිදුකළ සහ ශාඛා මට්ටමේ ක්‍රියාවලීන්
- වර්ධිත සෘජු පිරිසැකසුම්කරණය සහ අඩුකළ මෙහෙයුම් සංකීර්ණය
- වගවීම සඳහා ආරම්භකළ මධ්‍යගත නියාමනය සහ ශක්තිමත් විගණන විමසුම්
- අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද IT පාලන රාමුව හරහා වැඩිදියුණු කළ වෙනස් කිරීමේ විනය සහ පෙළගැස්ම
- දැනුම හුවමාරුව (විශ්ලේෂණ/ETL/වාර්තාකරණය) හරහා ශක්තිමත් කළ අභ්‍යන්තර හැකියාව සහ අඩුකළ රඳා පැවැත්ම.
- විසඳුම් සහ තෙහෙට්ටුව අඩු කිරීම සඳහා වෙනස කළමනාකරණය සහ යොදා ගැනීම කෙරෙහි යොමු කළ අඛණ්ඩ අවධානය

## 3 අපි ප්‍රතිඵල ශක්තිමත් කරන ආකාරය

බුද්ධිමය ප්‍රාග්ධනය වර්ධිත ගනුදෙනුකාර ප්‍රතිඵල, ශක්තිමත් අවදානම් විනය, සහ යහපත් තීරණ බුද්ධිය පරිවර්තනය කරන විට පමණක් වටිනාකම ලබා දේ.

2025 දී, ස්ථායිකරණය, පරිසර පද්ධති වර්ධනය. දත්ත විනය, සහ ඔරොත්තුදීම තුළ බැංකුවේ ආයෝජනය විශ්වාසය වර්ධනය කර ඇතුළත්වීම පදනම් මූලපිරීම් ප්‍රමාණනය කිරීමට ඇති බැංකුවේ හැකියාව ශක්තිමත් කළේය. මෙම ප්‍රතිඵල මෙහෙයුම් වර්ධනයන් තුළින් පමණක් නොව මධ්‍යගත ශිල්පය මාර්ග හරහා අඛණ්ඩතාව ශක්තිමත් කළ දිටිවා සුලි කුණාටුව වැනි බිඳවැටීම් සිදුවීම් තුළ ඔරොත්තුදීම තුළින් වලංගු කරනු ලැබුවේය.

## 3.1 වඩා යහපත් ගනුදෙනුකාර ප්‍රතිඵල සවිබලගැන්වීම

වර්ධිත පද්ධති ස්ථාවරත්වය සහ අඩුකළ අතින් කළ ක්‍රියාවලිය ජාලය පුරා වේගවත් සහ වඩාත් නොසැලෙන සේවාව ලබාදීමට සහය විය. නියමු තැපැල් බැංකුකරණය සහ ආරක්ෂක ගෙවීම් වර්ධනයන් වැනි ඩිජිටල් මූලපිරීම් ද ඇතුළත්වීම සහ පහසුව ශක්තිමත් කළ අතර ආරක්ෂාව සහ විශ්වාසය සවිබලගන්වන ලදී. ගනුදෙනුකාරුවන් සඳහා ප්‍රතිලාභී ප්‍රතිඵල පහත දැක්වේ:

- ස්ථාවර CBS හේතුවෙන් ශාඛා සහ ඩිජිටල් මාර්ග හරහා වඩාත් විශ්වාසදායක පාරිභෝගික ගමන්
- වැඩිදියුණු කළ සෘජු පිරිසැකසුම් හරහා අඩු වූ ආපසු හැරවුම් කාලයන් සහ අඩු බිඳවැටීම්
- නියමු තැපැල් බැංකුකරණය සහ POS දියත් කිරීමේ පදනම හරහා ඇතුළත් කිරීමේ පුළුල් කිරීමේ සූදානම
- සංකේතනය කළ Tap and Pay සූදානම හරහා ආරක්ෂිත ඩිජිටල් ගෙවීම් මාර්ගය

## 3.2 සුරක්ෂිත වර්ධනය හා ශක්තිමත් අවදානම් විනය ඇති කිරීම

වඩා ශක්තිමත් නියාමනය, ප්‍රවේශ විනය, ද්විත්ව පාලනය සහ වර්ධිත AML හැකියාව වඩා යහපත් අනුකූලතා ප්‍රතිලාභවලට සහය වූ අතර මෙහෙයුම් අවදානම අඩුකර ඇත. පාලනය හා DR සූදානම ඔරොත්තුදීම වැඩි කර විනයගරුක අවදානම් සංස්කෘතියට සහය විය.

- ශක්තිමත් අභ්‍යන්තර පාලනයන් (කාර්ය මණ්ඩල ප්‍රවේශ සීමා කිරීම්, ද්විත්ව පාලන මූලධර්ම)
- අඛණ්ඩ දත්ත-ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සමඟ වැඩිකළ AML පද්ධති හැකියාව
- DR පරීක්ෂණ සහ ව්‍යුහගත අනාගත පරීක්ෂණ සැලැස්මක් හරහා ශක්තිමත් කළ DR සූදානම
- නියාමන අපේක්ෂාවන්ට අනුකූලව වැඩිදියුණු කළ සිදුවීම් උත්සන්න කිරීම

## 3.3 තීරණවල තත්ත්වය සහ ක්‍රියාත්මක කිරීමේ විනය ශක්තිමත් කිරීම

වර්ධිත දත්ත ලබාගැනීමේ හැකියාව සහ ඒකාබද්ධ ස්ථාවරත්වය වාර්තාකරණ විශ්වාසය වැඩි කර ඇත. විශ්ලේෂණ හා ETL හි හැකියා සංවර්ධනය වඩාත් පාලන විනය සහිත තීරණ ප්‍රයෝජනවත් දැනුම උත්පාදනයට සහ අතින් කිරීමේ රඳාපැවැත්ම අඩු කිරීම ඇති බැංකුවේ හැකියාව ශක්තිමත් කරන ලදී.

- මධ්‍යගත පිරිසැකසුම් හේතුවෙන් දත්තවල වර්ධිත කාලෝචිතභාවය සහ අනුකූලතාව
- සංහිදියා විනය සහ ව්‍යතිරේක වසා දැමීමේ චර්යාවන් හරහා වඩාත් හොඳ වාර්තාකරණ විශ්වාසය
- ව්‍යුහගත පුහුණුව සහ දැනුම හුවමාරුව හරහා ශක්තිමත් අභ්‍යන්තර විශ්ලේෂණ හැකියාව
- MFT ස්වයංක්‍රීයකරණය සහ සැලසුම් කළ ව්‍යාප්තිය හරහා අඩුකළ අතින් මැදිහත්වීමේ අවදානම

බුද්ධිමය ප්‍රාග්ධනය

### 3.4 සේවා පොරොන්දුවක් ලෙස ඔරොත්තුදීම ගොඩ නැගීම

මෙහෙයුම් ඔරොත්තුදීම අභ්‍යන්තර හැකියාවක් පමණක් නොව එය ගනුදෙනුකාර විශ්වාසයේ පෙරොන්දුවක් ද වේ.

2025 දී, බැංකුව මධ්‍යගත ශිල්පය, විකල්ප මාර්ග වර්ධනයන්, සහ උත්සන්න ක්‍රියාපටිපාටි තුළින් වර්ධිත සම්බන්ධීකරණය මගින් සහය වූ දිට්වා සුලි කුණාටු තත්ත්වයන් යටතේ අඛණ්ඩතාව පෙන්නුම් කළේය.

- දිට්වා බලපෑම අතරතුර විකල්ප ශාඛා සහ ප්‍රධාන කාර්යාලය හරහා සේවාවන් පවත්වාගෙන යන ලදී
- වැඩිදියුණු කළ පද්ධති හැකියාව සහ නියාමනය හේතුවෙන් ඩිජිටල් ඉහළ යාමේ පරිමාවන් සුමටව හසුරුවන ලදී
- වැඩිදියුණු කළ සිදුවීම් උත්සන්න කිරීම සහ සන්නිවේදන ක්‍රියා පටිපාටි හරහා වේගවත් සම්බන්ධීකරණයක් ලබා ගන්නා ලදී
- DR පරීක්ෂණ සහ ඉදිරි ඔරොත්තු දීමේ මාර්ග සිතියමක් හරහා ප්‍රතිසාධන සූදානම ශක්තිමත් කරන ලදී.

## 4 මෙය ලබාදෙන ආකාරය

2025 දී, අපගේ දැනුම් වත්කම්වල විනයගරුක භාරකාරත්වය බැංකුවේ නවෝත්පාදන ධාරිතාව, මෙහෙයුම් බුද්ධිය සහ දිගුකාලීන තරඟකාරී වාසිය ශක්තිමත් කළේය. ආයතනික දැනුම ග්‍රහණය කර සම්පාදනය කරන අතරතුර පද්ධති, ක්‍රියාවලීන් සහ ඩිජිටල් යටිතල පහසුකම් තුළ හිතාමතාම ආයෝජනය කිරීම මගින්, අපගේ උපාය මාර්ගය ආරක්ෂිතව සහ තිරසාරව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අත්තිවාරම් අපි ශක්තිමත් කළෙමු. අපගේ ප්‍රධාන කාර්ය සාධන දර්ශක මගින් වලංගු කරන ලද පහත විස්තර කර ඇති ප්‍රතිඵල, අපගේ බුද්ධිමය ප්‍රාග්ධන ආයෝජන සහ බැංකුවේ මෙහෙයුම් ඔරොත්තු දීම, ගනුදෙනුකාර විශිෂ්ටත්වය සහ මූල්‍ය ස්ථාවරත්වය අතර පැහැදිලි සහ ප්‍රධාන සම්බන්ධයක් පෙන්නුම් කරයි.

### 4.1 ආයෝජනයෙන් උපරිම ප්‍රතිලාභී බලපෑමක් කරා

උපායමාර්ගික බුද්ධිමය ප්‍රාග්ධන මූලපිරීම් මත අපගේ අවධානය තිරණාත්මක මානයන් පහක් හරහා මැනියහැකි වටිනාකම ලබා දේ.

**ඩිජිටල් යටිතලපහසුකම් කල්පිරීම:** අඩුකළ පද්ධති කාලය සහ වැඩිකළ ඩිජිටල් යොදා ගැනීමේ අනුපාත මගින් සනාථ කළ විශ්වාසය, ආරක්ෂාව සහ පරිශීලක අත්දැකීම වර්ධනය කිරීමට අපගේ ප්‍රධාන බැංකුකරණ පද්ධති, වෙබ් අඩවිය, සහ ජංගම යෙදුම ක්‍රමානුකූලව වැඩිකර ඇත.

**දත්ත පදනම් තීරණ ගැනීම:** දත්ත විශ්ලේෂණය හා ව්‍යාපාරික බුද්ධිය තුළ ශක්තිමත් ආයතනික අතර හැකියාවන් වඩාත් නිවැරදි ගනුදෙනුකාර දැනුම, අවදානම් කළමනාකරණය සහ උපායමාර්ගික සැලසුම ශක්තිමත් කරයි.

**දැනුම සංරක්ෂණය හා මාරු කිරීම:** වර්ධිත ලේඛනගතකිරීම, ක්‍රියාවලි සම්මතකරණය, සහ අනුප්‍රාප්ති සැලසුම්කරණය මගින් සම්පාදනය කළ තීරණාත්මක ආයතනික දැනුම තනි පුද්ගල උපායශීලි දැනුම කෙරෙහි විශ්වාසය අඩුකර ප්‍රධාන පුද්ගල අවදානම අඩු කරයි.

**සයිබර් ආරක්ෂාව සහ ඔරොත්තුදීම:** වැඩිකළ අපගේ ආරක්ෂක ශිල්පය සහ තර්ජන සෙවීමේ හැකියාවන් ගනුදෙනු දත්ත ආරක්ෂා කර වෙනස්වන සයිබර් අවදානම්වලට අනුව ශක්තිමත් ආරක්ෂාවන් තුළින් විශ්වාසය පවත්වා ගැනීම.

**නව්‍යකරණ සංස්කෘතිය හා කඩිසරකම:** අත්හදාබැලීම සහ අඛණ්ඩ වර්ධනය දිරිගන්වන පරිසරයක් පෝෂණය කිරීම වෙළෙඳපොල වෙනස්වීම් සහ ගනුදෙනුකාර අවශ්‍යතාවන්ට වේගයෙන් යොදා ගැනීම ශක්තිමත් කරයි.

### 4.2 බුද්ධිමය ප්‍රාග්ධන වටිනාකම් ලකුණු කාඩ්පත

අපගේ ඉතාමත් වැදගත් දැනුම් වත්කම්, අපගේ පද්ධති, දත්ත සහ ආයතනික විශේෂඥතාව ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා; බැංකුව ප්‍රමුඛ සහ පසුගාමී බුද්ධිමය ප්‍රාග්ධන දර්ශකවල සමතුලිත කට්ටලයක් නියාමනය කරයි. මෙම මිනුම් අපගේ නවෝත්පාදන සෞඛ්‍යය පිළිබඳ තීරණාත්මක අවබෝධයක් ලබා දෙන අතර වලංගු BCP/DR සැලසුම් සහිත තීරණාත්මක අඩවි වැනි ප්‍රමුඛ දර්ශක හරහා අනාගත හැකියාව පුරෝකථනය කරන අතරම, ඩිජිටල් භාවිතය සහ බලපෑම වැනි පසුගාමී දර්ශක හරහා ප්‍රතිඵල මනිනු ලබයි මෙම විනයගරුක ලුහුබැඳීම අපගේ දැනුම පදනම් ශක්තිමත් කිරීම සඳහා මූලික වන අතර, නොසැලෙන මෙහෙයුම් ස්ථාවරත්වය සහ සේවා විශිෂ්ටත්වය පවත්වා ගනිමින් උපායමාර්ගික වෙනසක් ඇති කළ හැකි බව සහතික කරයි. පහත වගුවේ මෙම ප්‍රධාන ක්ෂේත්‍ර හරහා අපගේ කාර්යසාධනය පහත වගුවේ විස්තර කෙරේ.

## බුද්ධිමය ප්‍රාග්ධනය

| දර්ශක වර්ගය | මිනුම් ක්ෂේත්‍රය | මූලික කාර්යසාධන දර්ශක | ඒකක | 2025 | 2024 | ප්‍රවනතාව |
|---|---|---|---|---|---|---|
| ප්‍රමුඛ දර්ශක | ඔරොත්තුදීම හා සූදානම | BCP/DR සැලසුම් සමඟ වලංගු කළ තීරණාත්මක අඩවි | % | 100 | 100 | ස්ථාවර |
| | සයිබර් ආරක්ෂාව සහ සූදානම | SLA තුළ පරිමරණය කළ තීරණාත්මක පද්ධති ප්‍රතිශතය | % | 100 | 100 | ස්ථාවර |
| පසුගාමී දර්ශක | පද්ධති විශ්වාසය හා කාර්යසාධනය | ප්‍රධාන බැංකුකරණ පද්ධති කාලය (up-time) | % | 99.98 | 99.97 | ස්ථාවර |
| | සයිබර් ඔරොත්තුදීම හා ආරක්ෂාව | සැලකියයුතු සයිබර් ආර-ක්ෂක සිදුවීම් | ගණන | Zero | Zero | ස්ථාවර |
| | දත්ත යොදා ගැනීම සහ බලපෑම | සක්‍රිය ඩිජිටල් බැංකුකරණ පරිශීලකයින් | ගණන | 801,437 | 618,314 | වැඩිකළ |

වගුව 18

### වෙනත් ප්‍රාග්ධන සමඟ විභව සමතුලිතා හා සහක්‍රියා

- **මූල්‍ය ප්‍රාග්ධනය සමඟ විභව සමතුලිතතා:** ඉහළ දිගුකාලීන කාර්යක්ෂමතාව සහ තරඟකාරිත්වය ආරක්ෂා කර ගැනීමට තාක්ෂණික යටිතලපහසුකම් සයිබර් ආරක්ෂාව සහ ඩිජිටල් හැකියාවන් තුළ ආයෝජනය කිරීමට අපි ඉහළ කෙටිකාලීන පිරිවැය පිළිගනිමු
- **මානව ප්‍රාග්ධනය සමඟ සහක්‍රියා:** බුද්ධිමය ප්‍රාග්ධනය තුළ ආයෝජනය යහපත් මෙවලම් සහ දත්ත සමඟ අපගේ සේවකයින් සවිබල ගන්වන අතර ඔවුන්ගේ පළපරුද්ද සහ ප්‍රතිපෝෂණ අඛණ්ඩව හැකියාව සහ නව්‍යකරණවල ශක්තිමත් චක්‍රයක් නිර්මාණය කරමින් අපගේ පද්ධති වර්ධනය කරයි.
- **ගනුදෙනුකාර ප්‍රාග්ධනය සමඟ සහක්‍රියා:** වැඩිකළ ඩිජිටල් වේදිකා සහ දත්ත විශ්ලේෂණ සම්බන්ධතා තියුණු කරමින් හා විශ්වාසය ගොඩ නගමින් වඩාත් පුද්ගලාරොපිත, ප්‍රතිචාරාත්මක ගනුදෙනුකාර අත්දැකීම ශක්තිමත් කරමු.
- **නිෂ්පාදින ප්‍රාග්ධනය සමඟ සහක්‍රියා:** නවීන තාක්ෂණික යටිතල පහසුකම් පරීක්ෂාකාරී ඒකාබද්ධ කිරීම සහ ආයෝජන පෙළගැසීම අවශ්‍ය කරන ශක්තිමත් භෞතික වත්කම් (සර්වර්, ජාල, උපාංග) මත විශ්වාසය තබයි.

### ඉදිරි දැක්ම: 2026 සහ ඉන් ඔබ්බට ප්‍රමුඛතා

- **ඩිජිටල් පරිනාමනය වේගවත් කිරීම:** වෙනස්වන ගනුදෙනුකාර අපේක්ෂාවන් සපුරාලීමට මධ්‍ය බැංකුකරණ පද්ධති අඛණ්ඩව නවීකරණය හා ඩිජිටල් සේවා හැකියාවන් පුළුල් කිරීම.
- **දත්ත පාලනය ශක්තිමත් කිරීම:** ගනුදෙනුකාර විශ්වාසය පවත්වා ගනිමින් ගැඹුරු දැනුම විවෘත කිරීමට වැඩිකළ දත්තවල තත්ත්ව රාමුව, රහස්‍යතා පාලනයන් සහ විශ්ලේෂණ හැකියාවන් ක්‍රියාත්මක කිරීම.
- **උසස් සයිබර් ආරක්ෂාව ස්ථාපනය:** මතුවන අවදානම්වලින් ආරක්ෂා වීමට තර්ජන සොයා ගැනීම, ප්‍රතිචාර හැකියාවන්, සහ සේවක දැනුම තුළ සකීයව ආයෝජනය.
- **කෘතීම බුද්ධිය ඇතුළත් කිරීම:** ගනුදෙනුකාර සේවය, අවදානම් කළමනාකරණය, සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සඳහා කෘතීම බුද්ධි යෙදුම් ගවේෂණය.
- **ආයතනික දැනුම සම්පාදවනය:** තීරණාත්මක අත්දැකීම සුරක්ෂිත කිරීමට හා බාධාරහිත අනුප්‍රාප්තියට සහයවීම සඳහා ලේඛනගතකරණ හා දැනුම මාරුකිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම.
- **ඩිජිටල් සාක්ෂරතාව වැඩි කිරීම:** සියලුම සේවකයින්ට සිය කාර්යභාරයන්හී ඩිජිටල් මෙවලම් හා දත්ත විශ්වාසයෙන් භාවිතා කිරීම සහතික කිරීමට පුහුණු වැඩසටහන් ප්‍රමාණනය කිරීම.

### අනාගත වර්ධනය සඳහා බුද්ධිමය ප්‍රාග්ධනයේ ප්‍රමාණාත්මතාව

වේගවත් තාක්ෂණික වෙනස පිළිබඳ ද්විත්ව විධානයන්ට මුහණ දෙමින් හා සයිබර් තර්ජන උත්සන්න කරමින්, ප්‍රධාන පද්ධති නවීකරණය, දත්ත පාලනය, සහ ඩිජිටල් නව්‍යකරණය තුළ අපගේ තිරසාර ආයෝජනය ශක්තිමත් බුද්ධිමය වත්කම් පදනමක් පෝෂණය කර ඇත. අපගේ ආරක්ෂිත වේදිකා, විශ්ලේෂණමය හැකියාවන්, සහ වර්ධනීය පින්ටෙක් හවුල්කාරත්වයන් 2026-2028 උපායමාර්ග ලබාදීමට ආරක්ෂිතව කෘතිම බුද්ධිය, දත්ත සහ නව තාක්ෂණයන් ශක්තිමත් කිරීමට අපව ස්ථානගත කර ඇත.

සෑම පද්ධතියක්ම ඔරොත්තු දෙන, සෑම බුද්ධියක්ම ක්‍රියාවට නැංවිය හැකි, සහ සෑම ඩිජිටල් විසඳුමක්ම ජාතික ආර්ථික සහභාගිත්වය සහතික කරන ආරක්ෂිත මූල්‍ය නව්‍යකරණය තුළ නායකයෙක් වීමට අපි කැපවී සිටිමු.

# සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය



## විශ්වාසය ගොඩ නැගීම, වටිනාකම ගොඩ නැගීම

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේදී, සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය යන්නෙන් ගනුදෙනුකරුවන්, ප්‍රජාවන්, නියාමකයින්, සැපයුම්කරුවන්, හවුල්කරුවන් සහ ක්ෂේත්‍රයේ ආයතන සමඟ අපගේ සම්බන්ධතාවයේ ශක්තිය පිළිබිඹු කරයි. මෙය සදාචාර චර්යාව, සේවා විශ්වාසය, විනිවිදභාවය සහ වගකීම්සහගත බලපෑම මගින් ගොඩ නගා ඇත.

මෙම සම්බන්ධතාවය ප්‍රජාව අතර විශ්වාසය ගොඩ නැගීමට සහය වී ඇති අතර ජාතික ඉතුරුම් සේවයේ යොදවන තැන්පත් හිමියන්ගේ විශ්වාසය ආරක්ෂා කරන සහ ස්ථිරව සහ ප්‍රමාණයෙන් ශ්‍රී ලංකාව පුරා ඇතුළත් බැංකුකරණය ලබාදෙන උත්ප්‍රේරකයකි.

2025 දී, අපගේ සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධන ප්‍රමුඛතාවලින් ගනුදෙනුකාර විශ්වාසය සහ ඇතුළත්වීම විශ්වාසී සේවය හා ඩිජිටල් ප්‍රවේශය තුළින් තවදුරටත් ශක්තිමත් කිරීම, නියාමන සහභාගිත්වය සහ අනුකූලතා විනය තියුණු කිරීම, විශේෂයෙන් දිට්වා සුලි කුණාටු අවස්ථාවේදී ප්‍රජාවන්ට හා ජාතික ඔරොත්තුදීමට සහයවීම අපගේ තැපැල් හා ගෙවීම් පරිසර පද්ධති තුළින් හවුල්කාරත්වය පදනම් ලඟාවීම සහ නව්‍යකරණය වේගවත් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. මෙම ප්‍රමුඛතා “සෑම ගමනක්ම සවිබලගැන්වීම” යන අපගේ තේමාව අබණ්ඩව සවිබල ගන්වන අතර, අනුරූපතාව, විනිවිදභාවය, ප්‍රතිචාරාත්මකබව සහ ජාතික වටිනාකම් නිර්මාණය තුළින් සම්බන්ධතා දරා ගන්නා බව සහතික කිරීම සිදු කර ඇත.

**බැංකුවේ සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනයේ විෂයපථය**

මෙම ප්‍රාග්ධනය එකිනෙකට සම්බන්ධ පද්ධති හතරක් තුළින් ලබා දේ.

1. **ගනුදෙනුකාර ප්‍රාග්ධනය** – විශ්වාසය, ඇතුළත්වීම, සේවා අත්දැකීම, ආරක්ෂාව සහ පක්ෂපාතිත්වය
2. **ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය** – සැපයුම්කරුවන්, සේවා සපයන්නන්, උපායමාර්ගික සංධාන, සහ ක්ෂේත්‍රයේ ජාල
3. **නියාමන ප්‍රාග්ධනය** – අනුකූලතාවය, විශ්වාසය, සහ සක්‍රීය සේවා අධීක්ෂණ සහභාගිත්වය
4. **ප්‍රජා ප්‍රාග්ධනය** – සමාජ ආර්ථික බලපෑම, ඇතුළත් ප්‍රතිඵල සහ සමාජීය බලපත්‍රය

### උපායමාර්ගික කුළුණු සහ වටිනාකම් නිර්මාණත්වයට අදාළත්වය

**1 ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව සහ මූල්‍ය අන්තර්කරණය:**

විශ්වාසය මත පදනම් වූ සේවා ප්‍රමිතීන්, සාධාරණ ප්‍රතිඵල සහ ප්‍රවේශය පුළුල් කරන අතරම ගනුදෙනුකරුවන් ආරක්ෂිතව තබා ගන්නා පිවිසිය හැකි සේවා ගමන් මඟ.

**2 තිරසාර වෙනස්වීය වර්ධනය සහ කළඹ ප්‍රසන්නකරණය:**

වගකීම් සහගත නිෂ්පාදන සැලසුම සහ විනිවිද මිලකරණය/නියමයන් මගින් සහාය වන සම්බන්ධතාව පදනම් නායකත්වය සහ විචක්ෂණශීලී වර්ධනය

**3 සේවක, සංස්කෘතික සහ සහභාගිත්ව විශිෂ්ටත්වය:**

කීර්තිනාමය සහ ගනුදෙනුකාර විශ්වාසය ආරක්ෂා කරන බලගැන්වූ ඉදිරිපෙළ හැකියාව සහ ස්ථාවර සේවා සංස්කෘතිය

**4 අවදානම් සංස්කෘතිය, පාලනය සහ අනුකූලතා විනය:**

මෙහෙයවීමේ බලපත්‍රය ආරක්ෂා කරන ශක්තිමත් හැසිරීම, පැමිණිලි පාලනය, AML/ CFT සූදානම සහ පාර්ශ්වකරුවන්ගේ විනිවිදභාවය.

**5 ඩිජිටල් වේගවත් කිරීම සහ දත්ත පදනම් බැංකුකරණය:**

ඩිජිටල් සේවාවන් කෙරෙහි විශ්වාසය ශක්තිමත් කරන ආරක්ෂිත ඩිජිටල් භාවිතය, දත්ත රහස්‍යතා විනය සහ විශ්වාසදායක මාර්ග.

**6 තිරසාරතාවය, දේශගුණය සහ ප්‍රජා ඔරොත්තුදීම:**

ප්‍රජා ඔරොත්තු දීමේ ප්‍රතිඵල, සහන සහාය සහ සමාජ බලපත්‍රය සහ දිගුකාලීන විශ්වාසය ශක්තිමත් කරන දේශගුණයට පෙළගැසුණු බැංකුකරණය.

### ප්‍රධාන අවදානම් සහ අභියෝග

- **විශ්වාසය සහ කීර්ති නාමය බාදනය වීම:** සේවා අසාර්ථකත්වයන්, දත්ත කඩකිරීම් හෝ සදාචාරාත්මක අඩුපාඩු හේතුවෙන් විශ්වාසය අහිමිවීම
- **ගනුදෙනුකාර හානිය සහ සහභාගි නොවීම:** දුර්වල නිෂ්පාදන යෝග්‍යතාවය හෝ දුර්වල සහාය හේතුවෙන් මූල්‍යමය අලාභය හෝ පක්ෂපාතිත්වය අඩුවීම.
- **ක්‍රමානුකූල සහ නියාමන අවදානම:** නෙවන පාර්ශවීය වෙළෙන්දන් මත යැපීම සහ අනුකූලතාවය හෝ අඛණ්ඩතාව අසාර්ථක වීමේ අවදානම

### අපගේ උපායමාර්ගික ප්‍රතිචාරය හා අවම කිරීම

- **සැලසුම අනුව විශ්වාසය:** සෑම ගනුදෙනුකාර මැදිහත්වීමකටම සදාචාරාත්මක හැසිරීම සහ අවසානය දක්වා ආරක්ෂාව ඇතුළත් කිරීම.
- **සාධාරණ ප්‍රතිඵල:** සබඳතා-පදනම් වර්ධනය පෝෂණය කිරීම සඳහා නිෂ්පාදන පාලනය සහ මූල්‍ය සාක්ෂරතාවයට ප්‍රමුඛත්වය දීම.
- **ඔරොත්තු දෙන පරිසර පද්ධතිය:** ස්ථාවරත්වය සහතික කිරීම සඳහා වෙළෙඳ අධීක්ෂණය සහ සක්‍රීය නියාමන සහභාගිත්වය ශක්තිමත් කිරීම.

# සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

## සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධන වටිනාකම් දාමය හා තිරසාර අඛණ්ඩතාව

මූලික විශ්වාසය සහ සහයෝගී හවුල්කාරිත්වයන් ගොඩනැගීමේ සිට මැනිය හැකි සම්බන්ධතා වටිනාකම සහ සෑම අදියරකදීම ආයතනික ඔරොත්තු දීමේ අඛණ්ඩතාව, මූලික තිරසාරභාවය සහ දේශගුණික ප්‍රතිෂ්ඨාවන් දක්වා අවසානය දක්වා වටිනාකම් දාම කාවයක් හරහා අපි සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය දෙස බලමු. මෙයට ඇතුළත් කිරීමේ ප්‍රතිඵල, ශක්තිමත් ගනුදෙනුකාර ආරක්ෂාව, ප්‍රජා ඔරොත්තු දීම, දේශගුණයට අදාළ බාධා සඳහා සූදානමට ප්‍රමුඛතාවය දීම, සහ අපගේ හවුල්කාර පරිසර පද්ධතිය පුරා වගකිවයුතු හැසිරීම ඇතුළත් වේ.

**යෙදවුම්**

බැංකුව ආයෝජනය කර උපයෝගී කර ගන්නා විශ්වාසය, කීර්තිනාමය, හවුල්කාරිත්වයන් සහ විධිමත් ගිවිසුම් යන පදනම් වත්කම්

**භාරකාරත්ව කටයුතු**

එම සම්බන්ධතා වත්කම් පෝෂණය කිරීම, පාලනය කිරීම සහ ශක්තිමත් කිරීම දෛනිකව ගනු ලබන සක්‍රීය ක්‍රියාමාර්ග

**නිමැවුම්**

බැංකු සම්බන්ධතාවල යහපත හා ශක්තිය පෙන්නුම් කරන ආසන්න, මැනියහැකි ප්‍රතිඵල හා දර්ශක

**ගනුදෙනුකාර සහ පාලන ප්‍රතිඵල**

ශක්තිමත් සම්බන්ධතාවලින් ඇති වන ගනුදෙනුකරුවන් විසින් මුහුණපාන ස්පෘශ්‍ය ප්‍රතිලාභ සහ බැංකුවේ මෙහෙයුම් ඔරොත්තුදීම

**දිගුකාලීන බලපෑම්**

තිරසාර සම්බන්ධතා ශක්තිය තුළින් බැංකුවට සහ ජාතියට සුරක්ෂිත කර ඇති කල් පවතින උපායමාර්ගික වටිනාකම සහ තරඟකාරී වාසි

### ප්‍රමාණාත්මක කරුණු

**1.1**
ගනුදෙනුකාර කේන්ද්‍රීය හා ඇතුළත් දැරියහැකි බැංකුකරණය

**1.2**
ඩිජිටල් හා මූල්‍ය සාක්ෂරතාව

**2.2**
වත්කම්වල තත්ත්වය, ප්‍රාග්ධන හා ද්‍රවශීලතා කළමනාකරණය

**2.3**
මූල්‍ය තිරසාරතාවය හා ඉපයීම් ඔරොත්තුදීම

**4.1**
පාලන විශිෂ්ටත්වය, අනුකූලතාවය සහ සදාචාර චර්යාව

**4.2**
මූල්‍ය අපරාධය, වංචාව හා AML/CFT

**4.3**
විශ්වාසය, කීර්තිනාමය, සහ සක්‍රීය පාර්ශවකාර සහභාගිත්වය

**5.1**
ඩිජිටල් පරිනාමනය හා වගකීම් සහගත කෘතිම බුද්ධි/විශ්ලේෂණ

**5.2**
සයිබර් ආරක්ෂාව, දත්ත රහස්‍යතාව සහ මෙහෙයුම් ඔරොත්තුදීම

**5.3**
තෙවැනි පාර්ශව/ බාහිරකරණය හා විකුණුම්කාර ඔරොත්තුදීම

## SGDs ට අපගේ දායකත්වයි

**1 NO POVERTY** — ඉලක්කය 1.4

රට පුරා අවසාන සැතපුම් කණුව දක්වා තැපැල් ජාල ප්‍රවේශය හරහා සහ මූල්‍ය සාක්ෂරතා කඳවුරු හරහා ප්‍රජාවන් තුළ අපව කාවැද්දීමෙන් දැඩි අන්තර් පුද්ගල විශ්වාසයක් ගොඩනැගීම

**8 DECENT WORK AND ECONOMIC GROWTH** — ඉලක්කය 8.10

ESG - සම්බන්ධිත කාර්යසාධන දිරිගැන්වීම් හරහා සේවකයින් සන්නාම නානාපතිවරුන් බවට පත් කරන අතරම, ඉතුරුම් පිළිබඳ දැනුවත්භාවය තුළින් ගනුදෙනුකාර පක්ෂපාතිත්වය පෝෂණය කිරීමෙන් පාර්ශ්වකරුවන්ගේ බැඳීම් ශක්තිමත් කිරීම

**9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE** — ඉලක්කය 9.3

දුරස්ථ ජනගහනය සඳහා ජංගම බැංකු වෑන් රථ, තැපැල් ඩිජිටල් ඒකාබද්ධ කිරීම සහ ස්වභාෂා අතුරුමුහුණත් හරහා විධිමත් බැංකු පරතරය පියවීමෙන් සංයෝජන සම්බන්ධතාවය වැඩි කිරීම.

**10 REDUCED INEQUALITIES** — ඉලක්කය 10.2

විශේෂ ජ්‍යෙෂ්ඨ පුරවැසි සබඳතා, ශක්තිමත් හවුල්කාරිත්වයන් සහ කාන්තාවන්, ශිල්පීන් සහ ආන්තික කණ්ඩායම් සඳහා ගලපන ලද නිෂ්පාදන තුළින් මානව ගරුත්වය අගය කිරීමෙන් ඇතුළත් වූ කීර්තිනාමයක් උපයා ගැනීම

**17 PARTNERSHIPS FOR THE GOALS** — ඉලක්කය 17.3

දිගුකාලීන සංවර්ධනය සඳහා යටිතල පහසුකම් බැඳුම්කර, රජයේ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සහ නියාමක හවුල්කාරිත්වයන් සඳහා තැපැල් ජාල හරහා මහජන ඉතිරිකිරීම් බලමුලු ගැන්වීමෙන් ජාතික භාරකාරත්වය පෙන්නුම් කිරීම

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

## ගනුදෙනුකාර ප්‍රාග්ධනය

### අපගේ නිෂ්පාදන ප්‍රාග්ධන ගමන්මඟ: භාරකාරත්වයේ සිට මැනියහැකි වටිනාකම දක්වා

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේදී, අපගේ ගනුදෙනුකාර ප්‍රාග්ධනය යනු ස්ථාවර, සාධාරණ සහ ඇතුළත් සේවාව තුළින් ගොඩනගා ඇති අපගේ ආරක්ෂාව සහ පක්ෂපාතිත්වය තුළ විශ්වාසී තැන්පත්කරුවන් තබා ඇති ක්‍රියාව පිළිබඳ විශ්වාසයේ සෘජු ප්‍රතිමූර්තියයි. අපි සෑම ගනුදෙනුකාර අන්තර්ක්‍රියාවක්ම උපායමාර්ගික ආයෝජනයක් ලෙස කළමනාකරණය කරන අතර එහිදී විශ්වාසදායක ක්‍රියාත්මක කිරීම, විනිවිද ආරක්ෂාව සහ සංවේදනීය සහයෝගය කල් පවතින සබඳතා, ස්ථාවර අරමුදල් සැපයීම සහ තිරසාර වර්ධනයක් බවට පරිවර්තනය කරමු. 2025 දී, ඩිජිටල් ආරක්ෂාව, රහස්‍යතාව සහ ප්‍රතිචාරාත්මක බව සඳහා ඉහළ යන අපේක්ෂාවන් මගින් ගනුදෙනුකාර ප්‍රාග්ධනය හැඩගස්වන ලද අතර, බිඳවැටීම් අතරතුර රට පුරා ප්‍රවේශය සහ විශ්වසනීයත්වය  බැංකුව විසින් ආරක්ෂා කිරීමට ගනුදෙනුකරුවන්ට අවශ්‍ය විය.

**1 අපගේ ප්‍රාග්ධන පදනම්**

සැලැස්ම මගින් විශ්වාසය, සාධාරණ ප්‍රතිඵල, ඇතුළත්වීම සහ විශ්වාසනීයත්වය සඳහා අපගේ අසමසම පාලන තැන්පතු වගකීම, සදාචාර චර්යා රාමු සහ භාරකාරත්ව බැඳීම් පදනම් කර ඇති පාලනය

**2 අපි හැකියාව ශක්තිමත් කරන ආකාරය**

බාධා රහිත සේවය, වැඩිකළ වංචා පාලනය, සහ ගනුදෙනුකාර දැනුවත්භාවය, උසස් පැමිණිලි විශ්ලේෂණ හා මූලික හේතු නිවැරදි කිරීම, ඇතුළත් සැලස්ම සහ මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් සඳහා ඩිජිටල් වේදිකා ස්ථායිකරණය

**3 අපි ප්‍රතිඵල ශක්තිමත් කරන ආකාරය**

- වඩා යහපත් ප්‍රවේශය හා යොදා ගැනීම
- සාධාරණ ප්‍රතිඵල හා විශ්වාසය සවිබලගැන්වීම
- බිඳවැටීම තුළ ඔරොත්තුදීම සහ විස්වාශය
- සම්බන්ධතා පදනම් වර්ධනය

**4 මෙයින් ලබාදෙන දෑ**

ශ්‍රී ලංකාවේ ආරක්ෂිතම බැංකුව ලෙස අපගේ කීර්තිනාමය සවිබල ගන්වන ශක්තිමත් ගනුදෙනුකාර ආරක්ෂක මිණුම්, වර්ධිත සේවා ප්‍රතිචාරාත්මකභාවය, වඩා ඉහළ පැමිණිලි විසඳීමේ චිනය, සහ තියුණු පක්ෂපාතිත්වය

තැන්පතුහිමියන්ට හා ණය දෙන්නන්ට බෙදාහැරි ආර්ථික වටිනාකම

**රු. බි. 113**

2024 - රු. බි. 131

සක්‍රීය ගනුදෙනුකරුවන්ගේ ගිණුම්

**මිලියන 10.52**

2024 - මිලියන 10.42

### 1 අපගේ ප්‍රාග්ධන වත්කම්

බැංකුවේ ගනුදෙනුකාර සම්බන්ධතා විශ්වාසය මත පදනම් වී ඇත. තැන්පතු සහ එහි උපචිත පොලී පිළිබඳ පැහැදිලි රජයේ ඇපයක් සහිත ශ්‍රී ලංකාවේ එකම බැංකුව ලෙස, අපගේ ගනුදෙනුකාර පොරොන්දුව පැහැදිලි ප්‍රමිති, විනයගරුක පාලනය හා විනිවිද සන්නිවේදනය තුළින් සහයවන ස්ථාවරත්වය හා සේවා විශ්වාසය මත ගොඩ නගනු ලබයි.

#### 1.1 පාලනය හා අධීක්ෂණය

ගනුදෙනුකාර විශ්වාසය අපගේ වඩාත් තීරණාත්මක වත්කම බව හඳුනා ගනිමින් ඉහළම මට්ටමේ ආයතනික විනය සමඟ ගනුදෙනුකාර ප්‍රාග්ධනයේ භාරකාරත්වය පාලනය කෙරේ. අධීක්ෂණය අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ආරම්භ වන අතර, එය උපායමාර්ගික ස්වරය සකස් කර ගනුදෙනුකාර ආරක්ෂාව සහ සාධාරණ ප්‍රතිඵල අපගේ මූලික මෙහෙයුම්වලට ඇතුළත් කරන ප්‍රතිපත්ති අනුමත කරයි.

- **අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන ගනුදෙනුකාර අත්දැකීම් අධීක්ෂණය:** උපායමාර්ගික මැදිහත්වීම් සඳහා පද්ධතිමය ගැටළු ඉහළ නැංවීමට උත්සන්න කිරීමේ චර්යාවන් සමඟ, අධ්‍යක්ෂ මණ්ඩලය සහ එහි කමිටු ගනුදෙනුකාර සේවා කාර්යසාධනය සහ අත්දැකීම් මිනුම් නිතිපතා සමාලෝචනය කරයි.
- **අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද නිෂ්පාදන පාලනය:** දැඩි යෝග්‍යතාවය, දැරිය හැකි මිල සහ විනිවිද ප්‍රමිතීන් සහතික කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරන ලද රාමුව සැලසුම් සහ අවදානම් තක්සේරුවේ සිට අනුමැතිය සහ පශ්චාත් දියත් කිරීමේ නියාමනය දක්වා අවසානයට නිෂ්පාදන ජීවන චක්‍රය පාලනය කරයි.
- **විධායකය-කළමනාකරණය කරන ලද පැමිණිලි විසඳුම:** අසමසම හඬායාමේ සහ හැරවුම් ඉලක්ක සහිත මධ්‍යගත පැමිණිලි පද්ධතියක් ආයතනික කළමනාකරණය විසින් අධීක්ෂණය කරනු ලබන අතර, එය මූලික හේතු විශ්ලේෂණයන් සමාලෝචනය කරන අතර වැදගත් ප්‍රවණතා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ලබා දේ
- **අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහෙයවන ලද චර්යා රාමුව:** සියලුම සේවක ක්‍රියාවන් ආරක්ෂාව, අඛණ්ඩතාව සහ විනිවිදභාවය සඳහා  පෙළ ගස්වමින්, ගනුදෙනුකරුවන්-මුහුණ දෙන හැසිරීම් ප්‍රමිතීන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද චර්යා සංග්‍රහයට ඇතුළත් කර ඇත.

මෙම ව්‍යූහගත,ඉහළ සිට පහළට පාලනය මගින් ගනුදෙනුකාර ප්‍රාග්ධනය සඳහා වගවීම, පැහැදිලි, මැනියහැකි, සහ බැංකුවේ උපායමාර්ගික ක්‍රියාත්මක කිරීමට අත්‍යවශ්‍ය බව සහතික කර ශ්‍රී ලංකාවේ ආරක්ෂිත බැංකුව ලෙස අපගේ පොරොන්දුව සෘජුවම නගා සිටුවයි.

එක්සත් ජාතීන්ගේ ව්‍යාපාර සහ මානව හිමිකම් පිළිබඳ මාර්ගෝපදේශක මූලධර්ම සහ ජාත්‍යන්තර කම්කරු සංගමයේ මූලික මූලධර්ම සහ රැකියා ස්ථානයේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනය ඇතුළු බලයලත් අන්තර් රාජ්‍ය නෛතික ලියවිලි වෙත යොමු වෙමින් මෙම පාලන යාන්ත්‍රණ මගින් වගකිවයුතු ව්‍යාපාරික හැසිරීම සඳහා වන ප්‍රතිපත්තිමය කැපවීම් තහවුරු කරයි. එහිදී පුළුල් නිසි සම්ප්‍රජන්‍ය ක්‍රියාවලීන් අවශ්‍ය වීම, අවදානම් කළමනාකරණ තීරණවල පූර්වාරක්ෂාව පිළිබඳ මූලධර්මය ඇතුළත් කිරීම සහ සියලුම මෙහෙයුම් හරහා ජාත්‍යන්තරව පිළිගත් මානව හිමිකම් සඳහා ගරු කිරීම අනිවාර්ය කරයි.


සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

## 1.2 විශේෂ ගනුදෙනුකාර වටිනාකම කොටස



**අපගේ ගනුදෙනුකාර වටිනාකම කොටස**

බැංකුවේ දී, අපගේ වටිනාකම් කොටස ශ්‍රී ලංකාවේ ආරක්ෂිතම සහ වඩාත් විශ්වාසී බැංකු හවුල්කරුවීම මත ගොඩ නැගේ. අපි නොසැලෙන ආරක්ෂාව සහ විශ්වාසය සඳහා බැඳීමක් එකතු කරන අතර එය වර්තමාන අවශ්‍යතා සපුරාලන පහසු, පිවිසියහැකි, ඩිජිටල් අත්දැකීම් සහිත අපගේ විශ්වීය උරුමය මත පදනම් වේ. පුද්ගලාරෝපිත මඟපෙන්වීම, මූල්‍ය අධ්‍යාපනය, සහ අපගේ ගනුදෙනුකාර වටිනාකම් සහ අපේක්ෂාවන් සමඟ පෙළ ගැසෙන ඉදිරිය දකින හරිත මූල්‍ය විකල්ප තුළින් යහපැවැත්ම සහ තිරසාර වර්ධනය ප්‍රවර්ධනය කිරීමට අපි කැප වී සිටිමු. අප වෙනුවෙන්, සත්‍ය වටිනාකම මනිනු ලබන්නේ ප්‍රතිඵල සඳහාම පමණක් නොව, අපගේ ගනුදෙනුකරුවන්, අපගේ ප්‍රජාව සහ අපගේ ජාතියට වගකීම සඳහාය.




GRI 205-3

### ගනුදෙනුකාර පැමිණිලි විසඳීමේ රාමුව

සේවා ප්‍රමිති, අයිතිවාසිකම්, සහ වගකීම් සම්බන්ධයෙන් ගනුදෙනුකාර ප්‍රඥප්තිය අපගේ ගනුදෙනුකරුවන්ට බැංකුවේ බැඳීම පිළිබඳ විධිමත්, පොදු ප්‍රකාශනයක් ලෙස සේවය කරයි. නියාමන අනුකූලතාව සහ සදාචාර චර්යාව හා පෙළ ගැසුණු අපගේ මෙහෙයුම් මූලධර්ම ව්‍යවහාරවලට පත්කරන බව සහතික කරන වගවීමට යටත් රාමුවක් ලෙස කටයුතු කරයි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශ සහ නියෝග මත සෘජුවම ගොඩනගා ඇති මෙම ප්‍රඥප්තිය, හුදෙක් අභ්‍යන්තර අලෙවිකරණ මෙවලමක් නොව, ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව සඳහා වන මූලික ලේඛනයකි. සියලු පොලී අනුපාත, ගාස්තු ව්‍යුහයන් සහ සේවා ගාස්තු පිළිබඳ පැහැදිලි, පූර්ව සහ ප්‍රවේශ විය හැකි සන්නිවේදනයක් එය අනිවාර්ය කරන අතර සැඟවුණු පිරිවැය ඉවත් කරයි. තවද, එය ශාඛා කළමනාකරුවෙක්, විශේෂ ක්ෂණික ඇමතුම් අංකයක් හෝ පැමිණිලි විසඳීම සඳහා පැහැදිලි මාර්ගයක් සපයන නිශ්චිත විද්‍යුත් තැපෑලක් සම්බන්ධ කර ගැනීම වැනි නිශ්චිත මැසිවිලි මාර්ග පිළිබඳව ගනුදෙනුකරුවන්ට පැහැදිලිව දැනුම් දෙනු ලබයි.

මෙම ප්‍රඥප්තියේ උපායමාර්ගික වටිනාකම අධික වන අතර, එය ආයතනික විශ්වාසය ගොඩ නැගීම සඳහා තීරණාත්මක මෙවලමකි. නොපැහැදිළි, පොරොන්දුවල සිට විශේෂිත, වගකියන, බැඳීම්වලට මාරු වීම මගින්, නොසැලෙන නියාමන අනුකූලතාව පෙන්නුම් කරන අතර විශ්වාසය මෙහෙයුම් යථාර්ථයක් බවට පත් කරමින් ගනුදෙනුකාර යුතුකම අපගේ මෙහෙයුම්වල පෙරමුණේ ස්ථානගත කරයි.

**වාර්තාකරණ වසර තුළ, දූෂණය සම්බන්ධව කිසිදු ප්‍රසිද්ධ නෛතික ක්‍රියාවක් ආයතනයට හෝ එහි සේවකයින්ට විරුද්ධව ගෙන නොමැති අතර එහි ප්‍රතිඵලයක් ලෙස මෙම වාර්තාවට කිසිදු ප්‍රතිඵලයක් නොමැත.**[LA]

## 1.3 ජාතික මට්ටමේ සේවා පැවැත්ම

### පොදු මාර්ග ප්‍රවේශය

මෙම කුළුණ අපගේ ගනුදෙනුකරුවන්ගේ සහභාගිත්වයේ මූලික ශිල්පය වන අතර එය ඩිජිටල් හෝ පුද්ගලයින් සම්බන්ධ වුවද, සෑම මැදිහත්වීමක්ම ඒකාබද්ධ, ස්ථීර සහ ආයාශයකින් තොරව පහසු බව සහතික කරයි. අපි ඒකීය පරිසර පද්ධතියක් ලබා දෙන අතර, ඒ තුළ, සිය දෛනික ජීවිතයේ බලපාන කොටසක් ලෙස බැංකුව පත්කරමින් සේවා තත්ත්වය හෝ අඛණ්ඩතාව අමාරුවේ නොහෙලමින් ගනුදෙනුකරුවන්ට සිය මනාප මාර්ගය තෝරා ගත හැකිය.

**ශාඛා 263:** සංකීර්ණ ගනුදෙනු සඳහා, පුද්ගලාරෝපිත උපදේශන සේවා සඳහා භෞතික කේන්ද්‍රය වන අතර මානව කේන්ද්‍රීය විශ්වාසය ගොඩ නගයි.

**ස්වයං සේවා (ATMs -295 / CRMs -123):** 24/7 සුපුරුදු ගනුදෙනු (මුදල් ආපසු ගැනීම්, තැන්පත් සහ මාරුකිරීම්)ල පහසුව ලබාදීම ඇති කර ශාඛා තදබදය අඩු කරයි.


**ජංගම/අන්තර්ජාල බැංකුකරණ:** ඕනෑම අවස්ථාවක ඕනෑම ස්ථානයකදි පිවිසිය හැකි ගෙවීම්, අරමුදල් කළමනාකරණය, යෙදුම්, මූල්‍ය පරීක්ෂාව, ඇතුළුව සම්පූර්ණ සේවා බැංකුකරණය සඳහා මූලික ඩිජිටල් වේදිකා.

**ඇමතුම් මධ්‍යස්ථානය හා ඩිජිටල් විමසීම්:** ගැටළු විසඳීම, මඟපෙන්වීම, සහ දුරකථනය, විද්‍යුත් ලිපිනය හෝ වෙබ්වැට් හරහා ප්‍රමිතිගත නොවූ ඉල්ලීම් සඳහා තත්‍ය කාලීන මානව සහය ලබා දේ.

නිෂ්පාදිත ප්‍රාග්ධනය පිළිබඳ වැඩි විස්තර 109 සිට 116 දක්වා පිටුවල දැක්වේ

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

## ගනුදෙනුකාර තෘප්තිය පිළිබඳ සංඛ්‍යා ලේඛණ




රූපය 14

### ප්‍රවේශ්‍යතා විශේෂාංග සහ ප්‍රමුඛතා සහාය යාන්ත්‍රණ

සැබෑ සේවා විශිෂ්ටත්වය සඳහා විචක්ෂණ ඇතුළත් කිරීම අවශ්‍ය වේ. අපගේ ගනුදෙනුකාර ප්‍රාග්ධන රාමුව තුළ, අපගේ ප්‍රවේශ්‍යතා විශේෂාංග සහ ප්‍රමුඛතා සහාය යාන්ත්‍රණයන් මෙම මූලධර්මය ක්‍රියාත්මකභාවයට පරිවර්තනය කරන මූලික ආයෝජනය වන අතර, සියලුම ගනුදෙනුකරුවන්ට, විශේෂයෙන් ජ්‍යෙෂ්ඨයින්ට සහ විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින්ට සාධාරණ හා ගෞරවනීය ප්‍රවේශයක් සහතික කරයි.

අපගේ ශාඛා ජාලය හරහා භෞතික ප්‍රවේශ්‍යතාව, අපගේ NSB PayApp සහ වෙබ් අඩවියට ඇතුළත් කර ඇති ඩිජිටල් ප්‍රවේශ්‍යතාව, සහායක තාක්ෂණයන් සැපයීම සහ විශේෂයෙන් පුහුණුව ලත් කාර්ය මණ්ඩලය විසින් ලබා දෙන විශේෂ ප්‍රමුඛතා සහාය වැනි ඒකාබද්ධ, ස්පර්ශ පියවර හරහා අපි මෙම කැපවීම ක්‍රියාත්මක කරමු.

### විනිවිද හා වගකිම්සහගත බැංකුකරණය

GRI 206-1 417-1 417-2 417-3

වගකීම සහ විනිවිදභාවය යනු නිෂ්පාදන සැලැස්මේ සිට ගනුදෙනුකාර සහභාගිත්වය දක්වා අපගේ මෙහෙයුම්වල සෑම මුහුණතක්ම ඉස්මතු කරන මූලික මූලධර්ම වෙති. ඉහළම සදාචාර ප්‍රමිතිවලට අපගේ බැඳීම ප්‍රධාන මූලපිරීම්වලින් පෙන්වා දෙන අතර, ඉන් විනිවිදභාවය, වගවීම, සහ ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව සහතික කර, අපගේ ගනුදෙනුකාර ප්‍රාග්ධනයේ හරය තුළ විශ්වාසය සවිබල ගන්වයි.

**අපගේ මූලික මූලපිරීම්වලට පහත දැ ඇතුළත්ය:**

- **ආරක්ෂිත සහ සුදුසු විසඳුම් ලබාදීම:** අපි ගනුදෙනුකාර මූල්‍ය යහපැවැත්ම සමඟ බැඳුණු පිවිසිය හැකි ප්‍රතිලාභී නිෂ්පාදන ක්‍රමානුකූලව සැලසුම් කරමු.
- **පැහැදිලි සහ කාලීන සන්නිවේදනයක් සහතික කිරීම:** දැනුවත් තීරණ ගැනීමට හැකි වන පරිදි, ශාඛා සහ ඩිජිටල් වේදිකා හරහා අනුපාත, ගාස්තු සහ නියමයන් සහ කොන්දේසි ඇතුළුව සියලුම ප්‍රධාන මූල්‍ය තොරතුරු විනිවිද අනාවරණයට අපි ප්‍රමුඛත්වය දෙන්නෙමු.
- **පාරිභෝගික ප්‍රඥප්තිය තහවුරු කිරීම:** මහ බැංකුවේ මාර්ගෝපදේශවලට සම්පූර්ණ අනුකූලතාව තුළ, මූල්‍ය ඔම්බුඩ්ස්මන් වෙත ප්‍රවේශ විම ඇතුළුව සියලුම නිෂ්පාදන නියමයන්, සේවා කොන්දේසි සහ පැමිණිලි විසඳීමේ ක්‍රියා පටිපාටි අපි පැහැදිලිව සන්නිවේදනය කරමු.
- **ප්‍රතිපෝෂණ සක්‍රීයව කළමනාකරණය කිරීම:** විශ්වාසය සහ දිගුකාලීන සම්බන්ධතා පෝෂණය කිරීම සඳහා ව්‍යුහගත මැසිවිලි නිරාකරණ යාන්ත්‍රණ හරහා ගනුදෙනුකාර ගැටළු විසඳනු ලැබේ.
- **තොරතුරු සඳහා මහජන ප්‍රවේශය සහතික කිරීම:** තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් (RTI) පනතට අනුකූලව, බැංකු තොරතුරු වෙත ප්‍රවේශය පහසු කිරීම සඳහා නම් කරන ලද මහජන තොරතුරු නිලධාරියෙකු අප සතු වන අතර ඉන් ක්‍රියාපටිපාටි අර්ථ දක්වයි.
- **සදාචාර අලෙවිකරණය පවත්වා ගැනීම:** සියලුම ප්‍රවර්ධන ද්‍රව්‍ය රෙගුලාසිවලට දැඩි ලෙස අනුකූල වන අතර අපගේ සම්බන්ධතා තොරතුරු, නිල ණය ශ්‍රේණිගත කිරීම සහ 100% රජයේ සහතිකය ඇතුළත් වේ. පැහැදිලි, නිවැරදි සහ වගකිවයුතු නිෂ්පාදන ලේබල් කිරීම සහ අලෙවිකරණ සන්නිවේදනයන් සඳහා අපි කැපවී සිටින අතර, ගනුදෙනුකරුවන්ට දැනුවත් මූල්‍ය තීරණ ගැනීම සඳහා ප්‍රතිලාභ, නියමයන් සහ කොන්දේසි පිළිබඳ සම්පූර්ණ අනාවරණය ඔවුන්ට ලැබෙන බව සහතික කරමු. මහා බැංකුවේ රෙගුලාසිවලට අනුකූලව, අපි සියලුම වේදිකාවල සදාචාර ප්‍රමිති නගා සිටුවන අතර, වැරදි හිමිකම්, සැඟවුණු ගාස්තු, හෝ කුට ව්‍යවහාර වලක්වමින්, සියලුම පිරිනැමීම් විනිවිදව සහ නිවැරදිව නියෝජනය කරන බව සහතික කරමු.

**වාර්තාකරණ වසර තුළ, නිෂ්පාදන ලේබල්කරණය, අලෙවිකරණය, හෝ නියාමන මාර්ගෝපදේශවලට අනුකූල නොවූ අවස්ථා නොමැත.[LA]**

**වාර්තාකරණ වසර තුළ, තරඟ විරෝධී හැසිරීම, විශ්වාස විරෝධී හෝ ඒකාධිකාරී විරෝධී නීතිකරණ කඩකිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක හෝ නිමකළ කිසිදු නෛතික ක්‍රියාවක් බැංකුව වාර්තා කර නොමැත.[LA]**

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

### මූල්‍ය සාක්ෂරතාව සහ ඩිජිටල් ආරක්ෂක අධ්‍යාපනය

ගනුදෙනුකරුවන්ට මූල්‍ය සේවා ආරක්ෂිතව භාවිතා කිරීමට දැනුම සහ විශ්වාසය ඇති විට පමණක් මූල්‍ය ඇතුළත් වීම තිරසාර වේ. මූල්‍ය සාක්ෂරතාවය සහ ඩිජිටල් ආරක්ෂණ අධ්‍යාපනය තුළ ආයෝජනය කිරීමෙන්, දැනුවත් තීරණ ගැනීමට, වංචා වළක්වා ගැනීමට සහ වගකීමෙන් යුතුව ඩිජිටල් මාර්ග භාවිතා කිරීමට ගනුදෙනුකරුවන් සන්නද්ධ කිරීමෙන් බැංකුව ගනුදෙනුකාර ප්‍රාග්ධනය ශක්තිමත් කරයි.

2025 දී, මෙම අවධානය ජංගම හා අන්තර්ජාල බැංකුකරණය ආරක්ෂිතව යොදා ගැනීම සමඟ වූ අතර, ගනුදෙනුකාර විශ්වාසය වැඩිකර වංචා සහ වැරදි තොරතුරුවලට ඇති උවදුර අඩු කර ඇත.

- ඉතුරුම්, අයවැයකරණය, වගකිම්සහගත ණය ගැනීම් සහ ගනුදෙනුකාර අයිතිවාසිකම් පිළිබඳ මූල්‍ය සාක්ෂරතා වැඩසටහන්.
- **ඩිජිටල් ආරක්ෂණ අධ්‍යාපනය:** වංචා පිළිබඳ දැනුවත්භාවය, තතුබෑම් වැළැක්වීම, ආරක්ෂිත මුරපද භාවිතයන් සහ ආරක්ෂිත ගනුදෙනු හැසිරීම.
- **අවදානමට ලක්විය හැකි අංශ සඳහා ඉලක්කගත සහභාගිත්වය:** වැඩිහිටියන්, පළමු වරට ඩිජිටල් භාවිතා කරන්නන්, පාසල් බැංකු/තරුණ අංශ සහ ග්‍රාමීය ප්‍රජාවන්.
- **බහු මාර්ග අධ්‍යාපනයේ භාවිතය:** ශාඛා විසින් මෙහෙයවන සැසි, ප්‍රජා බලපෑම සහ නිල වේදිකා හරහා ඩිජිටල් අන්තර්ගතය.
- **සාක්ෂරතාවය ප්‍රතිඵල සමඟ සම්බන්ධ කිරීම:** වඩා යහපත් යොදා ගැනීම, අඩු වළක්වා ගත හැකි ආරවුල්, වර්ධිත විශ්වාසය සහ ශක්තිමත් දිගුකාලීන ගනුදෙනුකාර සබඳතා.


## 2 අපි හැකියාව ශක්තිමත් කරන ආකාරය

2025 දී. බැංකුව විශ්වාසය, ආරක්ෂාව, සාධාරණ ප්‍රතිඵල සහ ඇතුළත්වීම පිළිබඳ ධාවක කෙරෙහි අවධානය යොමු කරමින් ගනුදෙනුකාර සම්බන්ධතා හැකියාව තවදුරටත් ශක්තිමත් කරන ලදී. මෙම හැකියාව ගොඩ නැගීම වේදිකා ස්ථායිකරණය, ශක්තිමත් ගනුදෙනුකාර ආරක්ෂක පාලනයන්, වඩාත් විනයගරුක පැමිණිලි විශ්ලේෂණ හා සේවා ප්‍රතිසාධනය හා ගනුදෙනුකරුවන්ට හානි කරන අවදානම අඩු කිරීමට සාක්ෂරතා මුලපිරීම් තුළින් හඹා යන ලදී.

### 2.1 විවිධ ගනුදෙනුකාර පදනමක් සඳහා පුද්ගලාරෝපිත සේවා

අපගේ ගනුදෙනුකරුවන්ගේ විවිධාකාර මූල්‍ය අවශ්‍යතා අපි හඳුනා ගන්නා අතර ප්‍රවේශ්‍යතාව වැඩි දියුණු කරන, ව්‍යාපාර වර්ධනය ඇති කරන සහ දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වය ප්‍රවර්ධනය කරන ගලපන ලද බැංකු විසඳුම් ලබා දීමට කැපවී සිටිමු.

අපගේ පාරිභෝගික පදනම තරුණ වැඩිහිටියන්ගේ සිට ජ්‍යෙෂ්ඨයින් දක්වා (0-70+) නියෝජනයක් සමඟ සියලු වයස් කාණ්ඩ දක්වා විහිදෙන අතර, ජීවිතයේ සෑම අදියරකදීම ශ්‍රී ලාංකිකයින්ට සේවය කිරීම සඳහා අපගේ ඇතුළත් ප්‍රවේශය ඉන් පිළිබිඹු කරයි. පුද්ගලයන්ට සහ විශාල සංස්ථා සඳහා ගලපන ලද මූල්‍ය නිෂ්පාදන පිරිනැමීමෙන්, අපි ශක්තිමත්, කල් පවතින ගනුදෙනුකාර සම්බන්ධතා පෝෂණය කරමු. අපගේ පුද්ගලාරෝපිත උපදේශන සේවා, විශේෂඥයින්ගේ සහාය ඇතිව දැනුවත් මූල්‍ය තීරණ ගැනීමට ගනුදෙනුකරුවන්ට තවදුරටත් බලය ලබා දේ.




රූපය 15

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

## 2.2 ගනුදෙනුකාර අත්දැකීම වැඩි කිරීමට ඩිජිටල් පරිනාමනය

මූල්‍ය තාක්ෂණයේ වේගවත් පරිණාමය ගනුදෙනුකාර අපේක්ෂාවන් නැවත අර්ථ දක්වා ඇති අතර, පහසුව, ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව නවීන බැංකුකරණයේ මූලික ප්‍රතිඵලයාව බවට පත් කර ඇත. එයට ප්‍රතිචාර වශයෙන්, බැංකුව තාක්ෂණික දැනුමැති ගනුදෙනුකාර පදනමක් අවශ්‍යතා සපුරාලීම සඳහා නිර්මාණය කර ඇති මහත් අපේක්ෂාව ඇති ඩිජිටල් පරිවර්තන ගමනක් ආරම්භ කර ඇත. අපගේ උපායමාර්ගය සේවා වේගය, ප්‍රවේශ්‍යතාව සහ විශ්වාසය වැඩිදියුණු කරමින් ස්පෘශ්‍ය ප්‍රතිලාභ ලබා දෙන ඇතුළත්, ආරක්ෂිත සහ අනාගතයට සූදානම් ඩිජිටල් පරිසර පද්ධතියක් ගොඩනැගීම කෙරෙහි අවධානය යොමු කරයි.

- **ඩිජිටල්-පළමු, මිනිසා-සැමවිටම සේවා ආදර්ශයක් ශක්තිමත් කරන ගැටීම, අසාර්ථකත්වයන් සහ ආපසු හැරවීමේ කාලයන් අඩු කිරීම සඳහා ස්ථාවර සහ ප්‍රශස්තකරණය කළ මූලික වේදිකාව සහ ඩිජිටල් ගමන.**

  අපි Temenos T24 මූලික බැංකුකරණ පද්ධතිය සාර්ථකව ස්ථාවර කර ඇති අතර, එය විමධ්‍යගත පද්ධතියක සිට මෙහෙයුම් කාර්යක්ෂමතාව, පරිමාණය කිරීමේ හැකියාව සහ ගනුදෙනුකාර තෘප්තිය වැඩි දියුණු කරන ඒකාබද්ධ වේදිකාවකට මාරුකර ඇත. මෙම පරිවර්තනය මඟින් වේගවත් හැරවුම් කාලයන් මෙහෙයවමින් අරමුදල් මාරු කිරීම, ණය අයදුම්පත් සහ බිල්පත් ගෙවීම් වැනි පහසු ඩිජිටල් ගමන් අවම ගැටීම සහිතව ලබා දීමට අපට ඉඩ සලසයි. අපගේ ප්‍රශස්ත වේදිකාව ඩිජිටල්-පළමු ප්‍රවේශයකට සහාය වන අතර සියලුම ගනුදෙනුකරුවන් සඳහා සමබර, විශ්වාසදායක බැංකු අත්දැකීමක් නිර්මාණය කරමින් මානව සහාය පහසුවෙන් ප්‍රවේශ විය හැකි බව සහතික කරයි.

බුද්ධිමය ප්‍රාග්ධනය පිළිබඳ වැඩි විස්තර 134 සිට 143 දක්වා පිටුවල දැක්වේග

- **ඩිජිටල් මාර්ග වෙත සංක්‍රමණය වන ගනුදෙනුකරුවන්ට මඟ පෙන්වීම සහ ආරක්ෂාව ලබා ගැනීම සඳහා ශාඛා සහ ඇමතුම් මධ්‍යස්ථානවල ශක්තිමත් සහාය දක්වන ඩිජිටල් මාර්ගග**

  ඩිජිටල් බැංකුකරණය යොදා ගැනීමේදී ගනුදෙනුකරුවන්ට සහාය වීම සඳහා, අපගේ ශාඛා ජාලය සහ ඇමතුම් මධ්‍යස්ථාන හරහා සහාය සේවා මාර්ග අපි වැඩිදියුණු කර ඇත. සුමට හා ආරක්ෂිත සංක්‍රාන්තියක් සහතික කරමින් ජංගම සහ අන්තර්ජාල බැංකු ක්‍රියාවලීන් හරහා ගනුදෙනුකරුවන්ට මඟ පෙන්වීම සඳහා කාර්ය මණ්ඩලය පුහුණු කෙරේ. ආරක්ෂිත මාර්ගගත භාවිතයන් පිළිබඳව ගනුදෙනුකරුවන් දැනුවත් කිරීම, වංචාවලින් ඔවුන් ආරක්ෂා කිරීම සහ ඩිජිටල් මෙවලම් භාවිතා කිරීමේදී විශ්වාසය ගොඩනැගීම සඳහා අපි නිරන්තර ඩිජිටල් ආරක්ෂක දැනුවත් කිරීමේ වැටසටහන් ද පවත්වමු.

- AML/CFT **අනුකූලතා විනය පවත්වා ගනිමින් කඩදාසි වැඩ අඩු කිරීමට සහ ඇතුළත් කිරීම පුළුල් කිරීමට වැඩි දියුණු කළ ඩිජිටල් ඇතුළත් කිරීම සහ** e-KYC **වැඩ ප්‍රවාහ.**

  මූල්‍ය ඇතුළත් කිරීම සඳහා අපගේ කැපවීමට පෙළ ගැසෙමින්, බැංකුව විසින් ඉලෙක්ට්‍රොනික ඔබගේ ගනුදෙනුකරු දැනගන්න (e-KYC) හැකියාවන් සමඟින් සම්පූර්ණයෙන්ම ඩිජිටල්කරණය කළ ඇතුළත් කිරීම හඳුන්වා දී ඇත. ගනුදෙනුකරුවන්ට දැන් කඩදාසි රහිත ක්‍රියාවලියක් තුළින් දුරස්ථව ගිණුම් විවෘත කළ හැකි අතර, පරිපාලන බර සැලකිය යුතු ලෙස අඩු කරමින් විශේෂයෙන් දුරස්ථ හෝ ඌන සේවා ප්‍රදේශවල සිටින අයට ප්‍රවේශය පුළුල් කරයි. මෙම ක්‍රමවත් කළ වැඩ ප්‍රවාහය පහසුව සහ අනුකූලතාව යන දෙකම සහතික කරමින්, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (AML) සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ (CFT) රෙගුලාසිවලට දැඩි ලෙස අනුකූලතාව පවත්වා ගෙන යයි.

- **පුළුල් කළ ස්වයං සේවාව සහ ජංගම වේදිකා.**

  අපගේ වැඩි දියුණු කළ ජංගම බැංකුකරණ යෙදුම මඟින් සහජ ඥානය පිළිබඳ අතුරු මුහුණතක්, වේගවත් ගනුදෙනු පිරිසැකසුම්කරණයක් හා පුද්ගලාරෝපිත මූල්‍ය අවබෝධයක් පිරිනමන අතර ඉන් ගනුදෙනුකරුවන්ට ඕනෑම වේලාවක, ඕනෑම ස්ථානකයදී සිය මුදල් ආයාශයකින් තොරව කළමනාකරණය කර ගැනීමට ඉඩ සලසයි.

- **මුදල් රහිත අත්දැකීමක් සඳහා උසස් කළ ගෙවීම් විසඳුම්:**

  අපි පහත සඳහන් නව්‍යකරණ ගෙවීම් විසඳුම් හරහා මුදල් රහිත ආර්ථිකයක් කරා ශ්‍රී ලංකාවේ චිත්‍රන්වීම මෙහෙයවමින් සිටිමු:

  - සම්බන්ධතා රහිත NFC සහ QR කේත පදනම් කරගත් ගනුදෙනු
  - ඒකාබද්ධ වේගවත් ගෙවීම් ජාල හරහා ක්ෂණික අරමුදල් මාරු කිරීම්
  - තත්‍ය කාලීන පියවීමේ හැකියාවන්

- **ශක්තිමත් සයිබර් ආරක්ෂාව සහ ඩිජිටල් විශ්වාස රාමුව:**

  අපි පහත දැ ඇතුළුව ගනුදෙනුකරුවන්ගේ ගනුදෙනු සහ දත්ත සුරක්ෂිත කිරීමට නවීන ආරක්ෂක ක්‍රියාමාර්ග සංවර්ධනය කර ඇත.

  - තත්‍ය කාලීන වංචා හඳුනාගැනීම සහ ගනුදෙනු නියාමනය
  - අවසානය දක්වා සංකේතනය සහ බහු-සාධක සත්‍යාපනය (MFA)
  - ග්‍රහනය, මාර්ගගත වංචා සහ ඩිජිටල් ආරක්ෂාව පිළිබඳ අඛණ්ඩ ගනුදෙනුකාර දැනුවත් කිරීමේ වැඩසටහන්

GRI 418-1

## 2.3 ගනුදෙනුකාර ආරක්ෂාවථ චර්යාව, රහස්‍යතාව සහ වංචා ඔරොත්තුදීම

බැංකුවේ ගනුදෙනුකාර හිමිකම් සුරක්ෂිත කිරීම අපගේ සම්බන්ධතා ප්‍රාග්ධනයට මූලික වේ. ඩිජිටල් යොදා ගැනීම වේගවත් කරන බැවින්, වංචාව, දත්තවල රහස්‍යතාව සහ චර්යාවට අදාළ වෙනස වන අවදානම් විසඳීමට අපගේ ගනුදෙනුකාර ආරක්ෂක රාමුව අපි ශක්තිමත් කර ඇත. අපගේ ප්‍රවේශය මඟින් ආරක්ෂිත බැංකුකරණ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ඒකාබද්ධ තාක්ෂණය, විනයගරුක ක්‍රියාවලිය, සහ ඉලක්කගත ගනුදෙනුකාර අධ්‍යාපනය ඒකාබද්ධ කෙරේ.

- **වංචා අවදානම අඩු කිරීම සහ ගනුදෙනුකාර දත්ත ආරක්ෂා කිරීම සඳහා සත්‍යාපනය, ප්‍රවේශ විනය සහ ගනුදෙනු නියාමනය ශක්තිමත් කිරීම.**

  බහු-සාධක සත්‍යාපනය ඇතුළුව සියලුම බැංකු මාර්ග හරහා වැඩිදියුණු කළ ආරක්ෂක පියවර අපි යොදා ගෙන ඇත. සැක කටයුතු වහාම හඳුනාගෙන සලකුණු කිරීම සඳහා උසස් විශ්ලේෂණ මඟින් බල ගැන්වෙන තත්‍ය කාලීන ගනුදෙනු නියාමන පද්ධති, ක්‍රියාශීලී මැදිහත්වීම් සක්‍රීය කරයි. සෑම ස්පර්ශක ස්ථානයකදීම පෞද්ගලිකත්වය පවත්වා ගෙන යන බව සහතික කරමින් දැඩි ප්‍රවේශ පාලනයන් සහ අවසාන සංකේතනය මඟින් ගනුදෙනුකාර දත්ත අනවසර ප්‍රවේශයෙන් ආරක්ෂා කරයි.

- **අවදානමට ලක්විය හැකි අංශ ඉලක්ක කරගත් - ග්‍රහනය, අනුකරණය සහ ආරක්ෂිත ඩිජිටල් ව්‍යවහාර පිළිබඳ ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමේ ව්‍යාපාර.**

  ගනුදෙනුකාරුවන් පරික්ෂාකාරී වීම තීරණාත්මක ආරක්ෂක මාර්ගයක් ලෙස හඳුනා ගනිමින්, තතුබෑම්, අනුකරණ වංචා, සහ වංචා සහගත යෝජනා ක්‍රම වැනි මතුවන තර්ජන කෙරෙහි අවධානය යොමු කළ දැනුවත් කිරීමේ වැඩසටහන් අපි පවත්වමු. ජ්‍යෙෂ්ඨයින්, පළමු වරට ඩිජිටල් භාවිතා කරන්නන් සහ ග්‍රාමීය ප්‍රජාවන් ඇතුළු අවදානමට ලක්විය හැකි අංශ වෙත ළඟා වීමට මෙම වැඩසටහන් ගලපනු ලැබේ. ප්‍රවේශ විය හැකි භාෂාවක් සහ සමාජ මාධ්‍ය, ශාඛා අන්තර්ක්‍රියා සහ ප්‍රජා බලපෑම ඇතුළු බහු සන්නිවේදන මාර්ග භාවිතා කිරීමෙන් අපි මෙය සාක්ෂාත් කරගනිමු.

- **කාලීන, සාධාරණ ප්‍රතිඵල සහතික කිරීම සඳහා මතභේදාත්මක ගනුදෙනු, වංචා පැමිණිලි සහ දුෂ්කරතා සහාය සඳහා සිදුවීම් හැසිරවීමේ කාර්ය ග්‍රන්ථ වැඩි දියුණු කිරීම.**

  ගනුදෙනුකාර ගැටළු ස්ථාවර, දයානුකම්පිත සහ කාර්යක්ෂමව හැසිරවීම සහතික කිරීම සඳහා අපි අපගේ සිදුවීම් ප්‍රතිචාර කාර්ය ග්‍රන්ථ සංශෝධනය කර ප්‍රමිතිගත කර ඇත. පැහැදිලි උත්සන්න කිරීමේ මාර්ග, නිශ්චිත ආපසු හැරවීමේ වේලාවන් සහ වංචා සහ දුෂ්කරතා සිදුවීම් සඳහා විශේෂිත කණ්ඩායම් ඉක්මන් විසඳුමක් ඇති කරයි. සෑම වැදගත් සිදුවීමක් සඳහාම මූලික-හේතු විශ්ලේෂණය පවත්වනු ලබන අතර, පාලනයන් සහ ක්‍රියාවලීන් අඛණ්ඩව වර්ධනය කිරීමට පෝෂණය කරනු ලබයි.

## 2.4 පැමිණිලි විශ්ලේෂණ සහ සේවා ප්‍රතිසාධන කල්පිරීම

බැංකුව පැමිණිලි අසාර්ථක වීමක් ලෙස නොව, ගනුදෙනුකාර සබඳතා ශක්තිමත් කිරීමට සහ සේවා සැපයීම වර්ධනය කිරීමට ඇති අවස්ථාවන් ලෙස සලකනු ලබයි.

2025 දී, අපි පැමිණිලි සරලව විසඳීමේ සිට පැමිණිලි ඉගෙනීමේ සංස්කෘතියක් දක්වා ඉදිරියට ගෙන ගිය අතර, ඒ තුළ සෑම ගනුදෙනුකාර මැදිහත්වීමක්ම පද්ධතිමය වර්ධනයන් දැනුම් දේ.

- **පැමිණිලි විසඳීමේ සිට පැමිණිලි ඉගෙනීම දක්වා විතැන්වීම: වර්ගීකරණය, ප්‍රවණතා විශ්ලේෂණය, මූල හේතු හඳුනා ගැනීම සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග නිරීක්ෂණය කිරීම.**

  වර්ගය, මාර්ගය සහ මූලික හේතුව අනුව පැමිණිලි වර්ගීකරණය කරන ව්‍යුහගත පැමිණිලි විශ්ලේෂණ රාමුවක් අපි ක්‍රියාත්මක කර ඇත. ගැටළු නැවත සිදුවීම හඳුනා ගැනීම සඳහා කළමනාකරණය විසින් සමාලෝචනය කරනු ලැබූ සොයා ගැනීම් සමඟ ඉලක්කගත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග මෙහෙයවීම සඳහා ප්‍රවණතා විශ්ලේෂණය මාසිකව පවත්වනු ලබයි. මෙම විතැන්වීම මගින් රෝග ලක්ෂණ වලට හුදෙක් ප්‍රතිකාර කිරීම වෙනුවට නැවත නැවත පැමිණිලි ඇතිවීමේ සම්භාවිතාව අඩු කරමින් අපි පාදක වූ ගැටළුවලට විසඳුම් ලබා දෙන බව සහතික කරමු.

- **උත්සන්න කිරීමේ මාර්ග, ගනුදෙනුකාර සන්නිවේදන මාර්ගක සහ වසා දැමීමේ විනය ඇතුළුව, ඉදිරි පෙළ කණ්ඩායම් සඳහා ස්ථාවර සේවා ප්‍රතිසාධන මෙවලම් ගොඩ නැඟීම.**

  අපගේ ඉදිරි පෙළ කාර්ය මණ්ඩලය සවිබල ගැන්වීම සඳහා, අපි සම්මත කළ සේවා ප්‍රතිසාධන මෙවලම් යොදා ගෙන ඇති අතර, ඉන් අතෘප්තිමත් ගනුදෙනුකරුවන් හැසිරවීම පිළිබඳ පැහැදිලි මඟපෙන්වීම් ලබා දේ. මෙවැනි මෙවලම්වලට සන්නිවේදන මාර්ගක උත්සන්න කිරීමේ පෙරාතු ලේඛණ, සහ වසා දැමීමේ පිරික්සුම් ලැයිස්තු ඇතුළත් වන අතර සෑම පැමිණිල්ලක්ම සහකම්පනය, අනුරූපතාව සහ ව්‍යක්තිමයභාවය සමඟ කළමනාකරණය කරන බව සහතික කරයි. නිරන්තර පුනුණු සැසි සියලුම ශාඛා සහ ඇමතුම් මධ්‍යස්ථාන හරහා මෙම ව්‍යවහාර සවිබල ගන්වයි.

- **පාලනය ශක්තිමත් කිරීමට සහ සේවා ක්‍රියාවලීන් වර්ධනය කිරීමට පැමිණිලි සහ විමසීම් පූර්ව අනතුරු ඇඟවීමේ දර්ශක ලෙස භාවිතා කිරීම.**

  වර්තමානයේ පැමිණිලි සහ ගනුදෙනුකාර විමසීම් වටිනා බුද්ධි මූලාශ්‍ර ලෙස සලකනු ලැබේ. නිශ්චිත ගැටළු වර්ගවල මූලයන් පාදක ක්‍රියාවලීන්, පාලන හෝ පද්ධති ක්‍රියාකාරිත්වය පිළිබඳ ආසන්නතම සමාලෝචන ඇති කරයි. මෙම සක්‍රීය ප්‍රවේශය මඟින් විභව ගැටළු උත්සන්න වීමට පෙර හඳුනාගෙන නිවැරදි කිරීමට අපට හැකියාව ලැබෙන අතර සමස්ත සේවා විශ්වසනීයත්වය සහ ගනුදෙනුකාර තෘප්තිය වැඩි දියුණු කරයි.

## 2.5 ඇතුළත් වූ සේවා සැලැස්ම හා ප්‍රවේශ්‍යතාව

ඇතුළත්වීම යනු බැංකුවේ ගනුදෙනුකාර ප්‍රාග්ධන උපායමාර්ගයේ මුරගල වේ.

වයස, හැකියාව හෝ ස්ථානය නොසලකා සියලුම ශ්‍රී ලාංකිකයින්ට අපගේ බැංකු සේවාවන්ට ප්‍රවේශ විය හැකි සහ ප්‍රතිලාභ ලබා ගත හැකි බව සහතික කිරීමට අපි කැපවී සිටිමු. අපගේ ප්‍රවේශය සේවා සැලසුම් කිරීමේ සහ ලබාදීමේ සෑම අංශයකටම ප්‍රවේශ්‍යතාව ඒකාබද්ධ කරයි.

- **විවිධ ආබාධිත ගනුදෙනුකරුවන් සඳහා බාධක රහිත ප්‍රවේශය සහ ඇතුළත් සේවාවන්.**

  අපගේ භෞතික යටිතලපහසුකම් වඩාත් පිවිසිය හැකි බවට පත් කරමින් අපි සැලකියයුතු ප්‍රගතිය සිදු කර ඇත. අද දක්වා, ශාඛා 229ක බෑවුම්, පළල් දොරටු සහ ප්‍රවේශ විය හැකි කවුළු ඇතුළුව විවිධ ආබාධිත ප්‍රවේශ පහසුකම්වලින් සමන්විත කර ඇත. සියලුම නව සහ නැවත ස්ථානගත කරන ලද ශාඛා අනුමත කිරීමේ කොන්දේසියක් ලෙස මෙම ඇතුළත් සැලසුම් ප්‍රමිතීන් සපුරාලීම අවශ්‍ය වේ. පුනුණුව ලත් කාර්ය මණ්ඩලයකින් සමන්විත සහායක කවුළු මඟින් විශේෂ අවශ්‍යතා ඇති ගනුදෙනුකරුවන්ට පුද්ගලාරෝපිත සහාය ලැබෙන බව සහතික කෙරේ.

  මෙම ප්‍රවේශය නියාමන අවශ්‍යතා සපුරාලීමට වඩා වැඩි යමක් කරන අතර, එය සම්බන්ධතා සාධාරණත්වය සහ විශ්වාසය සක්‍රීයව ගොඩනඟයි. ප්‍රවේශ විය හැකි සහ ගෞරවනීය සේවාව පුළුල් කිරීමෙන්, අපි වැදගත් ගනුදෙනුකාර අංශ සමඟ සබඳතා ගැඹුරු කර, ශක්තිමත් කීර්තිනාමය පෝෂණය කරු, පක්ෂපාතිත්වය ශක්තිමත් කරමු.

  මෙය අපගේ සන්නාම පොරොන්දුව සියලුම ශ්‍රී ලාංකිකයින්ට අව්‍යාජව ඇතුළත් හා විශ්වාසී හවුල්කරුවෙක් ලෙස ශක්තිමත් කරන අතර සමාජීය විධිය තිරසාර වර්ධන ධාවකයෙක් ලෙස පරිවර්තනය කරයි.

- **ජ්‍යෙෂ්ඨයින් සහ විශේෂ අවශ්‍යතා ඇති ගනුදෙනුකරුවන් සඳහා සහාය සමඟ, සරල භාෂාවෙන් ගනුදෙනුකාර සන්නිවේදනය වැඩිදියුණු කිරීම.**

  අපි නිෂ්පාදන නියමයන්, අනාවරණ, සහ අලවිකරණ ද්‍රව්‍ය ඇතුළුව ප්‍රධාන ගනුදෙනුකාර සන්නිවේදන අවබෝධ කර ගැනීමට පැහැදිළි, සරල භාෂාවක් භාවිතා කරන බව සහතික කිරීමට ඒ පිළිබඳ අඛණ්ඩ සමාලෝචනය පවත්වමින් සිටිමු. වැඩිහිටියන් සහ විවිධ ආබාධිත ගනුදෙනුකරුවන් සඳහා, විශේෂිත සහය මාර්ග, ශාඛා තුළ සහාය සහ සරල කළ ලේඛනගතකරණය හරහා අපි අමතර සහාය අඛණ්ඩව ලබා දෙන්නෙමු. වෙබ් ප්‍රවේශ්‍යතා මාර්ගෝපදේශවලට අනුකූල වන පරිදි අපගේ වෙබ් අඩවිය සහ ජංගම යෙදුම ද ක්‍රමයෙන් වැඩිදියුණු කරමින් පවතී.

- **ඩිජිටල් වේගවත් කිරීමෙන් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් බැහැර නොකරන පරිදි මාර්ග සහ නිෂ්පාදන වෙනස්වීම්වල ඇතුළත් කිරීම් පරීක්ෂාවන් ඇතුළත් කිරීම.**

  අපගේ ඩිජිටල් පරිවර්තනය අපි වේගවත් කරන විට, සියලුම මාර්ග සහ නිෂ්පාදන සංවර්ධන ක්‍රියාවලි තුළට අනිවාර්ය ඇතුළත් කිරීමේ බලපෑම් තක්සේරු කිරීම් අපි ඇතුළත් කර ඇත. සීමිත ඩිජිටල් සාක්ෂරතාවය, තාක්ෂණයට ප්‍රවේශය හෝ ශාරීරික හැකියාවන් ඇති පාරිභෝගිකයින් සඳහා සලකා බැලීම සමඟ නව ඩිජිටල් සේවාවන් නිර්මාණය කරන බව මෙය සහතික කරයි. ඩිජිටල් විසඳුම් බාධක නිර්මාණය කළ හැකි අවස්ථාවේදී. කිසිදු ගනුදෙනුකරුවෙකු ඉවත් නොකරන බව සහතික කිරීම සඳහා අපි සමාන්තර සහායක මාර්ග පවත්වා ගනිමු.

## 2.6 අවදානම අඩුකිරීමේ උත්තෝලනයක් ලෙස මූල්‍ය සහ ඩිජිටල් සාක්ෂරතාව

අවදානම අඩු කර මූල්‍ය යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා දැනුමෙන් ගනුදෙනුකරුවන් සවිබල ගැන්වීම වඩාත් ඵලදායී මාර්ගවලින් එකකි. බැංකුවේ සාක්ෂරතා මූලපිරීම් මූල්‍ය වාතාවරණය තුළ ආරක්ෂිතව සැරිසැරීමට සහ දැනුවත් තීරණ ගැනීමට අවශ්‍ය කුසලතා සහ විශ්වාසය ගනුදෙනුකරුවන්ට ලබා දීම සඳහා සැලසුම් කර ඇත.

- **ආරක්ෂිත ඩිජිටල් භාවිතය වැඩිදියුණු කිරීම සහ වංචා අවදානම අවම කිරීම සඳහා ඉලක්කගත බලපෑම් සහිත සහ දැනුවත් කිරීමේ වැඩසටහන්.**

  අපි ශාඛා පාදක වැඩමුළු, ප්‍රජා සිදුවීම් සහ ඩිජිටල් චේදිකා හරහා ගනුදෙනුකරුවන් වෙත ළඟා වෙමින් රට පුරා නිරන්තර මූල්‍ය හා ඩිජිටල් සාක්ෂරතා වැඩසටහන් පවත්වමු. මෙම සැසිවලින් ආරක්ෂිත ඩිජිටල් බැංකුකරණ ව්‍යවහාර, වංචා හඳුනා ගැනීම සහ වළක්වා ගැනීම, අයවැයකරණය සහ ඉතිරිකිරීම් වැනි අත්‍යවශ්‍ය මාතෘකා ආවරණය කෙරේ. සංක්‍රමණික සේවකයින්, වැඩිහිටියන් සහ පළමු වරට බැංකු භාවිතා කරන්නන් ඇතුළු අවදානමට ලක්විය හැකි අංශ කෙරෙහි දේශීය භාෂාවලින් ලබාදෙන සහ ඔවුන්ගේ විශේෂිත අවශ්‍යතාවලට අනුව ගලපන ලද අන්තර්ගතය සමඟ විශේෂ අවධානයක් යොමු කරනු ලබයි.

- **ඔරොත්තු දීමේ ප්‍රතිඵල සමඟ සාක්ෂරතාවය පෙළගසවමින් බලපෑමට ලක් වූ කලාප සහ අවදානමට ලක්විය හැකි අංශ සඳහා ප්‍රජා සම්බන්ධිත සාක්ෂරතා මූලපිරීම්.**

2025 දී, අපි ප්‍රජාව පදනම් මූලපිරීම් ඇතුළත් කිරීමට සහ දේශීය අභියෝග ආමන්ත්‍රණය කිරීමට අපගේ

## සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

සාක්ෂරතා උත්සාහයන් පුළුල් කළෙමු. සංක්‍රමණික සේවකයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා විශේෂ මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් පැවැත්වීමට විදේශ රැකියා නියුක්ති කාර්යාංශය සමඟ අපි හවුල් වූ අතර එය ඔවුන්ට ප්‍රේෂණ කළමනාකරණය කර ගැනීමට හා ඔවුන්ගේ මූල්‍ය අනාගතය සැලසුම් කිරීම සඳහා උපකාරී විය. දිවිවා ආපදාවට ලක්වූ කලාප වල, සාක්ෂරතා සැසි පුළුල් ඔරොත්තුදීම ගොඩ නැගීමේ උත්සාහයන් සමඟ ඒකාබද්ධ කරන ලද අතර, ප්‍රජාවන්ට ප්‍රවේශය සඳහා දැනුම ඇති බවට සහ ප්‍රතිසාධනය තුළ බැංකු භාවිතා කරන බව සහතික කරයි.

- ලඟාවීම පරිමාණය කර ගැනීමට සුදුසු අවස්ථාවලදී හවුල්කාරිත්වයන්
  අපට තනිවම පරිමාණය ළඟා කර ගත නොහැකි බව හඳුනාගනිමින්, අපගේ සාක්ෂරතා ලඟාවීම පුළුල් කිරීමට අපි ජාතික ආයතන, ප්‍රජා සංවිධාන සහ සංවර්ධන හවුල්කරුවන් සමඟ ක්‍රියාකාරීව සහයෝගයෙන් කටයුතු කරන්නෙමු. මෙවැනි හවුල්කාරිත්වයන් පවතින ජාල උපයෝගී කර ගැනීමට, සම්පත් බෙදා ගැනීමට සහ වැඩසටහන් කාර්යක්ෂමව ලබා දීමට අපට හැකියාව ලබා දේ. ප්‍රධාන හවුල්කරුවන් අතරට විදේශ රැකියා නියුක්ති කාර්යාංශය, අධ්‍යාපන ආයතන සහ ප්‍රාදේශීය ප්‍රජා කණ්ඩායම් ඇතුළත් වන අතර ඔවුන් ඉලක්කගත ප්‍රේක්ෂකයින් සමඟ සම්බන්ධ වීමට සහ අපගේ බලපෑම පුළුල් කිරීමට අපට උපකාර කරයි.

## 3 අපි ප්‍රතිඵල ශක්තිමත් කරන ආකාරය

ආරක්ෂිත ප්‍රවේශය, සාධාරණ සැලකීම සහ විශ්වාසනීය සේවාව හරහා විශ්වාසය ස්ථාවර ප්‍රතිඵල බවට පත් කරන විට ගනුදෙනුකාර ප්‍රාග්ධනය තිරසාර වටිනාකමක් බවට පරිවර්තනය වේ. සෑම පාරිභෝගික මැදිහත්වීමක්ම අවදානම් විනය, වර්ධන ගුණාත්මකභාවය සහ කීර්තිනාමයට ඔරොත්තු දීම සමඟ සම්බන්ධ කරන විපරම් සහිත ප්‍රතිඵල මාර්ග මාලාවක් හරහා බැංකුව මෙය සක්‍රීය කරයි. ඩිජිටල් යටිතල පහසුකම්, ගනුදෙනුකාර ආරක්ෂාව සහ සේවා විශිෂ්ටත්වය තුළ අපගේ ආයෝජන, බැංකුවේ දිගුකාලීන ස්ථාවරත්වය ශක්තිමත් කරමින්, ගනුදෙනුකාර අත්දැකීම්වල මැනිය හැකි වර්ධනයන් ලබා දෙන බව සහතික කිරීම සඳහා මෙම මාර්ග නිර්මාණය කර ඇත.

| ප්‍රතිඵල මාර්ග | | මූලික ජයග්‍රහණ | ගනුදෙනුකාර වටිනාකම | බැංකුවට නිර්මාණය කළ වටිනාකම |
|---|---|---|---|---|
| **වඩා යහපත් ප්‍රවේශය හා ආරක්ෂිත යොදා ගැනීම** | | ශාඛාවල ස්ථාපිත මූලික වේදිකා, ඩිජිටල් තානාපතිවරුන් පද්ධති පහත වැටීම අඩු කරයි | ඩිජිටල් බැංකුකරණය තුළ පහසුව, විශ්වාසය හා ආරක්ෂාව | වඩා ඉහළ ඩිජිටල් යොදා ගැනීම, අඩුකළ මෙහෙයුම් පිරිවැයි |
| **සාධාරණ ප්‍රතිඵල හා විශ්වාසය බල ගැන්වීම** | → | SLA, දැරියහැකි පරීක්ෂාවන් තුළ සරල භාෂා අනාවරණ, 100% පැමිණිලි විසඳීම | විනිවිදභාවය, සාධාරණ සැලකීම සහ හානිවලින් ආරක්ෂාව | වඩා ශක්තිමත් කීර්තිනාමය, අඩුකළ නියාමන අවදානම |
| **බිඳවැටීම්වල ඔරොත්තුදීම සහ විශ්වාසය** | → | දිවිවා සුලි කුණාටු ප්‍රතිචාරය, අඛණ්ඩ ප්‍රතිව්‍යුහගත සහය | දුෂ්කරතාවලදී මනසේ නිදහස සහ අස්පෘශ්‍ය සහය | සමාජ බලපත්‍රය ශක්තිමත් කළ ගනුදෙනුකාර පක්ෂපාතිකම |
| **සම්බන්ධතා පදනම වර්ධනය** | | නිෂ්පාදන විනිවිදියාම වැඩි කළ මිලියන 10.52ක සක්‍රීය ගිණුම් | පුද්ගලාරෝපිත, අගයකළ, බැංකු සම්බන්ධතා | තිරසාර ඉපයීම්, අඩු ගනුදෙනුකාර අත්කර ගැනීමේ පිරිවැය |

### 3.1 වඩා යහපත් ප්‍රවේශය හා ආරක්ෂිත යොදා ගැනීම

සියලුම ගනුදෙනුකරුවන්ට පහසුවෙන් සහ ආරක්ෂිතව බැංකු සේවා වෙත ප්‍රවේශ විය හැකි බව සහතික කිරීම අපගේ ගනුදෙනුකාර වටිනාකම් කොටසේ මූලික අංගයකි. පුළුල් ප්‍රවේශය ආරක්ෂාව හෝ පාලනයට හානියක් නොවන බව සහතික කරන අතරම ප්‍රවේශයට ඇති බාධක ඉවත් කිරීම කෙරෙහි අපි අවධානය යොමු කර ඇත.

- **ගනුදෙනුකාර මග පෙන්වීම සහ පාලනයන් පවත්වා ගනිමින් ප්‍රශස්ත ඩිජිටල් ගමන් සහ සහායක යොදා ගැනීම තුළින් වැඩිදියුණු කළ පහසුව.**

  අපගේ ඩිජිටල් වේදිකා ස්වයංසිද්ධ, ගැටීම්-නිදහස් අත්දැකීම් ලබා දීම සඳහා නැවත සැලසුම් කර ඇති අතර, එමඟින් ගනුදෙනුකරුවන්ට ගනුදෙනු කිරීමට, තොරතුරු වෙත ප්‍රවේශ වීමට සහ ගිණුම් පහසුවෙන් කළමනාකරණය කිරීමට හැකි වේ.

  ඒ සමඟම, ගනුදෙනුකරුවන්ට සිය ඩිජිටල් පරිනාමය තුළින් මඟ පෙන්වීමට ශාඛාවල ඩිජිටල් තානාපතිරුන් සහ විශේෂ ඇමතුම මධ්‍යස්ථාන සහය ඇතුළුව සහය වූ යොදා ගැනීමේ මාර්ග අපි ශක්තිමත් කර ඇත. මෙම ද්විත්ව ප්‍රවේශය මගින් පහසුව ගනුදෙනුකාර අවබෝධය හෝ ආරක්ෂාවේ වියදම තුළ සාක්ෂාත් කර නොගන්නා බව සහතික කරයි. සෑම ඩිජිටල් ගමනක්ම පැහැදිලි මඟපෙන්වීම, කඩිනම් තහවුරු කිරීම සහ අවශ්‍ය පරිදි මානව සහය සඳහා පහසු ප්‍රවේශය ඇතුළත් කරයි.

- **ශක්තිමත් මාර්ග විශ්වාසය හා උත්සන්න මාර්ගවලින් අඩුකළ සේවා බිඳවැටීමේ අවදානම.**

  පද්ධතියේ විශ්වසනීයත්වය ගනුදෙනුකාර විශ්වාසයේ සාකච්ඡා කළ නොහැකි පදනමකි. අපගේ Temenos T24 මූලික බැංකුකරණ පද්ධතිය ස්ථායීකරණය සහ වැඩිකළ යටිතල පහසුකම් නියාමනය තුළින්, අපි සැලසුම් නොකළ පහත වැටීම් සහ ගනුදෙනු දෝෂ සැලකියයුතු ලෙස අඩු කර ඇත. පුළුල් උත්සන්න පුරුදු මගින් යම් සේවා බිඳවැටීමක් වහාම වාර්තා කර, විසඳා පීඩාවට පත් ගනුදෙනුකරුවන්ට සන්නිවේදනය කරන බව සහතික කරයි. නිරන්තර පීඩන පරීක්ෂණය හා ව්‍යාපාර අඛණ්ඩතා පෙරනුරු පහසු සේවා ලබාදීම පවත්වා ගැනීමට අපට ඇති හැකියාව තවදුරටත් ශක්තිමත් කරයි. (නිෂ්පාදිත ප්‍රාග්ධනය පිළිබඳ වැඩි විස්තර 109 සිට 116 දක්වා පිටුවල දැක්වේ)

## සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

### 3.2 සාධාරණ ප්‍රතිඵල හා විශ්වාසය බල ගැන්වීම

සාධාරණ ප්‍රතිකාරය අවසාන ගනුදෙනුකාර සම්බන්ධතාවල මූලාධාරය වේ. අපි නිෂ්පාදන සැලැස්මේ සිට පවත්නා සේවාව සහ පැමිණිලි විසඳීම දක්වා ගනුදෙනුකරුවෙකුගේ ජීවන චක්‍රයේ සෑම අදියරයකටම සාධාරණත්වය ඇතුළත් කර ඇත.

- **ගනුදෙනුකාර නානි අවදානම අඩු කිරීමට පැහැදිලි නියමයන්, වර්ධිත අනාවරණ, ශක්තිමත් පැමිණිලි පාලනය, සහ ස්ථීර සේවා ප්‍රමිති.**

  අපි නිෂ්පාදන විශේෂාංග, ගාස්තු, නියමයන් සහ කොන්දේසි පැහැදිලිව විස්තර කරන සරල, ප්‍රවේශ විය හැකි භාෂාවක් භාවිතා කිරීමට. සන්නිවේදනයන්ට මුහුණ පාන සියලුම ගනුදෙනුකරුවන් අඛණ්ඩව සමාලෝචනය කරමින් සිටිමු. අනිවාර්ය අනාවරණ සියලුම මාර්ග හරහා කැපී පෙනෙන ලෙස ප්‍රදර්ශනය කරන අතර, දැනුවත් තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු ගනුදෙනුකරුවන්ට ඇති බව සහතික කරයි. අපගේ ශක්තිමත් පැමිණිලි පාලන රාමුව මඟින් සෑම මැසිවිල්ලක්ම සටහන් කර, නිරීක්ෂණය කර, නිශ්චිත කාලරාමු තුළ ක්‍රියාවලි වර්ධනයට නැවත එකතු කරන මූලික-හේතු විශ්ලේෂණය සහිතව විසඳා ඇති බව සහතික කරයි, සියලුම ශාඛා සහ ඩිජිටල් මාර්ග හරහා ස්ථාවර සේවා ප්‍රමිතීන් මඟින් සෑම ගනුදෙනුකරුවෙකුටම ඔවුන් අප සමඟ බැංකු කටයුතු කරන ආකාරය හෝ ස්ථානය නොසලකා සාධාරණ ලෙස සැලකීමට අපගේ කැපවීම ශක්තිමත් කරයි.

- **දිගුකාලීන සම්බන්ධතා ශක්තිමත් කරන හා උවදුරට පත්වන ගනුදෙනුකරුඅවන් ආරක්ෂා කරන දැරියහැකි සහ තිරසාර පරීක්ෂාවන්.**

  වගකිවයුතු ණය දීම අපගේ ගනුදෙනුකාර ආරක්ෂණ ආචාර ධර්මවල කේන්ද්‍රීය අංගයකි. සෑම ණය නිෂ්පාදනයක්ම දැඩි දැරිය හැකි මිල සහ යෝග්‍යතා තක්සේරුවකට භාජනය වන අතර එමඟින් ගනුදෙනුකරුවන්ට අධික බරක් පැටවීමක් නැති බවත්, නිෂ්පාදනය ඒවායේ සැබෑ අවශ්‍යතා සපුරාලන බවත් සහතික කෙරේ. අවදානමට ලක්විය හැකි ගනුදෙනුකරුවන් සඳහා, අපි වැඩිදියුණු කළ නිසි සම්ප්‍රජන්‍ය යොදා ගන්නා අතර අවශ්‍ය විටෙක ගලපන ලද සහාය ලබා දෙන්නෙමු. මෙම ව්‍යවහාර මඟින් ගනුදෙනුකරුවන් හානිවලින් ආරක්ෂා කිරීම පමණක් නොව, කෙටි කාලීන ආදායමට වඩා ඔවුන්ගේ මූල්‍ය යහපැවැත්මට අපි ප්‍රමුඛත්වය ලබාදෙන බව පෙන්නුම් කිරීමෙන් දිගුකාලීන සබඳතා ශක්තිමත් කරයි.

### 3.3 බිඳවැටීම තුළ ඔරොත්තුදීම සහ විශ්වාසය

පුද්ගලික දුෂ්කරතා හා වඩා පුළුල් බිඳවැටීම්වලදී ගනුදෙනුකරුවන් සමඟ අප සිටිය යුතු බව ඔවුන් විශ්වාස කරයි. අපගේ ඔරොත්තුදීමේ රාමු ගනුදෙනුකරුවන් විපතකට පත්වන විට සේවා අඛණ්ඩතාව පවත්වා ගනීමට සහ කාරුණික සහය ලබාදීමට සැලසුම් කරයි.

- **බරපතල කාලගුණික සිදුවීම් ඇතුළුව බාහිර කම්පනවලදී විශ්වාසය පවත්වා ගැනීමට සේවා අඛණ්ඩතා සිරිත් හා සම්පත් මෙහෙයුම් ක්‍රියාපටිපාටි.**

  බැංකුව පුළුල් ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් සකස් කර ඇති අතර ඒවායින් ස්වභාවික විපත්වල සිට පද්ධති ඇනහිටීම් දක්වා පුළුල් පරාසයක බිඳවැටීම් අවස්ථා ආවරණය කරයි. මතුවන අවදානම් පිළිබිඹු කිරීම සඳහා මෙම සැලසුම් නිතිපතා ඇගයීමට ලක් කර යාවත්කාලීන කරනු ලැබේ. දිවිවා සුළි කුණාටුව අතරතුර, බලපෑමට ලක් වූ ප්‍රදේශවල ශාඛා ක්‍රියාත්මකව පවතින බව හෝ ඉක්මනින් යථා තත්ත්වයට පත්කළ බව සහ විකල්ප සේවා මාර්ග ගනුදෙනුකරුවන්ට පැහැදිලිව සන්නිවේදනය කළ බව අපගේ අඛණ්ඩතා චර්යාවන් සහතික කළේය. විශේෂ ගනුදෙනුකාර සහය කාර්ය ග්‍රන්ථ මඟින් අවිනිශ්චිත අවස්ථාවල විමසීම් කළමනාකරණයේදී සහ නැවත සහතික කිරීම ලබා දීමේදී ඉදිරිපෙළ කාර්ය මණ්ඩලය මෙහෙයවයි.

- **දුෂ්කර සංදර්භ තුළ ගනුදෙනුකාර ප්‍රතිඵල ආරක්ෂා කිරීමට විනිවිද සන්නිවේදනය හා සහන/ව්‍යූහගත සහය.**

  ගනුදෙනුකරුවන් පුද්ගලික ව්‍යාවරණ හෝ පුළුල් ආර්ථික කම්පන හේතුවෙන් මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණ දීමේදී, අපි සහකම්පනය හා නම්‍යතාව සමඟ ප්‍රතිචාර දක්වමු. අපගේ දුෂ්කරතා සහය රාමු මඟින් සිදුවීමෙන් සිදුවීම මත පදනම්ව තක්සේරු කළ ණය ප්‍රතිව්‍යූහගතකරණය, ගෙවීම් ප්‍රමාදකිරීම්, සහ ගාස්තු කපාහැරීම් ඇතුළුව ගලපන ලද සහන විකල්ප පිරිනමයි. ගනුදෙනුකරුවන් සහය සඳහා පිවිසීමට ඔවුන්ට ලබාගතහැකි විකල්ප සහ ක්‍රියාවලි පිළිබඳව අවබෝධ කර ගන්නා බව විනිවිද සන්නිවේදනය මඟින් සහතික කරයි.

  2025 දී, ශ්‍රී ලංකාවේ ප්‍රදේශ කිහිපයකට බලපෑ ලද දිවිවා සුළි කුණාටුව අතරතුර, බැංකුව අඛණ්ඩ සේවා සැපයීම සහතික කිරීම සඳහා එහි ගනුදෙනුකාර සහාය මාර්ගෝපදේශ සක්‍රීය කළේය. පිඩාවට ලක් වූ ගනුදෙනුකරුවන්ට විනිවිද සන්නිවේදනය, කඩිනම් දුෂ්කරතා ආධාර සහ ගලපන ලද ප්‍රතිව්‍යූහගත කිරීමේ සහාය ලබා දෙන ලද අතර ඒ තුළින් පුද්ගලික සහ ප්‍රජා-පුළුල් ආපදා වලදී ගනුදෙනුකරුවන් වෙනුවෙන් පෙනී සිටීමට අපගේ කැපවීම පෙන්නුම් කරයි. (බැංකුවේ ආපදා ප්‍රතිචාරය පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහා ප්‍රජා ප්‍රාග්ධනය 167 සිට 171 දක්වා පිටුවල දැක්වේ).

### 3.4 සම්බන්ධතා පදනම් වර්ධනය

බැංකුවේ තිරසාර වර්ධනය ආක්‍රමණශීලී මිලකරණය හෝ කෙටි කාලීන අලෙවි උපායන් මත නොව අපගේ ගනුදෙනුකාර සම්බන්ධතාවල ශක්තිය මත ගොඩ නැගේ. විශ්වාසය තියුණු කරමින් හා ස්ථීර වටිනාකම ලබා දෙමින්, අපි පක්ෂපාති, දිගුකාලීන ගනුදෙනුකාර සම්බන්ධතා සඳහා කොන්දේසි නිර්මාණය කරමු.

- **තිරසාර ඉපයීම් ඔරොත්තුදීමට සහය වෙමින් මිලකරණය මඟින් නොව විශ්වාසය මඟින් තියුණු කළ වඩා ශක්තිමත් රඳවාගැනීම සහ නිෂ්පාදන.**

  ගනුදෙනුකාර ප්‍රතිඵල කෙරෙහි අපගේ අවධානය වර්ධිත රඳවා ගැනීමට සහ වඩා ඉහළ නිෂ්පාදන විනවිදයාමකට පර්වර්තනය කර ඇත. අපව විශ්වාස කරන ගනුදෙනුකරුවන් කාලය සමඟ සිය නිෂ්පාදන දරාගැනීම වැඩි කරමින් අප බැංකුව සමඟ සිය බැංකු සම්බන්ධතා ඒකාබද්ධ කිරීමට කැමැත්තෙන් සිටී. මෙම සම්බන්ධතා මත පදනම් වර්ධන ආදර්ශය ස්ථීර, ඔරොත්තුදෙන ඉපයීම් පදනමක් ලබා දෙන අතර එය කෙටිකාලීන මිලකරණයට අඩුවෙන් සංවේදනය වේ.

  2025 දී, ගනුදෙනුකරුවෙකුට නිෂ්පාදන විනිවිදයාම ස්ථීරව ඉහළ යාමත් සමඟ සක්‍රීය ගනුදෙනුකාර ගිණුම් මිලියන 10.52ක් විය.

- **සේවය කිරීමේ පිරිවැය හා කාලය සමඟ තෘප්තිය වර්ධනය කරන නිෂ්පාදන හා ක්‍රියාවලි වර්ධනයන්ට ගනුදෙනුකාර දැනුමෙන් ප්‍රතිපෝෂණ ලැබීම්.**

  ගනුදෙනුකාර ප්‍රතිපෝෂණ ග්‍රහණය කර ගැනීමට සහ ඒ මත ක්‍රියා කිරීමට අප සතුව ආයතනික යාන්ත්‍රණ ඇත. පැමිණිලි, විමසීම් සහ සමීක්ෂණ ප්‍රතිචාර වර්ධනය සඳහා ගැටළු සහ අවස්ථා හඳුනා ගැනීම සඳහා ක්‍රමානුකූලව විශ්ලේෂණය කරනු ලබයි. මෙම අවබෝධය නිෂ්පාදන වැඩිදියුණු කිරීම්, ක්‍රියාවලි සරල කිරීම් සහ මාර්ග ආයෝජන ඍජුවම දැනුම් දෙයි. කාලයත් සමඟ, මෙම අඛණ්ඩ වර්ධනීය චක්‍රය අපගේ සේවා පිරිවැය අඩු කරන අතරම පාරිභෝගික තෘප්තිය වැඩි කරයි.

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

## 4 මෙය ලබාදෙන ආකාරය

2025 දී, ගනුදෙනුකාර කේන්ද්‍රීය උපායමාර්ගවල විචාරවත් ආයෝජනය බැංකුවේ වෙළෙඳපොල කොටස, සන්නාම විශ්වාසය සහ දිගුකාලීන පාර්ශවකාර වටිනාකම ශක්තිමත් කර ඇත.

පුද්ගලාරෝපිත සේවාව, විනිවිද පෙනෙන සන්නිවේදනයන් සහ ප්‍රවේශ විය හැකි මාර්ග හරහා ගනුදෙනුකාර සම්බන්ධතාවය තියුණු කිරීමෙන්, කල් පවතින සබඳතා සහ තිරසාර වර්ධනය ගොඩනැගීමට අවශ්‍ය අත්තිවාරම් අපි ශක්තිමත් කළෙමු. අපගේ ප්‍රධාන කාර්යසාධන දර්ශක මගින් තහවුරු කරන ලද පහත විස්තර කර ඇති ප්‍රතිඵලවලින්, අපගේ ගනුදෙනුකාර ප්‍රාග්ධන මූලපිරීම් සහ බැංකුවේ මෙහෙයුම් ඔරොත්තු දීම, වෙළෙඳපොල කීර්තිනාමය සහ මූල්‍ය ස්ථාවරත්වය අතර පැහැදිලි සහ බලගතු සම්බන්ධයක් පෙන්නුම් කරයි.

### 4.1 ආයෝජනයේ සිට බලපෑම දක්වා

උපායමාර්ගික ගනුදෙනුකාර මූලපිරීම් පිළිබඳ අපගේ අවධානය තුළින් තිරණාත්මන මානයන් පහක් හරහා මැනියහැකි වටිනාකම ලබා දී ඇත:

- **වැඩි කළ ගනුදෙනුකාර විශ්වාසය සහ විශ්වාසනීයත්වය:** වැඩිදියුණු කළ ගනුදෙනුකාර තෘප්තිමත් ලකුණු සහ අඩු කළ පැමිණිලි මගින් සනාථ වන පැහැදිලි, සරල භාෂා සන්නිවේදනයන් සහ විනිවිද නිෂ්පාදන අනාවරණ කිරීම් හරහා ශක්තිමත් කරන ලද ගනුදෙනුකාර සබඳතා.
- **ඇතුළත් සහ ප්‍රවේශ විය හැකි සේවා සැපයීම:** ජ්‍යෙෂ්ඨ සහ විවිධ හැකියාවන් ඇති ගනුදෙනුකරුවන්ට විශ්වාසයෙන් හා ස්වාධීනත්වයෙන් සම්බන්ධ වීමට හැකි ශාඛා සහ ඩිජිටල් වේදිකා හරහා පුළුල් කළ බාධක රහිත ප්‍රවේශය.
- **ප්‍රතිචාරාත්මක සහ සංවේදී සහාය:** විශේෂ උපකාරක මාර්ග, සරල කළ ලේඛනගතකරණය සහ බලගැන්වූ ඉදිරි පෙළ කණ්ඩායම් හරහා වර්ධිත පළමු සම්බන්ධතා විසඳුම සහ ගනුදෙනුකාර අත්දැකීම්
- **මානුෂික ස්පර්ශයක් සහිත ඩිජිටල් සක්‍රීය කිරීම:** ගනුදෙනුකරුවන්ට සම්මුතියක් නොමැතිව තමා කැමති මාර්ගය තෝරා ගත හැකි බව සහතික කරන ශාඛාව තුළ සහාය පවත්වා ගනිමින් ක්‍රමයෙන් වැඩිදියුණු කළ වෙබ් අඩවි සහ ජංගම යෙදුම් ප්‍රවේශ්‍යතාව.
- **සදාචාරයට එකඟ වූ වෙළෙඳපොල චර්යාව:** මහ බැංකුවේ රෙගුලාසිවලට, විනිවිද අලෙවිකරණයට දැඩිව අනුකූලවීම සහ නොමඟ යවන හිමිකම් හෝ සැඟවුණු නියමයන් තුරන් කිරීම තුළින් ශක්තිමත් කළ ගනුදෙනුකාර ආරක්ෂාව.

### 4.2 ගනුදෙනුකාර ප්‍රාග්ධන වටිනාකම් ලකුණු කාඩ්පත

අපගේ ඉතාමත් වැදගත් වෙළෙඳපොල වත්කම වන අපගේ ගනුදෙනුකරුවන් ඵලදායීව කළමනාකරණය සඳහා, බැංකුව ප්‍රමුඛ සහ පසුගාමී ගනුදෙනුකාර ප්‍රාග්ධන දර්ශකවල සමබර කට්ටලයක් නියාමනය කරයි. මෙම මිනුම් අපගේ සම්බන්ධතා සෞඛ්‍යය පිළිබඳ තීරණාත්මක අවබෝධයක් ලබා දෙයි, තෘප්තිය සහ ප්‍රතිචාරාත්මක බව වැනි ප්‍රමුඛ දර්ශක හරහා අනාගත පක්ෂපාතිත්වය පුරෝකථනය කරන අතරම, පසුම්බියේ රඳවා තබා ගැනීම සහ කොටස වැනි පසුගාමී දර්ශක හරහා ප්‍රතිඵල මැනීම සිදු කරයි. මෙම විනයගරුක ලුහුබැඳීම අපගේ ගනුදෙනුකාර විධිනියෝගය ශක්තිමත් කිරීම සඳහා මූලික වන අතර, නොසැලෙන සේවා විශිෂ්ටත්වය සහ සදාචාරාත්මක හැසිරීම පවත්වා ගනිමින් අපට සබඳතා ගැඹුරු කළ හැකි බව සහතික කරයි. පහත වගුවේ මෙම ප්‍රධාන ක්ෂේත්‍ර හරහා අපගේ කාර්යසාධනය විස්තර කෙරේ.

| දර්ශක වර්ගය | මිනුම් ක්ෂේත්‍රය | මූලික කාර්යසාධන දර්ශක | ඒකක | 2025 | 2024 | ප්‍රවනතාව |
|---|---|---|---|---|---|---|
| ප්‍රමුඛ දර්ශක | ගනුදෙනුකාර සහභාගිත්වය | සක්‍රීය ඩිජිටල් පරිශීලකයින් | ගණන | 801,437 | 618,314 | වැඩිකළ |
| | පැමිණිලි කළමනාකරණය | විසඳන ලද පැමිණිලි | % | 90.6 | 92.5 | අඩුකළ |
| පසුගාමී දර්ශක | වෙළෙඳපොල ලඟාවීම | මුළු සක්‍රීය ගිණුම් ගණන | ගණන | 10.5 Mn. | 10.4 Mn. | වැඩිකළ |
| | ප්‍රවේශ්‍යතා බලපෑම | සහය මාර්ග හරහා මුළුගනුදෙනු | ගණන | 17.6 Mn. | අදාළ නැත | අදාළ නැත |

වගුව 19

**වෙනත් ප්‍රාග්ධන සමඟ විභව සමතුලිතතා හා සහක්‍රියා**

- **මූල්‍ය ප්‍රාග්ධනය සමඟ විභව සමතුලිතතා:** ගනුදෙනුකාර අධ්‍යාපනය, ප්‍රවේශ්‍යතා වැඩිදියුණු කිරීම් සහ සේවා වර්ධනයන් සඳහා ආයෝජනය කිරීම සඳහා අපි ඉහළ කෙටි කාලීන පිරිවැයක් පිළිගනිමු, එමඟින් ඉහළ දිගුකාලීන පක්ෂපාතිත්වයක් සහ ආදායම් ස්ථාවරත්වයක් ලබා ගනිමු.
- **සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය සමඟ සහක්‍රියා:** විනිවිද සහ සදාචාරාත්මක ගනුදෙනුකාර භාවිතයන් තුළින් ගොඩනගා ඇති විශ්වාසය, බැංකුවේ මෙහෙය වීමට ඇති සමාජ බලපත්‍රය සෘජුවම ශක්තිමත් කරන අතර ප්‍රජාවන් තුළ අපගේ කීර්තිනාමය වැඩි කරයි.
- **බුද්ධිමය ප්‍රාග්ධනය සමඟ සහක්‍රියා:** බලගැන්වූ, මනාව පුහුණුව ලත් සේවකයින් උසස් ගනුදෙනුකාර අත්දැකීම් ලබා දෙන අතර, හැකියාව, තෘප්තිය සහ පක්ෂපාතිත්වය පිළිබඳ ශක්තිමත් කිරීමේ චක්‍රයක් නිර්මාණය කරයි.
- **ස්වභාවික ප්‍රාග්ධනය සමඟ සහක්‍රියා:** බොහෝ ගනුදෙනුකරුවන් විසින් අගය කරනු ලබන මානව සම්බන්ධතාවය ප්‍රතිස්ථාපනය කිරීමට වඩා තාක්ෂණය වැඩිදියුණු කිරීම් සහතික කිරීම සඳහා ඩිජිටල් වේදිකා සහ දත්ත විශ්ලේෂණවල ආයෝජන පරීක්ෂාකාරීව සමතුලිත කරනු ලබයි.

**ඉදිරි දැක්ම: 2026 සහ ඉන් ඔබ්බට ප්‍රමුඛතා**

- **මූල්‍ය ඇතුළත්වීම තියුණු කිරීම:** වැඩිහිටියන්, විවිධ ආබාධිත ගනුදෙනුකරුවන් සහ ග්‍රාමීය ප්‍රජාවන් ඇතුළුව අඩු පහසුකම් සහිත අංශ සඳහා ගැලපෙන විසඳුම් සහ සහාය සේවාවන් පුළුල් කිරීම.
- **පොදු මාර්ග අත්දැකීම වැඩි කිරීම:** සියලුම ස්පර්ශක ස්ථාන හරහා ස්ථාවර, පුද්ගලාරෝපිත සේවාවක් ලබා දීම සඳහා ඩිජිටල් සහ භෞතික මාර්ග බාධාවකින් තොරව ඒකාබද්ධ කිරීම.
- **ගනුදෙනුකාර හඬ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම:** ගනුදෙනුකරුවන් සමඟ එක්ව විසඳුම් නිර්මාණය කිරීමට සහ ගැටළු කල්තියා විසඳීමට තත්‍ය කාලීන ප්‍රතිපෝෂණ මාර්ග පුළුල් කිරීම.
- **මූල්‍ය සාක්ෂරතාවය දියුණු කිරීම:** ඩිජිටල් ආරක්ෂාව, වගකිවයුතු ණය ගැනීම් සහ ඉතුරුම් විනය පිළිබඳ පාරිභෝගික අධ්‍යාපන මූලපිරීම් පුළුල් කිරීම.
- **සදාචාරාත්මක අලෙවිකරණය අනුකූල කිරීම (Embed ethical marketing):** නියාමන ප්‍රමිතීන් ඉක්මවා යමින් සහ පාරිභෝගික විශ්වාසය තහවුරු වන පරිදි නිෂ්පාදන ලේබල් කිරීම සහ සන්නිවේදනය අඛණ්ඩව පිරිපහදු කිරීම.

## ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය

**ස්ථාවරත්වය ආරක්ෂා කිරීම හා විශ්වාසය ශක්තිමත් කිරීම අපගේ නිෂ්පාදන ප්‍රාග්ධන ගමන්මඟ: භාරකාරත්වයේ සිට මැනියහැකි වටිනාකම දක්වා**

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේදී, අපගේ ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය යන්නෙන් අපි තෙවැනි පාර්ශව සමඟ ඇති කර ගන්නා උපායමාර්ගික සම්බන්ධතා නියෝජනය කරන අතර එය අපගේ ලඟාවීම පුළුල්කර, අපගේ හැකියාවන් වැඩි කර, අපගේ බලපෑම විශාලනය කරයි.

මහජන විධිනියෝගය සහිත ශ්‍රී ලංකාවේ ආරක්ෂිතම බැංකුව ලෙස, අපගේ අභ්‍යන්තර මෙහෙයුම්වලට යොදා ගන්නා විනය සමඟ අපි ව්‍යාපාර හවුල්කාරත්වයන් කළමනාකරණය කරන අතර එය සේවා විශිෂ්ටත්වය, නව්‍යකරණය හා තිරසාර වර්ධනය සඳහා පාලනය, අනෝන්‍ය වටිනාකම් නිර්මාණය, සහ කාර්යසාධන වගකීම් හා සම්බන්ධ වේ.

අපගේ හවුල්කරුවන්ට රජයේ ආයතන, ෆින්ටෙක් සපයන්නන්, අනුරූප බැංකු, සේවා විකුණුම්කරුවන් සහ බෙදාහැරීමේ මාර්ග ඇතුළත් වේ.

ඒවා ගනුදෙනුකරුවන්ට හා ජාතියට සේවය කිරීමට අපට ඇති හැකියාව සාමූහිකව ශක්තිමත් කරයි.


2025 දී, ඒකාබද්ධ ඩිජිටල් විසඳුම්, මූලික බැංකුකරණයෙන් ඔබ්බට විශේෂිත හැකියාවන් සඳහා අවශ්‍යතාව, සහ සාමූහික වටිනාකම උපරිම කරමින් තෙවැනි පාර්ශව අවදානම කළමනාකරණය කිරීමේ විධාන සඳහා වැඩි වන ඉල්ලුම වැඩිකරමින් ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය හැඩගස්වන ලදී.

### 1 අපගේ ප්‍රාග්ධන පදනම්

බැංකුවේ ව්‍යාපාර හවුල්කාර සම්බන්ධතා අනෝන්‍ය විශ්වාසය හා බැඳුනු හිමිකම් තුළ පදනම දමා ඇත. පැහැදිලි රජයේ ඇපයක් සහිත රජයට අයත් ආයතනයක් ලෙස අපි දැඩි ප්‍රමිති සහිත හවුල්කාරත්වයන්ට ප්‍රවේශ වන අතර එය සාමූහික වටිනාකම් නිර්මාණය ශක්තිමත් කරමින් අපගේ කීර්තිනාමය, ගනුදෙනුකරුවන්, සහ පාර්ශ්වකරුවන් ආරක්ෂා කරයි.

අපගේ වටිනාකම ලබාදීම පුළුල් ජාලයක් මත රඳා පවතින අතර එයට සැපයුම්කරුවන්, බාහිර සේවා සපයන්නන්. තාක්ෂණික හා ගෙවීම් පරිසර පද්ධති හවුල්කරුවන්, උපායමාර්ගික සංධාන, සහ ක්ෂේත්‍රයේ ආයතන ඇතුළත් වේ.

මෙම හවුල්කාර පරිසර පද්ධතිය එදිනෙදා අඛණ්ඩතාවය (පරිශ්‍ර සහ ආරක්ෂාක සේවා වැනි), පරිනාමන ලබාදීම (තොරතුරු තාක්ෂණ පද්ධති සහ ඩිජිටල් බලගැන්වීම) සහ අංශය අතර අන්තර් මෙහෙයුම් හැකියාවට (ගෙවීම් ජාලය හා ක්ෂේත්‍රයේ ආයතන) සහය වේ.




### 1 අපගේ ප්‍රාග්ධන පදනම්

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද රාමු, නිසි සම්ප්‍රජන්‍ය පෙරාතු ලේඛණ, සේවා මට්ටමේ ගිවිසුම් සහ සියලුම තෙවන පාර්ශවීය සබඳතා පාලනය කරන සදාචාරාත්මක ප්‍රමිතීන් මත පදනම් වූ පාලනය.

### 2 අපි හැකියාව ශක්තිමත් කරන ආකාරය

වැඩිදියුණු කළ හවුල්කාර ඇතුළත් කර ගැනීම්, කොන්ත්‍රාත් සහ කාර්යසාධන කළමනාකරණය, ඒකාබද්ධ අවදානම් නියාමනය සහ හැකියා වර්ධනය සඳහා හවුල් මුලපිරීම්.

### 3 අපි ප්‍රතිඵල ශක්තිමත් කරන ආකාරය

ඒකාබද්ධ මාර්ග හතර පහත දැක්වේ:

- මෙහෙයුම් විශ්වසනීයත්වය සහ සේවා අඛණ්ඩතාව
- නවෝත්පාදන වේගවත් කිරීම සහ හැකියාවන් වැඩිදියුණු කිරීම
- වගකීම සහ තිරසාර ප්‍රසම්පාදනය
- අන්‍යෝන්‍ය වර්ධනය සහ හැඩගැස්වූ වටිනාකම් නිර්මාණය

### 4 මෙයින් ලබාදෙන දෑ

වැඩිදියුණු කළ හවුල්කාර කාර්යසාධන මිනුම්, හවුල්කාරිත්වයන් හරහා ශක්තිමත් සේවා සැපයීම, තෙවන පාර්ශවීය අවදානම් සිදුවීම් අඩු වීම සහ හවුල්කාර මාර්ග හරහා පුළුල් පාරිභෝගික ප්‍රවේශයක්.

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

## 1.1 පාලනය හා අධීක්ෂණය

ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනයේ භාරකාරත්වය ආයතනික විනයකින් පාලනය වන අතර, අපගේ හවුල්කරුවන් අපගේ සන්නාමය සහ බලපෑම පුළුල් කරන බව හඳුනා ගනී.

අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අධීක්ෂණය ආරම්භ වන අතර, එය හවුල්කාරිත්වයන් සඳහා උපායමාර්ගික දිශාව සකසමින් අවදානම් කළමනාකරණය සහ වටිනාකම් නිර්මාණය අපගේ හවුල්කාර සබඳතාවලට ඇතුළත් කරන රාමු අනුමත කරයි.

- **අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද හවුල්කාරිත්ව රාමුව:** විස්තීර්ණ රාමුවක් මගින් හඳුනාගැනීමේ සහ නිසි සම්ප්‍රජන්‍ය සිට කොන්ත්‍රාත් කිරීම, කාර්යසාධන නියාමනය සහ පිටවීමේ කළමනාකරණය දක්වා අවසාන හවුල්කාර ජීවන චක්‍රය පාලනය කරන අතර සියලුම තෙවන පාර්ශවීය සබඳතා හරහා අනුරූපතාව සහ විනය සහතික කරයි

- **අවදානම් මත පදනම් වූ නිසි සම්ප්‍රජන්‍ය:** සියලුම විභව හවුල්කරුවන් මූල්‍ය ස්ථායිතාව, මෙහෙයුම් හැකියාව, නියාමන අනුකූලතාව, කීර්තිනාමය සහ බැංකුවේ සදාචාර ප්‍රමිතීන් සමඟ පෙළගැස්වීම ආවරණය වන පරිදි දැඩි තක්සේරුවකට භාජනය වේ. ඉහළ අවදානම් හෝ උපායමාර්ගික හවුල්කාරිත්වයන් සඳහා වැඩි දියුණු කළ නිසි සම්ප්‍රජන්‍ය අදාළ වේ.

- **විධායක-කළමනාකරණය කරන ලද හවුල්කාර පාලනය:** ආයතනික කළමනාකරණය, නම් කරන ලද සම්බන්ධතා හිමිකරුවන් සහ පාලන කමිටු හරහා, හවුල්කරු කාර්යසාධනය, කොන්ත්‍රාත් අනුකූලතාවය සහ ගැටළු උත්සන්න කිරීම අධීක්ෂණය කරයි. වැදගත් හවුල්කාරිත්වයන් නිතිපතා විධායක සමාලෝචනයට ලක් වේ.

- **කොන්ත්‍රාත් සහ සේවා මට්ටමේ ගිවිසුම් විනය:** ප්‍රමිතිගත ගිවිසුම් මාර්ගකවලට පැහැදිලි සේවා මට්ටම්, කාර්යසාධන මිණුම්, වාර්තා කිරීමේ බැඳීම්, අවසාන කිරීමේ අයිතිවාසිකම් සහ විගණන විධිවිධාන ඇතුළත් වේ. නීතිමය සහ අනුකූලතා කණ්ඩායම් ක්‍රියාත්මක කිරීමට පෙර අවශ්‍ය කොන්ත්‍රාත් සමාලෝචනය කරයි.

- **තුන්වන පාර්ශවීය අවදානම් කළමනාකරණය:** ඒකාබද්ධ අවදානම් රාමු, හවුල්කරු විවේචනාත්මකභාවය මත පදනම්ව උත්සන්න අධීක්ෂණයක් සමඟ මෙහෙයුම්, අනුකූලතාව, කීර්තිනාමය සහ සංකේන්ද්‍රණ අවදානම් ඇතුළුව හවුල්කරුට අදාළ අවදානම් නියාමනය කරයි.

මෙම ව්‍යූහගත පාලනය මගින් ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය සඳහා වගවීම සාමූහික වර්ධනය වැඩි කරමින් අපගේ විධිනියෝගය ආරක්ෂා කරමින් බැංකුවේ උපායමාර්ගික ක්‍රියාත්මක කිරීමට පැහැදිළි, මැනියහැකි සහ අත්‍යවශ්‍ය බව සහතික කරයි.

## 1.2 භාරකාරත්ව පදනම්

- **ප්‍රසම්පාදනය සහ විකුණුම්කරුවන් තෝරා ගැනීමේදී සාධාරණත්වය සහ විනිවිදභාවය:** අපි අපගේ සැපයුම්කරුවන් උපායමාර්ගික හවුල්කරුවන් ලෙස සලකනු ලබන අතර, ඔවුන්ගෙන් ගුණාත්මකභාවය, සේවාව සහ ආචාර ධර්ම පිළිබඳ ඉහළම ප්‍රමිතීන් අපි අපේක්ෂා කරමු. **බැංකුවේ ප්‍රසම්පාදන ව්‍යවහාර මගින් ප්‍රධාන වශයෙන් දේශීය සැපයුම්කරුවන් සමඟ සහයෝගයෙන්, ප්‍රජා සහභාගීත්වය වැඩි කිරීම සහ ජාතික ආර්ථික වර්ධනයට සහාය වීම මගින් දේශීය සැපයුම් දාම ශක්තිමත් කිරීම අවධාරණය කරයි.**[LA]

- **බාහිරින් ලබාගත් සහ තෙවන පාර්ශවීය සේවාවන්හි අඛණ්ඩතාව සහ ඔරොත්තු දීම:** මෙයට තීරණාත්මක තාක්ෂණය, ආරක්ෂාව සහ මාර්ගස්ථ මුදල් මෙහෙයුම් ඇතුළත් වන අතර, එහිදී ගනුදෙනුකාර විශ්වාසය සහ මෙහෙයුම් ස්ථාවරත්වය සඳහා අඛණ්ඩ සේවා සැපයීම අත්‍යවශ්‍ය වේ.

- **අදාළ අවස්ථාවලදී සැපයුම් දාමයේ සදාචාරාත්මක සහ තිරසාර අපේක්ෂාවන් :** තීරණ ගැනීමේදී ආර්ථික, සමාජීය සහ පාරිසරික බලපෑම් ඒකාබද්ධ කරමින්. තිරසාරභාවය අපගේ ප්‍රසම්පාදන උපාය මාර්ගයට පහසුවෙන් ඇතුළත් කර ඇත. ESG මූලධර්මවලට අනුකූලව පරිසර හිතකාමී සැපයුම්කරුවන්ට ප්‍රමුඛත්වය දෙමින් ද්‍රව්‍ය වගකීමෙන් යුතුව ලබා ගන්නා බව මෙය සහතික කරයි.

- **ගනුදෙනු ගිවිසුම්ගතකරණය නොව දිගුකාලීන හවුල්කාරිත්වයන් හරහා අන්‍යෝන්‍ය වටිනාකම් නිර්මාණය:** අපි අපගේ සැපයුම්කරුවන් කාලයත් සමඟ නවෝත්පාදනය, කාර්යක්ෂමතාව සහ පිරිවැය ප්‍රශස්තිකරණය මෙහෙයවන කල් පවතින සබඳතා ගොඩනඟන උපායමාර්ගික හවුල්කරුවන් ලෙස සලකමු.

## 2 අපි හැකියාව ශක්තිමත් කරන ආකාරය

2025 දී, බැංකුව තිරසාර පෙළ ගැසීම ශක්තිමත් කරමින්, සැපයුම්කාර පාලනය, තෙවන පාර්ශව ඔරොත්තුදීම ගොඩනැගීම, සහ නව්‍යකරණය හා ඇතුළත්වීම වේගවත් කිරීමට හවුල්කාරත්වයන් භාවිතා කරමින් ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය ශක්තිමත් කරන ලදී.

## 2.1 වගකීම්සහගත ප්‍රසම්පාදනය හා සැපයුම්කරුවන් පාලනය

තිරසාර සහ සදාචාර ප්‍රසම්පාදන ව්‍යවහාර බැංකුවේ ප්‍රවේශයට මූලික වේ. ප්‍රසම්පාදනය හුදෙක් මෙහෙයුම් අවශ්‍යතාවක් පමණක් නොවේ. එය බැංකුව හා එහි දිගුකාලීන පාර්ශ්වකරුවන්ට දිගුකාලීන වටිනාකම ජනනය කරමින් සදාචාර මූලාශ්‍රකරණය, විනිවිදභාවය සහ තිරසාරතාව නගා සිටුවන සැලසුම් කළ උපායමාර්ගික මූලපිරිමකි.

ශක්තිමත් ප්‍රසම්පාදන රාමුවක් තුළින්, සියලුම භාණ්ඩ හා සේවා තරඟකාරිත්වය, පාරිසරික වගකීම සහ සමාජීය අනුකූලතාව සමඟ පෙළ ගැසෙන බව අපි සහතික කරමු.

- **පැහැදිලි සේවා මට්ටමේ අපේක්ෂාවන්, බෙදාහැරීමේ නියාමනය සහ පුනරාවර්තන අසාර්ථකත්වයන් සඳහා දඬුවම්/නිවැරදි කිරීමේ යාන්ත්‍රණයන් නිර්වචනය කිරීම:** අපගේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආර්ථික වටිනාකම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව උපරිම කිරීම, නියමිත ප්‍රමිතීන්, නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම, ලංසුකරුගේ රහස්‍යභාවය ආරක්ෂා කිරීම සහ මෙහෙයුම් කාලරාමු සපුරාලීම සඳහා භාණ්ඩ හා සේවා කඩිනම් බෙදාහැරීම සහතික කිරීම වටා භ්‍රමනය වේ.

- **හැකි සෑම විටම අදාළ කාණ්ඩ (IT උපකරණ, පහසුකම්, ඉදිකිරීම් සහ සේවා) සඳහා ESG -දැනුවත් ප්‍රසම්පාදන නිර්ණායක හඳුන්වා දීම:** වගකිවයුතු ප්‍රසම්පාදනය යටතේ ඇති ප්‍රධාන මූලපිරිමිලට පහත දැ ඇතුළත් වේ:

  - **ගුණාත්මකභාවය, නෛතික අනුකූලතාව, කාර්යසාධන ඉතිහාසය, ආචාර ධර්ම සහ මූල්‍ය ඔරොත්තු දීම ආවරණය කරමින් සැපයුම්කරු නිසි සම්ප්‍රජන්‍ය ශක්තිමත් කිරීම:** අපගේ හවුල්කරුවන් විශ්වසනීයත්වය සහ අඛණ්ඩතාව පිළිබඳ ඉහළම ප්‍රමිතීන් සපුරාලන බව සහතික කිරීම සඳහා අපි පුළුල් තක්සේරු කිරීම් සිදු කරමු. සැපයුම් දාම අවදානම් කළමනාකරණයට සැපයුම්කරුවන් අතර මූල්‍ය අස්ථාවරත්වය, සදාචාරාත්මක ගැටළු සහ නීතිමය අනුකූල නොවීම ආමන්ත්‍රණය කිරීම සඳහා නිසි සම්ප්‍රජන්‍ය ඇතුළත් වේ. මූල්‍ය සේවා ආයතනයක් ලෙස අපගේ මෙහෙයුම්වල ස්වභාවය අනුව, අපගේ සෘජු සැපයුම්කරුවන් ප්‍රධාන වශයෙන් ළමා ශ්‍රමය හෝ බලහත්කාර ශ්‍රම සිදුවීම් සඳහා ඉහළ අවදානමක් ලෙස නොසලකන ශ්‍රී ලංකා අංශ තුළ ක්‍රියාත්මක වන වෘත්තීය සේවා සපයන්නන්, තාක්ෂණික වෙළෙන්දන් සහ කාර්යාල උපකරණ සැපයුම්කරුවන්ගෙන් සමන්විත වේ. කෙසේ වෙතත්, අපගේ සැපයුම්කරු නිසි සම්ප්‍රජන්‍ය රාමුව මගින් මෙහෙයුම් වර්ගය හෝ භූගෝලීය පිහිටීම නොසලකා මෙම සදාචාරාත්මක නිර්ණායකයන්ට අනුව ඇගයීමට ලක් කරන ලද සියලුම අනාගත සැපයුම්කරුවන් සමඟ. ළමා ශ්‍රමය, තරුණ සේවකයින් සඳහා අනතුරුදායක වැඩ සහ ඕනෑම ආකාරයක බලහත්කාර හෝ අනිවාර්ය ශ්‍රමය පැහැදිලිවම තහනම් කරයි, වාර්තාකරණ කාල සීමාව තුළ, අපගේ පුළුල් තක්සේරු කිරීම් මත පදනම්ව එවැනි සිදුවීම් සඳහා සැලකිය යුතු අවදානමක් ඇති බවට කිසිදු මෙහෙයුමක් හෝ සැපයුම්කරුවෙකු හඳුනාගෙන නොමැත.

  - **විවිධාංගීකරණය වූ සැපයුම් දාම:** අවදානම් අවම කිරීම සහ ආර්ථික අවස්ථා උපරිම කිරීම සඳහා සැපයුම්කරු කළඹ තුලනය කිරීම.

  - **සාධාරණ ටෙන්ඩර් ක්‍රියාවලිය:** වෙළෙන්දන් සඳහා සමාන තරඟකාරී මට්ටම් නිර්මාණය කිරීම සඳහා තරඟකාරී සහ අපක්ෂපාතී තේරීම් ක්‍රියාවලියක් පවත්වා ගැනීම.

- පාරිසරික අනුකූලතාවථ සැපයුම්කාර අංශ අදාළ බලධාරීන්ගෙන් අවශ්‍ය අනුමැතීන් ලබා ගනිමින් මූලික පාරිසරික පරීක්ෂණ, සහ පරිසර බලපෑම තක්සේරු වැනි පාරිසරික තක්සේරු සමඟ අනුකූලතාව සහතික කරයි.

## 2.2 තෙවන පාර්ශව ඔරොත්තු දීම සහ අඛණ්ඩතා සූදානම

බාධාරහිත ගනුදෙනුකාර සේවාව සහ මෙහෙයුම් ස්ථාවරත්වය පවත්වා ගෙන යාමට අපගේ හවුල්කාර පරිසර පද්ධතිය හරහා ව්‍යාපාර අඛණ්ඩතාව සහතික කිරීම අත්‍යවශ්‍ය වේ. අපි මෙය පහත සඳහන් ඉලක්කගත ක්‍රියාමාර්ගවලින් සාක්ෂාත් කර ගනිමු:

- **ප්‍රධාන වෙළෙන්දන් සහ බාහිරින් ලබාගත් සැපයුම්කරුවන් අතර සේවා නිරණාත්මකභාවය සහ සංකේන්ද්‍රණ අවදානම සිතියම්ගත කිරීම:** අපගේ මෙහෙයුම් සඳහා කුමන හවුල්කරුවන් තීරණාත්මක වන්නේද යන්න පිළිබඳ පුළුල් අවබෝධයක් අපි පවත්වා ගෙන යන අතර තනි සැපයුම්කරුවෙකු මත අධික ලෙස යැපීම වළක්වා ගැනීම සඳහා සංකේන්ද්‍රණ අවදානම සක්‍රීයව නියාමනය කරමු.
- **තීරණාත්මක සේවා සඳහා වන කොන්ත්‍රාත්වල අඛණ්ඩතා වගන්ති සහ ප්‍රතිසාධන අපේක්ෂාවන් ඇතුළත් කර, හැකි සෑම තැනකම සූදානම පරීක්ෂා කිරීම:** සියලුම තීරණාත්මක සේවා කොන්ත්‍රාත්වල ප්‍රතිසාධන හැකියාවන් නිතිපතා පරීක්ෂා කිරීමත් සමඟ පැහැදිලි ව්‍යාපාර අඛණ්ඩතා විධිවිධාන ඇතුළත් වේ.
- **අක්‍රීය කාලය සහ ගනුදෙනුකාර බලපෑම අඩු කිරීම සඳහා සිදුවීම් උත්සන්න කිරීම සහ හවුල් ගැටළු විසඳීම ශක්තිමත් කිරීම:** පැහැදිලි උත්සන්න කිරීමේ පෙරාතුලේඛන මගින් තෙවන පාර්ශවයන් සම්බන්ධ යම් සේවා බිඳවැටීමක් සහයෝගී ගැටළු විසඳීම හරහා ඉක්මනින් විසඳනු ලබන බව සහතික කරන අතර එමඟින් ගනුදෙනුකරුවන් මත බලපෑම අවම කරයි.

GRI 407-1

## 2.3 දෙයාකාර සංවාදය හා කාර්යසාධනය වර්ධනය

ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනයට අපගේ ප්‍රවේශයේ මූලාධාරය වන්නේ අපගේ විකුණුම්කරුවන්, සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන් සමඟ අඛණ්ඩ, විවෘත, සහ උපකාරී සන්නිවේදනය පවත්වා ගැනීමයි. මේ මගින් බැංකුවේ සේවා විශිෂ්ටත්ව ප්‍රමිති සමඟ පෙළ ගැසීම සහතික කරන අතර විශ්වාසය හා දිගුකාලීන හවුල්කාරත්වයන් පෝෂණය කරයි.

- **ගුණාත්මක පරතර පියවා ගැනීමට සහ බෙදා හැරීමේ විනය වර්ධනය කිරීමට ව්‍යූහගත කාර්යසාධන සමාලෝචන සහ ප්‍රතිපෝෂණ මාර්ග:** කාලානුරූපී කාර්යසාධන සමාලෝචන මගින් සැපයුම්කරු සහ සේවා සපයන්නාගේ කාර්යසාධනය කාලීනබව, ගුණාත්මකභාවය සහ අනුකූලතාව වැනි මූලික දර්ශකවලට අනුව තක්සේරු කරයි.
- **අවශ්‍ය අවස්ථාවේදී ආරක්ෂාව, අනුකූලතාව සහ සේවා අපේක්ෂාවන් පිළිබඳ හවුල්කාර සාරාංශ/වැඩමුළු විකුණුම්කරුවන්, සහ හවුල්කරුවන් ක්ෂේත්‍රවේ මනා පරිචයන්, නියාමන අවශ්‍යතා සහ බැංකුවේ වෙනස්වන ව්‍යාපාර අවශ්‍යතා සමඟ යාවත් වී සිටින බව සහතික කිරීමට වැඩමුළු, සාරාංශ සහ තොරතුරු සැසි සංවර්ධනය කිරීම.**
- **ගනුදෙනුකාර සේවය, ආරක්ෂාව සහ අඛණ්ඩතාවයට බලපාන පුනරාවර්තන ගැටළු සඳහා හවුල් වර්ධන සැලසුම්:** සහයෝගී ගැටළු විසඳීම මගින් අනෝන්‍ය සාකච්ඡා තුළින් සක්‍රීයව අභියෝග ආමන්ත්‍රණය කරන අතර විභව සේවා බිඳවැටීම් ඵලදායීව අවම කරන බව සහතික කරයි.

## 2.4 බාහිර සේවා සපයන්නන්ට වටිනාකම ලබාදීම

IT යටිතලපහසුකම්, ආරක්ෂක සේවා, පහසුකම කළමනාකරණය, සහ ඩිජිටල් පරිනාමනය වැනි විවිධ කාර්යයන් සඳහා බැංකුව බාහිර සේවා සපයන්නන් කෙරෙහි විශ්වාසය තබයි. මෙවැනි සපයන්නන්ට ප්‍රමාණවත් සහය ලබාදීම මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ සේවා විශිෂ්ටත්වය පවත්වා ගෙන යාමේදී තීරණාත්මකය.

- **සාධාරණ වැටුප් ගෙවීම සහ කාලෝචිත ගෙවීම්:** සියලුම බාහිරින් ලබාගත් සේවා සපයන්නන්ට සැපයුම්කරු ජාලය තුළ මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගනිමින්, ඔවුන්ගේ සේවාවන් සඳහා කඩිනම් ගෙවීම් අපි සහතික කරමු. වර්ෂය තුළ, අපි අපගේ බාහිරින් ලබාගත් සේවා සපයන්නන්ට රු. මිලියන 744.3 ක් ගෙවා ඇත.
- **ධාරිතාව වැඩි දියුණු කිරීම:** සේවා ගුණාත්මකභාවය සහ මෙහෙයුම් ඵලදායිත්වය වැඩි දියුණු කිරීම සඳහා අපි තාක්ෂණික සහාය, දැනුම බෙදා ගැනීමේ අවස්ථා සහ තාක්ෂණ ඒකාබද්ධ කිරීමේ සහාය ලබා දෙන්නෙමු.
- **දිගුකාලීන උපායමාර්ගික හවුල්කාරිත්වයන්:** ප්‍රධාන සේවා සපයන්නන් සමඟ කල් පවතින සබඳතා ගොඩනඟා ගැනීම කාලයත් සමඟ නවෝත්පාදනය, කාර්යක්ෂමතාව සහ පිරිවැය ප්‍රශස්තිකරණයට හේතු වේ.

## 2.5 ගනුදෙනුකරුවන් හා තිරසාර ප්‍රතිඵල පුළුල් කරන උපායමාර්ගික ඔරොත්තුදීම

බැංකුව, එහි සේවා පිරිනැමීම් පුළුල් කිරීම, සහක්‍රියා උත්තේජනය කිරීම සහ මූල්‍ය ඇතුළත් කිරීම ඇති කිරීම සඳහා මූල්‍ය ආයතන, තාක්ෂණ සමාගම්, දේපළ වෙළඳාම් සංවර්ධකයින් සහ නියාමන ආයතන සමඟ උපායමාර්ගික සන්ධාන සක්‍රීයව වර්ධනය කරයි.

- බෙදාහැරීමේ ලඟාවීම පුළුල් කරන හවුල්කාරිත්වයන් ඩිජිටල් හැකියාව වැඩිකර, ඉලක්කගත ඇතුළත් කිරීමේ ප්‍රතිඵල වැඩි කරයි:
  - **මූල්‍ය ආයතන සමඟ සහයෝගීතාවය:** දේශසීමා ප්‍රේෂණ විසඳුම්, සම-සන්නාමගත මූල්‍ය නිෂ්පාදන සහ පුළුල් ණය දීමේ හැකියාවන් සඳහා දේශීය සහ ජාත්‍යන්තර බැංකු සමඟ හවුල් වීම.
  - **තාක්ෂණික හවුල්කාරිත්වයන්:** ඩිජිටල් බැංකුකරණ නවෝත්පාදන වේගවත් කිරීම, සයිබර් ආරක්ෂණ පියවර වැඩිදියුණු කිරීම සහ ගනුදෙනුකාර අත්දැකීම් වැඩිදියුණු කිරීම සඳහා මූල්‍ය තාක්ෂණ සමාගම් සමඟ සහභාගි වීම.
  - **දේපළ වෙළඳාම් සහ නිවාස අංශයේ හවුල්කාරිත්වයන්:** ගනුදෙනුකරුවන්ට දැරිය හැකි නිවාස මූල්‍යකරණ විසඳුම් ලබා දීම සඳහා දේපළ සංවර්ධකයින් සහ ඉදිකිරීම් සමාගම් සමඟ වැඩ කිරීම.
  - **නියාමන සහ රජයේ සන්ධාන:** මූල්‍ය සාක්ෂරතාවය, ආර්ථික ස්ථාවරත්වය සහ බැංකු අංශයේ වර්ධනය ප්‍රවර්ධනය කරන ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා මහ බැංකුව, මුදල් අමාත්‍යාංශය සහ අනෙකුත් නියාමන ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- **අදාළ අවස්ථාවල තිරසාරතාව හා බැඳුණු විසඳුම්වලට සහයවීමට සහයෝගීතාවය හේලිස්** සෝලර් සමඟ අපගේ හවුල්කාරත්වය පුනර්ජනනීය බලශක්ති යොදා ගැනීම සහ තිරසාර ව්‍යවහාර ප්‍රවර්ධනය කිරීමට අපගේ බැඳීම නිදසුන් ගෙන හැර දක්වයි.
- **අන්තර් මෙහෙයුම්, ප්‍රමිති හා අංශයේ ඉගෙනුම් ශක්තිමත් කරන ක්ෂේත්‍රයේ සාමාජිකත්වයන්:** අපි බැංකුවේ ගනුදෙනු ප්‍රවර්ධනය කිරීමට, සෑම ප්‍රජාවක් වෙත අපගේ ලඟාවීම පුළුල් කිරීමට අපගේ තැපැල් ජාලය සමඟ සක්‍රීයව සහභාගි වෙමු.

## 2.6 ක්ෂේත්‍රයේ සාමාජිකත්වයන්: ප්‍රගතිගාමී මූල්‍ය ප්‍රතිපත්තිවලට පක්ෂවීම

ප්‍රගතිගාමී බැංකුකරණ ප්‍රතිපත්ති, නව්‍යකරණය, සහ තිරසාර ආර්ථික ව්‍යවහාර සඳහා සහයවීමට බැංකුව ක්ෂේත්‍රයේ සංසද, මූල්‍ය සංගම්, සහ නියාමන කමිටු සමඟ සක්‍රීයව සහභාගි වේ.

## සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

**සක්‍රිය සාමාජිකත්වයට පහත දැ ඇතුළත්ය.**[LA]

- ජාතික වාණිජ මණ්ඩලය
- ලංකා ක්ලියර් පුද්ගලික සමාගම
- ලංකා සේවා යෝජක සංගමය
- ලෝවවටා අන්තර් බැංකු මූල්‍ය සන්නිවේදන සඳහා සමාජය (SWIFT)
- ශ්‍රී ලංකා SWIFT පරිශීලක සමූහය
- ලෝක ඉතුරුම් බැංකුකරණ ආයතනය

**ප්‍රතිපත්ති සාකච්ඡාවල සක්‍රිය සහභාගිත්වය:** අපි ජාතික මූල්‍ය උපායමාර්ග සහ ඩිජිටල් පරිනාමන මාර්ග සිතියමටය දායක වීමට රජයේ පාර්ශ්වකරුවන් සහ මූල්‍ය නියාමකයින් සමඟ සහභාගි වෙමු.

**පර්යේෂණ හා සංවර්ධන දායකත්වයන්:** අපි මූල්‍ය අංශයේ පර්යේෂක මූලපිරීම්වලට විශේෂයෙන් මූල්‍ය ඇතුළත්වීම, ඩිජිටල් බැංකුකරණ වෙනස්වීම සහ නියාමන වර්ධනයන්ය සහය වෙමු.

ක්ෂේත්‍රයේ සක්‍රිය සාමාජිකත්වයන් පවත්වා ගනිමින්, බැංකුව බැංකු අංශයේ වෙනස්වීම්වලදී පෙරමුණේ සිටින අතර ඉනාත්මක වෙනස්වීම්වලට ඉලපෑම් කරමින් ගෝලීය මූල්‍ය ප්‍රමිති සමඟ පෙළ ගැසීම සහතික කරයි.

## 3 අපි ප්‍රතිඵල ශක්තිමත් කරන ආකාරයි

සහයෝගීතාවය ස්ථාවර කාර්යසාධනය, විශ්වාසදායක සේවා සැපයීම, නුවමාරු නවෝත්පාදනය සහ අන්‍යෝන්‍ය වර්ධනයක් හි ප්‍රතිඵලය ඇති කිරීමේදී ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය තිරසාර වටිනාකමක් බවට පරිවර්තනය වේ. සෑම හවුල්කාර සහභාගීත්වය මෙහෙයුම් ස්ථාවරත්වය, සේවා ගුණාත්මකභාවය සහ දිගුකාලීන වටිනාකම් නිර්මාණයට සම්බන්ධ කරන විචක්ෂණ ප්‍රතිඵල මාර්ග රාශියක් හරහා බැංකුව මෙය සක්‍රිය කරයි. සැපයුම්කරු පාලනය, තෙවන පාර්ශවීය ඔරොත්තු දීම සහ උපායමාර්ගික සන්ධානවල අපගේ ආයෝජන මෙහෙයුම් කාර්යසාධනයට මැනිය හැකි වැඩිදියුණු කිරීම් ලබා දෙන බව සහතික කිරීම සඳහා මෙම මාර්ග නිර්මාණය කරන අතර එමඟින් බැංකුවේ දිගුකාලීන තරඟකාරිත්වය ශක්තිමත් වේ.

| ප්‍රතිඵල මාර්ග | මූලික ජයග්‍රහ | ගනුදෙනුකාර වටිනාකම | බැංකුවට නිර්මාණය කළ වටිනාකම |
|---|---|---|---|
| **මෙහෙයුම් විශ්වාසය සහ සේවා අඛණ්ඩතාව** | ස්ථාවර විකුණුම්කරුවන්ගේ කාර්යසාධනය, තිරණාත්මක විකුණුම්කරුවන්ගේ BCP/DR පරීක්ෂණ ආවරණය, අඩු විකුණුම්කරුවන්ගේ ආශ්‍රිත බාධා කිරීම් | පුරෝකථනය කළ හැකි හවුල්කාරිත්වයන්, පැහැදිලි සේවා අපේක්ෂාවන්, සාධාරණ ගෙවීම් ව්‍යවහාර | අඛණ්ඩ ගනුදෙනුකාර සේවය, අඩු මෙහෙයුම් අවදානම, සිදුවීම් ආශ්‍රිත පිරිවැය අඩු කිරීම |
| **නව්‍යකරණය වේගවත් කිරීම සහ හැකියා වර්ධනය** | සක්‍රිය කළ නව උපායමාර්ගික සන්ධාන, ඩිජිටල් ගෙවීම් නව්‍යකරණ, ෆින්ටෙක් සහයෝගීතා සක්‍රිය කරන තාක්ෂණික හවුල්කාරිත්වයන්, | බැංකුවේ ජාතික ප්‍රවේශය, සම-නිර්මාණ අවස්ථා, හැකියාවන් ගොඩනැගීමේ සහාය සඳහා ප්‍රවේශය, | නව හැකියාවන් වේගවත් ලෙස සංවර්ධනය, වැඩිදියුණු කළ ඩිජිටල් පිරිනැමීම්, වර්ධිත අන්තර් ක්‍රියාකාරිත්වය |
| **වගකීම්සහගත සහ තිරසාර ප්‍රසම්පාදනය** | ප්‍රධාන කොන්ත්‍රාත් සඳහා 100% ESG පරීක්ෂාව, ශක්තිමත් කළ සැපයුම්කරු නිසි සම්ප්‍රජන්‍ය, 100% දේශීය මූලාශ්‍ර කැපවීම් | සදාචාරාත්මක භාවිතයන් හඳුනා ගැනීම, ESG - අනුකූල සැපයුම්කරුවන් සඳහා මනාපය දිගුකාලීන හවුල්කාරිත්ව ස්ථාවරත්වය | ශක්තිමත් කළ කීර්තිනාමය, අඩු කළ සැපයුම් දාම අවදානම, ජාතික ආර්ථික සංවර්ධනයට දායකත්වය |
| **අන්‍යෝන්‍ය වර්ධනය සහ නුවමාරු වටිනාකම නිර්මාණය** | තිරණාත්මක විකුණුම්කරුවන්ගෙන් 100% ක් සමඟ ව්‍යුහගත කාර්ය සාධන සමාලෝචන, ඒකාබද්ධ වැඩිදියුණු කිරීමේ සැලසුම්, සහයෝගී ගැටළු විසඳීමේ පෙරාතු ලේඛණ | බැංකුවේ හවුල්කාරිත්වය හරහා ව්‍යාපාර වර්ධනය, හැකියාවන් වැඩි දියුණු කිරීම, ස්ථාවර ආදායම් ප්‍රවාහය | ප්‍රශස්ත කළ පිරිවැය සේවය, වර්ධිත විකුණුම්කරුවන්ගේ කාර්යසාධනය, ගැඹුරු හවුල්කරු පක්ෂපාතිත්වය |

### 3.1 මෙහෙයුම් විශ්වාසය හා සේවා අඛණ්ඩතාව

හවුල්කරුවන් විසින් සපයනු ලබන සියලුම සේවා අඛණ්ඩව සහ විශ්වාසදායක ලෙස ක්‍රියාත්මක වන බව සහතික කිරීම අපගේ මෙහෙයුම් විශිෂ්ටත්වයට පදනම වේ. කාර්යසාධන අපේක්ෂාවන් පැහැදිලිව නිර්වචනය කර සහ අඛණ්ඩව නියාමනය කරන බව සහතික කරමින් විකුණුම්කරුවන්ගේ පාලනය ශක්තිමත් කිරීම කෙරෙහි අපි අවධානය යොමු කර ඇත.

- **විනයගරුක සැපයුම්කාර කාර්යසාධන කළමනාකරණය තුළින් මෙහෙයුම් විශ්වාසය අඛණ්ඩතා අපේක්ෂාවන්**

  අපගේ ශක්තිමත් පාලන රාමුව මඟින් හවුල්කරුවන් පැහැදිලිව නිශ්චිත සේවා මට්ටමේ ගිවිසුම්වලට අනුකූලව අඛණ්ඩව සැපයීම සහතික කෙරේ. කාලීන බව ගුණාත්මකභාවය සහ අනුකූලතාව වැනි ප්‍රධාන දර්ශකවලට අනුව නිරන්තර කාර්යසාධන තක්සේරු කිරීම් අඛණ්ඩ වර්ධනය සිදු කිරීමට හේතු වේ. පුළුල් උත්සන්න කිරීමේ චර්යාවන් මඟින් ඕනෑම සේවා අපගමනය වහාම සලකුණු කර, ආමන්ත්‍රණය කර, සහයෝගී ගැටළු විසඳීම හරහා විසඳා ඇති බව සහතික කර, බැංකු මෙහෙයුම් සහ ගනුදෙනුකාර අත්දැකීම් කෙරෙහි ඇති විය හැකි අහිතකර බලපෑම අවම කිරීමට දායක වේ.

- **ශක්තිමත් මාර්ග විශ්වාසය හා උත්සන්න පුරුදු හරහා අඩුකළ සේවා බිඳවැටීමේ අවදානම**

  තීරණාත්මක වෙළෙඳ සිතියම්ගත කිරීම, වැඩිකළ යටිතල පහසුකම් නිරීක්ෂණය සහ හවුල් ව්‍යාපාර අඛණ්ඩතා පරීක්ෂණ ක්‍රියාත්මක කිරීම හරහා, අපි වෙළෙඳ ආශ්‍රිත බාධා සැලකිය යුතු ලෙස අඩු කර ඇත. විස්තීර්ණ උත්සන්න කිරීමේ පෙරාතු ලේඛණ මඟින් තෙවන පාර්ශවයන් සම්බන්ධ ඕනෑම සේවා බිඳවැටීමක් සහයෝගී ගැටළු විසඳීම හරහා ඉක්මනින් විසඳනු ලබන බව සහතික කෙරේ. තීරණාත්මක හවුල්කරුවන් සමඟ නිතිපතා පීඩන පරීක්ෂණ සහ ව්‍යාපාර අඛණ්ඩතා පෙරහුරු පහසු සේවා සැපයීම පවත්වා ගැනීමට අපගේ හැකියාව තවදුරටත් ශක්තිමත් කරයි.

## සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

### 3.2 නව්‍යකරණය වේගවත් කිරීම සහ හැකියා වර්ධනය

උපායමාර්ගික හවුල්කාරිත්වයන් බැංකුවේ නව්‍යකරණයේ ප්‍රධාන ධාවකයෙකි. අපි බැංකුවට නව හැකියාවන්, තාක්ෂණයන් රැගෙන එන සංධාන ඇති කරන ලද අතර වේගයෙන් වෙනස්වන වාතාවරණයක් තුළ තරඟකාරීව සිටීමින් ගනුදෙනුකරුවන්ට වඩා යහපත් අයුරින් සේවය කිරීමට අපව ශක්තිමත් කරනු ලබයි.

- **නව සේවා හැකියාවන්ගේ වේගවත් සංවර්ධනය සහ වර්ධිත අන්තර් ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කරන හවුල්කාරිත්වයන් හරහා නවෝත්පාදන වේගවත් කිරීම**

  ෆින්ටෙක් සමාගම්, තාක්ෂණික හවුල්කරුවන් සහ මූල්‍ය ආයතන සමඟ අපගේ සහයෝගීතාවයන් වෙළඳපොළට නව්‍ය විසඳුම් වඩාත් වේගයෙන් ගෙන ඒමට අපට හැකියාව ලබා දෙයි. වැඩිදියුණු කළ ගෙවීම් විසඳුම්වල සිට පුළුල් බෙදාහැරීමේ ලඟාවීම දක්වා, මෙම හවුල්කාරිත්වයන් අපගේ ඩිජිටල් පරිවර්තන ගමන වේගවත් කරයි. සම්බන්ධතා රහිත ගෙවීම්, QR කේත පදනම් කරගත් ගනුදෙනු සහ ක්ෂණික අරමුදල් මාරු කිරීම් සාර්ථකව ක්‍රියාත්මක කිරීම, උපායමාර්ගික සහයෝගීතාවයේ බලය පෙන්නුම් කරයි.

- **හවුල්කාර දැනුම නුවමාරුව සහ තාක්ෂණික ඒකාබද්ධ කිරීම තුළින් හැකියා වර්ධනයන්.**

  තාක්ෂණික සහාය, දැනුම නුවමාරු කර ගැනීමේ අවස්ථා සහ තාක්ෂණ ඒකාබද්ධ කිරීමේ සහාය හරහා අපගේ හවුල්කරුවන්ගේ හැකියාවන් ගොඩනැගීම තුළ අපි සක්‍රියව ආයෝජනය කරමු. ආරක්ෂාව, අනුකූලතාවය සහ සේවා අපේක්ෂාවන් පිළිබඳ හවුල්කරුවන්ගේ කෙටි විස්තර සහ වැඩමුළු මඟින් විකුණුම්කරුවන් ක්ෂේත්‍රයේ මනා පරිචයන් සහ නියාමන අවශ්‍යතා පිළිබඳව යාවත්කාලීනව සිටින බව සහතික කෙරේ. මෙම දෙයාකාර හැකියා ගොඩ නැගීම මඟින් බැංකුව සහ අපගේ හවුල්කරුවන් ප්‍රතිලාභ ලබන වර්ධනය පිළිබඳ සවිබල ගන්වන චක්‍රයක් නිර්මාණය කරයි.

- **අන්තර් මෙහෙයුම් හැකියාව, ප්‍රමිති සහ අංශයේ ඉගෙනුම ශක්තිමත් කරන ක්ෂේත්‍රයේ සාමාජිකත්වයන්**

  ලංකා ක්ලියර්, ස්විෆ්ට් සහ ලෝක ඉතිරිකිරීමේ බැංකු ආයතනය ඇතුළු ක්ෂේත්‍රයේ ප්‍රධාන ආයතනවල අපගේ සක්‍රීය සහභාගීත්වය මඟින්, ජාතික ඉතිරිකිරීමේ බැංකුව ගෝලීය මූල්‍ය ප්‍රමිතීන්ට අනුකූලව පවතින බව සහ ශ්‍රී ලංකාවේ බැංකුකරණයේ අනාගතය හැඩගැස්වීමට දායක වන බව සහතික කරයි. මෙවැනි සාමාජිකත්වයන් දැනුම නුවමාරුව, ප්‍රතිපත්ති ප්‍රවර්ධනය සහ සහයෝගී නව්‍යකරණය සඳහා වටිනා වේදිකා සපයයි.

### 3.3 වගකීම්සහගත සහ තිරසාර ප්‍රසම්පාදනය

වගකීම්සහගත ප්‍රසම්පාදනය අපගේ ව්‍යාපාර හවුල්කාර දර්ශනයේ කේන්ද්‍රය වේ. තෝරා ගැනීමේ සිට පවතින කාර්යසාධන නියාමනය දක්වා හවුල්කාර ජීවන චක්‍රයේ සෑම අදියරකටම අපි තිරසාරභාවය සහ සදාචාර ඇතුළත් කර ඇත.

- **හරිත ප්‍රසම්පාදනය හා හවුල්කරුවන් ශක්තිමත් කළ තිරසාර විසඳුම් හරහා තිරසාරභාව පෙළ ගැසීම**

  ESG-දැනුවත් කිරීමේ ප්‍රසම්පාදන නිර්ණායක මඟින් IT උපකරණ, පහසුකම්, ඉදිකිරීම් සහ සේවා ඇතුළුව සියලුම ප්‍රධාන කොන්ත්‍රාත් වර්ගීකරණ සඳහා සැපයුම්කරුවන් තෝරා ගැනීම මෙහෙයවනු ලබයි. අපි ශක්තිමත් පාරිසරික, සමාජ සහ පාලන ව්‍යවහාර පෙන්වන හවුල්කරුවන් ප්‍රමුඛ කරන අතර අපගේ සැපයුම් දාමය තුළින් තිරසාරතාවය කරා අපගේ බැඳීම පිළිබිඹු වන බව සහතික කරයි. ගේලීස් සෝලර් සමඟ අපගේ හවුල්කාරිත්වය තුළින් සහයෝගිතාවය ව්‍යාපාර පරමාර්ථ සහ පාලන අරමුණු අත්කර ගන්නා ආකාරය පෙන්නුම් කරයි.

- **නිසි සම්ප්‍රජන්‍ය සහ අනුකූලතා නියාමනය තුළින් ශක්තිමත් කළ සදාචාර සැපයුම් දාම කළමනාකරණය.**

  තත්ත්වය, නීතිමය අනුකූලතාව, කාර්යසාධන ඉතිහාසය, සදාචාර හා මූල්‍ය ඔරොත්තුදීම ආවරණය කරන පුළුල් සැපයුම්කාර නිසි සම්ප්‍රජන්‍ය තුළින් අපගේ ඉහළ ප්‍රමිති සපුරාලන ආයතන සමඟ පමණක් අපි හවුල්වන බව සහතික කරයි. නිරන්තර අනුකූලතා විගණන සහ අනුකූලතා පරීක්ෂාවන් අපගේ සැපයුම්කාර ජාලය තුළ අනුකූල නොවීම, සදාචාර ගැටළු, හෝ මූල්‍ය අස්ථාවරත්වය පිළිබඳ අවදානම අවම කරයි. ESG අනුකූල සැපයුම්කරුවන් සමඟ හවුල්වීම මඟින්, අපි බැංකුවේ කීර්තිනාමය ආරක්ෂා කරන අතර අපගේ වටිනාකම් දාම හරහා ව්‍යාපාර ව්‍යවහාර ප්‍රවර්ධනය කරයි.

- **100%ක දේශීය මූලාශ්‍රකින් බැඳීම තුළින් දේශීය ආර්ථික දායකත්වය.**

  අපගේ ප්‍රසම්පාදන ව්‍යවහාර මඟින් දේශීය සැපයුම්කරුවන් සමඟ පමණක් සම්බන්ධ වීමෙන් දේශීය සැපයුම් දාම ශක්තිමත් කිරීම අවධාරණය කරයි. මෙම ප්‍රවේශය ප්‍රජා සහභාගීත්වය වැඩි දියුණු කර, ජාතික ආර්ථික වර්ධනයට සහාය වී විදේශීය ප්‍රසම්පාදනය මත යැපීම අඩු කරයි. දේශීය හවුල්කරුවන්ට ප්‍රමුඛත්වය දීමෙන්, ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සමඟ පෙළගැස්වීම සහතික කරන අතරම, අප සේවය කරන ප්‍රජාවන්ගේ සමෘද්ධියට දායක වෙමු.

### 3.4 අනෝන්‍ය වර්ධනය හා නුවමාරු වටිනාකම් නිර්මාණය

තිරසාර හවුල්කාරත්වයන් අනෝන්‍ය ප්‍රතිලාභ මත ගොඩ නැගේ. දිගුකාලීන සහයෝගිතාව සහ නුවමාරු සාර්ථකත්වය සහතික කරමින් බැංකුව සහ අපගේ හවුල්කරුවන් සඳහා වටිනාකම නිර්මාණය කරන සම්බන්ධතා අපි පෝෂණය කරමු.

- **දෙයාකාර සංවාදය හා කාර්යසාධන වර්ධනය තුළින් ශක්තිමත් හවුල්කාර සම්බන්ධතා.**

  සියලුම තීරණාත්මක වෙළෙඳුන් සමඟ ව්‍යුහගත කාර්යසාධන සමාලෝචන සහ ප්‍රතිපෝෂණ මාර්ග මඟින් ගුණාත්මක පරතර පියවන බවත් බෙදා හැරීමේ විනය අඛණ්ඩව වර්ධනය කරන බවත් සහතික කෙරේ. මෙම සමාලෝචන කාලීනබව, ගුණාත්මකභාවය සහ අනුකූලතාවය, අඛණ්ඩ වැඩිදියුණු කිරීම මෙහෙයවීම වැනි මූලික දර්ශකවලට අනුව සැපයුම්කරුගේ කාර්යසාධනය තක්සේරු කරයි. ගනුදෙනුකාර සේවය, ආරක්ෂාව සහ අඛණ්ඩතාවයට බලපාන පුනරාවර්තන ගැටළු සඳහා ඒකාබද්ධ වර්ධන සැලසුම් මඟින්, සහයෝගී ගැටළු විසඳීම හරහා විභව බිඳවැටීම් ඵලදායී ලෙස අවම කරන බව සහතික කරයි.

- **හවුල්කාර විශ්වාසය හා විශ්වාසය ශක්තිමත් කරන සාධාරණ වැටුප් ගෙවීම සහ කාලීන ගෙවීම්**

  හවුල්කාර ජාලය තුළ මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගනිමින්, සියලුම සැපයුම්කරුවන්ට සහ බාහිරින් ලබාගත් සේවා සපයන්නන්ට ඔවුන්ගේ සේවාවන් සඳහා කඩිනම් ගෙවීම් අපි සහතික කරමු. වසර තුළ, සාධාරණ හා විනිවිද මූල්‍ය ගනුදෙනු සඳහා අපගේ කැපවීම පෙන්නුම් කරමින්, අපි අපගේ බාහිරින් ලබාගත් සේවා සපයන්නන්ට රුපියල් මිලියන 744.3 ක් ගෙවා ඇත. මෙම ගෙවීම් විනය මඟින් හවුල්කාර විශ්වාසය ශක්තිමත් කර දිගුකාලීන, ස්ථාවර සම්බන්ධතාවන් සවිබල ගන්වයි.

- **නව්‍යකරණය, කාර්යක්ෂමතාව සහ පිරිවැය ප්‍රසශ්තකරණය ඇති කරන දිගුකාලීන උපායමාර්ගික හවුල්කාරත්වයන්.**

  අපගේ සැපයුම්කරුවන් දෙස ගනුදෙනුමය විකුණුම්කරුවන් ලෙස නොව උපායමාර්ගික හවුල්කරුවන් ලෙස බලමින්, අපි කල්පවත්නා සම්බන්ධතා ගොඩ නගන අතර ඉන් කාලය සමඟ වටිනාකම ලබා දේ. මෙවැනි හවුල්කාරත්වයන් හවුල් නව්‍යකරණය, නුවමාරු ඉගෙනුම සහ අඛණ්ඩ වර්ධනය ඇති කරමින් අපගේ ගනුදෙනුකරුවන් සඳහා සේවා තත්ත්වය වැඩි කරමින් බැංකුව සහ අපගේ හවුල්කරුවන් යන දෙදෙනාටම ප්‍රතිලාභ අත්කර දෙන චක්‍රයක් නිර්මාණය කරයි.

- **හවුල්කාර - බලගැන්වූ ප්‍රජාව සහ ඇතුළත ප්‍රතිඵල තුළින් නුවමාරු වටිනාකම.**

  අපගේ හවුල්කාර ජාලය, මූල්‍ය සාක්ෂරතා වැඩසටහන්, ආපදා ප්‍රතිචාර සහ ඇතුළත් කිරීමේ මුලපිරීම් සක්‍රීය කරමින්, අඩු පහසුකම් සහිත ප්‍රජාවන් වෙත අපගේ ලඟාවීම පුළුල් කරයි. ජාතික ආයතන, ප්‍රජා සංවිධාන සහ සංවර්ධන හවුල්කරුවන් සමඟ සහයෝගිතාවයන්, අපගේ බලපෑම පරිමාණය කිරීමට සහ අප සේවය කරන ප්‍රජාවන් සඳහා අර්ථවත් ප්‍රතිඵල ලබා දීමට අපට ඉඩ සලසයි.

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

## 4 මෙයින් ලබාදෙන දෑ

2025 දී, හවුල්කාර කේන්ද්‍රීය උපාය මාර්ගවල උපායමාර්ගික ආයෝජන මගින් බැංකුවේ මෙහෙයුම් ඔරොත්තු දීම, ප්‍රසම්පාදන පාලනය සහ දිගුකාලීන පාර්ශවකාර වටිනාකම ශක්තිමත් කරන ලදී. විනිවිද ක්‍රියාවලීන්, සහයෝගීතා සබඳතා සහ බෙදාගත් වටිනාකම් නිර්මාණය හරහා හවුල්කරුවන්ගේ සහභාගිත්වය දැඩි කිරීමෙන්, අපි කල් පවතින හවුල්කාරිත්වයන් සහ තිරසාර වර්ධනයක් ගොඩනැඟීමට අවශ්‍ය අත්තිවාරම් ශක්තිමත් කළෙමු. අපගේ ප්‍රධාන කාර්යසාධන දර්ශක මගින් වලංගු කරන ලද පහත විස්තර කර ඇති ප්‍රතිඵලවලින්, අපගේ ව්‍යාපාරික හවුල්කාර ප්‍රාග්ධන මූලපිරීම් සහ බැංකුවේ මෙහෙයුම් ස්ථාවරත්වය, වෙළෙඳපොල කීර්තිනාමය සහ මූල්‍ය කාර්යසාධනය අතර පැහැදිලි සහ බලගතු සම්බන්ධයක් පෙන්නුම් කරයි.

### 4.1 ආයෝජනයේ සිට බලපෑම දක්වා

උපායමාර්ගික හවුල්කාර මූලපිරීම් පිළිබඳ, අපගේ අවධානය තිරණාත්මක මානයන් පහක් හරහා මැනියහැකි වටිනාකම ලබා දේ:

- **මෙහෙයුම් විශිෂ්ටත්වය:** තිරණාත්මක විකුණුම්කරු පරීක්ෂණය තුළින් වැඩිකළ පද්ධතිග
- **වගකීම්සහගත ප්‍රසම්පාදනය:** දේශීය සැපයුම්කාර නිසි සම්ප්‍රජන්‍ය ශක්තිමත් කරමින් කොන්ත්‍රාත්වල 100% නිවාරණය අත්කර ගැනීම.
- **නව්‍යකරණය වේගවත් කිරීම:** ඩිජිටල් ගෙවීම් විසඳුම් පුළුල් කිරීමට නව ෆින්ටෙක් සහ ආයතනික සංධාන සක්‍රිය කිරීම.
- **හවුල්කාර පරිසර පද්ධති සෞඛ්‍ය:** නියමිත වේලාමට ගෙවීම් පවත්වා ගැනීම, හවුල් වර්ධන සැලසුම් තුළින් විකුණුම්කාර සහයෝගය දැඩි කිරීම.
- **ක්ෂේත්‍රයේ ආහාෂය:** ක්ෂේත්‍රයේ මූලික ආයතන හයක් තුළ සක්‍රීය සහභාගිත්වය තුළින් හැඩගැස්වූ අංශමය ප්‍රතිපත්තිය සහ ගෝලීය ප්‍රමිති.

### 4.2 ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධන වටිනාකම් ලකුණු කාඩ්පත

අපගේ හවුල්කාර පරිසර පද්ධතිය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා, බැංකුව සමබර ප්‍රමුඛ සහ පසුගාමී දර්ශක සමූහයක් නිරීක්ෂණය කරයි. මෙම මිනුම් අපගේ හවුල්කාර සබඳතා සෞඛ්‍යය පිළිබඳ තීරණාත්මක අවබෝධයක් ලබා දේ. නිසි සම්ප්‍රජන්‍ය ආවරණය වැනි ප්‍රමුඛ දර්ශක හරහා අනාගත ඔරොත්තු දීමේ හැකියාව පුරෝකථනය කරන අතරම, නියමිත වේලාවට සැපයුම්කරු ගෙවීම් වැනි පසුගාමී දර්ශක හරහා ප්‍රතිඵල මැනීම සිදු කරයි. මෙම ලුහුබැඳීමේ විනය අපගේ මෙහෙයුම් ස්ථාවරත්වය ශක්තිමත් කිරීම සඳහා මූලික වන අතර, ප්‍රසම්පාදන පාලනයේ ඉහළම ප්‍රමිතීන් පවත්වා ගනිමින් අපට පහසු ගනුදෙනුකාර සේවාවක් ලබා දිය හැකි බව සහතික කරයි.

අපි මෙහෙයුම් පාසටහන සිය මූල්‍යකරණ බලපෑම් දක්වා අවසාන වටිනාකම් දාම කාව තුළින් ස්වභාවික ප්‍රාග්ධනය කළමනාකරණය කරමු. අපි කළඹ තුළ එක් එක් අදියරේදී (බලශක්තිය, විමෝචන, අපද්‍රව්‍ය, ජලය, සහ ස්වභාවික/ජෛව විවිධත්ව අවදානම්) තිරසාර සහ දේහගුණික ප්‍රතිෂ්ඨාවන්ට ඇතුළත් කරමු.

| යෙදවුම් | භාරකාරත්ව කටයුතු | නිමැවුම් | ගනුදෙනුකාර සහ පාලන ප්‍රතිඵල | දිගුකාලීන බලපෑම් |
|---|---|---|---|---|
| පාරිභෝජනය කළ සම්පත් (බලශක්තිය, ජලය, අමුද්‍රව්‍ය) සහ දේශගුණයට හා ස්වභාවික අවදානම්වලට කළඹ නිරාවරණය | කාර්යක්ෂම ක්‍රියාමාර්ග, පුනර්ජනනීය යොදා ගැනීම, ඩිජිටල්කරණය. අපද්‍රව්‍ය කළමනාකරය, සහ ණයදීම තුළ දේශගුණික අවදානම් නිරාවරණ සූදානම (S2 අදාළ අවස්ථාවල). | පරිභෝජනය තුළ මැනියහැකි අඩුකිරීම් සහ අපද්‍රව්‍ය සමඟ ණය ක්‍රියාවලිය තුළ දේශගුණික අවදානම් පිළිබඳ වර්ධිත අවබෝධය. | අඩු මෙහෙයුම් පිරිවැය, වැඩිකළ අනුකූලනාව, ශක්තිමත් ගනුදෙනුකාර විශ්වාසය, අඩුකළ පාරිසරික සිදුවීම් සහ යහපත් කළඹ අවදානම් විනය. | ජාතික දේශගුණික අරමුණු හා බැඳුණු ඉතා කුඩා පාරිසරික පාසටහන, සහ මූල්‍ය කටයුතුවල වැඩිකළ ඔරොත්තුදීම. |

### ප්‍රමාණාත්මක කරුණු

**6.1**
දේශගුණික ඔරොත්තුදීම, ආපදා ප්‍රතිචාරය සහ සංක්‍රාන්ති මූල්‍ය

**6.3**
මෙහෙයුම් පාරිසරික පාසටහන

**6.4**
මූල්‍ය කළඹ තුළ ස්වභාවික, ජෛව විවිධත්ව බලපෑම්

**6.5**
ESG දත්තවල තත්ත්වය විනිවිදභාවය සහ වාර්තාකරණ සූදානම (SLFRS S1 සහ SLFRS S2)

## SDGs ට අපගේ දායකත්වය

**ඉලක්කය 7.2, 7.3**

වහල මත සවිකර ඇති සූර්ය බලශක්ති සහ බලශක්ති කාර්යක්ෂම උපකරණ සඳහා හරිත ණය ලබා දී ඇති අතර, එමඟින් පිරිසිදු බලශක්තිය සඳහා ගෘහස්ථ ප්‍රවේශය පුළුල් කර ඇත.

ශාඛා LED ආලෝකකරණය සහ ඉන්වර්ටර් උපකරණ වලින් සමන්විත කෙරේ. ජාතික ජාලයට ස්ථානීය සූර්ය බලශක්තිය දායක විය.

**ඉලක්කය 12.5**

කඩදාසි රහිත බැංකුකරණ මූලපිරීම් (ඩිජිටල් රිසිට්පත්, විද්‍යුත් ප්‍රකාශන); ශාඛා අපද්‍රව්‍ය වෙන් කිරීම හඳුන්වා දුන් අතර අනතුරුදායක තොරතුරු තාක්ෂණ වත්කම් බැහැර කිරීම වැඩිදියුණු කරන ලදී.

**ඉලක්කය 13.1, 13.3**

සොභාදනවි ණය මුදල රුපියල් බිලියන 1 ක් ලබා දෙමින් හරිත මූල්‍ය වැඩසටහනක් දියත් කරන ලදී. මන්නාරම ව්‍යාපෘතිය සඳහා සුළං බලශක්ති සූරාකුම්කරණය ක්‍රියාත්මක කරන ලදී; දේශගුණික ක්‍රියාමාර්ග සඳහා WSBI SDG සම්මානය සමඟ පිළිගැනීමට ලක්විය.

අඩු කාබන් පාරිභෝගික දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම සඳහා මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් සඳහා දේශගුණික ප්‍රතිෂ්ඨාවන් ඒකාබද්ධ කරන ලදී.

**ඉලක්කය 15.2, 15.5**

රුක් රෝපන සහ ගෙවතු මූලපිරීම් දියත් කරන ලදී.

ජාතික පාරිසරික ප්‍රමිති සමඟ මෙහෙයුම් පෙළ ගැස්වීමට හරිත බලශක්ති විශේෂඥයින් සහ පාරිසරික ආයතන සමඟ හවුල්වීම

# ස්වාභාවික ප්‍රාග්ධනය

## අපගේ ස්වභාවික ප්‍රාග්ධන ගමන්මඟ: භාරකාරත්වයේ සිට මැනියහැකි වටිනාකම දක්වා

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේදී, අපගේ ස්වාභාවික ප්‍රාග්ධනය යන්නෙන් අපගේ මහජන විශ්වාසය සහ දිගුකාලීන මෙහෙයුම් ඔරොත්තු දීමට පාදක වන පාරිසරික පදනම අදහස් වේ. ණය දීමේ තීරණවල සිට ශාඛා මෙහෙයුම් දක්වා අපගේ මෙහෙයුම් සහතික කරමින්, ස්වාභාවික සම්පත් වගකීමෙන් කළමනාකරණය කරමින්, දේශගුණික අවදානම් අවම කරමින්, සහ කල් පවතින ජාතික වටිනාකමට දායක වෙමින්, අපගේ මූල්‍ය සම්පත් සඳහා යොදන ලද දැඩි පාලනය සමඟින් අපි අපගේ පාරිසරික බලපෑම් කළමනාකරණය කරමු.

**1 අපගේ ප්‍රාග්ධන පදනම්**

අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ තිරසාරතා අධීක්ෂණය, ශක්තිමත් පාරිසරික පාලනය, සහ ණය සහ අවදානම් රාමුවලට ESG සාධක ඒකාබද්ධ කිරීම.

**2 අපි හැකියාව ශක්තිමත් කරන ආකාරය**

සම්පත් කාර්යක්ෂමතාව, සහ ඩිජිටල් පරිනාමනය, සහ ශක්තිමත් තිරසාර ප්‍රසම්පාදනය තුළින් වැඩිකළ දේශගුණික අවදානම් තක්සේරු, පූර්ව්ල්කළ හරිත මූල්‍ය මුලපිරීම්, අඩුකළ මෙහෙයුම් පාසටහන.

**3 අපි ප්‍රතිඵල ශක්තිමත් කරන ආකාරය**

- හරිත තෝරාගැනීම් තුළින් ගනුදෙනුකාර සහ ප්‍රජා ප්‍රතිඵල
- මෙහෙයුම් ඔරොත්තුදීම සහ අඛණ්ඩතාව
- අවදානම් විනය, අනුකූලතාව සහ කීර්තිනාම ආරක්ෂාව
- පිරිවැය කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව

**4 මෙයින් ලබාදෙන දෑ**

හරිත මූල්‍යකරණ කළඹ තුළ වර්ධනය, බලශක්තිය, ජලය, සහ කඩදාසි පරිභෝජනයේ මැනියහැකි අඩුවීම්, ශක්තිමත් කළ නියාමන අනුකූලතාව සහ වැඩිකළ පාර්ශවකාර විශ්වාසය.

## 1 අපගේ ප්‍රාග්ධන පදනම්

අපගේ ස්වභාවික ප්‍රාග්ධන භාරකාරිත්වය, බැංකුවේ සෘජු සහ වක්‍ර පාරිසරික බලපෑම් අවබෝධ කර ගැනීමට, කළමනාකරණය කිරීමට සහ අවම කිරීමට සැලසුම් කර ඇති පුළුල් රාමුවක් වටා ගොඩනගා ඇත. මෙයට අපගේ මෙහෙයුම් පාසටහන, අපගේ ණය දීමේ සහ ආයෝජන කළඹ සහ දේශගුණික-ඔරොත්තු දෙන ආර්ථිකයකට ශ්‍රී ලංකාව සංක්‍රමණය වීමට සහාය වීමේ දී අපගේ කාර්යභාරය ඇතුළත් වේ. සියලුම මූලපිරීම් දැඩි නියාමන අපේක්ෂාවන් සපුරාලන අතර ජාතික තිරසාර ප්‍රමුඛතා සමඟ පෙළ ගැසේ.

### 1.1 පාලනය හා අධීක්ෂණය

අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණය, කළමනාකරණ කමිටු, සහ ස්වාධීන සහතික කිරීම අපගේ ස්වභාවික ප්‍රාග්ධන පාලනය ශක්තිමත් කරයි. මෙම පාලන රාමුවට පාරිසරික අවදානම් කළමනාකරණය, හරිත මූල්‍ය පාලනය, නියාමන අනුකූලතාව, සම්පත්වල කාර්යක්ෂමතාව සහ තිරසාර වාර්තාකරණය හරහා ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි ඇතුළත් වේ.

- **අධ්‍යක්ෂ මණ්ඩලය සහ ආයතනික කළමනාකරණය,** පාරිසරික කාර්යසාධනය සහ දේශගුණය ආශ්‍රිත අවදානම් පිළිබඳ නිරන්තර වාර්තාකරණය සමඟ තිරසාර උපායමාර්ගය, පාරිසරික ප්‍රතිපත්ති සහ හරිත මූල්‍ය ප්‍රමුඛතා අධීක්ෂණය සපයයි. අධ්‍යක්ෂ මණ්ඩලය, ආයතනික තිරසාර කමිටුව හරහා, ගෝලීය ESG රාමු සහ ජාතික පාරිසරික රෙගුලාසි සමඟ පෙළ ගැසුණු තිරසාර ප්‍රතිපත්ති සකස් කරන අතර, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව තුළ දේශගුණික සහ පාරිසරික අවදානම් ඇතුළත් කරයි.
- **ආයතනික තිරසාර කමිටුව (CSC)** අධ්‍යක්ෂ මණ්ඩලයට කාර්තුමය ප්‍රගති වාර්තා සමඟ, තිරසාර ප්‍රතිපත්ති සංවර්ධනය, පාර්ශවකාර සහභාගිත්වය, ප්‍රමාණාත්මතා තක්සේරු කිරීම, සහ පාරිසරික කාර්යසාධන නියාමනය පාලනය කරයි. ආයතනික තිරසාර කමිටුව මෙහෙයුම් හරහා ESG මූලධර්මවල ඵලදායී ඒකාබද්ධ කිරීම සහතික කර, ප්‍රතිපත්ති හා ප්‍රමිති සකස් කර, පාලන ව්‍යුහයන්ට වර්ධනයන් නිර්දේශ කරයි.
- අවදානම, අනුකූලතාව, සහ පාරිසරික අවදානම් කළමනාකරණ ව්‍යවහාර, නියාමන අනුකූලතාව සහ තිරසාර වාර්තාකරණ අඛණ්ඩතාව පිළිබඳ අභ්‍යන්තර විගණන සමාලෝචන හරහා ඒකාබද්ධ සහතික කිරීම ලබා ගනී.

### 1.2 නීති හා රෙගුලාසි සමඟ අනුකූලතාවයි

**නීති හා රෙගුලාසි සමඟ අනුකූලතාවය**

බැංකුව 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත (සංශෝධිත පරිදි) සමඟ අනුකූල වේ. එම පනතින් මධ්‍යම පරිසර අධිකාරිය ස්ථාපිත කරන ලද අතර දූෂණය පාලනය, ස්වාභාවික සම්පත් ආරක්ෂාව සහ පාරිසරික බලපෑම් තක්සේරුකරණ අවශ්‍යතා සඳහා යාන්ත්‍රණ සපයයි. බැංකුවේ අනුකූලතාවයට ඇතුළත් වන්නේ:

- **පාරිසරික බලපෑම් තක්සේරුව (EIA):** අනුකූල විය (අදාළ වන විට)
- **පාරිසරික ආරක්ෂණ බලපත්‍රකරණය (EPL):** අනුකූල විය (අදාළ වන විට)
- **දූෂණ ප්‍රමිතීන් සහ අපද්‍රව්‍ය පාලනය:** අනුකූල විය

**තිරසාර මූල්‍ය නියාමන පෙළ ගැසීම**

- **ශ්‍රී ලංකා හරිත මූල්‍ය වර්ගීකරණය/ මහ බැංකුවේ නියෝග:** මහ බැංකුවේ තිරසාර මූල්‍ය නියෝගවලට අනුකූලව (2022 අංක 05 දරණ බැංකු පනත් නියෝගය), බැංකුව පාරිසරික, දේශගුණික අනුවර්තනය/අවම කිරීම සහ සමාජීය අංග තිරසාර මූල්‍ය හා තිරණ ගැනීම වෙත ඇතුළත් කරයි.

### ස්වේච්ඡා මනා පරිචයන් (ප්‍රතිපත්ති පදනම)

- **පාරිසරික සහ සමාජීය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති (ESRM):** දිගුකාලීන වටිනාකම නිර්මාණය කරන ආකාරයෙන් සෘජු හා වක්‍ර පාරිසරික බලපෑම්, අවදානම් හා අවස්ථා අවබෝධ කරගෙන කළමනාකරණය කිරීමට රාමුව ස්ථාපිත කරයි. එමෙන්ම එය යහපත් පාරිසරික සහ දේශගුණික අවදානම් කළමනාකරණය දිරි ගැන්වීමට ගනුදෙනුකරුවන්, නියාමකයින්, ප්‍රජාවන්, සහ වෙනත් පාර්ශ්වකරුවන් සමඟ සහභාගිත්වය ශක්තිමත් කරයි.

## 2 අපි හැකියාව ශක්තිමත් කරන ආකාරය

ස්වභාවික ප්‍රාග්ධනය ශක්තිමත් කිරීම විනයගරුක වැඩසටහනක් වන අතර එය පාරිසරික වගකීම්, මෙහෙයුම් කාර්යක්ෂමතාව, නියාමන අනුකූලතාව සහ දිගුකාලීන වටිනාකම නිර්මාණය තුලනය කරයි. 2025 දී, බැංකුව දේශගුණික අවදානම් තක්සේරු ශක්තිමත් කිරීම, හරිත මූල්‍යකරණය පුළුල් කිරීම, සම්පත් කාර්යක්ෂමතාව සහ ඩිජිටල් පරිනාමනය හරහා අපගේ මෙහෙයුම් පාසටහන අඩු කිරීම සහ ප්‍රසම්පාදන තීරණවලට තිරසාරතාවය ඇතුළත් කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. එය ඇතුළත් ප්‍රවේශය දරා ගනිමින් ජාතික දේශගුණික අරමුණුවලට දායකවීමේ බැංකුවේ ඉලක්කය සමඟ බැඳී පැවතුනී.

### 2.1 දේශගුණික අවදානම් කළමනාකරණය: භෞතික සහ සංක්‍රාන්ති අවදානම්

අපගේ සේවා ලබාදීමේ ආරක්ෂාව, කාර්යක්ෂමතාව සහ ඔරොත්තුදීම දේශගුණයට අදාළ අවදානම් කළමනාකරණය කිරීමට අපට ඇති හැකියාව මගින් අතිශයින් බලපෑම් කර ඇත. අපි මෙම අවදානම් හුදකලා තර්ජන ලෙස නොව පුළුල් ඒකාබද්ධ ප්‍රතිචාර අවශ්‍යවන අන්තර් සම්බන්ධිත අභියෝග ලෙස කළමනාකරණය කරමු.

බැංකුව සහ එහි ගනුදෙනුකරුවන් අහිතකර කාලගුණික සිදුවීම්වල සහ අඩු කාබන් ආර්ථිකයකට සංක්‍රාන්තියේ බලපෑම්වලින් ආරක්ෂා කිරීමට බැංකුව සක්‍රීයව දේශගුණයට අදාළ අවදානම් කළමනාකරණය කරනු ලබයි. කොළඹ පිහිටි අපගේ ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල 11ක් දේශගුණික අවදානම් නියාමනය, ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්කරණය සහ රටපුරා ප්‍රතිචාර සම්බන්ධීකරණය සඳහා උපායමාර්ගික විධාන මධ්‍යස්ථාන ලෙස සේවය කරයි. දේශගුණයට අදාළ බිඳවැටීම් තුළ, බාධා රහිත මෙහෙයුම් සහතික කිරීම සඳහා නවීන උපස්ථ සැලැස්ම සහ සන්නිවේදන පද්ධති සමඟ ඔරොත්තු දීම සඳහා මෙම පහසුකම් නිර්මාණය කර ඇත.

- අපි සියලුම ශාඛා හා තීරණාත්මක යටිතලපහසුකම්වලට භූගෝලීය උවදුරු නිරාවරණ අනුරූපිත, ආයෝජන තීරණ හා අඛණ්ඩ සැලසුම්කරණය දැනුවත් කිරීම සමඟ පුළුල් භෞතික අවදානම් තක්සේරු සේවයේ යොදවමු.
- සංක්‍රාන්ති අවදානම් නියාමනය වෙනස්වන ප්‍රතිපත්ති, වෙළෙඳපොල විතැන්වීම්, සහ ණයවල තත්ත්වය කෙරෙහි බලපෑම කළමනාකරණය කිරීමට ණයකරුගේ සංක්‍රාන්ති හැකියාව සහ කිර්තිනාමය පසුවිපරම් කරයි.
- විවිධ අනාගත මාර්ග යටතේ දේශගුණයට අදාළ අවදානම් හා අවස්ථා මනාව අවබෝධ කරගෙන ඇගයීම සඳහා අවස්ථා විශ්ලේෂණ හැකියාවන් සංවර්ධනය කරමින් පවතී.
- බැංකුව විසින් අරමුදල් සපයන ලද වත්කම් භෞතික දේශගුණික අවදානම්වලට ඔරොත්තු දෙමින් පවතින බව සහතික කිරීමට වැඩිකළ ඇප අවදානම් තක්සේරු කිරීම් දේශගුණික ප්‍රතිඡ්ඨාවන් ඒකාබද්ධ කරයි.

දේශගුණයට අදාළ සිදුවීම් වලදී වත්කම් ආරක්ෂා කිරීම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා සියලුම පරිශ්‍රයන් පුරා භෞතික ආරක්ෂක පෙරහුරු ලේඛණ දැඩි ලෙස පවත්වා ගෙන යනු ලැබේ. අපගේ පහසුකම් කළමනාකරණයට විදුලි පද්ධති, වායු සමීකරණ, ගිනි හඳුනාගැනීමේ සහ මර්දන පද්ධති, හදිසි ආලෝකකරණය සහ ඉවත් කිරීමේ මාර්ග කල්තියා නඩත්තු කිරීම ඇතුළත් පුළුල් පාරිසරික සහ ආරක්ෂක පාලනයන් ඇතුළත් වේ. නිතිපතා ආරක්ෂක පෙරහුරු සහ අනිවාර්ය සහතික කිරීම් මඟින් බැඳවැටීම් වලදී අපගේ පරිශ්‍රයන් ගනුදෙනුකරුවන් සහ සේවකයින් ආරක්ෂිතව පවතින බව සහතික කෙරේ.

### 2.2 දේශගුණික හා පාරිසරික අවස්ථා කළමනාකරණය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පාරිසරික අවස්ථාවල භාරකාරත්වය වටිනාකම් නිර්මාණය ප්‍රශස්ත කිරීමට සහ අඩු කාබන් ආර්ථිකයකට සංක්‍රාන්තිය තුළ ඔරොත්තු දීම සහතික කිරීම සඳහා සැලසුම් කළ උපායමාර්ගික, අවසාන රාමුවකින් පාලනය කෙරේ.

මෙම ප්‍රවේශය මූලික අවස්ථා ක්ෂේත්‍ර හතරකින් විදහා පෙන්වයි:

- **ඔරොත්තුදීමේ ප්‍රතිසාධන මූල්‍ය:** නිවාස අළුත්වැඩියාව සඳහා ව්‍යුහගත සහය සහ දේශගුණයට අදාළ ජීවනෝපායන්, දේශගුණයට අදාළ සිදුවීම්වලින් පසු වඩාත් ඔරොත්තුදීමට ප්‍රජාවන් පත් කිරීමට හැකියාව ඇති කරයි. මෙයට දේශගුණයට ඔරොත්තුදෙන ද්‍රව්‍ය සහ සැලසුම් සමඟ නැවත ගොඩ නැගීමට සහය වෙන වරණීය මූල්‍යකරණ නියමයන් ඇතුළත් වේ.
- **ඔරොත්තු දීම-පෙළගැස්වූ නිෂ්පාදන:** ණය ගැතියන්ගේ ඔරොත්තු දීම ශක්තිමත් කරන සහ දිගු කාලීනව කළඹේ ගුණාත්මකභාවය වැඩිදියුණු කරන නිෂ්පාදන සැලසුම් සහ තක්සේරු ආවරණ. දේශගුණික අවදානම් තක්සේරු කිරීම් ණය මිලකරණය සහ ව්‍යුහගතකරණය සඳහා ඒකාබද්ධ කිරීම මෙයට ඇතුළත් වේ.
- **වර්ධිත අවදානම් මිලකරණය සහ කළඹ මෙහෙයවීම:** වඩා යහපත් දේශගුණික දත්ත සහ අවස්ථා විශ්ලේෂණ හැකියාවන් මඟින් කාලයත් සමඟ වඩාත් නිවැරදි අවදානම් මිලකරණය සහ උපායමාර්ගික කළඹ වෙන් කිරීම සක්‍රීය කරන අතර ණය ගැණුම්කරුවන්ට අඩු අවදානම් සහ දේශගුණිකව ඔරොත්තු දෙන නිෂ්පාදන ලබා දේ.
- **හරිත මූල්‍යකරණය පුළුල් කිරීම:** ගනුදෙනුකාර සංක්‍රාන්තියට සහාය වන පුනර්ජනනීය බලශක්තිය, බලශක්ති කාර්යක්ෂමතාව සහ හරිත ගොඩනැගිලි ව්‍යාපෘති සඳහා ඉලක්කගත ණය පහසුකම්, සහ උසස් තත්ත්වයේ, අනාගතයට ගැලපෙන ණය කළඹක් ගොඩනැගීම.

### 2.3 අන්තර් රඳා පැවැත්ම සහ තීරණාත්මක යටිතලපහසුකම්

බැංකුවේ පාරිසරක ඔරොත්තුදීම බාහිර ජාතික පද්ධති හා තෙවැනි පාර්ශව හවුල්කරුවන් සමඟ මූලිකවම අන්තර් සම්බන්ධ වේ. අපි ව්‍යුහගත කුළුණු තුනක උපායමාර්ගයක් තුළින් මෙම තීරණාත්මක රඳා පැවතුම් සක්‍රීයව කළමනාකරණය කරමු:

1. **ජාතික යටිතල පහසුකම් ඒකාබද්ධ කිරීම:** ජාතික පද්ධතිවල ප්‍රධාන සහභාගිවන්නෙකු ලෙස, ශක්තිමත් තාක්ෂණික ඒකාබද්ධතාවය, ජාතික යටිතල පහසුකම් සඳහා දේශගුණික ආශ්‍රිත බිඳවැටීම් අඛණ්ඩව නියාමනය කිරීම සහ අංශ පුරා දේශගුණික ඔරොත්තු දීමේ මූලපිරීම්වල සක්‍රීය සහයෝගීතාවය තුළින් විශ්වසනීයත්වය අපි සහතික කරමු.

2. **පාලින තෙවන පාර්ශවීය කළමනාකරණය:** උපයෝගිතා, අපද්‍රව්‍ය කළමනාකරණය සහ විදුලි සංදේශනය සඳහා ප්‍රධාන විකුණුම්කරුවන් මත අපගේ විශ්වාසය බලාත්මක කරන ලද සේවා මට්ටමේ ගිවිසුම්, දේශගුණික අවස්ථා, කාර්යසාධන සමාලෝචන සහ සංකේන්ද්‍රණ අවදානම අවම කිරීම සඳහා සැපයුම්කරු විවිධාංගීකරණය ඇතුළත් අනිවාර්ය ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම අවශ්‍යතා සමඟ ගිවිසුම් හරහා පාලනය කරනු ලබයි.

3. **පරීක්ෂා කරන ලද අඛණ්ඩතා සහතිකය:** පුළුල්, නිතිපතා පරීක්ෂා කරන ලද ව්‍යාපාර අඛණ්ඩතා සහ ආපදා ප්‍රතිසාධන සැලසුම් හරහා දේශගුණික සිදුවීම් අතරතුර සේවා ලබා ගැනීමේ හැකියාව අපි සහතික කරමු. මෙයට විකල්ප වැඩබිම්, උපස්ථ යටිතල පහසුකම්, නිශ්චිත ප්‍රතිසාධන අරමුණු සහ සැලකිය යුතු පාරිසරික සිදුවීම් සඳහා සූදානම සහතික කිරීම සඳහා දේශගුණික බිඳවැටීම් අවස්ථා ඇතුළත් අර්ධ-වාර්ෂික සමාකරණ පෙරහුරු ඇතුළත් වේ.

ස්වාභාවික ප්‍රාග්ධනය

## 2.4 තිරසාර මූල්‍යකරණය හා ESG – ඒකාබද්ධ ණය විනය

බැංකුව තම ණය දීමේ සහ ආයෝජන තීරණවලින් පාරිසරික හා සමාජීය ප්‍රතිඵලවලට සැලකිය යුතු ලෙස බලපෑම් කළ හැකි බව හඳුනා ගනී. එබැවින් මූල්‍ය, ස්වාභාවික, සමාජීය සහ සම්බන්ධතා සහ මානව ප්‍රාග්ධන හරහා උපායමාර්ග සහ වටිනාකම් නිර්මාණය කිරීමේ මූලික සංරචකයක් ලෙස වගකීම් සහගත මූල්‍යකරණය ඇතුළත් කර ඇත.


- **ණය ඇගයීම සහ IRM තුළට ඇතුළත් කළ ESG:** මහ බැංකුවේ තිරසාර මූල්‍ය නියෝගවල අනුකූලව, ESG ප්‍රතිෂ්ඨාවන් ක්‍රමානුකූලව ණය ඇගයීම් සහ IRM රාමුවට ඒකාබද්ධ කරනු ලබයි. ඉහළ ESG අවදානම් පැතිකඩ සහිත ගනුදෙනු වැඩිදියුණු කළ නිසි සම්ප්‍රජන්‍යයට සහ නියාමනයට යටත් වන අතර, එමඟින් අහිතකර බලපෑම් කලින් හඳුනා ගැනීමට සහ අවම කිරීමට හැකි වේ.

- **ආයතනික ණය ප්‍රතිපත්තියට ඇතුළත් කර ඇති බැහැර කිරීමේ ලැයිස්තුව:** බැංකුවේ ආයතනික ණය ප්‍රතිපත්තියට පැහැදිලිව නිර්වචනය කරන ලද බැහැර කිරීමේ ලැයිස්තුවක් ඇතුළත් වන අතර, ඉන් සැලකිය යුතු පාරිසරික හෝ සමාජීය හානියක් සිදුවිය හැකි කටයුතු සඳහා මූල්‍යකරණය තහනම් කර, විනයගරුක අවදානම් රැුචිය සහ කීර්තිනාමය ආරක්ෂා කිරීමට සහාය වේ.

- **පාරිසරික ලේඛනගතකරණය සහ නියාමන අනුකූලතා අවශ්‍යතා:** ණය ලබා ගන්නන් අදාළ පාරිසරික හා සමාජීය රෙගුලාසිවලට අනුකූල විය යුතු අතර ණය අනුමත කිරීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස අදාළ වන පරිදි පාරිසරික බලපෑම් තක්සේරු ඇතුළුව අදාළ පාරිසරික ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

- **සහභාගිත්වය ප්‍රමුඛ සංක්‍රාන්ති ප්‍රවේශය:** වාර්තාකරණ කාල සීමාව තුළ, පාරිසරික පසුබිම් මත කිසිදු ණය අයදුම්පතක් හෝ පහසුකම් ප්‍රතික්ෂේප කර නොමැත. ඒ වෙනුවට, බැංකුව සරල බැහැර කිරීම වෙනුවට ක්‍රමානුකූල සංක්‍රාන්තියට සහාය වන වෙනස් වන ESG ප්‍රමිතීන් සහ ක්ෂේත්‍රයේ මනා පරිචයන් සමඟ ගනුදෙනුකාර මෙහෙයුම් ක්‍රමානුකූලව පෙළගැස්වීමට ගනුදෙනුකාර සහභාගිත්වය දිරිමත් කරයි.

- **ESRM යටතේ පාලනය, නිසි සම්ප්‍රජන්‍ය සහ නියාමනය:** විනිවිදභාවය, වගවීම සහ අනුකූලතාවය සහතික කරමින්, වගකීම් සහගත මූල්‍යකරණය, පාලන ව්‍යුහයන්, විස්තීර්ණ නිසි සම්ප්‍රජන්‍ය සහ අඛණ්ඩ නියාමනය තුළින් ශක්තිමත් කරනු ලැබේ,




GRI 302-1 302-3

## 2.5 වගකීම්සහගත පරිභෝජනය හා මෙහෙයුම් ආර්ථික කාර්යක්ෂමතාව

බැංකුවේ මෙහෙයුම් පාසටහන අඩු කිරීම ස්වභාවික ප්‍රාග්ධන භාරකාරත්වයේ මූලික අංගයකි. අපි සම්පත් කාර්යක්ෂමතාව, අපද්‍රව්‍ය අවම කිරීම, සහ මෙහෙයුම්වලින් පාරිසරික බලපෑම අඩු කිරීමට තිරසාර ප්‍රසම්පාදනය ප්‍රවර්ධනය කරමු.

### බලශක්ති කළමනාකරණය

වගකීම්සහගත බලශක්ති කළමනාකරණය පුනර්ජනනීය බලශක්තිය යොදා ගැනීම, බලශක්ති කාර්යක්ෂම යටිතල පහසුකම්, සහ පාරිසරිකමය වගකීම්සහගත ගෙඩනැගිලි සැලසුම් තුළින් වඩාත් හරිත සහ වඩාත් ඔරොත්තු දෙන අනාගතයකට සහය වේ.

- **බලශක්ති මුසුකිරීමේ විනය:** බැංකුවේ ප්‍රාථමික බලශක්ති ප්‍රභවයන් අතරට ස්ථානීය සූර්ය උත්පාදනයෙන් අනුපූරණය වන ජාතික විදුලිබල පද්ධතියෙන් ලැබෙන විදුලිය, සහ මෙහෙයුම් අවශ්‍යතා සඳහා ඩීසල්/පෙට්‍රල් ඇතුළත් වේ.
- බලශක්ති කාර්යක්ෂමතාව සහ විමෝචන අඩු කිරීමේ මුලපිරීම් (GRI 302 පෙළ ගැසුණු):
  - ජල විදුලිය මත යැපීම අඩු කිරීම සඳහා සූර්යබල උත්පාදනය පුළුල් කිරීම.
  - කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ විමෝචනය අඩු කිරීම සඳහා ඉන්වර්ටර්-ක්‍රියා කරන, CFC රහිත වායු සමීකරණ පද්ධති ස්ථාපනය කිරීම.
  - අනවශ්‍ය පරිභෝජනය අවම කිරීම සඳහා වායු සමීකරණ භාවිතය සම්මත බැංකු වේලාවන්ට සීමා කිරීම.
  - LED/CFL ආලෝකකරණය ස්ථාපනය කිරීම සහ බලශක්ති කාර්යක්ෂම උපකරණ භාවිතය (LED මොනිටර් ඇතුළුව) ප්‍රවර්ධනය කිරීම.
  - සම්පත් වගකීමේ කොටසක් ලෙස ශාඛා හරහා ප්‍රතිචක්‍රීකරණ ව්‍යවහාර ප්‍රවර්ධනය කිරීම.
  - අභ්‍යන්තර සන්නිවේදනයන් තුළින් අඛණ්ඩ සේවක සහභාගිත්වය හරහා දැනුවත්භාවය සහ වගකිවයුතු බලශක්ති හැසිරීම් ශක්තිමත් කිරීම.

### ජල කළමනාකරණය

බැංකුව ජලය අත්‍යවශ්‍ය සහ සීමිත ස්වභාවික සම්පතක් ලෙස හඳුනා ගනී. තිරසාර ජල කළමනාකරණය මෙහෙයුම්වලට ඇතුළත් කර ඇති අතර එය ස්වාභාවික ප්‍රාග්ධන කළමනාකරණ අරමුණු පෙළගැසී ඇත.

- **වගකීම්සහගත ජල භාවිතය:** 2025 වසර තුළ බැංකුව ජලය ඝන මීටර් 68,815.4 ක් ඉවත් කර ගෙන ඇත. ජල කාර්යක්ෂම තාක්ෂණයන්, වර්ධිත ව්‍යවහාර සහ කාර්ය මණ්ඩල දැනුවත්භාවය තුළින් පසු කාලවලදී ජලය ඉවත් කිරීම අඩු කිරීම සඳහා සක්‍රීය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කෙරේ.

- **පාරිසරික බලපෑම් කළමනාකරණය:** අවට පරිසර පද්ධති කෙරෙහි අහිතකර බලපෑම් අවම කිරීම සඳහා අදාළ නියාමන අවශ්‍යතාවන්ට දැඩි අනුකූලතාවය සමඟ ජලය ඉවත් කිරීම, පරිභෝජනය සහ බැහැර කිරීමේ ව්‍යවහාර නියාමනය කරනු ලැබේ.

- **විනිවිද වාර්තාකරණය සහ කාර්යසාධන ලුහුබැඳීම (GRI 303 පෙළගස්වා ඇත):** අඛණ්ඩ වර්ධනය සහ විනිවිදභාවයට සහාය වීම සඳහා බැංකුව විසින් මුළු ජල ඉවත් කිරීම සහ පරිභෝජනය ඇතුළුව ප්‍රධාන ජල මිනුම් ලුහුබැඳ වාර්තා කරයි.

ස්වාභාවික ප්‍රාග්ධනය

### අපද්‍රව්‍ය කළමනාකරණය

ඵලදායී අපද්‍රව්‍ය කළමනාකරණය පාරිසරික කළමනාකරණයේ ප්‍රධාන අංගයකි. අන්තරායකර සහ අන්තරායකර නොවන අපද්‍රව්‍ය වෙන් කිරීම, අවම කිරීම සහ වගකීමෙන් යුතුව බැහැර කිරීම සිදුකරන බව බැංකුව සහතික කරයි.

- **ප්‍රතිචක්‍රීකරණය සහ වෙන් කිරීමේ වැඩසටහන්:**
  - අපද්‍රව්‍ය වෙන් කිරීම මඟින් කඩදාසි, ප්ලාස්ටික් සහ කාබනික අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමට සහ හැකි අවස්ථාවල නැවත භාවිතා කිරීමට හැකියාව ලැබේ.
  - මධ්‍යම පරිසර අධිකාරියේ මාර්ගෝපදේශයන්ට අනුකූලව මහ නගර/නගර සභා සමඟ සහයෝගයෙන් බැහැර කිරීම කළමනාකරණය කෙරේ.
  - ආහාර අපද්‍රව්‍ය සහ පොලිතීන් අපද්‍රව්‍ය නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනට භාර දෙනු ලැබේ.
  - අනෙකුත් ප්‍රතිචක්‍රීකරණය කළ හැකි/නැවත භාවිතා කළ හැකි ද්‍රව්‍ය සැපයුම් අංශය හරහා වෙන්දේසි කරනු ලැබේ.
- **අන්තරායකර සහ අන්තරායකර නොවන නියාමනය (GRI i 306 පෙළගස්වා ඇත):** බැංකුව කඩදාසි අපද්‍රව්‍ය සහ ජෛව හායනයට ලක්විය හැකි ද්‍රව්‍ය ප්‍රවාහ ඇතුළුව අපද්‍රව්‍ය පරිමාවන් සහ සංයුතිය නියාමනය කර වාර්තා කරයි.
- **අනතුරුදායක අපද්‍රව්‍ය වගකීමෙන් බැහැර කිරීම:** පාරිසරික හානිය සහ සෞඛ්‍ය අවදානම් අවම කිරීම සඳහා යල් පැන ගිය තොරතුරු තාක්ෂණ උපකරණ සහ රසායනික ද්‍රව්‍ය පදනම් කරගත් ද්‍රව්‍ය පාරිසරික නීතිවලට අනුකූලව බැහැර කරනු ලැබේ.

## 2.6 තිරසාර ප්‍රසම්පාදනය හා වගකීම්සහගත මූලාශ්‍රකරණය

බැංකුවේ තිරසාර ප්‍රසම්පාදන ප්‍රවේශය, ශක්තිමත් ESG ව්‍යවහාර ක්‍රියාත්මක කර ඇති සැපයුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙන අතර පිරිවැය සහ මෙහෙයුම් කාර්යසාධනය සමඟ තිරසාර සාක්ෂි පත් පිළිබඳ සහතික සලකා බලයි.

- **පරිසර හිතකාමී සැපයුම්කරු හවුල්කාරිත්වයන්:** කාර්යාල සැපයුම්, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ ඉදිකිරීම් ද්‍රව්‍ය හරහා තිරසාර මනා පරිචයන් සහ වගකීම්සහගත මූලාශ්‍ර පෙන්නුම් කරන සැපයුම්කරුවන් සඳහා මනාපය, හැකි සෑම තැනකම ජෛව හායනයට ලක්විය හැකි, ප්‍රතිචක්‍රීකරණය කළ හැකි හෝ බලශක්ති කාර්යක්ෂම විකල්පවලට ප්‍රමුඛත්වය දීම.
- **හරිත නිෂ්පාදන තෝරා ගැනීම:** මෙහෙයුම් පාසටහන අඩු කිරීම සඳහා ප්‍රතිචක්‍රීකරණය කරන ලද කඩදාසි, පරිසරිකමය වගකීම්සහගත ඇසුරුම් සහ බලශක්ති කාර්යක්ෂම උපකරණ වැනි තිරසාර විකල්පවලට ප්‍රමුඛත්වය දීම.
- **තිරසාර තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්:** සම්පත් භාවිතය ප්‍රශස්ත කිරීම, භෞතික දෘඩාංග මත යැපීම අඩු කිරීම සහ කාලයත් සමඟ විද්‍යුත් අපද්‍රව්‍ය උත්පාදනය අවම කිරීම සඳහා බලශක්ති කාර්යක්ෂම සේවාදායකයන්, මේඝ මත පදනම් වූ විසඳුම් සහ ඩිජිටල් වේදිකා තුළ ආයෝජනය කිරීම.

## 2.7 පාරිසරික සක්‍රීයකරුවෙක් ලෙස ඩිජිටල් පරිනාමනය

තිරසාරභාවය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සඳහා වූ බැඳීමේ කොටසක් ලෙස, බැංකුව නාස්තිය අඩු කරන, පාසටහන අඩු කරන සහ ඔරොත්තු දීම වර්ධනය කරන, කඩදාසි රහිත බැංකුකරණය සහ ඩිජිටල් ලෙස සක්‍රීය කරන ලද සේවා ස්ථානයක් වේගවත් කරමින් සිටී.

**ඇතුළත් මූලික මූලපිරීම්:**

- **කඩදාසි රහිත බැංකුකරණය සහ ඩිජිටල් ගනුදෙනුකාර සහභාගීත්වය:** ඩිජිටල් බැංකුකරණ මධ්‍යස්ථාන මූලපිරීම් පුළුල් කිරීම සහ මුද්‍රිත ප්‍රවර්ධන ද්‍රව්‍ය අඩු කිරීම සඳහා සමාජ මාධ්‍ය සහ ඩිජිටල් මාර්ග භාවිතය වැඩි කිරීම.
- **ඩිජිටල් ගනුදෙනුකාර සන්නිවේදනය සහ සේවා:** කඩදාසි පාදක ලිපි හුවමාරුව අඩු කිරීම සඳහා ඩිජිටල් ගෙවීම් මාර්ග දිරිමත් කරන, විද්‍යුත් අලුත් කිරීමේ ලිපි, කෙටි පණිවිඩ පාදක PIN නිකුත් කිරීම, වැඩිකළ විද්‍යුත් ප්‍රකාශන, මාර්ගගත අරමුදල් මාරු කිරීම් සහ ඩිජිටල් ලැබීම්.
- **අභ්‍යන්තර ක්‍රියාවලි ඩිජිටල්කරණය:** කඩදාසි මත පදනම් වූ සංදේශ සහ වැඩ ප්‍රවාහ අනුමැතීන් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා විද්‍යුත් අනුමත කිරීමේ පද්ධති යොදා ගැනීම.
- **OASYS පද්ධති ක්‍රියාත්මක කිරීම:** වැඩ ප්‍රවාහයන් ක්‍රමවත් කිරීම සහ ලියකියවිලි අඩු කිරීම සඳහා අතින් සිදුකරන අභ්‍යන්තර ඉල්ලීම් (IT දෘඩාංග/මෘදුකාංග, පරිශ්‍ර නඩත්තුව, වාහන කළමනාකරණය) OASYS මෘදුකාංගයට සංක්‍රමණය කිරීම.
- **ඩිජිටල් ලේඛන කළමනාකරණය:** ගබඩා අවශ්‍යතා අඩු කිරීම, නැවත ලබාගැනීමේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ පාරිසරික කාර්යසාධනය ශක්තිමත් කිරීම සඳහා භෞතික වාර්තා තබා ගැනීම ප්‍රතිස්ථාපනය කිරීම.
- **දැනුම ඩිජිටල්කරණය:** කඩදාසි භාවිතය අඩු කරන අතරම ප්‍රවේශය වැඩි දියුණු කරමින්, භෞතික අත්පොත් බැංකුවේ ඩිජිටල් පුස්තකාලය බවට පරිවර්තනය කිරීම,
- **තාක්ෂණයෙන් සක්‍රීය සේවා ප්‍රශස්තිකරණය:** කාර්යක්ෂම සේවා සැපයීමට සහාය වීම සහ අතින් සැකසීම අඩු කිරීම සඳහා CRM යන්ත්‍ර භාවිතය වැඩි කිරීම.

වැඩි විස්තර සඳහා 134 සිට 143 දක්වා පිටුවල බුද්ධිමය ප්‍රාග්ධනය බලන්න.

**ජාතික ඇගයීම**

දේශගුණික මූල්‍යකරණය, පාරිභෝගික ආරක්ෂණය සහ ඩිජිටල් පරිවර්තනය යන ක්ෂේත්‍රයන්හි දක්වූ විශිෂ්ට නායකත්වය වෙනුවෙන් WSBI-SDG සම්මාන උළෙලේදී ජාතික ඉතිරිකිරීමේ බැංකුව සම්මානයට පාත්‍ර විය.



## 2.8 පාර්ශවකාර සහභාගිත්වය හා හවුල්කාරිත්වයන්

ස්වභාවික ප්‍රාග්ධනයේ අර්ථවත් ප්‍රගතිය සහයෝගීතාවය මත රඳා පවතී. අපගේ පාරිසරික බලපෑම, ජාතික ප්‍රමුඛතා සමඟ පෙළගැස්වීම වර්ධනය කිරීමට, සහ හුවමාරු වටිනාකම ගොඩනැඟීමට බැංකුව සේවකයින්, ගනුදෙනුකරුවන්, හවුල්කරුවන් සහ නියාමකයින් සමඟ සක්‍රීයව සම්බන්ධ වේ. පහත වගුව අපගේ සහභාගිත්ව ප්‍රවේශය සහ 2025 ප්‍රධාන ඉස්මතු කිරීම් සාරාංශ කරයි.

## ස්වාභාවික ප්‍රාග්ධනය

| පාර්ශ්වකරුවන් | සහභාගිත්ව ප්‍රවේශය | 2025 විශේෂ සිදුවීම් |
|---|---|---|
| **සේවකයින්** | අභ්‍යන්තර සන්නිවේදනයන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා බලශක්ති සංරක්ෂණය සහ තිරසාර සේවා ස්ථාන භාවිතයන් සඳහා සහභාගිත්වය. | තිරසාරභාවය පිළිබඳ දැනුවත්භාවය සන්නිවේදනයට ඒකාබද්ධ කර ඇත. සූර්ය කෝෂ මිලදී ගැනීම සඳහා නව කාර්ය මණ්ඩල ණය. |
| **ගනුදෙනුකරුවන්** | නිෂ්පාදන සන්නිවේදනය සහ ඩිජිටල් යොදාගැනීමේ මූලපිරීම් හරහා පරිසර හිතකාමී මූල්‍ය හැසිරීම් පිළිබඳ දැනුවත්භාවය. | අප බෙදා ගන්නා සෑම සංවාදයකදීම පරිසර හිතකාමී මූල්‍ය හැසිරීම් අවදි කරන කථා සහ පණිවිඩ රැල්ලක් සෑදීමට බැංකුව සමාජ මාධ්‍ය වැළඳගෙන ඇත. |
| **ව්‍යාපාරික හවුල්කරුවන්** | පුනර්ජනනීය බලශක්ති යොදා ගැනීම පුළුල් කරන සහ හරිත මූල්‍යකරණ ප්‍රතිඵල ප්‍රවර්ධනය කරන හවුල්කාරිත්ව පදනම් වැඩසටහන්. | අඩු විමෝචනය සහ ඉහළ කාර්යක්ෂමතාවයකින් යුත් තාප බල උත්පාදනය සඳහා සොහාධනවි (පුද්ගලික) සමාගමට ආයතනික ණය ලබා දී ඇත. |
| **නියාමකයින් හා ක්ෂේත්‍රයේ ආයතන** | මහ බැංකුවේ තිරසාර මූල්‍ය මාර්ග සිතියම, හරිත මූල්‍ය වර්ගීකරණය සහ CA ශ්‍රී ලංකා හි SLFRS S1/S2 ක්‍රියාත්මක කිරීමේ මාර්ග සිතියම සමඟ පෙළගැස්වීම. | සක්‍රිය සහභාගිත්වය සහ අනුකූලතා නියාමනය. |

### 2.9 දිට්වා සුළි කුණාටුව තුලින් පාරිසරික බැඳීම නගා සිටුවීම

2025 දී ඇති වූ දිට්වා සුළි කුණාටුව අතරතුර අපගේ පාරිසරික සහ ඔරොත්තු දීමේ රාමුවේ මෙහෙයුම් ඵලදායිත්වය තීරණාත්මකව පරීක්ෂා කරන ලදී. මෙම සිදුවීම දේශගුණිකව ඔරොත්තු දෙන යටිතල පහසුකම්වල අපගේ ආයෝජන සහ බිඳවැටීම් අතරතුර ගනුදෙනුකරුවන්ට සහාය වීමට අපගේ සූදානම තහවුරු කළේය.

- **සක්‍රියකරණය සහ ප්‍රතිචාර දැක්වීම:** පෙර ස්ථාපිත අවදානම් ආදර්ශ සහ සිදුවීම් විධාන ව්‍යුහයන් වහාම සක්‍රිය කරන ලදී. බලපෑමට ලක් වූ දිස්ත්‍රික්කවල සේවා ස්ථාන කිහිපයක් තාවකාලික බිඳවැටීම්වලට මුහුණ දුන් අතර, අපගේ විමධ්‍යගත කළමනාකරණ පෙරාතු ලේඛණ මඟින් කාර්ය මණ්ඩල ආරක්ෂාව සහ සේවා අඛණ්ඩතාව සහතික කිරීම සඳහා කඩිනම් තීරණ ගැනීමට හැකි විය.
- **සේවයේ යොදවන ලද ගනුදෙනුකාර සහාය:** මුදල් ප්‍රවේශ සීමාවන්, ගෙවීම් බිඳවැටීම් සහ ලියකියවිලි දුෂ්කරතා හේතුවෙන් ගනුදෙනුකරුවන්ට ඇති වන ක්ෂණික පීඩනය සමනය කිරීම සඳහා ඉදිරි පෙළ මාර්ගෝපදේශය ශක්තිමත් කරන ලදී. අදාළ වන පරිදි, සාධාරණත්වය, පැහැදිලිකම සහ වේගයට ප්‍රමුඛත්වය දෙන ආකාරයෙන් සහන සහ ප්‍රතිව්‍යුහගත කිරීමේ මාර්ග කරා ගනුදෙනුකරුවන් යොමු කරන ලදී.
- **ප්‍රතිඵල සහ වලංගුකරණය:** මූලික යටිතල පහසුකම්වලට ප්‍රධාන ව්‍යුහාත්මක හානියක් සිදු නොවී බලපෑමට ලක් වූ ප්‍රදේශවලට තීරණාත්මක සේවාවන් කඩිනමින් යථාවත් කරන ලදී. මෙම ප්‍රතිචාරය මගින් පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය ශක්තිමත් කළ අතර අපගේ ඔරොත්තු දීමේ සැලසුම්කරණයේ ස්පෘශ්‍ය වටිනාකම පෙන්නුම් කළේය.
- **ඉදිරියට යොදාගත් පාඩම්:** විනයගරුක සන්නිවේදනය, පැහැදිලි උත්සන්න කිරීමේ මාර්ග, සූදානම පරීක්ෂා කිරීම සහ විකල්ප ප්‍රවේශ සැලසුම් සඳහා අවශ්‍යතාවය දිට්වා විසින් ශක්තිමත් කරන ලදී. අනාගත ප්‍රජා ආරක්ෂාව සහ අඛණ්ඩතා ප්‍රතිඵල වැඩිදියුණු කිරීම සඳහා මෙම පාඩම් ප්‍රතිචාර කාර්ය ග්‍රන්ථ පොත්වලට ඇතුළත් කරන ලදී.

දේශගුණිකව ඔරොත්තු දෙන යටිතල පහසුකම්වල සිට ගනුදෙනුකාර සහාය පෙරාතු ලේඛන දක්වා අපගේ ස්වාභාවික ප්‍රාග්ධන කළමනාකරණය මගින්, පාරිසරික හා මෙහෙයුම් බිඳවැටීම් හරහා ජාතියට විශ්වාසදායක කුළුණක් ලෙස බැංකුව පවතින බව සහතික කරන බව මෙම සැබෑ ලෝක පීඩන පරීක්ෂණයෙන් ඔප්පු විය.

වැඩි විස්තර සඳහා 167 සිට 171 දක්වා පිටුවල ප්‍රජා ප්‍රාග්ධනය බලන්න.

ස්වාභාවික ප්‍රාග්ධනය

## 3 අපි ප්‍රතිඵල ශක්තිමත් කරන ආකාරය

ස්වභාවික ප්‍රාග්ධනය ගනුදෙනුකාර පාරිභෝගික විශ්වාසය, උපායමාර්ගික කඩිසරකම සහ දිගුකාලීන ඔරොත්තු දීම ඇතිකරන බැවින් එය අනුකූලතාවයෙන් ඔබ්බට තිරසාර වටිනාකමක් නිර්මාණය කරයි. බැංකුව, එහි ගනුදෙනුකරුවන් සහ පුළුල් මූල්‍ය පද්ධතිය සඳහා ස්ථාවරත්වය, කීර්තිනාමය සහ උපායමාර්ගික ස්ථානගත කිරීමෙහි මැනිය හැකි වර්ධනයන් ලබා දෙමින්, විචාරවත් ප්‍රතිඵල මාර්ග හරහා පාරිසරික හාරකාරත්වය ස්පෘශ්‍ය ප්‍රතිලාභ බවට පරිවර්තනය කරයි. බැංකුව විසින් ප්‍රතිඵල මාර්ග හතරක් හරහා මෙය සක්‍රීය කරයි:

| ප්‍රතිඵල මාර්ග | මූලික ජයග්‍රහණ | ගනුදෙනුකාර වටිනාකම | බැංකුවට නිර්මාණය කළ වටිනාකම |
|---|---|---|---|
| **ගනුදෙනුකාර සහ ප්‍රජා ප්‍රතිඵල** | පුළුල් කළ හරිත මූල්‍යකරණය වේගවත් කළ කඩදාසි රහිත බැංකුකරණය, පුනර්ජනනීය බලශක්ති ප්‍රවේශය සඳහා ස්ථාපිත හවුල්කාරිත්වයන්. | බැංකුවේ ධනාත්මක පාරිසරික දායකත්වය පිළිබඳ විශ්වාසය, පිරිසිදු බලශක්ති මූල්‍යකරණය සඳහා පාරිභෝගික ප්‍රවේශය. | ශක්තිමත් පාරිභෝගික සබඳතා, වැඩිදියුණු කළ කීර්තිය, හරිත ණය දීම හරහා කළඹ විවිධාංගීකරණය. |
| **මෙහෙයුම් ඔරොත්තුදීම** | දේශගුණික-ඒකාබද්ධ BCP, පුනර්ජනනීය බලශක්තිය යොදා ගැනීම, ප්‍රගතිය ලද භූගෝලීය අවදානම් සිතියම්ගත කිරීම. | අහිතකර කාලගුණය තුළ තිරණාත්මක යටිතල පහසුකම් ඔරොත්තු දීම පිළිබඳ විශ්වාසය, අඩුකළ පද්ධතිමය බාධා අවදානම. | වඩා අඩු මෙහෙයුම් අක්‍රීය කාලය, අඩුකළ බලශක්ති මිල නිරාවරණය, දීර්ඝ කළ වත්කම් ආයු කාලය. |
| **අවදානම් හා අනුකූලතා විනය** | ඇතුළත් කළ ESRM/ESG නිවාරණය, වැඩි කළ නිසි සම්ප්‍රජන්‍ය, ප්‍රගතියක් ලබා ඇති SLFRS S1/S2 සූදානම. | පාරිසරික අවදානම් කළමනාකරණය පිළිබඳ විශ්වාසය, අධීක්ෂණ නියාමනය සඳහා විශ්වාසදායක අනාවරණ. | පාරිසරික හානියට අඩුකළ නිරාවරණය, සුමට නියාමන අනුමැතීන්, ශක්තිමත් වාර්තාකරණ අඛණ්ඩතව |
| **පිරිවැය කාර්යක්ෂමතාව** | වර්ධිත බලශක්ති කාර්යක්ෂමතා, පරිභෝජන ද්‍රව්‍ය අඩු කිරීම සඳහා කඩදාසි රහිත භාවිතය, වගකීම්සහගතු අපද්‍රව්‍ය කළමනාකරණය. | පාරිසරික වගකීම සහ මූල්‍ය විචක්ෂණභාවය එකිනෙකා ශක්තිමත් කරන බව පෙන්නුම් කිරීම. | අඩු මෙහෙයුම් පිරිවැය, වැඩිදියුණු කළ ඵලදායිතාව, අඩුකළ පාරිසරික පියසටහන. |

### 3.1 හරිත තේරීම් හරහා ගනුදෙනුකාර හා ප්‍රජා ප්‍රතිඵල

- කඩදාසි රහිත සහ ඩිජිටල්-පළමු සේවාවන් කඩදාසි භාවිතය සහ ඒ ආශ්‍රිත පාරිසරික බලපෑම් අඩු කරන අතරම පහසුව සහ ප්‍රවේශ්‍යතාව වර්ධනය කරයි.
- තිරසාර මූල්‍ය සහ ඔරොත්තු දීම හා පෙළගැස්වූ නිෂ්පාදන ගනුදෙනුකරුවන්ට සහ ප්‍රජාවන්ට පිරිසිදු බලශක්ති විසඳුම් යොදා ගැනීමට සහය වන අතර කාලයත් සමඟ ප්‍රතිසාධන හැකියාව ශක්තිමත් කරයි.
- සහභාගිත්වය මෙහෙයවන ESG ඉහළ නැංවීම, විනයගරුක ගනුදෙනුකාර පාරිසරික හාරකාරත්වයට සංක්‍රමණය වීම, දිගුකාලීන සම්බන්ධතා ප්‍රතිඵල සහ ඔරොත්තු දීම ශක්තිමත් කිරීම සඳහා සහාය වේ.

### 3.2 මෙහෙයුම් ඔරොත්තුදීම සහ අඛණ්ඩතාව

- සම්පත් කාර්යක්ෂමතාව සහ පුනර්ජනනීය යොදා ගැනීම, බලශක්ති අස්ථාවරත්වයට නිරාවරණය අඩු කර ඇති අතර පරිශ්‍ර කාර්යක්ෂමතාව වර්ධනය කර ඇත.
- ශක්තිමත් නියාමනය, විනයගරුක මෙහෙයුම් චර්යාවන් සහ අඛණ්ඩ සූදානම අක්‍රීය කාලය අඩු කිරීමට සහ සේවා ලබා ගැනීමේ හැකියාව ආරක්ෂා කිරීමට උපකාරී වේ.
- පාරිසරික හාරකාරත්වය වැඩිකළ මනා පහසුකම් භාවිතයන් සහ අඩුකළ බිඳවැටීම් අවදානම හරහා භෞතික ඔරොත්තු දීමට සහාය වේ.

### 3.3 අවදානම් විනය, අනුකූලතාවය හා කීර්තිනාම ආරක්ෂාව

- ESG ඒකාබද්ධ ණය ඇගයීම සහ ESRM පාලනයන් මූල්‍යකරණය කරන ලද පාරිසරික හානියට නිරාවරණය වීම සහ ඒ ආශ්‍රිත කීර්තිනාම අවදානම අඩු කරයි.
- නියාමන පෙළගැස්ම (මහ බැංකුවේ තිරසාර මූල්‍ය නියෝග සහ වර්ගීකරණ අපේක්ෂාවන්) මගින් පාලන විශ්වසනීයත්වය ශක්තිමත් කරන අතර අධීක්ෂණ අවදානම අඩු කරයි.
- වඩා යහපත් දත්ත විනය කාලයත් සමඟ වාර්තා කිරීම, තිරණ ගැනීම සහ අවදානම් මෙහෙයවීම පිළිබඳ විශ්වාසය වර්ධනය කර ඇත.

### 3.4 පිරිවැය කාර්යක්ෂමතාව සහ ඵලදායිතාවය

- බලශක්ති සහ ජල කාර්යක්ෂමතාව මෙහෙයුම් පිරිවැය පීඩනය අඩු කළ අතර දිගුකාලීන ඵලදායිතාව ශක්තිමත් කර ඇත.
- කඩදාසි රහිත මෙහෙයුම් පරිභෝජනය, ගබඩා කිරීම සහ අතින් සැකසීමේ බර අඩු කර ඇත.
- තිරසාර ප්‍රසම්පාදනය හැකි තැන්වල වඩාත් කල් පවතින, කාර්යක්ෂම සහ වගකීම්සහගත විකල්ප තෝරා ගැනීමෙන් ජීවන චක්‍ර කාර්යක්ෂමතාව වැඩි දියුණු කර ඇත.

# ස්වාභාවික ප්‍රාග්ධනය

## 4 මෙයින් ලබාදෙන දෑ

2025 දී, ස්වභාවික ප්‍රාග්ධන කළමනාකරණය සඳහා අපගේ විනයගරුක සහ ක්‍රියාශීලී ප්‍රවේශය බැංකුවේ පාරිසරික පදනම් ශක්තිමත් කර, පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය වැඩි දියුණු කර, අඩු කාබන් ආර්ථිකයක් කරා ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තිය තුළ වගකීම්සහගත හවුල්කරුවෙකු ලෙස අපව ස්ථානගත කළේය. පාරිසරික වගකීම අනුකූලතා බරක් ලෙස නොව උපායමාර්ගික වත්කමක් ලෙස සැලකීමෙන්, සමාජය සහ ආර්ථිකය පවත්වා ගෙන යන ප්‍රාග්ධනයම අපි ශක්තිමත් කර ඇත. පහත විස්තර කර ඇති ප්‍රතිඵල අපගේ ස්වාභාවික ප්‍රාග්ධන මූලපිරීම් සහ බැංකුවේ මෙහෙයුම් අඛණ්ඩතාව, වෙළෙඳපොල කීර්තිනාමය සහ දිගුකාලීන උපායමාර්ගික ස්ථානගත කිරීම අතර පැහැදිලි සම්බන්ධයක් පෙන්නුම් කරයි.

### 4.1 ආයෝජනයේ සිට බලපෑම දක්වා

ස්වභාවික ප්‍රාග්ධනය ශක්තිමත් කිරීම කෙරෙහි අපගේ අවධානය තුළින් තීරණාත්මක මානයන් පහක් හරහා මැනියහැකි වටිනාකම ලබා දී ඇත:

- **නියාමන අනුකූලතාවය සහ චාර්තා කිරීමේ සූදානම:** පාරිසරික රෙගුලාසි සමඟ පූර්ණ අනුකූලතාවය SLFRS සහ SLFRS S2 පෙළගැස්ම කෙරෙහි සැලකිය යුතු ප්‍රගතිය.
- **හරිත මූල්‍ය ව්‍යාප්තිය:** පාරිසරික ණය බෙදාහැරීම් වැඩි වීම, සූර්ය විසඳුම් සඳහා ගනුදෙනුකාර ප්‍රවේශය පුළුල් කරන හවුල්කාරිත්වයන්.
- **මෙහෙයුම් පියසටහන් අඩු කිරීම:** සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ශාඛා ස්ථාන 45 ක් දක්වා ව්‍යාප්ත වීම, කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම් හරහා බලශක්ති තීව්‍රතාවය අඩු වීම, කඩදාසි රහිත භාවිතය වේගවත් වීම, බලශක්ති කාර්යක්ෂම පියවර හරහා බලශක්ති පරිභෝජනය.
- **දේශගුණිකව ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම:** දිට්වා සුළි කුණාටුවේ පාඩම් BCP තුළට ඇතුළත් කර ඇත, භූගෝලීය අවදානම් අනුරූපිතයේ ප්‍රගතිය; තීරණාත්මක ස්ථානවල ශක්තිමත් කළ උපස්ථ බලය සහ සන්නිවේදනය.
- **පාර්ශවකාර විශ්වාසය සහ කීර්තිනාමය:** වැඩිකළ තිරසාර අනාවරණ, තිරසාර මූල්‍යකරණය පිළිබඳ තියුණු නියාමන සහභාගිත්වය, දෘශ්‍ය පාරිසරික බැඳීම් තුළින් ශක්තිමත් ගනුදෙනුකාර විශ්වාසය

### 4.2 ස්වභාවික පාග්ධන වටිනාකම් ලකණු කාඩ්පත

අපගේ ස්වභාවික ප්‍රාග්ධනය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා, බැංකුව ප්‍රමුඛ සහ පසුගාමී දර්ශකවල සමතුලිත කට්ටලයක් නිරීක්ෂණය කරයි. මෙම මිනුම්වලින් අපගේ පාරිසරික කාර්යසාධනය පිළිබඳ තීරණාත්මක අවබෝධයක් ලබා දේ. පුනර්ජනනීය බලශක්ති ප්‍රසාරණය සහ ESG නිවාරණ ආවරණය වැනි ප්‍රමුඛ දර්ශක හරහා අනාගත ඔරොත්තු දීමේ හැකියාව පුරෝකථනය කරන අතර සම්පත් පරිභෝජනය සහ හරිත මූල්‍ය පරිමාවන් වැනි පසුගාමී දර්ශක හරහා ප්‍රතිඵල මනිනු ලබයි. පාරිසරික කාර්යසාධනය ප්‍රශස්ත කිරීම, නියාමන අනුකූලතාව සහතික කිරීම සහ ජාතික තිරසාර ඉලක්ක සඳහා සහාය වීම සඳහා මෙම විනයගරුක ලුහුබැඳීම මූලික වේ.

පහත වගුව මගින් මෙම ප්‍රධාන ක්ෂේත්‍ර හරහා අපගේ කාර්යසාධනය විස්තර කරයි.

| දර්ශක වර්ගය | මිනුම් ක්ෂේත්‍රය | මූලික කාර්යසාධන දර්ශක | ඒකක | 2025 | 2024 | ප්‍රවනතාව |
|---|---|---|---|---|---|---|
| ප්‍රමුඛ දර්ශක | පුනර්ජනනීය බලශක්ති ප්‍රසාරණය | සූර්ය බලශක්ති ස්ථාන | ගණන | 45 | 45 | ස්ථාවර |
| | ESG ඒකාබද්ධ කිරීම | ESG නිවාරණය මගින් ආවරණය කළ කළඹ | % | 100 | 100 | ස්ථාවර |
| | නියාමන අනුකූලතාව | පාරිසරික නියාමන කඩකිරීම්/දඩ | ගණන | 0 | 0 | ස්ථාවර |
| පසුගාමී දර්ශක | වාර්තාකරණ නිරවද්‍යතාව | නියමිත වේලාවට ඉදිරිපත් කළ තිරසාර අනාවරණ | % | 100 | 100 | ස්ථාවර |
| | බලශක්ති කාර්යක්ෂමතාව | බලශක්ති පරිභෝජනය | GJ | 35,353 | 33,857 | අඩුකළ |
| | පුනර්ජනනීය උත්පාදනය | බලශක්ති තීව්‍රතාව | GJ | 8.4 | 7.8 | අඩුකළ |
| | | සූර්ය බල උත්පාදන දායකත්වය | GJ | 2,059 | 1,684 | වැඩිකළ |
| | ජල කළමනාකරණය | තෙවැනි පාර්ශව ජල ඉවත්කර ගැනීම් | $m^3$ | 68,815 | 62,744 | අඩුකළ |
| | කඩදාසි පරිභෝජනය | කඩදාසි භාවිතය | ඒකක | 900,741 | 685,343 | අඩුකළ |
| | තිරසාර මූල්‍ය | බෙදාහැරි හරිත මූල්‍යකරණය | රු.මි. | 1,000 | 4,000 | අඩුකළ |

වගුව 23

# ස්වාභාවික ප්‍රාග්ධනය

## වෙනත් ප්‍රාග්ධන සමඟ විභව සමතුලිතතා හා සහක්‍රියා

- **මූල්‍ය ප්‍රාග්ධනය සමඟ විභව සමතුලිතතා:** දිගුකාලීන ඉතුරුම්, අවදානම් අඩු කිරීම සහ කිර්තිනාම ලාභ සඳහා ඉහළ මුල් ආයෝජනය
- **සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය සමඟ සහක්‍රියා:** පාරිසරික භාරකාරත්වය ප්‍රජාවන්, නියාමන ආයතන සහ ගනුදෙනුකරුවන් සමඟ විශ්වාසය ගොඩනඟයි.
- **මානව ප්‍රාග්ධනය සමඟ සහක්‍රියා:** හරිත මූලපිරීම් සඳහා සේවක සහභාගිත්වය අභිමානය, හැකියාව ගොඩනඟන අතර අරමුණු මත පදනම් වූ දක්ෂතා ආකර්ෂණය කරයි.
- **ඔස්වහාවික ප්‍රාග්ධනය සමඟ සහක්‍රියා:** දේශගුණික රාමු සහ දත්ත හැකියාවන් තුළ ආයෝජනය කිරීම මූලික කටයුතුවලින් අවධානය තාවකාලිකව වෙනතකට යොමු කළ හැකිය.

## ඉදිරි දැක්ම: 2026 සහ ඉන් ඔබ්බට ප්‍රමුඛතා

- **සූර්ය බලශක්ති ධාරිතාව පුළුල් කිරීම:** සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ස්ථාන වැඩි කර උත්පාදනය ප්‍රශස්ත කිරීම.
- **දේශගුණික අවදානම් තක්සේරු ශක්තිමත් කිරීම:** ණය දීමේ සහ ආයෝජන තීරණ වලට දේශගුණික අවදානම ඒකාබද්ධ කිරීම.
- **හරිත මූල්‍යකරණය පරිමාණය කිරීම:** පුනර්ජනනීය බලශක්ති සහ කාර්යක්ෂම ව්‍යාපෘති සඳහා ණය පහසුකම් පුළුල් කිරීම.
- **SLFRS S1/S2 සූදානම ඉදිරියට ගෙන යාම:** දත්ත පද්ධති ශක්තිමත් කිරීම සහ තිරසාර වාර්තාකරණය සඳහා සහතික කිරීම.
- **අතිරේක හරිත නිෂ්පාදන සංවර්ධනය කිරීම:** හරිත බැඳුම්කර සහ තිරසාරභාවයට සම්බන්ධ ණය දියත් කිරීම.
- **ශක්තිමත් ESG පාලනය:** දේශගුණික අවස්ථා විශ්ලේෂණය ඇතුළත් කර ESG මිනුම් ශක්තිමත් කිරීම.

## අනාගත වර්ධනය සඳහා ස්වභාවික ප්‍රාග්ධනයේ ප්‍රමාණාත්මතාව

දේශගුණික අස්ථාවරත්වය, සම්පත් හිඟය සහ ඉහළ යන පාරිසරික අපේක්ෂාවන් යන අංශවල වර්ධනිය පීඩන මධ්‍යයේ වුවද, හරිත යටිතල පහසුකම්, දේශගුණික අවදානම් ඒකාබද්ධ කිරීම සහ සම්පත්-කාර්යක්ෂම මෙහෙයුම් තුළ අපගේ ක්‍රියාකාරී ආයෝජන වගකිවයුතු සහ ඔරොත්තු දෙන පාරිසරික පදනමක් නිර්මාණය කර ඇත. අපගේ සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ශාඛා, තිරසාර ප්‍රසම්පාදන ව්‍යවහාර සහ ශක්තිමත් කරන ලද දේශගුණික අනුවර්තන පියවර අපගේ 2026-2028 උපාය මාර්ගය ලබා දීමට අවශ්‍ය මෙහෙයුම් ස්ථාවරත්වය සහ පාරිසරික හාරකාරත්වය සපයයි.

අපගේ ආර්ථිකය තහවුරු කරන ස්වභාවික පද්ධති සංරක්ෂණය කිරීමට සහ වැඩිදියුණු කිරීමට අපි කැපවී සිටිමු - එහිදී අපගේ යටිතල පහසුකම් සහ මූල්‍ය කටයුතු වර්තමාන අවශ්‍යතා සඳහා පමණක් නොව තිරසාර බව සඳහා බව සහතික කරමු.



**පෙට්‍රල්[LA]**
**567.16 GJ**

**ඩීසල්[LA]**
**527.26 GJ**

**බලශක්ති තීව්‍රතාව[LA]**
**8.4 GJ**
(2024 – 7.8 GJ)

**තෙවැනි පාර්ශ්ව ජල ඉවත්කර ගැනීම්[LA]**
**68,815 m³**
(2024 – 62,744 m³)

**විදුලි පරිභෝජනය[LA]**
**34,258 GJ**

**බලශක්ති පරිභෝජනය[LA]**
**35,353 GJ**
(2024 – 33,857 GJ)

**අලෙවි කළ විදුලිය[LA]**
**2,059 GJ**
(2024 – 1,684 GJ)

**ශාඛාවකට බලශක්ති පරිභෝජනය**
**134.4 GJ**
(2024 – 125.5 GJ)

රූපය 16

ලබා ගත හැකි සහය ලියකියවිලි භාවිතයෙන් මුළු විදුලි පරිභෝජනය ගණනය කරන ලදී. අභ්‍යන්තර ගැටළු සහ දිවිවාහි බලපෑම හේතුවෙන්, ශාඛා 26 ක් සඳහා ජනවාරි සහ දෙසැම්බර් බිල්පත් ඇතුළු සහය ලේඛන ලබා ගත නොහැකි විය. ඒ අනුව, 2025 සඳහා සාමාන්‍ය පරිභෝජන අනුපාතය භාවිතා කරමින් අතුරුදහන් වූ අගයන් ඇස්තමේන්තු කරන ලදී.

# SLFRS තිරසාරතාවයට අදාළ මූල්‍ය අනාවරණ (SLFRS S1 සහ SLFRS S2)

## දළ විශ්ලේෂණය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ, තිරසාරතාවය යනු සමාන්තර වැඩසටහනක් නොවන අතර එය තැන්පත්කරුවන්ගේ විශ්වාසය ශක්තිමත් කරන, ගනුදෙනුකාර ප්‍රතිඵල වැඩිදියුණු කරන, මෙහෙයුම් ඔරොත්තු දීම වැඩි කරන සහ ශ්‍රී ලංකාවේ දිගුකාලීන ආර්ථික හා සමාජීය ප්‍රගතියට සහාය වන වටිනාකම් ආරක්ෂණ සහ වටිනාකම් නිර්මාණය කිරීමේ විනයකි. උපාය මාර්ග, අවදානම් රුචිය, පාලන විනය සහ සම්පත් වෙන් කිරීම සමඟ ESG ප්‍රමුඛතා පෙළඟ ස්වමින්, අපගේ තිරසාර ප්‍රවේශය ඒකාබද්ධ චින්තනය මත පදනම් වී ඇති අතර එමඟින් තීරණාත්මක ප්‍රාග්ධන හයක් හරහා සහ කෙටි, මධ්‍යම සහ දිගු කාලීනව ඇගයීමට ලක් කෙරේ.

2025 දී, අපගේ තිරසාරතා අවධානය හැඩගස්වනු ලැබුවේ:

- ස්වෛරී පාදක වූ සහතික කිරීමේ කොටසක් සහිත රජයට අයත් ඉතුරුම් ආයතනයක් සඳහා ඔරොත්තු දීම සහ විශ්වාසනීය අපේක්ෂාවන්
- ප්‍රවේශ්‍යතාව සහ සහාය-සේවා අවශ්‍යතා ඇතුළුව ගනුදෙනුකාර ඇතුළත් වීම සහ සාධාරණ ප්‍රතිඵල
- මෙහෙයුම් සහ ප්‍රජාවන් හරහා අඛණ්ඩතාවයේ සහ ප්‍රතිසාධන හැකියාවේ අවශ්‍යතාවය හඳුනා ගනිමින් දේශගුණික සහ ආපදා ප්‍රතිෂ්ඨාවන්,
- SLFRS S1 (තිරසාරතාවයට අදාළ මූල්‍ය තොරතුරු අනාවරණය සඳහා වන පොදු අවශ්‍යතා) සහ SLFRS S2 (දේශගුණයට අදාළ අනාවරණ) සඳහා ප්‍රගතිශීලී සූදානම ඇතුළුව වෙනස් වන අනාවරණ අපේක්ෂාවන්

මෙම පරිච්ඡේදය මගින් 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අපගේ තිරසාරතාවයට අදාළ මූල්‍ය අනාවරණ ඉදිරිපත් කර ඇත. එය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලදී. SLFRS S1 සහ SLFRS S2 ට අදාළව සකස් කර ඇති අතර IFRS පදනම යටතේ ජාත්‍යන්තර තිරසාරතා ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කරන ලද IFRS තිරසාරතාවය පිළිබඳ අනාවරණ ප්‍රමිතීන්ට අනුකූල වේ.

මෙම අනාවරණවලින් තිරසාරතාවය සහ දේශගුණය ආශ්‍රිත අවදානම් තක්සේරු කිරීමේදී අපගේ පොදු අරමුණු වන මූල්‍ය වාර්තාවල ප්‍රාථමික පරිශීලකයින්ට සහාය වීම අරමුණු කරන අතර එය සාධාරණව බලපෑම් කළ හැකි වන්නේ අපගේ:

- මුදල් ප්‍රවාහ,
- මූල්‍ය ප්‍රවේශය, හෝ
- කෙටි, මධ්‍යම සහ දිගු කාලීනව ප්‍රාග්ධන පිරිවැයටය.

අපs SLFRS S1 සහ SLFRS S2 සඳහා මූලික හැකියා ගොඩනැඟීමේ අදියරක සිටිමු. අදාළ වන පරිදි දිවිවා සිදුවීමට සම්බන්ධ අපගේ තක්සේරු සහ ප්‍රතිචාර ක්‍රියාමාර්ග (සිදුවීම් ආශ්‍රිත ණය සමාලෝචන ක්‍රියාමාර්ග සහ ඒ ආශ්‍රිත ආවරණ ඇතුළුව) හැර, දේශගුණයට අදාළ බලපෑම් ප්‍රමාණනය කිරීම තවමත් සංවර්ධනය යටතේ පවතී, එමනිසා, පළමු වසරේ යොදා ගැනීමට අනුකූලව, අපs SLFRS S1 සහ SLFRS S2 යටතේ අවසර දී ඇති සංක්‍රාන්ති සහන යොදාගෙන ඇති අතර, අනවශ්‍ය පිරිවැය හෝ වෑයමක් නොමැතිව වාර්තා කිරීමේ දිනයේදී ලබා ගත හැකි "සාධාරණ සහ සහායවන තොරතුරු" භාවිතය ඇතුළුව ප්‍රමිති මගින් අවසර දී ඇති සමානුපාතික යාන්ත්‍රණ භාවිතා කර ඇත.

### 2025 අනාවරණ අවධාරණ හා මූලික හැකියා පරතර

අපගේ 2025 අනාවරණ මගින් තීරණ-ප්‍රයෝජනවත් දේශගුණය ආශ්‍රිත තොරතුරු ප්‍රමුඛ කරන අතර, සාක්ෂි පදනම ප්‍රමාණවත් තරම් ශක්තිමත් වන පුළුල් තිරසාරතාවය ආශ්‍රිත අවදානම් සහ අවස්ථාවන් දක්වා ක්‍රමයෙන් ව්‍යාප්ත වේ. මෙය තිරසාර මූල්‍ය සහ පාරිසරික හා සමාජීය අවදානම් කළමනාකරණය 2025-2029 කාලය තුළ මූල්‍ය අංශ පාලනය, අවදානම් කළමනාකරණය සහ වෙළෙඳපොල සංවර්ධනයට ඒකාබද්ධ කළ යුතු වන ශ්‍රී ලාංකික අධීක්ෂණ අපේක්ෂාවන් සමඟ පෙළ ගැසේ.

- ප්‍රධාන හැකියා පරතර, සම්පූර්ණ SLFRS S1 සහ SLFRS S2 පරිණතභාවයට අදාළ වන අතර, අපගේ ප්‍රතිචාර වන්නේ:

- **කළඹේ දේශගුණික විශ්ලේෂණ:** භෞතික සහ සංක්‍රාන්ති අවදානම් පියවර ගොඩනගන අතර, කළඹ මට්ටමේ තාප සිතියම් සහ ණය ගැණුම්කරු මට්ටමේ දත්ත පොහොසත් කිරීම වේදිකාගත කර ඇත.
- **මූල්‍යමය විමෝචන (විෂය පථය 3 කාණ්ඩය 15):** මුල් සංවර්ධනයේ දී; පිළිගත් මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවේශයන් භාවිතා කරමින් අදියරගත ශක්‍යතා සැලසුම් ක්‍රියාත්මක වෙමින් පවතී.
- **ප්‍රමාණාත්මක අවස්ථා විශ්ලේෂණය සහ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව අනාවරණය කිරීම:** 2025 දී භාවිතා කරන ලද ගුණාත්මක අවස්ථා චින්තනය සමඟ සංක්‍රාන්ති සහන කාලයෙන් පසු අදියරගත කර ඇත.
- **ප්‍රමාණාත්මක අපේක්ෂිත මූල්‍ය බලපෑම්:** 2025 දී ප්‍රධාන වශයෙන් ගුණාත්මක ක්‍රම පරිණත වන බැවින් ප්‍රමාණකරණය අදියරගත කර ඇත.

SLFRS S1 සහ SLFRS S2 අනාවරණවල නිර්මාණ ශිල්පය පහත වගුවෙන් ඉදිරිපත් කරයි.


| කොටස | අන්තර්ගතය | පිටුව |
|---|---|---|
| කොටස (1) | සකස් කිරීමේ පදනම | 182 |
| කොටස (2) | පාලනය | 187 |
| කොටස (3) | අවදානම් කළමනාකරණය | 192 |
| කොටස (4) | උපායමාර්ගය | 197 |
| කොටස (5) | මිණුම් හා ඉලක්ක | 210 |


## (1) සකස් කිරීමේ පදනම

### 1.1 වාර්තාකරණ ආයතනය, ආයතනයේ සීමාව සහ වටිනාකම දාමය

මෙම වාර්තාව SLFRS S1: තිරසාරතාවයට අදාළ මූල්‍ය තොරතුරු අනාවරණ කිරීම සඳහා වන පොදු අවශ්‍යතා සහ SLFRS S2: දේශගුණයට අදාළ හෙළිදරව් කිරීම් (මෙහි මින්මතු ප්‍රමිතීන් ලෙස හැඳින්වේ) හි දක්වා ඇති පරිදි ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ (බැංකුවේ) තිරසාරතාවයට අදාළ මූල්‍ය අනාවරණ කිරීම් දක්වා ඇත. මෙම අනාවරණ කිරීම් බැංකුවේ ප්‍රධාන කාර්යාලය සහ දිවයින පුරා ශාඛා ජාලය ඇතුළුව එහි මෙහෙයුම් ආවරණය කරන අතර විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා වාර්තාකරණ සීමාව සමඟ අනුකූල වේ. ප්‍රමාණාත්මක තිරසාරතාවයට අදාළ මූල්‍ය අනාවරණය කිරීම් හඳුනා ගැනීමේදී, බැංකුව එහි ව්‍යාපාර ආදර්ශය සහ වටිනාකම් දාමය සමීපව සමාලෝචනය කර ඇත. මෙම සමාලෝචනය, බැංකුවේ ව්‍යාපාර ආදර්ශයට ප්‍රමාණාත්මක තිරසාරතාවයට අදාළ බලපෑම් ඇති කරන ඉහළ ප්‍රවාහ මෙහෙයුම් (මූලාශ්‍ර සහ භවුල්කාරිත්වයන් ඇතුළුව), අභ්‍යන්තර ක්‍රියාවලීන් සහ පහළ ප්‍රවාහ මෙහෙයුම් දක්වා විහිදේ.

#### 1.1.1 වටිනාකම් දාමය

අපි රඳාපැවතුම් (ක්‍රියා කිරීමට අපට අවශ්‍ය යෙදවුම්) සහ බලපෑම් (අපගේ කටයුතු මූල්‍ය, නිෂ්පාදිත, බුද්ධිමය, මානව, සමාජීය සහ සම්බන්ධතා සහ ස්වාභාවික ප්‍රාග්ධනයට බලපාන ආකාරය) මගින් හැඩ ගස්වන ලද අන්තර් වශයෙන් රඳා පවතින වටිනාකම් දාමයක් තුළ ක්‍රියාත්මක වේ. දේශගුණයට අදාළ අවදානම් සහ අවස්ථා (CRROs) තක්සේරු කිරීමේදී, අනවශ්‍ය පිරිවැය හෝ වෑයමක් නොමැතිව වාර්තා කිරීමේ දිනයේදී ලබා ගත හැකි සාධාරණ සහ සහාය දැක්විය හැකි තොරතුරු භාවිතා කරමින් අපි ඉහළ සහ පහළ ප්‍රවාහ වටිනාකම් දාම අංග සලකා බලමු.

## SLFRS තිරසාරතාවයට අදාළ මූල්‍ය අනාවරණ (SLFRS S1 සහ SLFRS S2)

### 1.1.1.1 ඉහළ ප්‍රවාහ වටිනාකම් දාම

ඉහළ ප්‍රවාහ කටයුතු අතරට බැංකුවේ මෙහෙයුම් සඳහා අත්‍යවශ්‍ය බහු-ප්‍රාග්ධන සම්පත් සුරක්ෂිත කිරීම සඳහා පාර්ශ්වකරුවන් සමඟ එහි සහභාගිත්වය ඇතුළත් වේ. මිලියන 7.2 කට අධික ගනුදෙනුකරුවන් සංඛ්‍යාවක් සමඟ ශ්‍රේණිගත ආයතනයක් ලෙස බැංකුවේ ස්ථානය තුළින් එහි ප්‍රාග්ධන පදනමේ සහ පාර්ශ්වකරුවන්ගේ සබඳතාවල ශක්තිය පෙන්නුම් කරයි.

මූල්‍ය ප්‍රාග්ධනය

- ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත යටතේ පැහැදිලි 100% රජයේ ඇපකරයකින් පාදක වන, මිලියන 10.5 කට අධික ක්‍රියාකාරී ගිණුම් වලින් රු. ට්‍රිලියන 1.5 දක්වා ලඟා වූ ගනුදෙනුකාර තැන්පතු.
- ශූන්‍ය අවදානම් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර ඇති 60-70% තැන්පතු සහිත සම්පදායික වත්කම් වෙන් කිරීම පිළිබිඹු කරන, ප්‍රාථමික ආයෝජන මාර්ගයක් ලෙස රජයේ සුරැකුම්පත් කළඹ.
- අභියෝගාත්මක සාර්ව ආර්ථික කාල පරිච්ඡේදවලදී පවා ශක්තිමත් මූල්‍ය විනයක් පෙන්නුම් කරමින්, 2025 දී වාර්තා කළ 24.9% ක ස්ථර 1 ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය සහ රු. බිලියන 44.5 ක බදු ගෙවීමට පෙර ලාභය.

නිෂ්පාදිත ප්‍රාග්ධනය

- ශාඛා 263ක්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 295ක් සහ CRMs යන්ත්‍ර 123කින් සමන්විත දිවයින පුරා භෞතික යටිතල පහසුකම.
- වඩාත් දුරස්ථ ප්‍රජාවන්ට පවා ළඟාවීම පුළුල් කරමින්, බැංකු සේවා සැපයීමට 4,002කට අධික තැපැල් කාර්යාල සහ උප තැපැල් කාර්යාල පුරා සවිමත් ශ්‍රී ලංකා තැපෑල සමඟ අද්විතීය හවුල්කාරිත්වය
- ශාඛා ජාලය පුරා සම්බන්ධතාවය සහ ඩිජිටල් විශ්වසනීයත්වය වැඩි දියුණු කරන නවීකරණය කරන ලද තාක්ෂණික යටිතල පහසුකම්

බුද්ධිමය ප්‍රාග්ධනය

- තත්‍ය කාලීන ගනුදෙනු සැකසීම, පොලී ගණනය කිරීම් සහ බාධාවකින් තොරව සේවා ලබා ගැනීමේ හැකියාව ලබා දෙන මූලික බැංකුකරණ වේදිකාව (Temenos T24)
- තොරතුරු ආරක්ෂණ සාක්ෂි පත්‍ර ශක්තිමත් කරන ISO 27001 සහ PCI-DSS සහතික කිරීම්

මානව ප්‍රාග්ධනය

- බැංකු මෙහෙයුම්, අවදානම් කළමනාකරණය, ඩිජිටල් නවෝත්පාදන සහ ගනුදෙනුකාර සේවය හරහා දක්ෂ ශ්‍රම බලකාය
- සයිබර් ආරක්ෂාව, අනුකූලතාවය සහ අවදානම් පැතිකඩ පිළිබඳ නිතිපතා පුහුණුවක් සමඟින්, බැංකුවේ ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (බවී හරහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය
- රට පුරා ස්ථාවර ණය පාලන යෙදුමක් සහතික කරන විශේෂ අයකරගැනීම් සහ අක්‍රීය ණය කණ්ඩායම්

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

- 1832 දී පිහිටුවන ලද ලංකා ඉතිරිකිරීමේ බැංකුව දක්වා දිව යන බැංකුවේ මූලාරම්භය සමඟ වසර 200 කට ආසන්න සේවා කාලයක් පුරා ගොඩනැගුණු විශ්වාසනීය සබඳතා
- ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සහ රජයේ සංවර්ධන ප්‍රමුඛතා සමඟ පෙළගැසුණු ශක්තිමත් නියාමන සබඳතා
- ගිණුම් මඟින් ගෙවීම් සඳහා Mastercard සමඟ උපායමාර්ගික හවුල්කාරිත්වයන් සහ ඩිජිටල් ගෙවීම් විසඳුම්
- දිවයින පුරා ඒකාබද්ධ සේවා සැපයීම සක්‍රීය කරමින් ශ්‍රී ලංකා තැපැල් සමඟ සහයෝගිතා සම්බන්ධතාවය

ස්වභාවික ප්‍රාග්ධනය

- ශාඛා ජාල සහ දත්ත මධ්‍යස්ථාන හරහා බලශක්ති පරිභෝජනය
- කඩදාසි භාවිතය සහ මෙහෙයුම් වලින් අපද්‍රව්‍ය ජනනය
- ජාතික විදුලිබල පද්ධතියට දායක වන ස්ථානීය සූර්ය උත්පාදන මුලපිරීම්

CRROs අභ්‍යන්තරව කළමනාකරණය කරන ලද ප්‍රාග්‍ධනයන් සහ මූල්‍ය සහ මූල්‍ය නොවන ප්‍රාග්ධනය සඳහා ස්ථාවර ප්‍රවේශයක් පවත්වා ගැනීමට බැංකුවට ඇති හැකියාව යන දෙකටම බලපෑම් කිරීමෙන් බැංකුවේ ඉහළ ප්‍රවාහ කටයුතු වලට බලපායි. උදාහරණයක් ලෙස, භෞතික දේශගුණික අවදානම් ශාඛා මෙහෙයුම් වලට බලපෑ හැකි අතර, සංක්‍රාන්ති අවදානම් තැන්පත්කරුවන්ගේ මනාපයන් සහ තිරසාර මූල්‍ය සම්බන්ධයෙන් නියාමන අපේක්ෂාවන්ට බලපෑම් කළ හැකිය.

### 1.1.1.2 අභ්‍යන්තර මෙහෙයුම්

අභ්‍යන්තර මෙහෙයුම් යන්නෙන් යෙදවුම් ප්‍රාග්ධනය නිෂ්පාදන, සේවා සහ උපායමාර්ගික ප්‍රතිඵල බවට පරිවර්තනය කරන බැංකුවේ මූලික කාර්යයන් නියෝජනය කරයි. බැංකුවේ පාලන රාමුව මඟින් මෙම මෙහෙයුම් විචක්ෂණශීලී බව, වගවීම සහ තිරසාර ප්‍රතිඵලවන් කෙරෙහි අවධානය යොමු කරමින් සිදු කරන බව සහතික කෙරේ.

මූලික මෙහෙයුම් ක්ෂේත්‍ර

| මෙහෙයුම් ක්ෂේත්‍ර | විස්තරය |
|---|---|
| **ණය දීම සහ ආයෝජන තීරණ** | ශූන්‍ය අවදානම් රජයේ සුරැකුම්පත් කෙරෙහි අවධානය සමඟ සම්ප්‍රදායික වත්කම්-වග කීම් කළමනාකරණය, ගනුදෙනුකාර හා ආයතනික අංශ හරහා ණය කළඹ කළමනාකරණය, පුනර්ජනනීය බලශක්ති මූල්‍යකරණය ඇතුළු හරිත ණය වැඩසටහන් |
| **අවදානම් සහ අනුකූලතා කළමනාකරණය** | ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව, ඩිජිටල් මාර්ගවල තත්‍ය කාලීන නිරීක්ෂණය කිරීම, ස්ථර 1 ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව, ද්‍රවශීලතා ආවරණ අනුපාතය සහ ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය ඇතුළු ඉහළ නියාමන අනුපාත පවත්වා ගැනීම. |
| **ඩිජිටල් යටිතල පහසුකම් සහ නවෝත්පාදන** | තත්‍ය කාලීන සැකසුම් සක්‍රීය කරන T24 මූලික බැංකු පද්ධතිය; සැලකිය යුතු පරිශීලකයින් සංඛ්‍යාවකට වඩා NSB Pay පදඉසකැ්චව භාවිතය, Blockchain බලගන්වන eKYC; ආරක්ෂිත ඩිජිටල් සේවා සැපයීම සහතික කරන ISO 27001 සහ PCI-DSS සහතික කිරීම්. |
| **තිරසාර මූල්‍ය ඒකාබද්ධතාවය** | ණය දීමේ තීරණ ESG ප්‍රතිඵලවන්, අවදානම් නිවාරණය සඳහා පාරිසරික හා සමාජ කළමනාකරණ පද්ධතිය (ESMS), ව්‍යවසාය අවදානම් කළමනාකරණයට ඒකාබද්ධ කරන ලද දේශගුණික අවදානම් පාලනය. |
| **පාරිසරික කළමනාකරණය** | LED ආලෝකකරණය සහ ඉන්වර්ටර් වර්ගයේ උපකරණ ඇතුළු බලශක්ති කාර්යක්ෂම යටිතල පහසුකම්, කඩදාසි රහිත බැංකුකරණ මූලපිරීම්, අපද්‍රව්‍ය වෙන් කිරීම සහ අන්තරායකර අපද්‍රව්‍ය කළමනාකරණය |
| **කාර්ය මණ්ඩල සංවර්ධනය සහ හැකියා වර්ධනය** | තිරසාර දැනුවත්කම පිළිබඳ නිරන්තර පුහුණුව, දේශගුණයට අදාළ අවදානම්, සහ LMS වේදිකාව හරහා වගකීම්සහගත බැංකුකරණ ව්‍යවහාර |

බැංකුවේ අභ්‍යන්තර මෙහෙයුම්, විචක්ෂණශීලීභාවය සහ වගවීමේ සංස්කෘතියකින් අනුරූපනය වේ. අඛණ්ඩ නියාමන පද්ධති සහ සේවක පුහුණුව හරහා අවදානම් පිළිබඳ දැනුවත්භාවය දෛනික මෙහෙයුම්වලට ඇතුළත් කර ඇති අතර, එමඟින් ආයතනය පුරා ස්ථාවරත්වය මූලික වටිනාකමක් සහ ජීවමාන භාවිතයක් බවට පත් කරයි.

CRROs මෙම අභ්‍යන්තර මෙහෙයුම් වලට කිහිප ආකාරයකින් බලපෑම් කළ හැකිය. ශක්තිමත් ව්‍යාපාර අඛණ්ඩ සැලසුම් කිරීමක් අවශ්‍ය කරමින්, භෞතික දේශගුණික අවදානම් ශාඛා මෙහෙයුම් වලට බාධා කළ හැකිය නැතිනම් යටිතල පහසුකම් වලට හානි කළ හැකිය. සංක්‍රාන්ති අවදානම්වලට ණය ප්‍රතිපත්ති, අවදානම් තක්සේරු රාමු සහ රෙගුලාසි වෙනස්වන

# SLFRS තිරසාරතාවයට අදාළ මූල්‍ය අනාවරණ (SLFRS S1 සහ SLFRS S2)

බැවින් මෙහෙයුම් ව්‍යවහාරවලට අවශ්‍ය විය හැකිය. අනෙක් අතට, මෙහෙයුම් කාබන් පාසටහන අඩු කරන සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩි කරන බැංකුව විසින් අඩු සේවා සපයන ප්‍රදේශවල මාර්ගගත සහ ජංගම බැංකුකරණ ප්‍රවේශය සක්‍රීය කිරීම සඳහා එහි තැපැල් ජාලය ඩිජිටල්කරණය කිරීම වැනි ඩිජිටල් නව්‍යකරණ හරහා අවස්ථා උදා වේ.

### 1.1.1.3 පහළ ප්‍රවාහ වටිනාකම් දාම

පහළ ප්‍රවාහ කටයුතුවලට නිෂ්පාදන යෙදවීම, ගනුදෙනුකාර සහභාගීත්වය සහ ජාතික සංවර්ධනයට දායකත්වය ඇතුළුව පාර්ශ්වකරුවන්ට වටිනාකමක් ලබා දෙන බැංකුවේ බාහිර මුහුණත් මෙහෙයුම් ඇතුළත් වේ.

## නිෂ්පාදනය හා සේවා ලබාදීම

බැංකුවේ නිෂ්පාදන පෙළ ජීවිතයේ සෑම අදියරකම වෙනස්වන ගනුදෙනුකාර අවශ්‍යතා සපුරාලීමට සැලසුම් කෙරේ:

| නිෂ්පාදන වර්ගය | ඉලක්ක අංශය |
|---|---|
| **ඉතුරුම් නිෂ්පාදන** | ලදරුවාගේ සිට ජ්‍යෙෂ්ඨ පුරවැසියන් දක්වා සියලුම වයස් කාණ්ඩ |
| **ජ්‍යෙෂ්ඨ පුරුවැසි පිරිනැමීම්** | ජ්‍යෙෂ්ඨ පුරවැසියන් |
| **ඩිජිටල් බැංකුකරණ විසඳුම්** | තාක්ෂණයෙන් දැනුවත් ගනුදෙනුකරුවන් |
| **තිරසාර මූල්‍ය නිෂ්පාදන** | පාරිසරිකව දැනුවත් ගනුදෙනුකරුවන් සහ ව්‍යාපාර |
| **ආයතනික බැංකුකරණය** | විශාල ආයතන, රජයට අයත් ව්‍යවසාය හා මූල්‍ය ආයතන |
| **ජාත්‍යන්තර බැංකුකරණය** | ජාත්‍යන්තර බැංකුකරණ අවශ්‍යතා සහිත ගනුදෙනුකරුවන් |
| **භාණ්ඩාගාර මෙහෙයුම්** | ආයතනික හා පාරිභෝගික ආයෝජකයින් |

## ගනුදෙනුකාර ලඟාවීම සහ මූල්‍ය ඇතුළත් කිරීම

බැංකුවේ පහළ ප්‍රවාහ වටිනාකම විවිධ මාර්ග හරහා සිය අසමාන ලඟාවීම මගින් අනුරූපනය කෙරේ:

- **භෞතික ජාලය:** දිවයින පුරා ශාඛා 263ක් සහ ATMs/CRMs යන්ත්‍ර 418ක්
- **තැපැල් ජාලය:** දුරස්ථ ප්‍රජාවන්ට බැංකු සේවා ලබාදෙන 4,000කට අධික තැපැල් කාර්යාල සහ උප තැපැල් කාර්යාල ගණන
- **ඩිජිටල් මාර්ග:** අන්තර්ජාල බැංකුකරණය, 800,000කට අධික පරිශීලකයින් සිටින NSB Pay ජංගම යෙදුම
- **දොර ලඟටම සේවා:** රටේ ඈත කෙළවර දක්වා විධිමත් මූල්‍ය පහසුකම් ව්‍යාප්ත කරන තැන්පතු එකතු කිරීමේ සේවා

විස්තර සඳහා 109 සිට 116 දක්වා පිටුවල නිෂ්පාදිත ප්‍රාග්ධනය බලන්න.

### පාර්ශවකාර වටිනාකම් නිර්මාණය

පහළ ප්‍රවාහ කටයුතුවලින් විවිධ පාර්ශවකාර කණ්ඩායම් සඳහා වටිනාකම ජනනය කරයි:

- **ගනුදෙනුකරුවන්:** 100% රජයේ ඇපකරයක් සහිත සුරක්ෂිත ඉතුරුම්, ප්‍රවේශ විය හැකි බැංකු සේවා, ජීවන අවධීන්ට ගැලපෙන නිෂ්පාදන
- **රජය:** මූල්‍ය සේවා සඳහා බදු හරහා රාජ්‍ය මූල්‍යයට දායකත්වය; රජයේ සුරැකුම්පත් ආයෝජන හරහා සංවර්ධන ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීම; ජාතික සමාජ-ආර්ථික අරමුණු සඳහා සහාය
- **ආර්ථිකය:** නිෂ්පාදන අංශ සඳහා ණය ව්‍යාප්තිය; ඉතුරුම් සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම; රැකියා උත්පාදනය
- **පරිසරය:** හරිත ණය වැඩසටහන් (2025 දී රු. බිලියන 1 ක් ලබා දෙන ලදී); සුළං බලශක්ති සුරැකුම්කරණය ඇතුළුව පුනර්ජනනීය බලශක්ති මූල්‍යකරණය
- **සමාජය:** මූල්‍ය සාක්ෂරතා මුලපිරීම්; කාන්තා ව්‍යවසායකයින් සඳහා සහාය; තැපැල් ජාල බැංකුකරණය හරහා ග්‍රාමීය සංවර්ධනය

## පහළ ප්‍රවාහ කටයුතු පිළිබඳ CRRO බලපෑම්

| අවදානම්/වස්ථාව අවස්ථා වර්ගය | පහළ ප්‍රවාහ කටයුතු මත බලපෑම |
|---|---|
| **භෞතික අවදානම්** | දේශගුණික ආශ්‍රිත සිදුවීම් ණය ගැතියන්ගේ ඔරොත්තු දීම සහ විශේෂයෙන් ආන්තික කාලගුණයට ගොදුරු විය හැකි අංශවල කළඹී ගුණාත්මක භාවයට බලපෑ හැකිය |
| **සංක්‍රාන්ති අවදානම්** | ප්‍රතිපත්ති වෙනස්කම්, තාක්ෂණික මාරුවීම් සහ වෙළෙඳපොල මනාපයන් බැංකුව විසින් මූල්‍යකරණය කරන ලද අංශවලට බලපෑ හැකිය; කාබන් මිලකරණය ණය ගැතියන්ගේ ආර්ථිකයට බලපෑ හැකිය |
| **සංක්‍රාන්ති අවස්ථා** | තිරසාර මූල්‍ය සඳහා වර්ධනය වන ඉල්ලුම හරිත ණය දීම පුළුල් කිරීමට අවස්ථා නිර්මාණය කරයි; දේශගුණික මූල්‍ය නායකත්වය සඳහා WSBI-SDG සම්මානවලදී බැංකුවේ පිළිගැනීම මගින් සාර්ථක අවස්ථා ග්‍රහනය පෙන්නුම් කරයි |
| **කිරිතිනාම අවස්ථා** | වගකිවයුතු බැංකු භාවිතයන් හරහා වැඩි දියුණු කළ පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය; ජාතික දේශගුණික බැඳීම් සහ SDG ඉලක්ක සමඟ පෙළගැස්වීම |

### 1.1.1.4 වටිනාකම් දාමය ඒකාබද්ධ කිරීම හා ඔරොත්තුදීම

බැංකුවේ වටිනාකම් දාමය ඉහළ ප්‍රවාහ යෙදවුම්, අභ්‍යන්තර මෙහෙයුම් සහ පහළ ප්‍රවාහ කටයුතු අන්‍යෝන්‍ය වශයෙන් ශක්තිමත් වන ඒකාබද්ධ පද්ධතියක් ලෙස ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකාවේ එකම රජයේ සහතික ලත් බැංකුව ලෙස බැංකුවේ අද්විතීය ස්ථානය වටිනාකම් දාමය පුරා සුවිශේෂී ලක්ෂණ නිර්මාණය කරයි:

- **ඉහළ ප්‍රවාහ ඔරොත්තු දීම:** ආර්ථික අස්ථාවරත්වය තුළ පවා ස්ථාවර අරමුදල් සහතික කරමින්, ස්වෛරී සහතිකය මගින් ශක්තිමත් කළ තැන්පත්කරුවන්ගේ විශ්වාසය
- **මෙහෙයුම් ඔරොත්තු දීම:** සියලුම සේවා ස්ථාන සම්බන්ධ කරන මධ්‍යගත තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ස්ථාවර සේවා සැපයීම සහ තත්‍ය කාලීන අවදානම් නියාමනය සවිමත් කරයි
- **පහළ ප්‍රවාහ ප්‍රවේශය:** තැපැල් ජාල හවුල්කාරිත්වය දිගුකාලීන පාරිභෝගික සබඳතා ගොඩනඟන අතර සංවර්ධන විධි නියෝගය ඉටු කරමින්, අඩු සේවාලාභී ජනතාවට විධිමත් මූල්‍යකරණය පුළුල් කරයි

පුළුල් අවබෝධය සහතික කිරීමට සමස්ත වටිනාකම් දාමය හරහා CRROs තක්සේරු කෙරේ:

| වටිනාකම දාම කොටස | CRRO ප්‍රතිඵලවනි |
|---|---|
| **ඉහළ ප්‍රවාහ** | දේශගුණික ආශ්‍රිත ආර්ථික බිඳවැටීම් යටතේ තැන්පතු පදනමේ ස්ථායිතාව; හරිත අරමුදල් මාර්ග ලබා ගැනීමේ හැකියාව; ශ්‍රී ලංකා මහ බැංකුවෙන් නියාමන අපේක්ෂාවන්, තිරසාරභාවය පිළිබඳ විශේෂඥතාව සඳහා ප්‍රවේශය |
| **අභ්‍යන්තර මෙහෙයුම්** | අහිතකර කාලගුණික සිදුවීම් සඳහා මෙහෙයුම් ඔරොත්තු දීම, අභ්‍යන්තර ව්‍යවහාරවල සංක්‍රාන්ති පෙළගැස්ම; බලශක්ති කාර්යක්ෂමතාව සහ කාබන් පාසටහන; තිරසාරභාවය පිළිබඳ පාලන රාමු |
| **පහළ ප්‍රවාහ** | ණය ගැතියන්ගේ දේශගුණික ඔරොත්තු දීම; දේශගුණික සංවේදී අංශ සඳහා කළඹ නිරාවරණය; තිරසාර මූල්‍ය නිෂ්පාදන සඳහා ඉල්ලුම; ජාතික දේශගුණික ඉලක්ක සඳහා දායකත්වය |

බැංකුවේ ශක්තිමත් මූල්‍ය මූලධර්ම සහ පාලන රාමුව මගින් සහාය දක්වන ලද වටිනාකම් දාම කළමනාකරණය සඳහා වූ මෙම ඒකාබද්ධ ප්‍රවේශය, තිරසාර වටිනාකම් නිර්මාණය සඳහා අවස්ථා සොයමින් CRROs ඵලදායී ලෙස හඳුනා ගැනීමට, තක්සේරු කිරීමට සහ කළමනාකරණය කිරීමට

# SLFRS තිරසාරතාවයට අදාළ මූල්‍ය අනාවරණ (SLFRS S1 සහ SLFRS S2)

බැංකුවට හැකියාව ලබා දේ, දේශගුණික මූල්‍ය, ගනුදෙනුකාර ආරක්ෂාව සහ ඩිජිටල් පරිනාමනය තුළ සිය නායකත්වය සඳහා ජාත්‍යන්තර සංසදවල බැංකුවේ පිළිගැනීම සියලුම පාර්ශ්වකරුවන්ට තිරසාර වටිනාකම ලබාදීමේදී මෙම ප්‍රවේශයේ ඵලදායිත්වය තහවුරු කරයි.

## 1.2 ප්‍රමාණාත්මතා පදනම

SLFRS S1 මඟින් අපගේ අපේක්ෂාවන්ට බලපානු ඇතැයි සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි තිරසාරතාවයට අදාළ අවදානම් සහ අවස්ථා (SRROs) පිළිබඳ වැදගත් තොරතුරු පිළිබඳ අනාවරණය කිරීම අවශ්‍ය වේ. තොරතුරු මඟ හැරීම, වැරදි ලෙස ප්‍රකාශ කිරීම හෝ සම්මිලනය සාමාන්‍ය අරමුණු සහිත මූල්‍ය වාර්තාවල ප්‍රාථමික පරිශීලකයින්ගේ තීරණවලට බලපෑම් කිරීමට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි නම් තොරතුරු වැදගත් වේ.

එබැවින් ගුණාත්මක පරාමිතීන් භාවිතා කරමින් අපගේ මූල්‍ය ප්‍රමාණාත්මක තක්සේරුව මඟින්, වර්තමාන සහ අපේක්ෂිත බලපෑම් යන දෙකම සැලකිල්ලට ගනිමින්, අපගේ අපේක්ෂාවන්ට සෘජු හෝ වක්‍ර විභව මූල්‍ය බලපෑම් සහිත SRROs/CRROs කෙරෙහි අවධානය යොමු කරයි. මෙයට සමාන්තරව, අභ්‍යන්තර පාලනය සහ පාර්ශ්වකරුවන්ගේ වගවීම සඳහා බලපෑම් ප්‍රමාණාත්මතාව අපි සිතියම්ගත කරමු (SLFRS S1 සහ SLFRS S2 යටතේ අනාවරණය කිරීමේ විෂය පථය සඳහා බලපෑම් සිතියම්ගත කිරීම පදනම නොවේ).

ප්‍රමාණාත්මක තක්සේරුවේ පදනම ප්‍රමාණාත්මතාව කොටසේ මෙම ලියවිල්ලේ 40 සිට 51 දක්වා පිටුවල පැහැදිළි කෙරේ.

## 1.3 කාර්යාත්මක මුදල

මෙම SLFRS තිරසාරතාවයට අදාළ මූල්‍යමය අනාවරණ සමූහයේ කාර්යාත්මක හා ඉදිරිපත් කිරීමේ මුදලවන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කෙරේ.

## 1.4 මඟපෙන්වීමේ මූලාශ්‍රය

බැංකුව සිය දේශගුණය සහ තිරසාරතාවය ආශ්‍රිත මූල්‍ය අනාවරණ තහවුරු කිරීමට ශක්තිමත් විශ්ලේෂණාත්මක සහ සංකල්පීය පදනමක් ස්ථාපිත කර ඇත. මෙම දැඩි ප්‍රවේශය මගින් අපගේ වාර්තාකරණය සාක්ෂි මත පදනම් වූ, දේශීය මෙහෙයුම් පරිසරය තුළ ගැඹුරින් මුල් බැසගත් බව සහ ගෝලීය ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කරයි.

- **ශ්‍රී ලංකා තිරසාර අනාවරණ ප්‍රමිති – SLFRS S1 සහ SLFRS S2**

  ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද SLFRS S1 සහ SLFRS S2, ජාත්‍යන්තර තිරසාර ප්‍රමිති මණ්ඩලය (ISSB) මගින් සංවර්ධනය කරන ලද IFRS S1 සහ IFRS ප්‍රමිතීන් මත පදනම් වේ. මෙම ප්‍රමිති දේශගුණයට අදාළ අවදානම් හා අවස්ථාවල්ට අදාළ වැදගත් තොරතුරු තීරණය කිරීම හා පදනම සකස් කර ඇත. එය බැංකුවේ අනාවරණ ව්‍යුහය මෙහෙයවන අතර ගෝලීය තිරසාර වාර්තාකරණ මූලධර්මවලට අනුකූලතාව සහතික කර ඇත.

- **තිරසාර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලයේ** (SASB) **ප්‍රමිති: වාණිජ බැංකු – තිරසාර ගිණුම්කරණ ප්‍රමිති ක්ෂේත්‍රයේ ප්‍රමිති පිටපතථ 2023-12**

  SASB ප්‍රමිතිවලින් මූල්‍ය සේවා කටයුතු හරහා ව්‍යවසාය වටිනාකම සහ ආයෝජක තීරණ ගැනීමට වඩාත් අදාළ අංශයට විශේෂ තිරසාර මාතෘකා සහ මිණුම් පිළිබඳ බැංකුවේ හඳුනා ගැනීම දැනුම් දී ඇත.

- **ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් තීරණය කළ දායකත්වයන්** (NDC)

  පැරිස් ගිවිසුමට අනුකූලව ජාතික දේශගුණික අවම කිරීම සහ අනුවර්තන ප්‍රමුඛතා විස්තර කරන 2025 සැප්තැම්බර් මාසයේදී නිකුත් කරන ලද ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්ව 3.0 (2026-2035) බැංකුව විසින් යොමු කරන ලදී. මෙම රාමුව මඟින් දේශීය මට්ටමේ සංක්‍රාන්ති මාර්ග පිළිබඳ බැංකුවේ අවබෝධය දැනුම් දුන් අතර ණය කළඹ තුළ දේශගුණයට අදාළ අවදානම් සහ අවස්ථාවන්ට වඩාත් නිරාවරණය වන අංශ හඳුනා ගැනීමට මඟ පෙන්වන ලදී.

- **මහ බැංකුව විසින් නිකුත් කළ තිරසාර මූල්‍ය මාර්ග සිතියම 2.0**

  ශ්‍රී ලංකා මහ බැංකුව, නියාමකගේ ධාරිතාවය තුළ, දේශගුණික අවදානම් කළමනාකරණය සහ හරිත මූල්‍ය සේවයේ යෙදවීම සඳහා පැහැදිළි අපේක්ෂාවන් නියම කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ තිරසාර මූල්‍ය මාර්ග සිතියම 2.0 මගින් මූල්‍ය ආයතන තම ණය දීමේ සහ ආයෝජන කළඹවල පාරිසරික හා දේශගුණිකව අදාළ අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීම අපේක්ෂා කරන බවත්,බැංකු තමන්නේ සමස්ත අවදානම් කළමනාකරණ රාමු තුළට දේශගුණික හා පාරිසරික අවදානම් සලකා බැලීම් ඒකාබද්ධ කළ යුතු බවත් නියම කරයි.

  මාර්ග සිතියම මගින් ආයතනවලට අඩු කාබන්, සම්පත්-කාර්යක්ෂම සහ දේශගුණිකව ඔරොත්තුදෙන අංශ කෙරෙහි තම කළඹ ක්‍රමයෙන් නැවත පෙළගස්වා ගැනීමට දිරිගන්වයි. ශ්‍රී ලංකාවේ දේශගුණික සහ සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා තිරසාර හා හරිත මූල්‍යකරණය සඳහා පෞද්ගලික ප්‍රාග්ධනය සේවයේ යෙදවීම තීරණාත්මක බව එය හඳුනා ගනී. මෙම උපදෙස් මගින් පවතින කළඹ සඳහා සංක්‍රාන්තිය සහ භෞතික අවදානම් ප්‍රතිෂ්ඨාවන් නිර්මාණය කරන අතර ජාතික දේශගුණික ප්‍රමුඛතා සහ ශ්‍රී ලංකාවේ NDC 3.0 ඉලක්කවලට අනුකූල හරිත මූල්‍ය නිෂ්පාදන තුළින් බැංකුව සඳහා නව වර්ධන අවස්ථා විවෘත කරයි.

- **බැංකුවේ කළඹ විසිරීම සහ පාරිසරික හා සමාජීය අවදානම් කළමනාකරණ පද්ධති** (ESMS) **රාමුව**

  දේශගුණයට අදාළ අවදානම් සහ අවස්ථා (CRROs) නිර්වචනය කිරීමේදී, බැංකුව එහි අභ්‍යන්තර ESMS රාමුව යටතේ අනුරූප පාරිසරික හා සමාජීය අවදානම් වර්ගීකරණයන් සමඟ ප්‍රධාන ආර්ථික අංශ හරහා එහි කළඹ සංයුතිය ඇගයීමට ලක් කළේය. මෙම රාමුව ඉහළ, මධ්‍යම සහ පහළ පාරිසරික හා සමාජීය අවදානම් මට්ටම්වලට නිරාවරණයන් වර්ගීකරණය කරන අතර, එක් එක් අංශය තුළ විභව දේශගුණයට අදාළ සහ තිරසාර බලපෑම් පිළිබඳ ව්‍යුහගත තක්සේරුවක් සක්‍රීය කරයි. සොයාගැනීම් මඟින් බැංකුවේ අවදානම් අවම කිරීමේ සහ අවස්ථා වැඩිදියුණු කිරීමේ පියවරවල ප්‍රමුඛතාවය දැනුම් දේ.

## 1.5 වාර්තාකරණ කාලසීමාව

මෙම වාර්තාවෙන් බැංකුවේ මූල්‍ය වාර්තාකරණ කාල සීමාවට අනුකූලව 2025 ජනවාරි 01 සිට 2025 දෙසැම්බර් 31 දක්වා මූල්‍ය වර්ෂය ආවරණය කරයි.

## 1.6 කාලසීමාව

මෙම අනාවරණ සඳහා බැංකුව විසින් යොදන කාල සීමාවන්, පහත දක්වා ඇති පරිදි, එහි උපාය මාර්ග සැකසීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී භාවිතා කරන ලද කාල සීමාවන්ට අනුකූල වේ.

| කාලසීමාව | නිර්වචනය | මූල්‍ය වසර |
|---|---|---|
| කෙටි කාලය | වාර්තාකරණ දිනයේ සිට එක වසරක් ඇතුළත | 2026 |
| මධ්‍යම කාලය | අවුරුදු 2-3 | 2027 – 2028 |
| දිගු කාලය | අවුරුදු | 2028 න් ඉදිරියට |

## SLFRS තිරසාරතාවයට අදාළ මූල්‍ය අනාවරණ (SLFRS S1 සහ SLFRS S2)

### 1.7 සංක්‍රාන්ති සහන

SLFRS S1 සහ S2S ප්‍රමිති යොදා ගැනීමේ පළමු වසර වාර්තාකරණ කාලසීමාව වන බැවින් බැංකුව පහත අවසර දුන් සංක්‍රාන්ති සහන යොදා ගෙන ඇත.

**තිරසාරතාවයට අදාළ මූල්‍ය තොරතුරු සඳහා පොදු අවශ්‍යතාව**

**දේශගුණික පළමු වාර්තාකරණය:** බැංකුව දේශගුණයට අදාළ අවදානම් සහ අවස්ථා (CRROs) පිළිබඳ තොරතුරු අනාවරණය කරනු ඇත

**තුලනාත්මක අනාවරණ**: වත්මන් වර්ෂය සඳහා තුලනාත්මක තොරතුරු අනාවරණය කිරීම අවශ්‍ය නොවේ. 2 වන වසරේ සිට ඉදිරියට දේශගුණයට අදාළ අනාවරණ කිරීම් සඳහා පෙර වර්ෂයේ සැසඳීම් ලබා දෙනු ඇත

**විෂයපථය 03 GHG විමෝචන**: පළමු වසර තුළ විෂය පථය 3 විමෝචන අනාවරණය අනිවාර්ය නොවේ. එබැවින්, බැංකුව විෂය පථය 3 විමෝචන අනාවරණය නොකරනු ඇත.

**SRROs හා CRROs පිළිබඳ අපේක්ෂිත මූල්‍ය බලපෑම්:** බැංකුව පළමු වාර්තාකරණ වසර දෙක සඳහා අපේක්ෂිත දේශගුණිකව අදාළ මූල්‍ය බලපෑම් පිළිබඳ ගුණාත්මක අනාවරණ කල් දැමීමට ආයතනවලට අවසර දෙන සංක්‍රාන්ති සහන යොදා ගෙන ඇත.

මූලික වාර්තාකරණ වසර දෙක තුළ, බැංකුව CA ශ්‍රී ලංකා විසින් ලබා දුන් සංක්‍රාන්ති සහය යොදා ගැනීමට තෝරා ගෙන ඇති අතර ඒ තුළින් අනිවාර්ය දේශගුණික ඔරොත්තුදීමේ අනාවරණ අවශ්‍යතා සම්පූර්ණයෙන් කල් දමන ලදී.

### 1.8 සම්බන්ධිත තොරතුරු

මෙම පරිච්ඡේදය හුදකලාව කියවිය යුතු නැති නමුත් බැංකුවේ පුළුල් වාර්තාකරණ රාමුවේ අනිවාර්ය අංගයක් ලෙස කියවිය යුතුය. එය විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන, ප්‍රාග්ධන හයක සාකච්ඡාව (මූල්‍ය, නිෂ්පාදිත, මානව, බුද්ධිමය, සමාජීය සහ සම්බන්ධතා සහ ස්වාභාවික ප්‍රාග්ධනය) සහ අවදානම් කළමනාකරණය සහ දේශගුණික ආශ්‍රිත මූල්‍ය අවදානම් පිළිබඳ විශේෂ අනාවරණය කිරීම් සමඟ කියවීමට සැලසුම් කර ඇත. තවද, මෙම අනාවරණය කිරීම් සභාපතිවරයාගේ පණිවිඩය, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය, ආයතනික පාලන වාර්තාව, උපායමාර්ග සහ මෙහෙයුම් පරිසර කොටස් සහ අවදානම් කළමනාකරණ වාර්තාව සමඟ එකිනෙකට සම්බන්ධිත වේ.

SLFRS S1 සහ SLFRS S2 සම්බන්ධිත තොරතුරු කෙරෙහි ශක්තිමත් අවධාරණයක් යොමු කරන බව බැංකුව පිළිගනී. ඒ අනුව, තිරසාරතාවයට අදාළ කරුණු ව්‍යාපාර ආකෘති පැහැදිලි කිරීම්, ප්‍රාග්ධන සාකච්ඡා, අවදානම් වාර්තාකරණය හෝ මූල්‍ය කාර්යසාධන විවරණ වලින් හුදකලා නොවන බව සහතික කිරීම සඳහා මෙම පරිච්ඡේදය සංවර්ධනය කර ඇත. තිරසාරතාවයට අදාළ කරුණු පවත්නා කළමනාකරණය තුළ හෝ වත්කම්වල තත්ත්වය නියාමනය, ද්‍රවශීලතා සහ ප්‍රාග්ධන ඔරොත්තුදීම, ගනුදෙනුකාර පැමිණිළි හා සේවා අඛණ්ඩතාව, සයිබර් හා මෙහෙයුම් ඔරොත්තුදීම, දේශගුණයට අදාළ බිඳවැටීම්, වගකීම්සහගත මූල්‍යකරණය, හෝ සම්පත් කාර්යක්ෂම ආයෝජන වැනි ව්‍යවස්ථාපිත වාර්තාකරණය තුළ දැනටමත් පිළිබිඹු වන අවස්ථාවේදී, මෙම පරිච්ඡේදයෙන් පිටපත් කරණයට වඩා සම්බන්ධ කිරීමට උත්සාහ කරයි. මෙම කොටස් එක්ව, තිරසාරතාවයට අදාළ කරුණු බැංකුවේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය, මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රවේශය, ප්‍රාග්ධන පිරිවැය සහ දිගුකාලීන විධාන ක්‍රියාත්මක කිරීම කෙරෙහි බලපාන මාර්ග පැහැදිලි කරයි.

### 1.9 විනිශ්චය හා මැනීමේ අවිනිශ්චිතතා

මතුවන අභ්‍යන්තර විශේෂඥතාව සහ දත්ත සීමාවන් සමඟ දේශගුණයට අදාළ අවදානම් සහ අවස්ථාවල වෙනස්වන ස්වභාවය සැලකිල්ලට ගනිමින්, බැංකුවේ අනාවරණ කිරීම්වලට සැලකිය යුතු ව්‍යක්තීය විනිශ්චයක් සම්බන්ධ වේ. එහි ව්‍යාපාර ආකෘතිය, උපාය මාර්ගය සහ අවදානම් කළමනාකරණය කෙරෙහි බලපෑම් තක්සේරු කිරීමේදී, බැංකුව වාර්තාකරණ දිනයේදී ලබා ගත හැකි සාධාරණ සහ සහාය දැක්විය හැකි තොරතුරු මත විශ්වාසය තබන අතර, අනවශ්‍ය පිරිවැයක් හෝ වෑයමක් නොමැතිව යොදනු ලැබේ. මෙම තිරසාර වාර්තාවේ අන්තර්ගතය තීරණය කිරීම සඳහා විශේෂයෙන් ප්‍රමිතීන් නම්‍යශීලී බවක් ලබා දෙන අවස්ථාවේදී අනාවරණය අදාළ, විශ්වාසදායක සහ ප්‍රයෝජනවත් බව සහතික කිරීම සඳහා විනිශ්චය අවශ්‍ය වේ, පහත වගුව මෙම ප්‍රධාන විනිශ්චයන් සාරාංශ කරයි.

#### 1.9.1 මූලික විනිශ්චය අවිනිශ්චිතතාවන්

| මාතෘකාව | විස්තරය |
|---|---|
| **ප්‍රමාණාත්මක තක්සේරුව** | වටිනාකම් දාමය පුරා බලපෑම් සහ රඳාපැවතුම් තක්සේරු කිරීමේදී විනිශ්චය යොදා ගන්නා ලදී. මෙම ක්‍රියාවලිය තිරසාරතාවයට අදාළ අවදානම් සහ අවස්ථා හඳුනා ගැනීම සහ බැංකුවේ උපාය මාර්ගය, ව්‍යාපාර ආදර්ශය හෝ මූල්‍ය කාර්යසාධනය කෙරෙහි සාධාරණ ලෙස බලපෑම් කළ හැකි වැදගත් තොරතුරු තීරණය කිරීම පිළිබඳව දැනුවත් කළේය. |
| **වටිනාකම් දාමය නිර්වචනය** | මෙහෙයුම් පාලනය සහ බැංකුව මත බලපෑමේ ප්‍රමාණාත්මතාව විසින් දැනුම් දෙන සිතියම් තීරණ සමඟ සිය වටිනාකම් දාමය පුරා CRROs නැඹුරුවන සියලුම ඉහළ සහ පහළ ප්‍රවාහ කටයුතු බැංකුව සිතියම් ගත කර ඇත. |
| **කාලසීමා තීරණය කිරීම** | ප්‍රශස්ත ඒකාබද්ධතාවය සඳහා බැංකුවේ උපායමාර්ගික සැලසුම්කරණය සහ ව්‍යාපාරය මත පදනම්ව කෙටි, මධ්‍යම සහ දිගු කාලීන කාල සීමාව නිර්වචනය කිරීම. මෙම විනිශ්චයන් කාලයත් සමඟ CRROs අනාවරණය කර නිරීක්ෂණය කරන ආකාරය කෙරෙහි සෘජුවම බලපායි. |
| CRROs **හි හඳුනාගැනීම** | බැංකුවේ භෞතික දේශගුණික අවදානම් ප්‍රක්ෂේපණ රටේ ප්‍රකාශිත දේශගුණික අවදානම් පැතිකඩ මත පදනම් වන අතර, එය සලකා බලන අවස්ථාව මත රැඳෙමින් සැලකිය යුතු කලාපීය විචලනයක් පෙන්නුම් කරයි. |

## SLFRS තිරසාරතාවයට අදාළ මූල්‍ය අනාවරණ
## (SLFRS S1 සහ SLFRS S2)

### 1.9.2 මූලික මැනීමේ අවිනිශ්චිතතාවන්

| මාතෘකාව | විස්තරය |
|---|---|
| **භෞතික දේශගුණික අවදානම් ප්‍රක්ෂේපණ** | ශ්‍රී ලංකාව සඳහා දේශගුණික අවදානම් ආදර්ශ විවිධ කලාප සහ අවස්ථා හරහා සැලකිය යුතු ලෙස වෙනස් වන බැවින්, බැංකුව භෞතික දේශගුණික අවදානම් තක්සේරුව වඩාත් වත්මන් සහ පොදුවේ යොමු කරන ලද මූලාශ්‍ර මත පදනම් කර ගෙන ඇත. |
| **නියාමන සහ ප්‍රතිපත්ති අනාවැකි** | අදාළ නියාමන වෙනස්කම්වල විභව බලපෑම් ඇස්තමේන්තු කිරීම සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට සම්බන්ධ වේ |
| **ප්‍රධාන ප්‍රතිඵල** | දේශගුණික අනාවරණවල ඇස්තමේන්තු සහ විනිශ්චය අවිනිශ්චිතතාවයන් ආමන්ත්‍රණය කිරීම සඳහා දැඩි, සම්ප්‍රදායික ක්‍රමවේදයක් භාවිතා කරයි. මෙය ප්‍රධාන පාර්ශ්වකරුවන් විසින් අපේක්ෂා කරන විනිවිදභාවය සහ සංසන්දනාත්මක බව ලබා දෙන අතරම මෙහෙයුම් යථාර්ථයන් සමඟ පෙළගැස්වීම සහතික කරයි. |
| CRROs **වල සම්භාවිතාව** | හඳුනාගත් CRROs වල සම්භාවිතාව අනාගත සිදුවීම්වල රඳපැවැත්ම සැලකිල්ලට ගනිමින් වෘත්තීය විනිශ්චය භාවිතයෙන් තීරණය කර ඇත. |

දැක්ම

තිරසාර වාර්තාකරණ රාමුව වැඩිදියුණු කිරීම සඳහා, බැංකුව එහි අනාවරණය කිරීම් වලදී වැඩි නිරවද්‍යතාවයක් සහ විනිවිදභාවයක් සහතික කිරීම සඳහා එහි දත්ත රැස් කිරීමේ පද්ධතිය වර්ධනය කිරීමට ප්‍රමුඛත්වය දෙනු ඇත. ඊට අමතරව, බැංකුව එහි උපායමාර්ගික සැලසුම් දැනුම් දීම සඳහා විවිධ දේශගුණික අවස්ථාවන්ගෙන් පැන නගින අවදානම් සහ අවස්ථාවන් ක්‍රමානුකූලව ඇගයීමට ලක් කරනු ඇත. මෙම මූලික කාර්යය මත පදනම්ව, බැංකුව 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා තිරසාරතාවයට අදාළ මූල්‍ය අනාවරණ පිළිබඳ සම්පූර්ණ කට්ටලයක් සකස් කරනු ඇත. මෙම අනාවරණ කිරීම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද SLFRS තිරසාර අනාවරණ ප්‍රමිතීන්ට සම්පූර්ණයෙන්ම අනුකූලව සකස් කරනු ලැබේ.

## 2 පාලනය

උපායමාර්ගික තීරණ ගැනීම, අවදානම් කළමනාකරණය සහ කාර්යසාධන අධීක්ෂණය සඳහා තිරසාරතාවය සහ දේශගුණය ආශ්‍රිත ප්‍රතිඵලවල ඒකාබද්ධ කරන ශක්තිමත් පාලන රාමුවක් පවත්වා ගැනීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව කැපවී සිටී. මෙම කොටසින් SLFRS S1 තිරසාරතාවය ආශ්‍රිත මූල්‍ය තොරතුරු අනාවරණය සඳහා පොදු අවශ්‍යතා සහ SLFRS S දේශගුණය ආශ්‍රිත අනාවරණවලට අනුකූලව ස්ථාපිත කර ඇති පාලන ව්‍යුහයන්, කාර්යභාර සහ වගකීම් ගෙනහැර දක්වයි.

බැංකුවේ පාලන ශිල්පයෙන් අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ දී අධීක්ෂණය, කමිටු මට්ටමේදී විශේෂ නියාමනය සහ පැහැදිලි වාර්තාකරණ මාර්ග සහ වගවීමේ යාන්ත්‍රණ සමඟ ආයතනය තුළ ඵලදායී ක්‍රියාත්මක කිරීම සහතික කරයි.


### 2.1 අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණ කාර්යභාරය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය, කෙටි, මධ්‍ය සහ දිගු කාලීනව බැංකුවේ මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය සහ ඔරොත්තු දීමේ හැකියාව කෙරෙහි සාධාරණ ලෙස බලපානු ඇතැයි අපේක්ෂා කළ හැකි තිරසාරතාවය සහ දේශගුණය ආශ්‍රිත අවදානම් සහ අවස්ථා (SRROs/ CRROs) අධීක්ෂණය කිරීමේ අවසාන වගකීම දරයි. මෙම අධීක්ෂණය SLFRS S1 සහ SLFRS S2 මූලධර්මවලට අනුකූල වන පාලන රාමුවක් හරහා ක්‍රියාත්මක වන අතර, තිරසාරතාවයට අදාළ කරුණු නියාමනය සහ කළමනාකරණය කිරීම සඳහා ශක්තිමත් ක්‍රියාවලීන්, පාලනයන් සහ ක්‍රියා පටිපාටි සහතික කරයි.

#### 2.1.1 වර්තමාන අධීක්ෂණ රාමුව

වර්තමානයේ, තිරසාරතාවය සහ දේශගුණික ආශ්‍රිත කරුණු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරියාගේ සභාපතිත්වයෙන් යුත් විශේෂ කළමනාකරණ මට්ටමේ කමිටුවක් වන ආයතනික තිරසාරතා කමිටුව හරහා ක්‍රියාත්මක කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද විධිමත් විෂය නිර්දේශ යටතේ ක්‍රියාත්මක වන, ආයතනික තිරසාරතා කමිටුවේ අධිකාරිය, වගකීම් සහ වාර්තාකරණ ව්‍යුහය පැහැදිලිව අර්ථ දක්වා ඇත. කමිටුව එහි නිරීක්ෂණ, නිර්දේශ සහ ප්‍රගතිය කාර්තුමය පදනමක් මත රැස්වීම් වාර්තා හරහා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීමෙන්, තිරසාරතාවය සහ දේශගුණික ප්‍රතිඵලවල් බැංකුවේ උපායමාර්ගික තීරණ ගැනීම, ප්‍රාග්ධන වෙන් කිරීම සහ අවදානම් පාලන රාමුවට ඒකාබද්ධ කරයි.

SLFRS තිරසාරතාවයට අදාළ මූල්‍ය අනාවරණ
(SLFRS S1 සහ SLFRS S2)




රූපය 17

### 2.1.2 අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ අධීක්ෂණය ශක්තිමත් කිරීම

ශක්තිමත් පාලනයක් සඳහා වූ තම කැපවීම ශක්තිමත් කරමින්, තිරසාරතාවයට අදාළ කරුණු අධීක්ෂණය කිරීම සඳහා විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවක් පිහිටුවීමේ ක්‍රියාවලියක බැංකුව නිරතව සිටී. මෙම උප කමිටුව පත් කළ පසු, වග කියනු ලබන්නේ:

- බැංකුවේ තිරසාරතාව උපායමාර්ගය මෙහෙයවීම සහ වැදගත් තිරසාරතාවය පිළිබඳ කරුණු සම්බන්ධයෙන් මඟ පෙන්වීම ලබා දීම
- නැගී එන තිරසාරතාවය සහ දේශගුණය ආශ්‍රිත අවදානම් සහ අවස්ථා නියාමනය කිරීම
- SLFRS S1 සහ SLFRS S2 ඇතුළුව වෙනස් වන නියාමන සහ වාර්තාකරණ අවශ්‍යතා සමඟ පෙළගැස්වීම සහතික කිරීම
- බැංකුවේ මූලික පාලන නිර්මාණ ශිල්පයට තිරසාරතාවය ඒකාබද්ධ කිරීම අධීක්ෂණය කිරීම
- තිරසාරතාවයට අදාළ අනාවරණ සහ ඉලක්කවලට අනුව කාර්යසාධනය සමාලෝචනය කිරීම

## 2.2 කාර්යභාර,විධිනියෝග හා ක්‍රියාපටිපාටි

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සමස්ත ESG පාලනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවසාන වගකීම දරනු ලබයි. බැංකුවේ ආයතනික පාලන රාමුව සමඟපෙළ ගැසෙමින්, තිරසාරතාවයට අදාළ අවදානම් සහ අවස්ථා (SRROs), දේශගුණයට අදාළ අවදානම් සහ අවස්ථා (CRROs) සහ පුළුල් බලපෑම් කළමනාකරණය කිරීම සඳහා ආයතනික තිරසාර කමිටුවට (CSC) මූලික වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා ඇත. මෙම විධිනියෝගය ආයතනික තිරසාර කමිටුවේ විෂය නිර්දේශය හා අදාළ ප්‍රතිපත්ති ලියවිලි මගින් විධිමත් කරන අතර, සුදුසු අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණය පවත්වා ගනිමින්, පාරිසරික, සමාජීය හා ආර්ථික ප්‍රතිඵලවල් මෙහෙයුම් තීරණ ගැනීම්, සම්පත් වෙන් කිරීම, සහ කාර්යසාධන කළමනාකරණය තුළට ඇතුළත් කර ඇති බව සහතික කරයි.

### 2.2.1 අධ්‍යක්ෂ මණ්ඩල වගකීම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ තිරසාරතාවයට අදාළ වගකීම්වලට පහත දැ ඇතුළත්ය:

| පාලන ක්ෂේත්‍ර | අධ්‍යක්ෂ මණ්ඩල වගකීම් |
|---|---|
| **රාමුව සහ උපාය මාර්ගය** | තිරසාරතාවය පිළිබඳ රාමුව සහ පාලන ව්‍යුහය තීරණය කිරීම, තිරසාරතාවය පිළිබඳ උපාය මාර්ග, වැදගත් තිරසාරතාවය පිළිබඳ කරුණු, අදාළ ප්‍රතිපත්ති සහ ඉලක්ක අනුමත කිරීම |
| **බලපෑම් සහ අවදානම් අධීක්ෂණය** | වැදගත් තිරසාරතාවය පිළිබඳ බලපෑම් මාතෘකා, SRROs/CRROs, සහ දිගුකාලීන වටිනාකම් නිර්මාණය සඳහා ඒවායේ ඇඟවුම් නිරීක්ෂණය කිරීම, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අතරතුර තිරසාරතාවය පිළිබඳ බලපෑම් සහ බලපෑම් අවම කිරීම සඳහා උපාය මාර්ග තක්සේරු කිරීම |
| **ප්‍රතිපත්ති සහ සම්පත් වෙන් කිරීම** | ආයතනික තිරසාර කමිටුව විසින් සකස් කර සංශෝධනය කරන ලද පරිදි බැංකුවේ තිරසාරතාවය පිළිබඳ ප්‍රතිපත්තිය අනුමත කිරීම, තිරසාරතාවය පිළිබඳ වැඩසටහන් සඳහා වාර්ෂික අයවැය අනුමත කිරීම |
| **කාර්ය සාධන නියාමනය** | වාර්ෂික වාර්තාවට ඇතුළත් කිරීම සඳහා තිරසාරතාවය පිළිබඳ ප්‍රකාශය සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම, තිරසාරතාවය, පරිසරය, ප්‍රජාවන්, ගනුදෙනුකරුවන් සහ අනෙකුත් ප්‍රධාන පාර්ශ්වකරුවන්ට අදාළ කරුණු වලට බලපාන බැවින් බැංකුවේ කාර්යසාධනය නිරීක්ෂණය කිරීම |
| **සදාචාරාත්මක පාලනය** | බැංකුවට තම ව්‍යාපාරය සදාචාරාත්මකව, වගකීමෙන් සහ තිරසාරව ක්‍රියාත්මක කිරීමට සහාය වීම, ආර්ථික, පාරිසරික සහ සමාජීය කරුණු සම්බන්ධයෙන් රජයේ රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම සඳහා සාධාරණ සහ ප්‍රමාණවත් පද්ධති ක්‍රියාත්මක වන බව සහතික කිරීම. |
| **වාර්තා කිරීම සහ අනාවරණ කිරීම්** | තීරණ-ප්‍රයෝජනවත් SRROs සහ බලපෑම් තොරතුරු කාලෝචිත පදනමක් මත අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙන ඒම සඳහා බැංකුව පද්ධති, පාලන, ප්‍රතිපත්ති සහ කුසලතා පවත්වා ගැනීම සහතික කිරීම. |

## SLFRS තිරසාරතාවයට අදාළ මූල්‍ය අනාවරණ (SLFRS S1 සහ SLFRS S2)

#### 2.2.1.1 අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණ යාන්ත්‍රණ

අධ්‍යක්ෂ මණ්ඩල පහත පරිදි අධීක්ෂණය කරයි:

- **කාර්තුමය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්:** තිරසාරතාවය පිළිබඳ බලපෑම්, SRROs/CRROs, සහ උපායමාර්ගික අරමුණු වලට එරෙහිව ප්‍රගතිය නිරන්තරව තක්සේරු කිරීම.
- **ව්‍යුහගත වාර්තාකරණය:** විෂය නිර්දේශයේ දක්වා ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ ආයතනික තිරසාර කමිටුව ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ කමිටු වලින් වාර්තා ලබා ගැනීම.
- **ඒකාබද්ධ අවදානම් සමාලෝචන:** සමූහයේ අවදානම් ලේඛනයට දේශගුණය සහ තිරසාරතාවය පිළිබඳ අවදානම් ඒකාබද්ධ කරන ERM වාර්තා සමාලෝචනය කිරීම.
- **තාවකාලික සංකීර්ණතයන්:** සැලකිය යුතු නියාමන වර්ධනයන්, නැගී එන ESG ප්‍රවණතා සහ වැදගත් තිරසාරතාවය පිළිබඳ සිදුවීම් පිළිබඳ යාවත්කාලීන කිරීම් ලබා ගැනීම.
- **ප්‍රාග්ධන වෙන් කිරීමේ අධීක්ෂණය:** ආයෝජන තීරණ සහ සම්පත් වෙන් කිරීම තුළ තිරසාර ප්‍රතිෂ්ඨාවන් ඇතුළත් කර ඇති බව සහතික කිරීම.

පොදුවේ, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත ප්‍රතිපත්ති, බලපෑම් මත පදනම් වූ මූලික කාර්යසාධන දර්ශක, සහ මෙහෙයුම් මූලපිරීම් අධීක්ෂණය හරහා බලපෑම් කළමනාකරණය මෙහෙයවා ඇත. දේශගුණික අභිලාෂයන් වෙනස් වන බැවින්, බැංකුවේ දේශගුණික අභිලාෂයන් සහ නිමකිරීම මත සංක්‍රාන්ති සැලසුම් සමාලෝචනය සහ අනුමත කිරීම ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩලයේ වත්මන් අවධානයට නැගී එන දේශගුණික අවදානම් සහ දේශගුණික සලකා බැලීම් දිගුකාලීන උපායමාර්ගික සැලසුම්කරණයට ඒකාබද්ධ කිරීම ඇතුළත් වේ.

### 2.2.2 අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC)

බැංකුවේ ආයතනික පාලන රාමුව, ආයතනික පාලනය පිළිබඳ බැංකු පනත් නියෝගය, ඒකාබද්ධ අවදානම් අධීක්ෂණය සඳහා SLFRS S1 සහ SLFRS S2 හි අවශ්‍යතාවන්ට අනුකූලව, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) තිරසාර කරුණුවලට අදාළ අවදානම් කළමනාකරණය අධීක්ෂණය තුළ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

#### 2.2.2.1 වගකීම් සහ කාර්යභාරය

දේශගුණයට අදාළ අවදානම් ඇතුළුව තිරසාරතාවයට අදාළ අවදානම් සහ අවස්ථා බැංකුවේ සමස්ත ඒකාබද්ධ අවදානම් කළමනාකරණ (IRM) රාමුවට ඒකාබද්ධ කර ඇති බව සහතික කිරීම සඳහා BIRMC වගකිව යුතුය. කමිටුවේ වගකීම් අතරට පහත දෑ ඇතුළත්ය:

- **අවදානම් ඒකාබද්ධ කිරීම:** SRROs සහ CRROs හඳුනාගැනීම, තක්සේරුව, ප්‍රමුඛකරණය සහ නියාමනය තුළින් මේවා බැංකුවේ විස්තීර්ණ අවදානම් ලේඛණය සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලි තුළ ඇතුළත් කරන බව සහතික කරයි.
- **නියාමන අනුකූලතා සමාලෝචනය:** ආර්ථික, පාරිසරික සහ සමාජීය කරුණු සම්බන්ධයෙන් රජයේ රෙගුලාසිවලට අනුකූල වීම ඇතුළුව බැංකුව මත සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි ආයතනික පුරවැසියෙකු ලෙස බැංකුවේ වගකීම්වලට අදාළ නීතිමය, නියාමන සහ අනෙකුත් කරුණු සමාලෝචනය කිරීම
- **කීර්තිනාම අවදානම් අධීක්ෂණය:** කීර්තිනාමයට අදාළ අවදානම් ඇතුළුව ප්‍රජාවන්, ගනුදෙනුකරුවන් සහ අනෙකුත් ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ බැංකුවේ අන්තර්ක්‍රියාවලට අදාළ අවදානම් කළමනාකරණය අධීක්ෂණය කිරීම
- **ප්‍රාග්ධන වෙන් කිරීම සහ ඔරොත්තු දීම:** වත්කම් සහ මෙහෙයුම් ඔරොත්තු දීම, මෙහෙයුම් පිරිවැය සහ දිගුකාලීන වටිනාකම් නිර්මාණය සඳහා ගම්‍යාර්ථ ඇතුළුව වැදගත් ආයෝජන සහ උපායමාර්ගික තීරණ වලදී තිරසාර බලපෑම් සහ SRROs/CRROs පැහැදිලිව සලකා බලන බව සහතික කිරීම
- **දේශගුණික අවදානම් තක්සේරුව:** බැංකුවේ ණය දීමේ කළඹ, මෙහෙයුම් සහ සැපයුම් දාමය හරහා භෞතික හා සංක්‍රාන්ති දේශගුණික අවදානම් නිරාවරණයන් සමාලෝචනය කිරීම

BIRMC කළමනාකරණ වාර්තා සහ ප්‍රගතිය යාවත්කාලීන කිරීම් ලබා ගනිමින් සහ ඉන්පසුව අධ්‍යක්ෂ මණ්ඩලයට සිය නිරීක්ෂණ හා නිර්දේශ ලබාදෙමින් සියලුම තිරසාරතාව අදාළ අවදානම් කරුණු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ව්‍යුහගත මාධ්‍යයක් ලෙස කටයුතු කරයි. කමිටුව සිය සොය ගැනීම් සහ නිර්දේශ සිය රැස්වීම් හා විධිමත් ඉදිරිපත් කිරීම්වල වාර්තා හරහා සම්පූර්ණයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි.

## 2.3 කළමනාකරණ මට්ටමේ පාලනය හා ක්‍රියාත්මක කිරීමේ ශිල්පය

තිරසාරතාවයට අදාළ කරුණු ස්වභාවිකව තනි කාර්යයක් තුළ නොපවතින බැවින්, කළමනාකරණ ක්‍රියාත්මක කිරීම විචාරවත්ව හරස්ව ක්‍රියාත්මක වේ, ගනුදෙනුකාර ඇතුළත් කිරීම සහ සාධාරණ ප්‍රතිඵල ව්‍යාපාරික මාර්ග, මෙහෙයුම්, සේවා ගුණාත්මකභාවය, නෛතික සහ අනුකූලතාව හා සම්බන්ධ වේ. දේශගුණික ඔරොත්තු දීමට අවධානම, මෙහෙයුම්, පරිශ්‍රය, ව්‍යාපාර අඛණ්ඩතාව, දත්ත, භාණ්ඩාගාරය සහ ණය ඇතුළත් වේ. තිරසාරතාවයට අදාළ මූල්‍ය අනාවරණයන්ට මූල්‍ය, සැලසුම් කිරීම, අවදානම, තිරසාරතාවය පිළිබඳ කේන්ද්‍රස්ථාන, අභ්‍යන්තර පාලනය සහ සහතික කිරීමේ කාර්යයන් සම්බන්ධ වේ. එබැවින් පාලන නිර්මාණ ශිල්පය රහසිගත හිමිකාරිත්වයට වඩා සම්බන්ධීකරණයට සහාය වීම සඳහා සැලසුම් කර ඇත.

කළමනාකරණ කමිටුවලින් තිරසාරතාවයට අදාළ කරුණු මෙහෙයුම් තීරණවලට පරිවර්තනය කරන බව සහතික කිරීමට අපේක්ෂා කෙරේ.

මෙයට ප්‍රතිකර්ම ප්‍රමුඛතාවය දීම, වගකිවයුතු හිමිකරුවන් පැවරීම, පද්ධති සහ ක්‍රියාවලි උසස් කිරීම් අනුක්‍රමණය කිරීම, දත්ත සූදානම සමාලෝචනය කිරීම, කාර්ය මණ්ඩල හැකියාවන් අවශ්‍යතා හඳුනා ගැනීම සහ අධ්‍යක්ෂ මණ්ඩල මඟ පෙන්වීම හෝ ප්‍රතිපත්ති සංශෝධනය අවශ්‍ය විය හැකි කරුණු උත්සන්න කිරීම ඇතුළත් වේ.

තිරසාරතාවයට අදාළ කරුණු තනි අංශයක් තුළ නොව බහු කාර්යයන් හරහා ක්‍රියාකාරීව ප්‍රකාශ වන බැවින්, කළමනාකරණ වගවීම අත්‍යවශ්‍ය වේ. එබැවින් උපාය මාර්ග සහ සැලසුම්කරණය, අවදානම් කළමනාකරණය, මූල්‍ය, තොරතුරු තාක්ෂණ, මෙහෙයුම්, මානව සම්පත්, ණය, භාණ්ඩාගාරය, අනුකූලතාව, අලෙවිකරණය සහ ගනුදෙනුකරු-මුහුණ දෙන කාර්යයන් හරහා සම්බන්ධීකරණ හිමිකාරිත්වය මත බැංකුවේ ක්‍රියාත්මක කිරීමේ නිර්මාණ ශිල්පය විශ්වාසය තබයි. සාධාරණ ගනුදෙනුකාර ප්‍රතිඵල, ESG-සම්බන්ධිත නිෂ්පාදන නිර්මාණය, දේශගුණික අවදානම් හඳුනා ගැනීම, ඩිජිටල් ඔරොත්තු දීම, මූල්‍ය ඇතුළත් කිරීම, සම්පත් කාර්යක්ෂමතාව, අඛණ්ඩ සැලසුම් කිරීම සහ අනාවරණ සූදානම වැනි කරුණු සඳහා මෙම හරස් ක්‍රියාකාරී හිමිකාරිත්වය විශේෂයෙන් වැදගත් වේ.

ආයතනික තිරසාර කමිටුව මෙම නිර්මාණ ශිල්පයේ ප්‍රධාන කළමනාකරණ සංසදය වේ. එය ප්‍රතිපත්ති සම්පාදනය, ගැටළු හඳුනා ගැනීම, ප්‍රගති අධීක්ෂණය, පාර්ශ්වකරුවන්ගේ දැනුවත්භාවය සහ අභ්‍යන්තර පෙළගැස්ම සඳහා සහාය වේ. තිරසාරතාවයට අදාළ කරුණු ප්‍රධාන මට්ටමින් පමණක් පැවතීම වෙනුවට මෙහෙයුම් ක්‍රියාමාර්ග සහ කළමනාකරණ තොරතුරු බවට පරිවර්තනය කරන බව සහතික කිරීමට ද එය උපකාරී වේ. කාලයත් සමඟ, මෙම කමිටුව ශක්තිමත් ඉලක්ක ලුහුබැඳීම, අනාවරණය කිරීමේ පාලනය, සහතික කිරීමේ සම්බන්ධීකරණය සහ දේශගුණික-දත්ත විනය සඳහා සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### 2.3.1 තනික තිරසාර කමිටුව (CSC)

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සහ බැංකුවේ ආයතනික පාලන රාමුවට අනුකූලව විධිමත් විෂය නිර්දේශ යටතේ ක්‍රියාත්මක වන, ආයතනික තිරසාර කමිටුව, එහි SRROs සහ CRROs ඇතුළුව බැංකුවේ තිරසාර න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා මූලික වගකීම දරයි. කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයේ තිරසාර අභිලාෂයන් බැංකුව පුරා ක්‍රියාත්මක කළ හැකි උපාය මාර්ග, වැඩසටහන් සහ ව්‍යවහාර බවට පරිවර්තනය කරයි. ප්‍රධාන අංශවල නියෝජනය සමඟින්, ආයතනික තිරසාර කමිටුව තිරසාර කළමනාකරණය සඳහා පුළුල් හා ඒකාබද්ධ ප්‍රවේශයක් සහතික කරයි. එය අවශ්‍ය පරිදි එහි නිරීක්ෂණ, නිර්දේශ සහ ප්‍රගති යාවත්කාලීන කිරීම් සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරන අතර බැංකුවේ උපායමාර්ගික තීරණ ගැනීම, ප්‍රාග්ධන වෙන් කිරීම සහ අවදානම් පාලන රාමුවට තිරසාරභාවය සහ දේශගුණික ප්‍රතිෂ්ඨාවන් ඇතුළත් කරයි.

## SLFRS තිරසාරතාවයට අදාළ මූල්‍ය අනාවරණ (SLFRS S1 සහ SLFRS S2)

**2.3.1.1 වගකීම් හා කාර්යභාරය**

උපායමාර්ගික, මෙහෙයුම් සහ වාර්තාකරණ මානයන් හරහා බැංකුවේ තිරසාර වැඩසටහන් මෙහෙයවීම සඳහා ආයතනික තිරසාර කමිටුව වගකීමට බැඳී සිටී. එහි වගකීම් පහත තේමාත්මක ක්ෂේත්‍ර යටතේ සංවිධානය කෙරේ:

| ක්ෂේත්‍ර | වගකීම් |
|---|---|
| **උපායමාර්ගික අධීක්ෂණය සහ සැලසුම් කිරීම** | අධ්‍යක්ෂ මණ්ඩලයට අනුමැතිය සඳහා උපාය මාර්ග, ප්‍රතිපත්ති සහ ඉලක්ක නිර්දේශ කිරීමෙන් සහ ඒවා මෙහෙයුම් සැලසුම් බවට පරිවර්තනය කිරීමෙන් බැංකුවේ තිරසාරභාවය මෙහෙයවීමට මඟ පෙන්වීම. |
| **අවදානම් සහ අවස්ථා කළමනාකරණය** | වගවීම සහ ඒකාබද්ධ කිරීම සහතික කරමින් වටිනාකම් දාමය හරහා SRROs/CRROs හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ කළමනාකරණය අධීක්ෂණය කිරීම, |
| **පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය සහ ප්‍රමාණාත්මකතාවය** | බැංකුවේ තිරසාරභාවය පිළිබඳ ප්‍රතිපත්තිය දැනුම් දීම සහ අනාවරණය කිරීම සඳහා වැදගත් මාතෘකා හඳුනා ගැනීම සඳහා පාර්ශ්වකරුවන්ගේ ඉදිරිදර්ශන ක්‍රමානුකූලව රැස් කර සලකා බැලීම සහතික කිරීම. |
| **ක්‍රියාත්මක කිරීම සහ වැඩසටහන් අධීක්ෂණය** | වැඩසටහන් අධීක්ෂණය කිරීම, පෙළගස්වන ලද ව්‍යාපෘති අනුමත කිරීම සහ සියලුම අංශ හරහා භාවිතයන් ස්ථාවර ලෙස ඒකාබද්ධ කිරීම සහතික කිරීම මගින් තිරසාරභාවය පිළිබඳ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම මෙහෙයවීම. |
| **කාර්යසාධන අධීක්ෂණය සහ වාර්තා කිරීම** | ඉලක්ක සහ මූලික කාර්යසාධන දර්ශක සහ මහජන අනාවරණවලට අනුව බැංකුවේ තිරසාරතාවය පිළිබඳ කාර්ය සාධනය නියාමනය කිරීම. |
| **අනුකූලතාවය සහ අබණ්ඩ වැඩිදියුණු කිරීම** | අදාළ ප්‍රතිපත්ති සහ රෙගුලාසි පිළිපැදීම සහතික කිරීම, සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ වෙනස් වන ව්‍යාපාරික අවශ්‍යතා සමඟ පෙළ ගැසීම සඳහා තිරසාරතාවය පිළිබඳ වැඩසටහන් අබණ්ඩව වැඩිදියුණු කිරීම සඳහා නායකත්වය. |

### 2.4 කුසලතා සහ දක්ෂතා

ඵලදායී තිරසාර පාලනය විධිමත් ව්‍යුහයන් සහ වාර්තාකරණ චර්යාවන් මත පමණක් නොව, අධීක්ෂණය සහ ක්‍රියාත්මක කිරීම හාරව සිටින අයගේ දැනුම, විනිශ්චය සහ තීරණ ගැනීමේ හැකියාව මත ද රඳා පවතින බව බැංකුව හඳුනා ගනී. තිරසාරතාවයට අදාළ සහ දේශගුණයට අදාළ මූල්‍ය අනාවරණ කිරීම්වලට තිරසාරතාවය වාර්තා කිරීමේ ප්‍රමිතීන්, දේශගුණයට අදාළ මූල්‍ය අවදානම, පාලනය සහ සහතික කිරීමේ අපේක්ෂාවන්, ගනුදෙනුකාර සහ හැසිරීම් ගම්‍යතාව, වගකිවයුතු මූල්‍යකරණය, මෙහෙයුම් ඔරොත්තු දීම සහ තිරසාරතාවයට අදාළ කරුණු සහ බැංකුවේ මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය සහ අපේක්ෂාවන් අතර සම්බන්ධතා පිළිබඳ අවබෝධය ඇතුළුව වැඩිවන පුළුල් මිශ්‍රණයක් අවශ්‍ය වේ.

ඒ අනුව, තිරසාරතාවයට අදාළ කරුණු වඩාත් ගැඹුරින්, අනුකූලතාවයෙන් සහ විශ්වාසයෙන් සලකා බැලිය හැකි වන පරිදි, අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ආයතනික කළමනාකාරිත්වයේ කුසලතා සහ නිපුණතා ක්‍රමයෙන් ශක්තිමත් කිරීමේ ක්‍රියාවලියක බැංකුව නිරත වෙමින් සිටී. මෙම හැකියා ගොඩනැගීමේ උත්සාහය, අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමින් ශක්තිමත් අභියෝග සහ අධීක්ෂණය, කළමනාකරණය විසින් වඩා යහපත් හරස්-ක්‍රියාකාරී ක්‍රියාත්මක කිරීම සහ SLFRS S1 සහ SLFRS S2 සමඟ පෙළ ගැසුණු වර්ධිත තීරණ-ප්‍රයෝජනවත් අනාවරණ කිරීම් සඳහා සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා, මෙම සංවර්ධන මාර්ගය තුළින් තිරසාර පාලන වගකීම්, දේශගුණයට අදාළ මූල්‍ය අවදානම් සහ අවස්ථා, වෙනස්වන අනාවරණ අපේක්ෂාවන්, ප්‍රමාණාත්මතා විනිශ්චයන්, සහ උපායමාර්ගය තුළ තිරසාර තොරතුරුවල අර්ථකතනය, අවදානම් රුචිය, ප්‍රාග්ධනය වෙන් කිරීම සහ කාර්යසාධන අධීක්ෂණය වැනි ක්ෂේත්‍ර පිළිබඳ අවධානය කිරීමට අපේක්ෂා කෙරේ. ආයතනික කළමනාකරණය සඳහා, දත්ත හිමිකාරත්වය, පාලනයන් සහ සහතික කිරීමේ සූදානම, තිරසාර මූල්‍ය, ගනුදෙනුකාර ආරක්ෂාව, සහ ඇතුළත් ප්‍රතිෂ්ඨාවන්, අවදානම් තක්සේරු කිරීම්, අවස්ථා විශ්ලේෂණ, සහ තිරසාරතාවයට අදාළ කරුණු සැලසුම් කිරීම, මෙහෙයුම් සහ වාර්තාකරණයට ඇතුළත් කිරීම ඇතුළුව ප්‍රායෝගික ක්‍රියාත්මක කිරීමේ හැකියාවන් පුළුල් කිරීමට අවධානය යොමු කරයි.

කාලයත් සමඟ, ව්‍යුහගත පුහුණුව, ඉලක්කගත සංක්ෂිප්ත කිරීම්, කළමනාකරණ ඉගෙනුම් සැසි සහ වෙනස් වන වෙළෙඳපොළ, නියාමන සහ වාර්තාකරණ වර්ධනයන් සඳහා අබණ්ඩව නිරාවරණය වීම තුළින් බැංකුව මෙම හැකියාවන් ගොඩනැගීමේ ප්‍රවේශය විධිමත් කිරීමට අදහස් කරයි. මින් වඩාත් පරිණත තිරසාර පාලනය සඳහා බැංකුවේ ආයතනික සූදානම ශක්තිමත් කිරීමට සහ අධීක්ෂණ ආයතන සහ විධායක නායකත්වය යන දෙකම නැගී එන තිරසාරතාවයට අදාළ සහ දේශගුණයට අදාළ අවදානම් සහ අවස්ථාවන්ට සුදුසු පරිදි ප්‍රතිචාර දැක්වීමට සන්නද්ධ කරන සහතික කිරීමට අපේක්ෂා කෙරේ.

### 2.5 දැනුම්දීම සහ ආමන්ත්‍රණය

බැංකුව සඳහා, තිරසාරතාවය තනි අධ්‍යනයක් ලෙස නොසලකන අතර, එය ගනුදෙනුකාර සේවා සැලසීම, ශාඛා සහ මාර්ග ඔරොත්තුදීම, ඩිජිටල් ආයෝජනය, මෙහෙයුම් පාලනයන්, නිෂ්පාදන පාලනය, වගකීම්සහගත මූල්‍ය, සැපයුම්කාර අධීක්ෂණය සහ ප්‍රජා සහය පිළිබඳ තීරණ දැනුම්දීමට භාවිතා කෙරේ. තිරසාරතාවයට අදාළ කරුණකට තැන්පතුහිමි විශ්වාසය, ගනුදෙනුකාර ප්‍රතිඵල, අනුකූලතා ආකල්පය, ශේෂ පත්‍ර ඔරොත්තුදීම, හෝ දිගු කාලීන මෙහෙයුම් හැකියාවට බලපාන විභවතාවයක් ඇති අවස්ථාවක, කළමනාකරණ අවධානය සහ සම්පත් වෙන් කිරීමට බලපෑම් කිරීම අපේක්ෂා කෙරේ. ප්‍රතිපත්ති නිවැරදි කිරීම, පාලනය ශක්තිමත් කිරීම, හැකියාවන් ගොඩනැගීම සහ තෝරාගත් උපායමාර්ගික ආයෝජනවල සංයෝගයක් හරහා බැංකුව මෙම කරුණු ආමන්ත්‍රණය කරයි.

මෙයටම සීමා නොවූවද මෙයට,ගනුදෙනුකරුවන් සඳහා ප්‍රවේශ්‍යතාව සහ සහාය-සේවා මාර්ග වැඩිදියුණු කිරීම, පැමිණිලි-ඉගෙනුම් මාර්ග ශක්තිමත් කිරීම, අවදානම් සහ වාර්තාකරණ ක්‍රියාවලීන්හි තිරසාරතාවය සහ දේශගුණික ප්‍රතිෂ්ඨාවන් වඩාත් පැහැදිලිව ඇතුළත් කිරීම, අහිතකර කාලගුණික සිදුවීම් සඳහා ව්‍යාපාර අබණ්ඩතා සූදානම වැඩි දියුණු කිරීම සහ තීරණ-ප්‍රයෝජනවත් SLFRS - පෙළගැස්ම අනාවරණ කිරීම් සඳහා අවශ්‍ය ආයතනික හැකියාව පුළුල් කිරීම ඇතුළත් වේ, දේශගුණයට අදාළ නියමයන් තුළ, මෙයට මෙහෙයුම් බිඳවැටීම් අත්දැකීම භාවිතය සහ අබණ්ඩතා සැලසුම්කරණය දැනුම් දීමට මතුවන කළඹ අවබෝධය, ඔරොත්තු දෙන චින්තනය, සහ ප්‍රතිසාධන මූල්‍යයට සම්බන්ධ අනාගත නිෂ්පාදන සංවර්ධන අවස්ථා, පුනර්ජනනීය බලශක්තිය, සහ හරිත ගනුදෙනුකාර විසඳුම් ඇතුලත් ය. මෙම "දැනුම්දීම සහ ආමන්ත්‍රණය" විනය බැංකුවේ ඒකාබද්ධ චින්තන ආදර්ශයට කේන්ද්‍රීය වේ. වැදගත් කරුණු හුදෙක් කාරණයෙන් පසුව අනාවරණය කිරීම පමණක් නොව, කෙටි, මධ්‍යම සහ දිගු කාලීනව බැංකුව සැලසුම් කරන, ප්‍රතිචාර දක්වන සහ උත්සාහය වෙන් කරන ආකාරය වැඩි වැඩියෙන් හැඩගස්වයි.

## SLFRS තිරසාරතාවයට අදාළ මූල්‍ය අනාවරණ (SLFRS S1 සහ SLFRS S2)

### 2.6 ඉලක්ක, නියාමනය සහ පාරිශ්‍රමිකය

මිනුම් පරිණතභාවය වර්ධනය වන බැවින්, බැංකුව ප්‍රධාන වශයෙන් ක්‍රියාකාරකම් මත පදනම් වූ නියාමනයේ සිට ප්‍රමුඛ සහ පසුගාමී දර්ශකවල වඩාත් සමබර මුසුවක් කරා මාරු වීමට අදහස් කරයි. ප්‍රමුඛ දර්ශකවලින් මාර්ග සිතියමේ ප්‍රගතිය, අවදානම් තක්සේරු කිරීම් ආවරණය කිරීම, පාලනයන් සම්පූර්ණ කිරීම, පුහුණු විනිවිද යාම, දත්ත සූදානම, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ සන්ධිස්ථාන සහ ගැටළු වසා දැමීමේ විනය ඇතුළත් කිරීමට අපේක්ෂා කෙරේ. පසුගාමී දර්ශකවලින් සාක්ෂාත් කරගත් සේවා අඛණ්ඩතා ප්‍රතිඵල, පැමිණිලි සහ හැසිරීම් ප්‍රතිඵල, කළඹේ ගුණාත්මක බලපෑම්, මෙහෙයුම් කාර්යක්ෂමතා බලපෑම්, විමෝචන සහ සම්පත්-තීව්‍රතා ප්‍රවණතා සහ පීඩන සිදුවීම් අතරතුර නිරීක්ෂණය කරන ලද ඔරොත්තු දීමේ ප්‍රතිඵල ඇතුළත් කිරීමට අපේක්ෂා කෙරේ.

පාරිශ්‍රමික සම්බන්ධයෙන්, බැංකුවේ වර්තමාන ප්‍රවේශය ක්‍රමානුකූලව තිරසාරතාවයට සම්බන්ධ කිරීම වෙනුවට පාලනයට සම්බන්ධ ලෙස මනාව විස්තර කෙරේ. උපායමාර්ගික ක්‍රියාවට නැංවීම, පාලන විනය, මෙහෙයුම් ඔරොත්තුදීම, ගනුදෙනුකාර ප්‍රතිඵල සහ අනුකූලතා අපේක්ෂාවන් මගින් කළමනාකරණ කාර්යසාධනයට දැනටමත් බලපෑම් කර ඇත. කාලයත් සමඟ, අභ්‍යන්තර මිණුම් කල්පිරෙන බැවින් සහ වඩාත් සහතික කිරීමට පත්වන බැවින්, බැංකුව අදාළ කළමනාකරණ කාර්යභාර සඳහා ලකුණු කාඩ්වල විශේෂයෙන් දර්ශක පැහැදිලිවම ව්‍යවසාය වටිනාකම ආරක්ෂාව සහ දිගුකාලීන උපායමාර්ගය ලබාදීමට සම්බන්ධ වන අවස්ථාවේ තෝරාගත් තිරසාරතාවයට අදාළ සහ දේශගුණයට අදාළ දර්ශක භාවිතය ක්‍රමයෙන් විධිමත් කිරීමට අපේක්ෂා කරයි.

පාලනය මැනියහැකි ප්‍රතිපත්ති, විනයගරුක නියාමනය සහ පැහැදිලි කළමනාකරණ වගකීම බවට පත්වන අවස්ථාවේදී පමණක් එය පාලත්මක බවට පත් වන බව බැංකුව හඳුනා ගනී. ඒ අනුව, උපායමාර්ගික සන්ධිස්ථාන, අවදානම් දර්ශක, කළමනාකරණ උපකරණ පුවරු සහ ක්‍රියාත්මක කිරීමේ සමාලෝචනවල එකතුවක් හරහා තිරසාරතාවය හා සම්බන්ධ සහ දේශගුණය ආශ්‍රිත කරුණු ක්‍රමයෙන් බැංකුවේ අභ්‍යන්තර කාර්යසාධන නිර්මාණ ශිල්පයට ඇතුළත් කරනු ලැබේ. පරිණතභාවය වාර්තා කිරීමේ මෙම අදියරේදී, බැංකුවේ ප්‍රවේශය හිතාමතාම ප්‍රායෝගික වේ: එය තීරණ-ප්‍රයෝජනවත් දර්ශක ශක්තිමත් කිරීම, හිමිකාරිත්වය පැහැදිලි කිරීම සහ වඩාත් දියුණු ඉලක්ක-සම්බන්ධිත පාරිශ්‍රමික යාන්ත්‍රණ වෙත යාමට පෙර කමිටු ව්‍යුහයන් හරහා ප්‍රගතිය පිළිබඳ ස්ථාවර සමාලෝචනයට ප්‍රමුඛත්වය ලබා දේ.

කළමනාකරණ කමිටුවලට සහ අදාළ අවස්ථාවන්හිදී අධ්‍යක්ෂ මණ්ඩලයට වරින් වර වාර්තා කිරීම හරහා නියාමනය සිදු කෙරේ. මෙම වාර්තා මගින් ගනුදෙනුකාර ආරක්ෂාව සහ පැමිණිලි ප්‍රවණතා, ඇතුළත් කිරීමේ සහ ප්‍රවේශ්‍යතා ප්‍රගතිය, මෙහෙයුම් ඔරොත්තුදීම සහ සිදුවීම් ප්‍රතිචාර, නියාමන සහ අනුකූලතා වර්ධනයන්, දේශගුණය සහ තිරසාරතාවය අනාවරණ සූදානම සහ දේශගුණයට අදාළ මිනුම් සහ පාලනයන්හි පරිණතභාවය වැනි ක්ෂේත්‍ර ආවරණය කෙරේ. මූල්‍ය හා අවදානම් කාර්යසාධනය සමඟ වැදගත් තිරසාරතාවයට අදාළ අවදානම් සහ අවස්ථා සමාලෝචනය කළ හැකි වන පරිදි බැංකුව වඩාත් ව්‍යුහගත තිරසාරතාවය පිළිබඳ උපකරණ පුවරු ප්‍රවේශයක් කරා ද ගමන් කරමින් සිටී. බැංකුව වඩාත් ව්‍යූශගත තිරසාර උපකරණ පුවරු ප්‍රවේශයක් කරා කටයුතු කරමින් සිටින අතර, ඒ අනුව වැදගත් තිරසාරතාවයට අදාළ අවදානම් සහ අවස්ථා මූල්‍ය සහ අවදානම් කාර්යසාධනය සමඟ සමාලෝචනය කළ හැකි වේ. පාරිශ්‍රමිකය සම්බන්ධයෙන්, බැංකුව තෝරාගත් තිරසාරතාවයට අදාළ ප්‍රමුඛතා නායකත්ව කාර්යසාධන තක්සේරුවේදී පිළිබිඹු විය හැකි ආකාරය ක්‍රමයෙන් සලකා බලමින් සිටින අතර එහිදී විශේෂයෙන් ඒවා උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම, පාලන ගුණාත්මකභාවය, ගනුදෙනුකාර ප්‍රතිඵල, මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව හෝ අනාවරණය කිරීමේ සූදානම සමඟ සෘජුවම සම්බන්ධ වේ. සම්පූර්ණයෙන්ම ප්‍රමාණනය කරන ලද තිරසාරතාවයට සම්බන්ධ පාරිශ්‍රමික ආදර්ශයක් තවමත් වෙනස් වෙමින් පවතින අතර, ඉහත සඳහන් කළ පරිදි තවදුරටත් ශක්තිමත් කිරීම අපේක්ෂා කරන බැවින් පාලන නියෝගය පැහැදිලිය. කළමනාකරණ දිරිගැන්වීම් කෙටි කාලීන ප්‍රතිඵලවලට වඩා දිගු කාලීන වටිනාකම් ආරක්ෂාව, සදාචාරාත්මක හැසිරීම සහ ඔරොත්තු දෙන කාර්යසාධනය සඳහා වැඩි වැඩියෙන් සහාය විය යුතුය.

### 2.7 පාලනයට සහයවන ප්‍රතිපත්ති සහ රාමු

බැංකුවේ තිරසාරතාවයට අදාළ කරුණුවල පාලනයට පුළුල් ප්‍රතිපත්ති හා රාමු කිහිපයක් මගින් සහය වේ:

| ප්‍රතිපත්ති/රාමු | අරමුණ |
|---|---|
| **තිරසාරතාවය පිළිබඳ ප්‍රතිපත්තිය** | බැංකුවේ කැපවීම, මූලධර්ම සහ තිරසාරතාවය කළමනාකරණය සඳහා ප්‍රවේශය සකසයි |
| **CSR ප්‍රතිපත්තිය** | CSR ව්‍යාපෘති සහ වැඩසටහන් තෝරා ගැනීම, ක්‍රියාත්මක කිරීම සහ නියාමනය කිරීම මෙහෙයවයි |
| **පාරිසරික හා සමාජ කළමනාකරණ පද්ධතිය (ESMS)** | ණය දීමේ සහ මෙහෙයුම් වලදී පාරිසරික හා සමාජීය අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ව්‍යුහගත ප්‍රවේශයක් සපයයි |
| **තොරතුරු දැනුම් දීමේ ප්‍රතිපත්තිය** | සදාචාර විරෝධී භාවිතයන් හෝ අනුකූල නොවීම පිළිබඳ ගැටළු මතු කිරීමට පාර්ශ්වකරුවන්ට හැකියාව ලබා දේ. |
| **පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්ව රාමුව** | පාර්ශ්වකරුවන් සමඟ ඔවුන්ගේ ගැටළු සහ අපේක්ෂාවන් තේරුම් ගැනීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමට ක්‍රමානුකූල සහභාගිත්වයට මඟ පෙන්වයි |
| **ප්‍රමාණාත්මතා තක්සේරු රාමුව** | වාර්තා කිරීම සහ ක්‍රියාමාර්ග ගැනීම සඳහා වැදගත් තිරසාරභාවය පිළිබඳ මාතෘකා හඳුනා ගැනීම සහ ප්‍රමුඛතාවය දීම සඳහා සහාය වේ. |
| **ආචාර ධර්ම සහ චර්යා සංග්‍රහය** | සදාචාරාත්මක සහ වගකිවයුතු හැසිරීම සම්බන්ධයෙන් සේවකයින් සහ කළමනාකරණය සඳහා හැසිරීම් අපේක්ෂාවන් සකසයි |

### 2.8 සමූහ ආයතනය සමඟ සම්බන්ධීකරණය

අදාළ වන පරිදි, තිරසාර පාලනය කණ්ඩායම් ආයතන සහ අනුබද්ධිත සමාගම් දක්වා විහිදෙන අතර, බැංකු සමූහය පුරා ප්‍රතිපත්ති, වැඩසටහන් සහ වාර්තාකරණ ව්‍යවහාර අඛණ්ඩව යොදා ගැනීම සහතික කරයි. සම්බන්ධීකරණ යාන්ත්‍රණවලට නිතිපතා රැස්වීම්, බෙදාගත් රාමු සහ ඒකාබද්ධ වාර්තාකරණ ක්‍රියාවලීන් ඇතුළත් වේ.

### 2.9 සහතික කිරීම හා අඛණ්ඩ වර්ධනය

බැංකුවේ දිගුකාලීන අරමුණ වන්නේ තිරසාරතාවයට අදාළ අනාවරණ කිරීම් සඳහා අභ්‍යන්තර පාලන පරිසරයක් සංවර්ධනය කිරීම වන අතර එය මූල්‍ය වාර්තාකරණය, පැහැදිලි හිමිකාරිත්වය, පාලිත අර්ථ දැක්වීම්, සිතියම්ගත කළ මූලාශ්‍ර පද්ධති, ලේඛනගත සමාලෝචන ක්‍රියා පටිපාටි, ව්‍යතිරේක උත්සන්න කිරීම, පිටපත් පාලනය, විගණන විමසුම් රඳවා තබා ගැනීම සහ වරින් වර ස්වාධීන සමාලෝචනය සඳහා යොදාගත් විනයට වැඩියෙන් සමාන වේ. වාර්ෂික වාර්තා පරිශීලකයින් තිරසාරතාවයට අදාළ තොරතුරු තීරණ-ප්‍රයෝජනවත්, සැසඳිය හැකි සහ සහතික කළ හැකි වනු ඇතැයි වැඩි වැඩියෙන් අපේක්ෂා කරන බැවින් මෙය විශේෂයෙන් වැදගත් වේ. මෙයට ලේඛන ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම, සාක්ෂි විමසුම් සමාලෝචන පාලනයන් සහ තිරසාරතාවයට අදාළ තොරතුරු මත අනාගත අභ්‍යන්තර සහ බාහිර සහතික කිරීමට සහාය වීමේ හැකියාව ඇතුළත් වේ.

## SLFRS තිරසාරතාවයට අදාළ මූල්‍ය අනාවරණ (SLFRS S1 සහ SLFRS S2)

එබැවින් අඛණ්ඩ වර්ධනය වියුක්ත අභිලාෂයක් නොව මෙහෙයුම් අවශ්‍යතාවයකි. සෑම වාර්තාකරණ චක්‍රයකින්ම දත්ත සම්පූර්ණත්වය, කාර්යභාරය පැහැදිලි බව, කමිටු වාර්තාකරණයේ අනුකූලතාව, අනාගත සහතික කිරීම සඳහා සූදානම සහ තිරසාරතාවයට අදාළ කරුණු වල වත්මන් සහ අපේක්ෂිත මූල්‍ය බලපෑම් වඩාත් නිරවද්‍යතාවයෙන් සහ විශ්වාසයෙන් පැහැදිලි කිරීමට බැංකුවට ඇති හැකියාව වැඩිදියුණු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 3 අවදානම් කළමනාකරණය

බැංකුව තිරසාරතාවයට අදාළ අවදානම් සම්පූර්ණයෙන්ම වෙනම පද්ධතියක් ලෙස කළමනාකරණය නොකරයි. ඒ වෙනුවට, එය ක්‍රමානුකූලව ඒවා එහි පුළුල් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ නිර්මාණ ශිල්පයට ඒකාබද්ධ කරන අතර, ණය අවදානම, මෙහෙයුම් අවදානම, හැසිරීම් අවදානම, අනුකූලතා අවදානම, කීර්තිනාම අවදානම, සයිබර් අවදානම, සේවක අවදානම සහ උපායමාර්ගික අවදානම වැනි පවතින වර්ගීකරණ තුළ තිරසාරතාවයට අදාළ අවදානම් රාශියක් දැනටමත් ඇතුළත් කර ඇති බව හඳුනා ගනී. එබැවින් අභියෝගය වන්නේ සමාන්තර අවදානම් ලේඛනයක් නිර්මාණය කිරීම පමණක් නොව, බැංකුව ආරක්ෂා කිරීම සඳහා දැනටමත් භාවිතා කර ඇති පද්ධති තුළ තිරසාරතාවයට අදාළ මානයන් නිසි ලෙස හඳුනාගෙන, තක්සේරු කර, නියාමනය කර උත්සන්න කර ඇති බව සහතික කිරීමයි.

### 3.1 දේශගුණයට අදාළ අවදානම් කළමනාකරණ දළ විශ්ලේෂණය

දේශගුණයට අදාළ අවදානම්වලින් තනි තනි ආයතන හා පුළුල්ව මූල්‍ය පද්ධතියට බලපාන විභවතාව සහිත මූල්‍ය අවදානමේ සැලකියයුතු මූලාශ්‍රයක් නියෝජනය කරන බව මූල්‍ය සේවා ක්ෂේත්‍රය වැඩි වැඩියෙන් හඳුනා ගනී. මෙවැනි අවදානම් භෞතික හා සංක්‍රාන්ති යන මූලික මාර්ග දෙකෙන් සම්ප්‍රේෂණය කෙරේ. මානව ලක්ෂණ සහිත මේවා බැංකුවේ මූල්‍ය යහපත, මෙහෙයුම් ස්ථාවරත්වය සහ උපායමාර්ගික ස්ථානගතවීම හා එකිනෙකට සම්බන්ධ වේ.

#### 3.1.1 දේශගුණය හා සම්බන්ධිත අවදානම්

**භෞතික අවදානම්**

දේශගුණික වෙනස සහ පාරිසරික හායනයේ ඍජු බලපෑම්වලින් ඇති වේ. මේ ලක්ෂණ පහත පරිදි වේ:

- **නිවැරදි භෞතික අවදානම්:** මෙහෙයුම් බිඳවැටීමට, අලාභ වත්කම් සහ ණය ගැතියාගේ හැකියාවට බාධා කරන ගංවතුර, සුලි කුණාටු, නායයාම්, සහ නියඟය වැනි අහිතකර කාලගුණ සිදුවීම්වල වැඩිවන බරපතලකම සහ වාරගණන ඇතුළුව සිදුවීම් පදනම් බලපෑම්.
- **නිදන්ගත භෞතික අවදානම:** ආර්ථික හැකියාවට, අංශයේ කාර්යසාධනයට හා ඇප වටිනාකම්වලට ක්‍රමයෙන් බලපාන මුහුදු මට්ටම ඉහළයාම, උෂ්ණත්වය වැඩිවීම, සහ ජල හිඟය ඇතුළුව දේශගුණික රටාවල දිගුකාලීන වෙනස්වීම.

**සංක්‍රාන්ති අවදානම්**

අඩු කාබන් ආර්ථිකයක් කරා ගැලපීම් ක්‍රියාවලියෙන් ඇති වේ. එයට පහත දෑ ඇතුළත්ය.:

- **ප්‍රතිපත්ති සහ නීතිමය අවදානම්:** දේශගුණික රෙගුලාසිවල වෙනස්වීම්, ණය ගැතියන්ගේ අනුකූලතා පිරිවැය සහ මෙහෙයුම් ශක්‍යතාවයට බලපාන කාබන් මිලකරණ යාන්ත්‍රණ සහ අනාවරණය කිරීමේ අවශ්‍යතා,
- **තාක්ෂණික අවදානම්:** විභවයෙන් ස්ථිර වත්කම් හෝ ව්‍යාපාර ආකෘති යල් පැන යාමෙන් අඩු කාබන් විකල්ප මගින් ස්ථාපිත තාක්ෂණයන් විස්ථාපනය කිරීම,
- **වෙළෙඳපොල අවදානම්:** දේශගුණික ගැටළු පිළිබඳ දැනුවත්භාවය වර්ධනය වන බැවින්, ගනුදෙනුකරුවන්ගේ මනාපයන්, ආයෝජක හැඟීම් සහ ඉල්ලුම් රටා වල වෙනස්වීම්.
- **කීර්තිනාම අවදානම්:** දේශගුණික අරමුණු සඳහා දායක වන හෝ අඩු කරන මූල්‍යකරණ ක්‍රියාකාරකම්වල බැංකුවේ කාර්යභාරය පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ අවබෝධය.

මෙවැනි අවදානම් වර්ගීකරණ අනෝන්‍ය වශයෙන් බහිෂ්කාර නොවන බව බැංකුව හඳුනා ගනී. භෞතික හා සංක්‍රාන්ති අවදානම් භෞතික දේශගුණික සිදුවීම්වලට ප්‍රතිපත්ති ප්‍රතිචාරය සංක්‍රාන්ති මාර්ගය වේගවත් කළ හැකි අතර සංක්‍රාන්ති ක්‍රියාමාර්ග භෞතික අවදානම්වල උවදුරට බලපාන බෙදහැරීමේ ප්‍රතිවිපාක ඇති සංකීර්ණ ආකාරයෙන් මැදිහත් වේ.

##### 3.1.1 දේශගුණයට අදාළ අවස්ථා

අවදානම් හඳුනාගැනීම සහ කළමනාකරණයට සමානුපාතිකව, බැංකුව දිගුකාලීන ආයතනික ඔරොත්තුදීම ශක්තිමත් කරමින් තිරසාර ආර්ථිකයක් කරා සංක්‍රාන්තියට සහයවිය හැකි දේශගුණයට අදාළ අවස්ථා හඳුනා ගැනීමට සක්‍රීයව උත්සාහ දරයි. මෙම අවස්ථාවන්ට දේශගුණිකවම ඔරොත්තුදෙන යටිතල පහසුකම් සඳහා මුදල් සැපයීම, ගනුදෙනුකාර අනුවර්තන පියවරයන්ට සහාය වීම, තිරසාර භාවිතයන් දිරිමත් කරන නිෂ්පාදන සංවර්ධනය කිරීම සහ වැඩිදියුණු කළ දේශගුණික දත්ත සහ විශ්ලේෂණ හරහා අවදානම් තක්සේරු කිරීමේ හැකියාවන් වැඩි දියුණු කිරීම ඇතුළත් වේ.

මෙම අවස්ථා උපායමාර්ගික සැලසුම්කරණයට හඳුනාගැනීමට,තක්සේරු කිරීමට, සහ ඒකාබද්ධ කිරීමට අසමත්වීම එය අවදානමක් වන බව බැංකුව පිළිගන්නා අතර වඩාත් කඩිනම් වෙළෙඳපොල කොටසේ අලාභයක්, ප්‍රත්‍යක්ෂ අක්‍රීයතාවයෙන් කීර්තිනාම පසු බැසීමක්, හෝ වර්ධනීය තිරසාර මූල්‍ය වෙළෙඳපොල තුළ වැරදුණු ආයෝජන විභවතාවක් අර්ථ ගන්වයි.

### 3.2 දේශගුණික අවදානම් කළමනාකරණ ඒකාබද්ධ කිරීමට අදියර ප්‍රවේශය

2025 වසර තුළ, දේශගුණික අවදානම් කළමනාකරණය සඳහා උපායමාර්ගික සහ මෙහෙයුම් රාමුව ස්ථාපිත කිරීම සඳහා බැංකුව මූලික කටයුතු ආරම්භ කළේය. මෙම අදියර ප්‍රවේශය මගින් දේශගුණික අවදානම් ඒකාබද්ධ කිරීම යනු ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි, දත්ත හැකියාවන් සහ මානව විශේෂඥතාව ප්‍රගතිශීලී ලෙස වැඩිදියුණු කිරීම අවශ්‍ය වන බහු-වසර ගමනක් බව හඳුනා ගනී.

බැංකුවේ දේශගුණික අවදානම් කළමනාකරණ රාමුව පහත දෑ ඇතුළත් කිරීමට සංවර්ධනය කරමින් පවතී:

- **අවදානම් හඳුනා ගැනීම:** කළඹ, මෙහෙයුම් සහ වටිනාකම් දාමය පුරා දේශගුණයට අදාළ අවදානම් හඳුනා ගැනීම සඳහා ක්‍රමානුකූල ක්‍රියාවලීන්.
- **තක්සේරුව සහ මිනුම්:** වත්මන් දත්ත සීමාවන් හා වෙනස්වන විශ්ලේෂණ ශිල්පීය ක්‍රම හඳුනා ගනිමින් දේශගුණීන අවදානම් බලපෑම් විශාලත්වය සහ සම්භාවිතාව තක්සේරු කිරීමේ ක්‍රමවේද
- **අවම කිරීම සහ ප්‍රතිචාර දැක්වීම්:** අනුවර්තන පියවර, කළඹ මෙහෙයවීම සහ ගනුදෙනුකාර සහභාගීත්වය ඇතුළුව හඳුනාගත් අවදානම් කළමනාකරණය කිරීමේ උපාය මාර්ග,
- **නියාමනය සහ වාර්තා කිරීම:** කළමනාකරණ සහ අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ කමිටුවලට නිතිපතා වාර්තා කිරීමත් සමඟ දේශගුණික අවදානම් නිරාවරණයන් සහ අවම කිරීමේ පියවරවල කාර්යක්ෂමතාව අඛණ්ඩව නිරීක්ෂණය කිරීම.

භෞතික අවදානම් සඳහා, රාමුව මගින් ගංවතුර, සුලි කුණාටු, නායයාම් සහ නියඟවලට විශේෂ අවධානයක් සමඟ ශ්‍රී ලංකාව තුළ ඒවායේ ඓතිහාසික වාරග ණන සහ බලපෑම මත පදනම් වී උවදුරු ප්‍රමුඛ කරයි. සංක්‍රාන්ති අවදානම සඳහා, ප්‍රතිපත්ති වෙනස්වීම්, වෙළෙඳපොල සංවර්ධනයන්, සහ කාබන් තීව්‍ර අංශවල තාක්ෂණික වෙනස්වීම් වෙත නිරාවරණය අවබෝධ කර ගැනීම කෙරෙහි අවධානය යොමු වේ.

**SLFRS S2 යටතේ මෙම රාමුවේ සංවර්ධන අවධියේ බැංකුව සිටී. විස්තීර්ණ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ ප්‍රමාණාත්මක තක්සේරු හැකියාවන් ක්‍රමානුකූලව සංවර්ධනය කර අනාගත වාර්තාකරණ චක්‍රවලදී අනාවරණය කරනු ලැබේ.**

## SLFRS තිරසාරතාවයට අදාළ මූල්‍ය අනාවරණ (SLFRS S1 සහ SLFRS S2)

### 3.3 දේශගුණයට අදාළ අවදානම් හඳුනා ගැනීම

බැංකුව නිරාවරණය සහ අවදානමේ බහුවිධ මානයන් සලකා බලන ව්‍යුහගත ක්‍රියාවලියක් හරහා දේශගුණය ආශ්‍රිත අවදානම් හඳුනා ගනී. මෙම ක්‍රියාවලිය බැංකුවේ පුළුල් අවදානම් හඳුනාගැනීමේ රාමුවට ඒකාබද්ධ කර ඇති අතර අභ්‍යන්තර දත්ත සහ බාහිර තොරතුරු මූලාශ්‍ර දෙකම භාවිතා කරයි.

**අවදානම් හඳුනා ගැනීම සඳහා පරාමිති**

| පරාමිති | විස්තරය | යොදා ගැනීම |
|---|---|---|
| **කළඹ සංයුතිය** | අංශය, භූගෝලය සහ නිෂ්පාදන වර්ගය අනුව ණය දීමේ නිරාවරණයන් විශ්ලේෂණය කිරීම | දේශගුණික බලපෑම්වලට ගොදුරු විය හැකි සංකේන්ද්‍රණයන් හඳුනා ගැනීම |
| **භූගෝලීය පාඝාතන** | ශාඛා ජාලය, ගනුදෙනුකාර ස්ථාන සහ ඇපකර බෙදා හැරීම පිළිබඳ තක්සේරු කිරීම | භෞතික උපද්‍රව වලට නිරාවරණය වීම සිතියම්ගත කිරීම (ගංවතුර කලාප, නායයෑම් අවදානම් සහිත ප්‍රදේශ, වෙරළබඩ ප්‍රදේශ) |
| **ආංශික අවදානම** | භෞතික හා සංක්‍රාන්ති අවදානම් සඳහා ආර්ථික අංශවල සංවේදීතාව ඇගයීම | වැඩිදියුණු කළ නිසි සම්ප්‍රජන්‍ය සඳහා අංශවලට ප්‍රමුඛතාවය (කෘෂිකර්මය, සංචාරක, ධීවර, නිෂ්පාදන) |
| **නාවකාලික සලකා බැලීම්** | කෙටි, මධ්‍යම සහ දිගු කාලීන සිමාවන් හරහා අවදානම් වෙනස් විය හැකි ආකාරය පිළිබඳ ඉදිරි දැක්මක් සහිත තක්සේරුව | උපායමාර්ගික සැලසුම්කරණය සහ අවදානම් රුචිය සැකසුම් දැනුම් දීම |
| **නියාමන සීමා ස්කෑන් කිරීම** | නැගී එන දේශගුණයට අදාළ රෙගුලාසි, අනාවරණ කිරීමේ අවශ්‍යතා සහ ප්‍රතිපත්ති දිශාවන් නියාමනය කිරීම | අනුකූලතා බැඳීම් සහ සංක්‍රාන්ති මාර්ග අපේක්ෂා කිරීම |

හඳුනාගැනීමේ ක්‍රියාවලිය SLFRS S2 අවශ්‍යතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ තිරසාර මූල්‍ය උපදෙස්, ජාතික දේශගුණික බැඳීම් (ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වයන්) සහ ශ්‍රී ලාංකික සන්දර්භයට අදාළ වන විට ජාත්‍යන්තර රාමු ඇතුළු බහුවිධ මාර්ගෝපදේශක මූලාශ්‍ර මත පදනම් වේ.

**භූගෝලීය විශ්ලේෂණ මෙවලම් ඒකාබද්ධ කිරීම, ආංශික පර්යේෂණ සහ අවස්ථා චින්තනය ඇතුළුව දේශගුණික අවදානම් හඳුනාගැනීමේ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා බැංකුව මාර්ග සිතියමක් සකස් කර ඇත. මෙම සංවර්ධන අධියර තුළ, SLFRS S2 යටතේ ලබා ගත හැකි සංක්‍රාන්ති සහන යොදා ගැනීමට බැංකුව තෝරාගෙන ඇත.**

### 3.4 දිට්වා සුළි කුණාටුවෙන් පාඩම්

2025 දී සිදු වූ දිට්වා සුළි කුණාටු සිදුවීම, දේශගුණික අවදානම් හඳුනා ගැනීම සඳහා බැංකුවේ ප්‍රවේශය පිළිබඳව දැනුවත් කළ සැබෑ ලෝක පිඩන පරීක්ෂණයක් සපයන ලදී. පහත අත්දැකීම් ඉස්මතු කර දැක්වීය:

- භෞතික උපද්‍රවවලට නිරාවරණය වීම අවබෝධ කර ගැනීමේදී භූගෝලීය කැටි ගැසීමේ වැදගත්කම
- මෙහෙයුම් බාධාවන්හි අන්තර් සම්බන්ධිත ස්වභාවය සහ ණය ගුණාත්මක බලපෑම්
- සක්‍රිය ගනුදෙනුකාර සහභාගිත්වයේ සහ සහන යාන්ත්‍රණවල වටිනාකම
- දේශගුණික සිදුවීම්වලට ගලපන ලද ශක්තිමත් ව්‍යාපාර අඛණ්ඩතා පෙරාතු ලේඛණ සඳහා අවශ්‍යතාව

ප්‍රායෝගික අත්දැකීම් ක්‍රමවේද සංවර්ධනයට දැනුම් දෙන බව සහතික කරමින්, බැංකුවේ වෙනස්වන දේශගුණික අවදානම් හඳුනාගැනීමේ රාමුවට මෙම පාඩම් ඇතුළත් කෙරේ.

### 3.5 දේශගුණයට අදාළ අවදානම් තක්සේරුව

#### 3.5.1 භෞතික අවදානම් තක්සේරු කිරීමේ ප්‍රවේශය

භෞතික දේශගුණික අවදානම් තක්සේරු කිරීම සඳහා බැංකුවේ ප්‍රවේශයෙන්, ණය ගැතියන්ගේ ආපසු ගෙවීමේ හැකියාව, ඇපකර වටිනාකම් සහ බැංකුවේම මෙහෙයුම් කෙරෙහි ඇති විය හැකි බලපෑම් සලකා බලයි. විශ්ලේෂණ මට්ටමින් විවිධ අවබෝධයන් මතුවන බව හඳුනා ගනිමින්, කළඹ සහ ගනුදෙනුකාර මට්ටම් දෙකෙහිම තක්සේරුව සිදු කරනු ලැබේ.

**කළඹ මට්ටමේ භෞතික අවදානම් තක්සේරු කිරීම:**

කළඹ මට්ටමේදී, බැංකුව පහත දෑ තුළින් භෞතික අවදානම් නිරාවරණය ඇගයීමට ලක් කරයි:

- **අංශමය අවදානම් විශ්ලේෂණය:** භෞතික දේශගුණික උපද්‍රව වලට ඉහළ සංවේදීතාවයක් ඇති අංශ ඒවායේ මෙහෙයුම් ලක්ෂණ, සැපයුම් දාම රඳාපැවතුම් සහ වෙළෙඳපොල නිරාවරණය මත පදනම්ව හඳුනා ගැනීම, ප්‍රමුඛතා අංශ අතරට කෘෂිකර්මාන්තය, සංචාරක ව්‍යාපාරය, ධීවර කර්මාන්තය සහ ආපදා අවදානම් ප්‍රදේශවල කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ඇතුළත් වේ.
- **භූගෝලීය නිරාවරණ අනුරූපිතය:** ගංවතුර, සුළි කුණාටු, නායයාම්වලට ඓතිහාසික උවදුරක් සහිත ප්‍රදේශවලට විශේෂ අවධානය සමඟ දිස්ත්‍රික්ක හා කලාප හරහා ණයදීමේ නිරාවරණ ව්‍යාප්තිය තක්සේරු කිරීම. මෙම අනුරූපිතය ලබාගතහැකි උවදුරු දත්ත හා ඓතිහාසික ආපදා වාර්තාවලින් ලබා ගනී.
- **සංකේන්ද්‍රණ විශ්ලේෂණය:** කළඹ කාර්යසාධනය කෙරෙහි දේශගුණික සිදුවීම්වල බලපෑම වැඩි කළ හැකි අධි අවදානම් අංශවල හෝ කලාපවල සැලකිය යුතු නිරාවරණ සංකේන්ද්‍රණ හඳුනා ගැනීම.

**ගනුදෙනුකාර මට්ටමේ භෞතික අවදානම් තක්සේරුව:**

පූර්ව නිශ්චිත සීමා ඉක්මවන නිරාවරණ හෝ ඉහළ අවදානම් ක්ෂේත්‍ර තුළ අයත්වීම් තුළ, බැංකුව උසස් කළ නිසි සම්ප්‍රජන්‍ය පවත්වන අතර ඉන් පහත දෑ සලකා බලයි:

- **ස්ථානය-නිශ්චිත අවදානම් නිරාවරණය:** ගනුදෙනුකාර මෙහෙයුම්, වත්කම් හෝ ඇපකරය භෞතික දේශගුණික උපද්‍රව වලට ගොදුරු වන ප්‍රදේශවල පිහිටා තිබේද යන්න තක්සේරු කිරීම.
- **මෙහෙයුම් අවදානම:** අහිතකර කාලගුණික සිදුවීම් ගනුදෙනුකාර මෙහෙයුම්, සැපයුම් දාම හෝ වෙළෙඳපොල ප්‍රවේශයට බාධා කළ හැකි ආකාරය ඇගයීම.
- **අනුවර්තන ධාරිතාව:** රක්ෂණ ආවරණය, විවිධාංගීකරණය සහ ඔරොත්තු දීමේ ආයෝජන ඇතුළුව දේශගුණික සිදුවීම් වලින් ආරක්ෂා වීමට හෝ යථා තත්ත්වයට පත් කිරීමට ගනුදෙනුකරුවන් ගෙන ඇති පියවර සලකා බැලීම.

**බැංකුවේ භෞතික අවදානම් තක්සේරු කිරීමේ හැකියාවන් සංවර්ධනය වෙමින් පවතී. දිට්වා සුළි කුණාටුවෙන් පසුව, තක්සේරු ක්‍රමවේද පිරිසිදු කිරීම සහ උපද්‍රව හඳුනා ගැනීම සහ ණය තීරණ ගැනීම අතර සම්බන්ධතාවය ශක්තිමත් කිරීම සඳහා භෞතික අවදානම් ප්‍රතිඵලවන් පිළිබඳ පුළුල් සමාලෝචනයක් ආරම්භ කරන ලදී. දත්ත පද්ධති සහ ක්‍රමවේද පරිණත වන බැවින්, ප්‍රමාණාත්මක කළඹ මට්ටමේ නිරාවරණ විශ්ලේෂණය ක්‍රමයෙන් සංවර්ධනය කෙරේ.**

## SLFRS තිරසාරතාවයට අදාළ මූල්‍ය අනාවරණ (SLFRS S1 සහ SLFRS S2)

### 3.5.2 සංක්‍රාන්ති අවදානම් තක්සේරු ප්‍රවේශය

අඩු කාබන් ආර්ථිකයක් කරා මාරුවීම ණය ගැතියන්ගේ ණය සුදුසුකම්, අංශයේ ශක්‍යතාව සහ බැංකුවේ උපායමාර්ගික ස්ථානගත කිරීම කෙරෙහි බලපාන්නේ කෙසේද යන්න තේරුම් ගැනීම කෙරෙහි සංක්‍රාන්ති අවදානම් තක්සේරුව අවධානය යොමු කරයි.

**කළඹ මට්ටමේ සංක්‍රාන්ති අවදානම් තක්සේරු කිරීම:**

කළඹ මට්ටමේදී, බැංකුව පහත දෑ තුළින් සංක්‍රාන්තිය තක්සේරු කරයි:

- **ආංශික නිරාවරණ විශ්ලේෂණය:** දේශගුණික ප්‍රතිපත්ති, කාබන් මිලකරණය, තාක්ෂණික බිඳවැටීම් හෝ වෙළෙඳපොල මනාපයන් වෙනස් වීමෙන් බලපෑමට ලක් විය හැකි අංශවලට ණය දීමේ නිරාවරණ හඳුනා ගැනීම. අවධානය යොමු කරන අංශ අතරට විදුලිබල උත්පාදනය, නිෂ්පාදනය, ප්‍රවාහනය සහ අපනයන-නැඹුරු කර්මාන්ත ඇතුළත් වේ.
- **ප්‍රතිපත්ති සහ නියාමන නියාමනය:** ණය ගැති මෙහෙයුම් පරිසරයන්ට බලපෑ හැකි දේශගුණික ප්‍රතිපත්ති, තිරසාර මූල්‍ය රෙගුලාසි සහ ජාත්‍යන්තර වෙළෙඳ පියවර (කාබන් දේශසීමා ගැලපුම් යාන්ත්‍රණ වැනි) වල වර්ධනයන් නිරීක්ෂණය කිරීම.
- **වෙළෙඳපොල ප්‍රවනතා විශ්ලේෂණ:** ගනුදෙනුකාර මනාප, ආයෝජක අපේක්ෂාවන්, සහ දේශගුණය හා තිරසාරතාවයට අදාළ ක්ෂේත්‍රයේ ව්‍යවහාරවල වෙනස්වීම නිරීක්ෂණය.

**ගනුදෙනුකාර මට්ටමේ සංක්‍රාන්ති අවදානම් තක්සේරු කිරීම**

සංක්‍රාන්ති-සංවේදී අංශවල සැලකියයුතු නිරාවරණය සඳහා, වැඩිකළ නිසි සම්ප්‍රජන්‍ය විසින් පහත දෑ සලකා බලයි:

- **කාබන් තීව්‍රතාවය:** දත්ත ලබා ගත හැකි අංශ මිණුම් සලකුණු වලට සාපේක්ෂව සෘජු හා වක්‍ර විමෝචන තක්සේරු කිරීම.
- **සංක්‍රාන්ති සූදානම:** දේශගුණයට අදාළ අවදානම්, ප්‍රතිපත්ති වෙනස්කම් වලට අනුවර්තනය වීමේ සැලසුම් සහ අඩු කාබන් තාක්ෂණයන් හෝ භාවිතයන්හි ආයෝජන පිළිබඳ ණය ගැතියන්ගේ දැනුවත්භාවය ඇගයීම.
- **නියාමන නිරාවරණය:** විභව කාබන් මිලකරණය, විමෝචන ප්‍රමිතීන් හෝ අනාවරණය කිරීමේ අවශ්‍යතා සඳහා ණය ගැතියන්ගේ සංවේදීතාව විශ්ලේෂණය කිරීම.
- **වෙළෙඳපොල ස්ථානගත කිරීම:** වෙනස් වන ගනුදෙනුකාර මනාපයන් සහ තරඟකාරී ගතිකත්වයන් ණය ගැතියන්ගේ ශක්‍යතාවයට බලපාන ආකාරය සලකා බැලීම.

මෙම ව්‍යූහගත ඇගයීම තුළින්, දේශගුණික අවදානම පහත දෑ කෙරෙහි විශේෂ අවධානය සමඟ සම්ප්‍රදායික අවදානම් වර්ගීකරණ සමඟ ප්‍රමුඛ කෙරේ:

- **ණය අවදානම:** දේශගුණික සංවේදී අංශ සහ කලාපවල අවදානම හරහා
- **මෙහෙයුම් අවදානම:** ශාඛා, පද්ධති සහ කාර්ය මණ්ඩලයට සෘජු බලපෑම් හරහා
- **කීර්තිනාම අවදානම:** දේශගුණික සිදුවීම් සහ සංක්‍රාන්තිය සඳහා බැංකුවේ ප්‍රතිචාරය පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් හරහා
- **උපායමාර්ගික අවදානම:** මෙහෙයුම් පරිසරයේ සහ ගනුදෙනුකාර අපේක්ෂාවන්ගේ දිගුකාලීන මාරුවීම් හරහා

**දේශගුණික අවදානම් තක්සේරු කිරීමේ හැකියාවන් පරිණත වන බැවින් දිට්ඨා සුළි කුණාටුව වැනි සිදුවීම්වල අත්දැකීම් බලපෑම් මාර්ග පිළිබඳ අවබෝධය ලබා දෙන බැවින්, බැංකුවේ ප්‍රමුඛතා රාමුව අඛණ්ඩව විකාශනය වනු ඇත.**

**බැංකුවේ සංක්‍රාන්ති අවදානම් තක්සේරු කිරීමේ හැකියාවන් සංවර්ධනයේ මුල් අවධියේ පවතී. සංක්‍රාන්ති නිරාවරණයන් පිළිබඳ මූලික අවබෝධයක් ස්ථාපිත කිරීමට සහ අනාගත වාර්තාකරණ චක්‍රවල වඩාත් ක්‍රමානුකූල තක්සේරුවක් සඳහා රාමු සංවර්ධනය කිරීමට කටයුතු සිදු වෙමින් පවතී.**

### 3.6 වෙනත් අවදානම් වර්ගවලට සාපේක්ෂව දේශගුණික අවදානම ප්‍රමුඛ කිරීම

මූල්‍ය ස්ථාවරත්වය සහ මෙහෙයුම් ඔරොත්තු දීම සඳහා එහි වර්ධනීය වැදගත්කම හඳුනා ගනිමින්, බැංකුව දේශගුණික අවදානම එහි සමස්ත අවදානම් කළමනාකරණ රාමුවට ඒකාබද්ධ කරයි. දේශගුණික අවදානම් සම්පූර්ණයෙන්ම නව අවදානම් කාණ්ඩ නොවන බවත්, පවතින අවදානම් වර්ග, ණය අවදානම, මෙහෙයුම් අවදානම, කීර්තිනාම අවදානම සහ උපායමාර්ගික අවදානම උග්‍ර කරන බවත් අවබෝධ කර ගැනීමෙන් ප්‍රමුඛතාවය මෙහෙයවනු ලැබේ.

**අවදානම් ප්‍රමුඛකරණය සඳහා රාමුව:**

| මානය | ප්‍රතිඵලය | දේශගුණික අවදානමට යොදා ගැනීම |
|---|---|---|
| **විභව මූල්‍ය බලපෑම** | ලාභදායිතාවය, ප්‍රාග්ධන ප්‍රමාණතාව සහ වත්කම් ගුණාත්මකභාවය කෙරෙහි ඇති විය හැකි බලපෑම්වල විශාලත්වය | භෞතික සිදුවීම් සැලකිය යුතු හානි කිරීමේ ගාස්තු දිරිමත් කළ හැකිය, සංක්‍රාන්ති බලපෑම් දිගු කාලයක් පුරා එකතු විය හැකිය |
| **මෙහෙයුම් විවේචනාත්මකභාවය** | තීරණාත්මක මෙහෙයුම් හෝ සේවාවන් බිඳදැමියකළ හැකි මට්ටම | අහිතකර කාලගුණික සිදුවීම් ශාඛා මෙහෙයුම්, සේවා ලබා ගැනීමේ හැකියාව සහ ගනුදෙනුකාර ප්‍රවේශයට සෘජුවම බලපෑ හැකිය. |
| **උපායමාර්ගික පෙළගැස්ම** | බැංකුවේ උපායමාර්ගික අරමුණු සහ මහජන විධිනියෝගය සමඟ අනුකූල වීම | දේශගුණික ඔරොත්තු දීම දිගුකාලීන වටිනාකම් නිර්මාණය සහ තැන්පත්කරුවන්ගේ ආරක්ෂාව සඳහා අත්‍යවශ්‍ය වේ. |
| **ප්‍රකාශනයේ ප්‍රවේගය** | අවදානම ඇති විය හැකි සහ බැංකුවට බලපාන වේගය | භෞතික අවදානම් වේගයෙන් ඇති විය හැකිය, සංක්‍රාන්ති අවදානම් සාමාන්‍යයෙන් දිගු කාලයක් පුරා පරිණාමය වේ. |
| **පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන්** | නියාමන, ගනුදෙනුකාර සහ ආයෝජකයින් දේශගුණික අවදානම් කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කරයි | බැංකුවේ විධිනියෝගය අනුව නියාමකයින්, තැන්පත්කරුවන් සහ මහජනතාවගෙන් පරීක්ෂාව වැඩි කිරීම |
| **අන්තර් සම්බන්ධතාවය** | අනෙකුත් අවදානම් වර්ගීකරණ සමඟ සම්බන්ධතා සහ රැලී බලපෑම් සඳහා විභවය | දේශගුණික සිදුවීම් එකවර ණය, මෙහෙයුම් සහ කීර්තිනාම බලපෑම් ඇති කරයි. |

# SLFRS තිරසාරතාවයට අදාළ මූල්‍ය අනාවරණ (SLFRS S1 සහ SLFRS S2)

## 3.7 දේශගුණික අවදානම නියාමනය

දේශගුණික අවදානම් නිරීක්ෂණය කිරීම සඳහා බැංකුවේ ප්‍රවේශය පුළුල් දේශගුණික අවදානම් කළමනාකරණ රාමුවේ කොටසක් ලෙස සංවර්ධනය වෙමින් පවතී. නියාමනයට උපද්‍රව සිදුවීම්, ප්‍රතිපත්ති වර්ධනයන්, වෙළෙඳපොල ප්‍රවණතා සහ කළඹ සංකේන්ද්‍රණයන්, ගනුදෙනුකාර අවදානම, මෙහෙයුම් සූදානම වැනි අභ්‍යන්තර නිරාවරණයන් වැනි බාහිර පරිසරය යන දෙකම ඇතුළත් වේ.

### වර්තමාන නියාමන ව්‍යවහාර:

| නියාමන ක්ෂේත්‍රය | වර්තමාන ප්‍රවේශය | සංවර්ධන මාර්ගය |
|---|---|---|
| **අහිතකර කාලගුණික සිදුවීම්** | කාලගුණ විද්‍යාත්මක අනතුරු ඇඟවීම් සහ ආපදා ප්‍රකාශන නිරීක්ෂණය කිරීම, සිදුවීම් වලින් පසු බලපෑම් තක්සේරු කිරීම් | කළඹ නිරාවරණ දත්ත සමඟ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති ඒකාබද්ධ කිරීම |
| **ආංශික කාර්ය සාධනය** | දේශගුණික සංවේදී අංශ කෙරෙහි අවධානය සමඟ අංශයේ කාර්යසාධන දර්ශක නිතිපතා සමාලෝචනය කිරීම | අංශ විශේෂිත දේශගුණික අවදානම් දර්ශක සංවර්ධනය කිරීම |
| **නියාමන සංවර්ධනයන්** | මහ බැංකුවේ තිරසාර මූල්‍ය උපදෙස් සහ දේශගුණික ප්‍රතිපත්ති නිවේදන නියාමනය කිරීම | සංක්‍රාන්ති ආශ්‍රිත ප්‍රතිපත්ති වෙනස්වීම් සඳහා ක්‍රමානුකූල සීමා ස්කෑන් කිරීම |
| **කළඹ සංකේන්ද්‍රණ** | අංශ සහ භූගෝලීය සංකේන්ද්‍රණයන් පිළිබඳ කාර්තුමය සමාලෝචනය | සංකේන්ද්‍රණ නියාමනයේදී දේශගුණික අවදානම් ආවරණ ඒකාබද්ධ කිරීම |
| **ගනුදෙනුකාර අවදානම** | බලපෑමට ලක් වූ ගනුදෙනුකරුවන්, තාවකාලික සහභාගිත්වය පිළිබඳ පසු හඳුනා ගැනීම | ක්‍රමානුකූල ගනුදෙනුකාර මට්ටමේ අවදානම් තක්සේරුවක් සංවර්ධනය කිරීම |

**දේශගුණික අවදානම් නිරාවරණයන් වඩාත් සියුම් ලෙස නියාමනය කිරීමට සහාය වීම සඳහා දත්ත යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියක බැංකුව නිරතව සිටී. අනාගත වාර්තාකරණ චක්‍රවලදී වඩාත් සංකීර්ණ නියාමනයට ඉඩ සලසන භූගෝලීය දත්ත ග්‍රහණය කර ගැනීම සඳහා පද්ධති, අංශ වර්ගීකරණයන් සහ අවදානම් දර්ශක තුළ ආයෝජනය කිරීම මෙයට ඇතුළත් වේ.**

## 3.8 පූර්ව වාර්තාකරණ කාලසීමාවට සාපේක්ෂව දේශගුණික අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය තුළ වෙනස්වීම්

SLFRS S1 සහ S2 යටතේ බැංකුවේ පළමු වාර්තාකරණ චක්‍රය මෙය වන බැවින්, පෙර වාර්තාකරණ කාලපරිච්ඡේදය හා සසඳන විට වාර්තා කිරීමට කිසිදු වෙනසක් නොමැත. 2025 දී, දේශගුණික අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් ස්ථාපිත කිරීම සඳහා බැංකුව මූලික කටයුතු ආරම්භ කළේය. එයට පහත දෑ ඇතුළත්ය:

- SLFRS S2 සංක්‍රාන්ති සහන කාලසීමා සමඟ ගැලපෙල දේශගුණික අවදානම් ඒකාබද්ධ කිරීම සඳහා මාර්ග සිතියමක් සංවර්ධනය කිරීම.
- ආංශික නිරාවරණය, භූගෝලීය ප්‍රතිෂ්ඨාවන්, සහ දිට්වා සුළි කුණාටුවෙන් ලබාගත් පාඩම් මත පදනම්ව දේශගුණයට අදාළ අවදානම් මූලික වශයෙන් හඳුනා ගැනීම.
- පශ්චාත් දිට්වා සමාලෝචනය මගින් දැනුම් දෙන ලද ව්‍යාපාර අඛණ්ඩතා පෙරාතු ලෙඛණ වැඩි දියුණු කිරීම.
- අදාළ කාර්ය මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් හැකියා ගොඩ නැගීම.
- දේශගුණික දත්ත ශිල්පය හා තක්සේරු ක්‍රමවේද මත මූලික වැඩ.

**රාමු, දත්ත හැකියාවන් සහ ක්‍රමවේද පරිණත වන බැවින්, දේශගුණික අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන්හි ප්‍රගතිශීලී වැඩිදියුණු කිරීම් අනාගත වාර්තාකරණ චක්‍ර මගින් ලේඛනගත කරනු ඇත.**

## 3.9 දේශගුණිකව අදාළ අවස්ථා හඳුනාගැනීම, තක්සේරු කිරීම සහ නියාමනය සඳහා ක්‍රියාවලිය

දේශගුණයට අදාළ අවස්ථා හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ නියාමනය කිරීම සඳහා බැංකුව ක්‍රමානුකූල ප්‍රවේශයක් සේවයේ යොදවන අතර, මෙම අවස්ථා තිරසාර වටිනාකම් නිර්මාණය සහ උපායමාර්ගික ස්ථානගත කිරීම සඳහා අත්‍යවශ්‍ය බව හඳුනා ගනී.

### අවස්ථා හඳුනා ගැනීම:

දේශගුණයට අදාළ අවස්ථා පහත දෑ හරහා හඳුනා ගනී:

- **ජාතික ප්‍රතිපත්ති නියාමනය:** ශ්‍රී ලංකාව ජාතික වශයෙන් තීරණය කළ දායකත්වයන්, මහ බැංකුවේ තිරසාර මූල්‍ය නියෝග සහ ජාතික අනුවර්තන සැලසුම් මගින් දක්වන ලද දිරිගැන්වීම් හා ප්‍රමුඛතා හඹායාම.
- **වෙළඳපල නිරීක්ෂණය:** දේශගුණික අනුවර්තනයට අදාළ දේශගුණිකව ඔරොත්තු දෙන නිෂ්පාදන, තිරසාර මූල්‍ය විසඳුම් සහ උපදේශන සේවා සඳහා නැගී එන ගනුදෙනුකාර අවශ්‍යතා හඳුනා ගැනීම.
- **පාර්ශවකාර සහභාගිත්වය:** දේශගුණයට අදාළ අභියෝග සහ අවශ්‍යතා පිළිබඳව ගනුදෙනුකාරුවන්, ප්‍රජාවන්, සහ සංවර්ධන හවුල්කරුවන් සමඟ සංවාදය
- **සිදුවීම් වලින් පසු ඉගෙනීම:** දිට්වා සුළි කුණාටුව වැනි දේශගුණික සිදුවීම් සමඟ අත්දැකීම් මත පදනම්ව නිෂ්පාදන සහ ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීමට අවස්ථා හඳුනා ගැනීම.

### අවස්ථා තක්සේරුව:

හඳුනාගත් අවස්ථා පහත දෑ ඇතුළු නිර්ණායන අනුව තක්සේරු කෙරේ:

- **උපායමාර්ගික පෙළගැස්ම:** බැංකුවේ විධිනියෝගය, උපායමාර්ගික අරමුණු සහ අවදානම් රුචිය සමඟ අනුකූල වීම
- **වෙළෙඳපොල විභවතාව:** ගනුදෙනුකාර ඉල්ලුමේ සහ වර්ධන අපේක්ෂාවල පරිමාණය
- **අවදානම්-ප්‍රතිලාභ පැතිකඩ:** අපේක්ෂිත මූල්‍ය කාර්යසාධනය සහ කළඹේ ගුණාත්මකභාවය සඳහා දායකත්වය
| | **චක්‍ර ක්‍රියාමාර්ග**<br>දත්ත සහ විශ්ලේෂණ: බාහිර දේශගුණික දත්ත ඒකාබද්ධ කිරීම හරහා, ණයගැති සහ ආයෝජන කළඹ (Portfolio) මට්ටමින් දේශගුණික අවදානම් තක්සේරු කිරීමේ හැකියාවන් වර්ධනය කිරීම සහ එමඟින් කළමනාකරණ ආවරණ (Overlay) සැලසුම් කිරීම සහ පිරිපහදු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීම.<br>දැනුම නුවමාරු කර ගැනීම: හොඳම භාවිතයන් (Best practices) හඳුනා ගැනීමට සහ දේශගුණික මූල්‍යකරණ ක්‍රමවේදයන් සංවර්ධනය කිරීමට දායක වීම සඳහා දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන මූල්‍ය ක්ෂේත්‍රයේ කර්මාන්ත සංසද (නිදසුනක් ලෙස: තිරසාර බැංකුකරණ මූලපිරීම් – Sustainable Banking Initiatives, කලාපීය දැනුම බෙදාගැනීමේ වේදිකාවන්) සමඟ සම්බන්ධ වීම.<br>හවුල්කාරිත්වයන් ගොඩනැඟීම: ප්‍රත්‍යස්ථතා තක්සේරු කිරීමේ ක්‍රමවේදයන් (Resilience assessment methodologies) සහ උපදේශන සම්පත් සංවර්ධනය කිරීම සඳහා තාක්ෂණික ආයතන (මධ්‍යම පරිසර අධිකාරිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ලංකා වැසි ජලය රැස් කරන්නන්ගේ සංසදය), පර්යේෂණ ආයතන සහ සංවර්ධන හවුල්කරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම. |
| **බැංකුව විසින් ක්‍රියාකාරකම් සඳහා සම්පත් වෙන් කරන ආකාරය සහ සැලසුම් කර ඇති ආකාරය** | **මානව ප්‍රාග්ධන සංවර්ධනය:** දේශගුණික අවදානම් තක්සේරු කිරීම, ප්‍රත්‍යස්ථතා ලක්ෂණ සහ කළමනාකරණ ආවරණ භාවිතය පිළිබඳව ණය නිලධාරීන් පුහුණු කිරීම. 2026-2027 වන විට ඉලක්කගත පුහුණු කිරීම් ඉහළ නැංවීම.<br>**ක්‍රමවේද සංවර්ධනය:** කළමනාකරණ ආවරණ රාමු (Overlay frameworks), අවදානම් ලකුණු කිරීමේ ක්‍රමවේද (Risk scoring methodologies) සහ නිෂ්පාදන සැලසුම්කරණය සඳහා සම්පත් වෙන් කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී ඒ සඳහා බාහිර තාක්ෂණික දායකත්වය ලබා ගැනීම.<br>**දත්ත සහ විශ්ලේෂණ:** ආපදා දත්ත ඒකාබද්ධ කිරීම සහ අවදානම් ලකුණු කිරීමේ ආකෘති (Scoring models) ඇතුළුව, ණයගැති සහ ආයෝජන කළඹ මට්ටමින් දේශගුණික අවදානම් තක්සේරු කිරීමට සහාය වීම සඳහා දත්ත හැකියාවන් වෙනුවෙන් ආයෝජනය කිරීම.<br>**තාක්ෂණික ඒකාබද්ධතාවය:** කළමනාකරණ ආවරණ තක්සේරු කිරීම් ඇතුළත් කිරීමට, අදාළ දත්ත ක්ෂේත්‍ර ලබා ගැනීමට සහ තීරණ ගැනීම සඳහා අවදානම් ලකුණු (Risk scores) ජනනය කිරීමට හැකි වන පරිදි ණය සම්පාදන පද්ධති (Credit origination systems) වැඩිදියුණු කිරීම.<br>**හවුල්කාරිත්වයන් ගොඩනැඟීම:** අවබෝධතා ගිවිසුම් (MOUs) සහ ඒකාබද්ධ මූලපිරීම් හරහා උපදේශන සහාය සහ ක්‍රමවේද වලංගුභාවය (Methodology validation) ලබා ගැනීම සඳහා තාක්ෂණික හවුල්කරුවන් සමඟ සබඳතා ගොඩනැඟීම. |
| **සැලසුම් සහ මූලපිරීම්වල ප්‍රගතිය** | **නියමු සැලසුම්කරණය:** 2026 වසරේදී කළමනාකරණ ආවරණ භාවිතය පරීක්ෂා කිරීම සඳහා තෝරාගත් අධි-අවදානම් සහිත අංශ හෝ කලාප සඳහා නියමු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම පිළිබඳව සලකා බලමින් පවතී.<br>**දත්ත ඇගයීම:** කළමනාකරණ ආවරණ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දත්ත සහ ඒවායේ පවතින බව පිළිබඳ මූලික ඇගයීම අවසන් කර ඇති අතර, ප්‍රතිකර්ම යෙදිය යුතු ප්‍රමුඛ දත්ත හිඩැස් හඳුනා ගැනීමේ කටයුතු දැනට සිදු වෙමින් පවතී.<br>**නිෂ්පාදන සංකල්ප:** සූර්ය බලශක්ති මූල්‍යකරණය සහ දේශගුණික හිතකාමී කෘෂිකාර්මික ණය පහසුකම් ඇතුළුව, තවදුරටත් ඇගයීමට ලක් කිරීම සඳහා ප්‍රත්‍යස්ථතාව මත පදනම් වූ (Resilience-linked) නිෂ්පාදන පිළිබඳ මූලික සංකල්ප සකස් කර ඇත.<br>**හවුල්කාරිත්ව සාකච්ඡා:** ප්‍රත්‍යස්ථතා තක්සේරු කිරීමේ ක්‍රමවේදයන් සම්බන්ධයෙන් විභව තාක්ෂණික හවුල්කරුවන් සමඟ ගවේෂණාත්මක සාකච්ඡා ආරම්භ කර ඇත. |
| **ලාභ හෝ අලාභ ප්‍රකාශය (P&L) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (SOFP) සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය (CF) වෙත වත්මන් වර්ෂයේ මූල්‍ය බලපෑම්** | 2025 වර්ෂය තුළදී ප්‍රත්‍යස්ථතාව මත පදනම් වූ (Resilience-aligned) නිෂ්පාදන හෝ ඇගයීම් ආවරණ (Appraisal overlays) මඟින් සිදු වූ ද්‍රව්‍යමය මූල්‍ය බලපෑමක් හඳුනාගෙන නොමැත. |
| **මීළඟ වාර්ෂික වාර්තාකරණ කාල සීමාව තුළ සැලකිය යුතු මට්ටමේ ගැලපීම් සිදු වීමේ අවදානම** | මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති වත්කම් සහ වගකීම්වල ශේෂිත අගයන් (Carrying amounts) සම්බන්ධයෙන්, මීළඟ වාර්ෂික වාර්තාකරණ කාලසීමාව තුළ ප්‍රමාණාත්මක ගැලපීමක් (Material adjustment) සිදු වීමේ සැලකිය යුතු අවදානමක් නොමැත. කළමනාකරණ ආවරණ රාමු සහ නිෂ්පාදන සංවර්ධනයන්, නිසි වලංගුකරණයන් සහිතව ක්‍රමිකව ක්‍රියාත්මක කරනු ලැබේ. |
| **කෙටි, මධ්‍යම සහ දිගු කාලීනව P&L, SOFP සහ CF වෙත අපේක්ෂිත මූල්‍ය බලපෑම්** | සංක්‍රාන්ති සහන ක්‍රියාත්මක කෙරේ. ඉහත වත්මන් හා අපේක්ෂිත ප්‍රතිඵල අංශයේ ගුණාත්මක දිශාත්මක බලපෑම් අනාවරණය කෙරේ.<br>186 වන පිටුවේ සටහන 1.7 වෙත යොමු වන්න. |
| **දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව** | සංක්‍රාන්ති සහන යොදා ගන්නා ලදී. SLFRS S2 සංක්‍රාන්ති සහන විධිවිධානවලට අනුකූලව දේශගුණික ප්‍රත්‍යස්ථතා අනාවරණයන් කල් දමන ලදී.<br>186 පිටුවේ 1.7 සටහන බලන්න. |
| **වැදගත් විනිශ්චයන් සහ අවිනිශ්චිතතාවන්** | ණයගැතියන්ගේ අවදානම් සහගත බව (Vulnerability) පුරෝකථනය කිරීමේදී ප්‍රත්‍යස්ථතා ආවරණවල (Resilience overlays) සඵලතාවය රඳා පවතින්නේ දේශගුණික දත්තවල ගුණාත්මකභාවය සහ අවදානම් ලකුණු කිරීමේ ක්‍රමවේදවල නිරවද්‍යතාවය මත වන අතර, මේවා තවමත් සංවර්ධනය වෙමින් පවතින අදියරක පවතී. ප්‍රත්‍යස්ථතා නිෂ්පාදන (Resilience products) සඳහා වන ණයගැති උනන්දුව සහ මිල දිරිගැන්වීම් (Pricing incentives) කෙරෙහි දක්වන ප්‍රතිචාරය අවිනිශ්චිතය. විවිධාංගීකරණය කළ මිලකරණයන්හි (Differentiated pricing) පිරිවැය-ප්‍රතිලාභ අතර පවතින සැසඳීම අත්දැකීම් මඟින් තහවුරු කළ යුතුව ඇත. මහා පරිමාණයෙන් දේපළ ප්‍රත්‍යස්ථතා පරීක්ෂාවන් සිදු කිරීමේ තාක්ෂණික ශක්‍යතාවය රඳා පවතින්නේ තක්සේරුකරුවන්ගේ පවතින බව සහ ප්‍රමිතියෙන් යුත් නිර්ණායක මතය. ආයෝජන කළඹෙහි ගුණාත්මකභාවය සම්බන්ධයෙන් ලැබෙන දිගුකාලීන ප්‍රතිලාභ නිරීක්ෂණය කළ හැක්කේ දේශගුණික සිදුවීම් සහ ආර්ථික චක්‍ර කිහිපයක් හරහා පමණි. |

## SLFRS තිරසාරතාවයට අදාළ මූල්‍ය අනාවරණ (SLFRS S1 සහ SLFRS S2)

### CRO 3 වැඩිදියුණු කළ දේශගුණික දත්ත සහ අවස්ථා හැකියාව හරහා වැඩිදියුණු කළ අවදානම් මිලකරණය සහ කළඹ මෙහෙයවීම.

| | |
|---|---|
| **විස්තරය** | වැඩිදියුණු කරන ලද දේශගුණික දත්ත හැකියාවන් සහ අවස්ථානුකූල විශ්ලේෂණයන් (Scenario analysis) මඟින් වඩාත් දැනුවත් අවදානම් මිලකරණය (Risk pricing), ආයෝජන කළඹ මෙහෙයවීම (Portfolio steering) සහ උපායමාර්ගික තීරණ ගැනීම සඳහා අවස්ථාව සලසා දෙයි. මෙම හැකියාවන් නියාමන අනුකූලතාවය (Regulatory compliance) සඳහා සහාය වන අතර, විවිධ අංශ සහ කලාප හරහා අවදානම් වෙන් කර හඳුනා ගැනීමටත්, දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන මූල්‍ය ක්ෂේත්‍රයේ නැඟී එන අවස්ථාවන් සඳහා බැංකුව ස්ථානගත කිරීමටත් උපකාරී වේ. බැංකුවේ SLFRS S2 සූදානම් වීමේ ගමන්මග, සංක්‍රාන්ති සහන කාල සීමාව තුළ (Transition relief period) මෙම හැකියාවන් වර්ධනය කර ගැනීම සඳහා පදනම සපයනු ලබයි. |
| **භෞතික/සංක්‍රාන්ති අවදානම** | දේශගුණික අවස්ථාව |
| **කාල සීමාව** | මධ්‍යම සහ දිගු කාලීන |
| **කාල පරාසය අර්ථ දැක්වීම** | 185 පිටුවේ, 1.6 කොටසේ ඇති "කාල පරාසය අර්ථ දැක්වීමේ පදනම" බලන්න. |
| **බැංකුවේ ව්‍යාපාරික ආකෘතිය සහ අගය දාමය මත වත්මන් සහ අපේක්ෂිත බලපෑම්** | **වත්මන් බලපෑම**<br>SLFRS S2 අවශ්‍යතාවලට සූදානම් වීමක් වශයෙන් දේශගුණික දත්ත ව්‍යුහය (Data architecture) සහ අවස්ථානුකූල විශ්ලේෂණ හැකියාවන් පිළිබඳ මූලික කටයුතු ආරම්භ කර ඇත. දත්ත හිඩැස් සහ සංවර්ධන අවශ්‍යතා පිළිබඳ වැඩිදියුණු කළ අවබෝධය, මාර්ග සිතියම් සැලසුම්කරණය (Roadmap planning) සඳහා තොරතුරු සපයයි. අභ්‍යන්තර දත්තවල පවතින බව සහ බාහිර දත්ත මූලාශ්‍ර පිළිබඳ මූලික ඇගයීම් දැනට සිදු වෙමින් පවතී.<br>**අපේක්ෂිත බලපෑම**<br>දේශගුණික දත්ත හැකියාවන් ක්‍රමිකව වැඩිදියුණු කිරීම මඟින් කාලයත් සමඟ වඩාත් සියුම් අවදානම් තක්සේරු කිරීම් සහ මිලකරණ විවිධාංගීකරණයන් සඳහා අවස්ථාව සැලසේ. අවස්ථානුකූල විශ්ලේෂණයන් මඟින් ලබා දෙන ප්‍රමාණාත්මක තීක්ෂ්ණ බුද්ධිය, උපායමාර්ගික සැලසුම්කරණය, ප්‍රාග්ධන වෙන් කිරීම සහ අවදානම් රැචිය කෙරෙහි බලපෑමක් ඇති කරයි. ආයෝජන කළඹ මෙහෙයුම් (Portfolio steering) මඟින් අවදානම් සංකේන්ද්‍රණය වීම (Concentration risks) අවම කරන අතර ඔරොත්තු දෙන අංශවල (Resilient sectors) නැඟී එන අවස්ථා හඳුනා ගැනීමට සහාය වේ. වැඩිදියුණු කළ කළමනාකරණ තොරතුරු, දේශගුණික කරුණු ඒකාබද්ධ කළ වාර්තාකරණය හරහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ කමිටුවල තීරණ ගැනීම් සඳහා සහාය වේ. පියවරෙන් පියවර සිදු කරන හැකියාවන් වර්ධනය කිරීම හරහා, විකාශනය වන හෙළිදරව් කිරීමේ අවශ්‍යතා සඳහා වන නියාමන අනුකූලතාවය තහවුරු වේ. දේශගුණික අවදානම් කළමනාකරණ හැකියාවන් ප්‍රදර්ශනය කිරීම හරහා වෙළඳපල ස්ථානගත වීම ශක්තිමත් වන අතර, එය ආයෝජක විශ්වාසය සහ පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය තහවුරු කිරීමට දායක වේ.<br>**බලපෑමට ලක්වන ක්ෂේත්‍ර/එය සංකේන්ද්‍රණය වී ඇත්තේ කොතැනද?**<br>**අවදානම් කළමනාකරණය**<br>වැඩිදියුණු කළ දත්ත සහ විශ්ලේෂණ මඟින් සියලුම දේශගුණික අවදානම් කාණ්ඩ (භෞතික, සංක්‍රාන්ති සහ කීර්තිනාම) හරහා අවදානම් හඳුනා ගැනීම, මැනීම සහ නිරීක්ෂණය කිරීම විධිමත් කරයි.<br>**උපායමාර්ගික සැලසුම්කරණය**<br>ව්‍යුහගත "කුමක් සිදු වේද" (what-if) විශ්ලේෂණයන් හරහා, දිගුකාලීන උපායමාර්ගික සැලසුම්කරණය, ප්‍රාග්ධන සැලසුම්කරණය සහ ව්‍යාපාරික ආකෘතියේ ප්‍රත්‍යස්ථතාව තක්සේරු කිරීම සඳහා අවස්ථානුකූල විශ්ලේෂණයන් මඟින් තොරතුරු සපයයි.<br>**මිලකරණය සහ රක්ෂණ ප්‍රතිග්‍රහණය**<br>දේශගුණික තත්ත්වයන්ට අනුව ගැලපූ අවදානම් ශ්‍රේණිගත කිරීම් හරහා වඩාත් නිවැරදි අවදානම් විභේදනයක් සිදු කිරීමටත්, එමඟින් වඩාත් නිරවද්‍ය මිලකරණය සහ අවදානම්-ප්‍රතිලාභ තීරණ ගැනීමටත් අවස්ථාව සැලසේ.<br>**ආයෝජන කළඹ කළමනාකරණය**<br>වැඩිදියුණු කළ මෙහෙයුම් හැකියාවන් මඟින් අවදානම් සංකේන්ද්‍රණය වීම ක්‍රියාකාරීව කළමනාකරණය කිරීමටත්, ප්‍රත්‍යස්ථ අංශ සහ කොටස් වෙත උපායමාර්ගිකව සම්පත් වෙන් කිරීමටත් ඉඩ සලසයි.<br>**හෙළිදරව් කිරීම සහ වාර්තාකරණය**<br>ගවැඩිදියුණු කළ දත්ත හැකියාවන් හරහා SLFRS S2 ප්‍රමිතීන්ට අනුකූලව විනිවිදභාවයකින් යුත් සහ තීරණ ගැනීමට උපකාරී වන හෙළිදරව් කිරීම් මඟින් නියාමන අනුකූලතාවය සහ පාර්ශ්වකරුවන්ගේ සන්නිවේදනය ශක්තිමත් කරයි. |
| **උපායමාර්ගය සහ තීරණ ගැනීමේදී CROs සඳහා බැංකුවේ ප්‍රතිචාරය** | **ඍජු ක්‍රියාමාර්ග**<br>**දත්ත යටිතල පහසුකම් සංවර්ධනය**<br>දේශගුණික දත්ත ව්‍යුහය: භූගෝලීය දත්ත (දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටම), අංශ වර්ගීකරණයන් සහ අවදානම් ප්‍රමිතික (ආපදා නිරාවරණ ලකුණු, කාබන් තීව්‍රතා ප්‍රතියෝජක – (carbon intensity proxies) ඇතුළුව ණයගැති, අංශ සහ ආයෝජන කළඹ මට්ටමින් දේශගුණික තොරතුරු රැස් කිරීමට, වලංගු කිරීමට සහ විශ්ලේෂණය කිරීමට අවශ්‍ය දත්ත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.<br>**අවස්ථානුකූල විශ්ලේෂණ හැකියාව**<br>අවස්ථානුකූල විශ්ලේෂණ ඒකාබද්ධතාවය: දේශගුණික අවස්ථානුකූල විශ්ලේෂණයන් සිදු කිරීමේ හැකියාවන් ගොඩනැගීම සහ එම ප්‍රතිඵල උපායමාර්ගික සැලසුම්කරණය, ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය ඇගයීමේ ක්‍රියාවලිය (ICAAP) සහ අවදානම් රැචිය නිර්ණය කිරීම සඳහා ඒකාබද්ධ කිරීම. මෙය සංක්‍රාන්ති සහන කාලරාමුවට අනුකූලව අදියර වශයෙන් ක්‍රියාත්මක කෙරේ.<br>ආකෘති පාලනය සහ වලංගුකරණය (Model governance and validation): ස්වාධීන වලංගුකරණ ප්‍රොටෝකෝල සහිතව, දේශගුණික අවදානම් ආකෘතිවල ශක්තිමත් සංවර්ධනය, වලංගුකරණය සහ භාවිතය තහවුරු කිරීම සඳහා ආකෘති පාලන රාමු ශක්තිමත් කිරීම.<br>**ආයෝජන කළඹ කළමනාකරණය ඉහළ නැංවීම**<br>ආයෝජන කළඹ මෙහෙයවීමේ සීමාවන්/ඉලක්ක: වැඩිදියුණු කළ දත්ත සහ විශ්ලේෂණවල සහාය ඇතිව, දේශගුණික බලපෑම්වලට සංවේදී නිරාවරණයන් සඳහා සීමාවන් සහ ඉලක්ක සහිත ආයෝජන කළඹ මෙහෙයවීමේ රාමු ස්ථාපිත කිරීම. මෙය ණය සාන්ද්‍රණ අවදානම් රාමුව සමඟ ඒකාබද්ධ කිරීම.<br>කළමනාකරණ තොරතුරු පුවරු: කමිටු සහ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා සඳහා දේශගුණික අවදානම් නිරාවරණයන්, ආයෝජන කළඹ ප්‍රවණතා සහ නැඟී එන ගැටලු නිරීක්ෂණය කිරීමට කළමනාකරණ තොරතුරු පුවරු සංවර්ධනය කිරීම. |

# SLFRS තිරසාරතාවයට අදාළ මූල්‍ය අනාවරණ (SLFRS S1 සහ SLFRS S2)

| | |
|---|---|
| | **චක්‍ර ක්‍රියාමාර්ග**<br>ක්ෂේත්‍ර සහයෝගිතාවය: දේශගුණික දත්ත ප්‍රමිතීන්, අවස්ථානුකූල විශ්ලේෂණ ක්‍රමවේද සහ හොඳම භාවිතයන් සංවර්ධනය කිරීම සම්බන්ධ ක්ෂේත්‍ර මූලපිරීම් සඳහා සහභාගී වීම (නිදසුනක් ලෙස: තිරසාර බැංකුකරණ මූලපිරීම් – Sustainable Banking Initiatives සහ කලාපීය ක්‍රියාකාරී කණ්ඩායම්).<br>ධාරිතා වර්ධනය: පුහුණු කිරීම් සහ ඉලක්කගත බඳවා ගැනීම් හරහා දේශගුණික විශ්ලේෂණ, අවස්ථානුකූල ආකෘතිකරණය (Scenario modelling) සහ දත්ත කළමනාකරණය පිළිබඳ අභ්‍යන්තර විශේෂඥතාව ඉහළ නැංවීම.<br>තාක්ෂණික හවුල්කාරිත්වයන්: හැකියාවන් වර්ධනය කිරීම වේගවත් කිරීමට සහ විශේෂඥ දැනුම ලබා ගැනීම සඳහා තාක්ෂණික සේවා සපයන්නන්, දත්ත විකුණුම්කරුවන් සහ පර්යේෂණ ආයතන සමඟ හවුල්කාරිත්වයන් ඇති කර ගැනීම පිළිබඳ ගවේෂණය කිරීම. |
| **බැංකුව විසින් ක්‍රියාකාරකම් සඳහා සම්පත් වෙන් කරන ආකාරය සහ සැලසුම් කර ඇති ආකාරය** | **මානව ප්‍රාග්ධන සංවර්ධනය:** විශේෂිත පුහුණු වැඩසටහන් හරහා දේශගුණික විශ්ලේෂණ, අවස්ථානුකූල ආකෘතිකරණය සහ දත්ත කළමනාකරණය පිළිබඳ අභ්‍යන්තර විශේෂඥතාව ගොඩනැගීම.<br>**තාක්ෂණික ආයෝජන:** දේශගුණික අවදානම් කළමනාකරණයට සහාය වීම සඳහා දත්ත යටිතල පහසුකම්, විශ්ලේෂණ වේදිකාවන් සහ වාර්තාකරණ මෙවලම් වෙනුවෙන් සම්පත් වෙන් කිරීම.<br>**දත්ත ලබා ගැනීම:** අවදානම් තක්සේරු කිරීම් සඳහා තොරතුරු ලබා ගැනීමට බාහිර දේශගුණික දත්ත සේවා, ආපදා සිතියම්කරණය (Hazard mapping) සහ අංශ පිළිබඳ පර්යේෂණ (Sectoral research) සඳහා අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම.<br>**ආකෘති සංවර්ධනය:** අවස්ථානුකූල ආකෘති සංවර්ධනය, වලංගුකරණය සහ ඒවා පවතින අවදානම් රාමු සමඟ ඒකාබද්ධ කිරීම සඳහා අවශ්‍ය සම්පත් වෙන් කිරීම.<br>**පාලන පද්ධතිය ඉහළ නැංවීම:** අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය හරහා වැඩිදියුණු කළ දේශගුණික අවදානම් අධීක්ෂණයට සහාය වීම සඳහා කමිටු ව්‍යුහයන් සහ වාර්තාකරණ ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම. |
| **සැලසුම් සහ මූලපිරීම්වල ප්‍රගතිය** | **මාර්ග සිතියම් සංවර්ධනය:** SLFRS S2 සංක්‍රාන්ති සහන කාලරාමුවට (2025-2027) අනුකූලව, දේශගුණික දත්ත සහ අවස්ථානුකූල විශ්ලේෂණ හැකියාවන් සඳහා වන මූලික මාර්ග සිතියම සකස් කර ඇත. දත්ත ලබා ගැනීම (2026), අවස්ථානුකූල විශ්ලේෂණ රාමු සංවර්ධනය (2026-2027) සහ නියමු ක්‍රියාත්මක කිරීම (2027) සඳහා වන ප්‍රධාන සන්ධිස්ථාන මෙහිදී නිර්වචනය කර ඇත.<br>**දත්ත ඇගයීම:** අභ්‍යන්තර දත්තවල පවතින බව සහ බාහිර දත්ත මූලාශ්‍ර පිළිබඳ මූලික ඇගයීම් දැනට සිදු වෙමින් පවතින අතර, භූගෝලීය ටැග් කිරීම් (Geographic tagging), අංශ වර්ගීකරණය සහ ඓතිහාසික ආපදා දත්තවල පවතින ප්‍රමුඛ දත්ත හිඩැස් හඳුනා ගනිමින් පවතී.<br>**අවස්ථානුකූල සැලසුම්කරණය:** අවස්ථානුකූල විශ්ලේෂණ ක්‍රමවේදයන් තෝරා ගැනීම පිළිබඳ මූලික කටයුතු ආරම්භ කර ඇත. ශ්‍රී ලංකාවට අදාළ දේශගුණික තත්ත්වයන් (භෞතික අවදානම් මාර්ග සහ සංක්‍රාන්ති ප්‍රතිපත්ති ගමන් පථයන්) ඇගයීමට ලක් කිරීම දැනට සිදු වෙමින් පවතී.<br>**පුහුණු කිරීම්:** අවදානම් සහ මූල්‍ය අංශවල නිලධාරීන් දේශගුණික අවස්ථානුකූල විශ්ලේෂණ පිළිබඳ දැනුවත් කිරීමේ සැසි සඳහා සහභාගී වූ අතර, උසස් පුහුණු වැඩසටහන් 2026 වසර සඳහා සැලසුම් කර ඇත.<br>**පාලනය:** දේශගුණික අවදානම් වාර්තාකරණය කාර්තුමය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු යාවත්කාලීනයන් සඳහා ඒකාබද්ධ කර ඇති අතර, වැඩිදියුණු කළ තොරතුරු පුවරු දැනට සංවර්ධනය වෙමින් පවතී. |
| **ලාභ හෝ අලාභ ප්‍රකාශය (P&L) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (SOFP) සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය (CF) වෙත වත්මන් වර්ෂයේ මූල්‍ය බලපෑම්** | වැඩිදියුණු කරන ලද දේශගුණික දත්ත සහ අවස්ථානුකූල විශ්ලේෂණ හැකියාවන්ගෙන් සිදු වූ ප්‍රමාණාත්මක මූල්‍ය බලපෑමක් 2025 වර්ෂය තුළදී හඳුනාගෙන නොමැත. සංවර්ධන සහ දත්ත ලබා ගැනීමේ පිරිවැය (Data acquisition costs) ඒවා සිදු වූ අවස්ථාවේදීම වියදම් ලෙස හඳුනාගෙන ඇති අතර (Expensed as incurred), ඒවා ප්‍රමාණාත්මක නොවේ. |
| **මීළඟ වාර්ෂික වාර්තාකරණ කාල සීමාව තුළ සැලකිය යුතු මට්ටමේ ගැලපීම් සිදු වීමේ අවදානම** | මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති වත්කම් සහ වගකීම්වල ශේෂිත අගයන් සම්බන්ධයෙන්, මීළඟ වාර්ෂික වාර්තාකරණ කාලසීමාව තුළ ප්‍රමාණාත්මක ගැලපීමක් සිදු වීමේ සැලකිය යුතු අවදානමක් නොමැත. හැකියාවන් වර්ධනය කිරීම ක්‍රමිකව සිදු වන්නක් වන අතර, එය වත්කම් තක්සේරු කිරීම් කෙරෙහි සෘජුව බලපානු නොලබයි. |
| **කෙටි, මධ්‍යම සහ දිගු කාලීනව P&L, SOFP සහ CF වෙත අපේක්ෂිත මූල්‍ය බලපෑම්** | සංක්‍රාන්ති සහන ක්‍රියාත්මක කෙරේ. ඉහත වත්මන් හා අපේක්ෂිත ප්‍රතිඵල අංශයේ ගුණාත්මක දිශාත්මක බලපෑම් අනාවරණය කෙරේ. 186 වන පිටුවේ සටහන 1.7 වෙත යොමු වන්න. |
| **දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව** | සංක්‍රාන්ති සහන භාවිත කර ඇත. SLFRS S2 සංක්‍රාන්ති සහන විධිවිධානවලට අනුකූලව, දේශගුණික ප්‍රත්‍යස්ථතා හෙළිදරව් කිරීම් කල් තබා ඇත. ප්‍රමාණාත්මක අවස්ථානුකූල විශ්ලේෂණ ප්‍රතිඵල, සංක්‍රාන්ති සහන කාලසීමාවෙන් පසුව හෙළිදරව් කරනු ලැබේ. 186 පිටුවේ ඇති 1.7 සටහන බලන්න. |
| **වැදගත් විනිශ්චයන් සහ අවිනිශ්චිතතාවන** | දේශගුණික දත්ත සහ අවස්ථානුකූල විශ්ලේෂණ හැකියාවන් වර්ධනය කිරීම සඳහා සැලකිය යුතු ආයෝජනයක් සහ තාක්ෂණික විශේෂඥතාවක් අවශ්‍ය වන අතර, අපේක්ෂිත පරිණත මට්ටම් කරා ළඟා වීම සඳහා ගතවන කාලරාමුව අවිනිශ්චිතය. ශ්‍රී ලංකාව සම්බන්ධ බාහිර දේශගුණික දත්තවල ගුණාත්මකභාවය සහ සියුම් බව සීමිත විය හැකි බැවින්, දේශීයව අදාළ කර ගැනීමේ සීමාවන්ට යටත්ව ගෝලීය දත්ත කට්ටල මත රඳා පැවතීමට සිදු විය හැක. අවස්ථානුකූල විශ්ලේෂණයන් තුළ, ප්‍රතිපත්තිමය මාර්ග, තාක්ෂණික සංවර්ධනය සහ දේශගුණික පද්ධතිවල ප්‍රතිචාර පිළිබඳ උපකල්පනයන්හි සහජ අවිනිශ්චිතතාවන් පවතී. දේශගුණික අවදානම් සඳහා වන ආකෘති වලංගුකරණය සහ පාලන රාමු ගෝලීය වශයෙන් තවමත් විකාශනය වෙමින් පවතින අතර, දේශීය සන්දර්භය සඳහා ස්ථාපිත භාවිතයන් පවතින්නේ සීමිත වශයෙනි. මිලකරණය සහ ආයෝජන කළඹ තීරණ සඳහා දේශගුණික කරුණු සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ කිරීමට බැංකුවට ඇති හැකියාව, පුළුල් වෙළඳපල පිළිගැනීම සහ නියාමන මගපෙන්වීම් මත රඳා පවතී. |

## SLFRS තිරසාරතාවයට අදාළ මූල්‍ය අනාවරණ (SLFRS S1 සහ SLFRS S2)

# 5 ප්‍රමිති සහ ඉලක්ක

තිරසාරත්වය පිළිබඳ කරුණු වාචික අවබෝධයකින් ඔබ්බට ගොස් විනයානුකූල කළමනාකරණ ක්‍රියාවලියක් දක්වා පරිවර්තනය කිරීම සඳහා ප්‍රමිතික සහ ඉලක්ක අත්‍යවශ්‍ය බව NSB බැංකුව පිළිගනී. ඒ අතරම, දුර්වල ගුණාත්මකභාවයකින් යුත් ප්‍රමිතික මඟින් බැංකුවේ පරිණතභාවය පිළිබඳ වැරදි අවබෝධයක් ඇති කළ හැකි බව ද බැංකුව හඳුනා ගනී. එම හේතුව නිසා, බැංකුවේ 2025 ප්‍රවේශය විනිවිදභාවය සහ සුපරීක්ෂාකාරී බව අතර සමතුලිතතාවයක් පවත්වා ගනී: එනම් දැනට විශ්වාසදායී ලෙස මැනිය හැකි දෑ හෙළිදරව් කිරීම, මූලික මට්ටමේ (Baseline) වැඩකටයුතු තවමත් සිදුවෙමින් පවතින අංශ හඳුනා ගැනීම සහ වැඩිදියුණු කිරීම සඳහා පැහැදිලි මාර්ග සිතියමක් සකස් කිරීමයි.

## 5.1 ප්‍රමිති සඳහා කළමනාකරණ ප්‍රවේශය

ප්‍රමිති යනු අදාළ මෙන්ම පාලනය කළ හැකි ඒවා විය යුතු බව බැංකුව පිළිගනී. සංකල්පීය වශයෙන් ආකර්ෂණීය වුවද, වගකීම පැවරීම දුෂ්කර, සාක්ෂි සහිතව ඔප්පු කිරීමට අපහසු හෝ වාර්තාකරණ චක්‍රයන් හරහා අනුකූලතාවයක් නොමැති ප්‍රමිතිකයකින් තීරණ ගැනීමේදී ලැබෙන ප්‍රයෝජනය සීමිතය. එබැවින් කළමනාකරණ ක්‍රියාමාර්ග, කමිටු අධීක්ෂණය සහ අභ්‍යන්තර විගවීම සමඟ සම්බන්ධ කළ හැකි මිනුම් දඬුවලට NSB ප්‍රමුඛතාවය ලබා දෙයි. සම්පූර්ණ බාහිර වාර්තාකරණ පරිණතභාවය (Reporting maturity) සඳහා තවදුරටත් පිරිපහදු කිරීම් අවශ්‍ය වුවද, ප්‍රමිතිකවල පළමු අදියර දැනටමත් භාවිත වන කළමනාකරණ දර්ශකවලින් (Management indicators) සැලකිය යුතු ලෙස ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ එබැවිනි.

කාලයත් සමඟ, මූල්‍ය සහ මූල්‍ය නොවන වාර්තාකරණය පුරා මෙම ප්‍රමිති ව්‍යුහය (Metric architecture) වඩාත් ඒකාබද්ධ වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙයට වඩාත් පැහැදිලි මූලික මට්ටම් (Baselines) සංසන්දනාත්මක දත්ත, දත්ත ශබ්දකෝෂ (Data dictionaries), හිමිකාරිත්ව ව්‍යුහයන්, වලංගුකරණ ක්‍රමවේද සහ සුදුසු අවස්ථාවලදී පාලන ක්‍රියාවලීන් හරහා අනුමත කරන ලද ඉලක්කගත පරාසයන් (Target ranges) ඇතුළත් වේ. මෙහි අරමුණ වන්නේ විශාල ප්‍රමිතික සංඛ්‍යාවක් නිර්මාණය කිරීම නොව, තීරණ ගැනීම සඳහා සැබැවින්ම තොරතුරු සපයන විනයානුකූල සහ විශ්වාසදායී දර්ශක සමූහයක් ගොඩනැඟීමයි. කළමනාකරණය ප්‍රමිතික සඳහා අදියර හතරක ප්‍රවේශයක් අනුගමනය කරයි: පළමුව, පාරිභෝගික පැමිණිලි, ඩිජිටල් ක්‍රියාකාරිත්වය, සේවා අඛණ්ඩතාව, ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා අනුපාත, පුනුණු කිරීම්, ප්‍රවේශ ප්‍රමිතික, අවදානම් සිදුවීම් සහ මෙහෙයුම් සම්පත් දර්ශක වැනි පාලන කටයුතු සහ තීරණ ගැනීම් සඳහා දැනටමත් භාවිත කරන අභ්‍යන්තර දර්ශක හඳුනා ගනී.

දෙවනුව, බාහිර තිරසාර වාර්තාකරණය සඳහා මේවා අතරින් ප්‍රමාණවත් තරම් පරිණත මට්ටමක පවතින දර්ශක මොනවාදැයි ඇගයීමට ලක් කරයි. තෙවනුව, එම දර්ශක සම්බන්ධ හිමිකාරිත්වය, ක්‍රමවේදය, පාලනයන් සහ පැහැදිලි කිරීම් ශක්තිමත් කරයි. සිව්වනුව, විශේෂයෙන් දේශගුණය, විමෝචනය, තිරසාර මූල්‍යකරණය සහ ප්‍රත්‍යස්ථතාව ආශ්‍රිත මිනුම් දඬුවම් සඳහා යෝග්‍ය පරිදි අනාගත ඉලක්ක සහ මූලික මට්ටම් සංවර්ධනය කරයි.

## 5.2 NSB සඳහා වන මූලික ප්‍රමිති තේමාවන්

බැංකුවේ මූලික ප්‍රමිති තේමාවන් මඟින් පාරිභෝගික ඇතුළත් කර ගැනීම සහ සාධාරණ ප්‍රතිඵල, මෙහෙයුම් සහ සයිබර් ප්‍රත්‍යස්ථතාව, පැමිණිලි, හැසිරීම සහ සේවා යථා තත්ත්වයට පත් කිරීම, සේවක දක්ෂතාවය සහ පාලන පරිණතභාවය, මෙහෙයුම්වල දේශගුණික සහ පාරිසරික භාරකාරත්වය, වගකීම් සහගත මූල්‍යකරණය සහ ආයෝජන කළඹ ආවරණ මෙන්ම හෙළිදරව් කිරීම සහ පාලන සූදානම වැනි අංශ ආවරණය කිරීමට අපේක්ෂා කෙරේ. සෑම තේමාවකදීම, ක්‍රියාකාරකම් අධීක්ෂණය සඳහා වන ප්‍රමිතික, ප්‍රතිඵල අධීක්ෂණය සඳහා වන ප්‍රමිතික සහ ප්‍රත්‍යස්ථතාව හෝ මූල්‍ය බලපෑම ඇගයීම සඳහා වන ප්‍රමිතික අතර වෙනස හඳුනා ගැනීමට බැංකුව අදහස් කරයි. මෙම වෙන් කර හඳුනා ගැනීම වැදගත් වන්නේ සෑම ප්‍රගතියක්ම එකම ආකාරයකින් සාක්ෂි සහිතව ඔප්පු කළ නොහැකි බැවිනි.

| ප්‍රමිති තේමාව | දර්ශක | මෙය වැදගත් වන්නේ ඇයි |
|---|---|---|
| **පාරිභෝගික විශ්වාසය, සාධාරණත්වය සහ ඇතුළත් කර ගැනීම** | පැමිණිලි ප්‍රවණතා, විසඳුම් ලබා දීමේ කාලෝචිතභාවය, ප්‍රවේශවීමේ මිනුම් දඬු, සහායක සේවා භාවිතය, මූල්‍ය සාක්ෂරතාවය ව්‍යාප්ත වීම. | ඇතුළත් කර ගැනීම සහ පාරිභෝගික ආරක්ෂණ වගකීම් ප්‍රායෝගික ප්‍රතිඵල බවට පරිවර්තනය වන්නේද යන්න මෙයින් පෙන්නුම් කරයි. |
| **මෙහෙයුම් ප්‍රත්‍යස්ථතාව සහ ඩිජිටල් විශ්වාසය** | සේවා ක්‍රියාකාරී කාලය, සිදුවීම් ගණනය කිරීම්, ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්/ආපදා ප්‍රතිසාධන පරීක්ෂණ, සයිබර් ප්‍රමිතික, යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රියාකාරිත්වය. | සේවා මාර්ගවල (Channels) සහ මෙහෙයුම් ආකෘතියේ පවතින ප්‍රත්‍යස්ථතාව මෙයින් පෙන්නුම් කරයි. |
| **මිනිසුන් සහ සංස්කෘතිය** | පුහුණු සම්පූර්ණ කිරීම, තීරණාත්මක හැකියාවන් වර්ධනය කිරීම, සේවක සුභසාධනය සහ රඳවා ගැනීමේ දර්ශක. | ක්‍රියාත්මක කිරීමේ ධාරිතාව සහ පාලන පරිසරයේ ශක්තිමත්භාවය පිළිබඳ සංඥා කරයි. |
| **මූල්‍ය ප්‍රත්‍යස්ථතා සම්බන්ධතාවය** | ප්‍රාග්ධනය, ද්‍රවශීලතාවය, හානිකරණය, අරමුදල් ස්ථායීතාවය සහ අවදානම්-පිරිවැය ආවරණ. | තිරසාරත්වය ආශ්‍රිත කරුණු, ව්‍යවසාය වටිනාකම සහ බැංකුවේ විධානය (Mandate) ආරක්ෂා කිරීම සමඟ සම්බන්ධ වන්නේ කෙසේද යන්න පෙන්වා දෙයි. |
| **ස්වාභාවික ප්‍රාග්ධනය සහ මෙහෙයුම් පියසලකුණ** | බලශක්තිය, ඉන්ධන, කඩදාසි, ජලය, අපද්‍රව්‍ය සහ පුනර්ජනනීය බලශක්ති භාවිතය පිළිබඳ දර්ශක | පාරිසරික භාරකාරත්වය (Environmental stewardship) සහ සම්පත් කාර්යක්ෂමතාව අධීක්ෂණයට සහය වේ. |
| **දේශගුණික හා තිරසාර මූල්‍ය** | හරිත මූල්‍ය පරිමාවන්, ESRM ආවරණය, දේශගුණික අවදානම් පරීක්ෂාව, දේශගුණික සූදානම සන්ධිස්ථාන. | SLFRS සහ සංක්‍රාන්ති/අනුවර්තන මූල්‍ය විනයට සහය දක්වයි. |

## SLFRS තිරසාරතාවයට අදාළ මූල්‍ය අනාවරණ (SLFRS S1 සහ SLFRS S2)

### 5.3 දේශගුණික විපර්යාස ආශ්‍රිත දර්ශක සහ ඉලක්ක සංවර්ධන ගමන්මග

අදියර වශයෙන් පරිණත වන ප්‍රවේශයකට අනුකූලව, දේශගුණික විපර්යාස ආශ්‍රිත දර්ශක, මෙහෙයුම් පියසලකුණු (Operational footprint) සහ සූදානම් වීමේ දර්ශකයන්ගේ සිට තීරණ ගැනීම සඳහා වඩාත් ප්‍රයෝජනවත් වන්නා වූ ආයෝජන කළඹ සහ ඔරොත්තු දීමේ මිනුම්දඬු දක්වා පරිණාමය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. පළමු අදියරේදී, බලශක්ති භාවිතය, සම්පත් කාර්යක්ෂමතාව, අදාළ අවස්ථාවලදී පුනර්ජනනීය බලශක්ති ව්‍යාප්තිය, ශාඛා සහ මෙහෙයුම් ඔරොත්තු දීමේ දර්ශක, හරිත හෝ ඔරොත්තු දීමේ හැකියාව මත පදනම් වූ මූල්‍යකරණ ක්‍රියාකාරකම් සහ ආයතනික පාලන හෝ ක්‍රියාවලිමය සන්ධිස්ථාන කෙරෙහි වැඩි අවධානයක් යොමු වීමට ඉඩ ඇත. දත්තවල ගුණාත්මකභාවය ඉහළ යත්ම, මීළඟ අදියරයන්හිදී වඩාත් දියුණු ආයෝජන කළඹ දර්ශක, මූල්‍යකරණය කළ විමෝචන මිනුම් (Financed emissions measures) සහ දෘශ්‍යමාන අවස්ථා මත පදනම් වූ දර්ශක (Scenario-linked indicators) ඇතුළත් කරනු ඇත.

දේශගුණික විපර්යාස ආශ්‍රිත ඉලක්ක විශ්වසනීය, සාධාරණීකරණය කළ හැකි සහ උපායමාර්ගයන්ට අනුකූල විය යුතු බව බැංකුව තවදුරටත් පිළිගනී. එබැවින්, දුර්වල සාක්ෂි මත පදනම් වූ අභිලාෂකාමී කැපවීම් ප්‍රකාශ කිරීමට වඩා, ඒවායේ සීමාවන්, අයිතිය සහ මිනුම් ක්‍රමවේදයන් ප්‍රමාණවත් තරම් ස්ථාවර වූ පසු ක්‍රමයෙන් ඉලක්ක අනුගමනය කිරීම වඩාත් යෝග්‍ය වේ. මෙම විචක්ෂණශීලී ප්‍රවේශය මගින් විශ්වසනීයත්වය, පාලන විනය සහ අනාගත සහතික කිරීමේ (Assurance) සූදානම තහවුරු කෙරේ.

දේශගුණික වාර්තාකරණය සම්බන්ධයෙන් බැංකුව අදියර වශයෙන් ප්‍රගතියක් ලබමින් සිටී. මෙහිදී ආසන්නතම ප්‍රමුඛතාවය වන්නේ මෙහෙයුම් සම්පත් දත්ත සහ දේශගුණික අවදානම් දර්ශක වටා ඇති ආයතනික පාලනය, නිර්වචන සහ පාලන පරිසරය ශක්තිමත් කිරීමයි. මෙයට මූලාශ්‍ර පද්ධති (Source systems), සීමාවන්, අයිතිය සහ ක්‍රමවේද තේරීම් පැහැදිලි කිරීම ඇතුළත් වේ. මීළඟ අදියර වන්නේ ආයෝජන කළඹට අදාළ දේශගුණික දර්ශක ශක්තිමත් කිරීමයි. මෙයට පිරික්සුම් ආවරණය (Screening coverage), අංශ අනුව සංවේදීතා දසුන්, තිරසාර මූල්‍ය වර්ගීකරණය සහ කාලයත් සමඟ ක්‍රමවේදයන් දියුණු වූ පසු වඩාත් විධිමත් මූල්‍යකරණය කළ විමෝචන සහ දේශගුණික අවදානම් විශ්ලේෂණ ඇතුළත් වේ.

එබැවින්, ඉලක්කයන් ද අදියර වශයෙන් පරිණත වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙටිකාලීනව, බැංකුව බොහෝ විට මූලික දර්ශක (Baseline indicators), දිශානුගත ඉලක්ක සහ හැකියාවන් වර්ධනය කිරීමේ සන්ධිස්ථානවල එකතුවක් මත රඳා පවතිනු ඇත. කාලයත් සමඟ මෙහෙයුම් කාර්යක්ෂමතාව, පුනර්ජනනීය බලශක්තිය, අනාවරණය කිරීමේ සූදානම, දේශගුණික අවදානම් ආවරණය සහ තිරසාර මූල්‍ය වර්ධනය සම්බන්ධයෙන් වඩාත් ප්‍රමාණාත්මක ඉලක්ක මතු වනු ඇත.

| දේශගුණික විපර්යාස ආශ්‍රිත දර්ශකය | වත්මන් අගය/තත්ත්වය |
|---|---|
| **පළමු පරාසයේ (Scope 1) හරිතාගාර වායු විමෝචනය** | ගිගාජූල් (GJ) 1,094 |
| **දෙවන පරාසයේ (Scope 2) හරිතාගාර වායු විමෝචනය** | ගිගාජූල් (GJ) 34,258 |
| **පරිවර්තන අවදානම්වලට (Transition risks) නිරාවරණය වී ඇති වත්කම්/ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල වටිනාකම සහ ප්‍රතිශතය** | ඇඟයීමට ලක් කර නොමැත: නිරාවරණය පිළිබඳ දත්ත දැනට ලබාගත නොහැක. |
| **භෞතික අවදානම්වලට (Physical risks) නිරාවරණය වී ඇති වත්කම්/ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල වටිනාකම සහ ප්‍රතිශතය** | ඇඟයීමට ලක් කර නොමැත: නිරාවරණය පිළිබඳ දත්ත දැනට ලබාගත නොහැක. |
| **දේශගුණික විපර්යාස ආශ්‍රිත අවස්ථාවන් (Opportunities) සමඟ අනුකූල වන වත්කම්/ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල වටිනාකම සහ ප්‍රතිශතය** | ලුහුබැඳ ගොස් නොමැත: අනුකූලතා දත්ත දැනට ලබාගත නොහැක. |
| **දේශගුණික විපර්යාස ආශ්‍රිත අවදානම් සහ අවස්ථාවන් වෙනුවෙන් ප්‍රාග්ධනය යෙදවීම** | ලුහුබැඳ ගොස් නොමැත: වියදම් සහ මූල්‍යකරණ දත්ත දැනට ලබාගත නොහැක. |
| **අභ්‍යන්තර කාබන් මිලකරණය** | ස්ථාපිත කර නොමැත: දැනට කිසිදු අභ්‍යන්තර කාබන් මිලකරණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක නොවේ. |
| **පාරිශ්‍රමිකයන්** | ඒකාබද්ධ කර නොමැත: දැනට දේශගුණික විපර්යාස ආශ්‍රිත පාරිශ්‍රමික නිර්ණායක අදාළ කර නොගනී. |

#### 5.3.1 බැංකුව විසින් නියම කර ඇති ඉලක්ක

බැංකුව මෙතෙක් නිල වශයෙන් දේශගුණික විපර්යාස ආශ්‍රිත ඉලක්ක (Climate-related targets) ස්ථාපිත කර නොමැත. කෙසේ වෙතත්, දේශගුණික ඔරොත්තු දීමේ හැකියාවේ (Climate resilience) වර්ධනය වන වැදගත්කම හඳුනා ගනිමින්, අනාගත අවම කිරීමේ (Mitigation) සහ අනුවර්තනය වීමේ (Adaptation) උත්සාහයන් සඳහා සහය වීමට සුදුසු ඉලක්ක සකස් කිරීමේ ක්‍රියාවලියක බැංකුව නිරතව සිටී. මෙම අඛණ්ඩ කාර්යයේ කොටසක් ලෙස, අනාගතය සඳහා යෝග්‍ය කාර්යසාධන දර්ශක (Performance indicators) තීරණය කිරීම සඳහා බැංකුව සිය දත්ත පද්ධති ශක්තිමත් කරමින් සිටී.

මෙම ඉලක්ක ස්ථාපිත කළ පසු, අදාළ මෙහෙයුම් දර්ශක (Operational metrics) භාවිතයෙන් කළමනාකාරිත්වය විසින් ඒවායේ ප්‍රගතිය නිරීක්ෂණය කරනු ලබන අතර, පාලක මණ්ඩලය (Governance body) විසින් වාරිකව ඒවා සමාලෝචනය කරනු ඇත.

### 5.4 අනාගත සූදානම සහ මීළඟ චක්‍රයේ ප්‍රමුඛතා ශක්තිමත් කිරීම

සමස්තයක් ලෙස ගත් කල, මෙම ප්‍රමුඛතාවයන්ගේ අරමුණ වන්නේ, ජාතික ඉතිරිකිරීමේ බැංකුව මනාව ව්‍යුහගත වූ පළමු චක්‍රයේ අනාවරණය කිරීමේ පරිච්ඡේදයක සිට (First-cycle disclosure chapter), ඉදිරි වාර්ෂික වාර්තා හරහා වඩාත් පරිණත, මිණුම්දඬුගත ගුණාත්මකභාවයකින් (Benchmark-quality) යුත් තිරසාරභාවය ආශ්‍රිත මූල්‍ය අනාවරණය කිරීමේ පාලන තන්ත්‍රයක් (Financial disclosure regime) කරා යොමු කිරීමයි.

| ප්‍රමුඛතා ක්ෂේත්‍රය | සැලසුම් සහගත වැඩිදියුණු කිරීමේ දිශානතිය |
|---|---|
| **ආයතනික පාලනයේ පරිණතභාවය** | අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ තිරසාරභාවය පිළිබඳ අධීක්ෂණය වඩාත් විධිමත් කිරීම සහ කමිටු වාර්තාකරණ විනය ශක්තිමත් කිරීම. |
| **දත්ත සහ පාලන ක්‍රමවේද** | තිරසාරභාවය ආශ්‍රිත දර්ශක සඳහා දත්ත මූලාශ්‍ර සෙවීමේ හැකියාව, වලංගුකරණය, සාක්ෂි පථ සහ මූලාශ්‍ර හිමිකාරිත්වය වැඩිදියුණු කිරීම. |
| **දේශගුණික විශ්ලේෂණ** | වඩාත් විධිමත් දේශගුණික අවදානම් ආවරණ, දෘශ්‍යමාන අවස්ථා පිළිබඳ තර්කනය සහ ආයෝජන කළඹ සංවේදීතා දසුන් සංවර්ධනය කිරීම. |
| **ඉලක්කගත ව්‍යුහය** | මූලික මට්ටමේ සහ විස්තරාත්මක කැපවීම්වල සිට, ප්‍රායෝගිකව කළ හැකි අවස්ථාවලදී වඩාත් ප්‍රමාණාත්මක සහ නිරීක්ෂණය කළ හැකි ඉලක්ක කරා යොමු වීම. |
| **සහතික කිරීමේ සූදානම** | තෝරාගත් තිරසාරභාවය ආශ්‍රිත අනාවරණය කිරීම් සඳහා වඩාත් ව්‍යුහගත අභ්‍යන්තර සහ බාහිර සහතික කිරීමේ සහාය ලබා ගැනීමට සූදානම් වීම. |


# ආයතනික පාලනය පිළිබඳ ප්‍රකාශය

ජාතික ඉතිරිකිරීමේ බැංකුව ආයතනික පාලනය යනු හුදෙක් අනුකූලතා යාන්ත්‍රණයක් ලෙස පමණක් නොව එය අපගේ අගය නිර්මාණය කිරීමේ දාමයේ සෑම අදියරකම පවතින සදාචාරාත්මකව දැඩි සහ වගකිව යුතු කළමනාකරණයක මූලික පදනම ලෙස සලකනු ලබයි. ඒකාබද්ධ චින්තන දර්ශනය තුළ ගැබ්ගිරින් අන්තර්ගත වී ඇති අපගේ පාලන රාමුව තීරණ ගැනීමේ ක්‍රියාවලිය සදාචාරාත්මක, වගකිවයුතු සහ ගුණාත්මක මූලධර්ම සමඟ සමපාත කරවයි. එමගින් අපගේ මූලික වටිනාකම් සහ උපායමාර්ගික අභිලාෂයන් ශක්තිමත් කෙරේ. මෙම රාමුව සැලසුම් කර ඇත්තේ අඛණ්ඩ වටිනාකම් නිර්මාණය කිරීමටත්, අවංකභාවය සහ තිරසාරත්වය මත පදනම් වූ ආයතනික සංස්කෘතියක් පෝෂණය කිරීමටත්, සියලු මෙහෙයුම් හරහා නොසැලෙන විනිවිදභාවය සහ වගවීම සහතික කිරීමටත්ය.

NSB හි පාලන ව්‍යුහය ශක්තිමත් නායකත්වය, අපක්ෂපාතී අධීක්ෂණය සහ කළමනාකරණ වගවීම මත ගොඩනැගී ඇති අතර, ඒ සියල්ල ස්ථාවර සදාචාරාත්මක පදනමක් මත නැංගුරම් ලා ඇත. බැංකුවේ පාලන ව්‍යුහය විසින් පැහැදිලිව අර්ථ දක්වන ලද සීමාවන් ස්ථාපිත කර ඇති අතර, ආයතනයේ භාරකාරීත්වය (Stewardship) පිළිබඳ උපරිම වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි. උපායමාර්ගික අධීක්ෂණය සඳහා බලතල විශේෂිත අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු (Board Committees) සහ ආයතනික කළමනාකාරීත්වය වෙත පවරා ඇති අතර, ඒවා සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ නායකත්වය යටතේ ක්‍රියාත්මක වේ. කෙසේ වෙතත්, බැංකුවේ සමස්ත මෙහෙයුම් පරාසය පිළිබඳ පුළුල් අධීක්ෂණය අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. මෙම ව්‍යුහගත බලතල පැවරීම හරහා ආරක්ෂිත, සමාජීය සහ පාරිසරික තිරසාර අරමුණු සමඟ සමපාත වීමත්, කොටස්කරුවන්ගේ අපේක්ෂාවන්ට ප්‍රතිචාර දැක්වීමත් සහතික කෙරේ.

බැංකුවේ උපායමාර්ගික සහ මෙහෙයුම් ඉලක්ක හැඩගැස්වීමේදී සහ අනුමත කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන අතර, සියලු පාර්ශ්වකරුවන්ට සාධාරණ වටිනාකමක් ලබා දීම පිළිබඳව දැඩි අවධානයක් යොමු කරයි. තවද, විනිවිදභාවය, වගවීම, අපක්ෂපාතීත්වය සහ මෙහෙයුම් විශිෂ්ටත්වය වැනි මූලික මූලධර්ම අවධාරණය කරමින් හිඊ හි බැංකු මෙහෙයුම්වල අඛණ්ඩතාව සහ කාර්යක්ෂමතාව මණ්ඩලය විසින් ආරක්ෂා කරනු ලබයි. ක්ෂේත්‍රයේ ප්‍රමිතීන් (Industry benchmarks), රෙගුලාසිගත විධානයන් (Regulatory mandates) සහ නීතිමය ප්‍රමිතීන්ට අනුකූල වීම, සදාචාරාත්මක ආයතනික පාලනය සඳහා NSB සතු නොසැලෙන කැපවීම තහවුරු කරයි.

NSB හි පාලනය යනු තිරසාර සාර්ථකත්වය කරා මෙහෙයවීම, පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම සහ සමාජයට සදාචාරාත්මක මූල්‍ය සේවාවන් ලබා දීම අරමුණු කරගත් බහුවිධ උපායමාර්ගික මුලපිරීමකි. එබැවින්, පාලනය යනු බැංකුවේ ප්‍රමුඛතාවයක් වන අතර එය අපගේ ආයතනික විඥානයේ සෑම අංශයකම අන්තර්ගත වී ඇත.




රූප සටහන 18

# අවදානම් කළමනාකරණය පිළිබඳ ප්‍රකාශය

ජාතික ඉතිරිකිරීමේ බැංකුව තුළ, විකාශනය වන මූල්‍ය ක්ෂේත්‍රයේ සංකීර්ණතා හමුවේ ඔරොත්තු දීමේ හැකියාවෙන් සහ දූරදර්ශීව කටයුතු කිරීමට හැකිවන පරිදි ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුවක් පවත්වාගෙන යාම සඳහා අපි ඉහළම ප්‍රමුඛතාවයක් ලබා දෙන්නෙමු. ශ්‍රී ලංකාවේ විශාලතම බලපතුලාභී විශේෂිත බැංකුව ලෙස, දේශීය සාර්ව ආර්ථික පරිසරය, රෙගුලාසිගත වෙනස්වීම් සහ බාහිර වෙළඳපල ගතිකත්වයන්ගෙන් පැන නගින අවදානම් පිළිබඳව අපි දැඩි අවධානයෙන් පසුවෙමු. අපගේ අවදානම් කළමනාකරණ ප්‍රවේශය උපායමාර්ගිකව සැලසුම් කර ඇත්තේ බැංකුවේ මූල්‍ය ස්ථාවරභාවය ආරක්ෂා කිරීමට පමණක් නොව, ශ්‍රී ලංකාවේ පුළුල් ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා ද වේ.


## අවදානම් පාලනය සහ අධීක්ෂණය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අවදානම් කළමනාකරණය අධීක්ෂණය කරන පාලන ව්‍යුහය වගවීම, විනිවිදභාවය සහ දැනුවත් තීරණ ගැනීම යන මූලධර්ම මත පදනම් වේ. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සහාය ලබන අධ්‍යක්ෂ මණ්ඩලය, අවදානම් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳ සමස්ත අධීක්ෂණය සපයන අතර බැංකුවේ විකාශනය වන අවදානම් තත්ත්වය අඛණ්ඩව නිරීක්ෂණය කරයි. උපායමාර්ගික අරමුණු ඉටු කිරීමේදී ඒකාබද්ධ ප්‍රවේශයක් සහතික කිරීම සඳහාත්, එමගින් ප්‍රාග්ධන කාර්යක්ෂමතාව සහ මෙහෙයුම් ඵලදායීතාවය ප්‍රශස්ත කිරීම සඳහාත්, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීවරයා සහ කළමනාකරණ කමිටු වෙත නිසි පරිදි බලතල පවරා ඇත. ප්‍රධාන අවදානම් නිලධාරී විසින් අවදානම් කාර්යභාරය මෙහෙයවනු ලබන අතර, බැංකුවේ උපායමාර්ගික අභිලාෂයන් සහ එහි ප්‍රකාශිත අවදානම් රුචිය අතර අනුකූලතාවය සහතික කරන අතරම, රෙගුලාසිගත අවශ්‍යතා සහ ක්ෂේත්‍රයේ හොඳම භාවිතයන් අනුගමනය කරයි.

අපගේ අවදානම් හඳුනාගැනීමේ ක්‍රියාවලිය පුළුල් මෙන්ම ක්‍රියාශීලී එකකි. ව්‍යාපාරික අංශ සහ සහායක අංශ තුළ අනුයුක්ත කර ඇති සම්බන්ධීකරණ නිලධාරීන්ගෙන් ලබාගන්නා තොරතුරු මගින් දැඩි අවදානම් තක්සේරු කිරීම් සිදු කිරීමටත්, අධ්‍යක්ෂ මණ්ඩලය, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සඳහා සවිස්තරාත්මක අවදානම් වාර්තා සකස් කිරීමටත් පහසුකම් සැලසේ. ශ්‍රී ලංකාවේ ඓතිහාසික සාර්ව ආර්ථික අස්ථාවරත්වය සැලකිල්ලට ගනිමින්, නිතිපතා සිදුකරනු ලබන ආතති පරීක්ෂණ සහ අවස්ථානුකූල විශ්ලේෂණයන් මගින් විවිධ පීඩන තත්ත්වයන් යටතේ මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව ඇගයීමට සහ පූර්ව ආරක්ෂණ පියවර ක්‍රියාත්මක කිරීමට අපට හැකියාව ලැබේ.

## 2025 වසරේ වර්ධනයන්

2025 වසර තුළදී, පවතින දේශීය හා ගෝලීය අභියෝගයන්ට ප්‍රතිචාර වශයෙන් ජාතික ඉතිරිකිරීමේ බැංකුව සිය අවදානම් කළමනාකරණ ව්‍යුහය තවදුරටත් ශක්තිමත් කළ අතර, මතුවන තර්ජනයන්ට එරෙහිව අබණ්ඩ ඔරොත්තු දීමේ හැකියාව සහතික කළේය. ශ්‍රී ලංකා ආර්ථිකය මුහුණ දෙන බහුවිධ අභියෝග සහ ණය ගැතියන්ගේ ණය පියවීමේ හැකියාවට ඉන් එල්ල වන බලපෑම සැලකිල්ලට ගනිමින්, අපි අපගේ ණය අවදානම් කළමනාකරණ රාමුව තවදුරටත් දැඩි කළෙමු. ණය පැහැර හැරීමේ හැකියාව පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ දර්ශක සමීපව නිරීක්ෂණය කිරීම සහ වඩාත් නිතර සවිස්තරාත්මක ආතති පරීක්ෂණ සිදු කිරීම මගින්, ණය අවදානම අවම කිරීමට සහ බැංකුවේ ගෙවුම්ශක්ති දර්ශක කෙරෙහි ඇති විය හැකි බලපෑම් තක්සේරු කිරීමට කාලෝචිත මැදිහත්වීම් සිදු කිරීමට අපට හැකි විය.




රූපය 19

# ස්වාධීන වෘත්තිකයින්ගේ සීමිත සහතික කිරීමේ වාර්තාව

KPMG
(Chartered Accountants)
P. O. Box 186,
Colombo 00300, Sri Lanka.

Tel : +94 - 11 542 6426
Fax : +94 - 11 244 5872
Internet : www.kpmg.com/lk

## TO THE BOARD OF DIRECTORS OF NATIONAL SAVINGS BANK

### Report on selected indicators included in National Savings Bank's Integrated Annual Report for the year ended 31 December 2025

### Conclusion

We have performed a limited assurance engagement on whether the selected sustainability related indicators as defined in annexure A ("Subject matter Information" or "SMI") in National Savings Bank's ("the Bank") Integrated annual report for the year ended 31 December 2025 have been prepared with reference to the selected Global Reporting Initiative Standards 2021 as mentioned in Annexure A ("Criteria").

Based on the procedures performed and evidence obtained, nothing has come to our attention to cause us to believe that the selected sustainability related indicators as defined in annexure A of National Savings Bank for the year ended 31 December 2025 are not prepared, in all material respects, with reference to the Criteria.

The SMI subject to our limited assurance engagement are listed in Annexure A. The assured sustainability information is marked with Bold font and marked with "LA" in the Integrated Annual Report, and the corresponding GRI indicators are also provided in Annexure A.

Our conclusion on the SMI as defined in annexure A does not extend to other information that accompanies or contains the SMI as defined in annexure A and our assurance report.

### Basis for conclusion

We conducted our engagement in accordance with Sri Lanka Standard on Assurance Engagements (SLSAE) 3000 (Revised), Assurance Engagements Other Than Audits or Reviews of Historical Financial Information issued by the Institute of Chartered Accountants of Sri Lanka. Our responsibilities under this standard are further described in the "Our responsibilities" section of our report.

We have complied with the independence and other ethical requirements of the Code of Ethics for professional Accountants issued by CA Sri Lanka (Code of Ethics).

Our firm applies Sri Lanka Standard on Quality Management (SLSQM) 1, which requires the firm to design, implement and operate a system of quality management including policies or procedures regarding compliance with ethical requirements, professional standards and applicable legal and regulatory requirements.

We believe that the evidence we have obtained is sufficient and appropriate to provide a basis for limited assurance conclusion.

### Intended use or purpose

We have been engaged by the Management of National Savings Bank to provide limited assurance on whether the selected SMI as defined in annexure A have been prepared with reference to the Criteria

### Restriction on use or distribution

This report has been prepared for the Board of Directors of National Savings Bank for the purpose of providing an assurance conclusion on whether the selected SMI in the National Savings Bank's Integrated Annual Report for the Year ended 31 December 2025 has been prepared with reference to the Criteria and may not be suitable for another purpose. We disclaim any assumption of responsibility for any reliance on this report, to any person other than National Savings Bank, or for any other purpose than that for which it was prepared.

Our report should not be regarded as suitable to be used or relied on by any party wishing to acquire rights against us other than National Savings Bank, for any purpose or in any other context. Any party other than National Savings Bank who obtains access to our report or a copy thereof and chooses to rely on our report (or any part thereof) will do so at its own risk. To the fullest extent permitted by law, we accept or assume no responsibility and deny any liability to any party other than National Savings Bank for our work, for this independent assurance report, or for the conclusions we have reached.

Our conclusion is not modified in respect of this matter.

### Responsibilities of Management for the SMI

The management of the Bank are responsible for:

- Designing, implementing and maintaining internal control relevant to the preparation of the Subject Matter Information that is free from material misstatement, whether due to fraud or error.
- Selecting or developing suitable criteria for preparing the Subject Matter Information and appropriately referring to or describing the criteria

KPMG, a Sri Lankan Partnership and a member firm of the KPMG global organization of independent member firms affiliated with KPMG International Limited, a private English company limited by guarantee. All rights reserved.

C.P. Jayatilake FCA, Ms. S. Joseph FCA, R.M.D.B. Rajapakse FCA, M.N.M. Shameel FCA, Ms. P.M.K. Sumanasekara FCA, T.J.S. Rajakarier FCA, W.K.D.C Abeyrathne FCA, Ms. B.K.D.T.N. Rodrigo FCA, Ms. C.T.K.N. Perera ACA, R.G.H. Raddella ACA, W.W.J.C. Perera FCA, G.A.U. Karunaratne FCA, R.H. Rajan FCA, A.M.R.P. Alahakoon ACA

Principals: S.R.I. Perera FCMA (UK), LLB, Attorney-at-Law, H.S. Goonewardene ACA, Ms. F.R Ziyard FCMA (UK), FCIT, K. Somasundaram ACMA (UK), Ms. D Corea Dharmaratne

ස්වාධීන ව්‍යාත්තිකයින්ගේ සීමිත සහතික කිරීමේ වාර්තාව

- Preventing and detecting fraud and ensuring the Bank's compliance with applicable laws and regulations to its activities.
- Ensuring that staff involved in preparation and presentation of the description and Report are properly trained, information systems are properly updated and that any changes in reporting encompass all significant business units; and
- Preparing the Subject Matter Information with reference to the criteria
- The maintenance and integrity of National Savings Bank's website, including the presentation of our independent limited assurance report on the website is the responsibility of the National Savings Bank's management. Management is responsible for any changes to either the information in the Report or our independent limited assurance report that may have occurred since the initial date of its presentation on National Savings Bank's website.

Those charged with governance are responsible for overseeing the reporting process for the Bank's SMI.

## Inherent limitations

The preparation of SMI is subject to inherent limitations arising from the nature of non-financial data, including the use of estimates, assumptions, and third-party information. In addition, due to the inherent limitations of any internal control system, errors or irregularities may occur and not be detected.

Our engagement was not designed to detect internal control weaknesses because the procedures were performed on a test basis and not continuously throughout the period.

## Our responsibilities

We are responsible for:

- planning and performing the engagement to obtain limited assurance about whether the SMI is free from material misstatement, whether due to fraud or error;
- forming an independent conclusion, based on the procedures we have performed and the evidence we have obtained;
- reporting our conclusion to the Board of Directors of National Savings Bank.

## Summary of the work we performed as the basis for our conclusion

We exercised professional judgment and maintained professional skepticism throughout the engagement. We designed and performed our procedures to obtain evidence about the SMI that is sufficient and appropriate to provide a basis for our limited assurance conclusion.

Our procedures selected depended on our understanding of the SMI, other engagement circumstances, and our consideration of areas where material misstatements are likely to arise. In carrying out our engagement, the procedures we performed primarily consisted of:

- interviewed senior management and relevant staff at corporate and selected site level concerning sustainability strategy and policies for material issues, and the implementation of these across the business;
- enquired management to gain an understanding of the Bank's processes for determining material issues for the Bank's key stakeholder groups;
- enquired relevant staff at corporate and selected site level responsible for the preparation of the SMI in the Integrated Annual Report of National Savings Bank for the year ended 31 December 2025;
- enquired about the design and implementation of the systems and methods used to collect and report the SMI in the Integrated Annual Report of the National Savings Bank for the year ended 31 December 2025, including the aggregation of the reported information;
- applied analytical procedures, as appropriate;
- compared the SMI in the Integrated Annual Report of National Savings Bank for the year ended 31 December 2025 to relevant underlying sources on a sample basis to determine whether the relevant information has been appropriately included in the Report; and was not designed to test the completeness of the relevant data collection systems.
- recalculated the Information subject to Limited Assurance based on the criteria;
- read the SMI in the Integrated Annual Report of National Savings Bank for the year ended 31 December 2025 presented in the Report to determine whether they are in line with our overall knowledge of, and experience with, the sustainability performance of the Bank; and
- read the remainder of the Report to determine whether there are any material misstatements of fact or material inconsistencies based on our understanding obtained as part of our assurance engagement.

The procedures performed in a limited assurance engagement vary in nature and timing from, and are less in extent than for, a reasonable assurance engagement. Consequently, the level of assurance obtained in a limited assurance engagement is substantially lower than the assurance that would have been obtained had a reasonable assurance engagement been performed.



CHARTERED ACCOUNTANTS
Colombo
27 March 2026

ස්වාධීන වෘත්තිකයින්ගේ සීමිත සහතික කිරීමේ වාර්තාව

## ANNEXURE A TO OUR LIMITED ASSURANCE REPORT DATED 27 MARCH 2026

**The numbers in this annexure have been included in the Integrated Annual Report prepared by the Management. Our reporting boundary is limited to the Bank's operations in Sri Lanka.**

| GRI Standard (The criteria relevant to the information) | | Disclosure Topic | Point in time or period subject to assurance | Page |
|---|---|---|---|---|
| **Disclosure 2-7 Employees** | 2–7 a | Employees related metrics | As at 31 December 2025 | 121 |
| | 2–7 b (i) | | As at 31 December 2025 | 121 |
| | 2–7 c (i) | | for the year ended 31 December 2025 | 122 |
| | 2–7 d | | for the year ended 31 December 2025 | 122 |
| | 2–7 e | | for the year ended 31 December 2025 | 121 |
| **Disclosure 2-23** Policy Commitments | 2–23 a (i–iv) | Policy Commitments | for the year ended 31 December 2025 | 120 |
| | 2–23 b (i, ii) | | for the year ended 31 December 2025 | 120 |
| | 2–23 c | | for the year ended 31 December 2025 | 121 |
| | 2–23 d | | for the year ended 31 December 2025 | 120 |
| | 2–23 e | | for the year ended 31 December 2025 | 121 |
| **Disclosure 2-28** Membership associations | 2–28 a | Membership associations list | for the year ended 31 December 2025 | 158 |
| **Disclosure 2-30** Collective bargaining agreements | 2–30 a | Collective bargaining agreements coverage | for the year ended 31 December 2025 | 129 |
| **Disclosure 201-1** Direct economic value generated and distributed | 201–1 a (i–ii) | Direct economic value generated and distributed | for the year ended 31 December 2025 | 65 |
| **Disclosure 202-2** Proportion of Senior Management hired from the local community | 202–2 a | Proportion of Senior Management hired from the local community | for the year ended 31 December 2025 | 125 |
| | 202–2 c | | for the year ended 31 December 2025 | 125 |
| | 202–2 d | | for the year ended 31 December 2025 | 124 |
| **Disclosure 203-2** Significant indirect economic impacts | 203–2 a | Significant indirect economic impacts | for the year ended 31 December 2025 | 168 |
| **Disclosure 204-1** Proportion of spending on local suppliers | 204–1 a | Proportion of spending on local suppliers | for the year ended 31 December 2025 | 15 |
| | 204–1 b | | for the year ended 31 December 2025 | 156 |
| | 204–1 c | | for the year ended 31 December 2025 | 156 |
| **Disclosure 205-3** Confirmed incidents of corruption and actions taken | 205–3 a | Confirmed incidents of corruption and actions taken | for the year ended 31 December 2025 | 15 |
| | 205–3 d | | for the year ended 31 December 2025 | 147 |
| **Disclosure 206-1** Legal actions for anti-competitive behaviour, anti-trust, and monopoly practices | 206–1 a | Legal actions for anti competitive behaviour, anti-trust, and monopoly practices | for the year ended 31 December 2025 | 148 |
| **Disclosure 302-1** Energy consumption within the organisation | 302–1 a | Total energy consumption within the organisation | for the year ended 31 December 2025 | 181 |
| | 302–1 d (i) | | for the year ended 31 December 2025 | 181 |
| | 302–1 e | | for the year ended 31 December 2025 | 181 |
| **Disclosure 302-3** Energy intensity | 302–3 a | Energy intensity calculation | for the year ended 31 December 2025 | 181 |
| **Disclosure 303-3** Water withdrawal | 303–3 a (v) | Water Withdrawal | for the year ended 31 December 2025 | 181 |
| **Disclosure 401-1** New employee hires and employee turnover | 401–1 a | List of New employee hires and employee turnover | for the year ended 31 December 2025 | 124 |
| | 401–1 b | | for the year ended 31 December 2025 | 125 |

## ස්වාධීන වෘත්තිකයින්ගේ සීමිත සහතික කිරීමේ වාර්තාව

| GRI Standard (The criteria relevant to the information) | | Disclosure Topic | Point in time or period subject to assurance | Page |
|---|---|---|---|---|
| **Disclosure 401-2** Benefits provided to full-time employees that are not provided to temporary or part-time employees | 401–2 a (i–vii) | Benefits provided to full-time employees that are not provided to temporary or part–time employees | for the year ended 31 December 2025 | 122 |
| **Disclosure 401-3** Parental leave | 401–3 a | Parental leave calculations | for the year ended 31 December 2025 | 128 |
| | 401–3 b | | for the year ended 31 December 2025 | 128 |
| | 401–3 c | | for the year ended 31 December 2025 | 128 |
| | 401–3 d | | for the year ended 31 December 2025 | 128 |
| | 401–3 e | | for the year ended 31 December 2025 | 128 |
| **Disclosure 403-1** Occupational health and safety management system | 403–1 a (i, ii) | Occupational health and safety management system | for the year ended 31 December 2025 | 129 |
| | 403-1 b | | for the year ended 31 December 2025 | 129 |
| **Disclosure 403-8** Workers covered by an occupational health and safety management system | 403–8 a (i–iii) | Workers covered by an occupational health and safety management system | for the year ended 31 December 2025 | 129 |
| **Disclosure 403-9** Work-related injuries | 403–9 a (i) | Number of Work-related injuries | for the year ended 31 December 2025 | 129 |
| **Disclosure 404-1** Average hours of training per year per employee | 404–1 a (i–ii) | Average hours of training per year per employee | for the year ended 31 December 2025 | 127 |
| **Disclosure 404-3** Percentage of employees receiving regular performance and career | 404–3 a | Percentage of employees receiving regular performance and career development reviews | for the year ended 31 December 2025 | 129 |
| **Disclosure 405-1** Diversity of governance bodies and employees | 405–1 a (i, ii) | Diversity of governance bodies and employees | for the year ended 31 December 2025 | 121 |
| | 405–1 b (i, ii) | | for the year ended 31 December 2025 | 237 |
| **Disclosure 405-2** Ratio of basic salary and remuneration of women to men | 405–2 a | Ratio of basic salary and remuneration of women to men | for the year ended 31 December 2025 | 122 |
| **Disclosure 406-1** Incidents of discrimination and corrective actions taken | 406–1 a | Number of Incidents of discrimination and corrective actions taken | for the year ended 31 December 2025 | 131 |
| **Disclosure 408-1** Operations and suppliers at significant risk for incident of child labour | 408-1 a | Operations and suppliers at significant risk for incident of child labour | for the year ended 31 December 2025 | 131 |
| | 408-1 b | | for the year ended 31 December 2025 | 131 |
| **Disclosure 409-1** Operations and suppliers at significant risk for incident of forced or compulsory labour | 409-1 a | Operations and suppliers at significant risk for incident of forced or compulsory labour | for the year ended 31 December 2025 | 131 |
| **Disclosure 417-2** Incidents of non-compliance concerning product and service information and labeling | 417–2 a (i–iii) | Number of Incidents of non–compliance concerning product and service information and labeling | for the year ended 31 December 2025 | 148 |
| | 417–2 b | | for the year ended 31 December 2025 | 148 |
| **Disclosure 417-3** Incidents of non-compliance concerning marketing communications | 417–3 a (i–iii) | Incidents of non–compliance concerning marketing communications | for the year ended 31 December 2025 | 148 |
| | 417– 3 b | | for the year ended 31 December 2025 | 148 |
| **Disclosure 418-1** Substantiated complaints concerning breaches of customer privacy and losses of customer data | 418–1 a (i, ii) | Substantiated complaints concerning breaches of customer privacy and losses of customer data | for the year ended 31 December 2025 | 148 |
| | 418–1 b | | for the year ended 31 December 2025 | 148 |
| | 418–1 c | | for the year ended 31 December 2025 | 148 |



# සෑම ජීවන ගමනක්ම මෙහෙයවන කැපවීම සවිබල ගැන්වීම

සිය නිවෙස්වලින් සැතපුම් දහස් ගණනක් ඈතින් සිටිමින් ඔවුන් වෙහෙස මහන්සි වන්නේ තම පවුල් ඒකකයන්හි සෞභාග්‍යය උදෙසාය. ශ්‍රී ලංකාවේ විදේශගත ශ්‍රමික ප්‍රජාව සිදුකරන මෙම කැපවීම අගය කරන ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ප්‍රේෂණ සහ ඉතිරි කිරීම් සඳහා විශ්වසනීය මූල්‍ය මාවත් සලසා දෙයි. ඒ මගින්, ඔවුන් අතිශය දුෂ්කරතාවයෙන් උපයා මෙරටට එවනු ලබන සෑම රුපියලක්ම ආරක්ෂා කරමින් සහ සුරක්ෂිත කරමින්, ඔවුන් ගොඩනගන අනාගතය වෙනුවෙන් එම අරමුදල් ඵලදායී ලෙස ආයෝජනය වන බව සහතික කරයි.

# පාලනය


අධ්‍යක්ෂ මණ්ඩලය
220

ආයතනික කළමනාකාරිත්වය
226

විධායක කළමනාකාරිත්වය
228

ප්‍රධාන කළමනාකාරවරු
230

ආයතනික පාලනය
231

අධ්‍යක්ෂ මණ්ඩල
විගණන කමිටු වාර්තාව
245

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ
පාරිශ්‍රමික කමිටු වාර්තාව
248

අධ්‍යක්ෂ මණ්ඩල
නාම යෝජනා කමිටු වාර්තාව
250

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ
අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව
251

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ
උපායමාර්ගික කමිටු වාර්තාව
253

අවදානම් කළමනාකරණ වාර්තාව
254

# අධ්‍යක්ෂ මණ්ඩලය



# අධ්‍යක්ෂ මණ්ඩලය



**ආචාර්ය හර්ෂ කබ්රාල් PC**
සභාපති

ස්වාධීන නොවන, විධායක නොවන අධ්‍යක්ෂ

**පත්වීමේ දිනය**
2023 මැයි 2

**කුසලතා හා විශේෂඥතාව**

ආචාර්ය කබ්රාල් මහතා, බුද්ධිමය දේපල නීතිය, සමාගම් නීතිය, වාණිජ නීතිය, වාණිජ මධ්‍යස්ථකරණය, සුරැකුම්පත් නීතිය සහ ජාත්‍යන්තර වෙළෙඳ නීතිය යන ක්ෂේත්‍රවල සිවිල් හා අපරාධ අංශ දෙකම ආවරණය කරමින් වසර 38ක් අඛණ්ඩ අත්දැකීම ඇති ශ්‍රී ලංකාවේ ජනාධිපති නීතිඥයෙකි. ඔහු නීතිඥයෙකු ලෙස වසර 20ක් ශ්‍රී ලංකාවේ වාණිජ නඩු විධානාධිකරණ (Commercial High Courts) හා ශ්‍රේෂ්ඨාධිකරණයේ පුළුල් වෘත්තීය පරිචයක් ලබා ඇති අතර ඔහුගේ යටතේ නීතිඥයෙකු ලෙස නීතිය හදාරන ශිෂ්‍යයන් 16 දෙනෙකු සිටිති. ආචාර්ය කබ්රාල් ඔස්ට්‍රේලියාවේ කැන්බරා විශ්වවිද්‍යාලයෙන් සමාගම් නීතිය පිළිබඳ ආචාර්ය උපාධිය ලබාගෙන ඇත. ඔහු 2021 දක්වා වසර හයක කාලයක් පැරිසියේ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ (ICC) ජාත්‍යන්තර බේරුම්කරණ අධිකරණයේ සාමාජිකයෙකු විය. ඔහු ෆෙඩරේෂන් ඔෆ් ඉන්ටිග්රේටඩ් කොන්ෆ්ලික්ට් මැනේජ්මන්ට් (FICM) ආයතනයේ නියෝජිත සාමාජිකයෙකු මෙන්ම ජාත්‍යන්තර වාණිජ ආරවුල් විනිශ්චය ශ්‍රේෂ්ඨාධිකරණයේ (ICDT) නියෝජිත සාමාජිකයෙකු ද වේ.

ශ්‍රී ලංකාවේ සමාගම් නීතිය පිළිබඳ උපදේශක කොමිසමේ සාමාජිකයෙකු ලෙස, ආචාර්ය කබ්රාල්, 2007 අංක 07 දරන සමාගම් පනත, එනම් වත්මන් පනත, නිර්මාණය කිරීමේ නිර්මාතෘවරුන්ගෙන් කෙනෙකි.

ආචාර්ය කබ්රාල් මහතා මෙරට සහ විදේශයන්හි විශ්ව විද්‍යාල කිහිපයක ජ්‍යෙෂ්ඨ බාහිර කථිකාචාර්යවරයෙකි. ප්‍රසිද්ධ සම්මන්ත්‍රණවල නිතිපතා කථිකයෙකු වන අතර අධ්‍යක්ෂ මණ්ඩල පොත් කිහිපයක කතුවරයෙකි. ඔහු මෙරට සහ විදේශයන්හි ආයතනික නීතිය, බුද්ධිමය දේපළ නීතිය, වාණිජ බේරුම්කරණය, ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ පත්‍රිකා කිහිපයක් ද ඉදිරිපත් කර ඇත. උසාවිවල ක්‍රියාකාරී සේවයට සහ දේශනවලට අමතරව, ඔහු බොහෝ බේරුම්කරණ ආයතනවල උපදේශකයෙකු ලෙස කටයුතු කර ඇති අතර දේශීය හා ජාත්‍යන්තර බේරුම්කරණ ආයතන ගණනාවක එකම බේරුම්කරු, සම-බේරුම්කරු සහ සභාපති ලෙස සේවය කර ඇත. ආචාර්ය කබ්රාල් විසින් ප්‍රකාශයට පත් කරන ලද පොත් පහත දැක්වේ.

- සමාගම් නීතිය, ව්‍යුත්පන්නය (Derivative Actions): සන්සන්දනාත්මක ප්‍රවේශය
- ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපල නීතිය
- 2007 අංක 07 සමාගම් පනත හා ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත සමාගම් නීතිය
- ශ්‍රී ලංකාවේ සමාගම් අධ්‍යක්ෂවරුන්ගේ රාජකාරී හා ආයතනික පාලනය
- ශ්‍රී ලංකාවේ වාණිජ බේරුම්කරණය පිළිබඳ නීතිය සහ භාවිතය.
- කබ්රාල්ගේ බේරුම්කරණ නීති වාර්තා (වෙළුම I) [1895 - 2020]
- කබ්රාල්ගේ බුද්ධිමය දේපළ නීතිය වාර්තා (වෙළුම I) [1888 - 1995]
- කබ්රාල්ගේ බුද්ධිමය දේපළ නීතිය වාර්තා (වෙළුම II) [1995 - 2020]
- කබ්රාල්ගේ සමාගම් නීති වාර්තා (වෙළුම I) [1881 - 1982]
- කබ්රාල්ගේ සමාගම් නීති වාර්තා (වෙළුම II) [1983 - 1993]
- කබ්රාල්ගේ සමාගම් නීති වාර්තා (වෙළුම III ) [1994 - 2012]
- කබ්රාල්ගේ සමාගම් නීති වාර්තා (වෙළුම IV) [2013 - 2021]

**වත්මන් වෙනත් පත්වීම්**

ආචාර්ය කබ්රාල් ශ්‍රී ලංකා නීති කොමිසමේ සාමාජිකයෙකු වන අතර, ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ උපදේශක කොමිසමේ සාමාජිකයෙකු වන අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආයතනික පාලන පීඨයේ සහ ආයතනික පාලන කමිටුවේ සාමාජිකයෙකු වන අතර, පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනය සඳහා නාමයෝජිත සාමාජිකයෙකුද වේ. ආචාර්ය කබ්රාල් මහතා ශ්‍රී ලංකාවේ සිමෙන්ති සඳහා විශාලතම වෙළඳපොළ කොටස හිමි ටෝකියෝ සිමෙන්ති සමූහයේ සභාපතිවරයා ලෙස කටයුතු කරයි.

ආචාර්ය කබ්රාල් වර්තමානයේ විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස ඩිමෝ පීඑල්සී, හේලීස් පීඑල්සී, ඇලුමෙක්ස් පීඑල්සී, ටෝකියෝ සිමෙන්ති සමාගම (ලංකා) පීඑල්සී, ටෝකියෝ සුපර් සිමෙන්ති සමාගම ලංකා (පුද්ගලික) සීමිත, ටෝකියෝ සිමෙන්ති පවර් ලංකා (පුද්ගලික) සමාගම, ටෝකියෝ ඊස්ටර්න් සිමෙන්ති (පුද්ගලික) සමාගම, ටෝකියෝ සුපර් ඇග්‍රිගේට් (පුද්ගලික) සමාගම, ටෝකියෝ සුපර්මික්ස් (පුද්ගලික) සමාගම, චෙව්රොන් ලුබ්‍රිකන්ට්ස් ලංකා පීඑල්සී, සෙලින්කෝ ලයින් ඉන්ෂුවරන්ස් සමාගම (සීමිත) CCC-ICLP ජාත්‍යන්තර ADR මධ්‍යස්ථානය (ඇපකාර) සමාගම, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (ඇපකාර) සමාගම (SLIT), SLIT ජාත්‍යන්තර (පුද්ගලික) සමාගම, නැණ දිරිය (ඇපකාර) සමාගම (සභාපති) යන ආයතන වල සේවය කරන අතර විගණන කමිටු කිහිපයකල නාමයෝජනා කමිටු, වේතන කමිටු, අයකර ගැනීමේ කමිටු සහ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු යන කමිටු බොහොමයක සභාපතිත්වය දරයි.

**ප්‍රධාන පෙර පත්වීම්**

ආචාර්ය කබ්රාල් මහතා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (BOI) හිටපු සාමාජිකයෙකි.

ඔහු ශ්‍රී ලංකා ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානයේ ආරම්භක මණ්ඩල සාමාජිකයෙකු වූ අතර වත්මන් පනත වන 1995 අංක 11 දරන බේරුම්කරණ පනත කෙටුම්පත් කිරීමට සම්බන්ධ විය. ඔහු ශ්‍රී ලංකාවේ විශාලතම මූල්‍ය සමාගම්වලින් එකක් වන LOLC මූල්‍ය පීඑල්සී හි හිටපු සභාපතිවරයා විය. ඔහු සීමාසහිත LOLC රක්ෂණ සමාගම, සීමාසහිත වාණිජ කල්බදු සහ මූල්‍ය , රිචඩ් පීරිස් ඩිස්ට්‍රිබියුටර්ස් ලිමිටඩ් (ආර්පිකෝ සුපිරි වෙළඳසැල්), වර්ල්ඩ් එක්ස්පෝට් සෙන්ටර් ලිමිටඩ් සහ ඩාර්ලි ප්‍රොපර්ටි හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ද විය. ඔහු හැටන් නැෂනල් බැංකුවේ (HNB) හිටපු වැඩබලන සභාපතිවරයා ද විය. ඊට අමතරව, ආචාර්ය කබ්රාල් මහතා ශ්‍රී ලංකා යුනියන් බැංකුවේ ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු ද විය. ඔහු ජාතික වෙළඳ ප්‍රතිපත්තිය පිළිබඳ කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුවේ සාමාජිකයෙකු වූ අතර ශ්‍රී ලංකාවේ නීති ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පත් කරන ලද ජනාධිපති කොමිසමේ සාමාජිකයෙකු ද විය.

# අධ්‍යක්ෂ මණ්ඩලය



## ජූඩ් නිලුක්ෂන් මහතා

නිල බලයෙන් පත් කරන ලද අධ්‍යක්ෂ
ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂක

BIRMC BAC BHRRC

**පත්වීමේ දිනය**

2022 පෙබරවාරි 28

**කුසලතා හා විශේෂඥතාව**

ජූඩ් නිලුක්ෂාන් මහතා, රාජ්‍ය අංශයේ වසර 26 කට වැඩි පළපුරුද්දක් ඇති ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකි. දකුණු කොරියාවේ කියුං හී විශ්ව විද්‍යාලයෙන් ජාත්‍යන්තර වෙළඳාම සහ ආර්ථික සහයෝගීතාව පිළිබඳ පශ්චාත් උපාධියක් සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණ (රාජ්‍ය පරිපාලන) පිළිබඳ විශේෂ උපාධියක් ලබා ඇති නිලුක්ෂාන් මහතා, කීර්තිමත් දේශීය හා ජාත්‍යන්තර ආයතන සහ විශ්ව විද්‍යාල වලින් අයවැයකරණය සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුළුල් පුහුණුවක් සහ වෘත්තීය නිරාවරණයක් ලබා ඇත. ඔහු අවස්ථා කිහිපයකදී නිල නියෝජිත කණ්ඩායම්වල සාමාජිකයෙකු ලෙස ශ්‍රී ලංකාව නියෝජනය කර ඇත. ඔහු ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් රාජ්‍ය පරිපාලන සහතිකයක් සහ සාමාන්‍ය කළමනාකරණ සහතිකයක් ලබා ඇත.

**වත්මන් වෙනත් පත්වීම්**

ඔහු දැනට ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස පත් කර ඇත. ඔහුගේ වර්තමාන තනතුරට අමතරව, ඔහු ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ (SLIDA) පාලක මණ්ඩලයේ භාණ්ඩාගාරයේ ලේකම්වරයා ද නියෝජනය කරන අතර කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද විවිධ නිල කමිටු නියෝජනය කරයි. ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් ලෙස සේවය කරන අතරතුර, 2025 දී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද අතර 2022 දී තොරතුරු තාක්ෂණ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් ලෙස ද පත් කරන ලදී.

**ප්‍රධාන පෙර පත්වීම්**

ඔහුගේ රාජ්‍ය සේවා කාලය තුළ ඔහු ශ්‍රී ලංකා රේගුව සහ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ විවිධ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු හෙබවීය. ශ්‍රම වාසනා අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා ලෙසද ඔහු පත් කර ඇත. ලංකා විදුලිබල මණ්ඩලය (CEB), මූල්‍ය අධ්‍යයන ඇකඩමිය (MILODA), ශ්‍රී ලංකා ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC), ජාතික උද්භිද උද්‍යාන භාර අරමුදල, ස්වාධීන රූපවාහිනී ජාලය (ITN), සමුද්‍ර පරිසරය ආරක්ෂණ අධිකාරිය, පළාත් පාලන ණය මණ්ඩලය, ශ්‍රී ලංකා යොවුන් සේනාංකය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) සහ රාජ්‍ය සේවක අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමය (PSMPA) ඇතුළු ප්‍රධාන රාජ්‍ය ආයතන කිහිපයක පාලන ආයතනවල මහා භාණ්ඩාගාරය නියෝජනය කරයි. ඔහු ජාතික චිත්‍රපට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් කරන ලද සාමාජිකයෙකු ලෙස අගමැති විසින් පත් කර ඇත.



## එස් ආර් ඩබ්ලිව් එම් රුවන් පාලිත සත්කුමාර මහතා

නිල බලයෙන් පත් කරන ලද අධ්‍යක්ෂ
ස්වාධීන නොවන, විධායක නොවන අධ්‍යක්ෂ

BHRRC BNC BIRMC BITSC

**පත්වීමේ දිනය**

2023 මාර්තු 27

**කුසලතා සහ විශේෂඥතාව**

සත්කුමාර මහතා කැලණිය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් (Master of Economics) සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිතව කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධියක් [BSc Management (Special)] ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාවක් සහ වෘත්තිකයන් සඳහා වන ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාවක් ලබා ඇත. තවද, සත්කුමාර මහතා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් රාජ්‍ය ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාවක් ද ලබා ඇත. සත්කුමාර මහතා රාජ්‍ය අංශයේ වසර 26 කට වැඩි පළපුරුද්දක් සහිත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකි.

**වත්මන් වෙනත් පත්වීම්**

තැපැල්පති, තැපැල් දෙපාර්තමේන්තුව සහ සාමාජික, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල (PSPF).

**ප්‍රධාන පෙර පත්වීම්**

ශ්‍රී ලංකා පරිපාලන සේවා ආධුනික (SLAS Cadet) - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, සහකාර හිමිකම් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් - ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව, සහකාර ප්‍රාදේශීය ලේකම් - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ගනේවත්ත, සහකාර ප්‍රාදේශීය ලේකම් - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - උඩුබද්දාව, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) - ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ප්‍රාදේශීය ලේකම් - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ඉපලෝගම, අධ්‍යක්ෂ - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව (මහා භාණ්ඩාගාරය), නියෝජ්‍ය අධ්‍යක්ෂ/අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා රේගුව, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/අධ්‍යක්ෂ (ක්‍රීඩා සංවර්ධන) - ක්‍රීඩා අමාත්‍යාංශය, අතිරේක ලේකම් - ජනමාධ්‍ය අමාත්‍යාංශය, මන්නාරම ලුණු සමාගම (Mantai Salt Ltd) - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව (LRC) - කොමිෂන් සභා සාමාජික, කුසලතා සංවර්ධන අරමුදල (SDFL) - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, වැඩබලන සභාපති - ස්වාධීන රූපවාහිනී සේවය (ITN), අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - දූම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (NATA) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - සෙලසිනේ රූපවාහිනී ආයතනය.

# අධ්‍යක්ෂ මණ්ඩලය



## දුෂ්‍යන්ත බස්නායක මහතා

ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ

BITSC BAC BNC BHRRC

### පත්වීමේ දිනය

2023 මාර්තු 31

### කුසලතා හා විශේෂඥතාව

බස්නායක මහතා එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA-UK) සාමාජිකයෙකු (Fellow Member) සහ වරලත් ගෝලීය කළමනාකරණ ගණකාධිකාරිවරයෙකු (CGMA) වේ. ඔහු ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ සහතික ලත් සාමාජිකයෙකු වන අතර ශ්‍රී ලංකා වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ (Chartered Professional Managers) සාමාජිකයෙකු ද වේ. ඔහු එක්සත් රාජධානියේ ලන්ඩන් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ගෞරව උපාධියක් [BA (Honours)] සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් (PIM) විධායක ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධියක් (EMBA) ලබා ඇත. තවද, ඔහු එක්සත් රාජධානියේ කාඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයෙන් ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ නීතිපති උපාධියක් (LLM) ලබා ඇත. බස්නායක මහතා සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේ අර්නස්ට් ඇන්ඩ් යන්ග් (Ernst & Young) වරලත් ගණකාධිකාරී ආයතනයෙන් ගණකාධිකරණ ක්ෂේත්‍රයෙනි. ඔහු විවිධ රාජ්‍ය ආයතනවල සහ ආයතනික අංශයේ සමාගම්වල විධායක තනතුරු දරමින් වසර 36 කට වැඩි පුළුල් කුසලතා සහ පළපුරුද්දක් සහිත කළමනාකරණ උපදේශකවරයෙකි.

### වත්මන් වෙනත් පත්වීම්

සභාපති - ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව, NSB අරමුදල් කළමනාකරණ සමාගම, ආයු වෙන්චර්ස් (පුද්ගලික) සමාගම සහ මෙඩිමාර්කට් (පුද්ගලික) සමාගම.

### ප්‍රධාන පෙර පත්වීම්

කළමනාකාර අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, අධ්‍යක්ෂ - මූල්‍ය - ඇසෝසියේටඩ් පුවත්පත් සිලෝන් සමාගම, අධ්‍යක්ෂ - ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම.



## අශේන් ජයසේකර මහතා

ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ

BAC BIRMC BITSC

### පත්වීමේ දිනය

2024 ජනවාරි 9

### කුසලතා හා විශේෂඥතාව

අශේන් ජයසේකර මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු (FCA) එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු (FCMA) සහ එක්සත් රාජධානියේ බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේ සාමාජිකයෙකු (FBCS) වේ. ඔහු සිංගප්පූරු බේරුම්කරුවන්ගේ ආයතනයේ (Singapore Institute of Arbitrators) සාමාජිකයෙකු (AIArb) ද වේ. ඔහු ලන්ඩන් ගිල්ඩ්හෝල් විශ්වවිද්‍යාලයෙන් තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සහ දකුණු ක්වීන්ස්ලන්ත විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධියක් ලබා ඇත. තවද, ඔහු කාඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයෙන් තොරතුරු තාක්ෂණය සහ බුද්ධිමය දේපළ පිළිබඳ විශේෂඥතාව සහිත නීතිපති උපාධියක් (LLM) ලබා ඇත.

ජයසේකර මහතා සහතික ලත් අභ්‍යන්තර විගණකවරයෙකු (IIA-USA) සහතික ලත් වංචා පරීක්ෂකවරයෙකු (ACFE - USA) සහතික ලත් තොරතුරු පද්ධති විගණකවරයෙකු (ISACA - USA) සහ පරිගණක අනවසර ඇතුළුවීම් පිළිබඳ වෝහාරික පරීක්ෂකවරයෙකු [Computer Hacking Forensic Investigator – (EC Council – USA)] වේ.

ඔහුට අභ්‍යන්තර විගණනය, සයිබර් ආරක්ෂණය, වංචා පරීක්ෂණ, ආයතනික පාලනය, අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය යන ක්ෂේත්‍රවල වසර 22 කට වැඩි පළපුරුද්දක් ඇත. ඔහුගේ පළපුරුද්ද විවිධ අංශ හරහා පෞද්ගලික, ලැයිස්තුගත, බහුජාතික සහ රජයේ ව්‍යවසායයන් දක්වා විහිදේ. ඔහු බොහෝ වෝහාරික විගණනයන් (Forensic audits) අධීක්ෂණය කර ඇති අතර, බේරුම්කරණ විභාගවල සිට මහාධිකරණ නඩු දක්වා නීතිමය සහය ලබා දී ඇත. ඔහු ව්‍යවසාය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ IPPF මත පදනම් වූ අභ්‍යන්තර විගණන අත්පොත් සැකසීම සම්බන්ධයෙන් පළාත් පාලන සහ රජය සතු ව්‍යවසායයන් සඳහා උපදේශකයෙකු ලෙස කටයුතු කර ඇත. ඔහු ප්‍රමුඛ පෙළේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ විශ්වවිද්‍යාලවල බාහිර කථිකාචාර්යවරයෙකු වන අතර, ශ්‍රී ලංකාවේ උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලා සඳහා "වංචා සහ වෝහාරික ගණකාධිකරණය" විෂයයක් ලෙස හඳුන්වා දීම සහ ඉගැන්වීම සම්බන්ධයෙන් පුරෝගාමී මෙහෙවරක් ඉටු කර ඇත.

### වත්මන් වෙනත් පත්වීම්

බීඩීඕ පාර්ට්නර්ස් ශ්‍රී ලංකා (BDO Partners Sri Lanka) හි නියෝජ්‍ය කළමනාකාර හවුල්කරු සහ බීඩීඕ පාර්ට්නර්ස් (පුද්ගලික) සමාගමේ [BDO Partners (Pvt) Ltd] කළමනාකාර අධ්‍යක්ෂ. සභා සාමාජික - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, සාමාජික - ඇමරිකා එක්සත් ජනපදයේ සහතික ලත් වංචා පරීක්ෂකවරුන්ගේ සංගමයේ ගෝලීය උපදේශක සභාව (Global Advisory Council of the Association of Certified Fraud Examiners USA) සාමාජික - ඇමරිකා එක්සත් ජනපදයේ ඊසී කවුන්සිලයේ (EC Council USA) පරිගණක වෝහාරික පිළිබඳ ගෝලීය උපදේශක මණ්ඩලය.

### ප්‍රධාන පෙර පත්වීම්

බීඩීඕ මාලදිවයින (BDO Maldives) හි කළමනාකාර හවුල්කරු, බ්‍රිතාන්‍ය ටෙලිකොම් ග්ලෝබල් සර්විසස් [British Telecom Global Services (UK)] හි අනුබද්ධිත සමාගමක් වන බීටී කොමියුනිකේෂන් ලංකා (පුද්ගලික) සමාගමේ [BT Communication Lanka (Pvt) Ltd] අධ්‍යක්ෂ, බීඩීඕ බීපීඕ සර්විසස් (පුද්ගලික) සමාගමේ [BDO BPO Services (Pvt) Ltd] අධ්‍යක්ෂ, බීඩීඕ ප්‍රයිම් කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගමේ [BDO Prime Consultants (Pvt) Ltd] අධ්‍යක්ෂ, 2012/13 වසරේ ශ්‍රී ලංකා අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ (ඇමරිකා එක්සත් ජනපදයේ IIA Global ආයතනයට අනුබද්ධිත) සභාපති.

# අධ්‍යක්ෂ මණ්ඩලය



## රනිල් ගුණතිලක මහතා

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

BNC

**පත්වීමේ දිනය**

2025 ඔක්තෝබර් 23

**කුසලතා හා විශේෂඥතාව**

රනිල් ගුණතිලක මහතා (FCMA), එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) සාමාජිකයෙකි. ඔහු සිය වෘත්තීය ජීවිතය KPMG ශ්‍රී ලංකා ආයතනයෙන් ආරම්භ කළ අතර, පසුව හේකාබ් පීඑල්සී (Haycarb PLC) හි මූල්‍ය අංශයට සම්බන්ධ වී එහි මූල්‍ය අංශ කළමනාකරු (Divisional Manager - Finance) දක්වා උසස්වීම් ලැබීය. හේකාබ් ආයතනයේ සේවයෙන් පසු, 1998 වසරේදී ඔහු සිලෝන් බෲවරි පීඑල්සී (Ceylon Brewery PLC) ආයතනයට එහි මූල්‍ය පාලක (Financial Controller) ලෙස සම්බන්ධ විය. අනතුරුව 2004 අප්‍රේල් මාසයේදී ලයන් බෲවරි සිලෝන් පීඑල්සී (Lion Brewery Ceylon PLC) හි මූල්‍ය අධ්‍යක්ෂ ලෙස පත් කරන ලද අතර, 2023 දෙසැම්බර් මාසයේදී විශ්‍රාම ගන්නා තෙක් ඔහු එම තනතුර හෙබවීය.

ඔහු ප්‍රංශයේ INSEAD ආයතනයේ උපායමාර්ගික පිරිවැය කළමනාකරණය (Strategμc Cost Management) සහ ෆිලඩෙල්ෆියා හි වෝර්ටන් (Wharton) විශ්වවිද්‍යාලයේ උපායමාර්ග සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම (Formulating & Actioning Strategy) ඇතුළු විවිධ සාමාන්‍ය කළමනාකරණ විෂයයන් යටතේ මෙරට සහ විදේශයන්හිදී විධායක පුහුණුව ලබා ඇත.

**වත්මන් වෙනත් පත්වීම්**

වර්තමානයේ ඔහු ලයන් බෲවරි සිලෝන් පීඑල්සී (Lion Brewery Ceylon PLC) සහ පෙගසස් හොටෙල්ස් ඔෆ් සිලෝන් පීඑල්සී (Pegasus Hotels of Ceylon PLC) යන සමාගම්වල විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරන අතර, නමුණුකුල ප්ලාන්ටේෂන්ස් පීඑල්සී (Namunukula Plantations PLC) සහ සේලින්කෝ හෝල්ඩින්ග්ස් පීඑල්සී (Ceylinco Holdings PLC) යන සමාගම්වල ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරයි. තවද, ඔහු එම සමාගම්වල විගණන, අවදානම් සහ සම්බන්ධිත පාර්ශ්වයන් (Related Party) ඇතුළු විවිධ පාලන කමිටුවල ද සාමාජිකත්වය දරයි. ඔහු දිවයින පුරා පිහිටි සත්කාරක මධ්‍යස්ථාන 6ක් හරහා අසරණ දරුවන්ට නවාතැන් සහ රැකවරණය සපයන පුණ්‍යායතනයක් වන ළමා හා යොවුන් සුබසාධන ජාතික මණ්ඩලයේ (National Council for Child and Youth Welfare) මණ්ඩල සාමාජිකයෙකු ද වේ.

**ප්‍රධාන පෙර පත්වීම්**

ඔහු ලංකා වාණිජ මණ්ඩලයට අනුබද්ධ ශ්‍රී ලංකා අපනයනකරුවන්ගේ සංගමයේ (Exporters Association of Sri Lanka) ආසන්නතම හිටපු සභාපතිවරයා වේ.



## සුපුල් විජේසිංහ මහතා

ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

BAC BHRRC BNC

**පත්වීමේ දිනය**

2025 නොවැම්බර් 18

**කුසලතා හා විශේෂඥතාව**

සුපුල් විජේසිංහ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සහ කැලණිය විශ්වවිද්‍යාලයෙන් ගණකාධිකරණය හා මූල්‍ය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇති අතර, මේ වන විට සිය ආචාර්ය උපාධිය (PhD) සඳහා අධ්‍යයන කටයුතුවල නිරත වෙමින් සිටී. ඔහු එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු, එක්සත් රාජධානියේ වරලත් සහතික ලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ (ACCA) සාමාජිකයෙකු සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු ද වේ.

විජේසිංහ මහතාට විගණනය, ගණකාධිකරණය, අවදානම් කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, විශ්වාසනීය සුරක්ෂිතතාව (Fiduciary safeguards) ආයතනික සැලසුම්කරණය, ව්‍යාපාරික උපායමාර්ග, ආයතනික පාලනය, ව්‍යාපාරික පරිවර්තනය සහ උපායමාර්ගික ව්‍යාපාරික සන්ධාන යන ක්ෂේත්‍රයන්හි වසර 25කට වැඩි දේශීය හා ජාත්‍යන්තර පුළුල් පළපුරුද්දක් ඇත.

ආයතනික පාලන ක්ෂේත්‍රයේ පර්යේෂකයෙකු වන විජේසිංහ මහතා පර්යේෂණ ලිපි කිහිපයක් ප්‍රකාශයට පත් කර ඇති අතර, ඔහුගේ නවතම පර්යේෂණ පත්‍රිකාව වන්නේ "එක්සත් රාජධානියේ නියෝජිතායතන නීතිය පිළිබඳ විවේචනාත්මක විශ්ලේෂණයයි" (Critical Analysis of Agency Law of UK) උපායමාර්ගික කළමනාකරණය සහ චිත්තවේගීය බුද්ධිය (Emotional intelligence) පිළිබඳ ආයතනික පුහුණුකරුවෙකු ලෙස විජේසිංහ මහතා ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ පුහුණු වැඩසටහන් රාශියක් පවත්වා ඇත. ඔහු ICASL, ACCA, CIMA සහ CMA යන ආයතනවල වෘත්තීය ගණකාධිකරණ සිසුන් සඳහා සුපරීක්ෂකවරයෙකු සහ උපදේශකයෙකු ලෙස කටයුතු කරමින් ශ්‍රී ලංකාවේ ගණකාධිකරණ වෘත්තියේ වර්ධනයට දායක වී ඇත. විජේසිංහ මහතා සතු අධ්‍යක්ෂ මණ්ඩලීය කුසලතාව, උපායමාර්ගික දූරදක්නා නුවණ, නියාමන අවබෝධය සහ දේශසීමා ඉක්මවා ගිය නායකත්ව පළපුරුද්ද හේතුවෙන්, බැංකු හා මූල්‍ය අංශයේ ශක්තිමත් විගණන කටයුතු, අවදානම් කළමනාකරණය, ආයතනික පාලනය සහ තිරසාරත්වය මත පදනම් වූ වර්ධනය වෙනුවෙන් පෙනී සිටින වටිනා ස්වාධීන හඬක් බවට ඔහු පත්ව ඇත.

**වත්මන් වෙනත් පත්වීම්**

ඔහු පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව, ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය සහ SMB ෆයිනෑන්ස් පීඑල්සී (SMB Finance PLC) ඇතුළුව ලැයිස්තුගත සමාගම්වල මෙන්ම රාජ්‍ය අංශයේ සංවිධානවල අධ්‍යක්ෂ ධුර කිහිපයක් දරනු ලබයි. විජේසිංහ මහතා මෙම ආයතන කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වල සභාපතිත්වය දරා ඇති අතර, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව, තොරතුරු ආරක්ෂණ කමිටුව සහ සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු සමාලෝචන කමිටුව වැනි අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු පිළිබඳව ද පළපුරුද්දක් ඇත.

**ප්‍රධාන පෙර පත්වීම්**

විජේසිංහ මහතා සතු අසාමාන්‍ය සහ විවිධ අංශ කරා විහිදුණු වෘත්තීය ජීවිතය තුළ, ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් (PwC) ආයතනයේ විගණන සහ සහතික කිරීමේ කළමනාකරු (Audit and Assurance Manager) ලෝක බැංකුවේ මූල්‍ය කළමනාකරණ විශේෂඥ (Financial Management Specialist), විවිධ නිෂ්පාදන පෙළක් ඔස්සේ සිය පුළුල් නවෝත්පාදනයන් සඳහා ප්‍රසිද්ධ ඇමරිකානු බහුජාතික සම්මිශ්‍රිත සමාගමක් වන 3M ආයතනයේ මෙරට මූල්‍ය ප්‍රධානී (Country Finance Head) සහ කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත ආයතනයක් වන SMB ලීසිං පීඑල්සී (SMB Leasing PLC) හි ප්‍රධාන මූල්‍ය නිලධාරී (Chief Financial Officer) ඇතුළු දේශීය හා ජාත්‍යන්තර තනතුරු රැසක් හොබවා ඇත.

# අධ්‍යක්ෂ මණ්ඩලය



## රෝහණ බණ්ඩාර වීරකෝන් මහතා

වැඩ බලන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

**පත්වීමේ දිනය**

2026 මාර්තු 13

**කුසලතා හා විශේෂඥතාව**

බැංකු සහ මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 28කට අධික පුළුල් අත්දැකීම් සමුදායකින් හෙබි වීරකෝන් මහතා, වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත්වීමට ප්‍රථම එම බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන) ධුරයේ කටයුතු කළේය.

1998 වසරේදී බැංකුවට සම්බන්ධ වූ වීරකෝන් මහතා බැංකුවේ විවිධ මට්ටම්වල තනතුරු රැසක් හොබවා ඇත. භාණ්ඩාගාර මෙහෙයුම් (Treasury operations), ප්‍රාථමික ගනුදෙනුකාර කාර්යයන් (Primary dealer function), ශාඛා මෙහෙයුම්, පරිපාලනය සහ මානව සම්පත් සංවර්ධනය යන අංශයන්හි ගැඹුරු හා පුළුල් විශේෂඥතාවක් මෙන්ම කළමනාකරණ මට්ටමේ වැදගත් තනතුරු රැසක් දැරීම තුළින් ඉතා කෙටි කලක් තුළ සිය වෘත්තීය දිවියේ උච්චතම ස්ථානය කරා ළඟා වීමට ඔහුට හැකි විය.

ඔහු කැලණිය විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී (BCOM) උපාධියක් සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් (PIM) ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධියක් (MBA) ලබා ඇත. තවද, ඔහු ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ (APB) සහ ශ්‍රී ලංකා වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ (FCPM) සාමාජිකයෙකි. සිය සුහදශීලී පෞරුෂය තුළින් ඔහු නිරන්තරයෙන් කාර්ය මණ්ඩලයේ විශ්වාසය දිනාගත් අතර, විධායක නිලධාරීන්ගේ සංගමයේ ඔහු දැරූ හිටපු සභාපති ධුරය ඒ සඳහා මනා සාක්ෂියකි.

ඔහුගේ ප්‍රබල මෙහෙයුම් නික්ෂ්ණ බුද්ධිය, උපායමාර්ගික දැක්ම, මැනවින් ඔප්පු කරන ලද නායකත්ව ගුණාංග සහ හැකියාවන් සමඟ මුසු වූ කල්පනාකාරී, සංවේදී මෙන්ම සානුකම්පිත මානුෂීය ප්‍රවේශය, බැංකුවේ වර්තමාන සංක්‍රාන්ති අවධිය මෙහෙයවීමටත් එහි දිගුකාලීන වර්ධනය සහ ස්ථාවරත්වය තහවුරු කිරීමටත් මනා පිටුවහලක් වේ.



## අනුපමා මුහන්දිරම් මිය

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

**පත්වීමේ දිනය**

2016 දෙසැම්බර් 6
(2026 ජනවාරි 18 දක්වා)

**කුසලතා හා විශේෂඥතාව**

අනුපමා මුහන්දිරම් මහත්මිය ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරියක වන අතර, ඇය එක්සත් රාජධානියේ කාඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයෙන් නීතිපති උපාධියක් (LLM), මනිපාල් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධියක් (MBA) සහ ශ්‍රී ලංකා නීති අධ්‍යාපන සභාවෙන් බැංකු හා රක්ෂණ නීතිය පිළිබඳ නීතිඥ වෘත්තියෙන් පසු ලබන ඩිප්ලෝමාවක් (Post-Attorney Diploma) ලබා ඇත. මේ වන විට ඇය ශ්‍රී ලංකා වරලත් ආයතනික ලේකම්වරුන්ගේ ආයතනයේ (Chartered Corporate Secretaries of Sri Lanka) වෘත්තීය සුදුසුකම් සඳහා අධ්‍යයන කටයුතුවල නිරත වෙමින් සිටී.

2016 දෙසැම්බර් 6 වන දින ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස පත්වීමට ප්‍රථම, ඇය 2015 නොවැම්බර් සිට 2016 දෙසැම්බර් දක්වා අධ්‍යක්ෂ මණ්ඩල සහකාර ලේකම්වරිය ලෙස සේවය කළාය.

ඇය 2015 සිට 2017 දක්වා NSB ෆන්ඩ් මැනේජ්මන්ට් (NSB Fund Management Co Ltd) සමාගමේ සමාගම් ලේකම්වරිය ලෙස කටයුතු කර ඇති අතර, එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී (Entrust Securities PLC - ESP) හි කළමනාකරණ නියෝජිතයා ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුව කටයුතු කළ කාලය තුළ එම සමාගමේ සමාගම් ලේකම්වරිය ලෙස ද කටයුතු කළාය. බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 28ක පළපුරුද්දක් ඇති ඇය, වසර 17කට වැඩි කාලයක් මහජන බැංකුවේ ජ්‍යෙෂ්ඨ නීති නිලධාරිනියක සහ අධ්‍යක්ෂ මණ්ඩල සහකාර ලේකම්වරියක ලෙස සේවය කර ඇත.

මුහන්දිරම් මහත්මිය සබරගමුව විශ්වවිද්‍යාලයේ (වාණිජ නීතිය) සහ ලංකා පැසිෆික් ඒවියේෂන් (Lanka Pacific Aviation - ගුවන් ගමන් නීතිය සහ රෙගුලාසි) ආයතනයේ බාහිර කථිකාචාර්යවරියක ලෙස කටයුතු කරන අතර, ඇය ශ්‍රී ලංකාවේ බැංකු අධ්‍යක්ෂ මණ්ඩල/සමාගම් ලේකම්වරුන්ගේ සංගමයේ (Association of Board Company Secretaries of Banks in Sri Lanka) නිර්මාතෘ ලේකම්වරිය මෙන්ම ICT නීතිඥ සංගමයේ (ICT Lawyers Guild) සභා සාමාජිකාවක ද වේ. ඇය ඕස්ට්‍රේලියානු නීති ආයතනයක පුහුණුලාභිනියක ලෙස විදේශීය අත්දැකීම් ද ලබා ඇත.

## ඩබ්ලිව් එච් එම් ඩී බී විජේකෝන් මහතා


වැඩ බලන අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
නීතිඥ
2026 ජනවාරි 19 සිට බලාත්මකව

| | |
|---|---|
| **BIRMC**<br>අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු - සභාපති | **BIRMC**<br>අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු - සාමාජික |
| **BAC**<br>අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු - සභාපති | **BAC**<br>අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු - සාමාජික |
| **BHRRC**<br>අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා ප්‍රතිලාභ කමිටු - සභාපති | **BHRRC**<br>අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා ප්‍රතිලාභ කමිටු - සාමාජික |
| **BNC**<br>අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු - සභාපති | **BNC**<br>අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු - සාමාජික |
| **BITSC**<br>අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ ක්‍රමෝපාය කමිටු - සභාපති | **BITSC**<br>අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ ක්‍රමෝපාය කමිටු - සාමාජික |

# ආයතනික කළමනාකාරිත්වය



## ආයතනික කළමනාකාරිත්වය




**1** **රෝහණ බණ්ඩාර වීරකෝන් මහතා**

වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

**2** **කේ රවීන්ද්‍රන් මහතා**

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

**3** **ජී වී ඒ ඩී ඩී සිල්වා මෙය**

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(නම් කරන ලද)/නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(භාණ්ඩාගාර සහ ජාත්‍යන්තර)

**4** **ජී ඩබ්ලිව් ඊ ජයවීර මහතා**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විගණන)

**5** **එම් එන් ඒ ප්‍රනාන්දු මෙය**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පරිපාලන)

**6** **අජිත් අක්මීමන මහතා**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මූල්‍ය, සැලසුම් සහ කළමනාකරණ තොරතුරු
පද්ධති)/ප්‍රධාන මූල්‍ය නිලධාරී

**7** **ආර් ඒ එන් එන් විජේසිංහ මෙය**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මෙහෙයුම් සහ ශාඛා බැංකුකරණය)

**8** **අනුපමා මුහන්දිරම් මෙය**

වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති)

**9** **එල් සී සේනානායක මහතා**

වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(තොරතුරු තාක්ෂණ)

# විධායක කළමනාකාරිත්වය



සුජීත් ප්‍රනාන්දු මහතා
සහකාර සාමාන්‍යාධිකාරී

ඒ පී ආර් ද සොයිසා මහතා
ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරී

එච් එම් ජී පී ජේ හේරත් මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
(මෙහෙයුම්)

එස් එච් ඒ එස් කුමාරි මිය
සහකාර සාමාන්‍යාධිකාරී
(ණය අයකර ගැනීම්)

සී එන් ඒකනායක මිය
සහකාර සාමාන්‍යාධිකාරී
(නිපුණතා කළමනාකරණය)

එච් එම් එම් හේරත් මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
(තොරතුරු තාක්ෂණ)

කේ ඩී කේ කේ විජයවර්ධන මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
(මෙහෙයුම්)

එම් ඩී ටී පෙරේරා මිය
සහකාර සාමාන්‍යාධිකාරී
(අලෙවි)

# විධායක කළමනාකාරිත්වය



**ඩී එල් පී අබයසිංහ මහතා**
ප්‍රධාන විධායක නිලධාරී
(එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි)

**ඩබ්ලිව් පී යූ ඒ ද සිල්වා මිය**
සහකාර සාමාන්‍යාධිකාරී
(ආයතනික මූල්‍ය)

**ඩී එම් සී පී බී දිසානායක මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(මධ්‍යගත බැංකුකරණ පද්ධති)

**කේ බී එන් සී කුමාරි මිය**
සහකාර සාමාන්‍යාධිකාරී
(මූල්‍ය)

**එස් ඩබ්ලිව් ඒ විරසිංහ මිය**
සහකාර සාමාන්‍යාධිකාරී
(භාණ්ඩාගාර)

**එස් සිවසොරූපන් මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(තැපැල් බැංකු)

**අයි කේ එල් සසී මහේන්ද්‍රන් මිය**
අනුකූලතා නිලධාරී
(පින්තූරයේ නැත)

**එස් බී සුරංග මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(ශාඛා බැංකු)

**ඒ එල් ඒ හලීම් මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(මෙහෙයුම්)

**එම් ඩී සුරංජන මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(විගණන)

**ආර් පී ඒ එම් පී රාජනායක මිය**
ප්‍රධාන අවදානම් නිලධාරී

# ප්‍රධාන කළමනාකාරවරු

**ජේ එම් ඒ කේ ජයසිංහ මහත්මිය**
ප්‍රාදේශීය කළමනාකාර (බස්නාහිර 2)
ප්‍රාදේශීය කාර්යාලය (බස්නාහිර 2)

**එන් බහිර්තන් මහතා**
ප්‍රාදේශීය කළමනාකාර (උතුරු)
ප්‍රාදේශීය කාර්යාලය (උතුරු)

**එච් ඩී යූ සුසන්ත කුමාර මහතා**
ප්‍රාදේශීය කළමනාකාර (ඌව)
ප්‍රාදේශීය කාර්යාලය (ඌව)

**ඩී ඒ වී විජේලන්ත මහත්මිය**
ප්‍රාදේශීය කළමනාකාර (බස්නාහිර 1)
ප්‍රාදේශීය කාර්යාලය (බස්නාහිර 1)

**කේ සංජයන් මහතා**
ප්‍රාදේශීය කළමනාකාර (නැගෙනහිර)
ප්‍රාදේශීය කාර්යාලය (නැගෙනහිර)

**ආර් ටී සුබසිංහ මහතා**
ප්‍රාදේශීය කළමනාකාර (මධ්‍යම)
ප්‍රාදේශීය කාර්යාලය (මධ්‍යම)

**එච් එම් ජී හේරත් මහතා**
ප්‍රාදේශීය කළමනාකාර (සබරගමුව)
ප්‍රාදේශීය කාර්යාලය (සබරගමුව)

**එස් ජී එස් පී කේ පියරත්න මහතා**
ප්‍රාදේශීය කළමනාකාර (බස්නාහිර 3)
ප්‍රාදේශීය කාර්යාලය (බස්නාහිර 3)

**අයි එන් එස් ඒ නානායක්කාර මහතා**
ප්‍රාදේශීය කළමනාකාර (දකුණ 1)
ප්‍රාදේශීය කාර්යාලය (දකුණ 1)

**එච් එම් ආර් පුෂ්පකුමාර මහතා**
ප්‍රාදේශීය කළමනාකාර (වයඹ)
ප්‍රාදේශීය කාර්යාලය (වයඹ)

**අයි එස් ජයසූරිය මහතා**
ප්‍රාදේශීය කළමනාකාර (දකුණ 2)
ප්‍රාදේශීය කාර්යාලය (දකුණ 2)

**එස් එන් ආර් සේනාධීර මහතා**
ප්‍රධාන කළමනාකාර
ශාඛා කළමනාකරණ අංශය

**ඒ බී සී ආර් විජයපාල මහතා**
ප්‍රධාන කළමනාකාර
ණය පරිපාලන අංශය

**එම් වී ජී සුසිල් කුමාර මහතා**
ප්‍රධාන කළමනාකාර
ශාඛා කළමනාකරණ අංශය

**එම් ඩබ්ලිව් කේ සී ද සිල්වා මහතා**
ප්‍රධාන කළමනාකාර
ආයතනික මූල්‍ය අංශය

**ඩබ්ලිව් ඊ සී පෙරේරා මහත්මිය**
ප්‍රධාන කළමනාකාර
අවදානම් කළමනාකරණ අංශය

**ජේ එල් පී මංජුල මහතා**
ප්‍රධාන කළමනාකාර
සම්පාදන අංශය

**කේ සී නායානන්දන් මහත්මිය**
ශාඛා කළමනාකාර
යාපනය ශාඛාව

**ඒ එම් ජී අලහකෝන් බණ්ඩා මහතා**
ශාඛා කළමනාකාර
ගම්පහ ශාඛාව

**එන් ඩී සී ඩී කුලරත්න මහතා**
ශාඛා කළමනාකාර
මීගමුව ශාඛාව

**කේ වී ඩබ්ලිව් එස් දර්ශන මහතා**
ප්‍රධාන කළමනාකාර
(උකස් සහ මෙහෙයුම්)
ශාඛා කළමනාකරණ අංශය

**ටී ඒ ඩී එන් අනුරුද්ධි මහත්මිය**
ශාඛා කළමනාකාර
නුගේගොඩ ශාඛාව

**ඊ ඒ ආර් අබේසිංහ මහතා**
ප්‍රධාන කළමනාකාර
එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්

**ජී ඒ ඩී ගොඩමුල්ල මහත්මිය**
ප්‍රධාන කළමනාකාර
මුදල් හා සැලසුම් අංශය

**ඩබ්ලිව් එම් එම් ආර් පී පෙරේරා මහතා**
ප්‍රධාන කළමනාකාර
(ජාත්‍යන්තර බැංකු කටයුතු)
ජාත්‍යන්තර බැංකු අංශය

**ආර් එම් සී කේ රාජපක්ෂ මහතා**
ප්‍රධාන කළමනාකාර
තැපැල් බැංකු පරිපාලන අංශය

**ඒ ඩී ධර්මප්‍රිය මෙනවිය**
ප්‍රධාන කළමනාකාර (නීති)
මහනුවර ශාඛාව

**ඩබ්ලිව් ඒ යූ නන්දන මහතා**
ප්‍රධාන කළමනාකාර
ණය අංශය

**ඒ බී විමලදාස මහතා**
ශාඛා කළමනාකාර
මහරගම ශාඛාව

**ඩී ජී එස් ජයතිස්ස මහතා**
ශාඛා කළමනාකාර
බදුල්ල ශාඛාව

**එච් එල් එස් විජේසිංහ මහතා**
ප්‍රධාන කළමනාකාර (මුදල්)
මුදල් හා සැලසුම් අංශය

**ඊ ඒ ඒ චන්දිම මහතා**
ප්‍රධාන කළමනාකාර (පරිශ්‍ර)
පරිශ්‍ර අංශය

**බී එම් එම් සී කේ බස්නායක මහත්මිය**
ප්‍රධාන කළමනාකාර
(තොරතුරු තාක්ෂණ)
තොරතුරු තාක්ෂණ අංශය

**යූ ජී මල්ලිකා මහත්මිය**
ප්‍රධාන කළමනාකාර
(තොරතුරු තාක්ෂණ)
තොරතුරු තාක්ෂණ අංශය

**එස් තනීෂ්වරන් මහතා**
ශාඛා කළමනාකාර
වැල්ලවත්ත ශාඛාව

**බී ඒ පේමරත්න මහතා**
ප්‍රධාන කළමනාකාර
විගණන සහ විමර්ශන අංශය

**එම් ඩී ඒ පී ගුණතිලක මෙනවිය**
ප්‍රධාන කළමනාකාර
විද්‍යුත් බැංකු ඒකකය (E-banking Unit)

**කේ ජී රණසිංහ මහත්මිය**
ශාඛා කළමනාකාර
පානදුර ශාඛාව

**එච් පී ටී එස් ජයසූරිය මහතා**
ප්‍රධාන කළමනාකාර
ණය අයකර ගැනීමේ අංශය

**බී එල් ආර් මෙන්ඩිස් මහතා**
ප්‍රධාන කළමනාකාර (ආරක්ෂක)
ආරක්ෂක අංශය

**සී එස් ලියනපතිරණ මහතා**
ප්‍රධාන කළමනාකාර
(තොරතුරු තාක්ෂණ)
තොරතුරු තාක්ෂණ අංශය

# ආයතනික පාලනය

## සභාපතිතුමාගේ පණිවිඩය



ජාතික ඉතිරිකිරීමේ බැංකුවේදී, අපි ශක්තිමත් ආයතනික පාලනය, කල් පවතින කාර්ය සාධනය, ආයතනික ශක්තිය සහ අපගේ කොටස්කරුවන් අප කෙරෙහි තබා ඇති විශ්වාසය සඳහා මූලික සාධකයක් ලෙස සලකමු. සභාපතිවරයා ලෙස මගේ ධාරිතාවය තුළ, පාලනය නියාමන අනුකූලතාවයෙන් ඔබ්බට විහිදෙන බව මම විශ්වාස කරමි; එය ජාතික ඉතිරිකිරීම්වල විශ්වාසදායක භාරකරුවෙකු සහ ආර්ථික දියුණුවට දායක වන්නෙකු ලෙස බැංකුවට තම නියෝගය ක්‍රියාත්මක කිරීමට හැකි උපායමාර්ගික ලීවරයක් ලෙස සේවය කරයි.

ඩිජිටල් පරිවර්තනය, ඉහළ නියාමන පරීක්ෂාව සහ සමාජ-ආර්ථික මාරුවීම් මගින් හැඩගස්වන ලද ගතික සාර්ව ආර්ථික පරිසරයක් තුළ ක්‍රියාත්මක වන බැංකුව, ප්‍රතිචාරාත්මක, විනිවිද පෙනෙන සහ ඉදිරි දැක්මක් සහිත පාලන ව්‍යුහයන් සඳහා අවශ්‍යතාවය හඳුනා ගනී. අපගේ ප්‍රවේශය පැහැදිලිව ප්‍රකාශිත අරමුණක් තුළ පවතී: එනම් අඛණ්ඩතාව, වගවීම සහ මූල්‍ය විනය මත පදනම් වූ තීරණ හරහා පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා ඉදිරියට ගෙන යාම.

බැංකුවේ පාලන ගෘහ නිර්මාණ ශිල්පය පදනම් අංග හතරක් මත රඳා පවතී: අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යක්ෂමතාව, සදාචාරාත්මක හැසිරීමේ ප්‍රමුඛතාවය, ශක්තිමත් අවදානම් අධීක්ෂණයක් ක්‍රියාත්මක කිරීම සහ කොටස්කරුවන් සමඟ අර්ථවත් සම්බන්ධතාවයක්. 2025 වසර පුරාම, අධ්‍යක්ෂ මණ්ඩලය උපායමාර්ගික දිශාව මෙහෙයවීම, අවදානම් හූ දර්ශනය අධීක්ෂණය කිරීම සහ එහි විශ්වාසනීය රාජකාරි දැඩි ලෙස ඉටු කිරීම සඳහා ක්‍රියාකාරී භූමිකාවක් පවත්වා ගෙන ගියේය. මූල්‍ය මිනුම් සහ පුළුල් සලකා බැලීම් යන දෙකම ඇතුළත් සාකච්ඡා, අපගේ දිගුකාලීන අරමුණු සහ ජාතික සංවර්ධන අවශ්‍යතා සමඟ අනුකූලතාව සහතික කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය සහ විධායක කළමනාකාරිත්වය අතර අධිකාරිය පිළිබඳ පැහැදිලි අර්ථ දැක්වීමක් අඛණ්ඩව පවත්වා ගෙන යන අතර, දැනුවත් විවාදය, විනිවිදභාවය සහ බෙදාගත් වගකීම පිළිබඳ සංස්කෘතියක් ශක්තිමත් කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය, විශේෂඥතාව, ස්වාධීන විනිශ්චය සහ විවිධත්වය පිළිබඳ සමතුලිතතාවයක් පිළිබිඹු කරන අතර, වත්මන් මෙහෙයුම් පරිසරයේ සංකීර්ණතා ආමන්ත්‍රණය කිරීමට බැංකුව සන්නද්ධ කරයි.


පාලන ප්‍රමිතීන් පරිණාමය වීම අපේක්ෂාවෙන්, නැගී එන අපේක්ෂාවන් සපුරාලීමට බැංකුව ස්ථානගත වී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද සංශෝධිත ආයතනික පාලන උපදෙස් පිළිපැදීම ප්‍රමුඛතාවයක් ලෙස පවතී, අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමින් වගවීම ශක්තිමත් කිරීම, අවදානම් ප්‍රොටෝකෝල ශක්තිමත් කිරීම සහ අභ්‍යන්තර පාලන පද්ධති වැඩිදියුණු කිරීම. මීට අමතරව, අපගේ වාර්තාකරණයේ විනිවිදභාවය සහ විශ්වසනීයත්වය ශක්තිමත් කිරීමට සහ පාර්ශ්වකරුවන්ගේ සහතිකය පවත්වා ගැනීමට අදහස් කරන ප්‍රගතිශීලී පියවරක් වන SLFRS S1 සහ S2 තිරසාරභාවය හෙළිදරව් කිරීමේ ප්‍රමිතීන් අනුගමනය කිරීම සඳහා සූදානම් වීමේ මූලික කටයුතු බැංකුව ආරම්භ කර ඇත.

NSB හි, පාලනය විධිමත් ව්‍යුහයන්ට හෝ ලේඛනගත ප්‍රතිපත්තිවලට පමණක් සීමා නොවේ; එය ආයතනික සංස්කෘතිය තුළ අන්තර්ගත වේ. ඉදිරි පෙළ මෙහෙයුම්වල සිට ඉහළම මට්ටමේ නායකත්වය දක්වා, පැහැදිලිව ප්‍රකාශිත හැසිරීම් සංග්‍රහයන්, ප්‍රවේශ විය හැකි රහස් හෙළි කිරීමේ යාන්ත්‍රණයන් සහ උනන්දුව හෝ විෂමාචාර ගැටුම්වලට එරෙහිව ස්ථිර ස්ථාවරයක් හරහා ආචාර ධර්ම භාවිතය සඳහා කැපවීමක් වර්ධනය වේ. මෙම පාලන ආචාර ධර්ම අපගේ උපායමාර්ගික රාමුව සහ මෙහෙයුම් තීරණ තුළ ප්‍රගතිශීලී පාරිසරික, සමාජීය සහ පාලන (ESG) මූලධර්ම ඇතුළත් කිරීම තුළින් තවදුරටත් පිළිබිඹු වේ.

මෙම ඒකාබද්ධ වාර්ෂික වාර්තාව, පිටු අංක 440 සිට 468 දක්වා දක්වා ඇති සවිස්තරාත්මක අනුකූලතා ඇමුණුම් සමඟ, අපගේ පාලන රාමුවේ ප්‍රායෝගික යෙදුම පෙන්නුම් කරන අතර නියාමන නියෝග සහ ස්ථාපිත හොඳම භාවිතයන් සමඟ අඛණ්ඩව පෙළගැස්වීම තහවුරු කරයි. එය පාලන විශිෂ්ටත්වය, වගවීම සහ ප්‍රතිපත්තිගරුක නායකත්වය සඳහා අපගේ අඛණ්ඩ කැපවීම පිළිබඳ සාක්ෂියක් ලෙස පවතී.

ඉදිරිය දෙස බලන විට, අපගේ පාලන පිළිවෙත් අඛණ්ඩව වැඩිදියුණු කිරීම සඳහා අපි කැපවී සිටිමු. අපගේ ජාතික සන්දර්භය සහ වටිනාකම් තුළ මුල් බැස ගනිමින් ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් ඒකාබද්ධ කරමින් අපගේ රාමුව තක්සේරු කිරීම සහ පිරිපහදු කිරීම අපි දිගටම කරගෙන යන්නෙමු. අපගේ මෙහෙයුම් පුරා මෙම මූලධර්ම ශක්තිමත් කිරීමෙන්, ශ්‍රී ලංකාවේ සංවර්ධන ගමන් පථයට අපගේ දායකත්වය ශක්තිමත් කිරීම සහ ඔරොත්තු දෙන, ඇතුළත් අනාගතයක් නිර්මාණය කිරීමට සහාය වීම අපගේ අරමුණයි.

අපගේ පාලන රාමුවට පාදක වන මූලධර්ම කෙරෙහි ඔවුන්ගේ ස්ථිර කැපවීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ මගේ සගයන්ට, කළමනාකරණ කණ්ඩායමට සහ NSB හි සෑම සේවකයෙකුටම මගේ අවංක කෘතඥතාව පළ කරමි. විනිවිදභාවය, වගවීම සහ සදාචාරාත්මක හැසිරීම යන වටිනාකම්වලට විශ්වාසවන්තව සිටීමෙන්, ජාතික ඉතිරිකිරීමේ බැංකුව ආයතනික ස්ථාවරත්වයේ බලකොටුවක් ලෙස, පාලන විශිෂ්ටත්වය සඳහා මිණුම් ලකුණක් ලෙස සහ වඩාත් ඔරොත්තු දෙන සහ සියල්ල ඇතුළත් අනාගතයක් කරා ශ්‍රී ලංකාවේ ප්‍රගතිය ඉදිරියට ගෙන යාමේ විශ්වාසදායක හවුල්කරුවෙකු ලෙස දිගටම සේවය කරනු ඇතැයි මම විශ්වාස කරමි.




**ජනාධිපති නීතිඥ ආචාර්ය හර්ෂ කබරාල්**

සභාපති

2026 පෙබරවාරි 6

කොළඹ

## ආයතනික පාලනය




රූපය 20

### තිරසාර වටිනාකම් නිර්මාණය සඳහා අපගේ පාලන දර්ශනය

බැංකුවේ දී, අවංකභාවය, වගවීම, විනිවිදභාවය, සහ තිරසාරභාවය යන චිරස්ථායී මූලධර්මවල අපගේ පාලන දර්ශනය ගැඹුරින් මුල් බැසගෙන ඇත. අපි යහපාලනය අනුකූලතා විධානයක් ලෙස පමණක් නොසලකන අතර, පාර්ශවකාර විශ්වාසය පෝෂණය කිරීම සහ තිරසාර දිගුකාලීන වටිනාකම ලබාදීම සඳහා තීරණාත්මකව අපගේ මෙහෙයුම් ගොඩ නගන පදනමක් ලෙස එය සලකනු ලැබේ.

අවංකභාවය සහ වගවීම අපගේ පාලන ව්‍යවහාරවල සාදාචාරාත්මක පදනම සකස් කරයි. වර්යාව පිළිබඳ ඉහළම ප්‍රමිති සඳහා අපගේ කැපවීම පිළිබඳ අපි විශ්වාස කරන අතර අපගේ කොටස්හිමියන්ගේ, සේවකයින්ගේ, ගනුදෙනුකරුවන්ගේ ප්‍රජාවගේ සහ පරිසරයේ සාමූහික හිමිකම් වෙත අවංක, සාධාරණ හා අව්‍යාජ බැඳීමක් මගින් තීරණ මෙහෙයවන බව සහතික කරමු.

විනිවිදභාවය අපගේ සදාචාරාත්මක මූලධර්මවල අත්‍යවශ්‍ය කොටසකි. කාලීන, විවෘත සන්නිවේදනය හා අර්ථවත් අනාවරණ විශ්වාසය පෝෂණය කිරීමේ දී අත්‍යවශ්‍ය බවත්, එය සම්බන්ධතා වර්ධනය කරමින් ආයතනය තුළ විවෘත සංස්කෘතියත් පෝෂණය කරන බවත් අපි විශ්වාස කරමු.

තිරසාරභාවය යනු නොවැදගත් ප්‍රතිෂ්ඨාවක් නොවන අතර අපගේ පාලන ප්‍රවේශයේ කේන්ද්‍රයේ නියමු බලවේගය වේ. එය පාරිසරික බලපෑම අඩුකිරීමට, සමාජීය සමානතාව වර්ධනය කිරීමට සහ අප සේවය කරන ප්‍රජාවන්ට කල්පවත්නා ධනාත්මක දායකත්වයක් සිදු කිරීමට අපගේ කැපවීම ඉන් දැනුම් දෙන අතර වර්තමාන කටයුතු වඩාත් ඔරොත්තුදෙන සහ අන්තර්ගත අනාගතයක් සඳහා මඟ පෙන්වන බව සහතික කරයි.

මෙවැනි වටිනාකම් අපගේ පාලන ව්‍යවහාරවල සෑම අංගයකටම එකතු කරමින්, අපි නියාමන බැඳීම් ඉටු කිරීමට උත්සාහ කරන අතරම බැංකු ක්ෂේත්‍රය තුළ ප්‍රතිපත්තිගරුක අනාගතය දකින පාලනය සඳහා මිණුම්ලකුණක් නියම කිරීම ඉක්මවා යන්නෙමු.

### අප පාලනය කරන ආකාරය

(ප්‍රතිපත්තිය ඇ. 6, ඇ 7.1)

බැංකුවේ දී, පාලනය පිළිබඳ ඉහළම ප්‍රමිති කරා අපගේ නොසැලෙන බැඳීම, සදාචාර විශිෂ්ටත්වය, පුද්ගල හා ආයතනික අවංකභාවය තුළ මුල් බැසගත් සංස්කෘතියක් පෝෂණය කරන අපගේ උත්සාහයන්හී පිළිබිඹු කරයි. වගකීම්සහගත ආයතනික පුරවැසියෙක් ලෙස, අපි අදාළ නියාමනය විධානයන්, මනා පරිච පිළිබඳ ස්වේච්ඡා සංග්‍රහ සහ අපටම අයත් අභ්‍යන්තර ව්‍යවස්ථාපිත පාලන රාමු අපි උනන්දුවෙන් පිළිපදින්නෙමු.

# ආයතනික පාලනය

තිරසාර වටිනාකම් නිර්මාණය පෝෂණය කිරීම හා පාර්ශවකාර විශ්වාසය සවිබල ගැන්වීම සඳහා ශක්තිමත් ආයතන පාලනය අත්‍යවශ්‍ය බව අපි හඳුනා ගනිමු. විනිවිදභාවය, වගවීම සහ සදාචාර තීරණ ගැනීම පිළිබඳ මූලධර්ම මත පදනම් වී, අපගේ පාලන රාමුව වෙනස්වන නියාමන හා මෙහෙයුම් වාතාවරණයට ඔරොත්තු දීමට හා ප්‍රතිචාරාත්මකවීමට සැලසුම් කෙරේ.

මෙම කැපවීම සමඟ පෙළ ගැසෙමින්, අපගේ පාලන ව්‍යූහය පහත රාමු මගින් නියම කළ අනාවරණ අවශ්‍යතාවන්ට අනුකූල වේ.

## නියාමන රාමුව

- 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ එහි සංශෝධන
- 1988 අංක 30 දරන බැංකුකරණ පනත සහ එහි සංශෝධන
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා නිකුත් කර ඇති සියළු නියාමන, විශේෂයෙන් ආයතනික පාලනය පිළිබඳ 2024 අංක 05 දරණ බැංකු පනත් නියෝගය සහ එයට මහ බැංකුව විසින් පසුකාලීනව නිකුත්කළ සංශෝධන. (වැඩිදුර අනාවරණ සඳහා පිටු අංක 440 සිට 468)
- බලපත්‍රලාභී බැංකුවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති වෙනත් අනාවරණ අවශ්‍යතාවන්ට අනුකූලතාව (වැඩිදුර අනාවරණ සඳහා පිටු අංක 474 සිට 479)
- 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත සහ එහි සංශෝධන
- 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල පනත සහ එහි සංශෝධන
- 2022 අංක 09 දරණ පුද්ගලික දත්ත ආරක්ෂණ පනත
- ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසාය සඳහා ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සම්බන්ධව බැංකුවල අධ්‍යක්ෂවරුන් උදෙසා වන මාර්ගෝපදේශය

## බැංකුවට අදාල ස්වේච්ඡා නීති සංග්‍රහ

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ යහ පරිච සංග්‍රහය 2023 (වැඩිදුර අනාවරණ සඳහා පිටු අංක 469 සිට 473)

## අභ්‍යන්තර උපාංග

- අධ්‍යක්ෂ මණ්ඩලයේ හා අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල විෂය ක්ෂේත්‍රය
- සේවක ආචාර ධර්ම පද්ධතිය
- අධ්‍යක්ෂ මණ්ඩල ආචාර ධර්ම පද්ධතිය
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ප්‍රතිපත්ති හා මෙහෙයුම් ක්‍රියාපටිපාටි

## ස්වාධීන සහතික කිරීම තුළින් පාලනයේ අඛණ්ඩතාව සහතික කිරීම

බැංකුවේ බාහිර විගණක ලෙස සේවය කරන විගණකාධිපති ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති අවශ්‍යතාවන්ට අනුකූලව ආයතනික පාලනය පිළිබඳ 2024 අංක 05 දරණ බැංකු පනත් නියෝගයට අනුකූලව තත්ත්ව සහතිකය නිකුත් කර ඇත.

GRI 2-9


## පාලන ව්‍යූහය

බැංකුවේ දී, කෙටිකාලීන, මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන වටිනාකම නිර්මාණය කර දරා ගැනීමට බැංකුව සතු හැකියාව ශක්තිමත් කිරීමට අපගේ පාලන ව්‍යූහය සාකල්‍ය ලෙස ඉතා පරීක්ෂා සහිතව නිර්මාණය කර ඇත. පැහැදිලි වාස්තු විද්‍යාත්මක රාමුවකින් පදනම් වූ සහ ක්‍රියාපටිපාටිමය ශක්තියකින් මෙහෙයවන, එය ඵලදායී නායකත්වය, විස්තීර්ණ අධීක්ෂණය හා මෙහෙයුම් විශිෂ්ටත්වය සවිබල ගන්වයි.

මෙම රාමුවේ හරය වන්නේ බැංකුවේ උපායමාර්ගික දිශාව මෙහෙයවන සහ යහ පාලනය සහ ශක්තිමත් අභ්‍යන්තර පාලනයන් තුළින් පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම සහතික කරන අධ්‍යක්ෂ මණ්ඩලයයි.

බැංකුවේ ඒදිනෙදා මෙහෙයම් ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී වෙත පවරනු ලබන අතර, ඔහු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා කළමනාකාරිත්වය සහ එහි කමිටු මෙහෙයවනු ලැබේ. සෑම උපායමාර්ගික ව්‍යාපාරික ඒකකයක්ම පැහැදිලි නිශ්චිත අවදානම් සීමා තුළ ක්‍රියාත්මක වන අතර, මෙහෙයුම් තීරණ බැංකුවේ වඩාත් පුළුල් දැක්ම සහ දිගුකාලීන පරමාර්ථ සමඟ සම්පූර්ණයෙන්ම පෙළ ගැසෙන බව සහතික කරයි.

## ආයතනික පාලනය




රූපය 21

# ආයතනික පාලනය

## අධ්‍යක්ෂ මණ්ඩලය

(ප්‍රතිපත්තිය A.1, A.1.5, A.4 සහ A.10)

ඉහළම පාලන ආයතනය ලෙස, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ උපායමාර්ගික දිශානතිය නිශ්චය කිරීම, එහි සංස්කෘතිය හා වටිනාකම් හැඩගැස්වීම සහ සදාචාර හැසිරීම පිළිබඳ ඉහළම ප්‍රමිති නගා සිටුවීම තුළ අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය යහපත් අවදානම් කළමනාකරණය, මූල්‍ය අධීක්ෂණය සහ අනුප්‍රාප්තික සැලසුම් සහතික කිරීම සඳහා අවසාන වගකීම දරන අතර, ආයතනය අතර ව්‍යවසායකත්ව නායකත්ව සංස්කෘතියක් පෝෂණය කරයි.

විවිධ දෘෂ්ටිකෝණ එකම ස්ථානයකට ගෙනඑමින්, තිරසාර වටිනාකම නිර්මාණය ඇති කරන ආයතනික කළමනාකාරිත්වය සාධනීය ලෙස අභියෝගයට ලක් කිරීම මගින් අධ්‍යක්ෂ මණ්ඩලය සාකච්ඡාව සහ තීරණ ගැනීමේ තත්ත්වය වැඩි කරයි. අධ්‍යක්ෂවරුන් අතර පැහැදිලි රාජකාරි බෙදීමක් තුලනාත්මක පාලනය සුරක්ෂිත කරන අතර, තනි පුද්ගල සාමාජිකයෙකුගේ අනිසි බලපෑම වලක්වනු ලබයි.

1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ හා එහි සංශෝධනවල විධිවිධාන යටතේ ස්ථාපිත, අධ්‍යක්ෂ මණ්ඩලයේ බලය හා වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි සම්පූර්ණයෙන් විස්තර කෙරේ. එය බැංකුවේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය, මූල්‍ය ස්ථාවරත්වය සහ අභ්‍යන්තර පාලන පරිසරයේ ශක්තිය සඳහා ආයතනික කළමනාකාරිත්වය වගකියන බව සහතික කරයි.

විවෘත හා විනිවිද සංස්කෘතියක් මගින් අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකාරිත්වය අතර සම්බන්ධතාව විස්තර කරන අතර, සියලුම වැදගත් කරුණු සම්බන්ධයෙන් කාලීන හා අවංක සන්නිවේදනය සහතික කරයි. මෙම ඉදිරියට යන හා ගෞරවනීය අදහස් හුවමාරුව පාලනයේ තත්ත්වය වැඩිකර, වගකීම ශක්තිමත් කර, ඵලදායී හා මනාව දැනුවත් තීරණ ගැනීමට සහය වේ.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරයන් හා වගකීම්

(ප්‍රතිපත්තිය A. 1.2 සිට 1.7)

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉහළම පාලන ආයතනය ලෙස සේවය කරයි. එය උපායමාර්ගික නායකත්වය ලබාදීම, අධීක්ෂණය පවත්වා ගැනීම සහ දිගුකාලීන වටිනාකම නිර්මාණය සඳහා වගකීමට බැඳී සිටින අතර, පාර්ශ්වකරුවන්ගේ අයිතිවාසිකම් නගා සිටුවයි. එහි ප්‍රධාන වගකීම්වලට පහත දෑ ඇතුළත් වේ:

- **උපායමාර්ගික නායකත්වය හා සම්පත් වෙන් කිරීම:** බැංකුවේ දැක්ම, මෙහෙවර හා උපායමාර්ගික දිශානතිය සකස් කිරීමේ වගකීම හා ජාතික සංවර්ධන පරමාර්ථ සමඟ උපායමාර්ගික ප්‍රමුඛතා පෙළගැසීම අධීක්ෂණය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. බැංකුවේ දිගුකාලීන අරමුණුවලට සහයවීමට හා තරඟකාරී වාසිය පවත්වා ගැනීමට මූල්‍ය, මානව, සහ තාක්ෂණික සම්පත් ඵලදායී ආකාරයෙන් වෙන්කරන බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.
- **අවදානම් කළමනාකරණය හා මූල්‍ය අධීක්ෂණය:** අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ අවදානම් රුචිය තීරණය කරන අතර සිය අවදානම් කළමනාකරණ රාමුවේ ඵලදායීත්වය සහතික කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය කාර්යසාධනය නියාමනය කර, අයවැය හා ප්‍රාග්ධන සැලසුම් අනුමත කර අදාළ ගිණුම්කරණ ප්‍රමිති හා නියාමන මාර්ගෝපදේශවලට අනුකූලව මූල්‍ය වාර්තාකරණයේ අඛණ්ඩතාව සහතික කරයි.
- **පාලනය, අනුකූලතාව, සහ අභ්‍යන්තර පාලනය:** අධ්‍යක්ෂ මණ්ඩලය ශක්තිමත් අභ්‍යන්තර පාලනයන්, ශක්තිමත් අනුකූලතා යාන්ත්‍රණ, සහ සාදාචාර නායකත්වය තුළින් ඉහළම ආයතනික පාලන ප්‍රමිති පිළි ගනී. විනිවිදභාවය, වගවීම සමඟ සහ ව්‍යවස්ථාපිත හා නියාමන බැඳීම්වලට අනුකූලව තීරණ ගන්නා බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.
- **නායකත්වය, පත්කිරීම්, ඇගයීම, සහ අනුප්‍රාප්තික සැලසුම්කරණය:** සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් පත්කිරීම, ඔවුන්ගේ කාර්යසාධනය ඇගයීම, සහ බැංකුවේ උපායමාර්ගය ක්‍රියාවට නැංවීම සඳහා ඔවුන් මෙහෙයවීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. එමෙන්ම, නායකත්ව අඛණ්ඩතාව සහ ආයතනයේ ඔරොත්තුදීමට සහයවීම සඳහා අනුප්‍රාප්තික සැලසුම් ක්‍රියාවට නංවා ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.
- **පාර්ශවකාර සහභාගිත්වය හා පාලනයේ ඵලදායිතාවය:** විවෘත සන්නිවේදනය ප්‍රවර්ධනය හා විශ්වාසය සහ ලැදියාව පවත්වා ගැනීමට ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ සහභාගිත්වය මින් අදහස් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වෙනස්වන වාතාවරණයන්ට පාලන ව්‍යූහයන් ඵලදායීව, අදාළව හා ප්‍රතිචාරාත්මකව පවතින බව සහතික කිරීමට අඛණ්ඩවම එයට අයත් කාර්යසාධනය සහ සිය කම්ටුවල ඇගයීමට ලක් කරනු ලබයි.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ විධිවිධාන හා එහි සංශෝධනවලට අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන් හතකින් සමන්විත වන අතර, ඒ සෑම කෙනෙක්ම තමන්ට අදාළ ක්ෂේත්‍රයෙහි ප්‍රවීන වෘත්තිකයින් වේ. මෙම සංයුතිය තුළින් දැනුම් සම්භාරයක් හා සියලුම සාකච්ඡාවන්වලදී ස්වාධීන විනිශ්චයන් සහතික කරයි. සභාපති අධ්‍යක්ෂ මණ්ඩලය මෙහෙයවීම සඳහා සමස්ත වගකීම දරන අතර සිය අධීක්ෂණ කාර්යයන් මුදා හැරීමේදී එහි ඵලදායීත්වය සහතික කරයි.

2025 දෙසැම්බර් 31 දිනට, අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරු හතකින් සමන්විත වූ අතර, සෑම අධ්‍යක්ෂවරයෙක්ම අධ්‍යක්ෂ මණ්ඩල සාකච්ඡා සඳහා සැලකියයුතු ප්‍රවීණතාව ගෙන එනු ලබයි. මෙයින්, දෙදෙනෙක් ස්වාධීන නොවන විධායක අධ්‍යක්ෂවරුන් වන අතර, ඉතිරි දෙදෙනා ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙති. සුදුසුකම් සහ ප්‍රවීණතා ක්ෂේත්‍රය ඇතුළුව විස්තර පැතිකඩ 220 සිට 224 දක්වා පිටුවල දැක්වේ. අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු සම්බන්ධ තොරතුරු 237 පිටුවේ දැක්වේ.

## අධ්‍යක්ෂ මණ්ඩල නිපුණත්වය හා ප්‍රවීණතාව පිළිබඳ විවිධත්වය

(ප්‍රතිපත්තිය A. 10.1)

බැංකුවේ දී, මනාව සමබර හා ඉහළ කුසලතාවයකින් යුත් අධ්‍යක්ෂ මණ්ඩලයක් ශක්තිමත් පාලනයක් සහ උපායමාර්ගික වටිනාකම් නිර්මාණයක් සඳහා මූලික වන බව අපි හඳුනා ගනිමු. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමූහික ප්‍රවිනතාව, තාක්ෂණික දැනුම, ක්ෂේත්‍රයේ තීක්ෂ්ණ බුද්ධිය, නායකත්ව අත්දැකීම් සහ විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් පොහොසත් සම්මිශ්‍රණයක් ඇතුළත් වන අතර, එමඟින් බැංකුව සංකීර්ණත්වයන් හඹායාමට සහ නැඟී එන අවස්ථාවන් විශ්වාසයෙන් ග්‍රහනය කර ගැනීමට හැකියාව ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතියෙන් ව්‍යක්තීමය පසුබිම්, දක්ෂතාවයන් සහ කාලසීමාවන් පිළිබඳ ප්‍රශස්ත මුසුවක් සහතික කිරීමේ පරීක්ෂාකාරී උත්සාහයක් පිළිබිඹු කරයි. අධ්‍යක්ෂවරු බැංකුකරණය, මූල්‍ය, ආර්ථික විද්‍යාව, නීතිය, උපායමාර්ගික සැලසුම්කරණය, අවදානම් කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, සයිබර් ආරක්ෂාව, ජාත්‍යන්තර සම්බන්ධතා සහ පොදු ප්‍රතිපත්ති ඇතුළුව විවිධ පරාශයක ගැඹුරු දැනුමක් ලබා දේ.


මෙම පුළුල් දැනුම ශක්තිමත් අධීක්ෂණය ලබාදීමට, උපකල්පනයන්ට හිතකරව අභියෝග කිරීමට සහ අන්තර්ඥානය සහ පූර්ව දර්ශනය සමඟ බැංකුවේ උපායමාර්ගික වැඩසටහන මෙහෙයවීමට අධ්‍යක්ෂ මණ්ඩලය සවිබල ගන්වයි. පාලනයේ ඉහළම ප්‍රමිති නගා සිටුවීම, යහපත් විනිශ්චයන් පෙන්වාදීම, හා සදාචාර නායකත්වය හා වගවීමේ සංස්කෘතියක් පෝෂණය කිරීමට අවශ්‍ය ජාත්‍යන්තර තික්ෂණභාවය අත් කර ගැනීම අධ්‍යක්ෂවරුන්ගෙන් අපේක්ෂා කෙරේ.

විවිධත්වය සහ බහුවිනය යන දෙකම අයත් අධ්‍යක්ෂ මණ්ඩලයක් පවත්වා ගැනීම මගින්, බැංකුව නියාමන ඉල්ලීම්, ක්ෂේත්‍රයේ විතැන්වීම්, පාර්ශවකාර අපේක්ෂාවන් සහ දිගු කාලීන උපායමාර්ගික විධානයන්ට ප්‍රතිචාර දැක්වීමට මනාව ස්ථානගත වී ඇති බව සහතික කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ සුදුසුකම්, කුසලතා, අනෙකුත් වැදගත් තනතුරු සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල සාමාජිකත්වය ඇතුළු තොරතුරු පිටු අංක 220 සිට 224 දක්වා වන පිටුවල ඇතුළත් වේ.

## ආයතනික පාලනය

GRI 405-1




### අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාවලිය

(ප්‍රතිපත්තිය A. 1.3, A. 1.4, A. 1.6, A. 1.7, A. 3.1 සහ A. 6)

ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත අනුකූලව, ස්ථාපිත වාර්ෂික රැස්වීම් දින දර්ශනයක් මගින් මෙහෙයවන අවම වශයෙන් සති හයකට වරක් අධ්‍යක්ෂ මණ්ඩලය කැඳවනු ලැබේ.

උපලේඛණගත සැසි අතර ඇතිවන කාල සංවේදී කරුණු හෝ උපායමාර්ගික ප්‍රමුඛතා විසඳීමට අවශ්‍ය පරිදි අමතර රැස්වීම් පවත්වනු ලැබේ. අධ්‍යක්ෂවරු සාකච්ඡාවන් තුළ සිය නිරන්තර පැමිණීම හා සක්‍රියව දැනුවත් දායකත්වය තුළින් ශක්තිමත් සහභාගිත්වය අනුරූපව පෙන්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා පැමිණුම පිළිබඳ විස්තර පිටු අංක 237 හි දැක්වේ.

අධ්‍යක්ෂවරුන් යහපත් හා මනාව දැනුවත් තීරණ ගැනීමට හැකියාව ඇතිකරන කාලීන, නිවැරදි, සහ අදාළ තොරතුරුවලින් සන්නද්ධ බව සහතික කිරීමට බැංකුව සතුව විස්තීර්ණ හා මනාව ව්‍යුහගත වැඩසටහන් සකසන ක්‍රියාවලියක් ඇත. මෙම ක්‍රියාවලිය සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සමඟ සහයෝග යෙන් සභාපතිවරයා විසින් මෙහෙයවනු ලබන අතර, උපායමාර්ගික මූලපිරීම්, තිරණාත්මක ව්‍යාපාර කරුණු හා අධීක්ෂණ වගකීම් සාකච්ඡා කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් වෙන් කර ඇති බව සහතික කරයි. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට සමහර අයිතම සාකච්ඡාව සහ තීරණ ගැනීම සඳහා න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට ඉල්ලා සිටිය හැකිය.

විවෘත සාකච්ඡා, හිතකර අභියෝග කිරීම් සහ සහයෝගී තීරණ ගැනීම් සහිත පරිසරයක් පෝෂණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පරිස්සමින් සැලසුම් කරනු ලබයි. සලකා බැලීම සඳහා න්‍යාය පත්‍ර අයිතම යෝජනා කිරීමට අධ්‍යක්ෂවරු දිරිගන්වනු ලබන අතර, ඒ තුළින් අන්තර්ගත සහ හුවමාරු වගවීම පිළිබඳ සංස්කෘතියක් ශක්තිමත් කෙරේ.

පුළුල් සහය පත්‍රිකා මගින් සමන්විත රැස්වීම් න්‍යාය පත්‍ර රැස්වීමට සතියකට පෙර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතර විද්‍යුත් මාධ්‍යයෙන් බෙදා හරිනු ලබන අතර, ඉන් සමාලෝචනය හා සූදානම්වීම සඳහා ප්‍රමාණවත් කාලය අධ්‍යක්ෂවරුන්ට ලබා දේ.

විශේෂ අවස්ථාවලදී, තීරණාත්මක සංවර්ධනයන්ට කාලීන ප්‍රතිචාර සඳහා පහසුකම් සැලසීමට කෙටි දැනුම්දීමකින් හදිසි අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කරනු ලැබේ, නැත්නම් රැස්වීම් අතරතුර සභාගත කිරීම සිදු කෙරේ. සියලුම සාකච්ඡාවන් හා තීරණ විස්තරාත්මක වාර්තාවල ඇතුළත් කරන අතර එය ආරක්ෂිතව පවත්වා ගෙන යමින් අධ්‍යක්ෂවරුන්ට පහසුවෙන් පිවිසීමේ හැකියාව ඇති කරයි, ඒ තුළින් විනිවිදභාවය අඛණ්ඩතාව සහ ආයතනික මතකයට සහය වේ.

GRI 2-15

### බැඳියා පිළිගැටුම

(ප්‍රතිපත්තිය A. 5.5, සහ A. 10.1)

ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත හා 2004 අංක 05 දරණ (සංශෝධිත) ආයතනික පාලන නියෝගය මගින් පුද්ගලික ලාභය හෝ වෙනත් අයට අවිධිමත් ලාභය සඳහා සිය තනතුර හෝ රහසිගත තොරතුරු අවභාවිතය පැහැදිලිව වලක්වමින් අධ්‍යක්ෂවරුන්ගේ විශ්වාසවන්තභාවය පිළිබඳ වගකීම් ස්ථාපිත කරයි.

විශේෂිත ව්‍යාපාරික කරුණු සම්බන්ධයෙන් සැබෑ හෝ වියහැකි බැඳියා පිළිගැටුමක් පිළිබඳව අධ්‍යක්ෂවරුන් වහාම අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කළ යුතුය. යම් අධ්‍යක්ෂවරයෙකුට යම් කාරණයක් සම්බන්ධයෙන් පෞද්ගලික හෝ ව්‍යාපාරික අභිලාෂයක් ඇත්නම්, අදාළ අධ්‍යක්ෂවරයා ඊට අදාළ සාකච්ඡාවට සහභාගී වීමෙන් හෝ තීරණ ගැනීමෙන් වැළකී සිටිය යුතුය. එම කරුණ පිළිබඳ සාකච්ඡාවන් හෝ තීරණ යන අතරතුර රැස්වීමෙන් ඉවත්වීම හා මෙය සම්බන්ධ වේ.

න්‍යාය පත්‍රයේ ඇතුළත් වන සහ ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් රැස්වීම් වාර්තාවට ඇතුළත් කරන ලද කිසියම් කරුණක් සම්බන්ධයෙන් කිසියම් බැඳියා පිළිගැටුමක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සඳහා සම්මත න්‍යාය පත්‍ර අයිතමයක් ඇතුළත් කර ඇත. වර්ෂය තුළ බැඳියාවන් තුළ යම් වෙනස්වීම ඒ වෙනුවෙන් සංශෝධිත හිමිකම් ප්‍රකාශයක් සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය.

බැංකුව හා එහි සම්බන්ධිත පාර්ශව අතර සිදුවන ගනුදෙනු විනිවිදභාවය පිළිබඳ ප්‍රතිපත්ති මත පදනම්ව ඇති බවත් එවැනි සම්බන්ධිත පාර්ශ්ව අතර සිදුවන ගනුදෙනු වලදී බැඳියා පිළිගැටුම වැළැක්වෙන බව හා අවශ්‍ය මඟ පෙන්වීම සැපයෙන බව සහතික වනු පිණිස බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආශ්‍රිත පාර්ශව අතර ගනුදෙනු පිළිබඳ ප්‍රතිපත්තියක් ස්ථාපිත කරනු ලැබ ඇත. අධ්‍යක්ෂවරුන් වෙත සපයන ලද ඕනෑම බැංකුකරණ පහසුකමක් මහ බැංකුව විසින් සිදු කරන ලද බලය පැවරීම හා අනුකූල වේ. 2025 වර්ෂය තුළ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් අංක 49.2.2 හි දක්වා ඇති පරිදි හැර බැංකුව හෝ එහි පරිපාලිත සමාගම් විසින් අත්සන් තබන ලද කිසිදු කොන්ත්‍රාත්තුවක් හෝ විධිවිධානයක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් කිසිවෙකුට සැලකිය යුතු අභිලාෂයක් නොමැත.

# ආයතනික පාලනය

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

(ප්‍රතිපත්තිය A. 1.1 සහ A. 10.1)

2025 වර්ෂය තුළ, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 15 ක් පෙර සැලසුම් කරන ලද පරිදි පැවැත් වූ අතර, එම රැස්වීම් වලට අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම පිළිබඳ විස්තර වගුව 24 හි දැක්වේ, ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව අවම වශයෙන් සෑම සති 6කට වරක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වෙන අතර, විශේෂ රැස්වීම් අවශ්‍යතාව අනුව පවත්වනු ලැබේ. ඉන්ධන අර්බුදය හා නැගී එන ව්‍යාපාරික ප්‍රමුඛතා ආදියෙන් පසු මාර්ගගත රැස්වීම්වලට මාරුවීම වැනි වෙනස්වන වාතාවරණයන්ට ප්‍රතිචාර දැක්වීමට අනුවර්තනය හා නම්‍යශීලී වීමේ අවශ්‍යතාව බැංකුව හඳුනා ගන්නා අතර, බැංකුවේ ප්‍රධාන ගැටළු අඛණ්ඩව නියාමනය හා අධීක්ෂණය සහ බැංකුවට වියහැකි අවදානම් කළමනාකරණය කර ගැනීම සහතික කරයි.

තිරසාර වටිනාකම් නිර්මාණය හඹා යාමේදී, සුවිශේෂී කාලය කැපකරමින් බැංකුවේ උපායමාර්ගික දිශානතිය මෙහෙයවීමේදී සහ 2026 සිට 2028 දක්වා කාලසීමාව සඳහා බැංකුවේ තෙවර්ෂ උපායමාර්ගික ව්‍යාපාර සැලැස්ම සකස් කිරීම සඳහා ආයතනික කළමනාකාරිත්වයට අවශ්‍ය මගපෙන්වීම ලබාදෙමින් අධ්‍යක්ෂ මණ්ඩලය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. බැංකුවේ දිගු කාලීන දැක්ම හා උපායමාර්ගික ප්‍රමුඛතාවන් පිළිබිඹු කරන මෙම සැලැස්ම දැඩි ඇගයීමකට ලක් කළ අතර ඉන් පසුව අධ්‍යක්ෂ මණ්ඩලයේ විධිමත් අනුමැතිය ලබාගෙන ඇත.

වසර පුරාම, අධ්‍යක්ෂ මණ්ඩලය උපායමාර්ගික ව්‍යාපාර සැලැස්ම ඵලදායිව ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය තුළ සක්‍රියව සහභාගි වී ඇත. එය කාර්යසාධන ප්‍රතිඵල සම්පව නියාමනය කර, නිශ්චිත සන්ධිස්ථානවලට අනුව ප්‍රගතිය තක්සේරු කිරීම සහ උපායමාර්ගික යෙදවුම් ලබා දී ඇති අතර ඒ තුළ මතුවන අභියෝග හා අවස්ථාවලට ප්‍රතිචාර දැක්වීමට නැවත ක්‍රමාංකණය අවශ්‍ය වේ.

බැංකුවේ ද්‍රවශීලතාවය හා ප්‍රාග්ධනය ඵලදායීව කළමනාකරණය කිරීමේ අවශ්‍යතාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරන්තරයෙන් අවධාරණය කරන ලදී. බැංකුවේ උපායමාර්ගික පරමාර්ථ අනුව එහි කාර්යසාධනය ඇගයීම, ප්‍රගතිය සමාලෝචනය කිරීමට ප්‍රමාණවත් කාලය වෙන් කිරීම සහ වඩාත් පරීක්ෂාව අවශ්‍ය විශේෂ පරීක්ෂණ අවශ්‍ය ක්ෂේත්‍ර කෙරෙහි මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලින් අවධානය යොමු කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය ණයවල තත්ත්වය, උවදුරට පත්වන ක්ෂේත්‍රයන් හී අවදානම් නිරාවරණය දැඩිව හඹායාම, හානිකරණ ව්‍යවහාරවල ඵලදායිත්වය ත්කසේරු කිරීම, අවදානම් පැතිකඩ නියාමනය සහ ගැටළුසහගත ණය කළමනාකරණය පිළිබඳ සිය අධීක්ෂණය තියුණු කර ඇත.

සාකච්ඡාවන් අවදානම් කළමනාකරණය, අනුකූලතාව හා පාලනය දක්වා පුළුල් වූ අතර ඒ තුළ අධ්‍යක්ෂ මණ්ඩලය යහපත් අධීක්ෂණය, සදාචාර චර්යාව, සහ නියාමන පිළිපැදීම සඳහා සිය කැපවීම තවදුරටත් නගා සිටුවන ලදී. මෙවැනි සාමූහික උත්සාහයන් බැංකුවේ මෙහෙයුම් ඔරෝත්තු දීම, උපායමාර්ගික පෙළ ගැසීම සහ පාර්ශවකාර විශ්වාසය ශක්තිමත් කිරීමේ දී අත්‍යවශ්‍ය විය.

### 2025 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වල සංයුතිය සහ පැමිණීම[LA]

| අධ්‍යක්ෂවරයාගේ නම | පත්වූ දිනය | වයස | අධ්‍යක්ෂ තත්ත්වය | සහභාගී වූ/සහභාගී වීමට සුදුසුකම් ඇති | | | | | | අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි කාලසීමාව (අවු.) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව | අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත හා පාරිතුම්ක කමිටුව | අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව | අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව | අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපාය මාර්ගික කමිටුව | |
| **ජනාධිපති නීතිඥ ආචාර්ය හර්ෂ කබ්රාල්**<br>සභාපති | 2 මැයි 2023 | 66 | NED/NID | 15/15 | – | – | – | – | – | 2+ |
| **ජූඩ් නිලක්ෂන් මහතා**<br>අධ්‍යක්ෂ (නිල බලයෙන්) | 28 පෙබරවාරි 2022 | 56 | NED/NID | 13/15 | 13/14 | 12/13 | 7/7 | 5/7 | – | 4+ |
| **එස් ආර් ඩබ්ලිව් එම් රුවන් පාලිත සත්කුමාර මහතා**<br>අධ්‍යක්ෂ (නිල බලයෙන්) | 27 මාර්තු 2023 | 55 | NED/NID | 14/15 | – | 13/13 | 8/8 | 7/7 | 11/12 | 2+ |
| **දුෂ්‍යන්ත බස්නායක මහතා**<br>අධ්‍යක්ෂ | 31 මාර්තු 2023 | 62 | NED/NID | 15/15 | 12/14 | 0/1 | 8/8 | – | 12/12 | 2+ |
| **අශේන් ජයසේකර මහතා**<br>අධ්‍යක්ෂ | 9 ජනවාරි 2024 | 47 | NED/NID | 14/15 | 13/14 | 11/12 | – | 6/7 | 10/12 | 2+ |
| **ශලනි පීරිස් මෙනෙවිය**<br>අධ්‍යක්ෂ<br>(2025 නොවැම්බර් 24 වන දින සිට ඉල්ලා අස්වන ලදී) | 8 සැප්තැම්බර් 2025 | 53 | NED/ID | 3/3 | – | – | – | – | – | <1 |
| **කුසල් ජයවර්ධන මහතා**<br>අධ්‍යක්ෂ<br>(2025 නොවැම්බර් 21 වන දින සිට ඉල්ලා අස්වන ලදී) | 8 ඔක්තොම්බර් 2025 | 51 | NED/ID | 2/2 | – | – | – | – | – | <1 |
| **රනිල් ගුණතිලක මහතා**<br>අධ්‍යක්ෂ | 23 ඔක්තොම්බර් 2025 | 62 | NED/ID | 2/4 | – | – | 1/1 | – | – | <1 |
| **සුපුල් විජේසිංහ මහතා**<br>ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ (2025 නොවැම්බර් 20 වන දින සිට) | 18 නොවැම්බර් 2025 | 48 | NED/ID | 4/4 | 4/4 | 1/1 | 1/1 | – | – | <1 |

NED - විධායක නොවන අධ්‍යක්ෂ NID - ස්වාධීන නොවන අධ්‍යක්ෂ ID - ස්වාධීන අධ්‍යක්ෂ – 2025 දෙසැම්බර් 31 වන දිනට සභාපති

වගුව 24

ආයතනික පාලනය

## අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු

(ප්‍රතිපත්තිය A. 7.1 සිට A. 7.3, A. 7.5 සහ/හෝ, A. 7.6, B2, D.3 - D.5)

ස්වාධීන විනිශ්චයක් පෝෂණය කිරීම, නිසි බලතුලනයක් පවත්වා ගැනීම සහ රාජකාරි ඵලදායීව ඉටු කිරීම සඳහා බලතල බෙදා හැරීම උපකාර වන බව සහතික කරමින් සුදුසු යැයි හැඟෙන පරිදි කමිටු වෙත සිය බලතල, අභිමතයන් සහ අධිකාරිය පැවරීමට සිය ප්‍රඥප්තිය තුළ දක්වා ඇති පරිදි, අධ්‍යක්ෂ මණ්ඩලයට බලය ඇත. මෙම බෙදාහැරීම තුළින් උපායමාර්ගික, ඉදිරිය දකින මූලපිරීම්වලට වඩාත් කාලය කැප කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට ඉඩ දේ. එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුව සිය කාර්යභාරයන්, වගකීම් හා අභිමත මට්ටම් නිරූපනය කරන නිශ්චිත යොමු නිර්දේශ තුළ ක්‍රියාත්මක වේ. සමහර බලතල පැවරීම හමුවේ වුවත්, අනු කමිටු වල තීරණ පිළිබඳව අවසාන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය, දරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව යන අනිවාර්යය කමිටු සතර 2024 අංක 05 දරන බැංකු පනත් නියෝගයේ අවශ්‍යතාවක් අනුව ස්ථාපිත කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණික උපායමාර්ගික කමිටුව ස්වේච්ඡා කමිටුවක් ලෙස සකස් කරන ලදී. මෙම කමිටු ඒවායේ සොයා ගැනීම් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සියළුම අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවලද ලේකම් ලෙස කටයුතු කරන අතර කමිටු රැස්වීම්ල වාර්තා තොරතුරු දැන ගැනීම, සමාලෝචනය, අදහස් දැක්වීම සහ අවශ්‍ය අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි. යොමු නිර්දේශ, සංයුතිය, කාර්යභාරය හා වගකීම්, පැමිණීම, 2025 සිදුකළ කටයුතු සහ එක් එක් කමිටුවේ 2026 සහ ඉන් ඉදිරියට අවධානය තමන්ට අදාළ කමිටු වාර්තාවේ දැක්වෙන අතර, එම තොරතුරු පිටු අංක 245 සිට 253 දක්වා ඇත.

## කළමනාකරණ කමිටු

අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වලට අමතරව, අනුමත කරන ලද යොමු නිර්දේශ පරිදි බැංකුව විසින් කළමනාකරණ කමිටු කිහිපයක් ස්ථාපිත කර ඇත. අදාළ යොමු කිරීමේ නිර්දේශ ප්‍රකාරව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී ආයතනික ප්‍රසම්පාදන කමිටුව සහ විධායක ප්‍රසම්පාදන කමිටුව හැර සියලුම කළමනාකරණ කමිටුවල සභාපති ලෙස සේවය කරයි. මෙම කමිටු පහත වගුවේ දක්වා ඇති පරිදි බැංකුවේ මෙහෙයුම්වලට අත්‍යවශ්‍ය තීරණාත්මක කරුණු සාකච්ඡා කිරීමට කැඳවනු ලැබේ.

GRI 2-13

| කළමනාකරණ කමිටුව | අරමුණ හා වගකීම් | සංයුතිය |
|---|---|---|
| **ආයතනික කළමනාකරණ කමිටුව** (CMC) | ප්‍රතිපත්ති හා උපායමාර්ග සැකසීම හා සම්බන්ධ කරුණු අධීක්ෂණය, මෙහෙයුම් මට්ටමේදී ප්‍රතිපත්ති හා උපායමාර්ග ක්‍රියාවට නැංවීම. | බැංකුව තුළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී හා ඊට ඉහළ තනතුරු සේවය කරන සියළු නිලධාරීන් |
| **වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව** (ALCO) | ආදායම් ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම සඳහා බැංකුවේ පූර්ව නිශ්චිත අවදානම් අභිරුචිය තුළ වෙළෙඳපොළ සහ ද්‍රවශීලතා අවදානම පවත්වා ගැනීම. | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, මෙහෙයුම්, ණය, භාණ්ඩාගාර සහ අවදානම් කළමනාකරණ අංශ වල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් |
| **ණය කමිටුව** (CC) | බැංකුවේ ණය ප්‍රතිපත්තිය කලින් කලට සමාලෝචනය කිරීම, ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සහ ආදායම් ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම සඳහා බැංකුවේ අවදානම් අභිරුචි මට්ටම තුළ හිතකර ණය කළඹක් පවත්වාගෙන යාමෙහි නිරතවීම. | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, ආයතනික මූල්‍ය, භාණ්ඩාගාර, නීති අංශවල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් |
| **ආයෝජන කමිටුව** (IC) | බැංකුවේ ආයෝජන ප්‍රතිපත්ති කලින් කලට සමාලෝචනය කිරීම සහ බැංකුවේ සමස්ත අවදානම් රුචි මට්ටම තුළ බැංකුවේ ආයෝජන කටයුතු අධීක්ෂණය කිරීම. | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, ණය, භාණ්ඩාගාර, අවදානම් කළමනාකරණ අංශවල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් |
| **කාර්යසාධන සමාලෝචන කමිටුව** (PRC) | මූල්‍ය කාර්යසාධනය සමාලෝචනය, දැනට ක්‍රියාත්මක ක්‍රියාකාරකම් වල ප්‍රගතිය, සහ කාර්යසාධනයට පහසුකම් සපයන වෙනත් ඕනෑම උපකාරක සේවාවක් සමාලෝචනය කිරීම. | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, සියලුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්, සියලුම උපදේශකයින් හා අංශ ප්‍රධානීන්, සියලුම සහකාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්, සහ කමිටුව විසින් පත්කළ වෙනත් සාමාජිකයින් |
| **ශාඛා මෙහෙයුම් නියාමන කමිටුව** (BOSC) | පවරා ඇති මූල්‍ය අධිකාරිය තුල ශාඛා මෙහෙයුම්වල බලාත්මක කිරීම | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මෙහෙයුම් සහ පරිපාලන යන අංශවල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් |
| **තොරතුරු තාක්ෂණ නියාමන කමිටුව** (ITSC) | තොරතුරු තාක්ෂණ උපායමාර්ගය බැංකුවේ ව්‍යාපාරික උපායමාර්ගවලට අනුරූප බව සහතික කිරීම. | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, ජාත්‍යන්තර මෙහෙයුම්, ණය, නීති, මානව සම්පත් සංවර්ධන,තොරතුරු තාක්ෂණය, අනුකූලතාව සහ අවදානම් කළමනාකරණ, අලෙවි භාණ්ඩාගාර යන අංශවල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් |
| **අලෙවිකරණ කමිටුව** (MKTC) | අධ්‍යක්ෂ මණ්ඩලයට සහ ආයතනික කළමනාකාරීත්වයට අලෙවිකරණ උපදෙස්, විශේෂඥතාව සහ සහය ලබාදීම සහ බැංකුවේ සියළු අලෙවිකරණ කටයුතු සමාලෝචනය කිරීම සහ ඒ සඳහා මග පෙන්වීම. | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, මෙහෙයුම් සහ අලෙවිකරණ යන අංශවල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් |

## ආයතනික පාලනය

| කළමනාකරණ කමිටුව | අරමුණ හා වගකීම් | සංයුතිය |
|---|---|---|
| **මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව** (ORMC) | මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රමවේද ක්‍රියාවට නැංවීම, අධීක්ෂණය කිරීම සහ අදාළ ක්‍රියාමාර්ග ගැනීම තුළින් අභ්‍යන්තර පාලනයන්හි අඛණ්ඩභාවය පවත්වා ගැනීම අතරතුර බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණය කිරීම. | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරි, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මෙහෙයුම්, භාණ්ඩාගාර, ජාත්‍යන්තර, ආයතනික මූල්‍ය, මානව සම්පත් සංවර්ධන, තොරතුරු තාක්ෂණය, පරිපාලනය, නීති, අවදානම් කළමනාකරණය, අනුකූලතාව සහ තොරතුරු ආරක්ෂාව යන අංශවල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් |
| **නිමැවුම් සංවර්ධන කමිටුව** (PDC) | ඉහළ යන තරඟකාරීත්වයට මුහුණදීම සඳහා නවෝත්පාදක නිමැවුම් සංවර්ධනය තුළින් දිගුකාලීන වටිනාකම් නිර්මාණය කිරීම අධීක්ෂණය කිරීම. | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරි, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මෙහෙයුම්, ජාත්‍යන්තර, තොරතුරු තාක්ෂණය, පාරිභෝගික ණය, අලෙවිකරණය හා සැලසුම් කිරීම යන අංශවල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් |
| **මානව සම්පත් කමිටුව** (HRC) | බැංකුවේ උපායමාර්ගික අරමුණු වලට අනුකූලව මානව සම්පත් සංවර්ධනය කිරීම | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරි, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මානව සම්පත් සංවර්ධන, නීති, යන අංශවල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සහ ඊලඟ වඩාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී |
| **ආයතනික ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ)** | බැංකුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි පරිදි සිදු වන බව සහතික කිරීම | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරි, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, පාරිපාලනය, සහ මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයින් |
| **ආයතනික ප්‍රසම්පාදන කමිටුව (සුළු පරිමාණ)** | බැංකුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි පරිදි සිදු වන බව සහතික කිරීම | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, භාණ්ඩාගාර, පාරිපාලනය, සහ මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයින් |
| **විධායක ප්‍රසම්පාදන කමිටුව** (EPC) | බැංකුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි පරිදි සිදු වන බව සහතික කිරීම | භාණ්ඩාගාර, පාරිපාලනය, යන අංශවල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සහ සහකාර සාමාන්‍යාධිකාරී, (මූල්‍ය) |
| **ආයතනික තිරසාරභාවය පිළිබඳ කමිටුව** (CSC) | තිරසාර කාර්යසාධනය හා සංවර්ධනය හා සම්බන්ධ ආයතනික අරමුණු මගින් අර්ථ දක්වා ඇති ආකාරයට සදාචාරාත්මක, සමාජයීය හා පාරිසරික වගකීම අපගේ දෛනික ව්‍යාපාර මෙහෙයුම් සමග ඒකාබද්ධ කිරීම තුළින් ප්‍රධාන පාර්ශ්වකරුවන් සඳහා වටිනාකම් නිර්මාණය කිරීමට දායකවීම | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරි, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, ණය, ජාත්‍යන්තර අලෙවිකරණ මෙහෙයුම්, මානව සම්පත් සංවර්ධන, මූල්‍ය හා සැලසුම්කරණ යන අංශවල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් |
| **තොරතුරු ආරක්ෂණ කමිටුව** (ISC) | බැංකුවේ තොරතුරු ආරක්ෂාව කළමනාකරණය කිරීම හා නියාමන අවශ්‍යතාවය හා අනුකූලවීමේ මට්ටම සහ බැංකුවේ තොරතුරු ආරක්ෂණය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පාලන ක්‍රියාත්මක කිරීමට හා එවැනි පාලන වල ඵළදායීතාවය තක්සේරු කිරීමට පියවර ගැනීම. | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරි, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්), ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරි, තොරතුරු තාක්ෂණය, මානව සම්පත් හා ආරක්ෂාව යන අංශවල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් |
| **ණය අයකරගැනීමේ සැලසුම් නියාමන කමිටුව** (RCPSC) | බැංකුවේ ප්‍රාග්ධන, ද්‍රවශීලතා සහ සමස්ත මෙහෙයුම් කෙරෙහි බලපෑමක් ඇති කරන විවිධ දැඩි එහෙත් කළ හැකි ආතති තත්ත්වයන් හේතුවෙන් ඇති විය හැකි බිඳවැටීම්වලට විසඳුම් සැපයීම සඳහා බැංකුවේ ණය අයකරගැනීමේ සැලැස්ම සකස් කිරීම, නිරන්තරයෙන් ඇගයීම සහ ක්‍රියාත්මක කිරීම. | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරි, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, භාණ්ඩාගාර, ණය, ආයතනික මූල්‍ය, ණය අයකරගැනීම්, ජාත්‍යන්තර බැංකු, අලෙවි, මානව සම්පත් සංවර්ධන, මෙහෙයුම්, තොරතුරු තාක්ෂණ, තොරතුරු ආරක්ෂක, මූල්‍ය හා සැලසුම්, නීති, අවදානම් කළමනාකරණ, අනුකූලතා, විගණන සහ පරිපාලන යන අංශවල ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් |

GRI 2-10

### අධ්‍යක්ෂවරුන් පත් කිරීම, නැවත පත් කිරීම සහ ඉල්ලා අස්වීම

(ප්‍රතිපත්තිය A. 7, A. 8 සහ A. 9.3)

රජයට අයත් බැංකුවක් ලෙස, ජාතික ඉතිරිකිරීමේ බැංකුවට අධ්‍යක්ෂවරු පත් කිරීම 1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත හා එහි සංශෝධන අනුව සිදු කෙරේ. ඒ අනුව, ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත ප්‍රකාරව අධ්‍යක්ෂවරු සත් දෙනාගෙන් පස් දෙනෙකු රාජ්‍ය බැංකු සඳහා වගකිවයුතු විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අතර අනෙක් අධ්‍යක්ෂවරු දෙදෙනාගෙන් එක් අයෙක් භාණ්ඩාගාර ලේකම් හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙක් විය යුතුය. අනෙක් අධ්‍යක්ෂ තැපැල්පති හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙක් විය යුතුය. යෝග්‍යතාව හා සම්මතය සඳහා අවශ්‍ය නිර්ණායක සපුරා ඇත්නම්, කරන ලද පත්වීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කෙරේ. ආයතනික පාලනය පිළිබඳ 2004 අංක 05 දරණ බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව අධ්‍යක්ෂවරයෙක්ට සිය ධුරය දැරිය හැකි උපරිම කාලය වසර නමයකට සීමා වේ. අධ්‍යක්ෂවරුන්ගේ ඉල්ලා අස්වීම හා නැවත පත් කිරීම ද 1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතට අනුව සිදු කරන අතර, ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව නිසි පරිදි දැනුවත් කෙරේ. අධ්‍යක්ෂවරුන් හා වෙනස්වීම් පිළිබඳ විස්තර පිටු අංක 237 හි දැක්වේ.

ආයතනික පාලනය

## අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රේරණය හා පුහුණුව

(ප්‍රතිපත්තිය A. 1.8)

බැංකුවේදී, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායිතාවය වැඩි කිරීමේදී හා පාලනය හා උපායමාර්ගික සාකච්ඡා සඳහා අර්ථවත් දායකත්වයක් ලබාදීමට අධ්‍යක්ෂවරුන් මනාව සන්නද්ධ කරන බව සහතික කිරීමේදී සිය අත්‍යවශ්‍ය කාර්යභාරය හඳුනා ගනිමින් අපගේ අධ්‍යක්ෂවරුන්ගේ අඛණ්ඩ වර්ධනය කෙරෙහි ශක්තිමත් අවධාරණයක් අපි යොමු කරමු. තාක්ෂණය තුළ වේගවත් වර්ධනය විම, ආර්ථික ගතිකතාවන් වෙනස්වීම, සහ වෙනස්වන නීතිකරණ හා නියාමන රාමු මගින් සලකුණු කළ වාතාවරණයන් තුළ, අධ්‍යක්ෂ මණ්ඩලය මනාව දැනුවත්ව හා කඩිසරව සිටීම අත්‍යවශ්‍යය.

මෙයට සහයවීම සඳහා, අලුතින් බඳවාගත් අධ්‍යක්ෂවරුන් සඳහා ව්‍යූහගත සහ පුළුල් ප්‍රාරම්භක වැඩසටහන් බැංකුව ආරම්භ කර ඇත. මෙම හැඩ ගැසීමෙන් බැංකුවේ මෙහෙයුම්, උපායමාර්ගික ප්‍රමුඛතා, සහ පාලනය ව්‍යූහය පිළිබඳ ගැඹුරු අවබෝධයක් අධ්‍යක්ෂවරුන්ට ලබා දෙන අතර ඔවුන්ගේ භාරකාරත්වය, ව්‍යවස්ථාපිත සහ නෛතික බැඳීම් විස්තර කරයි.

බැංකුවේ අධ්‍යක්ෂධුරයට පත්වීමෙන් පසුව, අධ්‍යක්ෂවරුන්ට අධ්‍යක්ෂ මණ්ඩල අත්පොත හා අධ්‍යක්ෂ මණ්ඩල කමිටු ප්‍රඥප්ති ඇතුළුව ප්‍රධාන පාලන සම්පත් වෙත පිවිසීම ලබා දෙන අතර එය අත්‍යවශ්‍ය යොමු ලේඛනවල මධ්‍යම සුරක්ෂිතාගාරයක් ලෙස සේවය කරයි. මෙයට, 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත හා එහි සංශෝධන, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ නියෝග, අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය, අනු කමිටු විධානයන්, සහ අනෙකුත් අදාල නීති, චක්‍රලේඛ හා ප්‍රතිපත්ති ලියවිලි ඇතුළත් වේ.

ප්‍රාරම්භක පුහුණුවෙන් ඉදිරියට, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් පහසුකම් සලසන නිරන්තර යාවත් කිරීම හා පුහුණු සැසි තුළින් අඛණ්ඩව හැකියා ගොඩ නැගීම බැංකුව සහතික කරයි. මෙවැනි මූලපිරීම් මතුවන නියාමන ප්‍රවණතා, ආර්ථික සංවර්ධනයන්, සහ වෙනස් වන ක්ෂේත්‍රයේ මනා පරිචයන් පිළිබඳ අධ්‍යක්ෂවරුන් අවබෝධයෙන් ලබාගැනීමට සැලසුම් කර ඇත. අධ්‍යක්ෂවරුන්ගේ දර්ශනය, කඩිසරකම සහ උපායමාර්ගික දැක්ම තවදුරටත් ශක්තිමත් කරමින් නියාමන ආයතන හා වෘත්තීය ආයතන විසින් පිරිනමන බාහිර පුහුණු වැඩසටහන් හා වැඩමුළුවලට අධ්‍යක්ෂවරු සක්‍රීයව සහභාගී වේ.

## තොරතුරු වෙත ප්‍රවේශය

අධ්‍යක්ෂවරුන්ට සිය කාර්යයන් හා වගකීම් ඉටු කිරීමට අවශ්‍ය තොරතුරු මෙන්ම සම්පත් වෙත අසීමිත ප්‍රවේශයක් පවතී. ස්වාධීන වෘත්තීය උපදෙස් පිළිබඳ 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ හා එහි සංශෝධන ප්‍රකාරව බැංකුවේ වියදමෙන් බාහිර විශේෂඥ උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන්ට පහසුකම් සලසා දී ඇත. අවශ්‍ය සාකච්ඡාවන් සඳහා ප්‍රමාණවත් කාලයක් අධ්‍යක්ෂවරුන්ට ලබාදෙමින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා බෙදා හැරීම සඳහා විද්‍යුත් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඔවුන් වෙත ලබා දේ.

GRI 2-16

## 2025 වර්ෂයේ අවධානයට ලක්වූ ප්‍රධාන ක්ෂේත්‍ර

වෙනස්වන දේශපානික වාතාවරණය හා 2025 පුරා ආර්ථික ස්ථායීකරණයේ සංඥාවන්ට ප්‍රතිචාරාත්මකව, අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ උපායමාර්ගික දිශානතිය හැඩගැස්වීම හා මෙහෙයවීම කෙරෙහි ශක්තිමත් අවධානයන් පවත්වා ගෙන ගොස් ඇත. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ආයතනික කළමනාකාරිත්ව කණ්ඩායම සමඟ සමීපව කටයුතු කරමින්, අනුමත පරිදි බැංකුවේ දිගු කාලීන උපායමාර්ගය ඵලදායිව ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අධීක්ෂණය හා සහය ලබා දෙන ලදී. වසර පුරාම, අධ්‍යක්ෂ මණ්ඩලය සිය කටයුතුවලින් විනිවිදභාවය, විචක්ෂණභාවය සහ වගවීම පිළිබිඹු වන බව සහතික කරමින් ඉහළම පාලන ප්‍රමිති කරා සිය කැපවීම ශක්තිමත් කර ඇත. දුවශීලතාව කළමනාකරණය සමඟ මූල්‍ය කාර්යසාධනය තුලනය කිරීමට පරීක්ෂාකාරී අවධානය ලබා දෙන ලද අතර, ශක්තිමත් අභ්‍යන්තර පාලන ප්‍රතිපත්ති හා මෙහෙයුම් විනය පවත්වාගෙන ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාසය හා තිරසාර වටිනාකමේ ප්‍රධාන සක්‍රීයකරුවෙක් ලෙස යහ පාලනය ස්ථානගත කරමින් ආයතනය හරහා සදාචාර හැසිරීම සහ අවංකභාවය පිළිබඳ සංස්කෘතියක් අඛණ්ඩව පෝෂණය කරයි. එමෙන්ම එය අවදානම් කළමනාකරණ ව්‍යවහාර අධීක්ෂණය කරමින් හා නව්‍යකරණය, උපායමාර්ගික පුළුල් කිරීම හා වෙනස්වන ආර්ථික හා නියාමන සන්දර්භයට ප්‍රතිචාරාත්මකව ව්‍යාපාර නැවත සකස් කිරීම සඳහා අවස්ථා ගවේෂණය කරමින් බාහිර පරිසරයේ වෙනස්වීම් පිළිබඳව සැලකිල්ලෙන් සිටී.

පහත දැක්වෙන වගුවෙහි 2025 වර්ෂය තුළ, අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු වූ ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් දක්වා තිබෙන අතර, බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතා හා සිය ප්‍රධාන පාර්ශවකාර කණ්ඩායම්වල බැඳියාවන් සාකච්ඡාවන් හා තීරණ සමඟ පෙළ ගැසෙන ආකාරය පැහැදිලි කරයි.

| 2025 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු | ප්‍රතිඵල | ප්‍රමුඛ උපායමාර්ග | පාර්ශවකරු | 2026 පාලන අරමුණ |
|---|---|---|---|---|
| **ආයතනික උපාය මාර්ගය කාර්යසාධනය සහ වාර්තාකරණය** | | | | |
| • 2026-2028 කාලසීමාව සඳහා බැංකුවේ උපායමාර්ගික ව්‍යාපාර හැඩ ගැස්වීම සහ අවසන් කිරීමට ගැඹුරු සාකච්ඡා සැසි පැවැත්වීම.<br>• 2025 අයවැය සහ 2026 සංශෝධිත අයවැය සමාලෝචනය කර අනුමත කිරීම.<br>• අතුරු හා සහ වාර්ෂික මූල්‍ය වාර්තා අනුමත කිරීම,නිරවද්‍යතාව, විනිවිදභාවය, සහ වාර්තාකරණ ප්‍රමිති සමඟ අනුකූලතාව සහතික කිරීම | • අදාළ අරමුණ, සහ වටිනාකම තිරසාරව නිර්මාණය සහ බෙදාහැරීම වෙනුවෙන් කැපවූ ශක්තිමත් පාලන රාමුවක් යටතේ බැංකුව ක්‍රියාත්මකවීම.<br>• බැංකුවේ උපායමාර්ග සිය මෙහෙවර හා වටිනාකම් සාක්ෂාත් කර ගැනීම සමඟ පරීක්ෂාකාරීව පෙළගැසීම<br>• බැංකුවේ වටිනාකම් උත්පාදනය තුළ වැඩිකළ සහභාගිත්වයට හේතු වන පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය පෝෂණය කිරීම. | 1 2 3 4 5 6 | | සාර්ව ආර්ථික උච්චාවචනයන් හමුවේ ඔරොත්තුදීම පවත්වා ගනිමින් වෙනස්වන මෙහෙයුම් පරිසරය හඹා යමින් 2026 - 2028 උපාය මාර්ගික ව්‍යාපාරික සැලැස්ම පහසුවෙන් ක්‍රියාත්මක වීම සහතික කිරීමට උපයාමාර්ගික අධීක්ෂණය ලබාදීම |

# ආයතනික පාලනය

| 2025 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු | ප්‍රතිඵල | ප්‍රමුඛ උපායමාර්ග | පාර්ශවකරු | 2026 පාලන අරමුණ |
|---|---|---|---|---|
| **තාක්ෂණය**<br>• බාධා රහිත සේවා සැපයුම, වැඩිකළ ගනුදෙනුකාර අත්දැකීම සහ තිරසාර ප්‍රතිලාභ සහතික කරන බැංකුවේ තාක්ෂණික පරිවර්ථනය හා ඩිජිටල් පරිනාමනය මෙහෙයවීම. | • තාක්ෂණයට හුරු පරිසරයක් තුළ කඩිසර වීම | 1 2 3 4 5 6 | | ශීඝ්‍රයෙන් වෙනස්වන ගතික වාතාවරණයක් තුළ බාධාරහිත සේවා සැපයුමක්, සුරක්ෂිත හා ඔරොත්තුදෙන පරිසරයක්, විවිධ අංශවලට ගලපන ලද ප්‍රශස්ත හා තිරසාර ගනුදෙනුකාර අත්දැකීමක් සහ කල්පවත්නා වටිනාකම් නිර්මාණය සහතික කිරීම සඳහා බැංකුවේ තාක්ෂණික හා ඩිජිටල් පරිනාමනය මෙහෙයවීම |
| **ගනුදෙනුකරුවන්**<br>• ගනුදෙනුකරුවන්ගේ දත්ත ආරක්ෂා කිරීම සඳහා සැලසුම්කළ ප්‍රතිපත්ති හා පද්ධතිවල පුළුල් සමාලෝචනයක් හා අධීක්ෂණයක් පැවැත්වීම, කඩකිරීම්වලට අනුව දැඩි ආරක්ෂාව සහ නියාමන අවශ්‍යතාවන්ට දැඩිව අනුකූලතාව සහතික කිරීම, මෙයට සයිබර් ආරක්ෂණ රාමු. දත්ත සම්මිතික ප්‍රමිති, සහ ඉහළම මට්ටමේ ආරක්ෂාව හා විශ්වාසය පවත්වා ගැනීමට නෛතික ලේඛණවලට අනුකූලතාව ඇගයීම ඇතුළත්ය.<br>• බැංකුකරණ සේවාවන්හී ප්‍රවේශ්‍යතාව සහ අන්තර්ගතභාවය පෙරමුණු කර ගනිමින්, මූල්‍ය නිෂ්පාදන හා ඩිජිටල් වේදිකා විවිධ සමාජීය අංශ පරාශයකට සේවය සලසන බව සහතික කිරීම, නව්‍යකරණ විසඳුම් ක්‍රියාත්මක කරමින් අඩුවෙන් සේවය ලත් හා සේවය රහිත අංශවල අවශ්‍යතා විසඳීම, සමාජීය බලපෑමගත වැඩසටහන් පුළුල් කිරීම, සහ මූල්‍ය පරතරය කිරීමට තාක්ෂණය යොදා ගැනීම කෙරෙහි විශේෂ අවධානය ලබා දෙන ල්දී, අන්තර්ගත බැංකුකරණ පරිසරයක් පෝෂණය කරමින්, බැංකුව සමාන මූල්‍ය ප්‍රවේශ හා තිරසාර වටිනාකම් නිර්මාණය කරා සිය කැපවීම ශක්තිමත් කර ඇත. | • උපායමාර්ගික අරමුණු සාක්ෂාත්කර ගැනීම සඳහා පදනම ලෙස ගනුදෙනුකාර අවශ්‍යතා හා අත්දැකීම් ප්‍රමුඛ කිරීම.<br>• මෙහෙයුම් විශිෂ්ටත්වය හා දිගු කාලීන සාර්ථකත්වය ඇති කිරීමට ගනුදෙනුකාර කේන්ද්‍රීය ප්‍රවේශයක් ඇතුළත් කිරීම.<br>• පක්ෂපාතිකම හා තිරසාර වර්ධනය පෝෂණය කිරීමට ව්‍යාපාර උපාමාර්ග ගනුදෙනුකාර අපේක්ෂාවන් සමඟ පෙළ ගැසීම. | 1 2 4 5 6 | | ගනුදෙනුකරුවන් කේන්ද්‍රීය ප්‍රවේශයක් පෝෂණය කිරීමේදී බැංකුවේ වර්ධනයන් ඇගයීම හා පසු විපරම් කිරීම, සේවාවන්හි තත්ත්වය, සහභාගිත්වය හා තෘප්තිය තුළ අඛණ්ඩ වර්ධනය සහතික කිරීම. |

## ආයතනික පාලනය

| 2025 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු | ප්‍රතිඵල | ප්‍රමුඛ උපායමාර්ග | පාර්ශවකරු | 2026 පාලන අරමුණ |
|---|---|---|---|---|
| **අවදානම් කළමනාකරණය**<br>• අවදානම් අභිරුචිය<br>• අවදානම් අභිරුචි සීමා<br>• ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව<br>• සයිබර් ආරක්ෂක අවදානම් ඇගයීම<br>• පාලන කාර්යක්ෂමතා සමාලෝචනය<br>• නීතිපතා ගනු ලබන අවදානම් වාර්තා<br>• අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ වාර්තා<br>• 2025 අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා ඇගයීම් ක්‍රියාවලි වාර්තා අනුමත කිරීම | • බැංකුව වගවීම සහ ඔරොත්තුදීම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කරමින් සිය උපායමාර්ගික ප්‍රමුඛතා සමඟ පෙළ ගැසීම සහතික කරමින් අවදානම් හා අනුකූලතා කළමනාකරණ පරිචයන් බැංකුව ඒකාබද්ධ කර ඇත.<br>• තොරතුරු හා තාක්ෂණය වගකීම් හා සදාචාරාත්මක අයුරින් භාවිතා කරන අතර, ආරක්ෂාව, විනිවිදභාවය, සහ විශ්වාසය ශක්තිමත් කරමින් තිරසාර නව්‍යකරණය හා මෙහෙයුම් විශිෂ්ටත්වය ඇති කිරීම. | 1 2 4 5 | | බැංකුවේ සක්‍රීය අවදානම් කළමනාකරණ ප්‍රවේශයට උපායමාර්ගික අධික්ෂණය ලබාදීම හා වෙනස්වන සාර්ව ආර්ථික සාධකවලට වගකීම් සහගතව සිටින බව සහ විභව මූල්‍ය හා මෙහෙයුම් අවදානම් ඵලදායීව අවම කිරීම. |
| **නියාමන අනුකූලතාව**<br>• නියාමනයන් යාවත්කාලීන කිරීම | • නියාමන අවශ්‍යතාවන්ට අනුකූලවීම | 2 4 | | නියාමන අවශ්‍යතා හා ක්ෂේත්‍රයේ මනා පරිච සමඟ බැංකුව 100%ක අනුකූලතාවයෙන් යුතු බවට සහතිකවීම |
| **පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධතා**<br>• පාර්ශ්වකරුවන් හඳුනාගෙන පාර්ශ්වකරුවන් සමඟ අර්ථවත් සම්බන්ධතා සහ සහයෝගය පෝෂණය කිරීමට ඵලදායි සහභාගිත්ව උපායමාර්ග සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම මෙහෙයවීම.<br>• විශ්වාසය සහ පෙළගැසීම ශක්තිමත් කිරීමට කොටස්හිමියන් සමඟ නිරන්තර හා විනිවිද සන්නිවේදනය සහතික කරමින් කළමනාකාරිත්වයට උපායමාර්ගික දිශානතිය ලබාදීම. | • කාර්යභාරයන් හා වගකීම් විවිධ බැඳියාවන් හා දර්ශනයන් සමඟ පෙළ ගැසෙන බව සහතික කරමින් පාලනය තුළ පාර්ශ්වකරුවන් ඇතුළත් ප්‍රවේශයක් වැළඳ ගැනීම<br>• තිරසාර සම්බන්ධතා හා අනෝන්‍ය වර්ධනය පෝෂණය කරමින් පාර්ශවකාර අපේක්ෂාවන් හා බැංකුවේ විශිෂ්ට බැඳියාවන් අතර සාධාරණත්වය ඇති කිරීම<br>• දීර්ඝ කාලීන වටිනාකම් නිර්මාණය හා වගකීම්සහගත ව්‍යවහාර ඇති කරමින් බැංකුවේ උපායමාර්ගික රාමුවට පාරිසරික, සාමාජීය හා පාලන ප්‍රතිපත්ති ඒකාබද්ධ කිරීම. | 1 2 3 4 5 6 | | සන්නිවේදනය, සහයෝගිතාව හා ප්‍රතිචාරාත්මකබව තුළ අඛණ්ඩ වර්ධනය සහතික කිරීමට පාර්ශවකාර සහභාගිත්ව ක්‍රියාවලි අධික්ෂණය හා වැඩි කිරීම, උපායමාර්ග සකස් කරමින්, ගැටළු විසඳමින්, සහ බැංකුවේ දිගු කාලීන අරමුණු සමඟ පාර්ශවකාර බැඳියාවන් පෙළ ගස්වමින් සම්බන්ධතා ශක්තිමත් කිරීම, විවෘත සාකච්ඡාව හා සක්‍රීය සහභාගිත්වය තුළින් විශ්වාසය හා අර්ථවත් සම්බන්ධතා පෝෂණය කිරීම. |

# ආයතනික පාලනය

| 2025 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු | ප්‍රතිඵල | ප්‍රමුඛ උපායමාර්ග | පාර්ශවකරු | 2026 පාලන අරමුණ |
|---|---|---|---|---|
| **ආයතනික පාලනය**<br>• ස්වාධීන අධ්‍යක්ෂ මණ්ඩල ඇගයීමක් හා අනුකම්වූ ඇගයීමක් සිදු කිරීම.<br>• නියාමන බලධාරීන් විසින් නිකුත් කරන ලද ආයතනික පාලන දිශානතීන් සැලකිල්ලට ගැනීම සහ අනුකූලතා තත්ත්වය ඇගයීම | • අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්ය සාධනය හා ඵලදායිත්වය අඛණ්ඩව වර්ධනය<br>• නියාමන දිශානති හා මාර්ගෝපදේශ සමග අනුකූලතාවය. | 4 | | යහ පාලන පරිචවල ප්‍රමිති කෙරෙහි බැංකුවේ අනුකූලතාවය අධීක්ෂණය කිරීම |

## අවදානම් කළමනාකරණයේදී අධ්‍යක්ෂ මණ්ඩල කාර්යභාරය

අවදානම් කළමනාකරණය බැංකුවේ සමස්ත ව්‍යාපාරික උපායමාර්ගය සමග ඒකාබද්ධ කිරීමේ වැදගත්කම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනාගනු ලබයි. අවදානම් කළමනාකරණ පරිච දූරදර්ශීව අධීක්ෂණය කිරීමේ වැදගත්කම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවධාරණය කරනු ලබන අතර, එම කාර්යභාරය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත පවරනු ලැබ ඇත. බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යය අධීක්ෂණය කිරීමේ වගකීම එම කමිටුව වෙත පැවරී ඇත. බැංකුවේ සිය අවදානම් පැතිකඩ ඵලදායීව නිරීක්ෂණය කිරීම සඳහා ශක්තිමත් අවදානම් කළමනාකරණ කාර්යරාමුවක්, සංවර්ධනය කර ඇති අතර, එයට අවදානම් රුචි සහ ඉවසුම් සීමා ඇතුළත් වේ. අවදානම දැඩිව නිරීක්ෂණය කිරීම සහ තක්සේරු කිරීම සඳහා බැංකුවේ අවදානම් පැතිකඩ පිළිබඳ වාර්තා නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මගින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ. එකඟවූ අවදානම් රුචි මට්ටම්වල යම් අපගමනයන් පිළිබඳව කළමනාකරණය සමඟ කඩිනම්ව සාකච්ඡා කරන අතර එය සුදුසු අවම කිරීමේ උපායමාර්ග සකස් කිරීමට හේතු වේ.

බැංකුවේ මෙහෙයුම් හා සම්බන්ධ අවදානම් පරිස්සමින් සලකා බලා උපායමාර්ගික ව්‍යාපාර සැලැස්ම සමාලෝචනය තුළ පුළුල්ව ඒ පිළිබඳ සාකච්ඡා කෙරේ. ඒ තුලින් දිගු කාලීන උපායමාර්ගික පරමාර්ථ ප්‍රමාණවත්ව අවදානම් සාධක විසඳන බව සහතික කරයි. අවදානම් කළමනාකරණය පිළිබඳ වැඩි දුර විස්තර පිටු අංක 254-280 දක්වා වන අවදානම් කළමණාකරන වාර්තාවේ දැක්වේ.

## සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යභාරය

(ප්‍රතිපත්තිය A. 2 සහ A. 3)

1971 ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත, එහි සංශෝධන, ශ්‍රී ලංකා මහ බැංකු නියාමන සහ ක්ෂේත්‍රයේ සම්මත පරිච වලට අනුකූලව කළමනාකරණ නිළධාරීන් පත් කිරීම හා බලතල පැවරීම සඳහා බැංකුව ව්‍යුහගත රාමුවක් අනුගමනය කරයි. මෙම ප්‍රවේශය මගින් අදාළ කාර්යයන් සහ වගකීම් ඵලදායීව ක්‍රියාත්මක වන බව සහතික කරමින් කාර්යභාරවල පැහැදිලිතාව වැඩි කිරීමට සැලසුම් කෙරේ. මෙම පාලන ව්‍යූහයේ ප්‍රධාන අංගයක් වන්නේ එක් එක් අයට සුවිශේෂ වූ පැහැදිලි නිශ්චිත වගකීම් සහිතව සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිළධාරියාගේ කාර්යභාරයන් අතර සුවිශේෂී වෙනසක් සිදු කරයි. එක් එක් තනතුරට අදාළ වගකීම් බේදීම පවත්වා ගැනීමෙන්, බැංකුව පරීක්ෂාකාරී නොවන තීරණ ගැනීමේ අවදානම අවම කරන අතර, බලතල සමබරව බේදීම, වැඩි වූ වගවීම සහ ආයතනය තුළ ශක්තිමත් පාලනය පෝෂණය කරයි.

GRI 2-11

### සභාපති

සභාපතිවරයා විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙක් වන අතර සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රධාන කළමනාකරණ නිළධාරියෙක් වේ. එහෙත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් නොවේ. අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය මගින් සභාපතිවරයාගේ සහ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරියාගේ කාර්යභාරය හා වගකීම් පැහැදිලිව විග්‍රහ කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබාදීම, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායී ක්‍රියාකාරිත්වයට පහසුකම් සැලසීම, ක්‍රමානුකූලබව පවත්වාගෙන යාම, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායීතාවය සහ බැංකුව තුළ ආයතනික පාලනය ආශ්‍රිත ඉහළම ප්‍රමිතීන් පවත්වා ගැනීම සහතික කිරීම සභාපතිවරයා වෙත පැවැරෙන වගකීම් වේ. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සමග සාකච්ඡා කොට සභාපතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල න්‍යාය පත්‍රය සකස් කරනු ලබයි. සිය කාර්යයන් ඉටු කිරීමේදී තොරතුරු මත පදනම්වූ තීරණ ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ප්‍රමාණවත් පරිදි තොරතුරු ලැබෙන බව, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා එහි සාමාජිකයන්ගේ ඵලදායී සහභාගිත්වය ඇති බව සහ පාර්ශ්වකරුවන් සමග ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගන්නා බව මෙන්ම ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග විවෘත සන්නිවේදනයක් පවත්වා ගන්නා බවද සභාපතිවරයා සහතික වේ.

GRI 2-12

### සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා දී ඇති පරිදි අනුමත කරන ලද අවදානම් රුචි මට්ටම්වලට යටත්ව බැංකුවේ උපායමාර්ග සහ දෛනික ව්‍යාපාරික කළමනාකරණ කාර්යයන් සකස් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී වගකිව යුතුය. සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිළධාරී ආයතනික කළමනාකරණ කණ්ඩායම් වෙත නායකත්වය ලබාදෙන අතර, ආයතනික පාලන කාර්යරාමුව තුළ අවසරය පරිදි ඔහුට/ඇයට අයත් අධිකාරිය යටතේ පවතින ඇතැම් වගකීම් ආයතනික කළමනාකරණ කණ්ඩායම වෙත පවරයි. එසේම, ඔහු/ඇය කළමනාකරණ කමිටු වල සභාපතිත්වය දරණ අතර බැංකුවේ කාර්යසාධනය පිළිබඳව නිවැරදි, කාලීන හා පැහැදිලි තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලැබෙන බවට සහතික කරයි. බැංකුවේ කටයුතු පවත්වාගෙන යාමේදී යහපත් ආයතනික පාලනයක් හා ඉහළම ප්‍රමිතීන් යොදා ගෙන පවත්වා ගන්නා බවටද සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී විසින් සහතික කරනු ලබයි.

## ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ කාර්යභාරය

(ප්‍රතිපත්තිය A. 3.1, A. 5 සහ A. 5.1)

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු (INEDs) පාලනය ශක්තිමත් කරමින් හා අපක්ෂපාති තීරණ ගැනීම සහතික කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය මත තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

2025 දෙසැම්බර් 31 දිනට, අධ්‍යක්ෂවරු හත් දෙනාගෙන් දෙදෙනෙක් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු වූ අතර, (INEDs) ඉන් අධ්‍යක්ෂ මණ්ඩලයේ ශක්තිමත් කැපවීම හා ස්වාධීනත්වය ඉස්මතු කරයි. බැංකුව හා එහි සමූහය සමඟ ඔවුන්ගේ එකම සම්බන්ධය ඔවුන්ගේ අධ්‍යක්ෂධූර වන අතර, ඉන් ඔවුන්ගේ විනිශ්චයන් අපක්ෂපාති බව සහ බාහිර බලපෑම් හෝ බැඳියා පිළිගැටුම්වලින් තොර බව සහතික කරයි.

## ආයතනික පාලනය

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ශක්තිමත් ඉදිරිපත්වීම තුළින් සදාචාර පාලනය, විචක්ෂණ තීරණ ගැනීම, සහ දිගුකාලීන පාර්ශවකාර වටිනාකම නිර්මාණය කරා බැංකුවේ කැපවීම ශක්තිමත් කරයි.

### අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ කාර්යභාරය

(ප්‍රතිපත්තිය A. 1.4)

බැංකුව තුළ මනා ආයතනික පාලනයක් පවතින බව තහවුරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පටිපාටි අනුගමනය කරන බව සහ නීතිපතා සමාලෝචනය කරන බව සහතික කිරීමේදී ඉටු කිරීමට ප්‍රධාන කාර්යභාරයක් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් වෙත ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයාගේ වගකීම් පහත සාරාංශ කර දක්වා ඇත:

- සියළු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා අනුකමිටු රැස්වීම් සඳහා අවශ්‍ය පසුබිම සැකසීම.
- සියළුම අධ්‍යක්ෂ මණ්ඩල සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු රැස්වීම් වල වාර්තා පවත්වා ගැනීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියාමන සහ ව්‍යවස්ථාපිත අනුකූලතා පවත්වාගෙන යන බවට සහතික කිරීම
- අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායී ක්‍රියාකාරිත්වය සහතික කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා අනුකමිටු රැස්වීම් පැවැත්වීමට අදාළ සියළු කරුණු සම්බන්ධයෙන් සභාපතිවරයාට අවශ්‍ය ව්‍යක්තිමය සහය ලබාදීම.
- අදාළ නීති හා රෙගුලාසි සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ව්‍යක්තීය උපදෙස් ලබාදීම සහ ආයතනික පාලන මූලධර්ම සහ වෙනත් ආශ්‍රිත කාර්ය රාමු සමග අනුකූල වන බව සහතික කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා අනුකමිටු රැස්වීම් වාර්තා සහ අධ්‍යක්ෂවරුන්ට අදාළ වෙනත් ලියවිලි වල භාරකරු ලෙස ක්‍රියා කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා නිසි කලට අධ්‍යක්ෂවරුන් අතට පත්වන බවට හා අදාළ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ කාලීනව කළමනාකාරීත්වය වෙත සන්නිවේදනය කෙරෙන බවට සහතික වීම.
- අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුව විසින් ගනු ලබන තීරණ සහ ඒවායේ ප්‍රතිඵල පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය මනා ලෙස දැනුවත් බව සහතික කිරීම.
- කළමනාකාරීත්වය විසින් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කරන ලද ආකාරය හා එහි ප්‍රගතිය පිළිබඳ පසුවිපරම් කර අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් යනු ප්‍රධාන කළමනාකරණ පිරිසට ඇතුළත් තනතුරක් වන හෙයින් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් පත් කිරීම හෝ ඉවත් කිරීම යනු අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ උපදෙස් මත සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලයම සම්බන්ධ වන කරුණකි.

GRI 2-19 2-20

### අධ්‍යක්ෂවරුන්ගේ වේතන මට්ටම හා වේතන සකස් කිරීම

(ප්‍රතිපත්තිය A. 10, B. 1, B. 2 සහ B. 3)

1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත හා එහි සංශෝධන ප්‍රකාරව අධ්‍යක්ෂවරුවන්ගේ වේතනය අදාළ විෂයභාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබයි. කිසිදු අධ්‍යක්ෂවරයෙකු ඔහුගේ/ඇයගේ වේතනය තීරණය කිරීම සඳහා සම්බන්ධ නොවේ. වසර තුනකට වරක් සමාලෝචනය කෙරෙන සාමූහික ගිවිසුම මගින් නිර්දේශිත වැටුප් මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව විසින් සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරියාගේ සහ ප්‍රධාන කළමනාකරණ පිරිසට අදාළ වේතන පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි. බැංකුව ප්‍රධාන කළමනාකරණ පිරිස සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද වැටුප් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර ඇත. කමිටුවේ නිර්දේශ මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ විධිවිධාන සහ එහි සංශෝධන වලට අනුකූලව අවසාන අනුමැතිය ලබාදෙන, රාජ්‍ය බැංකු සම්බන්ධයෙන් වගකීම පැවරෙන අමාත්‍යවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ.

GRI 2-18

### අධ්‍යක්ෂ මණ්ඩල සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු ඇගයීම

**(ප්‍රතිපත්තිය A. 9)**

2024 අංක 05 දරණ බැංකු පනත් නියාමන සහ වෙනත් අදාළ වන නීති හා රෙගුලාසි මෙන්ම ආයතනික පාලනය පිළිබඳ යහපරිච මගින් ඉදිරිපත් කෙරෙන වගකීම් ඇතුළත් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය වගකීම් ඉටු කරනු ලබන බවට සහතිකවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වාර්ෂිකව ස්වයං ඇගයීමක් පවත්වනු ලැබේ. ඇගයීම් ක්‍රියාවලියේදී සෑම අධ්‍යක්ෂවරයෙක්ම අධ්‍යක්ෂ මණ්ඩල කාර්යසාධන ඇගයීම් පත්‍රිකාවක් සම්පූර්ණ කරන අතර ඒවා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව වෙත ඉදිරිපත් කරයි.

2025 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඇගයීම් 2026 වර්ෂයේ පළමු කාර්තුව තුලදී පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සිදුකරන ලදී.

### ප්‍රධාන විධායක නිලධාරී ඇගයීම

(ප්‍රතිපත්තිය A. 11)

වර්ෂය ආරම්භයේදී සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී සමග එකඟවූ පරිදි උපායමාර්ගික ව්‍යාපාර සැලැස්මේ මූල්‍ය හා මූල්‍ය නොවන ඉලක්ක වලට අනුකූල නිර්ණායක මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුවේ සහය ඇතිව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂික පදනමක් මත සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරීගේ කාර්යසාධන ඇගයීම සිදු කරනු ලබයි. එහිදී මෙහෙයුම් පරිසරයේ සිදු වන වෙනස්වීම්ද නිසි සැලකිල්ලට ගනු ලැබේ. සභාපතිවරයා මේ සම්බන්ධයෙන් සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී සමග සාකච්ඡා කරන අතර විධිමත් හා අවිධිමත් ප්‍රතිපෝෂණය ලබාදේ. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරීගේ කාර්යසාධනය ඇගයීම අනුමත කිරීමට පෙර ඒ සම්බන්ධයෙන් සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරීගේ ප්‍රතිචාර නිසි පරිදි සලකා බලනු ලැබේ.

# අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව



**සුපුල් විජේසිංහ මහතා**
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

**අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව කමිටුවේ සංයුතිය**

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය:

| නම | සාමාජිකත්ව තත්ත්වය | සහභාගී විය හැකි රැස්වීම් | සහභාගී වූ රැස්වීම් |
|---|---|---|---|
| **සුපුල් විජේසිංහ මහතා** – ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ** (සභාපති 2025 නොවැම්බර් 20 සිට මේ දක්වා) | සභාපති | 04 | 04 |
| **අශේන් ජයසේකර මහතා** (සභාපති – 2024 පෙබරවාරි 20 සිට 2025 නොවැම්බර් 20 දක්වා) | සාමාජික | 14 | 13 |
| **දුෂ්‍යන්ත බස්නායක මහතා** | සාමාජික | 14 | 12 |
| **ජූඩ් නිලූක්ෂන් මහතා** | සාමාජික | 14 | 13 |

*විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ **විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ

ඉහත සාමාජිකයින්ගේ පැතිකඩ 220 සිට 224 පිටුවල දක්වා ඇත.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් හත් දෙනෙකුගෙන් සමන්විත වන අතර 1971 අංක 30 දරන NSB පනතේ උප වගන්තියේ 8 (1) වගන්තියේ විධිවිධාන යටතේ පිහිටුවා ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු සාමාජිකයින් ඇතුළු සියලුම උප කමිටු සඳහා සාමාජිකයින් BAC හි සේවය කිරීමට අවශ්‍ය සුදුසුකම්, කුසලතා සහ පළපුරුද්ද ඇති ඉහත සඳහන් සාමාජිකයින් හත් දෙනාගෙන් (7) පත් කරනු ලැබේ.

**ගණපූරණය**

අවම වශයෙන් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සිටිය යුතුය.

**කමිටු ලේකම්**

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ලේකම්වරයා ලෙස කටයුතු කරයි.

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ කමිටුව රැස්වීම් 14 ක් පැවැත්වීය.

විගණකාධිපතිවරයාගේ නියෝජිතයා ලෙස ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරීවරයා ආරාධනය මත BAC රැස්වීම් 13 කට සහභාගී විය. බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී ඇතුළු ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය අවශ්‍යතා පදනම මත ආරාධනය මත රැස්වීම්වලට සහභාගී විය.

විධායක කළමනාකාරිත්වයේ සහභාගීත්වයෙන් තොරව රජයේ විගණක සමඟ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් දෙකක් (02) පවත්වන ලදි.

## අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නිතිපතා සමාලෝචනය කර ඇති අතර කමිටුවේ යොමු නියමයන් පැහැදිලිව නිර්වචනය කරයි. බැංකු අංශයේ නව වර්ධනයන් සැලකිල්ලට ගනිමින් කමිටු ප්‍රඥප්තිය අවසන් වරට සමාලෝචනය කරන ලද්දේ 2025 වර්ෂයේදී ය.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2024 අංක 05 දරන "බලපත්‍රලාභී බැංකු සඳහා ආයතනික පාලනය" පිළිබඳ බැංකු පනතේ 6.2 වගන්තිය සහ එහි පසුකාලීන සංශෝධන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද "ආයතනික පාලනය පිළිබඳ යහපරිච සංග්‍රහය" සහ එහි ප්‍රතිපාදන යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව පිහිටුවන ලදි.

පහත සඳහන් වගකීම් සහ අධීක්ෂණ කාර්යයන් ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුව බලගන්වා ඇත:

(අ) බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල විශ්වසනීයත්වය.

(ආ) බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යයේ ඵලදායීතාවය.

(ඇ) බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යයේ කාර්යසාධනය.

(ඈ) බැංකුවේ බාහිර විගණන කාර්යයේ කාර්යසාධනය.

කමිටුවේ කාර්යයන් සහ වගකීම් සහ අධිකාරිය ද ප්‍රඥප්තියෙහි දක්වා ඇත. කමිටුවේ කාර්යයන් ඉටු කිරීමේදී සහ එහි වගකීම් ඉටු කිරීමේදී ප්‍රඥප්තියට අනුකූල වීම තක්සේරු කිරීමට කමිටුවට සහාය වීම සඳහා ප්‍රඥප්ති පිරික්සුම් ලැයිස්තුව භාවිතා කරන ලදි.

## වාර්තා කිරීම

කමිටුව රැස්වීම්වල වාර්තා සමඟ එහි ක්‍රියාකාරකම් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වාර්තා කරයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අභ්‍යන්තර විගණනය, බාහිර විගණනය සහ අධ්‍යක්ෂ මණ්ඩලය අතර විවෘත සන්නිවේදන මාර්ගයක් සපයයි. කමිටුවේ අදහස වන්නේ කමිටුවේ නියමයන් (TOR) සියලු වැදගත් වන ප්‍රමාණාත්මක කරුණු තුළ සම්පාදනය කර ඇති බවයි.

# අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව

## 2025 වසරේ ක්‍රියාකාරකම්

### මූල්‍ය වාර්තා කිරීම

මූල්‍ය ප්‍රකාශනවල සහ හෙළිදරව් කිරීම් සඳහා සකස් කරන ලද කාර්තුමය වාර්තාවල අඛණ්ඩතාව සහ ඒවා නිකුත් කිරීමට පෙර එහි අඩංගු වැදගත් මූල්‍ය වාර්තාකරණ තීන්දුව නිරීක්ෂණය කිරීම සඳහා කමිටුව බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කළේය. කමිටුව ප්‍රධාන විනිශ්චය ක්ෂේත්‍ර, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ භාවිතයන්හි ඕනෑම වෙනසක්, විගණනයෙන් පැන නගින සැලකිය යුතු ගැලපීම්, අඛණ්ඩ පැවැත්මේ උපකල්පනය සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම සහ මූල්‍ය ප්‍රකාශන මගින් බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ කාර්ය සාධනය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන බවට සාක්ෂි සැපයීම සඳහා අනෙකුත් නීතිමය අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය පිළිබඳ වාර්තාව කමිටුව විසින් සමාලෝචනය කරන ලද අතර, එය අභ්‍යන්තර විගණන අංශය විසින් සොයා ගන්නා ලද කරුණු සමඟ ඉදිරිපත් කරන ලද අතර, කාර්තුමය පදනම මත ඉදිරිපත් කරන ලද කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනය සමාලෝචනය කරන ලදී.

### අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP)

2016 අංක 1 දරන බැංකු පනතේ 10 වන වගන්තියට අනුව බැංකුවේ ප්‍රාග්ධන තක්සේරු ක්‍රියාවලියේ අඛණ්ඩතාව, නිරවද්‍යතාවය සහ සාධාරණත්වය පිළිබඳ ස්වාධීන සමාලෝචනයක් අවශ්‍ය වේ. ICAAP හි නියාමන අවශ්‍යතා සපුරාලීම සඳහා අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ කාර්යක්ෂමතාව කමිටුව විසින් සමාලෝචනය කර ඇත.

### අවදානම් හඳුනා ගැනීම සහ පාලන පියවර

බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම්වල අධ්‍යක්ෂවරුන් අවදානම් හඳුනා ගැනීම සහ ඇගයීම සහ ව්‍යාපාර මෙහෙයුම් සහ මූල්‍ය වාර්තාකරණය කෙරෙහි එහි බලපෑම සඳහා වගකිව යුතුය. බැංකුව අවදානම් පාදක විගණන ප්‍රවේශයක් අනුගමනය කරන අතර කමිටුව බැංකු පනතට අනුකූලව මූල්‍ය වාර්තාකරණය පිළිබඳ බැංකුවේ අභ්‍යන්තර පාලනයේ කාර්යක්ෂමතාව තක්සේරු කරන ලදී. 2007 අංක 12 දරන නියෝගය, 3 (8) (II) (අ) වගන්තිය සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ මත පදනම්ව සකස් කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සමාලෝචනය කර තක්සේරු කරන ලද අතර, එයට සමස්ත පාලන පරිසරයේ ප්‍රමාණාත්මකභාවය සහ සැලකිය යුතු අවදානම් ක්ෂේත්‍රවල පාලනයන් ඇතුළත් විය. තවද, ගිණුම්කරණ සහ මූල්‍ය වාර්තාකරණ දෝෂ සහ වත්කම් අනිසි ලෙස පරිහරණය කිරීම, නීතිමය උල්ලංඝනයන් සහ ආයතනික පාලන සංග්‍රහයට අනුකූල නොවීම අනාවරණය කර ගැනීම සඳහා බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කර තක්සේරු කරයි. මේ සම්බන්ධයෙන්, බාහිර සහ අභ්‍යන්තර විගණකවරුන්ගේ අදාළ සොයාගැනීම් සහ නිර්දේශ, කළමනාකරණයේ ප්‍රතිචාර සමඟ සමාලෝචනය කරයි.

අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සහ අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව පිටු අංක 290 සිට 292 දක්වා දක්වා ඇත. මේ සම්බන්ධයෙන්, කමිටුවේ අදහස වන්නේ සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා අවශ්‍ය ක්‍රියා පටිපාටි සහ පරීක්ෂාවන් ක්‍රියාත්මක වන බවත් බැංකුව ඉහත සඳහන් අවශ්‍යතාවලට අනුකූල වන බවත්ය.

### අභ්‍යන්තර විගණනය සහ පරීක්ෂාව

අභ්‍යන්තර විගණන කාර්යය එය විගණනය කරන ක්‍රියාකාරකම් වලින් ස්වාධීන බව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සහතික කරයි. එය අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථය, කාර්යයන් සහ සම්පත් වල ප්‍රමාණවත් බව සමාලෝචනය කළ අතර, විගණන අංශයට එහි කාර්යය ඉටු කිරීමට අවශ්‍ය අධිකාරිය ඇති බවට ද සෑහීමකට පත්විය.

වාර්ෂික විගණන සැලැස්මට අනුව බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය ශාඛා, අංශ සහ අනෙකුත් ඒකක විගණනය සිදු කරන ලදි. තක්සේරු කරන ලද අවදානම් මට්ටම අනුව විගණන වාර ගණන තීරණය කරන ලදි. විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අනුමත කරන ලදි. 2025 වර්ෂය සඳහා අනුමත විගණන සැලැස්ම 2025 අවසානය වන විට සාක්ෂාත් කර ගෙන ඇත.

අභ්‍යන්තර විගණන අංශය ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල ඵලදායීතාවය සහතික කිරීම සඳහා විගණන පරීක්ෂාවන් සිදු කළ අතර කිසියම් අනුකූලතාවයක් නොමැතිකම සම්බන්ධයෙන් එහි සොයාගැනීම් වාර්තා කළේය. මෙහෙයුම් සහ කළමනාකරණ ක්‍රියාකාරකම් පිළිබඳ ස්වාධීන සහ වෛෂයික වාර්තාවක් සැපයීම සඳහා විගණන සිදු කරන ලදී.

අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරනු ලබන නීතිපතා විගණන පරීක්ෂණ සහ තොරතුරු පද්ධති විගණනවල සොයාගැනීම් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. තවද, කමිටුව අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරන ලද අභ්‍යන්තර විමර්ශන වාර්තා සමාලෝචනය කර අධීක්ෂණය කළ අතර වර්ෂය සඳහා විගණන සහ සුපරීක්ෂාකාරී අංශයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කාර්ය සාධනය සමාලෝචනය කළේය.

බැංකුවේ අභ්‍යන්තර විගණන අත්පොත අභ්‍යන්තර විගණන කාර්යයේ මෙහෙයුම් සාරාංශ කරන අතර සාමාන්‍යයෙන් අභ්‍යන්තර විගණන කාර්යය පාලනය කරන ප්‍රතිපත්ති, ප්‍රමිති සහ ක්‍රියා පටිපාටි විස්තර කරයි.

අභ්‍යන්තර විගණන අංශයට තම රාජකාරී ඵලදායීව සහ ස්වාධීනව ඉටු කිරීමට සහාය වීම සඳහා අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය භාවිතා කෙරේ. මෙම ප්‍රඥප්තියට අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථය, කාර්යයන්, වගකීම්, බලධාරීන්, වාර්තා කිරීමේ ක්‍රියා පටිපාටිය සහ ස්වාධීනත්වය සහ වෛෂයිකභාවය ඇතුළත් වේ.

### බාහිර විගණනය

නීතියට අනුව, විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණකවරයා වේ. විධායක කළමනාකරණයකින් තොරව බාහිර විගණකවරයා සමඟ රැස්වීම් අවම වශයෙන් දෙවරක්වත් පවත්වන ලදී. ඕනෑම වැදගත් කරුණක් පිළිබඳව සාකච්ඡා කර ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට කමිටුව ස්වාධීනව හමුවීමේ අවස්ථාව ද ඔවුන්ට ලබා දී ඇත.

විගණන ක්‍රියාවලියේ ඵලදායීතාවය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම්වලදී ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරී සමඟ සාකච්ඡා කරනු ලැබේ. විගණනය සඳහා බාහිර විගණකවරයාට අවශ්‍ය සියලුම තොරතුරු සහ ලේඛන සැපයීම කමිටුව සහතික කළේය.

වසර තුළ කමිටුව,

- 2025 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද විගණකාධිපතිවරයාගේ වාර්තාව, කළමනාකාරීත්ව ලිපිය සහ ඒ සඳහා බැංකුවේ ආයතනික කළමනාකාරීත්වය විසින් කරන ලද ප්‍රතිචාර සමාලෝචනය කර අවශ්‍ය නිවැරදි කිරීමේ පියවර අනුගමනය කළේය.
- අවශ්‍ය යැයි සැලකෙන ක්‍රියාමාර්ග ආරම්භ කරන ලද විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද වැදගත් වාර්තා සමාලෝචනය කර සාකච්ඡා කරන ලදී.

# අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව

## අභ්‍යන්තර පාලනයන් අධීක්ෂණය කිරීම

- විගණනයේදී හඳුනාගත් ගැටළු නිවැරදි කිරීම සඳහා පසු විපරම් යාන්ත්‍රණය ශක්තිමත් කර ඇත
- විනය කරුණු සහ විමර්ශන පිළිබඳ වාර්තා වරින් වර සමාලෝචනය කිරීම
- නැවත ඇතිවීම වැළැක්වීම සඳහා මූලික පියවර ගැනීම සඳහා වංචා/අක්‍රමිකතා පිළිබඳ පොදු අවස්ථා සමාලෝචනය කිරීම
- විමර්ශන/විනය විමසීම් කඩිනම් කිරීමට උපදෙස් දීම

## ආචාර ධර්ම සහ යහපත් පාලනය

බැංකුව තුළ යහපත් ආයතනික පාලන පිළිවෙත් ක්‍රියාත්මක කිරීම පිළිබඳව කමිටුව අඛණ්ඩව සමාලෝචනය කර අවධාරණය කළේය.

මේ සම්බන්ධයෙන්, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වංචා අවදානම් කළමනාකරණය සහ රහස්‍ය තොරතුරු හෙළිදරව් කිරීමේ ප්‍රතිපත්තිය බැංකුවේ අඛණ්ඩතාව ආරක්ෂා කිරීම සඳහා ප්‍රධාන අංගයකි. එය බැංකුවේ විනිවිදභාවය වැඩි දියුණු කිරීම සහ එහි ක්‍රියාකාරකම් සහ කීර්ති නාමයට හානි කළ හැකි භාවිතයන්ට එරෙහිව සටන් කිරීම සඳහා එහි පද්ධතියට සහාය වීම සහ වංචා සහ අනෙකුත් ගැටළු සහගත තත්වයන් කල්තියා හඳුනා ගැනීම සඳහා මාධ්‍යයක් සැපයීම අරමුණු කර ගෙන ඇත.

වංචා පිළිබඳ සිද්ධීන් පිළිබඳව කමිටුව සමාලෝචනය කළේය. සමාලෝචනය අතරතුර, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සංඛ්‍යානමය තොරතුරු මෙන්ම වංචා පිළිබඳ විස්තර, ඒ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග පරීක්ෂා කර, අවශ්‍ය අවස්ථාවලදී වංචා පිළිබඳ දඬුවම් සහ වැළැක්වීමේ ක්‍රියාපටිපාටි පිළිබඳව උපදෙස් නිකුත් කරන ලදී. ඕනෑම මූලික විමර්ශනයක් සහ සොයාගැනීම් සම්බන්ධයෙන් කෙටි විස්තරයක් ඉල්ලා සිටීමට අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව හට ඕනෑම අවස්ථාවක අයිතිය තිබුණි.

## ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්


බැංකුවට අදාළ වන නව සහ සංශෝධිත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (LKAs)/ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (SLFRS) සම්මත කර ගැනීම පිළිබඳ තීරණ කමිටුව සමාලෝචනය කර සංශෝධනය කර ඒ සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කළේය.

## අනුකූලතාව

නීති හා රෙගුලාසි වලට අනුකූල වීම නිරීක්ෂණය කිරීම සඳහා පද්ධතියේ ඵලදායීතාවය සහ අනුකූල නොවන ඕනෑම අවස්ථාවක කළමනාකාරිත්වයේ විමර්ශනයේ සහ පසු විපරම් (විනය ක්‍රියාමාර්ග ඇතුළුව) ප්‍රතිඵල කමිටුව විසින් සමාලෝචනය කරන ලදී.

## 2026 සහ ඉන් ඔබ්බට අවධානය

- මූල්‍ය පද්ධති, ක්‍රියාවලීන්, භාවිතා කරන අභ්‍යන්තර පාලනයන් කෙරෙහි අවධානය යොමු කිරීම දිගටම කරගෙන යෑමට බැංකුව බාහිර හා අභ්‍යන්තර පරිසරයේ සංකීර්ණ අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වමින් ඵලදායී ලෙස ක්‍රියාත්මක වේ.
- බැංකුවට බලපෑම් තක්සේරු කිරීම හරහා විගණකාධිපතිවරයාගේ ස්වාධීන සමාලෝචන මත පදනම්ව අවශ්‍ය සංවර්ධනයන් අධීක්ෂණය කිරීම සහ සිදු කිරීම.



**සුසුල් විජේසිංහ**

සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව
2026 පෙබරවාරි 6
කොළඹ

# අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටු වාර්තාව



**එස් ආර් ඩබ්ලිව් එම් රුවන් පාලිත සත්කුමාර මහතා**
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව

**කමිටුවේ සංයුතිය**

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය:

| නම | සාමාජිකත්ව තත්ත්වය | සහභාගී විය හැකි රැස්වීම් | සහභාගී වූ රැස්වීම් |
|---|---|---|---|
| **එස් ආර් ඩබ්ලිව් එම් රුවන් පාලිත සත්කුමාර මහතා*** | සභාපති | 13 | 13 |
| **ශ්‍රීඩ් නිලුක්ෂාන් මහතා*** | සාමාජික | 13 | 12 |
| **අෂේන් ජයසේකර මහතා*** (2024 පෙබරවාරි 20 සිට 2025 නොවැම්බර් 20 දක්වා) | සාමාජික | 12 | 11 |
| **දුශ්‍යන්ත බස්නායක මහතා*** (2025 නොවැම්බර් 20 දින අනුකමිටු ප්‍රතිසංවිධානයෙන් පසු පත් කරන ලදී) | සාමාජික | 01 | 00 |
| **සුපුල් විජේසිංහ මහතා**** – ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ (2025 නොවැම්බර් 20 දින අනුකමිටු ප්‍රතිසංවිධානයෙන් පසු පත් කරන ලදී) | සාමාජික | 01 | 01 |

*විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ **විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ

ඉහත සාමාජිකයින්ගේ පැහැකඩ 220 සිට 224 පිටුවල දක්වා ඇත.

**ආරාධනය මත නිතිපතා සහභාගි වන්නන්:**

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීවරයා කමිටුව වෙත අවශ්‍ය තොරතුරු සපයන අතර, ඔහුගේ තනතුරට අදාළ කරුණු සාකච්ඡා කරන අවස්ථාවලදී හැර අනෙකුත් සියලුම කමිටු රැස්වීම් සඳහා සහභාගි වේ.

එසේම, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන) සහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය අවශ්‍යතාවය මත ආරාධනය පරිදි රැස්වීම්වලට සහභාගි වේ.

**ගණපූරණය:**

අවම වශයෙන් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සහභාගි විය යුතුය.

**කමිටු ලේකම්:**

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුවේ ලේකම්වරයා ලෙස කටයුතු කරයි.

කමිටුව එහි විෂය පථය, බලතල, වගකීම් සහ ගණපූරණ අවශ්‍යතා විස්තර කෙරෙන ස්ථාපිත ප්‍රඥප්තිය යටතේ ක්‍රියාත්මක වේ. කමිටුව සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරන අතර කමිටු රැස්වීම්වල ප්‍රගතිය නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දෙනු ලැබේ.

## කමිටුවේ කාර්යභාරය සහ වගකීම්

කමිටු ප්‍රඥප්තියට අනුව කමිටුවේ කාර්යභාරයන් සහ වගකීම්වලට පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- සාමූහික ගිවිසුම මගින් තීරණය කරනු ලබන වේතන හැරුණු විට බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයට අදාළ වේතන ප්‍රතිපත්තිය (වැටුප්, දීමනා සහ අනෙකුත් මූල්‍ය ගෙවීම්) තීරණය කිරීම කමිටුවේ වගකීමකි.
- කමිටුව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා ඉලක්ක නියම කළේය. තවද, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය නියමිත ඉලක්කවලට එරෙහිව වරින් වර ඇගයීමට ලක් කළ අතර කාර්ය සාධනය මත පදනම් වූ දිරි දීමනා වල වේතනය, ප්‍රතිලාභ සහ අනෙකුත් ගෙවීම් සංශෝධනය කිරීමේ පදනම තීරණය කළේය.
- කමිටුව ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ කාර්ය මණ්ඩලයට අදාළ නියමයන් සහ කොන්දේසි වලට අමතරව සියලුම වැදගත් මානව සම්පත් ප්‍රතිපත්ති, මූලපිරීම්, වැටුප් ව්‍යුහයන් සමාලෝචනය කරයි. මෙම ක්‍රියාවලියේදී, බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයෙන් අවශ්‍ය තොරතුරු සහ නිර්දේශ ලබා ගන්නා ලදී.

# අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටු වාර්තාව


## 2025 වර්ෂය තුළ සිදුකළ ක්‍රියාකාරකම්

2025 වර්ෂය තුළ කමිටුව විසින් ඉටු කරන ලද වැදගත් කාර්යයන් පහත පරිදි වේ:

- 2024 සඳහා ප්‍රධාන කළමනාකරණ පිරිස්වල (KMPs) ප්‍රධාන කාර්ය සාධන දර්ශක ඇගයීම (සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, සියලුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් සහ සියලුම සහකාර සාමාන්‍යාධිකාරීවරුන් - අධ්‍යක්ෂ මණ්ඩලයට හෝ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවකට සෘජුවම වාර්තා කරන නිලධාරීන් හැර)
- බැංකුවේ අවශ්‍යතා මත පදනම්ව කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සහ උසස්වීම් සමාලෝචනය කරන ලදී.
- මානව සම්පත් සම්බන්ධ කරුණු සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද අභියාචනා සලකා බැලීම.
- කාර්ය මණ්ඩල උසස්වීම් සඳහා විනය ක්‍රියා පටිපාටි/දඬුවම් වල බලපෑම සමාලෝචනය කිරීම.
- බැංකුවේ ප්‍රධාන තනතුරු ආදිය සඳහා බඳවා ගැනීම් සඳහා මූලපිරීම්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය, සැලසුම් සහ කළමනාකරණ තොරතුරු පද්ධති) සහ සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)
- 2025 වර්ෂය සඳහා වන විනය පරීක්ෂණ

## 2026 සහ ඉන් ඉදිරියට අවධානය යොමු කරන කරුණු

- 2024 අංක 05 දරන බැංකු පනත් නියෝගවලට අනුකූලව විමර්ශන කොන්දේසි (TOR) යාවත්කාලීන කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරනු ඇත:
  - අධ්‍යක්ෂවරුන්ගේ, ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ පාරිශ්‍රමිකයන් බැංකුවේ අවදානම් සීමාවන්ට අනුකූලව පෙළගැස්වීම.
  - ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා කාර්යසාධනය මත පදනම් වූ ගෙවීම් ආපසු අයකර ගැනීමේ (Claw-back) විධිවිධාන සකස් කිරීම.
  - අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය විශ්‍රාම යාමේදී ලබා දෙන ප්‍රතිලාභ සඳහා අනුමත කිරීමේ ක්‍රියාවලියක් සකස් කිරීම.
- පාරිශ්‍රමික ප්‍රතිපත්තියේ යෝග්‍යතාවය අඛණ්ඩව සහතික කිරීම.
- උද්‍යෝගිමත් සේවක සංස්කෘතියක් ඇති කිරීම සඳහා මානව සම්පත් උපාය මාර්ග සංවර්ධනය කිරීම කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කිරීම.
- ප්‍රඥප්තියේ වගකීම් ඉටු කිරීම.



**එස් ආර් ඩබ්ලිව් එම් රුවන් පාලිත සත්කුමාර**

සභාපති

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ
පාරිශ්‍රමික කමිටුව

2026 පෙබරවාරි 6
කොළඹ

# අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටු වාර්තාව



**රනිල් ගුණතිලක මහතා**
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව

**කමිටුවේ සංයුතිය**

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය:

| නම | සාමාජිකත්ව තත්ත්වය | සහභාගී විය හැකි රැස්වීම් | සහභාගී වූ රැස්වීම් |
|---|---|---|---|
| **රනිල් ගුණතිලක මහතා**** (2025 නොවැම්බර් 20 සිට මේ දක්වා සභාපති) | සභාපති | 01 | 01 |
| **එස් ආර් ඩබ්ලිව් එම් රුවන් පාලිත සත්කුමාර මහතා** (2025 නොවැම්බර් 19 දක්වා සභාපති) | සාමාජික | 08 | 08 |
| **ජූඩ් නිලුක්ෂාන් මහතා*** (2022 මාර්තු 8 සිට 2025 නොවැම්බර් 20 දක්වා) | සාමාජික | 07 | 07 |
| **දුශ්‍යන්ත බස්නායක මහතා*** | සාමාජික | 08 | 08 |
| **සුපුල් විජේසිංහ මහතා**** – ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ | සාමාජික | 01 | 01 |

*විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ **විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ

ඉහත සාමාජිකයින්ගේ පැතිකඩ 220 සිට 224 පිටුවල දක්වා ඇත.

**ගණපූරණය**

අවම වශයෙන් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු.

**ආරාධනය මත නිතිපතා සහභාගි වන්නන්:**

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී විසින් කමිටුවට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරන අතර ආරාධනයෙන් කමිටුවේ රැස්වීම්වලට සහභාගී වේ.

**කමිටුවේ ලේකම්**

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු ලේකම් ලෙස කටයුතු කරයි.

කමිටුව ක්‍රියාත්මක වන්නේ එහි විෂය පථය, අධිකාරිය, වගකීම් සහ ගණපූරණය අවශ්‍යතා දක්වා ඇති ස්ථාපිත යොමු නියමයන් යටතේ ය. කමිටුව සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරන අතර, කමිටු රැස්වීම්වල කටයුතු නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කර ඇත.

## කමිටුවේ කාර්යභාරය සහ වගකීම්

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී තනතුරට සහ ප්‍රධාන කළමනාකරණ තනතුරු සඳහා පත් කිරීමට හෝ උසස් කිරීමට සුදුසුකම් ලැබීමට අවශ්‍ය සුදුසුකම්, පළපුරුද්ද වැනි නිර්ණායක සහ ප්‍රධාන ගුණාංග නියම කිරීම, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් තෝරා ගැනීම/පත් කිරීම සඳහා ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව වගකිව යුතුය.

තවද, කමිටුව විසින් අධ්‍යක්ෂවරුන්, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් නියෝග 3 (3) උපදෙස් වල දක්වා ඇති නිර්ණායකවල සහ ප්‍රඥප්තිවල දක්වා ඇති පරිදි තනතුරු දැරීමට සුදුසු පුද්ගලයින් බව සහතික කළ යුතුය. කමිටුව විසින් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් විශ්‍රාම ගැනීම සඳහා අමතර/නව විශේෂඥතාවේ අවශ්‍යතා සහ අනුප්‍රාප්තික විධිවිධාන කලින් කලට සලකා බලා නිර්දේශ කළ යුතුය.

## 2025 වසර තුළ ක්‍රියාකාරකම්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ, නාමයෝජනා කමිටු රැස්වීම් අටක් (8) පවත්වන ලදී.

වසර තුළ කමිටුව සහභාගී වූ සහ සිදු කරන ලද වැදගත් ක්‍රියාකාරකම් පහත පරිදි වේ:

- බැංකුවේ ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMP) සඳහා බඳවා ගැනීමේ යෝජනා ක්‍රම සමාලෝචනය කිරීම.
- ප්‍රධාන කළමනාකරණ පිරිස් (බැංකු සහ බැංකු නොවන) උසස්වීම්/පත්කිරීම් සඳහා සම්මුඛ පරීක්ෂණ.

## 2026 සහ ඉන් ඉදිරියට අවධානය යොමු කරන කරුණු

- 2024 අංක 05 දරන බැංකු පනත් නියෝගවලට අනුකූලව යොමු කොන්දේසි යාවත්කාලීන කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරනු ඇත:
  - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වයේ තත්ත්වය ඇගයීම
  - අධ්‍යක්ෂවරුන් සඳහා පුහුණුව, ධාරිතා වර්ධනය සහ වෘත්තීය සංවර්ධන වැඩසටහන්
  - නැවත තේරී පත්වීම සඳහා අධ්‍යක්ෂවරුන්ගේ කාලානුරූප ඇගයීම
  - විශ්‍රාම යන අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන විධායක නිලධාරීන් සඳහා අනුප්‍රාප්තික විධිවිධාන
  - සියලුම අදාළ නීති සහ රෙගුලාසි සහ කර්මාන්තයේ යහපරිචයන් සැලකිල්ලට ගනිමින් සමස්ත ආයතනික පාලන රාමුව සහ ප්‍රතිපත්ති සමාලෝචනය කර, යාවත්කාලීන කර, ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන බවට සහතික කිරීම.
- ප්‍රධාන කළමනාකරණ පිරිස් සම්බන්ධ කරුණු පිළිබඳ සමාලෝචනය අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම පිළිපැදීම
- අනුප්‍රාප්තික සැලැස්ම සහ බැංකුවේ අනුකූලතාවය අඛණ්ඩව අධීක්ෂණය කිරීම.
- ප්‍රධාන කළමනාකරණ පිරිස් වලට අදාළ තනතුරු සඳහා සුදුසු පුද්ගලයින් බඳවා ගැනීම පිළිබඳ සමාලෝචනය
- නව රෙගුලාසිවලට අනුව ස්වාධීන අධ්‍යක්ෂවරුන් පත් කිරීම.



**රනිල් ගුණතිලක**
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව
2026 පෙබරවාරි 6
කොළඹ

# අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව



**ජූඩ් නිලුක්ෂාන් මහතා**
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ

**කමිටුවේ සංයුතිය**

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය:

| නම | සාමාජිකත්ව තත්ත්වය | සහභාගී විය හැකි රැස්වීම් | සහභාගී වූ රැස්වීම් |
|---|---|---|---|
| **ජූඩ් නිලුක්ෂාන් මහතා*** | සභාපති | 07 | 05 |
| **එස් ආර් ඩබ්ලිව් එම් රුවන් පාලිත සත්කුමාර මහතා*** | සාමාජික | 07 | 07 |
| **අෂේන් ජයසේකර මහතා*** | සාමාජික | 07 | 06 |

*විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ **විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ

ඉහත සාමාජිකයින්ගේ පැතිකඩ 220 සිට 224 පිටුවල දක්වා ඇත.

**ආරාධනය මත නිතිපතා සහභාගි වන්නන්:**
බැංකුවේ සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරි, ප්‍රධාන අවදානම් නිලධාරි සහ අනුකූලතා නිලධාරි ආරාධනය පරිදි නිතිපතා රැස්වීම්වලට සහභාගි වෙති. එසේම, අවශ්‍යතාවය පරිදි අනෙකුත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්, සහකාර සාමාන්‍යාධිකාරීවරුන් සහ ප්‍රධාන කළමනාකරුවන් ද රැස්වීම්වලට සහභාගි විය යුතුය.

**ගණපූරණය**
අවම වශයෙන් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සහභාගි විය යුතුය.

**කමිටු ලේකම්**
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ ලේකම්වරයා ලෙස කටයුතු කරයි.

## කමිටුවේ නිර්දේශ නියමයන්

1988 අංක 30 දරන බැංකු පනතේ 46 (1) වගන්තිය ප්‍රකාරව, සංශෝධිත (බැංකු පනත) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද, බලපත්‍රලාභී බැංකු සඳහා ආයතනික පාලනය යන 2024 අංක 05 දරන බැංකු පනතේ විධානයට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව ස්ථාපිත කර ඇත.

බැංකුව තුළ ඒකාබද්ධ අවදානම් කළමනාකරණය සඳහා ස්වාධීන අවදානම් කළමනාකරණ කාර්යයක් ස්ථාපිත කිරීම කමිටුවේ වගකීමකි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරන ලද නිර්දේශ කොන්දේසි (TOR) වලට පහත සඳහන් දැ ඇතුළත් වේ:

- බැංකුව විසින් අනුමත කරන ලද ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සහ අනෙකුත් අවදානම් ආශ්‍රිත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ බැංකුව පුරා අවදානම් කළමනාකරණ රාමුව වරින් වර යාවත්කාලීන කිරීම.
- බැංකුව මුහුණ දෙන සියලුම ණය, වෙළඳපල, මෙහෙයුම් සහ උපායමාර්ගික අවදානම් නිසි පරිදි හඳුනා ගැනීම, මැනීම, අධීක්ෂණය සහ කළමනාකරණය කිරීම සහතික කිරීම.
- වගකිවයුතු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සියලුම තීරණාත්මක අවදානම් ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු ලබා ගැනීම සහ කමිටුවට පැවරී ඇති බලතල සහ වගකීම් රාමුව තුළ අධ්‍යක්ෂ මණ්ඩලයට සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම.
- නව මෙහෙයුම් වර්ධනයන්හි අවදානම් සහ ඒ හා සම්බන්ධ අනුකූලතා කරුණු හඳුනා ගැනීම, සමාලෝචනය කිරීම, වාර්තා කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නියෝග ක්‍රියාත්මක කිරීම සහ ඒවාට අනුකූල වීම සමාලෝචනය කිරීම.

බැංකු සහ/හෝ මූල්‍ය සේවා සම්බන්ධයෙන් අවදානම් කළමනාකරණ ගැටළු සහ භාවිතයන් පිළිබඳ හොඳ සාමූහික අත්දැකීම් ඇති සාමාජිකයින්ගෙන් කමිටුව සමන්විත වේ. කමිටුව ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සමඟ ඉතා සමීපව කටයුතු කරන අතර පවරා ඇති අධිකාරිය සහ වගකීම රාමුව තුළ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් තීරණ ගනී.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් ප්‍රධාන අවදානම් නිලධාරියාගේ කාර්යභාරයන් අධීක්ෂණය කරනු ලබන අතර, අවදානම් පැතිකඩ, ස්ථාපිත අවදානම් රුචියෙහි සීමාවන්ට සාපේක්ෂව පවතින නිරාවරණයන් සහ එම සීමාවන් ඉක්මවා යාම් සම්බන්ධයෙන් ප්‍රධාන අවදානම් නිලධාරියාගෙන් සහ අනෙකුත් අදාළ අංශවලින් නිතිපතා වාර්තා සහ සන්නිවේදනයන් ලබා ගනු ලබයි. බැංකුවේ ප්‍රතිපත්ති මෙන්ම නියාමන හා අධීක්ෂණ අවශ්‍යතා මත පදනම්ව කමිටුව විසින් තීරණය කරනු ලබන විචක්ෂණශීලී මට්ටම් ඉක්මවා අවදානම් පවතින අවස්ථාවලදී, එම විශේෂිත අවදානම්වල බලපෑම අවම කිරීම සඳහා කඩිනම් නිවැරදි කිරීමේ පියවර ගැනීම මෙහි අරමුණයි. තවද, මෙම කමිටුව විසින් අනුකූලතා නිලධාරියාගේ කාර්යභාරයන් අධීක්ෂණය කරනු ලබන අතර, ඇය විසින් ඉදිරිපත් කරනු ලබන වාරික වාර්තා සමාලෝචනය කිරීමද සිදු කරනු ලබයි.

## අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් රැස්වීම්වල සවිස්තරාත්මක වාර්තා ඇතුළුව සිය ක්‍රියාකාරකම් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සෘජුවම වාර්තා කරනු ලබයි. එමෙන්ම, විනිවිදභාවය සහ කාර්යක්ෂමතාව සහතික කරමින්, අවදානම් කළමනාකරණ අංශය, අභ්‍යන්තර විගණන අංශය සහ අධ්‍යක්ෂ මණ්ඩලය අතර බාධාවකින් තොර සන්නිවේදනයක් සහ සහයෝගීතාවක් පවත්වා ගැනීමට මෙම කමිටුව අනුබල දෙයි. තවද, කමිටුවේ විමර්ශන කොන්දේසි (Terms of Reference) සියලුම වැදගත් කරුණු සම්බන්ධයෙන් පුළුල් ලෙස සහ පූර්ණ වශයෙන් අනුගමනය කර ඇති බව කමිටුව මෙහිදී ස්ථිර කර සිටියි.

# අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

## 2025 වර්ෂය තුළ සිදුකළ ක්‍රියාකාරකම්

කමිටු ප්‍රඥප්තියට අනුව කමිටුව කාර්තුවකට වරක් රැස්වන අතර, පැන නගින අවශ්‍යතා මත අමතර රැස්වීම් ද පවත්වනු ලැබේ. 2025 වර්ෂය තුළ කමිටු රැස්වීම් හතක් (7) පවත්වන ලදි. වර්ෂය තුළ සිදුකළ ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ:

2025 වර්ෂය තුළදී, අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ පාලන ව්‍යුහය සමාලෝචනය කරමින් මෙන්ම, අවදානම් කළමනාකරණ සහ අනුකූලතා කාර්යභාරයන් නිසි පරිදි ස්ථානගත කිරීමට පියවර ගනිමින්, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව (Integrated Risk Management Framework) සක්‍රීයව ක්‍රියාත්මක වන බව කමිටුව විසින් සහතික කරන ලදී.

බැංකුවේ උපායමාර්ගික, ප්‍රාග්ධන සහ මූල්‍ය සැලසුම්වලට අනුකූල වන පරිදි බැංකුවේ "අවදානම් රුචිය" (Risk Appetite) නිර්වචනය කිරීමට කමිටුව කැපවී ක්‍රියා කළ අතර, නියමිත වේලාවට අවශ්‍ය පියවර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීම පිණිස, අවදානම් රුචියෙහි සීමාවන් ඉක්මවා යාම් පිළිබඳව කාලීනව නිරීක්ෂණය කරන ලදි.

ක්ෂණික අවධානය යොමු කළ යුතු විශේෂිත අවදානම් ක්ෂේත්‍ර හඳුනාගෙන ඒවා නියමිත වේලාවට විසඳීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් විශේෂ රැස්වීම් කිහිපයක් පවත්වනු ලැබිය.

අවදානම් කළමනාකරණ සහ අනුකූලතා ක්‍රියාවලීන්හි සඵලතාවය බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය මගින් වාර්ෂිකව විගණනය කරනු ලැබේ. වර්ෂය තුළ කමිටුව සහභාගී වූ සහ ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ:

1. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස, බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ (IRM) ප්‍රතිපත්ති රාමුව, අවදානම් රුචිය පිළිබඳ ප්‍රකාශය (Risk Appetite Statement) සහ අවදානම් දරාගැනීමේ සීමාවන් (Tolerance Limits) සමාලෝචනය කිරීම.

2. අවදානම් සීමාවන් සමාලෝචනය කිරීම සහ ඒවා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා නිර්දේශ කිරීම.

3. ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශ සහ අභ්‍යන්තර විගණන සොයාගැනීම්වලට අනුව, අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය ඇගයීමේ ක්‍රියාවලියේ (ICAAP) ප්‍රමාණාත්මකභාවය සමාලෝචනය කිරීම.

4. සියලුම අවදානම් ක්ෂේත්‍ර (එනම් ණය, වෙළඳපළ, මෙහෙයුම්, ද්‍රවශීලතාව ආදී) ආවරණය වන පරිදි, බැංකුවේ අවදානම් පැතිකඩ, අවදානම් රුචිය සහ දරාගැනීමේ සීමාවන්ට සාපේක්ෂව කාලීනව සමාලෝචනය කිරීම.

5. පාලන පද්ධති ශක්තිමත් කිරීම සහ අවදානම් අවම කිරීමේ පියවර නිර්දේශ කිරීම සඳහා, අවදානම් පාලන ස්වයං-ඇගයීම් (RCSA) වාර්තා, මූලික හේතු විශ්ලේෂණ (RCA) වාර්තා සහ ණය සමාලෝචන යාන්ත්‍රණ (LRM) වාර්තා සමාලෝචනය කිරීම.

6. අනුකූලතාවයට අදාළ ප්‍රතිපත්ති, අනුකූලතා වැඩසටහන සහ අනුකූලතා අත්පොත (Compliance Manual) වාර්ෂිකව සමාලෝචනය කිරීම.

7. බැංකුවේ අනුකූලතා ඇගයීම් ඇතුළුව, අනුකූලතා අංශය මඟින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සමාලෝචනය කිරීම.

## 2026 සහ ඉන් ඉදිරියට අපගේ අවධානය

I. යහපාලන ප්‍රමිතීන් ආරක්ෂා කර ගැනීම උදෙසා බැංකුවේ අවදානම් සහ අනුකූලතා උපායමාර්ගය අඛණ්ඩව නිරීක්ෂණය කිරීම සහ ඒවා සඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම.

II. වෙළඳපළ වර්ධනයන්ට අනුකූල වන පරිදි බැංකුවේ අවදානම් කළමනාකරණය සහ අනුකූලතා ප්‍රවේශය සකස් කරමින්, නිරන්තරයෙන් වෙනස් වන නියාමන අවශ්‍යතාවලට හැඩගැසීම කෙරෙහි අවධානය යොමු කිරීම.

III. අවදානම් කළමනාකරණ සහ අනුකූලතා කාර්යභාරයන් ස්වාධීනව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් මානව සම්පත සහ අනෙකුත් සම්පත් ලබා දීම සහතික කිරීම.

IV. ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගේ දායකත්වය ලබා ගනිමින් කමිටු සංයුතිය තවදුරටත් ශක්තිමත් කිරීම.



**ශ්‍රීඩ් නිලුක්ෂාන්**

සභාපති

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

2026 පෙබරවාරි 6
කොළඹ

# අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටු වාර්තාව



**දුෂ්‍යන්ත බස්නායක මහතා**
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුව

**කමිටුවේ සංයුතිය**

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපාය මාර්ග කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය.

| නම | සාමාජිකත්ව තත්ත්වය | සහභාගී විය හැකි රැස්වීම් | සහභාගී වූ රැස්වීම් |
|---|---|---|---|
| දුෂ්‍යන්ත බස්නායක මහතා* | සභාපති | 12 | 12 |
| එස් ආර් ඩබ්ලිව් එම් රුවන් පාලිත සත්කුමාර මහතා* | සාමාජික | 12 | 11 |
| අෂේන් ජයසේකර මහතා* | සාමාජික | 12 | 10 |
| **සුපුල් විජේසිංහ මහතා**** – ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ (2026 ජනවාරි 19 දින සිට) | සාමාජික | – | – |

*විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ **විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ

ඉහත සාමාජිකයින්ගේ පැතිකඩ 220 සිට 224 දක්වා පිටුවල දක්වා ඇත.

**ආරාධනය මත නිතිපතා සහභාගි වන්නන්:**
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)/ප්‍රධාන තොරතුරු නිලධාරීවරයා කමිටුව වෙත තොරතුරු සපයන අතර ආරාධනය පරිදි කමිටු රැස්වීම් සඳහා සහභාගි වෙති.

**ගණපූරණය**
අවම වශයෙන් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සහභාගි විය යුතුය.

**කමිටු ලේකම්**
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා, අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුවේ ලේකම්වරයා ලෙස ද කටයුතු කරයි.

තොරතුරු තාක්ෂණය කෙරෙහි බැංකුව සතු විශ්වාසනීයත්වය සහතික කිරීම සඳහාත්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අනුකූලව බැංකුවේ උපායමාර්ගික අරමුණු අධීක්ෂණය කිරීම සඳහාත් අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුව ස්ථාපිත කරන ලදි.

## කමිටුවේ කාර්යභාරය සහ වගකීම්

බැංකුවේ තොරතුරු තාක්ෂණ පාලන රාමුව සමාලෝචනය කිරීම, වැඩිදියුණු කිරීම සහ අනුමත කිරීම මෙන්ම වෙළඳපල ප්‍රවණතා සහ අභියෝගවලට සාර්ථකව මුහුණ දීම සඳහා නව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම මෙහිදී සිදු කෙරේ. තවද, තොරතුරු තාක්ෂණයට අදාළ ව්‍යාපෘති සහ ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණ ක්‍රියාවලියක් සහතික කරමින්, ඒ පිළිබඳ අවශ්‍ය නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමද කමිටුව මඟින් සිදු කරනු ලබයි. මෙහිදී අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු සමඟ සුමට සබඳතාවක් පවත්වා ගැනීමත්, බැංකුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආරක්ෂණ පද්ධතිවල ප්‍රමාණාත්මකභාවය සහ සඵලතාවය සහතික කිරීමත් අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුව වෙත පැවරී ඇති වගකීමකි.

## 2025 වර්ෂය තුළ සිදුකළ ක්‍රියාකාරකම්

බැංකුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘතිවලට අදාළ ප්‍රසම්පාදන යෝජනා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා කමිටුව විසින් නිර්දේශ කරන ලදී. එමෙන්ම, අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුවේ ප්‍රඥප්තිය සමාලෝචනය කර, වැඩිදියුණු කොට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. මීට අමතරව, පාරිභෝගික දත්ත ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය කමිටුව විසින් අවධාරණය කරන ලද අතර, තොරතුරු ආරක්ෂණය වෙනුවෙන් අවශ්‍ය සියලුම ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කර ඇති බව සහතික කරන ලදී.

තවද, 2024 සැප්තැම්බර් මාසයේදී ස්ථාපිත කරන ලද නව මූලික බැංකු පද්ධතියේ ප්‍රගතිය සමාලෝචනය කිරීමද කමිටුව මඟින් සිදු කරන ලදී.

## 2026 සහ ඉන් ඉදිරියට අවධානය යොමු කරන කරුණු

- බැංකුවේ මූලික බැංකුකරණ විසඳුම සියුම්ව සකස් කිරීම.
- සයිබර් ආරක්ෂාවට අදාළ කරුණු වලට වඩා ඉදිරියෙන් සිටීමට අඛණ්ඩ අවධානයක් යොමු කිරීම. ශක්තියේ මූලික කාර්යයක් ලෙස තොරතුරු තාක්ෂණ පාලන රාමුව නඩත්තු කිරීම.



**දුෂ්‍යන්ත බස්නායක**

සභාපති

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුව

2026 පෙබරවාරි 6
කොළඹ

# අවදානම් කළමනාකරණ වාර්තාව

අවදානම් කළමනාකරණය වැදගත් කාර්යක් වන අතර එය ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වටිනාකම එකතු කිරීමේ හැකියාව වර්ධනය කරයි. ඒ අනුව, බැංකුව සියලුම මෙහෙයුම් හා ව්‍යාපාර කාර්යයන් හරහා අවදානම් කළමනාකරණයට පහසුකම් ඇතිකර දිරි ගන්වයි. බැංකුව අවදානම් රුචිය උපායමාර්ගයට පරිස්සමින් පෙළ ගස්වමින් ශක්තිමත් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවක් තුළින් පාර්ශ්වකරුවන්ගේ බැඳියාවන් ස්ථිරව සුරක්ෂිත කර ඇත.

## බාහිර පරිසරය

ශ්‍රී ලංකා ආර්ථිකය 2025 වසර තුළ කර්මාන්ත, සේවා, සංචාරක, සහ විදේශ ප්‍රේෂණ අංශ සමඟ වර්ධිත සංචිත හා මූල්‍ය විනය යනාදියේ සහය ලබමින් පුරෝකථනය කළ 4-5% දළ දේශීය නිෂ්පාදිත වර්ධන වේගය වෙත ලඟාවීම සඳහා ධනාත්මක ප්‍රතිසාධන සංඥා පෙන්නුම් කළේය.

කෙසේවෙතත්, ප්‍රතිසාධනය දැනට පවත්නා ප්‍රතිසංස්කරණ මත රැඳෙමින් නොසැලී පැවති අතර සමාජීය නොසන්සුන්බව ඉහළ ණය, සහ විෂම පුද්ගලික අංශයේ වර්ධනයට මෙන්ම දේශගුණ කම්පනවල අනතුරට භාජනය වී පැවතුණි. මෙම ආර්ථික සහ දේශගුණ අභියෝගවලට අනුව දිගුකාලීන ඔරොත්තුදීම දේශපාලන ස්ථාවරත්වය සහ ශ්‍රී ලංකාවේ ජාතික දේශගුණ මූල්‍ය උපායමාර්ගය (2025–2030) වැනි ප්‍රතිපත්ති මූලපිරීම් සාර්ථකව ක්‍රියාත්මකවීම මත රඳා පවතී.

රටේ ණය අනුපාතය S&P ග්ලෝබල්, මූඩීස්, සහ ෆිච් ශ්‍රේණිගතකරණ වැනි ප්‍රධාන ජාත්‍යන්තර ආයතන විසින් 2025 දී උසස් කරන ලද අතර ඉන් ණය ප්‍රතිව්‍යුහගතකරණය, වර්ධිත සාර්ව ආර්ථික දර්ශක, සහ ස්ථාවර දැක්මක් සමඟ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) විසින් සහය වූ ප්‍රතිසංස්කරණ කරා කැපවීම තුල අබණ්ඩව ක්‍රියාත්මක කිරීමේ විශ්වාසය සලකුණු කරමින් ප්‍රගතිය පිළිබිඹු කළේය.

සංචාරක අංශය වසර පුරා සංචාරකයින් පැමිනීමත් සමඟ ශක්තිමත් ප්‍රතිසාධන මට්ටමක් පෙන්නුම් කළ අතර පසුගිය වසරට සාපේක්ෂව සැලකියයුතු වර්ධනයක් ඒ තුළ පිළිබිඹු විය. විදේශ සේවක ප්‍රේෂණ 2022 වාර්තා වූ වසර 10ක අඩුම මට්ටමේ සිට නැවත වර්ධනය වූ අතර 2025 දී වාර්තාගත ඉහළ මට්ටමකට ලඟා විය. විශේෂයෙන් අබණ්ඩ වෙළෙඳ අසමතුලිතතා හමුවේ විදේශ විනිමය සංචිත ශක්තිමත් කිරීමේදී සහ ගෙවුම් ශේෂ ජංගම ගිණුමේ හිඟය හිලව් කිරීමේදී විදේශ ප්‍රේෂණ තීරණාත්මක කාර්යභාරයක් අබණ්ඩව ඉටු කර ඇත.

කොළඹ කොටස් හුවමාරුව (CSE) රු.ට්‍රිලියන 8.1ක වාර්තාසහගත වෙළෙඳපොල ප්‍රාග්ධනීකරණයක් සමඟ වසර අවසන් කරන ලද අතර, එය පසුගිය වසරට සාපේක්ෂව 42%ක වැඩිවීමක් පිළිබිඹු කරයි. දේශීය ආයෝජක සහභාගිත්වය සැලකියයුතු ලෙස වැඩි වූ අතර විදේශීය ආයෝජක සහභාගිත්වය 2025 වසර තුළ මුළු වෙළෙඳපොල පිරිවැටුමෙන් ආසන්න වශයෙන් 4%ක් සඳහා දායක විය. මෙම ප්‍රවනතාවය සඳහා අඩු පොලී අනුපාත ක්‍රියාදාමය, වැඩිවූ දේශපාලන ස්ථාවරත්වය සහ අපේක්ෂිත ආර්ථික ප්‍රතිසංස්කරණ සහය විය.

තාක්ෂණය හා නව්‍යකරණයේ වැඩි දියුණු වීම් බැංකුකරණය තුළ නව වර්ධන අවස්ථා අඛණ්ඩව නිර්මාණය කළ අතර සේවා කාර්යක්ෂමතාව වර්ධනය කරයි. කෙසේවෙතත්, එය සැලකියයුතු සයිබර් ආරක්ෂක තර්ජන ද හඳුන්වා දේ. බැංකුව තම පද්ධති ආරක්ෂා කිරීමේ ක්‍රියාමාර්ග සහ මෙවැනි අවදානම් අවම කිරීමේ ක්‍රියාවලි අබණ්ඩව ශක්තිමත් කර ඇත.

ලෝක බැංකු සමූහය විසින් මුදාහැරි ගෝලීය සීග්‍ර පශ්චාත් ආපදා හානි තක්සේරු (GRADE) වාර්තාවට අනුව, පසුගිය නොවැම්බර්වල ශ්‍රී ලංකාව සහ දකුණු ඉන්දියාවට අධික වර්ෂාව ඇතිකළ විපත්තිකාරක නිවර්තන සුලිකුණාටුවක් වන, දිට්වා සුලි කුණාටුව ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 4%කට ආසන්නනව සමාන අලාභවල ඇ.ඩොලර් බිලියන 4.1ක් අලාභ සිදුකර ඇත. ශ්‍රී ලංකාවේ මෑත ඉතිහාසය තුළ වඩාත් තීව්‍ර සහ විනාශකාරී අතර, මෙම කුණාටුව සියලුම දිස්ත්‍රික්ක 25 තුළ මිලියන 2ක ජනතාව සහ පවුල් 50,000කට ආසන්න වශයෙන් බලපාන ලද අතර ජීවනෝපායන්, අත්‍යවශ්‍ය සේවා සහ වඩා පුළුල්ව ආර්ථිකයට බාධා කර ඇත. මධ්‍යම පළාත වැඩියෙන්ම පීඩාවට පත් පළාත වේ. පුද්ගලයින්ගෙන්, ජාත්‍යන්තර ආයතනවලින්, සහ ප්‍රජාවන්ගෙන් ප්‍රදාන සහ පරිත්‍යාග වඩාත් පීඩාවට පත් ප්‍රදේශවල ප්‍රතිසාධනයට සහයවීමට සහ සෞඛ්‍යාරක්ෂාව, ජලය, අධ්‍යාපනය, කෘෂිකර්මය, සම්බන්ධතා ඇතුළු අත්‍යවශ්‍ය සේවා සහ යටිතලපහසුකම් ප්‍රතිසංස්කරණයට යොදාගෙන ඇත.

දිට්වා සුලි කුණාටුව මගින් අහිතකර කාලගුණ සිදුවීම් හේතු කොට සැලකියයුතු මුදල් අලාභ සහ පද්ධතිමය ආර්ථික දුර්වලතා ඇතිකරන ආකාරය පෙන්වා දී ඇති අතර බැංකු ක්ෂේත්‍රය සඳහා කාලගුණ අවදානමේ අදාළත්වය තහවුරු කර ඇත. මෙම සිදුවීම මගින් කාලගුණ අවදානම් සඳහා මූලික ව්‍යූහ තිබීම සහ හදිසි ප්‍රායෝගික විසඳුම් ක්‍රියාත්මක කිරීම අතර පරතරය ඉස්මතු කර ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සුලිකුණාටු ආපදා සහය සඳහා 2025 දෙසැම්බර්වල හදිසි මූල්‍යකරණ උපකරණ (RFI) යටතේ ඇ. ඩොලර් 206ක පමණ හසිදි අරමුදල් ලබා දෙන ලදී. මෙය දැනට පවතින ඇ. ඩොලර් බිලියන 3ක විස්තීර්ණ අරමුදල් පහසුකම් (EFF) වැඩසටහනින් වෙනස් එකකි. මෙහි හතරවැනි සමාලෝචනය 2025 ජූලිවල නිමකරන ලද අතර, ඇ.ඩොලර් මිලියන 350ක් පමණ ලබා දී ඇත. ඒ අනුව මුළු ලබාදීම රුඩොලර් බිලියන 1.74ක් වේ. RFI ණය වසර 3-5 ක ආපසු ගෙවීමේ කාලයක් සහිත කෙටිකාලීන වරක් පමණක් සිදු වූ ණය පහසුකමක් වන අතර EFF පුළුල් ආර්ථික ප්‍රතිසංස්කරණවලට සහය වේ.

බාහිර පරිසරයේ සංවර්ධනයන් ජාතික ඉතිරිකිරීමේ බැංකු සමූහය තුළ විස්තීර්ණ අවදානම් කළමනාකරණ රාමුවක් සඳහා අවශ්‍යතාව වැඩි කර ඇත.


## අවදානම් කළමනාකරණ රාමුව

ඒකාබද්ධ අවදානම් කළමනාකරණය යනු බැංකුව තුළ අවදානම් හඳුනාගෙන, කළමනාකරණය කිරීමේ සහ සන්නිවේදනය කිරීමේ අඛණ්ඩ, සක්‍රීය, සහ ක්‍රමානුකූල ක්‍රියාවලියකි. එය බැංකුවේ සෑම මට්ටමකම විභව අවදානම් හඳුනා ගැනීමට සිදුවෙමින් පවතින තක්සේරු කිරීම්වලට සම්බන්ධ වන අතර, දැනුවත් තීරණ ගැනීම සඳහා පහසුකම් සැලසීම සඳහා වඩා ඉහළ මට්ටම්වලට ප්‍රතිඵල සන්නිවේදනය කරයි.

ඵලදායී අවදානම් කළමනාකරණ රාමුවක් තුළින් ඔරෝත්තුදීම ශක්තිමත් කර තිරසාර ව්‍යාපාර ආකෘතියකට සහය වේ. අවදානම් හඳුනාගනිමින්, තක්සේරු කරමින්, පාලනය කරමින් සහ නියාමනය කරමින්, බැංකුවලට වියහැකි මූල්‍ය කම්පනවලින් තමන් ආරක්ෂා කරගෙන තීරණ ගැනීම වැඩිදියුණු කරගත හැකිය.

සියලුම සේවකයින් අවදානම් කළමනාකරණය සඳහා වගකීමට බැඳෙන අතර අධ්‍යක්ෂ මණ්ඩලය අවසාන වගකීම දරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුව සහ පරිපාලිත සමාගම අතර විස්තීර්ණ අවදානම් කළමනාකරණ රාමුවක් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරයි.

## අවදානම් කළමනාකරණ වාර්තාව




**රූපය 22** අවදානම් කළමනාකරණ රාමුව

### අවදානම් පාලනය හා සංස්කෘතිය

අවදානම් පාලන ව්‍යූහයක් කාර්යභාරයන්, වගකීම් සහ ක්‍රියාවලි පිළිබඳ රාමුවක් විස්තර කරන අතර, ඉන් අවදානම් කළමනාකරණය උපායමාර්ගික තීරණ ගැනීම සහ දෛනික මෙහෙයුම්වලට ඒකාබද්ධ කරන බව සහතික කෙරේ. ඵලදායී අවදානම් පාලන ව්‍යූහයක් ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන අතර නියාමන අනුකූලතාවය සහතික කර පාර්ශවකාර හිමිකම් සුරක්ෂිත කරයි.

අවදානම් පාලනයේ ඉහළම ප්‍රමිති නගා සිටුවීමට සහ අවදානම් කළමනාකරණ මනා පිළිවෙත් මනා පරිචයන් යොදා ගැනීමට බැංකුව කැපවී සිටී. මෙමඟින් අධ්‍යක්ෂ මණ්ඩලයට හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට ඵලදායීව සහ විචක්ෂණව අවදානමට අදාළ කටයුතු සිදු කිරීමේ හැකියාව ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය අවදානම් පාලන ව්‍යූහයේ ඉහළින්ම සිටින අතර, බැංකුව වෙනුවෙන් සමස්ත අවදානම් රුචි සීමා නියම කිරීමේදී කේන්ද්‍රීය භූමිකාවක් ඉටු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය අවදානම් කළමනාකරණ රාමුව අනුමත කිරීම සඳහා වගකීමට බැඳී ඇති අතර, බැංකුවට අවදානම් ඵලදායීව කළමනාකරණය සඳහා ප්‍රමාණවත් සම්පත්, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ඇති බව සහතික කරයි. එමෙන්ම එය අවදානම් කළමනාකරණ පරිචයන් හි ඵලදායිත්වය අධීක්ෂණය කර නියාමනය කරන අතර අනුමත අවදානම් අභිරුචිය තුළ අවදානම් කළමනාකරණය කරන බව සහතික කරයි.

බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවට අනුකූලව මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම් කළමනාකරණය කර වාර්තා කරයි.


අවදානම් අධීක්ෂණයට සහයවීම සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ ප්‍රධාන අවදානම් කළමනාකරණ කමිටු දෙකක් ස්ථාපිත කර ඇත:

- අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC)
- අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC)

මෙම කමිටු අවදානම සම්බන්ධ වගකීම් ඉටු කිරීමට සහයවන අතර අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටිවල ප්‍රමාණවත් බව සහ ඵලදායිත්වය සහතික කරයි.

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් කළමනාකරණ කමිටු රාමුවක් ස්ථාපිත කරමින් මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම් සම්බන්ධ පාලනය ශක්තිමත් කර ඇත. මෙම රාමුව සියලුම ව්‍යාපාර මාර්ග හරහා දැනට පවතින නැගීඑන අවදානම්, ප්‍රවනතා සහ ගැටළු හඳුනා ගැනීම සහ අවබෝධ කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරන අතර දැනුවත් තීරණ ගැනීම සඳහා අවබෝධය ලබා දේ.

## අවදානම් කළමනාකරණ වාර්තාව





BIRMC – අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව BAC – අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව GM/CEO – සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී
ISC – තොරතුරු ආරක්ෂක නිලධාරී ORMC – මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව ALCO – වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව
CC – ණය කමිටුව IC – ආයෝජන කමිටුව

රූපය 23 අවදානම් කළමනාකරණ රාමුව

### අවදානම් කළමනාකරණ සංස්කෘතිය

අධ්‍යක්ෂ මණ්ඩලය හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය ඵලදායී නායකත්වය හා අධීක්ෂණය තුළින් ශක්තිමත් අවදානම් සංස්කෘතියක වැදගත්කම තහවුරු කර ඇත. බැංකුවේ ප්‍රතිපත්ති, ක්‍රියාවලි, පද්ධති සහ පුහුණු වැඩසටහන් සමඟ අවදානම් මූලධර්ම අන්තර් ගත කිරීම මගින් යහපත් අවදානම් සංස්කෘතියක් පවත්වා ගැනීමට සහය වේ.

බැංකුව තෙවැදෑරුම් ආරක්ෂක මාර්ගයක් යටතේ ක්‍රියාත්මක වේ. සෑම ආරක්ෂක මාර්ගයක් සඳහාම ඵලදායී අවදානම් කළමනාකරණයට සහයවීම සඳහා කාර්යභාරයන්, වගකීම් සහ ගමන්මඟ පැහැදිළිව දක්වා ඇත. මෙම ආදර්ශ අවදානම සෑම කෙනෙකුගේම වගකීමක් වන සංස්කෘතියක් වර්ධනය කරයි.




රූපය 24 ත්‍රිවිධ ආරක්ෂක මාර්ග

## අවදානම් කළමනාකරණ වාර්තාව

### 1st පළමු ආරක්ෂණ මාර්ගය

මෙහෙයුම් කළමනාකාරිත්වය දෛනික පදනමක් මත අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණය හා පාලනය සඳහා වගකිව යුතුය. මෙයට බැංකුව අවදානමට නිරාවරණය කරන ක්‍රියාවලිය තුළ ඉදිරි සෘජුව සම්බන්ධවන ඉදිරිපෙළ සේවකයින් සහ ව්‍යාපාර ඒකක ඇතුළත් වේ. පළමු පෙළේ සේවකයින්ට මෙම අවදානම් කළමනාකරණය කිරීමේ මූලික වගකීම පැවරෙන අතර, දෙවන සහ තෙවන පෙළේ සේවකයින් අධීක්ෂණය කරනු ලැබේ.

### 2nd දෙවන ආරක්ෂණ මාර්ගය

අවදානම් කළමනාකරණ අංශය (RMD) සහ අනුකූලතා අංශයෙන් සමන්විත, මෙම ස්ථරය අවදානම් නියාමනය සහ කළමනාකරණ මෙවලම් භාවිතා කරමින් පළමු මාර්ගය අධීක්ෂණය කරයි. අවදානම් කළමනාකරණ අංශය ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර කළමනාකරණය කිරීම සඳහා මූලික ඒකක තුනකට වියුහගත කෙරේ. ණය අවදානම් කළමනාකරණ ඒකකය (CRMU), භාණ්ඩාගාර මධ්‍යම කාර්යාලය, (TMO)/වෙළෙඳපොල අවදානම් කළමනාකරණ ඒකකය සහ අවදානම් කළමනාකරණ ඒකකය (MRMU) සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණ ඒකකය (ORMU) මෙම ක්ෂේත්‍ර වේ.

### 3rd තෙවන ආරක්ෂණ මාර්ගය

අභ්‍යන්තර විගණන අංශය (IAD) පාලනයේ ඵලදායිත්වය, අවදානම් කළමනාකරණය සහ වර්තමාන පද්ධතිමය සහ වෙනස්වන අවදානම් පිළිබඳ පාලනය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ විධායක කමිටුවට ස්වාධීන සහතික ලබා දේ. නියාමන සමාලෝචන සහ බාහිර විගණන මගින් ද පළමු සහ දෙවන ආරක්ෂක මාර්ගවල ප්‍රමාණවත් බව සහ ඵලදායිත්වය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වාධීන සහතික ලබා දේ.

### ඒකාබද්ධ අවදානම් කළමනාකරණය: ප්‍රතිපත්ති රාමුව

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියෙන් බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව අර්ථ දක්වන අතර එයට මූලික අවදානම් ක්ෂේත්‍ර, අවදානම් කළමනාකරණ ප්‍රවේශ, සහ වාර්තාකරණ අවශ්‍යතා විසඳීමට වෙනම ප්‍රතිපත්ති ඇතුළත් වේ.

අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියෙන් බැංකු අවදානම් හඳුනාගැනීම, මැනීම, ඇගයීම, නියාමනය, සහ වාර්තා කිරීම කරන ආකාරය සහ වැදගත් අවදානම් පාලනය කර අවම කරන ආකාරය ලේඛනගත කරයි. එමෙන්ම ඉන් අවදානම් පාලනය සඳහා අධීක්ෂණ යාන්ත්‍රණ සහ ඒ සඳහා වගකියන කමිටු විස්තර කරයි.

| අවදානම් කළමනාකරණය | ණය අවදානම | වෙළෙඳපොල අවදානම | මෙහෙයුම් අවදානම |
|---|---|---|---|
| ප්‍රතිපත්ති | ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය<br>ආතති පරීක්ෂණ ප්‍රතිපත්තිය<br>අවදානම් කළමනාකරණ අනාවරණ ප්‍රතිපත්තිය<br>අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණතා තක්සේරු ක්‍රියාවලි (ICAAP) කළමනාකරණ ප්‍රතිපත්තිය<br>ආදර්ශ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය<br>ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය | වෙළෙඳපොල හා ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය | මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය |
| අවදානම් හඳුනාගැනීම සහ තක්සේරු ප්‍රවේශ | • අවදානම් සීමාවන් නියාමනය<br>• අභ්‍යන්තර ශ්‍රේණිගතකරණ ආකෘති<br>• පූර්ව අවදානම් ඇගයීමේ දර්ශක<br>• අවස්ථා විශ්ලේෂණය<br>• ආතති පරීක්ෂණය | • අවදානම් සීමාවන් නියාමනය<br>• අවදානමේදී අගය (VaR)<br>• නවීකරණ කාලසීමාව (M-Duration)<br>• සංවේදීතා විශ්ලේෂණ<br>• අවස්ථා විශ්ලේෂණය<br>• ආතති පරීක්ෂණය | • අවදානම් සීමාවන් නියාමනය<br>• අලාභ සිදුවීම් දත්ත විශ්ලේෂණය<br>• සිදුවීම් නියාමනය<br>• මූල හේතු සහ අවස්ථා විශ්ලේෂණ<br>• ආතති පරීක්ෂණය<br>• අවදානම් සහ පාලන ස්වයං තක්සේරුව (RCSA)<br>• ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක (KORIs) |
| කළමනාකරණය/අධ්‍යක්ෂ මණ්ඩල මට්ටම්වලට වාර්තා කිරීම | • අවදානම් අභිරුචි උපකරණ පුවරුව<br>• පූර්ව අවදානම් ඇගයීමේ දර්ශක<br>• ණය අවදානම් සමාලෝචන<br>• ණය සමාලෝචන යාන්ත්‍රණය පිළිබඳ වාර්තා (LRM)<br>• අක්‍රීය ණය නියාමනය සහ විශ්ලේෂණය | • අවදානම් අභිරුචි උපකරණ පුවරුව<br>• සක්‍රීය කළඹ අවදානම් සමාලෝචනය<br>• විදේශ මුදල් අවදානම් සමාලෝචනය<br>• පොලී අනුපාත අවදානම් සමාලෝචනය<br>• ස්ථාවර ආදායම් සුරැකුම්පත් කළඹ අවදානම් සමාලෝචනය<br>• ද්‍රවශීලතා අවදානම් සමාලෝචනය | • අවදානම් අභිරුචි උපකරණ පුවරුව<br>• අලාභ සිදුවීම් විශ්ලේෂණය<br>• KORIs උපකරණ පුවරුව<br>• RCSA වාර්තා<br>• මූල් හේතු විශ්ලේෂණ<br>• ගනුදෙනුකාර පැමිණිලි විශ්ලේෂණ<br>• ව්‍යාපාර බිඳවැටීම් සහ පද්ධති දෝෂ පිළිබඳ වාර්තා |

වගුව 25 අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව තුළ ප්‍රවේශ හා වාර්තා

# අවදානම් කළමනාකරණ වාර්තාව

## අවදානම් රුචිය සහ උපායමාර්ගය: අවදානම් රුචි මට්ටම් නිර්වචනය

අවදානම් අභිරුචිය තුළින් බැංකුව සිය උපායමාර්ගික අරමුණුවලට අනුව භාරගැනීමට කැමතිවන අවදානම් මට්ටම් නිර්වචනය කරන අතර මූල්‍ය ස්ථාවරත්වය, නියාමන අනුකූලතාව සහ කීර්තිනාම ආරක්ෂාව ඉන් සහතික කරයි.

අවදානම් අභිරුචි ප්‍රකාශය, අවදානම් කළමනාකරණ කටයුතු සඳහා මඟපෙන්වන මූලධර්ම ලෙස කටයුතු කරන අතර, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ බැංකුවේ අවදානම් දරන හැකියාව සඳහා පැහැදිලිකිරීම් සහ උපදෙස් ලබා දේ. මෙම ප්‍රකාශයෙන් උපායමාර්ගික තීරණ ගැනීම සහ මූල්‍ය සැලසුම් ක්‍රියාවලිය මෙහෙයවමින් බැංකුව භාරග ැනීමට පහසුවන අවදානම්වල සමුච්චිත මට්ටම සහ වර්ගය පැහැදිලි කරයි.

ප්‍රමාණාත්මක හා ගුණාත්මක පරාමිති භාවිතා කරමින් ආයතනික මට්ටමේදී අවදානම් අභිරුචිය සකස් කිරීමේදී බැංකුව ඉහළ සිට පහළ දක්වා ප්‍රවේශයක් යොදා ගනී.

සියලුම උපායමාර්ගික මට්ටමේ අවදානම් දර්ශක පූර්ව නිශ්චිත අවදානම් රුචි මට්ටම්වලට ඉහළින් පැවතුන අතර, බැංකුවේ අවදානම් කළමනාකරණය සහ අයකිරීමේ ක්‍රියාමාර්ගවල ප්‍රමාණාත්මතාව සහ ඵලදායිතාවය පෙන්නුම් කරයි. අභ්‍යන්තර හා බාහිර පාරිසරික ගැටළු සලකා බලමින්, මෙවැනි ක්‍රියාමාර්ග පරිස්සමින් හා උපායමාර්ගිකව ක්‍රියාත්මක කරන ලදී.

## අවදානම් කළමනාකරණ උපායමාර්ගය: අවදානම් කළමනාකරණයට ප්‍රවේශය

අවදානම් කළමනාකරණ උපායමාර්ගය තුළින් බැංකුවේ උපායමාර්ගික ව්‍යාපාර සැලැස්ම සාක්ෂාත්කර ගැනීමට සහයවීමට අවදානම් කාර්යය ව්‍යූහගත කරන ආකාරය විස්තර කරයි. එමෙන්ම එය ව්‍යාපාර උපායමාර්ගයෙන් ඇති වන අවදානම් කළමනාකරණ සඳහා ප්‍රවේශය අර්ථ දක්වන අතර අදාළ රෙගුලාසි, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවලට යොමු වෙමින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව විසින් සෑම ප්‍රමාණාත්මක සහ මතුවන අවදානම් ක්ෂේත්‍රයක්ම ආමන්ත්‍රණය කරන ආකාරය පිළිබඳ දළ සැලැස්මක් ලබා දේ.

| අවධානිත ක්ෂේත්‍ර | දර්ශක | 2025 - සත්‍ය ප්‍රතිඵලය | අවදානම් රුචිය අනුව කාර්යසාධනය |
|---|---|---|---|
| ලාභදායිතාව | ශුද්ධ පොලී ආන්තිකය | 4.74 | ✓ |
| | ස්කන්ධය මත ඉපයීම | 25.08 | ✓ |
| | වත්කම් මත ඉපයීම | 2.48 | ✓ |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව | CET 1 | 23.40 | ✓ |
| | Tier 1 | 24.90 | ✓ |
| | මුළු ප්‍රාග්ධනය | 26.83 | ✓ |
| ද්‍රවශීලතාව | LCR (රුපියල) | 360.39 | ✓ |
| | NSFR | 206.44 | ✓ |
| තෝලනය | තෝලන අනුපාතය | 9.34 | ✓ |

අවදානම් මට්ටම

✓ අවදානම් අභිරුචි සීමාව තුළ ✓ උපරිම දරාගැනීමේ සීමාව තුළ

✓ අවම දරාගැනීමේ සීමාවෙන් ඔබ්බට

**වගුව 26** අවදානම් රුචිමට්ටම් අනුව මූල්‍ය දර්ශක

අවදානම හඳුනාගැනීම සහ අවදානම් ප්‍රවේශවල විස්තීර්ණ කට්ටලයක් මගින් අවදානම් අවම කිරීමේ යාන්ත්‍රණය තීරණය කිරීම සඳහා ආවේනික අවදානම්, ක්‍රියාත්මක පවතින පාලන මට්ටම් සහ ශේෂ වූ අවදානමට නිරාවරණය පිළිබඳ අවබෝධය ඇති කරයි.

අවදානම් කළමනාකරණය මගින් බැංකුව තුළ අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම, නියාමනය සහ අවම කිරීම සඳහා විවිධ ක්‍රියාවලි, ආකෘති හා මෙවලම් ඒකාබද්ධ කරයි. මෙවැනි උපාංග අවදානම පදනම් තීරණ ගැනීමට සහය වන අතර, මහ බැංකුව විසින් නියම කළ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව සහ වෙනත් විචක්ෂණ අවශ්‍යතා සමඟ අනුකූලතාව සහතික කරයි.

**අවදානම හඳුනාගැනීම**
- ආවේනික අවදානම් අවබෝධකර ගැනීම
- අවදානම් සමාහරණය
- අවදානම් ආදර්ශකරණය හා හිමිකාරත්වය

**අවදානම් තක්සේරුව**
- ආවේනික අවදානම් ඇගයීම
- පාලනයේ ඵලදායිත්වය හඳුනා ගැනීම
- ශේෂ වූ අවදානම් තීරණය කිරීම

**අවදානම නියාමනය සහ වාර්තාකරණය**
- අවදානම් මාදිලි හා ප්‍රවනතා විශ්ලේෂණය
- ප්‍රේරක මට්ටම්වලට අනුව අවදානම් හඳුනා ගැනීම
- අවශ්‍ය පිරිවැය සහ සම්පත් සලකා බැලීම
- එක් එක් අවදානමට ප්‍රතිචාර ඇගයීම අවදානම් හිමිකරුවන්ට, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම

**අවදානම අවමකිරීම සහ පාලනය**
- අවදානම් අවමකිරීමේ කටයුතු ගැනීම/පාලනය වැඩි දියුණුකිරීම්

**රූපය 25** අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

බැංකුව තම ප්‍රධාන සහ නැගීඑන අවදානම් අවබෝධකරගෙන යාවත් කිරීමට අභ්‍යන්තර හා බාහිර පරිසරය සක්‍රියව තක්සේරු කරයි. මෙම ක්‍රියාවලියෙන් උපායමාර්ගික සැලසුම් කාල සීමාව තුළ උපායමාර්ගය සහ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට තර්ජනයක් විය හැකි ගැටළු පිළිබඳ ඉදිරි දැක්මක් සපයයි.

# අවදානම් කළමනාකරණ වාර්තාව

ප්‍රධාන සහ මතුවන අවදානම්, අවදානම් මට්ටම් හා එම අවදානම් කළමනාකරණය කිරීමට අපේක්ෂිත අවදානම් මට්ටම් හා ප්‍රවේශ පහත සාරාංශ කර දැක්වේ:

| අවදානම් සංරචකය | අවදානම් කළමනාකරණ ප්‍රවේශය | ආවේනික අවදානම් මට්ටම | බලපෑම* |
|---|---|---|---|
| **ණය අවදානම** | | | |
| **ණය අවදානම** | • අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම<br>• අවදානම් තක්සේරු කිරීම් සමඟ ණය ඇගයීම්<br>• අවදානම් ශ්‍රේණිගත කිරීම<br>• ණය අනුමැතිය සඳහා පවරා ඇති බලතල ව්‍යුහය<br>• සුරැකුම්කරණය<br>• සුරැකුම් තක්සේරු කිරීම/නැවත ඇගයීම සහ LTV අනුපාත නියාමනය කිරීම<br>• ණය සීමාවන්ට එරෙහිව නියාමනය කිරීම<br>• පූර්ව අවදානම් ඇඟවීමේ දර්ශක, අක්‍රීය ණය ප්‍රවණතා නියාමනය කිරීම<br>• ගනුදෙනු සහ කළඹ මට්ටමේදී නියාමනය/ස්වාධීන අවදානම් සමාලෝචනය<br>• පසු විසර්ජන සමාලෝචන/ණය සමාලෝචන යාන්ත්‍රණය (LRM)<br>• ආතති පරීක්ෂාව<br>• හානිකරණ වෙන් කිරීම<br>• අබණ්ඩ පුහුණුව සහ සංවර්ධනය | පහළ මධ්‍යම **ඉහළ** | ↑ |
| සංකේන්ද්‍රණ අවදානම | • සීමා නියාමනය: නිරාවරණ සීමාවන්, සංකේන්ද්‍රණ සීමාවන්, (හර්ෆින්ඩාල් - හර්ෂ්මන් දර්ශකය - HHI)<br>• ආතති පරීක්ෂාව | පහළ මධ්‍යම **ඉහළ** | ↑ |
| පියවීමේ අවදානම | • ගෙවීම් අනුව ලබාදීමේ (DvP) ක්‍රම<br>• පූර්ව අරමුදල්කරණය/ආන්තික අවශ්‍යතා<br>• සීමා නියාමනය: ප්‍රතිපාර්ශවීය සීමා | පහළ මධ්‍යම **ඉහළ** | → |
| අන්තර් දේශ සීමා ණය අවදානම | • සුරැකුම්කරණය<br>• සීමා නියාමනය<br>• ආතති පරීක්ෂාව | පහළ මධ්‍යම **ඉහළ** | → |
| **වෙළෙඳපොල අවදානම** | | | |
| ප්‍රති-මිලකරණ අවදානම | • ප්‍රතිමිලකරණ පරතර සීමාවන් නියාමනය කිරීම<br>• අනුපාත සංවේදී වත්කම් (RSA) සහ අනුපාත සංවේදී වගකීම් (RSL) පිළිබඳ සීමාවන් | පහළ මධ්‍යම **ඉහළ** | → |
| ඵලදා වක්‍ර අවදානම | • සංවේදීතාව/අනුපාත කම්පන සමඟ පීඩන පරීක්ෂාව<br>• ආයෝජන කළඹේ, කාලසීමාව සහ කාලසීමා පරතරය නියාමනය<br>• අලාභ සීමාවන් නැවැත්වීම | පහළ මධ්‍යම **ඉහළ** | → |
| පදනම් අවදානම | • RSA/RSL පරතරය මත අනුපාත කම්පනවලට සංවේදීතා විශ්ලේෂණය | පහළ මධ්‍යම **ඉහළ** | → |
| විදේශ විනිමය අවදානම | • විනිමය අනුපාත වෙනස්වීම් නියාමනය<br>• විනිමය අනුපාත අවදානමේදී වටිනාකම<br>• සීමා නියාමනය<br>• ආතති පරීක්ෂාව | පහළ මධ්‍යම **ඉහළ** | ↑ |
| කොටස් මිල අවදානම | • සීමා නියාමනය<br>• ස්කන්ධ අවදානමේදී වටිනාකම<br>• දෛනික පදනමක් මත වෙළෙඳපොල ලාභ/අලාභ නියාමනය<br>• ආතති පරීක්ෂාව. | පහළ මධ්‍යම **ඉහළ** | ↑ |
| වෙළෙඳ භාණ්ඩ මිල අවදානම | • උකස් කිරීමේදී LTV නියාමනය කිරීම<br>• රන් මිල නියාමනය කිරීම<br>• ආතති පරීක්ෂාව. | පහළ මධ්‍යම **ඉහළ** | ↑ |

## අවදානම් කළමනාකරණ වාර්තාව

| අවදානම් සංරචකය | අවදානම් කළමනාකරණ ප්‍රවේශය | ආවේනික අවදානම් මට්ටම | බලපෑම* |
|---|---|---|---|
| **ද්‍රවශීලතා අවදානම** | | | |
| ද්‍රවශීලතා අවදානම | • අවම අවශ්‍යතාවන්ට අනුව නියාමන අනුපාත නියාමනය කිරීම<br>• නියමිත කාල පරාසයන්හී සීමාවන්ට අනුව ගිවිසුම්ගත සහ චර්යාත්මක කල්පිරීමේ පරතර නියාමනය<br>• තොග ප්‍රවේශය යටතේ ද්‍රවශීලතා අනුපාත නියාමනය කිරීම<br>• ද්‍රවශීලතා හදිසි සැලසුම්කරණය<br>• පීඩන පරීක්ෂණ සහ අවස්ථා විශ්ලේෂණය | පහළ මධ්‍යම ඉහළ | ↓ |
| **මෙහෙයුම් අවදානම** | | | |
| වංචා අවදානම/මූල්‍ය අපරාධ අවදානම | • වංචා අවදානම් කළමනාකරණය සහ තොරතුරු දැනුම්දීමේ ක්‍රියාවලිය.<br>• අභ්‍යන්තර පාලනයන්<br>• ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක (KORIs) නියාමනය කිරීම<br>• අලාභ සිදුවීම් නියාමනය කිරීම<br>• අවදානම් පාලන ස්වයං තක්සේරුව (RCSA)<br>• අල්ලස් හා දූෂණ විරෝධී අවදානම් තක්සේරුව<br>• මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට අරමුදල්කරණය වැලැක්වීම නියාමනය | පහළ මධ්‍යම ඉහළ | ↑ |
| තොරතුරු තාක්ෂණ (IT)/ සයිබර් ආරක්ෂණ අවදානම | • අභ්‍යන්තර පාලනයන්<br>• තොරතුරු ආරක්ෂණ කළමනාකරණ ප්‍රතිපත්තිය<br>• KORIs නියාමනය කිරීම<br>• සිදුවීම් වාර්තාකරණය<br>• අවදානම් පාලන ස්වයං තක්සේරුව | පහළ මධ්‍යම ඉහළ | ↑ |
| ව්‍යාපාර අඛණ්ඩතා අවදානම | • ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය (BCMS) ක්‍රියාත්මක කිරීම<br>• KORIs නියාමනය කිරීම | පහළ මධ්‍යම ඉහළ | → |
| අනුකූලතා/ නියාමන අවදානම | • අනුකූලතා වැඩසටහන් සහ පරීක්ෂාවන්<br>• KORIs නියාමනය කිරීම<br>• අනුකූලතා අවදානම් සඳහා ලකුණු කාඩ්පත | බිඳුර මධ්‍යම ඉහළ | ↑ |
| නෛතික අවදානම | • සියලු ගිවිසුම්ගත බැඳීම් මත නීතිමය නිෂ්කාශනය<br>• KORIs නියාමනය කිරීම | පහළ මධ්‍යම ඉහළ | → |
| **වෙනත් පවතින සහ පැනනගින අවදානම්** | | | |
| වසංගත අවදානම | • ඇප විවිධාංගිකරණය තුළින් සංකේන්ද්‍රණ කළමනාකරණය කිරීම<br>• නිරාවරණ සීමා නියාමනය කිරීම<br>• ද්‍රවශීලතා අහඹු සැලසුම් කිරීම<br>• පීඩන පරීක්ෂණ සහ අවස්ථා විශ්ලේෂණය | පහළ මධ්‍යම ඉහළ | → |
| ආදර්ශ අවදානම | • ආදර්ශ වලංගුකරණය හා ස්වාධීන සමාලෝචනය<br>• සම්ප්‍රදායික උපකල්පන හා කළමනාකරණ වසාලීම<br>• ආදර්ශ කාර්යසාධනය ඉදිරියට යන නියාමනය | පහළ මධ්‍යම ඉහළ | → |
| පාරිසරික, සමාජ සහ පාලන (ESG) අවදානම | • අවදානම් තක්සේරුවට ESG සංකලනය<br>• නිසි සම්ක්ෂණය හා පරීක්ෂාව<br>• සිදුවීම් විශ්ලේෂණය<br>• ආතති පරීක්ෂාව. | පහළ මධ්‍යම ඉහළ | ↑ |

*ඉපයීම් සහ ප්‍රාග්ධනය මත බලපෑම්වල වාර්ෂික වෙනස

→ වෙනසක් නැත ↑ බලපෑම්වල වැඩිවීම ↓ බලපෑම්වල අඩුවීම

වගුව 27 අවදානම් සමාලෝචනය

# අවදානම් කළමනාකරණ වාර්තාව

බැංකුවේ අවදානම් ලේඛණය දැනට පවතින හා නැඟී එන අවදානම් ලේඛණගත කරයි. අවදානම හඳුනාගැනීමේ සහ තක්සේරු කිරීමේ මෙවලම් සහ ආකෘතිය භාවිතා කරමින් අවදානම් කළමනාකරණ අංශය විසින් එය කාලානුරූපීව යාවත් කරනු ලැබේ. ඒ අනුව, මූලික අවදානම් හතරක් ඇති අතර ඒවානම් ණය අවදානම, වෙළෙඳපොල අවදානම (එනම් කොටස්, විදේශ මුදල් සහ පොළී අනුපාතය), මෙහෙයුම් අවදානම සහ ද්‍රවශීලතා අවදානමයි. අවදානම් වර්තා මූලික අවදානම් මෙන්ම පවතින හා නැඟී එන අවදානම් පිළිබඳ අදහස් ලබාදීම සඳහා කළමනාකාරිත්වයට හා අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ කමිටු වෙත ඉදිරිපත් කරයි. මෙවැනි අවදානම් කෙරෙහි ආර්ථික, සමාජීය හා පාලන (ESG) වෙනස්වීම් මත බලපෑම් කාලානුරූපීව තක්සේරු කෙරේ.

අවදානම් කළමනාකරණයේ මූලික කාර්යභාරය වන්නේ පාර්ශ්වකරුවන් ආරක්ෂා කර ගනිමින් උපායමාර්ගික පරමාර්ථ හා තිරසාර වර්ධනය අත්කර ගැනීම සහතික කිරීමයි. එමනිසා බැංකුව අවදානම් කළමනාකරණය කිරීමේ පාලන පරිසරය හා ප්‍රවේශය අඛණ්ඩව ශක්තිමත් කරයි.

පවතින හා නැඟී එන අවදානම් සහ බැංකුවට මූල්‍ය සහ මූල්‍ය නොවන බලපෑම් අවම කිරීමට ඒවා කළමනාකරණය කරන ලද ආකාරය පිළිබඳ දළ විශ්ලේෂණයක් පහත දක්වා ඇත.

## ණය අවදානම


ණය අවදානම යනු එකඟ වූ නියමයන්ට අනුකූලව සිය ගිවිසුම්ගත බැඳීම ඉටු කිරීමට ප්‍රතිපාර්ශව අසමත්වීමෙන් ඇතිවන අලාභ අවදානම වේ. ණය නිරාවරණ මූලිකවම ශේෂ පත්‍ර කටයුතුවලින් සහ ඉන් පරිබාහිර ඇති වේ. මෙම කටයුතුවලට ණය, අත්තිකාරම්, බැඳීම්, ඇපකර, අන්තර් බැංකු තැන්පතු ආරක්ෂක ආයෝජන සහ අනෙකුත් අවිනිශ්චිත වගකීම් ඇතුළත් වේ. ණය අවදානම ප්‍රතිපාර්ශව අංශ පැහැර හැරීමේ අවදානම, සංකේන්ද්‍රණ අවදානම සහ පියවීමේ අවදානමෙන් සමන්විත වේ.



2025 දී, බැංකුව උපරිම දළ ණය නිරාවරණය තුළ 5.3%ක වැඩිවීමක් වාර්තා කළ අතර, රු.බිලියන 29.3ක් වූ හානිකරණ සඳහා දීමනාව තුළ 1.4%කින් වැඩිවීම මෙයට හේතු විය.

### ශේෂ පත්‍රය මත හා බාහිර ණය නිරාවරණය

පුස්ථාර 67





| දෙසැම්බර් 31 දිනට | 2025 උපරිම ණය අවදානම් නිරාවරණය | | | 2024 උපරිම ණය අවදානම් නිරාවරණය | | | ශුද්ධ නිරාවරණය තුළ වාර්ෂික වෙනස |
|---|---|---|---|---|---|---|---|
| | දළ ධාරණ වටිනාකම රු. '000 | ණය හානිකරණය රු. '000 | ශුද්ධ නිරාවරණය රු. '000 | දළ ධාරණ වටිනාකම රු. '000 | ණය හානිකරණය රු. '000 | ශුද්ධ නිරාවරණය රු. '000 | % |
| උපරිම ණය අවදානම් නිරාවරණය | 1,802,319,739 | 29,345,269 | 1,772,974,470 | 1,711,564,236 | 28,947,718 | 1,682,616,520 | 5.4 |
| ශේෂ පත්‍රය මත නිරාවරණය | 1,792,701,094 | 29,345,269 | 1,763,355,825 | 1,698,436,824 | 28,947,718 | 1,669,489,108 | 5.6 |
| ශේෂ පත්‍රයෙන් බාහිර නිරාවරණය | 9,618,645 | – | 9,618,645 | 13,127,412 | – | 13,127,412 | -26.7 |
| ප්‍රධාන ණය අවදානම් නිරාවරණය ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්. | | | | | | | |
| - ණය හා අත්තිකාරම් | 580,150,556 | 29,322,187 | 550,828,369 | 561,313,699 | 28,934,686 | 532,379,013 | 3.5 |
| - ණය හා අනෙකුත් උපකරණ | 1,092,998,122 | 8,208 | 1,092,989,914 | 1,039,038,477 | 3,905 | 1,039,034,572 | 5.2 |

වගුව 28 උපරිම ණය අවදානම් නිරාවරණ

## අවදානම් කළමනාකරණ වාර්තාව

### ණය අවදානම සඳහා අවදානම මත බරතබන ලද වත්කම් ප්‍රස්ථාර 68




2016 අංක 1 දරන මහ බැංකුවේ නියෝගයට අනුකූලව, ණය අවදානම සඳහා අවදානම මත බරතබන ලද වත්කම් (RWAs) ගණනය කිරීම සඳහා බැංකුව සම්මත ප්‍රවේශය යොදා ගනී. මෙම ප්‍රවේශය යටතේ, ශුද්ධ ණය නිරාවරණයන් සඳහා සුදුසුකම්ලත් ඇපකර සැලකිල්ලට ගනිමින් නියමිත අවදානම් බර තැබීම සිදුකරනු ලබයි.

### පැහැරහැරීමේ අවදානම


2025 දී, ණය හානිකරණය වූ (අදියර 3) ණය සහ අත්තිකාරම් වල දළ ධාරණ වටිනාකම 2024 දී පැවති රුපියල් බිලියන 49.7ට සාපේක්ෂව රුපියල් බිලියන 33.6 දක්වා පහළ ගියේය. 2025 දෙසැම්බර් 31 වන විට, බැංකුවේ අදියර 3 හානිකරණ ණය අනුපාතය 2024 දී පැවති 5.2% ට සාපේක්ෂව 2.5% ක් විය.

ණය කළඹ තුළ ගුණාත්මකභාවයේ පහත වැටීම වසර තුළ රු.බිලියන 0.4ක (2024 දී රු.බිලියන 6.6) හානිකරණ අයකිරීමකට හේතු වූ අතර මුළු ණය හානිකරණ වෙන් කිරීම රු. බිලියන 29.3 දක්වා වැඩි විය. වසර අවසානයේදී, මෙම අදියර 3 වෙන් කිරීම් ආවරණ අනුපාතය 2024 දී පැවති 44.53%ට සාපේක්ෂව 58.6%ක් ලෙස වාර්තා කර ඇත.


| | අදියර 3ණය හා අත්තිකාරම් රු. '000 | තනි පුද්ගල හානිකරණය සඳහා දීමනාව රු. '000 | සාමූහික හානිකරණය සඳහා දීමනාව රු. '000 | අපේක්ෂිත ණය අලාභ දීමනාව රු. '000 |
|---|---|---|---|---|
| 2024 | 49,677,946 | 3,754,556 | 18,350,326 | 22,104,882 |
| **2025** | **33,573,810** | **3,912,774** | **15,746,806** | **19,659,580** |

වගුව 29 අදියර 3 ණය හානිකරණය වූ ණය හා අත්තිකාරම් බෙදීයාම


### දළ ණය හා අත්තිකාරම් ප්‍රස්ථාර 69




### අදියර 3 ණය හා වෙන්කිරීම් ආවරණය ප්‍රස්ථාර 70




### හානිකරණය වූ ණය (අදියර 3) අනුපාතය (%) ප්‍රස්ථාර 71





### සංකේන්ද්‍රණ අවදානම


සංකේන්ද්‍රණ ණය සීමා බැංකුවේ අවදානම් අභිරුචි ප්‍රකාශයේ දක්වා ඇත. ඉදිරියට යන අනුකූලතාව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හා ණය කමිටුව තුළ සංකේන්ද්‍රණ මට්ටම් ස්ථාපිත සීමාවන් අනුව කාර්තුමය පදනමක් මත නියාමනය කෙරේ. ආතති තත්ත්වයන් යටතේ පමණක් දැකිය හැකි නිරාවරණ අතර සංකේන්ද්‍රණ අවදානම තක්සේරු කිරීමට හා විභව අනෝන්‍ය රැඳියාව හඳුනා ගැනීමට හර්ෆින්ඩාල්-හර්ෂ්මාන් දර්ශකය සහ ආතති පරීක්ෂණය ඇතුළු ප්‍රමාණාත්මක මෙවලම් බැංකුව භාවිතා කරයි.

## අවදානම් කළමනාකරණ වාර්තාව

### නිෂ්පාදිතය අනුව නිරාවරණය - (ණය හා ආයෝජන කළඹ)

පිටුව 72









- නිවාස හා දේපල ණය
- පුද්ගලික ණය
- තැන්පතු මත ණය
- උකස් ණය
- කාලීන ණය - රජයට අයත් ව්‍යවසාය හා ශ්‍රී ලංකා රජය
- කාලීන ණය - බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතන
- කාලීන ණය - වෙනත් ආයතනික
- ආයතනික ණය උපකරණවල ආයෝජන

### ක්ෂේත්‍රය අනුව නිරාවරණය - (ණය කළඹ)

පිටුව 73









- කෘෂිකර්මය හා ධීවර
- සංචාරක
- පුද්ගලික/උකස්කර/ වෙනත්
- ඉදිකිරීම/නිවාස
- මූල්‍ය හා ව්‍යාපාර සේවා
- යටිතලපහසුකම්
- විදුලි බලය හා බලශක්තිය
- අධ්‍යාපනය

### භූගෝලීය පිහිටීම අනුව නිරාවරණය - (ණය කළඹ)

පිටුව 74








- බස්නාහිර පළාත
- දකුණු පළාත
- වයඹ පළාත
- මධ්‍යම පළාත
- සබරගමුව පළාත
- ඌව පළාත
- උතුරු මැද පළාත
- උතුරු පළාත
- නැගෙනහිර පළාත

## අවදානම් කළමනාකරණ වාර්තාව


### පාරිභෝගික ණය ගැණුම්කරුවන් සඳහා වන ණය හා අත්තිකාරම් පිළිබඳ නිෂ්පාදන අනුව භූගෝලීය විශ්ලේෂණය

පිටුව 75




### ඇප අනුව නිරාවරණය - (ණය හා ආයෝජන කළඹ)

පිටුව 76




බැංකුවේ ණය හා ආයෝජන කළඹ මූලිකවම පාරිභෝගික ණය නිෂ්පාදනවලින් සමන්විත වේ. පුද්ගලික ණය විශාලතම කොටස වන අතර එය පාරිභෝගික ණය කළඹින් 43.7%ක් නියෝජනය කරයි. ආයතනික අංශය තුළ, රජයට අයත් ව්‍යවසාය වෙත නිරාවරණ ණය හා ආයෝජන කළඹින් විශාල කොටසට දායක වන අතර එය ආයතන නිරාවරණවලින් 60.2%ක් වේ. මෙම නිරාවරණය ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර ඇපවලින් පිටුබලය ලබන ණය හා ණය උපකරණවලින් සමන්විත වේ.

බැංකුව ක්ෂේත්‍රයේ සංකේන්ද්‍රණය සඳහා මධ්‍යස්ථ අවදානම් රුචියක් පවත්වා ගනී. පුද්ගලික ණය දීම හා උකස් අංශය විශාලතම දායකයා වන අතර, එය බැංකුවේ මුළු ණය නිරාවරණයෙන් 37.6%ක් නියෝජනය කරයි. ඉන්පසුව ඉදිකිරීම් අංශය 35.6%ක නිරාවරණයක් නියෝජනය කරයි.

මහ පරිමාණ ණයවලින් වැඩි ප්‍රමාණයක් ආයතනික ණය අංශය ලබා දී ඇති නිසා බස්නාහිර පළාත තුළ ඉහළම භූගෝලීය සංකේන්ද්‍රණය නිරීක්ෂණය වේ. රජයේ (භාණ්ඩාගාර ඇප හෝ රජයේ සුරකුම්පත්) පිටුබලය සහිත ණය මුළු ණය සහ ආයෝජන බැංකුවේ මුළු ණය සහ ආයෝජන කළඹෙන් 26.7% ක් සඳහා දායක වේනියෝජනය කරයි.

### අන්තර් දේශ සීමා ණය අවදානම

විදේශීය බැංකුවල තැන්පතුවලින් සහ ණය පහසුකම්වලින් ඇතිවන බැංකුවේ අන්තර් දේශ සීමා ණය නිරාවරණය මුළු වත්කම්වලින් 0.3%ට සීමා වී පැවතුණි.


### ණය අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

මුළු වත්කම්වලින් 37.6%ක් සඳහා ණය හා අත්තිකාරම් දායක වන බැවින් හා ණය අවදානමේ මුළු අවදානම මත බරතබන ලද වත්කම්වලින් 70%කට වඩා නියෝජනය වන බැවින්, ඵලදායිණව අවදානම් කළමනාකරණය බැංකුවේ දිගුකාලීන ස්ථාවරත්වයට බලපාන තීරණාත්මක සාධකයක් වේ.

ණය අවදානම අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ණය අවදානම් කළමනාකරණ රාමුවක් මගින් පාලනය කරන අතර, එම රාමුවට ශක්තිමත් අවදානම් පාලන ව්‍යූහයක් සහ විස්තීර්ණ අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටි ඇතුළත්ය.

අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද ණය ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි මගින් විවිධ කාර්යයන්හී නිලධාරීන් අතර රාජකාරි කාර්ය වෙන් කිරීම සහතික කරයි. එමගින් ණය ක්‍රියාවලියේ ප්‍රධාන අවස්ථා පුරා ව්‍යාපාර මාර්ග මට්ටමින් ණය අවදානම් කළමනාකරණය සඳහා සහාය ලබා දේ. මෙම ප්‍රතිපත්ති බැංකුවේ අවදානම් රුචිය සහ ණය සීමා සමඟ එක්ව නියමිත කාල පරාසයන් තුළ සමාලෝචනය කරනු ලබන පවතින හා අපේක්ෂිත වෙළෙඳපොල තත්ත්වයන්ට අනුකූලව යාවත්කාලීන කරනු ලැබේ.

# අවදානම් කළමනාකරණ වාර්තාව




**රූපය 26** ණය අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

ණය කළමනාකරණ ක්‍රියාවලිය අවදානම් කළමනාකරණ අංශ තුළ ණය අවදානම් කළමනාකරණ අංශය (CRMU) විසින් ශෙක්තිමත් කරන අතර, එය ගනුදෙනු සහ කළඹ මට්ටම්වලදී ස්වාධීන අවදානම් විශ්ලේෂණ හා නියාමනය ලබා දේ. මෙම ප්‍රවේශය ආර්ථික, පාරිසරික හා සමාජීය සහ ක්ෂේත්‍රයට අදාළ අවදානම් ඇතුළුව අභ්‍යන්තර හා බාහිර සාධක සමඟ ගනුදෙනුකාර විශේෂ සාධක සලකා ලබයි.

සක්‍රීය හා නිවැරදි ණය අවදානම් කළමනාකරණය සහතික කිරීම සඳහා, CRMU විසින්:

- ගනුදෙනු මට්ටමින් ණය නිරාවරණ සඳහා ස්වාධීන අවදානම් තක්සේරු කිරීම් සහ ශ්‍රේණිගතකරණ වලංගු කිරීම් සිදු කරයි.
- පූර්ව අනතුරු ඇඟවීමේ සංඥා, අක්‍රීය ණයවල ප්‍රවණතා, සංකේන්ද්‍රණ අවදානම් සහ සමස්ත ණය කළඹ කාර්යසාධනය නියාමනය කරයි.
- විවිධ අවදානම් අවස්ථා යටතේ අවදානම්වල විභව බලපෑම තක්සේරු කිරීම සඳහා ආතති පරීක්ෂණය සහ අවස්ථා විශ්ලේෂණය සිදු කරයි.

ණය ප්‍රදානය කිරීමේ ක්‍රියාපටිපාටියේදී වැඩි දියුණු කළ අංශ හඳුනා ගැනීම සඳහා නිරන්තර පදනමක් මත ණය හා සම්බන්ධ නිෂ්පාදිත හා ක්‍රියාවලි සඳහා පවත්වනු ලබන අවදානම් සහ පාලන ස්වයං තක්සේරු කිරීමේ (RCSA) ක්‍රියාවලියෙහි ප්‍රතිඵල උපකාරී වේ. CRMU ක්‍රියාවලි හා වෙනස්කම් පාලනයට නිර්දේශ කරයි. මෙයට අමතරව, ණය අවදානම සහ ණය දීමේ ක්‍රියාවලියෙහි පවත්නා මෙහෙයුම් අවදානම් හඳුනා ගැනීම සඳහා ණය සමාලෝචන යාන්ත්‍රණය (LRM) වැදගත්

කාර්යභාරයක් ඉටු කරණ අතර, එම ක්‍රියාවලිය මගින් උචිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම තුළින් සමස්ත ණය කළඹේ ගුණාත්මකභාවය වර්ධනය කරයි.

### වෙළෙඳපොල අවදානම

වෙළෙඳපොල අවදානම යනු ආයතනයකට නිරාවරණයක් ඇති මූල්‍ය වෙළෙඳපොල විචල්‍යතා වෙනස්වීම්වලින් ඇතිවන අවදානමකි. එය පොලී අනුපාත, විදේශ විනිමය අනුපාත, කොටස් මිල ගණන්, හා වෙළෙඳ භාණ්ඩවල මිල වැනි වෙළෙඳපොල විචල්‍යතාවල අහිතකර විතැන්වීමෙන් ඇති වන අතර, අනාගත අපේක්ෂිත මුදල් ප්‍රවාහ, ඉපයීම් සහ ප්‍රාග්ධන මට්ටම් අහිතකරව වෙනස් කරයි.

වෙළෙඳපොල අවදානම් බැංකුවේ නිරාවරණ වෙළෙඳ කළඹ සහ වෙළෙඳ නොවන කළඹින් ඇති වේ.



## අවදානම් කළමනාකරණ වාර්තාව


2025 වසර අවසානයේදී, වෙළෙඳපොල අවදානමට නිරාවරණය වූ බැංකුවේ වත්කම් මුළු වත්කම්වලින් 96.3%ක් වූ අතර වෙළෙඳපොල අවදානමට නිරාවරණය වූ වගකීම් 91.0%ක් විය. බොහෝ මූල්‍ය වත්කම් පොලී අනුපාත අවදානමට නිරාවරණය වේ. ශුද්ධ විනිමය නිරාවරණය මුළු වත්කම්වලින් 0.06%ක් වන අතර ස්කන්ධ මිල අවදානමට 0.4%ක් නිරාවරණය

| 2025 දෙසැම්බර් 31 දිනට | මූල්‍ය ප්‍රකාශ අනුව ප්‍රමාණය රු. '000 | වෙළෙඳ අවදානමට නිරාවරණය රු. '000 | වෙළෙඳ නොවන අවදානමට නිරාවරණය රු. '000 | වෙළෙඳ අවදානම් චර්යය |
|---|---|---|---|---|
| මූල්‍ය වත්කම් | | | | |
| මුදල් හා මුදලට සමාන දෑ | 8,326,738 | | 8,326,738 | IRR, FX |
| මහ බැංකුව සමඟ ශේෂ | 167,212 | | 167,212 | IRR |
| බැංකු සමඟ ස්ථාපන | 24,181,317 | | 24,181,317 | IRR, FX |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 68,813 | | 68,813 | IRR, FX |
| සාධාරණ වටිනාකමට මනින ලද මූල්‍ය වත්කම් | 22,158,765 | 22,158,765 | | IRR, Equity |
| ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ ලැබිය යුතු දෑ | 550,828,369 | | 550,828,369 | IRR, FX |
| ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ වෙනත් මූල්‍ය උපකරණ | 1,092,989,914 | | 1,092,989,914 | IRR |
| වෙනත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ වටිනාකමට මනින ලද මූල්‍ය වත්කම් | 64,634,698 | | 64,634,698 | IRR, Equity |
| **එකතුව** | 1,763,355,826 | 22,158,765 | 1,741,197,061 | |
| මූල්‍ය වගකීම් | | | | |
| බැංකුවලට ගෙවියයුතු | 80,972 | | 80,972 | IRR, FX |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 13 | | 13 | IRR, FX |
| ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - තැන්පතුහිමියන්ට ගෙවියයුතු | 1,608,490,322 | | 1,608,490,322 | IRR, FX |
| ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - වෙනත් ණයකරුවන්ට ගෙවිය යුතු | 39,057,116 | | 39,057,116 | IRR |
| කල්බදු වගකීම් | 1,492,523 | | 1,492,523 | IRR |
| නිකුත්කළ ණය සුරැකුම්පත් | 16,911,043 | | 16,911,043 | IRR |
| **එකතුව** | 1,666,031,990 | | 1,666,031,990 | |

වගුව 30 වෙළෙඳපොල ණය නිරාවරණය

බැංකුවේ වෙළෙඳපොල අවදානම සඳහා අවදානම් බරතබන ලද වත්කම් වසර තුළ රු. බිලියන 19.0 දක්වා 75.1%කින් ඉහළ ගිය අතර මෙම වැඩිවීමට වෙළෙඳ කළඹ තුළ ස්ථිර ආදායම් සුරැකුම්පත්වල වැඩි කළ ආයෝජන සැලකියයුතු ලෙස හේතු විය. බැංකුව සම්මත මිණුම් ක්‍රමය (SMM) යටතේ වෙළෙඳපොල අවදානම සඳහා අවදානම් බරතබන ලද වත්කම් ගණනය කරයි.

**වෙළෙඳපොල අවදානම සඳහා අවදානම් බරතබන ලද වත්කම්** පුස්ථාර 77



# අවදානම් කළමනාකරණ වාර්තාව


## පොලී අනුපාත අවදානම

### වෙළෙඳ කළඹ තුළ පොලී අනුපාත අවදානම

| කළඹ වර්ගය | 2025 | | 2024 | |
|---|---|---|---|---|
| | පොත් වටිනාකම රු. '000 | පොත් වටිනාකම රු. '000 | පොත් වටිනාකම රු. '000 | සාධාරණ වටිනාකම රු. '000 |
| FVPL කළඹ | 20,435,498 | 20,855,082 | 20,451,390 | 20,874,049 |
| FVOCI කළඹ | 53,771,310 | 56,387,679 | 45,234,756 | 47,900,345 |
| එකතුව | 74,206,808 | 77,242,761 | 65,686,146 | 68,774,394 |

වගුව 31 ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට සහ අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට රජයේ සුරැකුම්පත්

**රජයේ සුරැකුම්පත් කළඹ** පුස්ථාර 78




වෙළෙඳ කළඹ තුළ පොලී අනුපාත අවදානම (IRR)

වෙළෙඳ කළඹ තුළ දරන බැංකුවේ පොලී අනුපාත සංවේදී ආයෝජනවලින් ඇති වේ. රජයේ සුරැකුම්පත් වෙළෙඳ කළඹ තුළ ඇති පොලී අනුපාත අවදානම පූර්ව නිශ්චිත රුචි සීමාවන්, උපලබ්ධි නොවූ ලාභ/අලාභ සහ ප්‍රාග්ධන අවශ්‍යතාවලට අනුව M – Duration භාවිතයෙන් නියාමනය කරනු ලබන අතර එය වෙළෙඳ කළඹ තුළ දරන සුරැකුම්පත් වල කාලසීමාව මත පදනම්ව ගණනය කෙරේ

බැංකුවේ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට (FVPL) සහ අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට (FVOCI) රජයේ සුරැකුම්පත්වල ආයෝජන කළඹ වසර අවසානයේදී සිය රජයේ සුරැකුම්පත්වල මුළු ආයෝජනයෙන් 7.3% ක් විය. භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර කළඹේ වෙළෙඳපොල වටිනාකම (FVPL+FVOCI) රු. බිලියන 77.2ක් විය.

පොලී අනුපාත අවදානම වෙත බැංකුවේ නිරාවරණය වෙළෙඳපොල පොලී අනුපාතවල උච්ඡාවචනයෙන් ඇති වන අතර එය ශුද්ධ පොලී ආදායමට බලපායි. මෙය බැංකුවේ පාදක වන පොලිය උපයන වත්කම්, පොලිය දරණ වගකීම් සහ ශේෂ පත්‍රයෙන් බාහිර අයිතම මත විභව බලපෑමක් ඇත. පොලී අනුපාත අවදානමට බැංකුවේ නිරාවරණය ප්‍රතිමිලැකරණ අවදානම, ඵලදා වක්‍ර අවදානම සහ පදනම් අවදානම ඇතුළු විවිධ ආකාරවලින් ප්‍රකාශ විය හැකිය.

සමාලෝචිත වසර තුළ පොලී අනුපාතවල අඩුවන ප්‍රවනතාව බැංකුවේ ප්‍රාග්ධනය සහ ඉපයීම් කෙරෙහි ධනාත්මකව බලපාන ලදී. පොලී සංවේදී වත්කම් සහ වගකීම්වල කාල ව්‍යූහය සහ උපකරණ මිලකළ පොලී අනුපාත දර්ශකවල වෙනස්වීම්වලින් පොලී අනුපාත අවදානම ඇති වේ. එබැවින්, බැංකුවේ ප්‍රාග්ධන කළඹ පදනම සහ අනාගත ඉපයීම් මත සැලකියයුතු අහිතකර බලපෑම අවම කිරීමට බැංකු කළඹ තුළ පොලී අනුපාත අවදානම කළමනාකරණය කෙරේ.

### බැංකු කළඹ තුළ පොලී අනුපාත අවදානම (IRRBB)


| | මාස 1ට අඩු | මාස 1-3 | මාස 3-6 | මාස 6-12 | අවුරුදු 1-3 | අවුරුදු 3-5 | අවුරුදු 5ට වැඩි |
|---|---|---|---|---|---|---|---|
| RSA (රු. මිලියන) | 91,894 | 108,567 | 200,929 | 301,102 | 435,838 | 272,497 | 318,261 |
| RSL (රු. මිලියන) | 285,396 | 522,994 | 319,455 | 367,061 | 149,507 | 7,408 | 12,718 |
| කාලසීමා පරතරය (RSA-RSL) - (රු. මිලියන) | (193,502) | (414,426) | (118,526) | (65,959) | 286,331 | 265,089 | 305,543 |
| සමුච්චිත පරතරය - (රු. මිලියන) | (193,502) | (607,928) | (726,455) | (792,414) | (506,083) | (240,994) | 64,549 |
| RSL හි ප්‍රතිශතයක් ලෙස සත්‍ය පරතරය - 2025 (%) | -67.8 | -79.2 | -37.1 | -18.0 | 191.5 | 3578.6 | 2402.4 |
| RSL හි ප්‍රතිශතයක් ලෙස සත්‍ය පරතරය - 2024 (%) | -75.4 | -83.4 | -61.4 | -27.3 | 349.0 | 1223.4 | 8093.0 |

වගුව 32 පොලී අනුපාත සංවේදී පරතරය- බැංකු කළඹ

# අවදානම් කළමනාකරණ වාර්තාව

## එලදා වක්‍රයේ වෙනස්වීම

පිටුව 79




(මූලාශ්‍රය: Bloomberg)

බැංකුව මූලිකවම පොලී අනුපාත ප්‍රතිමිලකරණ පරතර විශ්ලේෂණ තුළින් පොලී අනුපාත අවදානම තක්සේරු කරන අතර, ඉන් පොලී අනුපාත කම්පනවලින් ඉපයීම් සහ ප්‍රාග්ධනයට ඇති අනතුර පෙන්වා දේ. මෙම විශ්ලේෂණ මගින් නිශ්චිත කල්පිරීමේ රාමු තුළ ප්‍රතිමිලකරණය කළ පොලී ඉපයීම් වත්කම් සහ පොලිය දරන වගකීම් අතර වෙනස මනිනු ලබයි. බැංකුව ඉපයීම් දර්ශනයක් සහ ආර්ථික වටිනාකම් දර්ශනයක් තුළින් පොලී අනුපාත අවදානම ඇගයීමට ලක් කරයි.

එලදායී පොලී අනුපාත අවදානම් කළමනාකරණය තීරණාත්මක වේ. එයට හේතුව බැංකුවේ වත්කම් සහ වගකීම්වලින් 90%ක් පොලී අනුපාත සංවේදී වීම හා බැංකුවේ පොලී අනුපාත ආදායම සහ/හෝ ශුද්ධ පොලී ආන්තිකය පොලී අනුපාත උච්ඡාවචනයට ඉතා ඉහළින් සංවේදීවීමයි.

බැංකුවේ පොලී අනුපාත අවදානම් කළමනාකරණ උපායමාර්ගවලට කල්පිරීම්වල නොගැලපීම් අවම කිරීම (ස්ථීර අනුපාත වත්කම් සහ වගකීම් සඳහා) සහ ප්‍රතිමිලකරණ දින ගැලපීම (පාවෙන අනුපාත වත්කම් සහ වගකීම් සඳහා) ඇතුළත්ය. 2025 වසර අවසානයේදී කල්පිරීම් රාමු කිහිපයක් තුළ වර්ධනයන් නිරීක්ෂණය විය.

## ස්කන්ධ මිල අවදානම

| කළඹ වර්ගය | 2025 | | 2024 | | උපලබ්ධි ලාභ/(අලාභ) |
|---|---|---|---|---|---|
| | පොත් වටිනාකම රු. '000 | සාධාරණ වටිනාකම රු. '000 | පොත් වටිනාකම රු. '000 | සාධාරණ වටිනාකම රු. '000 | රු. '000 |
| FVPL කළඹ | 1,171,891 | 1,303,683 | 187,520 | 212,732 | 106,580 |
| FVOCI කළඹ | 2,820,030 | 7,192,082 | 2,784,598 | 5,568,833 | 1,587,817 |
| එකතුව | 3,991,921 | 8,495,765 | 2,972,118 | 5,781,565 | 1,694,397 |

චගුව 33 ස්කන්ධ කළඹේ තත්ත්වය

ස්කන්ධ මිල අවදානම යනු කොටස් වෙළෙඳපොල ගතිකතා හේතු කොට ගෙන කොටස් ආයෝජන කළඹෙහි වටිනාකම අඩුවීමේ අවදානමයි. මෙගින් බැංකුවේ ආදායම හා සංචිතවල විභව්‍ය විචල්‍යතා ඇති විය හැකිය. බැංකුව සාමාන්‍ය කොටස් හා ඒකක භාර සඳහා ලැයිස්තුගත ස්කන්ධ උපකරණවල සිය ආයෝජනවලින් ස්කන්ධ මිල අවදානමට මුහුණ දේ. වෙළෙඳපොල විචල්‍යතා සහ වෙළෙඳ කටයුතු වෙනස්වීම්වලින් ඇතිවන කොටස් ගනුදෙනු සහ කළඹ අවදානම් නියාමනය කිරීමට විස්තීර්ණ සීමා ව්‍යූහයක් ස්ථාපනය කර ඇත.


බැංකුවේ ලැයිස්තුගත ස්කන්ධ කළඹ FVPL සහ FVOCI යන කළඹ දෙකෙන් සමන්විත වේ. FVOCI කළඹට උපායමාර්ගික හා ව්‍යවස්ථාපිත අරමුණු සඳහා සිදුකළ ස්කන්ධ ආයෝජන ඇතුළත්ය.

FVPL කළඹ වසර අවසානයේදී අඩු වූ අතර එයට ප්‍රධාන වශයෙන් ධනාත්මක ස්කන්ධ වෙළෙඳපොල කාර්යසාධනය හමුවේ අලෙවි කිරීම් වැඩිවීම හේතු විය.

ස්කන්ධ ආයෝජනවල ප්‍රමාණය අවදානම් සීමා රාමුව, ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය, සහ පවත්නා වෙළෙඳපොල තත්ත්වයන් මත පදනම් වී තීරණය කෙරේ. ස්කන්ධ ආයෝජනවල අබණ්ඩ නියාමනය බැංකුවේ අවදානම් අභිරුචිය තුළ ස්කන්ධ මිල අවදානම කළමනාකරණය සඳහා තීරණාත්මක වේ.

## ස්කන්ධ උපකරණවල ආයෝජන

පිටුව 80




## විදේශ විනිමය අවදානම

විදේශ විනිමය (FX) තුළ ඉදිරි රැකුම් නොකළ තත්ත්වයන්ගෙන් විදේශ විනිමය අවදානම ඇති වේ. බැංකුව, සම්මත මැනීමේ ප්‍රවේශය (SMA) යටතේ, ශුද්ධ විදේශ විනිමය නිරාවරණය (NFCE) මත පදනම් වූ විදේශ විනිමය අවදානම සඳහා බැංකුව ප්‍රාග්ධනය වෙන් කරයි. ශුද්ධ විවෘත තත්ත්වය (NOP) නියාමන සහ අභ්‍යන්තර සංඥා සීමා අනුව දෛනිකව නියාමනය කෙරේ. 2025 වසර අවසානයේදී. බැංකුවේ NFCE ඇ. ඩොලර් මිලියන 3.71ක් වූ අතර එය බැංකුවේ මුළු නියාමන ප්‍රාග්ධනයෙන් 1.3%ක් නියෝජනය කරයි.

# අවදානම් කළමනාකරණ වාර්තාව

| | මාස 1ට අඩු | මාස 1-3 | මාස 3-6 | මාස 6-9 | මාස 9-12 |
|---|---|---|---|---|---|
| ඇමෙරිකන් ඩොලර් | (6,254,746) | 17,029,277 | (7,177,701) | (10,153,226) | 11,506,016 |
| යුරෝ | (1,784,763) | (543,617) | 1,797,110 | (457,067) | 2,024,467 |
| බ්‍රිතාන්‍ය පවුම් | (1,082,868) | (949,473) | 258,423 | 1,281,420 | 1,314,884 |
| සිංගප්පූරු ඩොලර් | 45,772 | – | – | – | – |
| ඕස්ට්‍රේලියන් ඩොලර් | (1,055,121) | (834,940) | 131,832 | 1,687,554 | 2,147,958 |
| ජපන් යෙන් | 2,506,045 | (32,638,631) | – | – | – |
| UAE ඩිරාම් | 68,960 | – | – | – | – |
| කැනේඩියන් ඩොලර් | 358,243 | – | – | – | – |
| ස්විස් ෆ්‍රෑන්ක් | 60,640 | – | – | – | – |


වගුව 34 විදේශ විනිමය මෙහෙයුම් සඳහා මුදල අනුව කල්පිරීමේ පරතර

| සැරුසටබ ජමරරුබජහ'000* | 2025 | 2024 |
|---|---|---|
| ීඃ | (391) | (2,520) |
| ැඔසඃ | 1,036 | 902 |
| ඨඊඡ | 822 | 1,108 |
| ඝඡශ | 2,503 | 2,726 |
| ීඔඃ | 2,052 | 1,600 |
| ීඨඃ | 46 | 11 |

ඕගුකැ 35 Structural net foreign currency exposures

## ශුද්ධ විවෘත තත්ත්වය


ප්‍රස්ථාර 81




බැංකුව ස්කන්ධ වෙළෙඳ කළඹ සහ විදේශ විනිමය විවෘත තත්ත්වය සඳහා අවදානමේ වටිනාකම (VaR) භාවිතයෙන් වෙළෙඳපොල අවදානම් කළමනාකරණ කාර්යය යටතේ මිල උච්චාවචනය මනිනු ලබයි. ස්කන්ධ සහ විදේශ විනිමය අවදානම් සඳහා අවදානමේදී වටිනාකම අවදානම් දරා ගැනීමේ සීමාව (RTL) තුළ පවතී.

## ස්කන්ධ අවදානමේදී වටිනාකම (VAR) වෙනස්වීම


ප්‍රස්ථාර 82



## අවදානම් කළමනාකරණ වාර්තාව

### විදේශ විනිමය අවදානමේදී වටිනාකම තුළ වෙනස්වීම

ප්‍රස්ථාර 83




### වෙළෙඳපොල අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

**1**

**හඳුනාගැනීම**

පොලී අනුපාත අවදානම, විදේශ විනිමය අවදානම, ස්කන්ධ මිල අවදානම සහ වෙළෙඳ භාණ්ඩ මිල අවදානම හඳුනාගැනීම සඳහා වෙළෙඳ කළඹ, වෙළෙඳ නොවන කළඹ, සහ ශේෂ පත්‍රයෙන් බැහැර අයිතම වල ඇති ව්‍යුත්පන්න නිෂ්පාදන හා ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ විවිධ ප්‍රවේශයක් භාවිතා කරමින් යොදා ගැනේ.

**2**

**තක්සේරුව හා මැනීම**

වෙළෙඳපොල අවදානම් නිරාවරණයන් අවදානමේදී අගය (VAR), කාලසීමාව (Duraton), අපේක්ෂිත හිඟය, අවස්ථා විශ්ලේෂණය, සහ ආතති පරීක්ෂණය වැනි මෙවලම්/ආකෘති කිහිපයක් භාවිතා කරමින් එහි බලපෑම මැනීබැලීම සඳහා තක්සේරු කරනු ලැබේ.

**3**

**නියාමනය හා වාර්තාකරණය**

TFO මෙහෙයුම් සහ පෙර තීරණයකළ අවදානම් සීමා හා අනුකූලතා අවශ්‍යතා අනුව කළඹේ කාර්යසාධනය නියාමනය සහ අවදානම් හිමිකරුවන්ට, ජ්‍යෙෂ්ඨ කළමනාකරණයට හා අධ්‍යක්ෂ මණ්ඩලවය වාර්තා කිරීම.

**4**

**අවමකිරීම හා පාලනය**

අවදානම් අඩු කිරීමේ ක්‍රියාමාර්ග සහ පාලන වර්ධනයන්ථ නිර්දේශිත කිරීම පහත පරිදි:

**ඉදිරියකුම්:** විභව අවදානම් අඩුකිරීම සඳහා

**විවිධාංගීකරණය:** සංකේන්ද්‍රණ අවදානම අඩු කිරීම සඳහා

**වත්කම් වගකිම් කළමනාකරණය:** පොලී අනුපාත අවදානම අඩු කිරීම සඳහා

**කළඹ නැවත තුලනය:** වෙළෙඳපොල තත්ත්වයන් ගැලපීම සඳහා

පළමු ආරක්ෂක මාර්ගය ලෙස කටයුතු කරන භාණ්ඩාගාර ඉදිරි කාර්යාලය (TFO) අවදානම් කළමනාකරණ රාමුවේ විෂය පථය තුළ බැංකුවේ වෙළෙඳ සහ වෙළෙඳ නොවන වෙළෙඳපොල අවදානම් ද්විත්වය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා වගකිව යුතුය. භාණ්ඩාගාර මැදි කාර්යාලය (TMO) දෙවන පාලන මාර්ගය ලෙස ක්‍රියා කරන අතර, වෙළඳාම සහ ආයෝජන ක්‍රියාවලිය සහ කළඹ කාර්යසාධනය ස්වාධීනව ඉටු කරයි. IRMF යටතේ, වෙළෙඳපොල අවදානම් කළමනාකරණ රාමුව වෙළෙඳ සහ වෙළෙඳ නොවන අවදානම් සඳහා පොදු අවදානම් ලක්ෂණ ප්‍රදර්ශනය කරන සියලුම වර්ගයේ අවදානම් එකතු කරයි.

භාණ්ඩාගාර මෙහෙයුම්වල අවදානම් අවම කිරීම සහතික කිරීම සඳහා, භාණ්ඩාගාර මැදි කාර්යාලය ක්‍රියාවලි හිමිකරුවන් සමඟ සහයෝගයෙන් කාර්යසාධනයේ සමස්ත වර්ධනය ඇති කිරීමට නියාමන අවශ්‍යතාවන්ට අනුව අවදානම් පාලන ස්වයං තක්සේරුව (RCSAs) සහ පරතර විශ්ලේෂණ පවත්වයි.

# අවදානම් කළමනාකරණ වාර්තාව

## ද්‍රවශීලතා හා අරමුදල් අවදානම

ද්‍රවශීලතාව හා අරමුදල් අවදානම පිළිගත නොහැකි අලාභ දැරීමක් නොමැතිව ගෙවීමට ඇති තත්ත්වයයට පත්වන ශේෂ පත්‍රයේ හෝ ඉන් පිටත බැඳීම් සපුරාලීමට බැංකුවට ප්‍රමාණවත් ස්ථාවර හෝ විවිධ අරමුදල් ප්‍රභවයන් නොමැති වන අවස්ථාවල ඇති වේ. බැංකුවේ ද්‍රවශීල අවදානම් කළමනාකරණ රාමුව මගින් බැංකුවේ මෙහෙයුම් පූර්ව නිශ්චිත ද්‍රවශීලතා සීමාවන් තුල පවතින බව සහ ද්‍රවශීල ප්‍රතිපත්ති, නියාමන අවශ්‍යතා සහ ව්‍යවහාරවලට අනුකූලව පවතින බව සහතික කිරීම අවශ්‍ය වේ.



ද්‍රවශීලතා සහ අරමුදල් අවදානම් කළමනාකරණයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ සාමාන්‍ය සහ පීඩන අවස්ථා යටතේ නිවැරදි පිරිවැයට බැඳීම් සපුරාලීම සඳහා කාලීනව අරමුදල් ලබාගැනීම සහතික කිරීමයි.

## නියාමන අනුපාත

බැංකුවේ නියාමන ද්‍රවශීලතා දර්ශක පසුගිය වසරට සාපේක්ෂව වර්ධනය ද්‍රවශීලතා සහ අරමුදල් අවදානම් කළමනාකරණයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ සාමාන්‍ය සහ පීඩන අවස්ථා යටතේ නිවැරදි පිරිවැයට බැඳීම් සපුරාලීම සඳහා කාලීනව අරමුදල් ලබාගැනීම සහතික කිරීමයි.


| අනුපාතය | 2025 | 2024 | නියාමන අවමය |
|---|---|---|---|
| LCR - රුපියල් ප්‍රතිශතය | 360.4 | 351.3 | 100.0 |
| LCR - (සියලු මුදල්) ප්‍රතිශතය | 349.2 | 344.6 | 100.0 |
| NSFR ප්‍රතිශතය | 206.4 | 193.5 | 100.0 |

වගුව 36 නියාමන ද්‍රවශීලතා අනුපාත


## නිෂ්පාදන මගින් අරමුදල විවිධාංගීකරණය

2025 දී, බැංකුවේ තැන්පතු පදනම වාර්ෂිකව 3.4%කින් වර්ධනය වූ අතර රු. ට්‍රිලියන 1.61ට ලඟාවිය. මෙම වර්ධනයට මූලික වී ඇත්තේ විශේෂයෙන් රජයේ සුරැකුම්පත් සහ විකල්ප ස්ථිර ආදායම් උපකරණ මත පොලී අනුපාතවල අඩුවීමයි. බැංකුව අඩු පිරිවැය ඉතුරුම් සාර්ථකව සේවයේ යොදවන ලදී. ඉතුරුම් තැන්පතු වාර්ෂිකව 11.7%කින් වැඩි වූ අතර, ස්ථිර තැන්පතු වාර්ෂිකව 1.3%කින් වර්ධනය විය.

**නිෂ්පාදන අනුව අරමුදල විවිධාංගීකරණය** ප්‍රස්ථාර 84




**ස්ථාවර සහ ඉතුරුම් තැන්පතු මුසුව** ප්‍රස්ථාර 85




බැංකුවට සිය ශාඛා ජාලය තුළින් පාරිභෝගික සහ ආයතනික තැන්පතුවල පුළුල් පරාශයකට ප්‍රවේශය ඇති අතර, එය ස්ථිර අරමුදල්වල මූලික මූලාශ්‍රය වශයෙන් පවතී. දිවයින පුරා ශාඛා ජාලය තුළින් පාරිභෝගික තැන්පතු කරා ප්‍රවේශය (එනම් ඉතුරුම් හා ස්ථාවර තැන්පතු) අරමුදල්කරණය තුළ සංකේන්ද්‍රණ අවදානම අඩු කිරීමට උපකාරී වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවලට අනුව භාණ්ඩාගාර අංශය තුළ වත්කම් සහ වගකීම් කළමනාකරණ (ALM) ඒකකය විසින් අරමුදල් අවදානම් කළමනාකරණය කෙරේ.

බැංකුව නියාමන අවශ්‍යතා සහ තොග සහ ප්‍රවාහ ප්‍රවේශවලට අනුකූලව ප්‍රධාන ද්‍රවශීලතා අවශ්‍යතාවන්ට අනුකූලව නියාමනය කිරීම මගින් ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කරයි. බැංකුවේ වත්කම් හා වගකීම්වල වෙනස්වීම් අරමුදල් අවශ්‍යතාවලට සමානුපාතිකව මනිනු ලබන්නේ බැංකුවේ ද්‍රවශීලතා මට්ටම් කළමනාකරණය කර, බැංකුවේ අවදානම් අභිරුචිය සමඟ පෙළ ගස්වා ඇති බව සහතික කිරීමටයි. යහපත් ද්‍රවශීලතා පැතිකඩක් පවත්වා ගැනීමට රුපියල් සහ ප්‍රධාන විදේශ විනිමය සඳහා ද්‍රවශීලතා පරතර මත අභ්‍යන්තර සීමා නිරන්තරව නියාමනය කෙරේ.

ද්‍රවශීලතා අවදානම ඉහළ තත්ත්වයේ ද්‍රවශීල වත්කම්වල ප්‍රමාණවත් ස්වාරක්ෂක පවත්වා ගනිමින් සහ අරමුදල් මූලාශ්‍ර විවිධාංගීකරණය කරමින් අවම කෙරේ. ඊට අමතරව, බැංකුවේ සම්භාව්‍ය අරමුදල් සැලැස්ම මගින් ප්‍රමාණවත් ද්‍රවශීලතා මූලාශ්‍ර අවශ්‍ය පරිදි ක්‍රියාවට නංවා ඇති බව සහතික කරයි.

# අවදානම් කළමනාකරණ වාර්තාව

## තොග ප්‍රවේශය

අරමුදල්වල ප්‍රමාණාත්මතාව සහතික කිරීමට, සහ අවදානම් රුචිය තුළ ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කිරීමට, බැංකුව තොග ප්‍රවේශය යටතේ පහත ද්‍රවශීල අනුපාත නියාමනය කරයි.

| තොග ප්‍රවේශය යටතේ අනුපාත | 2025 % | 2024 % |
|---|---|---|
| මුළු වත්කම්වලට ශුද්ධ ණය | 30.1 | 30.4 |
| ගනුදෙනුකාර තැන්පතුවලට ණය | 36.1 | 36.1 |
| කෙටි කාලීන වගකීම්වලට ද්‍රවශීල වත්කම් | 69.0 | 62.4 |
| මුළු වත්කම්වලට මිලදී ගත් අරමුදල් | 18.0 | 17.1 |
| (විශාල වගකිම්-තාවකාලික ආයෝජන) සිට (ඉපයිම් වත්කම්-තාවකාලික ආයෝජන) දක්වා | -1.6 | -2.5 |
| මුළු ණයවලට බැඳීම | 0.8 | 0.9 |

වගුව 37 තොග ප්‍රවාහය යටතේ අනුපාත

## ප්‍රවාහ ප්‍රවේශය

ප්‍රවාහ ප්‍රවේශය යටතේ, ද්‍රවශීල වත්කම් තක්සේරු කිරීමට බැංකුව විසින් ද්‍රවශීලතා පරතර විශ්ලේෂණ පවත්වනු ලැබේ. ද්‍රවශීලතා පරතර ස්ථාපිත සීමා අනුව නිරන්තරයෙන් නියාමනය කරන අතර සංවේදී විශ්ලේෂණ සහ පීඩන පරීක්ෂාව සඳහා දත්ත භාවිතා කෙරේ.

කල්පිරීමේ පරතර විශ්ලේෂණ නියාමනය වියහැකි අහිතකර ද්‍රවශීල අවස්ථා කල්තියා දැනගැනීමට සහය වේ.

| බැංකුව - රු. මිලියන | මාස 0-3 | මාස 3-12 | අවුරුදු 1-3 | අවුරුදු 3-5 | අවුරුදු 5 ට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|
| ගිවිසුම්ගත කල්පිරීම සහිත වත්කම් | 213,245 | 450,960 | 491,640 | 305,484 | 369,695 | 1,831,024 |
| ගිවිසුම්ගත කල්පිරීම සහිත වගකීම් | 823,456 | 698,999 | 150,215 | 7,709 | 150,645 | 1,831,024 |
| කල්පිරීමේ පරතරය | (610,211) | (248,040) | 341,425 | 297,775 | 219,050 | (0) |
| සමුච්චිත පරතරය | (610,211) | (858,250) | (516,825) | (219,050) | 0 | 0 |
| වගකීම්වල ප්‍රතිශතයක් ලෙස සත්‍ය පරතරය - 2025 | -74 | -35 | 227 | 3863 | 145 | 0 |
| වගකීම්වල ප්‍රතිශතයක් ලෙස සත්‍ය පරතරය - 2024 | -78 | -39 | 364 | 1199 | 273 | 0 |

වගුව 38 ගිවිසුම්ගත කල්පිරීමේ පරතර

### මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම යන්නෙන් බැංකුවේ මෙහෙයුම්වලට බාධා ඇති කරන ප්‍රමාණවත් නොවන හෝ අසමත් අභ්‍යන්තර ක්‍රියාවලි, පද්ධති, මානව දෝෂ හෝ බාහිර සිදුවීම්වලින් ඇතිවිය හැකි අලාභය අර්ථවත් වේ. මෙහෙයුම් අවදානම් අභ්‍යන්තර උවදුරු හෝ බාහිර තර්ජනවලින් ඇතිවිය හැකි බැවින් මෙවැනි වර්ගයේ අවදානම් සෑමවිටම බොහෝ සෙයින් සංකීර්ණ මෙන්ම අන්තර් සම්බන්ධ වේ. මෙහෙයුම් අවදානමට නෛතික අවදානම ඇතුළත් වුවද කීර්තිනාම සහ උපායමාර්ගික අවදානම ඇතුළත් නොවේ.



මෙහෙයුම් අවදානම් ධාවක


දෙවන ආරක්ෂක මාර්ගය ලෙස, මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව හා අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව පවරන ප්‍රධාන අවදානම් කරුණු සමඟ කාලීන තීරණ සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට ව්‍යූහගත පාලන යාන්ත්‍රණ තුළින් මෙහෙයුම් අවදානම් නියාමනය කෙරේ.

2025 වසර අයහපත් කාලගුණික තත්ත්වයන්ගෙන් ඇති කළ සැලකියයුතු මෙහෙයුම් බිඳවැටීම සමඟ, ශ්‍රී ලංකාවේ ඉතිහාසය තුළ වඩාත් බරපතල ආර්ථික අර්බුදවලින් පසු ක්‍රමානුකූල ආර්ථික ප්‍රතිසාධන වසර ලෙස නම් කළ හැකිය. මෙම තත්ත්වයන් ව්‍යාපාර අඛණ්ඩතාවයට විශේෂයෙන් සම්බන්ධ මෙහෙයුම් අවදානම්වලට බැංකුවේ නිරාවරණය ඉස්මතු කරන ලදී.

# අවදානම් කළමනාකරණ වාර්තාව

## මෙහෙයුම් අවදානම් පැතිකඩ

බාසල් මාර්ගෝපදේශ අනුව, මෙහෙයුම් අවදානම් සිදුවීම් අලාභ සිදුවීම් වර්ග හතකට වර්ගීකරණය කෙරේ:





රූපය 27 අලාභ සිදුවීම් වර්ග

2025 දී, මුළු මෙහෙයුම් අලාභ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත RAL තුළ පැවතුන අතර වසර තුනක සාමාන්‍ය විගනිත දළ ආදායමෙන් 0.59%ක් විය.

### අවදානම් අභිරුචිය හා දරාගැනීමේ සීමාවන්ට අනුව සැබෑ මෙහෙයුම් ආදායම


ප්‍රස්ථාර 86




පසුගිය වසර කිහිපය තුළ, බැංකුව සිය මෙහෙයුම් අලාභ අවදානම් අභිරුචි මට්ටමට වඩා පහළින් අලාභ පවත්වා ගන්නා ලද අතර මින් පාලන ව්‍යුහයේ, ප්‍රතිපත්ති, අභ්‍යන්තර පාලනයන් හා අවදානම් සංස්කෘතියේ ඵලදායිත්වය පිළිබිඹු කරයි.


### උග්‍රතාවය අනුව අලාභ සිදුවීම්

ප්‍රස්ථාර 87




### සංඛ්‍යානය අනුව අලාභ සිදුවීම්

ප්‍රස්ථාර 88




- අභ්‍යන්තර වංචාව
- බාහිර වංචාව
- සේවක ව්‍යවහාර සහ සේවා ස්ථාන ආරක්ෂාව
- සේවාදායකයා, නිෂ්පාදන, සහ ව්‍යාපාර පරිචයන්
- භෞතික වත්කම්වලට හානිය
- ව්‍යාපාර බිඳවැටීම් හා පද්ධති දෝෂ*
- ක්‍රියාත්මක කිරීම, ලබාදීම සහ ක්‍රියාවලි කළමනාකරණය*

* ප්‍රතිවර්ගීකරණය

## අවදානම් කළමනාකරණ වාර්තාව

බැංකු ක්ෂේත්‍රය එහි සංකීර්ණ ක්‍රියාවලි හා නියාමන ඉල්ලුම් හේතුවෙන් අසමසම මෙහෙයුම් අභියෝගවලට මුහුණ දේ.

ඵලදායී අවදානම් කළමනාකරණය උවදුරු අවම කිරීමට සහ නියාමන අනුකූලතාව සහතික කිරීමට තීරණාත්මක වේ. බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව එහි අවදානම් රුචියට අනුකූල වෙමින් මෙම අවදානම් කළමනාකරණය කිරීම සඳහා සැලසුම් කර ඇත. එය පද්ධති පාලනයන්, ප්‍රවේශ පාලනයන්, රාජකාරී වෙන් කිරීම, පැහැදිලි අධිකාරී මායිම්, ද්විත්ව පාලනය, භෞතික වත්කම් පාලනයන්, වාර්තා තබා ගැනීම, සැසඳීමේ ක්‍රියාවලිය සහ විගණන විමසුම් වැනි ශක්තිමත් අභ්‍යන්තර පාලනයන් ඒකාබද්ධ කරයි.

### මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

බැංකුව සිය මෙහෙයුම් හරහා මෙහෙයුම් අවදානම් හඳුනාගෙන තක්සේරු කිරීම සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක මෙවලම් පරාශයක් යොදවයි:

**1 හඳුනාගැනීම**

පුද්ගලයන්, ක්‍රියාවලීන්, පද්ධති සහ බාහිර සිදුවීම් වලින් සිදුවන මෙහෙයුම් අවදානම් ධාවකයන් හඳුනාගැනීමට බැංකුව බහුවිධ ප්‍රවේශයන් භාවිතා කරයි. OKRI, RCSA, පාරිභෝගික පැමිණිලි විශ්ලේෂණය මගින් මෙහෙයුම් අවදානම් කල්තියා හඳුනා ගැනීමට පහසුකම් සපයයි.

**2 තක්සේරුව හා මැනීම**

තාප සිතියම් සහ ලකුණු කාඩ්පත් ප්‍රවේශය වැනි මෙවලම් භාවිතයෙන් අවදානමේ බරපතලකම සහ සිදුවීමේ සම්භාවිතාව සැලකිල්ලට ගනිමින් අවදානම් නිරාවරණයන් තක්සේරු කරනු ලැබේ.

**3 නියාමනය හා වාර්තාකරණය**

හඳුනාගත් අවදානම් නියාමනය කර අවදානම් හිමිකරුවන්ට, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරනු ලැබේ.

**4 අවම කිරීම හා පාලනය**

වාර්තා කරන ලද තොරතුරු මත පදනම්ව සුදුසු අවම කිරීමේ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම. සිදුවීම්වල වාර ගණන සහ බරපතලකම මත පදනම්ව, උපාය මාර්ග අවදානම් මාරු කිරීම, අවදානම වළක්වා ගැනීම, අවදානම පිළිගැනීම හෝ අවදානම අවම කිරීම කෙරෙහි අවධානය යොමු කරයි.

රූපය 28 මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

**මූලික මෙහෙයුම් අවදානම් දර්ශක (KORIs)**

උපායමාර්ගික මට්ටමින් දර්ශක හයක් එනම් විගණන ගැටළු කළමනාකරණය, ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණය, තොරතුරු ආරක්ෂාව, නිෂ්පාදන ගුණාත්මකභාවය, ක්‍රියාවලි ගුණාත්මකභාවය, අනුකූලතාව සහ ව්‍යාපාර මට්ටම ඇතුළත් වේ,

**මූලික හේතු විශ්ලේෂණ (RCA)**

පාදක හේතු හඳුනා ගැනීම සඳහා සැලකිය යුතු සිදුවීම් සඳහා RCA යොදනු ලැබේ.

නිවැරදි කිරීමට සහ නැවත ඇතිවීම වැළැක්වීමට තිරසාර ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට උපකාරී වේ.

**අලාභ සිදුවීම් දත්ත එකතුව**

ආසන්න අතපසුවීම් ඇතුළුව අභ්‍යන්තර හා බාහිර අලාභ සිදුවීම්, ක්‍රමානුකූලව ග්‍රහණය කර විශ්ලේෂණය කරනු ලැබේ.

අලාභවල ප්‍රවණතා, බරපතලකම සහ මූල් හේතු හඳුනා ගැනීමට උපකාරී වේ.

**අවදානම් හා පාලන ස්වයං තක්සේරුව (RCSA)**

ව්‍යාපාරික ඒකක සමඟ සහයෝගයෙන් පවත්වනු ලබන RCSA මෙහෙයුම් අවදානම් සහ පවතින පාලනයන්හි ඵලදායීතාවය ක්‍රමානුකූලව තක්සේරු කරයි.

මෙමගින්, බැංකුවේ අවදානම් රුචිය සමඟ පෙළගැස්ම පවත්වා ගනිමින් අවදානම් හඳුනාගෙන ඵලදායී ලෙස අවම කිරීම සහතික කරනු ලබයි.

**ආතති පරීක්ෂණය හා අවස්ථා විශ්ලේෂණ**


බරපතලකමේ විවිධ අවස්ථා වලින් බලපෑම තක්සේරු කිරීමේ තාක්ෂණය.

බැංකුවේ මූල්‍ය කාර්ය සාධනය සහ නුඹුන්වත් කිරීමේ දර්ශක කෙරෙහි බලපාන අහිතකර තත්ත්වයන් යටතේ සැඟවුණු අවදානම් අනාවරණය කිරීමට හැකියාව ලබා දීම.

සටහන 29 Tools to identify and assess operational risks

# අවදානම් කළමනාකරණ වාර්තාව

**මෙහෙයුම් අවදානම සඳහා අවදානම බරතබන ලද වත්කම්** පිටුව 89




2016 අංක 01 දරන මහ බැංකු නියෝගයට අනුකූලව, බැංකුව මෙහෙයුම් අවදානම් ප්‍රාග්ධන ගණනය කිරීම් සඳහා මූලික දර්ශක ප්‍රවේශය (BIA) යොදා ගනී. මෙහෙයුම් අවදානම සඳහා මූලික දර්ශක ප්‍රවේශය භාවිතා කරමින් ගණනය කළ RWAs බැංකුවේ මුළු RWAs වලින් 23.8%ක් නියෝජනය කරයි. මෙහෙයුම් අලාභ ආවරණය කිරීමට අවශ්‍ය ප්‍රාග්ධනය තීරණය කිරීමට වඩා උසස් ක්‍රම යොදා ගැනීමට සුදුසුකම් ලබන නිර්ණායක සපුරාලීමට උත්සාහයන් ගනිමින් පවතී.

ඇතැම් වැඩි-බරපතල, අඩු-සංඛ්‍යාණ අවදානම් රක්ෂණය ආවරණ තුළින් අවම කෙරේ. පරිපාලන අංශය මධ්‍යස්ථව රක්ෂණ වැඩපිළිවෙල කළමනාකරණය කරන අතර නිරන්තර පදනමක් මත රක්ෂණ හිමිකම් හා අයකිරීම් මෙහෙයුම් අවදානම් කළමනාකරණ කණ්ඩායම නියාමනය කරයි.

බාහිරකරණ ප්‍රතිපත්තියට අනුකූලව අවදානම මාරු කිරීමේ උපායමාර්ගයක් ලෙස බාහිරකරණය භාවිතා කෙරේ. සේවා බාහිරෙන් ලබා ගැනීම භාවිතා කෙරේ. බැංකුව නව ගිවිසුම්වලට ඇතුළත්වීමට හෝ පවතින ගිවිසුම් අලුත් කිරීමට පෙර සැපයුම්කරුවන් පිළිබඳ නිසි පරීක්ෂාව පවත්වයි.

වංචා අවදානම යන්නෙන් අභ්‍යන්තර හෝ බාහිර පාර්ශවයන් විසින් සිදුකරන වංචනික ක්‍රියාවන්ගෙන් ඇතිවියහැකි විභව මූල්‍යමය, හෝ කීර්තිනාම අලාභ අර්ථවත් වේ. බැංකුව අභ්‍යන්තර වංචාවලට ශූන්‍ය ඉවසුමක් පවත්වා ගන්නා අතර ශක්තිමත් අභ්‍යන්තර පාලනයන්, සදාචාර ප්‍රමිති, සහ දැනුවත් කිරීමේ වැඩසටහන් විසින් සහය ලබන බාහිර වංචා අවම කිරීමට ක්‍රියාමාර්ග ගනී.

වංචා අවදානම් සෑමවිටම අල්ලස් හා දූෂණය සමඟ සම්බන්ධ වේ. එබැවින් බැංකුවේ අල්ලස් සහ දූෂණ විරෝධී ප්‍රතිපත්තියේ දක්වා ඇති පරිදි සේවකයින් සහ අදාළ සියලුම පාර්ශව සිදුකරන ලද සේවයට ප්‍රතිචාරයක් වශයෙන් ලබාදෙන ත්‍යාග සහ සත්කාර හෝ පහසුකම් සඳහා ගෙවීම්, දේශපාලන දායකත්වයන්, අනුග්‍රහක සංචාර සහ නවාතැන්, යනාදිය ගැනීමෙන් වැලකී සිටිය යුතුය.

වංචා අවදානම කළමනාකරණය මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය, තොරතුරු දැනුම්දීමේ ප්‍රතිපත්තිය, අල්ලස් හා දූෂණ විරෝධී ප්‍රතිපත්තියෙන් පාලනය කෙරේ.

ව්‍යාපාර අඛණ්ඩතා අවදානම් විභව බිඳවැටීම්වලට සම්බන්ධ වන අතර, එය තීරණාත්මක සේවා ලබාදීමට බැංකුවේ හැකියාවට හානිකළ හැකිය. පාලනය හා අඛණ්ඩ වර්ධනය විසින් සහයවන විස්තරාත්මක ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ රාමුවක් ක්‍රියාත්මකය. පරිපාලන අංශය BCM ක්‍රියාත්මක කිරීම සහ පරීක්ෂාව සඳහා වගකිව යුතු අතර තාක්ෂණික ඔරොත්තුදීම සහ දත්ත අඛණ්ඩතාව සහතික කරමින් තොරතුරු තාක්ෂණ අංශය විසින් ආපදා ප්‍රතිසාධන ස්ථානය කළමනාකරණය කරයි.

## තොරතුරු තාක්ෂණ අවදානම

තොරතුරු තාක්ෂණ අවදානම යනු මෙහෙයුම් අවදානමේ තීරණාත්මක අංගයක් වන අතර, ව්‍යාපාර දත්ත, තීරණාත්මක පද්ධති සහ විවිධ ව්‍යාපාරික ක්‍රියාවලීන්ට තර්ජනයක් එල්ල කරයි.

දත්තවල සංවේදීතාව, තොරතුරු පද්ධතිවල තීරණාත්මක බව සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්වල ස්වභාවය සලකා බලමින් ව්‍යාපාර ඔරොත්තුදීම ශක්තිමත් කිරීමට බැංකුවේ තාක්ෂණ අවදානම් කළමනාකරණ උපාය මාර්ගය අරමණු කරන අතර, කළහැකි, සහ ප්‍රමිතිගත තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ විසඳුම් භාවිතා කරයි.

තාක්ෂණයේ යල්පැනීමේ අවදානම අවම කිරීමට හා ක්ෂේත්‍රයේ තරඟකරුවන් සමඟ තරඟකාරීව සිටීමට බැංකුවට අවශ්‍ය තාක්ෂණය තුළ උපායමාර්ගික වර්ධනයන් උපායමාර්ගික සැලසුම්කරණ ක්‍රියාවලිය තුළින් තීරණය කෙරේ.

ප්‍රධාන තොරතුරු තාක්ෂණට අදාළ අවදානම්වලට පද්ධති බිඳවැටීම් සහ දෝෂ, පද්ධති මෙහෙයවීම තුළින් වංචාව, සහ සයිබර් ප්‍රහාර ඇතුළත්ය.

ප්‍රධාන තොරතුරු නිලධාරී/නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - IT විසින් මෙහෙයවන තොරතුරු තාක්ෂණ අංශය තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණය කරන අතර තොරතුරු තාක්ෂණය මෙහෙයවීමේ කමිටුව (ITSC) වෙත වාර්තා කරයි.

ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරී (CISO) විසින් මෙහෙයවනු ලබන තොරතුරු ආරක්ෂක අංශය (ISD) අභ්‍යන්තර මනා පරිචයන් සහ මහ බැංකුවේ අවශ්‍යතාවලට අනුකූලතාව සහතික කරමින් තොරතුරු ආරක්ෂක අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා වගකීමට බැඳී සිටී. කළමනාකාරිත්ව මට්ටමින්, තොරතුරු ආරක්ෂක කමිටුව (ISC) තොරතුරු ආරක්ෂක අවදානම් කළමනාකරණයේ උපායමාර්ගික සහ මෙහෙයුම් අංශ දෙකම අධීක්ෂණය කරයි.

බලපත්‍රලාභී බැංකුවල තාක්ෂණික අවදානම් කළමනාකරණය හා ඔරොත්තුදීම පිළිබඳ මහ බැංකුවේ නියාමන රාමුව සමඟ අනුකූලවීමට බැංකුව සක්‍රීයව කටයුතු කරන අතර නිරන්තර පාලන සමාලෝචන තුළින් තොරතුරු තාක්ෂණය හා තොරතුරු ආරක්ෂාව, කළමනාකරණ පද්ධති වර්ධනය කිරීම සහතික කරයි.

මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සහ තොරතුරු ආරක්ෂක ප්‍රතිපත්තිය මගින් තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණ රාමුව විස්තර කරයි. මෙහෙයුම් අවදානම් කළමනාකරණ ඒකකය නියාමන අවශ්‍යතා සහ මනා පරිචයන් ක්‍රියාත්මක කිරීම නියාමනය කරයි. බැංකුව විසින් KORIs භාවිතා කරමින් තොරතුරු තාක්ෂණ හා ආරක්ෂක අවදානම් සඳහා RALs ස්ථාපිත කර ඇති අතර, ඒවා අවදානම් පැහැකඩ තක්සේරු කිරීම සඳහා පූර්ව නිශ්චිත මට්ටම්වලට අනුව නියාමනය කරනු ලැබේ. මීට අතිරේකව, තොරතුරු තාක්ෂණ අවදානම් සහ තොරතුරු තාක්ෂණය පදනම් ක්‍රියාවලීන් හඳුනා ගැනීමට සහ තක්සේරු කිරීමට මෙවලමක් ලෙස RCSA භාවිතා කරයි.

හඳුනා ගනු ලැබූ යම් අපගමනයන් කඩිනම් අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග සඳහා BIRMC හරහා ඉහළ කළමනාකාරිත්වයට හා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කෙරේ.

## අනුකූලතා අවදානම

වර්තමාන සංකීර්ණ හා අන්තර් සම්බන්ධිත ව්‍යාපාර පරිසරයක් තුළ, නියාමන අවශ්‍යතා ඉදිරියට ගෙන යාම ආයතනයේ සාර්ථකත්වය හා තිරසාරභාවය සහතික කිරීම සඳහා අත්‍යවශ්‍යය. බැංකු ක්ෂේත්‍රය තුළ ෆින්ටෙක් නව්‍යකරණයන් සහ උසස් කිරීම් හේතුවෙන් රෙගුලාසි අඛණ්ඩව වෙනස් කිරීමට සහ දැඩි කිරීමට සිදු විය.

නියාමන වාතාවරණය වේගයෙන් වෙනස් වෙමින් පවතින අතර බැංකුවට ඵලදායී අවදානම් කළමනාකරණ උපායමාර්ග, ක්‍රමවේද සහ රාමු සංවර්ධනය කර ඒකාබද්ධ කිරීම සඳහා අවශ්‍යතාව ඉන් ඇති කරයි. නියාමන වෙනස්වීම් කළමනාකරණය කිරීමට, නව රෙගුලාසි සමඟ යාවත් වී සිටීමට, ව්‍යාපාරය කෙරෙහි ඒවායේ බලපෑම තක්සේරු කිරීමට හා අනුකූලතාව සහතික කිරීමට සුවිශේෂී අනුකූලතා කණ්ඩායමක් වගකීමට බැඳී සිටී.

නියාමන අවශ්‍යතාවන්හි වැඩිවන සංකීර්ණත්වය සැලකිල්ලට ගනිමින්, අනුකූලතා අවදානම සඳහා සාම්ප්‍රදායික ප්‍රවේශයන් තවදුරටත් ප්‍රමාණවත් නොවේ. මෙය විසඳීම සඳහා, බැංකුව නවීන, නව්‍යකරණ අවදානම් තක්සේරු කිරීමේ උපාය මාර්ග යොදාගෙන ඇති අතර, නීති-පදනම් ප්‍රවේශයක සිට ශක්තිමත් පාලන රාමුවකින් සහාය ලබන අවදානම-පදනම් ප්‍රවේශයකට මාරු වී ඇත.

අනුකූලතා නිලධාරී විසින් මෙහෙයවන අනුකූලතා අංශය BIRMC හරහා අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වාර්තා කරයි.

# අවදානම් කළමනාකරණ වාර්තාව

2025 තුළ, අනුකූලතා සහ නියාමන අවදානම් අවම කිරීම සඳහා බැංකුව ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කර ඇත:

- 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතට අනුව, මුදල් විශුද්ධිකරණය හා තුස්තවාදයට අරමුදල්කරණය වැලැක්වීමට, සෙවීමට, විමර්ෂණය කිරීමට හා අභිචෝදනා කිරීමට මූල්‍ය බුද්ධි ඒකකයට සැකසහිත ගනුදෙනු වාර්තා කිරීම. මෙයට ගනුදෙනු නියාමන පද්ධතිය හා ශාඛා මට්ටමේ තොරතුරු ලැබීම් වලින් පහසුකම් ඇතිකරයි.
- බලතල හා වගකීම් වෙන්කිරීම තීරණය කිරීමට 1988 අංක 33 දරන බැංකු පනතේ 76 (ජේ) (1) වගන්තිය යටතේ නිකුත්කළ ආයතනික පාලනය පිළිබඳ 2024 අංක 5 දරන නියෝගයට අනුකූලවීම සහ ඒ තුළින් බැංකුවේ ව්‍යාපාර හා කටයුතු එහි අධ්‍යක්ෂ මණ්ඩලය හා ආයතනික කළමනාකාරිත්වය විසින් කරගෙන යනු ලැබේ. මේ තුළින් බැංකුවේ මූල්‍ය ස්ථාවරත්වය, පාලනය සහ ව්‍යාපාර මෙහෙයුම් ශක්තිමත් කරයි.
- අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවල කාලීන සමාලෝචනය කිරීම සහතික කිරීම.
- නියාමන බලධාරීන්ට කාලීනව වාර්තා ඉදිරිපත් කිරීම සහතික කිරීම.
- නිසි බලධාරීන් විසින් ඉල්ලා ඇති තොරතුරු කාලීනව ඉදිරිපත් කිරීම.
- අනුරූප බැංකු අවශ්‍යතා සමඟ අනුකූලවීම.
- මූල්‍ය කාර්යසාධන බලකායේ ප්‍රමිති බැංකුව විසින් පිළිපදින බව සහතික කිරීම.
- බැංකුවේ ශාඛා, සේවා අංශ සහ නිෂ්පාදන පිළිබඳ අනුකූලතා තක්සේරු කිරීම් සිදු කිරීම සහ බැංකුවේ සමස්ත අනුකූලතාවය තක්සේරු කිරීම.
- වරින් වර පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලබන අතර, බැංකුව දැනුවත් කර සූදානම්ව තබා ගැනීමට පද්ධති පාදක නියාමනය ශක්තිමත් කර යාවත්කාලීන සිදු කරනු ලබයි.
- අවදානම් මට්ටම සහ අවදානම් අවම කිරීමේ ක්‍රියාවලි ගණනය කිරීමට මුදල් විශුද්ධිකරණය හා තුස්තවාදයට අරමුදල්කරණය වැලැක්වීම පිළිබඳ ව්‍යවසාය මට්ටමේ අවදානම් තක්සේරුවක් පැවැත්වීම.

## නෛතික අවදානම

නෛතික අවදානම යන්නෙන් බැංකුවේ ව්‍යාපාර, සම්බන්ධතා, ක්‍රියාවලි, සහ සේවාවන්ට අදාළ නීති හා රෙගුලාසි පිළිබඳ දැනුම නොමැතිකම, අනවබෝධය, බහු අර්ථතාව, වැරදි ලෙස දැක්වීම තුළින් ඇතිවන මූල්‍ය අලාභ, කීර්තිනාම හානිය, හෝ මෙහෙයුම් බිඳවැටීම්වල අවදානම අර්ථවත් වේ. නෛතික අවදානම යනු මෙහෙයුම් අවදානමේ ආවේනික සංරචකයකි.

මෙයට ලියකියවිලි අඩුපාඩු සහ/හෝ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූල නොවීම හේතුවෙන් ගිවිසුම් ක්‍රියාත්මක නොකිරීමෙන් ඇතිවන අලාභ ඇතුළත් වන අතර, නඩුකිරීම්, ගිවිසුම් ආරවුල්, මූල්‍ය වගකීම් හෝ හානි සඳහා හිමිකම් පෑමට හේතු විය හැක.

බැංකුවේ නීති අංශය නෛතික අවදානම්වල උපායමාර්ගික කළමනාකරණය සඳහා වගකීමට බැඳී සිටී. වියහැකි නෛතික අවදානම් හඳුනා ගැනීමට සහ බැංකුවේ හිමිකම් ආරක්ෂා කිරීමට සුදුසු අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට වෙනත් ව්‍යාපාර අංශ සමඟ සක්‍රියව සහයෝගයෙන් කටයුතු කරයි. මෙම අංශය කඩිනම් නෛතික ක්‍රියාවන් තුළින් ණය පැහැර හැරීමේ අවදානම් අවම කිරීමට ප්‍රධාන වශයෙන් දායක වේ.

නීති අංශය අර්බුද අවස්ථා කළමනාකරණය කර ගැනීමට, පරිපාලිත සමාගම්වලට අදාළ ගැටළු විසඳීමට, අයකිරීම්වලට පහසුකම් ඇති කිරීමට, බැංකුවේ මෙහෙයුම්වලට ප්‍රමාණාත්මක බලපෑමක් ඇති නීතියේ සංවර්ධනය සලකා බලමින් අභ්‍යන්තර නීති හා ක්‍රියාපටිපාටි ප්‍රතිශෝධනය කිරීමට නීතිමය සහය, මඟපෙන්වීම සහ උපදේශනය ලබා දේ. එමෙන්ම, එය නෛතික අවදානම්වල බරපතලකම අවම කිරීමට කාර්යක්ෂමව හා ඵලදායීව ප්‍රතිචාර දැක්වීමේදී හා බැංකුවේ ව්‍යාපාර මෙහෙයුම් සහ ගිවිසුම්ගත සම්බන්ධතා අදාළ ව්‍යවස්ථාපිත රාමුවට අනුකූල බව සහතික කිරීමේදී එය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

## පාරිසරික, සමාජීය හා පාලන අවදානම

පාරිසරික, සමාජීය හා පාලන (ESG) අවදානම් විවිධ අභියෝගවලට යටත්වන අතර ඒවා ආයතනයේ මූල්‍ය කාර්යසාධනය, ව්‍යාපාර අඛණ්ඩතාව සහ කීර්තිනාමය කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කළ හැක. මෙවැනි අවදානම් බැංකුවේ පාරිසරික, සමාජීය හා පාලන ව්‍යවහාරවලින් මතුවන අතර, දිගුකාලීන තිරසාරභාවය සහතික කිරීම සඳහා ඵලදායී කළමනාකරණය අවශ්‍ය වේ.

**පාරිසරික අවදානම්** - දේශගුණික විපර්යාස, ජෛව විවිධත්ව හිඟය, සහ පාරිසරික පිරිහීම

**සමාජීය අවදානම්** - මානව හිමිකම් ගැටළු, ස්ත්‍රීපුරුෂ විවිධත්වය, සහ ශ්‍රමික ගැටළු


**පාලන අවදානම්** - ආයතනික පාලනයය හොඳම ක්‍රමවේද අනුගමනය කිරීම, දූෂණ විරෝධී ප්‍රතිපත්ති, අක්‍රමිකතා හෙළිදරව් කිරීමේ යාන්ත්‍රණ, පැමිණිළි නිරාකරණ පද්ධති, සහ බදු සාධාරණත්වය සම්බන්ධ ගැටළු.

බැංකුවේ හරිත හිතකාමී සහ සමාජමය ඇතුළත් කිරීම් සහිත පරිසරයක් ප්‍රවර්ධනය කිරීම සඳහා පාරිසරික හා සමාජීය අවදානම් කළමනාකරණය කිරීමේ වැදගත්කම හඳුනා ගනී. පාරදෘෂ්‍යතාව සහ වගවීම්භාරය සහතික කිරීම සඳහා බැංකුව අදාළ නීති, රෙගුලාසි සහ හොඳම ක්‍රියාපයිපායිවලට අනුකූලව කටයුතු කරයි. ESG (පාරිසරික හා සමාජ හා පාලන) අවදානම් කළමනාකරණය බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණ රාමුවට ඇතුළත් කර ඇති අතර, ව්‍යාපාරික ක්‍රියාකාරකම් වලදී තිරසාරභාවය මූලික සලකා බැලීමක් ලෙස පවත්වාගෙන යාම සහතික කරයි.

දේශගුණික විපර්යාස නිසා ඇතිවන භාර්ගික, ක්‍රියාත්මක සහ මූල්‍ය ප්‍රතිවිපාක මෙන්ම එය කළමනාකරණය කිරීමට ගන්නා උත්සාහයන් ද දේශගුණික විපර්යාස සම්බන්ධ මූල්‍ය අවදානම් ලෙස සැලකේ. දේශගුණික අවදානම් අවම කිරීම සහ අනුවර්තනය යනු දේශගුණික විපර්යාස අවදානම් කළමනාකරණයේදී භාවිතා වන ප්‍රධාන ක්‍රමවේද වන්නේ අවම කිරීම (Mitigation) සහ අනුකූල (Adaption) වීමය. අවම කිරීමේ ක්‍රමවේද ප්‍රධාන වශයෙන් වායු ගෝලයට නිකුත්වන හරිත ගෘහ වායු (Greenhouse gases) ප්‍රමාණය අඩු කිරීම මගින් අනාගත ජලවායු වෙනස්වීම් තීව්‍රතාව අඩුකිරීම අරමුණු කර ගනී. අනුකූලවීමේ ක්‍රමවේද යනු දැනට සිදුවෙමින් පවතින හෝ අපේක්ෂිත දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම් අවම කිරීම සඳහා ඒවාට සම්බන්ධ අවදානම් නිරාවරණයන් සහ හෝ දුර්වලතා අඩු කිරීමයි. බැංකුව දේශගුණික විපර්යාස වදානම් කළමනාකරණය සම්බන්ධ අවස්ථා නිරන්තර කාලපාරාසයන් තුළ විමර්ෂණය කරයි.

2025 නොවැම්බර් අවසානයේ ශ්‍රී ලංකාවට බලපෑම් කළ දිට්වා සුලිකුණාටුව නිසාවෙන් දිවයිනේ බොහෝ දිස්ත්‍රික්කවල විශාල හානියක් සිදුවිය. සම්පූර්ණ බලපෑ තවමත් ඇගයීම් මට්ටමේ පවතින අතර සම්පූර්ණ බලපෑම කොතෙක්දැයි ගණනය කිරීම අපහසු විය හැක. කෙසේවෙතත්, බලපෑමට බලපෑමට ලක් වූ මෙහෙයුම් හා ව්‍යාපාර ක්ෂේත්‍ර හඳුනාගෙන ඇති අතර, ව්‍යාපාරික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. භෞතික වත්කම්වලට සිදු වූ හානි හේතුවෙන් ඇතිවන මූල්‍ය බලපෑම රක්ෂණ ආවරණයක් මගින් අවම කර ගෙන ඇත.

# අවදානම් කළමනාකරණ වාර්තාව





රූපය 30 දේශගුණික අවදානම් කළමනාකරණය

මෙය ණය තුණාත්මකභාවය පහල යාමේ හැකියාව ඉහළ නැංවීම මගින් බැංකුවේ අවදානම වැඩි කරයි. එය ණය අසමත්වීම (defaults) හෝ ආපසු ගෙවීම් ප්‍රමාද වීම (Repayment delays) ඉහළ වීම හේතුවෙන් ඇති විය හැකිය.

බැංකුව සහන අවශ්‍යවන ගනුදෙනුකරුවන්ට සහයවීමට අවශය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ඒ අනුව අදාළ බලපෑම හානිකරණ වෙන්කිරීම් ගණනය කිරීමේදී සලකා බලා ඇත.

## දිට්ටිවාවලින් පීඩාවටපත් දිස්ත්‍රික්කවලට බැංකුවේ ණය නිරාවරණය

පිටුව 90




## කීර්තිනාම අවදානම් කළමනාකරණය

කීර්තිනාම අවදානම යන්නෙන් සිය කටයුතු, ව්‍යාපාර ව්‍යවහාර, නිෂ්පාදන, සේවා හෝ බාහිර සිදුවීම්වල ඍණාත්මක දර්ශනය තුළින් ඇතිවන බැංකුවේ සන්නාම අගය සහ පාර්ශවකාර විශ්වාසය කෙරෙහි වියහැකි අහිතකර බලපෑම අර්ථවත් වේ. දැඩිකළ පොදු පරීක්ෂණ පරිසරයක් තුළ, නියාමන අපේක්ෂාවන්, සහ දේශගුණයට අදාළ බිඳවැටීම්, ඵලදායී කීර්තිනාම අවදානම් කළමනාකරණය ප්‍රධාන ප්‍රමුඛතාවක් ව පවති.

බැංකුවට කීර්තිනාම අවදානම සඳහා ශූන්‍ය අවදානම් අභිරුචියක් ඇත. දෙවැනි ආරක්ෂක මාර්ගය ලෙස, අවදානම් කළමනාකරණ අංශය කීර්තිනාම අවදානම් දර්ශක නියාමනය කරන අතර, කාලීන ක්‍රියාමාර්ග සඳහා යම් ගැටළු ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට සන්නිවේදනය කරයි.

අභ්‍යන්තර ප්‍රාග්ධනය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP) තුළ කීර්තිනාම අවදානම ලකුණු පදනම් කාඩ්පතක් පදනම් ප්‍රවේශයක් භාවිතා කරමින් තක්සේරු කරනු අතර බැංකුවේ සමස්ත අවදානම් පැතිකඩ ඒකාබද්ධ කිරීම සහතික කරයි.

## උපායමාර්ගික අවදානම් කළමනාකරණය

බැංකුවේ දිගුකාලීන පරමාර්ථ, මූල්‍ය කාර්යසාධනය හෝ තිරසාරභාවය කෙරෙහි අහිතකර බලපෑමට ලක්වියහැකි තීරණ හෝ ක්‍රියාමාර්ගවලින් උපායමාර්ගික අවදානම ඇති වේ. ප්‍රධාන මූලාශ්‍රවලට සාර්ව ආර්ථික තත්ත්වයන්, නියාමන සංවර්ධනයන් තරඟකාරී ගතිකතා, තාක්ෂණික වෙනස්වීම් සහ වෙනස්වන ගනුදෙනුකාර අපේක්ෂාවන් ඇතුළත්ය.

බැංකුවේ උපායමාර්ගික සැලැසුම් ක්‍රියාවලියට අභ්‍යන්තර හා බාහිර සාධක පිළිබඳ පුළුල් තක්සේරු කිරීම් ඇතුළත් වන අතර, අනුමත අභිරුචිය සමඟ උපායමාර්ගික මූලපිරීම් පෙළ ගැසීම සිදු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය උපායමාර්ගික අවධානම් පිළිබඳ සමීප අධීක්ෂණයන් පවත්වා ගන්නා අතර මතුවන අභියෝගවලට කාලීන ප්‍රතිචාර සහතික කරයි.

අභ්‍යන්තර ප්‍රාග්ධනය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP) තුළ කීර්තිනාම අවදානම ලකුණු කාඩ්පතක් පදනම් ක්‍රමවේදයක් භාවිතා කරමින් තක්සේරු කරන අතර එහි ඒකාබද්ධ කිරීම ප්‍රාග්ධන සැලසුම්කරණය හා දිගුකාලීන තීරණ ගැනීම සඳහා ශක්තිමත් කරයි.

# අවදානම් කළමනාකරණ වාර්තාව

## ප්‍රාග්ධන කළමනාකරණය

නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට, සිය තැන්පතුහිමියන්ට හා ණයකරුවන්ට මූල්‍ය ආරක්ෂාව ලබාදීමට සහ අනාගත ව්‍යාපාර පුළුල් කිරීම සඳහා අයබදු පවත්වා ගැනීමට සහ සිය කොටස්හිමියන්ට ප්‍රමාණවත් ප්‍රතිලාභ උත්පාදනය කිරීමට බැංකුවට ශක්තිමත් ප්‍රාග්ධන තත්ත්වයක් අවශ්‍ය වේ.

ඵලදායී ප්‍රාග්ධන කළමනාකරණය බැංකුවේ ඔරොත්තුදීම වැඩි කරන අතර ප්‍රශස්ත කොටස්හිමියන්ගේ ප්‍රතිඵල සහතික කරයි. බැංකුවේ අරමුණ වන්නේ වත්කම් මත අවදානම බර තැබූ වත්කම් (RWA) මුසුව සහ අවදානම් පැතිකඩෙහි වෙනස්වීම් සමීපව නියාමනය කරමින් කාර්යසාධනය හා අවදානම අතර තුලනය ප්‍රශස්ථ කිරීමයි. ප්‍රාග්ධන කළමනාකරණ ක්‍රියාවලිය මහ බැංකුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශවලට අනුකූල වේ.

2019 අංක 11 දරන බැංකු පනත් නියෝගය පරිදි, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා බාසල් III යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ විධාන සංශෝධන මත, 39 වගුව තුළ දක්වා ඇති පරිදි අවම ප්‍රාග්ධන අනුපාත පවත්වා ගැනීම අවශ්‍ය වේ.


බැංකුව 2025 වසර තුළ නියාමන අවම අවශ්‍යතා මට්ටමට ඉහළින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව පවත්වා ගෙන ඇත. පොදු ස්කන්ධ ස්ථර 1 අනුපාතය වසර තුළ 2024 දෙසැම්බර් 31ට පැවති 21.71% ට සාපේක්ෂව 2025 දෙසැම්බර් 31 දිනට 23.4% දක්වා වැඩි විය. බැංකුවේ ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය 2025 දෙසැම්බර් 31 දිනට 24.90% දක්වා වැඩි විය. මුළු ප්‍රාග්ධන අනුපාතය 2024 දෙසැම්බර් 31 දිනට පැවති 25.88%ට සාපේක්ෂව 2025 දෙසැම්බර් 31 දිනට 26.83% දක්වා වැඩි විය.

සමූහයේ මුළු ප්‍රාග්ධන අනුපාතය 2024 දෙසැම්බර් 31ට පැවති 29.06% ට අනුව 2025 දෙසැම්බර් 31 දිනට 29.07% ක් විය. 100%ක් ගනුදෙනුකාර තැන්පතු මත රජයේ ඇප සහිත රජයට අයත් ඉතුරුම් බැංකුවක් ලෙස, නියාමන ප්‍රාග්ධනය බාහිරින් රැස්කර ගැනීමට ඇති විකල්ප සීමිත වේ.

එබැවින්, රඳවාගත් ඉපයීම් බැංකුවේ ප්‍රාග්ධනය ශක්තිමත් කිරීමේ ප්‍රධාන මූලාශ්‍රය වේ. ප්‍රාග්ධනය ශක්තිමත් කිරීමට රඳවාගත් ඉපයීම්වල දායකත්වය 2024 වසරට සාපේක්ෂව 2025 වසර තුළ ඉහළ අගයක් ගනී.

### ප්‍රාග්ධන මට්ටම බැංකුව සහ සමූහය

**ප්‍රාග්ධන මට්ටම බැංකුව සහ සමූහය** පිටුව 91




## ICAAP අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව තක්සේරු කිරීමේ ක්‍රියාවලිය

බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන මට්ටම සිය අවදානම් පැතිකඩ සමඟ සරිලන බව සහතික කිරීමට අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP) මඟින් ව්‍යාපාර කාර්යසාධනය, අවදානම් කළමනාකරණ කාර්යයන් සහ ව්‍යූහගත ආකාරයෙන් අවදානම සංවේදී ප්‍රාග්ධනය ඒකාබද්ධ කරයි.

ICAAP මඟින් විස්තීර්ණ අවදානම් කළමනාකරණ රාමුවක් තුළ අවදානම් රුචිය, පිඩන පරීක්ෂණය, සහ ප්‍රාග්ධනය සැලසුම් කිරීම ඒකාබද්ධ කරන අතර සියලුම ප්‍රමාණාත්මතක අවදානම් ඵලදායීව ග්‍රහනය කරන බව සහතික කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය BIRMC හරහා, අධීක්ෂණය ලබාදෙන අතර අවදානම් කළමනාකරණ අංශය ක්‍රියාවලිය ලේඛණගත කිරීම සඳහා වගකිව යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ICAAP ප්‍රතිපත්තියට අනුකූලව ICAAP පවත්වා ලේඛන ගත කරන අතර එය අධීක්ෂණ සමාලෝචනය සඳහා බාසල් III ස්ථම්භ II මාර්ගෝපදේශ සහ ජාත්‍යන්තර මනා පරිචයන් පිළිබඳ මහ බැංකුවේ නියෝග සමඟ පෙළ ගැසේ. බැංකුවේ අවදානම් තක්සේරු කිරීම් ස්ථම්භ I සහ ස්ථම්භ II අවදානම් ඒකාබද්ධ කරයි.

ICAAP නියාමනය වන ප්‍රධාන මූලධර්ම හතර බැංකුවට මෙන්ම නියාමකවරයාට මූලික මාර්ගෝපදේශ ලෙස සැලකේ. බැංකුව සිය අවදානම් පැතිකඩ සහ අභ්‍යන්තර ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කර ප්‍රමාණනය කිරීමට අභ්‍යන්තර ආදර්ශක භාවිතා කරයි. අවදානම් අභිරුචි සීමාව ප්‍රාග්ධන මට්ටම් නිරන්තර නියාමනයට පහසුකම් සැලසීම සඳහා ප්‍රාග්ධන අවශ්‍යතාව සලකා බලමින් නියම කෙරේ. ප්‍රාග්ධන සැලසුම් කිරීම සඳහා ICAAP සම්බන්ධ වන අතර අවම නියාමන අවශ්‍යතාවන්ට අමතරව බැංකුව ප්‍රාග්ධනය පවත්වා ගැනීම සහතික කරනු ලබන්නේ සියලුම අවදානම් නිරාවරණ (ස්ථම්භ I සහ II) ආවරණය කිරීමට සහ ආතති පරීක්ෂා ස්වාරක්ෂකය ලෙසය.

### ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය

| අනුපාත (%) | නියාමන අවමය | 2025 දෙසැම්බර් 31 දිනට සත්‍ය | | 2024 දෙසැම්බර් 31 දිනට සත්‍ය | |
|---|---|---|---|---|---|
| | | බැංකුව | සමූහය | බැංකුව | සමූහය |
| CET1 plus CCB | 7 | **23.40** | **25.85** | 21.71 | 25.03 |
| Tier 1 plus CCB | 8.5 | **24.90** | **27.27** | 23.42 | 26.69 |
| මුළු ප්‍රාග්ධනය | 12.5 | **26.83** | **29.07** | 25.88 | 29.06 |

වගුව 39 ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය

ස්ථම්භ I සහ ස්ථම්භ II අවදානම් ද්විත්වය ආවරණය කිරීමට අවම අවශ්‍යතාවල අතිරික්තය තුළ බැංකුව ප්‍රාග්ධනය පවත්වා ගැනීමට සහ පීඩන අවස්ථා යටතේ ස්වාරක්ෂකයක් ලෙස පවත්වා ගැනීමට බැංකුව අදහස් කරයි. බැංකුවේ අවදානම් පැතිකඩ ආවරණය කිරීමට ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP) තුළ පුළුල්ව තක්සේරු කෙරේ.

# අවදානම් කළමනාකරණ වාර්තාව

## ආතති පරීක්ෂණය

ආතති පරීක්ෂණය ICAAP හි අත්‍යවශ්‍ය කොටසකි. බැංකුවේ ආතති පරීක්ෂණ රාමුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ආතති පරීක්ෂණ ප්‍රතිපත්තිය සහ මහ බැංකුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ මගින් පාලනය කෙරේ. බැංකුවේ ආතති පරීක්ෂණ රාමුවට ණය අවදානම, වෙළෙඳ පොතේ හා බැංකු පොතේ පොලී අනුපාත අවදානම සහ මෙහෙයුම් අවදානම, ද්‍රවශීලතා අවදානම, සංකේන්ද්‍රණ අවදානම, සහ ශේෂ වූ ණය අවදානම වැනි සියලුම ප්‍රමාණාත්මක අවදානම් මත ආතති පරීක්ෂණ ඇතුළත් වේ. ආතති පරීක්ෂණය සඳහා බරපතලකම වැඩිවීමේ මට්ටම් තුනක් සුළු, මධ්‍ය හා විශාල (හෝ අඩු, මධ්‍යම හා ඉහළ) ලෙස බැංකුව අර්ථ දක්වා ඇත.

ආතති පරීක්ෂණය, බැංකුව ක්‍රියාත්මක පරිසරය තුළ අහිතකර ආර්ථික, දෙශපාලණික, සහ භෞතික වෙනස්වීම් යටතේ වෙනස්වන අනපේක්ෂිත අවස්ථාවන්ට ඔරොත්තුදීමට බැංකුවේ හැකියාව පිළිබඳව අවබෝධයක් ලබා දේ. වෙනස්වන සීග්‍රතාවේ බලපෑම්වලින් ප්‍රාග්ධනය කෙරෙහි විභව බලපෑම මැනීමට සහ කාලිනව වැලැක්වීමේ ක්‍රියාමාර්ග ගැනීමට මූල්‍ය ආපදා හෝ ඔරොත්තු නොදීමට හේතුවන ප්‍රේරක මට්ටම හඳුනා ගැනීමට හැකියාව ඇති කරයි.

පොලී අනුපාත, විනිමය හුවමාරු අනුපාත, සහ කොටස් මිල ගණන් ඇතුළුව ආයෝජන කළඹ තුළ විශේෂිත මූල්‍ය උපකරණවල වෙනස්වන වෙළෙඳපොල සාධකවල ලාභදායිතාව කෙරෙහි බලපෑම මැනීමට සංවේදී විශ්ලේෂණ භාවිතා කෙරේ.

අහිතකර පොලී අනුපාත උච්ඡාවචනයන්, හේතුවෙන් වෙළෙඳ හා බැංකු ආයෝජන කළඹ කෙරෙහි බලපෑම තක්සේරු කිරීමට බැංකුව සංවේදීතා විශ්ලේෂණ භාවිතා කරන අතර අදාළ වාර්තා නිරන්තර පදනමක් මත වත්කම් හා වගකීම් කමිටුවට ඉදිරිපත් කෙරේ.

මෙම වාර්තා වත්කම් හා වගකීම් කළමනාකරණය හා බැංකුවේ මිලකරණ තීරණවලට අත්‍යවශ්‍ය වේ.

| රු. මිලියන | FVPL | FVOCI | Total |
|---|---|---|---|
| 2025 වසර සඳහා උපලබ්ධි නොවූ ලාභය/(අලාභය) | 19 | (337) | (318) |
| වෙළෙඳපොල M2M වටිනාකම තුළ අවදානම් කම්පන වෙනස | | | |
| සඵලතා අනුපාත 100 bps වැඩිවීම | (190) | (1,115) | (1,305) |
| සඵලතා අනුපාත 200 bps වැඩිවීම | (375) | (2,178) | (2,552) |
| සඵලතා අනුපාත 100 bps අඩුවීම | 194 | 1,172 | 1,367 |
| සඵලතා අනුපාත 200 bps අඩුවීම | 394 | 2,406 | 2,800 |

වගුව 40 සංවේදිතා විශ්ලේෂණ - වෙළෙඳ කළඹ රජයේ සුරැකුම්පත්වල පොලී අනුපාත අවදානම

| ඍණාත්මක පරතර මත 100bp අනුපාත කම්පනය | | මාස 1 දක්වා | මාස 1-3 | මාස 3-6 | මාස 6-12 | අවුරුදු 1-3 | අවුරුදු 3-5 | අවුරුදු 5ට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| තනි මට්ටම | පරතරය | (193,502) | (414,426) | (118,526) | (65,959) | 1-3 | 265,089 | 305,543 | 64,549 |
| | NII මත බලපෑම (රු. මි.) | (1,861) | (3,463) | (747) | (172) | – | – | – | (6,242) |
| ඒකාබද්ධ මට්ටම | පරතරය | (218,022) | (424,290) | (125,372) | (79,039) | 289,089 | 267,998 | 305,704 | 16,069 |
| | NII මත බලපෑම (රු. මි.) | (2,097) | (3,545) | (790) | (206) | – | – | – | (6,638) |

වගුව 41 සංවේදී විශ්ලේෂණ - බැංකු කළඹ තුළ ප්‍රතිමිලකරණ වකුය තක්සේරු කිරීම

ආතති පරීක්ෂණ ව්‍යවහාරයෙන් ලබාගත් ප්‍රතිඵල අවදානම් අභිරුචිය හා අවදානම් සීමා, සකස් කිරීම, ප්‍රාග්ධන සැලසුම්කරණය, උපායමාර්ගික ව්‍යාපාර සැලසුම් කිරීම සඳහ සහ සක්‍රීය තීරණ ගැනීමට සහයවීමට තීරණාත්මක ව්‍යාපාර මෙහෙයුම්වල අවදානම් කළමනාකරණය කිරීමට භාවිතා කෙරේ.

## අවදානම් කළමනාකරණ වාර්තාව

විවිධ ආර්ථික තත්ත්වයන්ගේ බලපෑම් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට, අධ්‍යක්ෂ මණ්ඩලයට සහ ICAAP තුළින් නියාමකවරයාට බලපෑම් වේලාසනින් සන්නිවේදනය කිරීමට සිදුකරන ලද ආතති පරීක්ෂාවන්

| අවදානම් ක්ෂේත්‍ර | අවස්ථා | විවිධ ආතති මට්ටම්වලදී ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතයට බලපෑම (%) | | |
|---|---|---|---|---|
| | | පහළ | මධ්‍යම | ඉහළ |
| **ණය අවදානම** | ණය අවදානම - පැහැරහැරීමේ විභවතාවයෙහි වැඩිවීම | | | |
| | පහළ 10% | | | |
| | මධ්‍යම 20% | (0.566) | (1.062) | (1.685) |
| | ඉහළ 30% | | | |
| **වෙළෙඳපොල අවදානම්** | පොලි අනුපාත අවදානම: වෙළෙඳපොල ඉපයීම් වැඩිවීම | | | |
| | පහළ 50 bps | | | |
| | මධ්‍යම 100 bps | (0.184) | (0.365) | (0.714) |
| | ඉහළ 200 bps | | | |
| | ස්කන්ධ මිල අවදානම: වෙළෙඳපොල මිල අඩුවීම | | | |
| | පහළ 10% | | | |
| | මධ්‍යම 20% | (0.094) | (0.141) | (0.188) |
| | ඉහළ 30% | | | |
| | විදේශ විනිමය අවදානම: හුවමාරු අනුපාත විතැන්වීම | | | |
| | පහළ10% | | | |
| | මධ්‍යම 15% | (0.014) | (0.028) | (0.043) |
| | ඉහළ 20% | | | |
| **මෙහෙයුම් අවදානම** | බාසල් II අලාභ සිදුවීම් වර්ග යටතේ වර්ගීකරණය කළ මෙහෙයුම් අලාභවල වැඩිවීම | (0.132) | (0.167) | (0.210) |

වගුව 42 විවිධ ආතති මට්ටම්වලදී ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතයට බලපෑම

### අයකිරීම සැලසුම්කරණය

දැඩි පිඩන අවස්ථාවක් තුළ, ආයතනික විශේෂ පීඩනයන්, වෙළෙඳපොල අතර පීඩනයන්ගෙන් හෝ මේ දෙකම ඒකාබද්ධවීමෙන් ඇති විය හැකි ප්‍රාග්ධනය, ද්‍රවශීලතාව සහ වෙනත් සියලු අංග සමඟ කටයුතු කරමින් කාලීන ආකාරයෙන් සිය ශක්තිය නැවත සකස් කර ගැනීමට බැංකු පද්ධතිය සූදානම් විය යුතුය.

අයකිරීම් සැලසුම් කිරීම වර්තමාන අවදානම් පැතිකඩ, අවදානම් අභිරුචිය හා දරාගැනීම සලකා බලමින් පූර්ව සංඥා දර්ශක සහ අයකිරීමේ පූරක මගින් බලපෑමට ලක්වේ. අයකිරීමේ සැලසුම දැඩි පීඩන අවස්ථාවල බැංකුවට රඳා පැවතීම සඳහා අයකිරීමේ විකල්ප රාශියක් හඳුනා ගනී.

බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත අයකිරීමේ සැලැස්මක් (RCP) ක්‍රියාවට නංවා ඇති අතර, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා අයකර ගැනීමේ සැලසුම් පිළිබඳ 2025 අංක 019 දරන බැංකු පනත් නියෝගයේ උපදෙස්වලට අනුකූලව ලේඛනගත කර ඇත.

### අවම අනාවරණ අවශ්‍යතා - ස්ථම්භ III

බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව සහ අවදානම් නිරාවරණය අගය කිරීම සඳහා වෙළෙඳපොල සහභාගිවන්නන්ට ඉඩදෙන බාසල් රාමුව III තුළ මහ බැංකුව විසින් අවම අනාවරණ අවශ්‍යතා හඳුන්වා දෙන ලදී. 2016 අංක 01 දරන බැංකු පනත් නියෝගය සහ පසුකාලීන එකතුකිරීම් පරිදි අවම අනාවරණ අවශ්‍යතා 480 සිට 489 දක්වා පිටුවල දැක්වේ.

සංයුක්තය

# මූල්‍ය වාර්තා


මූල්‍ය දින දර්ශනය
282

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව
283

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම සම්බන්ධ ප්‍රකාශය
289

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය
290

අභ්‍යන්තර පාලනය පිළිබඳ ස්වාධීන සහතික වාර්තාව
292

සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරීගේ සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්, සැලසුම් සහ කළමනාකරණ තොරතුරු පද්ධති)/ප්‍රධාන මූල්‍ය නිලධාරීගේ වගකීම් ප්‍රකාශය
293

විගණකාධිපති වාර්තාව
294

මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගතය
297

ආදායම් ප්‍රකාශය
298

විස්තීරණ ආදායම් ප්‍රකාශය
299

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
300

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය
302

මුදල් ප්‍රවාහ ප්‍රකාශය
306

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්
308

# මූල්‍ය දින දර්ශනය

## මූල්‍ය දින දර්ශනය 2025

| | |
|---|---|
| 2025 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම | 2025 මැයි 29 |
| 2025 ජූනි 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම | 2025 අගෝස්තු 29 |
| 2025 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම | 2025 නොවැම්බර් 24 |
| 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා (විගණනය කළ) ප්‍රකාශයට පත් කිරීම | 2026 මාර්තු 20 |

## යෝජිත මූල්‍ය දින දර්ශනය 2026 (දළ වශයෙන්)

| | |
|---|---|
| 2026 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම | 2026 මැයි 08 |
| 2026 ජූනි 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම | 2026 අගෝස්තු 07 |
| 2026 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම | 2026 නොවැම්බර් 06 |
| 2026 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා (විගණනය කළ) ප්‍රකාශයට පත් කිරීම | 2027 මාර්තු 05 |

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

## 1 සාමාන්‍ය

1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ එහි සංශෝධනවල අවශ්‍යතාවලට අනුකූලව, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන බැංකුවේ කටයුතු පිළිබඳ ඒකාබද්ධ වාර්ෂික වාර්තාව, බැංකුවේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මෙන්ම එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව ද ඉදිරිපත් කිරීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉතා සතුටින් යුතුව කටයුතු කරයි. 1988 අංක 30 දරන බැංකු පනත සහ එහි සංශෝධන මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපතුලාභී බැංකු සඳහා නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ 2024 අංක 05 දරන බැංකු පනත් නියෝග සහ ඉන් අනතුරුව සිදු කරන ලද සංශෝධන යටතේ අනාවරණය කළ යුතු කරුණු ද මෙම වාර්තාවට ඇතුළත් කර ඇත. මෙම වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2026 පෙබරවාරි 23 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර අනුමත කරන ලදී.

1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත ජාතික ඉතිරිකිරීමේ බැංකුව, 1988 අංක 30 දරන බැංකු පනත සහ එහි සංශෝධන ප්‍රකාරව බලපතුලාභී විශේෂිත බැංකුවක් ලෙස පිහිටුවා ඇත. මෙම බැංකුව සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා රජයට අයත් වේ. ලංකා රේටින් ඒජන්සි (Lanka Rating Agency) විසින් බැංකුව වෙත AAA (Stable) දීර්ඝකාලීන ණය ශ්‍රේණිගත කිරීමක් ලබා දී ඇති අතර, බැංකුව අඛණ්ඩව එම ඉහළම ශ්‍රේණිගත කිරීම රඳවා ගැනීමට සමත්ව සිටියි.

## 2 ව්‍යාපාර සමාලෝචනය

### 2.1 බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම්

වර්ෂය තුළ බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ ශ්‍රී ලාංකික ජනතාව අතර ඉතිරිකිරීම් ප්‍රවර්ධනය කිරීම, සිල්ලර බැංකුකරණය (Retail Banking), ආයතනික බැංකුකරණය (Corporate Banking), වෙළඳ මූල්‍යකරණය (Trade Financing) සහ ප්‍රාථමික ගනුදෙනුකාර කටයුතු (Primary Dealing) යනාදියයි. තවද, 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ එහි සංශෝධන මගින් බලය පවරන ලද පරිදි භාණ්ඩාගාර මෙහෙයුම්, අනුදේශිත බැංකුකරණය (Correspondence Banking) සහ මුදල් ප්‍රේෂණ පහසුකම්, උකස් සේවා, විදේශ විනිමය මෙහෙයුම් සහ අනෙකුත් මූල්‍ය සේවාවන් සැපයීම ද මෙහිදී සිදු කරන ලදී.

### 2.2 දැක්ම, මෙහෙවර සහ වටිනාකම්

බැංකුවේ දැක්ම (Vision), මෙහෙවර (Mission) සහ වටිනාකම් (Values) මෙම වාර්ෂික වාර්තාවේ 10 වන පිටුවේ දක්වා ඇත. බැංකුවේ දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේදී ඉහළම ආචාරධාර්මික ප්‍රමිතීන් පවත්වා ගැනීමේ අරමුණින්, සියලුම ස්ථිර සේවකයින් බැංකුවේ ආචාර ධර්ම පද්ධතියට (Code of Conduct) සහ රජයේ දිවුරුමට (Government Oath) අනුකූලව බැඳී සිටියි.

### 2.3 රජයේ ඇපකරය

බැංකුවෙහි තැන්පත් කරන ලද මුදල් සහ ඒ සඳහා වන පොලිය නැවත ගෙවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය ඇපකරු ලෙස පෙනී සිටියි.

### 2.4 බැංකුවේ පරිපාලිත ආයතන

එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් (NSB Fund Management) සමාගම සහ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව (SLSB), ජාතික ඉතිරිකිරීමේ බැංකුවට සම්පූර්ණයෙන්ම අයත් පරිපාලිත ආයතන දෙක වේ. එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගමෙහි ප්‍රධාන කාර්යය වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලය පවරන ලද ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු (Primary Dealer) ලෙස රජයේ සුරැකුම්පත් ගනුදෙනු කිරීමයි.

ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ ඉතුරුම් සහ ස්ථාවර තැන්පතු බලමුලු ගැන්වීම (Mobilising), ණය ලබා දීම, මූල්‍ය කල්බදු (Lease), කුලී පදනම මත මිලදී ගැනීමේ පහසුකම් (Hire purchase), උකස් සේවා සහ අනෙකුත් ණය පහසුකම් සැපයීම මෙන්ම, අකර්මන්‍ය වූ ප්‍රමුඛ ඉතුරුම් සහ සංවර්ධන බැංකුවේ (PSDBL) තැන්පතු වගකීම් පියවීම සහ එහි ණය ගිණුම් ප්‍රතිසංස්කරණය කිරීමයි.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමඟ ඒකාබද්ධ වීමේ ක්‍රියාවලිය හේතුවෙන්, 2021 වසරේ සිට ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව (SLSB) වෙත නව ණය ලබා දීම, තැන්පතු භාර ගැනීම, නව සේවකයින් බඳවා ගැනීම සහ ඕනෑම පාර්ශ්වයක් සමඟ නව ගිවිසුම්වලට එළඹීම තහනම් කර ඇත. SLSB සතු වත්කම්, වගකීම් සහ සේවකයින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත අනුශෝෂණය (Absorption) කර ගැනීමෙන් අනතුරුව, එම බැංකුව ඈවර (Liquidate) කරනු ඇත. මෙම ගනුදෙනුවලට අදාළ සවිස්තරාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල 24 සහ 52 වන සටහන්හි දක්වා ඇත.

### 2.5 සමූහ ව්‍යුහයෙහි වෙනස්වීම්

බැංකුවේ හෝ සමූහයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයෙහි සැලකිය යුතු වෙනස්වීම් කිසිවක් සිදුවී නොමැත.

### 2.6 වර්ෂය තුළ ව්‍යාපාරික ක්‍රියාකාරීත්වය සමාලෝචනය

2025 මූල්‍ය වර්ෂය සඳහා බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ සමස්ත සමාලෝචනය සභාපතිවරයාගේ පණිවිඩය (16 පිටුව), සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය (20 පිටුව), 80 සිට 181 දක්වා පිටුවල ඇතුළත් "කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය" (Management Discussion and Analysis) සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන (297 සිට 438 දක්වා පිටු) මගින් ඉදිරිපත් කර ඇත. මෙම වාර්තා වාර්ෂික වාර්තාවේ අත්‍යවශ්‍ය සහ වෙන් කළ නොහැකි කොටස් ලෙස සැලකේ.

### 2.7 ශාඛා ජාලය ව්‍යාප්ත කිරීම

සමාලෝචිත වර්ෂය තුළදී, බැංකුවේ ශාඛා ජාලය වෙත එක් නව ශාඛාවක් එක් වූ අතර, ඒ අනුව සමස්ත ශාඛා සංඛ්‍යාව 263 කි. මීට අමතරව, බැංකුව සතුව ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) සහ මුදල් තැන්පතු යන්ත්‍ර (CRM) 418 ක් පවතින අතර, අනෙකුත් බැංකුවල ATM යන්ත්‍ර භාවිත කිරීමේ පහසුකම ද පාරිභෝගිකයන් වෙත සලසා ඇත. මේ හරහා ගනුදෙනුකරුවන්ට සිය බැංකු කටයුතු බාධාවකින් තොරව සහ පහසුවෙන් සිදු කර ගැනීමට අවස්ථාව හිමි වේ.

### 2.8 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

ශ්‍රී ලංකා චරලත් ගණකාධිකාරී ආයතනය (CA Sri Lanka) විසින් පනවා ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs/LKASs) අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති අතර, 1988 අංක 30 දරන බැංකු පනත සහ එහි සංශෝධන මෙන්ම විශේෂිත අනාවරණයන් ඇතුළත් නියාමන අවශ්‍යතාවලට ද ඒවා අනුකූල වේ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්, සැලසුම් සහ කළමනාකරණ තොරතුරු පද්ධති) /ප්‍රධාන මූල්‍ය නිලධාරී විසින් නිසි පරිදි සහතික කරන ලද සහ බැංකුවේ සභාපතිවරයා ඇතුළු අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු විසින් අනුමත කර අත්සන් තබන ලද, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන 298 සිට 301 දක්වා පිටුවල දක්වා ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන බැංකුවේ වාර්ෂික වාර්තාවේ අත්‍යවශ්‍ය සහ වෙන් කළ නොහැකි කොටසකි.

#### 2.8.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වර්ෂය තුළ සිදු වූ වෙනස්වීම්

බැංකුව සහ සමූහය සිය මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs/LKASs) අනුකූලව පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම වාර්තාවේ 308 සිට 323 දක්වා පිටුවල දක්වා ඇත. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී බැංකුවේ හෝ සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි කිසිදු වෙනසක් සිදු වී නොමැත.

මූල්‍ය දින දර්ශනය

### 2.9 මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

2025 දෙසැම්බර් 31 දිනට බැංකුවේ පැවති මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන ලාභය පිළිබඳ නිවැරදි හා සාධාරණ දර්ශනයක් (True and fair view) පිළිබිඹු වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ේ වගකීම දරනු ලබයි. මෙම වාර්තාවේ 297 සිට 438 දක්වා පිටුවල දැක්වෙන මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRSs/LKASs), 1988 අංක 30 දරන බැංකු පනත සහ එහි සංශෝධන මෙන්ම 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ එහි සංශෝධනවල අවශ්‍යතාවලට අනුකූලව පිළියෙල කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතයයි. අනුබද්ධ සමාගම්වල මූල්‍ය ප්‍රකාශන ද 2007 අංක 07 දරන සමාගම් පනත සහ එහි සංශෝධන මගින් පනවා ඇති අවශ්‍යතාවලට අනුකූලව පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් සතු වගකීම් පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් මෙම වාර්ෂික වාර්තාවේ 289 වන පිටුවේ ඇති 'මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශයෙහි' අන්තර්ගත වන අතර, එය අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවේ අත්‍යවශ්‍ය සහ වෙන් කළ නොහැකි කොටසකි.

### 2.10 විගණක වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ විගණකවරයා ලෙස කටයුතු කරනු ලබන්නේ විගණකාධිපතිවරයායි. විගණකාධිපතිවරයා විසින් 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනය සිදු කරන ලදී. තවද, එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම සහ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව සම්බන්ධයෙන් ද විගණකාධිපතිවරයා විසින් විගණන කටයුතු සිදු කර ඇත. 2025 වර්ෂය පුරාවට බැංකුව සඳහා අඛණ්ඩ විගණනයක් (Continuous audit) ක්‍රියාත්මක කරන ලදී. එම වාර්තා මගින් හඳුනාගත් ගැටළු, කඩිනම් පියවර ගැනීම සඳහා කළමනාකාරිත්වය වෙත නිතිපතා ඉදිරිපත් කෙරිණි. මූල්‍ය වාර්තාකරණයේ නිරවද්‍යතාවය තහවුරු කිරීමෙන් අනතුරුව, එම මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය දත්ත සහ තොරතුරු ද සමඟ පරීක්ෂණ කටයුතු සඳහා විගණකාධිපතිවරයා වෙත ලබා දෙන ලදී. බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ මතය මෙම වාර්ෂික වාර්තාවේ 294 වන පිටුවේ දක්වා ඇත.

## 3 අනාගත සංවර්ධනයන්

බැංකුවේ අනාගත සංවර්ධනයන් පිළිබඳ සමාලෝචනයක්, 2025 ඒකාබද්ධ වාර්ෂික වාර්තාවේ සභාපතිවරයාගේ පණිවිඩය (16 පිටුව), සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය (20 පිටුව) සහ 80 සිට 181 දක්වා පිටුවල ඇතුළත් 'කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය' යන කොටස්වල දක්වා ඇත.

## 4 දළ ආදායම

2025 වර්ෂය සඳහා බැංකුවේ දළ ආදායම රුපියල් මිලියන 202,761ක් වූ අතර (2024 - රුපියල් මිලියන 207,637), සමූහයේ ආදායම රුපියල් මිලියන 207,908ක් (2024 - රුපියල් මිලියන 213,417) විය. බැංකුවේ සහ සමූහයේ දළ ආදායම පිළිබඳ විශ්ලේෂණය මූල්‍ය ප්‍රකාශනවල 3 වන සටහනෙහි දක්වා ඇත. බැංකුවේ දළ ආදායම, සමූහයේ මුළු දළ ආදායමෙන් 97.5%ක් (2024 - 97.3%) නියෝජනය කරයි. බැංකුවේ සහ සමූහයේ ප්‍රධාන ආදායම් මාර්ගය වන්නේ පොලී ආදායම වන අතර, එය දළ ආදායමෙන් පිළිවෙළින් 97.5%ක් (2024 - 98.1%) සහ 97.4%ක් (2024 - 97.8%) ලෙස සමන්විත වේ.

## 5 ලාභාංශ සහ සංචිත

### 5.1 ලාභය සහ විසර්ජනය

බැංකුවේ සහ සමූහයේ ආදායම් බදු වලට පෙර ලාභය (Profit before income Tax) පිළිවෙළින් රුපියල් මිලියන 44,493ක් සහ රුපියල් මිලියන 45,945ක් විය (2024 - රුපියල් මිලියන 26,268 සහ රුපියල් මිලියන 28,359). බැංකුවේ සහ සමූහයේ බදු පසු ලාභය (Profit after Tax) පිළිවෙළින් රුපියල් මිලියන 27,321ක් සහ රුපියල් මිලියන 28,163ක් ලෙස වාර්තා විය (2024 - රුපියල් මිලියන 16,122 සහ රුපියල් මිලියන 17,497). බැංකුවට සහ සමූහයට අදාළ ලාභය පිළිබඳ විස්තර පහත වගුවේ දැක්වේ.

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| | 2025 රුපියල් මිලියන | 2024 රුපියල් මිලියන | 2025 රුපියල් මිලියන | 2024 රුපියල් මිලියන |
| සියලුම වියදම් ගෙවීමෙන් පසු සහ ක්ෂයවීම්, විය හැකි ණය හානි සහ අහඹු සිදුවීම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමෙන් පසු, එකතු කළ අගය මත බදු (VAT) සහ ආදායම් බදු වලට පෙර වර්ෂයේ ලාභය | 57,387 | 35,615 | 59,206 | 38,248 |
| මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද (VAT) | 11,321 | 8,208 | 11,645 | 8,683 |
| මූල්‍ය සේවා මත සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) | 1,572 | 1,140 | 1,617 | 1,206 |
| ආදායම් බදු වියදම් | 17,172 | 10,145 | 17,782 | 10,862 |
| වර්ෂය සඳහා ලාභය | 27,321 | 16,122 | 28,163 | 17,497 |
| වර්ෂය සඳහා අනෙකුත් විස්තීර්ණ ආදායම (බදු ශුද්ධ) | (1,247) | 1,184 | (1,264) | 1,388 |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | 26,074 | 17,307 | 26,898 | 18,885 |
| **විසර්ජනයන්:** | | | | |
| ව්‍යවස්ථාපිත සංචිතයට මාරු කිරීම | (546) | (326) | (554) | (347) |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය/ලාභාංශ | (6,088) | - | (6,088) | - |
| අයිතිකරුවන් විසින් ඉල්ලා නොමැති තැන්පතු සංචිතයට මාරු කිරීම | (223) | (162) | (223) | (162) |
| සංචිත වෙත මාරු කිරීම | (19,217) | (16,819) | (20,033) | (18,376) |

# මූල්‍ය දින දර්ශනය

## 5.2 බදුකරණය සඳහා වන ප්‍රතිපාදන

2022 දෙසැම්බර් 19 දින සභතික කරන ලද, 2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතට අනුව ආදායම් බදු සඳහා වන සම්මත අනුපාතය 30% කි.

2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ විධිවිධාන ප්‍රකාරව, 2022 ඔක්තෝබර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, මූල්‍ය සේවාවලට අදාළ එකතු කළ අගය මත 2.5% ක අනුපාතයකින් සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ගෙවීමට බැංකුව බැඳී සිටියි. එමෙන්ම, බැංකුවේ සහ සමූහයේ මෙහෙයුම් කටයුතු මූල්‍ය සේවා මත 18% ක අනුපාතයකින් එකතු කළ අගය මත බද්දට යටත් වේ.

බැංකුව සහ සමූහය විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය (LKAS) 12 - ආදායම් බදු යටතේ වගකීම් ක්‍රමය (Liability method) අනුගමනය කරමින් සියලුම හඳුනාගත් තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු (Deferred tax) ප්‍රතිපාදන සලසා ඇත. ආදායම් බදු වියදම් සහ විලම්බිත බදුකරණය පිළිබඳ තොරතුරු පිළිවෙළින් 333 සහ 364 පිටුවල 13 සහ 30 යන සටහන්වල දක්වා ඇත.

## 5.3 ලාභාංශ, බදු සහ බදු අයකිරීම්/ජාතික දායකත්වය

බැංකුව සහ සමූහය විසින් 2025 වර්ෂය තුළ රජය වෙත බදු සහ විවිධ බදු අයකිරීම් (Levies) මගින් පිළිවෙළින් රුපියල් මිලියන 36,427ක් සහ රුපියල් මිලියන 37,405ක දායකත්වයක් ලබා දී ඇත (2024 - පිළිවෙළින් රුපියල් මිලියන 19,655ක් සහ රුපියල් මිලියන 20,914ක්). එම දායකත්වය පහත සඳහන් අංගයන්ගෙන් සමන්විත විය.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | 2025 රුපියල් මිලියන | 2024 රුපියල් මිලියන | 2025 රුපියල් මිලියන | 2024 රුපියල් මිලියන |
| ආදායම් බදු | 17,172 | 10,145 | 17,782 | 10,862 |
| එකතු කළ අගය මත බදු සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 12,894 | 9,347 | 13,262 | 9,889 |
| ඒකාබද්ධ අරමුදලට ලබාදුන් දායකත්වය | 6,088 | – | 6,088 | – |
| ජාතික රක්ෂණ භාර අරමුදලට (NITF) ලබාදුන් දායකත්වය | 273 | 163 | 273 | 163 |
| **ජාතිය වෙත ලබාදුන් මුළු දායකත්වය** | 36,427 | 19,655 | 37,405 | 20,914 |

## 5.4 සංචිත

2025 දෙසැම්බර් 31 දිනට බැංකුවේ සහ සමූහයේ මුළු සංචිත පිළිවෙළින් රුපියල් මිලියන 109,651ක් සහ රුපියල් මිලියන 118,468ක් ලෙස වාර්තා විය (2024 - පිළිවෙළින් රුපියල් මිලියන 89,443ක් සහ රුපියල් මිලියන 97,435ක්). සමූහයේ සංචිත පහත සඳහන් අංගයන්ගෙන් සමන්විත වේ.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | 2025 රුපියල් මිලියන | 2024 රුපියල් මිලියන | 2025 රුපියල් මිලියන | 2024 රුපියල් මිලියන |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 6,241 | 5,695 | 6,365 | 5,811 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 7,943 | 7,946 | 8,640 | 8,643 |
| රඳවාගත් ඉපයීම් | 46,546 | 28,462 | 52,797 | 33,772 |
| අනෙකුත් සංචිත | 48,921 | 47,339 | 50,666 | 49,209 |
| **මුළු සංචිත** | 109,651 | 89,443 | 118,468 | 97,435 |

සංචිතවල වෙනස්කම් පිළිබඳ තොරතුරු 302 සිට 305 දක්වා පිටුවල ඇති කොටස්වල වෙනස්කම් ප්‍රකාශයේ දක්වා ඇත.

## 6 තැපැල්පතිවරයා (PMG) වෙත ගෙවන සේවා ගාස්තු

2025 වර්ෂය සඳහා තැපැල්පතිවරයා වෙත ගෙවිය යුතු රුපියල් මිලියන 335ක සේවා ගාස්තු, 2024 වර්ෂයේ අනුගමනය කරන ලද පදනම මතම ප්‍රතිපාදනය කර ඇත.

## 7 විශ්‍රාම ප්‍රතිලාභ සහ බැඳීම්

බැංකුව විසින් "සේවක විශ්‍රාම වැටුප් අරමුදල I" සහ "සේවක විශ්‍රාම වැටුප් අරමුදල II" ලෙස විශ්‍රාම වැටුප් අරමුදල් දෙකක් පවත්වාගෙන යනු ලබයි. මීට අමතරව, බැංකුව විසින් වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුප් අරමුදලක් මෙන්ම සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් පසු ක්‍රියාත්මක වන වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමයක් ද (Post-Employment Medical Scheme) පවත්වාගෙන යනු ලබයි. මේ පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්හි 372 සිට 381 දක්වා පිටුවල "විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්" පිළිබඳ 38 වන සටහනෙහි දක්වා ඇත.

## 8 දේපළ, පිරියත හා උපකරණ සහ ප්‍රාග්ධන වියදම්

වර්ෂය තුළදී දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් (කාරක ප්‍රාග්ධනයද ඇතුළුව) අත්පත් කර ගැනීම සඳහා බැංකුව විසින් දරන ලද මුළු ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 2,311ක් (2024 - රුපියල් මිලියන 3,044) වූ අතර, සමූහයේ එම වියදම රුපියල් මිලියන 2,321ක් (2024 - රුපියල් මිලියන 3,054) විය. මේ පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ 358 සිට 359 දක්වා සහ 362 යන පිටුවල මූල්‍ය ප්‍රකාශනවලට අදාළ 26.(අ), 26.(ආ) සහ 29 යන සටහන්හි දක්වා ඇත.

## 9 දේපළ, පිරියත හා උපකරණවල අගය

2025 වර්ෂ අවසානය වන විට බැංකුවේ සහ සමූහයේ දේපළ, පිරියත හා උපකරණවල මුළු ශුද්ධ පොත් අගය (Net Book value) පිළිවෙළින් රුපියල් මිලියන 17,312ක් සහ රුපියල් මිලියන 18,449ක් විය (2024 - බැංකුව රුපියල් මිලියන 17,416ක් සහ සමූහය රුපියල් මිලියන 18,556ක්). මේ පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්හි පහත පරිදි දක්වා ඇත:

- මූල්‍ය ප්‍රකාශනවල 26 වන සටහන: දේපළ, පිරියත හා උපකරණ (357 වන පිටුව).

මූල්‍ය දින දර්ශනය

## 10 ප්‍රකාශිත ප්‍රාග්ධනය සහ කොටස් හිමිකාරිත්වය

### 10.1 ප්‍රකාශිත ප්‍රාග්ධනය

බැංකුවේ බලයලත් කොටස් ප්‍රාග්ධනය රුපියල් බිලියන 10ක් වන අතර, එය රුපියල් 10 බැගින් වූ සාමාන්‍ය කොටස් බිලියන එකකින් සමන්විත වේ. 2025 දෙසැම්බර් 31 දිනට බැංකුවේ නිකුත් කරන ලද කොටස් ප්‍රාග්ධනය රුපියල් බිලියන 9.4ක් ලෙස වාර්තා විය. මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා සිය නිල ධූරය අනුව (Official capacity), නිකුත් කරන ලද සමස්ත කොටස් ප්‍රාග්ධනයේ හිමිකාරිත්වය දරනු ලබයි. මේ පිළිබඳ විස්තර 383 වන පිටුවේ ඇති "ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය" පිළිබඳ 43 වන සටහනෙහි සහ 385 වන පිටුවේ ඇති "අයිතිකරුවන් විසින් ඉල්ලා නොමැති තැන්පතු සංචිතය' පිළිබඳ 46.1 සටහනෙහි දක්වා ඇත."

### 10.2 කොටස් හිමිකාරිත්වය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ එකම කොටස් හිමිකරු වන්නේ ශ්‍රී ලංකා රජයයි.

## 11 නිත්‍ය ණයකර/බැඳුම්කර නිකුතුව

2025 දෙසැම්බර් 31 දිනට බැංකුවේ පියවීමට ඇති යටත් වගකීම් (Subordinated liabilities), අතිරේක පෙළ I ප්‍රාග්ධනය (Additional Tier I Capµtal) සඳහා සුදුසුකම් ලබන පරිදි 2020 ඔක්තෝබර් 27 දින පෞද්ගලික පදනමින් (Private Placement) නිකුත් කරන ලද, රුපියල් 100 බැගින් වූ, ලැයිස්තුගත නොකළ, ශ්‍රේණිගත කළ, ඇප රහිත, යටත්, නිත්‍ය ණයකර (Perpetual Debentures) රුපියල් බිලියන 5 කින් සමන්විත වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශිත දිනට පියවීමට ඇති ණයකර පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල 370 වන පිටුවේ යටත් වගකීම් පිළිබඳ 37.1 සටහනෙහි දක්වා ඇත.

## 12 ප්‍රමුඛ ණයකර නිකුතුව

2025 දෙසැම්බර් 31 දිනට බැංකුවේ පියවීමට ඇති ණයකර, 2021 සැප්තැම්බර් 24 දින පෞද්ගලික පදනමින් (Private Placement) නිකුත් කරන ලද, රුපියල් 100 බැගින් වූ, ලැයිස්තුගත නොකළ, ශ්‍රේණිගත කළ, විමෝච්‍ය (Redeemable), ප්‍රමුඛ ණයකර (Senior Debentures) රුපියල් බිලියන 11.5 කින් සමන්විත වේ. ප්‍රමුඛ ණයකර පිළිබඳ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ 371 වන පිටුවේ 37.2 සටහනෙහි දක්වා ඇත.

## 13 කොටස් පිළිබඳ තොරතුරු

2025 වර්ෂය සඳහා බැංකුවේ සහ සමූහයේ මූලික කොටසක ඉපැයීම (Basic earnings per share) සහ කොටසක ශුද්ධ වත්කම් අගය (Net assets value per share) පහත දැක්වේ:

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | 2025 රුපියල් | 2024 රුපියල් | 2025 රුපියල් | 2024 රුපියල් |
| මූලික කොටසක ඉපැයීම | 29.06 | 17.15 | 29.96 | 18.61 |
| කොටසක ශුද්ධ වත්කම් අගය | 126.65 | 105.15 | 136.03 | 113.65 |

## 14 පරිත්‍යාග

2025 වර්ෂය තුළ බැංකුව විසින් කිසිදු පරිත්‍යාගයක් සිදු කර නොමැත.

## 15 අධ්‍යක්ෂ මණ්ඩලය

### 15.1 2025 වර්ෂය තුළ ධූර දැරූ අධ්‍යක්ෂවරුන් පිළිබඳ තොරතුරු

1995 අංක 28 දරන පනතින් සංශෝධිත 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව, 2025 මූල්‍ය වර්ෂය තුළ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සභාපතිවරයා ඇතුළුව අධ්‍යක්ෂවරුන් හත් දෙනෙකුගෙන් සමන්විත විය. මීට මුදල් අමාත්‍යාංශය සහ තැපැල්පතිවරයා නියෝජනය කරනු ලබන නිල බලයෙන් පත්වන (Ex Officio) සාමාජිකයින් දෙදෙනෙකු ඇතුළත් වේ. සභාපතිවරයා සහ අනෙකුත් අධ්‍යක්ෂවරුන් හතර දෙනා මුදල් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබයි. ස්වාධීන අධ්‍යක්ෂවරුන් (independent directors) දැනට පත් කරනු ලබන්නේ මුදල් අමාත්‍යාංශය විසින් පිහිටුවන ලද ස්වාධීන වරණ කමිටුවක් මගිනි. වර්ෂය තුළ ධූර දැරූ අධ්‍යක්ෂවරුන් පිළිබඳ විස්තර පහත දැක්වෙන අතර ඔවුන්ගේ සංක්ෂිප්ත ජීව දත්ත තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ 220 සිට 224 දක්වා පිටුවල ඇතුළත් වේ.

| නම | ධූර කාලය | සාමාජිකත්ව තත්ත්වය |
|---|---|---|
| ආචාර්ය හර්ෂ කබ්රාල් (ජනාධිපති නීතිඥ) – සභාපති | 2023 මැයි 02 සිට මේ දක්වා | විධායක නොවන/අධ්‍යක්ෂ ස්වාධීන නොවන අධ්‍යක්ෂ |
| ජූඩ් නිලූක්ෂාන් මහතා – නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ | 2022 පෙබරවාරි 28 සිට මේ දක්වා | විධායක නොවන/අධ්‍යක්ෂ ස්වාධීන නොවන අධ්‍යක්ෂ |
| එස් ආර් ඩබ්ලිව් එම් රුවන් පාලිත සත්කුමාර මහතා – නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ | 2023 මාර්තු 27 සිට මේ දක්වා | විධායක නොවන/අධ්‍යක්ෂ ස්වාධීන නොවන අධ්‍යක්ෂ |
| දුෂ්‍යන්ත බස්නායක මහතා – අධ්‍යක්ෂ | 2023 මාර්තු 31 සිට මේ දක්වා | විධායක නොවන/අධ්‍යක්ෂ ස්වාධීන නොවන අධ්‍යක්ෂ |
| අශේන් ජයසේකර මහතා – අධ්‍යක්ෂ | 2024 ජනවාරි 09 සිට මේ දක්වා | විධායක නොවන/අධ්‍යක්ෂ ස්වාධීන නොවන අධ්‍යක්ෂ |
| ශාලිනි පීරිස් මහත්මිය – අධ්‍යක්ෂ | 2025 සැප්තැම්බර් 08 සිට 2025 නොවැම්බර් 24 දක්වා | විධායක නොවන අධ්‍යක්ෂ/ ස්වාධීන අධ්‍යක්ෂ |
| කුසල් ජයවර්ධන මහතා – අධ්‍යක්ෂ | 2025 ඔක්තෝබර් 08 සිට 2025 නොවැම්බර් 21 දක්වා | විධායක නොවන අධ්‍යක්ෂ/ ස්වාධීන අධ්‍යක්ෂ |
| රනිල් ගුණතිලක මහතා – අධ්‍යක්ෂ | 2025 ඔක්තෝබර් 23 සිට මේ දක්වා | විධායක නොවන අධ්‍යක්ෂ/ ස්වාධීන අධ්‍යක්ෂ |
| සුපුල් විජේසිංහ මහතා – ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ (2025 නොවැම්බර් 20 සිට ක්‍රියාත්මක වන පරිදි) | 2025 නොවැම්බර් 18 සිට මේ දක්වා | විධායක නොවන අධ්‍යක්ෂ/ ස්වාධීන අධ්‍යක්ෂ |

මූල්‍ය දින දර්ශනය

### බැංකුවේ අනුබද්ධිත සමාගම්වල අධ්‍යක්ෂවරුන්ගේ ලැයිස්තුව

**එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නම් පහත දැක්වේ:**

- දුෂ්‍යන්ත බස්නායක මහතා - (සභාපති)
- ශෂී කණ්ඩම්බි මහත්මිය (2026 ජනවාරි 09 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම ලැබිය)
- ඕෂධ රොද්‍රිගු මහතා
- කේ. රවීන්ද්‍රන් මහතා
- කේ. පී. ප්‍රියංකර හේවා මිහිරිපැන්න මහතා

**ශ්‍රී ලංකා සේවිංග්ස් බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ නම් පහත දැක්වේ:**

- දුෂ්‍යන්ත බස්නායක මහතා - (සභාපති)
- හේමන්ත ගමගේ මහතා
- ප්‍රසාද් ඉඹුලාගොඩ මහතා
- ජනක අරුණශාන්ත මහතා
- සමදරා ජයරත්න මහත්මිය

## 15.2 අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු

අධ්‍යක්ෂ මණ්ඩලය සමස්ත වගකීම සහ වගවීම දරන අතරම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද "ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකු සඳහා වන ආයතනික පාලනය" පිළිබඳ 2024 අංක 05 දරන බැංකු පනත් විධිවිධානවලට අනුකූලව අනිවාර්ය මණ්ඩල අනුකමිටු හතරක් පත් කර ඇත. එනම්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවයි. (බැංකුව සඳහා වන අදාළ පාර්ශ්වයන්ගේ ගනුදෙනු සමාලෝචන කමිටුවේ ඵලදායී දිනය 2027 ජනවාරි 01 වනු ඇත).

අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරයන් ඉටු කිරීමට සහාය වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුව නමින් ස්වේච්ඡා මණ්ඩල අනුකමිටුවක් ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කර ඇත. මෙම මණ්ඩල අනුකමිටුවල බලතල සහ කාර්යයන් (Terms of Reference), නියාමකයා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිර්දේශයන්ටත්, ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතට මෙන්ම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ස්වේච්ඡා කේතයන්ටත් අනුකූල වේ.

2025 දෙසැම්බර් 31 දිනට මණ්ඩල අනුකමිටුවල සංයුතිය සහ අධ්‍යක්ෂවරුන් රැස්වීම්වලට සහභාගී වීමේ විස්තර 237 වැනි පිටුවේ දක්වා ඇති අතර, මෙම අනුකමිටුවල වාර්තා 245 සිට 253 දක්වා පිටුවල ඇතුළත් කර ඇත.

## 15.3 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ මණ්ඩල අනුකමිටු රැස්වීම්වලින් සමන්විත වන්නා වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ විස්තර සහ ඒවාට සහභාගී වීම පිළිබඳ තොරතුරු, වාර්ෂික වාර්තාවේ 237 වැනි පිටුවේ ඇති ආයතනික පාලන වාර්තාවෙහි දක්වා ඇත.

## 15.4 කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ උනන්දුව/ සම්බන්ධතාව

අධ්‍යක්ෂවරුන් බැංකුව සමඟ ඇති කරගෙන තිබෙන කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් පවතින සෘජු සහ වක්‍ර සම්බන්ධතා (interests) මූල්‍ය ප්‍රකාශනවලට අදාළව 388 වැනි පිටුවේ ඇති 49.2.2 අංකිත සටහනෙහි සඳහන් වේ. මෙම සම්බන්ධතා/උනන්දුව පිළිබඳ තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී ප්‍රකාශයට පත් කර ඇත. බැංකුව සමඟ පවතින වෙනත් කොන්ත්‍රාත්තු හෝ යෝජිත කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ට කිසිදු සෘජු හෝ වක්‍ර සම්බන්ධතාවක් නොමැත.

## 15.5 බැංකුව විසින් නිකුත් කරන ලද ණයකර සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ සම්බන්ධතාව

කිසිදු අධ්‍යක්ෂවරයෙකුගේ නාමය යටතේ ලියාපදිංචි කරන ලද ණයකර (Debentures) නොපැවතිණි.

## 15.6 අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික සහ අනෙකුත් ප්‍රතිලාභ

2025 මූල්‍ය වර්ෂය සඳහා බැංකුව සහ සමූහය වෙනුවෙන් අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකයන් (Emoluments) සහ අනෙකුත් ප්‍රතිලාභ පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල 388 වැනි පිටුවේ ඇති 49.2.1 අංකිත සටහනෙහි දක්වා ඇත.

## 15.7 අදාළ පාර්ශ්වයන් අතර සිදු වූ ගනුදෙනු

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අනුගමනය කරනු ලබන අංක 24 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය (LKAS 24) අදාළ පාර්ශ්වයන් අනාවරණය කිරීම් (Related Party Disclosures) යටතේ අදාළ පාර්ශ්වයන් අතර සිදු වූ ගනුදෙනු ලෙස වර්ග කළ හැකි යම් ගනුදෙනුවක් පවතින්නේ නම්, අධ්‍යක්ෂවරුන් විසින් ඒවා ද අනාවරණය කර ඇත. අධ්‍යක්ෂවරුන් විසින් එලෙස අනාවරණය කරන ලද ගනුදෙනු, අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ කොටසක් ලෙස සලකනු ලබන මූල්‍ය ප්‍රකාශනවල 388 වැනි පිටුවේ ඇති 49 වැනි සටහනෙහි දක්වා ඇත.

## 16 පාරිසරික ආරක්ෂණය

සමූහය සහ බැංකුව ඔවුන් දන්නා උපරිම දැනුම පරිදි, පරිසරයට අහිතකර කිසිදු ක්‍රියාවක නිරත වී නොමැත. පරිසරය සුරැකීම සඳහා ගෙන ඇති විශේෂිත ක්‍රියාමාර්ග 172 සිට 181 දක්වා පිටුවල දක්වා ඇත.

## 17 ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන් දන්නා උපරිම දැනුම සහ විශ්වාසය පරිදි, රජයට සහ අනෙකුත් නියාමන ආයතනවලට ගෙවිය යුතු මෙන්ම සේවකයින්ට අදාළ වන සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් (Statutory Payments) නියමිත වේලාවට සිදු කර ඇති බවට ඔවුන් සෑහීමකට පත්වේ.

## 18 වාර්තාකරණ දිනෙන් පසු සිදු වූ සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවල 394 වැනි පිටුවේ ඇති 52 අංකිත සටහනෙහි අනාවරණය කර ඇති කරුණුවලට අමතරව, වාර්තාකරණ දිනෙන් (Reporting date) පසුව ගිණුම්වල ගැලපීම් සිදු කිරීමට හෝ අනාවරණය කිරීමට අවශ්‍ය වන කිසිදු තත්ත්වයක් පැන නැඟී නොමැත.

## 19 අඛණ්ඩ පැවැත්ම

බැංකුවේ මෙහෙයුම් කටයුතු අනාගතයේදී අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් සම්පත් පවතින බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර තහවුරු කර ඇත. තවද, බැංකුවේ අඛණ්ඩ පැවැත්ම (Going concern) පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි මෙහෙයුම් සීමා කිරීම් හෝ සැලසුම් වැනි කිසිදු වැදගත් අවිනිශ්චිතතාවක් පිළිබඳව අධ්‍යක්ෂවරුන් දැනුවත් වී නොමැත.

## 20 අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනයන් සහ කළමනාකරණ තොරතුරු පද්ධති

### 20.1 අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි. බැංකුව මුහුණ දෙන අවදානම් හඳුනා ගැනීම, ඇගයීම සහ කළමනාකරණය කිරීම සඳහා අඛණ්ඩ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වේ. අවදානම් අවම කිරීම සඳහා බැංකුව විසින් ගෙන ඇති විශේෂිත ක්‍රියාමාර්ග පිළිබඳව මෙම වාර්තාවේ 254 සිට 280 දක්වා පිටුවල ඇති අවදානම් කළමනාකරණ වාර්තාවෙහි සහ 251 සිට 252 දක්වා පිටුවල ඇති මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ වාර්තාවෙහි සවිස්තරාත්මකව දක්වා ඇත.

මූල්‍ය දින දර්ශනය

### 20.2 අභ්‍යන්තර පාලනයන් සහ කළමනාකරණ තොරතුරු පද්ධති

අධ්‍යක්ෂ මණ්ඩලය, මණ්ඩල විගණන කමිටුව හරහා බැංකුව තුළ ඵලදායී හා විස්තීර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් සහ කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කර ක්‍රියාත්මක කරන බව සහතික කර ඇත. බැංකුව මුහුණ දෙන අවදානම් අවම කිරීම සඳහාත්, ප්‍රමාණාත්මක වැරදි ප්‍රකාශයන් (Material misstatements) හෝ පාඩු සිදුනොවන බවට සාධාරණ සහතිකයක් ලබා දීම සඳහාත් අභ්‍යන්තර පාලන පද්ධති ප්‍රතිනිර්මාණය කර ඇත. මණ්ඩල විගණන කමිටු වාර්තාව මෙම වාර්තාවේ 245 සිට 247 දක්වා පිටුවල දක්වා ඇත.

බලපත්‍රලාභී බැංකු සඳහා වන ආයතනික පාලනය පිළිබඳ 2024 අංක 05 දරන බැංකු පනත් විධිවිධානවල 9.2 (ආ) විධිවිධානයට අනුකූලව, බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ ප්‍රකාශයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කර ඇති අතර එය මෙම වාර්තාවේ 290 සිට 291 දක්වා පිටුවල දක්වා ඇත. මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය පිළිබඳ සාධාරණ සහතිකයක් ලබා දෙන අයුරින් මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සැලසුම් කර ඇති බවත්, බාහිර වාර්තාකරණ කටයුතු සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම අදාළ ගිණුම්කරණ මූලධර්ම සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව සිදු කර ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇත.

අධ්‍යක්ෂවරුන්ගේ අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගෙන් ලබාගත් සහතික කිරීමේ වාර්තාව (Assurance Report) මෙම වාර්තාවේ 292 පිටුවේ දක්වා ඇත.

## 21 විගණකවරුන් පත් කිරීම සහ ඔවුන්ගේ පාරිශ්‍රමිකය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ විගණකවරයා වන්නේ විගණකාධිපතිවරයාය. ගිණුම්කරණ කාලසීමාව තුළ විගණන ගාස්තු සහ ඉටු කරන ලද අනෙකුත් සේවාවන් වෙනුවෙන් දරන ලද වියදම්, මූල්‍ය ප්‍රකාශනවල 333 වැනි පිටුවේ ඇති 12 වැනි සටහනෙහි දක්වා ඇත.

## 22 නියාමන අධීක්ෂණය

නියාමන අධීක්ෂණ ආයතනය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධානයන්ට අනුකූල වීම තහවුරු කර ගැනීම සඳහා බැංකුවේ වාර්තා සහ කටයුතු පිළිබඳව වරින් වර පරීක්ෂාවන් සිදු කරන ලදී. එසේම, පාර්ශ්වකරුවන්ගේ, විශේෂයෙන්ම තැන්පතුකරුවන්ගේ අවශ්‍යතාවන් සුරක්ෂිත වන පරිදි අවශ්‍ය මූල්‍ය දර්ශක නියමිත මට්ටමින් පවත්වාගෙන යන්නේද යන්නත් මෙහිදී තීරණය කරනු ලබයි.

## 23 ආයතනික පාලනය

බැංකුව කළමනාකරණය කිරීමේදී, හොඳම ආයතනික පාලන පිළිවෙත් සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම කෙරෙහි අධ්‍යක්ෂවරුන් විශේෂ අවධානයක් යොමු කර ඇත. ඒ අනුව, අධ්‍යක්ෂවරුන් විසින් මෙලෙස ප්‍රකාශ කරනු ලබයි:

(අ) බැංකුවේ ව්‍යාපාරික කටයුතු සිදු කිරීමේදී අදාළ වන නීති සහ රෙගුලාසිවලට අනුකූල වී ඇති අතර, අදාළ නීති සහ රෙගුලාසි උල්ලංඝනය වන කිසිදු ක්‍රියාවක නිරත වී නොමැත.

(ආ)බැංකුව සම්බන්ධ වන කොන්ත්‍රාත්තු වලදී පවතින සියලුම ප්‍රමාණාත්මක සම්බන්ධතා (Material interest) ඔවුන් විසින් ප්‍රකාශ කර ඇති අතර, එවැනි ප්‍රමාණාත්මක සම්බන්ධතාවක් පවතින ඕනෑම කරුණකදී එයින් ඉවත් වී කටයුතු කර ඇත.

(ඇ)ව්‍යාපාරය අඛණ්ඩව පවත්වාගෙන යන්නක් (Going concern) වන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපායමාර්ගික ව්‍යාපාර සැලැස්ම (Strategic Business Plan) සමාලෝචනය කර ඇත. ඒ අනුව, පෙනී යන අනාගතය තුළ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඉදිරි ගමන වේගවත් කිරීම සඳහා ප්‍රමාණවත් සම්පත් පවතින බවට මණ්ඩලය සෑහීමකට පත්වේ. එබැවින්, බැංකුවේ සහ එහි අනුබද්ධිත සමාගම් වල මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ අඛණ්ඩ පැවැත්මේ උපකල්පනය මත පදනම්වය.

(ඈ)අදාළ පාර්ශ්වයන්ගේ ගනුදෙනු පිළිබඳ තොරතුරු බැංකුව විසින් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර ඇත.

(ඉ) මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා පාලනයන් (Compliance controls) සහ අවදානම් කළමනාකරණය ආවරණය වන පරිදි අභ්‍යන්තර පාලනයන් පිළිබඳ සමාලෝචනයක් බැංකුව විසින් සිදු කර ඇති අතර, ඒවායේ ඵලදායීතාව සහ අනුකූලතාව පිළිබඳව සාධාරණ සහතිකයක් ලබාගෙන ඇත.

## 24 තිරසාරත්වය

බැංකුව සිය ව්‍යාපාරික උපායමාර්ග සකස් කිරීමේදී තිරසාරත්ව අංශ කෙරෙහි අවධානය යොමු කර ඇති අතර, ඒ පිළිබඳ විස්තර GRI දර්ශකය (GRI index) යටතේ 491 සිට 493 දක්වා පිටුවල අනාවරණය කර ඇත. ඒ හා සමගාමීව, තිරසාරත්වය සහ දේශගුණය ආශ්‍රිත මූල්‍ය අවදානම් සහ අවස්ථාවන් හඳුනා ගැනීමට, ඇගයීමට, කළමනාකරණය කිරීමට සහ අනාවරණය කිරීමට අවශ්‍ය පාලනයන්, ක්‍රියාවලීන් සහ දත්ත රාමු සම්බන්ධයෙන් මූලික පදනම සකස් කරමින්, SLFRS S1 සහ SLFRS S2 ප්‍රමිතීන් අනුග මනය කිරීම සඳහා වන අපගේ සංක්‍රාන්ති ක්‍රියාවලිය අපි ආරම්භ කළෙමු. මෙම මූලාරම්භය ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ NSB ESG රාමුව (පාරිසරික, සමාජීය සහ පාලන රාමුව) තුළ ක්‍රියාත්මක වන අතර, එමඟින් උපායමාර්ගික සංවර්ධනය, ණය ලබා දීමේ තීරණ ගැනීම, ව්‍යවසාය අවදානම් කළමනාකරණය සහ පාර්ශ්වකරුවන්ගේ සම්බන්ධතාව යන අංශයන්හි තිරසාරත්ව සාධක ඇතුළත් කිරීම සඳහා ව්‍යුහගත ප්‍රවේශයක් ලබා දෙයි.

## 25 මානව සම්පත්

උසස් තත්ත්වයේ සේවාවක් හරහා තිරසාර වටිනාකමක් නිර්මාණය කිරීම වෙනුවෙන් කැපවී සිටින, උද්‍යෝගිමත් මෙන්ම කාර්යශූර සේවක පිරිසක් අඛණ්ඩව වර්ධනය කර ගැනීමට සහ පවත්වාගෙන යාමට බැංකුව කටයුතු කළේය. බැංකුවේ මානව ප්‍රාග්ධනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා සැලකිය යුතු ආයෝජනයන් සිදු කර ඇත. මානව ප්‍රාග්ධනය පෝෂණය කිරීම සඳහා බැංකුව විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි 2025 වාර්ෂික වාර්තාවේ 117 සිට 133 දක්වා පිටුවල විස්තර කර ඇත.


## 26 විභාග වෙමින් පවතින නඩු

අධ්‍යක්ෂවරුන්ගේ සහ බැංකුවේ නීතිඥවරුන්ගේ මතය අනුව, මූල්‍ය ප්‍රකාශනවල 394 වැනි පිටුවේ ඇති 51 අංකිත සටහනෙහි අනාවරණය කර ඇති, බැංකුවට සහ සමූහයට එරෙහිව විභාග වෙමින් පවතින නඩු මගින් බැංකුවේ මූල්‍ය තත්ත්වයට හෝ එහි අනාගත මෙහෙයුම් කටයුතු සඳහා ප්‍රමාණාත්මක බලපෑමක් (Material impact) ඇති නොකරනු ඇත.


## 27 වාර්තාවේ අන්තර්ගතය අනුමත කිරීම

වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් අනුමත කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,



**ආචාර්ය හර්ෂ කබ්රාල්, ජනාධිපති නීතිඥ**
සභාපති



**ඩබ්ලිව්. එච්. එම්. ඩී. බී. විජේකෝන්**
වැඩබලන අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2026 පෙබරවාරි 23
කොළඹ

# මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම සම්බන්ධ ප්‍රකාශය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ (බැංකුව) මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ සහ එහි පරිපාලිතයේ (සමූහය) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ වගකීම මෙම ප්‍රකාශයෙන් දක්වා ඇත.

## මූල්‍ය ප්‍රකාශන

බැංකුව සහ සමූහය සියලු ගනුදෙනුවල නිසි ගිණුම් තැබීම කරන බවට සහ අදාළ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූලව එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේදී බැංකුවේ සහ සමූහයේ කටයුතුවල තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන බවට සහතිකවීම සඳහා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වග කියයි. මූල්‍ය ප්‍රකාශනවලට 2025 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, 2025 වසර සඳහා ආදායම් ප්‍රකාශය සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශ සහ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සහ සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ එයට සම්බන්ධ සටහන් ඇතුළත්ය.

බැංකුවේ සහ පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශන පහත කරුණු පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙයි:

1. 2025 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ සහ එහි පරිපාලිතයේ මූල්‍ය තත්ත්වය; සහ

2. 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා බැංකුවේ සහ එහි පරිපාලිතයේ මූල්‍ය කාර්ය සාධනය.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අධ්‍යක්ෂවරුන් පහත දේවල් පිළිබඳව තහවුරු කිරීම අවශ්‍යය:

1. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී යොදා ගන්නා ලද පිටු අංක 308 හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති පවතින මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූලව යෝග්‍ය ඒවා විය. මෙම ප්‍රතිපත්ති සංගත ලෙස භාවිතා කරන අතර ඒවා ප්‍රමාණාත්මකව හෙළිදරව් කරන ලදී.

2. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ගනුදෙනුවේ නෛතික පදනම හා ආර්ථික හරය නිසි ලෙස පිලිබිඹු වන බව සහතික කිරීමට අවශ්‍ය අවස්ථාවලදී සාධාරණ සහ විචක්ෂණශීලී විනිශ්චයන් සිදු කර ඇත

3. අදාළ වන සියළුම ගිණුම්කරණ ප්‍රමිතීන් අදාළ ලෙස අනුගමනය කර ඇත.

1971 අංක 38 දරන මුදල් පනත, 2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනත සහ 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 7(1) වගන්ති විධිවිධාන ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ කටයුතු සහ බැංකුවේ ව්‍යාපාර කටයුතු පාලනය සහ පරිපාලනය කිරීම අවශ්‍ය වේ.

මූල්‍ය ප්‍රකාශන මහ බැංකුව විසින් බලපතලාභී විශේෂිත බැංකු සඳහා නිකුත් කර ඇති ආකෘතියට අනුකූල බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.

සලකනු ලබන ඕනෑම කාල පරිච්ඡේදයක සාධාරණ නිරවද්‍යතාවක් සහිතව, බැංකුවේ මූල්‍ය තත්ත්වය නිවැරදිව වාර්තා කරන සහ විස්තර කරන අදාළ ගිණුම්කරණ වාර්තා ලබා දෙමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ හැකියාව තහවුරු කරන බව සහතික කිරීම සඳහාද අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.

මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවල සත්‍ය බව සහ විෂය මූලික බව සඳහා වන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගනී. (මූල්‍ය ප්‍රකාශන පිටු 298 සිට 438 දක්වා දක්වා ඇත) 2025 වර්ෂය සඳහා පිළියෙළ කළ මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනත සහ 2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනත යන ඒවායෙහි අවශ්‍යතා සමග අනුකූල වේ.

## අභ්‍යන්තර පාලන

අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ සහ සමූහයේ වත්කම් ආරක්ෂා කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගැනීමට සහ විධිවිධාන ලබා දීමට, වංචා සහ අනෙකුත් අක්‍රමිකතා හෙළිදරව් කිරීමට වගකියන ලද අතර ඵලදායී සහ විස්තීර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් සහ අභ්‍යන්තර විගණනයක් ඇතුළත් ඵලදායිතාව නිරීක්ෂණය කිරීමේ ඵලදායී පද්ධතියක් ද පිහිටුවා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය ප්‍රකාශන ඔවුන් විසින් ඔවුන්ගේ විධිමත් රැස්වීම්වලදී සහ විගණන කමිටු මණ්ඩලයේදීද සමාලෝචනය කරන බව සහතික කරයි. මෙම වාර්ෂික වාර්තාවේ 290 පිටුවේ මූල්‍ය වාර්තාකරණය කෙරෙහි අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය දී ඇති අතර බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකාධිපතිගේ සහතිකකරණ වාර්තාව 292 පිටුවෙහි දක්වා ඇත.


## විගණන වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන ඇතුළුව සියලු වාර්තා විගණකාධිපති වෙත ලබා දී ඇති අතර සුදුසු යැයි ඔවුන් සලකන සියලු පරීක්ෂා කිරීම් සිදු කිරීමට සෑම ඉඩ ප්‍රස්තාවක්ම ලබා දෙන ලදී. විගණකාධිපති දෙපාර්තමේන්තුව පරීක්ෂා කිරීම් කර ඇති අතර විගණකාධිපතිගේ මතය ඔහු විසින් වාර්තා කළ පරිදි මෙම වාර්ෂික වාර්තාවෙහි 294 පිටුවේ දක්වා ඇත.

## අනුකූලතා වාර්තාව

අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ උපරිම දැනුමේ සහ විශ්වාසයේ තරමට බැංකුව හා සමූහය විසින් ගෙවිය යුතු සියලු බදු, ගාස්තු සහ අය බදු සහ රජයට සහ අනෙකුත් අදාළ නියාමන සහ ව්‍යවස්ථාපිත අධිකාරිවලට බැංකුවේ සහ සමූහයේ සේවකයන් වෙනුවෙන් සහ ඔවුන් සම්බන්ධව ගෙවිය යුතු සියලු දායකත්ව මුදල් සහ බදු, සහ වෙනත් දන්නා සියළු ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් බැංකුව සහ සමූහය විසින් කළයුතු සහ ගෙවිය යුතු දේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනට ගෙවා ඇති බව හෝ අදාළ තැනදී වෙන් කර ඇති බව තහවුරු කරයි. තවද, වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය සහ සුරැකුම්පත් විනිමය කොමිෂන් සභාව විසින් ඒකාබද්ධව නිකුත් කළ "ආයතනික යහපාලන" සංග්‍රහය තුළ දැක්වීමට අවශ්‍ය මූල්‍ය තත්ත්වය, මෙහෙයුම් තත්ත්ව සහ නියාමන සහ වෙනත් සාධක සැලකීමෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩලය එය තහවුරු කර ඇත.බැංකුවට සහ සමූහයට ඉදිරි අනාගතයේදී මෙහෙයුම් අඛණ්ඩව කරගෙන යාමට සහ මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම යොදා ගැනීම සාධාරනීකරණය කිරීමට ප්‍රමාණවත් තරම් සම්පත් ඇති බව සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කර ඇති විධිවිධාන සමග අනුකූල වීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගෙන ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,



**ඩබ්ලිව්. එච්. එම්. ඩී. බී. විජේකෝන්**
වැඩබලන අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2026 පෙබරවාරි 23 දින

කොළඹදී

# මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

## වගකීම

මෙම වාර්තාව බැංකු පනතේ 2024 අංක 05 දරණ නියමයේ, 9 (2) (ආ) වගන්තිය සමග අනුකූලව නිකුත් කර ඇති අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය (CA Sri Lanka) විසින් නිකුත් කර ඇති යහපරිචයන් සහිත ආයතනික යහපාලන සංග්‍රහය 2023 හි D.1.5 මූලධර්ම මත පදනම්ව පිළියෙළ කළ අභ්‍යන්තර පාලනය පිළිබඳ මෙම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරයි.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රමාණවත් තරම් සහ ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පිහිටුවා පවත්වාගෙන යන බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය (මණ්ඩලය) වගකියයි. කෙසේ වුවද එවැනි පද්ධතියක් බැංකුවේ ව්‍යාපාර පරමාර්ථ ළඟා කර ගැනීම අසාර්ථක වීමේ අවදානම ඉවත් කරනවාට වඩා, පිළිගත හැකි අවදානම් පරාසයක් තුළ බැංකුවේ සැලකිය යුතු අවදානම් ක්ෂේත්‍ර කළමනාකරණය කිරීමට සැලසුම් කෙරේ. ඒ අනුව අභ්‍යන්තර පාලන පද්ධතියට කළමනාකරණ සහ මූල්‍ය තොරතුරු සහ වාර්තාවල සැලකිය යුතු සාවද්‍ය ප්‍රකාශ සහ වාර්තා හෝ මූල්‍යමය අලාභ හෝ වංචාවලට එරෙහිව පරම සහතිකයක් නොව සාධාරණ සහතිකවීමක් පමණක් සපයනු ලැබේ.

බැංකුව මුහුණ දෙන සැලකිය යුතු අවදානම් හඳුනා ගැනීම, ඇගයීම සහ කළමනාකරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අඛණ්ඩ ක්‍රියාවලියක් ස්ථාපිත කර ඇති අතර, ව්‍යාපාරික පරිසරයේ හෝ නියාමන අවශ්‍යතා සහ අනෙකුත් මාර්ගෝපදේශවල වෙනස්කම් සිදුවන විට ඒවා ඇතුළත් වන පරිදි අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩිදියුණු කිරීම මෙම ක්‍රියාවලියට ඇතුළත් වේ. මෙම ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරන්තරව සමාලෝචනය කරනු ලබන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශන පිළිබඳ බැංකුවේ අධ්‍යක්ෂවරුන් සඳහා වන මාර්ගෝපදේශය සමඟ අනුකූල බව තහවුරු කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය එම මාර්ගෝපදේශයෙහි දී ඇති අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයීම සඳහා වූ සියලු ප්‍රධාන මූලධර්ම සැලකිල්ලට ගෙන අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයීමට ලක් කර ඇත.

අභ්‍යන්තර පාලන පද්ධතිය මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීය බව පිළිබඳ සාධාරණ සහතිකයක් සැපයීමට තරම් යහපත් සහ ප්‍රමාණවත් බවද, බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල බවද අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහසයි.

කළමනාකාරිත්වය විසින් බැංකුව මුහුණ දෙන අවදානම් හඳුනාගෙන තක්සේරු කිරීමෙන් සහ මෙම අවදානම් අවම කිරීම සහ පාලනය කිරීම සඳහා සුදුසු අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම මගින් අවදානම් සහ පාලනයන් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ.

**මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමයේ සැලසුම සහ කාර්යක්ෂමතාවය යොදා ගැනීමේදී හා සමාලෝචනය කිරීමේ දී අනුගමනය කරන ක්‍රියාවලියේ ප්‍රධාන ලක්ෂණ**

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලසුම සහ ඵලදායීතාව සමාලෝචනය කිරීමේ පද්ධතියද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කාලානුරූපීව පිහිටුවනු ලැබ තිබේ. අනෙකුත් දේවල් අතර එහි මූලික ක්‍රියාවලිවල පහත දේවල් ඇතුළත් වේ.

- බැංකුවේ දෛනික මෙහෙයුම්වල කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා මණ්ඩලයට සහාය වීමට සහ බැංකුවේ මෙහෙයුම් ආයතනික අරමුණු, උපාය මාර්ග සහ වාර්ෂික අයවැය මෙන්ම මණ්ඩලය විසින් අනුමත කර ඇති ප්‍රතිපත්ති සහ ව්‍යාපාරික උපදෙස් වලට අනුකූලව සිදු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උප කමිටු පහක් (5) ස්ථාපිත කර ඇති අතර, ඒවා 2024 අංක 05 දරන බැංකු පනතේ උපදෙස් මඟින් අවශ්‍ය වන අනිවාර්ය කමිටු වේ (2024 අංක 05 දරන බැංකු පනතේ උපදෙස් 6 වන වගන්තිය 2027 ජනවාරි 01 දින සිට බැංකුවට බලපැවැත්වෙනු ඇත). එක් එක් උප කමිටුව විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර 245 සිට 253 පිටුවල දක්වා ඇත.
- අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) විසින් බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය, බාහිර විගණකවරුන්, නියාමන අධිකාරීන් විසින් හඳුනා ගන්නා අභ්‍යන්තර පාලන දුර්වලතා වරින්වර සමාලෝචනය කරනු ලබන අතර එම දුර්වලතා නිවැරදි කිරීමට නිසි ක්‍රියාමාර්ග ගනියි. බැංකුවේ බාහිර විගණනය විගණකාධිපති විසින් සිදු කරනු ලැබේ. රජයේ විගණන අධිකාරී වෙත සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් සඳහා ආරාධනා කෙරේ.
- විගණනයෙහි විෂයපථය සහ ගුණාත්මක බව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අභ්‍යන්තර විගණන කාර්යය සමාලෝචනය කරයි. මෙම වාර්ෂික වාර්තාවේ 245 පිටුවෙහි ඇති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාවේ 2025 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග දක්වා ඇත. බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය වාර්ෂික විගණන සැලසුම පරිදි ශාඛාවල, අංශවල සහ අනෙකුත් ඒකකවල විගණනය සිදු කරයි. විගණනය කරන වාර ගණන තක්සේරු කළ අවදානම් මට්ටම අනුව තීරණය කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විගණන සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කරනු ලැබේ. අභ්‍යන්තර විගණන අංශය ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සමග අනුකූලතාව සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල ඵලදායීතාව සහතික කිරීමට විගණන පරීක්ෂා සිදු කරන අතර කිනම් හෝ අනනුකූලතාවක් සම්බන්ධව එහි සොයා ගැනීම් වාර්තා කරයි. මෙහෙයුම් සහ කළමනාකරණ ක්‍රියාකාරකම් පිළිබඳ ස්වාධීන සහ විෂය මූලික වාර්තාවක් සැපයීමට විගණන සිදු කෙරේ. විගණනවල සොයා ගැනීම් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි වරින් වර පවත්වන රැස්වීම්වලදී සමාලෝචනය සඳහා යොමු කෙරේ. කමිටු රැස්වීම්වල සටහන් සමගින්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි ක්‍රියාකාරකම් කාලානුරූපී පදනමකින් අධ්‍යක්ෂ මණ්ඩලයේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කෙරේ.
- බැංකුවේ ප්‍රධාන අවදානම් ක්ෂේත්‍රවල සමස්ත කළමනාකරණය අධීක්ෂණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) පිහිටුවා ඇත. බැංකුවෙහි ක්‍රියාකාරකම්, අදාළ නීති, රෙගුලාසි සහ නියාමන උපදෙස්වලට අනුකූලව සිදු කරන බව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වාධීන අනුකූලතා ඒකකයක්ද ස්ථාපනය කර ඇති අතර අනුකූල නොවීම පිළිබඳ යම් ගැටලු කාලානුරූපීව අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කෙරේ. අවදානම් තක්සේරුව පිළිබඳ වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් කාලානුරූපීව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ.
- බැංකුවේ එදිනෙදා ව්‍යාපාර මෙහෙයුම්වලදී බැංකුවේ ප්‍රධාන ක්ෂේත්‍රවල ඵලදායී කළමනාකරණ සහ අධීක්ෂණය සහතික කිරීමට කළමනාකරණ මට්ටමේ කමිටු ද නිසි සවිබලගැන්වීමක් සමගින් ක්‍රියාත්මකව ඇත. තක්සේරු කිරීම බැංකුව විසින් යොදන ක්‍රියාවලි පමණක් ආවරණය කරන අතර එහි පරිපාලිතය විසින් කරගෙන යන ක්‍රියාවලි අඩංගු නොකරයි.

## මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය


2018 ජනවාරි 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි බැංකුව විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය ශ්‍රී. ල. මූ. ව. ප්‍ර. 9 – මූල්‍ය උපකරණ" භාවිත කරන ලදි. එවැනි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් යොදා ගැනීමෙහි සිට පිළිගැනීම" මිනුම් කිරීම වර්ගීකරණය සහ අනාවරණය කිරීමේ නව අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා ක්‍රියාවලීන් අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ ප්‍රගතිශීලී වැඩිදියුණු කිරීම සිදු කරනු ලැබේ.

පසුගිය වසරවල මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනයන්ට අදාළව බාහිර විගණකවරුන් විසින් ඉදිරිපත් කරන ලද අදහස් වර්ෂය තුළ සමාලෝචනය කර ඒවා නිවැරැදි කිරීමට සුදුසු පියවර ගෙන ඇත. මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයන්ට අදාළව 2025 දී බාහිර විගණකවරුන් විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශවලට ඉදිරියේදී විසඳුම් ලබාදෙනු ඇත.


### තහවුරු කිරීම

ඉහත ක්‍රියාවලි මත පදනම්ව, මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීය බව පිළිබඳව සාධාරණ සහතිකයක් සැපයීමට බැංකුවේ මූල්‍ය වාර්තාකරණ පද්ධතිය නිර්මාණය කර ඇති බවත් සහ බාහිර අවශ්‍යතාවයන් සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවලට අනුකූල බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,



**ආචාර්ය හර්ෂ කබ්රාල්, ජනාධිපති නීතීඥ**
සභාපති



**සුපුල් විජේසිංහ**
අධ්‍යක්ෂ



**රනිල් ගුණතිලක**
අධ්‍යක්ෂ

**2026 පෙබරවාරි 23**
කොළඹදී

# අභ්‍යන්තර පාලනය පිළිබඳ ස්වාධීන සහතික වාර්තාව




The Chairman
National Savings Bank

**Independence Assurance Report of the Auditor General to the Board of Directors on the Directors' Statement on Internal Control over Financial Reporting of National Savings Bank**

## INTRODUCTION

This report is to provide assurance on the Directors' Statement on Internal Control over Financial Reporting (the "Statement") of National Savings Bank (the "Bank") included in the annual report for the year ended 31 December 2025.

## MANAGEMENT'S RESPONSIBILITY

Management is responsible for the preparation and presentation of the Statement in accordance with the "Guidance for Directors of Bank on the Directors' Statement on Internal Control" issued in compliance with the section 9 (2) (b) of the Banking Act Direction No. 05 of 2024, by the Institute of Chartered Accountants of Sri Lanka.

## MY RESPONSIBILITIES AND COMPLIANCE WITH SLSAE 3050 (REVISED)

My responsibility is to assess whether the Statement is both supported by the documentation prepared by or for directors and appropriately reflects the process the directors have adopted in reviewing the design and effectiveness of the internal control of the Bank.

I conducted my engagement in accordance with Sri Lanka Standard on Assurance Engagements (SLSAE) 3050 (Revised) – Assurance Report for Banks on Directors' Statement on Internal Control issued by The Institute of Chartered Accountants of Sri Lanka.

This standard required that I plan and perform procedures to obtain limited assurance about whether management has prepared, in all material aspects, the statement on internal control over financial reporting.

For the purpose of this engagement, I am not responsible for updating or reissuing any reports, nor have I, in the course of this engagement, performed and audit or review of the financial information.

## SUMMARY OF WORK PERFORMED

I conducted my engagement to assess whether the Statement is supported by the documentation prepared by or for Directors; and appropriately reflected the process the Directors have adopted in reviewing the system of internal control over financial reporting of the Bank.

The procedures performed were limited primarily to inquiries of Bank personnel and the existence of documentation on a sample basis that supported the process adopted by the Board of Directors.

SLSAE 3050 (Revised) does not require me to consider whether the Statement covers all risks and controls, or to form an opinion on the effectiveness of the Bank's risk and control procedures. SLSAE 3050 (Revised) also does not require me to consider whether the processes described to deal with material internal control aspects of any significant problems disclosed in the annual report will, in fact, remedy the problems.

The Procedures selected depend on my judgment, having regard to my understanding of the nature of the Bank, the event or transaction in respect of which the Statement has been prepared.

I believe that the evidence I have obtained is sufficient and appropriate to provide a basis for my conclusion.

## CONCLUSION

Based on the procedures performed, nothing has come to my attention that causes me to believe that the Statement included in the Annual Report is inconsistent with my understanding of the process the Board of Directors has adopted in the review of the design and effectiveness of internal control system over the financial reporting of the Bank.

**L.S.I Jayaratna**
Auditor General

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

# සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරීගේ සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්, සැලසුම් සහ කළමනාකරණ තොරතුරු පද්ධති)/ප්‍රධාන මූල්‍ය නිලධාරීගේ වගකීම් ප්‍රකාශය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ (බැංකුව) මූල්‍ය ප්‍රකාශන සහ බැංකුව හා එහි අනුබද්ධිත සමාගම්වල (සමූහය) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 2025 දෙසැම්බර් 31 දිනට පහත සඳහන් ප්‍රමිතීන්ට සහ විධිවිධානවලට අනුකූලව සකස් කර ඉදිරිපත් කර ඇත:

- 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ එහි සංශෝධන.
- 1971 අංක 38 දරන මුදල් පනත.
- 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිතීන් පිළිබඳ පනත.
- 1988 අංක 30 දරන බැංකු පනත සහ එහි සංශෝධන මෙන්ම, ඒ යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ මූල්‍ය ප්‍රකාශන ආකෘති සහ තොරතුරු අනාවරණය කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද විධානයන්, නිර්ණයන් සහ මාර්ගෝපදේශ.
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්/ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද 2023 ආයතනික පාලනය පිළිබඳ වඩා යහපත් පරිචය පිළිබඳ සංග්‍රහය.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු සඳහා වන ආයතනික පාලනය පිළිබඳ නිකුත් කරන ලද 2024 අංක 05 දරන බැංකු පනත් විධානය.
- 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිත කරන ලද ආකෘති සහ සිදු කරන ලද අනාවරණයන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද ආකෘතිවලට අනුකූල වන අතරම, ඒවා "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" පිළිබඳ අංක 01 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (LKAS 1) අනාවරණ අවශ්‍යතාවලට ද අනුකූල වේ. බැංකුව සහ සමූහය සිය මූල්‍ය ප්‍රතිඵල කාර්තුමය පදනමකින් පරීශීලකයින් වෙත ඉදිරිපත් කරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති උචිත වන අතර, ඒවා බැංකුව සහ සමූහය විසින් අඛණ්ඩව අනුගමනය කර ඇත. ඉහළ මට්ටමේ විනිශ්චයන් සහ සංකීර්ණත්වයකින් යුත් වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ඇස්තමේන්තු පිළිබඳව බැංකුවේ බාහිර විගණකවරුන් සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සමඟ සාකච්ඡා කරන ලදි.

මූල්‍ය ප්‍රකාශනවල 53 වන සටහනෙහි අනාවරණය කර ඇති වෙනස්කම් හැර, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව ප්‍රකාශයට පත් කළ දින සිට ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගණනය කිරීමේ ක්‍රමවේදවල කිසිදු වෙනසක් සිදු වී නොමැත. ඒ අනුව, අදාළ අවස්ථාවන්හිදී වත්මන් ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි සංසන්දනාත්මක තොරතුරු සංශෝධනය කර ඇත.

අප දන්නා තරමින්, මෙම වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇති මූල්‍ය ප්‍රකාශන, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් මූල්‍ය තොරතුරු මඟින් සමාලෝචිත වර්ෂය තුළ බැංකුවේ සහ සමූහයේ වත්කම්, වගකීම්, මෙහෙයුම් ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහයන් පිළිබඳ සියලු ප්‍රමාණාත්මක අංශයන් සාධාරණව ඉදිරිපත් කර ඇති බවත්, මූල්‍ය ප්‍රකාශන මඟින් සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දී ඇති බවත් අපි සහතික කරමු. තවද, බැංකුවට සහ සමූහයට සිය මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් සම්පත් ඇති බවත්, මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී "අඛණ්ඩ පැවැත්මේ පදනම" යොදාගෙන ඇති බවත් අපි වැඩිදුරටත් සහතික කරමු.

## අභ්‍යන්තර පාලනය සහ ක්‍රියාපටිපාටීන් පිළිබඳ වගකීම

බැංකුවේ සහ එහි පරිපාලිතවල අභ්‍යන්තර පාලනයන් සහ ක්‍රියාපටිපාටීන් ස්ථාපිත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම සඳහා අපි වගකීම දරන්නෙමු. වත්කම් සුරක්ෂිත කිරීම, වංචා සහ/හෝ වැරදි මෙන්ම අනෙකුත් අක්‍රමිකතා වැළැක්වීම සහ හඳුනා ගැනීම සඳහා බැංකුවට සහ සමූහයට අදාළ වැදගත් තොරතුරු අප වෙත ලැබෙන බව තහවුරු කෙරෙන ඵලදායී අභ්‍යන්තර පාලනයන් සහ ක්‍රියාපටිපාටීන් පවතින බව අපි සහතික කරන අතර, ඒවා අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරමින්, ඇගයීමට ලක් කරමින් සහ යාවත්කාලීන කරනු ලබයි. අප දන්නා තරමින්, අභ්‍යන්තර පාලනයන් සහ ක්‍රියාපටිපාටීන් සැලසුම් කිරීමේදී හෝ ක්‍රියාත්මක කිරීමේදී සැලකිය යුතු අඩුපාඩුවක් හෝ දුර්වලතාවයක් නොතිබූ බව අපි සැහිමට පත් වෙමු. අපගේ ඇගයීම් මත පදනම්ව, කළමනාකාරීත්වය හෝ වෙනත් සේවකයින් සම්බන්ධ වූ වංචාවක් සිදු නොවූ බව අපි සහතික කරමු. ස්ථාපිත කර ඇති මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයන් සහ ක්‍රියාපටිපාටීන් අඛණ්ඩව අනුගමනය කරන්නේද යන්න සහතික කිරීම සඳහා බැංකුවේ අභ්‍යන්තර විගණකවරුන් ද වරින් වර සමාලෝචනයන් පවත්වනු ලබයි. කෙසේ වෙතත්, ඕනෑම අභ්‍යන්තර පාලන සහ ගිනුම්කරණ පද්ධතියක් මගින් ලබා දෙන සහතිකය ඇගයීමේදී පිළිගතයුතු ආවේණික සීමාවන් පවතින බව ද සැලකිල්ලට ගත යුතුය.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය මෙම වාර්ෂික වාර්තාවේ 290 වන පිටුවේ දක්වා ඇත. බැංකුව විසින් අනුගමනය කරනු ලබන මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයන්හි ඵලදායීතාව විගණකාධිපතිවරයා විසින් විගණනය කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් ලබා දී ඇති විකරණය නොකල විගණන මතය මෙම වාර්ෂික වාර්තාවේ 294 වන පිටුවේ දක්වා ඇත.


## බාහිර විගණනය

බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා විසින් විගණනය කරන ලදී. බැංකුවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 294 වන පිටුවේ දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින්, අනෙකුත් කරුණු ද සමඟින්, සියලුම අභ්‍යන්තර විගණන සහ පරීක්ෂණ වැඩසටහන්, අභ්‍යන්තර පාලන පද්ධති සහ ක්‍රියාපටිපාටීන්හි කාර්යක්ෂමතාව මෙන්ම වැදගත් ගිනුම්කරණ ප්‍රතිපත්ති සහ ඒවා ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම පිළිබඳව සමාලෝචනය කරන ලදී. මේ පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ 245 සිට 247 දක්වා පිටුවල ඇති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාවේ ඇතුළත් වේ. පූර්ණ ස්වාධීනත්වය සහතික කිරීම සඳහා, ඕනෑම වැදගත් කරුණක් සාකච්ඡා කිරීමට විගණකාධිපතිවරයාට සහ අභ්‍යන්තර විගණකවරුන්ට අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සාමාජිකයින් වෙත පූර්ණ සහ නිදහස් ප්‍රවේශය ලබා දී ඇත.

## සහතික කිරීම

අප දන්නා තරමින් පහත කරුණු අපි මෙයින් සහතික කරමු:

- බැංකුව සහ සමූහය අදාළ සියලුම නීති සහ රෙගුලාසි මෙන්ම විවක්ෂණශීලී අවශ්‍යතා සමඟ අනුකූල වී ඇත.
- මූල්‍ය ප්‍රකාශනවල 394 වන පිටුවේ ඇති 51 වන සටහනෙහි අනාවරණය කර ඇති කරුණු හැර, බැංකුවට සහ සමූහයට එරෙහිව පවතින ප්‍රමාණාත්මක නඩුකරයන් හෝ සැළකිය යුතු අනුකූල නොවීමක් නොමැත.
- 2025 දෙසැම්බර් 31 දිනට බැංකුව සහ සමූහය විසින් ගෙවිය යුතු සියලුම බදු, තීරුබදු, අයබදු සහ සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් මෙන්ම බැංකුවේ සහ සමූහයේ සේවකයින් වෙනුවෙන් සහ ඔවුන් සම්බන්ධයෙන් ගෙවිය යුතු සියලුම දායකත්ව මුදල්, අයබදු සහ බදු ගෙවා ඇති බව හෝ අදාළ අවස්ථාවන්හිදී ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර ඇත.



**රෝහණ බණ්ඩාර වීරකෝන්**
වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී



**අජිත් අක්මීමන**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මුදල්, සැලසුම් සහ කළමනාකරණ තොරතුරු පද්ධති)/ප්‍රධාන මූල්‍ය නිලධාරී

2026 පෙබරවාරි 06
කොළඹ

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. BAN/A/NSB/2025/FA/24
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 27 February 2026

Chairman
National Savings Bank

**Report of the Auditor General on the Financial Statements and Other Legal and Regulatory Requirements of the National Savings Bank and its subsidiaries for the year ended 31 December 2025 in terms of Section 12 of the National Audit Act, No. 19 of 2018.**

## 1 FINANCIAL STATEMENTS

### 1.1 Opinion

The audit of the financial statements of the National Savings Bank (the "Bank") and the consolidated financial statements of the Bank and its subsidiaries (the "Group") for the year ended 31 December 2025 comprising the statement of financial position as at 31 December 2025 and the income statement, statement of comprehensive income, statement of changes in equity and statement of cash flow for the year then ended, and notes to the Financial Statements, including material accounting policy information, was carried out under my direction in pursuance of provisions in Article 154 (1) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka read in conjunction with provisions of the National Audit Act No. 19 of 2018 and Finance Act No.38 of 1971. My report to parliament in pursuance of provisions in Article 154 (6) of the Constitution will be tabled in due course.

In my opinion, the accompanying financial statements of the Bank and the Group give a true and fair view of the financial position of the Bank and the Group as at 31 December 2025 and of their financial performance and their cash flows for the year then ended in accordance with Sri Lanka Accounting Standards.

### 1.2 Basis for Opinion

I conducted my audit in accordance with Sri Lanka Auditing Standards (SLAuSs). My responsibilities, under those standards are further described in the Auditor's Responsibilities for the Audit of the Financial Statements section of my report. I believe that the audit evidence I have obtained is sufficient and appropriate to provide a basis for my opinion.

### 1.3 Other information included in the Bank's 2025 Annual Report

The other information comprises the information included in the Bank's 2025 Annual Report, but does not include the financial statements and my auditor's report thereon, which is expected to be made available to me after the date of this auditor's report. Management is responsible for the other information.

My opinion on the financial statements does not cover the other information and I do not express any form of assurance conclusion thereon.

In connection with my audit of the financial statements, my responsibility is to read the other information identified above when it becomes available and, in doing so, consider whether the other information is materially inconsistent with the financial statements or my knowledge obtained in the audit or otherwise appears to be materially misstated.

When I read the Bank's 2025 Annual Report, if I conclude that there are material misstatements therein, I am required to communicate that matter to those charged with governance for correction. If further material uncorrected misstatements are existed those will be included in my report to Parliament in pursuance of provisions in Article 154 (6) of the Constitution that will be tabled in due course.

### 1.4 Responsibilities of Management and Those Charged with Governance for the Financial Statements

Management is responsible for the preparation of financial statements that give a true and fair view in accordance with Sri Lanka Accounting Standards, and for such internal control as management determine is necessary to enable the preparation of financial statements that are free from material misstatement, whether due to fraud or error.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

In preparing the financial statements, management is responsible for assessing the Group's ability to continue as a going concern, disclosing, as applicable, matters related to going concern and using the going concern basis of accounting unless management either intends to liquidate the Group or to cease operations, or has no realistic alternative but to do so.

Those charged with governance are responsible for overseeing the Group's financial reporting process.

As per Section 16(1) of the National Audit Act No. 19 of 2018, the Bank and the Group is required to maintain proper books and records of all its income, expenditure, assets and liabilities, to enable annual and periodic Financial Statements to be prepared of the Bank and the Group.

## 1.5 Auditor's Responsibilities for the Audit of the Financial Statements

My objective is to obtain reasonable assurance about whether the financial statements as a whole are free from material misstatement, whether due to fraud or error, and to issue an auditor's report that includes my opinion. Reasonable assurance is a high level of assurance, but is not a guarantee that an audit conducted in accordance with Sri Lanka Auditing Standards will always detect a material misstatement when it exists. Misstatements can arise from fraud or error and are considered material if, individually or in the aggregate, they could reasonably be expected to influence the economic decisions of users taken on the basis of these financial statements.

As part of an audit in accordance with Sri Lanka Auditing Standards, I exercise professional judgment and maintain professional scepticism throughout the audit. I also:

- Identify and assess the risks of material misstatement of the financial statements, whether due to fraud or error, design and perform audit procedures responsive to those risks, and obtain audit evidence that is sufficient and appropriate to provide a basis for my opinion. The risk of not detecting a material misstatement resulting from fraud is higher than for one resulting from error, as fraud may involve collusion, forgery, intentional omissions, misrepresentations, or the override of internal control.
- Obtain an understanding of internal control relevant to the audit in order to design audit procedures that are appropriate in the circumstances, but not for the purpose of expressing an opinion on the effectiveness of the internal control of the Bank and the Group.
- Evaluate the appropriateness of accounting policies used and the reasonableness of accounting estimates and related disclosures made by the management.
- Conclude on the appropriateness of the management's use of the going concern basis of accounting and based on the audit evidence obtained, whether a material uncertainty exists related to events or conditions that may cast significant doubt on the Group's ability to continue as a going concern. If I conclude that a material uncertainty exists, I am required to draw attention in my auditor's report to the related disclosures in the Financial Statements or, if such disclosures are inadequate, to modify my opinion. My conclusions are based on the audit evidence obtained up to the date of my auditor's report. However, future events or conditions may cause the Group to cease to continue as a going concern.
- Evaluate the overall presentation, structure and content of the financial statements, including the disclosures, and whether the financial statements represent the underlying transactions and events in a manner that achieves fair presentation.
- Plan and perform the group audit to obtain sufficient appropriate audit evidence regarding the financial information of the entities or business units within the Group as a basis for forming an opinion on the consolidated financial statements. I am responsible for the direction, supervision and review of the audit work performed for the purposes of the group audit. I remain solely responsible for my audit opinion.

I communicate with those charged with governance regarding, among other matters, significant audit findings, including any significant deficiencies in internal control that I identify during my audit.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 2 REPORT ON OTHER LEGAL AND REGULATORY REQUIREMENTS

**2.1** National Audit Act, No. 19 of 2018 includes specific provisions for following requirements.

**2.1.1** I have obtained all the information and explanation that required for the audit and as far as appears from my examination, proper accounting records have been kept by the Bank as per the requirement of section 12 (a) of the National Audit Act, No. 19 of 2018.

**2.1.2** The financial statements presented is consistent with the preceding year as per the requirement of section 6 (1) (d) (iii) of the National Audit Act, No. 19 of 2018.

**2.1.3** The financial statements presented includes all the recommendations made by me in the previous year as per the requirement of section 6 (1) (d) (iv) of the National Audit Act, No. 19 of 2018.

**2.2** The Section 39 of the Banking Act No.30 of 1988 (as amended by Banking Act No.24 of 2024) includes specific provisions for following requirements.

**2.2.1** The disclosures made in the accompanying financial statements are in accordance with the requirements of Circular No. 05 of 2024 issued by Central Bank of Sri Lanka.

**2.3** Based on the procedures performed and evidence obtained were limited to matters that are material, nothing has come to my attention;

**2.3.1** to state that any member of the governing body of the Bank has any direct or indirect interest in any contract entered into by the Bank which are out of the normal course of business as per the requirement of section 12 (d) of the National Audit Act, No. 19 of 2018;

**2.3.2** to state that the Bank has not complied with any applicable written law, general and special directions issued by the governing body of the Bank as per the requirement of section 12 (f) of the National Audit Act, No. 19 of 2018;

**2.3.3** to state that the Bank has not performed according to its powers, functions and duties as per the requirement of section 12 (g) of the National Audit Act, No. 19 of 2018;

**2.3.4** to state that the resources of the Bank had not been procured and utilised economically, efficiently and effectively within the time frames and in compliance with the applicable laws as per the requirement of section 12 (h) of the National Audit Act, No. 19 of 2018.

**L S I Jayaratna**
Auditor General

# මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගතය


| | | පිටු අංකය |
|---|---|---|
| **මූලික මූල්‍ය ප්‍රකාශය** | | |
| ආදායම් ප්‍රකාශය | | 298 |
| විස්තිරණ ආදායම් ප්‍රකාශය | | 299 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | | 300 |
| හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - බැංකුව | | 302 |
| හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - සමූහය | | 304 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | | 306 |
| **මූල්‍ය ප්‍රකාශනවල අදාල සටහන්** | | |
| 1. | **වාර්තාකරණ ඒකකය** | 308 |
| 1.1 | ආයතනික තොරතුරු | 308 |
| 1.2 | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන | 308 |
| 1.3 | මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය | 308 |
| 2. | **ගිණුම්කරණ ප්‍රතිපත්ති** | 308 |
| 2.1 | ගිණුම් පිළියෙල කිරීමේ පදනම | 308 |
| 2.2 | ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම් | 312 |
| 2.3 | සාධාරණ අගය මිනීම | 312 |
| 2.4 | සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති - පොදු | 313 |
| 2.5 | සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති - වත්කම් හා වගකීම් හඳුනාගැනීම | 313 |
| 2.6 | වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති - මූල්‍ය උපකරණ සඳහා ආදායම් හා වියදම් හඳුනාගැනීම | 322 |
| 2.7 | වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති - බදුකරණය | 322 |
| 2.8 | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 322 |
| 2.9 | නියාමන ප්‍රතිපාදන | 322 |
| 2.10 | වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම් | 322 |
| 2.11 | නිකුත් කරන ලද මුත් වාර්තාකරණ දිනට බල නොපැවැත්වෙන ගිණුම්කරණ ප්‍රමිතීන් | 322 |
| **මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් - ආදායම් ප්‍රකාශය** | | |
| 3. | දළ ආදායම | 324 |
| 4. | ශුද්ධ පොළී ආදායම | 324 |
| 5. | ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම | 327 |
| 6. | වෙළඳාම් කටයුතු වලින් ලත් ශුද්ධ ලාභය/(අලාභය) | 328 |
| 7. | ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය උපකරණයන්ගෙන් ලත් ශුද්ධ ලාභය/(අලාභය) | 328 |
| 8. | මූල්‍ය වත්කම් හඳුනාගැනීම අත්හැරීම මඟින් ලත් ශුද්ධ ලාභය/(අලාභය) | 329 |
| 9. | වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ) | 329 |
| 10. | හානිකරණ වියදම්/(ප්‍රතිවර්තන) | 330 |
| 11. | සේවක මණ්ඩල වියදම් | 331 |
| 12. | වෙනත් වියදම් | 333 |
| 13. | බදු වියදම් | 333 |
| 14. | කොටසක ඉපැයුම | 335 |
| **මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් - මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය වත්කම්** | | |
| 15. | ගණනය කරන ලද පදනම මත මූල්‍ය උපකරණවල විශ්ලේෂණය | 336 |
| 16. | මුදල් හා මුදල් සමානයන් | 338 |
| 17. | මහ බැංකුව වෙතැති ශේෂයන් | 339 |
| 18. | බැංකුවල ඇති තැන්පතු | 339 |
| 19. | ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 340 |
| 20. | ලාභ/අලාභ මඟින් හඳුනාගත් මූල්‍ය වත්කම් | 341 |
| 21. | ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම් | 343 |
| 22. | ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ | 349 |
| 23. | වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් | 352 |
| 24. | පාලිත සමාගම්වල ආයෝජනයන් | 356 |
| 25. | ආශ්‍රිත සමාගම්වල සහ බද්ධ ව්‍යාපාරවල ආයෝජනය | 356 |
| 26. | දේපල, පිරියත සහ උපකරණ | 357 |
| 27. | පරිහරනය කිරීමේ අයිතිය හිමි වත්කම් | 360 |
| 28. | දේපල ආයෝජන | 361 |
| 29. | කීර්තිනාමය සහ අස්පෘශ්‍ය වත්කම් | 362 |
| 30. | විලම්බිත බදු (වත්කම්)/වගකීම් | 364 |
| 31. | වෙනත් වත්කම් | 366 |
| **මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් - මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය - වගකීම් සහ හිමිකම** | | |
| 32. | බැංකුවලට ගෙවිය යුතු | 367 |
| 33. | ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 367 |
| 34. | ලාභ/අලාභ මඟින් හඳුනාගත් මූල්‍ය වගකීම් | 367 |
| 35. | ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වගකීම් | 368 |
| 36. | කල්බදු වගකීම් | 369 |
| 37. | නිකුත්කළ ණය සුරැකුම්පත් | 370 |
| 38. | සේවාවසාන ප්‍රතිලාභ බැඳීම් | 372 |
| 39. | ප්‍රවර්තන බදු වගකීම් | 382 |
| 40. | වෙනත් ප්‍රතිපාදන | 382 |
| 41. | වෙනත් වගකීම් | 382 |
| 42. | පරිපාලිත සමාගම් වෙත ගෙවිය යුතු | 382 |
| 43. | ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය | 383 |
| 44. | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 383 |
| 45. | රඳවාගත් ඉපැයීම් | 383 |
| 46. | වෙනත් සංචිත | 384 |
| 47. | පාලනය යටත් නොවන හිමිකම | 386 |
| **මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් - අනෙකුත් හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන්** | | |
| 48. | අසම්භාව්‍ය වගකීම් හා බැඳීම් | 386 |
| 49. | සම්බන්ධිත පාර්ශ්වයන්ට අදාළ හෙළිදරව් කිරීම | 388 |
| 50. | සාමාන්‍ය කොටසක ශුද්ධ වත්කම් වටිනාකම | 393 |
| 51. | බැංකුවට හා සමූහයට විරුද්ධව ඇති නීති කෘත්‍යයන් | 394 |
| 52. | මූල්‍ය ප්‍රකාශ වාර්තා කළ දිනට පසු සිදුවීම් | 394 |
| 53. | සංසන්දනාත්මක තොරතුරු | 395 |
| 54. | මූල්‍ය අවදානම් කළමනාකරණය | 396 |
| 55. | මූල්‍ය උපකරණවල සාධාරණ අගය | 429 |
| 56. | ප්‍රාග්ධන කළමනාකරණය (නියාමන වාර්තාකරණය අනුව) | 434 |
| 57. | පිටපත් රහිත භාණ්ඩාරගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කරවලට අදාල ප්‍රතිමිලට ගැනීම් හා ප්‍රතිවිකුණුම් ගනුදෙනු | 434 |
| 58. | මෙහෙයුම් අංශ | 435 |
| 59. | තෝරාගත් කාර්යසාධක දර්ශක (මහ බැංකුවට සපයන නියාමන වාර්තාව අනුව) | 438 |

# ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | පිටුව | බැංකුව 2025 රු. '000 | බැංකුව 2024 රු. '000 | බැංකුව වෙනස (%) | සමූහය 2025 රු. '000 | සමූහය 2024 රු. '000 | සමූහය වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|---|
| **දළ ආදායම** | 3 | 324 | **202,761,289** | 207,636,948 | (2) | **207,907,654** | 213,417,164 | (3) |
| පොළී ආදායම | | | **197,777,349** | 203,748,274 | (3) | **202,459,287** | 208,632,122 | (3) |
| අඩුකළා: පොළී වියදම | | | **112,928,430** | 131,165,321 | (14) | **116,039,888** | 133,563,015 | (13) |
| **ශුද්ධ පොළී ආදායම** | 4 | 324 | **84,848,919** | 72,582,953 | 17 | **86,419,399** | 75,069,107 | 15 |
| ගාස්තු සහ කොමිස් ආදායම | | | **2,936,871** | 2,078,830 | 41 | **2,938,382** | 2,085,090 | 41 |
| අඩුකළා: ගාස්තු සහ කොමිස් වියදම | | | **376,539** | 328,272 | 15 | **376,923** | 328,737 | 15 |
| **ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම** | 5 | 327 | **2,560,332** | 1,750,558 | 46 | **2,561,459** | 1,756,353 | 46 |
| වෙළඳාම් කටයුතුවලින් ලද ශුද්ධ ලාභය/(අලාභය) | 6 | 328 | **708,034** | 911,630 | (22) | **1,137,128** | 1,791,936 | (37) |
| ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය උපකරණයන්ගෙන් ලත් ශුද්ධ ලාභය/(අලාභය) | 7 | 328 | **–** | – | – | **–** | – | – |
| මූල්‍ය වත්කම් හඳුනාගැනීම අත්හැරීම තුළින් ලත් ශුද්ධ ලාභය/(අලාභය) | 8 | 329 | **553,002** | 442,273 | 25 | **553,002** | 442,273 | 25 |
| වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ) | 9 | 329 | **786,033** | 455,941 | 72 | **819,855** | 465,743 | 76 |
| **මුළු මෙහෙයුම් ආදායම** | | | **89,456,320** | 76,143,355 | 17 | **91,490,843** | 79,525,412 | 15 |
| අඩුකළා: හානිකරණ වියදම් | 10 | 330 | **1,636,616** | 11,526,056 | (86) | **1,571,222** | 11,513,684 | (86) |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම** | | | **87,819,704** | 64,617,299 | 36 | **89,919,621** | 68,011,728 | 32 |
| **අඩුකළා: වියදම්** | | | | | | | | |
| සේවක මණ්ඩල වියදම් | 11 | 331 | **19,891,920** | 20,306,147 | (2) | **19,968,397** | 20,846,003 | (4) |
| ක්ෂයවීම් හා ක්‍රමක්ෂය වියදම් | | | **2,258,283** | 1,674,524 | 35 | **2,272,374** | 1,689,188 | 35 |
| වෙනත් වියදම් | 12 | 333 | **8,282,777** | 7,021,348 | 18 | **8,472,393** | 7,228,304 | 17 |
| **මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු සහ සමාජ ආරක්ෂණ දායකත්ව පෙර මෙහෙයුම් ලාභය** | | | **57,386,724** | 35,615,280 | 61 | **59,206,457** | 38,248,233 | 55 |
| අඩුකළා: මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු | | | **11,321,227** | 8,207,522 | 38 | **11,644,625** | 8,683,243 | 34 |
| අඩුකළා: මූල්‍ය සේවා මත සමාජ ආරක්ෂණ දායකත්ව | | | **1,572,393** | 1,139,934 | 38 | **1,617,126** | 1,205,905 | 34 |
| **මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු සහ සමාජ ආරක්ෂණ දායකත්ව පසු මෙහෙයුම් ලාභය** | | | **44,493,104** | 26,267,824 | 69 | **45,944,706** | 28,359,085 | 62 |
| ආශ්‍රිත සමාගම්වල සහ බද්ධ ව්‍යාපාර වල ලාභයෙන් හිමි කොටස | | | **–** | – | – | **–** | – | – |
| **ආදායම් බදුවලට පෙර ලාභය** | | | **44,493,104** | 26,267,824 | 69 | **45,944,706** | 28,359,085 | 62 |
| අඩුකළා: ආදායම් බදු වියදම | 13 | 333 | **17,172,346** | 10,145,432 | 69 | **17,782,154** | 10,862,124 | 64 |
| **වර්ෂය සඳහා ලාභය** | | | **27,320,758** | 16,122,392 | 69 | **28,162,552** | 17,496,961 | 61 |
| **ලාභය බෙදී යන ආකාරය** | | | | | | | | |
| බැංකුවේ කොටස් හිමියන් | | | **27,320,758** | 16,122,392 | 69 | **28,162,552** | 17,496,961 | 61 |
| පාලනයට යටත් නොවන හිමිකම් | | | **–** | – | – | **–** | – | – |
| **වර්ෂය සඳහා ලාභය** | | | **27,320,758** | 16,122,392 | 69 | **28,162,552** | 17,496,961 | 61 |
| **ලාභය මත කොටසක ඉපැයීම** | | | | | | | | |
| සාමාන්‍ය කොටසක මූලික ඉපැයීම් (රු.) | 14 | 335 | **29.06** | 17.15 | 69 | **29.96** | 18.61 | 61 |
| සාමාන්‍ය කොටසක තනුක ඉපැයීම් (රු.) | | | **29.06** | 17.15 | 69 | **29.96** | 18.61 | 61 |
| **වර්ෂය සඳහා ලාභය** | | | **27,320,758** | 16,122,392 | 69 | **28,162,552** | 17,496,961 | 61 |

308 පිටුවේ සිට 438 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

# විස්තීරණ ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | බැංකුව | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|
| | **2025 රු. '000** | 2024 රු. '000 | වෙනස (%) | **2025 රු. '000** | 2024 රු. '000 | වෙනස (%) |
| **වර්ෂය සඳහා ලාභය** | **27,320,758** | 16,122,392 | 69 | **28,162,552** | 17,496,961 | 61 |
| **ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කළ යුතු වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | | | |
| විදේශ ගනුදෙනු පරිවර්තනය මත වූ විනිමය වෙනස්කම් | **–** | – | – | **–** | – | – |
| ඉදිරි සුරැකුම් මුදල් ප්‍රවාහ කටයුතු වලින් ලත් ශුද්ධ ලාභ/(අලාභ) | **–** | – | – | **–** | – | – |
| වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට පවතින ණය උපකරණ මත ශුද්ධ ලාභ/(අලාභ) | **–** | – | – | **–** | – | – |
| ආශ්‍රිත සමාගම් සහ බද්ධ ව්‍යාපාර වල ලාභයෙන් හිමි කොටස | **–** | – | – | **–** | – | – |
| වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට නම් කළ ණය උපකරණ | **225,681** | 996,856 | (77) | **178,526** | 1,053,092 | (83) |
| වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට නම් කළ ණය උපකරණ ඉවත් කිරීම මත සාධාරණ අගය මත ලාභ/(අලාභ) ආදායම් ප්‍රකාශයට මාරු කිරීම | **(553,002)** | (442,273) | 25 | **(553,002)** | (442,273) | 25 |
| ඉහත අයිතම සඳහා විලම්බිත බදු බලපෑම | **98,196** | (166,375) | 159 | **112,343** | (183,246) | 161 |
| **ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කලයුතු වෙනත් විස්තීර්ණ ආදායම් එකතුව** | **(229,125)** | 388,208 | (159) | **(262,133)** | 427,573 | (161) |
| **ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කළ යුතු නොවන වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | | | |
| වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට පවතින හිමිකම් උපකරණවල ආයෝජනයන්හි සාධාරණ අගයෙහි වෙනස්වීම | **1,587,818** | 2,538,631 | (37) | **1,603,677** | 2,705,001 | (41) |
| ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට පවතින මූල්‍ය වගකීම් මත බැංකුවේ ණය අවදානම ආරෝපණය කිරීමේ සාධාරණ වෙනස්වීම | **–** | – | – | **–** | – | – |
| සේවාවසාන ප්‍රතිලාභ බැඳීම් නැවත ආගණනය | **(3,335,729)** | (2,228,542) | 50 | **(3,335,546)** | (2,231,825) | 49 |
| ඉහත අයිතම සඳහා විලම්බිත බදු බලපෑම | **729,878** | 486,042 | 50 | **729,823** | 487,027 | 50 |
| **සේවාවසාන ප්‍රතිලාභ බැඳීම් නැවත ආගණනය (බදු පසු)** | **(2,605,851)** | (1,742,500) | 50 | **(2,605,723)** | (1,744,798) | 49 |
| ප්‍රත්‍යාගණන අතිරික්තයේ වෙනස්වීම් | **–** | – | – | **–** | – | – |
| ඉහත අයිතම සඳහා විලම්බිත බදු බලපෑම | **–** | – | – | **–** | – | – |
| ප්‍රත්‍යාගණන අතිරික්තයේ වෙනස්වීම් (බදු පසු) | **–** | – | – | **–** | – | – |
| ආශ්‍රිත සමාගම් සහ බද්ධ ව්‍යාපාර වල ලාභයෙන් හිමි කොටස | **–** | – | – | **–** | – | – |
| **ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණ කළ යුතු නොවන වෙනත් විස්තීර්ණ ආදායම් එකතුව** | **(1,018,033)** | 796,131 | (228) | **(1,002,046)** | 960,203 | (204) |
| **වර්ෂයට අදාළ වෙනත් විස්තීර්ණ ආදායම්, බදු ගෙවූ පසු** | **(1,247,158)** | 1,184,339 | (205) | **(1,264,179)** | 1,387,776 | (191) |
| **වර්ෂයට අදාළ මුළු විස්තීර්ණ ආදායම** | **26,073,600** | 17,306,731 | 51 | **26,898,373** | 18,884,737 | 42 |
| **ලාභය බෙදී යන ආකාරය** | | | | | | |
| බැංකුවේ කොටස් හිමියන් | **26,073,600** | 17,306,731 | 51 | **26,898,373** | 18,884,737 | 42 |
| පාලනයට යටත් නොවන හිමිකම් | **–** | – | – | **–** | – | – |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | **26,073,600** | 17,306,731 | 51 | **26,898,373** | 18,884,737 | 42 |

308 පිටුවේ සිට 438 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | සටහන | පිටුව | බැංකුව 2025 රු. '000 | බැංකුව 2024 රු. '000 | බැංකුව වෙනස (%) | සමූහය 2025 රු. '000 | සමූහය 2024 රු. '000 | සමූහය වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | | | |
| මුදල් හා මුදල්වලට සමානයන් | 16 | 338 | 8,326,738 | 8,358,742 | (0.4) | 8,386,287 | 8,544,416 | (2) |
| මහ බැංකුව වෙතැති ශේෂයන් | 17 | 339 | 167,212 | 357,054 | (53) | 167,236 | 357,117 | (53) |
| බැංකුවල ඇති තැන්පතු | 18 | 339 | 24,181,317 | 14,794,637 | 63 | 24,181,317 | 14,794,637 | 63 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 19 | 340 | 68,813 | 9,131 | 654 | 83,979 | 54,892 | 53 |
| ලාභ අලාභ මඟින් හඳුනාගත් මූල්‍ය වත්කම් | 20 | 341 | | | | | | |
| – සාධාරණ අගයට ගණනය කළ | | | 22,158,765 | 21,086,781 | 5 | 78,625,066 | 46,749,528 | 68 |
| – සාධාරණ අගයට නම් කළ | | | – | – | – | – | – | – |
| ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් | | | | | | | | |
| – ණය හා අත්තිකාරම් | 21 | 343 | 550,828,369 | 532,379,013 | 3 | 550,639,060 | 527,715,322 | 4 |
| – ණය හා වෙනත් උපකරණ | 22 | 349 | 1,092,989,914 | 1,039,034,572 | 5 | 1,096,342,623 | 1,048,965,769 | 5 |
| වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් | 23 | 352 | 64,634,698 | 53,469,178 | 21 | 67,997,754 | 55,306,512 | 23 |
| පාලිත සමාගම්වල ආයෝජනයන් | 24 | 356 | 7,311,000 | 7,311,000 | – | – | – | – |
| ආශ්‍රිත සමාගම්වල සහ බද්ධ ව්‍යාපාරවල ආයෝජනයන් | 25 | 356 | – | – | – | – | – | – |
| දේපල, පිරියත සහ උපකරණ | 26 | 357 | 17,311,732 | 17,415,792 | (1) | 18,448,620 | 18,556,112 | (1) |
| භාවිතයට අයිතිය ඇති වත්කම් | 27 | 360 | 1,244,252 | 1,041,185 | 20 | 1,265,447 | 1,066,014 | 19 |
| දේපළ ආයෝජන | 28 | 361 | – | – | – | 349,000 | 349,000 | – |
| කීර්තිනාමය හා අස්පෘශ්‍ය වත්කම් | 29 | 362 | 2,380,283 | 2,183,860 | 9 | 2,383,250 | 2,185,087 | 9 |
| විලම්බිත බදු වත්කම් | 30 | 364 | 6,562,684 | 4,995,021 | 31 | 6,562,684 | 4,995,021 | 31 |
| වෙනත් වත්කම් | 31 | 366 | 32,858,406 | 50,002,248 | (34) | 32,906,100 | 50,127,502 | (34) |
| **මුළු වත්කම්** | | | 1,831,024,183 | 1,752,438,214 | 4 | 1,888,338,423 | 1,779,766,929 | 6 |
| **වගකීම්** | | | | | | | | |
| බැංකු වලට ගෙවිය යුතු | 32 | 367 | 80,972 | 487,521 | (83) | 80,972 | 487,521 | (83) |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 33 | 367 | 13 | 258,409 | (100) | 13 | 258,409 | (100) |
| ලාභ අලාභ මඟින් හඳුනාගත් මූල්‍ය වගකීම් | 34 | 367 | – | – | – | – | – | – |
| ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වගකීම් | 35 | 368 | | | | | | |
| – තැන්පත්කරුවන්ට ගෙවිය යුතු | | | 1,608,490,322 | 1,556,270,863 | 3 | 1,608,891,967 | 1,556,681,918 | 3 |
| – ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවිය යුතු | | | – | – | – | – | – | – |
| – වෙනත් ණය ගැනීම් සඳහා ගෙවිය යුතු | | | 39,057,116 | 48,190,057 | (19) | 93,629,216 | 66,049,093 | 42 |
| කල්බදු වගකීම් | 36 | 369 | 1,492,523 | 1,281,561 | 16 | 1,522,484 | 1,314,177 | 16 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | 37 | 370 | 16,911,043 | 16,966,482 | (0.3) | 16,983,801 | 17,039,651 | (0.3) |
| සේවාවසාන ප්‍රතිලාභ බැඳීම් | 38 | 372 | 19,922,794 | 17,489,868 | 14 | 19,941,644 | 17,597,407 | 13 |
| ප්‍රවර්තන බදු වගකීම් | 39 | 382 | 8,483,816 | 3,648,729 | 133 | 8,798,200 | 4,054,844 | 117 |
| විලම්බිත බදු වගකීම් | 30 | 364 | – | – | – | 73,495 | 61,869 | 19 |
| වෙනත් වෙන්කිරීම් | 40 | 382 | – | – | – | – | – | – |
| වෙනත් වගකීම් | 41 | 382 | 17,534,957 | 9,002,109 | 95 | 10,549,051 | 9,387,245 | 12 |
| පාලිත සමාගම්වලට ගෙවිය යුතු | 42 | 382 | – | – | – | – | – | – |
| **මුළු වගකීම්** | | | 1,711,973,556 | 1,653,595,599 | 4 | 1,760,470,843 | 1,672,932,134 | 5 |

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | | | බැංකුව | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | සටහන | පිටුව | **2025 රු. '000** | 2024 රු. '000 | වෙනස (%) | **2025 රු. '000** | 2024 රු. '000 | වෙනස (%) |
| **හිමිකම්** | | | | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය | 43 | 383 | **9,400,000** | 9,400,000 | – | **9,400,000** | 9,400,000 | – |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 44 | 383 | **6,241,292** | 5,694,877 | 10 | **6,364,888** | 5,810,742 | 10 |
| රඳවාගත් ඉපැයීම් | 45 | 383 | **46,545,531** | 28,462,305 | 64 | **52,797,100** | 33,771,814 | 56 |
| වෙනත් සංචිත | 46 | 384 | **56,863,804** | 55,285,433 | 3 | **59,305,592** | 57,852,239 | 3 |
| අයිතිකරුවන්ගේ මුළු හිමිකම | | | **119,050,627** | 98,842,615 | 20 | **127,867,580** | 106,834,795 | 20 |
| පාලනයට යටත් නොවන හිමිකම් | 47 | 386 | **–** | – | – | **–** | – | – |
| **මුළු හිමිකම** | | | **119,050,627** | 98,842,615 | 20 | **127,867,580** | 106,834,795 | 20 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | | **1,831,024,183** | 1,752,438,214 | 4 | **1,888,338,423** | 1,779,766,929 | 6 |
| **අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්** | 48 | 386 | **12,653,943** | 15,042,447 | (16) | **12,655,443** | 15,050,755 | (16) |
| **නාමික තොරතුරු** | | | | | | | | |
| සේවක සංඛ්‍යාව | | | **4,203** | 4,212 | | | | |
| ශාඛා සංඛ්‍යාව | | | **263** | 262 | | | | |

සටහන: හානිකරණයෙන් හා ක්ෂය කිරීමෙන් පසු ශුද්ධ අගයන් දක්වා ඇත.


308 පිටුවේ සිට 438 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

**සහතික කිරීම**
ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශනවලින් 2025 දෙසැම්බර් 31 දිනට බැංකුවේ කටයුතු සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි ලාභය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පෙන්නුම් කරන බවට සහතික කරමි.



**අජිත් අක්මීමන**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මුදල්, සැලසුම් සහ කළමනාකරණ තොරතුරු පද්ධති) / ප්‍රධාන මූල්‍ය නිලධාරී

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම, අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.
අනුමත කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.



**ආචාර්ය හර්ෂ කබ්රාල්, ජනාධිපති නීතිඥ**
සභාපති



**සුපුල් විජේසිංහ**
අධ්‍යක්ෂ



**ප්‍රෑඩ් නිලුක්ෂාන්**
අධ්‍යක්ෂ

2026 පෙබරවාරි 23
කොළඹ
ශ්‍රී ලංකාව

# හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

බැංකුව

| |
|---|
| **2024 ජනවාරි 01 දිනට ශේෂය** |
| 2024 වර්ෂය සඳහා ලාභය |
| වෙනත් විස්තීර්ණ ආදායම් (බදු පසු) |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** |
| **හිමිකමට සෘජුව ගලපන ලද හිමිකරුවන් සමඟ සිදුකළ ගනුදෙනු** |
| වර්ෂය තුළ සංචිත වෙත/වෙතින් මාරුකිරීම් |
| ඒකාබද්ධ අරමුදලට දායකවීම්-ලාභාංශ/විශේෂ බදු |
| හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරුකිරීම් |
| **හිමිකම් දරන්නන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු එකතුව** |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
| 2025 වර්ෂය සඳහා ලාභය |
| වෙනත් විස්තීර්ණ ආදායම් (බදු පසු) |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** |
| **හිමිකමට සෘජුව ගලපන ලද හිමිකරුවන් සමඟ සිදුකළ ගනුදෙනු** |
| වර්ෂය තුළ සංචිත වෙත/වෙතින් මාරුකිරීම් |
| ඒකාබද්ධ අරමුදලට දායකවීම්-ලාභාංශ/විශේෂ බදු |
| දේපල ප්‍රත්‍යාගණනය කිරීමේ අතිරික්තය/(ආපසු හැරවීම) |
| හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරුකිරීම් |
| **හිමිකම් දරන්නන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු එකතුව** |
| **2025 දෙසැම්බර් 31 දිනට ශේෂය** |

308 පිටුවේ සිට 438 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය/ පවරන ලද ප්‍රාග්ධනය | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | ප්‍රත්‍යාගණන සංචිතය | වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය | වෙනත් සංචිත | රඳවාගත් ඉපයුම් | මුළු හිමිකම |
|---|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| | 9,400,000 | 5,369,172 | 7,946,216 | 1,286,463 | 42,964,284 | 14,408,118 | 81,374,253 |
| | – | – | – | – | – | 16,122,392 | 16,122,392 |
| | – | – | – | 2,926,839 | – | (1,742,500) | 1,184,339 |
| | – | – | – | 2,926,839 | – | 14,379,892 | 17,306,731 |
| | – | 325,705 | – | – | – | (325,705) | – |
| | – | – | – | – | – | – | – |
| | – | – | – | – | 161,631 | – | 161,631 |
| | – | 325,705 | – | – | 161,631 | (325,705) | 161,631 |
| | 9,400,000 | 5,694,877 | 7,946,216 | 4,213,302 | 43,125,915 | 28,462,305 | 98,842,615 |
| | – | – | – | – | – | 27,320,758 | 27,320,758 |
| | – | – | – | 1,358,693 | – | (2,605,851) | (1,247,158) |
| | – | – | – | 1,358,693 | – | 24,714,907 | 26,073,600 |
| | – | 546,415 | – | – | – | (546,415) | – |
| | – | – | – | – | – | (6,088,296) | (6,088,296) |
| | – | – | (3,030) | – | – | 3,030 | – |
| | – | – | – | – | 222,708 | – | 222,708 |
| | – | 546,415 | (3,030) | – | 222,708 | (6,631,681) | (5,865,588) |
| | 9,400,000 | 6,241,292 | 7,943,186 | 5,571,995 | 43,348,623 | 46,545,531 | 119,050,627 |

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

**සමූහය**

| | |
|---|---|
| **2024 ජනවාරි 01 දිනට ශේෂය** | |
| 2024 වර්ෂය සඳහා ලාභය | |
| වෙනත් විස්තීර්ණ ආදායම් (බදු පසු) | |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | |
| **හිමිකමට සෘජුව ගලපන ලද හිමිකරුවන් සමඟ සිදුකළ ගනුදෙනු** | |
| වර්ෂය තුළ සංචිත වෙත/වෙතින් මාරුකිරීම් | |
| ඒකාබද්ධ අරමුදලට දායකවීම්-ලාභාංශ/විශේෂ බදු | |
| හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරුකිරීම් | |
| **හිමිකම් දරන්නන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු එකතුව** | |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | |
| 2025 වර්ෂය සඳහා ලාභය | |
| වෙනත් විස්තීර්ණ ආදායම් (බදු පසු) | |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | |
| **හිමිකමට සෘජුව ගලපන ලද හිමිකරුවන් සමඟ සිදුකළ ගනුදෙනු** | |
| වර්ෂය තුළ සංචිත වෙත/වෙතින් මාරුකිරීම් | |
| ඒකාබද්ධ අරමුදලට දායකවීම්-ලාභාංශ/විශේෂ බදු | |
| දේපල ප්‍රත්‍යාගණනය කිරීමේ අතිරික්තය/(ආපසු හැරවීම) | |
| හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරුකිරීම් | |
| **හිමිකම් දරන්නන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු එකතුව** | |
| **2025 දෙසැම්බර් 31 දිනට ශේෂය** | |

308 පිටුවේ සිට 438 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය/ පවරන ලද ප්‍රාග්ධනය | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | ප්‍රත්‍යාගණන සංචිතය | වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය | වෙනත් සංචිත | රඳවාගත් ඉපයුම් | මුළු හිමිකම |
|---|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| | 9,400,000 | 5,464,218 | 8,642,884 | 1,433,850 | 44,241,756 | 18,605,719 | 87,788,427 |
| | – | – | – | – | – | 17,496,961 | 17,496,961 |
| | – | – | – | 3,132,574 | – | (1,744,798) | 1,387,776 |
| | – | – | – | 3,132,574 | – | 15,752,163 | 18,884,737 |
| | – | 346,524 | – | – | 239,544 | (586,068) | – |
| | – | – | – | – | – | – | – |
| | – | | – | – | 161,631 | | 161,631 |
| | – | 346,524 | – | | 401,175 | (586,068) | 161,631 |
| | 9,400,000 | 5,810,742 | 8,642,884 | 4,566,424 | 44,642,931 | 33,771,814 | 106,834,795 |
| | – | – | – | – | – | 28,162,552 | 28,162,552 |
| | – | – | – | 1,061,881 | – | (2,326,060) | (1,264,179) |
| | – | – | – | 1,061,881 | – | 25,836,492 | 26,898,373 |
| | – | 554,146 | – | – | 171,794 | (725,940) | – |
| | – | – | – | – | – | (6,088,296) | (6,088,296) |
| | – | – | (3,030) | – | – | 3,030 | – |
| | – | – | – | – | 222,708 | – | 222,708 |
| | – | 554,146 | (3,030) | – | 394,502 | (6,811,206) | (5,865,588) |
| | 9,400,000 | 6,364,888 | 8,639,854 | 5,628,305 | 45,037,433 | 52,797,100 | 127,867,580 |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | පිටුව | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| **මෙහෙයුම් කටයුතු වලින් ලත් මුදල් ප්‍රවාහ** | | | | | | |
| පොලී ලැබීම් | | | **190,765,104** | 202,040,657 | **195,108,335** | 207,054,865 |
| පොලී ගෙවීම් | | | **(110,450,988)** | (141,113,474) | **(112,773,629)** | (120,872,004) |
| ශුද්ධ කොමිස් ලැබීම් | | | **2,560,332** | 1,750,558 | **2,561,458** | 1,756,353 |
| වෙළඳාම් කටයුතු වලින් ලද ආදායම | | | **740,505** | 1,319,972 | **1,417,338** | 2,050,386 |
| සේවක මණ්ඩල ගෙවීම් | | | **(19,133,809)** | (19,229,579) | **(19,250,556)** | (19,753,044) |
| මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | | | **(12,686,629)** | (9,495,582) | **(13,008,523)** | (10,045,524) |
| වෙනත් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබීම් | | | **474,263** | 341,384 | **518,375** | 351,186 |
| වෙනත් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලට ගෙවීම් | | | **(8,035,120)** | (6,999,833) | **(8,238,825)** | (7,212,338) |
| **මෙහෙයුම් වත්කම් හා වගකීම්වල වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | | | **44,233,658** | 28,614,103 | **46,333,973** | 53,329,880 |
| **මෙහෙයුම් වත්කම්වල (වැඩිවීම)/අඩුවීම** | | | | | | |
| බැංකුවල ඇති තැන්පතු | | | **(9,392,784)** | 7,060,549 | **(9,392,784)** | 8,026,324 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | | | **258,395** | (241,327) | **288,990** | (276,780) |
| ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට පවතින මූල්‍ය වත්කම් | | | **(800,005)** | (3,106,029) | **(31,200,280)** | (6,325,589) |
| ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම් | | | **(21,776,943)** | (15,430,619) | **(26,196,305)** | (13,466,139) |
| ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ | | | **(40,749,916)** | (91,233,762) | **(41,703,119)** | (91,744,837) |
| මූල්‍ය ආයෝජන විකිණීම හා කල්පිරීම මඟින් ලත් මුදල් | | | **–** | – | **–** | – |
| වෙනත් වත්කම් | | | **17,324,173** | 17,754,749 | **17,381,158** | 17,794,102 |
| | | | **(55,137,080)** | (85,196,439) | **(90,822,340)** | (85,992,919) |
| **මෙහෙයුම් වගකීම්වල වැඩිවීම/(අඩුවීම)** | | | | | | |
| බැංකු වලට ගෙවිය යුතු | | | **–** | (8,750,000) | **1,070** | (20,625,367) |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 33 | 367 | **(258,395)** | 258,208 | **(258,395)** | 258,208 |
| ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් - තැන්පත්කරුවන්ට ගෙවියයුතු | | | **52,978,422** | 85,708,062 | **52,965,492** | 85,696,513 |
| ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් - ණය සුරුකුම්පත් හිමියන්ට ගෙවියයුතු | | | **–** | – | **–** | – |
| ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් - වෙනත් ණය ගැනීම් සඳහා ගෙවියයුතු | | | **(10,529,563)** | (12,579,138) | **25,397,132** | (23,170,978) |
| නිකුත්කළ ණය සුරුකුම්පත් | 37 | 370 | **–** | (6,323,000) | **–** | (6,323,000) |
| වෙනත් වගකීම් | | | **(207,349)** | (5,895,370) | **(450,799)** | (5,757,565) |
| | | | **41,983,115** | 52,418,762 | **77,654,500** | 30,077,811 |
| **ආදායම් බදු පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලත් ශුද්ධ මුදල් ප්‍රවාහ** | | | **31,079,693** | (4,163,574) | **33,166,133** | (2,585,228) |
| ගෙවූ ආදායම් බදු | 39 | 382 | **(13,008,193)** | (5,035,397) | **(13,674,766)** | (5,637,408) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වල (යෙදවූ)/වලින් ලත් ශුද්ධ මුදල්** | | | **18,071,500** | (9,198,971) | **19,491,367** | (8,222,636) |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | පිටුව | බැංකුව 2025 රු. '000 | බැංකුව 2024 රු. '000 | සමූහය 2025 රු. '000 | සමූහය 2024 රු. '000 |
|---|---|---|---|---|---|---|
| **ආයෝජන කටයුතුවලින් ලත් මුදල් ප්‍රවාහ** | | | | | | |
| දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම් | | | (779,736) | (620,581) | (785,712) | (630,105) |
| දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලත් මුදල් | | | 4,865 | 7,287 | 5,095 | 7,287 |
| වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට පවතින මූල්‍ය උපකරණවල ශුද්ධ (වැඩිවීම්)/අඩුවීම් | | | (9,692,542) | 11,877,564 | (11,229,228) | 11,058,062 |
| මූල්‍ය ආයෝජන විකිණීම හා කල්පිරීම මඟින් ලත් මුදල් | | | – | – | – | – |
| අස්පෘශ්‍ය වත්කම් ශුද්ධ මිලදී ගැනීම් | | | (733,067) | (177,346) | (736,255) | (177,346) |
| ආයෝජන දේපළවල ශුද්ධ මිලදී ගැනීම් සහ වැඩිදියුණු කිරීම් | | | – | – | – | – |
| පාලිත හා ආශ්‍රිත සමාගම්වල ආයෝජන අත්පත් කර ගැනීම මඟින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | | – | – | – | – |
| පාලිත හා ආශ්‍රිත සමාගම්වල ආයෝජනයෙන් ලද ලාභාංශ | | | – | – | – | – |
| **ආයෝජන ක්‍රියාකාරකම්වල (යෙදවූ)/වලින් ලත් ශුද්ධ මුදල්** | | | (11,200,480) | 11,086,924 | (12,746,100) | 10,257,898 |
| **මූල්‍යනය කිරීමේ කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ** | | | | | | |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය නිකුත් කිරීමෙන් ලද ශුද්ධ මුදල් | | | – | – | – | – |
| යටත්කාලීන ණය නිකුත් කිරීම් මඟින් ලත් ශුද්ධ මුදල් | | | – | – | – | – |
| යටත්කාලීන ණය ආපසු ගෙවීම් | | | – | – | (294) | – |
| යටත්කාලීන ණය මත ගෙවූ පොළිය | | | (1,686,673) | (3,223,872) | (1,686,790) | (3,223,872) |
| ඒකාබද්ධ අරමුදලට දායකවීම් - ලාභාංශ/විශේෂ බදු | | | (5,000,000) | – | (5,000,000) | – |
| **මූල්‍යන කටයුතු වලින් ලද ශුද්ධ මුදල්** | | | (6,686,673) | (3,223,872) | (6,687,084) | (3,223,872) |
| **මුදල් හා මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්)** | | | 184,347 | (1,335,919) | 58,183 | (1,188,610) |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමානයන් | | | 8,228,822 | 9,564,741 | 8,414,559 | 9,603,169 |
| මුදල් හා මුදල් සමානයන්ගේ විනිමය වෙනස | | | – | – | – | – |
| **වර්ෂය අවසාන දිනට මුදල් හා මුදල් වලට සමානයන්** | | | 8,413,169 | 8,228,822 | 8,472,742 | 8,414,559 |
| **මුදල් හා මුදල් සමානයන් අයිතම සැසඳීම** | | | | | | |
| අතැති මුදල් | 16 | 338 | 4,680,659 | 4,496,582 | 4,682,459 | 4,499,644 |
| බැංකුව වෙතැති ශේෂයන් | 16 | 338 | 3,414,983 | 3,645,461 | 3,472,732 | 3,828,073 |
| ඉල්ලුම් සහ කෙටිකාලීන තැන්පතු | 16 | 338 | 231,287 | 217,246 | 231,287 | 217,246 |
| ශ්‍රී ලංකා මහ බැංකුව වෙතැති ශේෂයන් | 17 | 339 | 167,212 | 357,054 | 167,236 | 357,117 |
| බැංකුවලට ගෙවිය යුතු | 32 | 367 | (80,972) | (487,521) | (80,972) | (487,521) |
| | | | 8,413,169 | 8,228,822 | 8,472,742 | 8,414,559 |

308 පිටුවේ සිට 438 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 1 වාර්තාකරණ ඒකකය

### 1.1 ආයතනික තොරතුරු

ජාතික ඉතිරිකිරීමේ බැංකුව, 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත යටතේ 1972 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ස්ථාපනය කරන ලද බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි. එය 1988 අංක 30 දරන බැංකු පනත හා එහි සංශෝධන යටතේ නියාමනය වන බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි. බැංකුවේ ලියාපදිංචි කාර්යාලය, අංක 255, "ඉතිරිකිරීමේ මන්දිරය" ගාලුපාර, කොළඹ 03, ශ්‍රී ලංකාව යන ලිපිනයෙහි පිහිටා ඇත.

| සේවක සංඛ්‍යාව | 2025 | 2024 |
|---|---|---|
| බැංකුව | 4,203 | 4,212 |
| සමූහය | 4,224 | 4,331 |

වාර්ෂික වාර්තාවේ පසුපස කවරයේ ඇතුළත ආයතනික තොරතුරු දක්වා ඇත.

සේවා සැපයුම් ස්ථාන ලෙස ශාඛා 263 ක්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 295 ක් හා සී.ආර්.එම් යන්ත්‍ර 123 ක් ද බැංකුව සතුව පවතින අතර, නියෝජිත ජාල ලෙස තැපැල් කාර්යාල 651 ක් සහ උප තැපැල් කාර්යාල 3,351 ක් බැංකුව සතුව පවතී.

### 1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයෙහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට බැංකුව (මව් සමාගම) සහ එහි පූර්ණ අයිතියට යටත් එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව නම්වූ පාලිත සමාගම් දෙක ඇතුළත් වේ. (පොදුවේ "සමූහය" ලෙසද තනිව ගත් කල "බැංකුව" ලෙස ද ඇතුළත් වේ).

බැංකුවෙහි පූර්ණ අයිතිය ශ්‍රී ලංකා රජය සතුවේ. බැංකුව සමූහයෙහි අවසන් පරිපාලකයා වේ. බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන සඳහා දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් පාදක වෙයි. සෑම වසරකදීම පාර්ලිමේන්තුවේ දී සභාගත කිරීම පිණිස, දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන මාස දොළහක කාලපරිච්ඡේදය සඳහා "බැංකුවේ" සහ "සමූහයේ" මූල්‍ය ප්‍රකාශන බැංකුව විසින් පිළියෙල කරනු ලබයි.

### 1.3 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

#### බැංකුව

පෙර පරිදිම, ශ්‍රී ලාංකික ජනතාව අතර ඉතිරි කිරීම ප්‍රගුණ කරවීමත් එසේ එක්රැස් කරගන්නා ලද ඉතුරුම් ලාභදායී අයුරින් ආයෝජනය කිරීමත් බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. තැන්පතු භාර ගැනීම, ආයතනික සහ පාරිභෝගික ණය, ව්‍යාපාර මූල්‍යයනය, රාජ්‍ය ව්‍යාපෘති සඳහා ණය, උකස් ණය, ඩිජිටල් බැංකුකරණය, එස්. එම්. එස්. බැංකුකරණය යනාදී මූල්‍ය විසඳුම් රැසක් ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙතින් සැපයෙයි. 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත ප්‍රකාර බැංකුව එහි තැන්පතුවලින් අවම වශයෙන් 60% ක් රාජ්‍ය සුරැකුම්පත්හි ආයෝජනය කිරීමට බැඳී සිටී.

#### පාලිත සමාගම්

##### සීමාසහිත එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම

සීමාසහිත එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම, ප්‍රාථමික අලෙවිකරුවකු වශයෙන් කටයුතු කරන අතර, රජයේ සුරැකුම්පත් ගනුදෙනු කිරීමෙහි යෙදී සිටියි.

##### සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

ඉතුරුම් හා කාලීන තැන්පතු සංචලනය, ණය, කල්බදු, කුලී පිට ගැනුම්, උකස් ණය හා වෙනත් ණය පහසුකම් සැපයීම සහ සීමාසහිත ප්‍රමුඛ ඉතිරිකිරීමේ හා සංවර්ධන බැංකුවේ ණය ගිණුම් ප්‍රතිව්‍යුහගත කිරීමත් සමඟ සී.ස. ප්‍රමුඛ ඉතිරිකිරීමේ හා සංවර්ධන බැංකුවේ පැහැර හරිනු ලැබූ තැන්පතු වගකීම් පියවීම යනාදිය බැංකුවේ මූලික ක්‍රියාකාරකම් යටතට අයත් විණි. ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමඟ ඒකාබද්ධවීමේ ක්‍රියාපටිපාටිය හේතුවෙන් 2021 වර්ෂයේ සිට ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව නව ණය ප්‍රදානය, තැන්පතු භාර ගැනීම, නව සේවක බඳවා ගැනීම් සහ කිසියම් පාර්ශ්වයක් සමඟ නව ගිවිසුම්වලට එළඹීමෙන් වළකින ලදී. ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ වත්කම්, වගකීම් හා කාර්ය මණ්ඩලය ජාතික ඉතිරිකිරීමේ බැංකුවට අවශෝෂණය කර ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව ඈවර කරනු ලැබීමට නියමිතය.

## 2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී වෙනත් ආකාරයකට දක්වා ඇති බවට සඳහනක් නොවේ නම්, සෑම කාලපරිච්ඡේදයකදීම පහත සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති උපයෝගී කරගනු ලැබ ඇත. බැංකුවේ මෙම ප්‍රතිපත්ති නොකඩවාම සමූහය විසින් උපයෝගී කරගනු ලැබ ඇති අතර ඉන් පරිභාහිර අවස්ථාවන් ඒ අනුව හෙළිදරව් කර ඇත.

### 2.1 ගිණුම් පිළියෙල කිරීමේ පදනම

#### 2.1.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

ආදායම් ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම දක්වන ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට සටහන් යනාදියෙන් සමන්විත බැංකුවේ මූල්‍ය ප්‍රකාශන හා සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS සහ LKAS) අනුකූලව වන අතර, එය 1988 අංක 30 දරන බැංකු පනත සහ එහි සංශෝධන වලටද අනුකූල වේ. මුදල් ප්‍රවාහ තොරතුරු හැරුණු කොට සෙසු මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත්තේ උපචිත පදනමටය.

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී භාවිත කරන ලද ආකෘති ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකුවල වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම සහ ප්‍රකාශනය කිරීම සඳහා බලපත්‍රලාභී බැංකුවල වාර්ෂික හා කාර්තුමය මූල්‍ය ප්‍රකාශ හා වෙනත් හෙළිදරව් කිරීම් ප්‍රකාශයට පත්කිරීම පිළිබඳ 2024 දෙසැම්බර් 31 දිනැති චක්‍රලේඛ අංක 2024 හි 05 මඟින් නිර්දේශ කර ඇති ආකෘතියට ද අනුකූල වේ.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

### 2.1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතෙහි හා එහි සංශෝධනවල ප්‍රතිපාදන ප්‍රකාර, බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමයි. "අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව", "මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය", මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සහතිකකරණය මඟින් දක්වා ඇති පරිදි මූල්‍ය ප්‍රකාශ සඳහා සිය වගකීම, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළිගනු ලබයි.

මෙකී මූල්‍ය ප්‍රකාශයන්ට පහත කොටස් අන්තර්ගත වේ.

I. සමාලෝචිත වර්ෂය සඳහා බැංකුවේ හා සමූහයේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ විස්තර සපයන ආදායම් ප්‍රකාශය හා වෙනත් විස්තීර්ණ ආදායම (පිටු අංක 298 හා 299)

II. වර්ෂාවසානයට බැංකුවේ හා සමූහයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු සපයන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය (පිටු අංක 300 හා 301)

III. සමාලෝචනයට බඳුන් වූ වර්ෂය තුළ බැංකුවේ හා සමූහයේ කොටස්හිමියන්ගේ අරමුදල්වල සියලු වෙනස්කම් දැක්වෙන හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය (පිටු අංක 302 හා 304)

IV. මුදල් හා මුදල්වලට සමාන දෑ ජනනය කිරීමට බැංකුව හා සමූහය සතු හැකියාව මෙන්ම එම මුදල් ප්‍රවාහ භාවිතය පිළිබඳ විස්තර සපයන මූල්‍ය ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය (පිටු අංක 306)

V. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වෙනත් සවිස්තරාත්මක කරුණු ඇතුළත් මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන් (පිටු අංක 308 හා 438)

### 2.1.3 මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන (2024 වර්ෂය හා සන්සන්දනාත්මක තොරතුරු සමඟ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026 පෙබරවාරි 23 දින අනුමත කරන ලදි. (2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025 පෙබරවාරි 28 වන දින අනුමත කර පළ කිරීම සඳහා අවසර දෙන ලදි).

### 2.1.4 මිනුම්කරණ පදනම

මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ සාධාරණ අගය මත ගණනය කර ඇති පහත අයිතමයන් හැරුණු කොට බැංකුවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත.

I. වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් (සටහන් අංක 23)

II. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ (සටහන් අංක 19 හා 33)

III. ලාභ හෝ අලාභ මඟින් හඳුනාගනු ලැබූ මූල්‍ය වත්කම් සහ වගකීම් (සටහන් අංක 20 හා 34)

IV. ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම් සහ වගකීම් (සටහන් අංක 20)

V. අත්පත් කර ගැනීමේදී පිරිවැයට මනිනු ලබන හා පසුව සාධාරණ අගය මත ප්‍රත්‍යාගණිත අගයන් අනුව මිනුම් කරනු ලබන ඉඩම් හා ගොඩනැගිලි (සටහන් අංක 26)

VI. මූලිකව පිරිවැයට හඳුනාගනු ලබන, පසුව සාධාරණ අගයට අනුව මනිනු ලබන ආයෝජන දේපළ (සටහන් අංක 28)

VII. නිශ්චිත ප්‍රතිලාභ වගකීම්වල වර්තමාන වටිනාකමෙන් සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගය ඉන් අඩු කිරීමෙන් පසු සේවක නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වල වගකීම හඳුනාගනු ලබයි. (සටහන් අංක 38) සැලසුම්ගත වත්කම්වල ශුද්ධ වටිනාකම අඩුකර, හඳුනානොගත් ආයුගණක ලැබීම් එකතුකර හඳුනා නොගත් පසුගිය සේවා පිරිවැය හා හඳුනානොගත් ආයුගණක අලාභ අඩු කළ පසු නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්හි වත්මන් අගය ලෙස නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල ශුද්ධ වගකීම හඳුනාගනු ලැබේ.

### 2.1.5 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කරනු ලබන ව්‍යවහාර මුදල

සමූහයේ මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන මූලික ආර්ථික පරිසරයේ ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් (රු.) වලින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇති අතර, විශේෂයෙන් දක්වා ඇති අවස්ථාවලදී හැරුණු කොට සියලුම අගයන් ආසන්න දහස් ස්ථානයට වටයා ඇත. සමාලෝචිත වර්ෂය තුළ සමූහයේ ඉදිරිපත් කළ වාර්තාවල ක්‍රියාකාරී මුදල හා ඉදිරිපත් කරනු ලැබූ ව්‍යාපාර මුදල අතර වෙනසක් වාර්තා වී නොමැත.

### 2.1.6 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඉදිරිපත් කර ඇති බැංකුවේ සහ සමූහයේ වත්කම් හා වගකීම්, ඒවායෙහි ස්වභාවය අනුව වර්ගකර, කල්පිරීමේ රටාව හා සාපේක්ෂ ද්‍රවශීලතා අනුපිළිවෙල පිළිබිඹු වන අයුරින් ලැයිස්තුගත කර ඇත.

මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමන සාධක සම්බන්ධයෙන් ගැලපීමක් සිදුකර නොමැත. බැංකුවේ හා සමූහයේ වත්කම් හා වගකීම්වල කල්පිරීමේ රටාවන්හි විශ්ලේෂණය සටහන් අංක 54.2.2 (පිටු අංක 412 සිට 415) හි දක්වා ඇත.

### 2.1.7 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පදනමක් මත ඉදිරියට පැවතීමට බැංකුවට ඇති හැකියාව පිළිබඳව කළමනාකාරිත්වය විසින් තක්සේරුවක් සිදුකර ඇති අතර ඉදිරි අනාගතයේ දී ව්‍යාපාර කටයුතුවල නිරතවීමට බැංකුව සතු ශක්‍යතාව පිළිබඳ සෑහීමට පත්වී ඇත. තවද අඛණ්ඩ පැවැත්ම සඳහා සමූහයට ඇති හැකියාව පිළිබඳ සැක පහළ වන සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි සාධකයක් කළමනාකාරිත්වයට හමු වී නොමැත. එහෙයින් අඛණ්ඩ පැවැත්ම යන පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම තව දුරටත් සිදු කෙරෙයි.

### 2.1.8 ප්‍රමාණාත්මකභාවය සහ සමාහරණය

සෑම ප්‍රමාණාත්මක සමාන අයිතම පන්තියක්ම මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන්ව ඉදිරිපත් කරනු ලබයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ල.ගි.ප්‍ර. 01) "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" මඟින් ඉඩදී ඇති පරිදි අසමාන ස්වභාවයේ අයිතමයන් හෝ කාර්යයන් ප්‍රමාණාත්මක නොවන දෑ ලෙස නොසලකයි නම් පමණක් ඒවා වෙන වෙනම ඉදිරිපත් කරනු ලබයි.

### 2.1.9 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වැඩි අවබෝධයක් ලබාගැනීම සඳහා සහ කාලපරිච්ඡේද දෙක සංසන්දනය කිරීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා මූල්‍ය ප්‍රකාශනයෙහි පසුගිය කාලපරිච්ඡේදයට අදාළ සංසන්දනාත්මක තොරතුරු ප්‍රමාණාත්මකව, විස්තරාත්මකව හෙළිදරව් කර ඇත. වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් අරභයා මෙන්ම ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම් සමඟ අනුරූපවීමට අවශ්‍ය අවස්ථාවලදී ද සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ග කර දක්වා ඇත. පිටු අංක 395 හි මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 53 යටතේ අදාළ සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇත.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

### 2.1.10 වැටයීම

"මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" පිළිබඳ ශ්‍රී ල.ගි.ප්‍ර. 01 - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් මඟින් අනුමත පරිදි වෙනයම් අයුරකින් දක්වා ඇති අවස්ථාවලදී හැරුණු විට මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ඇති අගය ආසන්න රුපියල් දහසට වටයා ඇත.

### 2.1.11 හිලව් කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ අගය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි සඳහන් කරනු ලබන්නේ හඳුනාගත් අගයන් හිලව් කිරීම නෛතිකව බලාත්මක කළ හැකි වූ හා ශුද්ධ පදනමක් මත පියවීමට හෝ එක්වරම වත්කම් උපලබ්ධි කර වගකීම් පියවීමට අදහස් කරන විට පමණි. ගිණුම්කරණ ප්‍රමිතියක්/අර්ථකථනයක් (අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරන ප්‍රමිතීන් අර්ථකථන කමිටුව සහ ප්‍රමිතීන් අර්ථකථන කමිටුව විසින් නිකුත් කරන ලද) සහ බැංකුවේ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් මඟින් නිශ්චිතව අනුමත කර හෝ අවශ්‍ය බව දක්වා ඇති විටකදී හැර ආදායම් සහ වියදම්, ආදායම් ප්‍රකාශයේ හිලව් කරනු නොලැබේ.

### 2.1.12 සැලකිය යුතු ගිණුම්කරණ තීන්දු, ඇස්තමේන්තු හා උපකල්පන

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලව වන පරිදි බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වත්කම්, වගකීම්, ආදායම් හා වියදම්වල අගයන් තීරණය කිරීම සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතය සම්බන්ධයෙන් තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන උපයෝගී කර ගැනීමට කළමනාකාරිත්වයට සිදු වේ. සැබෑ ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු වලින් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු හා උපකල්පන අඛණ්ඩව සමාලෝචනයට භාජනය කරයි. ගිණුම් ඇස්තමේන්තුවල යම් සංශෝධනයක් වෙතොත් එම සංශෝධනය කෙරෙන කාලපරිච්ඡේදය තුළදී, එම සංශෝධන ඉදිරි කාලපරිච්ඡේදයකට බලපාන්නේ නම්, ඉදිරි කාලපරිච්ඡේදවලදී ද ගිණුම්ගත කරනු ලැබේ.

බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අගයන් මත වැඩිම බලපෑමක් ඇති කිරීමට හැකි ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතයේ දී යොදාගත් සැලකිය යුතු තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන පහත දක්වා ඇත.

**අ. සැලකිය යුතු ගිණුම්කරණ තීන්දු**

මෙම මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති අගයන් සම්බන්ධයෙන් සැලකිය යුතු බලපෑමක් ඇති කරලන අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලදී ගනු ලබන තීන්දු, පිළිබඳව තොරතුරු පහත සටහන් අංක 2.1.12.1 මඟින් දැක්වේ.

#### 2.1.12.1 මූල්‍ය වත්කම් සහ වගකීම් වර්ගීකරණය

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 අනුව පහත නිර්නායක මත පදනම්ව ක්‍රමක්ෂය පිරිවැය, වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගය, ලාභය හෝ අලාභ මඟින් සාධාරණ අගය යන විවිධ කාණ්ඩවලට මූල්‍ය වත්කම් වර්ග කිරීමට හා මැනීමට සමූහයේ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මඟින් අවකාශය සැලසේ.

- පිටු අංක 314 හි සටහන් අංක 2.5.1.4.1 හි දක්වා ඇති මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීමේ ආයතනික ව්‍යාපාරික ආකෘතිය
- පිටු අංක 314 හි සටහන් අංක 2.5.1.4.2 හි දක්වා ඇති මූල්‍ය වත්කම්හි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ගුණාංග

#### 2.1.12.2 ආයෝජන දේපළ වර්ගීකරණය

ආයෝජන දේපළක් ලෙස දේපළක් සුදුසුකම් ලබන්නේ ද යන්න තීරණය කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් සිය විනිශ්චය යොදා ගනු ලබයි. කුලී ආදායමක් ඉපයීම සඳහා හෝ ප්‍රාග්ධන ඇගැයීම සඳහා හෝ ඒ ද්විත්වයම සඳහා රඳවාගනු ලබන දේපළක් හා ඒ ඔස්සේ සමූහයේ අන් වත්කම්වලින් ස්වාධීනව මූල්‍ය ප්‍රවාහ උත්පාදනය කරනු ලබන දේපළ ආයෝජන දේපළ ලෙස වර්ගීකරණය කරනු ලැබෙයි.

අනෙක් අතට භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හෝ සැපයීම සඳහා හෝ පරිපාලනය සඳහා උපයෝගී කරනු ලබන දේපළ සහ ඒ මඟින් අදාළ දේපළට පමණක් නොව නිෂ්පාදන හා සැපයුම් ක්‍රියාවලිය සඳහා උපයෝගී කර ගනු ලබන වෙනත් වත්කම් සඳහා දායක වන මූල්‍ය ප්‍රවාහ උත්පාදනය කරනු ලබන දෑ, දේපළ, පිරියත හා උපකරණ ලෙස වර්ගීකරණය කරනු ලැබෙයි.

ආයෝජන දේපළෙහි ගිණුම්කරණ වර්ගීකරණයන්, එම දේපළෙහි වර්තමාන භාවිතය සැළකිල්ලට ගනිමින් සමූහය වාර්ෂිකව තක්සේරුව සිදුකරනු ලබයි.

**ආ. උපකල්පන සහ අවිනිශ්චිතතා තක්සේරු කිරීම**

සැලකියයුතු වෙනස්වීම්වලට තුඩු දිය හැකි අන්දමේ උපකල්පන හා අවිනිශ්චිතතා තක්සේරු පිළිබඳ තොරතුරු පහත සටහන් අංක 2.1.12.2 සිට 2.1.12.9 මඟින් දක්වා ඇත.

#### 2.1.12.3 මූල්‍ය උපකරණවල සාධාරණ අගය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වාර්තා කර ඇති මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම්වල සාධාරණ අගයන්, සක්‍රීය වෙළෙඳපොළ තුළින් ලබාගත නොහැකි විට, එය තීරණය කිරීම සඳහා ගණිතමය ආකෘතීන් භාවිතය ද ඇතුළත් තක්සේරුකරණ ක්‍රමවේද යොදා ගැනෙයි. මෙකී ආකෘතීන් සඳහා යෙදවුම්, නිරීක්ෂණය කළහැකි වෙළෙඳපොළ දත්ත වෙතින් හැකි අවස්ථාවලදී ලබා ගන්නා අතර, නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපොළ දත්ත නොමැති විට සාධාරණ අගයක් ස්ථාපිත කර ගැනීමට තීන්දුවක් ගත යුතු වේ.

මූල්‍ය උපකරණ අගය කිරීම පිණිස යොදාගන්නා ක්‍රමවේද සහ සාධාරණ අගයන්හි ධූරාවලිය සටහන් අංක 55 මඟින් මූල්‍ය ප්‍රකාශනයෙහි පිටු අංක 429 හි සවිස්තරාත්මකව දක්වා ඇත.

#### 2.1.12.4 මූල්‍ය වත්කම් මත හානිකරණ අලාභ

සියලුම මූල්‍ය වත්කම් කාණ්ඩ, ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 සහ ශ්‍රී.ල.ගි.ප්‍ර. 39 යටතේ හානිකරණ අලාභ මිනීම සඳහා විශේෂයෙන්ම හානිකරණ අලාභ නිශ්චය කිරීමේදී ඉදිරි මුදල් ප්‍රවාහ වල අගය හා කාල වකවානුව සහ ඇප වටිනාකම්වල අගය පිළිබඳව නිසි තීන්දු ගැනීම අවශ්‍ය වේ.

ඒ අනුව, ආදායම් ප්‍රකාශයෙහි හානිකරණ අලාභ වාර්තා කළ යුතු දැයි තක්සේරු කිරීම පිණිස මූල්‍ය තත්ත්ව පිළිබඳව වාර්තා කරනු ලබන සෑම දිනයකදීම සමූහය විසින් එහි සැලකිය යුතු ණය හා අත්තිකාරම් පිළිබඳව තනි තනිව සමාලෝචනය කෙරෙයි. හානිකරණ අලාභ නිශ්චය කිරීමේ දී විශේෂයෙන්ම අනාගත මුදල් ප්‍රවාහ වල කාලය හා වටිනාකම තීරණය කිරීමට කළමනාකාරිත්වයේ තීන්දු අවශ්‍ය වේ. මෙකී ඇස්තමේන්තු පදනම් වනුයේ සාධක රාශියක් පිළිබඳ උපකල්පන ගණනාවක් මත වන හෙයින් සත්‍ය ප්‍රතිඵල මීට වෙනස්විය හැකිය.

හානිකරණය සඳහා කේවල ඇගයීමට ලක් කරනු ලබන මූල්‍ය වත්කම් සහ ඉදිරියේදී ලැබෙතැයි අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහවල වත්මන් අගය පිළිබඳ කළමනාකාරිත්වයේ නිසි ඇස්තමේන්තුව මත කේවල හානිකරණ ප්‍රතිපාදන පදනම් වේ. මෙම මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීමේදී ණයකරුගේ මූල්‍ය තත්ත්වය හා පාදක වූ ඇපවල ශුද්ධ උපලබ්ධි අගය පිළිබඳ කළමනාකාරිත්වය විසින් සලකා බැලෙයි. සෑම හානිකරණ වත්කමක්ම එහි වටිනාකම හා ප්‍රායෝගික උපාය මාර්ග, ආපසු ලබාගත හැකි යැයි සැලකෙන මුදල් ප්‍රවාහවල ඇස්තමේන්තුව මත ඇගයීමට ලක් කෙරෙයි.

## මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

පහත පරිදි සාමූහික හානිකරණ ප්‍රතිපාදන ස්ථාපිත කර ඇත.

- කේවල වශයෙන් නොසැලකෙන සමජාතීය ණය හා අත්තිකාරම් කාණ්ඩ
- කේවල වශයෙන් සැලකූ නමුත් කේවල වශයෙන් හානිකරණය වී නොමැති වත්කම් කාණ්ඩ
- ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 අනුව සමූහයේ අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීම, විවල්‍ය යෙදවුම් විකල්ප සහ ඒ මත වන අන්තර් යැපීමට පාදක උපකල්පන ගණනාවකින් යුත් සංකීර්ණ ආකෘතිවල ප්‍රතිඵලයකි. ගිණුම්කරණ තීන්දු හා ඇස්තමේන්තු ගණයෙහි ලා සැලකෙන අපේක්ෂිත ණය පාඩු ආකෘතිවලට පහත සාදක ඇතුළත් වේ.
- ණය අවදානමෙහි සැලකියයුතු වැඩිවීමක් වී ඇත්දැයි ගුණාත්මක ඇගයීම සඳහා සමූහයේ නිර්නායක සහ අපේක්ෂිත ජීවකාල ණය පාඩු පදනම මත මනිනු ලබන මූල්‍ය වත්කම් සඳහා වන දීමනා
- සාමූහික පදනමක් මත අපේක්ෂිත ණය පාඩු අගයනු ලබන අවස්ථාවේ මූල්‍ය වත්කම් වර්ගීකරණය
- විවිධ සංඛ්‍යාත්මක සූත්‍ර සහ යෙදවුම් විකල්ප ඇතුළත් අපේක්ෂිත ණය පාඩු ආකෘති සංවර්ධනය
- දළ දේශීය නිෂ්පාදිත වර්ධනය, උද්ධමනය, පොළී අනුපාතික, විනිමය අනුපාතික, විරැකියාව, ණය පැහැර හැරීමේ සම්භාවිතාවය (PD) නිරාවරණයවීමේ පාඩුව (EAD) හා පැහැර හැරීමකදී සිදුවිය හැකි පාඩුව (LGD) ආදී සර්ව ආර්ථික යෙදවුම් අතර සම්බන්ධතාවය තීරණය කිරීම.
- ආර්ථික යෙදවුම්, අපේක්ෂිත ණය පාඩු ආකෘති වලට අදාළ කර ගැනීම සඳහා ඉදිරි දැක්මැති සාර්ව ආර්ථික සංසිද්ධීන් හා එහි සම්භාවිතාව පිළිබඳ බර තැබීම් තෝරා ගැනීම.

### 2.1.12.5 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සෑම වාර්තාකරණ දිනකම විලම්භිත බදු වත්කම් හැර අනෙකුත් වත්කම් හානිකරණය වූ බවට කිසියම් හෝ හැඟවීමක් ඇත්දැයි සමූහය විසින් අගයනු ලබයි. එබඳු හැඟවීමක් ඇත්නම් හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂාවක් සිදුකිරීම අවශ්‍ය වන්නේ නම්, සමූහය විසින් වත්කමෙන් නැවත අයකරගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ධාරණ අගය එහි නැවත අයකරගත හැකි වටිනාකම ඉක්මවයි නම්, එම වත්කම හානිකරණය වී ඇතැයි සලකනු ලබන අතර, එම වත්කමේ අගය නැවත අයකරගත හැකි අගය දක්වා කපා හරියි.

### 2.1.12.6 දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය

සමූහය විසින් වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ කොටස් ලෙස හඳුනාගනු ලබන සාධාරණ වටිනාකමෙහි වෙනස්වීම් සහිත ප්‍රත්‍යාගණිත අගයන්ට අනුව ඉඩම් හා ගොඩනැගිලි මනිනු ලැබෙයි.

"සාධාරණ අගය මැනීමට" අනුකූලව සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලිවල සාධාරණ අගය නීර්ණය කිරීම සඳහා සමූහය විසින් ස්වාධීන වෘත්තීය තක්සේරුකරුවන් යොදවන ලදී.

සින්නක්කර ගොඩනැගිලි සහ ඉඩම්වල සාධාරණ අගය නීර්ණය කිරීම සඳහා භාවිතා කල ක්‍රමවේද හා ප්‍රධාන උපකල්පන මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 2.3 හි තවදුරටත් විස්තර කර දක්වා ඇත.

### 2.1.12.7 දේපළ, පිරියත හා උපකරණවල ඵලදායී ජීවකාලය

සමූහය, දේපළ, පිරියත හා උපකරණවල සුන්බුන් වටිනාකම, ඵලදායී ජීවකාලය හා ක්ෂය ක්‍රමය, සෑම වාර්තාකරණ දිනකම සමාලෝචනය කරයි. මෙම අගයන්, අනුපාත හා ක්‍රම ඇස්තමේන්තු කිරීමේ දී කළමනාකාරිත්වයේ තීරණ භාවිතා කෙරෙන හෙයින් ඒවායෙහි අගයන් අවිනිශ්චිතතාවයකින් යුක්ත වෙයි.

### 2.1.12.8 විලම්බිත බදු වත්කම්

බදු අලාභ මත වූ විලම්භීත බදු වත්කම් හඳුනා ගනු ලබන්නේ අනාගතයේ ඉපැයිය හැකි ලාභ මත ගෙවිය යුතු බදු, එම විලම්භීත බදු වත්කම් මගින් පියවිය හැකි සීමාවන් දක්වා පමණි. හඳුනාගත හැකි විලම්බිත බදු වත්කමේ අගය නීර්ණය කිරීම පිණිස අනාගතයේ විය හැකි බදු වන ලාභයන්හි කාලසීමාව හා ප්‍රමාණය සහ අනාගත බදු සැලසුම්කරණ උපායමාර්ග මත පදනම්ව තීරණ ගත යුතු වේ.

### 2.1.12.9 නිර්වචිත ප්‍රතිලාභ වගකීම්

ආයුගණක තක්සේරු උපයෝගී කරගනිමින් නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය සහ එම වගකීම්වල වර්තමාන අගය තීරණය කෙරෙයි. වට්ටම් අනුපාත, වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාත, ඉදිරි වැටුප් වැඩිවීම්, සේවක මරණ අනුපාතය හා ඉදිරි විශ්‍රාම වැටුප් වැඩිවීම් පිළිබඳ උපකල්පන ආයුගණක තක්සේරුව හා සම්බන්ධ වේ.

මෙම සැලසුම්වල දීර්ඝ කාලීන ස්වභාවය හේතුකොට ගෙන එම ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකින් යුක්ත වෙයි.

යෝග්‍ය වට්ටම් අනුපාතය තීරණය කිරීමේදී විශ්‍රාම අරමුදලේ කාලසීමාවට බර තැබූ සාමාන්‍ය ශේෂයට සමාන ඉහළ ගුණාත්මක බවින් යුතු ආයතනික බැඳුම්කරයක ප්‍රතිලාභ කළමනාකරණය විසින් සලකා බලනු ලැබෙයි. වෙළෙඳපොළ තුළ ගැලපෙන ඉහළ ගුණාත්මකබවින් යුතු ආයතනික බැඳුම්කර නොමැති අවස්ථාවකදී සමාන කාලසීමාවකට අවදානම ගලපන ලද රාජ්‍ය බැඳුම්කර ප්‍රතිලාභ, වට්ටම් අනුපාතය ලෙස යොදා ගනු ලැබිණි.

පොදුවේ භාවිත මර්ත්‍යතා වක්‍ර අනුව මර්ත්‍යතා (mortality) අනුපාතිකය තීරණය වෙයි. අපේක්ෂිත අනාගත උද්ධමන අනුපාත හා බැංකුවේ අපේක්ෂිත අනාගත වැටුප් වර්ධක මත ඉදිරි වැටුප් හා විශ්‍රාම වැටුප් වැඩිවීම් තීරණය වෙයි.

### 2.1.12.10 වගකීම් හා අලාභ සඳහා ප්‍රතිපාදන, බැඳියාවන් හා අසම්භාව්‍යයන්

සමූහයේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී සමූහයට එරෙහි නෛතික හිමිකම් ඉල්ලීම් ඉදිරිපත්වූ විට එම හිමිකම් ඉල්ලීම් සාර්ථක වීමේ ඉඩකඩ සම්බන්ධයෙන්, ප්‍රතිපාදන සැලසීම කළමනාකාරීත්වය විසින් තීරණය කරයි. නීතිමය හිමිකම් සම්බන්ධ ක්‍රියාමාර්ග අවසන් කිරීමට ගතවන කාලසීමාව මෙන්ම ආර්ථික ප්‍රතිලාභ ගලායෑමේ ප්‍රමාණය ද අවිනිශ්චිත වේ. මේ සඳහා ගතවන කාලසීමාව සහ පිරිවැය අවසාන වශයෙන් තීරණය වනුයේ අදාළ නෛතික බලසීමාව මතය. වර්ෂය තුළ සාමාන්‍ය ව්‍යාපාරික මෙහෙයුම් තුළදී හඳුනාගනු ලැබූ සියලුම අලාභ වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ.

### 2.1.12.11 කල්බදු - (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර.16)

බැංකුව විසින් ගිවිසුමක් ආරම්භයේදී එම ගිවිසුම කල්බදු ගිවිසුමක්දැයි හෝ එයට කල්බදු ගිවිසුමක් අයත්දැයි යන්න හා ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 16 හි මාර්ගෝපදේශ අනුව සලකා බැලීම සඳහා යම් කාල පරිච්ඡේදයකදී හඳුනාගත් වත්කමක් ලෙස භාවිත කිරීමේ හැකියාව පාලනය කිරීමේ අයිතිය, එම ගිවිසුමෙන් සන්නිවේදනය වේද යන්න තක්සේරු කරනු ලබයි. මෙම තක්සේරුවේ දී නැවත භාවිත කෙරෙන කාල පරිච්ඡේදය තුළ හඳුනාගත් වත්කම භවිතයෙන් සියලු ආර්ථික ප්‍රතිලාභ ලැබීමේ අයිතිය මෙන්ම හඳුනාගත් වත්කම භාවිත කරනුයේ කවර පරමාර්ථයෙන් සහ කෙසේද යන්න විධාන කිරීමේ අයිතිය බදු ගැනුම්කරු සතු වේ.

ගිවිසුම කල්බදු ගිවිසුමක්දැයි හෝ එයට කල්බදු ගිවිසුමක් අයත්දැයි යන්න තක්සේරු කිරීමෙන් අනතුරුව ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 16 හි සවිස්තරාත්මක මාර්ගෝපදේශ අනුව, එයට අතිරේක කල්බදු ගිවිසුමක/කල්බදු නොවන (සේවා) අංශ ඇතුළත්දැයි යන්න බැංකුව විසින් තීරණය කරනු ලැබෙයි. ඒ අනුව තනිව ගත් විට හෝ බදු ගැනුම්කරුට පහසුවෙන් ලබාගත හැකි වෙනත් සම්පත් සමඟ අදාළ වත්කම භාවිත කිරීමෙන් බදු ගැනුම්කරුට ප්‍රතිලාභ ලැබිය හැකි නම් සහ අදාළ වත්කම, ගිවිසුමෙහි වෙනත් වත්කම් සමඟ ඉහළ අන්තර් සම්බන්ධයක් නොමැති නම් හෝ ඒ මත විශාල වශයෙන් රඳා නොපවතී නම්, හඳුනාගත් වත්කමක් භාවිත කිරීමේ අයිතිය වෙනම කල්බදු අංගයක් ලෙස සැලකෙයි.

## මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

**2.1.12.11.1 භාවිතයට අයිතිය ඇති වත්කම්**

භාවිතයට අයිතිය ඇති වත්කම්, සමුච්චිත ක්ෂයවීම් හා හානිකරණ පාඩු අඩුකර පිරිවැයට මනිනු ලබන අතර කිසියම් කල්බදු වගකීම් ප්‍රතිමිනුම් වේ නම් ඊට ගලපනු ලැබෙයි. හඳුනාගනු ලැබූ කල්බදු වගකීම් අගය සහ ලද කල්බදු දිරි දීමනා වේ නම් එය අඩු කළ පසු ආරම්භක දිනට හෝ ඊට පෙර සිදු කරනු ලද කල්බදු ගෙවීම්, භාවිතයට අයිතිය ඇති වත්කම්වල පිරිවැයට අන්තර්ගත වේ. කල්බදු කාලසීමාව අවසානයේදී කල්බදු වලට අදාළ වත්කමෙහි හිමිකාරිත්වය පිළිබඳ සාධාරණ සහතිකයක් බැංකුව සතු නොවේ නම් මිස, භාවිතයට අයිතිය ඇති වත්කම්, එහි අපේක්ෂිත ඵලදායී ජීවකාලය හා කල්බදු කාලසීමාව යන දෙකෙන් අඩු සීමාව තුළ සරල රේඛීය පදනම මත ක්ෂය කරනු ලැබෙයි. භාවිතයට අයිතිය ඇති වත්කම් හානිකරණයට බඳුන් වෙයි.

**2.1.12.11.2 කල්බදු වගකීම්**

කල්බදු සමාරම්භක දිනට බැංකුව විසින් කල්බදු කාලසීමාව තුළ කළයුතු ගෙවීම්වල වත්මන් අගයට මනිනු ලබන කල්බදු වගකීම් හඳුනා ගැනෙයි. ස්ථාවර ගෙවීම්, ලැබිය හැකි කල්බදු දීමනා අඩු කළ පසු දර්ශකයක් හෝ අනුපාතයක් මත පදනම් වන විචල්‍ය කල්බදු ගෙවීම් සහ ඇපකර වටිනාකම් යටතේ ගෙවීමට අපේක්ෂිත අගයන් කල්බදු ගෙවීම්වලට අයත් වේ. බැංකුව විසින් උපයෝගී කරගනු ලැබීමට හේතු සහගත ගැනුම් විකල්පයක පුරුදු මිල හා ගිවිසුම අවසන් කළ හැකිය යන විකල්පය බැංකුවට භාවිත කිරීමේ අයිතිය කල්බදු කොන්දේසි වලින් පිළිඹිබු වේ නම්, කල්බදු ගිවිසුමක් අවසන් කිරීමට අදාළ දඩ මුදල් ද කල්බදු ගෙවීම්වලට ඇතුළත් වේ. ගෙවීම් කිරීමට තුඩු දෙන යම් සිදුවීමක් හෝ තත්ත්වයක් උදාවූ කාලසීමාව තුළ යම් දර්ශකයක් හෝ අනුපාතිකයක් මත පදනම් නොවූ විචල්‍ය කල්බදු ගෙවීම් වියදම් ලෙස හඳුනා ගැනෙයි.

කල්බදු ගෙවීම්වල වත්මන් අගය ගණනය කිරීමේදී කල්බදු වලට අදාළ පොලී අනුපාතිකය එක්වරම තීරණය කළ නොහැකි වන විටක කල්බදු ආරම්භක දිනට පවතින භාණ්ඩාගාර බැඳුම්කර අනුපාතිකය (භාණ්ඩාගාර බැඳුම්කර කාලසීමාව කල්බදු ගිවිසුම් කාලසීමාවට සමාන විය යුතුයි) බැංකුව විසින් උපයෝගී කරගනු ලැබෙයි.

සමාරම්භක දිනට පසුව පොලිය එකතුවීම පිළිඹිබු කිරීමට කල්බදු වගකීම් ප්‍රමාණය වැඩිකර ගෙවන ලද කල්බදු ගෙවීම් ප්‍රමාණය අඩු කරනු ලබයි. ඊට අමතරව වෙනස් කිරීමක්, කල්බදු කාලසීමාවෙහි වෙනසක්, ප්‍රධාන වශයෙන් ස්ථාවර කල්බදු ගෙවීම්හි වෙනසක් හෝ පාදක වූ වත්කම මිලදී ගැනීමේදී තක්සේරුකරණයේ වෙනසක් යනාදිය ඇති අවස්ථාවලදි කල්බදු වගකීම්හි ධාරණ අගය ප්‍රත්‍යාගණනය කෙරෙයි.

කල්බදු වගකීම මෙලෙස යළි මනිනු ලබන විට වත්කම් භාවිත කිරීමේ අයිතියෙහි ධාරක අගයට අදාළ ගැලපීමක් සිදු කරනු ලබයි. නොඑසේ නම්, වත්කම් භාවිත කිරීමේ අයිතියෙහි ධාරක අගය 0 තෙක් අඩු වී ඇත්නම්, එය ලාභ/අලාභ යටතේ වාර්තා කරනු ලබයි.

සමූහය විසින් වත්කම් භාවිතා කිරීමේ අයිතිය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වන අතර කල්බදු වගකීම්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි "වෙනත් වගකීම්" යටතේ දක්වනු ලැබෙයි.

**2.1.12.11.3 කෙටිකාලීන කල්බදු හා අඩු වටිනාකමැති කල්බදු වත්කම්**

බැංකුව එහි කෙටිකාලීන කල්බදු වලට (එනම්, මිලදී ගැනීමේ විකල්පයක් නොමැති හා ආරම්භක දින සිට මාස 12 ක හෝ ඊට අඩු කල්බදු කාලසීමාවක් සහිත කල්බදු වලට) කෙටිකාලීන කල්බදු හඳුනාගැනීම් නිදහස් කිරීම අදාළ කර ගනියි. එමෙන්ම අඩු වටිනාකමක් ඇති බවට සලකනු ලබන අවස්ථාවලදී ද බැංකුව අඩු වටිනාකමැති වත්කම් කල්බදු හඳුනාගැනීම් නිදහස් කිරීම අදාළ කර ගනියි. කෙටිකාලීන කල්බදු මත හා අඩු වටිනාකමැති වත්කම් මත කල්බදු ගෙවීම්, කල්බදු කාලසීමාව තුළදී සරල රේඛීය පදනමක් මත වියදම් ලෙස හඳුනාග නු ලබයි. බැංකුව විසින් පාදක වූ වත්කමෙහි අගය රු. මිලියන 1ට සමාන හෝ අඩු නම්, අඩු වටිනාකමැති වත්කම්වල කල්බදු සලකා බැලෙයි.

**2.1.12.11.4. අළුත්කිරීමේ විකල්පය සහිත ගිවිසුම්වල කල්බදු කොන්දේසි තීරණය කිරීමේදී වැදගත් තීරණ**

උපයෝගී කරගත හැකි බවට පිළිගත හැකි පරිදි තහවුරු කළ හැකි, දීර්ඝ කළ හැකි විකල්පයක් මඟින් ආවරණය වන කිසියම් කාලච්ඡේද සමඟ හෝ උපයෝගී කරගනු ලබන බවට පිළිගත හැකි පරිදි තහවුරු කළ නොහැකි විටකදී කල්බදු අවසන් කිරීමට විකල්පයක් මඟින් ආවරණය වන කාලච්ඡේද සමඟ අවලංගු කළ නොහැකි කල්බදු කොන්දේසි, බැංකුව විසින් කල්බදු කොන්දේසි ලෙස තීරණය කරනු ලබයි. අළුත් කිරීමේ විකල්පය උපයෝගී කරගනු ලබන බවට පිළිගත හැකි පරිදි තහවුරු කර ගැනීම උදෙසා බැංකුව තීරණ ගනු ලබයි. එනම්, අළුත් කිරීම උපයෝගී කර ගැනීම සඳහා ආර්ථිකමය දිරිදීමනාවක් උත්පාදනය කරන අදාළ සියලු සාධක එය සලකා බලනු ලබයි. ආරම්භක දිනට පසු, සිය පාලනය යටතේ ඇති හා අළුත්කිරීමේ විකල්පය උපයෝගී කර ගැනීමට (හෝ උපයෝගී කර නොගැනීමට) ඇති හැකියාව බලපානු ලබන වාතාවරණයන්හි වෙනසක් හෝ වැදගත් සිද්ධියක් වේ නම්, බැංකුව විසින් කල්බදු කොන්දේසි යළි ඇගයීමට ලක් කෙරෙයි. කල්බදු දීර්ඝ කර ගැනීමේ හෝ අවසන් කිරීමේ විකල්ප අඩංගු ගිවිසුම්හි කල්බදු කොන්දේසි තීරණය කිරීමේදී බැංකුව පසු දැක්මක් යොදා ගනියි. ඒ අනුව, බැංකුව හා බදුහිමියා විසින් අත්සන් කරන ලද කුලී එකඟතාව මඟින් ආවරණය වන කාලච්ඡේදය තුළ වසර ගණන මත පදනම්ව බැංකුව විසින් කල්බදු කොන්දේසි හඳුනාගනු ලබයි

### 2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම්

පහත කරුණු හැරුණුවිට 2025 වර්ෂය තුළ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි ප්‍රධාන පෙළේ වෙනස්කම් සිදු නොවිණි.

### 2.3 සාධාරණ අගය මිනීම

"සාධාරණ අගය" වූ කලී විධිමත් ගනුදෙනුවකදී වත්කමක් විකිණීමට හෝ වගකීමක් ගෙවා නිදහස් වන මිල සඳහා ගෙවීමේදී හෝ එසේ නොමැති විටක මනිනු ලබන දින වෙළෙඳපොළ පාර්ශ්වකරුවන් අතර සිදුවන නිසි ගනුදෙනුවකදී සමූහයට එදිනට පිවිසිය හැකි වඩා ප්‍රතිලාභදායී වෙළෙඳපොළකදී ලැබෙන මිලකි. වගකීමක සාධාරණ අගය එහි කාර්යසාධනමය නොවන අවදානම පිළිඹිබු කරයි.

යම් උපකරණයක් සඳහා සක්‍රීය වෙළඳපොළක් තුළ ප්‍රකාශිත මිල භාවිත කරමින් සමූහය විසින් එකී උපකරණයෙහි සාධාරණ අගයට මනිනු ලබයි. අඛණ්ඩ පදනමක් මත මිලකරණ තොරතුරු සැපයීමට ප්‍රමාණවත් ධාරිතාවක් හා තීව්‍රතාවයක් සහිත වත්කමක හෝ වගකීමක ගනුදෙනු සිදුවන්නේ නම්, එකී වෙළඳපළ සක්‍රීය යැයි සැලකෙයි.

සක්‍රීය වෙළඳපොළක් තුළ ප්‍රකාශිත මිලකරණයක් නොවේ නම් නිරීක්ෂණය කළ හැකි අදාළ යෙදවුම්වල භාවිතය උපරිම කරවන සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්වල භාවිතය අවම කරවන තක්සේරු විධික්‍රම සමූහය විසින් භාවිත කෙරෙයි. මිලකරණ ගනුදෙනුවකදී වෙළෙඳපොළ පාර්ශ්වකරුවන් ආර්ථික අතින් ඔවුන්ගේ උපරිම යහපත තකා කටයුතු කරන්නේ නම්, වත්කම හෝ වගකීම මිලකරණයේදී ඔවුන් සාධාරණ අගයෙහි ධූරාවලිය උපයෝගී කරගනු ඇතැයි යන උපකල්පනය මත වත්කමක/වගකීමක සාධාරණ අගය මනිනු ලැබේ.

වෙනස්වීම් සිදුවී ඇති වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී සාධාරණ අගයෙහි ධූරාවලි මට්ටම් අතර මාරුවීම් සමූහය විසින් හඳුනාගනු ලබයි.

මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මැනීමේදී වත්කමක් එහි ඉහළම/හොඳම භාවිතය තුළින් හෝ එලෙස ඉහළම/හොඳම ලෙස භාවිත කරනු ලබන වෙනත් වෙළෙඳපොළ පාර්ශ්වකරුවකුහට විකිණීම තුළින් ආර්ථික ප්‍රතිලාභ ජනනය කිරීමට වෙළෙඳපොළ පාර්ශ්වකරුවකු සතු හැකියාව සලකා බලනු ලබයි. ඉඩම් සහ ගොඩනැගිලි වැනි සැලකිය යුතු වත්කම් තක්සේරු කිරීම සඳහා බාහිර ව්‍යත්තීමය අගය කරන්නන් සම්බන්ධ වේ.

මූල්‍ය වත්කම් හා වගකීම්වල සාධාරණ අගය මිනීමේ/විශ්ලේෂණයක් පිටු අංක 429 සිට 433 දක්වා සටහන් අංක 55 හි දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 2.4 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති - පොදු

### 2.4.1 ඒකාබද්ධ කිරීමේ පදනම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 10) " ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන" සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර.27) "ඒකාබද්ධ හා තනි මූල්‍ය ප්‍රකාශන" ප්‍රකාර බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන, බැංකුවේ සහ එහි පාලිතයේ මූල්‍ය ප්‍රකාශන වලින් සමන්විත වේ.

#### 2.4.1.1 ව්‍යාපාරික ඒකාබද්ධවීම්

පාලනය සමූහය වෙත සංක්‍රමණය වන අවස්ථාවේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 3 - "ව්‍යාපාරික ඒකාබද්ධවීම්" යටතේ අත්පත් කර ගැනීමේ ක්‍රමවේදය උපයෝගී කර ගනිමින් ව්‍යාපාරික ඒකාබද්ධවීම් ගිණුම්ගත කෙරෙයි. අත්පත් කර ගැනීමේදී සංක්‍රමණය කෙරෙන ප්‍රතිලාභ හා අත්පත් කරගනු ලබන ශුද්ධ හඳුනාගත හැකි වත්කම් සාධාරණ අගයට මනිනු ලැබෙයි. පැන නගිනු ලබන යම් කීර්තිනාමයක් වේ නම්, වාර්ෂිකව හානිකරණය සඳහා පරීක්ෂා කරනු ලබයි. කේවල් කර මිලදි ගැනීමකදී ඇති වන ඕනෑම ලාභයක් වහාම ලාභයට හෝ අලාභයට හඳුනාගනු ලැබෙයි. ණය හෝ හිමිකම් කොටස් සුරැකුම් නිකුතුවට අදාළ නම් හැර ගනුදෙනු පිරිවැය සිදු වූ වියදම් ලෙස ගණනය වෙයි.

පෙර පැවති සබඳතා පියවීමට අදාළ ප්‍රතිලාභ සංක්‍රමණය වූ ප්‍රතිලාභ වලට ඇතුළත් නොවෙයි. එබඳු ප්‍රමාණ සාමාන්‍යයෙන් ලාභ හෝ අලාභවල හඳුනාගනු ලැබෙයි.

අත්පත් කරගනු ලබන ඕනෑම අසම්භාව්‍ය ප්‍රතිලාභයන් එය අත්පත් කරගන්නා දිනට එහි සාධාරණ වටිනාකමට මනිනු ලබයි. ගෙවීමට ඇති බැඳියාව මූල්‍ය උපකරණ වර්ගීකරණයෙහි හිමිකම නිර්වචනය යටතට ගැනෙන විට එය ප්‍රත්‍යාගණනය නොකරන අතර පියවීමද හිමිකම් ඇතුලත ගිණුම්ගත කරයි. නොඑසේ නම් අබණ්ඩ සලකා බැලීමක සාධාරණ වටිනාකම පසුකාලීන වෙනස්වීම් ලාභයට හෝ අලාභයට හඳුනා ගනියි.

#### 2.4.1.2 පාලනය නොවන හිමිකම

ඉහත විස්තර පිටු අංක 386 හි සටහන් අංක 47 යටතේ දක්වා ඇත.

#### 2.4.1.3 පරිපාලිත සමාගම්

බැංකුව වෙත පාලනය පැවරෙන දින පටන් පාලිතයෙහි මූල්‍ය ප්‍රකාශන මූලුමනින්ම ඒකාබද්ධ කෙරෙන අතර, එබඳු පාලනයක් අවසන් වනතුරු ඒකාබද්ධ කිරීම සිදුවෙයි. පාලනයක් පවතින්නේ බැංකුවට එකී පාලිත සමාගමේ ක්‍රියාකාරකම් වලින් ප්‍රතිලාභ ලබාගත හැකිවන පරිදි, එහි මූල්‍ය හා මෙහෙයුම් ප්‍රතිපත්ති පාලනය කිරීමට බලයක් ඇති විටදීය. ඒකාබද්ධ කිරීමේදී භාවිතා වන බැංකුවේ පරිපාලිතයෙහි මූල්‍ය ප්‍රකාශන, ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි මූල්‍ය ප්‍රකාශන වාර්තාකරණ කාලපරිච්ඡේදය අදාළ වන අතර ඊට සමාන ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කරමින් පිළියෙල කරනු ලබයි.

#### 2.4.1.4 පාලනය අහිමිවීම

පාලිත සමාගමක පාලනය සමූහය සතු නොවන විට එය විසින් පාලිත සමාගමෙහි වත්කම් හා වගකීම් සහ අදාළ ඕනෑම පාලනයකට යටත් නොවන හා හිමිකම්වල වෙනත් උපාංග හඳුනාගනු නොලැබෙයි. එහි ප්‍රතිඵල ලෙස උත්පාදිත ලාභ හෝ අලාභ, ලාභයට හෝ අලාභයට හඳුනාගනු ලැබෙයි. පාලනය සතු නොවන විට පෙර පාලිත සමාගමෙහි රඳවාගත් ඕනෑම පොලියක් සාධාරණ වටිනාකමට මනිනු ලබයි.

#### 2.4.1.5 ඒකාබද්ධ කිරීමේදී ඉවත් කරනු ලැබූ ගනුදෙනු

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සියලුම අන්තර් සමාගම් ශේෂයන්, ආදායම් හා වියදම් මෙන්ම එවැනි අන්තර් සමාගම් ගනුදෙනුවලින් පැන නගින ලද උපලබ්ධි නොවූ ලාභ සහ අලාභ සම්පූර්ණයෙන් ඉවත් කර ඇත.

පිටු අංක 389 හි දක්වා ඇති පාලිත සමාගම සමඟ ගනුදෙනුවලට අදාළ සටහන් අංක 49.3 වෙත යොමු වන්න.

### 2.4.2 විදේශ මුදල් ගනුදෙනු සහ ශේෂ

#### විදේශීය ව්‍යවහාර මුදලින් කරනු ලබන ගනුදෙනු

එකී ගනුදෙනු සිදුවූ අවස්ථාවේදී පැවති විනිමය අනුපාතික මත වාර්තාකරන/ක්‍රියාකාරී මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලබයි.

ශේෂපත්‍ර දිනට විදේශ ව්‍යවහාර මුදලින් සමන්විත මූල්‍ය වත්කම් හා වගකීම් වාර්තාකරණ දිනට පවතින මධ්‍යම විනිමය අනුපාතය යොදාගනිමින් ශ්‍රී ලංකා රුපියල්වලට යළි පරිවර්තනය කරනුලබයි. මූල්‍ය අයිතම පියවීම මත හෝ මුලින් වාර්තා කළ අනුපාතයකට වඩා වෙනස් අනුපාත වලට මූල්‍ය අයිතම පරිවර්තනය මත පැන නගින සියලුම විනිමය වෙනස්කම්, එකී වෙනස්කම් පැනනගින කාලපරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබෙයි.

ඓතිහාසික පිරිවැයට අගය කරනු ලබන මූල්‍ය නොවන විදේශ මුදලින් ප්‍රකාශිත අයිතම, ආරම්භක ගනුදෙනු සිදු වූ දින පැවති විනිමය අනුපාත භාවිතයට ගනිමින් ව්‍යවහාරික මුදල් වලට පරිවර්තනය කරනු ලබේ. විදේශ මුදලින් ප්‍රකාශිත සාධාරණ අගයට අගය කරනු ලබන මූල්‍ය නොවන අයිතම සාධාරණ අගය තීරණය කළ දින පැවති විනිමය අනුපාත භාවිතයට ගනිමින් පරිවර්තනය කරනු ලැබේ.

## 2.5 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති - වත්කම් හා වගකීම් හඳුනාගැනීම

### මූල්‍ය උපකරණ

2018 ජනවාරි මස 01 දින හෝ ඉන් පසුව එළැඹෙන වාර්ෂික කාලපරිච්ඡේදය සඳහා ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 "මූල්‍ය උපකරණ" මඟින් ශ්‍රී.ල.ගි.ප්‍ර 39 ආදේශ වෙයි. ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 යටතේ අනුමත ප්‍රතිපත්තිමය විකල්පයක් ලෙස ශ්‍රී.ල.ගි.ප්‍ර 39 ප්‍රකාර ඉදිරි ගිවිසුම් ගිණුම්කරණ අබණ්ඩවම යොදාගැනීමට බැංකුව තීරණය කරන ලදි.

### 2.5.1 මූල්‍ය උපකරණ - මූලික හඳුනාගැනීම්, වර්ගීකරණය සහ පසුව මිනීම

#### 2.5.1.1 හඳුනා ගැනීමේ දිනය

සමූහය විසින් ආරම්භයේදී ණය හා අත්තිකාරම්, තැන්පතු හා යටත්කාලීන වගකීම් යනාදිය ඒවා ඇති වූ දිනට හඳුනාගනු ලැබෙයි. ගනුදෙනුකරුවන්ට ලබාදෙන ණය හා අත්තිකාරම් හඳුනාගනු ලබන්නේ ගනුදෙනුකරුවන්ගේ ගිණුම්වලට අරමුදල් බැර වූ පසුවය. ගනුදෙනුකරුවන්ගේ අරමුදල් බැංකුවට ලැබූ පසුව තැන්පත්කරුවන්ට ගෙවිය යුතු ශේෂ ලෙස බැංකුව හඳුනාගනී. අනෙකුත් සියලුම මූල්‍ය උපකරණ (සාමාන්‍ය ක්‍රමයට මිලදී ගැනීම් හා මූල්‍ය වත්කම් විකිණීම් ඇතුළත්ව) මූලිකව ගනුදෙනු කරන දිනට එනම්, උපකරණවල ගිවිසුම්ගත ප්‍රතිලාභ සඳහා සමූහය පාර්ශ්වකරුවකු වන දිනට හඳුනා ගැනේ.

#### 2.5.1.2 මූල්‍ය උපකරණ හඳුනාගැනීම හා මූලික ගණනය කිරීම

මූලික ගණනය කිරීම් සඳහා මූල්‍ය උපකරණ වර්ගීකරණය කිරීම තීරණය වනුයේ, සටහන් අංක 2.5.1.4.1 සහ 2.5.1.4.2 හි විස්තර කර ඇති පරිදි උපකරණ කළමනාකරණය කිරීමේ ව්‍යාපාරික ආකෘතිය සහ ගිවිසුම්ගත කොන්දේසි මතය.

ලාභය හෝ පාඩුව හරහා වාර්තා කළ මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වලදී හැරුණුවිට මූල්‍ය උපකරණ මූලික ගණනය කිරීමේදී ඒවායේ සාධාරණ වටිනාකමට (සටහන් අංක 56 හි නිර්වචිත අයුරින්) මනිනු ලබන අතර ඊට වෙළෙඳ ගනුදෙනු පිරිවැය එකතු කිරීම හෝ අඩු කිරීම සිදු කෙරෙයි. වෙළෙඳාම් මඟින් ලැබීම් ගනුදෙනු මිලට මනිනු ලබයි. මූලික ගණනය කිරීමේ මූල්‍ය උපකරණවල සාධාරණ අගය වෙළෙඳ ගනුදෙනු මිලෙන් වෙනස් වන අවස්ථාවේදී බැංකුව සහ සමූහය විසින් පහත සඳහන් පරිදි දින 1 ලාභය හෝ අලාභය සඳහා ගිණුම්කරණය කෙරෙයි.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

### 2.5.1.3 "දින 1" ලාභය හෝ අලාභය

නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපොළෙහි දත්ත ඇතුළත් විචල්‍යයන් මත වූ ඇගයීමේ ශිල්පක්‍රම පදනම්ව ගණනය කළ සාධාරණ අගය හෝ එකම නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ ගනුදෙනු පදනම් කරගෙන නිර්ණය කළ සාධාරණ අගය ගනුදෙනු මිලෙන් වෙනස් වන විට වෙනස සමූහය විසින් වහාම හඳුනාගනී. නිරීක්ෂණය කළ නොහැකි දත්ත උපයෝගී කර ගනිමින් සාධාරණ අගය තීරණය කරනු ලබන අවස්ථාවල දී යෙදවුම් දත්ත නිරීක්ෂණය කළ හැකි වන විට හෝ අයිතමය හඳුනා නොගන්නා විට ගනුදෙනු කරන මිල හා ආකෘතියෙහි අගය අතර වෙනස විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි පමණක් හඳුනාගනු ලබයි. ගනුදෙනුකරන මිලෙහි සහ සාධාරණ අගයෙහි වෙනස ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලබයි. පොදු යෝජනා ක්‍රමයක් යටතේ සහනදායී පොළී අනුපාතයට සේවකයන්ට ප්‍රදානය කරන ලද ණය වලින් ජනිත වන දින 1 ලාභය සේවකයන්ගේ ඉදිරියට ඇති සේවා කාලය හෝ ණය කාලසීමාව යන දෙකෙන් අඩු අගයට පොළී අදායම් හා පුද්ගල වියදම්හි සළුප පොළී අනුපාතය භාවිතයෙන් හඳුනාගනු ලබයි.

### 2.5.1.4 මූල්‍ය වත්කම් වර්ගීකරණය සහ පසුව මිනීම

බැංකුව විසින් පහත කවරාකාරයෙන් හෝ මනින ලදුව වත්කම්වල ගිවිසුම්ගත කාලසීමා කළමනාකරණය කිරීමේ ව්‍යාපාරික ආකෘතිය මත පදනම්ව එහි සියලු මූල්‍ය වත්කම් වර්ගීකරණය කෙරෙයි.

- ක්‍රමක්ෂය පිරිවැය
- වෙනත් විස්තීර්ණ ආදායම් මඟින්
- සාධාරණ අගය

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය සටහන් අංක 2.5.1.6 හි විස්තර කොට ඇති පරිදි බැංකුව හා සමූහය විසින් ව්‍යුත්පන්න සහ ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට අගය කරන වෙළඳ කළඹ වර්ගීකරණය කර අගය කරනු ලබයි. බැංකුව විසින් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට මූල්‍ය උපකරණ නියම කරනු ලබන අතුරින් එමඟින් අගය කිරීමේ හෝ හඳුනාගැනීමේ අසමානතා සැලකියයුතු ලෙස අඩු කෙරෙයි.

#### 2.5.1.4.1 ව්‍යාපාරික ආකෘති ඇගැයීම

සිය අරමුණු ඉටුකර ගැනීමට මූල්‍ය වත්කම් කළමනාකරණය කරන අයුරු හොඳින්ම පිළිඹිබු වන මට්ටමට බැංකුව සහ සමූහය විසින් එහි ව්‍යාපාරික ආකෘතිය තීරණය කරනු ලබයි.

බැංකුවේ ව්‍යාපාරික ආකෘතිය, උපකරණයෙන් උපකරණය යන පදනම නොව වඩාත් ඉහළ මට්ටමේ කළඹ එකතුව මත ඇගයීමට ලක් වන අතර, පහත සඳහන් නිරීක්ෂණය කළහැකි සාධක මත පදනම් වේ.

- ව්‍යාපාරික ආකෘතියෙහි කාර්ය සාධනය සහ එකී ව්‍යාපාරික ආකෘතිය තුළ රඳවා ගනු ලබන මූල්‍ය වත්කම් අගයන අයුරු හා ආයතනයේ ප්‍රධාන කළමනාකාරිත්ව පිරිස් වෙත වාර්තා කරනු ලබන අයුරු.
- ව්‍යාපාරික ආකෘතියෙහි කාර්ය සාධනයට බලපානු ලබන අවදානම් (සහ එකී ව්‍යාපාරික ආකෘතිය තුළ රඳවා ගනු ලබන මූල්‍ය වත්කම්) හා විශේෂයෙන්ම එකී අවදානම් කළමනාකරණය කරන අයුරු.
- ව්‍යාපාරයේ කළමනාකරුවන් හානිපූරණය කෙරෙන අයුරු (උදා: වශයෙන් කළමනාකරණය කරනු ලබන වත්කම්වල සාධාරණ වටිනාකම මත නැතහොත් රැස් කරනු ලබන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ මත හානිපූරණය කෙරේද)
- අපේක්ෂිත වාර ගණන, වටිනාකම හා විකුණුම් සිදු කරනු ලබන කාලසීමාව යනාදිය ද බැංකු මඟින් කරනු ලබන ඇගයීමේදී වැදගත් අංගයක් වේ.

ආතති සිදුවීම් හා වියහැකි නරකම සිදුවීම් සැලකිල්ලට නොගෙන පිළිගත හැකි අපේක්ෂිත සිදුවීම් මත පදනම්ව ව්‍යාපාරික ආකෘතිය ඇගයීම සිදුකෙරේ. මූලික හඳුනාගැනීමෙන් පසුව බැංකුවේ මුල් අපේක්ෂාවට වඩා වෙනස් අයුරින් මුදල් ප්‍රවාහ හඳුනාගනු ලැබේ නම්, එකී ව්‍යාපාරික ආකෘතියෙහි රඳවාගනු ලබන සෙසු මූල්‍ය වත්කම් වල වර්ගීකරණය බැංකුව විසින් වෙනස් නොකරන අතර අලුතින් ජනිත හෝ අලුතින් මිලට ගනු ලැබූ මූල්‍ය වත්කම් අගය කිරීමේදී එකී විස්තර අන්තර්ගත කරනු ලැබේ.

#### 2.5.1.4.2 ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ හුදු මුල් මුදල සහ පොළිය ගෙවීමේ ඇති ඇගැයීම (SPPI Test)

වර්ගීකරණ ක්‍රියාවලියේ දෙවැනි පරීක්ෂාව වශයෙන් මුල් මුදල හා පොළිය ගෙවීම සම්බන්ධයෙන් පමණක් අදාළ වේදැයි හඳුනාගැනීම පිණිස බැංකුව විසින් මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත නියමයන් අගයනු ලබයි.

මෙම පරීක්ෂාවේදී මුල් මුදල නිර්වචනය කරනු ලබන්නේ මූලික හඳුනාගැනීමේදී මූල්‍ය වත්කමෙහි සාධාරණ අගය ලෙස වන අතර, මූල්‍ය වත්කමෙහි ජීවකාලය තුළ එය වෙනස් වියහැකිය. (උදා: වශයෙන් මුල් මුදල යළි ගෙවීම හෝ අධිමිල/වට්ටම් ක්‍රමක්ෂයවීම් මත) ණයදීමේ ක්‍රියාවලිය තුළ වඩාත් වැදගත් පොළී සම්බන්ධ සාධක වන්නේ ණය අවදානම සහ මුදල්වල කාලීන අගය පිළිබඳ සලකා බැලීමයි. ඉහත කී ඇගයීම සිදුකිරීම පිණිස මූල්‍ය වත්කම පවතින මුදල් වර්ගය සහ පොළී අනුපාතිකය අදාළ වන කාලසීමාව ආදී කරුණු බැංකුව විසින් සලකා බලා විනිශ්චයකට එළඹෙයි.

අවදානමට ඇති අවම නිරාවරණයවීම් හෝ වෙනස්වීම් හඳුන්වාදෙනු ලබන ගිවිසුම්ගත නිරාවරණයවීම් වලට වඩා මූලික ණයදීමේ ක්‍රියාවලියට සම්බන්ධ නොමැති ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ, හිඟ මුදල් මත පමණක් මුල් මුදල් හා පොළී ගෙවීම් වලට තුඩු නොදෙයි. එවන් අවස්ථාවලදී මූල්‍ය වත්කම් සාධාරණ අගය මත ලාභ අලාභ අනුව ගණනය කළ යුතු වේ.

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති විවිධ මූල්‍ය වත්කම් කාණ්ඩ පිළිබඳ විස්තර සඳහා සටහන් අංක 2.5.1.4.3 සිට 2.5.1.4.5 දක්වා යොමු වන්න.

#### 2.5.1.4.3 ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වත්කම්

පහත සඳහන් කොන්දේසි දෙකම සපුරාලන්නේ නම් සහ ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නියම නොකෙරේ නම්, මූල්‍ය වත්කම ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබෙයි.

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම් සඳහා වත්කම් රඳවාගැනීම අරමුණ වන ව්‍යාපාරික ආකෘතියක් තුළ වත්කම රඳවාගනු ලැබීම.
- මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත කොන්දේසි නිශ්චිත දිනයන්හි ගෙවියයුතු සම්පූර්ණ මුදලෙහි මුල් මුදල හා පොළිය ගෙවීම් පමණක් වන මුදල් ප්‍රවාහ ඇතිකරවීම.
- ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වත්කම් පහත දැක්වේ.

  **(අ) මුදල් හා මුදල්වලට සමානයන්**
  මුදල් හා මුදල්වලට සමානයන් පිළිබඳ විස්තර පිටු අංක 338 හි සටහන් අංක 16 හි දැක්වේ.

  **(ආ) මහ බැංකුව වෙනැති ශේෂයන්**
  මහ බැංකුව වෙනැති ශේෂයන් පිළිබඳ විස්තර පිටු අංක 339 හි සටහන් අංක 17 හි දැක්වේ.

  **(ඇ) බැංකුවල ඇති තැන්පතු**
  බැංකුවල ඇති තැන්පතු පිළිබඳ විස්තර පිටු අංක 339 හි සටහන් අංක 18 හි දැක්වේ.

  **(ඈ) ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම්**
  ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම් පිළිබඳ විස්තර පිටු අංක 343 හි සටහන් අංක 21 හි දැක්වේ.

  **(ඉ) ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ**
  ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ පිළිබඳ විස්තර පිටු අංක 349 හි සටහන් අංක 22 හි දැක්වේ.

  **(ඊ) නැවත විකිණීමේ ගිවිසුම මත මිලදීගත් සුරකුම්පත් (ප්‍රති විකුණුම්)**
  නැවත විකිණීමේ ගිවිසුම මත මිලදීගත් සුරකුම්පත් පිළිබඳ විස්තර පිටු අංක 349හි සටහන් අංක (22) හි දැක්වේ.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

**2.5.1.4.4 වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම්**

වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට දක්වන ණය හා හිමිකම් උපකරණ යනාදිය වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම්වලට ඇතුළත්ය.

වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම් පිළිබඳව පහත සඳහන් සටහන් (අ) සහ (ආ) මඟින් දැක්වේ.

**(අ) වෙනත් විස්තීරණ ආදායම් මඟින් සාධාරණ අගයට ගණනය කරන ලද ණය උපකරණ**

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම සඳහා වත්කම් රඳවා ගැනීම අරමුණු වන ව්‍යාපාරික ආකෘතියක් තුළ වත්කම රඳවාගනු ලබන්නේ නම් හෝ ගෙවියයුතු මුළු මුදලින් මුල් මුදල හා පොළිය ගෙවීම පමණක් නියෝජනය කරනු ලබන වත්කමක මුදල් ප්‍රවාහ විකිණීම සිදු කරනු ලබන්නේ නම්, වෙනත් විස්තීරණ ආදායම් මඟින් සාධාරණ අගයට ණය උපකරණ ගණනය කරනු ලබයි.

ඉහත විස්තර පිටු අංක 352 සටහන් අංක 23 මඟින් දැක්වේ.

**(ආ) වෙනත් විස්තීරණ ආදායම් මඟින් සාධාරණ අගයට නියම කරන ලද හිමිකම් උපකරණ**

මූලික හඳුනාගැනීමේ දී වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට ගණනය කරන ලද හිමිකම් උපකරණ ලෙස උපාය මාර්ගික හා ව්‍යවස්ථාපිත අරමුණු උදෙසා රඳවාගන්නා හිමිකම් ආයෝජන අතරින් ඇතැම් ඒවා යළි වෙනස් නොකළ හැකි සේ වර්ගීකරණය කිරීමට සමූහය තීරණය කරනු ලබයි.

ඉහත විස්තර පිටු අංක 354 හි සටහන් අංක 23 හි දැක්වේ.

**2.5.1.4.5 ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම්**

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 ට අනුව ක්‍රමක්ෂය පිරිවැයට හෝ වෙනත් විස්තීරණ ආදායම් මඟින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම් හැර අනෙකුත් සියලු මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට දක්වනු ලබයි. කොන්ත්‍රාත්තුමය මුදල් ප්‍රවාහ රැස්කිරීමට හෝ මූල්‍ය වත්කම් විකිණීම සඳහා යන කරුණු හේතුවෙන් රඳවා නොගන්නා බැවින් සාධාරණ අගය යන පදනම මත අගයනු ලබන වෙළඳාම සඳහා රඳවාගන්නා හෝ කළමනාකරණය කරන මූල්‍ය වත්කම් ලාභය/අලාභය මඟින් සාධාරණ අගයට මූලිකව හඳුනාගැනීමෙන් නියම කරන ලද මූල්‍ය වත්කම් පහත සාකච්ඡාවට භාජනය කර ඇත.

කාලපරිච්ඡේදය අවසානයේදී ලාභය/අලාභය මඟින් සාධාරණ අගයට ගණනය කිරීමේදී මූලිකව හඳුනාගනු ලබන නියම කරන ලද මූල්‍ය වත්කම් සමූහය සතුව නැත.

**(ඇ) ලාභය/අලාභය මඟින් සාධාරණ අගයට නියම කරන ලද මූල්‍ය වත්කම්**

ලාභය/අලාභය මඟින් සාධාරණ අගයට නියම කරනු ලබන මූල්‍ය වත්කම්, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සාධාරණ අගයට වාර්තා කරනු ලබයි. සාධාරණ අගයෙහි වෙනස්කම්, "ලාභය/අලාභය හරහා සාධාරණ අගයට නියම කරනු ලබන මූල්‍ය වත්කම් සහ වගකීම් මත ශුද්ධ ලැබීම් හෝ අලාභයන්හි" වාර්තා කරනු ලබයි. උපයනු ලබන පොළිය සඵල පොළී අනුපාත උපයෝගී කර ගනිමින් "පොළී ආදායම්" හි උපචිත වන අතර මුදල ලැබීමේ අයිතිය ස්ථාපිත වූ විට ලාභාංශ ආදායම "වෙනත් මෙහෙයුම් ආදායම්හි" වාර්තා කෙරෙයි.

කාලපරිච්ඡේදය අවසානයේදී ලාභය/අලාභය මඟින් සාධාරණ අගයට ගණනය කිරීමේදී මූලිකව හඳුනාගනු ලබන නියම කරන ලද මූල්‍ය වත්කම් සමූහය සතුව නැත.

### 2.5.1.5 මූල්‍ය වගකීම් වර්ගීකරණය සහ පසුව මිනීම

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 ප්‍රකාර මූල්‍ය ඇප සහ ණය බැඳීම් හැරුණු විට අනෙක් මූල්‍ය වගකීම්, සමූහය විසින් පහත කාණ්ඩ අතුරින් එකකට වර්ගීකරණය කෙරෙයි.

- ලාභ/අලාභ මඟින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වගකීම්
  - වෙළඳාම සඳහා රඳවාගත්
  - ලාභ/අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ
- ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වගකීම්

මූල්‍ය වගකීම්හි පසුකාලීන මිණුම් ඒවායෙහි වර්ගීකරණය මත පදනම් වේ. මූල්‍ය වර්ගීකරණයෙහි ලා පැවති ශ්‍රී ල.ගි.ප්‍ර. 39 නිර්නායක බොහොමයක් ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 යටතේ ද පවතී.

**2.5.1.5.1 ලාභය/අලාභය මඟින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වගකීම්**

වාර්තාකරන කාලය අවසානයේදී ලාභ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ කිසිම මූල්‍ය වගකීමක් සමූහය සතුව නැත.

**2.5.1.5.2 ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කළ මූල්‍ය වගකීම්**

සමූහය විසින් එළඹ ඇති ගිවිසුම්වලට අනුව, දරා සිටින්නාට මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් භාරදීමට බැඳියාවක් පවතින විට හෝ බැඳියාවක් පියවීම සඳහා නිශ්චිත හිමිකම් කොටස් සංඛ්‍යාවක් නිශ්චිත මුදලකට හෝ නිශ්චිත වෙනත් මූල්‍ය වත්කම් අගයකට හුවමාරු වන අවස්ථාවක් හැරුණුවිට, සමූහය විසින් නිකුත් කරන ලද ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් නොකළ මූල්‍ය වගකීම්, "බැංකු වලට ගෙවියයුතු", "වෙනත් තැන්පත්කරුවන්ට ගෙවිය යුතු", "ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවියයුතු" හෝ "නිකුත් කළ ණය සුරැකුම්පත්" මෙම වර්ගීකරණයට අයත්ය.

උපකරණයේ ගිවිසුම්ගත කොන්දේසි ප්‍රකාර සමූහය විසින් ප්‍රධාන උපකරණ මූල්‍ය වගකීම් හෝ හිමිකම් උපකරණ ලෙස වර්ගීකරණය කෙරෙයි.

මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, සඵල පොළී අනුපාතික ක්‍රමය යොදා ගනිමින් එම මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබයි. අත්පත් කර ගැනීමට අදාළ වට්ටම් හෝ අධි මිල සහ සඵල පොළී අනුපාතිකයෙහි අත්‍යන්ත කොටසක් වන ගාස්තු හා පිරිවැය ද සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබයි. සඵල පොළී අනුපාතික ක්‍රමක්ෂයවීම් ආදායම් ප්‍රකාශයෙහි "පොළී ව්‍යදම්" යටතේ හඳුනා ගනී. සඵල පොළී අනුපාතික ක්‍රමක්ෂය ක්‍රියාවලිය හරහා වගකීම් හඳුනා ගැනීම අත්හරින විට ලාභ හා අලාභ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලබයි.

**(අ) බැංකු වලට ගෙවිය යුතු**
බැංකු වලට ගෙවිය යුතු පිළිබඳ විස්තර පිටු අංක 367 හි සටහන් අංක 32 මඟින් දැක්වේ.

**(ආ) තැන්පත්කරුවන්ට ගෙවිය යුතු**
තැන්පත්කරුවන්ට ගෙවිය යුතු පිළිබඳ විස්තර පිටු අංක 368 හි සටහන් අංක 35 මඟින් දැක්වේ.

**(ඇ) ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවියයුතු**
ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවිය යුතු පිළිබඳ විස්තර පිටු අංක 368 හි සටහන් අංක 35 මඟින් දැක්වේ.

**(ඈ) වෙනත් ණය ගැනීම් සඳහා ගෙවියයුතු**
වෙනත් ණය ගැනීම් සඳහා ගෙවිය යුතු පිළිබඳ විස්තර පිටු අංක 368 හි සටහන් අංක 35 මඟින් දැක්වේ.

**(ඉ) නැවත මිලදී ගැනීමේ ගිවිසුම මත විකිණූ සුරැකුම්පත් (ප්‍රති මිලදී ගැනීම්)**
නැවත මිලදී ගැනීමේ ගිවිසුම මත විකිණූ සුරැකුම්පත් පිළිබඳ විස්තර පිටු අංක 368හි සටහන් අංක (35) හි දැක්වේ.

**(ඊ) නිකුත් කළ ණය සුරැකුම්පත්**
නිකුත් කළ ණය සුරැකුම්පත් පිළිබඳ විස්තර පිටු අංක 370 සටහන් අංක 37හි දැක්වේ.

### 2.5.1.6 ව්‍යුත්පන්න වත්කම් සහ වගකීම්

ව්‍යුත්පන්න වූ කලී පහත සඳහන් ගුණාංග තුනෙන්ම සමන්විත මූල්‍ය උපකරණයක් හෝ වෙනත් ගිවිසුමකි.

1. මූල්‍ය නොවන විචල්‍ය අතින් ගිවිසුමෙහි පාර්ශ්වයකට එය සීමා නොවේ නම්, නිශ්චිත පොළී අනුපාත, මූල්‍ය උපකරණ මිල, වෙළෙඳ ද්‍රව්‍ය මිල, විදේශ විනිමය අනුපාත, මිල හෝ අනුපාත දර්ශක, ණය ශ්‍රේණිගත කිරීම් හෝ ණය දර්ශක හෝ වෙනත් විචල්‍ය වල වෙනස්කම්වලට ප්‍රතිචාර ලෙස එහි අගය වෙනස් වෙයි.

2. ඊට මූලික ශුද්ධ ආයෝජන හෝ වෙළෙඳපොළ සාධක වල වෙනස්වීම්වලට සමාන ප්‍රතිචාර දැක්වීමට අපේක්ෂිත වෙනත් ගිවිසුම් වර්ගවලට අවශ්‍ය ප්‍රමාණයට වඩා අඩු මූලික ශුද්ධ ආයෝජන අවශ්‍ය නොවේ.

3. එය ඉදිරි දිනයකදී පියවනු ලැබේ.

## මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

බැංකුව විවිධ පාර්ශ්ව සමඟ ව්‍යුත්පන්න ගනුදෙනුවලට එළඹෙයි. පොළී අනුපාත හුවමාරු, ණය පැහැර හැරීම් හුවමාරු, විවිධ විනිමය හුවමාරු, ඉදිරි විදේශ හුවමාරු ගිවිසුම් සහ විදේශ ව්‍යවහාර මුදල් ඊට ඇතුළත්ය. ව්‍යුත්පන්න සාධාරණ අගයට වාර්තා කරන අතර එම අගය ධන වන විට වත්කම් ලෙස සලකන අතර, සාධාරණ අගය ඍණ වන විට වගකීම් ගණයෙහිලා සැලකෙයි. එවන් ව්‍යුත්පන්නවල සාධාරණ අගය සහ නාමික අගය සටහන් අංක 19 හි වෙන් වෙන්ව හෙළිදරව් කර ඇත. ඉදිරි ගිවිසුම් ගිණුම්කරණය අදාළ කර නොගන්නේ නම් ව්‍යුත්පන්න වල සාධාරණ අගයෙහි වෙනස්වීම්, ශුද්ධ වෙළෙඳ ආදායම් හි ඇතුළත් කෙරෙයි.

**2.5.1.6.1 ලාභ/අලාභ මඟින් සාධාරණ අගයට වාර්තා කළ ව්‍යුත්පන්න**

ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් සාධාරණ අගයට වාර්තා කරනු ලැබෙයි. ව්‍යුත්පන්නයන්හි සාධාරණ අගයෙහි වෙනස්කම් ආදායම් ප්‍රකාශයෙහි "වෙළෙඳාමෙන් ලද ශුද්ධ ලාභ/(අලාභ)" යටතේ ඇතුළත් වෙයි.

**2.5.1.6.2 අවදානම් කළමනාකරණ අරමුණු සහ ඉදිරි ගිවිසුම් ගිණුම්කරණය සඳහා රඳවාගන්නා ව්‍යුත්පන්න**

වෙළෙඳ වත්කම් හා වගකීම් ලෙස වර්ගීකරණය නොකළ සියලු ව්‍යුත්පන්න වත්කම් හා වගකීම්, අවදානම් කළමනාකරණ අරමුණු සඳහා රඳවා ගන්නා ව්‍යුත්පන්න වලට අයත් වේ. අවදානම් කළමනාකරණ අරමුණු සඳහා රඳවා ගන්නා ව්‍යුත්පන්න මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සාධාරණ අගයට මනිනු ලබයි.

2.5.1.7 මූල්‍ය වත්කම් හා වගකීම් නැවත වර්ගීකරණය

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 ට අනුව මූල්‍ය වත්කම් ඒවායේ මූලික හඳුනාගැනීමෙන් අනතුරුව අත්පත් කර ගැනීම, ඉවතලීම හෝ ව්‍යාපාරික ක්‍රියාදාමයක් නැවතීම යනාදිය ඇතුළත්ව එවන් මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා ව්‍යාපාරික ආකෘතියක අරමුණ සමූහය විසින් වෙනස් කරනු ලබන දුර්ලභ අවස්ථාවලදී පමණක් හැර ඒවායේ මූලික හඳුනාගැනීමට පසුව නැවත වර්ගීකරණය නොකෙරෙයි.

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 ප්‍රකාර නැවත වර්ගීකරණය කිරීම්වලට අවසර නොමැති හෙයින් මූල්‍ය වගකීම් නැවත වර්ගීකරණය නොකෙරෙයි.

**2.5.1.7.1 මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය හා මිනීම**

2.5.1.7.1.1 ලාභ/අලාභ මඟින් සාධාරණ අගයට මූල්‍ය උපකරණ නැවත වර්ගීකරණ

- **වෙනත් විස්තීරණ ආදායම් මඟින් සාධාරණ අගය**

  නැවත වර්ගීකරණ දිනට සාධාරණ අගය නව දළ ධාරණ අගය බවට පත් වෙයි. නව දළ ධාරණ අගය මත පදනම්ව සඵල පොළී අනුපාතිකය ගණනය කෙරෙයි. සාධාරණ අගයෙහි පසුකාලීන වෙනස්කම් වෙනත් විස්තීරණ ආදායම්හි හඳුනාගනු ලැබෙයි.

- **ක්‍රමක්ෂය පිරිවැය**

  නැවත වර්ගීකරණ දිනට සාධාරණ අගය නව ධාරණ අගය බවට පත් වෙයි. නව දළ ධාරණ අගය මත පදනම්ව සඵල පොළී අනුපාතිකය ගණනය කෙරෙයි.

2.5.1.7.1.2 වෙනත් විස්තීරණ ආදායම් මඟින් සාධාරණ අගයට මූල්‍ය උපකරණ නැවත වර්ගීකරණය

- **ලාභ/අලාභ මඟින් සාධාරණ අගය**

  වෙනත් විස්තීර්ණ ආදායම්හි සමුච්චිත ශේෂය, නැවත වර්ගීකරණ දිනට ලාභයට/අලාභයට නැවත වර්ගීකරණය කෙරෙයි.

- **ක්‍රමක්ෂය පිරිවැය**

  මූල්‍ය වත්කම්, සාධාරණ අගයට නැවත වර්ගීකරණ කරයි. වෙනත් විස්තීර්ණ ආදායම් හි සමුච්චිත ශේෂය, ඉවත් කර නැවත වර්ගීකරණ දිනට සාධාරණ අගයට ගැලපීම් කරයි. ගලපන ලද අගය, ක්‍රමක්ෂය පිරිවැය බවට පත් වෙයි.

මූලික හඳුනාගැනීමේදී තීරණය කරන ලද සඵල පොළී අනුපාතිකය හා දළ ධාරණ අගය, නැවත වර්ගීකරණ ප්‍රතිඵල ලෙස ගලපනු නොලබයි.

2.5.1.7.1.3 ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය උපකරණ නැවත වර්ගීකරණය

- **වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගය**

  වත්කම සාධාරණ අගයට යළි මනිනු ලබන අතර වෙනස වෙනත් විස්තීරණ ආදායම්හි හඳුනාගනු ලබයි. මූලික හඳුනාගැනීමේදී තීරණය කරනු ලබන සඵල පොළී අනුපාතික, නැවත වර්ගීකරණයෙහි ප්‍රතිඵල ලෙස ගලපනු නොලබයි.

- **ලාභ/අලාභ මඟින් සාධාරණ අගය**

  නැවත වර්ගීකරණ දිනට සාධාරණ අගය නව ධාරණ අගය බවට පත් වෙයි. ක්‍රමක්ෂය පිරිවැය සහ ධාරණ අගය අතර වෙනස ලාභ සහ අලාභ ලෙස හඳුනාගනු ලැබෙයි. වාර්තා කරනු ලබන කාලසීමාව සඳහා බැංකුව හා සමූහය විසින් කිසිදු මූල්‍යමය උපකරණ නැවත වර්ගීකරණය කිරීමක් සිදු නොවිණි.

2.5.1.8 මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හඳුනා නොගැනීම

**2.5.1.8.1 මූල්‍ය වත්කම්**

වත්කම මඟින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය ඉකුත්වී ඇති විට හෝ වත්කම වෙතින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය සමූහය විසින් වෙනත් පාර්ශ්වයකට පවරා ඇති විට හෝ වත්කමෙහි සියලුම අවදානම් හා ප්‍රතිලාභ සමූහය විසින් සැලකියයුතු මට්ටමකට වෙනත් පාර්ශ්වයකට පවරා හෝ සමූහය විසින් වත්කමට අදාළ සියලුම අවදානම් හා ලාභ සැලකියයුතු මට්ටමකට රඳවාගෙන පවරා නොමැති මුත් වත්කමෙහි පාලනය පවරා ඇති විට, සමූහය විසින් මූල්‍ය වත්කමක් (හෝ අදාළ අවස්ථාවලදී මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක්) හඳුනාගනු නොලබයි.

මූල්‍ය වත්කම් හඳුනා නොගැනීම තුළ වත්කමක ධාරණ අගය (වත්කමක හඳුනා ගනු නොලබන කොටසට වෙන් කරන ලද ධාරණ අගය) සහ ලද මුදල්වල (ලද නව වත්කම් අඩු කිරීම නව වගකීම් ඇතුළත්ව) වෙනස සහ වෙනත් විස්තීර්ණ ආදායමෙහි හඳුනා ගන්නා ලද සමුච්චිත ලැබීම්/අලාභ, ලාභයට/අලාභයට හඳුනාගනු ලබයි.

කෙසේ වුවද ධාරණ අගයට වෙනස් විස්තීරණ ආදායම් හි නියම කරන ලද හිමිකම් ආයෝජන සුරැකුම් සම්බන්ධයෙන් වෙනත් විස්තීරණ ආදායම් හි හඳුනාගනු ලබන සමුච්චිත ලැබීම්/අලාභ, ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 අනුව එවන් සුරැකුම් හඳුනා ගැනීම මත ලාභයට/අලාභයට හඳුනාගනු නොලබයි. සමූහය විසින් ජනිත/රඳවාගනු ලැබූ මාරු කරන ලද මූල්‍ය වත්කම්වල පොළිය හඳුනාගනු නොලැබීමට හසු වන අතර වෙනත් වත්කමක්/වගකීමක් ලෙස හඳුනාගනු ලැබෙයි.

මූල්‍ය තත්වය පිළිබඳ වත්කම් ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති වත්කම් පවරනු ලබන ගනුදෙනුවලට සමූහය ඇතුළත් වන නමුත් මාරු කරන ලද වත්කම්වල සියලු අවදානම් සහ ප්‍රතිලාභ සියල්ල හෝ සැලකිය යුතු ප්‍රමාණයක් හෝ කොටසක් රඳවා ගනු ලබයි. වත්කම මඟින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය සමූහය විසින් වෙනත් පාර්ශ්වයකට පවරා ඇති විට හෝ මුදල් ප්‍රවාහ මුළුමනින්ම තෙවන පාර්ශ්වයකට ගෙවීමට බැඳීමක් ඇති කරගත් විට සමූහය විසින් වත්කම් වලට අදාළ සියලුම අවදානම් හා ලාභ සැලකිය යුතු මට්ටමකට රඳවාගෙන හෝ පවරා නොමැති මුත් වත්කමෙහි පාලනය පවරා ඇති විට වත්කමෙහි කටයුතු සම්බන්ධයෙන් සමූහයේ සහභාගීත්වයේ ප්‍රමාණය අනුව අදාළ වත්කම හඳුනාගනු ලබයි. එබඳු අවස්ථාවලදී සමූහය විසින් ආශ්‍රිත වගකීමක් ද හඳුනාගනු ලබයි. සමූහය විසින් රඳවාගනු ලැබූ අයිතීන් හා වගකීම් පිළිබිඹු වන ආකාරයට පවරන ලද වත්කම් හා ආශ්‍රිත වගකීම් මනිනු ලබයි.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

**2.5.1.8.2 මූල්‍ය වගකීම්**

වගකීම් යටතට ගැනෙන ගිවිසුම්ගත බැඳියාව ඉකුත් වී හෝ අවලංගු වී හෝ නිදහස් කර ඇති විට මූල්‍ය වගකීම හඳුනාගැනීම සමූහය විසින් අත් හරිනු ලබයි.

### 2.5.1.9 මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් නවීකරණය

**2.5.1.9.1 මූල්‍ය වත්කම් නවීකරණය**

මූල්‍ය වත්කම් පිළිබඳ කොන්දේසි නවීකරණය කෙරෙයි නම්, නවීකරණය කරන ලද වත්කම්වල මූල්‍ය ප්‍රවාහ සැලකිය යුතු ලෙස වෙනස් වන්නේදැයි සමූහය ඇගයීමට ලක් කරයි. මුදල් ප්‍රවාහ සැලකිය යුතු ලෙස වෙනස් වන්නේ නම්, මුල් මූල්‍ය වත්කමෙහි සිට මුදල් ප්‍රවාහවලට ඇති ගිවිසුම්ගත අයිතීන් කල් ඉකුත් වී ඇති බවට සැලකෙයි. මෙහිදී හඳුනාගත් මුල් මූල්‍ය වත්කම් ඉවත් කර නව මූල්‍ය වත්කමක් සාධාරණ අගයට හඳුනාගනු ලබයි.

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 ට අනුව, ක්‍රමක්ෂය පිරිවැයට පවතින නවීකරණය වූ වත්කම්වල මූල්‍ය ප්‍රවාහ සැලකිය යුතු ලෙස වෙනස් නෙවේ නම්, එකී නවීකරණය, හඳුනාගත් මූල්‍ය වත්කම් ඉවත් කිරීමකට තුඩු නොදෙයි. මේ අවස්ථාවේදී මූල්‍ය වත්කම් දළ ධාරණ අගයට, සමූහය විසින් නැවත ගණනය කර එම දළ ධාරණ අගය ගැලපීම තුළින් ඇති වන ලාභය/අලාභය නවීකරණ ලාභය/අලාභය ලෙස ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනී. ණයකරුගේ මූල්‍ය අපහසුතා හේතුවෙන් එවන් නවීකරණය කිරීමක් සිදුවන්නේ නම්, අදාළ ලාභය/අලාභය හානිකරණ පාඩු සමඟින් ඉදිරිපත් කෙරෙයි. අනෙක් අවස්ථාවන්හිදී එය පොළී ආදායමක් ලෙස ඉදිරිපත් කෙරෙයි.

**2.5.1.9.2 මූල්‍ය වගකීම් නවීකරණය**

පවතින මූල්‍ය වගකීමක් එකී ණයකරුගේම වෙනත් මූල්‍ය වගකීමකින් ආදේශ වන විට, පවත්නා කොන්දේසි සැලකිය යුතු ලෙස වෙනස් වන්නේ නම් සහ පවතින වගකීමක කොන්දේසි සැලකියයුතු ලෙස නවීකරණය වන්නේ නම්, එවන් හුවමාරු කිරීමක්/නවීකරණය කිරීමක් මුල් වගකීමෙහි ඉවත් කිරීමක් සිදුවන අතර එය නව වගකීමක් ලෙස හඳුනා ගැනෙයි. මෙහිදී නවීකරණය වූ කොන්දේසි මත පදනම් වූ නව මූල්‍ය වගකීමක් සාධාරණ අගයට හඳුනාගනු ලබයි. ඉවත් වූ මූල්‍ය වගකීමෙහි සහ නවීකරණය වූ කොන්දේසි සහිත නව මූල්‍ය වගකීමෙහි ධාරණ අගයෙහි වෙනස ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනු ලබයි.

### 2.5.1.10 මූල්‍ය උපකරණ හිලව් කිරීම

හඳුනාගනු ලැබූ අගයන් හිලව් කිරීමට දැනට ක්‍රියාත්මක කළහැකි නීතිමය අයිතියක් වේ නම් පමණක් සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ එකවර වත්කම් උපලබ්ධි වීමට හෝ වගකීම් පියවීමට අරමුණක් වේ නම්, මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ අගය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වාර්තා කෙරෙයි. බැංකුව හා සමූහය විසින් වාර්තා කරනු ලබන කාලසීමාව තුළ කිසිඳු මූල්‍ය උපකරණ හිලව් කිරීමක් සිදු නොකෙරිණි.

### 2.5.1.11 ක්‍රමක්ෂය පිරිවැය සහ දළ ධාරණ අගය

මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වගකීමක ක්‍රමක්ෂය පිරිවැය යනු මූලික හඳුනාගැනීමේ පිරිවැයෙන් මුල් ආපසු ගෙවීම් අඩුකර මූලික අගය හා කල් පිරුණු අගය අතර වෙනස සඵල පොළී අනුපාත ක්‍රමවේදය උපයෝගී කර ගනිමින් ගණනය කළ සමුච්චිත ක්‍රමක්ෂය එකතුකර හෝ අඩුකර මනිනු ලබන මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්වල අගයයි. මූල්‍ය වත්කම්වලට අපේක්ෂිත ණය පාඩු දීමනා ද ගලපනු ලබයි.

මූල්‍ය වත්කමක දළ ධාරණ අගය වූ කලී, කිසියම් අපේක්ෂිත ණය පාඩු දීමනාවක් සඳහා ගැලපීමට ප්‍රථම මූල්‍ය වත්කමක ක්‍රමක්ෂය පිරිවැයයි.

### 2.5.1.12 මූල්‍ය උපකරණවල සාධාරණ අගය

සාධාරණ අගයෙහි ධූරාවලිය ඇතුළත්ව මූල්‍ය උපකරණවල සාධාරණ අගය මිනීම පිළිබඳ අංක 312 හා 429 යන පිටුවල සටහන් අංක 2.3 හි හා 55 හි දක්වා ඇත.

## 2.5.2 මූල්‍ය වත්කම් හානිකරණය

### 2.5.2.1 අපේක්ෂිත ණය පාඩු පිළිබඳ දළ විශ්ලේෂණය

2018 ජනවාරි 01 දින සිට ලාභ/අලාභ මඟින් සාධාරණ අගයට රඳවා නොගත් වෙනත් මූල්‍ය වත්කම් හා සියලුම ණය සඳහා අපේක්ෂිත ණය පාඩු දීමනා මෙම කොටසෙහි "මූල්‍ය උපකරණ" ලෙස දක්වා ඇති ණය බැඳීම් සහ මූල්‍ය ඇපකර ගිවිසුම් සමඟින් බැංකුව විසින් වාර්තා කරනු ලැබ ඇත. ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 යටතේ හිමිකම් උපකරණ හානිකරණයට ලක් නොවේ.

ආරම්භයේ පටන් සැලකියයුතු ණය අවදානම් වර්ධනයක් නොමැති විටකදී හැර ණය පාඩු දීමනාව මාස 12 කට අපේක්ෂිත ණය පාඩු ලෙස ගණනය වෙයි. එසේ නොමැති වූ විට වත්කමක ජීවකාලය තුළ පැන නැගීමට ඉඩ ඇති ණය පාඩු මත පදනම්ව අපේක්ෂිත ණය පාඩු දීමනාව තීරණය වෙයි. ණය අවදානමෙහි සැලකියුතු වර්ධනයක් සිදුවී ඇත්දැයි යන්න තීරණය කිරීම සඳහා වූ බැංකුවේ ප්‍රතිපත්ති පිළිබඳ පිටු අංක 319 හි සටහන් අංක 2.5.2.7 හි දක්වා ඇත.

මාස 12 තුළ අපේක්ෂිත ණය පාඩු යනු වාර්තාකරනු ලබන දිනෙන් මාස 12 ක් තුළ මූල්‍ය උපකරණ මත පැහැර හැරීමේ සිදුවීම් මඟින් අපේක්ෂිත ණය පාඩු මඟින් නියෝජනය කරනු ලබන ජීවකාල අපේක්ෂිත ණය පාඩුවල කොටසකි. සලකනු ලබන මූල්‍ය උපකරණ කළඹේ ස්වභාවය මත පදනම්ව ජීවකාල අපේක්ෂිත ණය පාඩු සහ මාස 12 තුළ අපේක්ෂිත ණය පාඩු යන ද්විත්වයටම කේවල පදනම මත හෝ සාමූහික පදනම මත ගණනය කෙරෙයි.

මූල්‍ය උපකරණවල අවශේෂ ජීවකාලය පුරාවට ණය පැහැර හැරීම් සිදුවීමේ අවදානම වෙනස්වීම සලකා බලමින් බැංකුව විසින් සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේදීම යම් මූල්‍ය උපකරණයකට ණය අවදානම මූලික හඳුනාගැනීමේ පටන් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇතිදැයි ඇගයීමක් කිරීමේ ප්‍රතිපත්තියක් ස්ථාපිත කර ඇත.

එබඳු ක්‍රියාවලි මත පදනම්ව බැංකුව විසින් 1 අදියර, 2 අදියර, 3 අදියර ලෙස ණය කාණ්ඩ ගත කරනු ලබයි.

**1 වන අදියර**

- ණය පළමුව හඳුනාගනු ලැබූ විට බැංකුව විසින් මාස 12 තුළ අපේක්ෂිත ණය පාඩු මත පදනම් වූ දීමනාවක් හඳුනාගනු ලබයි. ණය අවදානම යහපත් වී ඇති විට සහ 2 වන අදියරෙන් ණය නැවත වර්ගීකරණය කර එම පහසුකම් 1 වන අදියරේ ණය වලට ඇතුළත් කරයි.

**2 වන අදියර**

- ආරම්භයේ පටන් ණය අවදානමෙහි සැලකිය යුතු වර්ධනයක් පෙන්වනු ලබන විට බැංකුව විසින් ජීවකාල අපේක්ෂිත ණය පාඩු සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලබයි. ණය අවදානම යහපත් වී 3 වන අදියරෙන් නැවත වර්ගීකරණය කර ණය පහසුකම් ද 2 වන අදියරේ ණය යටතට අයත් වේ.
- ගනුදෙනුකාර ගිවිසුම්ගත ගෙවීම් සිදු කළයුතු කාලසීමාව දින 30 ඉක්මවන අවස්ථාවලදී පහත 3 අදියර යටතේ වර්ගීකරණය කර ඇති ණය පහසුකම්වලදී හැර ශ්‍රී ල.මූ.වා.ප්‍ර. 9 හි ප්‍රකාශිත උපකල්පනයට යටත්ව ණය පහසුකම් ලබාදෙයි.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

3 වන අදියර

- ගනුදෙනුකාර ගිවිසුම්ගත ගෙවීම් සිදු කළයුතු කාලසීමාව දින 90 ඉක්මවන අවස්ථාවලදී ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 හි ප්‍රකාශිත උපකල්පනවලට යටත් ණය පහසුකම්
- දෙවරකට වඩා ප්‍රතිව්‍යුහගත කරන ලද සියලු ණය
- සියලුම නැවත සැලසුම් කළ ණය
- ශ්‍රී ලංකා මහ බංකු නියාමන ප්‍රකාර අක්‍රීය ලෙස වර්ගීකරණය කරන ලද සියලු ණය පහසුකම්/ගනුදෙනුකරුවන් ගනුදෙනුකරුවකුගේ හෝ උපකරණයක අවදානම් ශ්‍රේණිගත කිරීම, ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතනයක් මඟින් B+ දක්වා පහත දැමූ අවස්ථාවලදී සහ/හෝ බැංකුවල අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ පද්ධතිය මාපාංක 2 කින් පහත දැමූ අවස්ථාවලදී, ණය පහසුකම්/ගනුදෙනුකරුවන් ණය අවදානම් කැපී පෙනෙන ලෙස වර්ධනය (සටහන් අංක 2.5.2.7 වෙත යොමු වන්න)
- මූල්‍ය වත්කම්, උදෙසා මුළු හිඟ මුදල හෝ ඉන් කොටසක් හෝ යළි අයකර ගැනීමට බැංකුව සතු සාධාරණ අපේක්ෂාවන් නොපවතින විටදී මූල්‍ය වත්කම් හි දළ ධාරණ අගය අඩු කෙරෙයි. මෙය මූල්‍ය වත්කම් (අර්ධ වශයෙන්) හඳුනාගැනීම අත්හැරීමක් යැයි සැලකේ.

### 2.5.2.2 අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීම

සඵල පොළී අනුපාතිකයට ආසන්න වට්ටම් අගයක් යොදාගෙන අපේක්ෂිත මුදල් හිඟය මිනීමට බැංකුව විසින් අපේක්ෂිත ණය පාඩු ගණනය කරනු ලබයි. මුදල් හිඟය යනු ගිවිසුම් අනුව ආයතනයකට ගෙවිය යුතු මුදල් ප්‍රවාහ හා ගිවිසුම ප්‍රකාර යම් ආයතනයක් විසින් ලබා ගැනීමට අපේක්ෂිත මුදල් ප්‍රවාහ අතර පරතරයයි.

අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීමේ යාන්ත්‍රණය පහත සඳහන් පරිදි සැකෙවින් දක්වා ඇති අතර ප්‍රධාන සාධක පහත පරිදි වේ.

- **පැහැර හැරීමේ සම්භාවිතාවය (PD)**

  මෙය වූ කලී යම් කාලසීමාවක් තුළ ණය ගෙවීම පැහැර හැරීමේ හැකියාව පිළිබඳ ඇස්තමේන්තුවයි. යම් ණය පහසුකමක් මීට පෙර හඳුනාගෙන නොතිබිණි නම් සහ තවමත් කළඹට අයත් නම්, ඇගයීමට බඳුන් කාල පරිච්ඡේදය තුළ නිශ්චිත කාලසීමාවකදී පමණක් පැහැර හැරීම සිදුවිය හැකිය.

- **පැහැර හැරීමට නිරාවරණයවීම (EAD)**

  මෙය වූ කලී ගිවිසුම් මත හෝ වෙනත් හේතූන් මත මුල් මුදල සහ පොළිය ආපසු ගෙවීමද අතපසු වූ ගෙවීම්වල සමුච්චිත පොළිය ද ඇතුළුව වාර්තා කළ දිනට පසුව නිරාවරණයවීම්හි අපේක්ෂිත වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් ඉදිරි පැහැර හැරීම් දිනකදී නිරාවරණය වීමේ තක්සේරුවයි.

- **පැහැර හැරීමකදී සිදුවියහැකි පාඩුව (LGD)**

  මෙය වූ කලී යම් අවස්ථාවකදී පැහැර හැරීමක් සිදුවූ විටක උද්ගත වන පාඩුව ඇස්තමේන්තු කිරීමයි. කිසියම් පාර්ශ්වයක් ඇප සුරැකුම් උපලබ්ධිවීම් ද ඇතුළුව ණය හිමියන් විසින් ලබා ගැනීමට අපේක්ෂිත සහ ලබාගැනීමට නියමිත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ අතර වෙනස මත එය පදනම් වේ. එය සාමාන්‍යයෙන් පැහැර හැරීමට නිරාවරණය වීමෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කරනු ලබයි.

  ඊට ප්‍රථම කාලසීමාවක් තුළ ඇරයුම් කිරීමට බැංකුව සතුව නීතිමය අයිතියක් වේ නම් හැර ණය පාඩු තීරණය කරනු ලබන උපරිම කාලසීමාව, මූල්‍ය උපකරණයකට ගිවිසුම්ගත ජීව කාලයයි.

  හානිකරණ පාඩු සහ මුදාහැරීම්, මූල්‍ය වත්කම්වල දළ ධාරණ අගයෙහි ගැලපීමක් ලෙස ගණනය කරනු ලබන අතර නවීකරණය මඟින් ජනිත වූ අලාභ/ලැබීම් වලින් වෙන්කර හෙළිදරව් කරනු ලබයි.

  අපේක්ෂිත ණය පාඩු ක්‍රමවේද යාන්ත්‍රණ පහත සැකෙවින් දක්වා ඇත.

1 වන අදියර

වාර්තා කරනු ලබන දිනෙන් පසුව එළඹෙන මාස 12 ක කාලසීමා තුළ පැවතිය හැකි මූල්‍ය උපකරණ මත ආපසු ගෙවීම් පැහැර හැරීම්වල ප්‍රතිඵල ලෙස ඇති වියහැකි අපේක්ෂිත ණය පාඩු, ජීව කාලය පුරා අපේක්ෂිත ණය පාඩුවල කොටසක් ලෙස මාස 12 ක් තුළ අපේක්ෂිත ණය පාඩු ගණනය කෙරෙයි. වාර්තා කරන දිනට පසුව එළඹෙන මාස 12 තුළ අපේක්ෂිත, පැහැර හැරීමේ සම්භාවිතාව පදනම් කරගෙන මාස 12 ක් තුළ අපේක්ෂිත ණය පාඩු ගණනය කරයි. එම අපේක්ෂිත මාස 12 ක් තුළ පැහැර හැරීමේ අවදානම් පැහැර හැරීම් නිරාවරණ පුරෝකථනයට යොදා ගනිමින් අපේක්ෂිත පැහැර හැරීම් නිසා ඇති වන අලාභය ගුණිත කර මුල් සඵල පොළී අනුපාතිකයට ආදේශකයක් ලෙස යොදා ගනු ලැබෙයි.

2 වන අදියර

ආරම්භයේ පටන් ණය අවදානමෙහි කැපී පෙනෙන වර්ධනයක් ණය මඟින් පෙන්නුම් කර ඇති විට බැංකුව විසින් ජීව කාල අපේක්ෂිත ණය පාඩු වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කරයි. එහිදී අදාළ කරගනු ලබන යාන්ත්‍රණය ඉහත විස්තර කර ඇති කරුණු වලට සමාන වන නමුත් උපකරණයෙහි ජීව කාලය අරභයා පැහැර හැරීමේ සම්භාවිතාව සහ පැහැර හැරීම මත අලාභ තක්සේරු කෙරෙයි. මුල් සඵල පොළී අනුපාතිකය ආසන්න වශයෙන් සැලකීමෙන් අපේක්ෂිත හිඟ මුදල් වට්ටම් කෙරෙයි.

3 වන අදියර

හානිකරණය වී ඇතැයි සැලකෙන ණය සඳහා බැංකුව විසින් ජීවකාල අපේක්ෂිත ණය පාඩු හඳුනාගනු ලබයි. මෙම ක්‍රමවේදයේ, ණය පැහැර හැරීමේ සම්භාවිතාව 100% ලෙස සලකන අතර අනෙකුත් දෑ අදියර 2 වත්කම් සඳහා වූ ක්‍රමවේදයට සමාන වේ.

### 2.5.2.3 හානිකරණයෙහි කේවල තක්සේරුව

පෙර තීරණය කරන ලද සීමාවකට (වෙන් වෙන් වශයෙන් ගත්විට වැදගත් වන මූල්‍ය වත්කම්) වඩා ඉහළ මූල්‍ය වත්කම් සඳහා හානිකරණ පාඩුවක් සිදුවී ඇති බවට විෂයානුබද්ධ සාක්ෂි පවතී නම්, වත්කමෙහි ධාරණ අගය සහ අනාගත මුදල් ප්‍රවාහවල (අනාගත අපේක්ෂිත ණය පාඩු ඉවත් කළ විට) තක්සේරුගත වත්මන් අගය අතර වෙනස, අලාභ අගය ලෙස මනිනු ලබයි.

සුරැකුම් ලෙස තබා ඇති මූල්‍ය වත්කම්වල තක්සේරුගත ඉදිරි මුදල් ප්‍රවාහවල වත්මන් අගය ගණනය කිරීම මඟින් පූර්වාවරණය කිරීම හෝ නොකිරීම කෙසේ වුවද වත්කම අත්පත් කර ගැනීම හා විකිණීම සඳහා වන පිරිවැය අඩුකර පූර්වාවරණය කිරීමේ ප්‍රතිඵල ලෙස ඇති වන මුදල් ප්‍රවාහ පිළිඹිබු වේ. පිටු අංක 345 හි ඇති සටහන් අංක 21 (ඈ) මඟින් කේවල හානිකරණ තක්සේරුව පිළිබඳ විස්තර දැක්වේ.

### 2.5.2.4 වෙන් වෙන්ව ගත් විට සැලකිය යුතු තක්සේරුවක් ඇති නමුත් වෙන් වෙන්ව හානිකරණය නොවූ ණය

- හානිකරණය නොවූ නමුත් වෙන් වෙන්ව ගත් විට සැලකිය යුතු ණය ආරම්භයේ පටන් සැලකිය යුතු ණය ක්ෂයවීම් තිබී ඇත්දැයි යන නිර්ණායක මත පදනම්ව 1 වන හෝ 2 වන අදියර යටතේ හානිකරණය සඳහා සාමූහිකව අගයනු ලබයි.
- බැංකුවේ සැලකියයුතු ණය අපහායනයන් සනිටුහන් කර ගැනීමේදී පහත නිර්ණායක සලකා බලනු ලබයි.
- දැනට පවතින මූල්‍ය උපකරණවල නවක ආරම්භයේදී දැනට පවතින කොන්දේසි හෝ අනුපාතිකවල මූලාරම්භයට වඩා ඇති සැලකිය යුතු වෙනස්කම්
- විශේෂිත මූල්‍ය උපකරණ හෝ සමාන මූල්‍ය උපකරණවල ණය අවදානම පිළිබඳ බාහිර වෙළඳපොළ දර්ශකවල සැලකියයුතු වෙනස්කම්
- ණයකරුවෙකුගේ ණය/හිමිකම් කොටස් උපකරණවල අගයෙහි වෙනස්කම් ආදී ණයකරුට සම්බන්ධ වෙනත් තොරතුරු
- ණයකරු සඳහා සත්‍ය/අපේක්ෂිත අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම් පහත වැටීම හෝ අභ්‍යන්තර වශයෙන් ණය අවදානම ඇගයීමට යොදා ගනු ලබන චර්යාත්මක ලකුණුවල පහත වැටීම.
- ණයකරුවෙකුට සිය බැඳියාවන් පියවීමට ඇති හැකියාවට සැලකිය යුතු බලපෑම් සිදු කරන දැනට පවතින හෝ ඉදිරියට පුරෝකථනය කළ අහිතකර ව්‍යාපාරික වෙනස්වීම්, මූල්‍ය හෝ ආර්ථික තත්ත්වයන්.

## මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

- ආදායමෙහි තත්‍ය හෝ අපේක්ෂිත අඩුවීම, මෙහෙයුම් අවදානම ඉහළයාම, කාරක ප්‍රාග්ධන හිඟය, වත්කමෙහි ගුණාත්මක බව අඩුවීම, තෝලනය ඉහළ යාම, ද්‍රවශීල කළමනාකාරිත්වයට අදාළ ගැටළු නිසා ණයකරුගේ මෙහෙයුම් ප්‍රතිඵල වල සත්‍ය හෝ අපේක්ෂිත සැලකිය යුතු වෙනස්වීම්
- එකම ණයකරුගේ වෙනත් මූල්‍ය උපකරණ මත ණය අවදානම සැලකියයුතු ලෙස වර්ධනය වීම.
- ණය බැඳීම්වලට මුහුණදීමට ණයකරුවෙකු සතු හැකියාවෙහි සැලකිය යුතු වෙනස්වීම්වලට තුඩු දෙන ණයකරුගේ නියාමන, ආර්ථික හෝ තාක්ෂණික පරිසරයෙහි සිදුවන සත්‍ය හෝ අපේක්ෂිත සැලකිය යුතු අහිතකර වෙනස්වීම්.

### 2.5.2.5 වෙනත් විස්තීරණ ආදායම් මඟින් සාධාරණ අගයට මනින ලද ණය උපකරණ

වෙනත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ අගයට මනින ලද ණය උපකරණ සඳහා අපේක්ෂිත ණය පාඩු මඟින් සාධාරණ අගයට පවතින මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි මූල්‍ය වත්කම්වල ධාරණ අගයට අඩු නොකෙරෙයි. ඒ වෙනුවට ක්‍රමක්ෂය පිරිවැයට වත්කම් අගය කිරීමෙන් ඇති වන වෙන් කිරීමට සමාන අගයක් සමුච්චිත හානිකරණ අගයක් ලෙස වෙනත් විස්තීරණ ආදායම්හි හඳුනාගනු ලබන අතර අදාළ අනෙක් සටහන ආදායම් ප්‍රකාශයට ගලපනු ලබයි. විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගත් සමුච්චිත පාඩු වත්කම ඉවත් කිරීමේදී නැවත ආදායම් ප්‍රකාශයට ගලපනු ලබයි. වාර්තාකරණ කාලසීමාව තුළ හානිකරණයට භාජනය වූ වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකමට මනින ලද ණය උපකරණ කිසිවක් බැංකුව හා සමූහය සතු නොවිණි.

### 2.5.2.6 ප්‍රක්ෂේපිත තොරතුරු

අපේක්ෂිත ණය පාඩු ආකෘතියේ දී බැංකුව විසින් ආර්ථික සාධක ලෙස පහත සඳහන් ආකාරයේ පුළුල් පරාසයක ප්‍රක්ෂේපිත තොරතුරු මත රඳා පවතී.

- දළ දේශීය නිෂ්පාදිත වර්ධන වේගය
- විරැකියා අනුපාත
- උද්ධමනය අනුපාත
- විනිමය හුවමාරු අනුපාතික
- පොළී අනුපාත

අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීම සඳහා උපයෝගී කරගනු ලබන යෙදවුම් සහ ආකෘති සෑම විටකම මූල්‍ය ප්‍රකාශනයෙහි දිනට වෙළෙඳපොළ හැසිරෙන ආකාරය මුළුමනින්ම ග්‍රහණය කරගනු නොලැබේය. මෙය පිළිඹිබු කිරීම සඳහා එවන් සැලකිය යුතු වෙනස්වීම් පවතින අවස්ථාවලදී තාවකාලික ගැලපුම් ලෙස ගුණාත්මක ගැලපුම් සිදුකරයි.

### 2.5.2.7 ණය අවදානම සැලකියයුතු ලෙස වර්ධනය වීම

යම් උපකරණයක් හා උපකරණ කළඹක් මාස 12 අපේක්ෂිත ණය පාඩු හෝ ජීවකාල අපේක්ෂිත ණය පාඩු සඳහා බඳුන්වී දැයි තීරණය කරගනු පිණිස අපේක්ෂිත ණය පාඩු යටතට ගැනෙන සියලු වත්කම් බැංකුව විසින් අඛණ්ඩ අධීක්ෂණය කරනු ලබයි. මූලික හඳුනා ගැනීමේ පටන් ණය අවදානමෙහි සැලකියයුතු වර්ධනයක් සිදු වී ඇත්දැයි සමූහය විසින් තක්සේරු කරනු ලබයි. අනවශ්‍ය පිරිවැයක් හෝ පරිශ්‍රමයක් රහිතව උපයෝජ්‍ය හා අදාළ වන සහය වන පිළිගත හැකි තොරතුරු බැංකුව විසින් සලකා බලනු ලැබෙයි. බැංකුවේ ඓතිහාසික කරුණු හා ප්‍රක්ෂේපිත තොරතුරු ඇතුළුව විශේෂඥ ණය තක්සේරු මත පදනම් වූ ප්‍රමාණාත්මක හා ගුණාත්මක විස්තර විශ්ලේෂණ මීට ඇතුළත්ය.

ඒ අනුව, පහත සඳහන් නිර්ණායක වලින් එකක් හෝ සපුරාලන ලද විට ණය අවදානම සැලකියයුතු ලෙස වර්ධනය වී ඇති බව බැංකුව විසින් සලකනු ලබයි.

- ගෙවිය යුතු ගිවිසුම්ගත ගෙවීම් දින 30 ඉක්මවීම. (ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ නගී)
- අඛණ්ඩව දෙවසරක් තුළ පෙර වර්ෂය සමඟ සන්සන්දනය කිරීමේදී ණය ගනු ලබන ආයතනයේ බදු පෙර ලාභයෙන්/පිරිවැටුමෙන් 50% ක අඩුවීම. (ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාමකි).
- පෙර මූල්‍ය වර්ෂය හා සසඳන විට ණය ගනු ලබන ආයතනයේ ශුද්ධ වටිනාකම 25% කින් පමණ අඩුවීම (ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාමකි).
- ණය ගනු ලබන ආයතනයේ බාහිර ණය වර්ගීකරණ ශ්‍රේණිය, පසුව BB+ හෝ ඊට පහළ දැමීම. (ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාමකි.) (SICR) ණය ප්‍රදානයේදී දුන් ණය වර්ගීකරණය පසුව පහළ දැමීම සලකා බැලිය යුතුය.
- අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීම් යටතේ ඒකක දෙකකින් පහළ දැමීම. (ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාමකි).
- ඉහළ නංවන ලද ණය පහසුකමට අමතරව ණය පහසුකම දෙවතාවක් ප්‍රතිව්‍යුහගත කිරීම.
- මුල්වරට එකඟ වූ දින සිට දෙවසරකට වඩා ප්‍රමාදයක් සහිත ව්‍යාපාරික මෙහෙයුම්/ව්‍යාපෘති ආරම්භක ප්‍රමාදවීම් (ගනුදෙනුකාර අවදානම මත පැහැර හැරීමේ නිර්ණායක හෝ ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාම යන දෙකම විය හැකිය).
- විශේෂිත දේපළක් සඳහා නිශ්චිත දර්ශක මත පදනම්ව සුරැකුමෙහි වටිනාකම සැලකිය යුතු ලෙස අඩුවී (25% ක් ඉක්මවා) හෝ සුරැකුම උපලබ්ධිවීමේ හැකියාව සැක සහිත වීම. (දේපළ දර්ශක) (ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාමකි).
- පොදු ප්‍රවේශය සහිත තොරතුරු මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලයේ හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ නිරන්තර වෙනස්වීම් (ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාමකි).
- ණය ගිවිසුමෙහි නිශ්චිතව දක්වා ඇති අරමුණ හැර වෙනත් අරමුණක් උදෙසා ණයකරු විසින් ණය මුදල පරිහරණය කරනු ලබන බවට සෘජු සාක්ෂි තිබීම.
- අවදානම අවම කිරීමේ කිසිදු පියවරකින් තොරව ඇපකරු විසින් ඇපකාරිත්වය ඉවත්කර ගැනීම.
- ඇස්තමේන්තුගත පිරිවැයේ සිට ව්‍යාපෘති අවසානයේ තෙක් ව්‍යාපෘති පිරිවැයෙහි සැලකිය යුතු ඉහළයාම (25%) ව්‍යාපෘති ආරම්භ වන තුරු මෙම සාධක අදාළ වේ.
- AAA ශ්‍රේණියේ සිට BBB - දක්වා ශ්‍රේණිගත කිරීම හැර වත්මන් බාහිර ශ්‍රේණිගත කිරීම් මඟින් එක් ඒකයකින් පහළ දැමීම.
- පිළිගත හැකි තොරතුරු මත ණය පහසුකම්හි කාර්ය සාධනය වෙත සැලකිය යුතු බලපෑමක් ඇති කළහැකි නීතිමය කෘත්‍යයට ණයකර යටත් වන බවට සාක්ෂි තිබීම (ගනුදෙනුකාර අවදානම මත පැහැර හැරීමේ නිර්නායක හෝ ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාම යන දෙකම විය හැකිය).
- ගෙවීමට නියමිත පියවිය යුතු ගෙවීම් අවස්ථා වළකන සුළු, ණය පහසුකම්හි කාර්යසාධනයට සෘජු බලපෑමක් ඇති කරන භූගෝලීය පිහිටීමෙහි සැලකිය යුතු විපර්යාස/ස්වභාවික ව්‍යසන (ගනුදෙනුකාර අවදානම මත පැහැර හැරීමේ නිර්නායක හෝ ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාම යන දෙකම විය හැකිය).
- ව්‍යාපෘතිය මෙහෙයවනු ලබන ක්ෂේත්‍රයට/ණය ලබාගත් අරමුණ වන ව්‍යාපෘතියෙහි/පහසුකම්හි ආපසු ගැනීමේ හැකියාවට හානිකරණ මට්ටමට සාර්ව ආර්ථික සාධක ක්ෂයවීම.
- එකඟ වූ පරිදි ණය ආපසු ගෙවීමේ මෙහෙයුම් වළකන නව රෙගුලාසි/රාජ්‍ය ප්‍රතිපත්ති වල බලපෑමද මීට අයත් වේ. (ගනුදෙනුකාර අවදානම මත පැහැර හැරීමේ නිර්නායක හෝ ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාම යන දෙකම විය හැකිය).
- ණය ආපසු ගෙවීමට අහිතකර බලපෑම් ඇති කරන ගිවිසුම් අත්හැරීම්, ගෙවීම් විලම්භනය, කාලය දීර්ඝ කිරීම ආදී සහන සලසන කොන්දේසි නවීකරණය (ගනුදෙනුකාර අවදානම මත පැහැර හැරීමේ නිර්නායක හෝ ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාම යන දෙකම විය හැකිය).
- ණයකරු හමුවීමට හෝ සම්බන්ධ කර ගැනීමට නොහැකිවීම (පැහැර හැරීම් දර්ශකය)

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

- ඉහළ දමන ලද ණය පහසුකම් හැරුණුවිට අනෙක්වා දෙවතාවකට වඩා ප්‍රතිව්‍යුහගත කිරීම (ණය හානිකරණ දර්ශක)
- ඉහළ දමන ලද ණය පහසුකම් හැරුණුවිට ප්‍රතිලේඛණගත කළ ණයපහසුකම්
- ගෙවිය යුතු ගිවිසුම්ගත ගෙවීම් දින 90 ඉක්මවීම.
- අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ගැටළු හේතුවෙන් හෝ අයිතිය අත්හැරීමේ ප්‍රකාශයක් හෝ හානිකර මතයක් හේතුවෙන් විගණකවරයා විසින් විගණන මත සීමා කර ඇති අවස්ථාවක,
- ණයකරු බුන්වත් වී ඇති බවට/ද්‍රවශීලතා ක්‍රියාමාර්ග දැනටමත් ඇරඹී ඇති බවට හෝ ආරම්භවීමට නියමිත බවට ණය පැහැර හැරීම් පිළිබඳ දර්ශක) සෘජු සාක්ෂි ඇති අවස්ථාවක,

### 2.5.2.8 ණය හානිකරණය වූ හා පැහැර හැරි වත්කම් පිළිබඳ නිර්වචනය

පහත සඳහන් අවස්ථාවලදී සමූහය විසින් වෙනත් ගනුදෙනුකරුවන් ලබා දෙන ණය හා අත්තිකාරම් පැහැර හැරීම් ලෙස සලකනු ලබයි.

- සුරැකුම් උපලබ්ධි කිරීම (සුරැකුම් කිසිවක් රඳවාගෙන ඇත්නම්) ආදී ක්‍රියාමාර්ගවලට යොමුවීම හැර ණයකරු විසින් අදාළ බැඳීම් මුළුමනින්ම ගෙවීමට අපොහොසත් අවස්ථාවලදී හෝ
- ණයකරු තම ගිවිසුම්ගත ගෙවීම් කළ යුතු දිනය ඉක්මවා දින 90 ක් ඉකුත් වී තිබීම.

වැඩිමනත් වශයෙන්, සමූහය විසින් යම් ආයෝජනයකට පවරා ඇති බාහිර ණය ශ්‍රේණිගත කිරීම, පැහැර හැරීමක් වන විට 3 වන අදියර යටතේ මූල්‍ය ආයෝජන වර්ගීකරණය කරනු ලබයි.

## 2.5.3 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ පිළිබඳ විස්තර පිටු අංක 357 හි සටහන් අංක 26 මඟින් දැක්වේ.

### 2.5.3.1 ක්ෂයවීම්

පිටු අංක 357 දක්වා ඇති සටහන් අංක 26 යටතේ ක්ෂයවීම් තොරතුරු දැක්වේ.

### 2.5.3.2 ණය ගැනීමේ පිරිවැය

ණය ගැනීමේ පිරිවැය පිළිබඳ ල.ගි.ප්‍ර. 23 - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ප්‍රකාර සුදුසුකම් ලබන වත්කමෙහි අත්පත් කර ගැනීම්, ඉදිකිරීම් හෝ නිෂ්පාදනය අදාළව සෘජුව හඳුනාගත හැකි ණය පිරිවැය වත්කමෙහි පිරිවැයෙන් කොටසක් ලෙස ප්‍රාග්ධනීත කරනු ලබයි. අපේක්ෂිත භාවිතාව හෝ විකිණීම සඳහා සූදානම් කිරීමේදී සැලකිය යුතු කාලසීමාවක් ගතවන වත්කම්, සුදුසුකම් ලබන වත්කම් නම් වේ. අනෙකුත් ණය ගැනීමේ පිරිවැය එම පිරිවැය හටගන්නා කාලසීමාව තුළ ඇති ලාභයට හෝ අලාභය මත හඳුනාගනී. වාර්තා කරන ලද කාලසීමාව තුළ බැංකුව හා සමූහය විසින් කිසිදු ණය ගැනීමේ පිරිවැයක් ප්‍රාග්ධනීත නොකරන ලදී.

## 2.5.4 අස්පෘශ්‍ය වත්කම්

අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ විස්තර පිටු අංක 362 හි සටහන් අංක 29 මඟින් දැක්වේ.

## 2.5.5 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදීම විලම්බිත බදු වත්කම් නොවන වත්කම් හානිකරණය වූ බවට කිසියම් හෝ සළකුනක් ඇත්දැයි සමූහය විසින් අගයනු ලබයි. එබඳු හැඟවීමක් ඇත්නම් හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂාවක් සිදුකිරීම අවශ්‍ය වන්නේ නම්, සමූහය විසින් වත්කමෙන් නැවත අයකරගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ධාරණ අගය එහි නැවත අයකරගත හැකි වටිනාකම ඉක්මවයි නම්, එම වත්කම හානිකරණය වී ඇතැයි සලකනු ලබන අතර, වත්කමේ ධාරණ අගය එහි නැවත අයකරගත හැකි වටිනාකම අඩු කරයි.

## 2.5.6 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

### 2.5.6.1 නිර්වචිත විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම්

#### 2.5.6.1.1 සේවක විශ්‍රාම අරමුදල - I

1995 ඔක්තෝබර් 01 දිනට ප්‍රථම බැංකුවට බැඳුනු ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා නිර්වචිත විශ්‍රාම සැලසුම් ක්‍රමයක් බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මේ සඳහා වෙනම පාලනය කෙරෙන අරමුදලක් වෙත බැංකුව විසින් සාමාජිකයන්ගේ දායකත්වය ලබාදෙනු ලබයි. පුරෝකථන ඒකක ණය ජීවගණක තක්සේරු කිරීමේ ක්‍රමය භාවිතා කරමින් නිර්වචිත විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් යටතේ ප්‍රතිලාභ සැපයීමේ පිරිවැය වෙන වෙනම තීරණය කරනු ලබයි. ජීවගණක ලාභ හා අලාභ ඒවා ඇතිවන කාලපරිච්ඡේදය තුළ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ වාර්තා කරනු ලබයි.

නිර්වචිත ප්‍රතිලාභ වත්කම් හෝ වගකීම්, මින් පෙර හඳුනා නොගත් අතීත සේවා පිරිවැය හා බැඳීම් පියවීමට සෘජුවම අවශ්‍ය කෙරෙන සැලසුම් වත්කම්වල සාධාරණ අගය හා මින් පෙර හඳුනා නොගත් ජීව ගණක අලාභ අඩු කළ පසුව එළඹෙන නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්හි වත්මන් අගය ලෙස ගණනය කෙරේ. නිර්වචිත ප්‍රතිලාභ වගකීමෙහි අගය, බැංකුව විසින් දරනු ලබන අතර, ලාභ හෝ අලාභ යටතේ වාර්තා කරනු ලබයි. යම් වත්කමක අගය කිසියම් ජීව ගණක අලාභයක් සහ මින් පෙර හඳුනා නොගත් පැරණි සේවා පිරිවැය හා විශ්‍රාම සැලසුමට අදාළ ඉදිරි දායකත්ව මුදල් අඩු කිරීමක් හෝ ආර්ථික ප්‍රතිලාභයක වත්මන් අගය යනාදියෙහි ඓක්‍යයට, සීමා වෙයි.

ව්‍යෘත්තීමය ජීවගණක සමාගමක් වන යුනිට්ස් ඇක්චුරීස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස් (පුද්) සමාගමෙහි එම්. ජයරාමන් මහතා විසින් 2025 දෙසැම්බර් 31 දිනට නවතම ජීවගණක ඇගයීමක් සිදුකරන ලදී.

2025 දෙසැම්බර් 31 දිනට යෙදුනු ඇගයීමේදී යොදා ගන්නා ලද ප්‍රධාන මූල්‍ය උපකල්පන පහත පරිදි වේ.

විශ්‍රාම අරමුදලෙහි වත්කම්, බැංකුවේ වත්කම්වලින් වෙන්ව පවත්වාගෙන යනු ලබන අතර, භාරකාර අරමුදලෙහි ප්‍රතිපාදන අනුව භාරකරුවන් විසින් ස්වාධීනව පරිපාලනය කරනු ලැබෙයි. එමෙන්ම එය ස්වාධීන බාහිර විගණකවරුන්ගේ වාර්ෂික විගණනයට භාජනය වේ. සේවක විශ්‍රාම අරමුදල් - I හි මූල්‍ය ප්‍රකාශන මෙන්ම විගණන වාර්තාවද සභාගත කිරීමෙන් අනතුරුව භාරකාර මණ්ඩලය හා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලබයි. අරමුදල් සැපයීම, ප්‍රශස්ත මට්ටමින් සිදුවන බවට වගබලා ගැනීමට බැංකුව බැඳ සිටින බැවින් මෙකී මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තාව ද බැංකුවේ හෙළිදරව් කිරීම් වලදී සමාලෝචනයට ඉදිරිපත් කෙරෙයි. මෙම අරමුදලට දායක වූ සාමාජිකයෙකුගේ දිවි ඇති තෙක් විශ්‍රාම වැටුප මාසිකව ගෙවනු ලබයි. සේවක විශ්‍රාම අරමුදල - I පිළිබඳ විස්තර පිටු අංක 373 සිට 376 දක්වා සටහන් අංක 38 (අ) 1 හි දැක්වේ.

ජීවගණක ඇගයීම සිදු කළ වහාම අරමුදල් නොයෙදවූ පසුගිය සේවා පිරිවැය වෙනත් විස්තීරණ ආදායම් යටතේ හඳුනාගනු ලබයි. 2025 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 14,101 ක ශුද්ධ බැඳීම් හිඟයක් ජීවගණක ඇගයීම් තක්සේරුවෙහි ප්‍රතිඵල මඟින් පෙන්නුම් කරන අතර එය මුළුමනින්ම ප්‍රතිපාදනය කර ඇත.

අරමුදල් නොයෙදූ විශ්‍රාම වගකීමෙහි විස්තර පිටු අංක 373 සිට 376 දක්වා සටහන් අංක 38 (අ) 1 හි දක්වා ඇත.

#### 2.5.6.1.2 සේවක විශ්‍රාම අරමුදල - ii

1995 ඔක්තෝබර් මස 01 දින හෝ ඉන් අනතුරුව බැංකු සේවයට බැඳුනු ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා, බැංකුව විසින් අදාළ සාමාජිකයාගේ මාසික දළ වැටුපින් 12% ක දායකත්වයක් වෙනම පාලනය වන අරමුදලක් වෙත මාසිකව දායක කළ යුතු වන නිර්වචිත විශ්‍රාම ප්‍රතිලාභ සැලසුමක් බැංකුව විසින් ස්ථාපනය කර මෙහෙයවනු ලබයි.

පුරෝකථන ඒකක ප්‍රතිලාභ, ජීවදත්ත ඇගයීම් ක්‍රමයක් භාවිත කරමින් නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලසුම් යටතේ ප්‍රතිලාභ සැපයීමේ පිරිවැය වෙනම තීරණය කරනු ලබයි. ආයු ගණනයෙන් ඇති වූ ලාභ හා පාඩු ඒවා පැන නගිනු ලබන කාලපරිච්ඡේදය තුළ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගනු ලබයි.

## මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

නිර්වචිත ප්‍රතිලාභ වත්කම් හෝ වගකීම්, මින් පෙර හඳුනා නොගත් අතීත සේවා පිරිවැය හා බැඳීම් පියවීමට සෘජුවම අවශ්‍ය කෙරෙන සැලසුම් වත්කම්වල සාධාරණ අගය හා මින් පෙර හඳුනා නොගත් ජීවගණක අලාභ අඩු කළ පසුව එළඹෙන නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්හි වත්මන් අගය ලෙස ගණනය කෙරේ. නිර්වචිත ප්‍රතිලාභ වගකීමෙහි අගය, බැංකුව විසින් දරනු ලබන අතර, ලාභ හෝ අලාභ යටතේ වාර්තා කරනු ලබයි. යම් වත්කමක අගය කිසියම් ජීව ගණක අලාභයක් සහ මින් පෙර හඳුනා නොගත් පැරණි සේවා පිරිවැය හා විශ්‍රාම සැලසුමට අදාළ ඉදිරි දායකත්ව මුදල් අඩු කිරීමක් හෝ ආර්ථික ප්‍රතිලාභයක වත්මන් අගය යනාදියෙහි ඓක්‍යයට, සීමා වෙයි.

වෘත්තීමය ජීවගණක සමාගමක් වන යුනිට්ස් ඇක්චුරීස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස් (පුද්) සමාගමෙහි එම්. ජයරාමන් මහතා විසින් 2025 දෙසැම්බර් 31 දිනට නවතම ජීවගණක ඇගයීමක් සිදුකරන ලදී. 2025 දෙසැම්බර් 31 දිනට යෙදුණු ඇගයීමේදී යොදා ගන්නා ලද ප්‍රධාන මූල්‍ය උපකල්පන පහත පරිදි වේ.

විශ්‍රාම අරමුදලෙහි වත්කම්, බැංකුවේ වත්කම් වලින් වෙන්ව පවත්වාගෙන යනු ලබන අතර, හාරකාර අරමුදලෙහි ප්‍රතිපාදන අනුව හාරකරුවන් විසින් ස්වාධීනව පරිපාලනය කරනු ලැබෙයි. එමෙන්ම එය ස්වාධීන බාහිර විගණකවරුන්ගේ වාර්ෂික විගණනයට භාජනය වේ. සේවක විශ්‍රාම අරමුදල් - I හි මූල්‍ය ප්‍රකාශන මෙන්ම විගණන වාර්තාවද සභාගත කිරීමෙන් අනතුරුව හාරකාර මණ්ඩලය හා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලබයි. අරමුදල් සැපයීම, ප්‍රශස්ත මට්ටමින් සිදුවන බවට වගබලා ගැනීමට බැංකුව බැඳී සිටින බැවින් මෙකී මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තාව ද බැංකුවේ හෙළිදරව් කිරීම්වලදී සමාලෝචනයට ඉදිරිපත් කෙරෙයි. මෙම අරමුදලට දායක වූ සාමාජිකයෙකුගේ දිවි ඇති තෙක් විශ්‍රාම වැටුප මාසිකව ගෙවනු ලබයි.

සේවක විශ්‍රාම අරමුදල - II පිළිබඳ විස්තර පිටු අංක 376 සිට 378 දක්වා සටහන් අංක 38 (අ) 2 හි දැක්වේ.

ජීවගණක ඇගයීම සිදු කළ වහාම අරමුදල් නොයෙදවූ පසුගිය සේවා පිරිවැය වෙනත් විස්තීරණ ආදායම් යටතේ හඳුනාගනු ලබයි. 2025 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 740 ක ශුද්ධ බැඳීම් හිඟයක් ජීවගණක ඇගයීම් තක්සේරුවෙහි ප්‍රතිඵල මඟින් පෙන්නුම් කරන අතර, එය මුළුමනින්ම ප්‍රතිපාදනය කර ඇත. අරමුදල් නොයෙදූ විශ්‍රාම වගකීමෙහි විස්තර පිටු අංක 376 සිට 378 දක්වා සටහන් අංක 38 (අ) 2 හි දක්වා ඇත.

**2.5.6.1.3 වැන්දඹු හා අනත්දරු විශ්‍රාම අරමුදල**

2013 දෙසැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි බැංකුව විසින් සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය II හි සාමාජිකයන් වෙනුවෙන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ස්ථාපනය කරන ලදී. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය II හි සාමාජිකයින්ගේ මිය ගිය සහකරුවන් හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලබා ගැනීමේ අවස්ථාව ඇත. බැංකුව විසින් මෙම අරමුදල සඳහා දායක නොවන අතර බැංකු සේවකයන් විසින් ඔවුන්ගේ මූලික වැටුපින් 5%ක් මාසිකව දායක මුදල් ලෙස ගෙවනු ලබයි.

### 2.5.6.2 විශ්‍රාම පාරිතෝෂික

සේවක විශ්‍රාම වැටුප් II යෝජනා ක්‍රමය ස්ථාපිත කිරීමත් සමඟ 1995 ඔක්තෝබර් මස 01 දින හෝ ඉන් පසුව බැංකු සේවයට බැඳුනු සේවකයින් සේවක විශ්‍රාම වැටුප් II යෝජනා ක්‍රමයට ඇතුළත් වේ. එහෙයින් ඔවුන් සේවා පාරිතෝෂික ක්‍රමය යටතේ හිමිවන අයිතීන් හා වරප්‍රසාද සඳහා හිමිකම් නොකියයි. කෙසේ වුවද, මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ හිමිකර ගැනීම සඳහා අවම වශයෙන් මාස 120 ක අඛණ්ඩ සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කළ යුතුව පවතී. එහෙයින් වසර 10 ක සේවා කාලය සම්පූර්ණ කිරීමට පෙර විශ්‍රාම යනු ලබන හෝ විශ්‍රාම යාම හැරුණු කොට වෙනත් හේතු මත වසර 05 කට පසු සේවා කාලය අවසන් වන සේවකයින්ගට 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීමේ පනත යටතේ සේවාවසාන පාරිතෝෂික දීමනා හිමිකර ගැනීමේ ව්‍යවස්ථාව හිමි වේ. මේ යටතේ සිය සේවය අවසන් කරන ලද මූල්‍ය වර්ෂයේ අවසන් මාසය සඳහා ගෙවන ලද දළ වැටුප මෙන් මාස 1/2 ක අනුපාතයක් යටතේ අඛණ්ඩ සේවයේ නියැළුණු සෑම වසරක් වෙනුවෙන්ම පාරිතෝෂික දීමනා ගෙවනු ලබයි.

කළමනාකාරිත්වයේ අදහස හා පසුගිය අත්දැකීම්වලට අනුව එබඳු සිදුවීමක් ඇතිවීමේ සම්භාවිතාවය විරලය. වාර්තා කරන දිනට සැලකිය යුතු වගකීමක් වාර්තා නොවුනහොත්, සේවා පාරිතෝෂික සඳහා මූල්‍ය ප්‍රකාශයෙහි ප්‍රතිපාදන වෙන් කරනු නොලබයි. 1983 අංක 12 දරන සේවා පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ ඉහත දැක්වූ අන්දමේ සිදුවීමක් මත සේවකයෙකුහට සේවා පාරිතෝෂික ගෙවීම සිදු කළහොත්, එය ගෙවූ වර්ෂයේ ආදායම් ප්‍රකාශයෙහි පාරිතෝෂික වියදමක් ලෙස හඳුනාගනු ලබයි.

### 2.5.6.3 විශ්‍රාමික සේවක වෛද්‍ය ප්‍රතිලාභ

විශ්‍රාමික සේවකයින් වෙනුවෙන් බැංකුව විසින් දායකත්ව වෛද්‍යාධාර යෝජනා ක්‍රමයක් පවත්වාගෙන යනු ලබයි. මේ සැලසුම යටතේ ඇති වත්කම් බැංකුවේ සෙසු වත්කම්වලින් ස්වාධීනව පවත්වා ගෙන යනු ලබන අතර, එම අරමුදලෙහි හාරකාර ඔප්පුවෙහි ප්‍රතිපාදන ප්‍රකාර බැංකුවේ කළමනාකාරිත්වය හා විශ්‍රාමිකයින් නියෝජනය කරනු ලබන කළමනාකාර/හාරකාර මණ්ඩලයක් මඟින් පරිපාලනය කරනු ලබයි.

ප්‍රක්ෂේපිත ඒකක හාර ජීවගණක ඇගයීම් ක්‍රමවේදය උපයෝගී කර ගනිමින් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම යටතේ ප්‍රතිලාභ ලබාදීමේ පිරිවැය තීරණය කෙරෙයි. ජීවගණක ලාභ හා අලාභ එම අගයන් පැවති කාලසීමාවට අදාළ වෙනත් විස්තීරණ ආදායම්වල හඳුනාගනු ලැබේ.

වරින් වර සිදු කරනු ලබන ජීවගණක නිර්දේශ මත බැංකුවේ කළමනාකාරිත්වය විසින් තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණය බැංකුව විසින් දායකත්ව වෛද්‍යාධාර සැලසුම් ක්‍රමය වෙත දායක කරනු ලබයි. ඒ අනුව 2025 වර්ෂයේ ලාභයෙන් රුපියල් මිලියන 557 ක් මේ සඳහා ප්‍රතිපාදනය කර ඇත.

වෘත්තීමය ජීවගණක සමාගමක් වන යුනිට්ස් ඇක්චුරීස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස් (පුද්) සමාගමෙහි එම්. ජයරාමන් මහතා විසින් 2025 දෙසැම්බර් 31 දිනට නවතම ජීවගණක ඇගයීමක් සිදුකරන ලදී. 2025 දෙසැම්බර් 31 දිනට යෙදුනු ඇගයීමේදී යොදාගන්නා ලද ප්‍රධාන මූල්‍ය උපකල්පන පහත පරිදි වේ.

විශ්‍රාම අරමුදලෙහි වත්කම්, බැංකුවේ වත්කම්වලින් වෙන්ව පවත්වාගෙන යනු ලබන අතර, හාරකාර අරමුදලෙහි ප්‍රතිපාදන අනුව හාරකරුවන් විසින් ස්වාධීනව පරිපාලනය කෙරෙනු ලැබෙයි. එමෙන්ම එය ස්වාධීන බාහිර විගණකවරුන්ගේ වාර්ෂික විගණනයට භාජනය වේ. විශ්‍රාම වැටුප් II අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශය මෙන්ම විගණන වාර්තාව හාරකාර මණ්ඩලය හා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබ සමාලෝචනයට බඳුන් වී ඇත.

අරමුදල් සැපයුම, ප්‍රශස්ත මට්ටමින් සිදු කරනු ලැබීමේ වගකීම බැංකුව සතු වන බැවින් බැංකුවේ නිරාවරණයවීම් සමාලෝචනය සඳහා ද ඉහත වාර්තා ඉදිරිපත් කෙරෙයි. අදාළ සාමාජිකයා ජීවතුන් අතර සිටීනතාක් විශ්‍රාම වැටුප මාසිකව ගෙවනු ලබයි.

විශ්‍රාමික සේවක වෛද්‍ය ප්‍රතිලාභ පිළිබඳ විස්තර පිටු අංක 378 සිට 381 දක්වා සටහන් අංක 38(අ)3 මඟින් දැක්වේ.

ජීවගණක ඇගයීම සිදුකළ වහාම අරමුදල් නොයෙදූ පසුගිය සේවා පිරිවැය වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගනු ලබයි. 2025 දෙසැම්බර් 31 දිනට රු. මී. 5,081 ක ශුද්ධ බැඳීම් හිඟයක් ජීවගණක ඇගයීම් තක්සේරුවෙහි ප්‍රතිඵල මඟින් පෙන්නුම් කරන අතර, එය මුළුමනින් ප්‍රතිපාදනය කර ඇත. අරමුදල් නොයෙදූ විශ්‍රාම වගකීමෙහි විස්තර පිටු අංක 378 සිට 381 හි සටහන් අංක 38(අ)3 හි දක්වා ඇත.

### 2.5.6.4 නිර්වචිත දායකත්ව සැලසුම්

නිර්වචිත දායකත්ව සැලසුම් පිළිබඳ විස්තර පිටු අංක 331 හි සටහන් අංක 11 මඟින් දැක්වේ.

## 2.5.7 වෙනත් වගකීම්

වෙනත් වගකීම් පිළිබඳ විස්තර පිටු අංක 382 හි සටහන් අංක 41 මඟින් දැක්වේ.

## 2.5.8 ප්‍රතිපාදන

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස සමූහය හමුවේ ප්‍රවර්තන බැඳීමක් (නෛතික හෝ සම්මුතික) ඇති විට හා එකී බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ වලින් යුතු සම්පත් පිටතට ගලායාම අවශ්‍යවීම හවිය වන විටක සහ බැඳීම් ප්‍රමාණයෙහි විශ්වසනීය ඇස්තමේන්තුවක් කළ හැකි විටකදී ප්‍රතිපාදන හඳුනාගනු ලබයි. කිසියම් ප්‍රතිපාදනයකට අදාළ වියදම්, ආදායම් ප්‍රකාශයෙහි දක්වනු ලබන්නේ කිසියම් ප්‍රතිපූරණයක් වේ නම් එය අඩු කිරීමෙන් අනතුරුවය.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

### 2.5.9 අසම්භාව්‍ය වගකීම් හා බැඳියාවන්

මේ යටතට බැංකු ඇපකර, ණයවර ලිපි, මුදා නොහළ ණය පහසුකම්, වෙනත් වකු ණය පහසුකම් සහ ප්‍රාග්ධන බැඳියාවන් ඇතුළත් වේ. බැංකු ඇපකර වූ කලී, ණය උපකරණයක නියාමනවලට අනුව යම් ණයකරුවෙකු නිසි දිනට ගෙවීම් සිදු කිරීමට අපොහොසත් වන අවස්ථාවලදී ඇති වියහැකි අලාභය වෙනුවෙන් සමූහය විසින් නිශ්චිත ගෙවීමක් සිදු කිරීමට අදාළ ගිවිසුම්ය. නොගෙවූ ණය බැඳියාවන්, ණයවර ලිපි යනු බැඳියාවට අදාළ කාලසීමාව තුළ ඇති බැඳියාවන් යටතේ බැංකුව විසින් පූර්ව නිශ්චිත කොන්දේසි යටතේ ගනුදෙනුකරුහට ණයක් ලබාදිය යුතු අවස්ථාය.

2018 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී.ල.මූ.ගි.ප්‍ර. 09 යටතේ හානිකරණ ඇගයීම්වලට මෙකී ගිවිසුම් යටත් වේ.

අසම්භාව්‍ය වගකීම් හා බැඳියාවන් පිළිබඳ විස්තර පිටු අංක 386 හි දක්වා සටහන් අංක 48 හි දක්වා ඇත.

### 2.5.10 කොටසක් සඳහා ඉපැයීම්

කොටසක මූලික සහ තනුක ඉපැයීම් පිළිබඳ විස්තර පිටු අංක 335 හි සටහන් අංක 14 හි දක්වා ඇත.

## 2.6 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති - මූල්‍ය උපකරණ සඳහා ආදායම් හා වියදම් හඳුනාගැනීම

ආදායම විශ්වසනීය ලෙස අගය කළ හැකි සහ ආර්ථික ප්‍රතිලාභ, බැංකුව වෙත ගලාඒමේ සම්භාවිතාව ඇති තාක් දුරට ආදායම හඳුනාගනු ලබයි. ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර පිටු අංක 324 සිට 335 දක්වා සටහන් අංක 3 සිට 14 හි දක්වා ඇත.

### 2.6.1 පොළී ආදායම් සහ වියදම්

පොළී ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර පිටු අංක 324 සිට 326 දක්වා සටහන් අංක 3 හා 4 හි දක්වා ඇත.

### 2.6.2 ගාස්තු සහ කොමිස් ආදායම

ගාස්තු සහ කොමිස් ආදායම විස්තර පිටු අංක 327 හි දක්වා සටහන් අංක 5 මඟින් දැක්වේ.

### 2.6.3 වෙළඳාම මඟින් ලත් ශුද්ධලාභ/(අලාභ)

වෙළඳාම මඟින් ලත් ශුද්ධ ලාභ/(අලාභ) පිටු අංක 328 හි සටහන් අංක 6 මඟින් දැක්වේ.

### 2.6.4 ලාභාංශ ආදායම

ආදායමක් ලැබීමට ඇති අයිතය තහවුරු වූ විට ලාභාංශ ආදායම හඳුනාගනු ලැබෙයි.

සාමාන්‍යයෙන් මෙය ලැයිස්තුගත කොටස සඳහා ලාභාංශ රහිත දිනයයි. ලාභාංශ ආදායම් පිළිබඳ විස්තර පිටු අංක 329 හි සටහන් අංක 09 මඟින් දැක්වේ.

### 2.6.5 කුලී ආදායම

කුලී ආදායම, උපචිත ආදායම මත ලාභයට හෝ අලාභයට හඳුනාගනු ලැබෙයි. කුලී ආදායම පිළිබඳ විස්තර පිටු අංක 329 හි සටහන් අංක 09 මඟින් දැක්වේ.

## 2.7 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති - බදුකරණය

### 2.7.1 ප්‍රවර්තන බදුකරණය

ප්‍රවර්තන බදු පිළිබඳ විස්තර පිටු අංක 333 හි සටහන් අංක 13 මඟින් දැක්වේ.

### 2.7.2 විලම්බිත බදුකරණය

විලම්බිත බදු පිළිබඳ විස්තර පිටු අංක 333 සහ 364 හි පිළිවෙලින් සටහන් අංක 13 හා 30 මඟින් දැක්වේ.

### 2.7.3 මූල්‍ය සේවා සඳහා එකතුකළ අගය මත බදු

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතෙහි 25 (අ) වගන්තිය සහ එහි සංශෝධන ප්‍රකාර මූල්‍ය සේවා සඳහා එකතුකළ අගය මත බදු ගණනය කෙරෙයි.

ආර්ථික ක්ෂයවීම් හා සේවක පාරිශ්‍රමික සඳහා ගලපන ලද මෙහෙයුම් ලාභයෙන් මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බදු හා සමාජ ආරක්ෂණ දායකත්ව අයබදු ගෙවීමට පෙර, 18% ක් මූල්‍ය සේවා සඳහා එකතුකළ අගය මත බදු ලෙස ගෙවිය යුතුවේ.

### 2.7.4 සමාජ ආරක්ෂණ දායකත්ව අයබදු (SSCL)

2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව අයබදු පනත යටතේ 2022 ඔක්තෝබර් මස 01 වන දින සිට සමාජ ආරක්ෂණ දායකත්ව අයබදු බලපැවැත්වේ. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතෙහි 6 වන වගන්තිය යටතේ එකතු කළ අගය මත බදු අරමුණ සඳහා නිශ්චිත කරගත් අයිතමවල අගය මත 2.5% ක අනුපාතයකට අයබදු අය වනු ඇත.

## 2.8 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ල.ගි.ප්‍ර. 7) අනුව මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරනු ලැබ ඇත්තේ සෘජු ක්‍රමය පදනම් කර ගෙනය. මුදල් හා මුදල් සමානයන්, කිසියම් මුදල් ප්‍රමාණයකට පහසුවෙන් පරිවර්තනය කළ හැකි, කෙටි කාලීන, ඉහළ ද්‍රවශීලතාවයෙන් යුතු ආයෝජනවලින් සමන්විත වන අතර, ඒවායේ වටිනාකම වෙනස්වීමේ අවධානම නොසැලකිය යුතු තරම් වේ. අතැති මුදල්, බැංකු වල තැන්පත් කර ඇති මුදල් ශේෂයන් හා කෙටි දැනුම්දීමකින් ලබා ගත හැකි මුදල්, මුදල් හා මුදල් සමානයන්ට අයත් වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිටු අංක 306 හි දක්වා ඇත.

## 2.9 නියාමන ප්‍රතිපාදන

### 2.9.1 තැන්පතු සඳහා රක්ෂණ යෝජනා ක්‍රමය

බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය මත පදනම්ව අදාළ වන ව්‍යවස්ථාපිත අනුපාතිකය වන 0.10% ක් ලෙස, බැංකුව විසින් අදාළ තැන්පතු පදනම මත රක්ෂණ වාරිකය ගණනය කරයි. රක්ෂණ නියාමන මඟින් දක්වාඇති පරිදි සෑම කාර්තුවක් අවසානයේ සිටම දින 15 ක කාලසීමාවක් ඇතුළත අදාළ වාරිකය බැංකුව විසින් ප්‍රේෂණය කරනු ලැබේ.

### 2.9.2 බෝග රක්ෂණ අයබදු (CIL)

2013 අංක 12 දරන මුදල් පනතෙහි 14 වන වගන්තියෙහි ප්‍රතිපාදන ප්‍රකාර 2013 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි බෝග රක්ෂණ අයබද්ද හඳුන්වා දෙනු ලැබූ අතර, එය ජාතික රක්ෂණ භාරකාර අරමුදලට ගෙවිය යුතු වේ. මේ වන විට බදු පසු ලාභයෙන් 1%ක් බෝග රක්ෂණ අයබදු ලෙස ගෙවිය යුතුය.

## 2.10 වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම්

වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම් පිළිබඳ විස්තර පිටු අංක 394 හි සටහන් අංක 52 මඟින් දැක්වේ.

## 2.11 නිකුත් කරන ලද මුත් වාර්තාකරණ දිනට බල නොපැවැත්වෙන ගිණුම්කරණ ප්‍රමිතීන්

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි නිකුත් කරන ලද නමුත් තවමත් බලාත්මක නොවන, නව සහ සංශොධිත ප්‍රමිතීන් සහ අර්ථකථන තුළින් සිදුවන බලපෑම පිළිබඳ බැංකුව විසින් තක්සේරු කරනු ලබයි. දේශීය අනුමත කිරීම් තවමත් සිදුවෙමින් පවතින හෝ පසුකලීන දිනයක ක්‍රියාත්මක වීමට ඇති නමුත් ඉහත පැහැදිලි කල පරිදි මෙයට නව ප්‍රමිතීන් හෝ සංශෝධන මත පදනම්ව දැනටමත් ක්‍රියාත්මක වන ප්‍රමිතීන් හෝ සංශොධන ඇතුළත් වනු ඇත.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

**(අ) ශ්‍රී.ල.මූ.වා.ප්‍ර 9 මූල්‍ය උපකරණ සහ ශ්‍රී.ල.මූ.වා.ප්‍ර 7: මූල්‍ය උපකරණ හෙළිදරව් කිරීම් යන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අදාළ සංශෝධන**

විනිවිදභාවය ශක්තිමත් කිරීම, අනුකූලතාව වැඩිදියුණු කිරීම සහ තිරසාරභාවයට සම්බන්ධ ලක්ෂණ යන සොබාදහම මත රඳා පවතින විදුලි ගිවිසුම් වැනි නැගී එන වෙළෙඳපොළ වර්ධනයන්ට මුහුණදීම අරමුණු කරගනිමින් මෙම සංශෝධන තුළ මූල්‍ය උපකරණ වලට අදාළ වන වර්ගීකරණය, මිනුම්කරණය හා හඳුනා ගැනීම ඉවත් කිරීම සහ හෙළිදරව් කිරීමේ අවශ්‍යතා සඳහා වැදගත් වැඩිදියුණු කිරීම් ඇතුළත් කර ඇත.

මෙම සංශෝධන මඟින් අවිනිශ්චිත හෝ ESG සම්බන්ධිත උපකරණ ඇතුළත්ව මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ තක්සේරු කිරීම පැහැදිලි කිරීම, මූල්‍ය වගකීම් (ඉලෙක්ට්‍රොනික ගෙවීම් පද්ධති හරහා පියවීම් ඇතුළත්ව) හඳුනා නොගැනීම පිළිබඳ අමතර මඟ පෙන්වීම සැපයීම, වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකමකින් නම් කරන ලද කොටස් උපකරණ සඳහා සහ මුදල් ප්‍රවාහ වෙනස් කළ හැකි ගිවිසුම්ගත නියමයන් සහිත උපකරණ සඳහා හෙළිදරව් කිරීමේ අවශ්‍යතා සඳහා වැදගත් වැඩිදියුණු කිරීම ආදිය සිදු කරනු ලබයි.

වර්ගීකරණය සහ මිනුම්කරණය සඳහා වන මූලධර්ම අඛණ්ඩව භාවිතයට ගැනීම සහ මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට ආයතනයේ මූල්‍ය උපකරණ සහ අදාළ අවධානම් සම්බන්ධයෙන් වඩාත් අදාළ සහ තීරණ ගැනීමට ප්‍රයෝජනවත් තොරතුරු සැපයීම මෙම වෙනස්කම් වල අරමුණයි. මෙම සංශෝධන 2026 ජනවාරි 01 වන දින හෝ ඉන්පසු ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා බලපැවැත්වේ. ඊට පෙර අනුකූල වීමටද ඉඩ ලබා දී ඇත.

**(ආ) ශ්‍රී.ල.මූ.වා.ප්‍ර 18 ඉදිරිපත් කිරීම සහ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීම**

මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහගත ඉදිරිපත් කිරීම සඳහා අඛණ්ඩ බව, සංසන්දනාත්මක බව හා විනිවිදභාවය ඉහළ නැංවීමට ශ්‍රී.ල.මූ.වා.ප්‍ර 18 මඟින් මූලධර්ම ස්ථාපිත කර ඇත. ප්‍රමිතියට අනුව, මෙහෙයුම්, ආයෝජන සහ මූල්‍යකරණය ඇතුළු කාණ්ඩ භාවිතා කරමින් අදාළ අවස්ථාවන්හිදී අනාවරණය කරන මෙහෙයුම් ලාභය වැනි උප එකතුන් සහිතව මූල්‍ය කාර්සාධනය ඉදිරිපත් කිරීමට ආයතන වලට සිදු වේ.

එය තොරතුරු එක්රැස් කිරීම සහ වෙන් කිරීම, කළමණාකරණය විසින් නිර්වචිත කාර්ය සාධන මිනුම් (MPMs) පැහැදිලිව හඳුනා ගැනීම සහ මූල්‍ය ප්‍රකාශන සටහන්වල වැදගත් තොරතුරු හෙළිදරව් කිරීම වැඩි දියුණු කිරීම යනාදිය සඳහා වැඩි දියුණු කල අවශ්‍යතා හඳුන්වා දෙයි.

මෙහි අරමුණ වන්නේ ශ්‍රී.ල.මූ.වා.ප්‍ර 18 ට අනුකූලව කාර්යසාධන මිනුම් ගණනය කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ විනිවිදභාවය සහතික කරමින් ආයතනයක මූල්‍ය කාර්යසාධනය සහ මූල්‍ය තත්වය පිළිබඳ වඩාත් ආදාළ, විශ්වශනීයතවය නියොජනය කරන සැසඳිය හැකි තොරතුරු පරිශීලකයන්ට ලබා දීමයි.

මෙම සංශෝධන 2027 ජනවාරි 01 වන දින හෝ ඉන්පසු ආරම්භ වන වාර්ෂික කාල පරිච්ඡේද සඳහා බලපැවැත්වේ. ඊට පෙර අනුකූල වීම් සඳහාද අනුමැතිය ලැබී ඇත.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය (ශ්‍රී.ල.මූ.ල.ප්‍ර 17) රක්ෂණ ගිවිසුම්**

ශ්‍රී.ල.මූ.ල.ප්‍ර 17 යනු රක්ෂණ ගිවිසුම් සඳහා වන හඳුනා ගැනීම, මිනුම් කිරීම, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම ආවරණය වන පුළුල් නව ගිණුම්කරණ ප්‍රමිතයකි. මෙය බලාත්මක වූ පසු 2005 දී නිකුත් කරන ලද ශ්‍රී.ල.මූ.ල.ප්‍ර 4: රක්ෂණ ගිවිසුම් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතය වෙනුවට ශ්‍රී.ල.මූ.ල.ප්‍ර 17 ක්‍රියාත්මක වනු ඇත. ශ්‍රී.ල.මූ.ල.ප්‍ර 17 බලපැවත්වෙන්නේ 2026 ජනවාරි 01 දින හෝ ඉන් පසු ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේද සඳහාය. මෙය තම මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි සමූහය අපේක්ෂා නොකරයි.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 3 දළ ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමූහයට ආර්ථික ප්‍රතිලාභ ගලාඒම හා ආදායම, විශ්වසනීය ලෙස ගණනය කිරීමට හැකි මට්ටම දක්වා දළ ආදායම් හඳුනාගනු ලබයි. ආදායම් හඳුනා ගැනීමට ප්‍රථම වෙනත් විශේෂිත නිර්ණායක ඒ ඒ ආදායමට අදාළ සටහන් යටතේ දක්වා ඇත.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| පොළී ආදායම | 197,777,349 | 203,748,274 | 202,459,287 | 208,632,122 |
| ගාස්තු හා කොමිස් ආදායම | 2,936,871 | 2,078,830 | 2,938,382 | 2,085,090 |
| වෙළඳාම් කටයුතු වලින් ශුද්ධ ලාභය/(අලාභය) | 708,034 | 911,630 | 1,137,128 | 1,791,936 |
| ලාභය/(අලාභය) මගින් සාධාරණ අගයට ඇති මූල්‍ය උපකරණවලින් ශුද්ධ සාධාරණ අගය ලාභ/(පාඩු | – | – | – | – |
| මූල්‍ය වත්කම් හඳුනා ගැනීම අත්හැරීම තුළින් ශුද්ධ ලාභ/(අලාභ) | 553,002 | 442,273 | 553,002 | 442,273 |
| වෙනත් මෙහෙයුම් ශුද්ධ ආදායම් | 786,033 | 455,941 | 819,855 | 465,743 |
| **දළ ආදායම** | 202,761,289 | 207,636,948 | 207,907,654 | 213,417,164 |

## 4 ශුද්ධ පොළී ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්ති

### පොළී ආදායම සහ පොළී වියදම හඳුනා ගැනීම්

ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරන ලද සියලු මූල්‍ය උපකරණ සඳහා හා වෙනත් විස්තිර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ලෙස වර්ග කරන ලද පොළී සහිත මූල්‍ය වත්කම් සහ ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය උපකරණ සඳහා පොළී ආදායම හෝ වියදම වාර්තා කරනුයේ සඵල පොළී අනුපාත භාවිතයෙනි. මෙය මූල්‍ය උපකරණයෙන් අපේක්ෂිත ජීව කාලය තුළ හෝ ඊට අඩු කාලසීමාවක් තුළ තක්සේරු කළ ඉදිරි මූල්‍ය ගෙවීම් හෝ ලැබීම් සුදුසු විටකදී මූල්‍ය වත්කමෙහි හෝ වගකීමෙහි පවතින ශුද්ධ අගයට නිශ්චිතව අඩුකරන අනුපාතයයි. මෙම ගණනය කිරීම සඳහා මූල්‍ය උපකරණයෙහි සියලුම ගිවිසුම් ප්‍රකාර කොන්දේසි (උදාහරණ වශයෙන් කලින් ගෙවීමේ විකල්ප) සැලකිල්ලට ගනු ලබන අතර මූල්‍ය උපකරණයට සෘජුවම සම්බන්ධ හා සඵල පොළී අනුපාතයෙහි සංකලිත කොටසක් වන කිසියම් ගාස්තු හෝ වර්ධක පිරිවැය ඕට ඇතුළු වන මුත් අනාගත ණය පාඩු ඊට අන්තර්ගත නොවේ.

සමූහය විසින් එහි ගෙවීම් හෝ ලැබීම්වල තක්සේරු අගයන් සංශෝධනය කෙරෙයි නම්, මූල්‍ය වත්කම් හෝ වගකීම් හි ධාරණ අගයද ගලපනු ලබයි. මුල් සඵල පොළී අනුපාත මත පදනම්ව අදාළ ගැලපීම් වලින් පසු ධාරණ අගය ගණනය කෙරෙන අතර, ධාරණ අගයෙහි වෙනස වෙනත් මෙහෙයුම් ආදායම් ලෙස වාර්තා කරනු ලබයි. කෙසේ වුවද, ලද මුදලෙහි ඉහළ ගිය අයකර ගැනීම් හැකියාවෙහි ප්‍රතිඵලයක් ලෙස බැංකුව විසින් අනාගත මුදල් ලැබීම් පිළිබඳ තක්සේරු පසුව වැඩි කරනු ලබන නැවත වර්ගීකරණය කරන ලද මූල්‍ය වත්කම් සඳහා තක්සේරුව වෙනස් කළ දින සිටම එම වැඩිකිරීම්වල බලපෑම සඵල පොළී අනුපාතිකයට කළ ගැලපීමක් ලෙස හඳුනාගනු ලබයි.

ණය හානිකරණය වූ වත්කම් හැර අනෙකුත් මූල්‍ය උපකරණ සඳහා සඵල පොළී අනුපාත ගණනය කිරීමේදී අපේක්ෂිත ණය පාඩු හැරුණුකොට මූල්‍ය උපකරණවල සියලු ගිවිසුම්ගත කොන්දේසි සලකා බලමින් බැංකුව විසින් ඉදිරි මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කරයි. අදියර 3 යටතේ වර්ගීකරණය කරන ලද ණය හානිකරණය වූ මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණය පාඩු ඇතුළත් කරමින් තක්සේරු කළ ඉදිරි මුදල් ප්‍රවාහ භාවිත කරමින් ණය ගලපන ලද අපේක්ෂිත පොළී අනුපාත ගණනය කෙරෙයි. ණය ගලපන ලද සඵල පොළී අනුපාත යනු මුල් හඳුනා ගැනීමේදී (ණය පාඩුද ඇතුළත්ව) තක්සේරු කළ ඉදිරි මුදල් ප්‍රවාහ ක්‍රමක්ෂය පිරිවැයට වට්ටම් කරන පොළී අනුපාතයයි.

හානිකරණ අලාභය හේතු කොට ගෙන මූල්‍ය වත්කමක හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක වාර්තා කළ අගය අඩුවූ විටද හානිකරණ අලාභය ගණනය කිරීම සඳහා අනාගත මූල්‍ය ප්‍රවාහ වට්ටම් කිරීමට යොදාගත් පොළී අනුපාතයම භාවිත කරමින් පොළී ආදායම හඳුනාගැනීම සිදු කෙරෙයි.


මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 4. ශුද්ධ පොළී ආදායම (සම්බන්ධයි)

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| **04. (අ) පොළී ආදායම** | | | | |
| මුදල් හා මුදල් සමානයන් | **63,242** | 66,042 | **67,472** | 69,056 |
| මහ බැංකුව වෙතැති ශේෂයන් | **–** | – | **–** | – |
| බැංකුවල ඇති තැන්පතු | **993,515** | 1,300,589 | **993,515** | 1,349,728 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **–** | – | **–** | – |
| ලාභ අලාභ මඟින් හඳුනාගත් මූල්‍ය වත්කම් | | | | |
| – සාධාරණ අගයට ගණනය කරන ලද | **1,571,286** | 2,193,865 | **5,340,048** | 5,374,556 |
| – සාධාරණ අගයට නම් කළ | **–** | – | **–** | – |
| ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් | | | | |
| – ණය හා අත්තිකාරම් | **61,189,117** | 68,747,284 | **61,282,686** | 68,824,412 |
| – ණය හා වෙනත් උපකරණ | **129,778,554** | 127,020,632 | **130,250,059** | 128,501,143 |
| වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් | **4,181,635** | 4,419,862 | **4,525,507** | 4,513,227 |
| වෙනත් | **–** | – | **–** | – |
| **මුළු පොළී ආදායම** | **197,777,349** | 203,748,274 | **202,459,287** | 208,632,122 |
| **04. (ආ) පොළී වියදම්** | | | | |
| බැංකුවලට ගෙවිය යුතු | **75,491** | 337,623 | **330,318** | 509,448 |
| ලාභ අලාභ මඟින් හඳුනාගත් මූල්‍ය වගකීම් | **–** | – | **–** | – |
| ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වගකීම් | | | | |
| – තැන්පත්කරුවන්ට ගෙවිය යුතු | **106,983,151** | 123,882,172 | **106,992,650** | 123,892,009 |
| – ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවිය යුතු | **–** | – | **–** | – |
| – වෙනත් ණය ගැනීම් සඳහා ගෙවියයුතු | **4,030,006** | 3,427,151 | **6,873,592** | 5,639,363 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | **1,631,233** | 3,319,253 | **1,631,233** | 3,319,253 |
| කල්බදු වගකීම් මත පොළී වියදම | **208,549** | 199,122 | **212,095** | 202,942 |
| **මුළු පොළී වියදම්** | **112,928,430** | 131,165,321 | **116,039,888** | 133,563,015 |
| **ශුද්ධ පොළී ආදායම** | **84,848,919** | 72,582,953 | **86,419,399** | 75,069,107 |

### පොළී ආදායමට එදිරිව පොළී වියදම්

පිටුව 92



මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 4. ශුද්ධ පොළී ආදායම (සම්බන්ධයි)

### 04 (අ) ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වලින් ලද ශුද්ධ පොළී ආදායම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුව, පහත දැක්වෙන රජයේ සුරැකුම්පත් සඳහා පොළී ආදායම සහ පොළී වියදම් පිළිවෙලින් 4 (අ) සහ 4 (ආ) සටහන් වල දක්වා ඇති පොළී ආදායමෙන් සහ පොළී වියදම් වලින් උපුටා ගෙන වෙන වෙනම අනාවරණය කර ඇත.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| **පොළී ආදායම** | | | | |
| ලාභ අලාභ මඟින් හඳුනාගත් මූල්‍ය වත්කම් | | | | |
| - සාධාරණ අගයට ගණනය කරන ලද | 1,571,286 | 2,193,865 | 5,340,048 | 5,374,556 |
| - සාධාරණ අගයට නම් කළ | – | – | – | – |
| ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් | | | | |
| - ණය හා අත්තිකාරම් (ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්) | 2,373,038 | 930,973 | 2,394,202 | 930,103 |
| - ණය හා වෙනත් උපකරණ | 116,092,951 | 109,630,388 | 116,244,498 | 110,756,375 |
| වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් | 4,050,563 | 4,419,862 | 4,394,435 | 4,513,227 |
| | 124,087,838 | 117,175,088 | 128,373,183 | 121,574,261 |
| **අඩු කළා: පොළී වියදම්** | | | | |
| බැංකුවලට ගෙවිය යුතු (ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ විකුණන ලද සුරැකුම්පත්) | 75,491 | 337,623 | 329,352 | 509,448 |
| වෙනත් ණය ගැනීම් සඳහා ගෙවිය යුතු (ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ විකුණන ලද සුරැකුම්පත්) | 4,030,006 | 3,427,152 | 6,874,590 | 5,635,552 |
| | 4,105,497 | 3,764,775 | 7,203,942 | 6,145,000 |
| **රජයේ සුරැකුම්පත් වලින් ලත් ශුද්ධ පොළී ආදායම** | 119,982,341 | 113,410,313 | 121,169,241 | 115,429,261 |

### 04 (ඈ) ණය තාවකාලික අත්හිටුවීම සහ කල්දැමීම නිසා පොළී ආදායමට වූ බලපෑම

ණය සහනය හෝ ගෙවීම් කල්දැමීම ප්‍රතික්ෂේප කළ අය හැර සෙසු සියළු ගනුදෙනුකරුවන්ට බැංකුව සිය ණය සහනය සහ ගෙවීම් කල් දැමීම ලබාදී ඇත. ණය සහනය 7% ක අනුපාතයකට ලබාදී ඇති අතර, ණය කාලය අවසන් වන තෙක් ගෙවීම් කල්දමා ඇත. ණය සහන කාලසීමාව මාස දෙකක සිට මාස හයක් දක්වා වෙනස් වී ඇති අතර ඉතා සීමිත අවස්ථාවක එය මාස හයකට වඩා වැඩි කර ඇත.

මූල්‍ය වර්ෂය තුළදී කල් දැමූ දින 1 අලාභය වූ රු. මිලියන 1,391 න් රු. මිලියන 112.7 ක පොළී ආදායමක් හඳුනාගත් අතර 2025 දෙසැම්බර් 31 දිනට කාල වෙනස සහ පාරිභෝගිකයාගේ කලින් ගෙවීම නිසා සිදුවූ කල්දැමූ දින 1 අලාභය ලෙස රු. මිලියන 302.3 වාර්තා කරන ලදී. මෙයට කාල වෙනස සහ ගනුදෙනුකරුවන්ගේ පෙර ගෙවීම් හේතු විය.

### 04. (ඉ) දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන නිසා පොළී ආදායමට වූ බලපෑම

2023 වසරේදී දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහනේ විකල්ප 111 යටතේ බැංකුව විසින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර කළඹ සම්පූර්ණයෙන්ම ලංකා රුපියල් බැඳුම්කර බවට පරිවර්තනය කර ඇත.

ශ්‍රී ලංකා රජය ක්‍රියාත්මක කරන දේශීය ණය ප්‍රශස්තකරණ වැඩ සටහන නිසා පැන නගින දින 01 වෙනස නීර්ණය කිරීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන පොදු රාමුවට අනුව සිදුකර ඇති අතර, බැංකුව විසින් 2025 දෙසැම්බර් 31 දිනට දින 01 අලාභය ලෙස රු. මිලියන 112.5 වාර්තා කරන ලදී.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 5 ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ගනුදෙනුකරුවන්ට සපයනු ලබන විවිධ වූ සේවාවන්ගෙන් සමූහය, ගාස්තු සහ කොමිස් ආදායම උපයාගන්නා අතර, එම සේවාවන් කාණ්ඩ දෙකකට බෙදා වෙන් කළ හැකිය.

**(අ) යම් කාලසීමාවක් පුරා සපයනු ලබන සේවාවන්ගෙන් උපයාගන්නා ගාස්තු හා කොමිස් ආදායම**

යම් කාලසීමාවක් පුරා සපයනු ලැබූ සේවාවන් වෙනුවෙන් ලැබෙන ගාස්තු සහ කොමිස් ආදායම එම කාලසීමාව පුරා උපචිත කර හඳුනාගනු ලැබේ.

**(ආ) ගනුදෙනු සේවා සැපයීම වෙනුවෙන් ලද ගාස්තු හා කොමිස් ආදායම**


තෙවන පාර්ශ්ව වෙනුවෙන් සිදුකරන ගනුදෙනු සාකච්ඡා කිරීම් හෝ යළි සලකා බැලීම් වලින් ලද ගාස්තු හා කොමිස් ආදායම් එම ගනුදෙනු සම්පූර්ණ වීමෙන් අනතුරුව හඳුනාගනු ලබයි. කිසියම් කාර්යයක් ඉටුකිරීම හා සම්බන්ධවී ඇති ගාස්තු හෝ ගාස්තු කොටස් එම කාර්යය ඉටු කිරීමෙන් අනතුරුව හඳුනාගනියි.

ගනුදෙනු හා සේවා වලට අදාළ ගාස්තු හා කොමිස් වියදම් එම සේවාවන් ලැබීමෙන් පසුව හඳුනාගනියි. ගාස්තු හා කොමිස් වියදම් උපචිත පදනමට ගිණුම්ගත කරයි.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| ගාස්තු හා කොමිස් ආදායම | **2,936,871** | 2,078,830 | **2,938,382** | 2,085,090 |
| ගාස්තු හා කොමිස් වියදම | **(376,539)** | (328,272) | **(376,923)** | (328,737) |
| **ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම** | **2,560,332** | 1,750,558 | **2,561,459** | 1,756,353 |
| **උපයන ලද්දේ** | | | | |
| ණය | **1,222,239** | 721,275 | **1,222,301** | 721,476 |
| කාඩ්පත් | **827,183** | 492,917 | **827,183** | 492,917 |
| වාණිජ හා ප්‍රේෂණ | **311,066** | 426,474 | **311,066** | 426,474 |
| ආයතනික බැංකුකරණය | **41,471** | 8,767 | **41,471** | 8,767 |
| තැන්පතු | **50,047** | 48,636 | **50,047** | 48,636 |
| ඇපකර | **25,004** | 17,038 | **25,004** | 17,038 |
| වෙනත් | **83,322** | 35,451 | **84,387** | 41,045 |
| **ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම** | **2,560,332** | 1,750,558 | **2,561,459** | 1,756,353 |

### ගාස්තු හා කොමිස් ආදායමට එරෙහි වියදම

පුස්ථාරය 93



මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 6 වෙළඳාම් කටයුතු වලින් ලත් ශුද්ධ ලාභය/(අලාභය)

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

පොළී ආදායම හැරුණු විට විදේශ විනිමය හුවමාරුවෙන් ලත් ආදායම, ලාභ හෝ අලාභ මඟින් හඳුනාගත් මූල්‍ය වත්කම්වලට අදාළ ලාභාංශ සහ සියලුම ලාභ/අලාභ වෙළඳාම් කටයුතුවලින් ලත් ශුද්ධ ලාභය ඇතුළත්ය.

ගෙවීම් ලබාගැනීම සඳහා සමූහය සතු අයිතිය ස්ථාපිත වූ විට ලාභාංශ ආදායම හඳුනාගනු ලබයි.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| විදේශ විනිමය | | | | |
| – අනෙකුත් ගනුදෙනුකරුවන්ගෙන් | **(389,094)** | (33,967) | **(389,094)** | (33,967) |
| ස්ථාවර ආදායම් සුරැකුම්පත් | **212,789** | 623,483 | **672,477** | 1,468,336 |
| හිමිකම් සුරැකුම්පත් | **566,262** | 555,233 | **566,262** | 555,233 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **318,077** | (233,119) | **287,483** | (197,666) |
| **එකතුව** | **708,034** | 911,630 | **1,137,128** | 1,791,936 |

## 7 ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය උපකරණයන්ගෙන් ලත් ශුද්ධ ලාභය/(අලාභය)

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ලාභය හෝ අලාභය මඟින් හඳුනාගත් මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම්වල සාධාරණ අගයෙහි වෙනස්වීම්වලින් ලත් සියලු උපලබ්ධි නොවූ ලාභ හා අලාභවලට අයත් වේ.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| ලාභ/අලාභ මඟින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් මත ලාභ | **–** | – | **–** | – |
| ලාභ/අලාභ මඟින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් මත අලාභ | **–** | – | **–** | – |
| ලාභ/අලාභ මඟින් සාධාරණ අගයට ඇති මූල්‍ය වගකීම් මත ලාභ | **–** | – | **–** | – |
| ලාභ/අලාභ මඟින් සාධාරණ අගයට ඇති මූල්‍ය වගකීම් මත අලාභ | **–** | – | **–** | – |
| **එකතුව** | **–** | – | **–** | – |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 8 මූල්‍ය වත්කම් හඳුනාගැනීම අත්හැරීම මගින් ලත් ශුද්ධ ලාභය/(අලාභය)

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගැනීම අත්හරින ලද වත්කම් සහ වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් වලට අදාළ ලාභයෙන් අලාභය අඩු කළ විට මූල්‍ය වත්කම් හඳුනාගැනීම අත්හැරීම මගින් ලත් ශුද්ධ ලාභ/(අලාභ) ගණනය වේ.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| **හඳුනාගැනීම** | | | | |
| ලාභ/අලාභ මගින් සාධාරණ අගයට | – | – | – | – |
| ක්‍රමක්ෂය පිරිවැයට | – | – | – | – |
| වෙනත් විස්තීර්ණ ආදායම මගින් සාධාරණ අගයට | 553,002 | 442,273 | 553,002 | 442,273 |
| **එකතුව** | 553,002 | 442,273 | 553,002 | 442,273 |

## 9 වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)

ගිණුම්කරණ ප්‍රතිපත්ති

**i. දේපල, පිරියත, උපකරණ ඉවත් කිරීමෙන් ලද ලාභය/(අලාභය)**

ඉවත් කරනු ලබන දිනට වත්කම්වල ධාරණ අගය හා ශුද්ධ විකුණුම් මිල අතර වෙනස මගින් දේපල, පිරියත, උපකරණ ඉවත් කිරීමෙන් ලද ලාභ/(අලාභ) තීරණය වේ. සැලකිය යුතු අවදානම් හා ප්‍රතිලාභ හිමිකම විකුණුම්කරු වෙත මාරු කරනු ලබන වර්ෂයේදී මෙය වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ හඳුනාගනු ලබයි

**ii. විදේශ විනිමය ලාභ/(අලාභ)**

සෑම වාර්තාකරණ දිනකටම විදේශ විනිමය තත්ත්වය යලි පරිවර්තනය කෙරෙයි. විනිමය අනුපාතික වෙනස්වීම් මත ඇතිවන ලාභ/(අලාභ) ඒවා පැන නගින කාලපරිච්ඡේදයේ ආදායම් ප්‍රකාශයෙහි දක්වනු ලබයි.

**iii. ලාභාංශ ආදායම**

ගෙවීම් ලබාගැනීම සඳහා සමූහය සතු අයිතිය ස්ථාපිත වූ විට වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් වලින් ඉපැයෙන ලාභාංශ හඳුනාගනු ලබයි.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| ආයෝජිත දේපල ලාභ/(අලාභ) | – | – | – | – |
| දේපල, පිරියත, උපකරණ විකිණීමෙන් ලත් ලාභ/(අලාභ) | (2,300) | 4,439 | (2,070) | 4,396 |
| විදේශ විනිමය යළි අගය කිරීමෙන් ලත් ලාභ/(අලාභ) | 312,866 | 105,430 | 312,866 | 105,430 |
| ආයෝජිත දේපල ප්‍රත්‍යාගණන ලාභ | – | – | – | – |
| ලියා හරින ලද ණය අයකර ගැනීම | – | – | 24,141 | 9,381 |
| අඩුකළා - ලියා හරින ලද ණය | – | – | – | – |
| ලාභාංශ ආදායම | 317,748 | 164,373 | 329,618 | 167,331 |
| කුලී ආදායම | 30,029 | 25,305 | 23,828 | 19,255 |
| වෙනත් ආදායම | 127,690 | 156,394 | 131,472 | 159,950 |
| **එකතුව** | 786,033 | 455,941 | 819,855 | 465,743 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 10 හානිකරණ වියදම්/(ප්‍රතිවර්තන)

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

මූල්‍ය උපකරණ පිළිබඳ ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 – ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් මඟින් ඇගයීමට ලක් කරන සියලු මූල්‍ය උපකරණ වෙනුවෙන් සිදුකළ හානිකරණ ප්‍රතිපාදනයේ වෙනස්වීම් සමූහය විසින් හඳුනාගනු ලබයි. සියලු මූල්‍ය වත්කම් ප්‍රභේද ඔස්සේ ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 යටතේ හානිකරණ අලාභ මිනීමේදී විශේෂයෙන්ම ණය අවදානමෙහි සැලකියයුතු වැඩිවීම් ඇගයීම, අනාගත මුදල් ප්‍රවාහ ප්‍රමාණය හා කාලය ඇස්තමේන්තු කිරීම, හානිකරණ අලාභ වලදී සුරැකුම් අගය තීරණය කිරීම යනාදිය සම්බන්ධයෙන් නිසි තීරණවලට එළඹිය යුතුය. මෙය ඇස්තමේන්තු සාධක ගණනාවක් මඟින් මෙහෙයවනු ලබන අතර, වෙනස්කම්වල ප්‍රතිඵලයක් ලෙස විවිධ මට්ටමේ දීමනා ලැබිය හැක. බැංකුවේ අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම් විචල්‍ය යෙදවුම් සහ ඒවායෙහි අන්තර් සම්බන්ධතාවයන් තෝරා ගැනීම සම්බන්ධයෙන් පාදක වන උපකල්පන ගණනාවක් සහිත සංකීර්ණ ආකෘතියක නිමයුමකි. හානිකරණ ඇගයීම වෙනුවෙන් උපයෝගී කරගත් ක්‍රමවේදය මූල්‍ය ප්‍රකාශයෙහි සටහන් අංක 21 (ඈ) මඟින් විස්තර කෙරෙයි.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| හානිකරණ වියදම් | **(661,258)** | 11,483,749 | **(772,509)** | 11,471,377 |
| ණය කපාහැරීම | **2,297,874** | 42,307 | **2,343,731** | 42,307 |
| **එකතුව** | **1,636,616** | 11,526,056 | **1,571,222** | 11,513,684 |

### 10.1 හානිකරණ වියදම්

| | | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| **මුදල් හා මුදල්වලට සමානයන්** | | | | | |
| 1 අදියර | | **(356)** | (746) | **(356)** | (746) |
| **බැංකුවල ඇති තැන්පතු** | | | | | |
| 1 අදියර | | **6,104** | 1,252 | **6,104** | 1,100 |
| 2 අදියර | | **–** | – | **–** | – |
| **ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් – ණය හා අත්තිකාරම්** | 21 (ඈ) | | | | |
| 1 අදියර | | **418,138** | 274,093 | **416,884** | 268,455 |
| 2 අදියර | | **2,414,665** | (1,372,754) | **2,412,389** | (1,391,335) |
| 3 අදියර | | **(2,445,303)** | 7,655,975 | **(2,553,022)** | 7,668,017 |
| **ක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් – ණය උපකරණ** | 22 | | | | |
| 1 අදියර | | **4,303** | 3,260 | **4,301** | 3,217 |
| 2 අදියර | | **–** | – | **–** | – |
| 3 අදියර | | **–** | – | **–** | – |
| වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් | 23 (ආ) | **–** | – | **–** | – |
| අසම්භාව්‍ය වගකීම් හා බැඳියාවන් | 48 | **–** | – | **–** | – |
| පාලිත සමාගම්වල ආයෝජන | 24.3 | **–** | – | **–** | – |
| ආශ්‍රිත සමාගම් හා බද්ධ ව්‍යාපාරවල ආයෝජන | 25 | **–** | – | **–** | – |
| දේපළ, පිරියත, උපකරණ | 26 | **–** | – | **–** | – |
| දේපල ආයෝජන | 28 | **–** | – | **–** | – |
| වෙනත් | 31.1 | **–** | – | **–** | – |
| භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු දෑ | 31.2 | **(1,058,809)** | 4,922,669 | **(1,058,809)** | 4,922,669 |
| **එකතුව** | | **(661,258)** | 11,483,749 | **(772,509)** | 11,471,377 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 10. හානිකරණ වියදම්/(ප්‍රතිවර්තන) (සම්බන්ධයි)

### 10.2 කළමනාකරණ ආවරණ තුලින් හානිකරණ වියදමට වන බලපෑම

**කළමණාකරණ ආවරණ තුළින් අපේක්ෂිත ණය අලාභයට වන බලපෑම**

තෝරාගත් අංශ සඳහා මූලිකව අදියර 1 යටතේ වෙන් කරන ලද පාරිභෝගික ණය සහ අත්තිකාරම් අදියර 2 සඳහා මාරු කිරීම හේතුවෙන් 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. මිලියන 17,755.5 ක ණය හා අත්තිකාරම් මුදලක් වාර්තා කළ අතර හානිකරණ වෙන්කිරීම් රු. මිලියන 1,899.3 කින් ඉහළ යන ලදි.

**ණය සහ අත්තිකාරම් 1 අදියරෙන් 2 අදියරට සංචලනය**

| | 1 අදියර | 2 අදියර | ශුද්ධ බලපෑම |
|---|---|---|---|
| නිරාවරණය: (රු. '000) | (17,755,497) | 17,755,497 | – |
| හානිකරණ වෙන්කිරීම් (රු. '000) | (258,885) | 2,158,144 | 1,899,260 |

තෝරාගත් අංශ සඳහා අදියර 2 යටතේ මූලිකව වර්ග කරන ලද පාරිභෝගික ණය සහ අත්තිකාරම් අදියර 3 සඳහා මාරු කිරීම හේතුවෙන් රු. මිලියන 1,092.5 ක ණය හා අත්තිකාරම් මුදලක් වාර්තා කළ අතර 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. මිලියන 241.6 ක හානිකරණ වෙන්කිරීම් ඉහළ යාමක් සිදුවිය.

**ණය සහ අත්තිකාරම් 2 අදියරෙන් 3 අදියරට සංචලනය**

| | 2 අදියර | 3 අදියර | ශුද්ධ බලපෑම |
|---|---|---|---|
| නිරාවරණය (රු. '000) | (1,092,493) | 1,092,493 | – |
| හානිකරණ වෙන්කිරීම් (රු. '000) | (181,409) | 423,013 | 241,604 |

වැඩිදුර තොරතුරු සඳහා සටහන් අංක 21 (ඊ) පිටු අංක 347 හි ඉදිරි දැක්මැති තොරතුරු වල ණය සහ අත්තිකාරම් සහ අපේක්ෂිත ණය අලාභ වෙන්කිරීම් සඳහා වූ බලපෑම් වෙත යොමුවන්න.

**ස්වාභාවික හා පාරිසරික අවදානම් සඳහා කළමණාකරණ ආවරණ තුළින් අපේක්ෂිත ණය අලාභයට වන බලපෑම**

2025 නොවැම්බර් මාසයේ ඇති වූ දිවිවා සුළි කුණාටුව සහ ගංවතුර ව්‍යසනය හේතුවෙන් ඇති විය හැකි බලපෑම සැලකිල්ලට ගනිමින් වත්මන් මූල්‍ය වර්ෂය සඳහා රුපියල් බිලියන 2.58 ක අතිරේක හානිකරණ ප්‍රතිපාදනයක් බැංකුව විසින් හඳුනාගෙන ඇත. වාර්තා කරන දිනට සත්‍ය බලපෑමේ ප්‍රමාණය සම්පූර්ණයෙන්ම නිශ්චය කළ නොහැකි බැවින්, අතිරේක හානිකරණ දීමනාව සඳහා අවශ්‍යතාවය තක්සේරු කිරීමේදී බැංකුව කළමනාකරණ විනිශ්චය ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව, වත්මන් මූල්‍ය වර්ෂය සඳහා අතිරේක ප්‍රතිපාදන අවශ්‍යතාවය ඇස්තමේන්තු කිරීම සඳහා හානිකරණ ආකෘතියේ කළමනාකරණ ආවරණයක් තීරණය කිරීමේදී භූගෝලීය සාන්ද්‍රණය සහ ඒ ආශ්‍රිත සාධක සලකා බලා ඇත.

## 11 සේවක මණ්ඩල වියදම්

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

i. **නිර්වචිත දායකත්ව සැලසුම**

සමූහය විසින් නිර්වචිත දායකත්ව සැලසුමක් මෙහෙයවනු ලබයි. නිශ්චිත දායකත්ව සැලසුමක් වෙත දැක්විය හැකි දායකත්වය තීරණය වනුයේ සේවකයින් විසින් සමූහය වෙත ලබා දෙන සේවයට සමානුපාතිකව වන අතර, එය "සේවක මණ්ඩල වියදම්" යටතේ වාර්තා කරනු ලබයි. ගෙවිය යුතු දායකත්ව මුදල්, වගකීමක් ලෙස වාර්තා කරනු ලබයි. සමූහය විසින් පහත සඳහන් නිර්වචිත දායකත්ව සැලසුම් වෙනුවෙන් එහි දායකත්වය දක්වනු ලබයි.

**(අ) සේවක අර්ථසාධක අරමුදල**

බැංකුව හා සේවකයින් විසින් සේවකයාගේ මාසික දළ වැටුපෙන් (අතිකාල දීමනා හැරුණු විට) පිළිවෙලින් 12% ක් හා 8% ක් බැගින් අර්ථසාධක අරමුදලට දායක වනු ලබයි. බැංකුවේ අර්ථසාධක අරමුදල වූ කලී සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ අනුමැතිය ලද අරමුදලකි. බැංකුව විසින් සේවක අර්ථසාධක අරමුදලෙහි සාමාජිකයින් හට වාර්ෂිකව 8% ක ප්‍රතිලාභයක් සහතික කරනු ලබයි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන සේවක අර්ථසාධක අරමුදලට පාලිත සමාගම් සහ එහි සේවකයින් විසින් 12% සහ 8% බැගින් පිළිවෙලින් දායක කරනු ලබයි.

**(ආ)සේවක භාරකාර අරමුදල**

සමූහය විසින් (අතිකාල දීමනා හැර) සේවකයින්ගේ මාසික දළ වැටුපෙන් 3% ක් සේවක භාරකාර මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන සේවක භාරකාර අරමුදලට දායක කරනු ලබයි.

ii. **නිර්වචිත ප්‍රතිලාභ සැලසුම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං.ගි.ප්‍ර. 19) "සේවක ප්‍රතිලාභවලට" අනුව සෑම නිර්වචිත ප්‍රතිලාභ සැලසුමක් මත පදනම්ව ඒ ඒ නිර්වචිත ප්‍රතිලාභ සැලසුම සඳහා වෙන වෙනම කරනු ලබන ස්වාධීන ජීවගණක තක්සේරුවක් මත දායකත්වය ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලබයි.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 11. සේවක මණ්ඩල වියදම් (සම්බන්ධයි)

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | බැංකුව 2025 රු. '000 | බැංකුව 2024 රු. '000 | සමූහය 2025 රු. '000 | සමූහය 2024 රු. '000 |
|---|---|---|---|---|---|
| වැටුප් සහ ප්‍රසාද දීමනා | | 15,079,623 | 15,662,688 | 15,117,262 | 16,053,927 |
| නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා දායකත්වය | | 1,425,537 | 1,417,025 | 1,431,978 | 1,448,931 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා දායකත්වය | 11 (අ,ආ,ඇ,ඈ) | 2,698,537 | 2,806,163 | 2,704,339 | 2,843,838 |
| කොටස් මත පදනම් වූ වියදම් | | – | – | – | – |
| වෙනත් | | 688,223 | 420,271 | 714,818 | 499,307 |
| **එකතුව** | | 19,891,920 | 20,306,147 | 19,968,397 | 20,846,003 |

### 11. (අ) දායකත්වය – සේවක විශ්‍රාම වැටුප් අරමුදල – 1

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | බැංකුව 2025 රු. '000 | බැංකුව 2024 රු. '000 | සමූහය 2025 රු. '000 | සමූහය 2024 රු. '000 |
|---|---|---|---|---|---|
| වියදම් ලෙස හඳුනාගත් මුදල | 38 (අ) 1 | 1,382,226 | 1,750,753 | 1,382,226 | 1,750,753 |

වෘත්තීමය ජීවගණක සමාගමක් වන යුනිට්ස් ඇක්චුරීස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස් (පුද්) සමාගමෙහි එම්. ජයරාමන් මහතා විසින් 2025 දෙසැම්බර් 31 දිනට ජීවගණක ඇගයීම සිදුකරන ලදී. (යොමුව සටහන් අංක 38.අ. 1 පිටු අංක 373).

### 11. (ආ) දායකත්වය - සේවක විශ්‍රාම වැටුප් අරමුදල - 11

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | බැංකුව 2025 රු. '000 | බැංකුව 2024 රු. '000 | සමූහය 2025 රු. '000 | සමූහය 2024 රු. '000 |
|---|---|---|---|---|---|
| වියදම් ලෙස හඳුනාගත් මුදල | 38 (අ) 2 | 759,390 | 267,143 | 759,390 | 268,430 |

1995 ඔක්තෝබර් මස 01 දින හෝ ඉන් පසුව බැංකු සේවයට බැඳුනු ස්ථිර සේවකයින් සඳහා බැංකුව විසින් සේවක විශ්‍රාම වැටුප් අරමුදල II ස්ථාපිත කර ඇත. වෘත්තීමය ජීවගණක සමාගමක් වන සී/ස යුනිට්ස් ඇක්චුරීස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස් (පුද්) සමාගමෙහි එම්. ජයරාමන් මහතා විසින් 2025 දෙසැම්බර් 31 දිනට ජීවගණක ඇගයීම සිදුකරන ලදී. (යොමුව සටහන් අංක 38 (අ) 2 පිටු අංක 376)

### 11. (ඇ) දායකත්වය - විශ්‍රාමික සේවක වෛද්‍යාධාර ක්‍රමය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | බැංකුව 2025 රු. '000 | බැංකුව 2024 රු. '000 | සමූහය 2025 රු. '000 | සමූහය 2024 රු. '000 |
|---|---|---|---|---|---|
| වියදම් ලෙස හඳුනාගත් මුදල | 38 (අ) 3 | 556,921 | 788,267 | 556,921 | 788,267 |

සියලුම බැංකු සේවකයින් සඳහා විශ්‍රාමික සේවක වෛද්‍යාධාර ක්‍රමය ස්ථාපිත කර ඇත. වෘත්තීමය ජීවගණක සමාගමක් වන සී/ස යුනිට්ස් ඇක්චුරීස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස් (පුද්) සමාගමෙහි එම්. ජයරාමන් මහතා විසින් 2025 දෙසැම්බර් 31 දිනට ජීවගණක ඇගයීම සිදුකරන ලදී. (යොමුව සටහන් අංක 38(අ) 3 පිටු අංක 378)

### 11. (ඈ) දායකත්වය – පාරිතෝෂිකය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | බැංකුව 2025 රු. '000 | බැංකුව 2024 රු. '000 | සමූහය 2025 රු. '000 | සමූහය 2024 රු. '000 |
|---|---|---|---|---|---|
| වියදම් ලෙස හඳුනාගත් මුදල | 38 (අ) 4 | – | – | 5,802 | 40,957 |

පරිපාලිත සමාගම්වල සේවක මණ්ඩලය විශ්‍රාම වැටුප් ක්‍රමයට හිමිකම් නොලබන අතර ඔවුන් 1983 අංක 12 දරන පාරිතොෂික දීමනා පනත යටතේ ප්‍රතිපාදන සඳහා හිමිකම් ලබයි. (පිටු අංක 380 – සටහන් අංක 38 (අ, 4).

## මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 12 වෙනත් වියදම්

### ගිණුම්කරණ ප්‍රතිපත්ති

දැරියයුතු වන පිරිවැය සහ ආදායමට සම්බන්ධ නිශ්චිත අයිතමවල ඉපැයීම් අතර සෘජු සම්බන්ධතාව මත පදනම්ව ආදායම් ප්‍රකාශයෙහි වෙනත් මෙහෙයුම් වියදම් හඳුනාගනු ලබයි. කාර්යක්ෂම තත්ත්වයන් යටතේ දේපළ, පිරියත හා උපකරණ පවත්වාගෙන යාමේදී හා ව්‍යාපාර කටයුතු ඉටු කිරීමේදී පැන නගින සියලු වියදම්, ලාභ හෝ අලාභ වර්ෂයේ ලාභය ගණනය කිරීමේදී ආදායම් ප්‍රකාශයෙහි දක්වා ඇත. පසුගිය සිදුවීමක් හේතුවෙන් සමූහය වෙත වත්මන් බැඳීමක් ඇති විට (නෛතික හෝ සම්ප්‍රයුක්ත) එකී බැඳීම් පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කෙරෙන සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය වියහැකි අතර එමගින් බැඳීමේ ප්‍රමාණය පිළිබඳ පිළිගත හැකි ඇස්තමේන්තුවක් කළ හැකි වන අතර සෙසු වියදම්වලට අදාළ ප්‍රතිපාදන හඳුනාගනු ලබයි. දේපළ පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම් අනෙකුත් වියදම්වලින් වෙන්කර ආදායම් ප්‍රකාශයෙහි දක්වනු ලැබේ.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| අධ්‍යක්ෂ මණ්ඩල පාරිශ්‍රමිකයන් | **2,688** | 2,413 | **7,470** | 7,641 |
| විගණක පාරිශ්‍රමිකයන් | **7,093** | 8,473 | **16,311** | 14,569 |
| විගණිත නොවන ගාස්තු විගණකවරුන් සඳහා | **–** | – | **–** | – |
| ව්‍යක්තීය හා නෛතික වියදම් | **39,845** | 47,753 | **46,474** | 66,491 |
| මහ බැංකුවට ගෙවන ලද තැන්පතු රක්ෂණ වාරිකය | **1,524,112** | 1,413,300 | **1,524,289** | 1,413,488 |
| කාර්යාල පරිපාලන හා ආයතනික වියදම් | **5,581,457** | 4,577,059 | **5,631,765** | 4,645,570 |
| වෙනත් | **1,127,582** | 972,350 | **1,246,084** | 1,080,545 |
| **එකතුව** | **8,282,777** | 7,021,348 | **8,472,393** | 7,228,304 |

## 13 බදු වියදම්

### ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.ගි.ප්‍ර.12) හි "ආදායම් බදු" අනුව බදු වියදම් යනු කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ ලාභය හෝ අලාභය තීරණය නිශ්චය කිරීමේදී ප්‍රවර්තන බද්ද සහ විලම්භිත බදු සඳහා ඇතුලත් කරනු ලබන සමාහාර අගයයි. හිමිකම් හෝ වෙනත් විස්තීර්ණ ආදායම්හි සෘජුවම දක්වනු ලබන අයිතමවලට අදාළ වන සීමාව හැරුණුවිට ආදායම් බදු ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලබයි.

**ප්‍රවර්තන බදුකරණය**

ප්‍රවර්තන වර්ෂය මෙන්ම ඊට පෙර වර්ෂ සඳහා දේශීය ආදායම් බදු කොමසාරිස් වෙත ගෙවිය යුතු හෝ අය කර ගත යුතු ප්‍රමාණයන්ගෙන් ප්‍රවර්තන බදු වත්කම් හා වගකීම් සමන්විත වේ. එම ප්‍රමාණ ගණනය කිරීම සඳහා යොදා ගන්නා ලද බදු අනුපාත හා බදු නීති, ශේෂපත්‍ර දිනට හෝ ඉන් පසුව නීතිගත කර ඇත. ඒ අනුව, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත හා එහි පරිශිෂ්ඨයන් හි ප්‍රතිපාදනයන්ට අනුව සටහන් අංක 13 (අ) හි ඇති අනුපාත යොදා ගනිමින් වර්ෂයට අදාල ලාභය මත පදනම්ව බදු සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

**විලම්බිත බදුකරණය**

වගකීම් ක්‍රමය උපයෝගී කරගනිමින් වාර්තාකරණ දිනට වත්කම් හා වගකීම් වල බදු පදනම සහ මූල්‍ය වාර්තා කිරීමේ අරමුණ පිණිස හඳුනාගන්නා අගය අතර, ඇති සියලුම තාවකාලික වෙනස්වීම් මත විලම්භිත බද්ද සඳහා සලකා බැලේ.

සියලුම අඩුකළ හැකි තාවකාලික වෙනස්වීම්වලට අදාළ විලම්බිත බදු වත්කම් හඳුනාගෙන ඇත. ඉදිරියට ගෙන ආ, පාවිච්චි නොකළ බදු බැර සහ පාවිච්චි නොකළ බදු අලාභ සඳහා ඊට යොදාගත හැකි අනාගත බදුවල ලාභ ලැබෙතැයි ගම්‍ය වනතාක් දුරට හඳුනාගත යුතුය.

සෑම වාර්තාකරන දිනකටම විලම්බිත බදු වත්කමක ධාරණ අගය සමාලෝචනය කරනු ලබන අතර, විලම්බිත බදු වත්කමෙන් කොටසක් හෝ සම්පූර්ණයෙන්ම කපාහැරීමට උපයෝගී කර ගැනීමේ වාසිය ලැබීමට ප්‍රමාණවත් තරම් බදු වන ලාභ ලැබෙතැයි තවදුරටත් හව්‍ය නොවන තෙක් විලම්බිත බදු වත්කමේ ධාරණ අගය අඩු කරනු ලබයි. හඳුනාගනු නොලැබ ඇති විලම්බිත බදු වත්කම් සෑම වාර්තාකරන දිනක දීම යළි තක්සේරු කරන අතර අනාගත බදු වන ලාභ වලින් විලම්බිත බදු වත්කම් අයකර ගැනීමට ඇති හැකියාව දැන් හව්‍ය වන තාක් දුරට හඳුනා ගනු ලබයි.

වාර්තාකරණ දිනට නීතිගත කර ඇති හෝ ඉන්පසුව බොහෝ දුරට නීතිගත තත්වයට පත්ව ඇති බදු අනුපාත සහ බදු නීති පදනම් කරගෙන වත්කම් උපලබ්ධි වූ හෝ වගකීම් පියවූ වර්ෂයට උපයෝගී කර ගැනීමට අපේක්ෂිත බදු අනුපාතය මත විලම්බිත බදු වත්කම් හා වගකීම් මනිනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 13. බදු වියදම් (සම්බන්ධයි)

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | බැංකුව 2025 රු. '000 | බැංකුව 2024 රු. '000 | සමූහය 2025 රු. '000 | සමූහය 2024 රු. '000 |
|---|---|---|---|---|---|
| **ප්‍රවර්තන බදු වියදම්** | | | | | |
| ප්‍රවර්තන වර්ෂය | | 17,929,245 | 8,935,497 | 18,432,446 | 9,770,215 |
| පසුගිය වර්ෂ සඳහා (අධි)/ඌණ වෙන් කිරීම් | | (17,310) | – | 63,579 | (105,378) |
| **විලම්බිත බදු වියදම්** | | | | | |
| බදු අනුපාතිකවල වෙනසෙහි බලපෑම | | – | – | – | – |
| තාවකාලික වෙනස්වීම් | 13 (ආ) | (739,589) | 1,209,935 | (713,871) | 1,197,287 |
| පෙර වර්ෂයේ (අධි)/ඌණ ප්‍රතිපාදන | 13 (ආ) | – | – | – | – |
| **එකතුව** | | 17,172,346 | 10,145,432 | 17,782,154 | 10,862,124 |
| සඵල බදු අනුපාතිකය (%) | | 38.60 | 38.39 | 38.70 | 38.08 |
| සඵල බදු අනුපාතිකය (විලම්බිත බදු හැර) (%) | | 40.26 | 33.81 | 40.26 | 33.89 |

### 13. (අ) බදු වියදම් සැසඳුම

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | බැංකුව 2025 රු. '000 | බැංකුව 2024 රු. '000 | සමූහය 2025 රු. '000 | සමූහය 2024 රු. '000 |
|---|---|---|---|---|
| **බදු පෙර ලාභය** | 44,493,104 | 26,430,676* | 45,944,706 | 28,521,937* |
| වර්ෂය සඳහා ආදායම් බදු (ශිෂ්ඨීකරණ ලාභය මත බදු අනුපාතය) | 13,347,931 | 7,929,203 | 13,783,412 | 8,556,581 |
| එකතු කළා: බදු කටයුතු සඳහා අඩු කළ නොහැකි වියදම් මඟින් බදු සඳහා ඇතිවූ බලපෑම | 4,712,044 | 6,452,494 | 4,849,382 | 6,675,894 |
| පාවිච්චි නොකල බදු අලාභ | – | – | – | – |
| අඩුකළා: බදු කටයුතු සඳහා අඩු කළහැකි වියදම් මඟින් බදු සඳහා ඇතිවූ බලපෑම | (286,606) | 2,880,047 | (216,988) | 2,896,107 |
| බදු නිදහස් ආදායම සඳහා බදු බලපෑම | 417,336 | 505,239 | 417,336 | 505,239 |
| පාවිච්චි කල බදු අලාභ | – | 2,060,914 | – | 2,060,914 |
| **වර්ෂය සඳහා බදු වියදම** | 17,929,245 | 8,935,497 | 18,432,446 | 9,770,215 |
| **බදු අනුපාත (%)** | 30 | 30 | 30 | 30 |

කරුණාකර පෙර වර්ෂයේ ගැලපීම් පිළිබඳ විස්තර සඳහා සටහන් අංක (53) වෙත යොමු වෙන්න.

### 13. (ආ) ආදායම් ප්‍රකාශයට ගලපන ලද විලම්බිත බදු (බැර)/වියදම සකස් වී ඇත්තේ පහත පරිදිය.

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | බැංකුව 2025 රු. '000 | බැංකුව 2024 රු. '000 | සමූහය 2025 රු. '000 | සමූහය 2024 රු. '000 |
|---|---|---|---|---|
| විලම්බිත බදු වත්කම් | (739,589) | 1,209,935 | (712,191) | 1,199,900 |
| විලම්බිත බදු වගකීම් | – | – | (1,680) | (2,613) |
| **ආදායම් ප්‍රකාශයට ගලපන ලද විලම්බිත බදු (බැර)/වියදම** | (739,589) | 1,209,935 | (713,871) | 1,197,287 |

## මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 14 කොටසක ඉපැයුම

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

සමූහය විසින් එහි සාමාන්‍ය කොටස්වල මූලික හා තනුක කොටසක ඉපැයීම් දත්ත ඉදිරිපත් කරනු ලබයි. බැංකුවේ සාමාන්‍ය කොටස් හිමිකරුවන්ට අදාළ වන වර්ෂය සඳහා වූ ලාභය හෝ අලාභය එම වර්ෂය තුළ බලාත්මක හරිත මධ්‍යක සාමාන්‍ය කොටස් ගණනින් බෙදීමෙන් මූලික කොටසක ඉපැයුම ගණනය කරනු ලැබේ. සාමාන්‍ය කොටස් හිමිකරුවන්ට අදාළ වන වර්ෂය සඳහාවූ ලාභය හෝ අලාභය වර්ෂය තුළ බලාත්මක හරිත මධ්‍යක සාමාන්‍ය කොටස් ගණනින් බෙදා ඊට සියලුම තනුකික විභව සාමාන්‍ය කොටස් සඳහා වූ බලපෑම ගැලපීමෙන් තනුක කොටසක ඉපැයුම ගණනය කෙරෙයි. 2025 දෙසැම්බර් 31 වන දිනට බැංකුව සතුව තනුකික විභව සාමාන්‍ය කොටස් නොමැත.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| සාමාන්‍ය කොටස් හිමිකරුවන් සඳහා වන ශුද්ධ ලාභය | 27,320,758 | 16,122,392 | 28,162,552 | 17,496,961 |
| සාමාන්‍ය කොටස් හිමිකරුවන්ට බෙදාහරින ලද ශුද්ධ ලාභය තනුකවීමේ බලපෑම සඳහා ගැලපීමෙන් පසු | 27,320,758 | 16,122,392 | 28,162,552 | 17,496,961 |
| කොටසක මූලික ඉපයුම් සඳහා හරිත මධ්‍යක සාමාන්‍ය කොටස් සංඛ්‍යාව | 940,000 | 940,000 | 940,000 | 940,000 |
| තනුක වීමේ බලපෑම | – | – | – | – |
| තනුක වීමේ බලපෑම ගැලපීමෙන් පසු හරිත මධ්‍යක සාමාන්‍ය කොටස් සංඛ්‍යාව | 940,000 | 940,000 | 940,000 | 940,000 |
| **සාමාන්‍ය කොටසක මූලික ඉපැයීම්** | 29.06 | 17.15 | 29.96 | 18.61 |
| **සාමාන්‍ය කොටසක තනුක ඉපැයීම්** | 29.06 | 17.15 | 29.96 | 18.61 |

කරුණාකර පෙර වර්ෂයේ ගැලපීම් පිළිබඳ විස්තර සඳහා සටහන් අංක (53) වෙත යොමු වෙන්න.

### 14. (අ) කොටසක මූලික හා තනුක ඉපයුම් සඳහා බර තැබූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව

| | පවතින සාමාන්‍ය කොටස් සංඛ්‍යාව | | බර තැබූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| ජනවාරි 01 දිනට නිකුත් වූ කොටස් සංඛ්‍යාව | 940,000 | 940,000 | 940,000 | 940,000 |
| එකතුකළා: වර්ෂය තුළ නිකුත් කළ කොටස් සංඛ්‍යාව | – | – | – | – |
| **කොටසක මූලික හා තනුක ඉපයුම් සඳහා බර තැබූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව** | 940,000 | 940,000 | 940,000 | 940,000 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 15 ගණනය කරන ලද පදනම මත මූල්‍ය උපකරණවල විශ්ලේෂණය

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී.ල.මු.වා.ප්‍ර. 9) මූල්‍ය උපකරණ අනුව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වර්ගීකරණය යටතේ මූල්‍ය උපකරණවල ධාරන අගය පහත පරිදි සාරාංශගත කර ඇත.

### 15. (අ) බැංකුව 2025

| දෙසැම්බර් 31 දිනට | සටහන් | ක්‍රමක්ෂය පිරිවැය රු. '000 | ලාභාලාභ මඟින් සාධාරණ අගයට නම්කරන ලද රු. '000 | වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 16 | 8,326,738 | – | – | 8,326,738 |
| මහ බැංකුව වෙතැති ශේෂයන් | 17 | 167,212 | – | – | 167,212 |
| බැංකුවල ඇති තැන්පතු | 18 | 24,181,317 | – | – | 24,181,317 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 19 | – | 68,813 | – | 68,813 |
| ණය සහ අත්තිකාරම් | 21 | 550,828,369 | – | – | 550,828,369 |
| ණය උපකරණ | 20, 22 සහ 23 | 1,092,989,914 | 20,855,082 | 57,442,616 | 1,171,287,612 |
| හිමිකම් උපකරණ | 20 සහ 23 | – | 1,303,683 | 7,192,082 | 8,495,765 |
| **මූල්‍ය වත්කම් එකතුව** | | 1,676,493,550 | 22,227,578 | 64,634,698 | 1,763,355,826 |

| දෙසැම්බර් 31 දිනට | සටහන් | ක්‍රමක්ෂය පිරිවැය රු. '000 | ලාභාලාභ මඟින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000 | වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|
| **වගකීම්** | | | | | |
| බැංකුවලට ගෙවිය යුතු | 32 | 80,972 | – | – | 80,972 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 33 | – | 13 | – | 13 |
| මූල්‍ය වගකීම් | | | | | |
| – තැන්පත්කරුවන්ට ගෙවිය යුතු | 35 | 1,608,490,322 | – | – | 1,608,490,322 |
| – ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවිය යුතු | 35 | – | – | – | – |
| – වෙනත් ණය ගැනීම් සඳහා ගෙවිය යුතු | 35 | 39,057,116 | – | – | 39,057,116 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | 37 | 16,911,043 | – | – | 16,911,043 |
| **මූල්‍ය වගකීම් එකතුව** | | 1,664,539,453 | 13 | – | 1,664,539,466 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 15. ගණනය කරන ලද පදනම මත මූල්‍ය උපකරණවල විශ්ලේෂණය (සම්බන්ධයි)

### 15. (අ) බැංකුව 2024

| දෙසැම්බර් 31 දිනට | සටහන් | ක්‍රමක්ෂය පිරිවැය රු. '000 | ලාභාලාභ මඟින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000 | වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 16 | 8,358,742 | – | – | 8,358,742 |
| මහ බැංකුව වෙතැති ශේෂයන් | 17 | 357,054 | – | – | 357,054 |
| බැංකුවල ඇති තැන්පතු | 18 | 14,794,637 | – | – | 14,794,637 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 19 | – | 9,131 | – | 9,131 |
| ණය සහ අත්තිකාරම් | 21 | 532,379,013 | – | – | 532,379,013 |
| ණය උපකරණ | 20, 22 සහ 23 | 1,039,034,572 | 20,874,049 | 47,900,345 | 1,107,808,966 |
| හිමිකම් උපකරණ | 20 සහ 23 | – | 212,732 | 5,568,833 | 5,781,565 |
| **මූල්‍ය වත්කම් එකතුව** | | 1,594,924,018 | 21,095,912 | 53,469,178 | 1,669,489,108 |

| දෙසැම්බර් 31 දිනට | සටහන | ක්‍රමක්ෂය පිරිවැය රු. '000 | ලාභාලාභ මඟින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|
| **වගකීම්** | | | | |
| බැංකුවලට ගෙවිය යුතු | 32 | 487,521 | – | 487,521 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 33 | – | 258,409 | 258,409 |
| මූල්‍ය වගකීම් | | | | |
| – තැන්පත්කරුවන්ට ගෙවිය යුතු | 35 | 1,556,270,863 | – | 1,556,270,863 |
| – ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවිය යුතු | 35 | – | – | – |
| – වෙනත් ණය ගැනීම් සඳහා ගෙවිය යුතු | 35 | 48,190,057 | – | 48,190,057 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | 37 | 16,966,482 | – | 16,966,482 |
| **මූල්‍ය වගකීම් එකතුව** | | 1,621,914,923 | 258,409 | 1,622,173,332 |

### 15. (ඇ) සමූහය 2025

| දෙසැම්බර් 31 දිනට | සටහන් | ක්‍රමක්ෂය පිරිවැය රු. '000 | ලාභාලාභ මඟින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000 | වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 16 | 8,386,287 | – | – | 8,386,287 |
| මහ බැංකුව වෙතැති ශේෂයන් | 17 | 167,236 | – | – | 167,236 |
| බැංකුවල ඇති තැන්පතු | 18 | 24,181,317 | – | – | 24,181,317 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 19 | – | 83,979 | – | 83,979 |
| ණය සහ අත්තිකාරම් | 21 | 550,639,060 | – | – | 550,639,060 |
| ණය උපකරණ | 20, 22 සහ 23 | 1,096,342,623 | 77,321,383 | 60,794,901 | 1,234,458,907 |
| හිමිකම් උපකරණ | 20 සහ 23 | – | 1,303,683 | 7,202,853 | 8,506,536 |
| **මූල්‍ය වත්කම් එකතුව** | | 1,679,716,523 | 78,709,045 | 67,997,754 | 1,826,423,322 |

| දෙසැම්බර් 31 දිනට | සටහන් | ක්‍රමක්ෂය පිරිවැය රු. '000 | ලාභලාභ මඟින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|
| **වගකීම්** | | | | |
| බැංකුවලට ගෙවිය යුතු | 32 | 80,972 | – | 80,972 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 33 | – | 13 | 13 |
| **මූල්‍ය වගකීම්** | | | | |
| – තැන්පත්කරුවන්ට ගෙවිය යුතු | 35 | 1,608,891,967 | – | 1,608,891,967 |
| – ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවිය යුතු | 35 | – | – | – |
| – වෙනත් ණය ගැනීම් සඳහා ගෙවිය යුතු | 35 | 93,629,216 | – | 93,629,216 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | 37 | 16,983,801 | – | 16,983,801 |
| **මූල්‍ය වගකීම් එකතුව** | | 1,719,585,956 | 13 | 1,719,585,969 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 15. ගණනය කරන ලද පදනම මත මූල්‍ය උපකරණවල විශ්ලේෂණය (සම්බන්ධයි)

### 15. (අ) සමූහය 2024

| දෙසැම්බර් 31 දිනට | සටහන් | ක්‍රමක්ෂය පිරිවැය රු. '000 | ලාභාලාභ මඟින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000 | වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 16 | 8,544,416 | – | – | 8,544,416 |
| මහ බැංකුව වෙතැති ශේෂයන් | 17 | 357,117 | – | – | 357,117 |
| බැංකුවල ඇති තැන්පතු | 18 | 14,794,637 | – | – | 14,794,637 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 19 | – | 54,892 | – | 54,892 |
| ණය සහ අත්තිකාරම් | 21 | 527,715,322 | – | – | 527,715,322 |
| ණය උපකරණ | 20, 22 සහ 23 | 1,048,965,769 | 46,536,796 | 49,366,765 | 1,144,869,330 |
| හිමිකම් උපකරණ | 20 සහ 23 | – | 212,732 | 5,939,747 | 6,152,479 |
| **මූල්‍ය වත්කම් එකතුව** | | 1,600,377,261 | 46,804,420 | 55,306,512 | 1,702,488,193 |

| දෙසැම්බර් 31 දිනට | සටහන් | ක්‍රමක්ෂය පිරිවැය රු. '000 | ලාභාලාභ මඟින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000 | වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|
| **වගකීම්** | | | | | |
| බැංකුවලට ගෙවිය යුතු | 32 | 487,521 | – | – | 487,521 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 33 | – | 258,409 | – | 258,409 |
| මූල්‍ය වගකීම් | | | | | |
| – තැන්පත්කරුවන්ට ගෙවිය යුතු | 35 | 1,556,681,918 | – | – | 1,556,681,918 |
| – ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවිය යුතු | 35 | – | – | – | – |
| – වෙනත් ණය ගැනීම් සඳහා ගෙවිය යුතු | 35 | 66,049,093 | – | – | 66,049,093 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | 37 | 17,039,651 | – | – | 17,039,651 |
| **මූල්‍ය වගකීම් එකතුව** | | 1,640,258,183 | 258,409 | – | 1,640,516,592 |

## 16 මුදල් හා මුදල් සමානයන්

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

වටිනාකම වෙනස්වීම නොසැලකිය හැකි තරම් වන අවදානමකට යටත් අතැති මුදල්, බැංකුවල ඇති තැන්පතු, කෙටි දැනුම් දීමකින් ලබාගත හැකි මුදල් යනාදිය මුදල් හා මුදල් සමානයන් යන්නට ඇතුළත්ය. දළ අගයෙන් හානිකරණ අඩු කොට මෙම මූල්‍ය වත්කම්වල වටිනාකම මූල්‍ය වාර්තාවල දක්වා ඇත. එම බැංකුවල බාහිර ශ්‍රේණිගත කිරීම් මත පදනම්ව ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 "මූල්‍ය උපකරණ" අනුව සමූහය විසින් හානිකර ප්‍රතිපාදන ගණනය කර ඇත.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| අතැති මුදල් | **4,680,659** | 4,496,582 | **4,682,459** | 4,499,644 |
| බැංකුවල ඇති ශේෂයන් | **3,414,983** | 3,645,461 | **3,472,732** | 3,828,073 |
| කෙටි දැනුම් දීමකින් ආපසු ලබා ගතහැකි මුදල් | **231,287** | 217,246 | **231,287** | 217,246 |
| **දළ මුදල් හා මුදල් සමානයන් (*)** | **8,326,929** | 8,359,289 | **8,386,478** | 8,544,963 |
| අපේක්ෂිත ණය අලාභ හානිකරණය | **(191)** | (547) | **(191)** | (547) |
| **ශුද්ධ මුදල් හා මුදල් සමානයන් (*)** | **8,326,738** | 8,358,742 | **8,386,287** | 8,544,416 |

(*) දළ මුදල් සහ මුදල් සමානයන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 17 මහ බැංකුව වෙතැති ශේෂයන්

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| **ශ්‍රී ලංකා මහ බැංකුව වෙතැති ව්‍යාවස්ථාපිත නොවන ශේෂයන්** | | | | |
| ශ්‍රී ලංකා මහ බැංකුව | 167,212 | 357,054 | 167,236 | 357,117 |
| **එකතුව** | 167,212 | 357,054 | 167,236 | 357,117 |

## 18 බැංකුවල ඇති තැන්පතු

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

බැංකුව සහ සමූහය එහි කෙටිකාලීන බැඳීම් කළමනාකරණය සඳහා යොදවනු ලබන හා සාධාරණ අගය වෙනස්වීමේ අවදානම නොසැළකිය හැකි තරම් වන බැංකුවල ඇති කෙටිකාලීන තැන්පතු මේ යටතට අයත් වේ. ඒවා මූල්‍ය ප්‍රකාශයන්හි ඒවායේ නාමික අගයට හෝ දළ වටිනාකමෙන් හානිකරණය අඩුකර අවශ්‍ය තැන්හි දක්වා ඇත. අදාළ බැංකුවේ බාහිර ශ්‍රේණිගත කිරීම් වලට අනුව ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 මූල්‍ය උපකරණ ප්‍රකාර සමූහය විසින් හානිකරණ ප්‍රතිපාදන ගණනය කර ඇත.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| **ශ්‍රී ලංකාවේ බැංකු වල ඇති තැන්පතු** | | | | |
| ශ්‍රී ලංකා රුපියල් | – | – | – | – |
| ඇමරිකානු ඩොලර් | 18,428,669 | 9,775,159 | 18,428,669 | 9,775,159 |
| යුරෝ | 2,235,556 | 1,790,922 | 2,235,556 | 1,790,922 |
| මහා බ්‍රිතාන්‍ය පවුම් | 2,107,073 | 1,964,241 | 2,107,073 | 1,964,241 |
| ඕස්ට්‍රේලියානු ඩොලර් | 1,424,702 | 1,272,894 | 1,424,702 | 1,272,894 |
| **ශ්‍රී ලංකාවෙන් පිටත බැංකු වල ඇති තැන්පතු** | | | | |
| ඇමරිකානු ඩොලර් | – | – | – | – |
| **බැංකුවල ඇති දළ තැන්පතු** | 24,196,000 | 14,803,216 | 24,196,000 | 14,803,216 |
| අඩුකළා: අපේක්ෂිත ණය අලාභ | (14,683) | (8,579) | (14,683) | (8,579) |
| **බැංකුවල ඇති ශුද්ධ තැන්පතු** | 24,181,317 | 14,794,637 | 24,181,317 | 14,794,637 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 19 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

පොළී අනුපාතික, මූල්‍ය උපකරණවල මිල, වෙළඳ ද්‍රව්‍ය මිල, විදේශ විනිමය අනුපාතික, ණය අවදානම් හා දර්ශක වල වෙනස්වීම් මත අගය සකස් කරගන්නා මූල්‍ය උපකරණ, ව්‍යුත්පන්නයන් වේ. ඉදිරි රැකුම් උපකරණ ලෙස නම් කර නොමැති විට ව්‍යුත්පන්න, වෙළඳාම සඳහා ඇති ලෙස වර්ගීකරණය වෙයි. සමූහය විසින් පොළී අනුපාතික හුවමාරු ගිවිසුම් හා විදේශ විනිමය ඉදිරි ගිවිසුම් යනාදී ව්‍යුත්පන්න භාවිතා කරනු ලබයි.

**ලාභ අලාභ හරහා සාධාරණ අගයට වාර්තාකරණ ලද ව්‍යුත්පන්න**

ඉදිරි රැකුම් උපකරණ ලෙස භාවිත වන ව්‍යුත්පන්න හැරුණුවිට සෙසු ව්‍යුත්පන්න සාධාරණ අගයට වාර්තා කරන අතර, එකී සාධාරණ අගය ධනාත්මක වන්නේ නම් වත්කම් ලෙස සලකන අතර සාධාරණ අගය ඍණාත්මක වන්නේ නම් වගකීම් ලෙස සැලකෙයි. ව්‍යුත්පන්නවල සාධාරණ අගයේ වෙනස්වීම්, වෙළඳාම් කටයුතු වලින් ලද ශුද්ධ ආදායම්වල ඇතුළත් වේ.

**ඉදිරි රැකුම් උපකරණ ලෙස භාවිත ව්‍යුත්පන්න**

විදේශ විනිමය අනුපාතික හෝ පොළී අනුපාතික සම්බන්ධ අවදානම් රැකුම්ගත කිරීම සඳහා සමූහය විසින් ව්‍යුත්පන්න ගිවිසුම් වලට එළඹෙයි. මෙකී ව්‍යුත්පන්න සාධාරණ අගයට මනිනු ලබයි. ඉදිරි රැකුම් කාර්යක්ෂම වන අවස්ථාවලදී, සාධාරණ අගයට මනිනු ලැබූ ව්‍යුත්පන්න සහ පිරිවැයට/ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කම් හෝ වගකීම් මගින් මූල්‍ය ප්‍රකාශනය තුළ පැන නගින අස්ථාවර භාවය ඉවත් කිරීම සඳහා සමූහය විසින් ඉදිරි රැකුම් ගිණුම්කරණ නොගැලපීම් යොදා ගනී.

**මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම්**

වාර්තා කරනු ලබන සෑම කාලසීමාවක් අවසානයේදීම මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම් සාධාරණ අගයට ගණනය කරනු ලබයි.

මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම් ලෙස නම් කෙරෙන සහ එසේ නම් කිරීමට සුදුසු වන ව්‍යුත්පන්නයන්හි සාධාරණ අගයෙහි වෙනස්කම්වල සඵල කොටස, මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම් සාධාරණ අගයේ ලාභ/අලාභ යටතේ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ දක්වනු ලැබේ. එසේ සඵල නොවන කොටසකට අදාළ සාධාරණ අගයෙහි කිසියම් ලාභයක් හෝ අලාභයක් ආදායම් ප්‍රකාශයෙන් එක්වරම හඳුනාගනු ලැබේ.

ඉදිරි රැකුම් අයිතම මගින් ලාභය හෝ අලාභයට බලපෑමක් ඇති කෙරෙන කාල සීමාවන්හි දී වෙනත් විස්තීර්ණ ආදායම්හි හඳුනාගෙන ඇති සමුච්චිත ලාභ හෝ අලාභ, ආදායම් ප්‍රකාශයට යළි වර්ගීකරණය කරනු ලබයි. කෙසේ වුවද ඉදිරි රැකුම්ගත පුරෝකථන ගනුදෙනුවල ප්‍රතිඵල ලෙස මූල්‍ය නොවන වත්කම් හෝ මූල්‍ය නොවන වගකීමක් හඳුනා ගැනෙන විට වෙනත් විස්තීර්ණ ආදායම්හි කලින් හඳුනාගන්නා ලද ලාභ හා අලාභ, හිමිකම් වෙතින් ඉවත්කර වත්කමෙහි හෝ වගකීමෙහි මූලික පිරිවැය ගණනය කිරීමෙහි ඇතුළත් කරනු ලබයි.

ඉදිරි රැකුම්ගත උපකරණයක් කල් ඉකුත්වන විට හෝ විකුණනු ලබන විට හෝ ඉදිරි රැකුමක් තවදුරටත් අදාළ ගිණුම්කරණ නිර්නායක සමග අනුකූල නොවන විට ආදායම් ප්‍රකාශයෙහි පුරෝකථන ගනුදෙනුව හඳුනා ගැනෙන තෙක් ඒ වන විට වෙනත් විස්තීර්ණ ආදායම්හි හඳුනාගෙන ඇති කිසියම් සමුච්චිත ලාභයක් හෝ අලාභයක් හිමිකම් වෙත රඳවා ගැනෙයි. පුරෝකථන ගනුදෙනුවක් තවදුරටත් සිදු වෙතැයි අපේක්ෂා නොකරන විට වෙනත් විස්තීර්ණ ආදායම්හි හඳුනාගනු ලැබ ඇති සමුච්චිත ලාභය හෝ අලාභය, එක්වරම ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කරනු ලබයි.

### 19.1 ව්‍යුත්පන්න වත්කම්

| දෙසැම්බර් 31 දිනට | සටහන් | බැංකුව 2025 රු. '000 | බැංකුව 2024 රු. '000 | සමූහය 2025 රු. '000 | සමූහය 2024 රු. '000 |
|---|---|---|---|---|---|
| **විදේශ විනිමය ව්‍යුත්පන්න** | | | | | |
| විනිමය හුවමාරු ගිවිසුම් | 48.2 | 68,741 | 9,131 | 68,741 | 9,131 |
| විදේශ විනිමය ඉදිරි ගිවිසුම් | | 72 | – | 15,238 | 45,761 |
| **එකතුව** | | 68,813 | 9,131 | 83,979 | 54,892 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 20 ලාභ/අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම්

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

මූල්‍ය වත්කමක් ප්‍රධාන වශයෙන් අත්පත් කරගෙන ඇත්තේ නුදුරු කාලයේදී විකිණීමේ හෝ ප්‍රතිමිලදී ගැනීමේ අරමුණින් හෝ කෙටිකාලීන ලාභාපේක්ෂාවන් එක්ව කළමනාකරණය කරනු ලබන ආයෝජන කළඹක කොටසක් ලෙස රඳවා තබාගෙන ඇති විට හෝ සාධාරණ අගයට වාර්තා කර ඇති විට ඒවා ලාභය/අලාභය මඟින් හඳුනාගනු ලැබූ මූල්‍ය වත්කමක් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ඉදිරි රැකුම් ගිවිසුම් යටතේ ඉදිරි රැකුම් උපකරණ ලෙස නම් නොකරන ලද ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ ද මෙම කාණ්ඩයට ඇතුළත් වේ. ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 – මූල්‍ය උපකරණ අනුව වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට හෝ ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන්නේ නම් හැර මූල්‍ය වත්කම් ලාභය/අලාභය මගින් සාධාරණ අගයට මනිනු ලබයි.

ලාභය/අලාභය හරහා හඳුනාගනු ලබන මූල්‍ය වත්කම්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සාධාරණ අගයට වාර්තා කරනු ලබයි. සාධාරණ අගයෙහි වෙනස්වීම්, වෙළඳාම් කටයුතු වලින් ලද ශුද්ධ ලාභ/අලාභ යටතේ හඳුනාගනු ලබන අතර ගිවිසුම්වල කොන්දේසි ප්‍රකාර හෝ ගෙවීම් සිදු කිරීමේ අයිතිය ස්ථාපිත වූ පොළී ආදායම් හා වියදම් ශුද්ධ පොළී ආදායමෙහි වාර්තා කරයි. ලාභාංශ ආදායම හා උපලබ්ධි ලාභ/අලාභ වෙළඳාම් කටයුතුවලින් ලද ශුද්ධ ලාභ/අලාභ යටතේ වාර්තා කෙරෙයි.

නුදුරු කාලයේදී විකිණීමට ඇති අපේක්ෂාව තව දුරටත් අදාළ වන්නේ දැයි තීරණය කිරීමට සමූහය විසින් ව්‍යුත්පන්නයන් නොවන ලාභය/අලාභය හරහා හඳුනාගත් මූල්‍ය වත්කම් අගයනු ලබයි. සක්‍රීය වෙළෙඳපොළක් නොමැතිවීම හේතුකොට ගෙන මෙම මූල්‍ය වත්කම් වෙළඳාම් කිරීමට අපොහොසත් වනවිට සහ නුදුරු අනාගතයේදී ඒවා විකිණීම සඳහා වන කළමනාකරණ අපේක්ෂාව සැලකිය යුතු ලෙස වෙනස් වී ඇති විට, සමූහයට ඉතා විරල අවස්ථාවන්හිදී පමණක් මෙම මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය සඳහා සලකා බැලිය හැකිය.

| දෙසැම්බර් 31 දිනට | සටහන් | බැංකුව 2025 රු. '000 | බැංකුව 2024 රු. '000 | සමූහය 2025 රු. '000 | සමූහය 2024 රු. '000 |
|---|---|---|---|---|---|
| **සාධාරණ අගයට ගණනය කළ** | | | | | |
| ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත් | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් | | 13,590,420 | 20,141,100 | 30,953,282 | 30,774,770 |
| භාණ්ඩාගාර බැඳුම්කර | | 7,264,662 | 732,949 | 46,368,101 | 15,762,026 |
| හිමිකම් සුරැකුම්පත් | 20 (ආ) | 1,303,683 | 212,732 | 1,303,683 | 212,732 |
| ඒකක භාර | | – | – | – | – |
| **උප එකතුව** | | 22,158,765 | 21,086,781 | 78,625,066 | 46,749,528 |
| **සාධාරණ අගයට ගණනය කළ** | | – | – | – | – |
| **එකතුව** | | 22,158,765 | 21,086,781 | 78,625,066 | 46,749,528 |

### 20. (අ) විශ්ලේෂණය

| දෙසැම්බර් 31 දිනට | බැංකුව 2025 රු. '000 | බැංකුව 2024 රු. '000 | සමූහය 2025 රු. '000 | සමූහය 2024 රු. '000 |
|---|---|---|---|---|
| **සුරැකුම්කරණය තුළින්** | | | | |
| සුරැකුම් ලෙස ගිවිසින ලද | – | – | 53,690,942 | 25,662,748 |
| තබා නොමැත | 22,158,765 | 21,086,781 | 24,934,124 | 21,086,780 |
| **එකතුව** | 22,158,765 | 21,086,781 | 78,625,066 | 46,749,528 |
| **ව්‍යවහාර මුදල් ඒකක වශයෙන්** | | | | |
| ශ්‍රී ලංකා රුපියල් | 22,158,765 | 21,086,781 | 78,625,066 | 46,749,528 |
| ඇමෙරිකානු ඩොලර් | – | – | – | – |
| **එකතුව** | 22,158,765 | 21,086,781 | 78,625,066 | 46,749,528 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 20. ලාභ/අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම් (සම්බන්ධයි)

### 20. (ආ) හිමිකම් සුරැකුම්පත් (නිල ලැයිස්තුගත) – බැංකුව හා සමූහය

| දෙසැම්බර් 31 දිනට | 2025 | | | 2024 | | |
|---|---|---|---|---|---|---|
| | කොටස් ගණන | පිරිවැය රු. '000 | වෙළඳ අගය රු. '000 | කොටස් ගණන | පිරිවැය රු. '000 | වෙළඳ අගය රු. '000 |
| **1. බැංකු ක්ෂේත්‍රය** | | | | | | |
| හැටන් නැෂනල් බැංකුව පීඑල්සී | 65,000 | 22,379 | 25,903 | – | – | – |
| සම්පත් බැංකුව පීඑල්සී | 50,000 | 6,220 | 7,325 | – | – | – |
| සෙලාන් බැංකුව පීඑල්සී (ඡන්දය රහිත) | 85,000 | 5,121 | 6,426 | – | – | – |
| පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී | 7,000,000 | 256,900 | 419,300 | – | – | – |
| **උප එකතුව** | | 290,620 | 458,954 | | – | – |
| **2. ප්‍රාග්ධන භාණ්ඩ ක්ෂේත්‍රය** | | | | | | |
| ඇක්සෙස් ඉන්ජිනියරින් පීඑල්සී | – | – | – | 2,016,000 | 62,271 | 69,552 |
| එයිටිකන් ස්පෙන්ස් පීඑල්සී | 150,000 | 22,618 | 23,437 | – | – | – |
| හේමාස් හෝල්ඩින්ග්ස් පීඑල්සී | 4,000,000 | 121,237 | 138,800 | – | – | – |
| ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පීඑල්සී | 17,084,793 | 383,959 | 370,740 | 5,300,000 | 102,849 | 119,780 |
| සියෙරා කේබල්ස් පීඑල්සී | 99,453 | 1,591 | 3,511 | – | – | – |
| **උප එකතුව** | | 529,405 | 536,488 | | 165,120 | 189,332 |
| **3. පාරිභෝගික සේවා** | | | | | | |
| ජෝන් කීල්ස් හොටෙල්ස් පීඑල්සී | 250,000 | 5,313 | 5,725 | – | – | – |
| **උප එකතුව** | | 5,313 | 5,725 | | – | – |
| **4. කල් පවතින පාරිභෝගික භාණ්ඩ සහ ඇඟලුම්** | | | | | | |
| ටීජේ ලංකා පීඑල්සී | 1,545,082 | 87,354 | 53,923 | – | – | – |
| **උප එකතුව** | | 87,354 | 53,923 | | – | – |
| **5. බලශක්ති** | | | | | | |
| ලංකා අයි.ඕ.සී. පීඑල්සී | 1,241,959 | 173,391 | 160,213 | – | – | – |
| **උප එකතුව** | | 173,391 | 160,213 | | – | – |
| **6. ආහාරපාන හා දුම්කොළ ක්ෂේත්‍රය** | | | | | | |
| සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් පීඑල්සී | 500,000 | 57,500 | 54,500 | – | – | – |
| **උප එකතුව** | | 57,500 | 54,500 | | – | – |
| **7. ද්‍රව්‍ය** | | | | | | |
| ඇලුමෙක්ස් පීඑල්සී | 450,000 | 7,184 | 9,180 | – | – | – |
| **උප එකතුව** | | 7,184 | 9,180 | | – | – |
| **8. විදුලි සංදේශ සේවා ක්ෂේත්‍රය** | | | | | | |
| ඩයලොග් ඇක්සියාටා පීඑල්සී | – | – | – | 2,000,000 | 22,400 | 23,400 |
| **උප එකතුව** | | – | – | | 22,400 | 23,400 |
| **9. උපයෝගිතා** | | | | | | |
| වැලිබල් වන් පීඑල්සී | 250,000 | 21,124 | 24,700 | – | – | – |
| **උප එකතුව** | | 21,124 | 24,700 | | – | – |
| **එකතුව** | | 1,171,891 | 1,303,683 | | 187,520 | 212,732 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 21 ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම්

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ණය හා අත්තිකාරම් අතරට පහත දෑ හැර සක්‍රීය වෙළඳපළක මිල ප්‍රකාශ කර නොමැති ස්ථාවර හෝ නිශ්චය කළහැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් අයත් වේ.

- සමූහය විසින් වහාම හෝ නුදුරු කාලයේදී විකිණීමට අපේක්ෂිත හෝ මූලික හඳුනා ගැනීමේදී ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ දෑ.
- සමූහය විසින් මූලික හඳුනා ගැනීමේදී වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම් ලෙස නම් කල දෑ.

ණය හා අත්තිකාරම් යන්නට බැංකුවලින් හා වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ලැබියයුතු වටිනාකම් අයත් වේ. මූලික ගණනය කිරීම් වලින් අනතුරුව ණය හා අත්තිකාරම්, සඵල පොළී අනුපාතික භාවිත කරමින් අගය අඩුවීම් සඳහා හානිකරණ ප්‍රතිපාදන තබමින් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබයි. ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබන්නේ සඵල පොළී අනුපාතිකයෙහි සංකලිත කොටසක් වන ගාස්තු සහ පිරිවැය හා අත්පත් කර ගැනීමේදී අත්වන කිසියම් වට්ටමක් හෝ අධිමිලක් සැලකිල්ලට ගැනීමෙනි. ආදායම් ප්‍රකාශයේ පොළී ආදායම් යටතට ක්‍රමක්ෂය අන්තර්ගත වේ. හානිකරණය මඟින් උද්ගතවූ අලාභ ආදායම් ප්‍රකාශයෙහි ණය සහ අනෙකුත් අලාභ හානිකරණ යටතේ වාර්තා කරනු ලබයි.

2018 ජනවාරි මස 01 දින සිට පහත සඳහන් කොන්දේසි ද්විත්වයට අදාල වන අවස්ථාවලදී බැංකුව විසින් ණය හා අත්තිකාරම් ක්‍රමක්ෂය පිරිවැයට පමණක් මනිනු ලබයි.

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම පිණිස මූල්‍ය වත්කම් රඳවා ගැනීමේ අරමුණ ඇතිව ව්‍යාපාරික ආකෘතියක් තුළ මූල්‍ය වත්කම් රඳවා ගනු ලබයි.
- මූල්‍ය වත්කම් වල ගිවිසුම්ගත නියමයන් මඟින් ගෙවියයුතු මුල් මුදල මත පොළිය හා මුල් මුදලෙහි පූර්ණ ගෙවීම් සඳහා මූල්‍ය ප්‍රවාහ නිශ්චිත දිනවල ඵළඹේ.

ව්‍යාපාරික ආකෘතියෙහි විස්තර පිටු අංක 314හි දක්වා ඇති සටහන් අංක 2.5.1.4.1 හා 2.5.1.4.2 හි දැක්වේ.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| **දළ ණය හා අත්තිකාරම්** | | | | |
| 1 අදියර | **511,247,181** | 492,507,588 | **511,020,504** | 487,777,387 |
| 2 අදියර | **35,329,565** | 19,128,165 | **35,350,248** | 19,183,611 |
| 3 අදියර | **33,573,810** | 49,677,946 | **34,843,181** | 51,077,085 |
| **දළ ණය හා අත්තිකාරම්** | **580,150,556** | 561,313,699 | **581,213,933** | 558,038,083 |
| **අඩුකළා: පහත පරිදි සමුච්චිත හානිකරණය** | | | | |
| 1 අදියර | **5,118,887** | 4,700,749 | **5,120,508** | 4,703,623 |
| 2 අදියර | **4,543,720** | 2,129,055 | **4,546,322** | 2,133,932 |
| 3 අදියර | **19,659,580** | 22,104,882 | **20,908,043** | 23,485,206 |
| **මුළු හානිකරණය** | **29,322,187** | 28,934,686 | **30,574,873** | 30,322,761 |
| **ශුද්ධ ණය හා අත්තිකාරම්** | **550,828,369** | 532,379,013 | **550,639,060** | 527,715,322 |

2025 වර්ෂය සඳහා ණය හා අත්තිකාරම්වලට රු. මිලියන 56,512 ක් වූ භාණ්ඩාගාර සහතිකය ලත් ණය ඇතුළත් විය. එවැනි ණය සඳහා අදාළ වන LGD අගය 0 වන බැවින් ඒ සඳහා හානිකරණ ප්‍රතිපාදනය ද 0 විය.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 21. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම් (සම්බන්ධයි)

### 21. (අ) නිමැවුම් අනුව විශ්ලේෂණය

| දෙසැම්බර් 31 දිනට | සටහන් | බැංකුව 2025 රු. '000 | බැංකුව 2024 රු. '000 | සමූහය 2025 රු. '000 | සමූහය 2024 රු. '000 |
|---|---|---|---|---|---|
| **නිමැවුම් අනුව** | | | | | |
| වෙළඳ මූල්‍ය | | – | – | – | – |
| කල් බදු කුලී හා ලැබිය යුතු කුලී පිට ගැනුම් | (21ඉ) | – | – | – | 25,911 |
| උකස් | | 155,376,418 | 119,692,775 | 155,376,446 | 119,692,803 |
| සේවක මණ්ඩල ණය | | 17,432,546 | 16,307,926 | 17,708,028 | 16,648,714 |
| කාලීන ණය | | | | | |
| කෙටි කාලීන | | 51,967 | 95,669 | 51,967 | 95,669 |
| දිගු කාලීන | | 356,873,051 | 384,286,416 | 358,207,452 | 385,812,874 |
| වෙනත් | | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | | – | – | – | – |
| රජයට ණය ලබාදීම් | | – | – | – | – |
| ප්‍රතිවිකුනුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත් | | 50,416,574 | 40,930,913 | 49,870,040 | 35,762,112 |
| **දළ එකතුව** | | 580,150,556 | 561,313,699 | 581,213,933 | 558,038,083 |

### 21. (ආ) ව්‍යවහාර මුදල් වශයෙන් විශ්ලේෂණය

| දෙසැම්බර් 31 දිනට | බැංකුව 2025 රු. '000 | බැංකුව 2024 රු. '000 | සමූහය 2025 රු. '000 | සමූහය 2024 රු. '000 |
|---|---|---|---|---|
| **ව්‍යවහාර මුදල් වශයෙන්** | | | | |
| ශ්‍රී ලංකා රුපියල් | 576,475,482 | 557,795,130 | 577,538,859 | 554,519,514 |
| ඇමරිකානු ඩොලර් | 3,675,074 | 3,518,569 | 3,675,074 | 3,518,569 |
| **දළ එකතුව** | 580,150,556 | 561,313,699 | 581,213,933 | 558,038,083 |

### 21. (ඇ) කර්මාන්ත වශයෙන් විශ්ලේෂණය

| දෙසැම්බර් 31 දිනට | බැංකුව 2025 රු. '000 | බැංකුව 2024 රු. '000 | සමූහය 2025 රු. '000 | සමූහය 2024 රු. '000 |
|---|---|---|---|---|
| **කර්මාන්ත වශයෙන්** | | | | |
| කෘෂිකාර්මික සහ ධීවර | 45,843,144 | 36,406,612 | 45,987,191 | 36,572,677 |
| නිෂ්පාදන | – | – | 498,689 | 587,812 |
| සංචාරක | 69,891 | 70,349 | 83,279 | 115,389 |
| ප්‍රවාහන | – | – | 13,764 | 15,415 |
| ඉදිකිරීම්/නිවාස | 206,648,213 | 173,805,328 | 207,059,484 | 174,296,676 |
| වෙළඳාම් | – | – | 361,096 | 391,901 |
| නව ආර්ථිකය | – | – | 1,042 | 27,269 |
| වෙනත් | | | | |
| මූල්‍ය හා ව්‍යාපාරික සේවා | 51,887,293 | 42,893,107 | 51,887,293 | 42,893,107 |
| යටිතල පහසුකම් | 46,315,626 | 53,544,313 | 46,315,626 | 53,544,313 |
| විදුලිබල හා බලශක්ති | 4,009,436 | 4,026,768 | 4,009,436 | 4,026,768 |
| අධ්‍යාපනය | 7,582,137 | 8,764,010 | 7,582,137 | 8,764,010 |
| පුද්ගලික/උකස්/වෙනත් | 217,794,816 | 241,803,212 | 217,414,896 | 236,802,746 |
| **දළ එකතුව** | 580,150,556 | 561,313,699 | 581,213,933 | 558,038,083 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 21. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම් (සම්බන්ධයි)

### 21. (අ) වර්ෂය තුළ හානිකරණයන්ගේ වෙනස්වීම්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

#### කේවල හානිකරණ ඇගයීම

ක්‍රමක්ෂය පිරිවැයට පවතින (බැංකුවලින් අයවිය යුතු මුදල්, ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය හා ලැබිය යුතු දෑ මෙන්ම ක්‍රමක්ෂය පිරිවැය ඇති මූල්‍ය වත්කම් - ණය සහ වෙනත් උපකරණ) මූල්‍ය වත්කම් සම්බන්ධයෙන්, වෙන් වෙන්ව ගත්විට හෝ සාමූහිකව ගත්විට සැලකිය යුතු මූල්‍ය වත්කම්වල හානිකරණය පිළිබඳ හෝ වෙන් වෙන්ව ගත්විට සැලකිය යුතු නොවන මූල්‍ය වත්කම් වල හානිකරණය පිළිබඳ විෂයය මූලික සාක්ෂි ඇත්දැයි සමූහය විසින් පළමුව ඇගයීමක් සිදුකරනු ලබයි. වෙන් වෙන්ව ඇගයීමක් සිදුකරන ලද මූල්‍ය වත්කම්වල හානිකරණය සම්බන්ධයෙන් විෂය මූලික සාක්ෂි නොමැති බවට සමූහය තීරණය කරන්නේ නම් එකී වත්කම් සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් කණ්ඩායමකට ඇතුලත් කර, ඒ සියල්ලම හානිකරණය පිළිබඳ සාමූහික ඇගයීමකට ලක් කරයි.

වෙන් වෙන් වශයෙන් හානිකරණය සම්බන්ධව කළ ඇගයීමේදී හානිකරණය පිළිබඳ අගය අඩුවීම් ඇති බවට හෝ දිගටම පවතින බවට හඳුනා ගන්නා මූල්‍ය වත්කම් මෙකී සාමූහික ඇගයීමට යොදා නොගනී.

හානිකරණයක් සිදුවී ඇති බවට විෂය මූලික සාක්ෂි ඇත්නම්, වත්කමෙහි ධාරණ අගය සහ තක්සේරු කළ අනාගත මූල්‍ය ප්‍රවාහයෙහි වත්මන් අගය (දැනට ඇති නොවුණු අනාගතයේදී ඇති විය හැකි බවට අපේක්ෂිත ණය පාඩු හැරුණු කොට) අතර වෙනස අනුව එකී අලාභය මනිනු ලබයි. වත්කමෙහි ධාරණ අගය ගැලපීම හානිකරණ ප්‍රතිපාදන ගිණුමක් මගින් අඩු කරනු ලබන අතර, ආදායම් ප්‍රකාශයෙහි එම අලාභය වාර්තා කරනු ලබයි. හානිකරණය වන්නා වූ අලාභ ගණනය කිරීමේ අරමුණ සඳහා අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමට යොදාගත් පොළී අනුපාතය භාවිතා කරමින් වත්කමෙහි අඩුකළ ධාරණ අගය මත පොළී ආදායම නොකඩවා උපචිත කිරීම සිදු කරයි. පොළී සහ සමාන ආදායම්හි, කොටසක් ලෙස පොළී ආදායම වාර්තා කෙරෙයි.

ඇස්තමේන්තු කරන ලද අනාගත මූල්‍ය ප්‍රවාහයන්හි වත්මන් අගය මූල්‍ය වත්කමෙහි මුල් සඵල පොළී අනුපාත මත වට්ටම් කරනු ලබයි. යම් ණය මුදලක පොළී අනුපාතය විචල්‍ය නම්, හානිකරණ අගය ගණනය කිරීම සඳහා වත්මන් සඵල පොළී අනුපාතය යොදා ගනී. සමූහය විසින් ගනුදෙනු කළ හැකි වත්කම්, ණය හා ලැබිය යුතු දෑ ලෙස නැවත වර්ගීකරණය කර ඇත්නම් හානිකරණ අලාභ ගණනය කිරීම සඳහා යොදා ගන්නේ යළි වර්ගීකරණ දිනයේදී තීරණය කරනු ලබන නව සඵල පොළී අනුපාතයයි. සුරැකුම් වශයෙන් තබන ලද මූල්‍ය වත්කම්වල ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහ වර්තමාන වටිනාකමට ගණනය කිරීමේදී එම උකස් තබන ලද දේපළ විකිණීමට හැකි හෝ නොහැකි වුවද, අදාළ මුදල් ප්‍රවාහයෙන් තීරණය වන්නේ එම සුරැකුම් ලබාගැනීමේ හා විකිණීමේ පිරිවැය අඩුකළ වටිනාකමය.

අනාගතයේදී යළි අයකර ගතහැකි බවට යථාර්තවාදී අදහසක් නොමැතිවිට සහ සියලු සුරක්ෂිතයන් උපලබ්ධි වී ඇති විට හෝ සමූහයට මාරුකර ඇති විට ණය ඊට අනුබද්ධ ගැලපීම් මඟින් ලියා හැරීම සිදුකරනු ලැබේ. පසුකාලීන වර්ෂයකදී හානිකරණය සඳහා අදාළ ගැලපීම් සිදුකිරීමෙන් පසු සිදුවූ සිද්ධියක් නිසා තක්සේරු කරන ලද හානිකරණ අලාභය ඉහළ යාමක් හෝ පහළ යාමක් සිදුවුවහොත් ගැලපුම් ගිණුම ගලපා මීට පෙර හඳුනාගත් හානිකරණ පාඩුව වැඩිකිරීම හෝ අඩුකිරීම සිදු කරනු ලබයි. අනාගතයේදී, ලියාහරින ලද හානිකරණයන් අය කර ගනු ලැබුවහොත් එය වෙනත් මෙහෙයුම් ආදායමට බැර කරනු ලබයි.

#### සාමූහික හානිකරණ ඇගයීම

තනි තනිව තක්සේරු කරන ලද මූල්‍ය වත්කම් සඳහා හානිකරණය පිළිබඳ සාක්ෂි නොමැති බව සමූහය තීරණය කරන්නේ නම්, එය සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් සමූහයක වත්කම් ඇතුලත් වන අතර ඒවා සාමූහික හානිපූරණය සඳහා තක්සේරු කරයි.

දුර්වලතා සඳහා සාමූහිකව තක්සේරු කරන ලද මූල්‍ය වත්කම් සමූහයක් මත ආනාගත මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීමේදී සමූහයේ ඒවාට සමාන ණය අවදානම් ලක්ෂණ සහිත වත්කම් සඳහා අපේක්ෂිත අලාභ අත්දැකීම් පදනම් වේ., අපේක්ෂිත අලාභ අත්දැකීම වර්තමාන නිරීක්ෂණ දත්ත මත පදනම්ව සකස් කරනු ලබන්නේ වත්මන් තත්වයන්ගේ බලපෑම පිළිඹිබු කිරීම සඳහා ඓතිහාසික අලාභ අත්දැකීම් පදනම් වී ඇති අතර ඓතිහාසික කාලපරිච්ඡේදයේ නොපවතින තත්වයන්ගේ බලපෑම ඉවත් කිරීම සඳහාය. අනාගත මූල්‍ය ප්‍රවාහයන්හි තක්සේරු කළ වෙනස්වීම්, වසරින් වසර නිරීක්ෂණය කළ හැකි අන්තවලට, සම්බන්ධ වෙනස්වීම් (විරැකියා අනුපාත, දේපළ මිල, පාරිභෝගික භාණ්ඩ මිල, ගෙවීමේ තත්ත්වයන් හෝ කාණ්ඩයට ඇති වූ අලාභ හා ඒවායේ ප්‍රමාණය දක්වන වෙනත් කරුණු ආදියේ වෙනස්වීම්) පිළිබිඹු කරයි. තක්සේරු කරන ලද අලාභ හා සත්‍ය අලාභ අත්දැකීම් අතර වෙනස්කම් අවම කිරීම සඳහා අනාගත මූල්‍ය ප්‍රවාහ තක්සේරු කිරීම සඳහා යොදගනු ලබන ක්‍රමවේද හා උපකල්පන නිරතුරුව සමාලෝචනය කෙරෙයි.

#### ණය හා ලැබියයුතු දෑ කපා හැරීම

ශ්‍රී ල.ගි.ප්‍ර. 39 යටතේ වූ බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 යටතේද එලෙසම පවතී. අයකරවා ගැනීමට හැකි සෑම පියවරක්ම ගෙන අවසන් වූ පසුව සහ ආපසු ණය අයකර ගැනීමේ යථාර්ථවාදී පසුබිමක් නොමැති අවස්ථාවලදී සාමාන්‍යයෙන් මුළුමනින්ම හෝ අර්ධ වශයෙන් ණය කපා හරිනු ලැබේ. ණය සඳහා සුරැකුම් ඇති විට සාමාන්‍යයෙන් සුරැකුම් උපලබ්ධියෙන් මුදල් ලැබීමෙන් පසු කරනු ලැබේ. කපා හැරිය යුතු දීමනාව සමුච්චිත අලාභ දීමනාවට වඩා වැඩිවන අවස්ථාවකදී එකී වෙනස, දීමනාවට එක් විය යුතු එකතුවක් ලෙස පළමුව සලකනු ලබන අතර, අනතුරුව දළ ධාරණ අගයට එරෙහිව යොදාගනු ලැබේ. කපාහැරීමක් පසුව හඳුනාගත හොත් එය වෙනත් මෙහෙයුම් ආදායමට බැර කෙරෙයි.

#### සුරැකුම් තක්සේරුකරණය

මූල්‍ය වත්කම්වල අවදානම අවම කර ගැනීම පිණිස සමූහය විසින් හැකි අවස්ථාවලදී සුරැකුම් උපයෝගී කරගනු ලබයි. මුදල්, රත්රන්, රාජ්‍ය සුරැකුම්පත් යනාදී විවිධ ස්වරූපයෙන් සුරැකුම් පවතියි. මෙලෙස සුරැකුම් ලෙස රඳවාගනු ලබන මූල්‍ය වත්කම් ආගණනය කිරීම සඳහා බැංකුව විසින් හැකිතාක් දුරට සක්‍රීය වෙළඳපළ දත්ත උපයෝගී කර ගනු ලබයි.

හානිකරණ ප්‍රතිපත්ති පිළිබඳ විස්තර පිටු අංක 317 හි සටහන් අංක 2.5.2 මගින් දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 21. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම් (සම්බන්ධයි)

### 21. (ඇ) වර්ෂය තුළ හානිකරණයන්ගේ වෙනස්වීම් (සම්බන්ධයි)

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| **අදියර 1** | | | | |
| ජනවාරි 01 දිනට ශේෂය | 4,700,749 | 4,426,656 | 4,703,623 | 4,435,168 |
| ආදායම් ප්‍රකාශයට ගැලපීම/(ආපසු ගැලපීම) | 418,138 | 274,093 | 416,885 | 268,455 |
| වර්ෂය තුළ කපාහැරීම් | – | – | – | – |
| වෙනත් සංචලන | – | – | – | – |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | 5,118,887 | 4,700,749 | 5,120,508 | 4,703,623 |
| **අදියර 2** | | | | |
| ජනවාරි 01 දිනට ශේෂය | 2,129,055 | 3,501,809 | 2,133,932 | 3,525,267 |
| ආදායම් ප්‍රකාශයට ගැලපීම/(ආපසු ගැලපීම) | 2,414,665 | (1,372,754) | 2,412,390 | (1,391,335) |
| වර්ෂය තුළ කපාහැරීම් | – | – | – | – |
| වෙනත් සංචලන | – | – | – | – |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | 4,543,720 | 2,129,055 | 4,546,322 | 2,133,932 |
| **අදියර 3** | | | | |
| ජනවාරි 01 දිනට ශේෂය | 22,104,882 | 14,448,907 | 23,485,206 | 15,826,569 |
| ආදායම් ප්‍රකාශයට ගැලපීම/(ආපසු ගැලපීම) | (2,387,428) | 7,698,282 | (2,449,291) | 7,710,325 |
| වර්ෂය තුළ කපාහැරීම් | (57,874) | (42,307) | (103,731) | (42,307) |
| වෙනත් සංචලන | – | – | (24,141) | (9,381) |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | 19,659,580 | 22,104,882 | 20,908,043 | 23,485,206 |
| **දෙසැම්බර් 31 දිනට මුළු හානිකරණ ප්‍රතිපාදන** | 29,322,187 | 28,934,686 | 30,574,873 | 30,322,761 |

### 21. (ඉ) ලැබිය යුතු කල්බදු හා කුලී පිට ගැණුම්

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| ලැබිය යුතු දළ කල්බදු හා කුලී පිට ගැණුම් | – | – | – | 26,570 |
| නොපියවූ පොලී වත්කම් | – | – | – | 6,592 |
| නොපියවූ පොලී වගකීම් | – | – | – | (7,251) |
| **ශුද්ධ ලැබිය යුතු කල්බදු හා කුලී පිට ගැණුම්** | – | – | – | 25,911 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 21. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම් (සම්බන්ධයි)

### 21. (ඊ) ඉදිරි දැක්මැති තොරතුරු

ණය කළඹට අදාළ ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන් තීරණය කිරීම සඳහාත්, යම්කිසි කාල පරාසයක් තුළ පවතින පරාමිතීන් තීරණය කිරීම සඳහා ඉදිරි දැක්මැති තොරතුරු ගැලපිය යුතු ප්‍රමාණය තීරණය කිරීමේදී සැලකිය යුතු විනිශ්චයන් කළයුතු වේ. කාල පරාසයක් තුළ පවතින පැහැර හැරීමේ සම්භාවිතාවය (PD) හැරීමකදී සිදුවිය හැකි පාඩුව (LGD) යම්කිසි අවස්ථාවක පවතින පරාමිතීන් බවට පරිවර්තනය කිරීම සඳහා භාවිතා කරන ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන්ගේ වෙනස්වීම එක්තරා කාලපරාසයකදී අපේක්ෂිත ණය පාඩු දීමනා වැඩිකිරීමට හෝ අඩු කිරීමට හේතු විය හැකි අතර ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන් ණය සිතියම්ගත කිරීමෙහි වෙනස්කම් කලාතුරකින් අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, අපගේ අනාවැකි කාර්තුමය පදනමින් යාවත්කාලීන වන බැවින් කිසියම් නිශ්චිත අවස්ථාවක පවතින පරාමිතීන් ගණනය කිරීම සඳහා භාවිතා කරන විශේෂිත ඉදිරි දැක්මැති තොරතුරු පරාමිතීන්හි වෙනස්කම් නිතර සිදු කෙරේ. ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන්හි අශුභවාදී මට්ටමේ වැඩිවීම අපේක්ෂිත ණය පාඩු වැඩි කිරීමට හේතු වන අතර ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන්හි සුභවාදී වෙන්වීම් පාඩුවෙහි අඩුවීමට හේතු වේ. මෙම වැඩිවීම් හා අපේක්ෂිත ණය අඩුවීම් කිසියම් විශේෂිත කාල පරිච්ඡේදයක් තුළ සැලකිය යුතු විය හැකි අතර අනාගතය පිළිබඳඅපගේ දැක්ම වෙනස් වන කාල පරිච්ඡේදයේදී එය සිදුවීමට පටන් ගනී.

ප්‍රධාන ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන්ට දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය, විරැකියා අනුපාතය, උද්ධමන අනුපාතය, විනිමය අනුපාතය, පොලී අනුපාතය ඇතුළත් වේ. අපගේ ණය කළඹේ බහුතරයක් සඳහා ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන් පිළිබඳ පුරෝකථනයන් ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී අපගේ කළමනාකාරිත්වය විසින් අභ්‍යන්තර සැලසුම් සහ පුරෝකථනයන් සඳහා යොදාගනු ලබන මූලික සිද්ධි සහ ඇතිවීමේ වැඩි සම්භාවිතාවයක් ඇති සිද්ධි යොදා ගනේ. මූලික සිද්ධි සැකසීමේදී, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ජාත්‍යන්තර සංවිධාන සහ ශ්‍රී ලංකා මහ බැංකුව වැනි මූල්‍ය බලධාරීන්ගේ මෙන්ම පෞද්ගලික අංශයේ සලකා බලන්නෙමු. ඇති විය හැකි මූලික සිද්ධි තත්ත්වයට ඉහළින් සහ පහළින් ඇති බාහිර පුරෝකථනයන් සහ කළමනාකරණ විනිශ්චයන් යොදා ගනිමින් වාසිදායක සිද්ධි තත්ත්වය සහ අවාසිදායක සිද්ධි තත්ත්වයන්ට අදාළව සම්භාවිතාවය බර තැබීම සඳහා අප විසින් කළමනාකරණ විනිශ්චයන් යොදා ගනේ. ඉදිරි දැක්මැති තොරතුරු පිළිබඳ අපගේ අපේක්ෂාව සුබවාදී නොවීම සිදුවිය හැකි අවාසි සිද්ධි තත්ත්වයේ සම්භාවිතාවය වැඩිවීමක් හෝ වාසිදායක සිද්ධි තත්ත්වයේ සම්භාවිතාවය අඩුවීම ඇස්තමේන්තුගත අපේක්ෂිත ණය පාඩු දීමනාව වැඩි කරයි.

ඊට හාත්පසින්ම වෙනස්ව, පුරෝකථනය කරන ලද ඉදිරි දැක්ම තොරතුරු පිළිබඳ අපගේ දෘෂ්ටියේ වැඩි දියුණුවක්, වාසිදායක සිද්ධි තත්ත්වයේ සම්භාවිතාවය වැඩිවීමක් හෝ අවාසිදායක සිද්ධි තත්ත්වයේ සම්භාවිතාවය අඩුවීමක් ප්‍රතිවිරුද්ධ බලපෑමක් ඇති කරයි. විචල්‍යයන්ගේ අන්තර් සම්බන්ධතාවය, යම් සිද්ධියකට ආවේණික වූ අශුභවාදී මට්ටම සහ එය සම්භාවිතාවයේ අන්තර් සම්බන්ධතාවය හේතුවෙන්, යම් සිද්ධියකට අදාළව පවතින විවිධ ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන්ගේ වෙනස්වීමේ බලපෑම අර්ථවත් ලෙස වෙන් වෙන්ව ගත නොහැක. අපගේ පුරෝකථන මඟින් ආර්ථික අර්බුදයේ බලපෑම පිළිබඳ බොහෝ උපකල්පන සහ අවිනිශ්චිතතාවයන් පිළිබිඹු වන බැවින් ආර්ථික අර්බුදයට අදාළව ඉදිරි දැක්මැති තොරතුරු පුරෝකථනය කිරීමට සහ එම තත්ත්වයන්ට අදාළව බර තැබීම් තීරණය කිරීම සඳහා ක්ෂේත්‍ර ගණනාවකට අදාළව විනිශ්චයන් ඉහළ නැංවීමට සිදුවිය. අපගේ අපේක්ෂිත ණය අලාභය තක්සේරු කිරීම සඳහා භාවිතා කරන තොරාගත් ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන් සඳහා මූලික සිද්ධි තත්ත්වය, වාසිදායක සිද්ධි තත්ත්වය සහ අවාසිදායක සිද්ධි තත්ත්වයන්ට අදාළ අවස්ථා පිළිබඳ පුරෝකථනයන් පහත වගුව මඟින් සපයයි.

### අවස්ථා සම්භාවිතා බර තැබීම (බැංකුව)

| දෙසැම්බර් 31 දිනට | 2025 % | 2024 % |
|---|---|---|
| මූලික සිද්ධි | 10 | 20 |
| වාසිදායක සිද්ධි තත්ත්වය | 10 | 5 |
| අවාසිදායක සිද්ධි තත්ත්වය | 80 | 75 |

### කළමනාකරණ ආවරණ භාවිතය

අපේක්ෂිත ණය අලාභ දීමනා ඇස්තමේන්තු සඳහා කළමනාකරණ ආවරණ යනු අපගේ පවත්නා යෙදවුම්, උපකල්පන සහ ආකෘති ශිල්පීය ක්‍රම අදාළ සියලු අවදානම් සාධක ග්‍රහණය කර නොගන්නා බවට අප විනිශ්චය කරන අවස්ථාවන්හිදී භාවිතා කරන ගැලපුම් වේ.

නව සාර්ව ආර්ථික, ක්ෂුද්‍ර ආර්ථික හෝ දේශපාලන සිදුවීම්වල මතුවීම්, අපගේ වර්තමාන පරාමිතීන් තුළ ඇතුළත් නොවන පරාමිතීන්, ආකෘති හෝ දත්තවල අපේක්ෂිත වෙනස්කම්, අභ්‍යන්තර අවදානම් ඇගයීම් සංක්‍රමණ හෝ ඉදිරි දැක්මැති තොරතුරු එවැනි තත්ත්වයන්ට උදාහරණ වේ.

සියලුම ආයතනික සේවාදායකයින් ඔවුන්ගේ අතීත ගෙවීම් රටා, ඔවුන්ගේ අංශයට හා භූගෝලීය ප්‍රදේශයට ආර්ථික අර්බුදය බලපෑම, ක්ෂේත්‍රයේ අපේක්ෂිත ප්‍රකෘතිය, ආයතනයේ මූල්‍ය ශක්තිය, රජයේ සහ මහ බැංකු සහාය සහ වෙනත් සාධක මත පදනම්ව තනි තනිව ඇගයීමට ලක් කරන ලදී. අපගේ තක්සේරුව මත පදනම්ව සමහර ණය ගැනියන් පළමු අදියර සිට දෙවන අදියර දක්වා (SICR) ගෙන ගිය අතර සමහර ණය ගැනියන් ඔවුන්ගේ අතීත ගෙවීම් තත්ත්වය නොතකා දෙවන අදියර සිට තුන්වන අදියර දක්වා (අපේක්ෂිත මුදල් ප්‍රවාහ දුර්වලතා හේතුවෙන්) ගෙන යන ලදී.

තනි ණය ගැනුම්කරුවන් සඳහා කළඹ මට්ටමේ හානිකරණ තක්සේරු කිරීම් සිදු කරන ලදී. කෙසේ වෙතත්, සමහර අවස්ථාවලදී, දිගුකාලීන ණය සහන හෝ කල් දැමීම පිළිබඳ පාරිභෝගික ඉල්ලීමෙහි සාධාරණත්වය තක්සේරු කිරීමට කළමනාකරණ විනිශ්චය භාවිත කරන ලදී. ණය ගැනුම්කරුවන්ට ඔවුන්ගේ අංශය සහ කළමනාකරණ විනිශ්චය මත පදනම්ව අදියර අතර වෙන් කරන ලදී. අපගේ තක්සේරුව මත පදනම්ව සමහර ණයගැනියන් පළමු අදියර සිට දෙවන අදියර දක්වා (SICR) ගෙනගිය අතර සමහර ණය ගැනියන් ඔවුන්ගේ අතීත ගෙවීම් තත්ත්වය නොතකා දෙවන අදියර සිට තුන්වන අදියර දක්වා (අපේක්ෂිත මුදල් ප්‍රවාහ දුර්වලතා හේතුවෙන්) ගෙන යන ලදී.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 21. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම් (සම්බන්ධයි)

### 21. (ඊ) ඉදිරි දැක්මැති තොරතුරු (සම්බන්ධයි)

**කළමනාකරණ ආවරණ මගින් අපේක්ෂිත ණය පාඩු සඳහා වන බලපෑම**

ණය සහ අත්තිකාරම් අදියර 1 න් අදියර 2 ට සංචලනය

අදියර 1 යටතේ මූලිකව සමූහගත වූ තෝරාගත් අංශවල සිල්ලර ණය හා අත්තිකාරම් අදියර 2 වෙත මාරු විය. ප්‍රතිඵලයක් ලෙස 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදියර 1 සිට අදියර 2 දක්වා ණය සහ අත්තිකාරම් රු. මිලියන 17,755.5 මාරුවූ අතර හානිකරණ ප්‍රතිපාදන රු. මිලියන 1,899.3 කින් ඉහළ යන ලදී.

| | අදියර 1<br>රු. '000 | අදියර 2<br>රු. '000 | ශුද්ධ බලපෑම<br>රු. '000 |
|---|---|---|---|
| නිරාවරණය | (17,755,497) | 17,755,497 | – |
| හානිකරණ වෙන්කිරීම් | (258,885) | 2,158,144 | 1,899,260 |

ණය සහ අත්තිකාරම් අදියර 2 න් අදියර 3 ට සංචලනය

අදියර 2 යටතේ මූලිකව සමූහගත වූ තෝරාගත් අංශවල සිල්ලර ණය හා අත්තිකාරම් අදියර 3 වෙත මාරු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට ණය සහ අත්තිකාරම් රු. මිලියන 1,092.5 අදියර 2 සිට අදියර 3 දක්වා ගෙන යන ලද අතර හානිකරණ ප්‍රතිපාදන රු. මිලියන 241.6 කින් ඉහළ යන ලදී.

| | අදියර 2<br>රු. '000 | අදියර 3<br>රු. '000 | ශුද්ධ බලපෑම<br>රු. '000 |
|---|---|---|---|
| නිරාවරණය | (1,092,493) | 1,092,493 | – |
| හානිකරණ වෙන්කිරීම් | (181,409) | 423,013 | 241,604 |

**ස්වාභාවික හා පාරිසරික අවදානම් සඳහා කළමණාකරණ ආවරණ තුළින් අපේක්ෂා ණය අලාභයට වන බලපෑම**

2025 නොවැම්බර් මාසයේ ඇති වූ දිට්වා සුළි කුණාටුව සහ ගංවතුර ව්‍යසනය හේතුවෙන් ඇති විය හැකි බලපෑම් සැලකිල්ලට ගනිමින් වත්මන් මූල්‍ය වර්ෂය සඳහා රුපියල් බිලියන 2.58 ක අතිරේක හානිකරණ ප්‍රතිපාදනයක් බැංකුව විසින් හඳුනාගෙන ඇත. වාර්තා කරන දිනට සත්‍ය බලපෑමේ ප්‍රමාණය සම්පූර්ණයෙන්ම නිශ්චය කළ නොහැකි බැවින්, අතිරේක හානිකරණ දීමනාව සඳහා අවශ්‍යතාවය තක්සේරු කිරීමේදී බැංකුව කළමනාකරණ විනිශ්චය ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව, වත්මන් මූල්‍ය වර්ෂය සඳහා අතිරේක ප්‍රතිපාදන අවශ්‍යතාවය ඇස්තමේන්තු කිරීම සඳහා හානිකරණ ආකෘතියේ කළමනාකරණ ආවරණයක් තීරණය කිරීමේදී හුගෝලීය සාන්ද්‍රණය සහ ඒ ආශ්‍රිත සාධක සලකා බලා ඇත.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 22 ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් – ණය හා වෙනත් උපකරණ

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

සමූහයට කල්පිරීම තෙක් රඳවා ගැනීමට අදහස් කරන හා හැකියාව තිබෙන ක්‍රමක්ෂය පිරිවැය – ණය ගණනය කරන මූල්‍ය වත්කම් හා වෙනත් උපකරණයි. නිශ්චිත කල්පිරීම් සීමා හා නිශ්චිතව තීරණය කළ හැකි ගෙවීම් සීමා සමඟ ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් මූලික මිනීමෙන් අනතුරුව ක්‍රමක්ෂය පිරිවැය – ණය ගණනය කරන මූල්‍ය වත්කම් හා වෙනත් උපකරණ, සඵල පොළී අනුපාතික යොදා ගනිමින් හානිකරණය අඩුකර ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබයි. සඵල පොළී අනුපාතිකයෙහි අත්‍යන්ත කොටසක් වන අත්පත් කර ගැනීමෙහිලා අදාළ වාරික සහ ගාස්තු හෝ වට්ටම් සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබයි. ආදායම් ප්‍රකාශයෙහි, පොළී හා සමාන ආදායම් හි ක්‍රමක්ෂය ඇතුළත් වේ. එවන් ආයෝජන වලින් පැන නගින හානිකරණය ආදායම් ප්‍රකාශයෙහි හානිකරණ ගාස්තු යටතේ හඳුනා ගැනෙයි.

| | | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | සටහන් | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත් | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් | | 136,974,101 | 143,755,805 | 136,974,101 | 146,718,039 |
| භාණ්ඩාගාර බැඳුම්කර | | 848,392,929 | 760,751,681 | 850,901,217 | 767,251,459 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | | – | – | – | – |
| ප්‍රති විකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත් | | – | – | 375,208 | – |
| ණයකර (භාණ්ඩාගාර ඇපකර) | | 77,509,137 | 125,964,603 | 77,509,137 | 125,964,603 |
| ආයතනික ණය උපකරණ | 22.1 | 2,867,364 | 2,739,086 | 3,336,726 | 3,208,422 |
| භාර සහතිකපත් | 22.2 | 27,254,591 | 5,827,302 | 27,254,591 | 5,827,302 |
| වාණිජ පත්‍රිකා | | – | – | 6,000 | 6,000 |
| වෙනත් ආයෝජන | | – | – | 165,595 | 165,595 |
| **දළ එකතුව** | | 1,092,998,122 | 1,039,038,477 | 1,096,522,575 | 1,049,141,420 |
| අපේක්ෂිත ණය පාඩු හානිකරණය | | (8,208) | (3,905) | (179,952) | (175,651) |
| **ශුද්ධ එකතුව** | | 1,092,989,914 | 1,039,034,572 | 1,096,342,623 | 1,048,965,769 |

*2024 වර්ෂයේදී රු. මිලියන 26,491.4 ක් වූ භාණ්ඩාගාර සහතිකය ලත් ණයකර 3 වන අදියරට වර්ගීකරණය කර ඇති නමුත් අදාළ වන LGD අගය 0 බැවින් හානිකරණ ප්‍රතිපාදන 0 වී ඇත. 2025 වර්ෂයේද එය එලෙසම වර්ගීකරණය කර ඇත.

### 22.1 ආයතනික ණය උපකරණ – බැංකුව

| | බැංකුව | | | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 ණයකර ගණන** | **2025 ධාරණ අගය රු. '000** | 2024 ණයකර ගණන | 2024 ධාරණ අගය රු. '000 |
| අලියාන්ස් ෆිනෑන්ස් කම්පැනි පිඑල්සී | 2,250,000 | 233,660 | – | – |
| ඇසෙට්ලයින් ෆිනෑන්ස් ලිමිටඩ් | 7,500,000 | 753,842 | – | – |
| ලංකා බැංකුව | – | – | 5,000,000 | 520,527 |
| කොමර්ෂල් බැංකුව පිඑල්සී | – | – | 2,105,800 | 224,305 |
| කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පිඑල්සී | 1,000,000 | 107,422 | 1,000,000 | 107,402 |
| ෆස්ට් කැපිටල් ට්‍රේෂරීස් පිඑල්සී | 3,991,300 | 407,673 | – | – |
| එල්.ඕ.එල්.සී. ෆිනෑන්ස් පීඑල්සී | – | – | 7,500,000 | 775,615 |
| නේෂන් ට්‍රස්ට් බැංකුව පිඑල්සී | 3,212,800 | 335,336 | 3,212,800 | 335,375 |
| පීපල්ස් ලීසිං පිඑල්සී | 2,064,900 | 214,005 | 2,064,900 | 214,005 |
| රේසස් බලශක්ති පීඑල්සී | 2,500,000 | 256,503 | 2,500,000 | 257,386 |
| සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් පිඑල්සී | 2,500,000 | 256,247 | – | – |
| සෙලාන් බැංකුව පීඑල්සී | 962,500 | 98,357 | – | – |
| සියපත ෆිනෑන්ස් පිඑල්සී | 1,929,300 | 204,319 | – | – |
| වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී | – | – | 3,000,000 | 304,471 |
| **ශුද්ධ එකතුව** | | 2,867,364 | | 2,739,086 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 22. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් – ණය හා වෙනත් උපකරණ (සම්බන්ධයි)

### 22.1 ආයතනික ණය උපකරණ - සමූහය

| | සමූහය | | | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 ණයකර ගණන** | **2025 ධාරණ අගය රු. '000** | 2024 ණයකර ගණන | 2024 ධාරණ අගය රු. '000 |
| අලියාන්ස් ෆිනෑන්ස් කම්පැනි පිඑල්සී | 2,250,000 | 233,660 | – | – |
| ඇසෙට්ලයින් ෆිනෑන්ස් ලිමිටඩ් | 7,500,000 | 753,842 | – | – |
| ලංකා බැංකුව | – | – | 5,000,000 | 520,527 |
| කොමර්ෂල් බැංකුව පීඑල්සී | – | – | 2,105,800 | 224,305 |
| කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | 1,000,000 | 107,422 | 1,000,000 | 107,402 |
| ෆස්ට් කැපිටල් ට්‍රේෂරීස් පිඑල්සී | 3,991,300 | 407,673 | – | – |
| එල්.ඕ.එල්.සී. ෆිනෑන්ස් පීඑල්සී | – | – | 7,500,000 | 775,615 |
| නේෂන් ට්‍රස්ට් බැංකුව පීඑල්සී | 3,212,800 | 335,336 | 3,212,800 | 335,375 |
| පීපල්ස් ලීසිං පීඑල්සී | 4,633,600 | 480,402 | 4,633,600 | 480,376 |
| රේසස් බලශක්ති පීඑල්සී | 2,500,000 | 256,503 | 2,500,000 | 257,386 |
| සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් පිඑල්සී | 2,500,000 | 256,247 | – | – |
| සෙලාන් බැංකුව පීඑල්සී | 1,962,500 | 205,409 | 1,000,000 | 107,052 |
| සියපත ෆිනෑන්ස් පිඑල්සී | 2,858,800 | 300,232 | 929,500 | 95,913 |
| වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී | – | – | 3,000,000 | 304,471 |
| **ඉදිරි එකතුව** | | 3,336,726 | | 3,208,422 |

### 22.2 භාර සහතිකපත්

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 ධාරණ අගය රු. '000** | **2025 ධාරණ අගය රු. '000** | 2024 ධාරණ අගය රු. '000 | 2024 ධාරණ අගය රු. '000 |
| සිබිසි ෆිනෑන්ස් ලිමිටඩ් | 253,502 | – | 253,502 | – |
| සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පිඑල්සී | 518,473 | – | 518,473 | – |
| එල්බී ෆිනෑන්ස් පිඑල්සී | 6,500,061 | 1,566,394 | 6,500,061 | 1,566,394 |
| එල්.ඕ.එල්.සී. ෆිනෑන්ස් පීඑල්සී | 5,046,841 | – | 5,046,841 | – |
| මහින්ද අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ් | 593,475 | – | 593,475 | – |
| ඔරියන්ට් ෆිනෑන්ස් පිඑල්සී | 168,173 | – | 168,173 | – |
| සිංගර් ෆිනෑන්ස් ලංකා පිඑල්සී | 4,585,358 | 255,383 | 4,585,358 | 255,383 |
| වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී | 5,045,316 | – | 5,045,316 | – |
| වින්ඩ්ස්කේප් මැනර් ප්‍රයිවට් ලිමිටඩ් | 4,543,392 | 4,005,525 | 4,543,392 | 4,005,525 |
| **ඉදිරි එකතුව** | 27,254,591 | 5,827,302 | 27,254,591 | 5,827,302 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 22. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් – ණය හා වෙනත් උපකරණ (සම්බන්ධයි)

### 22.3 විශ්ලේෂණය

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| **සුරැකුම්කරණය මගින්** | | | | |
| සුරැකුම් ලෙස ගිවිසින ලද | 42,004,794 | 40,408,287 | 44,800,297 | 47,367,819 |
| තබා නොමැති | 1,050,993,328 | 998,630,190 | 1,051,722,278 | 1,001,773,601 |
| **දළ එකතුව** | 1,092,998,122 | 1,039,038,477 | 1,096,522,575 | 1,049,141,420 |
| **ව්‍යවහාර ඒකක අනුව** | | | | |
| ශ්‍රී ලංකා රුපියල් | 1,092,998,122 | 1,039,038,477 | 1,096,522,575 | 1,049,141,420 |
| ඇමෙරිකානු ඩොලර් | – | – | – | – |
| **දළ එකතුව** | 1,092,998,122 | 1,039,038,477 | 1,096,522,575 | 1,049,141,420 |

### 22.4 වර්ෂය තුළ හානිකරණ සංචලන

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| **අදියර 1** | | | | |
| ජනවාරි 01 දිනට ශේෂය | 3,905 | 645 | 4,056 | 839 |
| ආදායම් ප්‍රකාශයට ගැලපීම්/(ආපසු ගැලපීම්) | 4,303 | 3,260 | 4,301 | 3,217 |
| වර්ෂය තුළ කපාහැරීම් | – | – | – | – |
| වෙනත් සංචලන | – | – | – | – |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | 8,208 | 3,905 | 8,357 | 4,056 |
| **අදියර 2** | | | | |
| ජනවාරි 01 දිනට ශේෂය | – | – | – | – |
| ආදායම් ප්‍රකාශයට ගැලපීම්/(ආපසු ගැලපීම්) | – | – | – | – |
| වර්ෂය තුළ කපාහැරීම් | – | – | – | – |
| වෙනත් සංචලන | – | – | – | – |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | – | – | – | – |
| **අදියර 3** | | | | |
| ජනවාරි 01 දිනට ශේෂය | – | – | 171,595 | 171,595 |
| ආදායම් ප්‍රකාශයට ගැලපීම්/(ආපසු ගැලපීම්) | – | – | – | – |
| වර්ෂය තුළ කපාහැරීම් | – | – | – | – |
| වෙනත් සංචලන | – | – | – | – |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | – | – | 171,595 | 171,595 |
| **දෙසැම්බර් 31 දිනට මුළු හානිකරණ ප්‍රතිපාදන** | 8,208 | 3,905 | 179,952 | 175,651 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 23 වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට ගණනය කරන ලද මූල්‍ය වත්කම් ගණයට හිමිකම් සහ ණය සුරැකුම්පත් අයත්වේ. වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගය ලෙසින් වර්ගීකරණය කරනු ලබන හිමිකම් ආයෝජන, උපායමාර්ගික ආයෝජන ලෙස පවතින අයිතමයන්ය. වෙළඳපළ තත්වයන්ගේ වෙනස්වීම් වලට ප්‍රතිචාර ලෙසින් හෝ ද්‍රවශීලතාව අවශ්‍යතාවන්ට ප්‍රතිචාර ලෙසින් විකුණනු ලබන මෙම ප්‍රභේදයට අයත් ණය සුරැකුම්පත් නිශ්චිත නොවන කාලපරිච්ඡේදයකට රඳවා ගැනීමට අපේක්ෂා කරනු ලබන අයිතමයන්ය.

මූලික මිනුමෙන් පසුව වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයට ගණනය කරන ලද මූල්‍ය වත්කම් පසුව සාධාරණ අගයට මනිනු ලබයි. වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් පහත පරිදි ප්‍රභේද දෙකකට වර්ග කළ හැකිය.

### i. වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට ඇති හිමිකම් උපකරණ

මූලික හඳුනාගැනීමෙන් පසුව, ශ්‍රී.ල.ගි.ප්‍ර. 32 මූල්‍ය උපකරණ යටතේ හිමිකම් යන්නෙහි නිර්වචනයට සරිලන අවස්ථාවලදී බැංකුව විසින් ඇතැම් විටෙක එහි හිමිකම් ආයෝජන වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයට ඇති හිමිකම් උපකරණ ලෙස ආපසු හැරවිය නොහැකි පරිදි වර්ගීකරණය කරනු ලබයි. එවන් වර්ගීකරණයක් උපකරණයෙන් උපකරණය යන පදනම මත තීරණය වෙයි

උපලබ්ධි නොවූ ලැබීම් හා අලාභ, වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතයෙහි සෘජුවම හිමිකම් ලෙස හඳුනාගනු ලබයි. මෙකී හිමිකම් උපකරණ මත ඇති වන ලැබීම් හා අලාභ යළි ලාභයක් ලෙස කිසි විටෙක ප්‍රතිවර්ගීකරණය කරනු නොලබයි. උපකරණයෙහි පිරිවැයෙහි කොටසක් ලෙස යළි අයකර ගැනීමෙහිදී එකී අරමුදලින් බැංකුව ප්‍රතිලාභ ලබන අවස්ථාවලදී හැර ගෙවීමේ අයිතිය ස්ථාපිත කර ගන්නා අවස්ථාවලදී ලාභාංශ, වෙනත් මෙහෙයුම් ආදායම් ලෙස ලාභයට/අලාභයට හඳුනාගනු ලබයි. එබඳු අවස්ථාවලදී එකී ලැබීම්, වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට ඇති හිමිකම් උපකරණ හානිකරණ ඇගයීමට යටත් නොවේ.

කෙසේ වෙතත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගය යටතේ ඇති ප්‍රකාශිත වෙළෙඳපොළ මිලක් නොමැති සහ සාධාරණ අගය විශ්වසනීය ලෙස මැනිය නොහැකි හිමිකම් ආයෝජන පිරිවැයට මනිනු ලබයි.

### ii. වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට ඇති ණය උපකරණ

පහත කොන්දේසි ද්විත්වයටම අනුකූල වන අවස්ථාවලදී වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයට මනිනු ලබන ණය උපකරණ සඳහා සමූහය විසින් ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 යටතේ නව වර්ගීකරණය අදාළ කරගනු ලබයි.

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස් කිරීම සහ මූල්‍ය වත්කම් විකිණීම මඟින් සාක්ෂාත් කරගත හැකි අරමුණු සහිත උපකරණ ව්‍යාපාරික ආකෘතියක් යටතේ රඳවාගනු ලබයි.
- මූල්‍ය වත්කම් ගිවිසුම්ගත නියමයන් SPPI පරීක්ෂාවට බඳුන් වෙයි.

වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට ඇති ණය උපකරණ පාඩුව සාධාරණ අගයට මනිනු ලබන අතර, එමඟින් ඇතිවන ලැබීම් සහ අලාභ වෙනත් විස්තීර්ණ ආදායමෙහි වාර්තා කරනු ලබයි. පොලී ආදායම, අපේක්ෂිත ණය පාඩු සහ අඩුවීම් ලාභය/අලාභයට හඳුනාගනු ලබයි. හඳුනාගැනීම අත්හැරීමේදී, වෙනත් විස්තීර්ණ ආදායමට කලින් වාර්තා කරන ලද මුළු ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කරනු ලැබේ.

| | | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | සටහන් | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| **ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්** | 23(අ) | | | | |
| භාණ්ඩාගාර බිල්පත් | | **22,983,387** | 24,302,555 | **22,983,387** | 24,302,555 |
| භාණ්ඩාගාර බැඳුම්කර | | **33,404,292** | 23,597,790 | **36,756,577** | 25,064,210 |
| **හිමිකම් සුරැකුම්පත්** | | | | | |
| නිල ලැයිස්තුගත හිමිකම් සුරැකුම්පත් | 23(ඇ) | **6,740,646** | 5,195,626 | **6,749,253** | 5,564,375 |
| නිල ලැයිස්තුගත නොවන හිමිකම් සුරැකුම්පත් | 23(ඉ) | **451,436** | 373,207 | **496,076** | 417,848 |
| **ආයතනික ණය උපකරණ** | | | | | |
| ණයකර | 23(ඊ) | **1,054,937** | – | **1,054,937** | – |
| (අඩුකළා): හානිකරණය | | **–** | – | **(42,476)** | (42,476) |
| **වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට ශුද්ධ මූල්‍ය වත්කම්** | | **64,634,698** | 53,469,178 | **67,997,754** | 55,306,512 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 23. වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් (සම්බන්ධයි)

### 23. (අ) විශ්ලේෂණය

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| **සුරැකුම්කරණය මඟින්** | | | | |
| සුරැකුම් ලෙස ගිවිසින ලද | – | – | 2,850,016 | 1,466,421 |
| තබා නොමැත | 64,634,698 | 53,469,178 | 65,147,738 | 53,840,091 |
| **දළ එකතුව** | 64,634,698 | 53,469,178 | 67,997,754 | 55,306,512 |
| **ව්‍යවහාර මුදල් ඒකක අනුව** | | | | |
| ශ්‍රී ලංකා රුපියල් | 64,634,698 | 53,469,178 | 67,997,754 | 55,306,512 |
| ඇමෙරිකානු ඩොලර් | – | – | – | – |
| **දළ එකතුව** | 64,634,698 | 53,469,178 | 67,997,754 | 55,306,512 |

### 23. (ආ) වර්ෂය තුළ හානිකරණ සංචලන

වර්ෂය තුළ හානිකරණ සංචලන වාර්තා නොවීය.

### 23. (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත්

| | බැංකුව | | | | | |
|---|---|---|---|---|---|---|
| | **2025** | | | 2024 | | |
| | **මුහුණත අගය රු. '000** | **ආයෝජන පිරිවැය රු. '000** | **සාධාරණ අගය රු. '000** | මුහුණත අගය රු. '000 | ආයෝජන පිරිවැය රු. '000 | සාධාරණ අගය රු. '000 |
| ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත් – භාණ්ඩාගාර බිල්පත් | 23,662,337 | 22,538,459 | 22,983,387 | 25,258,719 | 24,077,917 | 24,302,555 |
| ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත් – භාණ්ඩාගාර බැඳුම්කර | 32,312,129 | 31,232,851 | 33,404,292 | 21,838,510 | 21,156,839 | 23,597,790 |
| | | 53,771,310 | 56,387,679 | | 45,234,756 | 47,900,345 |

| | සමූහය | | | | | |
|---|---|---|---|---|---|---|
| | **2025** | | | 2024 | | |
| | **මුහුණත අගය රු. '000** | **ආයෝජන පිරිවැය රු. '000** | **සාධාරණ අගය රු. '000** | මුහුණත අගය රු. '000 | ආයෝජන පිරිවැය රු. '000 | සාධාරණ අගය රු. '000 |
| ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත් – භාණ්ඩාගාර බිල්පත් | 23,662,337 | 22,538,459 | 22,983,387 | 25,258,719 | 24,077,917 | 24,302,555 |
| ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත් – භාණ්ඩාගාර බැඳුම්කර | 35,474,380 | 34,352,813 | 36,756,577 | 23,186,832 | 22,375,888 | 25,064,210 |
| | | 56,891,272 | 59,739,964 | | 46,453,805 | 49,366,765 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 23. වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් (සම්බන්ධයි)

### 23. (ඈ) නිල ලැයිස්තුගත ආයෝජන – හිමිකම් සුරැකුම්පත් – බැංකුව සහ සමූහය

| | බැංකුව | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2025 | | | 2024 | | |
| | කොටස් ගණන | පිරිවැය රු. '000 | සාධාරණ අගය රු. '000 | කොටස් ගණන | පිරිවැය රු. '000 | සාධාරණ අගය රු. '000 |
| හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී | 13,083,066 | 1,730,274 | 5,213,602 | 13,083,066 | 1,730,274 | 4,183,310 |
| පීපල්ස් ලීසිං ෆිනෑන්ස් පීඑල්සී | 61,081,787 | 867,744 | 1,527,044 | 59,547,976 | 832,312 | 1,012,316 |
| | | 2,598,018 | 6,740,646 | | 2,562,586 | 5,195,626 |

| | සමූහය | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2025 | | | 2024 | | |
| | කොටස් ගණන | පිරිවැය රු. '000 | සාධාරණ අගය රු. '000 | කොටස් ගණන | පිරිවැය රු. '000 | සාධාරණ අගය රු. '000 |
| හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී | 13,083,066 | 1,730,274 | 5,213,602 | 13,083,066 | 1,730,274 | 4,183,310 |
| පීපල්ස් ලීසිං කම්පනි පීඑල්සී | 61,081,787 | 867,744 | 1,527,044 | 59,547,976 | 832,312 | 1,012,316 |
| ජාතික සංවර්ධන බැංකුව | 15,397 | 1,181 | 2,175 | 19,076 | 1,448 | 2,160 |
| කොමර්ෂල් බැංකුව පීඑල්සී | 247 | 12 | 50 | 245 | 11 | 36 |
| එල්.ඕ.එල්.සී. හෝල්ඩිංග්ස් පීඑල්සී | 200 | 1 | 112 | 200 | 1 | 138 |
| සම්පත් බැංකුව පීඑල්සී | 11,095 | 325 | 1,625 | 11,095 | 325 | 1,312 |
| වටවල ප්ලාන්ටේෂන් පීඑල්සී | 13,230 | 14 | 618 | 4,046 | 21 | 508 |
| ට්‍රාන්ස් ඒෂියා හොටෙල්ස් පීඑල්සී | 2,500 | 22 | 145 | 4,000 | 35 | 178 |
| ලංකා සෙරමික් පීඑල්සී | 917 | 24 | 156 | 917 | 24 | 137 |
| ලංකා වෝල්ටයිල් පීඑල්සී | – | – | – | 585 | 2 | 34 |
| කැළණි වැලි ප්ලාන්ටේෂන් පීඑල්සී | 9,000 | 162 | 828 | 11,000 | 198 | 1,063 |
| හපුගස්තැන්න ප්ලාන්ටේෂන් පීඑල්සී | 100 | 3 | 5 | 100 | 3 | 5 |
| එයිටිකන් ස්පෙන්ස් පීඑල්සී | 17,850 | 159 | 2,789 | 18,000 | 160 | 2,610 |
| පැන්ඒෂියා බැන්ක් පීඑල්සී | – | – | – | 10,298,499 | 96,012 | 360,448 |
| හැටන් ප්ලාන්ටේෂන් පීඑල්සී | 4,000 | 30 | 104 | 4,000 | 30 | 120 |
| | | 2,599,951 | 6,749,253 | | 2,660,856 | 5,564,375 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 23. වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් (සම්බන්ධයි)

### 23. (ඉ) නිල ලැයිස්තුගත නොවන ආයෝජන - හිමිකම් සුරැකුම්පත්

| | බැංකුව | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2025 | | | 2024 | | |
| | කොටස් ගණන | පිරිවැය රු. '000 | සාධාරණ අගය/පිරිවැය රු. '000 | කොටස් ගණන | පිරිවැය රු. '000 | සාධාරණ අගය/පිරිවැය රු. '000 |
| ණය තොරතුරු කාර්යාංශය | 30,450 | 57,364 | 57,364 | 30,450 | 57,364 | 57,364 |
| ඇසෝසියේටඩ් නිව්ස් පේපර්ස් සිලෝන් ලිමිටඩ් | 20,000 | 127 | 127 | 20,000 | 127 | 127 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB) | 16,452,126 | 164,521 | 393,945 | 16,452,126 | 164,521 | 315,716 |
| (අඩුකලා:) හානිකරණ ප්‍රතිපාදන | | – | – | | – | – |
| | | 222,012 | 451,436 | | 222,012 | 373,207 |

| | සමූහය | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2025 | | | 2024 | | |
| | කොටස් ගණන | පිරිවැය රු. '000 | සාධාරණ අගය/පිරිවැය රු. '000 | කොටස් ගණන | පිරිවැය රු. '000 | සාධාරණ අගය/පිරිවැය රු. '000 |
| ණය තොරතුරු කාර්යාංශය | 30,650 | 57,528 | 57,528 | 30,650 | 57,528 | 57,528 |
| ඇසෝසියේටඩ් නිව්ස් පේපර්ස් සිලෝන් ලිමිටඩ් | 20,000 | 127 | 127 | 20,000 | 127 | 127 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB) | 16,452,126 | 164,521 | 393,945 | 16,452,126 | 164,521 | 315,717 |
| ශ්‍රී ලංකා මූල්‍ය සේවා කාර්යාංශය | 200,000 | 2,000 | 2,000 | 200,000 | 2,000 | 2,000 |
| ප්‍රමුඛ මර්චන්ට් කෝපරේෂන් | 500,000 | 5,000 | 5,000 | 500,000 | 5,000 | 5,000 |
| ප්‍රයිම් ඩිවෙලොප්මන්ට් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස් | 230,000 | 2,300 | 2,300 | 230,000 | 2,300 | 2,300 |
| ජනශක්ති ලයින් | 2,500,000 | 25,000 | 25,000 | 2,500,000 | 25,000 | 25,000 |
| ජනශක්ති හෝල්ඩිංග්ස් | 1,000,000 | 10,000 | 10,000 | 1,000,000 | 10,000 | 10,000 |
| වණික් ඉන්කෝපරේෂන් | 17,000 | 176 | 176 | 17,000 | 176 | 176 |
| **දළ එකතුව** | | 266,652 | 496,076 | | 266,652 | 417,848 |
| (අඩුකලා:) හානිකරණ ප්‍රතිපාදන | | – | (42,476) | | – | (42,476) |
| **ශුද්ධ එකතුව** | | 266,652 | 453,600 | | 266,652 | 375,372 |

නිල ලැයිස්තුගත නොකළ වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට ගණනය කළ හිමිකම් කොටස් සියල්ල (ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හැරුණු විට) ඒවායේ සාධාරණ අගය විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කල නොහැකි බැවින් පිරිවැයට වාර්තා කර ඇත. මෙම ආයෝජන සඳහා ක්‍රියාකාරී වෙළෙඳපොළක් නොමැති බැවින් ඒවා දිගුකාලීනව පවත්වා ගනී. නිරීක්ෂණය කරන ලද දත්ත පදනම් කරගෙන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ කොටස් මත වූ ආයෝජන ඇගයීමේ ආකෘතිය වන සාධාරන අගයට ගණනය කර ඇත.

### 23. (ඊ) ණයකර

| | බැංකුව හා සමූහය | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2025 | | | 2024 | | |
| | ණයකර ගණන | පිරිවැය රු. '000 | සාධාරණ අගය/පිරිවැය රු. '000 | ණයකර ගණන | පිරිවැය රු. '000 | සාධාරණ අගය/පිරිවැය රු. '000 |
| ලංකා බැංකුව | 5,000,000 | 500,000 | 516,202 | – | – | – |
| කොමර්ෂල් බැංකුව පීඑල්සී | 2,105,800 | 210,580 | 230,688 | – | – | – |
| වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී | 3,000,000 | 300,000 | 308,047 | – | – | – |
| (අඩුකලා:) හානිකරණ ප්‍රතිපාදන | | – | – | | – | – |
| | | 1,010,580 | 1,054,937 | | – | – |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 24 පාලිත සමාගම්වල ආයෝජනයන්

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

පාලිත සමාගම්වල ආයෝජන, හානිකරණය වෙනුවෙන් දීමනා අඩු කළ පසු පිරිවැයට ගණනය කර බැංකුවේ මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වේ. කිසියම් හානිකරණ ඇඟවීමක් ඇත්දැයි තීරණය කිරීම පිණිස සෑම වාර්තාකරන දිනකදීම පාලිත සමාගම්වල ශුද්ධ වත්කම්, සමාලෝචනය කරනු ලබයි. කිසියම් හානිකරණයක් සිදුවී ඇති බවට ඇඟවීමක් වේ නම්, ආයෝජනයේ යළි අයකරගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලබන අතර, ශුද්ධ වත්කම්වල අලාභයෙහි මට්ටමට හානිකරණ අලාභය හඳුනාගනු ලබයි.

| දෙසැම්බර් 31 දිනට | | 2025 | 2024 | 2025 | | 2024 | |
|---|---|---|---|---|---|---|---|
| | සටහන් | % | % | පිරිවැය රු. '000 | තක්සේරුව* රු. '000 | පිරිවැය රු. '000 | තක්සේරුව* රු. '000 |
| **නිල ලැයිස්තුගත නොවන හිමිකම් කොටස්** | | | | | | | |
| එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ් (එකක් රු. 10 බැගින් වූ සාමාන්‍ය කොටස් 420,000,000) | | 100 | 100 | 4,200,000 | 7,150,847 | 4,200,000 | 6,496,550 |
| ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව (සාමාන්‍ය කොටස් 8,204,464) | | 100 | 100 | 3,111,000 | 8,977,105 | 3,111,000 | 8,806,628 |
| අඩුකලා: හානිකරණ ප්‍රතිපාදන | 24.3 | | | – | – | – | – |
| **ශුද්ධ එකතුව** | | | | 7,311,000 | 16,127,952 | 7,311,000 | 15,303,178 |

*පාලිත සමාගම්වල ආයෝජන පිළිබඳ තක්සේරුකරණය, ශුද්ධ වත්කම් පදනම මත 2025 දෙසැම්බර් 31 දිනට විගණිත මූල්‍ය ප්‍රකාශන පාදක කොට ගෙන ඇත.

### 24.1 පාලිත සමාගම් අත්පත් කර ගැනීම හා විකිණීම.

2025 වර්ෂය තුළ කිසිදු අත්පත් කර ගැනීමක් හෝ විකිණීමක් සිදු කර නොමැත.

### 24.2 පොලී ආදායම හා අත්පත් කරගැනීමේ ලාභය

2025 වර්ෂය තුළ කිසිදු අත්පත් කර ගැනීමක් හෝ විකිණීමක් සිදු කර නොමැත.

### 24.3 වර්ෂය තුළ හානිකරණ සංචලන

2025 වර්ෂය තුළ හානිකරණ සංචලන වාර්තා නොවීය.

## 25 ආශ්‍රිත සමාගම්වල සහ බද්ධ ව්‍යාපාරවල ආයෝජනය

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ආශ්‍රිතයන් යනු සමූහයට සැලකිය යුතු බලපෑමත් ඇති නමුත් ආයෝජකයාගේ බලය හරහා විචල්‍ය ප්‍රතිලාභ පාලනය කල නොහැකි ආයතනයි. අනෙක් ආයතනයේ 20% හෝ ඊට වැඩි ඡන්ද බලය පවතී නම්, සමූහය සැලකිය යුතු බලපෑමක් සිදුකළ හැකි යැයි උපකල්පනය කෙරේ.

ශ්‍රී.ල.ගි.ප්‍ර. 28, ආශ්‍රිත සහ බද්ධ ව්‍යාපාර ආයෝජන, යටතේ ආශ්‍රිතයන්ගේ ආයෝජන හිමිකම් ක්‍රමයට අනුව මූලිකව පිරිවැයට ගිණුම්ගත කළ හැකිවේ. හිමිකම් ක්‍රමය යටතේ ආශ්‍රිතයන්ගේ ආයෝජන පිරිවැයට අමතරව සමූහයේ ශුද්ධ වත්කම් වල අත්පත් කර ගැනීමේ කොටසෙහි වෙනස්කම් සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වෙනම අයිතමයක් ලෙස වාර්තා කර ඇත. ආශ්‍රිතයන්ගේ මෙහෙයුම්වල ප්‍රතිඵලවල සමූහයේ කොටස ආදායම් ප්‍රකාශයෙන් පිළිබිඹු කරයි. එම ආයෝජකයින්ගේ වෙනත් විස්තීර්ණ ආදායමේ කිසියම් වෙනසක් සමූහයේ වෙනත් විස්තීර්ණ ආදායමේ කොටසක් ලෙස ඉදිරිපත් කරයි. ඊට අමතරව ආශ්‍රිත හිමිකමෙහි සෘජුවම හඳුනාගත් වෙනසක් සිදු වූ විට සමූහය විසින් අදාළ අවස්ථාවන්හිදී අදාළ වෙනස්වීමේ කොටස වෙනත් විස්තීර්ණ ආදායමේ හිමිකම ලෙස හඳුනාගනී. සමූහය සහ ආශ්‍රිතයන් අතර ගනුදෙනුවල ප්‍රතිඵලයක් ලෙස හඳුනා නොගත් ලාභ අලාභ ආශ්‍රිතයාගේ අනුමැතිය පරිදි ඉවත් කෙරේ.

සමූහය සැලකිය යුතු බලපෑමක් සිදු කිරීම අවසන් වන දිනයේ සිට හිමිකම් ක්‍රමය භාවිතය අවසන් කරන අතර එවැනි ආයෝජකයන් ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 ක්‍රමය මූල්‍ය උපකරණ අනුව ගිණුම්ගත කරයි. ආශ්‍රිතයන් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් නැති වූ විට සමූහය විසින් රඳවාගත් ආයෝජන මැනීම සහ හඳුනා ගැනීම සාධාරණ අගයට සිදු කරයි.

ආශ්‍රිතයාගේ සැලකියයුතු බලපෑමක් ඇති කළ හැකි අලාභයේ සාධාරණ අගය සහ රඳවාගත් ආයෝජනයේ ලාභාලාභ වශයෙන් හඳුනා ගනී.

2025 දෙසැම්බර් 31 දිනට ආශ්‍රිත සමාගම්වල බද්ධ ව්‍යාපාර සඳහා ආයෝජන නොමැත.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 26 දේපල, පිරියත සහ උපකරණ

ගිණුම්කරණ ප්‍රතිපත්ති

**හඳුනාගැනීමේ පදනම**

වත්කමෙහි පිරිවැය විශ්වාසනීය ලෙස ගණනය කළ හැකි නම් සහ වත්කම් හා සබැඳි අනාගත ප්‍රතිලාභ, සමූහය වෙත ගලා ඒමේ සම්භාවිතාවයන් ඇති විටක දේපල, පිරියත හා උපකරණ පොත්වල හඳුනාගනු ලබයි. වත්කම අත්පත් කර ගැනීමට සෘජුවම අදාළ වන පිරිවැයද ඇතුළත්ව දේපල, පිරියත හා උපකරණ මූලිකවම පිරිවැයට ගණනය කරනු ලබයි.

**මිනීමේ පදනම**

වත්කමක් ලෙස හඳුනා ගැනීමට සුදුසුකම් ලබන දේපල, පිරියත හා උපකරණ අයිතමයක් මුල් වරට එහි පිරිවැයට මනිනු ලබයි. පිරිවැය යන්නට වත්කම අත්පත් කර ගැනීම සඳහා සෘජුව අදාළ කලහැකි පිරිවැය සහ පසුකාලීන පිරිවැය ඇතුලත් වේ. තමන් විසින්ම ඉදිකල වත්කමක පිරිවැය යන්නට සෘජු ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රම පිරිවැය සහ වත්කම කළමනාකාරිත්වය විසින් අපේක්ෂිත ආකාරයෙන් ක්‍රියාකරවිය හැකි තත්ත්වයට ගෙන ඒමට සෘජුව අදාළ කලහැකි අනෙකුත් පිරිවැය මෙන්ම වත්කම ස්ථානගත කර ඇති වැඩ බිමෙන් ගලවා දැමීම, ඉවත් කිරීම සහ භූමිය ප්‍රතිසංස්කරණ කිරීම සඳහා වන පිරිවැයෙහි මුල් ඇස්තමේන්තුව සහ ප්‍රාග්ධනිත කරන ලද ණය ගැනුම් පිරිවැය ඇතුළත් වේ. පරිගණක උපකරණවල ක්‍රියාකාරිත්වයේ සංකලිත කොටසක් වන මිලදී ගත් පරිගණක මෘදුකාංග, පරිගණක උපකරණ යටතේ ප්‍රාග්ධනිත කරයි.

දේපල, පිරියත හා උපකරණ අයිතමයක කොටස් විවිධ වූ ඵලදායී ජීවකාල වලින් යුක්ත වන විට එම කොටස් වෙන් වෙන් වූ දේපල, පිරියත හා උපකරණ අයිතමයන් ලෙස හඳුනාගනු ලැබේ.

**පිරිවැය ආකෘතිය**

සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි හැරුණුවිට සෙසු දේපල, පිරියත හා උපකරණ සඳහා සමූහය විසින් පිරිවැය ආකෘතිය උපයෝගී කරගනු ලබන අතර, මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය සහ ඒ සම්බන්ධ අමතර පිරිවැයද ඇතුලත්ව, සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩුකල පසු අගයට වාර්තා කරනු ලබයි.

**ප්‍රත්‍යාගණන ආකෘතිය**

සමූහය විසින් සමස්ත සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි කාණ්ඩයටම ප්‍රත්‍යාගණන ආකෘති උපයෝගි කරගනු ලබයි. ප්‍රත්‍යාගණනය කරනු ලබන දිනට වත්කමෙහි සාධාරණ අගයෙන් පසුකාලීනව සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභයන් අඩුකල පසු අගය වන ප්‍රත්‍යාගණිත අගයට එම දේපල පවත්වාගෙන යනු ලබයි. වාර්තාකරන දිනට ඇති සාධාරණ අගය හා ධාරණ අගය අතර සැලකියයුතු වෙනසක් නොමැති බව සහතික කරනු වස් චක්‍රීය පදනම මත සමූහයෙහි සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි සෑම තෙවසරකටම වරක් ප්‍රත්‍යාගණනය කරනු ලබයි.

මෙබඳු ව්‍යාවරණයක් යටතේ, ඇතිවන ඉහළයාම පෙර ලියා හැරීමේ අගය දක්වා ආදායමක් ලෙස වාර්තා කරනු ලබයි. ධාරණ අගයෙහි යම් අඩුවීමක් වේ නම්, එය ආදායම් ප්‍රකාශයෙහි වියදමක් ලෙස හඳුනා ගත යුතුය. කෙසේ වුවද එම වත්කමට අදාළව ප්‍රත්‍යාගණන සංචිතයෙහි පවතින යම් බැර ශේෂයක් වේ නම් එම අගය තෙක් ප්‍රත්‍යාගණය අඩුවීමක් වෙනත් විස්තීර්ණ ආදායම් වෙත හර කරනු ලබයි. වෙනත් විස්තීර්ණ ආදායම් හි වාර්තා කරනු ලබන එම අඩුවීම මගින් ප්‍රත්‍යාගණන සංචිත යටතේ සමුච්චිත හිමිකම් වල අගය අඩුවෙයි. යම් වත්කමකට අදාළව ප්‍රත්‍යාගණන සංචිතයෙහි ඉතිරි වන යම් ශේෂයක් වේ නම්, එය විශ්‍රාම යාම මත හෝ එම වත්කම් ඉවත් කිරීම මත රඳවාගනු ලබන ඉපයීම් වෙත සෘජුවම මාරු කරනු ලබයි.

**හඳුනාගැනීම අත්හැරීම**

විකුණා බැහැර කිරීමේදී හෝ එය පාවිච්චි කිරීමෙන් අනාගත ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා නොකරන විට දේපල, පිරියත හා උපකරණ පොත් වලින් ඉවත් කරනු ලැබේ. වත්කම් ඉවත් කිරීමේදි පැන නඟින කිසියම් ලාභයක් හෝ අලාභයක් (වත්කමෙහි ධාරණ අගය සහ බැහැරලීමේ ශුද්ධ අගය අතර වෙනස ලෙස ගණනය කෙරෙයි) එම වර්ෂය තුළ ආදායම් ප්‍රකාශයෙහි වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ හඳුනාගනු ලබයි.

**ප්‍රාග්ධනිත කල හැකි කෙරිගෙන යන වැඩ**

ප්‍රාග්ධනිත කිරීමට අපේක්ෂා කරන, ගොඩනැගිලි ඉදිකිරීම්, ප්‍රධාන යන්ත්‍රෝපකරණ සහ පද්ධති වැඩි දියුණු කිරීම සඳහා දරන ලද ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් මේ යටතට අයත් වේ. මේවා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සමුච්චිත හානිකරණ අලාභ අඩු කරන ලද පිරිවැයට දක්වා ඇත. කළමනාකාරිත්වය විසින් අපේක්ෂිත ආකාරයට ක්‍රියා කල හැකි තත්ත්වයට සහ ස්ථානයට පත්වූ පසු එම ප්‍රාග්ධනිත කළ හැකි කෙරිගෙන යන වැඩ, අදාළ වත්කම වෙත මාරු කරනු ලැබේ.

**ණය පිරිවැය**

සමූහය විසින් දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීමට අදාළ ප්‍රාග්ධනිත කළහැකි ණය පිරිවැය නොවිය.

**කුලියට/බදු දීම සඳහා ගොඩනැගිලිවලට සිදුකරනු ලබන වැඩිදියුණු කිරීම්**

2017 ජනවාරි 01 දින සිට කුලියට/බදු දීම් සඳහා ගොඩනැගිලිවලට සිදුකරනු ලබන වැඩිදියුණු කිරීම් ප්‍රාග්ධනිත කිරීම සඳහා බැංකුව විසින් තීරණය කර ඇත. එදින සිට බලපැවැත්වෙන පරිදි බදු කාලසීමාව තුළදී එකී වැඩිදියුණු කිරීම් ක්‍රමක්ෂය කරනු ලැබේ.

**ක්ෂයවීම්**

දේපල පිරියත සහ උපකරණ පිරිවැය, ඒවායේ තක්සේරු කළ ඵලදායී ජීවකාලය තුළ අවශේෂ වටිනාකම දක්වා සරළ මාර්ග ක්‍රමය උපයෝගී කරගනිමින්, ක්ෂයවීම් ගණනය කර ලාභ/අලාභ යටතේ වාර්තා කරනු ලබයි. ඉඩම්වල ක්ෂයවීමක් නොසැලකෙයි. හඳුනාගනු ලැබූ වත්කම් කාණ්ඩවලට අදාළ ක්ෂයවීම් අනුපාතික පහතින් දක්වා ඇත.

| වත්කම් වර්ගය | ක්ෂයවීම් කාලය |
|---|---|
| කල්බදු දේපල, කුලියට/බදු දීම සඳහා සිදුකරනු ලබන වැඩිදියුණු කිරීම් | බදු කාලසීමාව තුළදී |
| සින්නක්කර ගොඩනැගිලි | වසර 20 – 50 |
| කාර්යාල හා විවිධ උපකරණ සහ ලීබඩු හා සවිකිරීම් | වසර 5 – 10 |
| මෝටර් වාහන | වසර 5 |
| පරිගණක දෘඩාංග | වසර 4 – 5 |
| පරිගණක මෘදුකාංග | වසර 4 – 5 |

සමූහය විසින් වත්කමක් භාවිතයට හැකි දින සිට වත්කම් බැහැර කිරීමේ දිනය දක්වා ක්ෂය වීමක් සපයයි.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 26. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි)

### 26. (අ) දේපල, පිරියත සහ උපකරණ - බැංකුව - 2025

| | ඉඩම් හා ගොඩනැගිලි රු. '000 | බදු දේපල, කුලියට/බදු දීම සඳහා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි* රු. '000 | පරිගණක දෘඩාංග රු. '000 | කාර්යාලීය හා විවිධ උපකරණ ලී බඩු හා සවි කිරීම්** රු. '000 | මෝටර් රථවාහන රු. '000 | කෙරීගෙන යන වැඩ ගොඩනැගිලි රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය/සාධාරණ අගය** | | | | | | | |
| 2025 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | 14,426,451 | 959,611 | 5,288,580 | 2,844,152 | 445,416 | 50,687 | 24,014,897 |
| එකතු කිරීම් | 196,429 | 109,490 | 396,525 | 166,788 | – | 203,846 | 1,073,078 |
| ඉවත් කිරීම් | (4,736) | (55,856) | (11,779) | (7,137) | – | – | (79,508) |
| පරිපාලිත සමාගමෙන් මාරුවීම් | – | – | 10,146 | 15,446 | 41,147 | – | 66,739 |
| මාරු කිරීම්/ගැලපීම් | – | (20,381) | – | (17,316) | – | (199,792) | (237,489) |
| **2025 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය** | 14,618,144 | 992,864 | 5,683,472 | 3,001,933 | 486,563 | 54,741 | 24,837,718 |
| **අඩුකළා: සමුච්චිත ක්ෂයවීම්** | | | | | | | |
| 2025 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | 116,143 | 405,395 | 3,643,519 | 1,953,606 | 445,214 | – | 6,563,878 |
| වර්ෂය තුල අයකිරීම් | 119,357 | 46,630 | 534,239 | 176,248 | 1,363 | – | 877,837 |
| ඉවත් කිරීම් | – | – | (9,495) | (6,994) | – | – | (16,489) |
| පරිපාලිත සමාගමෙන් මාරුවීම් | – | – | 10,146 | 15,430 | 39,956 | – | 65,532 |
| 2025 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය | 235,500 | 452,025 | 4,178,409 | 2,138,290 | 486,533 | – | 7,490,758 |
| අඩුකළා: හානිකරණය | – | – | – | – | – | 35,228 | 35,228 |
| **2025 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය** | 14,382,644 | 540,839 | 1,505,063 | 863,643 | 30 | 19,513 | 17,311,732 |

### 26. (අ) දේපල, පිරියත සහ උපකරණ - බැංකුව - 2024

| | ඉඩම් හා ගොඩනැගිලි රු. '000 | බදු දේපල, කුලියට/බදු දීම සඳහා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි* රු. '000 | පරිගණක දෘඩාංග රු. '000 | කාර්යාලීය හා විවිධ උපකරණ ලී බඩු හා සවි කිරීම්** රු. '000 | මෝටර් රථවාහන රු. '000 | කෙරීගෙන යන වැඩ ගොඩනැගිලි රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය/සාධාරණ අගය** | | | | | | | |
| 2024 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | 14,423,000 | 928,559 | 4,736,369 | 2,572,835 | 445,416 | 47,860 | 23,154,039 |
| එකතු කිරීම් | 3,451 | 31,052 | 636,186 | 322,962 | – | 6,278 | 999,929 |
| ඉවත් කිරීම් | – | – | (83,975) | (55,971) | – | – | (139,946) |
| මාරු කිරීම්/ගැලපීම් | – | – | – | 4,326 | – | (3,451) | 875 |
| **2024 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය** | 14,426,451 | 959,611 | 5,288,580 | 2,844,152 | 445,416 | 50,687 | 24,014,897 |
| **අඩුකළා: සමුච්චිත ක්ෂයවීම්** | | | | | | | |
| 2024 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | – | 358,909 | 3,225,533 | 1,849,517 | 435,889 | – | 5,869,849 |
| වර්ෂය තුල අයකිරීම් | 116,143 | 46,272 | 502,018 | 157,232 | 9,328 | – | 830,993 |
| ඉවත් කිරීම් | – | – | (83,912) | (53,185) | – | – | (137,097) |
| මාරු කිරීම්/ගැලපීම් | – | 214 | (120) | 42 | (3) | – | 133 |
| **2024 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය** | 116,143 | 405,395 | 3,643,519 | 1,953,606 | 445,214 | – | 6,563,878 |
| අඩුකළා: හානිකරණය | – | – | – | – | – | 35,228 | 35,228 |
| **2024 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය** | 14,310,308 | 554,216 | 1,645,061 | 890,546 | 202 | 15,459 | 17,415,792 |

*කල්බදු දේපළ, කුලී/කල්බදු මත ඇති ගොඩනැගිලි වැඩිදියුණුකිරීම් යනාදියට 2025 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 5.9 ක අගයක් ගත් කුලී/කල්බදු මත ඇති ගොඩනැගිලි වැඩිදියුණු කිරීම සඳහා කෙරීගෙන යන වැඩ ඇතුළත්ය.

**කාර්යාලීය හා විවිධ උපකරණ, ලී බඩු හා සවිකිරීම් යනාදියට 2025 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 2.1 ක අගයක් ගත් කාර්යාලීය උපකරණ සඳහා කෙරීගෙන යන වැඩ ඇතුළත්ය.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 26. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි)

### 26. (අ) දේපල, පිරියත සහ උපකරණ - සමූහය - 2025

| | ඉඩම් හා ගොඩනැගිලි* රු. '000 | බදු දේපල, කුලියට/බදු දීම සඳහා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි රු. '000 | පරිගණක දෘඩාංග රු. '000 | කාර්යාලීය හා විවිධ උපකරණ ලී බඩු හා සවි කිරීම්** රු. '000 | මෝටර් රථවාහන රු. '000 | කෙරීගෙන යන වැඩ ගොඩනැගිලි රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය/ සාධාරණ අගය** | | | | | | | |
| 2025 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | 15,548,926 | 964,687 | 5,359,449 | 2,890,677 | 492,361 | 50,687 | 25,306,787 |
| එකතු කිරීම් | 196,429 | 109,490 | 401,247 | 168,850 | – | 203,846 | 1,079,862 |
| ඉවත් කිරීම් | (4,736) | (55,856) | (11,779) | (7,886) | – | – | (80,257) |
| මාරු කිරීම්/ගැලපීම් | – | (20,381) | – | (17,316) | – | (199,792) | (237,489) |
| **2025 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය** | 15,740,619 | 997,940 | 5,748,917 | 3,034,325 | 492,361 | 54,741 | 26,068,903 |
| **අඩුකළා: සමුච්චිත ක්ෂයවීම්** | | | | | | | |
| 2025 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | 123,336 | 405,396 | 3,701,155 | 1,995,780 | 489,780 | – | 6,715,447 |
| වර්ෂය තුල අයකිරීම් | 119,700 | 46,630 | 540,578 | 177,385 | 2,553 | – | 886,845 |
| ඉවත් කිරීම් | – | – | (9,495) | (7,743) | – | – | (17,238) |
| **2025 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය** | 243,036 | 452,026 | 4,232,238 | 2,165,422 | 492,333 | – | 7,585,054 |
| අඩුකළා: හානිකරණය | – | – | – | – | – | 35,228 | 35,228 |
| **2025 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය** | 15,497,583 | 545,914 | 1,516,679 | 868,903 | 28 | 19,513 | 18,448,620 |

### 26. (අ) දේපල, පිරියත සහ උපකරණ - සමූහය - 2024

| | ඉඩම් හා ගොඩනැගිලි* රු. '000 | බදු දේපල, කුලියට/බදු දීම සඳහා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි රු. '000 | පරිගණක දෘඩාංග රු. '000 | කාර්යාලීය හා විවිධ උපකරණ ලී බඩු හා සවි කිරීම්** රු. '000 | මෝටර් රථවාහන රු. '000 | කෙරීගෙන යන වැඩ ගොඩනැගිලි රු. '000 | එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය/සාධාරණ අගය** | | | | | | | |
| 2024 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | 15,545,275 | 933,635 | 4,798,023 | 2,619,285 | 492,361 | 47,860 | 24,436,438 |
| එකතු කිරීම් | 3,651 | 31,052 | 645,401 | 323,115 | – | 6,278 | 1,009,497 |
| ඉවත් කිරීම් | – | – | (83,975) | (55,971) | – | – | (139,946) |
| මාරු කිරීම්/ගැලපීම් | – | – | – | 4,248 | – | (3,451) | 797 |
| **2024 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය** | 15,548,926 | 964,687 | 5,359,449 | 2,890,677 | 492,361 | 50,687 | 25,306,787 |
| **අඩුකළා: සමුච්චිත ක්ෂයවීම්** | | | | | | | |
| 2024 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | 6,850 | 358,910 | 3,277,499 | 1,890,477 | 478,075 | – | 6,011,811 |
| වර්ෂය තුල අයකිරීම් | 116,486 | 46,272 | 507,688 | 158,481 | 11,708 | – | 840,635 |
| ඉවත් කිරීම් | – | – | (83,912) | (53,185) | – | – | (137,097) |
| මාරු කිරීම්/ගැලපීම් | – | 214 | (120) | 7 | (3) | – | 98 |
| **2024 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය** | 123,336 | 405,396 | 3,701,155 | 1,995,780 | 489,780 | – | 6,715,447 |
| අඩුකළා: හානිකරණය | – | – | – | – | – | 35,228 | 35,228 |
| **2024 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය** | 15,425,590 | 559,291 | 1,658,294 | 894,897 | 2,581 | 15,459 | 18,556,112 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 26. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි)

### 26. (ඇ) ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය/සාධාරණ තක්සේරුව

සෑම වසර 03 කට වරක් වෘත්තීමය වශයෙන් සුදුසුකම්ලත් ස්වාධීන තක්සේරුකරුවන් විසින් බැංකුවෙහි ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කරන ලදී. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දින ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර එදිනට රු. මිලියන 2,076 ක ප්‍රත්‍යාගණන අගයන් මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරන ලදී.

### 26. (ඈ) බැංකුවේ ඉඩම් හා ගොඩනැගිලි

2025 දෙසැම්බර් 31 දිනට ඉඩම් හා ගොඩනැගිලි ශේෂයට රු. මිලියන 10,975 ක සින්නක්කර ඉඩම් අගයක් ඇතුළත්ය.

### 26. (ඉ) වගකීම් සඳහා ඇප ලෙස සහතික කරන ලද දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ කිසිවක් වගකීම් සඳහා ඇප වශයෙන් තබා නොමැත.

### 26. (ඊ) සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද දේපල, පිරියත හා උපකරණ

වාර්තාකරණ දින දක්වා භාවිතයේ පවතින සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද දේපල, පිරියත හා උපකරණවල මූලික පිරිවැය පහත දක්වා ඇති පරිදි වේ.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| පරිගණක දෘඩාංග | 2,950,990 | 2,506,768 | 2,997,484 | 2,547,146 |
| **(ඇ) වෙනත් විස්තීර්ණ ආදායම්හි හඳුනාගෙන ඇති ප්‍රමාණය** | | |
| ප්‍රත්‍යක්ෂ (ලාභ)/අලාභ | 220,598 | (753,765) |
| උපකල්පනයන්ගේ වෙනස්වීම් මත (ලාභ)/අලාභ | 924,967 | (77,377) |
| සැලසුම්ගත වත්කම් මත ජීවගණක ලාභ/(අලාභ) | 43,541 | (174,149) |
| සේවකයින්ගේ දායකත්වය | (20,016) | (19,812) |
| **එකතුව** | 1,169,090 | (1,025,103) |
| **(ඈ) සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගයෙහි වෙනස්වීම් පහත පරිදි වේ.** | | |
| සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගයෙහි ආරම්භක අගය | 1,637,866 | 1,018,805 |
| සැලසුම්ගත වත්කම්වල අපේක්ෂිත ප්‍රතිලාභ | 208,092 | 132,444 |
| තථ්‍ය සේව්‍ය දායකත්වය | 788,269 | 732,789 |
| සහභාගිකරුවන්ගේ වාර්ෂික දායකත්වය | 20,016 | 19,812 |
| ගෙවූ ප්‍රතිලාභ | (465,032) | (440,133) |
| සැලසුම්ගත වත්කම් මත ජීවගණක ලාභ/(අලාභ) | (43,541) | 174,149 |
| **සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගයෙහි අවසාන ශේෂය** | 2,145,670 | 1,637,866 |
| **(ඉ) සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගයෙහි වෙනස්වීම් පහත පරිදි වේ.** | | |
| නිර්වචිත ප්‍රතිලාභ බැඳීමෙහි ආරම්භක ශේෂය | 5,781,264 | 6,131,827 |
| පොළී පිරිවැය | 638,106 | 797,137 |
| අතීත සේවා පිරිවැය | – | – |
| ප්‍රවර්තන සේවා පිරිවැය | 126,907 | 123,575 |
| ගෙවූ ප්‍රතිලාභ | (465,032) | (440,133) |
| උපකල්පනයන්ගේ වෙනස්වීම් මත (ලාභ)/අලාභ | 924,967 | (77,377) |
| සැලසුම්ගත වත්කම් මත ජීවගණක ලාභ/(අලාභ) | 220,598 | (753,765) |
| **නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල අවසාන ශේෂය** | 7,226,810 | 5,781,264 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 38. සේවාවසාන ප්‍රතිලාභ බැඳීම් (සම්බන්ධයි)

### 38. (අ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් (සම්බන්ධයි)

#### 38. (අ) 3. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ විශ්‍රාමික සේවකයින් සඳහා වන විශ්‍රාමික වෛද්‍යාධාර යෝජනා ක්‍රමය (සම්බන්ධයි)

| | බැංකුව සහ සමූහය | |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025** රු. '000 | 2024 රු. '000 |
| **(ඊ) සැලසුම්ගත වත්කම්වලට පහත අයිතමයන් ඇතුළත්ය.** | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | 1,602,186 | 1,444,855 |
| භාණ්ඩාගාර බිල්පත් | 374,465 | 203,854 |
| ස්ථාවර තැන්පතු | 536,187 | 257,380 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගත් සුරැකුම්පත් | 23,655 | 3,833 |
| ණයකර | 76,825 | 174,219 |
| ඉතුරුම් | 118 | 149 |
| වෙනත් ගෙවීම් | (467,766) | (446,424) |
| **එකතුව** | 2,145,670 | 1,637,866 |
| **(උ) නිශ්චිත ප්‍රතිලාභ බැඳීමහි කල්පිරීමේ පරාසය – අපේක්ෂිත සමුච්චිත ප්‍රතිලාභ ගෙවීම්වල වර්තමාන අගය** | | |
| ගෙවීම්හි වර්තමාන අගය ඉදිරි වර්ෂයන්හිදී නිශ්චිත ප්‍රතිලාභ බැඳීමහි වත්මන් අගයේ ව්‍යාප්තිය | | |
| වසර 1 ට වඩා අඩු | 468,135 | 425,424 |
| වසර 1-2 අතර | 866,925 | 770,005 |
| වසර 3-5 අතර | 1,130,216 | 974,024 |
| වසර 6-10 අතර | 1,432,310 | 1,213,585 |
| වසර 10 ට වැඩි | 3,329,224 | 2,398,226 |
| **එකතුව** | 7,226,810 | 5,781,264 |

| | **2025** % | 2024 % |
|---|---|---|
| **(ඌ) ජීවගණක උපකල්පන** | | |
| වෛද්‍ය පිරිවැය උද්ධමන අනුපාතිකය | 7.00 | 6.50 |
| වට්ටම් අනුපාතිකය | 10.50 | 11.50 |

**(එ) පහත දැක්වෙන උපකල්පනයන්ගේ වැඩිවීම/අඩුවීම මගින් නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගය මත ඇති කෙරෙන බලපෑම පහත පරිදි විස්තරාත්මකව දැක්විය හැකිය.**

| | බැංකුව සහ සමූහය | | | |
|---|---|---|---|---|
| | **2025** | | 2024 | |
| | 1% වැඩිවීම | 1% අඩුවීම | 1% වැඩිවීම | 1% අඩුවීම |
| වෛද්‍ය පිරිවැය ඉහල යෑමේ අනුපාතිකය | 8,280,146 | 6,375,216 | 6,539,494 | 5,158,846 |
| වට්ටම් අනුපාතිකය | 6,428,527 | 8,227,759 | 5,208,970 | 6,486,382 |

### 38. (අ) 4 පාරිතෝෂික සැලසුම - බැංකුව සහ සමූහය

#### බැංකුව

විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය II පිහිටුවීමත් සමග 1995 ඔක්තෝබර් 01 දින හෝ ඊට පසු සේවයට බැඳුණු සේවකයින් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය II හි සාමාජිකයන් වන බැවින්, සේවාවසාන ප්‍රතිලාභ යෝජනා ක්‍රමයෙහි අයිතීන් හා වරප්‍රසාද සඳහා හිමිකම් කියනු නොලබයි. කෙසේ වුවද විශ්‍රාම ප්‍රතිලාභ සඳහා හිමිකම් කීමට ප්‍රථම සේවා පාරිතෝෂික ගෙවීමක් ඇති විට බැංකුව ඒවා මුදල් පදනම යටතේ හඳුනාගනී.

#### සමූහය

පරිපාලිත සමාගම්හි කාර්ය මණ්ඩලය විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් කියනු නොලබයි. එහෙයින් 1983 අංක 12 දරන පාරිතෝෂික පනතෙහි ප්‍රතිපාදන ප්‍රකාර ඔවුන් පාරිතෝෂික සැලසුමෙහි සාමාජිකත්වය අඛණ්ඩව දරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 38. සේවාවසාන ප්‍රතිලාභ බැඳීම් (සම්බන්ධයි)

### 38. (අ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් (සම්බන්ධයි)

### 38. (අ) 4 පාරිතෝෂික සැලසුම - බැංකුව සහ සමූහය (සම්බන්ධයි)

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025** රු. '000 | 2024 රු. '000 | **2025** රු. '000 | 2024 රු. '000 |
| **(අ) ශුද්ධ ප්‍රතිලාභ වියදම් (සේවක මණ්ඩල වියදම් යටතේ හඳුනාගත්)** | | | | |
| ප්‍රවර්තන සේවා පිරිවැය | – | – | 1,488 | 36,804 |
| ප්‍රතිලාභ බැඳීම් මත පොළී පිරිවැය | – | – | 4,314 | 4,153 |
| **ශුද්ධ ප්‍රතිලාභ වියදම්** | – | – | 5,802 | 40,957 |
| **(ආ) සේවා පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන** | | | | |
| ජනවාරි 01 දිනට නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් | – | – | 107,539 | 68,707 |
| පොළී වියදම | – | – | 4,314 | 4,153 |
| ප්‍රවර්තන සේවා පිරිවැය | – | – | 1,488 | 36,804 |
| ගෙවූ ප්‍රතිලාභ | – | – | (94,308) | (2,125) |
| බැඳීම් මත ජීවගණක (ලාභ)/අලාභ (වෙනත් විස්තීර්ණ ආදායම්හි හඳුනාගත්) | – | – | (183) | – |
| **දෙසැම්බර් 31 දිනට නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්** | – | – | 18,850 | 107,539 |

| | ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි | | ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව | |
|---|---|---|---|---|
| | **2025** % | 2024 % | **2025** % | 2024 % |
| **(ඇ) ජීවගණක උපකල්පන** | | | | |
| ඉදිරි වාර්ෂික වැටුප් වර්ධක අනුපාතිකය | 10.00 | 10.00 | 10.00 | 10.00 |
| වට්ටම් අනුපාතිකය | 10.00 | 11.00 | 13.00 | 13.00 |
| මර්ත්‍යතාව | – | – | A67/70 | A67/70 |

### සේවක පිරිවැටුම් අනුපාතිකය සහ ඉදිරි සේවා කාලයෙහි සාමාන්‍යය

| | ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි - 2025 | | |
|---|---|---|---|
| වයස් කාණ්ඩය | 25-34 | 35-44 | 45< |
| සේවක පිරිවැටුම් අනුපාතිකය (%) | 0% | 0% | 0% |
| ඉදිරි සේවා කාලයෙහි සාමාන්‍යය - වර්ෂ | 32 | 21 | 10 |

**(අෑ) පහත දැක්වෙන උපකල්පනයන්ගේ වැඩිවීම/අඩුවීම මගින් නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගය මත ඇති කෙරෙන බලපෑම පහත පරිදි විස්තරාත්මකව දැක්විය හැකිය.**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන්, භාවිතා කරන මූල්‍ය සහ මූල්‍ය නොවන උපකල්පනවල වෙනස්කම් වලට ඉතා සංවේදී වේ නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්හි වර්තමාන අගය (PVDBO) සඳහා ශුද්ධ බලපෑම පහත දැක්වේ.

| | ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි | | | |
|---|---|---|---|---|
| | **2025** | | 2024 | |
| | **1% වැඩිවීම** | **1% අඩුවීම** | 1% වැඩිවීම | 1% අඩුවීම |
| ඉදිරි වාර්ෂික වැටුප් වර්ධක අනුපාතිකය | 2,155 | (1,852) | 1,146 | (1,020) |
| වට්ටම් අනුපාතිකය | (1,837) | 2,176 | (1,002) | 1,146 |

### උපකල්පන

මූල්‍ය උපකල්පන - වට්ටම් අනුපාතිකය, වැටුප් වර්ධක අනුපාතිකය

ජනවිකාස මත පදනම්වූ උපකල්පන - මර්ත්‍යතාව, සේවක පිරිවැටුම, ආබාධිතබව, විශ්‍රාම ගැනීමේ වයස

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 39 ප්‍රවර්තන බදු වගකීම්

| දෙසැම්බර් 31 දිනට | බැංකුව 2025 රු. '000 | බැංකුව 2024 රු. '000 | සමූහය 2025 රු. '000 | සමූහය 2024 රු. '000 |
|---|---|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | 3,648,729 | – | 4,054,844 | 305,869 |
| ලැබිය යුතු බදු (රඳවා ගැනීමේ බදු) | (68,655) | (60,351) | (80,280) | (192,812) |
| පෙර වර්ෂය සඳහා ගැලපීම් | (17,310) | – | 65,956 | – |
| වර්ෂය සඳහා අයකිරීම් | 17,929,245 | 8,935,497 | 18,432,446 | 9,770,215 |
| වර්ෂය තුළ ගෙවීම් | (13,008,193) | (5,035,397) | (13,674,766) | (5,637,408) |
| බදු ලැබිය යුතු දෑ වලින්/වලට මාරුකිරීම | – | (191,020) | – | (191,020) |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | 8,483,816 | 3,648,729 | 8,798,200 | 4,054,844 |

## 40 වෙනත් ප්‍රතිපාදන

2025 දෙසැම්බර් 31 දිනට වෙනත් ප්‍රතිපාදන යටතේ හෙළිදරව් කිරීමට අගයක් නොමැත.

## 41 වෙනත් වගකීම්

**ගිණුම්කරණ ප්‍රතිපත්ත**

පොලී, ගාස්තු සහ වියදම්, වැටුප් ආශ්‍රිත හා වෙනත් වියදම් සඳහා සිදු කරනු ලබන ප්‍රතිපාදන වෙනත් වගකීම් යටතට අයත්වේ. වාර්තාකරණ දිනට ගෙවියයුතු අගයන් අනුව මෙම වගකීම් වාර්තා ගත කර ඇත.

| දෙසැම්බර් 31 දිනට | බැංකුව 2025 රු. '000 | බැංකුව 2024 රු. '000 | සමූහය 2025 රු. '000 | සමූහය 2024 රු. '000 |
|---|---|---|---|---|
| විවිධ ණයහිමියෝ | 183,754 | 333,659 | 185,310 | 335,283 |
| ගෙවිය යුතු පොලී | – | – | 70,204 | 68,926 |
| ගෙවිය යුතු වැටුප් ආශ්‍රිත දෑ | 2,930,988 | 2,866,461 | 2,931,693 | 2,867,111 |
| ගෙවිය යුතු වෙනත් බදු | 1,762,105 | 599,583 | 1,768,435 | 640,292 |
| ගෙවිය යුතු - වෙනත් | 12,658,110 | 5,202,406 | 5,593,409 | 5,475,633 |
| **එකතුව** | 17,534,957 | 9,002,109 | 10,549,051 | 9,387,245 |

## 42 පරිපාලිත සමාගම් වෙත ගෙවිය යුතු

| දෙසැම්බර් 31 දිනට | බැංකුව 2025 රු. '000 | බැංකුව 2024 රු. '000 | සමූහය 2025 රු. '000 | සමූහය 2024 රු. '000 |
|---|---|---|---|---|
| එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගමට ගෙවිය යුතු | – | – | – | – |
| **එකතුව** | – | – | – | – |

පිටු අංක 389 පාලිත සමාගම් ගනුදෙනු – සටහන් අංක 49.3 වෙත යොමුවන්න.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 43 ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| **අනුමත කළ** | | | | |
| ජනවාරි 01 දිනට එකක් රු. 10/- බැගින් වූ සාමාන්‍ය කොටස් බිලියන 01 | 10,000,000 | 10,000,000 | 10,000,000 | 10,000,000 |
| **නිකුත් කළ හා ගෙවා නිමි ශේෂය ජනවාරි 01 දිනට** | | | | |
| එකක් රු. 10/- බැගින් වූ සාමාන්‍ය කොටස් මිලියන 940 | 9,400,000 | 9,400,000 | 9,400,000 | 9,400,000 |
| **වර්ෂය තුළ සාමාන්‍ය කොටස් නිකුතුව** | – | – | – | – |
| **එකතුව** | 9,400,000 | 9,400,000 | 9,400,000 | 9,400,000 |

## 44 ව්‍යවස්ථාපිත සංචිත අරමුදල

1988 අංක 30 දරණ බැංකු පනතෙහි 20 (1) වගන්තියෙහි දැක්වෙන උපදෙස් පරිදි ව්‍යවස්ථාපිත අරමුදල පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව බැංකුවේ ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් 50% කට සමාන වන තෙක් ලාභාංශ ප්‍රකාශයට පත් කිරීමට හෝ ලාභය වෙනත් ස්ථානයකට මාරු කිරීමට පෙර බදු පසු ලාභයෙන් 5% ක් ද, ඉන් අනතුරුව එම සංචිත අරමුදල බැංකුවේ ප්‍රකාශිත ප්‍රාග්ධනයට සමාන වනතෙක් එම ලාභයෙන් 2% ක්ද වශයෙන් වෙන් කරමින් ව්‍යවස්ථාපිත සංචිත අරමුදල ගොඩනගනු ඇත. 1988 අංක 30 දරණ බැංකු පනතෙහි 20 (2) වගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති අරමුණු සඳහා පමණක් ව්‍යවස්ථාපිත සංචිත අරමුදලෙහි ශේෂය භාවිතා කරනු ලැබේ.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| ආරම්භක ශේෂය | 5,694,877 | 5,369,172 | 5,810,742 | 5,464,218 |
| වර්ෂය තුළ මාරුකිරීම් - බදු පසු ලාභයෙන් 2% | 546,415 | 325,705 | 554,146 | 346,524 |
| **අවසන් ශේෂය** | 6,241,292 | 5,694,877 | 6,364,888 | 5,810,742 |

## 45 රඳවාගත් ඉපයීම්

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| ජනවාරි 01 දිනට ශේෂය | 28,462,305 | 14,408,118 | 33,771,814 | 18,605,719 |
| වර්ෂය සඳහා ලාභය | 27,320,758 | 16,122,392 | 28,162,552 | 17,496,961 |
| වෙනත් විස්තිර්ණ ආදායම් | (2,605,851) | (1,742,500) | (2,326,060) | (1,744,798) |
| සංචිත වෙත මාරු කිරීම් (ව්‍යවස්ථාපිත/වෙනත්) | (546,415) | (325,705) | (725,940) | (586,068) |
| දේපළ ප්‍රත්‍යාගණන අතිරික්තය/ (ආපසු හැරවීම්) | 3,030 | – | 3,030 | – |
| ලාභාංශ/අයබදු | (6,088,296) | – | (6,088,296) | – |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | 46,545,531 | 28,462,305 | 52,797,100 | 33,771,814 |

* කරුණාකර සටහන 53 සංසන්දනාත්මක සංඛ්‍යා බලන්න

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 46 වෙනත් සංචිත

| | බැංකුව | | |
|---|---|---|---|
| | 01 ජනවාරි 2025 දිනට ආරම්භක ශේෂය රු. '000 | සංචලනවීම්/මාරුකිරීම් රු. '000 | 31 දෙසැම්බර් 2025 දිනට අවසාන ශේෂය රු. '000 |
| පොදු සංචිතය | 37,740,877 | – | 37,740,877 |
| ප්‍රත්‍යාගණන සංචිතය (ශුද්ධ බදු) | 7,946,216 | (3,030) | 7,943,186 |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය | 4,213,302 | 1,358,693 | 5,571,995 |
| විදේශ විනිමය පරිවර්තන සංචිතය | – | – | – |
| අනෙකුත් සංචිත (සටහන් 46.1, 46.2) | 5,385,038 | 222,708 | 5,607,746 |
| **එකතුව** | 55,285,433 | 1,578,371 | 56,863,804 |

| | බැංකුව | | |
|---|---|---|---|
| | 01 ජනවාරි 2024 දිනට ආරම්භක ශේෂය රු. '000 | සංචලනවීම්/මාරුකිරීම් රු. '000 | 31 දෙසැම්බර් 2024 දිනට අවසාන ශේෂය රු. '000 |
| පොදු සංචිතය | 37,740,877 | – | 37,740,877 |
| ප්‍රත්‍යාගණන සංචිතය (ශුද්ධ බදු) | 7,946,216 | – | 7,946,216 |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය | 1,286,463 | 2,926,839 | 4,213,302 |
| විදේශ විනිමය පරිවර්තන සංචිතය | – | – | – |
| අනෙකුත් සංචිත (සටහන් 46.1, 46.2) | 5,223,407 | 161,631 | 5,385,038 |
| **එකතුව** | 52,196,963 | 3,088,470 | 55,285,433 |

| | සමූහය | | |
|---|---|---|---|
| | 01 ජනවාරි 2025 දිනට ආරම්භක ශේෂය රු. '000 | සංචලනවීම්/මාරුකිරීම් රු. '000 | 31 දෙසැම්බර් 2025 දිනට අවසාන ශේෂය රු. '000 |
| පොදු සංචිතය | 37,740,877 | – | 37,740,877 |
| ප්‍රත්‍යාගණන සංචිතය (ශුද්ධ බදු) | 8,642,884 | (3,030) | 8,639,854 |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය | 4,566,424 | 1,061,881 | 5,628,305 |
| විදේශ විනිමය පරිවර්තන සංචිතය | – | – | – |
| අනෙකුත් සංචිත (සටහන 46.1, 46.2, 46.3) | 6,902,054 | 394,502 | 7,296,556 |
| **එකතුව** | 57,852,239 | 1,453,353 | 59,305,592 |

| | සමූහය | | |
|---|---|---|---|
| | 01 ජනවාරි 2024 දිනට ආරම්භක ශේෂය රු. '000 | සංචලනවීම්/මාරුකිරීම් රු. '000 | 31 දෙසැම්බර් 2024 දිනට අවසාන ශේෂය රු. '000 |
| පොදු සංචිතය | 37,740,877 | – | 37,740,877 |
| ප්‍රත්‍යාගණන සංචිතය (ශුද්ධ බදු) | 8,642,884 | – | 8,642,884 |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය | 1,433,850 | 3,132,574 | 4,566,424 |
| විදේශ විනිමය පරිවර්තන සංචිතය | – | – | – |
| අනෙකුත් සංචිත (සටහන 46.1, 46.2, 46.3) | 6,500,879 | 401,175 | 6,902,054 |
| **එකතුව** | 54,318,490 | 3,533,749 | 57,852,239 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 46. වෙනත් සංචිත (සම්බන්ධයි)

### 46.1 හිමිකම් නොපෑ තැන්පතු සංචිතය

| දෙසැම්බර් 31 දිනට | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| ආරම්භක ශේෂය | 5,382,857 | 5,221,226 | 5,382,857 | 5,221,226 |
| කොටස් ප්‍රාග්ධනයට මාරුකිරීම් | – | – | – | – |
| වර්ෂය තුළ මාරුකිරීම් | 222,708 | 161,631 | 222,708 | 161,631 |
| **අවසාන ශේෂය** | 5,605,565 | 5,382,857 | 5,605,565 | 5,382,857 |

1995 අංක 28 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 30 වන වගන්තියෙන් සංශෝධිත 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 47 වන වගන්තිය ප්‍රකාර දස වසරක කාලයක් ඉතුරුම් තැන්පතු හෝ ස්ථාවර තැන්පතු ගිණුමක නිශ්ක්‍රීයව පවතින අරමුදල්, හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරු කළ යුතුය. ඒ අනුව 2025 වර්ෂය තුළ රු. මි. 222.7 ක ශුද්ධ අගයක් එම සංචිතයට මාරු කර තිබේ.

### 46.2 විශේෂ සංචිතය

| දෙසැම්බර් 31 දිනට | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| ආරම්භක ශේෂය | 2,181 | 2,181 | 2,181 | 2,181 |
| වර්ෂය තුළ මාරුකිරීම් | – | – | – | – |
| **අවසාන ශේෂය** | 2,181 | 2,181 | 2,181 | 2,181 |

නිශ්ක්‍රීය අරමුදල් එකතුව රු. 10/- ට වඩා අඩු අවස්ථාවලදී ගනුදෙනුකරුවන්ගේ නිදි ගිණුම්වලින් මාරු කරන අරමුදල්, විශේෂ සංචිතය මගින් නියෝජනය වෙයි.

විශේෂ සංචිත හා හිමිකම් නොපෑ සංචිත ප්‍රාග්ධනීකරණය කළහැකි අතර, එලෙස ප්‍රාග්ධනීකෘත අගයට සරිලන කොටස් භාණ්ඩාගාර ලේකම් නමට නිකුත් කළ හැකිය. නිකුත් කළ සහ ගෙවා නිමි කොටස් ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි පිළිබිඹු වන රු. මි. 9400 ක කොටස් ප්‍රාග්ධනය හිමිකම් නොපෑ තැන්පතු සංචිතය වරින්වර ප්‍රාග්ධනීකරණය තුළින් නිකුත් කරන ලදී.

### 46.3 විශේෂ අවදානම් සංචිතය (එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්)

| දෙසැම්බර් 31 දිනට | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| ආරම්භක ශේෂය | – | – | 1,517,016 | 1,277,472 |
| වර්ෂය තුළ මාරුකිරීම් - බදු පසු ලාභයෙන් 25% | – | – | 171,794 | 239,544 |
| **අවසාන ශේෂය** | – | – | 1,688,810 | 1,517,016 |

ප්‍රාථමික අලෙවිකරු පද්ධතියෙහි අඛණ්ඩතාවය සුරක්ෂිතබව හා ස්ථාවරත්වය වර්ධනය පිණිසත්, ප්‍රාථමික අලෙවිකරු ප්‍රාග්ධන සංචිතය ගොඩනැංවීම සඳහාත් 2004 ජූලි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රාථමික අලෙවිකරුවන් විසින් ඔවුන්ගේ බදු පසු ලාභයෙන් යම් ප්‍රතිශතයක් පහත පරිදි වාර්ෂිකව විශේෂ අවදානම් සංචිතයට මාරු කළ යුතු වේ.

i. රු.මි. 400 ට වඩා අඩු ප්‍රාග්ධන අරමුදලක් පවත්වාගෙන යනු ලබන ප්‍රාථමික අලෙවිකරුවන් විසින් වාර්ෂිකව බදු පසු ලාභයෙන් 50% ක්.

ii. රු.මි. 400 ට වඩා වැඩි ප්‍රාග්ධන අරමුදලක් පවත්වාගෙන යනු ලබන ප්‍රාථමික අලෙවිකරුවන් විසින් වාර්ෂිකව බදු පසු ලාභයෙන් 25% ක්.

### වෙනත් සංචිත

| දෙසැම්බර් 31 දිනට | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| වෙනත් සංචිත එකතුව | 5,607,746 | 5,385,038 | 7,296,556 | 6,902,054 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 47 පාලනය යටත් නොවන හිමිකම

බැංකුව සතුව සම්පූර්ණ හිමිකම සහිත පරිපාලිත සමාගම් දෙකක් ඇති අතර පාලනයට යටත් නොවන හිමිකම යටතේ හෙලිදරව් කිරීමට කිසිවක් නොමැත.

## 48 අසම්භාව්‍ය වගකීම් හා බැඳීම්

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ශ්‍රී.ල.ගි.ප්‍ර. 37 හි නිර්වචිත ආකාරයට අවිනිශ්චිත අනාගත සිදුවීමක් මගින් පැවැත්ම තහවුරු කෙරෙන අතීත සිදුවීම් වලින් පැන නැගිය හැකි බැඳීමක් හෝ ආර්ථික ප්‍රතිලාභ ගලායාමේ භව්‍යතාවයක් නොමැති හෝ බැඳීමේ ප්‍රමාණය විශ්වාසනීය ලෙස මැනිය නොහැකි ප්‍රවර්තන බැඳීමක්, අසම්භාව්‍ය වගකීමක් ලෙස හැඳින්වේ.

ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය අවශ්‍යතා සපුරාලනු පිණිස, බැංකුව ආපසු හැරවිය නොහැකි විවිධ බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම්වලට සම්බන්ධ වේ. මේ අතර මූල්‍ය ඇපකර, ණයවර ලිපි සහ ණයදීම සඳහා වෙනත් ලබා නොගත් බැඳීම් ඇතුලත් වේ. ණයවර ලිපි සහ ඇපකර මගින් සාමාන්‍යයෙන් ආනයනයට හෝ අපනයනයට අදාළ නිශ්චිත කටයුතු වලදී ගනුදෙනුකරුවන් වෙනුවෙන් ගෙවීම් සිදු කිරීමට බැංකුව වෙත බැඳීමක් ඇති කරයි. ණය සම්බන්ධයෙන් එක හා සමාන අවදානමක් ඇපකර සහ ණය පොරොත්තු ලිපි මඟින් ඇති කෙරෙයි.

අසම්භාව්‍ය වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ හඳුනාගෙන නොමැති අතර, එම සිදුවීම විරල නොවන විට මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර ඇත.

| | | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | සටහන් | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| **බැඳීම්** | | | | | |
| භාවිතයට නොගත් ණය පහසුකම් වෙත බැඳීම් | | 2,648,208 | 3,459,333 | 2,648,208 | 3,459,333 |
| වෙනත් බැඳීම් – වක්‍ර ණය පහසුකම් | | 481,774 | 1,043,688 | 481,774 | 1,043,688 |
| ප්‍රාග්ධන බැඳීම් | 48.1 | 1,502,302 | 619,267 | 1,503,802 | 627,575 |
| **උප එකතුව** | | 4,632,284 | 5,122,288 | 4,633,784 | 5,130,596 |
| **අසම්භාව්‍ය වගකීම්** | | | | | |
| සංලේඛන ණය | | 65,792 | – | 65,792 | – |
| බැංකු ඇපකර | | 1,467,204 | 1,295,768 | 1,467,204 | 1,295,768 |
| වෙනත් අසම්භාව්‍යතා | 48.2 | 6,488,663 | 8,624,391 | 6,488,663 | 8,624,391 |
| **උප එකතුව** | | 8,021,659 | 9,920,159 | 8,021,659 | 9,920,159 |
| **බැඳීම් සහ අසම්භාව්‍යතා එකතුව** | | 12,653,943 | 15,042,447 | 12,655,443 | 15,050,755 |

### 48.1 ප්‍රාග්ධන බැඳීම්

මූල්‍ය ප්‍රකාශයන්හි ප්‍රතිපාදන වෙන් නොකරන ලද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ ප්‍රාග්ධන වියදම් පහත පරිදි වේ.

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| **දේපළ පිරියත හා උපකරණවලට සම්බන්ධ බැඳීම්** | | | | |
| අනුමත කළ සහ ගිවිසුම්ගත කල | 975,547 | 12,040 | 975,547 | 12,040 |
| අනුමත කළ නමුත් ගිවිසුම්ගත නොකල | – | – | – | – |
| **උප එකතුව** | 975,547 | 12,040 | 975,547 | 12,040 |
| **අස්පෘශ්‍ය වත්කම් සම්බන්ධ බැඳීම්** | | | | |
| අනුමත කළ සහ ගිවිසුම්ගත කල | 526,755 | 607,227 | 528,255 | 615,535 |
| අනුමත කළ නමුත් ගිවිසුම්ගත නොකල | – | – | – | – |
| **උප එකතුව** | 526,755 | 607,227 | 528,255 | 615,535 |
| **එකතුව** | 1,502,302 | 619,267 | 1,503,802 | 627,575 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 48. අසම්භාව්‍ය වගකීම් හා බැඳීම් (සම්බන්ධයි)

### 48.2 වෙනත් අසම්භාව්‍යතා

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| **විදේශ විනිමය ව්‍යුත්පන්න** | | | | |
| මුදල් හුවමාරු ගිවිසුම් | 6,173,400 | – | 6,173,400 | – |
| විදේශ විනිමය ඉදිරි ගිවිසුම් | 315,263 | 8,624,391 | 315,263 | 8,624,391 |
| **එකතුව** | 6,488,663 | 8,624,391 | 6,488,663 | 8,624,391 |

### 48.3 අසම්භාව්‍ය වගකීම් හා බැඳීම් විශ්ලේෂණය

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| **නිමැවුම අනුව – දේශීය මුදල් ඒකකය** | | | | |
| උපයෝජනය නොකළ ණය පහසුකම් | 2,648,208 | 3,459,333 | 2,648,208 | 3,459,333 |
| සංලේඛන ණය | 65,792 | – | 65,792 | – |
| බැංකු ඇපකර | 1,467,204 | 990,116 | 1,467,204 | 990,116 |
| විදේශ විනිමය ඉදිරි ගිවිසුම් | 6,173,400 | 8,331,516 | 6,173,400 | 8,331,516 |
| වෙනත් බැඳීම් | 989,579 | 25,519 | 991,079 | 33,827 |
| **උප එකතුව** | 11,344,183 | 12,806,484 | 11,345,683 | 12,814,792 |
| **නිමැවුම අනුව - විදේශීය මුදල් ඒකකය** | | | | |
| උපයෝජනය නොකළ ණය පහසුකම් | – | – | – | – |
| සංලේඛන ණය | – | – | – | – |
| බැංකු ඇපකර | – | 305,652 | – | 305,652 |
| විදේශ විනිමය ඉදිරි ගිවිසුම් | 315,263 | 292,875 | 315,263 | 292,875 |
| වෙනත් බැඳීම් | 994,497 | 1,637,436 | 994,497 | 1,637,436 |
| **උප එකතුව** | 1,309,760 | 2,235,963 | 1,309,760 | 2,235,963 |
| **එකතුව** | 12,653,943 | 15,042,447 | 12,655,443 | 15,050,755 |

### 48.4 තවමත් සම්පූර්ණ කර නොමැති බදු තක්සේරු

- බැංකුවට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ආදායම් බදු තක්සේරු ලැබී ඇති අතර, ඒවා දැනට අභියාචනා කොමිසම ඉදිරියේ පවතී. අහිතකර තීරණයකින් පැන නගින ඕනෑම විභව වගකීම් පියවා ගැනීමට බැංකුව සතුව ප්‍රමාණවත් බදු බැර තිබේ. ඒ අනුව, මෙම තක්සේරුකරණයන්හි අවසාන විසඳුම බැංකුවේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 49 සම්බන්ධිත පාර්ශ්වයන්ට අදාළ හෙළිදරව් කිරීම්

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි ශ්‍රී.ල.ගි.ප්‍ර. 24 - සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම්, අනුව සම්බන්ධිත පාර්ශ්ව ලෙස නිර්වචනය කර ඇති (ශ්‍රී ලංකා රජය, පාලිත සමාගම්, සේවාවසාන ප්‍රතිලාභ සැලසුම්, ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMP), ප්‍රධාන කළමණාකරණ පිරිස්හි පවුලේ සමීප සාමාජිකයන් සහ වෙනත් අදාළ පාර්ශ්ව සමඟ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී බැංකුව විසින් අතේ දුරින් ගනුදෙනු සඳහා එළැඹී ඇත. සහනදායී අනුපාතික යටතේ සියලුම කාර්ය මණ්ඩලයට පොදුවේ අදාළ වන යෝජනා ක්‍රම යටතේ, ප්‍රධාන කළමනාකරණ පිරිස් විසින් සිදු කරන ලද ගනුදෙනු හැර සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම ශ්‍රී.ල.ගි.ප්‍ර. 24 අනුව සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් ලෙස නිර්වචනය කරනු ලබන පාර්ශ්ව සමඟ (එනම්, ශ්‍රී ලංකා රජය, පරිපාලිත සමාගම්, බැංකු සේවකයන් සඳහා වූ සේවාවසාන ප්‍රතිලාභ සැලසුම්, ප්‍රධාන කළමනාකාරිත්ව පිරිස් යනාදිය) බැංකුව විසින් වාණිජ අනුපාතිකයන් ප්‍රකාර සාමාන්‍ය ව්‍යාපාරික ගනුදෙනු ක්‍රියාත්මක කරන ලදී. එම ගනුදෙනුවලට ණයදීමේ ක්‍රියාකාරකම්, ස්ථානගත කිරීම්, පිටත ගනුදෙණු හා වෙනත් බැංකු හා මූල්‍ය ජෛව ප්‍රතිපාදන ඇතුලත් අතර පොදුවේ සියලුම කාර්ය මණ්ඩලයට අදාළ වන යෝජනා ක්‍රම වන සහනදායී පොලී යටතේ ණය හැර අනෙකුත් ගනුදෙනු අතේ දුරින් කළ ගනුදෙනු වේ.

### 49.1 පරිපාලකය හා පූර්ණ පාලන හිමිකම ඇති පාර්ශ්වය

ජාතික ඉතිරිකිරීමේ බැංකුව රජයට අයත් බැංකුවකි.

### 49.2 ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMP) සහ ප්‍රධාන කළමණාකරණ පිරිස්හි පවුලේ සමීප සාමාජිකයන්

LKAS 24 -සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම ට අනුව, ප්‍රධාන කළමණාකාරිත්ව පාර්ශ්ව යනු බැංකුවේ කටයුතු සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම සඳහා බලය හා වගකීම ඇති පාර්ශ්වයි. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය සහ ආයතනික කළමණාකාරිත්වයේ ප්‍රධාන සාමාජිකයන් ඉහත නිර්ණායක සපුරාලන පාර්ශ්ව ප්‍රධාන කළමණාකාරිත්ව පාර්ශ්ව ලෙස හඳුනා ගැනේ.

"පවුලේ සමීප සමාජිකයන්" ලෙස අර්ථ දක්වන්නේ ප්‍රධාන කළමණාකාරිත්ව පාර්ශ්වයන් ආයතනය සමඟ ගනුදෙනු කිරීමේදී බලපෑම් කළ හැකි හෝ බලපෑම් කිරීමට අපේක්ෂා කළ හැකි ප්‍රධාන කළමණාකාරිත්ව පාර්ශ්වයන්ගේ කාලාත්‍රයා හා යැපෙන්නන් වැනි පවුලේ සාමාජිකයන්ය.

#### 49.2.1 ප්‍රධාන කළමනාකාරිත්ව පිරිස් වෙත ගෙවීම

| | බැංකුව | |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2025 රු. '000** | 2024 රු. '000 |
| **බැංකුවේ ප්‍රධාන කළමනාකාරිත්ව පිරිස් වෙත ගෙවීම්** | | |
| කෙටිකාලීන සේවක ප්‍රතිලාභ | 330,339 | 208,853 |
| සේවාවසාන ප්‍රතිලාභ සැලසුම | 89,027 | 18,733 |
| **එකතුව** | 419,366 | 227,586 |

ඉහත ගෙවීම්වලට අමතරව බැංකුවේ අනුමත ප්‍රතිලාභ සැලසුම් ප්‍රකාර බැංකුව විසින් ප්‍රධාන කළමනාකාරිත්ව පිරිස් වෙත මූල්‍යමය නොවන ප්‍රතිලාභ ද සලසා ඇත.

#### 49.2.2 ප්‍රධාන කළමණාකාරිත්ව පිරිස් හා ඔවුන්ගේ පවුලේ සමීප සමාජිකයන් සම්බන්ධ ගනුදෙනු, වැඩපිළිවෙල හා ගිවිසුම්

(අ) ආදායම් ප්‍රකාශයේ ඇති අයිතම – බැංකුව

| | ප්‍රධාන කළමණාකාරිත්ව පිරිස් හා ඔවුන්ගේ පවුලේ සමීප සමාජිකයන් | |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2025 රු. '000** | 2024 රු. '000 |
| පොලී ආදායම | 8,224 | 8,607 |
| පොලී වියදම | 17,417 | 22,552 |
| ප්‍රධාන කළමනාකාරිත්ව පිරිස් වෙත ගෙවීම් | 419,366 | 227,586 |

(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇති අයිතම – බැංකුව

| | ප්‍රධාන කළමණාකාරිත්ව පිරිස් හා ඔවුන්ගේ පවුලේ සමීප සමාජිකයන් | |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 |
| **වත්කම්** | | |
| ණය හා අත්තිකාරම් | 225,602 | 233,691 |
| **වගකීම්** | | |
| තැන්පත්කරුවන්ට ගෙවිය යුතු | 228,581 | 173,414 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 49. සම්බන්ධිත පාර්ශ්වයන්ට අදාළ හෙළිදරව් කිරීම් (සම්බන්ධයි)

### 49.2 ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMP) සහ ප්‍රධාන කළමණාකරණ පිරිස්හි පවුලේ සමීප සාමාජිකයන් (සම්බන්ධයි)

#### 49.2.2 ප්‍රධාන කළමණාකාරිත්ව පිරිස් හා ඔවුන්ගේ පවුලේ සමීප සමාජිකයන් සම්බන්ධ ගනුදෙනු, වැඩපිළිවෙල හා ගිවිසුම් (සම්බන්ධයි)

(අ) ශේෂ පත්‍රයේ ඇතුළත් නොවන අයිතම – බැංකුව

| | ප්‍රධාන කළමණාකාරිත්ව පිරිස් හා ඔවුන්ගේ පවුලේ සමීප සමාජිකයන් | |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 |
| උපයෝජනය නොකළ බැඳීම් | – | – |

(ඇ) ණය ලබාදීම් හා තැන්පතුවල සාමාන්‍ය – බැංකුව

| | ප්‍රධාන කළමණාකාරිත්ව පිරිස් හා ඔවුන්ගේ පවුලේ සමීප සමාජිකයන් |
|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** |
| **වත්කම්** | |
| ණය හා අත්තිකාරම් | 229,646 |
| තැන්පත්කරුවන්ට ගෙවිය යුතු | 200,998 |

(ඉ) ප්‍රධාන කළමණාකාරිත්ව පිරිස් හා ඔවුන්ගේ පවුලේ සමීප සාමාජිකයන්ට ලබාදුන් ශුද්ධ ප්‍රතියෝජනය – බැංකුව

(ශ්‍රී ලංකා මහ බැංකුවෙන් නිකුත් කරන ලද 2024 අංක 05 දරන ආයතනික යහපාලන විධානයේ අංක 9 (2) (ඉ) ට අනුව හෙළිදරව් කිරීමකි.)

| | ප්‍රධාන කළමණාකාරිත්ව පිරිස් හා ඔවුන්ගේ පවුලේ සමීප සමාජිකයන් | |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 |
| **ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වෙත ලබාදුන්** | | |
| ණය හා අත්තිකාරම් | 225,602 | 233,691 |
| ශුද්ධ ප්‍රතියෝජන එකතුව | 225,602 | 233,691 |
| නියාමන ප්‍රාග්ධනය | 89,486,872 | 75,660,059 |
| **ශුද්ධ ප්‍රතියෝජනය, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙහි ප්‍රතිශතයක් ලෙස (%)** | 0.3 | 0.3 |

### 49.3 පරිපාලිත සමාගම්

#### 49.3.1 පරිපාලිත සමාගම් සම්බන්ධ ගනුදෙනු, වැඩපිළිවෙල හා ගිවිසුම්

වර්ෂය තුළ ගණුදෙනුවලින් පැන නගින සමස්ත ආදායම් හා වියදම් ප්‍රමාණය, අදාළ පාර්ශ්වයන්ගෙන් අයවිය යුතු ප්‍රමාණය සහ වසර අවසානයේ ශේෂ පත්‍රයෙන් බැහැර ගණුදෙනුවල මුළු එකතුව පහත සාරාංශගත කර ඇත.

(අ) ආදායම් ප්‍රකාශයේ ඇති අයිතම – බැංකුව

| | පරිපාලිත සමාගම් | |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2025 රු. '000** | 2024 රු. '000 |
| පොලී ආදායම | 66,869 | 117,630 |
| වෙනත් ආදායම | 8,602 | 7,621 |
| පොලී වියදම | 1,033 | 13 |
| වෙනත් වියදම | 300 | 300 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 49. සම්බන්ධිත පාර්ශ්වයන්ට අදාළ හෙළිදරව් කිරීම් (සම්බන්ධයි)

### 49.3 පරිපාලිත සමාගම් (සම්බන්ධයි)

#### 49.3.1 පරිපාලිත සමාගම් සම්බන්ධ ගනුදෙනු, වැඩපිළිවෙල හා ගිවිසුම් (සම්බන්ධයි)

(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇති අයිතම – බැංකුව

| | පරිපාලිත සමාගම් | |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 |
| **වත්කම්** | | |
| ණය හා අත්තිකාරම් | – | – |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදී ගත් සුරැකුම්පත් | 796,177 | 5,491,547 |
| වෙනත් ලැබීම් | 2,751 | 2,684 |
| **එකතුව** | 798,928 | 5,494,231 |
| **වගකීම්** | | |
| තැන්පත්කරුවන්ට ගෙවිය යුතු | 4,308 | 146 |
| ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකිණූ සුරැකුම්පත් | – | – |
| වෙනත් ගෙවීම් | 7,210,629 | – |
| **එකතුව** | 7,214,937 | 146 |

(ඇ) ශේෂ පත්‍රයේ ඇතුළත් නොවන අයිතම – බැංකුව

| | පරිපාලිත සමාගම් | |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 |
| උපයෝජනය නොකළ බැඳීම් | – | – |

(ඈ) සාමාන්‍ය ප්‍රතියෝජනය/තැන්පත්කරුවන්ට ගෙවිය යුතු – බැංකුව

| | පරිපාලිත සමාගම් |
|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** |
| ණය හා අත්තිකාරම් සහ වෙනත් ලැබීම් | 3,154 |
| තැන්පත්කරුවන්ට ගෙවිය යුතු සහ වෙනත් ගෙවීම් | 6,684,729 |

(ඉ) පරිපාලිත සමාගම්වලට ලබාදුන් ශුද්ධ ප්‍රතියෝජනය – බැංකුව

(ශ්‍රී ලංකා මහ බැංකුවෙන් නිකුත් කරන ලද 2024 අංක 05 දරණ ආයතනික යහපාලන විධානයේ අංක 9 (2) (ඉ) ට අනුව හෙළිදරව් කිරීමකි.)

| | පරිපාලිත සමාගම් | |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 |
| ණය හා අත්තිකාරම් සහ වෙනත් ලැබීම් | 798,928 | 5,494,231 |
| ශුද්ධ ප්‍රතියෝජන එකතුව | 798,928 | 5,494,231 |
| නියාමන ප්‍රාග්ධනය | 89,486,872 | 75,660,059 |
| **ශුද්ධ ප්‍රතියෝජනය, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙහි ප්‍රතිශතයක් ලෙස (%)** | 0.9 | 7.3 |

### 49.4 සුවිශේෂී ආයෝජකයන් සම්බන්ධ ගනුදෙනු හා බැංකුවේ සේවාවසාන ප්‍රතිලාභ සැලසුම සමග බැඳුනු ගනුදෙනු

රජය සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන (සුවිශේෂී ආයෝජකයන්) සමඟ බැංකුව විසින් එළඹෙන ගනුදෙනු සහ විධිවිධාන සහ තනි තනිව වැදගත් වන සහ සාමූහිකව, නමුත් තනි තනිව වැදගත් නොවන අනෙකුත් ගනුදෙනු සඳහා සේවාවසාන ප්‍රතිලාභ සැලසුම් පහත පරිදි වේ.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 49. සම්බන්ධිත පාර්ශ්වයන්ට අදාළ හෙළිදරව් කිරීම් (සම්බන්ධයි)

### 49.4 සුවිශේෂී ආයෝජකයන් සම්බන්ධ ගනුදෙනු හා බැංකුවේ සේවාවසාන ප්‍රතිලාභ සැලසුම සමග බැඳුනු ගනුදෙනු (සම්බන්ධයි)

#### 49.4.1 සාමූහික වශයෙන් වැදගත් ගනුදෙනු

##### 49.4.1.1 සුවිශේෂී ආයෝජකයන් සම්බන්ධ ගනුදෙනු, වැඩපිළිවෙල හා ගිවිසුම්

බැංකුව රජයට අයත් ආයතනයක් බැවින් එහි සුවිශේෂී ආයෝජකයා වන්නේ රජයයි. රජය යන්නෙන් ශ්‍රී ලංකා රජය, රජය සංස්ථා, පළාත් සභා, පළාත් පාලන ආයතන, අනෙකුත් රජයේ ආයතන සහ ඒවායේ අනුබද්ධිත සමාගම් අදහස් කෙරේ.

(අ) ආදායම් ප්‍රකාශයේ ඇති අයිතම – බැංකුව

| | සුවිශේෂී ආයෝජකයා | |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2025 රු. '000** | 2024 රු. '000 |
| පොලී ආදායම | 124,087,838 | 117,175,088 |
| වෙනත් ආදයම් | – | – |
| පොලී වියදම | 6,636,675 | 6,234,101 |
| වෙනත් වියදම් | – | – |
| බදු හා සම්බන්ධ වියදම් | 30,805,555 | 18,282,952 |

(ආ) හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ ඇති අයිතම – බැංකුව

| | සුවිශේෂී ආයෝජකයා | |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2025 රු. '000** | 2024 රු. '000 |
| ලාභාංශ ගෙවීම් | 6,088,296 | – |

(ඇ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇති අයිතම - බැංකුව

| | සුවිශේෂී ආයෝජකයා | |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 |
| **වත්කම්** | | |
| ණය හා අත්තිකාරම් | 64,029,732 | 74,342,788 |
| මහ බැංකුව වෙතැති ශේෂයන් | 167,212 | 357,054 |
| රජයේ සුරැකුම්පත් මත කරන ලද ආයෝජන | 1,062,609,791 | 973,281,879 |
| රාජ්‍ය සහ රාජ්‍ය පාලිත ආයතනවල ආයෝජන | 81,120,345 | 129,177,145 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදී ගත් සුරැකුම්පත් | 16,591,559 | 966,088 |
| රජයෙන් සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතනවලින් ලැබිය යුතු අනෙකුත් මුදල් | 21,888,039 | 39,899,777 |
| **එකතුව** | 1,246,406,678 | 1,218,024,731 |
| **වගකීම්** | | |
| තැන්පත්කරුවන්ට ගෙවිය යුතු | 34,145,447 | 54,687,816 |
| ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත් | 2,105,433 | 2,509,798 |
| ණයකර | – | – |
| රජයට සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතනවලට ගෙවිය යුතු අනෙකුත් ගෙවීම් | 8,483,816 | 3,648,729 |
| **එකතුව** | 44,734,696 | 60,846,343 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 49. සම්බන්ධිත පාර්ශ්වයන්ට අදාළ හෙළිදරව් කිරීම් (සම්බන්ධයි)

### 49.4 සුවිශේෂී ආයෝජකයන් සම්බන්ධ ගනුදෙනු හා බැංකුවේ සේවාවසාන ප්‍රතිලාභ සැලසුම සමග බැඳුනු ගනුදෙනු (සම්බන්ධයි)

#### 49.4.1 සාමූහික වශයෙන් වැදගත් ගනුදෙනු (සම්බන්ධයි)

##### 49.4.1.1 සුවිශේෂී ආයෝජකයන් සම්බන්ධ ගනුදෙනු, වැඩපිළිවෙල හා ගිවිසුම් (සම්බන්ධයි)

(අ) ශේෂ පත්‍රයේ ඇතුළත් නොවන අයිතම – බැංකුව

| | සුවිශේෂී ආයෝජකයා | |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 |
| උපයෝජනය නොකළ බැඳීම් | 2,323,970 | 3,323,970 |
| ඉදිරි විනිමය ගිවිසුම් සහ මුදල් හුවමාරු ගිවිසුම් | – | – |
| **එකතුව** | 2,323,970 | 3,323,970 |

(ඉ) ණය ලබාදීම් හා තැන්පතුවල සාමාන්‍ය – බැංකුව

| | සුවිශේෂී ආයෝජකයා |
|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** |
| ණය හා අත්තිකාරම් සහ වෙනත් ලැබීම් | 100,080,168 |
| තැන්පත්කරුවන්ට ගෙවිය යුතු සහ වෙනත් ගෙවීම් | 50,482,904 |

(ඊ) සුවිශේෂී ආයෝජකයන්ට ලබාදුන් ශුද්ධ ප්‍රතියෝජනය – බැංකුව

(ශ්‍රී ලංකා මහ බැංකුවෙන් නිකුත් කරන ලද 2024 අංක 05 දරන ආයතනික යහපාලන විධානයේ අංක 9 (2) (ඉ) ට අනුව හෙළිදරව් කිරීමකි.)

| | සුවිශේෂී ආයෝජකයා | |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 |
| ණය හා අත්තිකාරම් | 64,029,732 | 74,342,788 |
| ශුද්ධ ප්‍රතියෝජන එකතුව | 64,029,732 | 74,342,788 |
| නියාමන ප්‍රාග්ධනය | 89,486,872 | 75,660,059 |
| **ශුද්ධ ප්‍රතියෝජනය, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙහි ප්‍රතිශතයක් ලෙස (%)** | 72 | 98 |

##### 49.4.1.2 බැංකුවේ සේවාවසාන ප්‍රතිලාභ සැලසුම සමග බැඳුනු ගනුදෙනු, වැඩපිළිවෙල හා ගිවිසුම්

සේවාවසාන ප්‍රතිලාභ සැලසුම් යනු බැංකුව විසින් තම සේවකයින් සඳහා රැකියාව අවසානයේදී ප්‍රතිලාභ ලබා දීම සඳහා සකස් කරන ලද වැඩපිළිවෙලයි. ජාතික ඉතිරිකිරීමේ බැංකු සේවක අර්ථසාධක අරමුදල, සේවක විශ්‍රාම වැටුප් අරමුදල 1, සේවක විශ්‍රාම වැටුප් අරමුදල 11 ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ විශ්‍රාමික සේවකයින් සඳහා වෛද්‍ය ආධාර යෝජනා ක්‍රමය සහ වැන්දඹු/වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල ලෙස බැංකුව සේවාවසාන ප්‍රතිලාභ සැලසුම් 05ක් සමඟ ගනුදෙනු කරනු ලබයි.

(අ) ආදායම් ප්‍රකාශයේ ඇති අයිතම - බැංකුව

| | සේවාවසාන ප්‍රතිලාභ සැලසුම | |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2025 රු. '000** | 2024 රු. '000 |
| පොලී ආදායම | 394 | – |
| පොලී වියදම | 252,310 | 349,136 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 49. සම්බන්ධිත පාර්ශ්වයන්ට අදාළ හෙළිදරව් කිරීම් (සම්බන්ධයි)

### 49.4 සුවිශේෂී ආයෝජකයන් සම්බන්ධ ගනුදෙනු හා බැංකුවේ සේවාවසාන ප්‍රතිලාභ සැලසුම සමග බැඳුනු ගනුදෙනු (සම්බන්ධයි)

#### 49.4.1 සාමූහික වශයෙන් වැදගත් ගනුදෙනු (සම්බන්ධයි)

49.4.1.2 බැංකුවේ සේවාවසාන ප්‍රතිලාභ සැලසුම සමග බැඳුනු ගනුදෙනු, වැඩපිළිවෙල හා ගිවිසුම් (සම්බන්ධයි)

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇති අයිතම – බැංකුව

| | සේවාවසාන ප්‍රතිලාභ සැලසුම | |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 |
| **වගකීම්** | | |
| තැන්පත්කරුවන්ට ගෙවිය යුතු | 7,317,473 | 2,922,318 |
| ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත් | 303,000 | 1,300 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | 1,925,000 | 1,925,000 |
| **එකතුව** | 9,545,473 | 4,848,618 |

(ඇ) ණය ලබාදීම් හා තැන්පතුවල සාමාන්‍ය – බැංකුව

| | සේවාවසාන ප්‍රතිලාභ සැලසුම | |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 |
| තැන්පත්කරුවන්ට ගෙවිය යුතු සහ වෙනත් ගෙවීම් | 5,119,896 | 1,461,159 |

#### 49.4.2 වෙන් වෙන් වශයෙන් වැදගත් ගනුදෙනු

බැංකුව රජයට අයත් ආයතනයක් බැවින් හා ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත ප්‍රකාර එහි තැන්පතුවලින් 60%ක් රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කළයුතු වේ. එහෙයින් ඉහත සාමූහිකව නියෝජනය කර ඇති පරිදි දෛනික මෙහෙයුම්වලදී බැංකුව, ශ්‍රී ලංකා රජය හා සැලකිය යුතු ගනුදෙනුවල නිරත වෙයි. දෛනික මෙහෙයුම් හැරුණුවිට වෙන් වෙන් වශයෙන් ගත් කල වැදගත් වන ගනුදෙනු පහත පරිදි වේ.

- ජ්‍යෙෂ්ඨ පුරවැසි තැන්පතු සඳහා සහනාධාරය, ණය සඳහා සහනාධාරය සහ අක්‍රිය තැන්පතු හරහා මහා භාණ්ඩාගාරයට මාරු කරන ලද ලැබිය යුතු මුදල් පියවීම සඳහා වසර තුළ බැංකුවට රුපියල් මිලියන 15,329.40 ක් ලැබී තිබේ.
- වසර තුළ බැංකුව විසින් රු. මිලියන 6,088.30 ක ලාභාංශ ගෙවීමක් (ඒකාබද්ධ අරමුදලට දායකත්වය) හඳුනාගෙන ඇති අතර එයින් රුපියල් බිලියන 5 ක් මුදල් ලෙස ගෙවන ලද අතර ඉතිරි රු. මිලියන 1.088.30 ක් මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල්වලට එරෙහිව හිලව් කරන ලදි.

## 50 සාමාන්‍ය කොටසක ශුද්ධ වත්කම් වටිනාකම

| | බැංකුව | | සමූහය | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 රු. '000** | 2024 රු. '000 | **2025 රු. '000** | 2024 රු. '000 |
| ලවය ලෙස යොදා ගත් වටිනාකම | | | | |
| කොටස් හිමිකරුවන්ගේ අරමුදල | 119,050,627 | 98,842,615 | 127,867,580 | 106,834,795 |
| හරය ලෙස යොදා ගත් සාමාන්‍ය කොටස් සංඛ්‍යාව | | | | |
| මුළු කොටස් ගණන | 940,000 | 940,000 | 940,000 | 940,000 |
| **සාමාන්‍ය කොටසක ශුද්ධ වත්කම් අගය (රු.)** | 126.65 | 105.15 | 136.03 | 113.65 |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 51 බැංකුවට හා සමූහයට විරුද්ධව ඇති නීති කෘත්‍යයන්

බැංකුකරණ ව්‍යාපාරයේ ස්වභාවය අනුව නීති කෘත්‍යයන් යනු නොවැළැක්විය හැකි සිදුවීමකි. එවැනි නෛතික හිමිකම් සමග කටයුතු කිරීම සඳහා බැංකුවට ස්ථාපිත කෙටුම්පතක් ඇත. ප්‍රතිඵලයන්හි නිශ්චිතභාවය සම්බන්ධයෙන් වෘත්තීය උපදෙස් ලබාගත් පසු සහ අලාභයන් සාධාරණ අගයකට තක්සේරු කළ පසු, අදාළ නෛතික හිමිකම්වලින් මූල්‍ය ස්ථාවරයට විය හැකි අහිතකර බලපෑම් සඳහා බැංකුව තම ගිණුම්වලට ගැලපීම් සිදුකරනු ලබයි. ප්‍රතිඵලයන්හි අවිනිශ්චිතභාවය හේතු කොට ගෙන මූල්‍ය ප්‍රකාශනවලට කිසිදු ගැලපීමක් සිදු නොකළ, චර්ෂ අවසානයට ඇති බැංකුවට විරුද්ධ නොවිසඳුනු නඩු පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

| | බැංකුව | |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2025 ගණන** | 2024 ගණන |
| **විනිශ්චය සභා/අධිකරණ** | | |
| කම්කරු විනිශ්චය සභා | 10 | 14 |
| දිස්ත්‍රික් අධිකරණය | 70 | 58 |
| මහාධිකරණය, සිවිල් අභියාචන මහාධිකරණය, පළාත්බද මහාධිකරණය | 5 | 2 |
| අභියාචනාධිකරණය | 3 | 4 |
| ශ්‍රේෂ්ඨාධිකරණය | 3 | – |
| මානව හිමිකම් කොමිසම | 43 | 40 |
| වාණිජ මහාධිකරණය | 1 | 2 |
| බේරුම්කරණය | 2 | 2 |
| කම්කරු දෙපාර්තමේන්තුව | 2 | – |

## 52 මූල්‍ය ප්‍රකාශ වාර්තා කළ දිනට පසු සිදුවීම්

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

වාර්තා කරනු ලබන දින හා මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා අනුමැතිය ලද දින අතර සිදුවන වාසිදායක හා අවාසිදායක සිදුවීම් වාර්තාකරණ දිනට පසු සිදුවීම් ලෙස හැඳින්වේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ල.ගි.ප්‍ර.) 10හි වාර්තා කරන දිනට පසු සිදුවීම් ප්‍රකාර වාර්තා කරනු ලබන දිනට පසු ඇතිවූ සැලකියයුතු සියලුම සිදුවීම් අවශ්‍ය පරිදි සැලකිල්ලට ගෙන සුදුසු ගැලපුම්/හෙළිදරව් කිරීම්, මූල්‍ය ප්‍රකාශයන්හි සිදුකර ඇත.

පහත හෙළිදරව් කරන ලද ඒවා හැරුණු විට මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම අවශ්‍ය වන කිසිඳු තත්ත්වයක් වාර්තා කිරීමේ දිනයේ සිට පැන නැඟී නැත.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව අවශෝෂණය කිරීමේ ක්‍රියාවලිය පරිදි ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ සියලු වත්කම් හා වගකීම්, ශ්‍රී ලංකා මහ බැංකුවේ නියමය ප්‍රකාර ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත පවරා ගැනීමට නියමිත විය.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 53 සංසන්දනාත්මක තොරතුරු

වඩා හොඳ ඉදිරිපත් කිරීමක් ලබාදීම සඳහා වත්මන් වසරේ වර්ගීකරණයට අනුකූලවීම සඳහා සංසන්දනාත්මක තොරතුරු අවශ්‍ය ඕනෑම ස්ථානයක නැවත වර්ගීකරණය කර ඇත.

### 53.1 බෝග රක්ෂණ බද්ද සහ භාවිතයට අයිතිය ඇති වත්කම් මත කල්බදු පොලිය

බෝග රක්ෂණ බද්ද, හිමිකම් වෙන්ස්වීමේ ප්‍රකාශයේ සිට ආදායම් ප්‍රකාශයේ අනෙකුත් මෙහෙයුම් වියදම් දක්වා නැවත වර්ගීකරණය කර ඇති අතර භාවිතයට අයිතිය ඇති වත්කම් මත කල්බදු පොලිය මෙහෙයුම් වියදම් වල සිට පොලී වියදම් දක්වා නැවත වර්ගීකරණය කර ඇත.

| | | බැංකුව | | |
|---|---|---|---|---|
| | සටහන | 2024 විගණනය කරන ලද ශේෂයන් රු. '000 | නැවත වර්ගීකරණය රු. '000 | 2024 නැවත වර්ගීකරණය කරන ලද ශේෂයන් රු. '000 |
| වෙනත් වියදම් | 12 | 7,377,618 | 162,852 *<br>(199,122)**<br>(320,000)*** | 7,021,348 |
| පොලී වියදම් | | 130,966,199 | 199,122** | 131,165,321 |
| ශුද්ධ පොළී ආදායම | 4 | 72,782,075 | (199,122)** | 72,582,953 |
| ආදායම් බදුවලට පෙර ලාභය | | 26,430,676 | (162,852)* | 26,267,824 |
| වර්ෂය සඳහා ලාභය | | 16,285,244 | (162,852)* | 16,122,392 |

| | | සමූහය | | |
|---|---|---|---|---|
| | සටහන | 2024 විගණනය කරන ලද ශේෂයන් රු. '000 | නැවත වර්ගීකරණය රු. '000 | 2024 නැවත වර්ගීකරණය කරන ලද ශේෂයන් රු. '000 |
| වෙනත් වියදම් | 12 | 7,588,394 | 162,852*<br>(202,942)**<br>(320,000)*** | 7,228,304 |
| පොලී වියදම් | | 133,360,073 | 202,942** | 133,563,015 |
| ශුද්ධ පොළී ආදායම | 4 | 75,272,049 | (202,942)** | 75,069,107 |
| ආදායම් බදුවලට පෙර ලාභය | | 28,521,937 | (162,852)* | 28,359,085 |
| වර්ෂය සඳහා ලාභය | | 17,659,813 | (162,852)* | 17,496,961 |

### 53.2 මහා භාණ්ඩාගාරයට ලබාදෙන අත්තිකාරම්හි ක්‍රමක්ෂය හානිකරණ ගාස්තුවලට නැවත වර්ගීකරණය කිරීම

| | | බැංකුව | | |
|---|---|---|---|---|
| | සටහන | 2024 විගණනය කරන ලද ශේෂයන් රු. '000 | නැවත වර්ගීකරණය රු. '000 | 2024 නැවත වර්ගීකරණය කරන ලද ශේෂයන් රු. '000 |
| හානිකරණ වියදම් | 10 | 11,206,056 | 320,000 | 11,526,056 |

| | | සමූහය | | |
|---|---|---|---|---|
| | සටහන | 2024 විගණනය කරන ලද ශේෂයන් රු. '000 | නැවත වර්ගීකරණය රු. '000 | 2024 නැවත වර්ගීකරණය කරන ලද ශේෂයන් රු. '000 |
| හානිකරණ වියදම් | 10 | 11,193,684 | 320,000 | 11,513,684 |

* බෝග රක්ෂණ බදු ගැලපීම

** භාවිතයට අයිතිය ඇති වත්කම් මත කල්බදු පොලිය ගැලපීම

*** මහා භාණ්ඩාගාරයට ලබාදෙන අත්තිකාරම්හි ක්‍රමක්ෂය

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 54 මූල්‍ය අවදානම් කළමනාකරණය

### දළ විශ්ලේෂණය

සමූහය සිය මෙහෙයුම් හේතුවෙන් පැන නගින මූල්‍ය අවදානම් සහ මූල්‍ය නොවන අවදානම් වලට නිරාවරණය වේ. සමූහය මෙම අවදානම් කළමනාකරණය කරන්නේ අවදානම් කළමනාකරණ රාමුව හරහා වන අතර එය ව්‍යාපාර ක්‍රියාත්මක වන පරිසරයේ වෙනස්කම්, වඩා හොඳ පුහුණු ප්‍රවේශයන් සහ නියාමන වෙනස්වීම් වලට සරිලන පරිදි ක්‍රමයෙන් පරිණාමනය කර ගන්නෙමු.

### අවදානම් කළමනාකරණ රාමුව

විවිධ අවදානම් සහ එබඳු අවදානම් හඳුනාගැනීමේ යාන්ත්‍රණ, අවදානම් කළමනාකරණය කිරීමේ සහ අවම කිරීමේ සඵලදායී විධික්‍රම ආවරණය කෙරෙන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි, ජාතික ඉතිරිකිරීමේ බැංකු ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවට අයත් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණයෙන් බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව ආරම්භ වන අතර අවදානම් කළමනාකරණ වගකීම ඉටු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පිහිටුවා ඇත. බැංකුවේ අවදානම් කළමනාකරණ අංශය, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හරහා ස්වාධීනව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි. බැංකුවේ අවදානම් කළමනාකරණයෙහි ප්‍රමාණවත් බව සහ සඵලදායී බව තහවුරු කිරීම පිණිස මෙම කළමනාකරණ කමිටු විසින් අදාළ ව්‍යාපාරික අංශ සහ අවදානම් කළමනාකරණ අංශයෙන් වරින්වර ලැබෙන වාර්තා සුපරීක්ෂාකාරී අවධානයෙන් යුතුව සමාලෝචනයට බඳුන් කරනු ලබයි.

එක් එක් අවදානම් ක්ෂේත්‍ර සඳහා නොසැලෙන අවධානය හා සැලකිල්ලෙන් යුතුව අවදානම් කරුණු සම්බන්ධීකරණය කිරීමට පහත කළමනාකරණ කමිටු වගකීම දරනු ලබයි.

### කළමනාකරණ මට්ටමේ අවදානම් කළමනාකරණ කමිටු

- ණය කමිටුව
- වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව
- මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව
- ආයෝජන කමිටුව
- තොරතුරු ආරක්ෂණ කමිටුව

### වෙනත් කළමනාකරණ කමිටු

- ආයතනික කළමනාකරණ කමිටුව
- තොරතුරු තාක්ෂණ මාර්ගෝපදේශ කමිටුව
- මානව සම්පත් කමිටුව
- ශාඛා මෙහෙයුම් මාර්ගෝපදේශ කමිටුව
- කාර්යසාධන සමාලෝචන කමිටුව
- අලෙවි කමිටුව

අභ්‍යන්තර විගණන අංශය මගින් අවදානම් කළමනාකරණ පාලන හා ක්‍රියාපටිපාටි නිතිපතා හා අහඹු ලෙස සමාලෝචනය කොට ඒවායේ ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත වාර්තා කරනු ලබයි.

### ප්‍රධානතම අවදානම් ප්‍රභේද

| විස්තරය | පාලන ප්‍රතිපත්ති සහ ප්‍රධාන කළමනාකරණ කමිටුව | ප්‍රධාන පාලන සහ අවදානම අවම කිරීමේ උපාය මාර්ග |
|---|---|---|
| **ණය අවදානම**<br>ණය අවදානම යනු ප්‍රතිවිරුද්ධ පාර්ශ්වකරුවෙකු වෙනුවෙන් ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට අපොහොසත්වීමෙන් ඇතිවන පාඩුවයි. සමූහය මූලික වශයෙන් ණය අවදානමට නිරාවරණය වන්නේ<br>• ඇප සහිත දේපළ ණයදීම්<br>• පුද්ගලික ඇපකර මත වෙනත් පාරිභෝගික ණයදීම්<br>• තැන්පතු මත ණයදීම්<br>• චංචල වත්කම් මත ණයදීම්<br>• උකස් ණය<br>• වාණිජ ණය<br>විශාල ව්‍යාපාරික ආයතන වලට ණයදීම් හා වෙළෙඳපළ නිරාවරනයන්<br>රාජ්‍ය ආයතන සඳහා විශාල ණයදීම්<br>ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත සමාගම් සඳහා ණයදීම්<br>• ආයතනික ණය උපකරණ මත ආයෝජන | **පාලන ප්‍රතිපත්ති**<br>ණය ප්‍රතිපත්ති සහ ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති<br>**ප්‍රධාන කළමණාකරණ කමිටුව**<br>ණය කමිටුව | i. ණය ක්‍රමවේද සහ ආයතන සංග්‍රහ උපදෙස්<br>ii. ණය අනුමත කිරීම සඳහා බලතල පැවරීම.<br>iii. ප්‍රතිපත්තිමය මට්ටමින් ගුණාත්මක ඇපකරයක් ලබාගැනීම සහ වටිනාකම මත ණය ලබාදීම.<br>iv. අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීම්<br>v. අවදානම් අභිරුචි රාමුව: අවදානම් අභිරුචි සීමාවන්ට යටත්ව ප්‍රධාන අවදානම් දර්ශක/ප්‍රධාන කාර්ය සාධන දර්ශක අධීක්ෂණය කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම.<br>• වත්කම්වල ගුණාත්මක සීමා: අක්‍රීය පාරිභෝගික ණය, අක්‍රීය ආයතනික ණය, අදියර 03 හානිකරණ ආවරණ<br>• කළඹ ප්‍රතිලාභ සීමා: පාරිභෝගික ණය ප්‍රතිලාභ: ආයතනික ණය ප්‍රතිලාභ<br>• යොමු කිරීම් සීමා: අංශ යොමු කිරීම්, නම යොමු කිරීම්<br>• සම්පූර්ණ වත්කම් සඳහා ශේෂ පත්‍රයෙන් බැහැර බැඳීම්<br>vi. ණය සීමාවන් අධීක්ෂණ රාමුව: කළඹ සහ ගනුදෙනු මට්ටම නිරීක්ෂණය කිරීම සහ CC/IC/BIRMC/අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම<br>• ආංශික නිරාවරණ සීමාවන්<br>• අවදානම් බරිත වත්කම් කාණ්ඩ සඳහා සීමාවන්<br>• ආයතනික ණය උපකරණවල ආයෝජන සඳහා සීමාවන්<br>vii. ණය සීමා අධීක්ෂණ රාමුව කළඹ සහ ගනුදෙනු මට්ටම් නිරීක්ෂණය සහ ණය කමිටුව/ආයෝජන කමිටුව/අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව/අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම<br>viii. ණය සමාලෝචන යාන්ත්‍රණය (LRM).<br>ix. ප්‍රමිතිගත ප්‍රවේශයක් යටතේ ප්‍රාග්ධන වෙන් කිරීම<br>x. ණය අංශයේ කාර්ය මණ්ඩලය අඛණ්ඩව පුහුණු කිරීම |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 54. මූල්‍ය අවදානම් කළමනාකරණය (සම්බන්ධයි)

| විස්තරය | පාලන ප්‍රතිපත්ති සහ ප්‍රධාන කළමනාකරණ කමිටුව | ප්‍රධාන පාලන සහ අවදානම අවම කිරීමේ උපාය මාර්ග |
|---|---|---|
| **වෙළඳපොළ අවදානම (හිමිකම් අවදානම ඇතුළුව)** | | |
| වෙළඳපොළ අවදානම යනු වෙළඳපළ පොලී අනුපාත සහ මිල වෙනස්වීම් හේතුවෙන් සමූහයේ ලාභදායීතාව සහ/හෝ ශුද්ධ වටිනාකමට අහිතකර ලෙස බලපෑමයි. බැංකුව වෙළඳපොළ අවදානමට නිරාවරණය වීම වෙළඳ ආයෝජන සහ වෙළඳ නොවන ආයෝජන යන දෙකෙන්ම පැන නගී.<br><br>වෙළඳපළ අවදානම් සංරචක හතරකි<br>• පොලී අනුපාත අවදානම<br>• හිමිකම් අවදානම<br>• විදේශ විනිමය අවදානම<br>• වෙළඳ භාණ්ඩ අවදානම | **පාලන ප්‍රතිපත්ති**<br>වෙළඳපළ අවදානම් සහ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය<br><br>**ප්‍රධාන කළමණාකරණ කමිටු**<br>වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව<br><br>ආයෝජන කමිටුව | I. වත්කම් සහ වගකීම් කළමනාකරණයේ යහ භාවිතයන්<br>II. අවදානම් අභිරුචිකත්ව රාමුව: අවදානම් අභිරුචිකත්ව රාමුවට එරෙහිව ප්‍රධාන අවදානම් දර්ශක/ප්‍රධාන කාර්ය සාධන දර්ශක නිරීක්ෂණය කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුවට (BIRMC) හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම.<br>III. අවදානම් අධීක්ෂණ රාමුව: අවදානම් තක්සේරු මෙවලම්, ශිල්පීය ක්‍රම සහ ආකෘති භාවිතා කරමින් පොලී අනුපාත අවදානම, කොටස් අවදානම සහ විදේශ විනිමය අවදානම නිරීක්ෂණය කිරීම සහ ALCO/IC/BIRMC සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම<br>• වෙළඳපොළ මිළට සලකුණු කිරීම<br>• වෙනස් කළ කාල සීමාව<br>• ශුද්ධ විවෘත තත්වය (NOP)<br>• සංවේදිතා විශ්ලේෂණය සහ ආතති පරීක්ෂාව<br>IV. සාධනීය වෙළඳපළ හැසිරීම පිළිබඳ සහතික වනු පිණිස ගනුදෙනු සිදු කරනු ලබ ස්ථානීය හඬ පටිගත කිරීම් දිනපතා නිරීක්ෂණය කරනු ලැබේ.<br>V. අවදානම් සීමාවන් රාමුව: භාණ්ඩාගාර මධ්‍යම කාර්යාලය විසින් අවදානම් සීමාවන් රාමුවට සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව අවදානම් සීමාවන් නිරීක්ෂණය කිරීම.<br>VI. EAR හා EVA ක්‍රම භාවිත කරමින් සීමාවන් මත අනුපාතිකවලට සංවේදී හිඩැස් අධීක්ෂණය සහ ඉපයීම් හා ප්‍රග්ධනය මත ප්‍රවේශවීමේදී ඇතිවන බලපෑම අධීක්ෂණය.<br>VII. ප්‍රමිතිගත මිනුම් ක්‍රමවේද යටතේ ප්‍රාග්ධන වෙන්කිරීම්<br>VIII. උකස් සහ අත්තිකාරම්හි ණය වටිනාකම් අනුපාතය අධීක්ෂණය කිරීමට රන් මිල අධීක්ෂණය කිරීම |
| **ද්‍රවශීලතා සහ අරමුදල් අවදානම** | | |
| ද්‍රවශීලතා අවදානම යනු මූල්‍ය වගකීම් පියවා ගැනීමට නොහැකිවීම (අරමුදල් ද්‍රවශීලතා අවදානම) සහ මූල්‍ය සුරැකුම්පත් ද්‍රවශීලතාවය සැලකිය යුතු ලෙස අඩුවීමයි.<br><br>(වෙළඳපල ද්‍රවශීලතා අවදානම) සමූහය මූලික වශයෙන් ද්‍රවශීලතා අවදානමට නිරාවරණය වන්නේ: සමූහයේ ණය, ආයෝජන සහ අරමුදල් ප්‍රභවයන් අතර අරමුදල් නොගැලපීමයි. | **පාලන ප්‍රතිපත්ති**<br>වෙළඳපළ අවදානම් සහ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය,<br><br>**ප්‍රධාන කළමණාකරණ කමිටුව**<br>වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව | I. රජයේ සුරැකුම්පත්වල ආයෝජන පවත්වාගෙන යාම සඳහා ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය (තැන්පතු වලින් 60%)<br>II. භාණ්ඩාගාර අංශය විසින් මුදල් ප්‍රවාහ කළමනාකරණය<br>III. ද්‍රවශීල අවිනිශ්චිතතා සැලසුම් කිරීම<br>IV. ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (NSFR) සහ ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR) යන ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා අනුපාත අවම අවශ්‍යතාවයන්ට අනුව අධීක්ෂණය<br>V. බාසල් III ට අනුව කොටස් ප්‍රවේශය යටතේ අනුපාත අධීක්ෂණය කිරීම සහ ද්‍රවශීලතා අවදානම් අධීක්ෂණ මෙවලම් යටතේ ද්‍රවශීලතා අවදානම සඳහා අරමුදල් සැපයීම සහ වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව/අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම.<br>VI. අවදානම් සීමාවන්ට යටත්ව කල්පිරීමේ පරතරයේ ගිවිසුම්ගතභාවය හා හැසිරීම නිරීක්ෂණය |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 54. මූල්‍ය අවදානම් කළමනාකරණය (සම්බන්ධයි)

### පුළුල් අවදානම් ප්‍රභේද (සම්බන්ධයි)

| විස්තරය | පාලන ප්‍රතිපත්ති සහ ප්‍රධාන කළමනාකරණ කමිටුව | ප්‍රධාන පාලන සහ අවදානම අවම කිරීමේ උපාය මාර්ග |
|---|---|---|
| **මෙහෙයුම් අවදානම** | | |
| මෙහෙයුම් අවදානම යනු ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක වූ අභ්‍යන්තර ක්‍රියාවලීන්, පුද්ගලයින් සහ පද්ධති හෝ බාහිර සිදුවීම් වලින් පාඩු සිදුවීමේ සමූහය මූලික වශයෙන් මෙහෙයුම් අවදානමට නිරාවරණය වන්නේ:<br>• අභ්‍යන්තර වංචා<br>• බාහිර වංචා<br>• රැකියා භාවිතයන් සහ රැකියා ස්ථානයේ ආරක්ෂිත බව,<br>• සේවාදායක, නිෂ්පාදන සහ ව්‍යාපාර පුරුදු,<br>• භෞතික වත්කම්වලට හානිවීම<br>• ව්‍යාපාර කඩාකප්පල් කිරීම සහ පද්ධති අසාර්ථකත්වය,<br>• ක්‍රියාත්මක කිරීම, භාරදීම සහ ක්‍රියාවලි කළමනාකරණය | **පාලන ප්‍රතිපත්ති**<br>1. මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය<br><br>**මෙහෙයුම් අවදානම් කළමණාකරනයට සම්බන්ධ වෙනත් ප්‍රතිපත්ති:**<br>• බාහිරකරණ ප්‍රතිපත්තිය<br>• තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය<br>• ව්‍යාපාරික අඛණ්ඩතා ප්‍රතිපත්තිය<br>• අල්ලස් විරෝධී සහ දූෂණ ප්‍රතිපත්තිය<br>• ආදර්ශ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය<br><br>**ප්‍රධාන කළමණාකරණ කමිටු**<br>මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව (ORMC) | **සොරකම් හෝ වංචා අවදානම**<br>I. වංචා අවදානම් කළමනාකරණය සහ තොරතුරු දැනුම්දීම් ප්‍රතිපත්තිය/ක්‍රියාපටිපාටි<br>II. අභ්‍යන්තර පාලන ව්‍යුහය<br>III. දෛනික පරීක්ෂණ/විගණන<br>IV. ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක (KORIs) නිරීක්ෂණය<br>V. පාඩු සිදුවීම් දත්ත නිරීක්ෂණය<br>VI. අවදානම් පාලනය ස්වයං ඇගයීමේ ක්‍රියාවලිය (RCSA).<br>VII. මූල හේතු විශ්ලේෂණය<br>VIII. අල්ලස් විරෝධී සහ දූෂණ අවදානම් පාලනය<br><br>**තොරතුරු තාක්ෂණ අවදානම**<br>I. තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ නියාමන උපදෙස්, ප්‍රමිතීන් සහ හොඳම පරිචයන් පිළිපැදීම.<br>II. තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පාලන ව්‍යුහය, ක්‍රියාවලිය සහ පද්ධති ස්ථාපිත කිරීම.<br>III. ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක (KORI) නිරීක්ෂණය<br>IV. සිදුවීම් වාර්තාකරණය<br>V. අවදානම් සහ පාලන ස්වයං තක්සේරුව (RCSA)<br><br>**නීතිමය අවදානම**<br>I. ව්‍යාපාර සහ ගිවිසුම් බැඳීම්වලට ඇතුල්වීමේදී නීති අංශය මගින් නීති අවසරය ලබාදීම.<br>II. ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශකය නිරීක්ෂණය<br><br>**අඛණ්ඩ ව්‍යාපාර කළමනාකරණ අවදානම**<br>I. ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශකය නිරීක්ෂණය<br>II. ව්‍යවසන ප්‍රතිසාධන සහ අඛණ්ඩ ව්‍යාපාර කළමනාකරණ සඳහා වන රෙගුලාසි, ප්‍රමිත සහ යහ පරිචයන්ට අනුගත වීම. |
| **අනුකූලතා අවදානම**<br>අනුකූලතා අවදානම යනු සමූහයේ නීති, රෙගුලාසි, රීති, නියාමන ප්‍රතිපත්ති ප්‍රකාශන සහ එහි ව්‍යාපාරික කටයුතුවලට අදාළ වන චර්යාධර්ම පද්ධතියට අනුකූලවීමට අපොහොසත්වීම හේතුවෙන් සමූහයට සිදුවිය හැකි සම්බාධක සහ මූල්‍ය අලාභයයි. අනුකූලතා අවදානම යටතේ සමූහය මූලික වශයෙන් නිරාවරණය වේ.<br>• අභිලාෂ සටිටන හා රහස්‍යභාවය ඇතුළු නියාමන හා බලපත්‍ර වගකීම්,<br>• මූල්‍ය අපරාධ (මුදල් විශුද්ධිකරණය, ත්‍රස්ත විරෝධී මූල්‍යකරණය, අල්ලස් හා දූෂණ විරෝධී සහ සම්බාධක),<br>• දුර්වලතා හැසිරීම (නිෂ්පාදන සැලසුම් කිරීම සහ බෙදා හැරීම, වෙළඳපළ හැසිරීම සහ සේවක විෂමාචාර) | **පාලන ප්‍රතිපත්ති**<br>1. අනුකූලතා ප්‍රතිපත්තිය<br>2. මුදල් විශුද්ධිකරණ ප්‍රතිපත්තිය<br>3. සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය.<br><br>**ප්‍රධාන කළමණාකරණ කමිටුව**<br>මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව (ORMC) | I. අනුකූලතා වැඩසටහන් හා විනිශ්චය.<br>II. මුදල් විශුද්ධිකරණය හා ගනුදෙනුකරුවා පිළිබඳ දැනගැනීම නිරීක්ෂණය සඳහා අභ්‍යන්තර පද්ධති/ක්‍රියාවලි<br>III. ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක නිරීක්ෂණය |

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 54. මූල්‍ය අවදානම් කළමනාකරණය (සම්බන්ධයි)

### පුළුල් අවදානම් ප්‍රභේද (සම්බන්ධයි)

| විස්තරය | පාලන ප්‍රතිපත්ති සහ ප්‍රධාන කළමනාකරණ කම්ටුව | ප්‍රධාන පාලන සහ අවදානම අවම කිරීමේ උපාය මාර්ග |
|---|---|---|
| **උපාය මාර්ගික අවදානම** | | |
| උපායමාර්ගික අවදානම යනු වැදගත් පාර්ශ්වකරුවන්ගේ අගය විනාශවීමේ අවදානම හෝ සැලසුම් කළ අගය නිර්මාණය කිරීමට නොහැකි වීමයි. සමූහය මූලික වශයෙන් පහත දැක්වෙන සාධක හේතුවෙන් උපායමාර්ගික අවදානමට නිරාවරණය වේ.<br>• සමූහයේ බාහිර හා අභ්‍යන්තර මෙහෙයුම් පරිසරවල වෙනස්වීම් (සාර්ව ආර්ථික තත්ත්වයන්, තරඟකාරී බලවේග, තාක්ෂණය, නියාමන, දේශපාලන හා සමාජ ප්‍රවණතා, පාරිභෝගික අපේක්ෂාවන් සහ පරිසරය ඇතුළුව), සහ<br>• උපාය මාර්ග සංවර්ධනය හා උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය හා සම්බන්ධ අවදානම්, | **පාලන ප්‍රතිපත්ති**<br>ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය<br>උපායමාර්ගික ව්‍යාපාර සැලසුම<br>**ප්‍රධාන කළමණාකරණ කම්ටු**<br>මෙහෙයුම් අවදානම් කළමනාකරණ කම්ටුව (ORMC)<br>ආයතනික කළමනාකරණ කම්ටුව | I. ජ්‍යෙෂ්ඨ කළමනාකරණ අධීක්ෂණය<br>II. උපාය මාර්ගික සැලැස්ම සහ අයවැය සැකසුම් ක්‍රියාවලිය<br>III. අවදානම් තක්සේරුකරණ රාමුව අධීක්ෂණය (RAF) |
| **කීර්තිනාමයට වන අවදානම** | | |
| කීර්තිනාමයට වන අවදානම යනු බැංකුවේ ක්‍රියාකාරකම් ව්‍යාපාර පිළිවෙත්, නිෂ්පාදන, සේවා යනාදිය පිළිබඳව පාර්ශ්වකරුවන්ගේ සෘණාත්මක අවබෝධය හේතුවෙන් සන්නාම වටිනාකමට අහිතකර බලපෑම් ඇතිවීමේ අවදානමයි. කීර්තිනාමයට වන අවදානම සමූහයේ ඉපැයීම් සහ වත්කම් කෙරෙහි වක්‍රව බලපායි. | **පාලන ප්‍රතිපත්ති**<br>ඒකාබද්ධ අවදානම් කළමණාකරණ ප්‍රතිපත්තිය<br>**ප්‍රධාන කළමණාකරණ කම්ටු**<br>මෙහෙයුම් අවදානම් කළමනාකරණ කම්ටුව (ORMC)<br>ආයතනික කළමනාකරණ කම්ටුව | I. ජ්‍යෙෂ්ඨ කළමනාකරණ අධීක්ෂණය<br>II. වෙළඳනාම වටිනාකම සහ පාර්ශ්වකරුවන්ගේ සංජානනය වැඩිදියුණු කිරීමට අලෙවිකරණ අංශය කටයුතු කරයි<br>III. අවදානම් තක්සේරුකරණ රාමුව අධීක්ෂණය |
| **පාරිසරික, සමාජයීය හා පාලන (ESG) අවදානම** | | |
| | (ඇ) පහත ක්‍රියා මාර්ග තුළින් ශක්තිමත් අවදානම් පාලන සංස්කෘතියක් ප්‍රගුණ කිරීම;<br>(i) මූලික අවදානම් හඳුනා ගැනීම සහ විචක්ෂණශීලී ලෙස අවදානම් කළමනාකරණය සඳහා සුදුසු ක්‍රමවේද ක්‍රියාවට නැංවීම සහතික වීම<br>(ii) බැංකුවේ ආරක්ෂණ මාර්ග ත්‍රිත්වය වෙනුවෙන් මනා ලෙස අර්ථ දක්වා ඇති ආයතනික වගකීම් ස්ථාපනය කිරීම, එනම්,<br>(අ) ව්‍යාපාර අංශ<br>(ආ) පළමු හා තෙවන ආරක්ෂණ මාර්ගවලින් ස්වාධීන වූ අවදානම් කළමනාකරණ කාර්යය සහ අනුකූලතා කාර්යය<br>(ඇ) පළමු හා දෙවන ආරක්ෂණ මාර්ගවලින් ස්වාධීන වූ අභ්‍යන්තර විගණන කාර්යය<br>(iii) අවදානම් කළමනාකරණය, අනුකූලතාව හා අභ්‍යන්තර විගණන කාර්යයන් මනා ලෙස ස්ථානගත කර ඇති බවට සහ ස්වාධීනව, වෛෂයිකව හා ඵලදායී අයුරින් වගකීම් ඉටු කළ හැකි වන පරිදි ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයකින් සමන්විත බවට හා සම්පත් සපයා ඇති බවට සහතික කිරීම. අවදානම් කළමනාකරණය, අනුකූලතාව සහ අභ්‍යන්තර විගණන කාර්යයන්හි වගකීම පිළිවෙළින් උපලේඛන II, III හා IV හි දක්වා ඇත.<br>(iv) අවදානම් අභිරුචි ප්‍රකාශයක් හරහා පැහැදිලි කර ඇති බැංකුවේ උපාය මාර්ගික, ප්‍රාග්ධන හා මූල්‍ය සැලසුම් සමඟ සමපාත වන ආකාරයට බැංකුවේ අවදානම් අභිරුචිය නිර්වචනය කිරීම සහ<br>(v) ප්‍රමාණය ඉක්මවා අවදානම් ගැනීමට එරෙහි විනය ක්‍රියාමාර්ග, උත්සන්න කිරීමේ ක්‍රියාපටිපාටි හා අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීම ඇතුළු ප්‍රකාශිත අවදානම් අභිරුචි සීමා උල්ලංඝනය වන අවස්ථාවන් හි දී ගත යුතු ක්‍රියාමාර්ග ගෙන හැර දැක්වීම. | අනුකූල වී ඇත.<br>අවදානම් හඳුනා ගැනීම, මැනබැලීම සහ අවම කිරීමේ ක්‍රියාපටිපාටි සඳහා ණය වෙළඳපොළ කළමනාකරණය, ක්‍රියාකාරිත්වය සහ උපායමාර්ගික අවදානම් පියවර පැහැදිලි කෙරෙන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මකය.<br>පහත වාර්තා මීට අදාළ වැඩිදුර තොරතුරු සපයයි.<br>• පිටු අංක 254 සිට 280 දක්වා වන අවදානම් කළමනාකරණ වාර්තාව<br>• පිටු අංක 251 සිට 252 දක්වා වන අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව<br>අනුකූලතා නිලධාරියා සහ ප්‍රධාන අවදානම් නිලධාරියා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට ද, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විගණන) අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙතද සෘජුව වාර්තා කරති. බැංකුව, ආරක්ෂණ මාර්ග ත්‍රිත්වයම සමාන තනතුරුවලින් බලගැන්වීමේ ක්‍රියාවලියක නිරතව සිටී.<br>උපායමාර්ගික ව්‍යාපාර සැලැස්ම, බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණ රාමුව, ක්‍රියාපටිපාටිය හා අවදානම් අභිරුචිය සමඟ ගැලපෙන ආකාරයට සකස් කර ඇත.<br>ප්‍රධාන අවදානම් නිලධාරියා අවදානම් අභිරුචි සීමාවන්ට අදාළ බැංකුවේ කාර්ය සාධනය සමාලෝචනය කරන අතර, අවදානම් අවම කිරීමේ කාලෝචිත හේතු සමඟින් ඩෑෂ් බෝර්ඩ් වාර්තාවක් උපයෝගී කරගනිමින් මාසිකව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබයි. |

## 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|
| (ඈ) තැන්පත්කරුවන්ගේ, ණයහිමියන්ගේ හෝ සමස්තයක් ලෙස බැංකුවේ අභිලාෂයන්ට අහිතකර හෝ අගතිගාමී වන ආකාරයෙන් යම් කිසි අධ්‍යක්ෂවරයෙක් හෝ අධ්‍යක්ෂවරු කණ්ඩායමක් විසින් අධ්‍යක්ෂ මණ්ඩලය කෙරෙහි ආධිපත්‍යය පැතිරවීමක් හෝ සැලකිය යුතු බලපෑමක් එල්ල නොකරන බවට සහතික කිරීම සඳහා ප්‍රතිපත්තියක් ස්ථාපනය කිරීම | අනුකූල වී ඇත.<br>මෙකී අවශ්‍යතාවය සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල මාර්ගෝපදේශය භාවිතා කෙරේ. |
| (ඉ) නියාමකයන්, තැන්පත්කරුවන්, ණය හිමියන්, කොටස් හිමිකරුවන් සහ ණය ගැනුම්කරුවන් ඇතුළු සියලු සහභාගිත්ව කණ්ඩායම් සමඟ සන්නිවේදන ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවීම අනුමත කිරීම | අනුකූල වී ඇත.<br>සියලු සහභාගිත්ව කණ්ඩායම් ආවරණය කෙරෙන ඵලදායී හා කාලීන සන්නිවේදන ක්‍රමවේදයක් සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද දැනටම ක්‍රියාවේ යෙදවෙන සන්නිවේදන ප්‍රතිපත්තියක් බැංකුව සතුය. |
| (ඊ) බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිවල සහ කළමනාකරණ තොරතුරු පද්ධතිවල ප්‍රමාණවත් භාවය හා පරිපූර්ණත්වය සමාලෝචනය කිරීම | අනුකූල වී ඇත.<br>බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිවල හා කළමනාකරණ පද්ධතිවල ප්‍රමාණවත් භාවය හා පරිපූර්ණත්වය සමාලෝචනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහයවේ. අභ්‍යන්තර විගණන අංශය සහ රාජ්‍ය විගණනය විසින් මේ පිළිබඳව හා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනයට ලක් කරන ලද කරුණු මෙන්ම ඒ පිළිබඳ අදාළ වර්ෂය තුළ කළමනාකරණ ප්‍රතිචාර ද සමාලෝචනය කරනු ලබයි. සොයා ගැනීම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කෙරේ. |
| (උ) අදාළ පාර්ශ්ව ගනුදෙනු තුළින් හටගත හැකි ඕනෑම ළබැඳියාව පිළිබඳ ගැටුමක් වළක්වා ගනිමින් අදාළ පාර්ශ්ව නිරාවරණය කිරීම් කළමනාකරණය සඳහා ඵලදායී පාලන ක්‍රමවේද ක්‍රියාවට නැංවීම සහතික කිරීම | අනුකූල වී ඇත.<br>අධ්‍යක්ෂවරු විසින් පත්වීම් ලබා ගන්නා විට, වාර්ෂිකව හා වෙනසක් සිදු වන සෑම අවස්ථාවකම සිය ළබැඳියාවන් ප්‍රකාශයට පත් කරන අතර ගැටුම් පැන නැඟිය හැකි ක්ෂේත්‍ර (වෙතොත්) ඒ පිළිබඳව වාර්තාවක් කාර්තුවකට වරක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරති. අධ්‍යක්ෂවරු, ළබැඳියා පිළිබඳ ගැටුම් ඇති අවස්ථාවලදී සාකච්ඡාවන්ට සහභාගි වීමෙන්, සිය අදහස් ප්‍රකාශයට පත් කිරීමෙන් හෝ අනුමත කිරීමෙන් වැළකී සිටිති. අනුකූලතා අංශය අදාළ පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ වාර්තාවක් කාර්තුවකට වරක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබයි. |
| (ඌ) ඕනෑම බාධාකාරී අවස්ථාවක දී, මූල්‍ය ස්ථාවරත්වය, මෙහෙයුම් ප්‍රත්‍යස්ථතාව සහ මූලික බැංකු පද්ධති ඇතුළු වැදගත් මෙහෙයුම් හා සේවා ආරක්ෂා කර ගැනීම සහතික කිරීම සඳහා ව්‍යාපාර අඛණ්ඩතා සහ අවදානම් ප්‍රතිසාධන සැලසුම් අනුමත කිරීම හා අධීක්ෂණය | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපාර අඛණ්ඩතා සහ අවදානම් ප්‍රතිසාධන ප්‍රතිපත්තිය ක්‍රියාත්මකය. බාහිර උපදේශකයෙකු ගේ සහය ඇතිව බැංකුව මේ වන විට BCP සැලැස්ම සංශෝධනය කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටී. |
| (එ) වේතන අධීක්ෂණය හා සමාලෝචනය ඇතුළු වේතන ප්‍රවේශ අධීක්ෂණය සහ බැංකුවේ අවදානම් සංස්කෘතිය සහ අවදානම් අභිරුචිය සමඟින් වේතන සමපාත වීම සහතික කිරීම | අනුකූල වී ඇත.<br>1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 10 වන වගන්තිය සහ එහි සංශෝධනවලට අනුකූලව අධ්‍යක්ෂවරුන්ගේ වේතන තීරණය කරනු ලබන්නේ විෂය භාර අමාත්‍යවරයා විසිනි. සාමූහික මණ්ඩල ගිවිසුම මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික අවදානම් කමිටුව විසින් තීරණය කරනු ලබන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල වේතන, බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර මුදල් අමාත්‍යාංශය වෙත යොමු කරනු ලබයි. |
| (ඒ) ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හඳුනාගැනීම සහ නම් කිරීම<br>(i) ප්‍රතිපත්ති කෙරෙහි සැලකිය යුතු ලෙස බලපෑම් කිරීමට,<br>(ii) ක්‍රියාකාරකම් මෙහෙයවීමට සහ<br>(iii) ව්‍යාපාරික ක්‍රියාකාරකම්, මෙහෙයුම් සහ අවදානම් කළමනාකරණය මත පාලනය යෙදවීමේ හැකියාවෙන් යුත් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හඳුනාගෙන අදාළ තනතුරුවලට නම් කිරීම | අනුකූල වී ඇත.<br>ආයතනික පාලන අරමුණු වෙනුවෙන් බැංකුවේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය බැංකුව විසින් හඳුනාගෙන ඇත. සියලු නම් කරන ලද ප්‍රධාන කළමනාකරණ නිලධාරී පත් කිරීම් අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව විසින් නිර්දේශ කර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. |
| (ඔ) අධ්‍යක්ෂ මණ්ඩලයේ, ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ බලතල ක්ෂේත්‍ර හා ප්‍රධාන වගකීම් නිර්වචනය කිරීම | අනුකූල වී ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩලයේ බලතල ක්ෂේත්‍ර ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 7 වන වගන්තිය මගින් පාලනය කෙරේ.<br>අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව විසින් ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ බලතල ක්ෂේත්‍ර හා ප්‍රධාන වගකීම් නිර්වචනය කර ඇති අතර ඒවා සෑම ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු ගේම රැකියා විස්තරයට ඇතුළත් කර ඇත. |
| (ඕ) අධ්‍යක්ෂ මණ්ඩලයේ උපායමාර්ග හා ප්‍රතිපත්තිවලට අනුකූල වන පරිදි බැංකුවේ ක්‍රියාකාරකම් පිළිබඳ සුදුසු අධීක්ෂණයක් ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය විසින් සිදුකරන බවට සහතික වීම. | අනුකූල වී ඇත.<br>සිය විෂය පථයට අයත් කරුණු පිළිබඳව ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට හා උප කමිටුවලට නිරන්තරයෙන් කරුණු ඉදිරිපත් කරන අතර අවශ්‍ය වූ විටෙක තම විෂය ක්ෂේත්‍රයට අයත් කරුණු පැහැදිලි කිරීමට ඉල්ලීම් ප්‍රකාරව මණ්ඩලය ඉදිරියේ පෙනී සිටී. |

## 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|
| (ක) අධ්‍යක්ෂ මණ්ඩලයේ පාලන ක්‍රමවේදයන් හි ඵලදායිතාවය කාලාවර්තිකව ඇගයීම<br>(i) අධ්‍යක්ෂවරු, ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තේරීම, නම් කිරීම සහ පත් කිරීම<br>(ii) ළබැඳියා පිළිබඳ ගැටුම් කළමනාකරණය; සහ<br>(iii) දූර්වලතා හඳුනා ගැනීම සහ අවශ්‍ය වූ විට වැඩි දියුණු කිරීම් ක්‍රියාත්මක කිරීම | 2025ට පෙර අධ්‍යක්ෂවරු පත් කරන ලද්දේ 1995 අංක 28 දරන පනතින් සංශෝධිත 1971 ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 8 වන වගන්තියට අනුව අමාත්‍යවරයා විසිනි. වර්තමානයේ ස්වාධීන අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන්නේ ස්වාධීන ක්‍රියාපටිපාටියක් හරහාය. ගැටුම් වෙතොත් ඒවා අධීක්ෂණය සඳහා, සම්බන්ධිත පාර්ශ්ව හා ඔවුන්ගේ ළබැඳියාවන්ට අදාළව අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ප්‍රකාශයක් වාර්ෂිකව ලබා ගැනේ. බැංකුවේ ළබැඳියාවන් පිළිබඳ ගැටුම් කළමනාකරණය සඳහා සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මකය. ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තෝරා ගනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව විසිනි. |
| (ග) සෑම අධ්‍යක්ෂවරයෙක් විසින්ම වාර්ෂිකව සිදු කළ යුතු ස්වයං – ඇගයීම සඳහා අදාළ නිර්ණායක අනුමත කිරීම සහ එවැනි ඇගයීම් වාර්තා පවත්වාගෙන යාම | සියලුම අධ්‍යක්ෂවරුන්ගේ ස්වයං-ඇගයීම් හා ළබැඳියා ගැටුම් පිළිබඳ ප්‍රකාශන සෑම අධ්‍යක්ෂවරයෙක් විසින්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් වෙත වාර්ෂිකව ඉදිරිපත් කරති. |
| (ඝ) 6.4(I) නියමයේ පැහැදිලි කර ඇති පරිදි ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා සුදුසු අනුප්‍රාප්තික සැලැස්මක් බැංකුව සතු බව සහතික කිරීම | අනුකූල වී ඇත.<br>ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අනුප්‍රාප්තික සැලැස්මක් ක්‍රියාත්මකය. |
| (ඞ) ප්‍රතිපත්ති සමාලෝචනය, සන්නිවේදන මාර්ග ස්ථාපනය හා ආයතනික අරමුණු සාක්ෂාත් කරගැනීමේ ප්‍රගතිය අධීක්ෂණය සඳහා අවශ්‍යතා පදනම මත ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් නිරතුරුව හමුවීම | අනුකූල වී ඇත.<br>ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 13(4) වගන්තිය යටතේ අවසර හිමි ව ඇති පරිදි සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගිවෙති. මීට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩලයට, එක් එක් ප්‍රධාන කළමනාකරණ නිලධාරියාගේ විෂය ක්ෂේත්‍රයට අදාළ කරුණු සම්බන්ධයෙන් අදහස් හුවමාරු කර ගැනීමේ අවශ්‍යතාවයක් හටගත් විට ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් මණ්ඩල රැස්වීම්වලට නිරතුරුව සහභාගි වෙති.<br>සිය වගකීම් ක්ෂේත්‍රයට අදාළ කාර්ය සාධනය, උපාය මාර්ග සහ අනෙකුත් අදාළ කරුණුවල ප්‍රගතිය හා සම්බන්ධිත සාකච්ඡාවලට ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අධ්‍යක්ෂ මණ්ඩලයේ හා එහි අනු කමිටු රැස්වීම්වල දී එක් වෙති. |
| (ඩ) නියාමන පරිසරයේ සිදුවන භෞතික වෙනස්වීම් පිළිබඳව උරෙන් උර ගැටී සිටීම හා බැංකුව විසින් නියාමකයන් සමඟ ඵලදායී සබඳතාවක් පවත්වාගෙන යාම සහතික කිරීම | අනුකූල වී ඇත.<br>මාසික අනුකූලතා වාර්තාව මඟින් සියලුම අදාළ නියාමන අවශ්‍යතා පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් වෙති. සිය රාජකාරි සහ වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට පහසුකම් සලසමින් සිය දැනුම නිරන්තරයෙන් යාවත්කාලීන වන බව සහතික වනු පිණිස, අනුකූලතා නිලධාරියා විසින් මණ්ඩල රැස්වීම්වලදී ඔවුන්ව දැනුවත් කරනු ලබයි.<br>ශ්‍රී ලංකා මහ බැංකුවට ඉදිරිපත් කරනු ලබන සියලුම වාර්තා ඇතුළත් වූ මාසික අනුකූලතා වාර්තා මසකට වරක් මණ්ඩලයට ඉදිරිපත් කර සම්පව නිරීක්ෂණය කෙරේ. |
| (ණ) බාහිර විගණකවරුන් බඳවා ගැනීමේ දී හා අධීක්ෂණයේදී නිසි අවධානය යොමු කිරීම | රජයට අයත් බැංකුවක් බැවින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තියේ විධිවිධානවලට අනුව සහ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 37 වන වගන්තියට අනුව බැංකුවේ බාහිර විගණකවරයා වන්නේ විගණකාධිපතිය. තවද, විගණන ක්‍රියාවලියේ ස්වාධීනත්වය, විෂය මූලික භාවය හා ඵලදායිතාව සමාලෝචනය හා අධීක්ෂණයට සහ විගණන අධිකාරි හරහා විගණකාධිපතිට නිර්දේශ ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත බලය පැවරී ඇත. |
| (ත) වෘත්තිමය සහ සදාචාරාත්මක ආකාරයකින් කටයුතු කරමින් සේවකයන්, ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්, කොටස් හිමිකරුවන් හෝ බැංකුව හා සම්බන්ධ වෙනත් ඕනෑම පුද්ගලයෙකුගෙන් දිරි දීමනා, ත්‍යාග හෝ අරමුදල් ඇතුළු කිසිදු අනවශ්‍ය මූල්‍ය හෝ මූල්‍ය නොවන ප්‍රතිලාභ බාර නොගැනීම | අනුකූල වී ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අල්ලස් හා දූෂණ විරෝධී ප්‍රතිපත්තිය ක්‍රියාත්මකය. |
| (ද) බැංකුව පුරා වෘත්තීමය, සදාචාරාත්මක හා විචක්ෂණශීලී චර්යාවක් උදෙසා ශක්තිමත් කරන ලද මනා ආයතනික සංස්කෘතියක් ගොඩනැංවීම. වෙනත් කරුණු ඇතුළු දත්තවල රහස්‍යභාවය, ළබැඳියාවන් පිළිබඳ ගැටුම්, මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ හා ත්‍යාග සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රියාපටිපාටි, පරිපූර්ණ වාර්තාකරණය සහ ගනුදෙනුකරුවන්ට සාධාරණ ලෙස සැලකීම ආමන්ත්‍රණය කිරීම සඳහා ආයතනික හර පද්ධති මත පදනම් වූ, අධ්‍යක්ෂවරුන්ගේ හා සේවකයන්ගේ වෘත්තීමය සහ සදාචාරාත්මකව පිළිගත් චර්යාවන් සඳහා වන චර්යා සංග්‍රහයක් අනුමත කිරීම සහ එය ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කිරීම | අනුකූල වී ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩලයේ බල අධිකාරිය ජාතික ඉතිරිකිරීම් බැංකු පනතේ 7 වන වගන්තිය මඟින් පාලනය වේ. තවද, අධ්‍යක්ෂ මණ්ඩල අත්පොතක් ද ක්‍රියාත්මකය. අනෙකුත් කරුණු අතර දත්තවල රහස්‍යභාවය, ළබැඳියා අතර ගැටුම්, මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ හා ත්‍යාග සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රියාපටිපාටි, පර්පූර්ණ වාර්තාකරණය සහ ගනුදෙනුකරුවන්ට සාධාරණ ලෙස සැලකීම හා අදාළ ගැටලු ආමන්ත්‍රණය කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය, සදාචාරාත්මක හා වෘත්තීමය ආකාරයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වති. |

## 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| | (ත) නියාමකයා/නියාමකයන් විසින් මතුකරන අධීක්ෂණ ගැටලු කාලෝචිත ලෙස විමර්ශනය කිරීම සහ ඒ සඳහා අදාළ අනුකම්ටුවල සහය ලබා ගැනීම. | අනුකූල වී ඇත.<br>ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවස්ථාපිත පරීක්ෂණ වාර්තාවේ ප්‍රගතිය, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත කාර්තුවකට වරක් වාර්තා කෙරේ. ඊට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පෙන්වා දෙන ලද ගැටලු විසඳීම සඳහා අදාළ අංශ ප්‍රධානීන් සහ සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරියා අතර මුහුණට මුහුණ සාකච්ඡා පැවැත්වේ. මෙකී සාකච්ඡාවලදී කාර්යයන් සම්පූර්ණ කරන ලද සාක්ෂි ද ඇතුළත් ව, නිවැරදි කිරීම සඳහා ගන්නා ලද පියවරවල ප්‍රගතිය සමාලෝචනය කෙරේ. |
| | (ථ) පළිගැනීමට ලක්වීමේ අවදානමකින් තොරව, නීතියට පටහැනි, සදාචාරයට පටහැනි හෝ ගැටලුකාරී ක්‍රියා පිළිබඳව රහසිගතව සන්නිවේදනය කිරීම සඳහා සේවකයන් දිරිගැන්වීමේ අරමුණෙන් අයථා ක්‍රියා පිළිබඳ දැනුම් දීමේ ප්‍රතිපත්තියක් අනුමත කිරීම. ප්‍රතිපත්තිය අවම වශයෙන් වාර්ෂික පදනමින් සමාලෝචනය කළ යුතුය. පහත කරුණු අයථා ක්‍රියා දැනුම් දීමේ ප්‍රතිපත්තියේ පැහැදිලිව අන්තර්ගත විය යුතුය.<br>(i) බැංකුව තුළ ගැටලුව තවදුරටත් ඉදිරියට යොමු කළ හැකි පුද්ගලයන්;<br>(ii) සේවකයන් විසින් මතු කරන ලද නීත්‍යානුකූල ප්‍රමාණාත්මක ගැටලු විමර්ශනය කිරීමේ ක්‍රියාපටිපාටි;<br>(iii) කිසියම් අනර්ථකාරී සැලකීමක් හෝ පළිගැනීමක් හේතුවෙන් ගැටලුව මතු කරන ලද සේවකයන්ගේ ආරක්ෂාව සහ නිර්නාමික භාවය සහතික කිරීම සඳහා වන ක්‍රියාපටිපාටි; සහ<br>(iv) අයථා ක්‍රියා පිළිබඳව නියාමකයන් දැනුවත් කිරීමේ විකල්ප මාර්ග | අනුකූල වී ඇත.<br>නිශ්චිතව දක්වා ඇති සියලුම අංශ ආවරණය කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අයථා ක්‍රියා දැනුම් දීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මකය. |
| | (බ) මනා පාරිසරික, සමාජයීය හා පාලන ආකල්ප තුළින් බැංකුවේ ව්‍යාපාරික උපාය මාර්ගවල තිරසාරත්වය ප්‍රවර්ධනය කිරීම සහ හරිතවත්, දේශගුණික හිතකාමී සහ සමාජයීය වශයෙන් සියලු දෙනා ඇතුළත් වන්නා වූ ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන බවට සහතික වීම | අනුකූල වී ඇත.<br>පාරිසරික, සමාජයීය සහ පාලන ප්‍රතිඵල හරහා තිරසාරත්වය අවධාරණය කෙරෙන ආයතනික පාලන අවශ්‍යතාවන්ට අනුකූලව, බැංකුව සිය මෙහෙයුම්, තීරණ ගැනීම් හා නිෂ්පාදන පිරිනැමීම් තුළට තිරසරභාවය කාවද්දා ඇත. මේ කැපවීම්වල ව්‍යූහගත අධීක්ෂණය හා ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීම සහතික කිරීම සඳහා පුළුල් පාලන රාමුවේ කොටසක් ලෙස බැංකුව ආයතනික තිරසාරත්ව කමිටුවක් පිහිටුවා ඇත. |
| 1.2 | **සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරියා පත් කිරීම**<br><br>මෙකී නියමයන්ගේ 5 වන නියමයට අනුකූල වෙමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරියා පත් කළ යුතු අතර, සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යයන් සහ වගකීම් නිර්වචනය කර ඒවා අනුමත කළ යුතුය. | අනුකූල වී ඇත.<br>සභාපතිවරයාගේ හා ප්‍රධාන විධායක නිලධාරියාගේ වගකීම් ඉටු කරනු ලබන්නේ පුද්ගලයන් දෙදෙනෙක් විසිනි. 1995 අංක 28 දරන පනතින් සංශෝධිත 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 11(1) වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යවරයා විසින් සභාපතිවරයා පත් කරනු ලැබේ. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 26(1) වගන්තියේ සඳහන්ව ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයා ලෙස ගැළපෙන සුදුසු පුද්ගලයෙක් පත් කළ යුතු බවත්, ඔහු බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා විය යුතු බවත්ය. සභාපතිගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යයන් හා වගකීම්, ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතට සහ ආයතනික පාලන උපදෙස්වලට අනුකූලව අර්ථ දක්වා ඇත. |
| 1.3 | **අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම**<br><br>අධ්‍යක්ෂ මණ්ඩලය අවම වශයෙන් මාසික කාල පරාසයක් අතරතුර රැස්විය යුතු අතර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වසරකට අවම වශයෙන් දොළොස් වරක් පැවැත්විය යුතුය. එවැනි විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සාමාන්‍යයෙන් ඒ සඳහා සහභාගි වීමට සුදුසුකම් සහිත අධ්‍යක්ෂවරුන්ගේ බහුතරයකගේ ක්‍රියාකාරී සංවාද ඇතුළත් විය යුතුය. ලිඛිත සම්මත/පත්‍රිකා සංසරණය කිරීම තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟතාව ලබාගැනීමෙන් හැකිතාක් වැළකී සිටිය යුතුය. සංසරණය හරහා ලබා ගත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය, සංසරණයෙන් පසු පැවැත්වෙන පළමු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දීම සම්මත කර ගත යුතුය. මණ්ඩල කැඳවිය හැකි අතර/නැතහොත් අදාළ අධ්‍යක්ෂවරුන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය හා අවම වශයෙන් අර්ධ වාර්ෂික පදනමින් භෞතිකව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගි වීමේ කොන්දේසියට යටත්වීම සහතික කරමින් කිසියම් අධ්‍යක්ෂවරයෙකුට අත්‍යත්‍ය (virtual) ආකාරයෙන් පැවැත්විය හැක. | අනුකූල වී ඇත.<br>අධ්‍යක්ෂවරුන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වයෙන් සෑම මසකම විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වේ. අවධානය යොමු කෙරෙන කාල පරාස ඇතුළත මණ්ඩල රැස්වීම් 15ක් පවත්වා ඇත. |

## 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| 1.4 | **අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටිය** | |
| | (අ) ඉදිරිපත් කරන කරුණු හා යෝජනා බැංකුකරණ ව්‍යාපාර ප්‍රවර්ධනය, අවදානම් කළමනාකරණය හා බැංකු සේවක චර්යාවන් හා සම්බන්ධ වන අවස්ථාවල එවන් කරුණු හා යෝජනා; විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට සියලුම අධ්‍යක්ෂවරුන්ට හැකි වන පරිදි විධිවිධාන ක්‍රියාත්මක බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික වීම. | අනුකූල වී ඇත.<br>විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල න්‍යාය පත්‍රයට කරුණු සහ යෝජනා ඇතුළත් කිරීමට සියලුම අධ්‍යක්ෂවරුන්ට හැකි වන පරිදි ක්‍රියාපටිපාටිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අවම වශයෙන් දින 7කට පෙර න්‍යාය පත්‍රය ලබා දෙන අතර එවැනි කරුණු න්‍යාය පත්‍රයට ඇතුළත් කර ගැනීම සඳහා ලේකම් සම්බන්ධ කර ගැනීමට හැකි වී ඇත. |
| | (ආ) සියලුම අධ්‍යක්ෂවරුන්ට සහභාගි වීමේ අවස්ථාව සලසනු පිණිස විධිමත් රැස්වීම්වලට අවම වශයෙන් දින 7කට පෙර දැනුම් දීමක් කෙරෙන බවට අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටිය සහතික විය යුතුය. අනෙකුත් සියලුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වෙනුවෙන් සාධාරණ පෙර දැනුවත් කිරීමක් කළ යුතුය. | අනුකූල වී ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වසර ආරම්භයේ දී රැස්වීම් දින දර්ශනය සකස් කරනු ලබයි. ඊළඟ මණ්ඩල රැස්වීම් පිළිබඳව පෙර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම අවසන් වූ වහාම අධ්‍යක්ෂවරු දැනුවත් කෙරේ. |
| | (ඇ) මාස 12 ක කාලයක් තුළ එක ළඟ පැවති රැස්වීම්වලින් අවම වශයෙන් තුනෙන් දෙකකටවත් සහභාගි නොවූ හෝ නොකඩවා පැවති රැස්වීම් තුනකට හෝ සහභාගි නොවූ අධ්‍යක්ෂවරයෙක්, අධ්‍යක්ෂවරයෙක් ලෙස කටයුතු කිරීම නවතන බවට අධ්‍යක්ෂ මණ්ඩල පටිපාටිය සහතික විය යුතුය. කෙසේ වෙතත්, විකල්ප අධ්‍යක්ෂවරයකු ගේ නියෝජනයෙන් රැස්වීම්වලට සහභාගි වීම පැමිණීම ලෙස පිළිගත යුතුය. | අනුකූල වී ඇත.<br>වසර තුළ එවන් සිදුවීමක් හට නොගැනුනි. |
| 1.5 | **සමාගම් ලේකම්වරයෙක් පත් කිරීම** | |
| | (අ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ කොටස් හිමියන්ගේ රැස්වීම්වල දී ලේකම්වරයෙකු ලබාදෙන සේවා සැපයීම සහ ප්‍රඥප්තිවල සහ දැනට බල පවත්වන වෙනත් ලිඛිත නීතිවල නිශ්චිතව දක්වා ඇති අනෙකුත් කාර්යයන් ඉටු කිරීම ප්‍රධාන වගකීම කොටගත්, බැංකු පනතේ 43 වගන්තියේ විධිවිධාන සපුරාලන ලේකම්වරයෙක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කළ යුතුය. | අනුකූල වී ඇත.<br>ජාතික ඉතිරිකිරීමේ බංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස කටයුතු කරන්නේ 1988 අංක 30 දරන බැංකු පනතේ 43 වගන්තියේ විධිවිධාන සහ එහි සංශෝධනවලට අනුකූල අක්තපත්‍ර/සුදුසුකම් ඇති නීතිඥවරයෙකි. |
| | (ආ) අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටිය සහ සියලු අදාළ නීති, රීති සහ රෙගුලාසි අනුගමනය කෙරෙන බවට සහතික වනු වස් සියලුම අධ්‍යක්ෂවරුන්ට සමාගම් ලේකම්වරයාගේ උපදෙස් සහ සේවා ලබා ගැනීමේ ප්‍රවේශය හිමිවිය යුතුය. | අනුකූල වී ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටි සහ සියලුම අදාළ නීති, රීති සහ රෙගුලාසි අනුගමනය කරන බවට සහතික වීම සඳහා සියලුම අධ්‍යක්ෂවරුන්ට සමාගම් ලේකම්වරයාගේ උපදෙස් හා සේවා ලබාගැනීමේ පූර්ණ ප්‍රවේශය හිමි ය. |
| | (ඇ) අධ්‍යක්ෂවරුන්ගේ පුහුණු, ශක්‍යතා වර්ධන සහ වෘත්තීය සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් නාමයෝජනා සහ පාලන කම්ටුව විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශ සමාගම් ලේකම්වරයා විසින් ක්‍රියාවට නැංවිය යුතුය. | සමාගම් නීති, ශක්‍යතා වර්ධන හා අදාළ දැනුවත් කිරීමේ සැසිවලට හා වෘත්තීය සංවර්ධන වැඩසටහන්වලට අධ්‍යක්ෂවරු සහභාගි වී ඇත. |
| | (ඈ) සමාගම් ලේකම්වරයා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සටහන් සහ වාර්තා පවත්වාගෙන යා යුතු අතර එවන් සටහන්, ඕනෑම සාධාරණ වෙලාවක, ඕනෑම සාධාරණ පෙරදැනුම්දීමක් මත පරීක්ෂා කිරීමට ඕනෑම අධ්‍යක්ෂවරයෙකුට හෝ නියාමකවරයෙකුට විවෘතව තිබිය යුතුය. | අනුකූල වී ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් මණ්ඩල රැස්වීම් සටහන් සහ වාර්තා පවත්වාගෙන යන අතර ඒවා අධ්‍යක්ෂවරුන්ට සහ නියාමකයාට විවෘතය. |
| 1.6 | **අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පවත්වාගෙන යාම**<br>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා ප්‍රමාණවත් විස්තර සහිතව වාර්තා කර ගත යුතු අතර එමගින් අධ්‍යක්ෂ මණ්ඩලය සිය රාජකාරි ඉටු කිරීමේ දී නිසි සැලකිල්ලෙන් හා විචක්ෂණශීලීව කටයුතු කළේ දැයි දැන ගැනීමට හැකිය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල සාකච්ඡාවල ගැඹුර තක්සේරු කර ගැනීම සඳහා යොමුවක් ලෙස ද මෙකී සටහන් යොදා ගත හැකිය. එබැවින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක සටහන්වල පහත කරුණු විය යුතු හෝ යොමු කළ හැකි විය යුතුය.<br>(අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය සාකච්ඡාවල දී භාවිතා කරන ලද දත්ත හා තොරතුරුවල සාරාංශය සහ සාධාරණීකරණය/තාර්කිකත්වය<br>(ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බලන ලද කරුණු | අනුකූල වී ඇත.<br>මේ සඳහා වාර්තා ඇත. |

# 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| | (ඇ) අධ්‍යක්ෂ මණ්ඩලය නිසි සැලකිල්ලෙන් හා විචක්ෂණශීලීව සිය රාජකාරි ඉටු කරයි ද යන්න නිරූපණය කෙරෙන ප්‍රතිවාදී හෝ විසම්මුතික ගැටලු පිළිබිඹු කරන කරුණු ගවේෂණ සාකච්ඡා<br>(ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ උපායමාර්ග සහ ප්‍රතිපත්තිවලට අනුකූල වීම සහ අදාළ නීති සහ රෙගුලාසි නිසි ලෙස පිළිපැදීම විදහා දැක්වෙන ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ සාක්ෂි සහ තහවුරු කිරීම්<br>(ඉ) බැංකුව නිරාවරණය වී ඇති අවදානම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනුම සහ අවබෝධය සහ අනුගමනය කරන ලද අවදානම් කළමනාකරණ පියවර පිළිබඳ විශ්ලේෂණයක් සහ<br>(ඊ) අධ්‍යක්ෂ මණ්ඩල සම්මත කිරීම් සහ තීරණ | |
| 1.7 | **ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීම**<br><br>සාධාරණ ඉල්ලීමක් මත, සුදුසු තත්ත්ව යටතේ, බැංකුවේ පිරිවැයෙන් ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන්ට අවස්ථාව සලසා දෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එකඟ වූ පටිපාටියක් තිබිය යුතුය. සිය රාජකාරී ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා අදාළ අධ්‍යක්ෂවරයාට හෝ අධ්‍යක්ෂවරුන්ට වෙනම ස්වාධීන වෘත්තීය උපදෙස් සැපයීමට අධ්‍යක්ෂ මණ්ඩලය අරමුණු කර ගත යුතුය. | අනුකූල වී ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය සංග්‍රහය භාවිතා වන අතර එමඟින් අධ්‍යක්ෂවරුන්ට සාධාරණ ඉල්ලීමක් මත සුදුසු තත්ත්ව යටතේ ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීමේ හැකියාව පවතී.<br>අධ්‍යක්ෂ මණ්ඩලයට සිය වගකීම් ඉටු කිරීමේ දී අවශ්‍ය විටෙක ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගත හැකි බව ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 27 වන වගන්තියේ තවදුරටත් සඳහන් වේ. |
| 1.8 | **ළබැඳියාවන් පිළිබඳ ගැටුම් කළමනාකරණය**<br><br>(අ) අධ්‍යක්ෂවරු වෙනත් සංවිධාන, අදාළ පාර්ශ්ව සහ වෙනත් සහභාගිත්ව කණ්ඩායම් සමඟ කටයුතු කිරීමේ දී, බැඳීම් ඇති කර ගැනීමේ දී, අධ්‍යක්ෂවරු ළබැඳියාවන් පිළිබඳ ගැටුම් හෝ උද්ගත විය හැකි ළබැඳියාවන් පිළිබඳ ගැටුම් වළක්වා ගත යුතුය. | අනුකූල වී ඇත.<br>අධ්‍යක්ෂවරු තමන් පත් වන අවස්ථාවේ දී, වාර්ෂිකව සහ එහි වෙනසක් සිදුවන ඕනෑම අවස්ථාවක දී සිය ළබැඳියාවන් ප්‍රකාශයට පත්කරන අතර ගැටුම් ඇති විය හැකි ක්ෂේත්‍ර (වෙතොත්) පිළිබඳව වාර්තාවක් කාර්තුවකට වරක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යවනු ලැබේ. අධ්‍යක්ෂවරු එවැනි සාකච්ඡාවලට සහභාගි වීමෙන්, සිය මතය ප්‍රකාශ කිරීමෙන් හෝ ළබැඳියා පිළිබඳ ගැටුමක් ඇති අවස්ථා අනුමත කිරීමෙන් වැළකී සිටිති. |
| | (ආ) අධ්‍යක්ෂවරයෙක් ඔහු/ඇය හෝ ඔහුගේ/ඇයගේ සමීප ඥාතියෙක් හෝ ඔහු ඇය සැලකිය යුතු මට්ටමේ උනන්දුවක් දක්වන කරුණක් හා අදාළ කිසිදු සාකච්ඡාවකට සම්බන්ධ වීමෙන් වැළකී සිටිය යුතු අතර, භෞතිකව සහ/හෝ විද්‍යුත් වශයෙන් ප්‍රවේශ වීම ඇතුළුව ඒ හා සම්බන්ධ තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අවස්ථාව හිමි නොවිය යුතුය. | |
| | (ඇ) අධ්‍යක්ෂවරු අතර මෙන්ම අධ්‍යක්ෂවරු, ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අතර සබඳතා ප්‍රමාණය ඉක්මවූ සුහද, අනවශ්‍ය බලපෑමක් හෝ බලහත්කාරකමක් ඇති නොවන මට්ටමක පවතින බවට අධ්‍යක්ෂවරු සහතික විය යුතුය. | අනුකූල වී ඇත.<br>විනිවිදභාවය හා වගවීම ශක්තිමත් කිරීම සඳහා, අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වයට බලපෑ හැකි සබඳතා නිසි අයුරින් හඳුනා ගෙන, හෙළිදරවු කිරීම සහතික කිරීමේ ක්‍රියාපටිපාටි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපනය කර ඇත. වාර්ෂික වාර්තාවේ අංගයක් වන ආයතනික පාලන වාර්තාවෙහි, සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරියා සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතර ඇති ඕනෑම සබඳතාවක් (මූල්‍ය, ව්‍යාපාර, පවුල් හෝ වෙනත් භෞතික හෝ අදාළ සම්බන්ධතා ඇතුළු) හඳුනාගෙන අනාවරණය කිරීමේ ක්‍රමවේදයක් තිබේද යන්න පිළිබඳව හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතර සබඳතා ඇතුළු එවන් සම්බන්ධකම්වල ස්වභාවය ක්‍රමක්දැයි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පරීක්ෂා කරනු ලබයි. |
| | (ඈ) ළබැඳියාවන් අතර ගැටුම් හඳුනා ගෙන ඒවා කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවීම මණ්ඩලය විසින් අනුමත කර අධීක්ෂණය කළ යුතුය. එයට;<br>(i) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුගේ වගකීම වන්නේ ළබැඳියාවන් අතර ගැටුමකට හේතු විය හැකි හෝ දැනටමත් හේතු වී ඇති ඕනෑම කාරණයක් පිළිබඳව ක්ෂණිකව හෙළිදරව් කිරීමයි;<br>(ii) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුගේ වගකීම වන්නේ දේශපාලන සබඳතා ඇතුළු, ළබැඳියාවන් පිළිබඳ ගැටුම් හෝ ගැටුම්වලට තුඩු දිය හැකි ක්‍රියාකාරකම් හැකි තාක් දුරට වළක්වා ගැනීමයි; | අනුකූල වී ඇත.<br>අදාළ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන අතර ප්‍රතිපත්තියේ විධිවිධානවලට ළබැඳියාවන් අතර ගැටුම් කළමනාකරණය කිරීමේ ක්‍රියාවලියක් අන්තර්ගතය. |

## 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| | (iii) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් ලෙස ක්‍රියා කිරීමේ දී ගැටුම් උද්ගත විය හැකි අවස්ථා;<br>(iv) ඔහු/ඇය හෝ ඔහුගේ/ඇයගේ සමීප සබඳතා ඇති හෝ ඔහු සැලකිය යුතු මට්ටමේ උනන්දුවක් දක්වන ඕනෑම අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් පිළිබඳ සාකච්ඡාවලට සහභාගි වීමෙන් වැළකී සිටීමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුගේ වගකීම්; සහ<br>(v) ප්‍රතිපත්තියට අනුකූල නොවන අවස්ථාවක දී ගත යුතු ක්‍රියා මාර්ග | |
| 1.9 | **වගකීම් ඉටු කිරීමට අපොහොසත් වීම පිළිබඳව දැනුම් දීමේ අවශ්‍යතාව**<br>බැංකුව සිය වගකීම් ඉටු කිරීමට අපොහොසත් බව හෝ, එසේ කිරීමට අපොහොසත් විය හැකි බව හෝ බංකොලොත් විය හැකි බව හෝ තැන්පත්කරුවන්ට සහ අනෙකුත් ණය හිමියන්ට ගෙවිය යුතු ගෙවීම් අත් සිටුවීමට ආසන්න බව හෝ අධ්‍යක්ෂ මණ්ඩලයට පෙනී ගියහොත්, කිසියම් තීරණයක් හෝ ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙර බැංකුවේ තත්ත්වය පිළිබඳව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට වහාම දැනුම් දිය යුතුය. | අනුකූල වී ඇත.<br>බැංකුව නුබුන්වත් වන අතර, එහි නුබුන්වත් භාවයට අභියෝග කිරීමේ එවන් තත්ත්වයක් අදාළ වසර තුළ පැන නැඟී නොමැත. |
| 1.10 | **විචක්ෂණශීලී අවශ්‍යතාවන්ට අනුකූල වීම**<br>ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට පනවන ලද අනෙකුත් විචක්ෂණශීලී අවශ්‍යතා අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපේක්ෂා කරන මට්ටම්වලින් බැංකුව ප්‍රාග්ධනීකරණය කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතුය. | අනුකූල වී ඇත.<br>ප්‍රධාන අවදානම් නිලධාරියා විසින් අවදානම් අභිරුචි පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව නිතිපතා මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩලය කලින් කලට ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය සහ අනෙකුත් විචක්ෂණශීලී පියවර අධීක්ෂණය කරමින් බැංකුව නියමිත ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාත සහ අනෙකුත් විචක්ෂණශීලී අවශ්‍යතාවන්ට අනුකූල වන බව සහතික කරයි. |
| 1.11 | **වාර්ෂික ආයතනික පාලන වාර්තාව**<br>මෙකී උපදේශනවල අනුකූල වීම පෙන්නුම් කෙරෙන වාර්ෂික ආයතනික පාලන වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි පළ කළ යුතුය. | අනුකූල වී ඇත.<br>බැංකුවේ ආයතනික වාර්තාවේ අංගයක් වන මෙම වාර්තාව, වාර්ෂික වාර්තාවෙහි 440 සිට 468 දක්වා පිටු වල අඩංගු කර ඇත. |
| **2** | **අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය**<br>අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය, බැංකුවේ මෙහෙයුම්වල ප්‍රමාණය, පරිමාව, විවිධත්වය හා සංකීර්ණත්වයට අනුරූප වන පරිදි අදාළ ක්ෂේත්‍රවල දැනුම, සුදුසුකම්, හැකියාවන්, අත්දැකීම්, ස්ත්‍රී-පුරුෂභාවය සහ විවිධත්වය ප්‍රවර්ධනය කරන්නා වූ එකිනෙකට වෙනස් පසුබිම්වල මනා සම්මිශ්‍රණයක් බවට සහතික විය යුතුය. සුදුසුකම් හා අත්දැකීම් බැංකුකරණය, මූල්‍ය, ආර්ථික විද්‍යාව, ගිණුම්කරණය, ව්‍යාපාර පරිපාලනය, තොරතුරු තාක්ෂණය, අවදානම් කළමනාකරණය, නීතිය හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරනු ලබන වෙනත් ඕනෑම අදාළ විෂය පථයක විය යුතුය. | |
| 2.1 | **අධ්‍යක්ෂවරු පත්කිරීමේ ක්‍රියාපටිපාටිය**<br>(අ) අධ්‍යක්ෂ මණ්ඩලයේ නව අධ්‍යක්ෂවරු අයදුම් කිරීමේ විධිමත් හා පාරදෘශ්‍ය පටිපාටියක් තිබිය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුප්‍රාප්තික පත්කිරීම් සඳහා ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ක්‍රියාපටිපාටියක් තිබිය යුතුය. | අනුකූල වී ඇත<br>ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 8(1) වගන්තියට අනුව අධ්‍යක්ෂවරු පත් කර ඇත. වර්තමානයේ ස්වාධීන අධ්‍යක්ෂවරු තෝරා ගැනෙන්නේ කැබිනට් පත්‍රිකාවක් යටතේ ස්වාධීන ආයතනයක් විසිනි. |
| | (ආ) කිසියම් බැංකුවක් තවත් බැංකුවක අනුබද්ධ සමාගමක් හෝ සහකාර සමාගමක් වන අවස්ථාවක හැර, බැංකුවක අධ්‍යක්ෂවරයෙක් හෝ සේවකයෙක් වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙක් ලෙස පත් කිරීම, තෝරා ගැනීම හෝ නම් කිරීම නොකළ යුතුය. | අනුකූල වී ඇත.<br>අදාළ කාලය තුළ එවන් පත්කිරීම් සිදු කර නොමැත. |

# 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| 2.2 | **අධ්‍යක්ෂවරු සංඛ්‍යාව** | |
| | (අ) අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරු සංඛ්‍යාව 9ට නොඅඩු 13ට නොවැඩි විය යුතුය. අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාව, බැංකුවේ මෙහෙයුම්වල විශාලත්වය, පරිමාණය, විවිධත්වය හා සංකීර්ණත්වයට සරිලන පරිදි විය යුතුය. | මූල්‍ය වර්ෂය තුළ අධ්‍යක්ෂවරු හය දෙනෙක් අධ්‍යක්ෂ මණ්ඩලයට නම් කරන ලදි. නම් කරන ලද අධ්‍යක්ෂවරු හය දෙනාගෙන් දෙදෙනෙක් පත්වීම් ප්‍රතික්ෂේප කළහ. අධ්‍යක්ෂවරු දෙදෙනෙක් පත්වීමෙන් පසු ඉල්ලා අස්වූහ. එහි ප්‍රතිඵලයක් ලෙස, අධ්‍යක්ෂ මණ්ඩලය මේ වන විට අධ්‍යක්ෂවරු හත් දෙනෙකුගෙන් සමන්විතය. අධ්‍යක්ෂ මණ්ඩල සංයුතියේ පුරප්පාඩු, පත්කිරීමේ අධිකාරියට දැනුම් දී ඇත. |
| | (ආ) 2025 දෙසැම්බර් 31 වන විට අධ්‍යක්ෂ මණ්ඩලයේ අවම වශයෙන් එක් කාන්තා නියෝජිතවරියක් හෝ සිටිය යුතු අතර සාමාජිකයන් 10 දෙනෙකුට වඩා සිටින අධ්‍යක්ෂ මණ්ඩලවල 2025 දෙසැම්බර් 31 වන විට අවම වශයෙන් කාන්තා නියෝජිතවරියන් දෙදෙනෙක් හෝ සිටිය යුතුය. | 2025 ඔක්තෝබර් 8 වන දින එක් කාන්තා අධ්‍යක්ෂවරියක් පත්කිරීමෙන් අවශ්‍යතාවයට අනුකූල වූ අතර ඇය 2025 නොවැම්බර් 24 දින සිට බලපැවැත්වෙන පරිදි සිය තනතුරෙන් ඉල්ලා අස් වූවාය. |
| 2.3 | **විධායක අධ්‍යක්ෂවරු** | |
| | බැංකුවේ ප්‍රධාන කළමනාකාර නිලධාරීන්ගෙන් කෙනෙක් බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත් කළ, තෝරා පත්කර හෝ නම් කළ හැකිය. (මින් ඉදිරියට "විධායක අධ්‍යක්ෂ" ලෙස හැඳින්වෙන) එහෙත් විධායක අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාව, අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරු සංඛ්‍යාවෙන් තුනෙන් එකක් ඉක්මවා නොයා යුතුය. එවන් අවස්ථාවක එකී විධායක අධ්‍යක්ෂවරුන්ගෙන් එක් අයෙක් බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා විය යුතුය. | අනුකූල වී ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂවරු නොමැත.<br>සියල්ලෝම විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති. |
| 2.4 | **විධායක නොවන අධ්‍යක්ෂවරු** | |
| | විධායක නොවන අධ්‍යක්ෂවරු, මනා හැසිරීම හා අවංකභාවය පිළිබඳ පිළිගත හැකි වාර්තාවකින් සමන්විත සුදුසු වෘත්තිකයන් විය යුතු අතර උපාය මාර්ග, කාර්ය සාධනය සහ සම්පත් හා අදාළ ගැටලු ඵලදායී ලෙස ආමන්ත්‍රණය කිරීමෙහි ලා ස්වාධීන විනිශ්චයන් ලබා දීමට මෙන්ම බැංකුවේ තිරසාරත්වයට දායක වීමට අවශ්‍ය දැනුම, කුසලතා සහ අත්දැකීම් සතු විය යුතුය. | අනුකූල වී ඇත<br>විධායක නොවන අධ්‍යක්ෂවරු සියලු දෙනා සමබර තීරණ ගැනීමට සහය වෙමින් අධ්‍යක්ෂ මණ්ඩලය තුළ වගවීම ප්‍රවර්ධනය කරති. ඵලදායී මඟපෙන්වීමක් සහ අධීක්ෂණයක් සැලසීම තුළින් මනා පාලන පිළිවෙත් පවත්වාගෙන යාමට සහ බැංකුවේ දිගුකාලීන තිරසාරත්වය සහ ස්ථාවරත්වය සහතික කිරීමට කැපී පෙනෙන ලෙස දායක වෙති. |
| 2.5 | **ස්වාධීන අධ්‍යක්ෂවරු** | |
| | (අ) සමස්ත අධ්‍යක්ෂවරු සංඛ්‍යාවෙන් අවම වශයෙන් අඩක්වත් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් විය යුතුය. බලපත්‍රලාභී බැංකු 2027 ජනවාරි 1 දින වන විට මේ විධානයට අනුකූල විය යුතුය. | අනුකූල වී ඇත. |
| | (ආ) විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් ස්වාධීන ලෙස නොසැලකෙන්නේ ඔහු/ඇය ට;<br>(i) බැංකුවේ කොටස්වලින් සියයට 1කට වඩා ප්‍රමාණයකට සෘජු සහ වක්‍ර ඡන්ද බලය හිමි සහ/හෝ ඡන්ද බලය රහිත කොටස් හිමිකාරිත්වය දරීම;<br>(ii) ඔහු/ඇය අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීමට පෙර ආසන්නතම වසර දෙකක කාලය තුළ සිදු කර ඇති 7.2 විධානයේ විස්තර කර ඇති බැංකුව සමඟ වන, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 10 ඉක්මවන ඕනෑම ගනුදෙනුවක් තිබුණි නම් හෝ දැනට තිබේ නම්;<br>(iii) අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීමට පෙර ආසන්නතම වසර දෙකක කාලය තුළ බැංකුවේ සේවය කර තිබුණි නම්;<br>(iv) ඔහු/ඇය අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීමට පෙර ආසන්නතම වසර දෙකක කාලය තුළ බැංකුව සමඟ ප්‍රමාණාත්මක ව්‍යාපාරික සබඳතාවක් තිබුණි නම් හෝ දැනට තිබේ නම්;<br>(v) බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් හෝ ප්‍රධාන විධායක නිලධාරියා හෝ ප්‍රධාන කළමනාකරණ නිලධාරියෙක් හෝ ප්‍රමාණාත්මක කොටස් හිමිකරුවෙක් වන සමීප ඥාතියෙක් සිටී නම්; මෙහිදී "සමීප ඥාතියෙක්" යනුවෙන් අදහස් කරන්නේ කලත්‍රයා හෝ යැපෙන දරුවෙකි.<br>(vi) බැංකුවේ විශේෂිත පාර්ශ්වකරුවෙක් නියෝජනය කරන්නේ නම්; | අනුකූල වී ඇත.<br>අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික ප්‍රකාශනවල එවන් තත්ත්වයක් පෙන්වා නොදේ. |

## 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| | (vii) පහත ආකාරයේ සමාගමක හෝ ව්‍යාපාර සංවිධානයක සේවකයෙක් හෝ අධ්‍යක්ෂවරයෙක් හෝ ප්‍රමාණාත්මක කොටස් හිමිකරුවෙක් හෝ ප්‍රමාණාත්මක ව්‍යාපාරික සබඳතාවක් ඇති පුද්ගලයෙක් නම්;<br>(අ) මේ විධානවල, 7.2 විධානයේ අර්ථ දක්වා අති පරිදි බැංකුවේ නියාමක ප්‍රාග්ධනයෙන් සියයට 10 ඉක්මවන, බැංකුව සමඟ දැනට පවතින ගනුදෙනුවක් ඇත්නම්; හෝ<br>(ආ) මූල්‍ය අංශ බලධාරීන් විසින් නිර්දේශ කරන ලද පත්වීම් හැර, බැංකුවේ වෙනත් කිසියම් අධ්‍යක්ෂවරයෙක් සේවය කරන, අධ්‍යක්ෂවරුන් වන හෝ භෞතික කොටස් හිමිකරුවෙක් වන; හෝ<br>(ඇ) බැංකුවේ වෙනත් අධ්‍යක්ෂවරුන්, 7.2 විධානයේ අර්ථ දක්වා ඇති පරිදි බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 10 ඉක්මවන ගනුදෙනුවල නිරත<br>(viii) ඔහු/ඇය අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීමට පෙර ආසන්නතම වසරක කාලයක් බැංකුවට උපදේශන සේවා සපයන සමාගමක උපදේශකයෙක්/අනුශාසකයෙක් ලෙස හෝ ප්‍රධාන උපදේශක/අනුශාසක ලෙස සේවය කර ඇත්නම් හෝ දැනට සේවය කරන්නේ නම්; සහ<br>(ix) ඔහු/ඇය, අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීමට පෙර ආසන්නතම වසරක කාලයක් බැංකුවට විගණන සේවා සපයන ආයතනයක ප්‍රතිඥත හවුල්කරුවෙක් ලෙස කටයුතු කර ඇත්නම් හෝ දැනට කරන්නේ නම්, | |
| | (ඈ) බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ නම් හෙළි කෙරෙන සියලුම ආයතනික සන්නිවේදනවල ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු ප්‍රකාශිතව හඳුනා ගත හැකි විය යුතුය. | අනුකූල වී ඇත. |
| **2.6** | **විකල්ප අධ්‍යක්ෂවරු හරහා සිදු වන නියෝජනය**<br>(අ) බැංකු පනතේ 42 වන වගන්තියේ විධිවිධාන යටතේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව, එවැනි පත්වීමක් කළ දින සිට උපරිම වසරක කාලයක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සුවිශේෂී තත්ත්ව යටතේ පමණක් විකල්ප අධ්‍යක්ෂවරයෙක් හරහා නියෝජනයට අවසර ඇත.<br>(ආ) ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් නියෝජනය කිරීමට විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත් කරනු ලැබුවහොත්, එසේ පත්වීම ලබන පුද්ගලයා ස්වාධීන අධ්‍යක්ෂවරයාට අදාළ නිර්ණායක සපුරාලිය යුතුය.<br>(ඇ) බැංකුවේ දැනට සිටින අධ්‍යක්ෂවරයෙක්, බැංකුවේ දැනට සිටින වෙනත් අධ්‍යක්ෂවරයෙකුගේ විකල්ප අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්කළ නොහැක.<br>(ඈ) එක් අධ්‍යක්ෂවරයෙකුගේ විකල්ප අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලද පුද්ගලයෙක්, එම අධ්‍යක්ෂ මණ්ඩලයේම වෙනත් අධ්‍යක්ෂවරයෙකුගේ විකල්ප අධ්‍යක්ෂවරයා ලෙස පත්කළ නොහැක. | අදාළ නැත<br>ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත විකල්ප අධ්‍යක්ෂවරු පත් කිරීම සඳහා විධිවිධාන සපයන්නේ නැත. |
| **2.7** | **අධ්‍යක්ෂ මණ්ඩලයේ ගණ පූරණය**<br>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල ගණ පූරණය අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අඩකගෙන් සකස් විය යුතුය. එවැනි රැස්වීමක ගණපූරණය සකස් වීමට අවශ්‍ය අධ්‍යක්ෂවරු සංඛ්‍යාව පැමිණ සිටියද, එවන් රැස්වීම්වලට පැමිණ සිටින අධ්‍යක්ෂවරුන් ගණනෙන් තුනෙන් එකකට වඩා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු නොවන්නේ නම්, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් නිසි පරිදි සකස් නොකළ යුතුය. බලපතුලාභී බැංකු 2026 ජනවාරි 1 දින වන විට මේ විධානයට අනුකූල විය යුතුය. | අනුකූල වී ඇත.<br>ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 12 වන වගන්තියට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ ගණ පූරණය හතරක් වන අතර එය අධ්‍යක්ෂවරුන්ගෙන් අඩකට වඩා වැඩි වන අතර ඔවුන් සියල්ලෝම විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති. |

## 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| 3 | **අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය**<br>බලපත්‍රලාභී සියලුම බැංකුවල අධ්‍යක්ෂවරයෙක් ලෙස කටයුතු කරන හෝ කටයුතු කිරීමට අපේක්ෂා කරන පුද්ගලයෙක් පහත සඳහන් අවශ්‍යතාවන්ට අනුකූල විය යුතුය. | |
| 3.1 | **ඖචිත්‍යය හා යෝග්‍යතාව මැන බැලීමේ නිර්ණායක**<br>බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙක් ලෙස කටයුතු කරන හෝ එසේ කටයුතු කිරීමට අපේක්ෂා කරන පුද්ගලයෙකුගේ ඖචිත්‍යය හා යෝග්‍යතාව තීරණය කිරීම සඳහා බැංකු පනතේ 42 වන වගන්තියේ හා 76H වගන්තියේ විධිවිධාන අදාළ කර ගත යුතුය. එහි දක්වා ඇති කිසියම් නිර්ණායකයකට අනුකූල නොවීම, අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීමට, තෝරා ගැනීමට හෝ නම් කිරීමට හෝ අධ්‍යක්ෂවරයෙක් ලෙස අඛණ්ඩව කටයුතු කිරීමට නුසුදුසුකමක් වේ. බැංකු පනතේ 42 වන වගන්තිය සහ 76H වගන්තිය ප්‍රකාරව බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙක් පත් කිරීම, තෝරාගැනීම, නම් කිරීමට පෙර එක් එක් පුද්ගලයාගේ ඖචිත්‍යය හා යෝග්‍යතාවය සම්බන්ධයෙන් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. | අනුකූල වී ඇත.<br>සියලුම අධ්‍යක්ෂවරු පත්කර ඇත්තේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතියට යටත්වය. |
| 3.2 | **අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවයට අදාළ අමතර අවශ්‍යතා**<br>(අ) අධ්‍යක්ෂවරයෙක් ලෙස කටයුතු කරන පුද්ගලයෙකුගේ වයස අවුරුදු 70 නොඉක්මවිය යුතුය.<br>(ආ) ප්‍රධාන විධායක නිලධාරි හෝ ප්‍රධාන කළමනාකරණ නිලධාරි තනතුරු දරන අධ්‍යක්ෂවරයෙක් හැර අනෙකුත් අධ්‍යක්ෂවරුන්ගේ මුළු සේවා කාලය අවුරුදු නවය නොඉක්මවිය යුතුය.<br>(ඇ) පුද්ගලයෙක් බැංකුවට අනුබද්ධිත සමාගම හෝ හවුල්කාර සමාගම් ඇතුළු සමාගම්/ස්ථාන/ආයතන 20කට වැඩි ගණනක අධ්‍යක්ෂ ධුර නොදැරිය යුතුය.<br>(ඈ) බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් ලෙස වගකීම් ඉටු කිරීමට අධ්‍යක්ෂවරුන්ට ප්‍රමාණවත් කාලයක් තිබිය යුතුය. | අනුකූල වී ඇත.<br>අධ්‍යක්ෂවරුන් විසින් ලබා දී ඇති ප්‍රකාශ මගින් සියලුම අධ්‍යක්ෂවරු වසය අවුරුදු 70ට අඩු බවත්, සඳහන් කර ඇති පරිදි බැංකුවට අනුබද්ධිත ආයතන ඇතුළුව සමාගම් 20කට වඩා වැඩියෙන් අධ්‍යක්ෂ ධුර නොදරන බවත් සහතික විය. |
| 3.3 | **විරාම කාලය**<br>ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙක් හෝ ප්‍රධාන විධායක නිලධාරියෙක් ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකුවක ඔහුගේ/ඇයගේ ධූරය අවසන් වූ දින සිට මාස හයක් ඉක්මවා යාමට පෙර ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වෙනත් බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙක් හෝ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස පත් නොකළ යුතුය. ප්‍රතිව්‍යුහගත කළ යුතු බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිසංවිධානය කිරීමේ දී විශ්‍රාම යාමට නියමිත බැංකුකරුවන් ගේ විශේෂඥතා අවශ්‍ය විය හැකි සුවිශේෂී අවස්ථාන් හිදී සිදු වන ඕනෑම වෙනසක් ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ව අනුමැතියට යටත් විය යුතුය. | අනුකූල වී ඇත.<br>පත්කර ඇති අධ්‍යක්ෂවරු හෝ ප්‍රධාන විධායක නිලධාරියා සඳහන් කර ඇති ආකාරයේ කාර්යයන්වල නිරත වී නොමැත. |
| 4 | **කාර්යයන් පැවරීම**<br>සිය කාර්යයන් පැවරීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් අවශ්‍යතා හා අනුකූල විය යුතුය. | |
| 4.1 | **වගකීම් බෙදීම**<br>බලතල එක් පුද්ගලයෙක් වෙත සංකේන්ද්‍රානය නොවන පරිදි බලතල හා අධිකාරිත්වයේ මනා තුලනයක් සහතික වනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩලයේ මට්ටමෙන් සහ ප්‍රධාන කළමනාකරණ මට්ටමෙන් වගකීම් පැහැදිලිව බෙදිය යුතුය. | අනුකූල වී ඇත.<br>උපායමාර්ගික මඟ පෙන්වීම, අධීක්ෂණය හා පාලනය සඳහා මණ්ඩලය මූලික වශයෙන් වග කිව යුතු අතර සමාගම් ක්‍රියාකාරකම් එදිනෙදා කළමනාකරණය කිරීම සහ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම ප්‍රධාන විධායක නිලධාරියාට සහ ප්‍රධාන කළමනාකරණ කණ්ඩායමට පැවරේ. |

## 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| 4.2 | **අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සඳහා වන විශේෂිත කරුණු**<br><br>බැංකුවේ දිශානතිය සහ පාලනය ස්ථිර ලෙස සිය අධිකාරිය යටතේ පවතින බවට සහතික වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට විශේෂයෙන් සිය තීරණ සඳහා වෙන් කරන ලද විධිමත් කාර්ය සටහනක් තිබිය යුතුය. | අනුකූල වී ඇත.<br>බලය බෙදාහැරීම ක්‍රියාත්මකය. අධ්‍යක්ෂ මණ්ඩලය බලය පැවරීමේ සැලසුම් සමාලෝචනය කොට අනුමත කරන අතර බලය පැවරීමේ විස්තාරණය බැංකුවේ අවශ්‍යතා සපුරා ලන අතරම අධ්‍යක්ෂ මණ්ඩලයට කිසිදු බාධාවකින් තොරව සිය වගකීම් හා කාර්යයන් ඵලදායී අයුරින් ඉටු කිරීමට හැකි වන බවට සහතික වේ. |
| 4.3 | **බලය පැවරීමේ සීමා**<br><br>කිසියම් පැවරීමක් නිසා සමස්තයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් ඉටු කිරීමේ හැකියාව සැලකිය යුතු ලෙස අඩපණ කෙරෙන හෝ අවම කෙරෙන ප්‍රමාණයකට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කිසිදු කරුණක් අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවකට, ප්‍රධාන විධායක නිලධාරියාට, විධායක අධ්‍යක්ෂවරුන්ට හෝ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට නොපැවරිය යුතුය. | අනුකූල වී ඇත.<br>සමස්තයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයට සිය කාර්යයන් ඉටු කිරීමේ හැකියාවට බාධා පමුණුවන හෝ අවම කරන එවන් බලයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා දී නොමැත. |
| 4.4 | **බලය පැවරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම**<br><br>බැංකුවේ අවශ්‍යතාවන්ට අදාළව පවතින බවට සහතික කරගැනීම සඳහා මණ්ඩලය විසින් දැනට ක්‍රියාත්මකව පවතින බලය පැවරීමේ ක්‍රියාවලි වරින් වර සමාලෝචනය කළ යුතුය. | අනුකූල වී ඇත.<br>බලය පැවරීමේ සැලසුම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වරින් වර හෝ අවශ්‍යතා පදනම මත/කළමනාකාරිත්වයේ ඉල්ලීම මත සමාලෝචනය කරනු ලබයි. |
| **5** | **සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරියා**<br><br>ඕනෑම බැංකුවක කළමනාකරණයේ ප්‍රධාන අංග දෙකක් ඇත. එනම් (අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගෙන යන සමස්ත පාලනය, සහ (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උපායමාර්ගික ඉලක්ක, ආයතනික වටිනාකම්, සමස්ත අවදානම් ප්‍රතිපත්තිය සහ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියට අනුව ප්‍රධාන විධායක නිලධාරියා විසින් ගෙන යන බැංකුවේ ව්‍යාපාරවල එදිනෙදා කළමනාකරණය | |
| 5.1 | **සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි අතර වගකීම් බෙදීම**<br><br>සභාපතිගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ භූමිකා වෙන් වෙන්ව පැවතිය යුතු අතර ඒවා තනි පුද්ගලයෙක් විසින් ඉටු කළ යුතු නොවේ. සභාපතිවරයා සහ විධායක නිලධාරියා අතර වගකීම් බෙදීම පැහැදිලිව ස්ථාපිත කර ලිඛිතව දැක්විය යුතුය. | අනුකූල වී ඇත.<br>සභාපතිගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ වගකීම් ඉටු කරන්නේ පුද්ගලයන් දෙදෙනෙක් විසිනි. |
| 5.2 | **සභාපතිවරයාගේ යෝග්‍යතාව**<br><br>(අ) සභාපතිවරයා ස්වාධීන සහ විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් විය යුතුය. මුල් පත්වීමෙන් පසු සභාපතිවරයා ස්වාධීන නොවන විටෙක, අතුරු සැලසුමක් වශයෙන්, මනා ලෙස ලේඛනගත කරන ලද යොමු කිරීම් අනුදේශ සමඟින් මාස හයක් ඉක්මවා නොයන කාලයක් සඳහා මණ්ඩලය විසින් ස්වාධීන අධ්‍යක්ෂවරයෙක්, ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ ලෙස නම් කළ යුතුය. ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයාගේ තනතුර බැංකුවේ වාර්ෂික වාර්තාවෙන් අනාවරණය කළ යුතුය. | අනුකූල වී ඇත.<br>සභාපතිවරයා විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙක් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත් කරනු ඇත. |
| | (ආ) ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙක් සභාපතිවරයා ලෙස කටයුතු කරන අවස්ථාවක, එවැනි අධ්‍යක්ෂවරයෙකුට විධිවිධාන 3 ඇතුළු අදාළ නීති සහ රෙගුලාසිවලට යටත්ව 2027 දෙසැම්බර් 31 ඉක්මවා නොයන කාලයක් තෙක් සභාපති ධුරයේ රැඳී සිටිය හැක. | අදාළ නැත. |
| | (ඇ) මෙම විධිවිධානයේ බලපාන දිනයෙන් පසු පත් කරනු ලබන සභාපතිවරයා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් විය යුතුය. | අදාළ නැත. |

# 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| 5.3 | **සභාපතිවරයාගේ වගකීම්** | |
| | සභාපතිවරයා | අනුකූල වී ඇත. |
| | (අ) අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සැලසීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී ලෙස කටයුතු කරන බවට හා එහි වගකීම් නිසි ලෙස ඉටු කරන බවට සහතික වීම; | සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය දෙමින් අධ්‍යක්ෂ මණ්ඩලය සිය වගකීම් ඉටු කිරීමේ දී ඵලදායී අයුරින් ක්‍රියා කරන බවට සහතික වෙයි. අධ්‍යක්ෂ මණ්ඩලය කාලානුරූපව සියලු ප්‍රධාන කරුණු සාකච්ඡාවට ලක් කරයි. |
| | (ආ) සියලුම ප්‍රධාන සහ අදාළ ගැටලු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කාලානුරූප අයුරින් සාකච්ඡා කරන බවට සහතික වීම; | ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඉදිරිපත් කිරීමට පෙර කෙටුම්පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල සටහන් සභාපතිවරයා විසින් සමාලෝචනය කරනු ලබයි. සෑම අධ්‍යක්ෂවරයෙක් විසින් වාර්ෂිකව සිදු කරන ස්වයං තක්සේරු ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන අතර එකී තක්සේරු හා අදාළ වාර්තා පවත්වාගෙන යනු ලැබේ. |
| | (ඇ) සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකම න්‍යාය පත්‍රය අනුමත කිරීම, සුදුසු අවස්ථාවල දී, අනෙකුත් අධ්‍යක්ෂවරුන් විසින් න්‍යාය පත්‍රයට ඇතුළත් කරන ලෙස යෝජනා කරන ඕනෑම කරුණක් සලකා බැලීම. සභාපතිවරයාට, න්‍යාය පත්‍රය සැකසීම සමාගම් ලේකම්ට පැවරිය හැක. | සභාපතිවරයා රැස්වීම් න්‍යාය පත්‍රය කෙටුම්පත් කරයි. |
| | (ඈ) අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී මතු වන ගැටලු පිළිබඳව සියලුම අධ්‍යක්ෂවරු නිසි ලෙස දැනුවත් කෙරෙන බවට හා අධ්‍යක්ෂවරුන්ට කාලෝචිත අයුරින් ප්‍රමාණවත් තොරතුරු ලැබෙන බවට සහතික වීම; | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී මතු කෙරෙන කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රමාණවත් පරිදි දැනුවත් බවට සභාපතිවරයා සහතික වේ. එසේ සහතික වීම සඳහා පහත ක්‍රියාපටිපාටි ක්‍රියාත්මකය; |
| | (ඉ) අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියාකාරකම්වලට පූර්ණ හා ක්‍රියාකාරී ලෙස දායක වීම සඳහා සියලුම අධ්‍යක්ෂවරු දිරිගැන්වීම සහ බැංකුවේ උපරිම යහපත වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියා කරන බවට සහතික වීම සඳහා ප්‍රමුඛත්වය ගැනීම; | සමාලෝචනයට හා අතිරේක තොරතුරු හා පැහැදිලි කිරීම් ඉල්ලා සිටීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙමින් පෙර පැවති රැස්වීමේ සටහන් ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා රැස්වීමට දින හතකට පෙර සංසරණය කිරීම සහ රැස්වීමෙන් අනතුරුව, අවශ්‍ය අවස්ථාවන් හි දී ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් විසින් රැස්වීමෙන් පසු මතු කරන ලද ගැටලු පිළිබඳ පසු විපරම් සිදුකරයි. |
| | (ඊ) විශේෂයෙන්, විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ඵලදායී දායකත්වය සඳහා පහසුකම් සැලසීම සහ විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් අතර අර්ථවත් සාකච්ඡා සහතික කිරීම; | සභාපතිවරයාගේ භූමිකාව ඇගයීම සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්ය සාධනය පිළිබඳ සමස්ත ඇගයීම අධ්‍යක්ෂ ස්වයං-ඇගයීමේ ක්‍රියාවලියට අන්තර්ගත කර ඇත. ස්වයං ඇගයීම් පත්‍රිකා ලේකම් අංශයෙන් සම්පූර්ණ කෙරෙන අතර ඒවා ලබා ගැනීම සිදුවෙමින් පවතී. |
| | (උ) අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී විවේචනාත්මක හා අර්ථවත් සාකච්ඡාවල යෙදීමට සියලුම අධ්‍යක්ෂවරු දිරි ගැන්වීම සහ තීරණ ගැනීමේ ක්‍රියාවලිය ඇතුළත විසංවාදී අදහස් නිදහසේ ප්‍රකාශනයට හා සාකච්ඡා කිරීමට අවස්ථාව ඇති බව සහතික කිරීම; | විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් වන සභාපතිවරයා, ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හෝ වෙනත් ඕනෑම විධායක කාර්යයක් අධීක්ෂණය කිරීමේ විධායක කටයුතුවලට සෘජුව සම්බන්ධ නොවේ. |
| | (ඌ) ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්, අනෙකුත් සේවකයන් හෝ කුමන ආකාරයක හෝ වෙනත් විධායක වගකීම් හා සෘජුව අධීක්ෂණය කිරීම හා සම්බන්ධ ක්‍රියාකාරකම්වල නිරත නොවීම; සහ | බැංකුව සිය කොටස් හිමිකරු වන ශ්‍රී ලංකා රජය සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගනී. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතට අනුව පත්කර ඇති නිල බලයෙන් පත්වන අධ්‍යක්ෂවරයා, අධ්‍යක්ෂ මණ්ඩලය සහ කොටස් හිමිකරු අතර සන්නිවේදන මාර්ගය ලෙස ක්‍රියා කරයි. |
| | (එ) කොටස් හිමිකරුවන් සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වාගෙන යාම උදෙසා සුදුසු පියවර ගන්නා බවට හා කොටස් හිමිකරුවන්ගේ අදහස් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සන්නිවේදනය වන බවටත් සහතික වීම | |
| 5.4 | **ප්‍රධාන විධායක නිලධාරියාගේ ක්‍රියාකලාපය** | |
| | (අ) ප්‍රධාන විධායක නිලධාරියා බැංකුවේ මෙහෙයුම් සහ ව්‍යාපාරවල එදිනෙදා කළමනාකරණය භාරව සිටින ඉහළම නිලධාරියා ලෙස කටයුතු කළ යුතු අතර වෙනත් කිසිදු විධායක කාර්යයක් නොදැරිය යුතුය. | අනුකූල වී ඇත. |
| | (ආ) බලපත්‍රලාභී බැංකුවේ අනුබද්ධිත ආයතනයක හෝ ආශ්‍රිත සමාගමක විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් ලෙස හැර, ප්‍රධාන විධායක නිලධාරියා වෙනත් බලපත්‍රලාභී බැංකුවක හෝ වෙනත් සමාගමක/ආයතනයක/ස්ථානයක සේවකයෙක් හෝ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත් කිරීම හෝ නම් කිරීම නොකළ යුතුය. | |
| | (ඇ) බලපත්‍රලාභී බැංකුවේ අනුබද්ධිත හෝ ආශ්‍රිත සමාගමක විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් ලෙස ප්‍රධාන විධායක නිලධාරියාව පත්කරනු ලැබුවහොත්, එම වගකීම් ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් තමා ඵලදායී ලෙස ඉටු කරන වගකීම්වලට බලනොපාන බවට ඔහු/ඇය සහතික විය යුතුය. | |
| 5.5 | **ප්‍රධාන විධායක නිලධාරියාගේ යෝග්‍යතාව** | |
| | ප්‍රධාන විධායක නිලධාරියා ලෙස පත්කරන ලද නිලධාරියා බැංකු පනතේ 44A සහ 76H වගන්තිවලට අනුව එවන් තනතුරක් දැරීමට සුදුසු හා යෝග්‍ය පුද්ගලයෙක් විය යුතු අතර, බැංකුවේ මෙහෙයුම්වල ප්‍රමාණය, පරිමාණය, විවිධත්වය සහ සංකීර්ණත්වය සැලකිල්ලට ගනිමින් මූලික බැංකුකරණ කාර්යයන් සඳහා අවශ්‍ය ප්‍රමාණවත් අධිකාරිත්වය, පෞරුෂය, දැනුම, නිපුණතා සහ විශේෂඥතා<br>සතු විය යුතුය. | අනුකූල වී ඇත.<br>උචිත හා යෝග්‍යතා ලිපි, දිවුරුම් ප්‍රකාශ සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ලිපි ඇත. |

## 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| 6 | **අධ්‍යක්ෂ මණ්ඩල කමිටු**<br>මේ නියෝගවල නියෝග 6.2 – 6.6 දක්වා ඇති පරිදි අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල කමිටු පහක් හෝ බලපතලාභී බැංකුවක් සතු විය යුතුය. | |
| 6.1 | **අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සඳහා අවශ්‍යතා** | |
| | (අ) සෑම කමිටුවක්ම සෘජුව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතුය. | අනුකූල වී ඇත. |
| | (ආ) එක් එක් කමිටුව සතුව, විශේෂයෙන්, කමිටුවට අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරමින් ක්‍රියා කිරීමට බලයක් තිබේද, නැතහොත් නිශ්චිත ගැටලුවක් පරීක්ෂා කර නිර්දේශ සහිතව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීමට බලයක් තිබේද යන්න අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සඳහන් කළ යුතුය. | අධ්‍යක්ෂ මණ්ඩලය කමිටු පහක් (05) පිහිටුවා ඇත. 2024 අංක 5 දරන බැංකු පනතේ විධිවිධාන අනුව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් පාරිශ්‍රමික කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අනිවාර්ය කමිටු වන අතර අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ග කමිටුව පත්කරන ලද්දේ බැංකුවේ තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සඳහාය. තවද, විධිවිධාන අනුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ලැයිස්තුගත නොකළ බැංකුවක් බැවින්, අදාළ පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව 2027 ජනවාරි 1 දින වන විට ස්ථාපනය කළ යුතුය. කෙසේ වුවත්, බැංකුව 2026 පෙබරවාරි 17 වන දින සිට බලපැවැත්වෙන පරිදි අදාළ පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුවක් පිහිටුවා ඇති අතර විෂය ක්ෂේත්‍රය ස්ථාපනය කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටී. |
| | (ඇ) කමිටු සභාපතිගේ අධීක්ෂණය යටතේ, වෙනත් කරුණු අතර, රැස්වීම් සංවිධානය කිරීම හා ප්‍රමාණවත් විස්තර සහිතව සටහන් හා වාර්තා පවත්වාගෙන යාම සඳහා සියලුම කමිටු විසින් ලේකම්වරයෙක් පත්කර ගත යුතුය. සෑම කමිටුවකම සටහන් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. | කමිටු සභාපති හරහා සියලුම කමිටු සෘජුව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි. |
| | (ඈ) එක් එක් කමිටුව ගණපූරණය, අවම වශයෙන් කමිටු සාමාජිකයන් අඩකගෙන් සමන්විත විය යුතුය. | එක් එක් අනුකමිටුවේ වගකීම්, භූමිකා හා කාර්ය සාධනය පිළිබඳ වාර්තාවක් වාර්ෂික වාර්තාවේ පිටු අංක 245 සිට 253 දක්වා ඉදිරිපත් කර ඇත. |
| | (ඉ) වාර්ෂික රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එක් එක් කමිටුවේ කාර්ය සාධනය, වගකීම් සහ භූමිකා පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. | |
| 6.2 | **විගණන කමිටුව** | |
| | (අ) කමිටුවේ සභාපතිවරයා ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් විය යුතු අතර ඔහු අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ වෙනත් කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවක සභාපතිවරයා නොවිය යුතු සේම මූල්‍ය, ගිණුම්කරණය සහ/හෝ විගණනය පිළිබඳ සුදුසුකම් සහ පළපුරුද්දෙන් සමන්විත විය යුතු අතර පිළිගත් වෘත්තීය ගිණුම්කරණ ආයතනයක සාමාජිකත්වය දැරිය යුතුය. | අනුකූල වී ඇත.<br>විගණන කමිටු සභාපති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි. අවශ්‍ය සුදුසුකම් හා අත්දැකීම් ඔහු සතුය. |
| | (ආ) කමිටුවේ සාමාජිකයන් සියල්ලෝම විධායක නොවන අධ්‍යක්ෂවරුන් විය යුතු අතර බහුතරය ස්වාධීන අධ්‍යක්ෂවරු විය යුතුය. බැංකුවේ මෙහෙයුම්වල ප්‍රමාණය, පරිමාව, විවිධත්වය සහ සංකීර්ණත්වයට සරිලන මූල්‍ය, ගිණුම්කරණ සහ විගණන පිළිබඳ නිපුණත්වයක් සහ විශේෂඥ දැනුමේ සාමූහික තුලනයක් සාමාජිකයන් සතු විය යුතුය. | අනුකූල වී ඇත.<br>අධ්‍යක්ෂවරු සියල්ලෝම විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති. බැංකුවේ මෙහෙයුම්වල ප්‍රමාණය, පරිමාව, විවිධත්වය සහ සංකීර්ණත්වයට සරිලන මූල්‍ය, ගිණුම්කරණ සහ විගණනය පිළිබඳ නිපුණත්වයක් සහ විශේෂඥ දැනුමේ සාමූහික තුලනයක් ඔවුන් සතුය. |
| | (ඇ) කමිටු සාමාජිකයන්ගෙන් බහුතරය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු සාමාජිකයන්ගෙන් ද ප්‍රතිලෝමව ද සමන්විත නොවිය යුතුය. | අනුකූල වී ඇත. |
| | (ඈ) කමිටුව පහත කරුණු හා අදාළ නිර්දේශ ඉදිරිපත් කළ යුතුය;<br>(i) අදාළ ආඥාපනත්වලට අනුකූලව විගණන සේවා සැපයීම සඳහා බාහිර විගණකවරයෙක් පත් කිරීම;<br>(ii) බාහිර විගණකවරුන්ට කලින් කලට නිකුත් කරන ලද මහ බැංකු මාර්ගෝපදේශ ක්‍රියාවට නැංවීම;<br>(iii) අදාළ ගිණුම්කරණ ප්‍රමිත භාවිතය; සහ<br>(iv) බාහිර විගණකවරයාගේ සේවා කාලය වසර හය නොඉක්මවිය යුතු අතර, සෑම වසර තුනකට වරක් විශේෂ සම්බන්ධතා සහකරු වෙනස් කළ යුතුය යන තත්ත්වය යටතේ බාහිර විගණකවරයාගේ සේවා කාලය, විගණන ගාස්තු සහ ඉල්ලා අස්වීම හෝ සේවයෙන් පහ කිරීම | අදාළ නැත.<br>(i) ආඥා පනත්වලට අනුව බැංකුවේ බාහිර විගණන නිලධාරියා වන්නේ විගණකාධිපතිය. එබැවින්, බාහිර විගණන නිලධාරියා සම්බන්ධයෙන් කමිටුවට ඉටු කිරීමට කාර්යභාරයක් නොමැත.<br>(ii) බාහිර විගණන නිලධාරියා වන්නේ විගණකාධිපති බැවින් ඉහත සඳහන් සියලුම කරුණු සැලකිල්ලට ගෙන ඇත.<br>(iii) සහ (IV) විෂය ක්ෂේත්‍රය අනුව අනෙකුත් කරුණු ඇතුළු පහත සඳහන් නිර්දේශ විගණන කමිටුව විසින් කෙරේ.<br>• විගණන නිලධාරීන් සඳහා මහ බැංකුව විසින් කලින් කලට නිකුත් කරන ලද මාර්ගෝපදේශ ක්‍රියාවට නැංවීම<br>• අදාළ ගිණුම්කරණ ප්‍රමිති භාවිතයි |

## 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|
| (ඉ) කම්ටුව විසින් බාහිර විගණකවරයාගේ ස්වාධීනත්වය, අවංකභාවය, වෛෂයිකභාවය හා අදාළ ප්‍රමිති සහ ප්‍රශස්ත භාවිතයන්ට අනුකූලව විගණන ක්‍රියාවලීන් හි ඵලදායකත්වය සමාලෝචනය කර අධීක්ෂණය කළ යුතුය. | අනුකූල වී ඇත.<br>බාහිර විගණන නිලධාරියා විගණකාධිපති බැවින් ස්වාධීනත්වය හා වෛෂයිකභාවය ආරක්ෂා කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම්වල දී විගණන ක්‍රියාවලියේ ඵලදායකත්වය පිළිබඳව රජයේ විගණන අධිකාරිවරයා සමඟ සාකච්ඡා කෙරේ. |
| (ඊ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බාහිර විගණන නිලධාරීන් සඳහා නිකුත් කර ඇති මාර්ගෝපදේශ යටතේ අවසර ලබා දී ඇති විගණන නොවන සේවා සැපයීමට බාහිර විගණන නිලධාරියෙකු සම්බන්ධ කරගැනීම පිළිබඳ ප්‍රතිපත්තියක් කම්ටුව විසින් සකස් කොට ක්‍රියාවට නැංවිය යුතුය. විගණන නොවන සේවා සැපයීම, බාහිර විගණකවරයෙකුගේ ස්වාධීනත්වයට හෝ වෛෂයිකත්වයට හානි නොකෙරෙන බවට කම්ටුව විසින් සහතික විය යුතුය. විගණන නොවන සේවා සැපයීම සම්බන්ධයෙන් බාහිර විගණකවරයාගේ ස්වාධීනත්වය හෝ වෛෂයිකත්වය මැන බැලීමේ දී කම්ටුව පහත සඳහන් කරුණු සලකා බැලිය යුතුය.<br>(i) විගණන සමාගමේ නිපුණතා සහ පළපුරුද්ද, එය විගණන නොවන සේවා සඳහා සුදුසු සැපයුම්කරුවෙක් බවට පත් කරන්නේද;<br>(ii) බාහිර විගණකවරයෙක් විසින් එවන් සේවා සැපයීම හේතු කොට ගෙන විගණන කාර්යයේ ස්වාධීනත්වයට සහ/හෝ වෛෂයිකත්වයට තර්ජනයක් එල්ල නොවන බවට ආරක්ෂණ ක්‍රමෝපායන් තිබේද; සහ<br>(iii) විගණන නොවන සේවාවල ස්වභාවය, තනි තනිව සහ විගණන සමාගමට සාපේක්ෂව සමස්තයක් ලෙස ගාස්තු මට්ටම, බාහිර විගණකවරයාගේ වෛෂයිකත්වයට සහ/හෝ ස්වාධීනත්වයට තර්ජනයක් එල්ල කරන්නේද | අදාළ නැත.<br>බාහිර විගණන නිලධාරියා විගණකාධිපති බැවින් ස්වාධීනත්වය හා වෛෂයිකත්වය ආරක්ෂා කෙරේ. |
| (උ) විගණනය ආරම්භ කිරීමට පෙර පහත කරුණු ඇතුළත්ව විගණනයේ ස්වභාවය සහ විෂය පරාසය පිළිබඳ බාහිර විගණකවරයා සමඟින් සාකච්ඡා කොට අවසන් තීරණයකට එළඹිය යුතුය;<br>(i) ආයතනික පාලනය සහ මූල්‍ය වාර්තාකරණය මත කළමනාකාරිත්වයේ අභ්‍යන්තර පාලනය හා සම්බන්ධ අදාළ විධිවිධානවලට බැංකුවේ අනුකූලතාව පිළිබඳ තක්සේරුවක්;<br>(ii) අදාළ ගිණුම් ප්‍රතිපත්ති සහ වාර්තාකරණ ප්‍රතිඥාවන්ට අනුගත වෙමින් බාහිර අරමුණු උදෙසා මූල්‍ය ප්‍රකාශන සැකසීම; සහ<br>(iii) එක් විගණන ආයතනයකට වඩා සම්බන්ධ වන විට ආයතන අතර සම්බන්ධීකරණය | අනුකූල වී ඇත. |
| (ඌ) බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදයන් හි වඩා විනිවිදභාවයක් හා පරිපූර්ණත්වයක් සහ ගිණුම්කරණ සහ අනෙකුත් අභ්‍යන්තර පාලන ක්‍රමවල ප්‍රමාණාත්මක බව සහතික කිරීමේ අරමුණෙන් කම්ටුව ගිණුම්කරණ ප්‍රතිපත්ති/ක්‍රමවේද සහ අභ්‍යන්තර පාලන ව්‍යූහය සමාලෝචනය කළ යුතුය. | අනුකූල වී ඇත. |

## 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|
| (එ) තොරතුරු හෙළිදරවු කිරීම සඳහා සකස් කොට ඇති බැංකුවේ මූල්‍ය ප්‍රකාශන, එහි වාර්ෂික වාර්තාව, ගිණුම් සහ කාර්තු වාර්තා, සහ ඒවායේ අඩංගු වැදගත් මූල්‍ය වාර්තාකරණ විනිශ්චයන්හි පරිපූර්ණත්වය නිරීක්ෂණය සඳහා කමිටුව බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කළ යුතුය. බැංකුවේ වාර්ෂික වාර්තාව, ගිණුම් සහ කාර්තු වාර්තා සමාලෝචනයේ දී, අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙර කමිටුව පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතුය;<br>(i) ප්‍රධාන විනිශ්චය ක්ෂේත්‍ර;<br>(ii) ගිණුම්කරණ ප්‍රතිපත්තිවල හා භාවිතයන් හි වෙනස්කම්;<br>(iii) විගණනයෙන් මතුවන කැපී පෙනෙන හැඩ ගැසීම්;<br>(iv) අඛණ්ඩ පැවැත්මේ උපකල්පනය සහ<br>(v) අඛණ්ඩ ගිණුම්කරණ ප්‍රමිති හා වෙනත් නෛතික අවශ්‍යතාවන් සමඟ අනුකූලතාව | අනුකූල වී ඇත.<br>ප්‍රකාශනයට සූදානම් කර ඇති විට අනාවරණය කිරීමේ අරමුණෙන් සකස් කරන ලද කාර්තුමය මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සමාලෝචනය කරයි.<br>අභ්‍යන්තර විගණන අංශය, ප්‍රධාන විනිශ්චය ක්ෂේත්‍රවල විතැන්වීම්, ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්, ඇතුළුව සමාලෝචන වාර්තාවේ එක් එක් අවස්ථා සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වෙනම සමාලෝචන වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ අවධානය සඳහා යොමු කරයි. |
| (ඒ) අතුරු සහ අවසන් විගණන තුළින් මතු වන ගැටලු, කරුණු හා කෝන්දේසි සහ අවශ්‍ය වුවහොත්, ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් නොමැතිව සාකච්ඡා කළ යුතු කරුණු ඇතුළු බාහිර විගණන නිලධාරියා විසින් සංවාදයට ලක්කිරීමට අපේක්ෂා කරන ඕනෑම කරුණක් කමිටුව සාකච්ඡාවට භාජනය කළ යුතුය. | අනුකූල වී ඇත.<br>විධායක කළමනාකාරිත්වයේ සහභාගිත්වයක් නොමැතිව, ඉල්ලීම මත විගණනයට අදාළ කරුණු සාකච්ඡා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව බාහිර විගණක නිලධාරියා හමු වේ.<br>අතුරු සහ අවසන් විගණනවලින් මතුවන ගැටලු, කරුණු හා කොන්දේසි පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සාකච්ඡා කරයි. විගණකාධිපතිගේ නියෝජිතයෙක් මුළු කමිටු රැස්වීම් කාලය පුරා රැඳී සිටී. |
| (ඔ) කමිටුව, බාහිර විගණකවරයාගේ කළමනාකරණ ලිපිය සහ එයට කළමනාකාරිත්වයේ ප්‍රතිචාරය සමාලෝචනය කළ යුතුය. | අනුකූල වී ඇත.<br>මූල්‍ය පනතේ 14(2)(c) සහ 13(7) (a) යටතේ නිකුත් කරන ලද බාහිර විගණකවරයාගේ වාර්ෂික කළමනාකරණ ලිපිය හා එයට කළමනාකාරිත්වයේ ප්‍රතිචාරය සමාලෝචනය කර ඇත. |
| (ඕ) බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යයන් සම්බන්ධයෙන් කමිටුව පහත සඳහන් පියවර ගත යුතුය. | |
| (i) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂයපථය, කාර්යයන් හා සම්පත්වල ප්‍රමාණවත් භාවය සමාලෝචනය කිරීම සහ සිය කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය බලතල දෙපාර්තමේන්තුව සතු බවට තෘප්තිමත් වීම | අනුකූල වී ඇත.<br>විෂය පථය, කාර්යයන් සහ සැලසුමට අදාළ අවශ්‍යතා ඇතුළත්, අභ්‍යන්තර විගණන අංශය විසින් සකස් කරන ලද 2025 වසර සඳහා වන වාර්ෂික විගණන සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට ඉදිරිපත් කර අනුමත විය. |
| (ii) අභ්‍යන්තර විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කිරීම සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත අවශ්‍ය අවස්ථාවලදී සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බවට සහතික වීම | අනුකූල වී ඇත.<br>අභ්‍යන්තර විගණන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කරන කමිටුව, වැඩි දියුණු කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බවට සහතික වේ. |
| (iii) ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාගේ සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ කාර්ය සාධනය පිළිබඳ ඕනෑම ඇගයීමක් හෝ තක්සේරුවක් සමාලෝචනය කිරීම | ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාගේ හා කාර්ය පටිපාටියේ සහ අභ්‍යන්තර විගණන කාර්යයන්හි කාර්ය සාධන ඇගයීම සාමාන්‍යයෙන් සිදුකරන්නේ ගතවූ වසරේ පළමු කාර්තුවේදීය. ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ කාර්ය සාධන ඇගයීම, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ඇගයීම් ක්‍රියාවලියකට අනුව ප්‍රධාන බාහිර විගණකවරයා විසින් සිදු කරන අතර එය විගණන කමිටුවට ඉදිරිපත් කෙරේ. |
| (iv) ප්‍රධාන අභ්‍යන්තර විගණක, ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයන්, අභ්‍යන්තර විගණන කාර්යයන් සඳහා බාහිර සේවා සපයන්නන් පත් කිරීම හෝ ඉවත් කිරීම සඳහා නිර්දේශ කිරීම | අදාළ නැත.<br>වසර තුළ එවන් තත්ත්වයක් පැන නොනැගුණි. |
| (v) ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුළු අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයන් සහ ඕනෑම බාහිර සේවා සපයන්නෙකුගේ ඉල්ලා අස්වීම පිළිබඳව කමිටුව දැනුවත් කිරීම සහ ඉල්ලා අස්වන ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයන්ට සහ බාහිර සේවා සපයන්නන්ට ඉල්ලා අස්වීමට හේතු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දීම සහතික කිරීම | අදාළ නැත.<br>වසර තුළ එවන් තත්ත්වයක් පැන නොනැගුණි. |

## 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|
| (vi) අභ්‍යන්තර විගණනය, එහි අනෙකුත් විගණනයන්ගෙන් ස්වාධීන බවටත්, එය අපක්ෂපාතීව, ප්‍රවීණත්වයෙන් හා නිසි වෘත්තීය සැලකිල්ලෙන් සිදු කරන බවටත් සහතික විය යුතුය. | අනුකූල වී ඇත.<br>බැංකුවේ පාලන ව්‍යූහයට අනුව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව හරහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විගණන) ඍජුව මණ්ඩලයට වාර්තා කරන අතර එය බැංකුවේ අනෙකුත් මෙහෙයුම්වලින් ස්වාධීනය. |
| (ක) අභ්‍යන්තර විමර්ශනවල ප්‍රධාන සොයා ගැනීම් හා ඒවාට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර පිළිබඳව කමිටුව සලකා බැලිය යුතුය. | අනුකූල වී ඇත.<br>ප්‍රධාන සොයාගැනීම් හා ඒවාට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සමාලෝචනය කර ඇත. එකී විමර්ශනවල නිර්දේශ ක්‍රියාවට නැංවී ඇති බවටත් එය සහතික වේ. |
| (ග) න්‍යාය පත්‍රයේ අදාළ අංශය සඳහා කමිටුවේ ආරාධනයෙන් අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්, ප්‍රධාන විධායක නිලධාරි, ප්‍රධාන මූල්‍ය නිලධාරි, ප්‍රධාන අවදානම් නිලධාරි, ප්‍රධාන අනුකූලතා නිලධාරි, ඕනෑම ප්‍රධාන කළමනාකරණ නිලධාරියෙක් සහ බාහිර විගණන නිලධාරියාගේ නියෝජිතයෙකුට රැස්වීම්වලට සහභාගි විය හැකිය. කෙසේවුවද, අවම වශයෙන් වසරකට දෙවරක් වත් විධායක අධ්‍යක්ෂවරු නොමැතිව, කමිටුව බාහිර විගණන නිලධාරීන් හමු විය යුතුය. | අනුකූල වී ඇත.<br>2025 වසර තුළ රැස්වීම් 14ක් පවත්වා ඇති අතර ඉන් 13කට විගණකාධිපති කාර්යාලයේ නියෝජිතයෙක් සහභාගි වී ඇත. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරියා ආරාධනයෙන් රැස්වීම්වලට සහභාගි වෙති. ඉහත රැස්වීම්වලට අමතරව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරියා සහ අභ්‍යන්තර විගණන නිලධාරියාගේ සහභාගිත්වයකින් තොරව බාහිර විගණන නිලධාරියා (ජාතික විගණන කාර්යාලයේ අධිකාරී) දෙවරක් ස්වාධීනව හමුවී ඇත. |
| (ච) කමිටුවට:<br>(i) සිය විෂය පථය ක්ෂේත්‍රයට අදාළ ඕනෑම කරුණක් විමර්ශනය කිරීමේ පැහැදිලි බලය;<br>(ii) එසේ කිරීමට අවශ්‍ය වන සම්පත්;<br>(iii) තොරතුරු වෙත පූර්ණ ප්‍රවේශය;<br>(iv) අවශ්‍ය වුවහොත්, බාහිර උපදෙස් ලබා ගැනීමේ සහ අදාළ අත්දැකීම්වලින් යුත් බාහිර පුද්ගලයන්ට රැස්වීම්වලට ආරාධනා කිරීමේ බලය, තිබිය යුතුය. | අනුකූල වී ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තියට අනුව, ඕනෑම කරුණක් විමර්ශනයට, තොරතුරු වෙත ප්‍රවේශ වීමට, වෘත්තීය උපදෙස් ලබා ගැනීමේ බලය, සිය කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය සම්පත් ලබාගැනීම ආදිය සඳහා කමිටුව බලාත්මක කර ඇත. |
| (ඡ) සාකච්ඡාවට ලක් කරන කරුණු පිළිබඳ නිසි දැනුම් දීමක් සමගින් කමිටුව නිතිපතා රැස්විය යුතු අතර එහි රාජකාරී සහ වගකීම් ඉටු කිරීමේ දී නිගමන වාර්තා කර තබා ගත යුතුය. | අනුකූල වී ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව නිතිපතා රැස්වීම් සැලසුම් කර ඇත. අවශ්‍ය වූ විට අමතර රැස්වීම් සැලසුම් කෙරේ. කමිටුව වසර තුළ 14 වතාවක් හමු වී ඇත. සාකච්ඡා කිරීමට නියමිත කරුණු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු සාමාජිකයන් නිසි ලෙස දැනුවත් කෙරෙන අතර එහි රාජකාරී හා වගකීම් ඉටු කිරීමේදී එළඹෙන නිගමන, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ලේකම්/ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් පවත්වා ගෙන යන සටහන්වල වාර්තා කර තැබේ. |
| (ට) කමිටු ලේකම් අධ්‍යක්ෂ (සමාගම් ලේකම් හෝ ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරි) විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල සවිස්තරාත්මක සටහන් වාර්තා කර පවත්වාගෙන යා යුතුය. | අනුකූල වී ඇත. |
| (ඩ) කමිටුව:<br>(i) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අකටයුතුකම් හෙළි කිරීමේ ප්‍රතිපත්තියේ ඵලදායී ක්‍රියාත්මක භාවය; සහ<br>(ii) එවන් කරුණු පිළිබඳ සාධාරණ හා ස්වාධීන පරීක්ෂණයක් සඳහා නිසි ක්‍රමවේද සහ සුදුසු පසුවිපරම් ක්‍රියාමාර්ග තිබෙන බවට සහතික විය යුතුය. | අනුකූල වී ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩල විසින් අනුමත කරන ලද අකටයුතුකම් හෙළි කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මකය. |
| (ණ)බාහිර විගණකවරයා සමඟ බැංකුවේ සබඳතා අධීක්ෂණය කිරීමේ ප්‍රධාන නියෝජිත ආයතනය ලෙස කමිටුව ක්‍රියා කළ යුතුය. | අනුකූල වී ඇත.<br>බාහිර විගණකවරයා සමඟ බැංකුවේ සබඳතාවල ප්‍රධාන නියෝජිතයා වන්නේ කමිටුවයි. |

## 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| 6.3 | **මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව** | |
| | (අ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති නොවන සහ වඩාත් උචිත පරිදි ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් විසින් සභාපතිත්වය දැරිය යුතුය; | අනුකූල වී ඇත. |
| | (ආ) වඩාත් සුදුසු පරිදි ස්වාධීන අධ්‍යක්ෂවරු බහුතරයකගෙන් සමන්විත විය යුතුය; | අනුකූල වී ඇත. |
| | (ඇ) ප්‍රධාන විධායක නිලධාරියා හා සම්බන්ධ කරුණු සාකච්ඡාවට ගන්නා අවස්ථාවල දී හැර, ප්‍රධාන විධායක නිලධාරියා ආරාධනයෙන් රැස්වීම්වලට සහභාගි විය යුතුය; | අනුකූල වී ඇත. |
| | (ඈ) සේවය අවසන් කරන විට හෝ සේවයෙන් විශ්‍රාම ගන්නා විට අධ්‍යක්ෂවරුන්ට, ප්‍රධාන විධායක නිලධාරියාට සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට ලබා දෙන වැටුප්, දීමනා, විශේෂ ගෙවීම්/ප්‍රතිලාභ සහ අනෙකුත් මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ හා සම්බන්ධ වේතන ප්‍රතිපත්තිය තීරණය කිරීම; | 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 10 වන වගන්තිය හා එහි සංශෝධන අනුව විෂය භාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන්ගේ වේතනය තීරණය කරයි. සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ වේතන සාමූහික ගිවිසුම මත පදනම්ව මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව විසින් තීරණය කරනු ලබන අතර එය බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසු මුදල් අමාත්‍යාංශය වෙත යොමු කෙරේ. |
| | (ඉ) අධ්‍යක්ෂවරු, ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ අරමුණු සහ ඉලක්ක සැකසීම; | අනුකූල වී ඇත.<br>අධ්‍යක්ෂවරු හත්දෙනාම විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත අනුව අධ්‍යක්ෂවරු පත්කරනු ලබන්නේ අමාත්‍යවරයා විසිනි. වර්තමානයේ දී, ස්වාධීන ආයතනයක් විසින් ඔවුන් තෝරා ගනු ලැබේ. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ අරමුණු සහ ඉලක්ක ලේඛනගතකර ඇති අතර ඒවා අදාළ අංශ විසින් සිය ඉලක්ක සපුරා ගැනීම වෙනුවෙන් සකස් කොට ඇති 2026-2028 උපායමාර්ගික ව්‍යාපාර සැලැස්මේ විස්තර කොට ඇත. |
| | (ඊ) ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ කාර්ය සාධනය නියම කර ඇති අරමුණු සහ ඉලක්කවලට එදිරිව වරින් වර ඇගයීම සහ වේතන, ප්‍රතිලාභ සහ කාර්ය සාධන දිරි දීමනා මත පදනම් වූ අනෙකුත් ගෙවීම් සංශෝධනය කිරීමේ පදනම තීරණය කිරීම; | සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ කාර්ය සාධනය, නියම කර ඇති අරමුණු හා ඉලක්කවලට එරෙහිව ඇගයීම සඳහා වන නිර්ණායක, වාර්ෂිකව ඊළඟ වසරේ පළමු කාර්තුව තුළ කමිටුවට ඉදිරිපත් කර ඇත. සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරියා හැර, අනෙකුත් සියලුම ප්‍රධාන කළමනාකරණ පිරිස් ඇගයීම සම්පූර්ණයෙන් අවසන් කර ඇත. |
| | (උ) සේවය අවසන් කරන විට හෝ විශ්‍රාම ගන්නා විට, අධ්‍යක්ෂවරුන්ට, ප්‍රධාන විධායක නිලධාරියාට සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට ලබා දීමට නියමිත ඕනෑම විශේෂ ගෙවීම්/මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ සඳහා කොටස් හිමියන්ගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගැනීම සහතික කිරීම. බැංකුවේ ඡන්ද අයිතිය දරමින්, නිකුත් කරන ලද ප්‍රාග්ධනයෙන් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකා රජය සතු වන බලපත්‍රලාභී බැංකුවල දී එවන් පූර්ව අනුමැතිය ලබා ගත යුත්තේ භාණ්ඩාගාර ලේකම්ගෙනි. | අනුකූල වී ඇත.<br>වසර තුළ එවන් තත්ත්වයක් පැන නොනැගුණි. |
| | (ඌ) අධ්‍යක්ෂවරුන්ට, ප්‍රධාන විධායක නිලධාරියාට සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට ගෙවනු ලබන වත්දිය බැංකුවේ අවදානම් අභිරුචි සීමාව ඇතුළත පවතින බවට සහතික කිරීම සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සමඟ සම්බන්ධීකරණ; සහ | අනුකූල වී ඇත. |
| | (එ) බලපත්‍රලාභී බැංකුවට සිදුවන මූල්‍ය අලාභයේ ප්‍රමාණයට, වෙනත් කරුණු අතර, වංචා සහ අරමුදල් අවභාවිතා කිරීමේ තත්ත්ව යටතේ, බලපත්‍රලාභී බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියාට සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට කාර්ය සාධනය මත පදනම් වූ ගෙවීම් සඳහා නැවත අය කර ගැනීමේ සැලසුම් පිළිබඳ ප්‍රතිපත්තියක් ස්ථාපනය කිරීම ක්‍රියාපටිපාටි යෝග්‍යතාව, සාධාරණ සවන්දීම සහ විනිවිදභාවය සහතික කරමින් නැවත අය කර ගැනීමේ සැලසුම් බලාත්මක කිරීමට පෙර බලපත්‍රලාභී බැංකුව විසින් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය එවැනි ප්‍රතිපත්තියකින් පැහැදිලි කර දිය යුතුය. බලපත්‍රලාභී බැංකුවේ නැවත අය කර ගැනීමේ පටිපාටිය ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ සේවා කොන්ත්‍රාත්තුවට ඇතුළත් කළ යුතු අතර, දැනට සේවයේ නියුතු ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා ද ඒ හා සමාන සැලසුමක් ක්‍රියාවට නැංවිය යුතුය. | අදාළ නැත.<br>මෙය අදාළ වන්නේ 2026 ජනවාරි 1 දා සිටය. බැංකුව, ප්‍රතිපත්තියක් හා අදාළ සැලසුම් ස්ථාපනය කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටී. |

# 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| 6.4 | **නාමයෝජනා හා පාලන කමිටුව** | |
| | කමිටුව | |
| | (අ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් විසින් සභාපතිත්වය දැරිය යුතු අතර කමිටුව ස්වාධීන අධ්‍යක්ෂවරු බහුතරයකින් සමන්විත විය යුතුය. ප්‍රධාන විධායක නිලධාරියා හා සම්බන්ධ කරුණු සාකච්ඡා කරන විටක දී හැර, ආරාධනාව මත ප්‍රධාන විධායක නිලධාරියාට රැස්වීම්වලට සහභාගි විය හැක. | අනුකූල වී ඇත. |
| | (ආ) නව අධ්‍යක්ෂවරු, ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හඳුනා ගැනීම, නම් කිරීම සහ නිර්දේශ කිරීම සඳහා විධිමත් හා විනිවිද පෙනෙන ක්‍රියාපටිපාටියක් ක්‍රියාවට නැංවීම | අනුකූල වී ඇත. |
| | (ඇ) 3 සහ 8.2 විධානවල දක්වා ඇති පරිදි හා අදාළ නීති හා නියාමනවල සඳහන් කර ඇති පරිදි අධ්‍යක්ෂවරු, ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අදාළ තනතුරු දැරීමට උචිත සහ සුදුසු පුද්ගලයන් බව තහවුරු කිරීම; | අනුකූල වී ඇත.<br>අධ්‍යක්ෂවරුන්ගේ සහ සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරියාගේ අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශ හා ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් ලබා ගන්නා අතර එම ලියවිලි ජ්‍යෙෂ්ඨ කළමනාකරණ නිලධාරීන්ගෙන් ලබා ගන්නේ මානව සම්පත් අංශයයි. ඉන්පසු ඖචිත්‍යය හා සුදුසු බව තක්සේරු කිරීම සඳහා ඒවා මහ බැංකුව වෙත යොමු කෙරේ. |
| | (ඈ) ප්‍රධාන අවදානම් නිලධාරියා සහ ප්‍රධාන අනුකූලතා නිලධාරියා තේරීමේදී ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවෙන්, ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරියා තෝරා ගැනීමේ දී විගණන කමිටුවෙන් අදහස් ලබා ගැනීම | අනුකූල වී ඇත. |
| | (ඉ) අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් සමස්තයක් ලෙස ඉටු කිරීම සඳහා අදාළ අධ්‍යක්ෂවරයා විසින් දැක්වූ කාර්ය සාධනය සහ දායකත්වය කලින් කලට ඇගයීමෙන් වර්තමාන අධ්‍යක්ෂවරු නැවත තෝරා පත්කර ගැනීම සඳහා සලකා බැලීම සහ නිර්දේශ කිරීම (හෝ නිර්දේශ නොකිරීම); | අදාළ නැත.<br>අධ්‍යක්ෂවරු පත් කරනු ලබන්නේ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත අනුව හා කැබිනට් සංදේශ තුළිනි. |
| | (ඊ) 2.5(b) විධානය අනුව අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වයේ තත්ත්වය සහ එවැනි අධ්‍යක්ෂවරුන්ට ස්වාධීනව සිය වගකීම් ඉටු කිරීමේ හැකියාවට බාධා පමුණුවන කිසියම් ළබැඳියා අතර ගැටුමක් තිබේද යන්න පිළිබඳ කාර්තුමය වශයෙන් ඇගයීමට ලක් කිරීම සහ ස්වාධීන තත්ත්වයේ වෙනසක් (තිබේ නම්) බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට දැනුම් දීම; | අනුකූල වී ඇත.<br>අදාළ පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක ව පවතින අතර ළබැඳියා පිළිබඳ ගැටුම් කළමනාකරණයට ක්‍රියාපටිපාටියක් ඇත. |
| | (උ) ප්‍රධාන විධායක නිලධාරි තනතුරට සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරි තනතුරුවලට පත් කිරීම හෝ උසස් කිරීම සඳහා යෝග්‍ය වීමට අවශ්‍ය වන සුදුසුකම්, අත්දැකීම් වැනි නිර්ණායක සහ ප්‍රධාන ගුණාංග නියම කිරීම; | අනුකූල වී ඇත.<br>කමිටුව පත් කිරීමේ සහ උසස් කිරීමේ ප්‍රතිපත්තිය කලින් කලට සමාලෝචනය කරනු ලබයි. |
| | (ඌ) අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා අතිරේක/නව විශේෂඥ දැනුමේ අවශ්‍යතාවය සහ විශ්‍රාම යන අධ්‍යක්ෂවරුන් සඳහා අනුප්‍රාප්තික සැලසුම් පිළිබඳව කලින් කලට සලකා බලා නිර්දේශ කිරීම ; | අනුකූල වී ඇත.<br>අනුප්‍රාප්තික සැලසුම ක්‍රියාත්මකය. |
| | (එ) පහත කරුණු අන්තර්ගත ඵලදායී සහ පාරදෘශ්‍ය ක්‍රමවේදයක් සමඟ ින් ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් උදෙසා ශක්තිමත් අනුප්‍රාප්තික සැලැස්මක් බැංකුව සතු බවට සහතික වීම;<br>(i) බැංකුවේ මෙහෙයුම්වල විශාලත්වය, පරිමාණය, විවිධත්වය හා සංකීර්ණත්වය කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රධාන විධායක නිලධාරි/ප්‍රධාන කළමනාකරණ නිලධාරි තනතුරු පිරවීම සඳහා කෙටි, මධ්‍යම හා දිගු කාලීන අනුප්‍රාප්තියට සුදුසුකම් ලත් දක්ෂ පුද්ගලයන් (අභ්‍යන්තර/බාහිර) හඳුනාගැනීම;<br>(ii) අදාළ ක්ෂේත්‍ර සඳහා කුසලතා/දැනුමේ පරතර හඳුනාගෙන අවම කිරීම තුළින් අදාළ තනතුරු සඳහා තෝරා ගන්නා ලද අනුප්‍රාප්තිකයන් හැඩගැස්වීම<br>(iii) අවම වශයෙන් වාර්ෂික පදනම මත අනුප්‍රාප්තික සැලැස්ම සමාලෝචනය කිරීම | අනුකූල වී ඇත.<br>ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා මණ්ඩලය විසින් අනුමත අනුප්‍රාප්තික සැලසුම ක්‍රියාත්මකය. |

## 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| | (ඒ) බැංකුකරණ ක්ෂේත්‍රයට සම්බන්ධ අදාළ නීති, නියාමන, ක්ෂුද්‍ර ආර්ථික ප්‍රතිපත්ති, නව තාක්ෂණික වර්ධන සහ නැගී එන මූල්‍ය ආංශික හා වෙළඳ පොළ ප්‍රවණතා පිළිබඳව අඛණ්ඩ පදනමකින් අධ්‍යක්ෂවරු යාවත්කාලීන වන බවට සහතික වීම; | අනුකූල වී ඇත.<br>බැංකුකරණ ක්ෂේත්‍රයට සම්බන්ධ අදාළ නීති, නියාමන, ක්ෂුද්‍ර ආර්ථික ප්‍රතිපත්ති, නව තාක්ෂණික වර්ධන සහ නැගී එන මූල්‍ය ආංශික සහ වෙළඳ පොළ ප්‍රවණතා පිළිබඳව මාසික අනුකූලතා වාර්තාවෙන් අනුකූලතා නිලධාරියා විසින් යාවත්කාලීන කෙරේ. |
| | (ඔ) අධ්‍යක්ෂවරු සඳහා පුහුණු ශක්‍යතා වර්ධන සහ වෘත්තීය සංවර්ධන වැඩසටහන්වලට අදාළ ව නිතිපතා පදනමකින් අධ්‍යක්ෂවරුන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගෙන අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම; | අනුකූල වී ඇත. |
| | (ඕ) රාජකාරී සහ වගකීම් ඵලදායී ලෙස ඉටු කෙරෙන බවට සහතික වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල ව්‍යුහය, ප්‍රමාණය, සුදුසුකම් සහ සංයුතිය සමාලෝචනය කිරීම | අනුකූල වී ඇත.<br>අනුකමිටු සාමාජිකයන් පත් කෙරෙන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිසි විමර්ශනයෙන් අනතුරුවය. |
| | (ක) අදාළ වන සියලුම නීති සහ නියාමන, කර්මාන්ත/ජාත්‍යන්තර ප්‍රශස්ත භාවිත සැලකිල්ලට ගනිමින්, බැංකුවේ සමස්ත ආයතනික පාලන රාමුව සහ ප්‍රතිපත්ති සමාලෝචනය කර, යාවත්කාලීන කර ඵලදායී ආකාරයෙන් ක්‍රියාත්මක කරන බවට සහතික වීම. | අනුකූල වී ඇත. |
| **6.5** | **ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව**<br>කමිටුව | |
| | (අ) අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවක සභාපති නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් විසින් පාලනය වේ. | සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ වෙනත් කිසිදු අනුකමිටුවක සභාපතිත්වය නොදරයි. |
| | (ආ) අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් හා ස්වාධීන අධ්‍යක්ෂවරු බහුතරයකගෙන් සමන්විත විය යුතුය. බැංකුකරණය සහ/හෝ මූල්‍ය සේවා සම්බන්ධ ආපදා කළමනාකරණ ගැටලු හා භාවිත පිළිබඳ මනා සාමූහික පළපුරුද්දක් කමිටු සාමාජිකයන් සතු විය යුතුය ; | අනුකූල වී ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු සාමාජිකයෝ විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති. |
| | (ඇ) කමිටු සාමාජිකයන් බහුතරය, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු සාමාජිකයන්ගෙන් සහ ඊට ප්‍රතිලෝමව සමන්විත නොවිය යුතුය. | අනුකූල වී ඇත. |
| | (ඈ) පුළුල් අවදානම් කාණ්ඩ, එනම් ණය, වෙළඳපොළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම් සහ උපාය මාර්ගික අවදානම් අධීක්ෂණය කරන ප්‍රධාන විධායක නිලධාරියා, ප්‍රධාන අවදානම් නිලධාරියා, ප්‍රධාන අනුකූලතා නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අවශ්‍යතා මත රැස්වීම්වලට සහභාගි විය යුතුය; | අනුකූල වී ඇත. |
| | (ඉ) කමිටුවට පවරන ලද අධිකාරියේ සහ වගකීමේ රාමුව ඇතුළත ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ ඉතා සමීපව කටයුතු කිරීම සහ මණ්ඩලය වෙනුවෙන් තීරණ ගැනීම; | අනුකූල වී ඇත. |
| | (ඊ) බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණය සඳහා වගකියන ස්වාධීන අවදානම් කළමනාකරණ කාර්යයක් ස්ථාපනය කිරීම; | අනුකූල වී ඇත.<br>ණය අවදානම, වෙළඳපොළ අවදානම, ද්‍රවශීලතා අවදානම, මෙහෙයුම් අවදානම, අනුකූලතා අවදානම සහ උපාය මාර්ගික අවදානම ඇතුළු නමුත් ඒවාට පමණක් සීමා නොවී බැංකුවේ සෑම අංශයකම අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම, අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම සඳහා ස්වාධීන අවදානම් කළමනාකරණ කාර්යය වගකිව යුතුය. බැංකුවේ අනුමත අවදානම් සහ නියාමන අවශ්‍යතා ඇතුළත අවදානම් කළමනාකරණය කෙරෙන බවට සහතික වීම සඳහා ප්‍රධාන අවදානම් නිලධාරියා සහ ප්‍රධාන අනුකූලතා නිලධාරියා විසින් කාර්යය ක්‍රියාත්මක කර, පවත්වාගෙන ස්වාධීනව වාර්තා කරනු ලබයි. |

## 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|
| (උ) සුදුසු අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු තුළින් බැංකුවට එල්ල වන සියලු අවදානම්, එනම්, ණය, වෙළඳපොළ ද්‍රවශීලතාව, මෙහෙයුම්, තොරතුරු ආරක්ෂාව මාසික පදනමකින් තක්සේරු කිරීම. අනුබද්ධ සහ ආශ්‍රිත සමාගම්වල අවදානම් කළමනාකරණය තනි හා ඒකාබද්ධ පදනමින් සිදු කළ යුතුය; | අනුකූල වී ඇත.<br>අවදානම් කළමනාකරණ අංශය විසින් ණය, වෙළඳපොළ, මෙහෙයුම් අවදානම් තක්සේරු කර මාසික වාර්තා කමිටුවට ඉදිරිපත් කරනු ලබයි. RMD විසින් ආතති පරීක්ෂාව, ද්‍රවශීලතා අනුපාත, ප්‍රධාන කාර්යසාධක දර්ශක, ප්‍රධාන අවදානම් දර්ශක, ආයෝජන මත ප්‍රතිලාභ, වත්කම් මත ප්‍රතිලාභ ආදිය තුළින් අවදානම සමාලෝචනය කරන අවදානම් කළමනාකරණ අංශය, වරින් වර අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරනු ලබයි. අවදානම් කළමනාකරණ අංශය, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අවදානම් අභිරුචි මත පදනම්ව, මාසික හා කාර්තු අවදානම් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරයි. |
| (ඌ)අවදානම් අභිරුචිය කෙරෙහි වන බැංකුවේ නිරාවරණය පිළිබඳව මණ්ඩලයට උපදෙස් දීම හා වාර්තා කිරීම | අනුකූල වී ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව ක්‍රියාත්මකය. |
| (එ) ප්‍රධාන අවදානම් නිලධාරියාගේ ක්‍රියාකලාපය අධීක්ෂණය: අවදානම් පැතිකඩ, ස්ථාපිත අවදානම් අභිරුචි සීමාවන්ට එරෙහිව නිරාවරණය සහ සීමා උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් ප්‍රධාන අවදානම් නිලධාරියාගෙන් කමිටුවට නිතිපතා වාර්තා හා සන්නිවේදන ලැබිය යුතුය; | අනුකූල වී ඇත. |
| (ඒ) ප්‍රකාශිත අවදානම් අභිරුචිය සමඟින් සංගත වීම සහතික කිරීම සඳහා ණය, වෙළඳපොළ මෙහෙයුම්, තොරතුරු ආරක්ෂාව සහ උපායමාර්ගික අවදානම් වැනි බැංකුවේ සියලුම අදාළ අවදානම් කළමනාකරණයට සහ ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා කළමනාකරණය සඳහා ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් විසින් ක්‍රියාවට නංවා ඇති උපාය මාර්ග අධීක්ෂණය; | අනුකූල වී ඇත.<br>ප්‍රකාශිත අවදානම් අභිරුචිය සමඟින් සංගත වීම සහතික කිරීම සඳහා ණය, වෙළඳපොළ, මෙහෙයුම්, තොරතුරු ආරක්ෂාව සහ උපායමාර්ග අවදානම් වැනි බැංකුව සියලුම අදාළ අවදානම් කළමනාකරණයට සහ ප්‍රාග්ධන හා ද්‍රවශීලතා කළමනාකරණය සඳහා ක්‍රියාවට නංවා ඇති උපාය මාර්ග පිළිබඳව ප්‍රධාන අවදානම් නිලධාරියා වාර්තා කරයි. ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා කළමනාකරණය සඳහා සහ ණය, වෙළඳපොළ, මෙහෙයුම්, තොරතුරු ආරක්ෂාව, උපායමාර්ගික අවදානම් වැනි බැංකුවේ අදාළ සියලුම අවදානම් කළමනාකරණය සඳහා ක්‍රියාවට නංවන ලද උපායමාර්ග පිළිබඳ සාක්ෂි ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සතුව ඇත. |
| (ඔ) කමිටුව විසින් නිශ්චිතව සඳහන් කොට ඇති ගුණාත්මක හා ප්‍රමාණාත්මක අවදානම් සීමාව තුළ පවත්නා එකී අවදානම් කළමනාකරණයට සහ විශේෂිත වූ අවදානම් ආමන්ත්‍රණය කිරීම සඳහා ණය කමිටුව සහ වත්කම් වගකීම් කමිටුව වැනි අවදානම් සහගත ක්‍රියාකාරකම් හා සම්බන්ධ සියලුම කළමනාකරණ තලයේ කමිටුවල ප්‍රමාණවත්භාවය හා ඵලදායීතාව සමාලෝචනය කිරීම; | අනුකූල වී ඇත. |
| (ඕ) බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමන හා අධීක්ෂණ අවශ්‍යතා මත පදනම්ව කමිටුව විසින් තීරණය කරන ලද දූරදර්ශී මට්ටම් ඉක්මවා ගිය නිශ්චිත අවදානම්වල බලපෑම අවම කිරීම සඳහා කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම; | අනුකූලවී ඇත.<br>බැංකුවේ ප්‍රතිපත්ති මෙන්ම නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතා පදනම් කරගනිමින් කමිටුව විසින් තීරණය කරන ලද විචක්ෂණශීලී සීමාවන් ඉක්මවා යන අවදානම් පවතින අවස්ථාවලදී, එම අවදානම් සහගත බලපෑම අවම කිරීම සඳහා කඩිනමින් නිවැරදි කිරීමේ පියවර ගැනීම. |
| (ක) යාවත්කාලීන කරන ලද ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම ඇතුළු කළමනාකරණයේ සියලු අංශ ඇගයීම සඳහා අවම වශයෙන් කාර්තුවකට වරක් හෝ රැස්විය යුතුය; | අනුකූල වී ඇත.<br>කමිටුව 2025 වසරේදී හත් වරක් රැස් වී ඇත. |
| (ග) කමිටුව විසින් නිර්දේශ කර ඇති ආකාරයට නිශ්චිත අවදානම් හඳුනා ගැනීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව කඩිනමින් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම; | වසර තුළ එවන් අවශ්‍යතාවක් පැන නොනැඟුණි. |
| (ච) අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස්, එකඟත්වය සහ/හෝ නිශ්චිත උපදෙස් ලබාගැනීමේ අරමුණෙන් සෑම රැස්වීමක් අවසානයේ සභියක් ඇතුළත අවදානම් තක්සේරු වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම; | අනුකූල වී ඇත.<br>අවදානම් කළමනාකරණ අංශය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු අවදානම් සමාලෝචන වාර්තාව, ඊළඟට පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට සෘජුව ඉදිරිපත් කරනු ලබයි. |
| (ඡ) ව්‍යාපාර මෙහෙයුම්වල සියලුම ක්ෂේත්‍රවලට අදාළ නීති, නියාමන, නියාමන මාර්ගෝපදේශ සහ අනුමත ප්‍රතිපත්ති සමඟ බැංකුවේ අනුකූලතාවය මැන බැලීම සඳහා අනුකූලතා කාර්යයක් ස්ථාපනය කිරීම. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අතුරෙන් තෝරාගන්නා ලද ඒ සඳහා කැප වූ අනුකූලතා නිලධාරියෙක් අනුකූලතා කාර්යය ඉටු කළ යුතු අතර කලින් කලට කමිටුවට වාර්තා කළ යුතුය. | අනුකූලතා නිලධාරියෙක් පත්කිරීමෙන් අනුකූලතා කාර්යය පිහිටුවා ඇත. අනුකූලතා නිලධාරියා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට/අධ්‍යක්ෂ මණ්ඩලයට කලින් කලට වාර්තා ඉදිරිපත් කරනු ලබයි. අනුකූලතා කළමනාකරණ ව්‍යූහයෙන් බැංකුවේ සියලුම ව්‍යාපාර මෙහෙයුම්, අනුකූලතා ප්‍රතිපත්ති සහ පටිපාටි, නියාමන අධීක්ෂණ යාන්ත්‍රණ, අනුකූලතා අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරුව, වාර්තාකරණය සහ කාර්ය පටිපාටි වැඩි දියුණු කිරීම් ආවරණය කෙරේ. |

## 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| | (ට) මතු විය හැකි අවදානම් ඇතුළු සියලු අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහ බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ව්‍යූහයට අවශ්‍ය ඕනෑම වෙනස් කිරීමක් සහතික කරනු පිණිස තොරතුරු නුවමාරුවට පහසුකම් සැපයීම සඳහා විගණන කමිටුව සමඟින් ඵලදායී සන්නිවේදන සහ සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම; | අනුකූල වී ඇත.<br>අදාළ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු පත්‍රිකා අභ්‍යන්තර විගණන අංශය හරහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සමඟින් හුවමාරු කරගෙන ඇත. |
| | (ඩ) මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ කාර්යයන් පිළිබඳ පූර්ව විනිශ්චයකින් තොරව, සේවකයන්ට ලබා දෙන දිරි දීමනා ලබා දීමේදී බැංකුවේ අවදානම් මට්ටම්, ප්‍රාග්ධනය, ද්‍රවශීලතාව හා ඉපැයීම් සැලකිල්ලට භාජනය වේද යන්න පරීක්ෂා කිරීම; | අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද අවදානම් අභිරුචි සීමාවන්ට එදිරිව බැංකුවේ කාර්ය සාධනය ඇගයීමට ලක්කරයි. බැංකුවේ අවදානම්, ප්‍රාග්ධනය, ද්‍රවශීලතාව සහ සේවකයන්ට ලබා දෙන දිරි දීමනා ඇතුළත් බැංකුවේ ඉපැයීම් සැලකිල්ලට ගනිමින් අවදානම් අභිරුචි සීමා සකස් කොට ඇත. තවද, බැංකුවේ තුන් අවුරුදු උපාය මාර්ගික ව්‍යාපාර සැලැස්මට පුරෝකථනය කරන ලද බලපෑම් කෙරෙහි ප්‍රාග්ධන ප්‍රමාණවත් භාවයේ බලපෑම ඇතුළත් කර ඇත. |
| 6.6 | **අදාළ පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව**<br>කමිටුව: | |
| | (අ) අධ්‍යක්ෂ මණ්ඩල සභාපති නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් සභාපතිත්වය දැරිය යුතුය; | අදාළ නැත.<br>කමිටුව පිහිටුවිය යුත්තේ 2027 ජනවාරි 1 වන විටය. කෙසේවුවද, කමිටුව 2026 පෙබරවාරි 17 සිට බලපැවැත්වෙන පරිදි ස්ථාපනය කොට ඇත. |
| | (ආ) බහුතරය ස්වාධීන අධ්‍යක්ෂවරු සමගින් අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය. ප්‍රධාන විධායක නිලධාරියා සහ අදාළ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට අවශ්‍යතාවය මත අදාළ න්‍යාය පත්‍ර අංග සඳහා පමණක් සහභාගි විය හැක. | |
| | (ඇ) අදාළ නීති සහ නියාමනවලට අනුකූලව ඉදිරියට ක්‍රියාත්මක පදනම මත අදාළ පාර්ශ්ව ගනුදෙනු හඳුනා ගැනීම, අධීක්ෂණය හා වාර්තාකරණය සඳහා පැහැදිලි ප්‍රතිපත්තියක්, ක්‍රියාපටිපාටි සහ ක්‍රියාවලි ක්‍රියාත්මක බවට සහතික වීම; | |
| | (ඈ) 7.2 විධානයේ පැහැදිලි කර ඇති ගනුදෙනු ඇතුළුව, විශේෂයෙන් 7.1 විධානයේ අර්ථ දක්වා ඇති ආකාරයට 'අදාළ පාර්ශ්වකරුවන්' ලෙස සලකනු ලබන පුද්ගලයන් සමඟ එවන් වූ ගනුදෙනු තුළින් හටගත හැකි ළබැඳියාවන් අතර ගැටුම් වළක්වා ගැනීම සඳහා බැංකුවේ අදාළ පාර්ශ්ව ගනුදෙනු සමාලෝචනය කිරීම; | |
| | (ඉ) අදාළ පාර්ශ්ව, අදාළ පාර්ශ්ව ගනුදෙනු සහ අදාළ පාර්ශ්ව ගනුදෙනුවල ආර්ථික ප්‍රතිවිපාක පිළිබඳ විස්තර කාර්තුවකට වරක් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම | |
| | (ඊ) අධ්‍යක්ෂවරයාට හෝ ඔහුගේ/ඇයගේ සමීප ඥාතියෙකුට සම්බන්ධ ගනුදෙනුවක් හා අදාළ නැතහොත් අධ්‍යක්ෂවරයා සැලකිය යුතු උනන්දුවක් දක්වන කරුණක් හා අදාළ කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් හා බැඳුණු සාකච්ඡාවන්ට අධ්‍යක්ෂවරයා සහභාගි වීමෙන් වැළකෙන බවට සහතික වීම; සහ | |
| | (උ) 7.1 විධානයේ අර්ථ දක්වා ඇති පරිදි, සමාන ව්‍යාපාරවල නිරත බැංකුවේ අනෙකුත් හවුල්කරුවන්ට වඩා එවැනි පාර්ශ්වවලට "වඩා වාසිදායක සැලකීම්" ලබා දෙන ආකාරයේ අදාළ පාර්ශ්ව ගනුදෙනුවල බැංකුව නිරත නොවන බවට සහතික වීම, මේ සන්දර්භය තුළ "වඩා වාසිදායක සැලකීම්" යන්නෙන් අදහස් වන්නේ :<br>(i) බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන්, විචක්ෂණශීලී ප්‍රතිශතයක් ඉක්මවා යමින් අදාළ පාර්ශ්වවලට "පූර්ණ ශුද්ධ අනුග්‍රහය" ලබා දීම. මේ උපවිධානයේ අරමුණු සඳහා;<br>(අ) "අනුග්‍රහය" යන්නෙන් අදහස් වන්නේ උපරිම අනුග්‍රහය/විශාල නිරාවරණය පිළිබඳ බැංකු පනතේ විධානවල අර්ථ දක්වා ඇති අනුග්‍රහයයි.<br>(ආ) "පූර්ණ ශුද්ධ අනුග්‍රහය" ගණනය කරන්නේ මුළු අනුග්‍රහයෙන් එවන් අදාළ පාර්ශ්ව විසින් බැංකුවේ කොටස් ප්‍රාග්ධනයේ හා වසර 5ක් හෝ ඊට වැඩි කල්පිරීමේ ණය උපාංගවල සිදු කර ඇති මුදල් ඇපකර සහ ආයෝජන අඩු කිරීමෙනි. | |

# 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| | (ii) සම්බන්ධයක් නැති සන්සන්දනීය ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයක් සමඟ සිදු කරන සැසඳිය හැකි ගනුදෙනුවකට බැංකුවේ ඉහළම ණය අනුපාතිකයට වඩා අඩු පොළී අනුපාතයක් අය කිරීම හෝ බැංකුවේ තැන්පතු අනුපාතිකයට වඩා වැඩියෙන් ගෙවීම; | |
| | (iii) සබඳතාවක් නැති පාර්ශ්ව සමඟ සිදු කරන සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී පිරිනැමෙන කොන්දේසි ඉක්මවා යන වාසිදායක කොන්දේසි, වෙළඳ පාඩු ආවරණය සහ/හෝ ගාස්තු/කොමිස් මුදල් කපා හැරීම වැනි අනුග්‍රහපූර්වක සැලකිලිමත් පිරිනැමීම; | |
| | (iv) ඇගයීම් ක්‍රියාපටිපාටියක් අනුගමනය නොකර අදාළ පාර්ශ්වයකට සේවා සැපයීම හෝ ඔවුන්ගෙන් සේවා ලබා ගැනීම | |
| | (v) නීත්‍යානුකූල රාජකාරී සහ කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය වේ නම් හැර, අදාළ පාර්ශ්ව සමඟ විභව හිමිකාරිත්වය, රහස්‍ය හෝ වෙනත් අයුරකින් සංවේදී තොරතුරු බෙදාගැනීමට මුල් විය හැකි වාර්තාකරණ මාර්ග සහ තොරතුරු ප්‍රවාහ පවත්වා ගැනීම | |
| 7 | **සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු**<br>බලපත්‍රලාභී බැංකුවල සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවලදී පහත අවශ්‍යතා අදාළ විය යුතුය. | |
| 7.1 | **සම්බන්ධිත පාර්ශ්ව**<br>මේ විධානයේ අරමුණු වෙනුවෙන් "සම්බන්ධිත පාර්ශ්ව" ලෙස සලකනු ලබන කාණ්ඩ පහත පරිදි වේ.<br>(අ) බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙක්;<br>(ආ) එවන් අධ්‍යක්ෂවරයෙකුගේ සමීප ඥාතියෙක්;<br>(ඇ) එවන් බැංකුවක අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීම ලැබීමට පෙර හෝ පසුව ඇති කර ගන්නා ලද, බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙක් සැලකිය යුතු තරමේ උනන්දුවක් දක්වන කරුණක්;<br>(ඈ) බලපත්‍රලාභී බැංකුවක සමීප ඥාතියෙක් සැලකිය යුතු තරමේ උනන්දුවක් දක්වන කරුණක්;<br>(ඉ) එවන් බලපත්‍රලාභී බැංකුවක සේවකයන්ට අදාළ වන යෝජනා ක්‍රමයක් යටතේ එම නිලධාරියාට ලබා දී ඇති අනුග්‍රහ හැර වෙනත් ඕනෑම අනුග්‍රහයක් සම්බන්ධයෙන් කටයුතු කරන බලපත්‍රලාභී බැංකුවට ප්‍රධාන විධායක නිලධාරියා හෝ විධායක කාර්යයන් ඉටු කරන නිලධාරියෙක්;<br>(ඊ) පෞද්ගලික හෝ වෙළඳ භෞතික පොළියක් හිමි බලපත්‍රලාභී බැංකුවක කොටස් හිමිකරුවෙක්;<br>(උ) බලපත්‍රලාභී බැංකුවේ අනුබද්ධිත හා පරිපාලිත සමාගමක්<br>(ඌ) මව් බැංකුව සහ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කර ඇති බැංකුවේ අනුබද්ධිත ආයතන හැර, බලපත්‍රලාභී බැංකුවේ පරිපාලන සමාගමක් හා එහි අනුබද්ධිත ආයතන;<br>(එ) බලපත්‍රලාභී බැංකුවේ අනුබද්ධිත හෝ පරිපාලිත සමාගමක අධ්‍යක්ෂවරයෙක්;<br>(ඒ) බලපත්‍රලාභී බැංකුවක පරිපාලිත සමාගමක සහ එහි අනුබද්ධිත ආයතනයක අධ්‍යක්ෂවරයෙක්;<br>(ඔ) ඉහත විධාන 7.1(e) සහ (f) හි විශේෂයෙන් සඳහන් කර ඇති පුද්ගලයෙකුගේ සමීප ඥාතියෙක්;<br>(ඕ) එවන් බැංකුවක අධ්‍යක්ෂ වරයෙකුගේ හෝ හවුල්කරුවෙකුගේ හා සම්බන්ධ පුද්ගලයෙක් ගේ ගැටලුවක්;<br>(ක) බලපත්‍රලාභී බැංකුවක සැලකිය යුතු උනන්දුවක් දක්වන ප්‍රමාණාත්මක කොටස් හිමිකරුවෙක් ගේ ගැටලුවක්;<br>(ග) තනි, භෞතික කොටස් හිමිකරුවෙකුගේ සමීප ඥාතියෙකු සැලකිය යුතු උනන්දුවක් දක්වන ගැටලුවක්; | අනුකූල වී ඇත.<br>වාර්ෂික ප්‍රකාශනය සමඟින් පද්ධතියෙන් නිර්මාණය වන අදාළ පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ තොරතුරු එකතු කර තහවුරු කෙරේ. |

## 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| 7.2 | **අදාළ පාර්ශ්ව ගනුදෙනු වර්ග**<br><br>මේ විධානය මගින් ආවරණය කර ඇති අදාළ පාර්ශ්ව සමඟ ගනුදෙනු වර්ගවලට පහත කරුණු අඩංගු විය යුතුය: | |
| | (අ) බලපත්‍රලාභී බැංකුවක උපරිම අනුග්‍රහය/විශාල අනාවරණය කිරීම් සම්බන්ධයෙන් බැංකු පනත් විධිවිධානයේ අර්ථ දක්වා ඇති ඕනෑම ආකාරයක අනුග්‍රහ ප්‍රදානයක්; | අනුකූල වී ඇත.<br><br>අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්කිරීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් සියලුම අධ්‍යක්ෂවරුන් ගෙන් ප්‍රකාශන ලබාගන්නා අතර වැඩිමනත් ගනුදෙනු ප්‍රකාශයට පත්කරන ලෙස ඔවුන්ගෙන් ඉල්ලීම් කෙරේ. |
| | (ආ) තැන්පතු, ණය ගැනීම්, ආයෝජන ආකාරයෙන් බැංකුවේ ඕනෑම වගකීමක් නිර්මාණය කිරීම; | |
| | (ඇ) බැංකුවට සපයන ලද හෝ බැංකුවෙන් ලබා ගන්නා ලද මූල්‍යමය හෝ මූල්‍යමය නොවන ආකාරයේ ඕනෑම සේවාවක් සැපයීම; | අවශ්‍යතාවක් ඇති වුවහොත්, මුදල් මණ්ඩල විසින් අර්ථ දක්වා ඇති පරිදි අනිවාර්ය ආරක්ෂාව ලබා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව බැංකු සේවකයන් දැනුවත්ය. |
| | (ඈ) එවන් අදාළ පාර්ශ්වයන්ට ප්‍රතිලාභ අත්විය හැකි විභව හිමිකාරිත්වය, රහස්‍ය හෝ වෙනත් සංවේදී තොරතුරු හුවමාරුවට මග පැදිය හැකි ආකාරයේ වාර්තාකරණ මාර්ග හා තොරතුරු ප්‍රවාහ බැංකුව හා ඕනෑම අදාළ පාර්ශ්වයක් අතර නිර්මාණය කර පවත්වාගෙන යාම; | අනුකූලතා අංශය විසින් මේ නියාමනය සමඟින් ක්‍රමවේද අධීක්ෂණය කරන අතර කාර්තුවකට වරක් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තාවක් ඉදිරිපත් කරනු ලබයි. |
| 7.3 | **බැංකු පනත් නියමයන්ගේ අදාළත්වය**<br><br>බැංකුවේ ඕනෑම අදාළ පර්ශ්වයකට පිරිනමන අනුග්‍රහය සම්බන්ධයෙන් 7.1 විධානයේ අර්ථ දක්වා ඇති පරිදි බැංකුවේ සේවකයන්ට අදාළ යෝජනා ක්‍රමයක් යටතේ ප්‍රධාන විධායක නිලධාරියාට හෝ ප්‍රධාන කළමනාකරණ නිලධාරියෙකුට ලබා දී ඇති අනුග්‍රහ හැර, බලපත්‍රලාභී බැංකු, බැංකු පනතේ 47 වන වගන්තියේ හා 76K වගන්තියේ විධිවිධානවලට අනුකූල වීම සහතික කළ යුතුය. | අනුකූල වී ඇත. |
| 7.4 | **අධ්‍යක්ෂවරුන්ට හා සම්බන්ධිත පාර්ශ්වවලට පිරිනමා ඇති අනුග්‍රහ**<br><br>බලපත්‍රලාභී බැංකුවක් විසින් යම් පුද්ගලයෙකුට හෝ එම පුද්ගලයා සැලකිය යුතු උනන්දුවක් දක්වන අයෙකුට කිසියම් අනුග්‍රහයක් පිරිනමා ඇති විට සහ එකී පුද්ගලයා පසුව බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත් කරනු ලැබුවහොත්, සහ: | |
| | (අ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති අවශ්‍ය ආරක්ෂණය, එම පුද්ගලයා අධ්‍යක්ෂවරයෙක් ලෙස පත් කළ දිනයේ සිට වසරක් ඇතුළත ලබා දී නොමැති නම්; සහ | |
| | (ආ) අනුග්‍රහ සඳහා ගෙවිය යුතු ඕනෑම මුදලක් හා පොළිය ඇත්නම්, අනුග්‍රහය ප්‍රදානය කරන අවස්ථාවේදී නිශ්චිතව දක්වා ඇති කාල සීමාව ඇතුළත හෝ අධ්‍යක්ෂවරයා පත්කරනු ලැබූ දින සිට මාස දහ අටක කාලයක් ඉක්මනව විට, මේ අවස්ථා දෙකෙන් පළමුව කුමක් සිදුවන විට හෝ, පියවා නොමැති නම් ඉහත (අ) හි දක්වා ඇති කාලසීමාව තුළ එවැනි ආරක්ෂණයක් ලබා දී නොමැති අවස්ථාවක; එම අධ්‍යක්ෂවරයා, අධ්‍යක්ෂ ධුරයෙන් ඉවත් වූ බවට සලකනු ලැබේ. කෙසේ වෙතත්, මේ විධානය, අනුග්‍රහය ප්‍රදානය කරන ලද අවස්ථාවේ එවන් බැංකුවක සේවකයෙක්ව සිට, බැංකුවේ සියලුම සේවකයන් සඳහා අදාළ වූ යෝජනා ක්‍රමයක් යටතේ අනුග්‍රහය ලබා ගත් අධ්‍යක්ෂවරයෙකුට අදාළ නැත. | අනුකූල වී ඇත.<br><br>සියලුම සේවකයන් සඳහා අදාළ වන පොදු යෝජනා ක්‍රමය හැර වෙනත් මනාප පදනමක් නැත. |

## 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| 7.5 | **සේවකයන්ට පිරිනමන අනුග්‍රහ**<br>අනුග්‍රහ හා අදාළව බැංකු පනතේ 47(3) සහ (5) වගන්තිවලට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ හැකි ආරක්ෂක පියවරක් තුළින් සුරක්ෂිත කර ඇති විටෙක නැතහොත් එම බැංකුවේ සේවකයන්ට අදාළ වන යෝජනා ක්‍රමයක පදනම මත හැර ගාස්තු සහ/හෝ කොමිස් අය කර නොගැනීම සම්බන්ධයෙන් බැංකුවක් කිසිදු අනුග්‍රහයක් හෝ "වඩා හිතවත් සැලකීමක්" කිසිදු සේවකයෙකුට හෝ එවන් සේවකයෙකු ගේ ඥාතියෙකුට හෝ සේවකයා හෝ ඥාතියා සැලකිය යුතු උනන්දුවක් දක්වන පුද්ගලයෙකුට ලබා නොදිය යුතුය. | අනුකූල වී ඇත |
| 7.6 | **අදාළ පාර්ශ්ව සඳහා අනුග්‍රහ කපා හැරීම**<br>7.1 විධානයේ දක්වා ඇති, බලපතලාභී බැංකුවක් විසින් අදාළ පාර්ශ්වවලට ලබාදී ඇති අනුග්‍රහයක්, එවන් අනුග්‍රහයක කිසිදු පාර්ශ්වයක්, ඒ සඳහා ගෙවිය යුතු කිසිදු පොළී මුදලක් ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ව අනුමැතියකින් තොරව කපා නොහැරිය යුතු අතර එවන් අනුමැතියකින් තොරව සිදු කරන්නාවූ කපා හැරීමක් වලංගු නොවන අතර එහි කිසිදු ප්‍රයෝජනයක් ද නොමැත. | අනුකූල වී ඇත.<br>එවන් අවස්ථාවක් පැන නොනැගුණි. |
| 8 | **ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය**<br>මේ විධානයේ අරමුණු වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය යනුවෙන් අදහස් කරන්නේ බලපතලාභී බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ය. | |
| 8.1 | **ජ්‍යෙෂ්ඨ කළමනාකරණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණය**<br>අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත වගකීම යනු එදිනෙදා ක්‍රියාකාරකම් පරීක්ෂා කිරීමේ බැඳීමට ලෙසින් අර්ථ නොදැක්විය යුතු අතර එය, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උපාය මාර්ග සහ ප්‍රතිපත්තිවලට එකඟව ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සාමාජිකයන් විසින් එදිනෙදා කටයුතු ආරක්ෂාකාරීව හා මනා අයුරින් සිදු කරන බවට අධීක්ෂණය කිරීමේ හා සහතික වීමේ අවතතභාවය ලෙස අවබෝධ කරගත යුතුය. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය:<br>(අ) ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ අධිකාරී ක්ෂේත්‍රය සහ වගකීම් අර්ථ දැක්විය යුතුය;<br>(ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපාරික උපාය මාර්ගය හා ප්‍රතිපත්ති සමඟ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ ක්‍රියාකාරකම් අනුරූප බවට සහතික විය යුතුය;<br>(ඇ) ආයතනික අරමුණු ඉටු කර ගැනීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීමට අවශ්‍යතාව මත පදනම්ව නිතිපතා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සම්මුඛ විය යුතුය;<br>(ඈ) ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් සපයන පැහැදිලි කිරීම් හා තොරතුරු ප්‍රශ්න කර විවේචනාත්මකව සමාලෝචනය කළ යුතුය;<br>(ඉ) බැංකුවේ මෙහෙයුම්වල විශාලත්වය, පරිමාව, විවිධත්වය හා සංකීර්ණත්වය සැලකිල්ලට ගැනීමේ දී ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සාමූහික දැනුම හා විශේෂඥ භාවය සුදුසු තත්ත්වයක පවතිදැයි අගය කර බැලිය යුතුය; සහ<br>(ඊ) සිය ක්‍රියාකාරකම් සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සාමාජිකයන් වගකිව යුතු බවට ග්‍රහණය කර ගත යුතුය. | අනුකූල වී ඇත. |

# 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| 8.2 | **ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සුදුසු හා නිසි බව තක්සේරු කිරීමේ නිර්ණායක**<br><br>බැංකු පනතේ 44(අ) වගන්තිය සහ 76(උ) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිරීක්ෂණය කර ඇති ආකාරයට බලපත්‍රලාභී බැංකුවල ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය අදාළ තනතුරු දැරීමට සුදුසු හා නිසි පුද්ගලයන් විය යුතු අතර ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සාමාජිකයන් සුදුසු හා නිසි පුද්ගලයන් දැයි තීරණය කිරීම සඳහා බැංකු පනතේ 42(2) වගන්තියේ විධිවිධාන යොදා ගත යුතුය. | අනුකූල වී ඇත.<br><br>මානව සම්පත් අංශය විසින් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සාමාජිකයන්ගෙන් අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශ හා ප්‍රකාශන ලබාගෙන සුදුසු හා නිසි බව තක්සේරු කිරීම සඳහා මහ බැංකුව වෙත යොමු කරනු ලබයි. |
| 8.3 | **ජ්‍යෙෂ්ඨ කළමනාකරිත්වයේ වගකීම්**<br><br>ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සාමාජිකයන්:<br><br>(අ) පෞද්ගලික චර්යාව තුළින් බලපත්‍රලාභී බැංකුවක ශක්තිමත් ආයතනික පාලන රාමුවට ප්‍රමාණවත් ලෙස දායක විය යුතුය;<br><br>(අා) බලපත්‍රලාභී බැංකුවේ ඔහුගේ/ඇයගේ වගකීම් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් වෘත්තීමය කාලයක් කැප කළ යුතුය. බලපත්‍රලාභී බැංකුවේ අනුබද්ධිත හෝ පරිපාලිත සමාගමක විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් ලෙස ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සාමාජිකයෙක් පත්කරන ලද අවස්ථාවක, එම රාජකාරී, බැංකුවේ වගකීම් ඵලදායී අයුරින් ඉටු කිරීම කෙරෙහි බලනොපාන බවට ඔහු/ඇය සහතික විය යුතුය;<br><br>(ඇ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී ඇති විධාන යටතේ මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම් කළමනාකරණය සඳහා ව්‍යාපාරික උපායමාර්ග, අවදානම් කළමනාකරණ ක්‍රමවේද, අවදානම් හා අනුකූලතා සංස්කෘතිය සහ ක්‍රියාවලි සහ පාලනය ක්‍රියාවට නැංවිය යුතුය;<br><br>(ඈ) අවදානම් කළමනාකරණය, අනුකූලතා හා අභ්‍යන්තර විගණන කටයුතුවල ස්වාධීන වගකීම් හඳුනාගෙන ඒවාට ගරු කළ යුතු අතර එවැනි රාජකාරී අභ්‍යාසයන්ට මැදිහත් නොවිය යුතුය;<br><br>(ඉ) කාර්යක්ෂමතාව පවත්වාගෙන යාමට හා වැඩිදියුණු කර ගැනීම සඳහා නිරන්තර පුහුණු වැඩසටහන්වලට ප්‍රවේශ වීමට අවස්ථාව ලබාගැනීම හා අදාළ වගකීම් ක්ෂේත්‍රවලට අදාළ වර්ධනයන් පිළිබඳව යාවත්කාලීනව සිටිය යුතුය;<br><br>(ඊ) කාර්ය මණ්ඩලයට රාජකාරී පැවරීමේ සහ එවන් පවරන ලද රාජකාරී අධීක්ෂණය කිරීමේ වගකීම දැරිය යුතුය;<br><br>(උ) සමස්ත බැංකුව තුළ වගවීම සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කරන කළමනාකරණ ව්‍යූහයක් ස්ථාපනය කළ යුතුය.<br><br>(ඌ) උල්ලංඝන හඳුනාගතහොත් සුදුසු නිවැරදි කිරීමේ හෝ විනය ක්‍රියාමාර්ග ගන්නා බවට සහතික විය යුතුය;<br><br>(i) ප්‍රමාණාත්මක කරුණු පිළිබඳ විස්තර, එයට පමණක් සීමා නොවී, අධ්‍යක්ෂ මණ්ඩලයට හා අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවලට සුදුසු පරිදි සැපයීම යුතුය;<br><br>(i) ව්‍යාපාර උපාය මාර්ග/අවදානම් උපාය මාර්ග/අවදානම් අභිරුචි වෙනස්කම්,<br><br>(ii) බැංකුවේ කාර්ය සාධනය සහ මූල්‍ය තත්ත්වය<br><br>(iii) අවදානම් සීමා හෝ අනුකූලතා නීති කඩ කිරීම්<br><br>(iv) අභ්‍යන්තර පාලන බිඳවැටීම්, සහ<br><br>(v) නෛතික හෝ නියාමන ගැටලු<br><br>(ඒ) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුගේ හෝ වෙනත් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සාමාජිකයෙකුගේ යෝග්‍යතාවයට අහිතකර ලෙස බලපෑ හැකි ඕනෑම භෞතික තොරතුරක් පිළිබඳව දැනුවත් වූ විට ඒ බව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට දැනුම් දිය යුතුය. | අනුකූල වී ඇත.<br><br>පහත කරුණු පිළිබඳව ජ්‍යෙෂ්ඨ කළාමනාකාරිත්වය සහතික වේ.<br><br>● පෞද්ගලික චර්යාව තුළින් බැංකුවේ ශක්තිමත් ආයතනික පාලන රාමුවට සැලකිය යුතු ලෙස දායක වීම,<br><br>● සිය වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට ප්‍රමාණවත් වෘත්තීය කාලයක් වැය කිරීම;<br><br>● අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස්වලට අනුකූලව, මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම් කළමනාකරණයට ක්‍රියාවලි හා පාලන ඇතුළත් ව්‍යාපාර උපායමාර්ග, අවදානම් කළමනාකරණ පද්ධති සහ ශක්තිමත් අවදානම් සහ අනුකූලතා සංස්කෘතියක් ක්‍රියාවට නැංවීම.<br><br>● අවදානම් කළමනාකරණ, අනුකූලතා සහ අභ්‍යන්තර විගණන අංශවල ස්වාධීන වගකීම් හඳුනාගෙන ඒවාට ගරුකරන අතර, එම රාජකාරී සිදු කිරීමේදී සිදුවන මැදිහත් වීම්වලින් වැළකී සිටියි.<br><br>● නිපුණතා රැකගෙන වැඩි දියුණු කරගැනීම සඳහා නිතිපතා පුහුණු වීම සහ සිය අදාළ වගකීම් ක්ෂේත්‍රයේ ප්‍රවණතා පිළිබඳව දැනුවත් ව සිටීම,<br><br>● කාර්ය මණ්ඩලයට රාජකාරී පැවරීම සහ එසේ පවරන ලද රාජකාරී ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කිරීම,<br><br>● සමස්ත බැංකුව පුරා වගවීම් සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කරන කළමනාකරණ ව්‍යූහයක් ස්ථාපනය කිරීම,<br><br>● උල්ලංඝනය කිරීම් හඳුනාගත් විය සුදුසු නිවැරදි කිරීමේ සහ විනය ක්‍රියාමාර්ග ගැනීම,<br><br>● පහත කරුණුවලට පමණක් සීමා නොවී භෞතික කාරණා පිළිබඳව මණ්ඩලය සහ අදාළ මණ්ඩල අනු කමිටු නිරන්තරව දැනුවත් කිරීම,<br><br>– ව්‍යාපාර උපායමාර්ග, අවදානම් උපාය මාර්ග හෝ අවදානම් අභිරුචි වෙනස්කම්;<br><br>– කාර්ය සාධනය හා මූල්‍ය තත්ත්වය<br><br>– අවදානම් සීමා හෝ අනුකූලතා නීති කඩකිරීම්;<br><br>– අභ්‍යන්තර පාලන බිඳවැටීම්,<br><br>– නෛතික හෝ නියාමන ගැටලු<br><br>● අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුගේ හෝ වෙනත් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සාමාජිකයෙකුගේ යෝග්‍යතාවයට අහිතකර ලෙස බලපෑ හැකි ඕනෑම භෞතික කරුණක් පිළිබඳව දැනුවත් වූ විට ඒ බව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට දැනුම් දීම. |

## 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| 9 | **අනාවරණය කිරීම්**<br>තොරතුරු අනාවරණය කිරීම සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු පහත අවශ්‍යතාවන්ට අනුකූල විය යුතුය. | |
| 9.1 | **අනාවරණය කිරීම් හා සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩල වගකීම්**<br>බැංකුවේ මෙහෙයුම්වල ප්‍රමාණය, පරිමාව, විවිධත්වය සහ සංකීර්ණත්වයට අනුකූලව ඉහළ නංවන ලද වෙළඳපොළ විනය හා පාරදෘශ්‍යභාවයට පහසුකම් සැපයීම් වස් ප්‍රධාන කාර්යසාධන දර්ශක, ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය, ද්‍රවශීලතාව, ව්‍යාපාර ඝනත්වය, අදාළ පාර්ශ්ව ගනුදෙනු, ආයතනික පාලනය, මූල්‍ය ප්‍රකාශන ආදිය ඇතුළුව නමුත් ඒවාට පමණක් සීමා නොවී අදාළ තොරතුරු ප්‍රමාණවත් පරිදි කාලෝචිතව ප්‍රසිද්ධියේ අනාවරණය කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතුය. වාර්ෂික විගණනගත මූල්‍ය ප්‍රකාශන සහ කාර්තුමය ප්‍රකාශන, අධීක්ෂණ සහ නියාමන බලධාරීන් විසින් නියම කරන ලද ආකෘති හා අදාළ ගිණුම් ප්‍රමිතීන්ට සකස් කොට ප්‍රකාශයට පත් කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතුය. | අනුකූල වී ඇත. |
| 9.2 | **වාර්ෂික වාර්තාවෙන් සිදු කළ යුතු අවම අනාවරණය**<br>අවම වශයන් පහත සඳහන් අනාවරණය කිරීම් වාර්ෂික වාර්තාවෙහි අඩංගු බවට මණ්ඩලය සහතික විය යුතුය. | |
| | (අ) නිශ්චිත අනාවරණ ඇතුළුව විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, අදාළ ගිණුම්කරණ ප්‍රමිති සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සකස් කර ඇති බවට වන ප්‍රකාශයක් | අනුකූල වී ඇත.<br>විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ ගිණුම්කරණ ප්‍රමිති හා නියාමන අවශ්‍යතාවන්ට අනුකූල වී ඇති බවට 289 පිටුවේ "මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම" යටතේද 293 පිටුවේ "සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරි සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය, සැලසුම් සහ කළමනාකරණ තොරතුරු පද්ධති/ප්‍රධාන මූල්‍ය නිලධාරියාගේ වගකීම් ප්‍රකාශය" යටතේ ද අනාවරණය කර ඇත. |
| | (ආ) මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ විශ්වාසනීයත්වය සම්බන්ධව සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා මූල්‍ය වාර්තා කරණ පද්ධතිය නිර්මාණය කර ඇති බවට සහ බාහිර අරමුණු වෙනුවෙන් සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන අදාළ ගිණුම් ප්‍රතිපත්ති හා නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සකසා ඇති බවටත් තහවුරු කෙරෙන බැංකුවේ අභ්‍යන්තර යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවක් | අනුකූල වී ඇත.<br>මූල්‍ය වාර්තාකරණය පිළිබඳ බැංකුවේ අභ්‍යන්තර පාලන පරිසරයේ පරිපූර්ණත්වය සම්බන්ධයෙන් වන අධ්‍යක්ෂ මණ්ඩලයේ විධිමත් සහතික කිරීම් වාර්ෂික වාර්තාවේ අන්තර්ගතව ඇත. මූල්‍ය වාර්තාකරණ පද්ධතිය නිර්මාණය කර ඇත්තේ මූල්‍යමය අනාවරණවල විශ්වසනීයත්වය පිළිබඳ යුක්තියුක්ත සහතිකය ලබාදීම පිණිස බවට අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි. ඊට අමතරව, බාහිර පාර්ශ්වකරුවන් සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අදාළ ගිණුම්කරණ ප්‍රමිති හා නියාමන රාමුවලට දැඩිව අනුකූල බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ.<br>මේ පාලන රාමු පිළිබඳ පුළුල් සමාලෝචනයක් සඳහා පිටු 290 සිට 291 තෙක් දක්වා ඇති "මූල්‍ය වාර්තාකරණය මත අභ්‍යන්තර වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය" වෙත කරුණාකර යොමු වන්න. |
| | (ඇ) අභ්‍යන්තර පාලන යාන්ත්‍රණවල ඵලදායිතාව පිළිබඳ බාහිර විගණකගේ සහතිකය ඉහත (ආ) හි දක්වා ඇත. "ප්‍රතිඥාත සහතික කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති SLSAE 3035 – අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශ හා අදාළ වන බැංකු සහතික වාර්තා" යටතේ විගණකවරුන් විසින් නිකුත් කර ඇති වාර්තාව, මේ සම්බන්ධයෙන් ආදේශක අනාවරණයක් ලෙස යොදා ගත හැක. | අනුකූල වී ඇත.<br>බැංකුව විසින් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයේ ඵලදායිතාව පිළිබඳ වන ස්වාධීන සහතික වාර්තාවක් ලබා ගෙන ඇත. මේ සහතිකය වාර්තාවේ පිටු අංක 292 හි දක්වා ඇත. |

## 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|
| (ඇ) නම්, බැංකුව සමඟ ඇති ගනුදෙනු සහ බැංකුව විසින් ගෙවා ඇති මුළු ගෙවීම්/වේතන ඇතුළු අධ්‍යක්ෂවරුන් ගේ තොරතුරු | අනුකූල වී ඇත.<br>අධ්‍යක්ෂවරුන්ගේ විස්තර පිටු අංක 220 සිට 224 හි දක්වා ඇත.<br>පිටු අංක 388 සිට 393 හි දක්වා ඇති මූල්‍ය ප්‍රකාශනවල 49 වන සටහනෙහි බැංකුව සමඟ වන අදාල පාර්ශ්ව ගනුදෙනුවල විස්තර ඇතුළත් කර ඇත.<br>පිටු අංක 333 හි මූල්‍ය ප්‍රකාශනවල 12 වන සටහනෙහි බැංකුවෙන් ගෙවන ලද වේතන පිළිබඳ විස්තර ලබා දී ඇත. |
| (ඉ) අදාළ පාර්ශ්වවල එක් එක් කාණ්ඩයට ලබා දී ඇති මුළු ශුද්ධ මූල්‍ය පහසුකම්. අදාළ පාර්ශ්වවල එක් එක් කාණ්ඩයට ලබා දී ඇති ශුද්ධ මූල්‍ය පහසුකම් බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස ද අනාවරණය කළ යුතුය. | අනුකූල වී ඇත.<br>බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස අදාළ පාර්ශ්වවලට ලබා දී ඇති ශුද්ධ මූල්‍ය පහසුකම් පිටු අංක 388 සිට 393 දක්වා සටහන් අංක 49හි සඳහන් කර ඇත. |
| (ඊ) බැංකුව විසින් එහි ප්‍රධාන විධායක නිලධාරියාට සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට ගෙවා ඇති වේතනවල මුළු වටිනාකම සහ ගෙවන ලද වේතන, ප්‍රදානය කරන ලද මූල්‍ය පහසුකම්, තැන්පතු හෝ බැංකුව තුළ කර ඇති ආයෝජන වැනි පුළුල් කාණ්ඩ මගින් පෙන්නුම් කර ඇති බැංකුව විසින් සිය ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ සිදු කරන ලද ගනුදෙනුවල සමස්ත වටිනාකම | අනුකූල වී ඇත.<br>2025 වසර තුළ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට ගෙවන ලද සමස්ත වේතන හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ සිදු කරන ලද ගනුදෙනුවල සමස්ත වටිනාකම සටහන් අංක 49 යටතේ පිටු අංක 388 සිට 393 හි දැක්වේ. |
| (උ) පහත කරුණු ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල විස්තර<br>(i) වසර තුළ එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල කමිටුව විසින් සිදුකරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්වල විස්තර<br>(ii) වසර තුළ එක් එක් කමිටුව විසින් පවත්වන ලද රැස්වීම් ගණන<br>(iii) එවන් රැස්වීම්වල එක් එක් අධ්‍යක්ෂවරයාගේ පැමිණීම | අනුකූල වී ඇත.<br>ප්‍රධාන ක්‍රියාකාරකම්, රැස්වීම් වාර ගණන, අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීමේ වාර්තා ඇතුළු පුළුල් අනාවරණය කිරීම් පිටු අංක 245 සිට 253 දක්වා විස්තර කර ඇත. |
| (ඌ) වාර්ෂික ආයතන පාලන වාර්තාවෙන් පහත කරුණු අනාවරණය විය යුතුය:<br>(i) බලපත්‍රලාභී බැංකුවේ එක් එක් අනු කමිටුව සමඟ අනුකූලතාව පැහැදිලිව පෙන්නුම් කරන, මේ උපදෙස්වලට අනුකූල වීමේ බාහිර විගණන සහතිකය;<br>(ii) සභාපති, විධායක අධ්‍යක්ෂවරු, විධායක නොවන අධ්‍යක්ෂවරු සහ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් ගේ නම් ඇතුළුව අධ්‍යක්ෂවරුන්ගේ කාණ්ඩය අනුව අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය;<br>(iii) සභාපතිගේ හා ප්‍රධාන විධායක නිලධාරියාගේ අනන්‍යතාවය සහ මූල්‍ය, ව්‍යාපාරික, පවුල හෝ වෙනත් භෞතික/අදාළ සබඳතාවය (සබඳතා) වෙතොත් ඇතුළු සභාපති, ප්‍රධාන විධායක නිලධාරි සහ මණ්ඩල සාමාජිකයන් අතර ඕනෑම සම්බන්ධක ස්වභාවය | අනුකූල වී ඇත.<br>මෙම නියාමනයන්ට අනුකූල වෙමින් බැංකුව වාර්ෂික ආයතන පාලන වාර්තාවෙන් පහත විස්තර අනාවරණය කර ඇත.<br>(i) විධිවිධානවල අනුකූල වීම තහවුරු කරගැනීම සඳහා බැංකුව බාහිර විගණකගෙන් වෙනම සහතිකයක් ලබා ගෙන ඇත.<br>(ii) සභාපති, විධායක අධ්‍යක්ෂවරු, විධායක නොවන අධ්‍යක්ෂවරු සහ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ නම් ඇතුළු අධ්‍යක්ෂවරුන්ගේ කාණ්ඩය අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය 237 පිටුවෙන් අනාවරණය කර ඇත.<br>(iii) බැංකුව, සභාපති, ප්‍රධාන විධායක නිලධාරි, මණ්ඩලයේ සියලුම සාමාජිකයන් ගේ ළඟැදියාවන් සහ සබඳතා පිළිබඳව විධිමත් සමාලෝචනයක් සිදු කර ඇත. සභාපති, ප්‍රධාන විධායක නිලධාරි සහ මණ්ඩලයේ අනෙකුත් සියලුම සාමාජිකයන් අතර මූල්‍ය, ව්‍යාපාරික, පවුල් හෝ වෙනත් භෞතික/අදාළ සබඳතා නොපවතී. |
| (එ) විචක්ෂණශීලී අවශ්‍යතා, නියාමන, නීති හා අභ්‍යන්තර පාලන සහ කිසියම් අනුකූල නොවන තත්ත්වයක් වෙතොත් එය නිවැරදි කිරීමට ගන්නා ලද පියවර පිළිබඳ විස්තර සඳහන් කෙරෙන වාර්තාවක් | අනුකූල වී ඇත.<br>මූල්‍ය වාර්තාකරණය හා අදාළ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය 289 පිටුවෙහි ඇතුළත්ය. පිටු අංක 290 සහ 291 හි ඇතුළත් මූල්‍ය වාර්තාකරණය හා අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය, පිටු අංක 440 සිට 468 දක්වා ඇති බැංකු පනතේ 2004 අංක 5 දරන විධානයට අනුකූල වීම, විචක්ෂණශීලී අවශ්‍යතා, නියාමන, නීති සහ අභ්‍යන්තර පාලන හා අනුකූලත්වයට අදාළ විස්තර පැහැදිලිව සඳහන් කර ඇත. |

## 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| | (ඒ) බැංකුවේ අවදානම් කළමනාකරණයේ අඩුලුහුඬුකම්, හෝ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් සන්නිවේදනය කර ඇති මෙකී නියෝග වලට අනුකූල නොවීම් නැතහොත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති පරිපාලන දඩ මුදල් හා ඒවා මහජනතාවට අනාවරණය කරන ලෙසට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියෝග කර ඇති විටෙක එවැනි ගැටලු විසඳීමට බැංකුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සමඟින් නියාමන හා අධීක්ෂණ ගැටලු පිළිබඳ ප්‍රකාශයක් | අනුකූල වී ඇත.<br>2025 කාලය තුළ ඒ ආකාරයේ එවන් සිදුවීමක් නොවූ හෙයින් වසර තුළ කිසිදු අනාවරණයක් කරන ලෙසට මහ බැංකුව නියෝග කර නොමැත. |
| | (ඔ) අදාළ මූල්‍ය වර්ෂය තුළ සේවය අවසන් කිරීමේ දී හෝ විශ්‍රාම යෑමේදී අධ්‍යක්ෂවරුන්ට, ප්‍රධාන විධායක නිලධාරීන්ට සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට ලබා දී ඇති මුළු ව්‍යවස්ථාපිත නොවන විශේෂ ගෙවීම්/මූල්‍ය හෝ මූල්‍ය නොවන ප්‍රතිලාභවල සමස්ත වටිනාකම | අනුකූල වී ඇත.<br>වසර තුළ එවන් සිදුවීමක් ඇති නොවිය. |
| 9.3 | **අධ්‍යක්ෂ ධුරයෙන් ඉල්ලා අස්වීම, ඉවත් කිරීම හෝ තනතුර පුරප්පාඩු වීමේදී කළ යුතු අනාවරණ**<br>යම් අධ්‍යක්ෂවරයෙක් ඉල්ලා අස්වන්නේ නම් හෝ නියාමනවලට අනුකූල නොවීම නිසා සහ/හෝ අධ්‍යක්ෂ මණ්ඩල විසින් තීරණය කරන ලද පරිදි යම් අධ්‍යක්ෂවරයෙක් ඉවත් කරන්නේ නම් හෝ තනතුරෙන් ඉවත් වූ බවට සලකන්නේ නම්, අදාළ අධ්‍යක්ෂවරයා බැංකුව සමඟ එකඟ නොවන්නේ නම් එය ද ඇතුළුව නමුත් එයට පමණක් සීමා නොවී, අධ්‍යක්ෂවරයාගේ ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හෝ තනතුරෙන් ඉවත් වූ බවට සලකනු ලබන තත්ත්වය සහ ඊට හේතු බලපතුලාභී බැංකුවේ නිල වෙබ් අඩවියෙහි මණ්ඩලය විසින් සඳහන් කළ යුතුය. | අනුකූල වී ඇත.<br>අනුකූල වී ඇත. ආයතන පාලන වාර්තාවේ පිටු අංක 237 ට යොමු වන්න. |
| 10 | **ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගතකරන ලද බැංකු**<br>ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද බැංකු පහත අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය. | |
| 10.1 | **විධානවල අදාළත්වය**<br>මෙම නියෝග ශ්‍රී ලංකාවෙන් බැහැරව ලියාපදිංචි කර ඇති බැංකුවල මව් රටේ පවතින නීති සහ රීතින්ට පටහැනි නොවන තාක් දුරට එම බැංකු සඳහා ද අදාළ විය යුතුය. ඒ අනුව ශ්‍රී ලංකාවෙන් බැහැරව ලියාපදිංචි කර ඇති බැංකු ඒවායේ ප්‍රධාන කාර්යාලය හෝ ප්‍රාදේශීය කාර්යාලය විසින් ස්ථාපිත කර ඇති පවතින ආයතනික පාලන රාමු සහ ව්‍යුහයන් මත පදනම්ව මෙම නියෝගවල අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. | අදාළ නැත |

## 2024 අංක 05 දරන බැංකු පනත් නියාමනය සමඟ අනුකූල වීම

| | | 2025 වසර තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| 10.2 | **තොරතුරු ඉදිරිපත් කිරීම**<br>ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කර ඇති බැංකු විසින් පහත තොරතුරු වාර්ෂිකව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.<br>(අ) වාර්ෂිකව විගණනය කරන ලද අවසාන ප්‍රකාශන සමඟ විධිවිධාන 9.2(ඈ) සහ (ඌ) හැර 9 වන විධිවිධානයෙන් අවශ්‍ය කෙරෙන තොරතුරු. විධිවිධාන 9.2(ආ) සහ (එ) සඳහන් වාර්තා සකස් කළ යුත්තේ ප්‍රධාන කාර්යාලය හෝ ශ්‍රී ලංකාවේ මෙහෙයුම් අධීක්ෂණය කරන කලාපීය කාර්යාලය විසිනි.<br>(ආ) මූල්‍ය වසර අවසාන වී මසක් ඇතුළත පහත තොරතුරු:<br>(i) රැස්වීම් දින සහ එක් එක් රැස්වීමේ දී සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු සමඟ මූල්‍ය වර්ෂය තුළ පවත්වන ලද කළමනාකරණ මට්ටමේ සියලු රැස්වීම්වල ලැයිස්තුවක්;<br>(ii) අදාළ අධිකාරිය විසින් අනුමත කර ඇති සියලුම කළමනාකරණ කමිටුවල යොමු නියමයන්ගේ පිටපත්<br>(iii) එක් එක් කමිටුවේ සංයුතිය : සාමාජිකයන්ගේ නම් හා තනතුරු; සහ<br>(iv) වර්ෂය තුළ ප්‍රධාන කාර්යාලය සහ/හෝ කලාපීය කාර්යාල වෙත තොරතුරු සම්පාදනය සඳහා කාර්යාලය තුළ ක්‍රියාත්මක වූ වාර්තාකරණ මාර්ග පිළිබඳ විස්තර<br>(ඇ) මූල්‍ය වර්ෂය අවසානයෙන් පස් මසක් ඇතුළත නිකුත් කරන ලද මව් බැංකුවේ වාර්ෂික ආයතන පාලන වාර්තාවේ පිටපතක් | අදාළ නැත. |
| 11 | **සමාගම් ව්‍යවස්ථා ගැටුම්**<br>ඕනෑම බැංකුවකට අදාළව මෙම නියමයන්ගේ ඕනෑම විධිවිධානයක් සහ සංගම් ව්‍යවස්ථා (හෝ අභ්‍යන්තර නීති) අතර ගැටුමකදී මෙම නියමයන්ගේ විධිවිධාන බලපැවැත්වෙනු ඇත. තනි බැංකුව සමාගම් ව්‍යවස්ථාවෙන් මෙකී නියමයන් ගෙන් දක්වා ඇති ප්‍රමිතිවලට වඩා දැඩි ප්‍රමිති නියම කරන අවස්ථාවක, සමාගම් ව්‍යවස්ථාවේ එකී විධිවිධාන අනුගමනය කළ හැක. | 1971 අංක 30 දරන සංශෝධිත ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතින් පිහිටුවා ඇත. |

# ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA SRI LANKA) විසින් නිකුත් කරන ලද 2023 ආයතනික පාලනය පිළිබඳ යහපරිච සංග්‍රහය (සංග්‍රහය) සමඟ අනුකූලතාවය

| කේතය යොමුව | මූලධර්ම |
|---|---|
| A | **අධ්‍යක්ෂවරුන්** |
| A.1 | **අධ්‍යක්ෂ මණ්ඩලය**<br>1971 අංක 30 දරන ජාතික ඉතුරුම් බැංකු පනත සහ එහි සංශෝධනවල දක්වා ඇති පරිදි, ජාතික ඉතුරුම් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සභාපතිවරයා ඇතුළුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් (Non-Executive Directors) හත් දෙනෙකුගෙන් (07) සමන්විත වේ. ජාතික ඉතුරුම් බැංකු පනතට අනුව බැංකුවේ අධ්‍යක්ෂවරුන් පස් දෙනෙකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අතර, නිල බලයෙන් පත්වන අධ්‍යක්ෂවරුන් (Ex-officio Directors) දෙදෙනාගෙන් අයෙකු මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයෙකු විය යුතු අතර අනෙක් පුද්ගලයා තැපැල්පතිවරයා හෝ ඔහුගේ නාමිකයෙකු විය යුතුය.<br>සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ ඉහළම තීරණ ගැනීමේ මණ්ඩලය වේ. වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී පාලනයන් සහිතව බැංකුව මෙහෙයවීම සහ මගපෙන්වීම සඳහා ප්‍රමුඛ පෙළේ වෘත්තිකයන් හත් දෙනෙකුගෙන් (07) සමන්විත විය.<br>2025 වර්ෂය තුළ ධූර දැරූ අධ්‍යක්ෂවරුන් පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ 220 සිට 224 දක්වා පිටුවල දක්වා ඇත. |
| A.1.1 | **නිත්‍ය රැස්වීම්**<br>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් අවම වශයෙන් සති හයකට වරක්වත් පැවැත්විය යුතු බවට පනවා ඇති ව්‍යවස්ථාපිත විධිවිධානවලට අනුකූලව, සභාපතිවරයාට අවශ්‍ය යැයි හැඟෙන වාර ගණනක් රැස්වීම් පැවැත්වීමට අනුකූල වෙමින්, අධ්‍යක්ෂ මණ්ඩලය වර්ෂය පුරා නිත්‍ය ලෙස රැස් වී ඇත. වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම් 15 ක් කැඳවා තිබේ. අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු ද අදාළ ප්‍රඥප්තීන්ට (Charter) අනුකූල වෙමින් වර්ෂය පුරා නිත්‍ය ලෙස රැස් විය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල නිත්‍යභාවය සහ තොරතුරු ඉදිරිපත් කිරීමේ ව්‍යුහය සහ ක්‍රියාවලිය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය එකඟ වී ඒවා ලේඛනගත කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අනුකමිටු රැස්වීම් පිළිබඳ විස්තර 237 වන පිටුවේ දක්වා ඇත. |
| A.1.2 | **අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරයන් සහ වගකීම්**<br>අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම් පිළිබඳ විස්තර අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි (Board Charter) ඇතුළත් කර ඇති අතර, එය 235 වන පිටුවේ දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයාගේ සහාය හිමිවේ. |
| ශුද්ධ පොළී ආදායම | 84,849 | 42 | 72,583 | 35 | 29,565 | 13 | 32,463 | 19 | 54,630 | 40 |
| ගාස්තු සහ කොමිස් ආදායම | 2,937 | 1 | 2,079 | 1 | 1,593 | 1 | 2,173 | 1 | 3,051 | 2 |
| ගාස්තු සහ කොමිස් වියදම | (377) | (0) | (328) | (0) | (317) | (0) | (233) | (0) | (208) | (0) |
| ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම | 2,560 | 1 | 1,751 | 1 | 1,276 | 1 | 1,940 | 1 | 2,843 | 2 |
| වෙනත් පොළී නොවන ආදායම | 2,047 | 1 | 1,810 | 1 | 3,504 | 2 | (583) | (0) | 450 | 0 |
| මුළු මෙහෙයුම් ආදායම | 89,456 | 44 | 76,143 | 37 | 34,345 | 15 | 33,820 | 19 | 57,923 | 43 |
| හානිකරණ අයකිරීම් | (1,637) | (1) | (11,526) | (6) | (4,259) | (2) | (4,862) | (3) | (4,304) | (3) |
| ශුද්ධ මෙහෙයුම් ආදායම | 87,820 | 43 | 64,617 | 31 | 30,086 | 13 | 28,958 | 17 | 53,619 | 40 |
| සේවක මණ්ඩල වියදම් | (19,892) | (10) | (20,306) | (10) | (16,110) | (7) | (13,791) | (8) | (12,970) | (10) |
| ක්ෂයවීම් හා ක්‍රමක්ෂය වියදම් | (2,258) | (1) | (1,675) | (1) | (1,433) | (1) | (1,415) | (1) | (1,386) | (1) |
| වෙනත් වියදම් | (8,283) | (4) | (7,021) | (3) | (6,955) | (3) | (5,990) | (3) | (4,719) | (3) |
| බදු වලට පෙර මෙහෙයුම් ලාභය/(පාඩුව) | 57,387 | 28 | 35,615 | 17 | 5,589 | 2 | 7,763 | 4 | 34,544 | 26 |
| මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු | (11,321) | (6) | (8,208) | (4) | (1,143) | (0) | (3,186) | (2) | (6,162) | (5) |
| මූල්‍ය සේවා මත සමාජ ආරක්ෂණ දායකත්ව බදු | (1,572) | (1) | (1,140) | (1) | (159) | (0) | (67) | (0) | – | – |
| ආදායම් බදුවලට පෙර ලාභය/(පාඩුව) | 44,493 | 22 | 26,268 | 13 | 4,287 | 2 | 4,510 | 3 | 28,381 | 21 |
| ආදායම් බදු වියදම | (17,172) | (8) | (10,145) | (5) | 2,929 | 1 | (1,980) | (1) | (6,262) | (5) |
| කාල සීමාව සඳහා ලාභය/(පාඩුව) | 27,321 | 13 | 16,122 | 8 | 7,216 | 3 | 2,530 | 1 | 22,120 | 16 |

# මූල්‍ය තත්ත්වය පිළිබඳ තිරස් විශ්ලේෂණය

| දෙසැම්බර් 31 දිනට | 2025 | | 2024 | | 2023 | | 2022 | | 2021 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. මි. | % | රු. මි. | % | රු. මි. | % | රු. මි. | % | රු. මි. | % |
| **වත්කම්** | | | | | | | | | | |
| මුදල් සහ මුදලට සමානයන් | 8,327 | (0) | 8,359 | (12) | 9,509 | 9 | 8,734 | 14 | 7,656 | 18 |
| මහ බැංකුව වෙතැති ශේෂයන් | 167 | (53) | 357 | 45 | 247 | 4 | 236 | – | – | – |
| බැංකුවල ඇති තැන්පතු | 24,181 | 63 | 14,795 | (34) | 22,577 | 116 | 10,466 | 47 | 7,121 | (46) |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 69 | 654 | 9 | 888 | 1 | (97) | 28 | – | – | (100) |
| **ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම්** | | | | | | | | | | |
| සාධාරණ අගයට ගණනය කළ | 22,159 | 5 | 21,087 | 19 | 17,749 | 25 | 14,174 | (28) | 19,573 | 74 |
| **ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම්** | | | | | | | | | | |
| ණය හා අත්තිකාරම් | 550,828 | 3 | 532,379 | 1 | 526,521 | (5) | 553,027 | 3 | 538,942 | 4 |
| ණය හා වෙනත් උපකරණ | 1,092,990 | 5 | 1,039,035 | 10 | 943,705 | 3 | 919,129 | (2) | 935,350 | 24 |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් | 64,635 | 21 | 53,469 | (14) | 61,924 | 124 | 27,663 | 100 | 13,818 | (10) |
| පාලිත සමාගම්වල ආයෝජනයන් | 7,311 | – | 7,311 | – | 7,311 | – | 7,311 | 52 | 4,811 | – |
| ආශ්‍රිත සමාගම්වල සහ බද්ධ ව්‍යාපාරවල ආයෝජනයන් | – | – | – | – | – | – | – | – | – | – |
| දේපල, පිරියත සහ උපකරණ | 17,312 | (1) | 17,416 | 1 | 17,249 | 17 | 14,756 | (2) | 15,046 | (2) |
| භාවිතයට අයිතිය ඇති වත්කම් | 1,244 | 20 | 1,041 | (11) | 1,165 | (4) | 1,214 | 1 | 1,206 | (2) |
| දේපළ ආයෝජන | – | – | – | – | – | – | – | – | – | – |
| කීර්තිනාමය හා අස්පෘශ්‍ය වත්කම් | 2,380 | 9 | 2,184 | 193 | 745 | (0) | 747 | (8) | 816 | 19 |
| විලම්බිත බදු වත්කම් | 6,563 | 31 | 4,995 | (15) | 5,885 | 103 | 2,893 | 162 | 1,105 | (24) |
| වෙනත් වත්කම් | 32,858 | (34) | 50,002 | (31) | 72,379 | 29 | 56,307 | 67 | 33,655 | 46 |
| මුළු වත්කම් | 1,831,024 | 4 | 1,752,438 | 4 | 1,686,965 | 4 | 1,616,687 | 2 | 1,579,098 | 16 |
| **වගකීම්** | | | | | | | | | | |
| බැංකු වලට ගෙවිය යුතු | 81 | (83) | 488 | (95) | 8,985 | 120 | 4,087 | (47) | 7,687 | (40) |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 0 | (100) | 258 | 128,462 | 0 | – | – | – | – | – |
| **ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වගකීම්** | | | | | | | | | | |
| තැන්පත්කරුවන්ට ගෙවිය යුතු | 1,608,490 | 3 | 1,556,271 | 5 | 1,482,532 | 0 | 1,476,740 | 3 | 1,428,467 | 15 |
| ණය සුරැකුපත් හිමියන්ට ගෙවිය යුතු | – | – | – | – | – | – | – | – | – | – |
| වෙනත් ණය ගැනීම් සඳහා ගෙවිය යුතු | 39,057 | (19) | 48,190 | (22) | 61,611 | 267 | 16,766 | 117 | 7,720 | (5) |
| කල්බදු වගකීම් | 1,493 | 16 | 1,282 | (6) | 1,366 | (1) | 1,377 | 7 | 1,292 | 1 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | 16,911 | (0) | 16,966 | (29) | 23,807 | 0 | 23,778 | (37) | 37,529 | 18 |
| සේවාවසාන ප්‍රතිලාභ බැඳීම් | 19,923 | 14 | 17,490 | (3) | 18,100 | 45 | 12,489 | 45 | 8,591 | (26) |
| ප්‍රවර්තන බදු වගකීම් | 8,484 | 133 | 3,649 | – | – | (100) | 2,761 | (40) | 4,596 | 651 |
| විලම්බිත බදු වගකීම් | – | – | – | – | – | – | – | – | – | – |
| වෙනත් වෙන්කිරීම් | – | – | – | – | – | – | – | – | – | – |
| වෙනත් වගකීම් | 17,535 | 95 | 9,002 | (2) | 9,189 | 59 | 5,796 | (19) | 7,200 | 20 |
| පාලිත සමාගම්වලට ගෙවිය යුතු | – | – | – | – | – | – | – | (100) | 4 | (7) |
| මුළු වගකීම් | 1,711,974 | 4 | 1,653,596 | 3 | 1,605,590 | 4 | 1,543,795 | 3 | 1,503,085 | 15 |
| **හිමිකම්** | | | | | | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය | 9,400 | – | 9,400 | – | 9,400 | – | 9,400 | – | 9,400 | – |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 6,241 | 10 | 5,695 | 6 | 5,369 | 3 | 5,225 | 1 | 5,174 | 27 |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය | – | – | – | (100) | 1,286 | (177) | (1,670) | 154 | (658) | 51 |
| රඳවාගත් ඉපැයීම් | 46,546 | 64 | 28,462 | 98 | 14,408 | 27 | 11,359 | (17) | 13,728 | (5) |
| වෙනත් සංචිත | 56,864 | 3 | 55,285 | 9 | 50,911 | 5 | 48,578 | 0 | 48,369 | 79 |
| අයිතිකරුවන්ගේ මුළු හිමිකම | 119,051 | 20 | 98,843 | 21 | 81,374 | 12 | 72,892 | (4) | 76,013 | 40 |
| මුළු හිමිකම් සහ වගකීම් | 1,831,024 | 4 | 1,752,438 | 4 | 1,686,965 | 4 | 1,616,687 | 2 | 1,579,098 | 16 |

# මූල්‍ය තත්ත්වය පිළිබඳ සිරස් විශ්ලේෂණය

| දෙසැම්බර් 31 දිනට | 2025 | | 2024 | | 2023 | | 2022 | | 2021 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. මි. | % | රු. මි. | % | රු. මි. | % | රු. මි. | % | රු. මි. | % |
| **වත්කම්** | | | | | | | | | | |
| මුදල් සහ මුදලට සමානයන් | 8,327 | 0.5 | 8,359 | 0.5 | 9,509 | 0.6 | 8,734 | 0.5 | 7,656 | 0.5 |
| මහ බැංකුව වෙතැති ශේෂයන් | 167 | 0.0 | 357 | 0.0 | 247 | 0.0 | 236 | 0.0 | – | – |
| බැංකුවල ඇති තැන්පතු | 24,181 | 1.3 | 14,795 | 0.8 | 22,577 | 1.3 | 10,466 | 0.6 | 7,121 | 0.5 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 69 | 0.0 | 9 | 0.0 | 1 | 0.0 | 28 | 0.0 | – | – |
| **ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම්** | | | | | | | | | | |
| සාධාරණ අගයට ගණනය කළ | 22,159 | 1.2 | 21,087 | 1.2 | 17,749 | 1.1 | 14,174 | 0.9 | 19,573 | 1.2 |
| **ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම්** | | | | | | | | | | |
| ණය හා අත්තිකාරම් | 550,828 | 30.1 | 532,379 | 30.4 | 526,521 | 31.2 | 553,027 | 34.2 | 538,942 | 34.1 |
| ණය හා වෙනත් උපකරණ | 1,092,990 | 59.7 | 1,039,035 | 59.3 | 943,705 | 55.9 | 919,129 | 56.9 | 935,350 | 59.2 |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් | 64,635 | 3.5 | 53,469 | 3.1 | 61,924 | 3.7 | 27,663 | 1.7 | 13,818 | 0.9 |
| පාලිත සමාගම්වල ආයෝජනයන් | 7,311 | 0.4 | 7,311 | 0.4 | 7,311 | 0.4 | 7,311 | 0.5 | 4,811 | 0.3 |
| ආශ්‍රිත සමාගම්වල සහ බද්ධ ව්‍යාපාරවල ආයෝජනයන් | – | – | – | – | – | – | – | – | – | – |
| දේපල, පිරියත සහ උපකරණ | 17,312 | 0.9 | 17,416 | 1.0 | 17,249 | 1.0 | 14,756 | 0.9 | 15,046 | 1.0 |
| භාවිතයට අයිතිය ඇති වත්කම් | 1,244 | 0.1 | 1,041 | 0.1 | 1,165 | 0.1 | 1,214 | 0.1 | 1,206 | 0.1 |
| දේපළ ආයෝජන | – | – | – | – | – | – | – | – | – | – |
| කීර්තිනාමය හා අස්පෘශ්‍ය වත්කම් | 2,380 | 0.1 | 2,184 | 0.1 | 745 | 0.0 | 747 | 0.0 | 816 | 0.1 |
| විලම්බිත බදු වත්කම් | 6,563 | 0.4 | 4,995 | 0.3 | 5,885 | 0.3 | 2,893 | 0.2 | 1,105 | 0.1 |
| වෙනත් වත්කම් | 32,858 | 1.8 | 50,002 | 2.9 | 72,379 | 4.3 | 56,307 | 3.5 | 33,655 | 2.1 |
| **මුළු වත්කම්** | 1,831,024 | 100.0 | 1,752,438 | 100.0 | 1,686,965 | 100.0 | 1,616,687 | 100.0 | 1,579,098 | 100.0 |
| **වගකීම්** | | | | | | | | | | |
| බැංකු වලට ගෙවිය යුතු | 81 | 0.0 | 488 | 0.0 | 8,985 | 0.5 | 4,087 | 0.3 | 7,687 | 0.5 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 0 | 0.0 | 258 | 0.0 | 0 | 0.0 | – | – | – | – |
| **ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වගකීම්** | | | | | | | | | | |
| තැන්පත්කරුවන්ට ගෙවිය යුතු | 1,608,490 | 87.8 | 1,556,271 | 88.8 | 1,482,532 | 87.9 | 1,476,740 | 91.3 | 1,428,467 | 90.5 |
| ණය සුරැකුපත් හිමියන්ට ගෙවිය යුතු | – | – | – | – | – | – | – | – | – | – |
| වෙනත් ණය ගැනීම් සඳහා ගෙවිය යුතු | 39,057 | 2.1 | 48,190 | 2.7 | 61,611 | 3.7 | 16,766 | 1.0 | 7,720 | 0.5 |
| කල්බදු වගකීම් | 1,493 | 0.1 | 1,282 | 0.1 | 1,366 | 0.1 | 1,377 | 0.1 | 1,292 | 0.1 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | 16,911 | 0.9 | 16,966 | 1.0 | 23,807 | 1.4 | 23,778 | 1.5 | 37,529 | 2.4 |
| සේවාවසාන ප්‍රතිලාභ බැඳීම් | 19,923 | 1.1 | 17,490 | 1.0 | 18,100 | 1.1 | 12,489 | 0.8 | 8,591 | 0.5 |
| ප්‍රවර්තන බදු වගකීම් | 8,484 | 0.5 | 3,649 | 0.2 | – | – | 2,761 | 0.2 | 4,596 | 0.3 |
| විලම්බිත බදු වගකීම් | – | – | – | – | – | – | – | – | – | – |
| වෙනත් වෙන්කිරීම් | – | – | – | – | – | – | – | – | – | – |
| වෙනත් වගකීම් | 17,535 | 1.0 | 9,002 | 0.5 | 9,189 | 0.5 | 5,796 | 0.4 | 7,200 | 0.5 |
| පාලිත සමාගම්වලට ගෙවිය යුතු | – | – | – | – | – | – | – | – | 4 | 0.0 |
| හිලව් වන ගිණුම් | – | – | – | – | – | – | – | – | – | – |
| **මුළු වගකීම්** | 1,711,974 | 93.5 | 1,653,596 | 94.4 | 1,605,590 | 95.2 | 1,543,795 | 95.5 | 1,503,085 | 95.2 |
| **හිමිකම්** | | | | | | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය | 9,400 | 0.5 | 9,400 | 0.5 | 9,400 | 0.6 | 9,400 | 0.6 | 9,400 | 0.6 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 6,241 | 0.3 | 5,695 | 0.3 | 5,369 | 0.3 | 5,225 | 0.3 | 5,174 | 0.3 |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය | – | – | – | – | 1,286 | 0.1 | (1,670) | (0.1) | (658) | (0.0) |
| රඳවාගත් ඉපැයීම් | 46,546 | 2.5 | 28,462 | 1.6 | 14,408 | 0.9 | 11,359 | 0.7 | 13,728 | 0.9 |
| වෙනත් සංචිත | 56,864 | 3.1 | 55,285 | 3.2 | 50,911 | 3.0 | 48,578 | 3.0 | 48,369 | 3.1 |
| **අයිතිකරුවන්ගේ මුළු හිමිකම** | 119,051 | 6.5 | 98,843 | 5.6 | 81,374 | 4.8 | 72,892 | 4.5 | 76,013 | 4.8 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | 1,831,024 | 100.0 | 1,752,438 | 100.0 | 1,686,965 | 100.0 | 1,616,687 | 100.0 | 1,579,098 | 100.0 |

# අනුරූප බැංකු

**Banca Popolare Di Sondrio – Italy**

Piazza Garibaldi 16
23100,
Sondrlom SO, Italy
POSOIT22

www.popso.it
Phone: +390342528111
+390342528204

**Citi Bank – New York – USA**

388, Greenwich Street New York,
NY 10013,USA CITIUS33

www.citibank.com
Phone: +800-285-3000

**DBS Bank – Singapore**

DBS Bank Ltd.,
2 Changi Business Park Crescent,
Lobby A # 04-02, DBS Asia Hub,
Singapore 486029
DBSSSGSG

www.dbs.com
Phone: +65-6-2222200/
+65-6-8789010

**Deutsche Bank AG Frankfurt – Germany**

Deutsche Bank AG,
P.O. Box: 60202 Frankfurt am Main,
Germany
DEUTDEFF

www.deutsche-bank.com.de
www.db.com
Phone: +49 6991000/
+49 6991034225

**Deutsche Bank Trust Company**
Americas – New York – USA

No. 60, Wall Street, New York,
NY 10005, USA BKTRUS33

www.db.com
Phone: +1 212 2502500/
+1 212 7970291

**Emirates NBD Bank PJSC – Dubai – UAE**

P.O. Box 777, Deira, Dubai
United Arab Emirates
EBILAEAD

www.emiratesnbd.com
Phone: +971-600 540000

**Keb Hana Bank – Seoul – Korea**

55, Eulji-ro, Jung-gu,
Seoul-Republic of Korea
KOEXKRSE

www.kebhana.com
Phone: +82-02-2002-1111

**Kookmin Bank – Seoul – Korea**

9-1,Namdaemunno 2-GA,
Jung-Gu Seoul 100-092
CZNBKRSE

www.kbfg.com
Phone: +82-(2)-2073-2869

**MUFG Bank (Bank of Tokyo Mitsubishi Ltd) – Tokyo – Japan**

2-7-1, Marunouchi, Chiyoda-ku, Tokyo,
100-8388,
Japan BOTKGPJT

www.bk.mufg.jp
Phone: +81-3-3240-1111

**Post Finance AG – Bern – Switzerland**

Mingerstrasse 20,
3030 Berne,
Switzerland
POFICHBE

Phone: +4184888710

**Woori Bank – Seoul – Korea**

1-203,
Hoehyeon-dong, Jung-gu,
Seoul HVBKKRSE

www.wooribank.com
Phone: +82-2-2006 5000

# හුවමාරු සමාගම්

**Al Ahalia Exchange**

P.O. Box: 35245 Electra Street,
Abu Dhabi, UAE

Phone: +971229666

**Al Ansari Exchange**

Al Ansari Exchange LLC
Al Ansari Business Centre
Level 8, Al Barshal
P.O. Box: 6176, Dubai UAE

Phone: +97143772890/
+97143772788

**Al Fardan Exchange – Qatar**

P.O. Box: 9948, Doha Qatar
Phone: +974444408408

**Al Mulla International**

P.O. Box: 177
Safat 13002 Kuwait

Phone: +96522478250/
+22478242

**Al Rajhi Bank**

Olaya Street, Aqaria 3,
Riyadh, 1111,
Kingdom of Saudi Arabia

www.alrajhibank.com.sa
Phone: +96614603333

**Al Rostamani International**

The Maze Tower Level 18
Sheikh Zayed RD
POB 10072, Dubai UAE

Phone: +97144543200/
+97144543284

**Bahrain Exchange**

Bahrain Exchange Company
W.L.L.M Floor Al Hajery Building
P.O. Box: 29149,
Safat 13152 Kuwait

Phone: +96522089039/
+96522280520

**Bahrain Finance Company**

(Easy remit is a product of BFC)
P.O. Box: 243, 3rd Floor,
Bab Al Bahrain Building Manama
Bahrain

Phone: +97339958195

**Bank Al Bilad**

Corporate Banking Division
P.O. Box: 140 Riyadh
11411 Saudi Arabia

Phone: +96692000/002

**Doha Bank – Qatar**

Doha Bank Head Office Tower,
Corniche Street West Bay
P.O. Box: 3818, Doha, Qatar

Phone: +97444257633

**Federal Exchange-UAE**

Shop No.7, Ground Floor, Ahmed
Eissa Al Hameli Building, Thiqah
Street, M-17, Mussafah, Abu
Dhabi UAE

Phone: +971 4 325 0077

**Gmoney Trans Co Ltd – Korea**

305-2, Jong ro, Jongno-gu,
Seoul,
Republic of Korea

www.gmoneytrans.com
Phone: +82-2-1670-4565

**Hanpass Company Ltd.**

4th Floor,
92 Achasan-ro
(Gwangmyeong Tower)
Seongdong-gu, Seoul,
South Korea

Phone: +82-10-6610-4351

**Index Exchange (Habib) UAE**

Office 201, 2nd Floor,
Sons of Jassim Darwish Building,
Zayad 1st street, Khalidiyah
P.O. Box: 2370, Abu Dhabi UAE

Phone: +97126272656

**Instant Cash**

Instant Cash FZE
P.O. Box: 3014 Dubai, UAE

Phone: + 971 4 2059000/
Ext: 260

**Japan Remit Finance
Co., Ltd (JRM)**

3F Modulo
Hamamatsucho BLDG, 1-2-15,
Hamamatsucho, Minato-ku,
Tokyo, 105-0013, Japan

Website: www.jpremit.com
Phone: +81 3 5733 4337

**Joyalukkas Exchange
(Majan Exchange – Oman)**

P.O. Box:583
P.C.117 Ruwi
Sultanate of Oman

Phone: +96824794017/18

**Lulu Exchange
(Asia Express Exchange)**

P.O. Box: 881 Postal Code 112,
Ruwi High Street Muscat, Sultanate of Oman

Phone: +97126547019

**National Exchange
Company – Italy**

Via Ferruccio 30,00185
Rome Italia

Phone: + 390644341221

**Ria Money Transfer**

6565 Knott Ave, Buena Park,
CA 90620, United States

Phone: +1 562-345-2100

**Mastercard Global**

3, Fraser Street
DUO Tower
Level 17
Singapore 189352

Phone: +65 65332888

**Unistream**

20, Verhnyaya Maskovka Street
Building 2, 127083
Moscow, Russia

Phone: +74955179260

**Western Union LLC**

Denver, Colorado, United States

# මූල්‍ය සහ බැංකුකරණයට අදාළ පාරිභාෂික වචන මාලාව

## A

**ජීවගණක උපකල්පනයන්**
ජීවගණක උපකල්පන ආයතනයක අපක්ෂපාතී සහ අනෙන්‍යාන්‍ය වශයෙන් ගැලපෙන ජන විකාස සහ මූල්‍ය විචල්‍යයන්ගේ හොඳම ඇස්තමේන්තු මඟින් පශ්චාත් රැකියා ප්‍රතිලාභ ලබාදීමේ අවසාන පිරිවැය තීරණය කරනු ඇත.

**ගිණුම්කරණ ප්‍රතිපත්තීන්**
මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී ආයතනයක් විසින් භාවිතකර ඇති නිශ්චිත මූලධර්ම, පදනම්, ගිවිසුම්, නීති හා පරිචයන්.

**උපචිත පදනම**
ගණුදෙනු හා වෙනත් සිද්ධීන් වලින් වන බලපෑම මුදල් හෝ මුදල් සමාන දෙයකින් ලැබීම හෝ ගෙවීම තෙක් ප්‍රමාද නොකොට ගනුදෙනු හා වෙනත් සිද්ධීන් සිදුවන අවස්ථාවේදීම එහි බලපෑම හඳුනාගැනීම.

**ජීවගණක ලාභ/අලාභ**
ආයතනයක විශ්‍රාම සැලැස්මේ ඇස්තමේන්තුව සහ සත්‍ය අත්දැකීම් අතර වෙනසින් ඇතිවන්නා වූ ලාභ හෝ අලාභ.

**ක්‍රමක්ෂය**
අස්පෘශ්‍ය වත්කමක ක්ෂය කළ හැකි අගය එහි ප්‍රයෝජනවත් ජීවිතකාලය පුරා ක්‍රමානුකූල පදනමක් මත විභජනය කිරීම.

**ක්‍රමක්ෂය පිරිවැය**
ක්‍රමක්ෂය පිරිවැය යනු මූල්‍ය වත්කම්/මූල්‍ය වගකීම්, මූලික හඳුනාගැනීමේදී ගණනය කරනු ලබන අගයෙන් සළුප පොළී ක්‍රමය උපයෝගී කරගනිමින් ආපසු ගෙවූ මුල් මුදල අඩුකර, සමුච්චිත ක්‍රමක්ෂය අඩුකර/එකතුකර හෝ ආරම්භක වටිනාකම හා කල්පිරීමේදී ඇති වටිනාකම අතර වෙනස හා හානිකරණය හෝ රැස්කිරීමට නොහැකිවීම මත සිදු කරන අඩුකිරීම් හැර මෙය ගණනය කරනු ලබයි.

**විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම්**
මේ යටතට විකිණීම සඳහා පවතින ව්‍යුත්පන්න නොවූ මූල්‍ය වත්කම් හෝ ණය හා අත්තිකාරම් ලෙස හෝ ලාභ/අලාභ තුළින් සාධාරණ වටිනාකමට ගලපන ලද මූල්‍ය වත්කම් හෝ කල්පිරෙන තෙක් දරා සිටින ආයෝජන ලෙස වර්ගීකරණය නොකළ වත්කම් අයත් වේ.

## B

**බාසල් III**
බාසල් III යනු බැංකු වල ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය සහ ද්‍රවශීලතාවය පිළිබඳ බැංකු අධීක්ෂණ බාසල් කමිටුව විසින් නිකුත් කරන ලද ගෝලීය ස්වේච්ඡා නියාමන කාර්යරාමුවකි.

**පදනම් අංකය (BP)**
සියයට දශම බිංදුවයි එක යන අවස්ථාව (සියයට 0.01); පදනම් අංක 100ක් සියයට 1කි. පොලී අනුපාතයන් හෝ සූරාකුම්වල ප්‍රතිලාභවල චලනයන් නියම කිරීමේදී භාවිතා කරනු ලැබේ.

**ව්‍යාපාර ආකෘති ඇගයීම**
මෙය මූල්‍ය වත්කම් වර්ගීකරණ ක්‍රියාවලියේ පළමු පියවරයි. ව්‍යාපාර ආකෘතිය යනු ආයතනයක් විසින් මුදල් ප්‍රවාහ උත්පාදනය සඳහා මූල්‍ය වත්කම් කළමනාකරණය කරනු ලබන ආකාරයයි. එය උපකරණ මට්ටමට වඩා සාමූහික මූල්‍ය වත්කම් කළමනාකරණය කරන්නේ කෙසේද යන්න පිළිබඹුවූ වන මට්ටමක එය තීරණය වේ. ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 ව්‍යාපාර ආකෘති තුනක් හඳුනාගෙන ඇත. "එකතුකර ගැනීම සඳහා රඳවාගත්", "එකතුකර ගැනීම සඳහා රඳවාගත් සහ විකිණීම" සහ "වෙනත්", ව්‍යාපාර ආකෘතිය තීරණය කිරීමට එක් එක් ව්‍යාපාර ආකෘතියේ අරමුණු වටහා ගැනීම අත්‍යාවශ්‍ය වේ. ව්‍යාපාරයේ කාර්යසාධනය ප්‍රධාන කළමනාකාරිත්වයට වාර්තා කරන ආකාරය සහ ව්‍යාපාරයේ කළමනාකරුවන්ට වන්දි ගෙවීම වැනි ව්‍යාපාරයේ සියලුම අදාළ තොරතුරු සලකා බැලිය යුතුය.

## C

**ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත**
අන්තර්ජාතික පියවීම් (BIS) සඳහා බැංකුව විසින් සැලසුම් කළ හා දේශීය අවශ්‍යතාවයන්ට සරිලන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නවීකරණය කරන ලද රාමුවට අනුව නිශ්චිතව දක්වා ඇති ප්‍රාග්ධන හා අවදානම් බර තැබූ වත්කම් අතර ඇති සම්බන්ධතාවය.

**ප්‍රාග්ධන සංරක්ෂක අවරෝධකය**
නියාමනයන් විසින් බාසල් III යටතේ ප්‍රාග්ධන අවරෝධකය විස්තර කරනු ලබන්නේ ආතති වලින් ඔබ්බට කාලවලදී බැංකු විසින් ස්ථාපිත කරන ලද ප්‍රාග්ධන සංරක්ෂකයන් අලාභ ලබන අවස්ථාවලදී එය අඩු කිරීම සඳහා ආපසු ගතහැකි පරිදි නිර්මාණය කරන සහනිකවීමක් ලෙසයි. බැංකුවල ප්‍රාග්ධන මට්ටම ප්‍රාග්ධන සංරක්ෂණ අවරෝධක පරාස මට්ටමට වඩා අඩු වූ විට ප්‍රාග්ධන බෙදාහැරීම් නියාමනයන් විසින් සීමා කරනු ලබයි.

**ප්‍රාග්ධන වියදම්**
දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම සඳහා දරන ලද වියදම්.

**ප්‍රාග්ධන ලාභ**
වත්කමක් ඉවත් කිරීමෙන් (විකිණීමෙන්) ලැබෙන මුදලින් වත්කමේ පිරිවැය හා විකිණීම සඳහා වූ පිරිවැය අඩු කළ පසු ලැබෙන්නා වූ ලාභ ප්‍රාග්ධන ලාභ වේ.

**ප්‍රාග්ධන සංචිත**
1988 අංක 30 දරණ බැංකු පනත යටතේ නිශ්චිතව සඳහන් කර ඇති අරමුණු සඳහා වෙන්කර ඇති සංචිත අරමුදල් වලින් සහ දේපල ප්‍රත්‍යාගණන සංචිත අරමුදල් වලින් ප්‍රාග්ධන සංචිත සමන්විත වේ. මෙය අඩුකිරීමට හෝ බෙදාහැරීමට මූල්‍ය කමිටුවේ අනුමැතිය ලැබිය යුතුය.

**ධාරණ අගය**
වත්කම් හා වගකීම්වල සාධාරණ අගයට ගැලපුම් කිරීමට පෙර පවතින පොත් අගයයි.

**මුදල් උත්පාදන ඒකකය**
ස්වාධීන මුදල් ප්‍රවාහ ජනනය කරන සහ වෙනත් වත්කම්වලින් ස්වාධීනව ජනනය කරන මුදල් ප්‍රවාහයන්ගෙන් සමන්විත කුඩාම වත්කම් සමූහයයි.

**මුදල් හා සමාන දෑ**
වටිනාකම වෙනස්වීම පිළිබඳ සැලකියයුතු අවදානමක් නොමැතිව ව්‍යවහාර මුදල් බවට වහාම පරිවර්තනය කළහැකි කෙටි කාලීන ඉහළ ද්‍රවශීලතා තත්ත්වයක් පවත්නා වූ ආයෝජන.

**සාමූහික ගිවිසුම**
ජාතික ඉතිරිකිරීමේ බැංකුව, මුදල් අමාත්‍යාංශය සහ ව්‍යාපාරික සමිති අතර ඇති කරගන්නා ලද තෙත්‍රපාක්ෂික ගිවිසුම.

**ණය හානිකරණය සඳහා සාමූහිකව අගය කර සිදු කරනු ලබන වෙන් කිරීම්**
මෙය කළඹ හානිකරණ වෙන්කිරීම ලෙසද හැඳින්වේ. තනිව ගත් කළ විශේෂිත වටිනාකමක් නැති හෝ පාඩුවක් ඇතිවී ඇතත් ගිණුම් වාර්තා දිනයට එම වටිනාකම හඳුනා ගත නොහැකි එක සමාන ලක්ෂණයන්ගෙන් යුතු ණය සමූහයක් වෙනුවෙන් සාමූහික පදනමට කරනු ලබන ණය හානිකරණ අගය ගණනය කිරීමයි. ණය හා අත්තිකාරම්, ණය ආයෝජන කළඹ මත අගයනු ලබයි.

**බැඳියාවන්**
ණය පහසුකම් අනුමත කළ නමුත් වාර්තා කරන දිනට සේවා දායකයන් විසින් භාවිතා නොකරන ලද ප්‍රමාණය.

**අසම්භාව්‍යයන්**
අනාගත සිද්ධියක් හෝ සිද්ධීන් කිහිපයක් සිදුවීම හෝ සිදු නොවීම මත පමණක්, ප්‍රතිඵලය (ලාභ/අලාභ) තහවුරු වන ශේෂපත්‍ර දිනට පවතින තත්ත්වය/අවස්ථාව.

**ආයතනික පාලනය**
සංස්ථාපිත ආයතන පාලනය කිරීමට උපයෝගී කරගනු ලබන ක්‍රියාවලියයි. ආයතන කළමනාකරණය කිරීම හා මෙහෙයවීමේදී විධායක කටයුතු සුපරීක්ෂණය කිරීමේදී සහ අයිතිකරුවන්ට මෙන්ම අනෙකුත් පාර්ශ්වකරුවන් වෙත වගවීමේ කාර්යය ඉටුකිරීම සම්බන්ධයෙන් අධිකාරී බලය ක්‍රියාත්මක කරනු ලබන ආකාරය මෙහිදී සැලකිල්ලට ගැනේ.

**පිරිවැයට ආදායම් අනුපාතය**
ණය පාඩු ප්‍රතිපාදන හැරුණු කොට මෙහෙයුම් වියදම් සහ ගනුදෙනු කළහැකි සූරාකුම්පත්වල අගය පහත වැටීම් සඳහා වන ප්‍රතිපාදන ශුද්ධ ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස දැක්වීම.

**පිරිවැය ක්‍රමය**
ආයෝජනය එහි පිරිවැයට වාර්තාගත කරන ගිණුම්කරණ ක්‍රමයකි. ආයෝජිතයාගේ සමුච්චිත ශුද්ධ ලාභයෙන් බෙදාහැරීම් ලැබුණු ප්‍රමාණය දක්වා පමණක් ආයෝජකයාගේ ආදායම් ප්‍රකාශයේ එම ආයෝජනයේ ආදායම හඳුනාගනී.

**ණය ශ්‍රේණිගත කිරීම්**
සංස්ථාපිත ආයතනයකට එහි ණය පියවීමේ හැකියාව හෝ එය පැහැර නොහැරීමේ සම්භාවිතාව සම්බන්ධයෙන් ස්වාධීන ශ්‍රේණිගත කිරීමේ ආයතනයක් විසින් සිදු කරනු ලබන ඇගයීම.

**ණය අවදානම**
ණයගැතියෙකු හෝ අදාළ පාර්ශ්වයක් විසින් ගිවිසගත් කොන්දේසි ප්‍රකාර කටයුතු කිරීමට අපොහොසත්වීමෙන් පැන නඟින තත්ත්වය, ණය අවදානම නැතහොත් පැහැර හැරීමේ අවදානම වශයෙන් සරලව අර්ථ දැක්වේ.

**මුදල් හුවමාරුව (SWAPs)**
මුදල් ඒකක තත්කාලීන විනිමය ගෙවීම් ක්‍රමය යටතේ මිලදී ගැනීම සහ මෙම මුදල් ප්‍රමාණය එම මුදල් ඒකකයෙන්ම ඉදිරි ගිවිසුම් ගෙවීම් ක්‍රමය යටතේ විකිණීම සඳහා සමගාමීව කටයුතු කිරීම මුදල් හුවමාරුවක් වේ.

**පාරිභෝගික තැන්පතු**
ගිණුම් හිමියන් විසින් තැන්පත් කරන මුදල් වේ. මෙම අරමුදල් වගකීම් ලෙස වාර්තා කර ඇත.

**ණය අවදානම අවම කිරීම**
ඇපවීම්, ඇපකර සහ ණය ආරක්ෂණය වැනි ණය අවදානම් අවම කිරීමේ යෙදීමෙන් නිරාවරණයන් සහ සම්බන්ධ ණය අවදානම අඩු කිරීමේ ක්‍රමවේදයකි.

## D

**ණය ආපසු ගෙවීමේ සැලසුම්/ණය නැවත උපලේඛනගතකරණය**
නොගෙවූ ණය ගිවිසුම්වල නියමයන් සහ විධිවිධාන වෙනස් කිරීම වේ. මෙය බොහෝ විට සිදුකරනුයේ මුදල් ප්‍රමාණය සහ ණය ගැණුම්කරුගේ ණය ආපසු ගෙවීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහාය. එයට ආපසු ගෙවීමේ කාලසටහන් වෙනස් කිරීම මෙන්ම ණය හෝ පොලී ගෑස්තු අඩු කිරීම ඇතුළත් විය හැකිය.

**ගනුදෙනු කළහැකි සූරාකුම්පත්**
කෙටිකාලීනව යළි විකිණීමේ අදහස පෙරදැරිව අත්පත් කරගත් හා රඳවාගත් අලෙවි කළ හැකි සූරාකුම්පත්.

**ණයකර**
සංස්ථාපිත ආයතනයක් විසින් නිකුත් කරන ලද මධ්‍යකාලීන ණය උපකරණයකි.

**විලම්බිත බදු**
ප්‍රවර්තන මූල්‍ය වර්ෂය තුළදී හැර අනෙකුත් මූල්‍ය වර්ෂයන්හිදී ගෙවීමට සිදුවන බදු වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන වල වෙන්කර තබනු ලබන ප්‍රමාණය.

**ක්ෂය කිරීම**
වත්කමක ක්ෂය කළ හැකි වටිනාකම එහි ඵලදායී ජීවිත කාලය තුළ විධිමත්ව ප්‍රතිපාදනය කිරීම.

**හඳුනානොගත් ඉවත් කිරීම්**
මීන් පෙර මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශවලදී හඳුනාගත්තා ලද මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් පොත්වලින් ඉවත් කිරීම.

# මූල්‍ය සහ බැංකුකරණයට අදාළ පාරිභාෂික වචන මාලාව

**පැහැර හැරීම**
ණය හෝ වෙනත් මූල්‍ය වගකීමක් සඳහා වූ ගෙවීම් අනුක්‍රමයෙන් නොලැබීම පැහැර හැරීමකි. ණය සහ අත්තිකාරම් සඳහා වූ ගෙවීම් අබණ්ඩව මගහැරීම, පැහැර හැරීම ලෙස සලකනු ලැබේ.

**වියුත්පන්නයන්**
මූල්‍ය උපකරණයක් වන අතර, එහි මිල ඒ සඳහා භාජනය වන වත්කම් වල අගය මත තීරණය වෙයි.

**ණයවර ලිපි** (LCs)
තම ගනුදෙනුකරුවන් වෙනුවෙන් විශේෂිත නියමයන් සහ කොන්දේසි යටතේ නියම කර ඇති මුදල දක්වා බැංකුවෙන් ලබා ගැනීමට තුන්වන පාර්ශ්වයක් වෙත බැංකුව විසින් බලය ලබා දෙන්නා වූ ලිඛිත පොරොන්දුවයි. ජාත්‍යන්තර වෙළඳාමට පහසුකම් සැලසීමේ අරමුණින් මෙය පිහිටුවා ඇත.

**දේශීය වශයෙන් පද්ධතීමය වශයෙන් වැදගත් බැංකු** (d-Sibs)
දේශීය වශයෙන් පද්ධතීමය වශයෙන් වැදගත් බැංකු යනු අසාර්ථක වීමට ඉඩදිය නොහැකි විශාල බැංකුයි. මෙවැනි බැංකු, අර්බුදයකදී රටේ සැබෑ ආර්ථිකයට අත්‍යවශ්‍ය බැංකු සේවා අබණ්ඩව ලබාගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල වත්කම් රු.බිලියන 500 ට සමාන හෝ වැඩි බලපත්‍රලාභී වාණිජ බැංකු, දේශීය වශයෙන් පද්ධතීමය වශයෙන් වැදගත් බැංකු ලෙස නම් කර ඇත.

**වට්ටම් අනුපාතය**
අනාගත මුදල් ප්‍රවාහයන් මත වත්මන් අගයක් තැබීමට භාවිතා කරන අනුපාතයකි. මුදලට කාල වටිනාකමක් ඇති බව පිළිබිඹු කිරීම සඳහා අවශ්‍ය වේ.

## E

**සාමාන්‍ය කොටසක ඉපයුම** (EPS)
සාමාන්‍ය කොටස් හිමියන් සඳහා වූ ලාභය සාමාන්‍ය කොටස් ගණනින් බෙදූ විට ලැබෙන අගයයි.

**ආර්ථිකමය එකතුකළ අගය**
ඵලදායීතාව පිළිබඳ මිනුමක් වන අතර, ඒ සඳහා සමස්ත ආයෝජිත හිමිකම් පිරිවැය සැලකිල්ලට ගනු ලැබේ.

**සජල බදු අනුපාතය**
බදු පෙර ලාභයෙන් බෙදන ලද බදු සඳහා වන ප්‍රතිපාදන.

**සජල පොළී අනුපාතිකය**
මූල්‍ය උපකරණයෙන් අනාගතයේදී ලැබිය යුතු මුදල් ප්‍රවාහයන් හෝ ලැබීම් අපේක්ෂිත ජීව කාලය තුළ හෝ සුදුසු පරිදි ඊට අනුරූප කෙටිකාලයක් තුළ මූල්‍ය වත්කම්/වගකීම් වල ශුද්ධ ප්‍රවර්තන අගයට අනුව වට්ටම් කිරීමට යොදාගනු ලබන පොළී අනුපාතය.

**හිමිකම් උපකරණ**
ආයතනයේ වගකීම් අඩුකර ගැනීමෙන් පසු වත්කම්වල ඉතිරිව ඇති ප්‍රමාණය.

**හිමිකම් ක්‍රමය**
ආයෝජනය මුලදී පිරිවැයට ගිණුම්ගත කොට ඉන්පසු ඇති වූ වෙනස්කම් මත ආයෝජකයාගේ ගිණුම්වල ශුද්ධ වටිනාකමට/ආයෝජකයාට ඇති හිමිකමට වෙනස්කම් සිදුකොට ගිණුම් තැබීමේ ක්‍රමයයි. ආයෝජකයාගේ ලාභය හෝ අලාභයෙන් ආයෝජිතයාගේ කොටස ආයෝජකයා විසින් ඇතුලත් කරනු ලබයි.

**හිමිකම් අවදානම**
කොටස් වෙළඳපල විචලනයන් හේතුකොට ගෙන හිමිකම් වටිනාකම ක්ෂය වීමට ඇති අවදානම.

**පැහැර හැරීමට නිරාවරණය වීම (EAD)**
මෙය වූ කලී ගිවිසුම් මත හෝ වෙනත් හේතූන් මත ලේඛනගත කර ඇති මුදල සහ පොලිය ආපසු ගෙවීමද ඇතුළුව වාර්තා කළ දිනට පසු නිරාවරණයවීම්හි අපේක්ෂිත වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් ඉදිරි පැහැර හැරීම් දිනකදී නිරාවරණයවීමේ තක්සේරුවයි.

**අපේක්ෂිත ණය අලාභ (ECLs)**
මෙය ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09- මූල්‍ය උපකරණ යටතේ පවතින ණය අලාභ හානිකරණ කිරීමේ ක්‍රමයකි. මෙය පැහැර හැරීමේ සම්භාවිතාව, පැහැර හැරීමට නිරාවරණය වීම, පැහැර හැරීමකදී සිදුවිය හැකි පාඩුව ලෙස වට්ටම් සහිත නිෂ්පාදිත වේ. අපේක්ෂිත ණය අලාභ, අපක්ෂපාතී මිනුම් වන අතර එය තීරණය කරනු ලබන්නේ විය හැකි ප්‍රතිඵල පරාසයක් තක්සේරු කිරීමෙනි.

**විදේශ විනිමය ලාභය/අලාභය**
විදේශ විනිමය ගණුදෙනු සිදුවන දිනය/අවසන් වාර්තාගත දිනය සහ පියවීම්/වාර්තා කරන දිනය අතර විදේශ විනිමය අනුපාත අතර ඇති වෙනස මත විදේශ විනිමය ලාභ උපදී. මෙය විදේශ මුදල් වෙළඳාම මතද උපදී.

## F

**සාධාරණ අගය**
දැනුවත් හා කැමැත්ත දක්වන පාර්ශ්වයන් අතර සිදුවන අතේ දුරින් ගනුදෙනුවකදී ණයක් පියවීම සඳහා හෝ වත්කමක් හුවමාරුකර ගැනීම සඳහා යොදාගත හැකි අගයයි.

**මූල්‍ය වත්කම්**
යම් වත්කමක් එනම් මුදල් හා වෙනත් ඒකකයක හෝ වෙනත් ඒකකයකින් මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් ලැබීමට ඇති ගිවිසුම්මය අයිතියකි.

**ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරන ලද මූල්‍ය වත්කම්**
වත්කම පවත්වා ගෙන යනු ලබන ව්‍යාපාර ආකෘතියක් තුල වත්කමක් පවත්වා ගෙන යනු ලැබේ නම්, කොන්ත්‍රාත් මුදල් ප්‍රවාහයන් රැස් කිරීමට, වත්කම් තබා ගැනීම සහ මූල්‍ය වත්කමේ ගිවිසුම් නියමයන් නිශ්චිත දිනයක් මත පදනම්ව ගෙවනු ලබන මුදල් ප්‍රවාහයන් සඳහා ගෙවනු ලබන ප්‍රාග්ධනය සහ නොගෙවූ ප්‍රාග්ධනය සඳහා වූ පොලිය.

**විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම්**
මෙහි විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ ණය සහ හිමිකම් උපකරණ ඇතුළත් වේ. ණය උපකරණයක් මෙසේ ගණනය කරනු ලබන්නේ, එය කොන්ත්‍රාත් මුදල් ප්‍රවාහ එකතු කිරීම සහ මූල්‍ය වත්කම් විකිණීම යන දෙකම මගින් ව්‍යාපාරයේ ආකෘතිය තුල පවත්වාගෙන යනු ලබන්නේ නම් එය නියමිත දිනට නිශ්චිත දිනයන් මත ඉහළ යන මුදල් ප්‍රවාහයන් සඳහා ගෙවනු ලබන ප්‍රාග්ධනය සහ නොගෙවූ ප්‍රාග්ධන සඳහා වූ පොලියෙනි. හිමිකම් ආයෝජන, විස්තීර්ණ ආදායමේ සාධාරණ අගයට අනිවාර්යයෙන් වර්ගීකරණය කළ හැක්කේ ශ්‍රී.ල.ගි.ප්‍ර. 32 මූල්‍ය උපකරණ ප්‍රමිතයෙහි හිමිකම් නිර්වචනයට අනුව "ඉදිරිපත් කිරීම සහ විකිණීමට තබා නොමැති, යටතේය.

**ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම්**
ක්‍රමක්ෂය පිරිවැයට හෝ විස්තීර්ණ ආදායමේ සාධාරණ අගයට වර්ගීකරණය කර නොමැති සියලු මූල්‍ය වත්කම් මේ යටතට ගැනේ. මෙය විකිණීමට පවතින හෝ කළමනාකරණයට පවතින සහ ඒවායේ කාර්යසාධනය සාධාරණ අගයේ පදනම මත ඇගයීමට ලක් කෙරේ. එමෙන්ම මේවා රඳවා ගැනීමට කොන්ත්‍රාත් මුදල් ප්‍රවාහ මත එකතු නොකළ හෝ කොන්ත්‍රාත් මුදල් ප්‍රවාහ මත එකතු නොකළ සහ විකිණීම සඳහා නොපවතින මූල්‍ය වත්කම් යන දෙයාකාරයෙන් පවතින රඳවාගත් මූල්‍ය වත්කම් වේ.

**මූල්‍ය උපකරණ**
එක් පාර්ශ්වයකට මූල්‍ය වත්කමක් සහ අනෙක් පාර්ශ්වයට මූල්‍ය වගකීමක් හෝ හිමිකමක් ජනනය කරනු ලබන ගිවිසුමකි.

**මූල්‍ය වගකීම**
වෙනත් ඒකකයකට මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් භාරදීමට ඇති ගිවිසුම් ගත බැඳීමක්.

**ඇපයට තබන ලද පවරාගත් දේපල**
පූර්ණ හෝ අර්ධ වශයෙන් ණය තෘප්ත කිරීමෙන් අත්පත් කරගන්නා ලද දේපල.

**විදේශ ව්‍යවහාර මුදල් අවදානම**
දේශීය විනිමය හැරුණු විට අනෙකුත් විදේශ විනිමයන් සමග ගනුදෙනු කිරීමේදී ඇතිවන අවදානම මෙහිදී සැලකේ. විදේශ මුදල් හුවමාරු අනුපාතයේ අහිතකර වෙනස්වීම් මත විදේශ මුදලින් පවතින වත්කම්/වගකීම් වල අගය අඩු විය හැක.

**විදේශ විනිමය ගිවිසුම්**
ව්‍යවහාර මුදල් ඒකකයක් නවත් මුදල් ඒකකයක් සමග අනාගත දිනයක වර්තමානයේ එකඟවන අනුපාතයට හුවමාරු කිරීමට දෙපාර්ශ්වයක් විසින් ඇති කර ගන්නා එකඟතාවයකි.

## G

**පොදු ප්‍රතිපාදන**
තනි පුද්ගල පහසුකම් මත ණය පාඩු තීරණය කළ නොහැකි අවස්ථාවලදී සමුච්චිත නිරාවරණයවීම් හමුවේ ණය හා අත්තිකාරම් මත අනාගතයේදී සිදු වෙතැයි අපේක්ෂිත අලාභයන් ගෙවා දැමීම සඳහා වෙන්කර ඇති අරමුදල්.

**සමූහය**
සමූහය යනු, පරිපාලකය සහ එහි සියලුම පරිපාලිතයන්ය.

**ඇපවීම්**
ණය ගෙවීමට නියමිත තැනැත්තෙකු එය පියවීමට අපොහොසත් වුවහොත් එම වගකීම ඉටු කිරීමට එක් පාර්ශ්වයක (ඇපකරු) පොරොන්දුව මත බැඳෙන ත්‍රෛපාර්ශ්වික ගිවිසුමකි.

**ගෝලීය වාර්තාකරණ මූලපිරිම්**
මෙය ව්‍යාපාර සඳහා උපකාරී වන්නා වූ අන්තර් ජාතික ස්වාධීන ප්‍රමිත ආයතනයක් වන අතර මෙය ව්‍යාපාර, රාජ්‍ය සහ අනෙක් සංවිධාන සඳහා ඒවායේ ගැටළු වලට බලපාන්නාවූ දේශගුණික විපර්යාස, මානව හිමිකම් සහ දූෂණය වැනි දෑ තේරුම් ගැනීමට සහ සන්නිවේදනයට උපකාරී වන්නා වූ අන්තර්ජාතික ස්වාධීන ප්‍රමිත ආයතනයකි. මෙය තිරසාර සංවර්ධනයක් ලබාගැනීමට ව්‍යාපාරයට අවශ්‍ය වන්නා වූ මාර්ගය ප්‍රවර්ධනය කරයි.

**අබණ්ඩ පැවැත්ම**
යම් ආයතනයක මූල්‍ය ප්‍රකාශ සකසනු ලබන්නේ එම ආයතනය අපේක්ෂා කළහැකි කාලපරිච්ඡේදයන් සඳහා දිගටම ක්‍රියාත්මක වනු ඇතැයි උපකල්පනය මතය. එබැවින් ආයතනයකට ඇවර කිරීමට හෝ තම මෙහෙයුම්වල ප්‍රමාණාත්මක බව සහ පරිමාව සීමා කිරීමට චේතනාවක් හෝ අවශ්‍යතාවයක් නොමැති බවට උපකල්පනය කෙරේ.

**කිර්තිනාමය**
තනි තනිව හඳුනා නොගත් සහ වෙන් වෙන් වශයෙන් හඳුනා නොගත් ව්‍යාපාර සංයෝජනයකින් අත්පත් කරගත් වෙනත් වත්කම්වලින් මතුවන අනාගත ආර්ථික ප්‍රතිලාභ නියෝජනය කරන වත්කමකි.

## H

**ඉදිරි රැකුම්**
අවාසිදායක මිල වෙනස්වීම් (පොළී අනුපාත සහ භාණ්ඩ මිළ) නිසා ඇතිවන්නා වූ අවදානමත් එම අවදානම බලපැවැත්වෙන ගනුදෙනු ආරක්ෂා කර ගැනීම සඳහා යොදා ගන්නා ක්‍රමෝපායන්ය.

**කල් පිරෙන තෙක් දරා සිටින ආයෝජන**
කල් පිරීම තෙක් රඳවා ගැනීමේ අභිලාශය හා හැකියාව ඇති නිශ්චිත වටිනාකමක් සහ නිශ්චිත කල් පිරීමේ කාලයක් සහිත වියුත්පන්න නොවන මූල්‍ය වත්කම්.

**වෙළඳාම සඳහා දරා සිටින මූල්‍ය ආයෝජන**
කෙටි කාලීනව (අවුරුදු 1 ක කාලසීමාවට අඩු) යළි විකිණීමේ අදහස පෙරදැරිව අත්පත් කර ගත් ණය සහ හිමිකම් ආයෝජන

# මූල්‍ය සහ බැංකුකරණයට අදාළ පාරිභාෂික වචන මාලාව

**ගුණාත්මක බවින් ඉහළ ද්‍රවශීල වත්කම්**
ආතති කාලසීමාවන් තුළ ද්‍රවශීල හා ශ්‍රී ලංකා මහ බැංකුවට යෝග්‍ය බැඳීම් රහිත වත්කම්. නිදසුන් ලෙස මුදල් හා මහ බැංකුව හා මධ්‍යම බැංකු මත හිමිකම් මීට ඇතුළත්ය.

## I

**අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP)**
පවතින බැංකුකරණ අවදානම් සඳහා අමතර ප්‍රාග්ධනයක් යොමු කරන බවට බැංකුව විසින් සහතික වීමේ ක්‍රියාවලියයි.

**හානිකරණය**
වත්කමක් මගින් අයකර ගත හැකි මුදල් ප්‍රමාණය, එහි ප්‍රවර්තන අගයට වඩා අඩුවූ විට උද්ගත වන තත්ත්වයකි.

**හානිකරණයට ගැලපීම් සිදුකරන ලද වත්කම් කළඹ**
තනිව ගත්කළ වැදගත් වන, හානිකරණය සඳහා ගැලපීම් සිදුකරන ලද ණය කළඹ හා තනිව ගත්කළ වැදගත් නොවන නමුත් දින 180 ට වැඩිකාලයක් ගෙවීම් පැහැර හරින ලදුව ඇති ණය කළඹ මේ නමින් හැඳින්වේ.

**හානිකරණය සඳහා වූ දීමනාව**
සිදුවී ඇති අලාභයක් වෙනුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට ලාභයෙන් සිදුකරන වෙන් කිරීමකි. මෙය තනිව හෝ සාමූහිකව හඳුනාගනු ලබයි.

**හානිකරණ ගාස්තු/නැවත අයවීම්**
වත්කමකින් ජනිත වන අනාගත වට්ටම් කළ මුදල් ප්‍රවාහයන්ගේ සහ වත්කමේ වර්තමාන වටිනාකම අතර වෙනස.

**හානිකරණ ණය**
සමාගම් විසින් ගිවිසුම් පරිදි ලැබිය යුතු ණය මුදල් ප්‍රමාණ සියල්ල එකතු කිරීමට බලාපොරොත්තු නොවන හෝ එම ණය මුදල් ප්‍රවාහ ගිවිසුම් ප්‍රකාර දිනයට පසු දිනයකදී එකතු කිරීමට බලාපොරොත්තු වීම.

**කේවල හානිකරණය**
තනි තනිව ගත් කල සැලකිය යුතු ගිණුම් සහ සාමූහික හානිකරණයට අයත් නොවන සියලු ගිණුම් අලාභය සඳහා කොතරම් දුරට අනාවරණය වනවාද යන්න තක්සේරු කිරීම.

**අස්පෘශ්‍ය වත්කම්**
අස්පෘශ්‍ය වත්කමක් යනු භෞතිකමය තත්ත්වයක් නොමැති හඳුනාගත හැකි වත්කමකි. ආයතනික බුද්ධිමය දේපල (උදාහරණ ලෙස, පේටන්ට් බලපත්‍රය, පුරස්කාරය වෙළඳ ලකුණ, ව්‍යාපාර පටිපාටි), කීර්තිනාමය, වෙළඳ නාමය ආදිය වර්තමාන වෙළඳපොළේ පොදු අස්පෘශ්‍ය වත්කම් ගණයට අයත් වේ.

**අවිනිශ්චිත පොලී**
අක්‍රිය ණය හා අත්තිකාරම් මත ඇතිවන පොලී.

**පොලී ආන්තිකය**
ප්‍රකාශිත ශුද්ධ පොලී ආදායම, සාමාන්‍ය පොලී උපයන වත්කම්වල ප්‍රතිශතයක් ලෙස.

**පොලී අනුපාත අවදානම**
මූල්‍ය උපකරණයක සාධාරණ වටිනාකම හෝ අනාගත මුදල් ප්‍රවාහ වෙළඳපොළ පොලී අනුපාතවල වෙනස්වීම් හේතුවෙන් උච්චාවචනය වීමේ අවදානම.

**පොලී ව්‍යාප්තිය**
පොලී අනුපාතික, විනිමය අනුපාතික, ණය ව්‍යාප්තිය සහ වෙනත් වත්කම් මිල වැනි විචල්‍යයන් නිසා පොලී උපයන වත්කම් හා පොලී සහිත වගකීම් මත උපයන ලද පොලී අනුපාතිකයෙහි සාමාන්‍යය හා ගෙවන ලද පොලී අනුපාතිකයෙහි සාමාන්‍යය අතර ඇති වෙනස නිරූපණය කරයි.

**ආයෝජන දේපල**
භාවිතයට හෝ විකිණීමට හැර හූදෙක් බදු කුලි ඉපයීමට හෝ ප්‍රාග්ධන වටිනාකම වැඩිවීම හෝ දෙකම සඳහා (අයිතිකරු විසින් හෝ මූල්‍ය කල්බදු යටතේ බදු ගැණුම්කරු විසින්) තබා ගෙන ඇති දේපල (ඉඩම් හෝ ගොඩනැගිල්ලක්, ගොඩනැගිල්ලකින් කොටසක් හෝ ඒ දෙකම) වේ.

**ආයෝජන සුරුකුම්පත්**
ඉපයීම පිණිස, ප්‍රාග්ධන වර්ධන අරමුණු සඳහා අත්පත් කරගත් හා රඳවාගත් සහ සාමාන්‍යයෙන් කල්පිරීම තෙක් රඳවාගන්නා සුරුකුම්පත්.

**පොලී අනුපාත හුවමාරු**
නිශ්චිත මුල් මුදලක් මත පදනම්ව අනාගත පොලී ගෙවීම් සම්බන්ධයෙන් එක් ඉදිරි පොලී ගෙවීම් ප්‍රවාහයක් තවත් වර්ගයේ ඉදිරි පොලී ගෙවීම් ප්‍රවාහයකට හුවමාරු වීමට අදාළ පාර්ශ්ව 2 ක් (පාර්ශ්වකරුවන්) අතර එකඟතාව.

## K

**ප්‍රධාන කළමනාකරණ පිරිස**
අධ්‍යක්ෂවරුන්ද ඇතුළුව ආයතනයේ ක්‍රියාකාරකම් සෘජුව හෝ වක්‍රාකාරව සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය සඳහා අධිකාරය සහ වගකීම් ඇති පුද්ගලයින් වේ.

## L

**තෝලන අනුපාතය**
මෙය ස්ථර I ප්‍රාග්ධනය හා මුළු නිරාවරණය වීම් අතර මනින ලද අනුපාතයකි. අවදානම් මත පදනම් වූ ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා බැංකු ක්ෂේත්‍රය තුළ අතිරේක තෝලනයන් ගොඩනැගීම සීමා කිරීම මෙම අතිරේක මිනුම් මගින් අපේක්ෂිතය.

**ද්‍රවශීල වත්කම්**
මුදල් ලෙස රඳවාගන්නා ලද හෝ වෙනත් බැංකුවල තැන්පතු විනිමය බිල්පත් සහ භාණ්ඩාගාර බිල්පත් වැනි පහසුවෙන් මුදල් බවට පත් කළහැකි ආකාරයෙන් පවතින වත්කම් මේ මගින් දක්වා ඇත.

**ද්‍රවශීල වත්කම් අනුපාතය**
මහ බැංකුව විසින් ප්‍රකාශිත පරිදි මුදල් හෝ පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි ආකාරයෙන් පවතින වත්කම්, අසම්භාව්‍ය වගකීම්ද ඇතුළුව මුළු වගකීම් වලින් බෙදීමෙන් මෙම අනුපාතය ලබාගැනේ.

**ජීවකාල අපේක්ෂිත ණය පාඩු**
මූල්‍ය උපකරණයක අපේක්ෂිත ජීව කාලය තුළ ඇති විය හැකි සියලු පැහැර හැරීම්වල ප්‍රතිඵල ලෙස පැන නගින අපේක්ෂිත ණය පාඩු. "මූල්‍ය උපකරණ" පිළිබඳ ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9ට අනුව, මූලාරම්භයේ පටන් ණය පාඩුවල සැලකිය යුතු වර්ධනයක් නොමැති විටකදී හැර අපේක්ෂිත ණය පාඩු දීමනාව, ජීවකාල අපේක්ෂිත ණය පාඩු මත පදනම් විය යුතුය.

**ද්‍රවශීලතා ආවරණ අනුපාතය**
බැංකුව විසින් කෙටිකාලීන වගකීම් ඉටු කිරීම පිණිස පවත්වා ගෙන යනු ලබන වත්කම් මෙයින් අදහස් වේ. මෙම අනුපාතය තුළින් වෙළඳපොළ පුරා ඇති විය හැකි කම්පන ආතති පරීක්ෂාවක් සිදුවේ.

**ද්‍රවශීලතා අවදානම**
ඒකකයක් විසින් මූල්‍ය වගකීම සම්බන්ධ බැඳීම් සපුරාලීම සඳහා මුහුණ පෑමට සිදු වන දුෂ්කරතාවය පිළිබඳ අවදානම.

**ණය සහ ලැබිය යුතු දෑ**
වෙළඳපොළේදී වටිනාකමක් තීරණය වී නොමැති සාම්ප්‍රදායික ණය වත්කම්ය. (උපදවන ලද හෝ අත්පත් කරගත්)

**ගෙවීම් පැහැර හැරීම නිසා ඇතිවන පාඩුව**
ණයගැතියා ගෙවීම් පැහැර හැරීම නිසා ණය හිමියාට සිදුවන අලාභය මුළු මුදලෙහි ප්‍රතිශතයක් ලෙස දැක්වීම.

**ණයට වටිනාකම් අනුපාතය**
මුල් උකස් අයිතියෙහි වටිනාකම, සැබෑ දේපළක සමස්ත ඇගයුම් වටිනාකමෙහි ප්‍රතිශතයක් ලෙස ගණිතමය අනුසාරයෙන් ඉදිරිපත් කිරීම. ණය සඳහා යෝග්‍ය අවදානම් මට්ටම තීරණය කිරීමෙහි ලා ණයට වටිනාකම් අනුපාත ප්‍රතිශතය භාවිතා කෙරෙන අතර, එමගින් ණයකරුට ලබා දෙන ණයෙහි නිවැරදි මිල තීරණය කළ හැකි වේ.

## M

**වෙළඳපොළ අවදානම**
පොළී අනුපාත, විනිමය අනුපාත, ණය ව්‍යාප්තිය සහ වෙනත් වත්කම් මිල ආදී වෙළඳපළ විචල්‍යයන්ගේ වෙනස්වීම හේතුකොටගෙන මූල්‍ය උපකරණයන්හි අගය වෙනස්වීම මත අලාභ ඇතිවීමේ හැකියාව.

**ප්‍රමාණාත්මක බව**
යම් ගනුදෙනුවක හෝ සිදුවීමක සාපේක්ෂ වැදගත්කම හෝ යම් ගනුදෙනුවක් හෝ සිදුවීමක් අත්හැරීම හෝ සාවද්‍ය ප්‍රකාශයක් වීම මූල්‍ය ප්‍රකාශන ප්‍රයෝජනයට ගන්නා පාර්ශ්වයන්ගේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට බාධාවක් සිදු කරන්නේ නම් එය ප්‍රමාණාත්මක ගනුදෙනුවකි.

## N

**ශුද්ධ පොළී ආදායම**
ණය හා සුරුකුම්පත් වැනි බැංකුව සතු වත්කම්වලින් උපයන දේ සහ තැන්පතු ප්‍රතිමූල්‍ය අරමුදල් හා අන්තර් බැංකු ණයගැනීම් යනාදී මූල්‍ය වගකීම් අතර වෙනස වේ.

**ශුද්ධ පොලී ආන්තිකය**
පොලී උපයන සාමාන්‍ය වත්කම් වලින් බෙදන ලද ආන්තිකය, ශුද්ධ පොලී ආදායම ලෙස හඳුන්වයි.

**අක්‍රිය ණය**
තුන් මසකට වඩා වැඩි කාලයක් නොගෙවන ලද ණය.

**නොස්ට්‍රෝ ගිණුම්**
දේශීය බැංකුවක් විසින් විදේශීය රටක එම රටෙහි ව්‍යවහාර මුදලින් පවත්වාගෙන යනු ලබන නොස්ට්‍රෝ ගිණුම් මගින් විදේශ ව්‍යවහාර මුදලින් සිදු කළ වෙළඳ ගනුදෙනු පියවීමට පහසුකම් සැපයේ.

**අක්‍රිය ණය අනුපාතය**
සමස්ත අක්‍රිය ණය හා අත්තිකාරම් ප්‍රමාණය, (විලම්භිත පොලී රහිතව) සමස්ත ණය හා අත්තිකාරම් කළඹින් (විලම්භිත පොලී රහිතව) බෙදන ලද විට ලැබෙන අනුපාතය.

**ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය**
මූල්‍යනය කිරීම සඳහා යොදාගත් වත්කම්වල ද්‍රවශීලතාවය සහ ශේෂපත්‍රයේ සඳහන් නොවන අවිනිශ්චිත බැඳීම්වලට සාපේක්ෂව බැංකුවක් විසින් භාවිතා කරනු ලබන දිගුකාලීන, ස්ථාවර අරමුදල් ප්‍රභවයන් ගණනය කිරීම මෙම අනුපාතයෙන් සිදුවේ.

**පාලනයට යටත් නොවන හිමිකම්/ සුළුතර හිමිකම්**
සුළුතර හිමිකම් ලෙසද හඳුන්වනු ලබන පාලනය සම්බන්ධයෙන් තීරණ ගැනීමට හිමිකමක් නොමැති පාර්ශ්වයයි.

## O

**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙන් පරිබාහිර වූ ගනුදෙනු**
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනට හඳුනා නොගත් නමුත් අසම්භාව්‍යයන් හෝ වගකීම් ජනිතවන්නා වූ වත්කම් හෝ වගකීම් මේ නමින් හැඳින්වේ.

**මෙහෙයුම් අවදානම**
ප්‍රමාණවත් නොවන හා අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලීන්, පුද්ගලයන් සහ පද්ධතීන් නෛතික අවදානම් හෝ බාහිර සිදුවීම් නිසා පාඩු ඇති විය හැකි අවදානම.

**විවෘත ණය නිරාවරණ අනුපාතය**
මුළු ශුද්ධ අක්‍රිය ණය සහ අත්තිකාරම්, නියාමන ප්‍රාග්ධනයෙහි ප්‍රතිශතයක් ලෙස දැක්වීම මෙම අනුපාතයයි.

# මූල්‍ය සහ බැංකුකරණයට අදාළ පාරිභාෂික වචන මාලාව

## P

**පරිපාලකය**
පරිපාලනය යනු එක් පරිපාලක සමාගමක් හෝ ඊට වැඩියෙන් ඇති ආයතනයකි.

**පඬුව**
රාජ්‍ය සුරැකුම්, ණය හා අත්තිකාරම්, කොටස් ඇතුළු ආයෝජන සංචිතයකි.

**පැහැර හැරීමේ සම්භාවිතාව**
යම් වගකීමකට බැඳී සිටින තැනැත්තා එම වගකීම පැහැර හැරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් සෑම ගණුදෙනුකරුවෙක් පිළිබඳවම සිදු කෙරෙන අභ්‍යන්තර තක්සේරුවකි.

**ප්‍රක්ෂේපිත ඒකක ප්‍රතිලාභ ක්‍රමය**
සෑම සේවා කාල පරිච්ඡේදයක්ම අතිරේක ප්‍රතිලාභවලට හිමිකම් ලැබීමට ඉඩ සලසන අතිරේක ඒකකයක් ලෙස සලකන සහ අවසාන ගොඩනැගීම සඳහා සෑම ඒකකයක්ම වෙන් වශයෙන් මනිනු ලබන ආයු ගණක තක්සේරු කිරීමේ ක්‍රමයකි. අවිනිශ්චිත තත්වයන් යටතේ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය තීරණ ගැනීමේදී යම් මට්ටමක හෝ අවධානයක් පවත්වාගැනීම මගින් වත්කම් හෝ ආදායම් වැඩියෙන් ප්‍රකාශවීම සහ වගකීම් හෝ වියදම් අඩුවෙන් ප්‍රකාශවීම සිදු නොවනු ඇත.

## R

**වත්කම් වල සාමාන්‍ය මත ආදායම**
වත්කම් වල සාමාන්‍යයේ ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශිත බදු පසු ලාභය.

**හිමිකම් වල සාමාන්‍ය මත ආදායම**
සාමාන්‍ය කොටස් හිමියන්ගේ කොටස් වල ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශිත හිමිකරුවන් වෙත ලැබිය යුතු ශුද්ධ ලාභය.

**සම්බන්ධිත පාර්ශ්වයන්**
මූල්‍ය හෝ මෙහෙයුම් තීරණ ගැනීමෙහිලා සෘජුව හෝ වකුව එක් පාර්ශ්වයකට අනෙක් පාර්ශ්වය පාලනය කිරීමේ හෝ එම පාර්ශ්වය කෙරෙහි සැලකිය යුතු ආකාරයේ බලපෑමක් ඇති කිරීමේ හැකියාව සහිත පාර්ශ්වයන්.

**සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු**
මිලක් අයකරන්නේද නැද්ද යන්න ගැන නොසළකා. වාර්තාකරණ ආයතනය සහ සම්බන්ධිත පාර්ශ්වයන් අතර සම්පත්, සේවා හෝ බැඳීම් නුවමාරුවීමයි.

**ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම්**
පොලිය සමඟ ස්ථාවර මිලක් යටතේ පසු දිනයක ආපසු මිලදීගැනීමේ අරමුණෙන් ගැණුම්කරුවන් වෙත අලෙවි කෙරෙන සුරැකුම්.

**ප්‍රතිවිකුණුම් ගිවිසුම්**
බැංකුවක් හෝ ගණුදෙනුකරුවෙක් විසින් සුරැකුම් මිලට ගෙන නිශ්චිත මිලක් යටතේ පසු දිනෙක අලෙවිකරු වෙත සුරැකුම් ආපසු අලෙවි කිරීමට අදාළ ගණුදෙනුවකි.

**ආදායම් සංචිත**
අනාගතයේදී බෙදාහැරීම් සහ ආයෝජනය සඳහා වෙන් කර තැබෙන සංචිත.

**අවදානම මත බර තැබූ වත්කම්**
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව වත්කම් වල අගය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සඳහන් නොවන හා අදාළ අවදානම් මත බර තැබූ සාධක වලින් ගුණකරන ලද වත්කම් වලට සමවන ණය අගය.

**රුපියල් ණය**
ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන රුපියල් සුරැකුම්.

**ප්‍රේෂණ**
ප්‍රේෂණ යනු විදේශික ශ්‍රමිකයෙකු විසින් ඔහුගේ හෝ ඇයගේ මව් රටෙහි සිටින පුද්ගලයෙකුට මුදල් මාරු කිරීමකි.

## S

**කොටස්හිමිකරුවන්ගේ අරමුදල්**
1988 අංක 30 දරණ බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව සකස් කරන ලද ප්‍රාග්ධන සංචිතයකි.

**ණය අවදානමේ සැලකිය යුතු ලෙස ඉහළයාම**
ශ්‍රී ලංකා ඛිණුම්කරණ ප්‍රමිති 9 අනුව ප්‍රථම වරට හඳුන්වාදීමෙන් පසු යම් මූල්‍ය උපකරණයකට අදාළව ආපසු ගෙවීම පැහැර හැරීමේ අවදානම සැලකිය යුතු ආකාරයෙන් ඉහළ ගොස් තිබේද යන්න යම් ආයතනයක් විසින් තක්සේරු කරනු ලැබිය යුතුය. ගිවිසුම්ගත ගෙවීම් දින 30 ක් පසුවන විටත් නොගෙවී නම් ප්‍රථම වරට හඳුන්වාදීමෙන් පසු යම් මූල්‍ය වත්කමක් ආශ්‍රිත ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති බවට බිඳ හෙළිය නොහැකි පූර්ව නිගමනයක් සම්මතයේ පවතී.

**මුල් මුදල හා පොලිය ගෙවීම් පමණක් පරීක්ෂාව (Solely Payments of Principal and Capital - SPPI)**
ණය වර්ගීකරණ ක්‍රියාවලියේ දෙවන අදියර ලෙස මෙම පරීක්ෂාව සිදු කෙරේ. ප්‍රථම වරට හඳුන්වාදීමේදී මූල්‍ය වත්කමක සාධාරණ අගය "මුල් මුදල" ලෙස නිර්වචනය කෙරෙන අතර මුල් මුදල ආපසු ගෙවීම හෝ වාරිකය හෝ වට්ටම ක්‍රමක්ෂය වීම හේතුවෙන් එය වෙනස්විය හැකිය. මුදලේ කාලීන වටිනාකම සහ මුදල් මුදලෙන් නොගෙවූ කොටස ආශ්‍රිත ණය අවදානම සඳහා වන සැලකිල්ල "පොලිය" ලෙස නිර්වචනය කෙරේ. යම් මූල්‍ය උපකරණයක් මෙම පරීක්ෂාව සමත්වීමෙන් පසු එය "රැස්කිරීම සඳහා රඳවාගත්" ව්‍යාපාරික ආකෘතියට අනුකූල වේ නම් ක්‍රමක්ෂයවූ පිරිවැය මත වර්ගීකරණය කෙරෙන අතර එය "රැස්කිරීම සහ අලෙවිය සඳහා රඳවාගත්" ව්‍යාපාරික ආකෘතියට අනුකූලවේ නම් වෙනත් විස්තීරණ ආදායම් ඔස්සේ තක්සේරු කරන ලද සාධාරණ වටිනාකම් මත වර්ගීකරණය කෙරේ. යම් මූල්‍ය උපකරණයක් මෙම පරීක්ෂාව අසමත්වුවහොත් එය සම්පූර්ණයෙන්ම ලාභ හෝ අලාභ මත තක්සේරු කරන ලද සාධාරණ වටිනාකම මත වර්ගීකරණය කළ යුතුය.

**ව්‍යවස්ථාපිත සංචිත අරමුදල**
1988 අංක 30 දරණ බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව සකස් කරන ලද ප්‍රාග්ධන සංචිතයකි.

**යටත්කාලීන වගකීම්**
බුන්වත්වීමකදී හෝ ඇවර කිරීමකදී මූල්‍ය උපකරණ නිකුත්කරන්නා විසින් වෙනත් ණයහිමියන්ට ගෙවිය යුතු මුදල් ගෙවීමෙන් පසු ශේෂ වන වගකීම්.

**ආනති පරීක්ෂාව**
විවිධ තිවුතා සහිත අනපේක්ෂිත තත්වයන් දරාගැනීමට බැංකුවට හැකියාව තිබේද යන්න විවිධ මට්ටම් වලින් පෙන්නුම් කරන ඒකාබද්ධ පරීක්ෂාවකි.

**පරිපාලිතය**
එක් ආයතනයක් විසින් පාලනය වන තවත් ආයතනයක්.

**ස්වරූපයට වඩා යථාතත්වය**
ගනුදෙනු සහ අනිකුත් සිද්ධීන් ඒවායේ හුදු නෛතික ස්වරූපය අනුව පමණක් නොව ඒවායේ හරය හා නියම ආර්ථික ස්වභාවය අනුව ගිණුම්ගත කර ඉදිරිපත් කිරීම අවශ්‍යය යන මූලධර්මය.

**නුවමාරු (මුදල් ඒකක)**
ස්ථානීය ගෙවීම් සඳහා යම් මුදල් ඒකක ප්‍රමාණයක් එකවර මිලදීගැනීම සහ ඉදිරි ගෙවීම් සඳහා එම මුදල් ඒකකයේ එම ප්‍රමාණයම අලෙවි කිරීම. එසේ නොමැතිනම්, යම් මුදල් ඒකකයක් ස්ථානීය අලෙවිය සහ ඉදිරිය සඳහා මිලට ගැනීම.

## T

**ස්ථර I ප්‍රාග්ධනය**
සාමාන්‍ය සමකොටස් ස්ථර I ප්‍රාග්ධනය සහ අතිරේක ස්ථර I ප්‍රාග්ධනය යන සාධක වලින් සමන්විත නියාමන ප්‍රාග්ධනයේ එක් අංගයකි. බැංකුවේ මූල්‍ය ශක්තිය මනින ප්‍රධාන මිනුම ස්ථාවර කොටස් හිමියන්ගේ සමකොටස් සහ රඳවාගත් ඉපයීම් හා වෙනත් අතිරික්ත විසර්ජනය කිරීම ඔස්සේ නිර්මාණය කරන ලද හෝ ඉහළ නංවන ලද සංචිත නියෝජනය කරයි.

**ස්ථර II ප්‍රාග්ධනය**
ප්‍රත්‍යාගණන ලාභ, සාමාන්‍ය වෙන් කිරීම් හා නිශ්චිත හිමිකම් ලක්ෂණ පෙන්නුම් කරන අනෙකුත් ප්‍රාග්ධන උපකරණ මෙන්ම යටත්කාලීන, කාලීන ණය වැනි දෑ ඇතිණය මීට ඇතුලත්වය.

**සමස්ත ප්‍රාග්ධනය**
සමස්ත ප්‍රාග්ධනය යනු ස්ථර I ප්‍රාග්ධනය සහ ස්ථර II ප්‍රාග්ධනය යන සාධක දෙකෙහි සමාකරණයයි.

**භාණ්ඩාගාර බිල්පත්**
ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙන්දේසි පදනමක් මත නිකුත් කරනු ලබන කෙටි කාලීන ණය උපකරණයකි.

**භාණ්ඩාගාර බැඳුම්කර**
ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙන්දේසි පදනමක් මත නිකුත් කරනු ලබන දිගු කාලීන ණය උපකරණයකි.

**මාස 12ක කාලය සඳහා අපේක්ෂිත ණය අලාභ losses (12-Month ECL)**
වාර්තා කරන ලද දිනට පසු එළඹෙන මාස 12 ඇතුළත ඇතිවිය හැකි යම් මූල්‍ය උපකරණයක් ආශ්‍රිත ගෙවීම පැහැර හැරීමේ සිදුවීම් හේතුවෙන් පැන නැගිය හැකි අපේක්ෂිත ණය අලාභ නියෝජනය කරන පූර්ණ කාලීන ණය අලාභ වල කොටස.

## U

**ඒකක භාර**
ඒකක ඔප්පුවකට අදාල වගන්ති යටතේ සුරැකුම් වල ආයෝජනය කිරීම සඳහා භාරගැනීම.

**ප්‍රයෝජනවත් ජීව කාලය**
යම් ආයතනයක් විසින් යම් වත්කමක් ප්‍රයෝජනයට ගැනීම පිණිස සූදානම් කරනු ලැබීමට ගත වේ යැයි අපේක්ෂිත කාල සීමාව හෝ යම් ආයතනයක් වෙතින් යම් වත්කමක් ලබාගන්නා බවට අපේක්ෂිත නිමැවුම් සංඛ්‍යාව හෝ ඊට සමාන ඒකක සංඛ්‍යාව.

## V

**එකතු කළ වටිනාකම්**
බැංකු හා වෙනත් සේවා සැපයීම ඔස්සේ, එම සේවා සැපයීම සඳහා දරණ ලද පිරිවැය අඩු කිරීමෙන් පසු ජනනය වූ ධනය. එකතු කළ වටිනාකම් සේවකයන් හා ප්‍රාග්ධන සැපයුම්කරුවන් සඳහා මෙන්ම පුළුල් කිරීම සහ වර්ධනය සඳහා රඳවාගත් සහ බදු ලෙස රජය සඳහාද වෙන් කෙරේ.

**අවදානමේදී වටිනාකම**
පොලී අනුපාත, මිල උච්චාවචනයන් වැනි වෙළඳපොළ අවදානම් සාධක ආශ්‍රිත අහිතකර විචලන වල ප්‍රතිඵලයක් ලෙස ඇතිවන අවදානම් තත්ත්ව හේතුවෙන් කිසියම් නිශ්චිත කාලපරාසයකදී හා දී ඇති විශ්වාසනීය මට්ටමකදී ජනිත වන අලාභ තක්සේරු කිරීම සඳහා යොදාගන්නා ක්‍රමවේදයකි.

## Y

**කල්පිරීමේ ඵලදා අනුපාතය**
අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන වටිනාකම, සුරැකුම් වල වත්මන් මිල සමග සමාන වන වට්ටම් අනුපාතිකය

# ආයතනික තොරතුරු

**බැංකුවේ නම**

ජාතික ඉතිරිකිරීමේ බැංකුව

**නෛතික ස්වරූපය**

1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත මඟින් ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරන ලද රජයට අයත් බැංකුවක් වන අතර, 1988 අංක 30 දරණ බැංකු පනත මඟින් ඊට බලපත්‍රලාභී විශේෂිත බැංකුවක තත්ත්වය පිරිනමන ලදී.

**ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන කාර්යාලය**

"ඉතිරිකිරීමේ මන්දිරය",
නො. 255, ගාලු පාර,
කොළඹ 03, ශ්‍රී ලංකාව.
දුරකථනය: +94 11 257 3008-15
ෆැක්ස්: +94 11 257 3178
පාරිභෝගික ක්ෂණික ඇමතුම් +94 11 237 9379
කෙටි අංකය: 1972
ඊමේල්: nsbgen@nsb.lk
වෙබ් අඩවිය: http://www.nsb.lk
ස්විෆ්ට් අංකය: NSBALKLX
බැංකු අංකය: 7719
බදු ගෙවන්නන්ගේ හඳුනාගැනීමේ අංකය: 409046266

**සේවා මධ්‍යස්ථාන**

ශාඛා - 263
ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර/මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර - 418

**නියෝජිතායතන ජාලය**

දිවයින පුරා පැතිර පවතින තැපැල් කාර්යාල 651 ක් සහ උපතැපැල් කාර්යාල 3,351

**දේශීය ශ්‍රේණිගත කිරීම**

(SL) AAA (stable) ණය ශ්‍රේණිගත කිරීම ලංකා රේටින් ඒජන්සි (LRA)

**අධ්‍යක්ෂ මණ්ඩලය**

ආචාර්ය හර්ෂ කබ්රාල්, ජනාධිපති නීතිඥ - සභාපති
ජූඩ් නිලුක්ෂාන් මහතා - අධ්‍යක්ෂ (නිල බලයෙන්)
එස් ආර් ඩබ්ලිව් එම් රුවන් පාලිත
සත්කුමාර මහතා - අධ්‍යක්ෂ (නිල බලයෙන්)
දුෂ්‍යන්ත බස්නායක මහතා - අධ්‍යක්ෂ
අශේන් ජයසේකර මහතා - අධ්‍යක්ෂ
රනිල් ගුණතිලක මහතා - අධ්‍යක්ෂ
සුපුල් විජේසිංහ මහතා - ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ

**වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී**

රෝහණ බණ්ඩාර වීරකෝන් මහතා

**වැඩබලන මණ්ඩල ලේකම්**

ඩබ්ලිව් එච් එම් ඩී බී විජේකෝන් මහතා

**අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC)**

සුපුල් විජේසිංහ මහතා - සභාපති
ජූඩ් නිලුක්ෂාන් මහතා
දුෂ්‍යන්ත බස්නායක මහතා
අශේන් ජයසේකර මහතා

**අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව (BHRRC)**

එස් ආර් ඩබ්ලිව් එම් රුවන් පාලිත
සත්කුමාර මහතා - සභාපති
ජූඩ් නිලුක්ෂාන් මහතා
රනිල් ගුණතිලක මහතා
සුපුල් විජේසිංහ මහතා

**අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC)**

රනිල් ගුණතිලක මහතා - සභාපති
ජූඩ් නිලුක්ෂාන් මහතා
එස් ආර් ඩබ්ලිව් එම් රුවන් පාලිත
සත්කුමාර මහතා
අශේන් ජයසේකර මහතා

**අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව (BNC)**

රනිල් ගුණතිලක මහතා - සභාපති
එස් ආර් ඩබ්ලිව් එම් රුවන් පාලිත සත්කුමාර මහතා
දුෂ්‍යන්ත බස්නායක මහතා
සුපුල් විජේසිංහ මහතා

**අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුව (BITSC)**

දුෂ්‍යන්ත බස්නායක මහතා - සභාපති
එස් ආර් ඩබ්ලිව් එම් රුවන් පාලිත සත්කුමාර මහතා
අශේන් ජයසේකර මහතා
සුපුල් විජේසිංහ මහතා

**අධ්‍යක්ෂ මණ්ඩල සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු සමාලෝචන කමිටුව (BRPT)**

සුපුල් විජේසිංහ මහතා - සභාපති
ජූඩ් නිලුක්ෂාන් මහතා
අශේන් ජයසේකර මහතා

**අනුකූලතා නිලධාරී**

අයි කේ එල් සසී මහේන්ද්‍රන් මිය

**මහජන තොරතුරු නිලධාරී**

(2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතට අනුව)
අනුපමා මුහන්දිරම් මහත්මිය

**විගණකවරුන්**

විගණකාධිපති

**ගිණුම්කරණ වසර**

දෙසැම්බර් 31

**ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පරිපාලිත සමාගම්**

**සමාගමේ නම**

සී.ස. එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම

**ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන කාර්යාලය**

අංක 400, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකා.
දුරකථනය: +94 11 2425010-12, +94 11 256 5956
ෆැක්ස්: +94 11 257 4387
ඊමේල්: nsbfmc@nsb.lk
ස්විෆ්ට් අංකය: NSBFLKLX
බදු ගෙවන්නන්ගේ හඳුනාගැනීමේ අංකය: 134008512

**ප්‍රධාන විධායක නිලධාරී**

ඩී එල් පී අබයසිංහ මහතා

**විගණකවරුන්**

විගණකාධිපති

**සමාගමේ ලේකම්**

ෆර්සානා අනීෆ් මිය

**සමාගමේ නම**

සී.ස. ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

**ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන කාර්යාලය**

අංක 265, වෝර්ඩ් පෙදෙස, කොළඹ 07, ශ්‍රී ලංකා.
දුරකථනය: +94 11 267 4700/1/2/3, 269 1721-2
ෆැක්ස්: +94 11 267 4705/6
ඊමේල්: info@slsbl.lk
බදු ගෙවන්නන්ගේ හඳුනාගැනීමේ අංකය: 134013370

**සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී**

එම් ඒ එස් ප්‍රනාන්දු මහතා

**විගණකවරුන්**

විගණකාධිපති

**සමාගමේ ලේකම්**

ඩී ආර් එන් යූ පෙරමුණ මිය

* 2026 ජනවාරි 19 වන දින නැවත පිහිටුවන ලද කමිටු සාමාජිකයින්

** 2026 පෙබරවාරි 17 වන දින නැවත පිහිටුවන ලද කමිටු සාමාජිකයින්

GSARN©
www.gsarn.org
Global Standard Annual Report Number©
LKA8355NSBXX0250000S112

SMART MEDIA
The ANNUAL REPORT Company

Produced by Smart Media,
a GHG-neutral company
since 2011

**ජාතික ඉතිරිකිරීමේ බැංකුව**

"ඉතිරිකිරීමේ මන්දිරය"
නො. 255, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව
දුරකථනය: +94 11 257 3008-15
ෆැක්ස්: +94 11 257 3178
ඊමේල්: nsbgen@nsb.lk
වෙබ් අඩවිය: http://www.nsb.lk

ISBN 978-624-5790-17-3

9 786245 790173

ඔබගේ ස්මාර්ට් උපාංගයෙන්
QR කේතය ස්කෑන් කරන්න (Scan)
හෝ ලොග් වන්න

අනුගමනය කරන්න